ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

දහවන පාර්ලිමේන්තුව

(පළමුවන සැසිවාරය)




# විගණකාධිපති

## වාර්ෂික වාර්තාව

# 2024

# විගණකාධිපති

## වාර්ෂික වාර්තාව

## 2024

ජාතික විගණන කාර්යාලය

## අපගේ දැක්ම

රාජ්‍ය ගණන් දීමේ වගකීම
සහ
යහ පාලනය
පෙරදැරි කරගත්
රාජ්‍ය අංශයේ
මඟ පෙන්වන්නා වීම

## අපගේ මෙහෙවර

තිරසාර සංවර්ධනයක් උදෙසා
මනා මූල්‍ය කළමනාකරන සහ
රාජ්‍ය සම්පත්
ප්‍රශස්ත ලෙස උපයෝජනය කිරීම
තහවුරු කරනු වස් ,
විගණනය මෙහෙයවීම
මගින් යහපාලනය සහ
රාජ්‍ය ගණන්දීමේ වගකීම
ප්‍රවර්ධනය කිරීම.

## අපගේ වටිනාකම්

විශිෂ්ඨත්වය

නවෝත්පාදනය

නායකත්වය

## අපගේ අරමුණු

1.සම්පත්වල භාරකාරීත්වය පවරනු ලබන ආයතනවල කළමනාකරණයන් හා ඔවුන් හා පවරන ලද ගණන්දීමේ වගකීම ඉටුකර තිබේද යන්න ස්වාධීන පරික්ෂණයක් සිදුකිරීම සහ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම.

2. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යන නමින් හඳුන්වන පාර්ලිමේන්තුවේ අධීක්ෂණ කාරක සභා දෙක රාජ්‍ය ආයතනවල සිදුකරන කාර්යසාධනය පරික්ෂා කිරීමට සහාය වීම.

3. විගණිත ආයතනවලට ඔවුන්ගේ ගිණුම් කටයුතුභාවය වර්ධනය කර ගැනීමට කළමනාකරණ වාර්තා නිකුත් කිරීම මගින් නිර්දේශ සිදුකර සහාය වීම.

# ජාතික විගණන කාර්යාලයේ නිල ලාංඡනය

## මෙම නිල ලාංඡනය සඳහා භාවිතා කළ සංකේතවලින් පහත සඳහන් අර්ථයන් පිළිබිඹු කෙරේ

- ලාංඡනය ඉහළින්ම දක්වා ඇති සිංහයා මඟින් ශ්‍රී ලංකාව නිරූපනය කෙරේ.
- එහි මැද ඇති තරාදිය මඟින් ස්වාධීනත්වය හා අපක්ෂපාතීත්වය පිළිබිඹු කෙරේ.
- එය වටා ඇති ඔලිව් ඉති ද්විත්වය මඟින් සාමය හා සෞභාග්‍යය පිළිබිඹු කෙරේ.
- එය වටා ඇති පලා පෙති රටාව මඟින් ජාතික සංස්කෘතිය නිරූපණය කෙරේ.

# විගණකාධිපති සටහන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව සතුවන රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳ බලතල, ඵලදායීව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම, ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධිත විධායකගේ මෙහෙයුම් කටයුතු සම්බන්ධව ජාත්‍යන්තරව පිළිගත් පරිචයන්ට අනුකූලව ස්වාධීනව පරීක්ෂා කොට පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත පැවරී ඇති ප්‍රධානතම කාර්යය වේ. එම කර්තව්‍ය ඉටුකිරීමේදී 2024 මූල්‍ය වර්ෂයට අදාලව මා විසින් ඉදිරිපත් කරන ලද වාර්තා පහත සඳහන් පරිදි කාණ්ඩ දහයක් යටතේ පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු යොදා ඇති අතර හත්වන කාණ්ඩය වශයෙන් එම ක්ෂෙත්‍රයන්හි සුවිශේෂී විගණන නිරීක්ෂණද ඇතුළත් කොට මෙම විගණකාධිපති වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| පළමුවන කාණ්ඩය | - | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු |
| දෙවන කාණ්ඩය | - | රාජ්‍ය සංස්ථා , අධිකාරී , මණ්ඩල හා ව්‍යවස්ථාපිත අරමුදල් |
| තුන්වන කාණ්ඩය | - | ව්‍යවස්ථාපිත නොවන අරමුදල් |
| හතරවන කාණ්ඩය | - | විදේශ ආධාර ව්‍යාපෘති |
| පස්වන කාණ්ඩය | - | පළාත් සභා |
| හයවන කාණ්ඩය | - | පළාත් පාලන ආයතන |
| අටවන කාණ්ඩය | - | කර්යසාධන හා පාරසරික විගණන පැවරුම් |
| නවවන කාණ්ඩය | - | රාජ්‍ය සමාගම් |
| දහවන කාණ්ඩය | - | විශේෂ විගණන පැවරුම් |
| එකොලොස්වන කාණ්ඩය | - | ත්‍රෛවාර්ෂික වාර්තා |

උත්තරීතර විගණන ආයතනයන්හි ජාත්‍යන්තර සංවිධාන විසින් 2007 වර්ෂයේදී මෙක්සිකෝ ප්‍රකාශය මඟින් පිළිගෙන ඇති මූලික නිර්ණායකයන්ට අනුකූලව පරිපාලන, මූල්‍ය සහ කාර්යබද්ධ ස්වාධීනත්වය තහවුරු වන පරිදි රාජ්‍ය විගණන කටයුතු සම්බන්ධයෙන් නෛතික විධිවිධාන හා ආයතනික ව්‍යුහයන් සකස් වියයුතු බව ජාත්‍යන්තර පිළිගැනීමයි. ඒ සඳහා යොමු වීම පාදක කොටගෙන 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් 2015 වර්ෂයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාට සංශෝධන එක් කරමින් විගණන සේවා කොමිෂන් සභාව පිහිටුවීමට අදාල නෛතික සංශෝධනයන් සිදු කරන ලදී.

විගණන සේවා කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පිළිබඳ විධිවිධාන සැලැස්වීම, ජාතික විගණන කාර්යාලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය පිහිටුවීම, රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ කාර්යභාරය නිශ්චිතව දැක්වීම අරමුණු කොටගෙන 2018 අංක 19 දරන ජාතික විගණන පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කොට ඇත.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය විගණන කටයුතු ඉටුකරනු ලැබූ විගණකාධිපති දෙපාර්තමේන්තුව ජාතික විගණන කාර්යාලය ලෙස හැඳින්වීම හා විගණන කාර්ය මණ්ඩලය සඳහා රාජ්‍ය විගණන සේවාවක් ස්ථාපිත කොට එහි පත් කිරීම්, උසස් කිරීම්, මාරුකිරීම්, විනය පාලන බලතල හා ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික ඇස්තමේන්තුව සකස්කිරීමේ බලතල විගණන සේවා කොමිෂන් සභාව වෙත පැවරීම තුලින් ජාත්‍යන්තර නිර්ණායකයන්ට අනුකූලව රාජ්‍ය විගණන ක්‍රියාවලිය තුළ පරිපාලන හා මූල්‍ය ස්වාධීනත්වය ආරක්ෂා කිරීම අපේක්ෂා කොට ඇත.

කෙසේ වෙතත් විවිධ අභියෝග හමුවේ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කිරීම සඳහා වූ නව සේවා ව්‍යවස්ථාව  අනුමත කිරීමෙන් පසු 2024 ජනවාරි 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි අංක 2366/31 දරන අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කිරීමට ලැබීම සුවිශේෂී සන්ධිස්ථානයකි.

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, ව්‍යාපෘති ඇතුලු සේවාලාභී ආයතන 2368 කට වැඩි සංඛ්‍යාවක විගණන කටයුතු සිදුකර වාර්ෂිකව වාර්තා කිරීමේ වගකීම, 1995 ක් වූ රාජ්‍ය විගණන සේවයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් 40% ක පමණ පුරප්පාඩු  සහිතව 226 ක්වූ විගණන නොවන කාර්ය මණ්ඩලයේ සහය ඇතිව අපේක්ෂිත මට්ටමින් ඉටුකිරීම අභියෝගාත්මක වුවද 2024 වර්ෂය සඳහා ව්‍යවස්ථාපිතව ඉදිරිපත් කළයුතු වාර්තාව නියමිත ඉලක්කගත කාලපරිච්ඡේදය තුළ ඉදිරිපත් කිරීමට මාගේ කාර්‍ය මණ්ඩලය දැඩි කැපවීමෙන් කටයුතු කරන ලදී.

උත්තරීතර විගණන ආයතනයන්ගේ කාර්යසාධනය ඇගයීම සඳහා වන ආයතනය විසින් 2018 වර්ෂයේදී කරන ලද ඇගයීමට අනුව ජාතික විගණන කාර්යාලය විසින් වර්ධනය කරගත යුතු ක්ෂේත්‍ර කිහිපයක් පිළිබඳව පෙන්වාදී ඇත. ඊට සමගාමීව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට හා නවීන භාවිතයන්ට අනුරූපව ජාතික විගණන කාර්යාලයේ ධාරිතාව වැඩිදියුණු කිරීම සඳහා යුරෝපා සංගමයේ මූල්‍ය අධාර මත ලෝක බැංකුව විසින් ශ්‍රී ලංකා මූල්‍ය කළමණාකරණ වර්ධන ව්‍යාපෘතිය 2023-2026 කාලපරිච්ඡේදය තුල ක්‍රියාත්මකව පවතින අතර එමඟින් වඩාත් ගුණාත්වයෙන් යුත් උසස් විගණන වාර්තා නියමිත කාලසීමාවන් තුල ඉදිරිපත් කිරීමට අවශ්‍ය තාක්ෂණික වර්ධනයන් සිදුකිරීමට යෝජිතව පවතී. එහි සුමට ක්‍රියාකාරිත්වයට පැවති අභියෝග ජයගනිමින් ඉදිරි වසර තුළ අපේක්ෂිත ක්‍රියාකාරකම් නිම කිරීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කරමි.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය විගණන කටයුතු සම්බන්ධයෙන් පැරණිතම ලේඛණගත සාක්ෂිය වන මිහින්තලා සෙල් ලිපිය (ක්‍රි.ව. 956-972) අනුවද, මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කිරීමේදී අනාවරණය වන අඩුපාඩු අනුව දඩුවම් ලබා දීමේ ක්‍රියාවලියක් පිළිබඳ සඳහන් වන අතර මෙක්සිකෝ ප්‍රකාශයේ හත්වන මූලධර්මය ලෙස විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව ඵලදායී පසුවිපරම් යාන්ත්‍රණයක අවශ්‍යතාවය පිළිබඳ අවධාරණය කොට ඇත.

ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි මඟින් විගණන නිරීක්ෂණ අනුව අනාවරණය වන කරුණු සම්බන්ධයෙන් නිවැරදි කිරීම, වලක්වා ගැනීම හා අයකර ගැනීමේ බලතල හා වගකීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් වෙත පවරා ඇතත් එය නිසි ලෙස ක්‍රියාත්මක නොවීම සම්බන්ධව පාර්ලිමේන්තුව විසින් විවිධ අවස්ථාවන්හිදී අවධානයට ලක්කොට ඇති බව, පාර්ලිමේන්තු ප්‍රකාශ අංක 89 යටතේ 1986 අප්‍රේල් 25 දින ප්‍රකාශයට පත්කර ඇති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දොළොස්වන වාර්තාව, 1993 ජුලි 21 දිනැති අංක 320 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සාක්ෂි දරන නමුත් රාජ්‍ය මූල්‍ය කටයුතු මෙහෙයවන පාර්ශවයන් ඒ පිළිබඳ ප්‍රමාණවත් උනන්දුවක් සහිතව ක්‍රියාත්මක නොවීම පිළිබඳ මා විසින් ඉදිරිපත් කර ඇති වාර්තා සාක්ෂි සපයයි. එම තත්වය ආර්ථික අර්බුදයක් දක්වා රට යොමුකරලීමට ප්‍රධාන සාධකයක් වී ඇත. ඒ පිළිබඳව විශේෂ අවධානයකින් යුක්තව විගණන වාර්තා මඟින් ආවරණය වන කරුණු සම්බන්ධව නිවැරදි කිරීමේ, වලක්වා ගැනීමේ හා අයකර ගැනීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම කාලීන අවශ්‍යතාවයක්ව පවතී.

භෞතික හා මානව සම්පත්හි පවතින ඌණතාවයන් ව්‍යවස්ථාපිත කාර්යභාරය ඉටු කිරීමට අභියෝගාත්මක වුවද, මාගේ කාර්ය මණ්ඩලයේ දැඩි කැප කිරීම තුල විගණන කාර්යභාරයන් නියමිත ලෙස අවසන් කර නියමිත වාර්තා ඉලක්කගත කාල පරිච්ඡේදයන් තුළදී ඉදිරිපත් කිරීමට උපරිම වශයෙන් කටයුතු කරන ලදී. ජාතික විගණන කටයුතු ප්‍රශස්ථ ලෙස ඉටුකිරීම මෙන්ම රාජ්‍ය අංශය අංශයේ පවතින ආවේනික තත්වයන් හා ක්‍රියාකාරකම් හොඳින් අවබෝධ කර ගැනීම සහතික වන පරිදි විගණන වාර්තා කාර්යක්ෂව හා ඵලදායීව නිකුත් කිරීම උදෙසා ජාතික විගණන කාර්යාලය ක්‍රියාකාරකම් රාශියක් ක්‍රියාවට නංවා ඇති අතර එම කටයුතු අඛන්ඩව සමාලෝචනය කරමින් වර්ධනය කිරීමට කටයුතු යොදා ඇත.

විගණකාධිපති ධූරය 2024 අප්‍රේල් මස පුරප්පාඩු වූ දින සිට මේ දක්වා එම තනතුරේ වැඩ බැලීමේ වගකීම ඉටුකිරීමේදී රාජ්‍ය විගණන කටයුතු සඳහා කැප වූ ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලය සමග රාජ්‍ය මූල්‍ය පාලන කටයුතු ශක්තිමත්ව පවත්වා ගැනීම පිළිබඳ පරීක්ෂා කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම් ඉටුකිරීමට ලැබීම මා ලද භාග්‍යක් කොට සලකමි . රාජකාරී ඉටු කිරීමේදීත් විවිධ බාධා පැවතියද මාගේ කාර්ය මණ්ඩලය වෘත්තීමය ගරුත්වය ආරක්ෂා කරමින් කරන ලද කැපකිරීම් ප්‍රශංසාත්මකව අගයමි.

මෙම අවස්ථාව ගරු. කතානායකතුමා, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමන්ලා ඇතුළු සාමාජිකයන්, විගණන සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් හා කාර්ය මණ්ඩලය, ජනාධිපති ලේකම් ඇතුළු එම කාර්ය මණ්ඩලයට, මුදල් අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය, නීතිපතිවරයා හා පරිපාලන කටයුතු වලදී සහාය වූ අනෙකුත් රාජ්‍ය ආයතන පොදු වෘත්තීයේ යෙදෙන සහාය විගණනයන් සිදු කළ වරළත් ගණකාධිකාරීවරුන්ගෙන් සමන්විත ආයතන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, විගණිත ආයතන සහ භෞතික හා මානව සම්පත් සංවර්ධනයට දායක වූ යුරෝපා සංගමයට ස්තුති කිරීමට මම යොදා ගනිමි.

ජී. එච්. ඩී. ධර්මපාල
විගණකාධිපති(වැ.බ)

2025 ඔක්තෝබර් 30 දින

# පටුන



| I කොටස - අපගේ සංවිධානය | පිටුව | | පිටුව |
|---|---|---|---|
| **හැඳින්වීම** | | රාජ්‍ය ආයතනවල මූල්‍ය පාලනය හා කාර්යසාධනය - ඇගයීම සඳහා වන ප්‍රශ්නාවලිය | 13 |
| වාර්තාවේ සංයුතිය | 01 | වෙනත් කාරක සභා සඳහා වන ප්‍රශ්නාවලිය | 14 |
| ස්ථානගත වීම | 01 | විගණකාධිපති විසින් අධිභාර පැනවීම | 14 |
| **විගණන අධිකාරය** | | පළාත් පාලන ආයතනවල අධිභාර අයකිරීම | 15 |
| රාජ්‍ය විගණනයේ ඉතිහාසය | 02 | විශ්වවිද්‍යාල අධිභාර | 15 |
| විගණනය සඳහා වර්තමාන අධිකාරි බලය | 02 | මහජන නියෝජන පරීක්ෂා කිරීම | 16 |
| 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා සංශෝධන | 02 | නීති අංශය | 17 |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනත | 03 | අපගේ සංවිධාන සටහන | 18 |
| වෙනත් විශේෂිත අණපනත් | 03 | අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය | 20 |
| **විගණනයේ ස්වාධීනත්වය** | | කාර්ය මණ්ඩල පුහුණු කිරීම | 21 |
| ස්වාධීනත්වය පිළිබඳ ජාත්‍යාන්තර අවශ්‍යතා | 04 | දේශීය පුහුණු වැඩසටහන් | 23 |
| අපගේ ස්වාධීනත්වය | 07 | විදේශීය පුහුණු වැඩසටහන් | 23 |
| විගණන සේවා කොමිෂන් සභාව | 07 | බාහිර ආයතන සඳහා සම්පත් දායකත්වය ලබා දීම | 24 |
| **විගණන කාර්යභාරයන්** | | පුහුණු අවස්ථා සලසා දීම | 24 |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ජාතික විගණන පනත | 09 | සුදුසුකම්ලත් විගණකවරුන් සේවයේ යොදවා ගැනීම | 24 |
| විගණන ක්‍රමවේදය | 09 | ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ධාරිතා වර්ධන ව්‍යාපෘතිය | 25 |
| වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ වාර්තා පාර්ලිමේන්තුවට හා විගණිත අස්ථිත්ව වෙත ඉදිරිපත් කිරීම | 10 | තොරතුරු දැන ගැනීමේ පනත යටතේ තොරතුරු ඉදිරිපත් කිරීම | 27 |
| වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නොවන විගණනය | 11 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2024 | 28 |
| පාර්ලිමේන්තුවට සභාගත කිරීම | 11 | | |

| II කොටස - විගණන නිරීක්ෂණය | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපති ලේකම් කාර්යාලය හා ජනාධිපති අරමුදල | 32 | වාරිමාර්ග | 303 |
| ස්වාධීන කොමිෂන් සභා | 36 | විදුලිබල හා බලශක්ති | 317 |
| බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු | 40 | නාගරික සංවර්ධන හා නිවාස | 336 |
| මූල්‍ය කටයුතු | 50 | ඉදිකිරීම් හා ඉංජිනේරු | 357 |
| බැංකු කටයුතු | 101 | අධ්‍යාපන | 372 |
| රක්ෂණ කටයුතු | 123 | උසස් අධ්‍යාපන | 385 |
| ජාතික ආරක්ෂාව | 130 | නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන | 408 |
| අධිකරණ හා බන්ධනාගාර කටයුතු | 141 | රාජ්‍ය පරිපාලන | 415 |
| සෞඛ්‍යය | 150 | වැවිලි අංශය | 447 |
| දේශීය වෛද්‍ය | 179 | ජල සම්පාදන හා ජලාපවාහන | 454 |
| සන්නිවේදන හා මාධ්‍යය | 187 | කර්මාන්ත හා නිෂ්පාදන කටයුතු | 467 |
| විදේශ කටයුතු | 196 | ධීවර කටයුතු | 477 |
| විදේශ රැකියා | 199 | පරිසර | 483 |
| සංචාරක | 208 | වනාන්තර හා වනජීවී | 493 |
| ආයෝජන ප්‍රවර්ධන | 224 | කාන්තා හා ළමා කටයුතු | 501 |
| වෙළඳ හා වාණිජ | 229 | මහජන ආරක්ෂාව | 505 |
| ප්‍රජා ප්‍රවාහනය | 238 | කම්කරු | 511 |
| මහාමාර්ග | 246 | ක්‍රීඩා හා තරුණ කටයුතු | 523 |
| වරාය හා නාවික | 253 | භූ විද්‍යා හා පතල් කැණීම් | 535 |
| ගුවන් සේවා | 266 | ආපදා කළමනාකරණය | 541 |
| කෘෂිකර්මාන්තය | 275 | විදේශ ආධාර ව්‍යාපෘති | 549 |
| පශු සම්පත් | 291 | පළාත් සභා | 599 |
| ඉඩම් | 296 | පළාත් පාලන ආයතන | 639 |
| | | | |
| III කොටස - මූල්‍ය නොවන විගණන | | | |
| කාර්යසාධන විගණන අංශය | 672 | විශේෂ විමර්ශන අංශය | 690 |
| විශේෂ වාර්තා අංශය | 694 | | |




# 01

# අපගේ සංවිධානය

අපගේ සංවිධානය

# හැඳින්වීම

## වාර්තාවේ සංයුතිය

වාර්තාවේ පළමු කොටස ආයතනය හඳුනා ගැනීම, අධිකාර බලය, විගණනයේ ස්වාධීනත්වය, විගණන කාර්යභාරයන්, පාර්ලිමේන්තුවට සහාය වීම, අධිභාර පැනවීම, මහජන නියෝජන පරීක්ෂාව, සංවිධාන ව්‍යුහය, කාර්ය මණ්ඩල, පුහුණු කිරීම්, මූල්‍ය ප්‍රකාශන ආදී ලෙස වන ආයතනික තොරතුරුවලින් සමන්විත වේ.

වාර්තාවේ දෙවන කොටස මගින් ප්‍රධානතම ව්‍යවස්ථාපිත කාර්යභාරය වන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශේෂ වියදම් ඒකක, ව්‍යවස්ථාපිත ආයතන, රාජ්‍ය සමාගම්, ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් විදේශාධාර ව්‍යාපෘති, පළාත් සභා, පළාත් පාලන ආයතන ආදී වූ විගණන අස්තිත්වයන්හි වාර්ෂික විගණනවලදී නිරීක්ෂණය වූ ප්‍රධාන නිරීක්ෂණයන් මධ්‍යම රජයේ ආයතන, පළාත් සභා හා පළාත් පාලන ආයතන ආදී ලෙස වර්ගීකරණය කර දක්වා ඇත.

වාර්තාවේ තෙවන කොටස මගින් වාර්ෂික විගණනයන් නොවන කාර්යසාධන විගණනය, විශේෂ විගණනය, පරිසර විගණන, විශේෂ විමර්ශන ආදී වෙනත් විශේෂිත විගණන පිළිබඳ දක්වා ඇත. කෙසේ වුවද එම විගණනයන්ගෙන් අනාවරණය වූ ප්‍රධාන නිරීක්ෂණ II කොටසේ අදාළ විගණන ක්ෂේත්‍රය යටතේ නිරීක්ෂණ ලෙසට ඇතුළත් කර ඇත.

## ස්ථානගත වීම

ජාතික විගණන කාර්යාලය බත්තරමුල්ල, පොල්දූව පාර, නො.306/72 ස්ථානයේ පිහිටුවා ඇති අතර ප්‍රධානතම ශාඛා කාර්යාලය බොරැල්ල, කොටා ටෙරසය,නො 07 ස්ථානයේ පිහිටුවා ඇත . තවද බස්නාහිර පළාත තුළ රජයේ ආයතන පරිශ්‍ර තුළ පමණක් ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති කාර්යාල හා ශාඛා කාර්යාල 231 ක් මගින් විගණන කටයුතු සිදු කරනු ලබයි.

මීට අමතරව ඉතිරි පළාත් 8 තුළද පළාත් පාලන ආයතන විගණනය සඳහා සහ පළාත තුළ ක්‍රියාත්මක මධ්‍යම රජයේ ආයතනවල විගණන කටයුතු සඳහා ජ්‍යේෂ්ඨ සහකාර විගණකාධිපති කාර්යාල සහ විගණන ශාඛා 192 ක් ස්ථාපිත කර ඇත.

අපගේ වෙබ් පිටුව : http://www.auditorgeneral.gov.lk

විද්‍යුත් ලිපිනය: ag@auditorgeneral.gov.lk

ෆැක්ස් : 011 2887223

දුරකථන අංක : 011-2887028 – 34

# විගණන අධිකාරය

## රාජ්‍ය විගණනයේ ඉතිහාසය

ලංකාවේ රාජ්‍ය විගණනයේ ආරම්භය 1799 දක්වා අතීතයට දිව යයි. බ්‍රිතාන්‍ය ජාතිකයින් විසින් 1796 දී දිවයිනේ මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගැනීමෙන් පසු 1799 දී සිසිල් ස්මිත් මහතා ගණකාධිකාරි හා විගණකාධිපති ලෙස පත්කරනු ලැබ ඇති බවට ලේඛන මගින් තහවුරු වේ. ඉන්පසු 1931 දක්වා මෙම තනතුර විගණකාධිපති හා යටත් විජිත විගණක ලෙස වෙනස් වෙමින් පැවති අතර 1931 දී ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විගණකාධිපති ලෙස විගණන දෙපාර්තමේන්තු ප්‍රධානියා හඳුන්වා ඇත. ඉන්පසු විගණකාධිපති තනතුරු නාමය වෙනස් වී නොමැති අතර එතෙක් පැවති විගණකාධිපති දෙපාර්තමේන්තුව 2018 දී ජාතික විගණන කාර්යාලය ලෙස වෙනස් කරන ලදී.

1931 දී ඩොනමෝර් ව්‍යවස්ථාවට හා 1947 දී සෝල්බරි ව්‍යවස්ථාවට විගණකාධිපති කාර්යභාරය පිළිබඳ ඇතුළත් කර තිබී ඇති අතර 1972 දී ජනරජ ව්‍යවස්ථාව මගින් පළාත් පාලන ආයතන හා රාජ්‍ය සංස්ථා විගණනය පිළිබඳ ඇතුළත් කර ඇත.

## විගණනය සඳහා වර්තමාන අධිකාර බලය

### ➢ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව අනුව විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියලු දෙපාර්තමේන්තු, ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය, අමාත්‍ය මණ්ඩල ලේකම්වරයාගේ හා අමාත්‍ය කාර්යාල, අධිකරණ සේවා කොමිෂන් සභාව ඇතුළු ස්වාධීන කොමිෂන් සභා, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා, පාර්ලිමේන්තු සභාව හා පාර්ලිමේන්තු මහලේකම්, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා , අනෙකුත් රාජ්‍ය ව්‍යාපාර හා කොටස්වලින් සියයට 50 ට වැඩි අයිතිය රාජ්‍ය, සංස්ථා හෝ පලාත් පාලන ආයතන දරන සමාගම්ද, ඒවායේ ගිණුම්ද ඇතුළුව විගණනය කරනු ලැබිය යුත්තේය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව මගින්, පාර්ලිමේන්තුව විසින් අවශ්‍යතාවයක් ලෙස සම්මත කරන ලද මොනයම් හෝ නීතියකින් සඳහන් කරන කවර හෝ වෙනත් රාජකාරි ඉටුකිරීම විගණකාධිපතිවරයා විසින් කළ යුතු බවට දක්වා ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(4) ව්‍යවස්ථාව මගින් විගණකාධිපතිවරයාගේ කාර්ය්‍ය හා කර්තව්‍ය ඉටුකිරීමේදී හා පැවරීමේදී ඔහුගේ රාජකාරියට සහාය වීමට සුදුසුකම්ලත් විගණකවරුන්ගේ සේවය ලබා ගැනීමට විගණකාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය දී ඇත. තවද විගණනයට අදාළ වන තාක්ෂණ, වෘත්තීය හා විද්‍යාත්මක ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා විශේෂඥ සහාය ලබා ගැනීමට අවශ්‍ය විධිවිධානද එමගින් සලසා තිබේ.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(5) ව්‍යවස්ථාවෙන් විගණකාධිපතිවරයා ඔහුගේ රාජකාරි කටයුතු සිදු කිරීමේදී හා පැවරීමේදී විගණිත ආයතනවල සියලු පොත්පත් හා වාර්තා පරීක්ෂා කිරිම, ගබඩා හා වෙනත් දේපළවලට පිවිස විගණනයන් සිදු කිරීම හා අවශ්‍ය විය හැකි තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම් ලබා ගැනීමට විධිවිධාන සලසා ඇත.

## 2018 අංක 19 දරන ජාතික විගණන පනත

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ලබා දී ඇති රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ කාර්යභාරය නිශ්චිතව දැක්වීම ඇතුළු කාරණා පිළිබඳ විධිවිධාන සැලැස්වීම පිණිස ජාතික විගණන පනත සම්මත කරනු ලැබ ඇත. ඒ අනුව පනතේ 3(1) වගන්තිය මගින් විගණකාධිපතිවරයා විගණනය කරනු ලබන අස්ථිත්වයන්ට අදාළ විගණන විෂය පථය දක්වා ඇත.

ඒ අනුව ඒකාබද්ධ අරමුදල ලැබෙන සියලු ආදායම් හා ඒකාබද්ධ අරමුදලෙන් වන සියලු වියදම් විගණනය කරනු ලැබිය යුතු වේ.

එම විගණනයන් සිදු කිරීමේදී අදාළ ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා, තොරතුරු වෙත ප්‍රවේශ වීම හා කැඳවීම, තොරතුරු පිටපත් උද්‍ධෘත ලබා ගැනීම, යම් තොරතුරක් සන්තකයේ තබා ගෙන සිටින සේවයේ යෙදෙන හෝ එසේ නොවන අයකු කැඳවීම හා එම ලේඛන ලබා ගැනීම, මහේස්ත්‍රාත් අධිකරණයෙන් අවසර ලබා ගැනීමෙන් පසු සාවද්‍ය හෝ වංචා සහගත ගෙවීම් කරන ලද ආයතනයක ගිණුම්, ගනුදෙනු ආදිය පරීක්ෂා කල හැක.

### වෙනත් විශේෂිත අණපනත්

- රාජ්‍ය සංස්ථා සඳහා විගණන විධිවිධාන සලසන 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටස
- පළාත් සභා සඳහා විගණන විධිවිධාන සලසන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 වගන්තිය
- මහා නගර සභා සඳහා විගණන විධිවිධාන සලසන මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 219 වගන්තිය.
- නගර සභා සඳහා විගණන විධිවිධාන සලසන නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 181 වගන්තිය.
- ප්‍රාදේශීය සභා සඳහා විගණන විධිවිධාන සලසන 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 172 වගන්තිය.
- ගොවිජන සංවර්ධන සභා සඳහා විගණන විධිවිධාන සලසන 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන සභා පනතේ 58 වගන්තිය.
- ක්‍රීඩා සංගම් සඳහා විගණන විධිවිධාන සලසන 1993 අංක 47 දරන ක්‍රීඩා සංගම් පනතේ 9 වගන්තිය.

# විගණනයේ ස්වාධීනත්වය

## ස්වාධීනත්වය පිළිබඳ ජාත්‍යන්තර අවශ්‍යතා

එක්සත් ජාතීන්ගේ උත්තරීතර විගණන ආයතනයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (INTOSAI) 1977 දී අනුමත කළ "ලීමා ප්‍රකාශනය" මගින් ශිල්ප ක්‍රම හා වෘත්තීමය වශයෙන් රාජ්‍ය විගණනයේ ස්වාධීනත්වය පිළිබඳව මූලධර්ම කෙරෙහි අවධානය යොමු කර ඇත. වසර 30 කට පසුව උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ XIX සම්මේලනයේදී (2007 මැක්සිකෝව) "මැක්සිකෝ ප්‍රකාශනය" මගින් රාජ්‍ය අංශයේ මනා විගණනයක් සඳහා උත්තරීතර විගණන ආයතනයන්ගේ ස්වාධීනතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් පරිදි ප්‍රධාන අත්‍යවශ්‍ය අවශ්‍යතා 8 ක් හඳුනා ගෙන ඇත.

**1 ප්‍රතිපත්තිය** යෝග්‍ය වූ ද ඵලදායී වූ ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල / ව්‍යවස්ථාපිත / නෛතික කාර්ය රාමුවක් සහ එම කාර්ය රාමුව තුළ තත්ත්වාකාරයෙන් ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන පැවතීම.

උත්තරීතර විගණන ආයතන සතු ස්වාධීනත්වයේ ප්‍රමාණය සවිස්තරව විදහා දැක්වෙන නීති සම්පාදනය කිරීම අවශ්‍ය වේ.

**2 ප්‍රතිපත්තිය** උත්තරීතර විගණන ආයතනවල ප්‍රධානීන් සහ (විද්‍යායතනික ආයතනවල) සාමාජිකයන් ස්වකීය රාජකාරී සාමාන්‍ය වශයෙන් ඉටු කිරීමේදී ඔවුන්ගේ ධූරයේ ආරක්ෂාව සහ නෛතික පරිසරයේ ස්වාධීනත්වය.

**3 ප්‍රතිපත්තිය** උත්තරීතර විගණන ආයතනවල කාර්ය ඉටුකිරීමේදී ප්‍රමාණවත් තරම් පුළුල් වූ නීතිමය රාමුවක් (Mandate) සහ පූර්ණ අභිමතය පහත සඳහන් කාර්යයන් විගණනය කිරීමේ බලය, උත්තරීතර විගණන ආයතනවලට පැවරිය යුතුය.

- රාජ්‍ය මුදල්, සම්පත් හෝ වත්කම් ලබාගත් අයකු හෝ ප්‍රතිලාභියකු විසින් ඒවා ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව එහි නෛතික ස්වභාවය නොතකා විගණනය කිරීම.
- රජයට හෝ රජයේ ආයතනවලට ලැබිය යුතු ආදායම් එකතු කිරීම.
- රජයේ හෝ රජයේ ආයතනවල ගිණුම් පිළිබඳ නීත්‍යානුකූලභාවය සහ නියමානුකූලතාව
- මූල්‍ය කළමනාකරණයේ හා වාර්තා කිරීමේ ගුණාත්මකභාවය ; සහ
- රජයේ හෝ රාජ්‍ය ආයතනවල මෙහෙයුම් කටයුතු පිළිබඳ අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව සහ ඵලදායීභාවය.

නීති මඟින් එසේ කරන ලෙස නිශ්චිත වශයෙන් නියම කර ඇති අවස්ථාවලදී හැර, උත්තරීතර විගණන ආයතන විසින් රජයේ හෝ රජයේ ආයතනවල ප්‍රතිපත්ති

විගණනය නොකළ යුතු බැවින් ඔවුන්ගේ විගණනය, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ කාර්යයට පමණක් සීමා කළ යුතුය.

උත්තරීතර විගණන ආයතනවලට අදාළ වන අයුරින් ව්‍යවස්ථාදායකය පනවන නීතිවලට එම ආයතන ගරු කළ යුතු අතර, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකය හෝ විධායකය සිදු කරන විධානවලින් හෝ මැදිහත්වීම්වලින් එකී විගණන ආයතන නිදහස් වන්නේය;

- විගණන ගැටළු තෝරා ගැනීම;
- ඔවුන්ගේ විගණන සැලසුම් කිරීම, වැඩ සටහන්කරණය, වැඩසටහන් පැවැත්වීම, වාර්තා කිරීම සහ පසු විපරම් කටයුතු කිරීම;
- ස්වකීය කාර්යාලය සංවිධානය කිරීම සහ කළමනාකරණය;
- අනුමත කිරීම් ක්‍රියාත්මක කිරීම ස්වකීය නීතිමය රාමුවේ (Mandate) කොටසක් වන අවස්ථාවලදී ස්වකීය තීරණ බලාත්මක කිරීම;

උත්තරීතර විගණන ආයතන විසින් තමන් විගණනය කරනු ලබන සංවිධානවල කළමනාකාරීත්වය තුළ කිසිදු ආකාරයේ මැදිහත්වීමක් හෝ මැදිහත් වන බව පෙනී යන අයුරින් ක්‍රියාකිරීමක් හෝ නොකළ යුතුය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්, ප්‍රඥප්තිවලින් හෝ නීති සම්පාදනය මඟින් නියම කර ඇති ආකාරයට වාර්ෂික කාර්යසාධන වාර්තාවක් උත්තරීතර විගණන ආයතන විසින් ව්‍යවස්ථාදායකයට සහ අනෙකුත් රාජ්‍යආයතනවලට ඉදිරිපත් කළ යුතුය. එම ආයතන විසින් එකී වාර්තාව මහජනයා වෙත දැන ගැනීමට සැලැස්විය යුතුය.

**4 ප්‍රතිපත්තිය** සීමාවකින් තොරව තොරතුරු ලබා ගත හැකි වීම.

උත්තරීතර විගණන ආයතනය සතු ව්‍යවස්ථාපිත වගකීම් නිසියාකාරව ඉටුකිරීම සඳහා අවශ්‍ය සියලු ලේඛන සහ තොරතුරු කලට වේලාවට, නිවැරදිව, සෘජුවම සහ නිදහසේ ලබා ගැනීමට ප්‍රමාණවත් බලතල එම ආයතනය සතු විය යුතුය.

**5 ප්‍රතිපත්තිය** ස්වකීය වැඩ පිළිබඳව වාර්තා කිරීමට ඇති අයිතිය සහ බැඳීම.

ස්වකීය විගණන කාර්යයේ ප්‍රතිඵල වාර්තා කිරීම සම්බන්ධයෙන් උත්තරීතර විගණන ආයතනවලට සීමා කිරීම් නොකළ යුතුය. ස්වකීය විගණන කාර්ය ප්‍රතිඵල යටත් පිරිසෙයින් වර්ෂයකට එක් වරක්වත් වාර්තා කිරීමට ඔවුන්ට නීතියෙන් නියම කළ යුතුය.

**6 ප්‍රතිපත්තිය** විගණන වාර්තාවල අන්තර්ගතය සහ කාල නියමය තීරණය කිරීමේ නිදහස සහ ඒවා ප්‍රකාශයට පත්කොට බෙදාහැරීම.

- ස්වකීය විගණන වාර්තාවල අන්තර්ගතය තීරණය කිරීමේ නිදහස උත්තරීතර විගණන ආයතනවලට තිබේ.
- විගණනය කරනු ලබන ආයතනයේ අදහස් යෝග්‍ය පරිදි සැලකිල්ලට ගනිමින් ස්වකීය විගණන වාර්තාවල නිරීක්ෂණ සහ නිර්දේශ ඇතුළත් කිරීමේ නිදහස උත්තරීතර විගණන ආයතන සතු විය යුතුය.
- විගණන වාර්තාවල සඳහන් විය යුතු අවම අවශ්‍යතා නිශ්චිතව දැක්වීමත් යෝග්‍ය අවස්ථාවලදී විධිමත් විගණන මතයකට හෝ සහතික කිරීමකට නිශ්චිත කරුණු දැක්වීමත් නීති මගින් කළ යුතුය.
- සමස්තයක් වශයෙන් ව්‍යවස්ථාදායකය, එහි කොමිෂන් සභාවක් හෝ රජය විසින් විමර්ශනයක් නැතහොත් විගණනයක් සඳහා විශේෂ ඉල්ලීම් කළ විට උත්තරීතර විගණන ආයතනවලට ඒවා ඉටු කළ හැකිය.

**7 ප්‍රතිපත්තිය** උත්තරීතර විගණන ආයතනයේ නිර්දේශ පිළිබඳ ඵලදායී පසුවිපරම් යාන්ත්‍රණ පැවතීම.

- උත්තරීතර විගණන ආයතන ස්වකීය වාර්තාවල සඳහන් නිශ්චිත නිර්දේශ සමාලෝචනය කොට පසුවිපරම් කටයුතු කරමින් විශෝධන පියවරවල් ගැනීම සඳහා අදාළ වන පරිදි ව්‍යවස්ථාදායකය වෙත හෝ එහි කොමිෂන් සභාවක් වෙත හෝ විගණනය කරනු ලැබූ ආයතනයේ පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.
- උත්තරීතර විගණන ආයතනවල මෙන්ම අදාළ වන පරිදි ව්‍යවස්ථාදායකය, එහි කොමිෂන් සභාවක් හෝ විගණනය කරනු ලැබූ ආයතනයේ පාලක මණ්ඩලය යන මේවායේ නිරීක්ෂණ සහ නිර්දේශ නිසියාකාරව ක්‍රියාත්මක කරන බව තහවුරු කර ගැනීමට එම විගණන ආයතනවලට ස්වකීය වූ අභ්‍යන්තර පසු විපරම් ක්‍රමයක් පවතී.
- පසුවිපරම් කටයුතු සහ අනුමත කිරීම් සඳහා ස්වකීය වූ ව්‍යවස්ථාපිත බලතල උත්තරීතර විගණන ආයතන සතුව තිබියදී පවා එකී විගණන ආයතන ස්වකීය පසුවිපරම් වාර්තා අදාළ වන පරිදි ව්‍යවස්ථාදායකය වෙත හෝ එහි කොමිෂන් සභාවක් වෙත හෝ විගණනය කරනු ලැබූ ආයතනයේ පාලක මණ්ඩලය වෙත, සලකා බලා අවශ්‍ය පියවර ගැනීම සඳහා ඉදිරිපත් කරයි.

**8 ප්‍රතිපත්තිය** මූල්‍ය සහ කළමනාකරණ / පරිපාලන ස්වායත්තතාව සහ යෝග්‍ය මානව, භෞතික සහ මූල්‍ය සම්පත් පැවතීම.

- උත්තරීතර විගණන ආයතනවලට අවශ්‍ය කරන සහ සාධාරණ මානව, භෞතික සහ මූල්‍ය සම්පත් තිබිය යුතුය. මෙම සම්පත් ලබා ගැනීම පාලනය කිරීමට හෝ

මෙහෙයවීමට විධායකය ඉදිරිපත් නොවිය යුතුය. උත්තරීතර විගණන ආයතන ස්වකීය අයවැය ඔවුන් විසින්ම කළමනාකරණය කර ගෙන සුදුසු පරිදි වෙන් කර ගනිති.

- ව්‍යවස්ථාදායකය හෝ එහි එක් කොමිෂන් සභාවක් උත්තරීතර විගණන ආයතනවලට ස්වකීය නීතිමය රාමුවට (Mandate) අනුව කාර්යයන් සපුරාලීමට අවශ්‍ය කරන නිසි සම්පත් ඉඳුරාම ලබා දෙන බවට සහතික වීමේ වගකීම දැරිය යුතුය.
- උත්තරීතර විගණන ආයතනවලට සපයා ඇති සම්පත් ඔවුන්ගේ නීතිමය රාමුවට අනුව කාර්යයන් (Mandate) සපුරාලීමට පියවර ගැනීමට තරම් ප්‍රමාණවත් නොවේ නම් ඒ සම්බන්ධයෙන් කෙළින්ම ව්‍යවස්ථාදායකයට අභියාචනා කිරීමේ අයිතිය එකී විගණන ආයතන සතු වේ.

## අපගේ ස්වාධීනත්වය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව අනුව, විගණකාධිපති ධූරය ස්ථාපිත කර ඇති අතර සුදුසුකම්ලත් විගණකවරයෙකු 41(අ) වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව විගණකාධිපති ලෙස ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු බව තහවුරු කර ඇත. විගණකාධිපතිවරයා යථා පැවත්මෙන් සිටින තාක් ස්වකීය ධූරය දරන්නේය.

තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 ව්‍යවස්ථාව පරිදි විගණකාධිපති “රාජ්‍ය නිලධාරීන් නොවන විශේෂිත ලැයිස්තුවට” ඇතුළත් කර ඇත. මෙය තවදුරටත් විගණකාධිපතිගේ පරිපාලන ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා පනවන ලද ප්‍රතිපාදනයකි.

## විගණන සේවා කොමිෂන් සභාව

2022 නොවැම්බර් 4 දින ගැසට් කරන ලද 21 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව ව්‍යවස්ථාවේ 153(අ) සිට (ඌ) දක්වා වන වගන්ති මගින් විගණන සේවා කොමිෂන් සභාව පිහිටුවා ඇති අතර රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කිරීමත් සමඟ 2023 අප්‍රේල් 10 දින සිට විගණන සේවා කොමිෂන් සභාව බලාත්මක විය. විගණකාධිපතිවරයාගේ සභාපතිත්වයෙන් යුතුව ජාතික විගණන කාර්යාලයෙන් විශ්‍රාමික නියෝජ්‍ය විගණකාධිපති හෝ ඊට ඉහළ මට්ටමේ නිලධාරීන් දෙදෙනෙකුගෙන් හා විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ, අභියාචනාධිකරණ හෝ මහාධිකරණ විනිසුරුවරයෙකුගෙන් හා විශ්‍රාමික 1 ශ්‍රේණියේ පරිපාලන නිලධාරියෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත වේ.

153 වන ව්‍යවස්ථාව අනුව රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයින් පත් කිරීම, උසස් කිරීම ,මාරු කිරීම, විනය පාලනය කිරීමේ බලතල කොමිෂන් සභාව සතු වන අතර 153(ඇ) 2 (ආ) වගන්තිය අනුව ජාතික විගණන කාර්යාලයේ ඇස්තමේන්තු සකස් කිරීම කොමිෂන් සභාවේ කාර්යයක් වේ. එමගින් ජාතික විගණන කාර්යාලයේ මූල්‍යමය හා පරිපාලන ස්වාධීනත්වය ස්ථාපනය කර ඇත.

මේ අනුව, 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමඟ 2018 අංක 19 දරන ජාතික විගණන පනත සම්පූර්ණයෙන් බලාත්මක වීම මගින් උත්තරීතර විගණන ආයතනයක ස්වාධීනත්වය සඳහා පදනම් වූ උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ මූලික මූලධර්මයන් සමග අනුගතවීමට කටයුතු කර ඇත.

2018 වර්ෂය දක්වා විගණකාධිපතිවරයාට ඔහුගේ වියදම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය මත යැපීමට සිදු වූ අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙන් අනෙකුත් පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල්වල මෙන් ශ්‍රී ලංකාවේ විගණකාධිපතිවරයා, ඔහුගේ කාර්ය මණ්ඩලය ඇතුළත් ජාතික විගණන කාර්යාලය සඳහා වූ අයවැය, පාර්ලිමේන්තුවේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් සියුම් පරීක්ෂණයකට යටත්ව පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන අතර ඔහුගේ අයවැය පිළිබඳව විධායක පාලනයෙන් බැහැරව තීරණය කරනු ලැබේ. ඒ අනුව විගණකාධිපතිවරයාගේ අයවැය පාර්ලිමේන්තුව විසින් වෙනම තීරණය කිරීමට විධිවිධාන සලසා තිබීම මගින් විගණකාධිපතිවරයාගේ කාර්යභාරය ඉටුකිරීමේදී මූල්‍යමය ස්වාධීනත්වය තහවුරු කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ විගණකාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලය නොව, විගණකාධිපතිවරයා බැවින් වෙනත් රටවල මෙන්ම ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ කටයුතු සහ අධිකාරය විස්තරාත්මකව දක්වා තිබීමේ අවශ්‍යතාවය 2018 අංක 19 දරන ජාතික විගණන පනත මගින් 2018 අගෝස්තු 01 දින සිට සම්පූර්ණ කර ඇත.

මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් ඇතුළත ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව පිළියෙල කළ යුතු අතර කථානායකවරයා විසින් තීරණය කරනු ලබන දිනයකදී එය ඔහු වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ඇස්තමේන්තුව දින 10 ක් ඇතුළත මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ කථානායකවරයා ලබා ගෙන පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන ඇස්තමේන්තුව ජාතික අයවැයට ඇතුළත් කිරීම සඳහා කථානායකවරයා විසින් මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

# විගණන කාර්යභාරයන්

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ජාතික විගණන පනත

ජාතික විගණන කාර්යාලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය පිහිටුවීම සඳහාද, රාජ්‍ය මූල්‍ය පිළිබඳ විගණකාධිපතිවරයාගේ කාර්යභාරය නිශ්චිතව දැක්වීම සඳහාද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂාංගික කරුණු සඳහා විධිවිධාන 2018 අංක 19 දරන ජාතික විගණන පනතින් සලසා ඇත. ඒ අනුව විගණකාධිපතිවරයාගේ කාර්යභාරයන් පහත පරිදි වේ.

විගණකාධිපතිවරයා විසින්,

- ඒකාබද්ධ අරමුදල වෙත ලැබෙන සියලුම ආදායම් සහ ඒකාබද්ධ අරමුදලෙන් වන සියලු වියදම් විගණනය කරනු ලැබිය යුතුය.
- විගණනය කරනු ලබන ආස්ථිත්‍යයන්හි ගිණුම්වල වියපැහැදම් කරනු ලැබ ඇති බවට පෙන්නුම් කරනු ලබන මුදල්, ඒවා අදාළ කරගෙන ඇත්තා වූ හෝ අයකර ගෙන ඇත්තා වූ සේවා හෝ කාර්ය සඳහා නිත්‍යානුකූලව ලබා ගෙන සහ අදාළ කර ගෙන තිබේද යන්න පිළිබඳ විමසා දැනගත යුතුය.
- වියදම්, ඒවා පාලනය කරනු ලබන අධිකාරයට අනුකූල වන්නේද යන්න පිළිබඳ තීරණය කළ යුතුය.
- එක් එක් විගණනයේදී, ආදායම්, වියදම්, ගනුදෙනු හා සිද්ධීන් පිළිබඳව පරීක්ෂා කරනු ලැබිය යුතුය.
- ගිණුම්, මූල්‍ය, මූල්‍ය තත්ත්වය, රාජ්‍ය අරමුදල්වල මූල්‍ය පාලනය, විගණන ආයතනවල දේපළ පරීක්ෂාව සහ කාර්යසාධන විගණනයක්, පාරිසරික විගණනයක්, තාක්ෂණික විගණනයක් සහ වෙනත් විශේෂ විගණනයන් සිදුකළ යුතු බව.

## විගණන ක්‍රමවේදය

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ පිහිටුවන ලද විගණන ප්‍රමිති කමිටුව විසින් සකස් කර ඇති ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ජාතික විගණන කාර්යාලය විසින් විගණන කටයුතුවලදී අදාළ කරගනු ලැබේ. එම ප්‍රමිතවලට අනුව මූල්‍ය විගණනයක් සැලසුම් කිරීමේදී අවදානම පාදක කරගත් නියැදියක් හඳුනා ගන්නා අතර අවදානම හඳුනා ගැනීම සඳහා ප්‍රමිතවල සඳහන් මඟපෙන්වීම පරිදි නිර්ණායක ලෙස ගනුදෙනු, සිද්ධි හෝ ශේෂවල පවත්නා ප්‍රමාණාත්මක බව හා ගුණාත්මක වැදගත් බව සැලකිල්ලට ගනු ලබයි.

වාර්ෂික විගණනවලදී මූල්‍යමය ගනුදෙනුවලට පමණක් සීමා නොවී අස්ථිත්වයේ කාර්යසාධනය පිළිබඳවද පවත්නා සම්පත් ඇතුළු සීමාවන් තුළ විගණනයක් සිදු කරනු ලබයි. ඒ අනුව අස්ථිත්වයේ කාර්සාධනය පිළිබඳ සිදු කරන ලද නිරීක්ෂණ සුදුසු පරිදි අස්ථිත්වය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

## වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ වාර්තා පාර්ලිමේන්තුවට හා විගණිත අස්තිත්වයන් වෙත ඉදිරිපත් කිරීම

2018 අංක 19 දරන ජාතික විගණන පනත අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශ විගණනයෙන් පසු පහත සඳහන් පරිදි විගණන වාර්තා ඉදිරිපත් කල යුතු වේ.

- පනතේ 10 වන වගන්තිය අනුව එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු දක්වා ඇති කාල සීමාවන් තුළදී එක් එක් විගණනවල ප්‍රතිඵල පිළිබඳ පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කල යුතු බව

- පනතේ 11(1) වන වගන්තිය අනුව රාජ්‍ය සංස්ථා, රාජ්‍ය සමාගම් හැර යම් විගණනය කරනු ලබන ආස්තිත්යයක් විසින් ඉදිරිපත් කරන ලද යම් මූල්‍ය ප්‍රකාශයක් හෝ යම් ගිණුමක් සම්බන්ධයෙන්, විගණකාධිපතිවරයා විසින්, විගණනය කරනු ලබන ආස්තිත්‍යයට එක් එක් මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් පසු මාස පහක් තුළදී සම්පිණ්ඩන වාර්තාවක් නිකුත් කළ යුතු බව.

- පනතේ 12 වන වගන්තිය අනුව රාජ්‍ය සංස්ථාවක් වන හෝ රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් දරනු ලබන සමාගමක අනුමත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් අදාළ ලේඛන හා තොරතුරු විගණකාධිපතිවරයා වෙත ලැබී මාස තුනක් ඇතුළත, සිය වාර්ෂික වාර්තාවේ පළකිරීම සඳහා විගණකාධිපතිවරයා විසින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බව

- පනතේ 11(2) වන වගන්තිය අනුව අදාළ විගණනය කරනු ලබන ආස්තිත්‍යය පවරා ඇති අමාත්‍යවරයාට සහ මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයාට පිටපත් සහිතව එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් මාස පහක් ඇතුළත එක් එක් විගණනය කරනු ලබන ආස්තිත්‍යයන්හි පාලක මණ්ඩලයට විගණකාධිපතිවරයා විසින් වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බව

- පනතේ 14 වන වගන්තිය අනුව සෑම මුදල් වර්ෂ 3 ක් අවසන් වීමෙන් මාස 9ක් ඇතුළත පසු විගණනය කරනු ලබන අස්තිත්ව පිළිබඳ වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වේ.

ඒ අනුව 2024 වර්ෂය තුළදී ඉහත පරිදි වූ වාර්තා ඉදිරිපත් කිරීමට අදාළ විගණිත අස්තිත්ව ප්‍රමාණය පහත පරිදි වේ.

වගු අංකය 1.1 - 2024 වර්ෂය තුළදී වාර්තා ඉදිරිපත් කිරීමට අදාළ විගණිත අස්ථිත්ව ප්‍රමාණය

| සේවාලාභියා | ආයතන ගණන |
|---|---|
| අමාත්‍යාංශ | 29 |
| දෙපාර්තමේන්තු | 121 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 25 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 341 |
| රාජ්‍ය සංස්ථා, මණ්ඩල, අධිකාරි හා රජයට පවරාගත් ව්‍යාපාර | 222 |
| රාජ්‍ය සමාගම් | 117 |
| රාජ්‍ය බැංකු | 09 |
| ව්‍යවස්ථාපිත හා අනෙකුත් අරමුදල් | 67 |
| විදේශ අරමුදල් සම්පාදිත ව්‍යාපෘති | 113 |
| අනෙකුත් ස්වාධීන ආයතන | 11 |
| පළාත් සභා | 09 |
| පළාත් පාලන ආයතන | 341 |
| ගොවිජන සේවා මධ්‍යස්ථාන | 565 |
| ක්‍රීඩා සංගම් | 66 |
| පළාත් සභාවල අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකක | 273 |
| පළාත් සභා ප්‍රඥප්ති යටතේ පිහිටුවන ලද ආයතන | 70 |
| එකතුව | **2379** |

## වාර්ෂික මූල්‍ය ප්‍රකාශ නොවන විගණන

කාර්යසාධන විගණනය, විශේෂ විගණනය, පරිසර විගණනය හා විශේෂ විමර්ශන හා වෝහාරික විගණනය ආදී විගණන මගින් මූල්‍ය ප්‍රකාශ පදනම් කර නොගත් යම් විශේෂිත විෂය ක්ෂේත්‍රයක කාර්යසාධනය පිළිබඳ හෝ මතභේදයට තුඩු දෙන ගනුදෙනු හෝ සිදු වීමෙන් සම්බන්ධව ගැඹුරින් පරීක්ෂා කර වාර්තා කිරීම සිදු කෙරේ. වාර්තාවේ තෙවන කොටස මගින් මේ සම්බන්ධ විස්තර ඉදිරිපත් කර ඇත.

## පාර්ලිමේන්තුවට සහාය වීම

රාජ්‍ය ගිණුම් හා පොදු ව්‍යාපාර කාරක සභා අවස්ථා සඳහා සහභාගී වීම පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 හා 120 යටතේ ස්ථාපිත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA) හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) වශයෙන් හඳුන්වන පාර්ලිමේන්තුවේ කාරක සභා මගින් විගණකාධිපතිවරයා විසින් එක් එක් ආයතන පිළිබඳව පාර්ලිමේන්තුවේ සභාගත කරන වාර්තා පරීක්ෂා කරනු ලැබේ.

ස්ථාවර නියෝග 119 යටතේ පිහිටුවන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ (COPA) කාර්යය වනුයේ මහජන වියදම් සඳහා පාර්ලිමේන්තුව විසින් අමාත්‍යාංශ හා දෙපාර්තුමේන්තු වෙත ප්‍රතිපාදනය කරන ලද මුදල් භාවිතා කල ආකාරය පෙන්නුම් කරන ගිණුම්ද, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම වේ. පොදුවේ කිසියම් දෙපාර්තමේන්තුවක හෝ පළාත් පාලන ආයතනයක ගිණුම්, මූල්‍යායනයන්, මූල්‍ය පරිපාටි, කාර්යසාධනය සහ කළමනාකරණය පරීක්ෂා කිරීම හා ඉන් පැනනගින ඕනෑම කරුණක් පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට කලින් කලට වාර්තා කරනු ලැබේ.

ස්ථාවර නියෝග 120 යටතේ පිහිටුවන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE) කාර්යභාරය වනුයේ රාජ්‍ය සංස්ථා, මුළුමනින්ම හෝ කොටසක් ආණ්ඩුව විසින් අරමුදල් සපයනු ලබන ආයතනවල ගිණුම් සහ යම් ලිඛිත නීතියක් මගින් ආණ්ඩුවට පවරා ගන්නා ලද යම් ව්‍යාපාරයක් හෝ වෙනත් පැවරීමක් සම්බන්ධව පාර්ලිමේන්තුව ඉදිරියේ තබන ලද ගිණුම්, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම වේ. යම් රාජ්‍ය සංස්ථාවක හෝ යම් ලිඛිත නීතියක් මගින් ආණ්ඩුවට පවරන ලද ව්‍යාපාරයක හෝ වෙනත් පැවරීමක පරීක්ෂා කරන ලද ගිණුම් සම්බන්ධයෙන් අයවැය හා වාර්ෂික ඇස්තමේන්තු, මූල්‍ය, මූල්‍ය කාර්ය පරිපාටිය, කාර්යසාධනය හා සාමාන්‍ය කළමනාකරණය හා ඒ අනුව පැනනගින කවර හෝ කරුණක් පිළිබඳව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින්, කලින් කලට පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලබයි.

අවශ්‍ය යැයි හැඟී ගිය විටක කාරක සභාවේම සාමාජිකයන්ගෙන් සමන්විත අනුකාරක සභා පත් කිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට මෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවටද හැකියාව පවතින අතර, කාරක සභාවට මෙන්ම එහි අනුකාරක සභාවලටත් එයට අයත් කාර්යයන් ඉටුකිරීම පිණිස කවර හෝ පුද්ගලයෙකු කැඳවා ප්‍රශ්න කිරීමේ බලයත්, කවර හෝ ලිපියක්, පොතක්, ලේඛනයක් හෝ වෙනයම් ලියවිල්ලක් ගෙන්වා පරීක්ෂා කිරීමේ බලයත්, ගබඩාවලට සහ වෙනත් දේපළවලට පිවිසීමේ බලයත් පවතී.

පාර්ලිමේන්තුවේ පාලක පක්ෂය හා විරුද්ධ පක්ෂය විධිමත්ව නියෝජනය වන පරිදි තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීන් 16 දෙනෙකු බැගින් වන පරිදි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සමන්විත වේ. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යන සභා දෙකෙහි පරීක්ෂා කිරීම්වලින් අනතුරුව ඒවායේ නිර්දේශ විධායකය පිළිගනු ලැබුවේද යන්න පමණක් නොව එම නිර්දේශ ඵලදායීව හා සම්පූර්ණ ලෙස ක්‍රියාත්මක කෙරේද, වඩාත් වැදගත් ලෙස මූල්‍ය කාර්යක්ෂමතාවය හා සේවා ගුණාත්මක තත්ත්වය පිළිබඳ ධනාත්මක වෙනසක් සිදු කළේද යන්න පරීක්ෂා කිරීම සහ ක්‍රියාත්මක කිරීම් ක්‍රියාවලිය පිළිබඳව කමිටුවලට ආපසු වාර්තා කිරීමද විගණකාධිපතිවරයාගේ කාර්යභාරයට ඇතුළත් වේ.

විගණකාධිපතිවරයා සහ/හෝ ඔහුගේ නියෝජිතයින් සෘජුවම එම කමිටුවලට සහාය වේ. එහිදී සාකච්ඡාවට භාජනය වන ආයතනයට අදාළ විගණන වාර්තාවේ ඇතුළත් වැදගත් නිරීක්ෂණවල වර්තමාන තත්ත්වය පරීක්ෂා කර යාවත්කාලීන කරන ලද නිරීක්ෂණය සමඟ වර්තමාන කාර්යසාධනයට අදාළ කමිටුවේ සාකච්ඡා කිරීමට යෝග්‍ය නිරීක්ෂණ ඇතුළත් සාකච්ඡා සටහනක් පිළියෙල කර කමිටුව වෙත ඉදිරිපත් කරන අතර ඒ මත පදනම්ව කමිටු සභාපතිවරයා සාකච්ඡාව පවත්වා ගෙන යනු ලබයි.

සාකච්ඡාවට භාජන වීමට නියමිත විගණකාධිපතිවරයාගේ වාර්තාවේ ඇතුළත් කරුණුවලට අදාළ වර්තමාන තත්ත්වය සහ මෙහෙයුම් කාර්යසාධනය පිළිබඳ ලිඛිත තොරතුරු ඇතුළත් වාර්තාවක් සැපයීම සඳහා අදාළ රාජ්‍ය ආයතනයට සාමාන්‍යයෙන් මාසයක කාලයක් කමිටුව විසින් ලබා දේ. විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව ඉදිරිපත් කරන එම වාර්තාව පදනම් කරගෙන විගණකාධිපතිවරයා විසින් යථෝක්ත සාකච්ඡා සටහන පිළියෙල කරනු ලබන අතර පෙර පවත්වන ලද රැස්වීම්වලදී ලබා දී ඇති නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතියද පරීක්ෂා කර ඒ පිළබඳව තවදුරටත් සාකච්ඡා කළ යුතු කරුණුද එම සාකච්ඡා සටහනේ වෙනම ඇතුළත් කෙරේ.

කාරක සභා අවස්ථාවේදී විගණකාධිපතිවරයාගේ කාර්ය භාරය වනුයේ සාකච්ඡාවට බඳුන් වන කරුණු පිළිබඳව පසුබිම් තොරතුරු සැපයීම හා සලකා බලන විෂය පිළිබඳව අදහස් දැක්වීම මගින් කමිටුවට සහාය වීමයි. එහිදී අදාළ කරුණු පිළිබඳව මෙන්ම කමිටු සාමාජිකයන්ගෙන් පැන නගින ප්‍රශ්නවලට සහ සාකච්ඡාවට කැඳවූ ආයතනයේ නිලධාරීන් ඉදිරිපත් කරන කරුණු පිළිබඳව අදහස් දැක්වීම ද විගණකාධිපතිවරයා විසින් බොහෝදුරට සිදු කරනු ලබයි.

ඒ අනුව, 2024 වර්ෂය තුළදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ආයතන 35 ක් හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ආයතන 13 ක් පරීක්ෂා කිරීම සඳහා කැඳවා තිබුණු අතර එහිදී 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද විගණකාධිපති වාර්තා, විශේෂ විගණන වාර්තා හෝ කාර්යය සාධන වාර්තා සාකච්ඡා කරන ලද අතර එම කමිටු සභාවාර සඳහා විගණකාධිපතිවරයා සහාය වී ඇත.

## රාජ්‍ය ආයතනවල මූල්‍ය පාලනය හා කාර්යසාධනය ඇගයීම සඳහා වන ප්‍රශ්නාවලිය

ඊට අමතරව විශේෂයෙන් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන සහ ස්වාධීන කොමිෂන් සභාවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය ඇගයීම සඳහා තොරතුරු තාක්ෂණය පදනම් කරගත් ප්‍රශ්නමාලාවක් පිළියෙල කිරීම සඳහා ජාතික විගණන කාර්යාලයීය නිලධාරින් රාජ්‍ය ගිණුම් කාරක සභාවට සහාය වේ. තවද, ඒ එක් එක් ආයතන විසින් එම ප්‍රශ්ණවලට ලබා දුන් පිළිතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කර ඒ බව වාර්තා කිරීම මගින් අදාළ ඇගයීම් කටයුතු සාර්ථකව නිම කිරීමට වාර්ෂිකව විගණකාධිපතිවරයා තවදුරටත් එම කමිටුවට සහාය වේ.

## වෙනත් කාරක සභා සඳහා සහාය වීම

එමෙන්ම මුදල් පිළිබඳ කාරක සභාව, අයවැය කාරක සභා යනාදී විවිධ පාර්ලිමේන්තු කාරක සභා සඳහා විගණකාධිපතිවරයා නියෝජනය කරමින් නිලධාරීන් සහභාගී කරවීම යනාදී වශයෙන් විගණකාධිපතිවරයාගේ ව්‍යවස්ථාපිත කාර්යය භාරයට අමතරව නන් අයුරින් පාර්ලිමේන්තු කටයුතු සඳහා 2024 වර්ෂය තුළ විගණකාධිපතිවරයා සහාය වී ඇත.

සති 8 ක් ඇතුළත සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර පිළිබඳව වාර්තා කිරීම සඳහා මුදල් විෂයභාර අමාත්‍යවරයාට සහ ආයතන භාර අමාත්‍යවරයාට යොමු කරන පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා පිළිබඳව පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 114 ට අදාළව පාර්ලිමේන්තුව හමුවේ ඉදිරිපත් කරන ලද පිළිතුරු වාර්තා පරීක්ෂා කර නැවත පාර්ලිමේන්තුවට වාර්තා කිරීම වර්ෂය තුළ විගණකාධිපතිවරයා විසින් ඉටුකරන ලද තවත් සුවිශේෂී වූ කර්තව්‍යයක් වේ.

## විගණකාධිපතිරයා විසින් අධිභාර පැනවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනත සඳහා 2025 සැප්තැම්බර් 22 දිනැති 2025 අංක 19 දරන (සංශෝධිත) පනත බලාත්මක වීමත් සමඟම එහි 19 වගන්තිය පරිදි වෙනත් යම් ලිඛිත නීතියක අන්‍යාකාරයට විශේෂිතව විධිවිධාන සලස්වා ඇත්නම් මිස, යම් විගණනය කරනු ලබන අස්ථිත්‍යක යම් ගණුදෙනුවක් යම් ලිඛිත නීතියකට පටහැනිව සිදු කර ඇති බවටත් එම ගනුදෙනුව මගින් ඊට සම්බන්ධ තැනැත්තන්ගේ වංචාවක්, සාවධාන නොසැලකිල්ලක්, සාවද්‍ය පරිහරණයක් හෝ දූෂණයක් හේතුකොට ගෙන යම් ඌණතාවක් හෝ පාඩුවක් සිදු වී ඇති බවටත් විශ්වාස කිරීමට විගණකාධිපතිවරයාට සාධාරණ හේතු පවතින අවස්ථාවක දී, එම ගනුදෙනුවේදී සිදු වූ යම් ඌනතාවයක හෝ පාඩුවක වටිනාකම මත අධිභාරයක් පැනවීම සඳහා 21 වන වගන්තිය යටතේ පත් කරනු ලබන අධිභාර සමාලෝචන කමිටුව වෙත විගණකාධිපතිවරයා විසින් ස්වකීය නිර්දේශ සිදු කරනු ලැබිය යුතුය. විගණකාධිපතිවරයා විසින් සිදු කරනු ලබන නිර්දේශ මත අධිභාර සමාලෝචන කමිටුවේ තීරණය, ඌනතාවයක හෝ පාඩුවට වගකිව යුතු එක් එක් තැනැත්තන් වෙත අධිභාර සහතිකයක් නිකුත් කිරීම මගින් එම විගණනය කරනු ලබන ආස්ථිත්‍යයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා මගින් වාර්තා කළ යුතු වේ.

එලෙස වාර්තා කරනු ලබන වටිනාකම එම ඌනතාවයට හෝ පාඩුවට වගකිවයුතු තැනැත්තන්ගෙන් එක්ව හෝ වෙන් වෙන්ව අය කර ගැනීමේ වගකීම අදාළ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත පවරා ඇත.

සංශෝධිත විගණන පනතේ 21 වන වගන්තිය යටතේ පත් කරන ලද අධිභාර සමාලෝචන කමිටුව විසින්, විගණකාධිපතිවරයාගෙන් ලැබුණු නිර්දේශ සංඛ්‍යාව, පනවන ලද අධිභාර සංඛ්‍යාව, වෙනස්

කරන ලද කරන ලද නිර්දේශ සංඛ්‍යාව, පනවන ලද අධිභාර සහ සත්‍ය වශයෙන් අයකරනු ලැබූ අධිභාර පිළිබඳව මෙන්ම පැහැර හරින ලද විගණන අස්ථීත්‍ය පිළිබඳ විස්තර ඇතුලත් වාර්තාවක් 29 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ජාතික විගණන කාර්යාලයේ වෙබ් අඩවියේ අර්ධ වාර්ෂිකව පල කරනු ලැබිය යුතුය.

එසේම ජාතික විගණන පනත බලාත්මක වීමට ප්‍රථම සිට විශ්ව විද්‍යාල සහ පළාත් පාලන ආයතන වලට අදාළව අධිභාර පැනවීමට විගණකාධිපතිට වෙනත් ලිඛිත නීති මඟින් පවරා තිබූ බලතල මත එම අධිභාර ක්‍රියාවලිය විගණකාධිපතිගේ මැදිහත් වීම මත පෙර පරිදිම සිදුවෙමින් පවතී.

ඒ අනුව උක්ත සංශෝධිත පනත ප්‍රකාරව ඉදිරියේදී විගණකාධිපතිවරයා විසින් නිර්දේශ සහිතව අධිභාර ක්‍රියාවලිය අධිභාර සමාලෝචන කමිටුව මඟින් වඩාත් සක්‍රීයව ක්‍රියාත්මක වීම සඳහා වූ නෛතික ප්‍රතිපාදනයන් සලසා ඇත.

## පළාත් පාලන ආයතනවල අධිභාර අයකිරීම්

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන 341 ක් පවතින අතර මහා නගර සභා 28 ක්, නගර සභා 37 ක් හා ප්‍රාදේශීය සභා 276 ක් ඊට අයත් වේ. මෙම පළාත් පාලන ආයතන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) අනු ව්‍යවස්ථාව, 2018 අංක 19 දරන ජාතික විගණන පනත හා අදාළ ආඥාපනත් සහ පනත්වල විධිවිධාන පරිදි විගණකාධිපති විසින් විගණනය කරනු ලැබේ.

එකී ආඥාපනත් හා පනත්වලින්, නිතියට පටහැනි ගෙවීම් විෂයයන්, නොසැලකිල්ල හෝ විෂමාචාරය නිසා සිදු වූ පාඩු සහ ගිණුම්වල දැක්විය යුතු නමුත් දක්වා නැති විෂයයන් අධිභාර කිරීම සඳහා විගණකාධිපතිවරයා වෙත බලය පවරා ඇත. එකී බලය අනුව මහා නගර සභා ආඥා පනතේ 226 වගන්තිය සහ ප්‍රාදේශීය සභා පනතේ 172 වගන්තිවලින් විගණකාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 වර්ෂයේදී පාර්ශවකරුවන් 89 දෙනෙකු වෙත රු.මිලියන 17.10 ක අධිභාර නිවේදන නිකුත් කරන ලද අතර එම අධිභාර නිවේදන අතරින් පාර්ශවකරුවන් 40 දෙනෙකු වෙත ඉදිරිපත් කරන ලද රු.මිලියන 1.15 ක් වූ අධිභාර නිවේදන නිකුත් කරන ලදී.

ඉහත පරිදි නිකුත් කරන ලද අධිභාර නිවේදන අතරින් පාර්ශවකරුවන් 40 ක් සඳහා රු. මිලියන 1.15 ක් වටිනා අධිභාර සහතික ද 2024 වර්ෂය තුලදී නිකුත් කර ඇත.

## විශ්ව විද්‍යාල අධිභාර

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 107(6)(අ) සහ (ආ) වගන්ති වලින් විගණකාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 වර්ෂයේදී පාර්ශවකරුවන් 26 දෙනෙකු වෙත රු. මිලියන

16.54 ක අධිභාර නිවේදන නිකුත් කරන ලදි. ඉහත පරිදි නිකුත් කරන ලද අධිභාර නිවේදනයට අදාළව රු. මිලියන 5.6 ක් වූ මුදලක් අයවී තිබුණි.

## මහජන නියෝජන පරීක්ෂා කිරීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව විගණනය කරනු ලබන අස්ථිත්වයන්ට අදාළව ඕනෑම කාරණයක් පිළිබඳව සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි සහිතව මහජනතාව අතුරින් යම් අයෙකු විසින් විගණකාධිපතිවරයාට ලිඛිතව දැනුම් දීමක් කර තිබෙන විට ඒ පිළිබඳව පරීක්ෂා කළ හැකි අතර, ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුය.

ජාතික විගණන කාර්යාලය වෙත මහජනතාව පෞද්ගලිකව හෝ මහජන නියෝජිතයන් හා විවිධ සංවිධාන හරහා ලැබෙන ලිඛිත නියෝජන සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා කාර්යාලය තුළ වෙනම ඒකකයක් ස්ථාපනය කර ඇත. එම ඒකකය මගින් ආයතනයට ලැබෙන නියෝජන ලියාපදිංචි කර වැඩිදුර පරීක්ෂා කිරීම සඳහා එහි විශේෂ විමර්ෂන හා වෝහාරික විගණන ඒකකයට සහ / හෝ විවිධ විගණිත ආයතන වල පිහිටුවා තිබෙන විගණන ශාඛාවලට හෝ ප්‍රාදේශීයව පිහිටුවා තිබෙන විමර්ශන ඒකක වලට එම තොරතුරු ප්‍රේෂණය කරනු ලබයි. ප්‍රේෂණය කරන එම තොරතුරු පාදක කරගෙන පවත්වනු ලබන විගණනයන්ගෙන් මතුකර ගනු ලබන නිරීක්ෂණ ඒවායේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක භාවය සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව අදාළ විගණන අස්ථිත්වය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන විගණකාධිපති වාර්තාවලට ඇතුළත් කිරීමට හෝ විශේෂ වාර්තා / කාර්ය සාධන වාර්තා මගින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට හෝ ජාතික විගණන ආයතනය කටයුතු කරනු ලබයි. කෙසේ වෙතත් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 09 වගන්තියෙහි පවත්නා සීමාකාරී විධිවිධාන පිළිබඳ අවධානය යොමුකර එම විගණනයන්ගේ ප්‍රතිඵල සෘජුව අදාළ නියෝජනයන් ඉදිරිපත් කරනු ලැබූ පාර්ශවයන් වෙත දැනුම් දෙනු නොලැබේ. එහෙත් නිර්නාමික නියෝජන හැරුණු විට අනෙකුත් නියෝජන සම්බන්ධයෙන් එය ලද බව හා ඒවා පරීක්ෂා කර සුදුසු පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට කටයුතු කරනු ලබන බව ඒවා එවන ලද පාර්ශවයන් වෙත දන්වා යවනු ලැබේ.

2024 වර්ෂයේදී ජාතික විගණන කාර්යාලය වෙත මහජන නියෝජනයන් 2686 ක් ලැබී තිබුණු අතර එම නියෝජනයන්ගෙන් 2156 ක් රජයේ හෝ රාජ්‍ය ආයතන වල පරිපාලනමය කරුණු සම්බන්ධයෙන් වූ අතර 114 ක් විවිධ පාර්ශවයන්ගෙන් දුක්ගැනවිලි සම්බන්ධයෙන් විය. තවත් නියෝජන 1318 ක් ආයතනික වංචා හා දූෂණ සම්බන්ධයෙන් වූ අතර 26 ක් විවිධ පාර්ශවයන්ගේ පෞද්ගලික කරුණු සම්බන්ධයෙන් විය. එසේම මෙම නියෝජනයන් අතුරින් 945 ක් යොමු කරන්නාගේ අනන්‍යතාවය සහිතව ඉදිරිපත් කර තිබුණු අතර, නියෝජනයන් 1,741 ක් නිර්නාමිකව ඉදිරිපත් කර තිබුණි. මේ අතුරින් වැඩි ප්‍රමාණයක් ප්‍රමාණවත් හෝ යම් තරමක හෝ සාක්ෂි සහිතව ඉදිරිපත් කර තිබුණි. සාක්ෂි කිසිවක් නොමැතිව වුවද ලැබෙන පැමිණිලි ද පරීක්ෂාවන්ට ලක් කරනු ලැබේ. වැඩිදුර විමර්ශන කටයුතු සඳහා යොමුකරන ලද ලිඛිත නියොජිතයන් පිළිබඳ ආංශික වර්ගීකරණයක් සිදුකිරිමේදී ප්‍රධාන වශයෙන් අධ්‍යාපන ක්ෂේත්‍ර ස ඳහා 413 ක් ද, පළාත් සභා සඳහා

109 ක් ද, පළාත් පාලන අංශය සඳහා 190 ක් ද, සෞඛ්‍ය ක්ෂේත්‍ර සඳහා නියෝජනයන් 294 ක් ද ප්‍රාදේශිය ලේකම් කාර්යාල සම්බන්ධයෙන් නියෝජනයන් 282 ක් ද කෘෂිකර්ම, මාර්ග, උසස් අධ්‍යාපන, ජලසම්පාදන හා සනීපාරක්ෂක, ඉඩම්, වැවිලි, බැංකු , ආරක්ෂක හා බලශක්ති යන ක්ෂේත්‍ර සඳහා පිළිවෙලින් 116 ක් 88 ක් 82 ක් 59 ක් 54 ක් ද 49 ක් 36 ක් 33 ක් හා 36 ක් ද වශයෙන් නියෝජනයන් ලැබී තිබුණු අතර රජයේ විවිධ ආයතන සඳහා තවත් නියෝජනයන් 530 ක් ජාතික විගණන කාර්යාලය වෙත ලැබී තිබුණි.

## නීති අංශය

ජාතික විගණන කාර්යාලයේ නෛතික කටයුතුවලදී විගණකාධිපතිතුමා සහ ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන් පාර්ශවකරුවන් කරමින් පවරන සහ පවරා ඇති නඩු කටයුතුවලදී නීතිපති දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කිරීමද, විගණන කටයුතුවලදී අවශ්‍ය නෛතික උපදෙස් ඇතුළු සහය ලබා දීමද 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළබඳ පනත ප්‍රකාරව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළබඳ කොමිෂන් සභාව ඉදිරියේ ගොනු කරනු ලැබූ අභියාචනා සඳහා නෛතික සහය ලබා දීමද මෙම අංශය මගින් සිදු කරයි.

ඒ අනුව, 2024 වර්ෂයේදී ජාතික විගණන කාර්යාලයට අදාළ නඩු කටයුතු සඳහා සහය දැක්වීම ලෙස අධිකරණය වෙත යොමු කළ නඩු 34ක් වෙනුවෙන්ද අනෙකුත් කරුණු සම්බන්ධයෙන් විවිධ පාර්ශවයන් වෙත නෛතික උපදෙස් හා නෛතික සහය දැක්වීම් 81ක් ද තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරියේ ගොනු කරනු ලැබූ අභියාචනා 09ක් සඳහාද නෛතික සහය ලබා දීමද සිදු කර ඇත.

# අපගේ සංවිධාන සටහන

## වගු අංක 1.2 - සංවිධාන සටහන

**Organizational Structure of the Audit Staff of NAOSL (2025)**

A U D I T O R   G E N E R A L

| Senior Deputy Auditors General | Deputy Auditors General | Senior Assistant Auditors General – Sector | Code | Assistant Auditors General | Superintendents of Audit | Audit Officers |
|---|---|---|---|---|---|---|
| **Central Government Audit & Assurance** | Defence, Judicial, Law and Order (DJL) | Defence | (DEF) | | | |
| | | Judicial, Law & Order | (JLO) | | | |
| | | Disaster Management | (DMG) | | | |
| | | Parliamentary Affairs and Independent Commissions | (PIC) | | | |
| | Transpotation, Avaiation, Ports and Shipping (TAP) | Community Transpotation | (COT) | | | |
| | | Port & Shipping | (PAS) | | | |
| | | Aviation | (AAV) | | | |
| | | Communication and Media | (CAM) | | | |
| | Power and Energy (POE) | Power | (PWR) | | | |
| | | Energy | (ENR) | | | |
| | Foreign Funded Projects, Sports and Youth Affairs **(PSY)** | Sports and Youth Affairs | (SYA) | | | |
| | Special Audit Assignments **(SPA)** | Performance, Environmental & Citizen Participatory Audits | (PEE) | | | |
| | | | (SPC) | | | |
| | | Public Representation Division | | | | |
| | Health, Wellfare and Social Security **(HWS)** | Medical Supplies | (MSU) | | | |
| | | Teaching Hospitals | (THO) | | | |
| | | Medical Administration | (MED) | | | |
| | | Labour and Social Welfare | (LSW) | | | |
| | Irrigation, Water Resources & Mining **(WIM)** | Water & Sanitation | (WAS) | | | |
| | | Irrigation, Water Resources & Mining | (IWM) | | | |
| | | Training, Research & Development | (TRD) | | | |
| | | Quality Assurance | (QUA) | | | |
| | | Parliament Reporting & Coordination | (PRC) | | | |
| | | LEGAL DIVISION | (LEG) | | | |
| | | IT Audits | (ITA) | | | |
| **Central Government Audit & Assurance (CGAA-2)** | | Taxation & Procurement Audits | (TAX) | | | |
| | | Banking | (BAN) | | | |
| | | Treasury & Public Debt | (TPD) | | | |
| | | Public Revenue | (PUR) | | | |
| | | Insurance & Finance | (INF) | | | |
| | Industries, Trade & Commerce, Public Administration and Foreign Affairs **(ITP)** | Industries and Manufacruring | (IMT) | | | |
| | | Public Administration & Foreign Afffairs | (PAF) | | | |
| | | Trade and Commerce | (TAC) | | | |
| | Agriculture, Plantation, Fisharies and Irrigation **(APF)** | Fisheries & Liverstock | (FLS) | | | |
| | | Agriculture & Related Industries | (ARI) | | | |
| | | Plantation & Land | (PAL) | | | |
| | Tourism, Investment Promotion, Wild Life, Forest, Culture and Arts **(TWC)** | Cultural Affairs and Arts | (CAA) | | | |
| | | Forest, Wild Life and Environment | (FWL) | | | |
| | | Tourism & Investment Promotion | (TIP) | | | |
| | Education and Vocational Training **(EVT)** | Education | (EDU) | | | |
| | | Vocational Training | (VOT) | | | |
| | | Higher Education | (HED) | | | |
| | Road Construction, Housing and Urban Development **(RCH)** | Road & Highways | (RAH) | | | |
| | | Construction & Engineering | (CAE) | | | |
| | | Housing & Urban Development | (HUD) | | | |
| **Zonal Audit & Assurance (ZOAA)** | Local Government Authorities **(LPS)** | Local Authorities of Central Province | (CPLG) | | | |
| | | Local Authorities of Western Province | (WPLG) | | | |
| | | Local Authorities of Sabaragamuwa Province | (SGLG) | | | |
| | | Local Authorities of North Central Province | (NCLG) | | | |
| | | Local Authorities of Northern Province | (NPLG) | | | |
| | | Local Authorities of Southern Province | (SPLG) | | | |
| | | Local Authorities of Estern Province | (EPLG) | | | |
| | | Local Authorities of North Western Province | (NWLG) | | | |
| | | Local Authorities of Uva Province | (UPLG) | | | |
| | Provincial Councils Institutions **(PCI)** | Institutions of the Central Province | (CPPC) | | | |
| | | Institutions of the Western Province | (WPPC) | | | |
| | | Institutions of the Sabaragamuwa Province | (SGPC) | | | |
| | | Institutions of the North Central Province | (NCPC) | | | |
| | | Institutions of the Northern Province | (NPPC) | | | |
| | | Institutions of the Southern Province | (SPPC) | | | |
| | | Institutions of the Estern Province | (EPPC) | | | |
| | | Institutions of the North Western Province | (NWPC) | | | |
| | | Institutions of the Uva Province | (UPPC) | | | |
| | Utilization of Central Government Allocation in Provincial Level / Administration **(CGW / ADM)** | Central Govt. Allocation and institutions in Central Province | (CPCG) | | | |
| | | Central Govt. Allocation and institutions in Western Province | (WPCG) | | | |
| | | Central Govt. Allocation and institutions in Sabaragamuwa Province | (SGCG) | | | |
| | | Central Govt. Allocation and institutions in North Central Province | (NCCG) | | | |
| | | Central Govt. Allocation and institutions in Northern Province | (NPCG) | | | |
| | | Central Govt. Allocation and institutions in Southern Province | (SPCG) | | | |
| | | Central Govt. Allocation and institutions in Estern Province | (EPCG) | | | |
| | | Central Govt. Allocation and institutions in North Western Province | (NWCG) | | | |
| | | Central Govt. Allocation and institutions in Uva Province | (UPCG) | | | |
| | | Special Investigationand Forensic Audits | (SIF) | | | |
| | | Secretariat of the Auditor General & International Relations | (AGS) | | | |
| | | Training, Research and Development | (TRD) | | | |

ජාතික විගණන කාර්යාලයේ ප්‍රධානියා විගණකාධිපතිවරයා වන අතර කාර්යාලයේ මූල්‍යමය කටයුතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියෙකු ලෙසද කටයුතු කරනු ලබයි. ජාතික විගණන කාර්යාලයේ වර්තමාන සංවිධාන ව්‍යුහය මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති කාර්ය මණ්ඩලයට අනුකූලවන පරිදි එක් එක් මට්ටම්වලට ඇතුළත් කර ඇති නිශ්චිත නිලධාරීන් සංඛ්‍යාවකින් සැදුම්ලත් ධුරාවලි 5 කින් සමන්විත වේ.

පළමු මට්ටම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපතිවරුන් 03 දෙනෙකුගෙන් සමන්විත වේ. දෙවන මට්ටම නියෝජ්‍ය විගණකාධිපතිවරුන් 15 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් විසින් රාජ්‍ය විගණන කටයුතු පිළිබඳ ප්‍රතිපත්තිමය හා සමස්ථ රාජ්‍ය විගණනය අධීක්ෂණය කිරීම සිදු කරන ලබයි. නියෝජ්‍ය විගණකාධිපතිවරුන් යටතේ අංශ 72 ක් ස්ථාපිත කර ඇති අතර එම එක් එක් අංශය භාරව සිටින ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපතිවරු තෙවන මට්ටම නියෝජනය කරනු ලබයි. එම ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපතිවරුන්ගේ අධීක්ෂණය යටතේ රජයේ හා පළාත් සභාවල විගණන කටයුතුද සිදු කරනු ලැබේ. අංශ ප්‍රධානීන් වෙත පැවරෙන අංශයක ඇති විගණන "ශාඛා"වන්හි ප්‍රධානත්වය "ශාඛා ප්‍රධානී" ලෙස සහකාර විගණකාධිපතිවරයෙකු හෝ විගණන අධිකාරිවරයෙකු විසින් ඉටු කරනු ලබන අතර ඔහුට නිශ්චිත විගණන ආයතන සංඛ්‍යාවක් පවරා ඇත. ඔවුන් සිව්වන මට්ටමට අයත් වේ. ඒ අනුව නිශ්චිත ලෙස තම අධීක්ෂණයට ගැනෙන විගණන ශාඛා ක්‍රියාත්මක විය යුතු ආකාරය කළමනාකරණය කිරීම හා අධීක්ෂණය පිළිබඳ සම්පූර්ණ වගකීම අංශ ප්‍රධානීන්ට පැවරේ. ශාඛා ප්‍රධානීන් වෙත අනුයුක්ත කරනු ලැබ ඇති සහකාර විගණන අධිකාරීන් හා විගණන නිලධාරීන් කාර්යක්ෂම හා ඵලදායිව සේවයේ යොදවා ඔවුන් වෙත පවරා ඇති රාජ්‍ය ආයතනවල විගණනයන් ක්‍රියාත්මක කිරීම ශාඛා ප්‍රධානීන් විසින් සිදු කරනු ලබයි. ඒ අනුව ශාඛා ප්‍රධානීන්ට සහයවන එම නිලධාරීන් පස්වන මට්ටමට අයත් වේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති, ව්‍යවස්ථාපිත සහ වෙනත් නීතිමය අවශ්‍යතාවන්ට හා පරිචයන්ට අනුකූල වන පරිදි පරීක්ෂණ, නිරීක්ෂණ සහ ක්ෂේත්‍ර රාජකාරී සිය අනුමත වැඩසටහන්වලට අනුකූල වන පරිදි ඉටු කිරීම මගින් ඔවුන් වෙත පවරා ඇති රාජ්‍ය ආයතනවල විගණනය ක්‍රියාත්මක කරමින් සිය ශාඛා ප්‍රධානීන්ට සහය වීම විගණන නිලධාරීන් විසින් සිදු කරනු ලබයි. ඉහත සඳහන් තෙවන මට්ටමට අයත්වන අංශ 72 ක අංශ ප්‍රධානීන්ගෙන් අංශ ප්‍රධානීන් 27 දෙනෙකු දිස්ත්‍රික් මට්ටමින් ප්‍රාදේශීය විගණනය භාරව කටයුතු කරනු ලබන අතර ඔවුන්ගේ අධීක්ෂණය නියෝජ්‍ය විගණකාධිපතිවරුන් තිදෙනෙකු විසින් ඉටුකරනු ලැබේ.

ජාතික විගණන කාර්යාලයේ සමස්ථ මූල්‍ය හා පරිපාලන කටයුතු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපතිවරයෙකුගේ අධීක්ෂණය යටතේ පරිපාලන කටයුතු අධ්‍යක්ෂ (පාලන) විසින් ආයතන ශාඛාවෙන්ද, මූල්‍ය කටයුතු ප්‍රධාන ගණකාධිකාරී විසින් ගිණුම් අංශයෙන්ද සිදු කරනු ලබයි.

මුදල් රෙගුලාසි 133 සඳහන් පරමාර්ථ ඉටු කිරීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරී යටතේ සංවර්ධන නිලධාරීන්ගෙන් සමන්විත අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක වන අතර, ඔහු සෘජුව විගණකාධිපතිවරයාගේ මෙහෙයවීමට හා අධීක්ෂණය යටතේ කටයුතු කරනු ලැබේ.

**වගු අංක 1.3 - අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය.**

**2024 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දිනට ජාතික විගණන කාර්යාලයේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර**

| | තනතුර | 2024.01.01 දිනට සේවක සංඛ්‍යාව | | | 2024.12.31 දිනට සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|
| | | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
| 1. | විගණකාධිපති | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 2. | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති | 3 | 0 | 3 | 3 | 2 | 1 |
| 3. | නියෝජ්‍ය විගණකාධිපති | 15 | 12 | 3 | 15 | 13 | 2 |
| 4. | අධ්‍යක්ෂ (පාලන) | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 5. | ප්‍රධාන ගණකාධිකාරි | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 6. | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 7. | ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති | 72 | 43 | 29 | 72 | 60 | 12 |
| 8. | සහකාර විගණකාධිපති | 455 | 15 | 215 | 455 | 89 | 60 |
| 9. | විගණන අධිකාරි | | 255 | | | 306 | |
| 10. | සහකාර අධ්‍යක්ෂ (පාලන) | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 11. | ගණකාධිකාරි | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 12. | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 1 | 0 | 1 | 1 | 0 | 1 |
| 13. | නීති නිලධාරි | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 14. | පරිපාලන නිලධාරි {ක.සේ.නි.(අධි)} | 3 | 2 | 1 | 3 | 2 | 1 |
| 15. | තාක්ෂණ නිලධාරි විශේෂ | 1 | 0 | 1 | 1 | 0 | 1 |
| 16. | සහකාර විගණන අධිකාරි | 360 | 188 | 172 | 360 | 117 | 243 |
| 17. | විගණන නිලධාරි | 1090 | 752 | 338 | 1090 | 555 | 535 |
| 18. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | 3 | 2 | 1 | 3 | 1 | 2 |
| 19. | භාෂා පරිවර්තක | 10 | 8 | 2 | 10 | 7 | 3 |
| 20. | සංවර්ධන නිලධාරි | 73 | 62 | 11 | 73 | 69 | 4 |
| 21. | පුස්තකාලාධිපති | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 22. | තාක්ෂණ නිලධාරි - I | 1 | 0 | 1 | 1 | 0 | 1 |
| 23. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 6 | 1 | 5 | 6 | 2 | 4 |
| 24. | කළමනාකරණ සේවා නිලධාරි | 121 | 119 | 2 | 121 | 109 | 12 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 25. | වාර්තා සැකසුම්කරු * | 41 | 38 | - | 41 | 36 | - |
| 26. | ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | 1 | 0 | 1 | 1 | 0 | 1 |
| 27. | රියදුරු | 48 | 46 | 2 | 48 | 45 | 3 |
| 28. | සංචාරක බංගලා භාරකරු | 13 | 6 | 7 | 13 | 6 | 7 |
| 29. | විදුලි කාර්මික | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 30. | ජලනල කාර්මික | 1 | 1 | 0 | 1 | 1 | 0 |
| 31. | කා.සේ.සේ | 148 | 144 | 4 | 148 | 144 | 4 |
| 32. | දෙපාර්තමේන්තු කම්කරු ** | 2 | 1 | - | 2 | 1 | - |
| | එකතුව | 2477 | 1674 | 799 | 2477 | 1574 | 897 |

* මෙම තනතුර දැනට සිටින දෙපාර්තමේන්තුගත නිලධාරියාට පෞද්ගලික වන සේ පවත්වා ගැනීමෙන් පසු අහෝසි වීමට යටත්වේ.

** මෙම තනතුර දැනට සිටින දෙපාර්තමේන්තුගත නිලධාරියාට පෞද්ගලික වන සේ පවත්වා ගැනීමෙන් පසු අහෝසි වීමට යටත්වේ.

## කාර්ය මණ්ඩල පුහුණුව

රාජ්‍ය සම්පත් ආර්ථිකව, කාර්යක්ෂමව හා ඵලදායි ලෙස භාවිතා කිරීම ශක්තිමත් කිරීමට අවශ්‍ය දායකත්වය හා මගපෙන්වීම ලබාදීම තුළින් ශ්‍රී ලාංකික ජාතියට ගුණාත්මක හා විශ්වාසනීය රාජ්‍ය සේවාවක් සැලසීම තහවුරු කිරීම පිණිස ජාතික විගණන කාර්යාලය විසින් රාජ්‍ය ආයතනවල මූල්‍ය හා කාර්යසාධන කාර්යභාරයන් ඉටුකිරීම පිළිබඳ ගණන්දීමේ වගකීම නිවැරදි ලෙස ඉටුකර තිබේද යන්න පරීක්ෂා කර පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලබයි.

මෙම ව්‍යවස්ථාපිත කාර්යභාරය ඉටු කිරීම උදෙසා විගණන නිලධාරීන් 1143 කින් හා සහයක සේවාවන්වලට අයත් නිලධාරීන් 431 කින් සමන්විත කාර්යමණ්ඩලයක දායකත්වය වර්තමානයේ ජාතික විගණන කාර්යාලය විසින් ලබා ගනී.

එකී ව්‍යවස්ථාපිත කාර්යභාරය කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීම පිණිස ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලය පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ වර්තමානයට සරිලන ලෙස දැනුමෙන් හා කුසලතාවයෙන් සන්නද්ධ කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

- දැනුම හා තාක්ෂණික කුසලතා සංවර්ධනය
- කාර්යක්ෂමතාවය සහ කාර්යසාධනය ඉහළ නැංවීම
- කළමණාකරන හැකියාවන් වර්ධනය
- රාජකාරී ඉටුකිරීමෙහිලා අවශ්‍ය වන දැනුම, මෙවලම් හා ශිල්පීය ඥානය ලබාදීම
- මූල්‍යමය සහ සේවා නීති සම්බන්ධ දැනුම ලබාදීම
- කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීම
- යහපත් ආකල්ප වර්ධනය කිරීම

එම අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අපේක්ෂාවෙන් යුක්තව ජාතික විගණන කාර්යාලයේ සෑම නිලධාරියෙකු විසින්ම අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය (Continuous Professional Development – CPD) සඳහා වර්ෂයකට පැය 100 කට නොඅඩු න්‍යායාත්මක හා ප්‍රායෝගික වශයෙන් දේශීය හෝ විදේශීය පුහුණු පාඨමාලා සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය ජාතික විගණන කාර්යාලය විසින් අවධාරණය කර තිබේ.

නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ලබාදිය යුතු බවට හඳුනාගත් පහත ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් සම්පාදනය කිරීමේ කාර්යභාරය ජාතික විගණන කාර්යාලය සිදු කරමින් පවතී.

- මූල්‍ය විගණනය
- විමර්ශන විගණනය
- කාර්යසාධන විගණනය
- පරිසර විගණනය
- වෝහාරික විගණනය
- ප්‍රසම්පාදන හා ඉදිකිරීම් විගණනය
- ව්‍යාපෘති විගණනය
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා විගණන ප්‍රමිත
- බදුකරණය
- විගණන පනතේ 4 සහ 5 වගන්ති අවශ්‍යතා
- පලාත් පාලන ආයතන ගිණුම් හා විගණනය
- අධිභාර ක්‍රියාවලිය
- විගණන වාර්තාකරණය
- පරිගණක හැකියාව සංවර්ධනය
- භාෂාමය හැකියාවන් සංවර්ධනය
- දත්ත විශ්ලේෂණය

ඒ අනුව නිලධාරීන්ට ඔවුන්ගේ රාජකාරි වෘත්තීය මට්ටමින් සිදු කිරීමට අවශ්‍ය දක්ෂතාවයන් අත්පත් කරගත හැකි පරිදි දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් ජාතික විගණන කාර්යාලයේ පුහුණු අංශය විසින් සංවිධානය කිරීමත්, ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය සහාය ලබා දෙමින් ඔවුන්ව දිරිගැන්වීමටත් කටයුතු කරනු ලැබේ.

එමෙන්ම 2023 සිට 2026 දක්වා යුරෝපීය සංගමයේ (EU) අරමුදල් දායකත්වයෙන් ක්‍රියාත්මක රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියේ (PFMSP) සංරචකය 2 යටතේ අපේක්ෂිත ජාතික විගණන කාර්යාලයේ ආයතනික ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා වන දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමත් ඒ සඳහා අවශ්‍ය සහාය ලබා දීමත් සිදුකරනු ලැබේ

සම්පත් දායකයන් ලෙස ජාතික විගණන කාර්යාලයේ සේවයේ යෙදී සිටින සුදුසුකම් සහිත දක්ෂ නිලධාරීන්ගේ සහය මෙන්ම අවශ්‍ය පරිදි බාහිර දේශකවරුන්ගේ සහායද ලබා ගැනීමට කටයුතු කරන අතර පුහුණු වැඩසටහන් සඳහා දේශන, සාකච්ඡා, ප්‍රායෝගික පුහුණුව හා ක්ෂේත්‍ර චාරිකා ආදිය යොදා ගැනීම තුළින් අදාල පුහුණු අවශ්‍යතාවයන් සපුරා ගැනීම සිදු කරණු ලැබේ.

## දේශීය පුහුණු වැඩසටහන්

ඉහත අරමුණු සපුරාගැනීම උදෙසා 2024 වර්ෂයේ ජාතික විගණන කාර්යාලයේ පුහුණු අංශය මගින් විගණන නිලධාරීන් සඳහා ඉහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මාතෘකා 6 ක් යටතේ පුහුණු වැඩසටහන් 22 ක් පවත්වා ඇති අතර විගණන නොවන කාර්යමණ්ඩලයේ නිලධාරීන් සඳහාද පුහුණු පහසුකම් ලබා දී තිබේ.

## විදේශීය පුහුණු වැඩසටහන්

සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 13 දෙනෙකු විදේශීය පුහුණු වැඩසටහන් හා විවිධ වැඩමුළු සඳහා සහභාගී කරවා ඇත.

සමාලෝචිත වර්ෂයේදී ජාතික විගණන කාර්යාලයේ නිලධාරීන් සඳහා ඉහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පැවැත්වූ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් හා වැඩමුළු පිළිබඳව විස්තර පහත වගුවේ දක්වා ඇත.

**වගු අංක 1.4 - දේශීය විදේශීය පුහුණු වැඩසටහන්**

| | වැඩසටහන් විස්තරය | වැඩසටහන් ගණන | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව | පුහුණු පැය ගණන |
|---|---|---|---|---|
| | **දේශීය පුහුණුවැඩසටහන්** | | | |
| **1** | රාජ්‍ය බැංකු මූල්‍ය විගණන පුහුණුව | 4 | 99 | 826 |
| **2** | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත පුහුණුව | 4 | 401 | 11,629 |
| **3** | නීති හා රෙගුලාසි පුහුණුව | 10 | 995 | 21,641 |
| **4** | උසස්වීම් ලද විගණන අධිකාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන | 2 | 218 | 13,845 |
| **5** | විනය ක්‍රියාපටිපාටි පුහුණුව | 1 | 81 | 1,175 |
| **6** | පාරිසරික විගණන පුහුණුව | 1 | 48 | 1,044 |
| **7** | විගණන නොවන කාර්ය මංඩල සඳහා පුහුණුව | **2** | 85 | 1,370 |
| | **එකතුව** | **24** | **1927** | **51,530** |
| | **විදේශිය පුහුණු වැඩසටහන්** | | | |
| **1** | ජාත්‍යන්තර විගණන සහභාගිත්ව වැඩසටහන - එක්සත් ජනපදය | | 01 | 652 |
| **2** | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා රජයේ කාර්යක්ෂමතාව සහ කාර්යක්ෂමතාව පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය | | 01 | 101 |

| | | | |
|---|---|---|---|
| 3 | පොදු ඉදිකිරීම් කටයුතු පිළිබඳ රජයේ විගණනය - ජපානය | 01 | 174 |
| 4 | පාරිසරික විගණනය පිළිබඳ හැඳින්වීම - ඉන්දියාව | 04 | 377 |
| 5 | පුරවැසි සහභාගීත්ව විගණන පරිචය පිළිබඳ දැනුම බෙදා ගැනීමේ වැඩමුළුව - නේපාලය | 05 | 181 |
| 6 | ශ්‍රී ලංකාවේ දිපව්‍යාප්ත සේවා නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන - ඉංදියාව | 02 | 174 |
| | **එකතුව** | **14** | **1659** |

## බාහිර ආයතන සඳහා සම්පත්දායකත්වය ලබාදීම

ජාතික විගණන කාර්යාලයේ සේවයේ නියුතු නිළධාරීන් 5 දෙනෙකු 2024 වර්ෂය තුළ දී ජාතික විගණන පනත හා විගණනයට සමගාමී ක්ෂේත්‍ර පිළිබඳ රාජ්‍ය සේවයේ නියුතු අනෙකුත් නිළධාරීන්ගේ දැනුම හා හැකියාවන් වර්ධනය සඳහා තම සම්පත්දායකත්වය ලබා දීමට කටයුතු කර තිබේ.

### පුහුණු අවස්ථා සලසා දීම

ජාතික විගණන කාර්යාලයේ සේවයේ නියුතු නිළධාරීන්ගේ වෘත්තීය ප්‍රවීනතාව සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ලියාපදිංචි ශිෂ්‍ය නිළධාරීන් සඳහා අවශ්‍ය වෘත්තීය පුහුණු අවස්ථා සලසාදීමට අවශ්‍ය කටයුතු කර තිබේ.

## සුදුසුකම්ලත් විගණකවරුන් සේවයේ යොදවා ගැනීම

විගණන කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු හේතුවෙන් ඇති වන සම්පත්වල පරතරය පියවා ගැනීම සහ රාජ්‍ය බැංකු, රාජ්‍ය සමාගම් විගණනය සඳහා විශේෂිත සේවා අවශ්‍ය වන අවස්ථාවලදී සුදුසුකම්ලත් විගණකවරුන් සේවයෙහි යොදවා ගැනීමට අවශ්‍ය විය. ඒ සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (4) (අ) ව්‍යවස්ථාව මගින් විගණකාධිපතිවරයාට බලය පවරා ඇත.

රාජ්‍ය බැංකු විගණනය සඳහා සුදුසුකම්ලත් විගණකවරුන්ගේ සේවය ලබා ගැනීමේදී, ශ්‍රී ලංකා මහා බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විගණනයට අදාලව නිකුත් කර ඇති සුදුසුකම්ලත් විගණකවරුන්ගේ ලැයිස්තුව අනුව අදාල තෝරා ගැනීම් සිදු කල අතර ඔවුන් විසින් පෙර සපයා තිබුණු සේවාවන්ගේ ගුණාත්මකභාවය, සමාගමේ සිටින හවුල්කරුවන් සංඛ්‍යාව, ඔහුන්ගේ අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද, ඔවුන් සමග සේවයේ යෙදී සිටින විගණන පුහුණු වන්නන්ගේ සංඛ්‍යාව සහ මීට පෙර අදාල විගණනයන්හි යෙදීමෙන් ලබාගත් පළපුරුද්ද යනාදී සාධක සලකා බලන ලදී. ඒ අනුව විගණකවරුන් තෝරා ගැනීම ප්‍රසම්පාදන ක්‍රමවේදයන්ට අනුකූලව සිදු කර ඇත.

රාජ්‍ය බැංකු කාණ්ඩයට අයත් වන ශ්‍රී ලංකා මහා බැංකුව, ලංකා බැංකුව සහ මහජන බැංකුව යන බැංකුවල 2024 වර්ෂයේ විගණනය, සුදුසුකම්ලත් පෞද්ගලික විගණන සමාගමක් වෙත පවරා තිබු අතර ඒ වෙනුවෙන් රුපියල් මිලියන 31.7 ක මුදලක් ගෙවීම් කර ඇත.

එමෙන්ම ජාතික ඉතිරි කිරීමේ බැංකුව, නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව යන බැංකුවල 2024 වර්ෂයේ සෘජු විගණනය සඳහා සුදුසුකම්ලත් විගණන සමාගමක තාක්ෂණික උපදේශන සහාය ලබා ගත් අතර ඒ සඳහා රුපියල් මිලියන 3.1075 ක මුදලක් ගෙවීම් කර ඇත.

දහනමවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් විගණකාධිපතිගේ විෂය පථයට ඇතුලත් වූ සියයට 50 ක් හෝ ඊට වැඩි රාජ්‍ය අයිතියක් ඇති සමාගම් 125කින් සමාගම් 18ක් සඳහා පමණක් 2024 වර්ෂයේ විගණනය සිදු කිරීම වෙනුවෙන් සුදුසුකම්ලත් විගණන සමාගම් 2ක් මට සහාය වූ අතර ඒ සඳහා රුපියල් මිලියන 40.75 ක මුදලක් ගෙවීම් කර ඇත.

කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව සහ කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා අරමුදල යන ආයතනයන්හි විගණනය මා වෙත පැවරුණු අතර ඒ සඳහා 2024 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 0.47ක මුදලක් ගෙවීම් කර ඇත.

## ශ්‍රී ලංකා රාජ්‍ය මුල්‍ය කළමනාකරණ ධාරිතා වර්ධන ව්‍යාපෘතිය

ලෝක බැංකුව විසින් යුරෝපීය සහයෝගීතාවය යටතේ ක්‍රියාත්මක කරන විදේශාධාර ව්‍යාපෘතිය ජාතික විගණන කාර්යාලය ලද මහගු අවස්ථාවකි. උත්තරීතර විගණන ආයතනයන්ගේ කාර්යසාධනය ඇගයීම සඳහා වන ආයතනය විසින් කරන ලද ඇගයීමට අනුව ජාතික විගණන කාර්යාලය විසින් වර්ධනය කරගත යුතු ක්ෂේත්‍ර කිහිපයක් පිළිබඳව පෙන්වාදී ඇත. මීට සමගාමීව විගණන පණත යටතේ වන ව්‍යවස්ථාපිත කාර්යයන් වඩාත් කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා අවශ්‍ය වන ධාරිතාවය වර්ධනය කිරීම මෙම ව්‍යාපෘතිය මගින් ඉටුකිරීමට අපේක්ෂිතය. ඒ අනුව ජාතික විගණන කාර්යාලයට රාජ්‍ය අංශයේ ආයතනවලට අදාලව ගුණත්වයෙන් උසස් විගණන වාර්තා නියමිත කාලයට පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට හැකියාව ලැබේ. ජාතික විගණන කාර්යාලය සතුව දැනට පවත්නා හැකියා මට්ටම වැඩිදියුණු කරගත හැකිවනවා මෙන්න ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ වඩාත් හොඳ භාවිතයන් සමඟ සමපාත වීමේ අවස්ථාවද ලැබේ. මෙම ව්‍යාපෘතිය මගින් අවසාන වශයෙන් රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් වන කටයුතු වල වගවීම සහ විනිවිධභාවය වර්ධනය කර ගැනීමට අපේක්ෂා කෙරේ.

අත්සන් කර ඇති ආධාර ගිවිසුම අනුව එ.ජ.ඩො මිලියන 3.5 ක් ලැබීමට නියමිත අතර ව්‍යාපෘති කටයුතු 2026 වර්ෂයේ නොවැම්බර් 30 න් අවසන් වීමට නියමිතය. ව්‍යාපෘතිය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අනුව ව්‍යාපෘති කාලය සඳහා ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 1,050 ක් වේ.

ජාතික විගණන කාර්යාලයේ විශේෂ විගණන ක්ෂේත්‍ර දියුණු කිරීම සඳහා පහත සඳහන් උප-කණ්ඩායම් (Core-Groups) සමාලෝචිත වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.

- අවදානම් පාදක විගණන ක්‍රමවේදය (Risk Based Audit)
- ප්‍රසම්පාදන විගණනය (Procurement Audit)
- පාරිසරික විගණනය (Environment Audit)
- ප්‍රජා සහභාගීත්ව විගණනය (Citizen Participatory Audit)
- කාර්යසාධන විගණනය (Performance Audit)

උක්ත උප-කණ්ඩායම් යටතේ තෝරාගත් නිලධාරීන්ට, ව්‍යාපෘතිය යටතේ බඳවාගත් උපදේශකයන් මඟින් පුහුණුව ලබාදෙන අතර එම ක්ෂේත්‍ර සම්බන්ධ නව විගණන ක්‍රමවේද (Audit Methodology), පිරික්සුම් ලැයිස්තු (Check List) පිළියෙල කරමින් පවතී. එමෙන්ම උප-කණ්ඩායම් යටතේ නියමු විගණන (Pilot Audit) කටයුතු කරනු ලබන අතර එම වාර්තාවන් එළඹෙන වර්ෂයේදී පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට හා මහජනයාට ප්‍රසිද්ධ කිරීමටද සැලසුම් කර ඇත.

තවද, උප-කණ්ඩායම් ලබාගත් විෂය දැනුම පුහුණුකරුවන් පුහුණු කිරීම (TOT) මඟින් ජාතික විගණන කාර්යාලයේ සියලුම විගණන නිලධාරීන්ට ලබාදීමට සැලසුම් කර ඇත.

මීට අමතරව, ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේදී සාර්ථකව අවසන් කර ඇති අතර නිලධාරීන් ලබාගත් විෂය දැනුම විගණනයේදී භාවිතා කරමින් පවතින බැවින් ඒ තුළින් විගණනයේ ගුණාත්මක මට්ටම ඉහළයාමක්ද නිරීක්ෂණය වේ.

**වගු අංක 1.5 - නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර**

| | පුහුණු සැසිය | අපේක්ෂිත පුහුණු සැසි ගණන | 2024.12.31 දිනට පවත්වන ලද පුහුණු සැසි සංඛ්‍යාව | සහභාගී වූ විගණන නිලධාරීන් ගණන |
|---|---|---|---|---|
| i. | ගිණුම්කරණ ප්‍රමිත | 01 | 01 | 257 |
| ii. | නීති සහ රෙගුලාසි | 12 | 12 | 1073 |
| iii. | මෘදු කුසලතා | 16 | 06 | 376 |
| vi. | ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (SLAuS) | 07 | 07 | 949 |
| v. | තොරතුරු තාක්ෂණ කුසලතා සංවර්ධනය | 16 | 07 | 266 |

සමාලෝචිත වර්ෂයේ පැවති සියයට 40ක පමණ සේවක පුරප්පාඩු, ඒක පුද්ගල උපදේශකයන්/ උපදේශක ආයතන බඳවා ගැනීමට දිගු කාලයක් ගතවීම, ව්‍යාපෘතියට වෙනම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) නොමැතිවීම යන කරුණු ව්‍යාපෘතියේ සුමට ක්‍රියාකාරීත්වයට

අභියෝගයක්ව පැවතුණි. 2025 වර්ෂයේ නව බඳවාගැනීම් සමඟ මෙම තත්ත්වය මගහැරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු ඉදිරිපත් කිරීම

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ප්‍රකාරව ජාතික විගණන කාර්යාලය සඳහා තොරතුරු නිලධාරියෙකු සහ නම් කළ නිලධාරියෙකු පත්කර ඇත. එම තොරතුරු ඉල්ලීම් තැපැල් මගින් මෙන්ම විද්‍යුත් තැපෑල මගින්ද තොරතුරු නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලැබේ. 2024 වර්ෂයේදී තොරතුරු පනත යටතේ තොරතුරු ඉල්ලීම් 105ක් ලැබී ඇති අතර එයින් 81ක් සඳහා තොරතුරු සපයා ඇත. ලද ඉල්ලීම් 24ක් පනතේ 5 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කර තිබුණි. ප්‍රතික්ෂේපිත තොරතුරු ඉල්ලීම් බොහොමයක් විගණන විමසුම් පිටපත් ඉල්ලා ඉදිරිපත් කර තිබූ අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 9 ඡේදය අනුව විගණනයට අදාළ තොරතුරු හා ලේඛන ලබා දීමට නොහැකි බැවින් විගණන විමසුම් පිටපත් ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත.

## ජාතික විගණන කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන

## 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | | |
|---|---|---|---|
| | | 2024 | 2023 |
| | | රු. | රු. |
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | | 1,535,599,281 | 1,499,559,208 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | | 147,646,428 | 149,680,375 |
| මුදල් හා මුදල් සමාන දෑ | | 4,055,490 | - |
| **මුළු වත්කම්** | | **1,687,301,199** | **1,649,239,583** |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 146,903,251 | 148,755,223 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 1,535,599,281 | 1,499,559,208 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | | 743,177 | 925,152 |
| අග්‍රිම ශේෂය | | 4,055,490 | - |
| **මුළු වගකීම්** | | **1,687,301,199** | **1,649,239,583** |

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
|---|---|---|
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | දිනය : 2025/02/25 |
| දිනය : | දිනය : | |

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
306 / 72, පොල්දුව පාර,
බත්තරමුල්ල

# වාර්තාකිරීමේ පදනම

## මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

## වාර්තාකරණ කාලපරිච්ඡේදය

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

## මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

## ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

## දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

## දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

## මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු. | | තත්‍ය 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| 300,000,000 | **ආදායම් ලැබීම්** | 413,597,899 | 415,611,400 |
| - | ආදායම් බදු | - | - |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | - | - |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | - | - |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | - | - |
| 300,000,000 | **මුළු ආදායම් ලැබීම් (අ)** | 413,597,899 | 415,611,400 |
| - | **ආදායම් නොවන ලැබීම්** | - | - |
| - | භාණ්ඩාගාර අග්‍රිම | 2,034,823,000 | 1,769,796,000 |
| - | තැන්පතු | 167,008,259 | 172,584,544 |
| - | අත්තිකාරම් ගිණුම් | 75,944,829 | 83,389,954 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | 81,269,037 | 53,828,162 |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | **2,359,045,125** | 2,079,598,660 |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | **2,772,643,024** | 2,495,210,060 |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | 31,876,504 | 50,251,023 |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | 2,740,766,520 | 2,444,959,037 |
| | **අඩු කළා : වියදම්** | | |
| - | **පුනරාවර්තන වියදම්** | - | - |
| 2,163,700,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 2,011,825,901 | 1,795,785,797 |
| 614,300,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 413,905,603 | 414,843,197 |
| 21,500,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 12,948,384 | 14,186,831 |
| - | පොළී ගෙවීම් | - | - |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | - | - |
| 2,799,500,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | **2,438,679,888** | 2,224,815,825 |
| | **මූලධන වියදම්** | | |
| 32,600,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 19,533,411 | 10,418,737 |
| 48,500,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 45,551,121 | 20,669,581 |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | - | - |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | - | - |
| 5,400,000 | හැකියා වර්ධනය | 2,886,148 | 2,900,130 |
| 368,000,000 | වෙනත් මූලධන වියදම් | 28,404,146 | 1,087,688 |
| 454,500,000 | **මුළු මූලධන වියදම් (උ)** | **96,374,826** | 35,076,136 |
| | තැන්පතු ගෙවීම් | 167,190,234 | 432,815,339 |
| | අත්තිකාරම් ගෙවීම් | 73,910,882 | 38,961,782 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | 81,269,037 | 53,828,162 |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | 322,370,153 | 525,605,283 |
| 3,254,000,000 | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | 2,857,424,867 | 2,785,497,243 |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | (116,658,347) | (340,538,207) |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | (120,713,837) | (340,538,207) |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | 4,055,490 | - |
| | | (116,658,347) | - |

## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සත්‍ය | |
|---|---|---|
| | 2024<br>රු. | 2023<br>රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | 413,597,899 | 415,611,400 |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 81,090,867 | 331,911,553 |
| අග්‍රිම ලැබීම් | 2,034,823,000 | 1,769,796,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 76,644,843 | 83,799,160 |
| තැන්පතු ලැබීම් | 167,008,259 | 172,584,544 |
| වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | 81,269,037 | 53,828,162 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **2,854,433,905** | **2,827,530,819** |
| | | |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 2,417,371,598 | 2,202,032,094 |
| සහනාධාර සහ මාරුකිරීම් | 12,948,384 | 14,186,831 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 9,800,671 | 5,645,156 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 31,876,504 | 50,251,023 |
| අත්තිකාරම් ගෙවීම් | 71,060,288 | 35,950,225 |
| තැන්පතු ගෙවීම් | 167,190,234 | 432,815,339 |
| වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | 81,269,037 | 53,828,162 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **2,791,516,716** | **2,794,708,830** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **62,917,189** | **32,821,989** |
| | | |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| | | |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| මූලධන වියදම් | 58,861,699 | 32,821,989 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **58,861,699** | **32,821,989** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(58,861,699)** | **(32,821,989)** |
| | | |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **4,055,490** | - |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| | | |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| | | |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | **4,055,490** | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | [illegible] | - |




# 02

# විගණන නිරීක්ෂණ

# ජනාධිපති ලේකම් කාර්යාලය හා ජනාධිපති අරමුදල

**සංවර්ධන මූලාරම්භ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණ සහ අධීක්ෂණය යටතේ ව්‍යාපෘති 11,234ක් අනුමතකර තිබූ අතර 2024 දෙසැම්බර් 31ට එයින් ව්‍යාපෘති 3,544ක් හෙවත් අනුමත ව්‍යාපෘතිවලින් සියයට 32ක් අවලංගුකර තිබුණි. දිස්ත්‍රික්ක හතක අනුමත ව්‍යාපෘතිවලින් සියයට 50 කට වඩා ව්‍යාපෘති අවලංගුකර තිබුණි. තවද, 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තා අනුව සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණ හා අධීක්ෂණය සඳහා මුලතිව් දිස්ත්‍රික්කයේ අනුමත ප්‍රතිපාදන රු.මිලියන 24.57ක්වූ ව්‍යාපෘති 04 ක වැඩ ආරම්භ කර අත්හිටුවා තිබුණි. එසේම 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තා අනුව වතුකරයේ ජනතාවට ඉඩම් අයිතිය ලබාදීම සඳහා වූ දිස්ත්‍රික්ක හයක, ව්‍යාපෘති 748ක සියයට 61ත් 86ත් අතර වැඩ අවසන් කර නොතිබුණි.

**තරුණ අභිවෘද්ධි වැඩසටහන**

තරුණ අභිවෘද්ධි වැඩසටහන යටතේ අනුරාධපුර හා රත්නපුර දිස්ත්‍රික්ක සඳහා පිළිවෙලින් රු. මිලියන 25.4ක් සහ 2.45ක් ප්‍රතිපාදනය අනුමත වී තිබූ ව්‍යාපෘති 2024 වර්ෂය අවසාන වන විටත් අවසන් කර නොතිබුණි. අම්පාර දිස්ත්‍රික්කයේ අනුමත ව්‍යාපෘති 248න් ව්‍යාපෘතීන් 156ක් හෙවත් අනුමත ව්‍යාපෘති සංඛ්‍යාවෙන් සියයට 63ක වැඩ අවසන් කර නොතිබුණි. තරුණ අභිවෘද්ධි වැඩසටහන සඳහා නුවරඑළිය දිස්ත්‍රික්කයට අනුමත ව්‍යාපෘති නොතිබුණ ද එම දිස්ත්‍රික්කය සඳහා රු. මිලියන 29ක ප්‍රතිපාදන ලබාදී රු. මිලියන 0.335ක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා භාණ්ඩ හා ක්‍රීඩා උපකරණ ලබාගැනීමට පුවත්පත් දැන්වීම් පලකිරීම සඳහා වැයකර තිබුණි. තවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාල 04කට ලබාදී තිබූ එකතුව රු. මිලියන 58.35ක ප්‍රතිපාදනවලින් කිසිදු තරුණ අභිවෘද්ධි වැඩසටහනක් සිදු කර නොතිබූ අතර සම්පූර්ණ ප්‍රතිපාදන මුදලම ඉතිරිවී තිබුණි.

**ජනාධිපති අරමුදල සඳහා වියදම් කිරීම**

ජනාධිපති කාර්යාලයේ වියදම් ඇස්තමේන්තු තුල ජනාධිපති අරමුදලේ කාර්යයන් සඳහා වැය විෂයක් නොමැති වුවද, 2024 වර්ෂයේදී අරමුදලේ ස්ථිර හා තාවකාලික කාර්ය මණ්ඩලය සඳහා වැටුප් හා දීමනා ලෙස රු. මිලියන 47.37ක්, නඩත්තු වියදම් රු.

මිලියන 0.97ක් සහ අනෙකුත් වියදම් ලෙස රු. මිලියන 2.79ක් ලෙස එකතුව රු. මිලියන 51.13ක් කාර්යාලය විසින් ගෙවා තිබුණි.

**නිල වාහන ලබාදීම**

1986 අංක 04 දරණ ජනාධිපතිවරුන්ගේ හිමිකම් පනතේ 3(2) වගන්තිය අනුව හිටපු ජනාධිපතිවරු හතරදෙනෙකු සඳහා ලබාදිය හැකි උපරිම නිල වාහන සංඛ්‍යාව ඉක්මවා අයෙකුට වාහන 03 සිට 14 දක්වා එකතුව වාහන 38 ක් 2025 ජනවාරි දක්වා වැඩිපුර ලබාදී තිබුණු බව නිරීක්ෂණය විය.

**භෞතිකව නොපවත්නා වාහන**

මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව 2025 ජුනි 09 දින වනවිට ජනාධිපති කාර්යාලය නමින් ලියාපදිංචි කර ඇති නමුත් භෞතික පැවැත්ම තහවුරු කරගත නොහැකි වූ වාහන සංඛ්‍යාව 29ක් බව අණාවරනය විය. මෙම වාහන කිසියම් ආයතනයකට / පුද්ගලයෙකුට භාරදුන් බවට හෝ අතුරුදහන් වී ඇති බවට හෝ කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. තවද, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත පවරාගෙන තිබූ වාහන 27ක් තවදුරටත් ජනාධිපති කාර්යාලය සතු වාහන ලෙස දක්වා තිබුණි.

**වාහන අලුත්වැඩියාව**

2024 වර්ෂය තුලදී ජනාධිපති කාර්යාලයේ වාහන අලුත්වැඩියාව සඳහා දරණ ලද සමස්ථ වියදම රු. මිලියන 645.34ක් වූ අතර එම වර්ෂය තුලදී එකම වාහනය අලුත්වැඩියා වාර 10 සිට 17 දක්වා වූ පරාසයක් තුල අලුත්වැඩියා කිරීම් අවස්ථා 53 ක් නිරීක්ෂණය විය. තවද, විගණනය වෙත ලැබී ඇති තොරතුරු අනුව, රු. මිලියන 1 සිට රු.මිලියන 40 දක්වා වූ තක්සේරු වටිනාකම් සහිත වාහන 189ක් සඳහා 2024 වර්ෂය තුලදී එක් වාහනයකට රු.මිලියන 01 සිට රු.මිලියන 28ක් දක්වා වූ පරාසය තුළ අලුත්වැඩියාවන් සඳහා වැයකර තිබුණි.

**වාහනවලට ඉන්ධන යෙදීම**

විශේෂ ව්‍යාපෘති අංශයේ රාජකාරි කටයුතු සඳහා කාර්යාලය විසින් බෙන්ස් රථයක් ලබාදී තිබූ අතර ප්‍රවාහන අංශයේ වාර්තා අනුව, මෙම රථය ඉන්ධන ලීටරයකින් 6 km ක් ධාවනය කල හැකිය. 2022 නොවැම්බර් සිට 2024 සැප්තැම්බර් දක්වා මෙම රථය 30,689km ධාවනය කර තිබූ අතර, ඒ අනුව ඒ සඳහා ආසන්න වශයෙන් ඉන්ධන ලීටර් 5,150 ක් පමණ අවශ්‍ය වුවද, කාර්යාලයේ ඉන්ධන කූපන්පත්

භාවිතා කරමින් මෙම රථයට ඉන්ධන ලීටර් 7,425ක් එනම් සාමාන්‍ය අවශ්‍යතාවයට වඩා වැඩියෙන් ලීටර 2,300 ක් ලබාගෙන තිබුණි.

**නිල වාහන ආනයනය**

2013 වර්ෂයේදී කාර්යාලය විසින් හිටපු ජනාධිපතිවරයෙකුගේ භාවිතය සඳහා විදේශ සැපයුම් කරුවෙකුගෙන් Mercedes Benz G63 AMG මාදිලියේ රථයක් මිලදී ගෙන තිබූ අතර මෙම මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කළ බවට තහවුරු නොවූ අතර කාර්යාලය විසින් මේ සඳහා බ්‍රිතාන්‍ය සැපයුම්කරුට 2013 නොවැම්බර් 14 ණයවර ලිපි මඟින් රු. මිලියන 16.49ක් ප්‍රේෂණය කර තිබුණි. මීට අතිරේකව, 2014 මාර්තු 07 හා මැයි 09 දින වලදී පෞද්ගලික පාර්ශවයක් වෙත නැවත රු. මිලියන 16.25ක් ගෙවා තිබු අතර අදාල පෞද්ගලික පාර්ශවය විසින් එම මුදල විදේශ සැපයුම්කරුට ගාස්තු වශයෙන් ගෙවූ බව දන්වා තිබුණි. කෙසේ වෙතත් එසේ ගෙවු බවට තහවුරු නොවූ අතර, ණයවර ලිපි කාර්යාලය විසින් විවෘත කර තිබියදී රජයේ මුදල් තෙවන පාර්ශවයකට ගෙවීම සඳහා පදනම විගණනයේදී අනාවරණය නොවුණි.

එම පෞද්ගලික පාර්ශවය විසින් මෙම මෝටර් රථය ආනයනය කර කාර්යාලයට ලබාදුන් බවට තහවුරු නොවූ අතර රේගු සටහන්කරය අනුව 2013 නොවැම්බර් 21 දින ශ්‍රී ලංකාවට ලැබී තිබු රථය 2019 දෙසැම්බර් 10, එනම් වසර හයකට පසුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබුණි. රේගු සටහන්කරය අනුව මෙම රථයට ආනයන රේගු බදු වශයෙන් ගෙවිය යුතු රු. මිලියන 45.98ක් ගෙවීමකින් තොරව නිදහස්කර ගැනීමට අදාල බලධාරීන්ගේ අනුමැතිය විගණනයට තහවුරු නොවූ අතර ගෙවීම්වලට අදාළ වූ ගෙවීම් වවුචර් පත් හා අනෙකුත් ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2015.07.24 දින සිට 2025.03.17 දින දක්වා වසර 10 ක කාලයක් තුළ මෙම රථය කිලෝමීටර් 49,950 ක් පමණක් ධාවනය කර තිබූ අතර, විගණනයට ලද තොරතුරු අනුව, අළුත්වැඩියා, නඩත්තු හා වාර සේවා වියදම් ලෙස එම කාලය තුළ එකතුව රු. මිලියන 14.51 ක් වැයකර තිබුණි.

## ජනාධිපතිවරයාගේ අරමුදල

**නිර්ණායක සළකා බැලීමකින් තොරව වෛද්‍යාධාර ප්‍රදානය කිරීම**

විගණන නියැදි පරීක්ෂාව අනුව, 2005-2024 කාල පරිච්ඡේදය තුළදී ජනාධිපති අරමුදල මගින් වෛද්‍යාධාර ලබාදීමේදී සළකා බලනු ලබන මූල්‍යාධාර ලබාගැනීමට අදාලව විධිමත් අයදුම්පත්‍රයක්, ලබන මාසික ආදායම් සීමාව, ප්‍රාදේශීය ලේකම් වාර්තාව, ඔවුන්ගේ මූල්‍ය වත්කම්, උපරිම වෛද්‍ය ආධාර මුදල් සීමාවන් ආදී නිර්ණායක පිළිබඳව සම්පූර්ණ වශයෙන් සලකා බැලීමකින් තොරව පාර්ලිමේන්තු හා පළාත් සභා මන්ත්‍රීවරු 56 දෙනෙකු වෙත එකතුව රු. මිලියන 131.37ක් වෛද්‍යාධාර වශයෙන් ලබාදී තිබුණි.

**වෛද්‍යාධාර ණය මුදල් ආපසු නොගෙවීම**

ජනාධිපතිවරයාගේ අරමුදල් පනත ප්‍රකාරව, මුදල් ණය වශයෙන් ලබා දීමට ප්‍රතිපාදන සලසා දී නොතිබුණද, හිටපු අග්‍රාමාත්‍යවරයකු වෙත වෛද්‍ය පහසුකම් ලබාගැනීම වෙනුවෙන් 2012 හා 2014 වර්ෂවලදී අරමුදල මඟින් රු. මිලියන 29.81ක් ලබාදී තිබූ අතර, විගණනය වෙත ලද තොරතුරු අනුව, මෙයින් රු. මිලියන 13.75ක් නැවත අයකර ගැනීමේ පදනමට ලබාදී තිබුණි. එසේ වුවද, 2025 ජූනි මාසය දක්වා අදාල මුදල් නැවත අයකරගෙන නොතිබුණි. තවද, ජනාධිපති ලේකම්ගේ අංක PF/M/78/06 හා 2015 පෙබරවාරි 02 දිනැති ලිපියට අනුව නැවත ගෙවීමේ පදනම මත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට රු. මිලියන 10.91ක වෛද්‍යාධාර මුදලක් ජනාධිපතිවරයාගේ අරමුදලින් ලබා දී තිබුණද එම මුදල්ද 2025 ජූනි මාසය වන විටත් නැවත අයකරගෙන නොතිබුණි.

**රෝගීන් සඳහා මාසිකව දීමනා ලබාදීම**

ජීවිත කාලය පුරා රෝගී තත්වයෙන් පසුවන බවට හඳුනාගෙන තිබූ පුද්ගලයින් 11 දෙනෙකු වෙනුවෙන් 1988 ත් 2019 ත් අතර කාලය තුල අරමුදල විසින් රාජ්‍ය බැංකු 03 ක රු.මිලියන 3.45ක් ආයෝජනය කර එහි ප්‍රතිලාභ, මාසිකව එම රෝගීන්ට ලැබීමට සලසා තිබුණි. ආයෝජනය මගින් අදාල රෝගීන්ට ලැබෙන ප්‍රතිලාභ ඔවුන්ගේ රෝගී තත්වයන්ට ප්‍රමාණවත් වේද යන්න ඇගයීමට ලක්කර ඊට අනුකූලව අවශ්‍ය සංශෝධන සිදු කිරීමට අරමුදල විසින් 2024 වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

# ස්වාධීන කොමිෂන් සභා

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**අභියාචනා විසඳීම**

2024 වර්ෂය තුලදී අභියාචනා 1453ක් විසඳා තිබූ අතර අභියාචනා විසඳීම සඳහා ගත කළ කාලය පිළිබඳව සලකා බැලීමේදී, වර්ෂයක් තුල අභියාචනා 393ක් ද, වර්ෂ 2ක් ඇතුළත 502 ක් ද, වර්ෂ 3ක් තුල 199ක් ද, වර්ෂ 4ක් තුල 102ක් ද, වර්ෂ 5 ට වැඩි අභියාචනා 257ක් ද ලෙස විසඳීම් සිදුකර තිබුණි. මේ අනුව අභියාචනා ලැබීම් සඳහා වර්ෂයක් ඇතුළත විසඳීම, නිරීක්ෂණ නිර්දේශ හෝ වාර්තා ලබා දීම සිදුකර ඇති ප්‍රමාණය ලද අභියාචනාවලින් සියයට 27ක් වී තිබුණි.

## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

**පැමිණිලි විසඳීම**

2024 වර්ෂය ආරම්භයේදී පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත විසඳීම සඳහා පැමිණිලි 1007ක් පැවති අතර වර්ෂය තුල තවත් පැමිණිලි 522ක් ලැබී තිබුණි. ඒ අනුව විසඳීම සඳහා තිබූ පැමිණිලි සංඛ්‍යාව 1529ක් විය. ඉන් වර්ෂය තුල පැමිණිලි 455ක් අවසන් කර තිබූ අතර එලෙස අවසන් කල ආකාරය අනුව පැමිණිලි 141ක් බහා තැබීමෙන්ද පැමිණිලි 216ක් නිශ්ප්‍රභා කිරීමෙන්ද, පැමිණිලි 67 ක් ඉල්ලා අස්කර ගැනීමෙන්ද පැමිණිලි 36ක් විසඳීමෙන්ද අවසන් කර තිබුණි.

## සීමා නීර්ණය කොමිෂන් සභාව

**කාර්යභාරයන් ඉටුකිරීම**

ශ්‍රී ලංකාව තුල මැතිවරණ කොට්ඨාශ සීමා නීර්ණය කිරීම සඳහා 2015 නොවැම්බර් 13 වන දින ජනාධිපතිවරයා විසින් සීමා නීර්ණය කොමිෂන් සභාව ස්ථාපනය කර තිබුණු අතර මේ වන විට එය පිහිටුවා වසර 10ක් පමණ ගත වුවද කොමිෂන් සභාවේ කාර්යයන් නියමිතව හඳුනාගෙන නියමිත කාල රාමුවක් තුල ඉටුකර ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමුවිය යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## මානව හිමිකම් කොමිෂන් සභාව

**පැමිණිලි විසඳීම**

2024 ජනවාරි 01 දිනට විසඳීම සඳහා වූ පැමිණිලි 8,778ක්ද 2024 වර්ෂය තුලදී ලද පැමිණිලි සංඛ්‍යාව 9,844ක්ද ඒ අනුව විසඳීම සඳහා වූ පැමිණිලිවල එකතුව 18,622ක්ද විය. වර්ෂය තුලදී ඉන්පැමිණිලි 8,135ක් එනම් මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් සියයට 44ක් අවසන් කර තිබුණි.

තවද, එම පැමිණිලි ලද වර්ෂ අනුව විසඳීමට ගත කල කාලය පැමිණිල්ල ලැබී වර්ෂයක් තුල පැමිණිලි 11ක්ද, වර්ෂ 02ත් 04ත් අතර කාලය තුල පැමිණිලි 22 ක් ද, වර්ෂ 06 ත් 08 ත් අතර කාලය තුල පැමිණිලි 09ක් ද, වර්ෂ 08ක් තුල පැමිණිලි 03ක් ද, වර්ෂ 10ට වැඩි එක් පැමිණිල්ලක්ද විය.

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම**

වර්ෂ 2001 සිට වර්ෂ 2024 අතර කාලය තුල ලද පැමිණිලි විභාග කර ලබාදුන් නිර්දේශ 68ක් පිළිබඳ කොමිෂන් සභාව විසින් සිදුකල පසු විපරම් පරීක්ෂාව අනුව නිර්දේශ ලබාදී වසර 20 ක කාලය තුල ක්‍රියාත්මක කිරීමට හෝ එකඟතාවය ලබා ගැනීමට හැකිවී තිබූයේ නිර්දේශ 12ක් සඳහා පමණි.

## විගණන සේවා කොමිෂන් සභාව

**රීති සකස්කර ක්‍රියාවට නැංවීම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(ඇ) ව්‍යවස්ථාව අනුව කොමිෂන් සභාව විසින් ඉටුකල යුතු කාර්යයන් වශයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් විධිමත්ව කරනු ලබන ප්‍රතිපත්තිවලට යටත්ව ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයන්ගේ සේවයට බඳවාගැනීමේ පරිපාටි, පත් කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම් වලට අදාල රීති සකස්කර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 48 ඡේදය ප්‍රකාරව දක්වා ඇති පියවරයන් හා ක්‍රියා පිළිවෙත් අනුගමනය කර අදාල අනුමැතීන් ලබාගත යුතු වුවද 2024 දෙසැම්බර් 31 දින වන විටත් එම රීති සකස්කර ක්‍රියාත්මක තත්ත්වයට පත් වී නොතිබුණි.

## මුදල් කොමිෂන් සභාව

**ආයෝජන පිළිබඳ පසුවිපරම් ක්‍රමවේදයක් නොවීම**

ප්‍රාග්ධන ප්‍රදාන යටතේ යෝජිත සංවර්ධන සැලසුම් අනුමත කරමින් ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභා වෙත අරමුදල් ලබාදීම සිදුකලද, එම අරමුදල් ආයෝජනය කිරීම පිළිබඳ අධීක්ෂණය සමාලෝචනය හා පසු විපරම් සිදුකර සැලසුමේ සඳහන් නිමවුම් හා ප්‍රතිඵල ඇගයීමේ ක්‍රමවේදයක්, වර්තමානයේදී වගකීම පැවරුණු ස්වාධීන ආයතනයකින් හෝ පාර්ශවයකින් සිදු නොවන අතර ඒ පිළිබඳව දැක්විය යුතු නිර්දේශ 2024 වර්ෂයට අදාලව ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලැබූ නිර්දේශ පිළිබඳ වාර්තාවේ සඳහන් වීමක් සිදු වී නොතිබුණි.

**පළාත් සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රතිපාදන නොලැබීම**

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ පළාත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ මත අයවැය මඟින් 2022, 2023 හා 2024 වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 10,111ක්, රු.මිලියන 16,900 සහ රු.මිලියන 25,500ක් අයවැය මඟින් වෙන්කර දී තිබුණද ඊට අදාලව අක්මුදල් නිදහස් කිරීම් පිළිවෙලින් රු.මිලියන 5,055ක්, රු.මිලියන 8,600ක් සහ රු. මිලියන 17,889ක් හෙවත් අයවැය ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 50ක්, 51ක් සහ 70ක් පමණක් විය. මේ අනුව පළාත් සංවර්ධන වැඩසටහන් සඳහා මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ මත අයවැය ප්‍රතිපාදන ලබාදුන්නද ප්‍රමාණවත් පරිදි භාණ්ඩාගාරය විසින් අක්මුදල් නිදහස් නොකිරීම නිසා සැලසුම්කල පරිදි පළාත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වනවා මෙන්ම ප්‍රාදේශීය තුලිත සංවර්ධනය ඇති කිරීමේ අරමුණද ඉටුනොවන බව නිරීක්ෂණය කෙරේ.

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

**පැමිණිලි විසඳීම**

2024 වර්ෂය ආරම්භයේ විමර්ශනය සඳහා පැවැති ගොනු සංඛ්‍යාව 2,353ක් වූ අතර 2024 වර්ෂය තුල විමර්ශන කාර්යයන් සඳහා ලැබී තිබූ ගොනු සංඛ්‍යාව 2,941ක් සමඟ එකතුව 5,294ක ගොනු සංඛ්‍යාවක් 2024 වර්ෂය තුල විමර්ශන අංශය සතුව පැවතුණි. එයින් ගොනු 2,933ක් 2024 වර්ෂය තුල විමර්ශන කටයුතු සිදු කර තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට විමර්ශන කාර්යයේ සක්‍රීයව පැවති ගොනු සංඛ්‍යාව 2,361ක් වූ අතර එහි පැමිණිල්ල යොමු වූ වර්ෂය අනුව, වර්ෂයට අඩු ගොනු 715ක්ද, වසර 01 සිට 05 දක්වා කාලයට අදාල ගොනු 1283ක්ද වසර 05 සිට 10 දක්වා කාලයට අදාල ගොනු 347ක්ද සහ වසර 10 ට වැඩි ගොනු 16ක්ද විය.

## තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව

**වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම**

2024 වර්ෂය වන විට කොමිෂන් සභාව ආරම්භකර වසර 08ක් පමණ ගතවී තිබුණද, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 43 වන වගන්තියේ දැක්වෙන අර්ථ නිරූපණයට අනුව නිශ්චිතව හඳුනාගත් පොදු අධිකාරීන් ලැයිස්තුවක් කොමිෂන් සභාව සතුව නොතිබුණි. එබැවින් පනතේ 05 හා 10

වගන්තිවලට අනුව සහ 08 වන වගන්තිය ප්‍රකාරව ස්වකීය කර්තව්‍යයන් හා තොරතුරු ඇතුලත් කරමින් වාර්ෂික වාර්තාවක් සකස් කර එකී වාර්තා අදාල වන වර්ෂයට ඉක්බිතිව එළඹෙන වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට ඉදිරිපත් කළ යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොමැති පොදු අධිකාරීන් මොනවද යන්න නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි.

# බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු



2024 වර්ෂය ආරම්භයේදී බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු 09ක් සහ ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 10 ක් ද බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙමින් තිබුණි.

## විගණන නිරීක්ෂණ

### මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

**ව්‍යවස්ථාපිත නොවන අරමුදල් පවත්වාගෙන යෑම**

ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කොට ඒවායේ මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කළ යුතු වන අතර එවැනි අරමුදලක් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් පාර්ලිමේන්තු පනතක් මඟින් නීතිගත කිරීමට කටයුතු කල යුතු වේ. එසේ වුවද, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන හජ් අරමුදල පාර්ලිමේන්තුවේ පනතක් මඟින් නීත්‍යානුකූලව පිහිටුවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මුදල් රෙගුලාසි ප්‍රකාරව අරමුදල අහෝසි කොට එහි මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට ද කටයුතු කර නොතිබුණි.

### බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

**පනත පරිදි සිද්ධස්ථාන හඳුනා ගැනීම**

1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ 3 වගන්තිය පරිදි බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ පවතින සියළුම සිද්ධස්ථාන සංඛ්‍යාව හා පනතේ විධිවිධානයන්ගෙන් නිදහස් කර ඇති සිද්ධස්ථාන කොපමණද යන්න හඳුනාගෙන නොතිබුණු අතර පනත යටතට ගැනෙන හා නිදහස් කරන සිද්ධස්ථාන හඳුනා ගැනීමට නිර්ණායක හඳුන්වා දීමට ද කටයුතු කර නොතිබුණි.

**අර්ධ වාර්ෂික ගිණුම් වාර්තා ලබාගැනීම**

පනතේ 36(1) වගන්තිය අනුව එක් එක් වර්ෂයේ ජූනි 30 දින හා දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන ඒ ඒ හය මාසය සම්බන්ධයෙන් විහාර හා දේවාල විසින් පිළියෙළ කරනු ලබන ගණන් සටහන් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා විසින් පරීක්ෂා කළ යුතු වුවද 2024 වර්ෂයේදී ලබා ගත යුතු 216ක් වූ විහාරස්ථානවල පලමු අර්ධ වාර්ෂික ගිණුම් වාර්තා 51ක් සහ දෙවන අර්ධ වාර්ෂික ගිණුම්

වාර්තා 59ක් ලබාගෙන නොතිබූ අතර දේවාලවලට අදාළව ලබා ගත යුතු 38ක් වූ දෙවන අර්ධ වාර්ෂික වාර්තා 01 ක් ලබාගෙන නොතිබුණි.

**සිද්ධස්ථාන විගණනය**

සිය පාලනයට යටත් කර ඇති සිද්ධස්ථාන සංඛ්‍යාව 254 ක් බැව් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා විසින් තහවුරු කර තිබූ අතර එම සිද්ධස්ථාන 254 අතුරින් 2023 සහ 2024 වර්ෂවලදී පිළිවෙලින් සිද්ධස්ථාන 16ක් හා 06ක් පමණක් විගණනයට ලක් කර තිබුණු බව විගණනයට වාර්තා කර තිබුණි. එම ප්‍රමාණය දක්වා ඇති සිද්ධස්ථාන සංඛ්‍යාවෙන් සියයට 6ක් සහ සියයට 2ක් වශයෙන් වූ ප්‍රමාණයක් පමණක් වීම හේතුවෙන් පනතේ 38(1) වගන්තිය යටතේ වූ කාර්යභාරය ඉටු වී ඇති බව නිරීක්ෂණය නොවීය.

තවද, පනතේ 38(2) වගන්තිය අනුව පරීක්ෂණය සිදු කරන නිලධාරියා එබඳු පරීක්ෂණයක් අවසානයේදී වාර්තාවක් බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා වෙත යැවිය යුතු වුවත් පනතේ එම කොන්දේසිය ඉටුකර තිබේද යන්න පරීක්ෂා කිරීමට අදාල විගණිත වාර්තා හා එම වාර්තාවල ඇතුළත් කරුණු සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. තවද, පනතේ 38(1) හා 38(2) වගන්ති අනුව සිද්ධස්ථාන භාරකාරයින්ගේ සියලු ගණන් පරීක්ෂා කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි.

## සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය

**කාර්යභාර ඉටු කිරීම**

සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් වශයෙන් දහම් පාසැල් ගුරු භවතුන්ගේ සැත්කම් සඳහා ආධාර ලබාදීම, විහාරස්ථාන සඳහා වියළි සලාක ආධාර ලබා දීම, බුදුපුත් මාපිය උපහාර නිවාස ආධාර ලබා දීම, විහාරස්ථාන සඳහා ගොඩනැඟිලි ආධාර ලබා දීම සහ දහම් පාසැල් සිසුන්ට සිසුසවිය ශිෂ්‍යත්ව ආධාර ලබා දීම යනාදී කාර්යයන් 05ක් හඳුනාගෙන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණද, දහම් පාසැල් සිසුන්ට සිසුසවිය ශිෂ්‍යත්ව ආධාර සහ විහාරස්ථාන සඳහා ගොඩනැඟිලි ආධාර ලබා දීම 2020 වර්ෂයෙන් පසු සිදු කර නොතිබුණි. තවද, විහාරස්ථාන සඳහා ගොඩනැඟිලි ආධාර ලබා දීම කොවිඩ් 19 වසංගත තත්ත්වය පැවති 2019 – 2021 කාල වකවානුවේ පමණක් සිදු කර

තිබුණි. එමෙන්ම අදාළ කාර්යයන් ඉටු කර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර තිබූ බව ද නිරීක්ෂණය නොවීය.

## හින්දු සංස්කෘතික අරමුදල

**ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්නායක**

2024 වර්ෂය තුළ හින්දු කෝවිල්, දහම් පාසැල් සහ විවිධ ආයතන සඳහා රු.මිලියන 12.80ක ආධාර ලබාදීම සිදු කර තිබුණද ප්‍රතිලාභීන් තෝරා ගැනීමට අදාළව නිර්ණායක කිසිවක් විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එම ප්‍රතිලාභීන් තෝරා ගත්තේ කුමන පදනමකින්ද යන්න හා වැය කිරීමේ නිවැරදිතාවය පිළිබඳව විගණනයේදි සහතික විය නොහැකි විය.

## සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

**ජෝන් ද සිල්වා සමරු රඟහල**

ජෝන් ද සිල්වා සමරු රඟහල අදියර දෙකක් යටතේ නවීකරණය කිරීමට කටයුතු කිරීමට සැලසුම් කර 2013 වර්ෂයේ සිට වැඩ ආරම්භ කර තිබූ අතර අදියර I යටතේ අදාළ කොන්ත්‍රාත්කරු විසින් වසර 03ක කාල ප්‍රමාදයක් සහිතව එනම් 2018 නොවැම්බර් 24 දින ඉදිකරන ලද ගොඩනැඟිල්ල භාර දී තිබුණි. තවද, කොන්ත්‍රාත්කරු ගෙන් ප්‍රමාද ගාස්තු ලෙස අයකරන ලද රු.මිලියන 38.66ක මුදල නිසි අනුමැතියකින් හා සාධාරණ කරුණු තහවුරු කර ගැනීමකින් තොරව එම ප්‍රමාද ගාස්තුව කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු අතර, එම මුදල නැවත ආයතනයට ගෙවන ලෙස 2021 මැයි 10 දින කොන්ත්‍රාත්කරුට දැනුම් දී තිබුණ ද 2024 දෙසැම්බර් 31 දින වන විටත් එම මුදල ආපසු ඔහුගෙන් අය කරගෙන නොතිබුණි.

**චිත්‍ර සංරක්ෂණය හා වැඩමුළු පැවැත්වීම**

මිල කල නොහැකි උරුමයන් ප්‍රවර්ධනය හා සංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ චිත්‍ර සංරක්ෂණය හා වැඩමුළු පැවැත්වීම සඳහා 2024 වර්ෂයේ දී රුපියල් මිලියනයක ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණද වර්ෂය තුළ කිසිදු වැඩසටහනක් පවත්වා නොතිබුණි.

**විශ්ව කෝෂය සම්පාදනය**

විශ්ව ඥානය සිංහල භාෂාවෙන් සැපයීමේ අවශ්‍යතාව සපුරාලනු වස් සම්පාදනය කිරීමට ඉලක්කගත විශ්ව කෝෂ කාණ්ඩ ප්‍රමාණය 20ක් වූ අතර 2014 වර්ෂය වන විට කාණ්ඩ 14ක් පමණක් නිකුත් කර තිබූ අතර අවසන් කාණ්ඩය නිකුත් කර වසර 9ක් ඉකුත් වී තිබුණද ඊළඟ පොත් කාණ්ඩ 6 මේ දක්වා නිකුත් කර නොතිබුණි.

## ශ්‍රී ලංකා කලා මණ්ඩලය

**වීඩියෝ වැඩසටහන් සකස් කිරීම**

අවශ්‍ය පාර්ශවයන් දැනුවත් කිරීමේ අරමුණින් රයිගම් කෝරලයේ උරුමය පිළිබඳ වැඩසටහන, "හෙළ වෙදකම කුරුණෑගල දිස්ත්‍රික්කය" පිළිබඳ වැඩසටහන හා "කිතුල" වාර්තාමය වැඩසටහන් සඳහා 2024 වර්ෂයේ දී එකතු වටිනාකම රු.මිලියන 1.44ක පිරිවැයක් දරමින් වීඩියෝ පට නිපදවා තිබුණද, විගණන දිනය වූ 2025 මාර්තු 28 දින දක්වාම ඒවා විකාශය කිරීමට කටයුතු කර නොතිබුණි.

## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

**පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂා කිරීම හා ලේඛනගත කිරීමට කටයුතු නොකිරීම**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණු අතර සමස්ත පුරාවිද්‍යා උරුමය ආරක්ෂණය කිරීම හා පුරාවිද්‍යාත්මක උරුමය ලේඛනගත කිරීම ඇතුළත්ව ඇති නමුත්, 2019 ජනවාරි 01 දින සිට 2024 සැප්තැම්බර් 30 දින දක්වා දිවයින පුරා විසිරී පවතින ශිලා ලේඛන 275 අතුරින් 110ක් පිටපත් කර කියවා ප්‍රකාශයට පත්කර නොතිබුණි.

## ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

**කෞතුක භාණ්ඩ එකතු කළමනාකරණ ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් නොකිරීම**

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් කෞතුක භාණ්ඩ එකතු කළමනාකරණ ප්‍රතිපත්තියක් 2024 දෙසැම්බර් මාසය දක්වාත් ප්‍රකාශයට පත් කර නොතිබුණි.

**කෞතුක භාණ්ඩ සොරකම**

කොළඹ ජාතික කෞතුකාගාරයේ 2012 මාර්තු 16 දින සිදු වූ ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 4.44ක් වූ කෞතුක භාණ්ඩ 221ක් සොරකම් කිරීම සිදුවී 2024 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 12ක කාලයක් ගත වී පැවති නමුත්, අදාළ වුදිතයන්ට නිතිපති දෙපාර්තමේන්තුව විසින් චෝදනා ගොනුකොට නොමැති වීම හේතුවෙන් මේ දක්වාත් නඩු කටයුතු අවසන් කිරීමට නොහැකි වී තිබුණි.

## ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

**ඩිජිටල් කෝෂ්ඨාගාරයක් පිහිටුවීම**

විශ්වාසදායික ඩිජිටල් කෝෂ්ඨාගාරයක් පිහිටුවීම සඳහා 2021 අප්‍රේල් 20 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණු අතර, 2024 වර්ෂයේ රු.මිලියන 120 ක ප්‍රතිපාදන මේ සඳහා වෙන් කර තිබුණි. Atom හා Archivematica යන මෘදුකාංග ස්ථාපිත කිරීමට හා නඩත්තුව සඳහා විදේශීය වෘත්තීය සමාගමක් තෝරා ගැනීමටත්, සර්වර් පරිගණක හා ධාරිතාව ලබා ගැනීමටත්, අමාත්‍ය මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කිරීමටත් 2024 අගෝස්තු 28 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණය කර තිබුණු නමුත් 2024 දෙසැම්බර් 31 දක්වා ඒ සඳහා කටයුතු කර නොතිබුණි.

## ටවර් හෝල් රඟහල පදනම

**පදනම ස්වයං මූල්‍ය උත්පාදන ආයතනයක් බවට පත්කිරීම**

2024 ජුලි 16 දිනැති අමාත්‍ය මණ්ඩල ඒකාබද්ධ සංදේශයට අදාලව ලබා දුන් අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වහාම ගොඩනැගිලි පරිශ්‍රයෙන් ඉවත්වීම, ගෙවිය යුතු හිඟ කුලී මුදල වූ රු.මිලියන 145ක් වහාම ගෙවීම හා ටවර්හෝල් රඟහල පදනම 2027 වර්ෂයේ සිට ස්වයං මූල්‍ය උත්පාදන ආයතනයක් බවට පත්කිරීම ආදී තීරණ ගෙන තිබුණි. එහෙත් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරි කාර්යාලය 2024 දෙසැම්බර් 31 දක්වාම සව්සිරිපාය ගොඩනැගිලි පරිශ්‍රයෙන් ඉවත්වී නොතිබුණි. තවද, උක්ත කැබිනට් තීරණය ප්‍රකාරව අයකරගත යුතු හිඟ කුලී මුදල් වූ රු.මිලියන 145න් 2024 වර්ෂය තුලදී රු.මිලියන 25ක් පමණක් අය කරගෙන තිබුණි.

## ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය

**බඳවා ගැනීමේ පටිපාටියක් නොවීම**

2024 දෙසැම්බර් 31 දිනට ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය ආරම්භ වී වසර 36ක් ගතව ඇතත් මධ්‍යස්ථානයේ සේවක මණ්ඩලය සඳහා බඳවා ගැනීම් පටිපාටියක් සකස් කර අනුමත කරවාගෙන නොතිබුණි.

**ජේ. ආර්. ජයවර්ධන තොරතුරු මධ්‍යස්ථානය නමින් සමාගමක් පිහිටුවීම**

1996 ජනවාරි 19 දින අංක 7 දරන පාලක මණ්ඩල රැස්වීමේ නියෝග අංක 02 යටතේ ජේ.ආර්.ජයවර්ධන තොරතුරු මධ්‍යස්ථානය නමින් සමාගමක් පිහිටුවීම සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබා දී තිබූ අතර, ඒ අනුව සීමිත පෞද්ගලික සමාගමක් ලියාපදිංචි කර තිබුණි. එකී සමාගමට ආරම්භක ප්‍රාග්ධනය ලෙස ජයවර්ධන කේන්ද්‍රය මඟින් රු.මිලියන 5ක මුදලක් ලබාදී ඒ වෙනුවට සමාගමෙන් එකක් රු.10 බැගින් වූ කොටස් මිලියන 0.5ක් ලබාදී තිබුණි. එසේ වුවද, මේ සඳහා පාලක මණ්ඩල අනුමැතියක් ලැබී නොතිබුණි. එම මුදලින් විවෘත කළ පෞද්ගලික වාණිජ බැංකු ගිණුම 2008 වර්ෂයේදී වසා දමා තිබූ අතර, වසා දමන ලද දින දක්වා විවිධ අවස්ථාවලදී ප්‍රේෂණය කර තිබූ මුදල්ද ඇතුළුව රු.මිලියන 7.5ක් ගණුදෙනු සිදුකර තිබුණද ඒවා කුමක් සඳහා භාවිතා කළේ ද යන්න තොරතුරු නොවීය. එකී සමාගම වසා දැමීම හේතුවෙන් ආයතනයට ලැබිය යුතු රු.මිලියන 5ක මුදලින් රු.මිලියන 0.7ක් පමණක් ආපසු  ගෙවා තිබූ අතර ඉතිරි මුදල 2024 දෙසැම්බර් 31 දින දක්වාම අය කරගෙන නොතිබුණි.

**ඉඩමේ අයිතිය පවරා නොගැනීම**

මධ්‍යස්ථානය පිහිටි රූඩ් 3 පර්චස් 4.47ක් වූ ඉඩම, 1988 වසරේ මධ්‍යස්ථානය ආරම්භයේ සිටම පරිහරණය කර තිබුණද ඉඩමේ අයිතිය මධ්‍යස්ථානයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## චිත්‍රපට සංවර්ධන අරමුදල

**ලැබිය යුතු ආදායම්**

2024 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවෙන්, අරමුදලට ලැබිය යුතු කුලී දායකත්වය රු.මිලියන 26.62ක්ද, චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේ ආදායමින් ලැබිය යුතු රු.මිලියන 3.53ක්ද, ඇතුළු එකතුව  රු.මිලියන 30.15ක් වූ  ශේෂයෙන් රු.මිලියන 23.29ක් වසර 05 ඉක්මවා තිබුණද කළමනාකරණය විසින් මෙම මුදල් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද ඉදිරියේදී රූපවාහිනී මාධ්‍ය හරහා චිත්‍රපට ප්‍රදර්ශනය කර ආදායම් ඉපයීමට කටයුතු කරන බවට පිළිතුරු ලෙස දක්වා තිබුණ ද 2024 වර්ෂයේදී එසේ කර නොතිබුණි.

## ජාතික චිත්‍රපට සංස්ථාව

**සේ.අ.අ. හා සේ.භා.අ. දායකත්ව නියමිත පරිදි නොගෙවීම**

සංස්ථාවේ සේවක අර්ථ සාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් සඳහා වූ දායක මුදල් ගෙවීම් කිරීමේදී  නියමිත පරිදි නොගෙවීම හේතුවෙන් රු.මිලියන 12.21ක අධිභාරයක් ගෙවීම් කර තිබුණි.

**ලැබිය යුතු  මුදල්**

2024 දෙසැම්බර් 31 දිනට වසර 25කට අධික කාලයක් තුල චිත්‍රපට නිෂ්පාදනයට සහ සිනමාශාලා සඳහා ලබාදී ඇති ණය මුදල්වලින් එකතුව රු.මිලියන 88.38ක් සහ සිනමා ශාලාවලින් සංස්ථාවට ලැබිය යුතු හිඟ මුදල් ඇතුළුව  එකතුව රු.මිලියන 476.8ක මුදලක් සංස්ථාව වෙත ලැබිය යුතුව තිබුණි. එම මුළු ලැබිය යුතු මුදලින්     රු.මිලියන 360.97ක් අධිභාර සහ හානිකරණ ලෙස ගලපා තිබීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට අය කරගෙන නොතිබුණි.

**සංස්ථා පරිශ්‍රය තුළ කෞතුගාරයක් ඉදිකිරීම**

ආචාර්ය "ලෙස්ටර් ජේම්ස් පීරිස්" මහතා නමින් සංස්ථා පරිශ්‍රය තුළ කෞතුකාගාරයක් සහ පුස්තකාලයක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත එකතු වටිනාකම රු.මිලියන 99.96කට ඉදිකිරීම් සහ උපදේශනාත්මක කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ලබා දී තිබුණු අතර 2019 අප්‍රේල් 05 දින එහි ඉදිකිරීම් ආරම්භ කර තිබුණි. නාගරික සංවර්ධන අධිකාරියේ සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් රහිතව  ආරම්භ කළ මෙම ඉදිකිරීම වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.මිලියන 3.13ක් ගෙවීම් කර තිබුණු නමුත් ඉදිකිරීම් අතරමඟ නතර කර තිබුණි.

**පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීමේ ප්‍රමාදය**

චිත්‍රපට ආනයනය, බෙදාහැරීම හා ලියාපදිංචිය විධිමත් කිරීමට අදාළ පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීමේ කාර්යය සඳහා රු.මිලියන 15ක ප්‍රතිපාදනයක් යටතේ 2021 මාර්තු මස ආරම්භ කර ඔක්තෝබර් වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණද, 2025 මැයි 30 දින වන විටද පරිගණක පද්ධතිය ස්ථාපිත කර නොතිබූ අතර රු. මිලියන 7.32ක් ගෙවීම් කර තිබුණි.

## මධ්‍යම සංස්කෘතික අරමුදල

අරමුදල් පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව අරමුදලේ පරිපාලනය කළමනාකරණය සහ පාලනය පාලක මණ්ඩලයට පැවරී තිබුණද එම

පාලක මණ්ඩලය පසුගිය වර්ෂ 03 තුළ පවත්වා තිබූ රැස්වීම් ගණන 06ක් විය. ඒ අනුව අරමුදලෙහි අරමුණු ඵලදායී හා කාර්යක්ෂම ලෙස ඉටුකර ගැනීමට බාධාවක් වී තිබුණි.

## මහා භාරකාර දෙපාර්තමේන්තුව

මහා භාරකාර දෙපාර්තමේන්තුව යටතේ පවතින පෞරාණික වටිනාකමකින් යුතු කළුතර පළාතොට පිහිටි රිච්මන්ඩ් කාසල් ගොඩනැගිල්ල නිසි කාලය තුල විධිමත් පරිදි නඩත්තු කටයුතු සහ අළුත්වැඩියාවන් සිදුකර නොතිබීම හේතුවෙන් වහලයෙන් ජලය කාන්දු වී බිත්තිවලට හානි සිදු වී තිබීම හේතුවෙන් අළුත්වැඩියාවන් සිදු කිරීම සඳහා 2023 අගෝස්තු මාසයේදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් තත්ත්ව වාර්තාවක් ලබාගෙන තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විටද අළුත්වැඩියා කටයුතු සිදුකර නොතිබුණි.

## අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල

**කාර්ය මණ්ඩලය**

2009 අංක 44 දරන අම්බුළුවාව ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල් පනතේ 6(2)(1)(ඊ) වගන්තිය අනුව කාර්ය මණ්ඩලය හා ඔවුන් බඳවා ගැනීම සම්බන්ධ රීතීන් අනුමත කර ගෙන විධිමත් සංවිධාන ව්‍යුහයක් හා විධිමත් පරිදි කාර්යය මණ්ඩලයක් බඳවා ගැනීමට අරමුදල ආරම්භ කර වසර 15ක් යනතුරුත් කටයුතු කර නොතිබුණි.

**අරමුණුවලට පටහැනි ක්‍රියාකාරම්**

අරමුදල ස්ථාපිත පනතේ අරමුණු අනුව මෙම සංකීර්ණය ආගමික මධ්‍යස්ථාන ආරක්ෂා කිරීම, ආගමික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම අරමුණු ලෙස හඳුනාගෙන තිබුණද, 2024 වර්ෂය තුළ සංකීර්ණය ආශ්‍රිතව බියර් කවුන්ටරයක් ආරම්භ කිරීම වෙනුවෙන් වියදම් දරා තිබීමෙන් භාරයේ අරමුණට පටහැනිව කටයුතු කර තිබුණ බව නිරීක්ෂණය විය.

**අතරමග නවතා ඇති ව්‍යාපෘති**

ශක්‍යතා අධ්‍යයන වාර්තා, සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීමෙන් තොරව සංකීර්ණය තුළ ශෛලමය බුදු පිළිමයක් නෙළීම, වාහන නැවතුම්පල 02ක් ඉදි කිරීම සහ Tree Top ව්‍යාපෘතිය ආරම්භ කිරීම

වෙනුවෙන් එකතුව රු. මිලියන 10.31ක් වැය කර තිබුණද, 2022 වර්ෂය වනවිට ඒවායේ ඉදි කිරීම් අතරමග නවතා දමා තිබුණු අතර, 2024 වර්ෂය අවසන් වන විටත් ඉදි කිරීම් කටයුතු නැවත ආරම්භ කර නොතිබුණි.

**අවිධිමත් ප්‍රසම්පාදන කටයුතු**

2023 ජනවාරි 16 දින ප්‍රසම්පාදන කැඳවා ඊට මාස 07කට පසු එනම්, 2023 අගෝස්තු 16 දින සමාගම් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි කරන ලද සමාගමකට පරිගණක පද්ධතිය කළමනාකරණය කිරීම සඳහා පැවරීම් කර 2024 වර්ෂය තුළ රු.මිලියන 20.01ක් ගෙවීම් කර තිබුණි.

**කේබල් කාර් ව්‍යාපෘතිය**

2023 ජූනි 10 දින පවත්වන ලද භාරකාර මණ්ඩල රැස්වීමේදී රු.බිලියන 1.2ක ඇස්තමේන්තුවක් අනුව කේබල් කාර් ව්‍යාපෘතියක් ඉදිකර පවත්වාගෙන යාමට වෙනමම සමාගමකට බදු දීමටත්, ඇස්තමේන්තු මුදලින් සියයට 16ක් භාරය විසින් දැරීමටත් තීරණය කර තිබුණු අතර, ප්‍රසම්පාදන කැඳවීමකින් තොරව භාරකාර මණ්ඩල රැස්වීම පවත්වා දින 06කට පසු එනම් 2023 ජූනි 16 දින ලියාපදිංචි කළ සමාගමක් සමඟ ව්‍යාපෘතිය ඉටු කිරීමට ගිවිසුම්ගත වී තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂය තුළදී වවුචර් 19ක් මඟින් එකතුව රු.මිලියන 93.15ක් ගෙවා තිබුණු අතර, එය කුමන කාර්යයකටද යන්න සනාථ කර ගැනීමට ගෙවීම් වවුචරය සමඟ උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීය. කේබල් කාර් ව්‍යාපෘතියේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 250.36ක ඇස්තමේන්තුවක් පිළියෙල කර එයින් සියයට 37ක මුදලක් මේ වන විට භාරයෙන් වැයකර තිබුණු බව නිරීක්ෂණය විය.

## මහනුවර ඇසළ පෙරහැර භාරය

**වාර්ෂික අයවැය ලේඛනය**

2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF/423 හි 4.1 (අ) ඡේදය හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020 ජූලි 16 දිනැති ලිපිය අනුව අරමුදලේ අරමුණුවලට අනුකූලව පිළියෙල කරන ලද වාර්ෂික අයවැය ලේඛනය එහි පාලන අධිකාරිය සහ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ඊට පෙර වර්ෂයේ සැප්තැම්බර් 15 දිනට පෙර අදාළ ගරු අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන සැප්තැම්බර් 30 දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කිරීමකින් තොරව 2024 වර්ෂයේ රු.මිලියන.15.99 ක් වැයකර තිබුණි.

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනතේ 06 (ඈ) වන වගන්තිය අනුව ඇසළ පෙරහැරේදී උපයෝගි කර ගැනීමට අවශ්‍ය භාණ්ඩ නිෂ්පාදනය කිරීම සම්බන්ධව වැඩපිළිවෙලක් භාරය විසින් ක්‍රියාත්මක කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

# මූල්‍ය කටයුතු

## 1. රාජ්‍ය ආදායම

පාර්ලිමේන්තුව විසින් අනුමත කළ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව වසර වෙනුවෙන් රු.බිලියන 4,127ක රාජ්‍ය ආදායමක් අපේක්ෂා කර ඇත. එය 2023 වර්ෂයේ රජයේ ආදායම් ඇස්තමේන්තුව වූ රු බිලියන 3,408 හා සැසඳීමේ දී සියයට 21.1 කින් හෙවත් රු.බිලියන 719කින් ඉහළ නංවා රාජ්‍ය ආදායම් ඇස්තමේන්තු සකස් කර තිබුණි.

### දළ දේශීය නිෂ්පාදිතය

2024 වර්ෂය සඳහා දළ දේශීය නිෂ්පාදිතය රු.බිලියන 29,899ක් වූ අතර 2023 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතය වූ රු.බිලියන 27,586 හා සැසඳීමේ දී සියයට 8.38කින් එනම් රු.බිලියන 2,313කින් වැඩි වී තිබුණි.

### ආදායම් ඇස්තමේන්තුකරණය

පාර්ලිමේන්තුව විසින් අනුමත වර්ෂය සඳහා වන මුල් ආදායම් ඇස්තමේන්තු අනුව රු.බිලියන 4,127ක ආදායමක් අපේක්ෂා කර තිබූ අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තා සහ රාජ්‍ය මුදල් අමාත්‍යාංශයේ දත්ත අනුව රැස්කළ මුළු ආදායම රු.බිලියන 4,091ක් වී තිබුණි. ඒ අනුව ආදායමේන් සියයට 99 කට වඩා වැඩි අගයකින් ආදායම් ඇස්තමේන්තුව කරා ළඟා වීමට හැකි වී තිබුණි.

### පොළී ගෙවීම

අයවැය කාර්යසාධනය හා හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රකාශය අනුව වර්ෂයේදී රැස්කරන ලද රු.බිලියන 4,091ක් වූ රජයේ ආදායමෙන් රු.බිලියන 2,690ක් හෙවත් සියයට 65.7ක් රාජ්‍ය ණය පොළී ගෙවීම සඳහා භාවිතා කිරීමට සිදු වී තිබුණි. එය රජයේ සම්පූර්ණ ආදායමට (රු.බිලියන 4,091) සාපේක්ෂව ගණනය කර ඇත. කෙසේවෙතත්, මෙම ඉහළ ප්‍රතිශතය ශ්‍රී ලංකාවේ ණය අර්බුදයේ ගැඹුර සහ රජයේ මූල්‍ය ක්‍රියාකාරීත්වයට ඇති අභියෝග පෙන්නුම් කරයි.

### හිඟ ආදායම් ශේෂය

ආදායම් රැස්කරන ප්‍රධාන ආයතන කිහිපය අතරින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1,216,591ක හිඟ ආදායම් ශේෂයක් පැවතුණි.

## රාජ්‍ය ආයෝජන

පසුගිය දශක දෙදකට අධික කාලයක් තුළ පුනරාවර්තන වියදම හෝ පියවා ගැනීමට ප්‍රමාණවත් ආදායමක් රැස්කර ගැනිමට අපොහොසත් වී ඇතත් 2006- කාලය තුළ රාජ්‍ය ණය මඟින් රු.බිලියන 10,936ක ආයෝජනයන් සිදු කර තිබු අතර  වර්ෂය තුළ පමණක් රු.බිලියන 791ක රාජ්‍ය ආයෝජන සිදු කර තිබුණි.

## ආදායම් ඇස්තමේන්තු කිරිම

ඇතුළු වර්ෂ 5ක දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, මෝටර් රථ දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව යන ආයතනයන් හි සංශෝධිත ඇස්තමේන්තුගත ආදයම් හා රැස්කළ තත්‍ය ආදායම පහත පරිදි වේ.

**වගු අංක 2.1 - ඇතුළු වර්ෂ 5ක දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, මෝටර් රථ දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව යන ආයතනයන් හි සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම් හා රැස්කළ තත්‍ය ආදායම (රු. මිලියනවලින්)**

| වර්ෂය | 2020 | | 2021 | | 2022 | | 2023 | | 2024 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආයතනය | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ තත්‍ය ආදායම | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ තත්‍ය ආදායම | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ තත්‍ය ආදායම | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ තත්‍ය ආදායම | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ තත්‍ය ආදායම |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 575,403 | 511,190 | 612,615 | 619,715 | 1,131,012 | 1,045,189 | 1,761,984 | 1,832,274 | 2,740,443 | 2,605,027 |
| ශ්‍රී ලංකා රේගුව | 634,560 | 566,463 | 553,053 | 522,419 | 513,341 | 523,346 | 628,054 | 694,082 | 819,822 | 869,846 |
| මෝටර් රථ දෙපාර්තමේන්තුව | 8,445 | 9,027 | 7,002 | 7,709 | 6,130 | 7,928 | 13,150 | 15,262 | 15,530 | 17,532 |
| සුරාබදු දෙපාර්තමේන්තුව | 130,035 | 121,028 | 140,035 | 138,674 | 185,036 | 165,227 | 182,000 | 171,273 | 232,000 | 214,584 |
| **එකතුව** | **1,348,443** | **1,207,708** | **1,312,705** | **1,288,517** | **1,835,519** | **1,741,690** | **2,585,188** | **2,712,891** | **3,807,795** | **3,706,989** |

**මූලාශ්‍රය:- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, මෝටර් රථ දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව යන ආයතනවල ආදායම් ඇස්තමේන්තු හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන**

# විගණන නිරීක්ෂණ

## දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**සෘජු හා වක්‍ර බදුවල යෝග්‍ය මිශ්‍රණය ලබා කරගැනීමේ අවශ්‍යතාව**

ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති සම්පාදනය තුළ රජයේ මුළු ආදායම කෙරෙහි බලපාන සෘජු හා වක්‍ර බදුවල යෝග්‍ය මිශ්‍රණය ලෙස 60: 40 ඉලක්ක කෙරෙන අතර වසර සඳහා සිදු කළ ආදායම් ඇස්තමේන්තුව තුළ සෘජු බදු ආදායම දළ වශයෙන් සියයට 40 හා වක්‍ර බදු ආදායම සියයට 60 ක් ලෙස පැවතුණි. මේ අනුව රජයේ බදු එකතුකිරීමේ යෙදෙන ප්‍රධාන දෙපාර්තමේන්තුව වන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට මෙම යෝග්‍ය බදු මිශ්‍රණය කරා ළඟා වීම තවදුරටත් අභියෝගාත්මක තත්ත්වයක පවතින අතර, මෙම යෝග්‍ය මිශ්‍රණය කරා ළඟා වීම කෙරෙහි ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය යොමු කිරීමට දෙපාර්තමේන්තුව තවදුරටත් ක්‍රියා කළ යුතු බව නිරීක්ෂණය කෙරේ.

**හිඟ ආදායම**

රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 128 (2)(ඇ) ඡේදය ප්‍රකාරව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අර්ධ වාර්ෂික හිඟ බදු වාර්තා පිළිවෙලින් ජූලි 31 හා ඊළඟ මුදල් වර්ෂයේ ජනවාරි 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව 2024 වර්ෂය ඇතුළුව පසුගිය වර්ෂ 5ක හිඟ ආදායම පිළිබඳ විස්තර විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව පරිදි පහත දැක්වේ.

**වගු අංක 2.2 - Legacy හා RAMIS පද්ධති අනුව 2024 වර්ෂය ඇතුළුව පසුගිය වර්ෂ 5 ක විස්තර**

| වර්ෂය | රැස් කළ ආදායම රු. මිලියන | 2024 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම රු. මිලියන |
|---|---|---|
| 2020 | 511,190 | 56,722 |
| 2021 | 619,715 | 619,726 |
| 2022 | 1,045,189 | 904,342 |
| 2023 | 1,832,274 | 1,066,789 |
| 2024 | 2,605,027 | 1,150,004 |

මූලාශ්‍ර - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**අත්හිටවූ බදු, දඩ හා පොළී**

දෙපාර්තමේන්තුව විසින් එක් රැස් කර ගත යුතු සමස්ථ හිඟ බදු, දඩ හා පොළී ආදායමෙන් සියයට 84.72කට එනම් රු.මිලියන 974,307ක් තාවකාලිකව අත්හිටවූ බදු, දඩ හා පොළී ලෙස හඳුනාගෙන තිබුණි. RAMIS පරිගණක පද්ධතියට අදාළව, 2024 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ බදු, දඩ හා පොළී වටිනාකම වන රු.මිලියන 961,921න් සියයට 85.74ක් එනම්, රු.මිලියන 824,835ක් අයකිරීම් තාවකාලිකව අත්හිටවූ බදු, දඩ හා පොළී ලෙසත් රු.මිලියන 137,086ක් එනම් සියයට 14.26ක් අය කර ගත හැකි හිඟ බදු හා දඩ ලෙසත් හඳුනාගෙන තිබුණි. එම අගයන් Legacy පරිගණක පද්ධතියට අනුව, 2024 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ බදු හා දඩ වටිනාකම වන රු.මිලියන 188,082න් රු.මිලියන 149,471ක් එනම්, සියයට 79.47ක් අය කිරීම් තාවකාලිකව අත්හිටවූ බදු හා දඩ විය.

සමස්ථ හිඟ බදු, දඩ හා පොළී ආදායමෙන් සැලකිය යුතු ඉහළ වටිනාකමක් තාවකාලිකව අත්හිටවූ බදු, දඩ හා පොළී ලෙස පැවතීමත් එමගින් අපේක්ෂිත බදු ආදායම දෙපාර්තමේන්තුවට අයවීම, අභියාචනා ක්‍රියාවලිය විසඳීම මත තීරණය වන කරුණක් බැවින් එම බදු , දඩ හා පොළී මුදල් අයවිය යුතු බව හෝ අයවීමට හිඟ බද්දක් නොමැති බව තීරණය වීම සඳහා සැලකිය යුතු කාල සීමාවක් ගත වන බව නිරීක්ෂණය විය.

**RAMIS පද්ධතියේ කාර්යසාධනය**

2024 ජනවාරි 31 දක්වා වසර 03කට සිංගප්පූරු ඩොලර් 21,053,371කට (රු.මිලියන 3,155 ක් පමණ) නඩත්තු සේවා කොන්ත්‍රාත්තුව සිංගප්පූරු සහයෝගිතා ආයතනයේ උපකොන්ත්‍රාත් කරුවකු වෙත ලබා දී තිබුණු අතර එම කාලය අවසන් වීමට ප්‍රථම පද්ධතියේ නඩත්තු කටයුතු දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් නැවතත් 2024 පෙබරවාරි සිට 2027 ජනවාරි දක්වා වසර 3කින් දීර්ඝ කිරීමට 2024 සැප්තැම්බර් 13 වන දින ගිවිසුම් ගත වී ඇති අතර ගිවිසුම් වටිනාකම සිංගප්පූර් ඩොලර් (SGD) 31,808,289ක් (රු.මිලියන 7,315ක් පමණ) බව නිරීක්ෂණය විය.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සිංගප්පූරුවේ ආයතනය සමඟ එළඹ ඇති උක්ත ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ලබාදී නොමැති බැවින් RAMIS පද්ධතියට අදාළ මුදල් ගෙවීම්

අදාළ ගිවිසුම් ප්‍රකාරව සිදුවී ඇති ද යන්න විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

තවද, අදියර 4ක් යටතේ ආයතන 29ක් RAMIS පද්ධතියට සම්බන්ධ කළ යුතු වුවත් ශ්‍රී ලංකා රේගුව, මහජන බැංකුව, ලංකා බැංකුව, මුදල් අමාත්‍යාංශය, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, ලංකා ක්ලියර් පුද්ගලික සමාගම සහ මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව යන ආයතන 07 පමණක් දැනට සම්බන්ධ කර තිබුණි. විවිධ ගැටළු පැවතීම හේතුවෙන් ඉතිරි ආයතන මෙතෙක් සම්බන්ධ කර නොමැති අතර එම ආයතනයන්හි තොරතුරු මාර්ගගත ක්‍රමය යටතේ RAMIS පද්ධතියට ලබා ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

**ඉඩම් පවරා ගැනීම**

2007 සැප්තැම්බර් 12 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ අංක අම්ප/07/1625/342/021 හා 2007 සැප්තැම්බර් 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කොළඹ 12, ශ්‍රී සංඝරාජ මාවතේ පිහිටි ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට අයත් ඉඩමකින් පර්චස් 100ක බිම් කොටසක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පැවරීමට අදාළව ගිවිසුමකට එළඹීමෙන් තොරව රුපියල් මිලියන 50 ක අත්තිකාරම් මුදලක් ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට ගෙවා තිබුණු අතර මෙම ගනුදෙනුව සම්බන්ධයෙන් මෙතෙක් ගිණුම් මඟින් හෙළිදරව් කිරීම් සිදුව නොතිබුණි. තවද උක්ත ඉඩම කාර්යාල සංකීර්ණයකට සුදුසු නොවන බව තීරණය කර තිබූ අතර එම මුදලට හිලව් කිරීමක් ලෙස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව සතු කළුතර නාගරික බල ප්‍රදේශයේ පිහිටි ඉඩමක් දෙපාර්තමේතුව වෙත පවරා දීම පිළිබඳ සාකච්ඡා සිදුකල ද ගැටලුව සඳහා සාධනීය විසඳුමක් කරා එළඹීමට මෙතෙක් අපොහොසත්ව තිබුණි.

**නොනිමි වැඩ**

මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම සම්බන්ධයෙන් 2018 දෙසැම්බර් 31 දින කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය විසින් වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018 සමඟ නිකුත් කර ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශය ප්‍රකාරව, කෙරීගෙන යන ඉදිකිරීමක මෙතෙක් දරා ඇති සම්පූර්ණ වියදම කෙරීගෙන යන වැඩ වශයෙන් ගිණුම්ගත කළ යුතු බව දක්වා ඇත. එහෙත් දේශීය ආදායම්

දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ පිහිටි රු. මිලියන 176 ක මූලික ඇස්තමේන්තුවක් යටතේ ඉදිකෙරෙමින් පවතින මේ වන විට උපයෝජනය කළ හැකි මට්ටමට පත් නොකර ඉදිකිරීම් නවතා ඇති වාහන අංගනය වෙනුවෙන් මෙතෙක් දරා ඇති මුදල්, කෙරීගෙන යන ඉදිකිරීම් වශයෙන් ගිණුම් ගත කර නොතිබුණි. අංගනයේ වර්තමාන තත්ත්වය නිරීක්ෂණය කිරීමේදී , එය දැඩි ලෙස දිරාපත් වී හා අබලි වී ඇති බව නිරීක්ෂණය විය.

**නිෂ්කාර්ය වත්කම්**

ගොඩනැගිල්ල නවිකරණයේදී දෙපාර්තමේන්තුව වෙත සපයා තිබුණු ට්‍රාන්ස්පොමර් යන්ත්‍ර 02ක ප්‍රධාන විදුලි පද්ධතියට සම්බන්ධ කර නොතිබීම නිසා එම යන්ත්‍ර 2010 වර්ෂයේ සිටම භාවිතයට ගෙන නොතිබුණු අතර, මේ වන විට වර්ෂ 15 කට ආසන්න කාලයක් නිශ්ක්‍රියව පැවත තිබුණි.

**CCTV කැමරා පද්ධතිය භාවිතා නොකිරීම**

දෙපාර්තමේන්තුවේ CCTV කැමරා පද්ධතිය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ අධීක්ෂණය යටතේ පෞද්ගලික ආයතනයක් විසින් සම්පූර්ණ කර 2010 මැයි මසදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට භාර දී තිබුණු අතර ඒ වන විටද අවුරුද්දක වගකීම් කාලය ඉක්ම ගොස් තිබුණි. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් එය දෙපාර්තමේන්තුව වෙත විධිමත්ව භාර දී තිබූ බවට තහවුරු කල හැකි සාක්ෂි ඉදිරිපත් වී නොතිබූ අතර, මේ වන තුරු භාවිතයට ගෙන නොතිබුණු CCTV කැමරා 70 ක් ක්‍රියාකාරී තත්වයේද නොපැවති අතර මේ සඳහා දරන ලද පිරිවැය අදාළ ලිපිගොනු අනුව රු. මිලියන 7.98 ක් වී තිබුණි.

## ශ්‍රී ලංකා රේගුව

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ආරම්භය ක්‍රි.ව 1806 දක්වා දිවෙන අතර "ශක්තිමත් දේශසීමාවක් හරහා ආරක්ෂිත හා සමෘද්ධිමත් දේශයක්" යන දැක්ම සහ "ආදායම සුරක්ෂිත කිරීමත්, පරිසරය හා සමාජය ආරක්ෂා කිරීමටත් බාධක රහිත වෙළඳ ප්‍රවාහයක් මෙන්ම සංචාර ප්‍රවර්ධනය කිරීමටත් සුපිළිපන්නභාවය සහ වෘත්තීයභාවය සහිත ලොව පළමු පෙළේ රේගු සේවාවක් සැපයීම" යන මෙහෙවර පෙරදැරිව කටයුතු කරන ආයතනයකි. ස්වකීය අභිමතාර්ථ ලෙස ප්‍රධාන වශයෙන් ආදායම් උපරිම කිරීම, නීතිය බලාත්මක කිරීම, වෙළඳාම සඳහා පහසුකම් සැළසීම සහ සමාජ ආරක්ෂණය යන මූලික ක්ෂේත්‍ර කෙරෙහි සිය අවධානය යොමු කරමින් සිට 2028 දක්වා සිය උපාය මාර්ග සැලසුම් සකස් කර ඒ අනුව කටයුතු කරනු ලබයි.

**හිඟ බදු ආදායම්**

වර්ෂාවසානය වන විට රේගුවේ හිඟ හිටි බදු ආදායම රු. මිලියන 57,707ක් වූ අතර මෙම හිඟ බදු ආදායමෙන් රු.මිලියන 22,044 ක් හෙවත් සියයට 38.2 ක් ආනයන බදු වලින් සමන්විත වී තිබුණි.

**වගු අංක 2.3 - 2020 වර්ෂයේ සිට වර්ෂය දක්වා ආදායම් ලැබීම් හා සමුච්චිත හිඟ ආදායම් විස්තරය**

| වර්ෂය | මුලු ආදායම් ලැබීම (රු.මිලියන) | 2024 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම (රු.මිලියන) |
|---|---|---|
| **2020** | 566,463 | 63,459 |
| **2021** | 522,419 | 60,885 |
| **2022** | 523,346 | 61,254 |
| **2023** | 694,082 | 58,479 |
| **2024** | 869,846 | 57,707 |

**ඇඟිලි සලකුණු යන්ත්‍ර වාර්තා ඉදිරිපත් නොකිරීම**

2024 වර්ෂයේ දී ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් 2335ක් සේවයට වාර්තා කළ බව සනාථ කෙරෙන තහවුරු කිරීමේ සාක්ෂි වන ඇඟිලි සලකුණු යන්ත්‍ර වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි. ඒ අනුව රු.මිලියන 988ක් වූ අතිකාල ගෙවීම්වල නිවැරදිතාව තහවුරු කර ගැනීමට විගණනයේ දී නොහැකි විය.

**රේගු පරීක්ෂාවන් සිදු නොකිරීම සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග නොගැනීම**

**(i)** ප්‍රකාශ නොකරන ලද හා අඩුවෙන් ප්‍රකාශ කරන ලද වාහන අමතර කොටස් හා උපාංග ඒකක 609ක් හා ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුවේ බලපත්‍ර ලබා ගත යුතු පාවිච්චි කළ වාහන ආසන 122ක් හා ටයර් 18ක් අඩංගු බහලුමක් පරීක්ෂාවකින් තොරව නිදහස් කිරීමට කටයුතු කර තිබූ රේගු නිලධාරීන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**(ii)** විදේශීය පුද්ගලික ආයතනයක් විසින් නැවකින් නැවකට භාණ්ඩ මාරු කිරීමේ ක්‍රමය යටතේ (Transshipment) සිංගප්පූරුවෙන් නැව්ගත කරනු ලැබූ දුම්වැටි තොගයකට අදාළව සිදු කරන ලද රේගු විමර්ශනයන්හි ප්‍රතිඵලයක් ලෙස දුම්වැටි තොගය

රාජසන්තක කර පසුව රු.මිලියන 5.90 කට වෙන්දේසි කර තිබුණි. එහෙත් උක්ත රාජසන්තක කිරීමට එරෙහිව ආනයනකරු පැවරූ නඩුවෙන් රේගුව වැරදිකරු වී රු. මිලියන 69.45 ක වන්දියක් ආනයනකරු වෙත ගෙවීමට සිදු වී තිබුණි. ඉහත පරිදි රජයට වූ අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඔවුන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර රජයට සිදුවූ අලාභ අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

**(iii)** නිවාරණ කාර්යයන්හිදි බැංකු ඇපකර මත ආනයනික භාණ්ඩ නිදහස් කල අවස්ථා 27ක දී, ඇපකරය වලංගු කාලය තුල පරීක්ෂණ අවසන් කිරීමට හෝ පරීක්ෂණ කාලය හා සමගාමීව බැංකු ඇපකර වලංගු කාලය දීර්ඝ කර නොගැනීම හේතුවෙන් එලෙස රු.මිලියන 100.17 ක බැංකු ඇපකර මත නිදහස් කල භාණ්ඩ සම්බන්ධයෙන් අයකල යුතු දණ්ඩන හා අභිමි කිරීම් අයකර ගැනීම අවිනිශ්චිත වී තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට උක්ත පරීක්ෂණ ආරම්භකර වසර 1 ½ සිට වසර 12ක් දක්වා කාල පරාසයක් ගත වී ඇතත් පරීක්ෂණ අවසන් කිරීමට හෝ පරීක්ෂණ අවසන් කරන තෙක් බැංකු ඇපකර වලංගුව තබා නොගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතුකර නොතිබුණි.

**දණ්ඩන හා අහිමි කිරීම් අය නොකිරීම**

ආනයන අපනයන ක්‍රියාවලියට සම්බන්ධ පාර්ශවයන් විසින් සිදු කර තිබූ විවිධ රේගු වැරදි සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව විසින් පනවා තිබූ දණ්ඩන හා අහිමි කිරීම් වටිනාකමින් රු.මිලියන 4800ක්, 2024 දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර උක්ත දණ්ඩන හා අහිමි කිරීම් මූල්‍ය ප්‍රකාශ තුළ හිඟ ආදායම් ලෙස ගිණුම්ගත කිරීමට ද කටයුතු කර නොතිබුණි.

**රේගු විමර්ශන මගින් රාජ්‍ය ආදායම ප්‍රමාණවත් පරිදි සුරක්ෂිත නොවීම**

රේගු වැරදි සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුවේ විවිධ අංශ මගින් සිදු කර ඇති රේගු පරීක්ෂණ 21ක දී ආනයනකරුවන්/අපනයනකරුවන් විසින් රු.මිලියන 607ක බදු මුදලක් ගෙවීම පැහැර හැරීමට තැත්කර ඇති බව අනාවරණය කර ගෙන තිබුණි. කෙසේ වුවද ඒ සම්බන්ධයෙන් රේගු පරීක්ෂණ අවසන් කර පනවා තිබූ දණ්ඩන හා

අභිමි කිරීම්වලින් රු.මිලියන 293ක් පමණක් රජයේ ආදායමට බැර කර ඉතිරි දණ්ඩන හා අභිමි කිරීම් රේගු ත්‍යාග හා අරමුදල් දිමනා ලෙස බැර කර තිබුණි.

**අත්තිකාරම් නොපියවීම**

රේගුවේ විවිධ අංශ 14 ක් මගින් සිදු කරනු ලබන විමර්ශන 216 කට අවශ්‍ය වියදම් දැරීම සඳහා, අත්අඩංගුවට ගන්නා ලද සහ රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ අත්තිකාරම් ගිණුමෙන් (අ.රා.බ. ගිණුම) වසර 05 කට පෙර ලබාගෙන තිබූ රු. මිලියන 6.46 ක අත්තිකාරම් මුදල් වර්ෂය අවසාන වන විටත් පියවා නොතිබුණි. එසේම විමර්ශනයන් අවසන් වූ වහාම ලබාගත් අත්තිකාරම් කඩිනමින් පියවිය යුතු වුවත් විමර්ශන අවසන්වූ සිද්ධින් 11 ක් සඳහා ලබාගත් රු. මිලියන 1.12ක අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි.

**බන්ධිත ගුදම් පහසුකම ලබා ගන්නා ආනයනකරුවන් විසින් නිශ්පාදන බදු සහන ලබාගැනීම**

1869 අංක 17 දරන රේගු ආඥා පනතේ 84 (අ) (3) වගන්තිය අනුව බන්දිත ගුදම් පහසුකම (Manufacture in Bond-MIB) ලබාගන්නා ආනයනකරුවන්ගෙන් ආනයනික භාණ්ඩ ගුදමට ගෙනෙන විට බදු අයකර නොගන්නා අතර ගුදම්ගත භාණ්ඩ එහි නිෂ්පාදනය කර දේශීය පරිභරණය සඳහා මුදාහරින අවස්ථාවේදී “ආනයනය කරන ලද භාණ්ඩ සේ සලකා” තීරු බදු ගෙවීම සිදු කළ යුතුය. එවැනි බන්ධිත ගුදමකදි එකලස් කෙරෙන වාහන සඳහා දේශීයව සියයට 30 ට නොඅඩු අගයක් එකතු වන්නේ නම් කර්මාන්ත අමාත්‍යවරයාගේ නිර්දේශ මත සියයට 70ක නිෂ්පාදන බදු සහනයක් ලබා දිය හැකිය. 2024 වර්ෂය තුළදී එවැනි සමාගම් 7 ක් විසින් කර්මාන්ත අමාත්‍යවරයාගේ නිර්දේශ මත ලබා දෙන සියයට 70ක නිෂ්පාදන බදු සහනය ඉල්ලා තිබුණි. එහෙත් රේගුව විසින් රේගු ආඥා පනතේ ප්‍රතිපාදන අනුව පිරිවැය ගණනය කිරීම හා ඊට අදාල සියයට 30ක දේශීය අගය එකතු කිරීම් නිවැරදිව සලකා බැලීමකින් තොරව බදු සහනය ලබා දීමට කටයුතු කර තිබුණි. වර්ෂයේදී බන්ධිත ගුදම් හිමි නිෂ්පාදන සමාගම් 7ක් විසින් මෝටර් කාර් 538 ක් සහ යතුරු පැදි 53,381 ක් ගුදම්වල එකළස් කර දේශීය වෙළඳපලට නිකුත් කර තිබූ අතර විගණනය විසින් සිදුකල ගණනය කිරීම් අනුව එම වාහන සඳහා අයවිය යුතු නිෂ්පාදන බද්ද රු.මිලියන 10,744.33ක් වියයුතු වුවත් රේගුව විසින් රු. මිලියන 3,356.78 ක් පමණක් අයකර තිබීම

හේතුවෙන් රු. මිලියන 7,387.55ක නිෂ්පාදන බදු ආදායමක් අහිමි වී තිබුණි.

**ගෙවිය යුතු බදු මුදලට වඩා අඩු මුදලක් දණ්ඩණ හා අහිමිකිරීම් ලෙස අය කිරීම**

ස්වර්ණාභරණ ආනයනය සහ අලෙවිය සිදු කරන ප්‍රසිද්ධ සමාගමක් විසින් රු.මිලියන 753.21 ක් වටිනා රන් ආභරණ විදේශයන්ගෙන් ගෙන්වාගෙන ආනයන බදු ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් රේගු විමර්ශනයක් සිදු කර තිබුණි. එම සමාගම විසින් රේගුවට ගෙවිය යුතු බදු මුදල රු. මිලියන 219.82 ක් වු අතර රේගු ආඥා පනතේ 107 සහ 129 වගන්ති ප්‍රකාරව මෙම භාණ්ඩ රාජ සන්තක කර සහ භාණ්ඩ වටිනාකම මෙන් තෙගුණයක අහිමිකිරීමක් සිදු කළ හැකි වුවත්, විමර්ශන අවසානයේ රු. මිලියන 2,919.08 ක අහිමි කිරීමක් අනුව පසුව එය රු.190 ක් දක්වා ලිහිල් කර තිබුණි. මෙම ලිහිල් කිරීම හේතුවෙන් ගෙවිව යුතුව තිබු බදු මුදලට වඩා රු.29.81 ක් අඩුවෙන් ගෙවා භාණ්ඩ නිදහස් කර ගැනීමට ආනයනයකරුට හැකිවී තිබුණි.

## මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාව තුළ මෝටර් වාහන ලියාපදිංචිය, නියාමනය, රියදුරු බලපත් නිකුත් කිරීම, මාර්ග ආරක්ෂාව හා පරිසර හිතකාමී වාහන භාවිතය යන අරමුණු පෙරදැරිව කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සැපයීම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු ලෙස හඳුනාගෙන ඇත.

**සුඛෝපභෝගී ආදායම් බදු ගණනය කිරීම**

සුඛෝපභෝගී ආදායම් බදු ගණනය කිරීම අනුව වර්ෂය සඳහා රු.මිලියන 3,005 ක් සහ ඉකුත් වර්ෂයේ හිඟව තිබූ රු.මිලියන 137ක් සමඟ එකතුව රු.මිලියන 3,142ක් අයකර ගත යුතු වුවත්, ඉන් රු.මිලියන 131ක සුඛෝපභෝගී ආදායම් බදු ආදායමක් රැස් කර ගැනීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**SRITIS පරිගණක මෘදුකාංගයේ නඩත්තු හා සේවා**

රියදුරු බලපත්‍ර මුද්‍රණය සඳහා භාවිතා වන **SRITIS** පරිගණක මෘදුකාංගයේ නඩත්තු හා සේවා ලබා ගැනීම සඳහා ටෙන්ඩර් පටිපාටියකින් තොරව කොන්ත්‍රාත් ප්‍රදානය කර 2023 හා 2024 වර්ෂයන්හි පිළිවෙලින් රු.මිලියන 154.10 ක හා රු.මිලියන181.97 ක් පෞද්ගලික සමාගමක් වෙත ගෙවා තිබුණි.

**රියදුරු බලපත්‍ර මුද්‍රණය පෞද්ගලික සමාගමක් වෙත පැවරීම**

රියැදුරු බලපත්‍ර කාඩ්පත් මිලදී ගැනීම සඳහා පෞද්ගලික සමාගමක් සමග 2023 සැප්තැම්බර් 15 දින සිට වර්ෂයක කාලයකට ඇතිකර ගෙන තිබූ ගිවිසුම අනුව එක් කාඩ්පතකින් රු.265 ක් රජයට අලාභ වන පරිදි කටයුතු කිරීමට නිර්දේශ කිරීම හේතුවෙන් ගිවිසුම් ගත වී ඇති දින සිට 2024 ජූලි මාසය දක්වා කාලය තුළ එම පෞද්ගලික සමාගම විසින්ම කාඩ්පත් 507,807ක් මුද්‍රණය කර සැපයීම වෙනුවෙන් රු. මිලියන 134.57 ක මුදලක් වැඩිපුර ගෙවීම හේතුවෙන් රජයට අලාභයක් සිදු වී තිබුණි.

**රියැදුරු බලපත්‍ර කාඩ්පත් මිලදී ගැනීම**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුගත සාමාන්‍ය මාසික රියදුරු බලපත්‍ර නිකුත් කිරීම් ඒකක 90,000 ක් වන අතර, ඒ අනුව රියැදුරු බලපත්‍ර නිකුත් කිරීම සඳහා වාර්ෂික කාඩ්පත් අවශ්‍යතාවය 1,080,000 ක් වන නමුත් අවම වශයෙන් මාස 06කට වත් ප්‍රමාණවත් නොවන පරිදි කාඩ්පත් 400,000 ක් පමණක් මිලදී ගැනීමට ප්‍රසම්පාදනයක් සිදු කර තිබුණි.

**වාහන හඳුනාගැනීමේ අංකය සහිත අංක තහඩු සැපයීමේ කොන්ත්‍රාත් මිල සංශෝධනය**

වාහන අංක තහඩු සැපයීම සඳහා පෞද්ගලික සමාගමක් සමග ඇතිකර ගෙන තිබුණු ගිවිසුමේ කොන්දේසි අංක 30ට අනුකූලව මිල සංශෝධනයක් ලබා දීම සඳහා ගිවිසුමේ නෛතික ප්‍රතිපාදන පවතින්නේද යන්න 2023 පෙබරවාරි 09 දින අංක DMT/11/DE/02 දරණ ලිපිය මඟින් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නීතිපති විමසා තිබූ අතර "කිසිදු නෛතික විධිවිධානයක් සඳහන් කිරීමකින් තොරව මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනයේ අඩංගු කරුණු, ගිවිසුමේ 30 වගන්තියට ඇතුළත් විෂය පථයට අයත් නොවන බව" නීතිපති විසින් පෙන්වා දී තිබුණි. එහෙත් නීතිපති මතය අදාල කර ගැනීමකින් තොරව හා අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව මිල සංශෝධනයක් සඳහා අවශ්‍ය වන කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් වගන්ති සංශෝධනය කර සියයට 62.5ක මිල වැඩිවීමක් ලබාදිය හැකි පරිදි කොන්ත්‍රාත්කරු සමග ඇතිකරගෙන තිබූ ගිවිසුමේ 14 වැනි වගන්තිය සංශෝධනය කිරීමට කටයුතු කර තිබුණි.

**ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍ර නිකුත් කිරීම**

ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍රයක් නිකුත් කිරීමට පෙර කොමසාරිස් ජනරාල්වරයා විසින් තත්කාර්ය සඳහා පත් කරනු ලබන බලයලත් නිලධාරියෙකු විසින් ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙකුම පරීක්ෂා කළ යුතු බව දක්වා ඇති නමුත්, රියදුරු කාර්යය සඳහා අත්‍යාවශ්‍ය වන අයදුම්කරුවන්ගේ භෞතික ශරීර අවයව නිසි පරිදි ක්‍රියාත්මක වන්නේද යන්න හෝ (උදා: අත්, කකුල්, ඇස් නිසි ක්‍රියාකාරීත්වයෙන් යුක්තද යන්න) පරීක්ෂාවකින් තොරව අයදුම්කරු රහිතව අදාල සංගමය විසින් ඉදිරිපත් කරන අයදුම්පත් සඳහා ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍ර ලබා දී තිබුණි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2301/17 හා 2022/10/10 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මෝටර් වාහන පනතේ 203 අධිකාරිය සඳහා වූ නියෝග අනුව ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍රයක් නිකුත් කිරීමේ සාමාන්‍ය සේවා ගාස්තුව රු.3,000ක් හා එක්දින සේවා ගාස්තුව රු.3,500ක් වන අතර, එකී ගාස්තු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් අය කළ යුතු වේ. එහෙත් එකී සංගමය විසින් එක් ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍රයක් වෙනුවෙන් රු.10,394ක මුදලක් අයකර ගෙන තිබූ අතර, ඒ අනුව එක් රියදුරු අවසර පත්‍රයක් වෙනුවෙන් රු.7,394ක අමතර ගාස්තු අයකර තිබූ බව නිරීක්ෂණය විය. විගණනයට ඉදිරිපත්වූ තොරතුරු අනුව 2023 හා වර්ෂයන්හි දී එලෙස රු. මිලියන 527.30ක මුදලක් අමතරව අයකර ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

**දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියේ ඇතුළත් දත්ත වෙනස් කිරීම**

AT-212-0066488 චැසි අංක සහිත මෝටර් රථය 2007 අගෝස්තු 15 දින මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අංක LOT S 0034392 දරන ලියාපදිංචි සහතිකය යටතේ ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය, කොළඹ 01 නමින් ලියාපදිංචි වී තිබුණි. එකී ලියාපදිංචි අංකය යටතේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය තුළ ඇතුළත්ව තිබූ වාහනයේ හිමිකරුගේ නම, ලිපිනය, චැසි අංකය, එන්ජින් අංකය ඇතුළු ප්‍රධාන ලියාපදිංචි දත්තයන් වංචනික ලෙස වෙනස් කර, ඒ වෙනුවට එම ලියාපදිංචි සහතිකය යටතේම ගාල්ල ප්‍රදේශයේ පුද්ගලයෙකුගේ තොරතුරු මෝටර් රථ

ප්‍රවාහන දත්ත පද්ධතියට ඇතුළත් කරමින්, ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් උක්ත වාහනයේ තොරතුරු දත්ත පද්ධතියෙන් වංචනිකව මකා දමා තිබුණි.

## සුරාබදු දෙපාර්තමේන්තුව

**හිඟ සුරාබදු ආදායම්**

2024 දෙසැම්බර් 31 දිනට සුරාබදු දෙපාර්තමේන්තුව විසින් අයකරගත යුතු හිඟ ආදායම රු.මිලියන 8,749 ක් වූ අතර මෙය පසුගිය වර්ෂ 04 සමඟ සංසන්දනය කිරීමේදී ක්‍රමිකව වර්ධනය වන තත්ත්වයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4ක පැවති හිඟ ආදායම් සම්බන්ධ විස්තර පහත පරිදි වේ.

**වගු අංක 2.4 - 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා සුරාබදු දෙපාර්තමේන්තුවේ හිඟ ආදායම් සම්බන්ධ විස්තර**

| වර්ෂය | දෙසැම්බර් 31 දිනට හිඟ බදු ආදායම (රු.මිලියන) |
|---|---|
| 2020 | 3,969 |
| 2021 | 4,550 |
| 2022 | 5,569 |
| 2023 | 7,271 |
| 2024 | 8,749 |

**මූලාශ්‍රය : සුරාබදු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන**

2024 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් වාර්තාව අනුව මත්පැන් නිෂ්පාදන ආයතන 09 කින් රු.මිලියන 8,590 ක්ද, ස්කාගාර 05 කින් රු.මිලියන 63 ක්ද, මත්පැන් නිෂ්පාදනාගාර 03 කින් සාමාන්‍ය අපතය ඉක්මවා ගිය නිෂ්පාදන අපතය වෙනුවෙන් රු.මිලියන 92 ක්ද, දුම්කොළ සඳහා ආයතන දෙකකින් රු.මිලියන 4 ක්ද වශයෙන් රු.මිලියන 8,749 ක හිඟ බදු ආදායමක් අයවිය යුතුව පැවතුණි.

**මත්පැන් අපනයනය මත සුරාබදු අවකරණය**

අංක 2364/35 දරන 2023 දෙසැම්බර් 31 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ පළ වූ අංක 04/2023 දරන සුරාබදු නිවේදනය පරිදි වර්ෂය තුල නිෂ්පාදන ආයතන 03 ක් විසින් අවස්ථා 35 දී සංශුද්ධ මත්පැන් ලීටර් 20,976,757 ක් අපනයනය කර තිබූ අතර ඒ මත රු.මිලියන 12,194 ක සුරාබදු මුදල් අවකරණය කර තිබුණි.

අදාල අවකරණ වටිනාකම අඩුකල ශුද්ධ සුරාබදු ආදායම පමණක් සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ගිණුම්ගතකිරීම හා අපනයනය කරන මත්පැන් වලට අදාල බදු මුදල් ආපසු ගෙවීම ගිණුම්ගත කිරීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවට සුදුසු වැය විෂයයක් (Vote) හා අවශ්‍ය ප්‍රතිපාදන සහ එම වැය විෂයය මඟින් අදාල සුරාබදු අවකරණ මුදල ගිණුම්ගත කිරීමට අවශ්‍ය අනුමැතිය ලබානොදීම මත සුරාබදු දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ මත්පැන් මත බදු ආදායම හා සමස්ථ වියදම රු.මිලියන 12,194 කින් පමණ අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් කර තිබුණි.

**සුරාබදු දෙපාර්තමේන්තුවේ යෝජිත ආදායම් පරිපාලන පද්ධතිය (RASED)**

සුරාබදු දෙපාර්තමේන්තුවේ යෝජිත ආදායම් පරිපාලන පද්ධතිය (RASED) ගොඩනැගීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් 2022 වර්ෂයේ සිට වර්ෂය දක්වා එකතුව රු.මිලියන 1,041.8 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද, වර්ෂය අවසන් වන විට එයින් කිසිදු මුදලක් උපයෝජනය කර අදාල අරමුණ ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් සුරාබදු දෙපාර්තමේන්තුවට අදාලව බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය, නිෂ්පාදනාගාර අධීක්ෂණය, බෙදාහැරීම සහ සැපයුම් දාම නියාමනය, අපරාධ දත්ත හා නීති කළමනාකරණය, සුරාබදු සහ බදු පරිපාලනය ආදී වැදගත් ක්ෂේත්‍ර සහ රේගු දෙපාර්තමේන්තුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා මුදල් අමාත්‍යාංශයේ ක්‍රියාත්මක තොරතුරු පද්ධති සමඟ සම්බන්ධ වී තොරතුරු හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය ඒකාබද්ධ පද්ධතියක් හරහා සිදු කිරීම තවදුරටත් ප්‍රමාද වෙමින් පැවතුණි.

**මූලික විමර්ශණ වාර්තාවල ඇතුලත් නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම**

මත්පැන් නිෂ්පාදනාගාරයක 2024 මැයි මස 26 දින සිදුවූ ගිනි ගැනීම සම්බන්ධයෙන් හා මත්පැන් නිෂ්පාදනාගාරයකට අයත් ලොරි රථ 3ක් තුල ස්ප්‍රීතු බැරල් 25 ක් හා මත්පැන් බෝතල් 8,446 ක් පෞද්ගලික පරිශ්‍රයක තිබියදී අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් පත්කල පරීක්ෂණ කමිටු මඟින් ඉදිරිපත් කල මූලික විමර්ෂණ වාර්තාවලින් හිතාමතා ගිනිතැබීම් සිදුකර ඇති බව තහවුරු වී තිබීම, අසාමාන්‍ය ස්ටිකර් ප්‍රමාණයක් නිෂ්පාදනාගාරය වෙත නිකුත් කර තිබීම පිළිබඳ විධිමත් පරීක්ෂණයක් කර වගකිව යුතු නිලධාරීන් විෂයයෙහි නෛතික කටයුතු සිදු වීම සහ

ගිනිතැබීම සිදුවන අවස්ථාවේදී ලේබනගතව තිබූ ස්ටිකර් ප්‍රමාණය හා සත්‍ය වශයෙන් තිබූ ස්ටිකර් ප්‍රමාණය අතර වෙනසට අදාල ස්ටිකර් ප්‍රමාණය භාවිතාකර මත්පැන් බෝතල් නිෂ්පාදනය කලා සේ සලකා සුරාබදු බද්ද ගණනය කර අයකර ගැනීමට කටයුතු කිරීම ආදී නිර්දේශ ලබා දී ඇතත් අදාල නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි.

## ජාතික ලොතරැයි මණ්ඩලය

පවතින ආදායම් මට්ටම හා ලාභදායකත්වය වැඩි කිරීම තුළින් රජයට කරන දායකත්වය වැඩි කිරීම සඳහා 1963 අංක 11 දරන මුදල් පනත යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය 1963 වර්ෂයේ දී පිහිටුවා තිබුණි.

**ලාභය ඒකාබද්ධ අරමුදල වෙත බැරනොකිරීම**

1963 අංක 11 දරන ජාතික ලොතරැයි මණ්ඩල පනතේ 17(2) වගන්තිය අනුව, මණ්ඩලයේ ලොතරැයිපත් ආදායමෙන් නිශ්චිතව දක්වා ඇති වියදම් අඩු කළ පසු ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත්, දෙසැම්බර් 31 දිනට සමුච්චනය වි ඇති රු. මිලියන 4,040 ක ලාභය ඒකාබද්ධ අරමුදල වෙත බැරකිරීමකින් තොරව මණ්ඩලයේ අරමුදල තුළ රඳවා ගෙන තිබුණි.

**හිමිකම් නොපෑ ත්‍යාග රාජසන්තක කිරීම**

1963 අංක 11 දරන ජාතික ලොතරැයි මණ්ඩල පනතේ 16 (4) හා 1997 අංක 35 දරන සංශෝධන පනතේ 4 (4) සහ 5 (4) වගන්ති අනුව දිනුම් ඇදීනු ලැබූ දින සිට මාස 06 ක කාලයක් තුළ එම ලොතරැයියේ ත්‍යාගයකට හිමිකම් නොපාන්නේ නම්, එකී ත්‍යාග මුදල් රාජසන්තක කර ඒකාබද්ධ අරමුදල වෙත බැර කළ යුතුය. කෙසේ වුවද, වර්ෂයේ දිනුම් ඇදීනු ලැබූ ලොතරැයි වර්ග 05 කට අදාළව මාස 06 ක් ඇතුළත හිමිකම් නොපෑ රු. මිලියන 76 ක ත්‍යාග රාජසන්තක කර ඒකාබද්ධ අරමුදල වෙත ලබාදී නොතිබූ බව නිරීක්ෂණය විය.

**ලොතරැයි මුද්‍රණ ප්‍රසම්පාදන ප්‍රමාදය**

ලොතරැයි වර්ග 5 ක් මුද්‍රණය කරවා ගැනීමට අදාල ප්‍රධාන ප්‍රසම්පාදනය හා සූරන ලොතරැයිපත් මුද්‍රණය කිරීමට අදාල ප්‍රසම්පාදනය මාස 6 කට වඩා වැඩි කාලයක් ප්‍රමාද වීම තුළ පූර්ව සැපයුම් කරුගෙන් වැඩි මිලට ලොතරැයිපත් මුද්‍රණය කරවා ගැනිමට

සිදුවීම නිසා ආසන්න වශයෙන් රු.මිලියන 53 ක පමණ අතිරේක පිරිවැයක් දැරීමට සිදුව තිබුණි.

## සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**උත්සව වියදම්**

1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11 වන වගන්තිය, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2004 ජනවාරි 10 දිනැති අංක 01/ දරණ අයවැය චක්‍රලේඛයේ 12.3 වගන්තිය සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ 2024පෙබරවාරි 28 දිනැති අංක 01/ දරණ චක්රලේඛයේ 14.1 වගන්තිය යන වගන්තීන් උල්ලංඝණය කර 2024 ජුනි 19 දින සිට ජූලි 24 දින දක්වා කාලය තුළ දිවයිනේ පාසල් හා පිරිවෙන්හි 01 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන තෝරාගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 6000 කට ජනාධිපති අරමුදල අනුග්‍රහයෙන් පවත්වා තිබුණු ශිෂ්‍යත්ව වැඩසටහන් උත්සව කටයුතු සංවිධානය කිරීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් රු.මිලියන 73.27ක් වැය කර තිබුණි.

## දේශීය ආදායම් දෙපාර්තමේන්තු මුලාශ්‍රයන්ට අනුව රජයට අය විය යුතු නමුත් මෙතෙක් අය කරගෙන නොමැති එකතු කළ අගය මත බදු පිළිබඳ විශේෂ විගණන වාර්තාවේ ඇතුළත් ප්‍රධාන නිරීක්ෂණ.

**එකතුකල අගය මත හිඟ බදු මුදල් හා ඒ සඳහා වූ දඩ මුදල්**

2022 දෙසැම්බර් 31 දිනට Legacy හා RAMIS පරිගණක පද්ධතීන් අනුව අයකර ගැනීම තාවකාලිකව අත් හිටුවා ඇති එකතුකල අගය මත හිඟ බදු මුදල හා ඒ සඳහා වූ දඩ මුදලෙහි වටිනාකම පිළිවෙළින් රු. මිලියන 139,309 ක් හා රු. මිලියන 115,691 ක් විය.

**VAT බදු ප්‍රේෂණය නොකර රඳවා ගැනීම**

අත්හිටුවීමකට ලක් නොවී බාධාවකින් තොරව අය කරගත හැකි ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින්ම හඳුනාගෙන ඇති එකතු කළ අගය මත හිඟ බදු හා ඒ සඳහා වූ දඩ මුදලෙහි වටිනාකම පිළිවෙලින් රු. මිලියන 62,781 ක් හා රු. මිලියන 51,513 ක් වී තිබුණි. බාධාවකින් තොරව අය කරගත හැකි ලෙස හඳුනාගෙන ඇති එම බදු වටිනාකමින් සියයට 31 ක් වසර 13 දක්වා පැරණි එකතුකළ

අගය මත බදු බව නිරීක්ෂණය විය. තවද, ඉහත සඳහන් වටිනාකම් අතුරින් දඩ මුදල් හැර බදු ලෙස සඳහන් වටිනාකම් එලෙස "හිඟ බදු" ලෙස සඳහන් වුවද මෙම මුදල් සාමාන්‍ය ජනතාවගෙන් VAT බදු ලෙස මේ වන විටත් පෞද්ගලික හෝ රජයේ ආයතන විසින් එකතු කර ගන්නා ලද මුදල් වන අතර එම පාර්ශවයන් විසින් එම මුදල් රජයට ප්‍රේෂණය නොකර තමන් සතුව රඳවා ගෙන ඇති පොදු දේපළක් ලෙසද සැලකිය හැකි වටිනාකමක් බව විගණනයට නිරීක්ෂණය විය.

**පැහැර හරින ලද බදු අය කර ගැනීම සම්බන්ධ නීතිකෘත්‍යයන්**

2008 වර්ෂයේදී සිදුකල සංශෝධනයන්ට අනුව බාධාවකින් තොරව අයකර ගත හැකි ලෙස හඳුනාගෙන ඇති රු.මිලියන 114,294 ක් අතුරින් රු. මිලියන 22,185 ක හිඟ බදු හා දඩ මුදල් වර්ෂ 5 ½ ක කාලය ඉක්මවා යාම හේතුවෙන් නීතිකෘත්‍යක් හෝ ආරම්භ කිරීමට නොහැකි තත්ත්වයට පත් වී ඇති බැවින් එම ආදායම රජයට අයකර ගැනීමේ හැකියාව අවදානමට ලක් වී ඇත. ඒ අනුව රජයට ආදායම් රැස්කර ගැනීම පැවරී ඇති ප්‍රධාන ආයතනයක් ලෙස අය කර ගත යුතු සහ අයකළ හැකි ලෙස හඳුනාගන්නා ලද ආදායමෙන් සියයට 20 කට ආසන්න ප්‍රමාණයක් සම්පූර්ණයෙන්ම අයකල නොහැකි තත්ත්වයක පත් වන පරිදි කල්ගත කර තිබීම තුල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මනා කාර්යක්ෂමතාවයකින් හා වගකීමකින් කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

**නොවිසඳී පවතින අභියාචනා**

2023 මැයි 25 දින වන විට දෙපාර්තමේන්තු අභියාචනා ක්‍රියාවලිය තුල තවදුරටත් නොවිසඳී පවතින අභියාචනා/ පරිපාලන සමාලෝචන 9,620 ක් අතුරින් මතභේදකාරි තත්ත්වයන් හේතුවෙන් විසඳීම අවසන් කර නොතිබුණු රු.මිලියන 98,459 ක් වටිනා අභියාචනා 4,499 ක් පැවතුණි. ඒ අතර අවුරුදු 02 ක කාලය ඉක්ම වූ නමුත් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් සිය තීරණය ලබා දීමට අපොහසත් වූ රු. මිලියන 31,041 ක් වටිනා අභියාචනා 2,459 ක් ද ඇතුළත්ව තිබිණි. මීට අමතරව 2021 අංක 17 දරන 2019 කොරෝනා වෛරස් රෝග පනතෙන් කොමසාරිස් ජනරාල්වරයාට ලබා දී ඇති අමතර වර්ෂ 02 ක කාලය ඉක්ම වූ රු මිලියන.9,177 ක් වටිනා අභියාචනා 1,603 ක්ද පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව (අභියාචනය පරිදි) අදාළ කාලසීමාව තුළදී ඒ අභියාචනය සම්බන්ධයෙන් එකඟත්වයට නොපැමිණ හෝ තීරණය කරනු

නොලැබූ අවස්ථාවක, ඒ අභියාචනයට ඉඩදෙනු ලැබූ සේ සලකනු ලැබිය යුතු අතර බද්ද ඒ අනුව අයකරනු ලැබිය යුතු බැවින් එවැනි අවස්ථා රජයට අවාසිදායක විය හැකි බැවින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව රජයට වඩාත් වාසිදායක වන ආකාරයෙන් ආදායම් රැස්කර කිරීමට කටයුතු කර නොමැති බව විගණනයට නිරීක්ෂණය විය.

**ස්වතක්සේරුව අනුව බදු නොගෙවීම**

අයකර ගැනීමේ හැකියාව අවිනිශ්චිතභාවයකට ලක් වී ඇති එකතු කළ අගය මත බදු මුදල් වලින් රු.මිලියන 721ක් වටිනා හිඟ බදු මුදල් බදුකරුගේ ස්වතක්සේරුව අනුව බදු නොගෙවීම හේතුවෙන් අය වී නොතිබුණු බව Legacy පරිගණක පද්ධතිය ඇසුරෙන් සිදු කළ විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

**හිඟ බදු අයකර ගැනීම සඳහා වූ නඩුකරයන් 46 ක හිඟ ශේෂ Legacy පද්ධතිය තුල නොවීම**

රු. මිලියන 296 ක් වටිනා හිඟ බදු අයකර ගැනීම සඳහා නඩුකරයන් 46 ක් පවත්වා ගෙන ගියද එවැනි හිඟ ශේෂ පවතින බව Legacy පද්ධතිය තුල නිරූපණය නොවුණි. ඒ අනුව දත්ත පද්ධතිය මැනවින් නඩත්තු කර යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

**බදුකරුවන් විසින් නිසි පරිද පියවීමට කටයුතු කර නොතිබූ බදු මුදල්**

රාජ්‍ය ආයතන 13 ක් විසින් 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා සිය සැපයුම්කරුවන්ට ගෙවන ලද රු. මිලියන 883ක් වටිනා වැට් බදු, බදුකරුවන් විසින් දෙපාර්තමේන්තුවට නිසි පරිදි පියවීමට කටයුතු කර නොතිබුණි.

## ශ්‍රී ලංකා රේගුවේ පවතින විවිධ අරමුදල් කළමනාකරණය/ පරිපාලනය සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාවේ ඇතුළත් ප්‍රධාන නිරීක්ෂණ

**ත්‍යාග මුදල් අදාල නිලධරයන් සහ තොරතුරු සපයන්නන් අතර බෙදා දීම**

1869 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කළ යෝජනා ක්‍රමයකට අනුව ත්‍යාග මුදල් අදාල නිලධරයන් සහ තොරතුරු සපයන්නන් අතර බෙදා දීම සිදුවිය යුතු වුවද, අමාත්‍යවරයාගේ එවැනි

අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුව තම අභිමතය පරිදි සකස් කරන ලද අභ්‍යන්තර නියෝග මත පමණක් 1988 වසරේ සිට ත්‍යාග මුදල් ගෙවා තිබුණු අතර විගණනයට ලබා ගත හැකි වූ තොරතුරු මත 2012 සිට 2023 අගෝස්තු 31 දක්වා පමණක් රු.මිලියන 24,226 ක් ගෙවා තිබුණි. මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන ඇති බවට ලියකියවිලි ආයතනය තුළින් මේ වන විට සොයාගැනීමට නොහැකි බව ශ්‍රී ලංකා රේගුව විසින් විශේෂ විගණන වාර්තාවේ කෙටුම්පතට පිළිතුරු ලෙස දන්වා තිබුණි.

**ත්‍යාග අරමුදලට හා ඒකාබද්ධ අරමුදලට බැර කරන මුදල්**

රේගු වැරදිවලට පාදක වන ආනයනයන් එසේ නොමැතිව නිවැරදිව සිදු වූයේ නම් ඒ මත පනවන බදු මුදල් සම්පූර්ණයෙන්ම රජයේ ආදායමට බැර වන නමුත් දණ්ඩන පනවා මුදල් අයකර ගැනීමේදී ඉන් සියයට 50ක් ත්‍යාග අරමුදලට ද, සියයට 20 ක් කළමනාකරණ හා වන්දි අරමුදලට ද බැර කර සියයට 30 පමණක් ඒකාබද්ධ අරමුදලට බැර කෙරේ. ඒ අනුව 2012 වර්ෂයේ සිට 2023 අගෝස්තු 31 දක්වා වූ කාලපරිච්ඡේදයේදී පමණක් ත්‍යාග අරමුදලට රු. මිලියන 24,226ක් මාරු කරන විට ඒකාබද්ධ අරමුදලට රු. මිලියන 14,535 ක් පමණක් බැර කර තිබුණි.

**මධ්‍යගත තොරතුරු පද්ධතියක් නොවීම**

භාණ්ඩ නිශ්කාෂණ ක්‍රියාවලියට සම්බන්ධ වන දෙපාර්තමේන්තුවේ අංශ රාශියක් සිද්ධි හේතුවෙන් ආරම්භවන රේගු විමර්ශන කටයුතු වල නිරතව තිබුණ ද, එකී විමර්ශනයන්හි ප්‍රගතිය දැනගැනීමේ ක්‍රමවේදයක් නොවුණ අතර එක් එක් අංශ තනි තනිව විමර්ශන කටයුතු සිදුකර විමර්ශන අවසාන වූ පසු ත්‍යාග ගෙවීම් සඳහා මුදල් අංශයට යොමුකර තිබුණි. විමර්ශන ගොනු පිළිබඳ තොරතුරු එක් එක් අංශවල විමධ්‍යගතව පැවතුණු අතර ඒ අනුව විමර්ශන ප්‍රගතිය පිළිබඳව කළමනාකරණ තීරණ ගැනීමට සහ කාර්යසාධන පරීක්ෂාවට ද අවශ්‍ය මධ්‍යගත තොරතුරු පද්ධතියක් දෙපාර්තමේන්තුව සතුව නොපැවතුණි. තවද විවිධ අංශවලින් රේගු විමර්ශන සිදුකළ ද, අංශ 42ක් යටතේ සිදුකරමින් පැවතුණු විමර්ශන අතුරින් 2,661 ක් වසර 05 කට වඩා ද, 4,147ක් වසර 02 සිට වසර 04 ක් දක්වා ද ප්‍රමාද වී තිබුණු අතර, විගණනයේදී එකී ප්‍රමාදයට සාධාරණ හේතු අනාවරණය නොවුණි.

**පශ්චාත් උපාධි පාඨමාලා සඳහා කළමනාකරණ හා වන්දි අරමුදලෙන් මුදල් වැය කිරීම**

2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වර්ෂ 6 ක කාලපරිච්ඡේදයක දී පශ්චාත් උපාධි පාඨමාලා සඳහා කළමනාකරණ හා වන්දි අරමුදලෙන් වැය කළ මුදල රු. මිලියන 127ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දින වන විට පාඨමාලා හැදෑරූ නිලධාරීන් 323 ක් වුවද, ඉන් නිලධාරීන් 149 ක් පමණක් පාඨමාලා අවසන් කර සහතික පත්‍ර ඉදිරිපත් කර තිබුණි. ඉතිරි නිලධාරීන් එම පාඨමාලාව සාර්ථකව අවසන් කළාද, අත්හැරියේද යන්න පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොපැවතුණු අතර පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් ද නොතිබුණි.

**අතිකාල අරමුදලින් නිලධාරීන්ට ගෙවූ වටිනාකම සහ රජයට බැර කළ ආදායම**

සාමාන්‍ය රාජකාරී වේලාවෙන් පරිබාහිරව සේවයේ යෙදුනාද, නැද්ද යන්න නොසලකා රේගු අතිකාල අරමුදලින් සියයට 90 ක් නිලධාරීන් ට ගෙවා තිබුණු අතර සියයට 10ක් වැනි ඉතා සුළු ප්‍රමාණයක් පමණක් රාජ්‍ය ආදායමට බැර කර තිබුණි. 2021 සහ 2022 වර්ෂවල අතිකාල අරමුදලින් නිලධාරීන්ට ගෙවූ වටිනාකම පිළිවෙලින් රු.මිලියන 948 ක් සහ රු. මිලියන 939 ක් වූ අතර රජයට බැර කළ ආදායම පිළිවෙලින් රු. මිලියන 86ක් සහ රු. මිලියන 84 ක් පමණක් විය.

**කාර්යය මණ්ඩලයට පැනල් ගාස්තු ගෙවීම**

දෙපාර්තමේන්තු නියෝග 1140 අනුව රේගු නැව් බඩු පරීක්ෂණ ගාස්තු ලැබීමට හිමිකම් පෑම සඳහා සතියේ දින වල පෙ.ව. 06.00 ට පෙර සහ සති අන්තයන්හිදී සහ රජයේ නිවාඩු දින වලදී පෙ.ව. 09.00 ට පෙර සේවයට වාර්තා කළ යුතු බවත්, එසේ නොමැති අවස්ථා වල පැනල් ගාස්තු සඳහා හිමිකමක් නොමැති බවත් සඳහන් වුවද, ශ්‍රී ලංකා රේගුවෙහි කාර්යය මණ්ඩලය සඳහා පැමිණීම / පිටවීම පවත්නා චක්‍රලේඛවලට අනුව තහවුරු කර ගැනීමකින් තොරව 2012 වර්ෂයේ සිට 2023 අගෝස්තු දක්වා රු. මිලියන 3,242ක් පැනල් ගාස්තු ලෙස ගෙවා ඇති බව විගණනයට නිරීක්ෂණය විය.

## 2. රාජ්‍ය වියදම හා රාජ්‍ය ණය

රාජ්‍ය මූල්‍ය පාලනයට අදාළව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII පරිච්ඡේදයේ 148 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව ප්‍රකාරව රජය විසින් එකතු කරනු ලබන ආදායම් හා ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 හා 152 ව්‍යවස්ථාවන් ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් කළ යුතු ආකාරය සඳහන් කර ඇත. මෙම කාර්යයන් සැලසුම් කිරීම, මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම සිදු කරන ප්‍රධානම යාන්ත්‍රණය මහා භාණ්ඩාගාරය වේ. මෙම පරිච්ඡේදයේදී රාජ්‍ය වියදම, රාජ්‍ය ණය හා රාජ්‍ය ව්‍යවසායන් පිළිබඳ තොරතුරු හා නිරීක්ෂණ ඉදිරිපත් කෙරේ.

### රජයේ වියදම

මුදල් වර්ෂය සඳහා රජයේ වියදමට අවශ්‍ය නීතිමය විධිවිධාන 2023 අංක 34 දරන විසර්ජන පනතින් සලසා තිබුණි. ඒ අනුව, විසර්ජන පනතේ ප්‍රතිපාදන හා පවත්නා නීති මඟින් අනුමැතිය ලැබී ඇති, ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන විශේෂ නීති සේවා සඳහා ප්‍රතිපාදන ඇතුළුව රජයේ සැපයුම් හා සේවා සඳහා රු.මිලියන 11,276,838 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඊට අතිරේකව, වර්ෂය සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර රු.මිලියන 234,623 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාව ප්‍රකාරව විශේෂ නීති සේවා වොරන්ට් බලපත්‍රයක් මඟින් රු.මිලියන 473,012 ක ප්‍රතිපාදන විශේෂ නීති සේවා වියදම් සඳහා ලබා ගෙන තිබුණු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(4) වගන්තිය ප්‍රකාරව රු.මිලියන 5,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. ඒ අනුව, වර්ෂයේ සැපයුම් හා සේවා සඳහා රු.මිලියන 11,754,850 ක ශුද්ධ ප්‍රතිපාදනයක් සලසා ගෙන තිබුණි. විස්තර වගුව 2.5 හි දැක්වේ.

**වගු අංක 2.5 - රජයේ සැපයුම් හා සේවා සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන**

| මූල්‍ය | මූලධන ප්‍රතිපාදනය | පුනරාවර්තන ප්‍රතිපාදනය | එකතුව |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| සැපයුම් හා සේවා සඳහා විසර්ජන පනතින් සලසා තිබුණු ප්‍රතිපාදනය (විසර්ජන පනත I වන උපලේඛනය) | 1,714,424 | 2,596,422 | 4,310,846 |
| පවත්නා නීති මඟින් අනුමැතිය ලැබී ඇති, ඒකාබද්ධ අරමුදලට වැය බරක් වූ විශේෂ නීති සේවා සඳහා ප්‍රතිපාදන (විසර්ජන පනත II වන උපලේඛනය) | 4,263,745 | 2,702,247 | 6,965,992 |
| සැපයුම් හා සේවා වියදම් සඳහා අතිරේකව ලබා දෙන ලද ප්‍රතිපාදන (පරිපූරක ඇස්තමේන්තු මඟින්) | 10,264 | 224,359 | 234,623 |

| | | | |
|---|---|---|---|
| පරිපූරක ප්‍රතිපාදන සැලසීම සඳහා අවුරා තබන ලද ප්‍රතිපාදන | (198,801) | (35,822) | (234,623) |
| විශේෂ නීති සේවා වියදම් සඳහා අතිරේකව ලබා දෙන ප්‍රතිපාදන | 362,000 | 111,012 | 473,012 |
| මුදල් රෙගුලාසි ප්‍රකාරව පුනරාවර්තන මඟින් මූලධන වෙත මාරු කරන ලද ප්‍රතිපාදන | 75,533 | (75,533) | - |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(4) වගන්තිය මඟින් අනුමත කරන ලද ප්‍රතිපාදන | - | 5,000 | 5,000 |
| **එකතුව** | **6,227,165** | **5,527,685** | **11,754,850** |

**මූලාශ්‍රය - 2023 අංක 34 දරන විසර්ජන පනත හා පරිපූරක ඇස්තමේන්තු**

**මූලාශ්‍රය - වාර්ෂික වාර්තාව - මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

2023 අංක 34 දරන විසර්ජන පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව, ශීර්ෂය 240 ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.1 ඡේදයේ සඳහන් කාර්යයන් සඳහා පමණක් උපයෝජනය කිරීම සඳහා රු.මිලියන 201,118 ක අතිරේක ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම මුළු ප්‍රතිපාදනයෙන්, රු.මිලියන 177,649 ක ප්‍රතිපාදන වෙනත් වැය ශීර්ෂවලට මාරු කර තිබුණි. ඒ අනුව, සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 23,469 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර වගුව 2.6 හි දැක්වේ.

**වගු අංක 2.6 - පරිපූරක සහය සේවා හා හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ වූ ප්‍රතිපාදන හා එම ප්‍රතිපාදන වෙනත් වැය ශීර්ෂ වලට මාරු කිරීම.**

| වියදමේ ස්වභාවය | විසර්ජන පනතෙන් | පරිපූරක ඇස්තමේන්තු මඟින් | මු.රෙ.66/69 මාරු කිරීම් | ශුද්ධ ප්‍රතිපාදනය | වැය ශීර්ෂවලට ප්‍රතිපාදන මාරු කිරීම | ප්‍රතිපාදන ඉතිරිය |
|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| පුනරාවර්තන | 138,900 | (19,172) | - | 119,728 | (117,682) | 2,046 |
| මූලධන | 81,390 | - | - | 81,390 | (59,967) | 21,423 |
| එකතුව | 220,290 | (19,172) | - | 201,118 | (177,649) | 23,469 |

**මූලාශ්‍රය - ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූලාශ්‍ර ප්‍රකාශන**

**සමස්ත ප්‍රතිපාදන ඉතිරිවීම්**

2024 වර්ෂයේ රජයේ සැපයීම් හා සේවා සඳහා රු.මිලියන 11,754,850ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉකුත් වර්ෂය වෙනුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදනය රු.මිලියන 17,675,999ක් වී තිබුණි. ඒ අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ ප්‍රතිපාදනය රු.මිලියන 5,921,149ක් හෙවත් සියයට 33කින් අඩු වී තිබුණි. වර්ෂයේ සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 10,806,431ක් උපයෝජනය කර තිබීම හේතුවෙන් රු.මිලියන 948,418ක්, එනම් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 8 ක් ඉතිරි වී තිබුණි.

**පුනරාවර්තන ප්‍රතිපාදන ඉතිරිවීම්**

පුනරාවර්තන වියදම් සඳහා වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 5,598,719ක් වී තිබුණු අතර,2024 වර්ෂයේදී ඉන් රු.මිලියන 5,370,510ක් උපයෝජනය කිරීම නිසා රු.මිලියන 228,209 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සමස්ථ පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් සියයට 4ක් වී තිබුණි.

**ආයෝජන ප්‍රතිපාදන ඉතිරිවීම්**

රාජ්‍ය ආයෝජනය සඳහා රු.මිලියන 1,525,736ක ශුද්ධ ප්‍රතිපාදනයක් සලසා තිබුණු අතර, 2024 වර්ෂයේදී ඉන් රු.මිලියන 817,091ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, රු.මිලියන 708,644ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 46 ක් වී තිබුණි.

**ණය වාරික ගෙවීම සඳහා වූ ප්‍රතිපාදන ඉතිරිවීම්**

දේශීය හා විදේශීය ණය වාරික ගෙවීම සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 4,630,395ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් ණය ආපසු ගෙවීම සඳහා රු.මිලියන 4,618,830ක් වැය කර තිබුණි. ඒ අනුව, සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 11,565ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**පොළී වියදම වර්ධනය වීම**

වර්ෂයේදී පොළී වෙනුවෙන් රු.මිලියන 2,689,500ක් වැය කර තිබුණි. ඉකුත් වර්ෂයේදී එය රු.මිලියන 2,455,599ක් වී තිබුණු අතර, ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 233,901කින් හෙවත් සියයට 9.5කින් වැඩි වී තිබුණි. විස්තර රූපසටහනෙහි දැක්වේ.

රූපසටහන 2.1 - මුළු පුනරාවර්තන වියදම හා පොලී වියදම




**මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන**

**ආදායම් ඌනතාවය**

2024 වර්ෂය සඳහා විගණනය වෙත ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල අයවැය කාර්යසාධනය හා හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රකාශය අනුව, ආදායමේ ඌනතාවය රු.බිලියන 1,309ක් වී තිබුණු අතර, ඉකුත් වර්ෂයේදී එය රු.බිලියන 1,650ක් වී තිබුණි.

ආදායමේ ඌනතාවයේ අවම අගය 2007 වර්ෂයේදී වාර්තා වී තිබුණු අතර එය රු.බිලියන 43ක් වී තිබුණු අතර, රැස්කළ රජයේ ආදායමෙන් සියයට 7.52ක් නියෝජනය වී තිබුණි. එම කාල පරාසය තුළ සමස්ථ ආදායමේ ඌනතාවය රු.බිලියන 9,279ක් වී තිබුණි. එම ඌනතාවය පියවා ගැනීමට දේශීය හා විදේශීය ණය සහ විදේශ ප්‍රදාන ලබා ගෙන තිබුණි.

**ආදායම් ඌනතාවය පියවීම සඳහා ණය හා ප්‍රදාන ලබා ගැනීම**

2006 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වූ කාල පරාසය තුළ දේශීය ණය රු.බිලියන 29,894ක්ද, විදේශීය ණය රු.බිලියන 8,651ක් හා විදේශ ප්‍රදාන රු.බිලියන 330 ක් වශයෙන් එකතුව රු.බිලියන 38,874ක් ලබා ගෙන තිබුණි. එක් එක් වර්ෂයේදී එසේ ලබා ගෙන තිබුණු ණය හා ප්‍රදානවලින් සියයට 4.44ක සිට සියයට 57.92ක පරාසයක ප්‍රතිශතයන් මගින් ආදායමේ ඌනතාවය මූල්‍යනය කර

තිබුණි. ලබා ගෙන තිබුණු ණය හා ප්‍රදානවලින් ආයෝජනයන් සිදු නොකර පුනරාවර්තන වියදම් පියවා ගැනීම සඳහා 2019 වර්ෂයේදී සියයට 20.25ක්ද, 2020 වර්ෂයේදී සියයට 45.59ක්, 2021 වර්ෂයේදී සියයට 42.39ක්, 2022 වර්ෂයේදී සියයට 30.59ක්, 2023 වර්ෂයේ දී සියයට 19.65 හා 2024 වර්ෂයේදී සියයට 57.92 වශයෙන් උපයෝජනය කර තිබුණි.

**වගු අංක 2.7 - පුනරාවර්තන වියදම පියවා ගැනීමට නොහැකි වූ ආදායමේ ඌනතාවය, ණය හා ප්‍රදානවලින් උපයෝජනය කිරීම**

| වර්ෂය | තථ්‍ය ආදායම | තථ්‍ය පුනරාවර්තන වියදම | ආදායමේ ඌනතාවය | ආදායමේ ඌනතාවය රැස්කළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස | විදේශ ණය, ප්‍රදාන හා දේශීය ණය | ආදායමේ ඌනතාවය ණය හා ප්‍රදානවල ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|
| | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | සියයට | රු.බිලියන | සියයට |
| **2006** | 477 | 579 | 102 | 21.38 | 514 | 19.84 |
| **2007** | 572 | 615 | 43 | 7.52 | 587 | 7.33 |
| **2008** | 664 | 736 | 72 | 10.84 | 678 | 10.62 |
| **2009** | 708 | 882 | 174 | 24.58 | 1,019 | 17.08 |
| **2010** | 826 | 951 | 125 | 15.13 | 918 | 13.62 |
| **2011** | 943 | 1,020 | 77 | 8.17 | 998 | 7.72 |
| **2012** | 997 | 1,118 | 121 | 12.14 | 1,108 | 10.92 |
| **2013** | 1,066 | 1,254 | 188 | 17.64 | 1,289 | 14.58 |
| **2014** | 1,128 | 1,370 | 242 | 21.45 | 1,397 | 17.32 |
| **2015** | 1,394 | 1,673 | 279 | 20.01 | 1,750 | 15.94 |
| **2016** | 1,699 | 1,771 | 72 | 4.24 | 1,623 | 4.44 |
| **2017** | 1,845 | 1,946 | 101 | 5.47 | 1,466 | 6.89 |
| **2018** | 1,935 | 2,109 | 174 | 8.99 | 1,883 | 9.24 |
| **2019** | 1,907 | 2,322 | 415 | 21.76 | 2,049 | 20.25 |
| **2020** | 1,379 | 2,683 | 1,304 | 94.56 | 2,860 | 45.59 |
| **2021** | 1,467 | 2,757 | 1,290 | 87.93 | 3,043 | 42.39 |
| **2022** | 1,999 | 3,539 | 1,540 | 77.04 | 5,035 | 30.59 |
| **2023** | 3,078 | 4,729 | 1,651 | 53.64 | 8,396 | 19.66 |
| **2024** | 4,061 | 5,370 | 1,309 | 32.23 | 2,260 | 57.92 |
| එකතුව | **28,145** | **37,424** | **9,279** | | **38,873** | |

මූලාශ්‍රය - 2006 වර්ෂයේ සිට වර්ෂය දක්වා රජයේ මූල්‍ය ප්‍රකාශන

**පොළී ගෙවීම වර්ධනය වීම**

2024 වර්ෂයේදී රු.බිලියන 2,689ක පොලී ගෙවා තිබුණු අතර, එය මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 50.08ක නියෝජනයක් වී තිබුණි. ඉකුත් වර්ෂයේ පොලී ගෙවීම් රු.බිලියන 2,455 ක් හෙවත් මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 51.91ක් වී තිබුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී පොලී ගෙවීම් රු.බිලියන 234කින් වැඩි වී තිබුණි. තවද, එවකට මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මඟින් 2022 අප්‍රේල් 12 දින නිකුත් කරන ලද අන්තර්කාලීනව විදේශීය ණය සේවාකරණය අත්හිටුවීමේ ප්‍රතිපත්තිමය තීරණය අනුව, 2022 අප්‍රේල් 13 දින සිට වර්ෂයේ අවසන් දින වන විට ඇතැම් ණය වාරික හා පොලී ගෙවීම් අත්හිටුවා තිබුණු නමුත්, ඊට අදාළව වූ ගෙවීම් සිදු කලේ නම් මෙම ඌනතාවය තවදුරටත් වර්ධනය වන බව නිරීක්ෂණය විය.

2006 වර්ෂයේදී රු.බිලියන 151ක් වූ පොලී ගෙවීම්, 2024 වර්ෂය වන විට රු.බිලියන 2,689ක් දක්වා සියයට 1,681කින් වැඩි වී තිබුණි. අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා ණය ලබා ගැනීමට සිදුවී තිබූ අතර ඒ සඳහා වන පොලී ගෙවීම වාර්ෂිකව වැඩි වී තිබුණි. අයවැය කාර්යසාධනය හා හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රකාශය අනුව, 2024 වර්ෂයේදී රැස්කරන ලද රු.බිලියන 4,061ක් වූ රජයේ ආදායමෙන් රු.බිලියන 2,689ක් හෙවත් සියයට 66.22ක් පොලී ගෙවීමට සිදු වී තිබුණි. මෙම තත්ත්වය අදාළ කාලපරිච්ඡේදයේදී වාර්ෂිකව අඛණ්ඩව වර්ධනය වෙමින් පැවැති අතර 2019 වර්ෂයේ සිට එය සීඝ්‍ර ලෙස වර්ධනය වී තිබුණි. විස්තර පහත වගු අංක 2.8 හි දැක්වේ.

වගු අංක 2.8 - ණය සඳහා පොලී ගෙවීම සඳහා රැස්කළ ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් වැය කිරීම.

| වර්ෂය | තත්‍ය පුනරාවර්තන වියදම | පොලී වියදම | පොලී වියදම මුළු පුනරාවර්තන වියදමේ ප්‍රතිශතයක් ලෙස | තථ්‍ය ආදායම | පොලී ගෙවීම තථ්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු.බිලියන | රු.බිලියන | සියයට | රු.බිලියන | සියයට |
| **2006** | 579 | 151 | 26.08 | 477 | 31.66 |
| **2007** | 615 | 181 | 29.43 | 572 | 31.64 |
| **2008** | 736 | 212 | 28.80 | 664 | 31.93 |
| **2009** | 882 | 303 | 34.35 | 708 | 42.80 |
| **2010** | 951 | 348 | 36.59 | 826 | 42.13 |
| **2011** | 1,020 | 353 | 34.61 | 943 | 37.43 |
| **2012** | 1,118 | 409 | 36.58 | 997 | 41.02 |
| **2013** | 1,254 | 465 | 37.08 | 1,066 | 43.62 |
| **2014** | 1,370 | 446 | 32.55 | 1,128 | 39.54 |
| **2015** | 1,673 | 527 | 31.50 | 1,394 | 37.80 |
| **2016** | 1,771 | 611 | 34.50 | 1,699 | 35.96 |
| **2017** | 1,946 | 736 | 37.82 | 1,845 | 39.89 |
| **2018** | 2,109 | 852 | 40.40 | 1,935 | 44.03 |
| **2019** | 2,322 | 889 | 38.29 | 1,907 | 46.62 |
| **2020** | 2,683 | 975 | 36.34 | 1,379 | 70.70 |
| **2021** | 2,757 | 1,048 | 38.01 | 1,467 | 71.44 |
| **2022** | 3,539 | 1,565 | 44.22 | 1,999 | 78.29 |
| **2023** | 4,729 | 2,455 | 51.91 | 3,078 | 79.76 |
| **2024** | 5,370 | 2,689 | 50.07 | 4,061 | 66.22 |
| **එකතුව** | **37,424** | **15,215** | | **28,145** | |

මූලාශ්‍ර - 2006 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රජයේ මූල්‍ය ප්‍රකාශන

**රජයේ ණය ලබා ගැනීම**

ආදායම් ඇස්තමේන්තු පිළියෙල කර නොතිබීම හෝ පිළියෙල කළ ආදායම් ඇස්තමේන්තු අනුව ආදායම රැස් නොකිරීමත්, ආදායම් ඌනතාවයක් පැවතීම නිසා රජයට ණය ලබා ගැනීමට සිදු වී තිබුණි. රජයේ ණය ප්‍රමාණය ක්‍රමිකව ඉහළ යාම හේතුවෙන් ණය පොලී පිරිවැය ද වාර්ෂිකව වැඩිවී ඊට අනුරූපීව පුනරාවර්තන වියදමද වැඩි වී තිබුණි. ඒ අනුව, ඇස්තමේන්තු කළ ආදායම අපේක්ෂිත පරිදි රැස්

කර ගැනීමට නොහැකි වීම, පුනරාවර්තන වියදම් ක්‍රමිකව වැඩිවීම නිසා හා වාර්ෂිකව වියදම පියවා ගැනීමට තරම් ආදායම ප්‍රමාණවත් නොවීම නිසා ආදායම් ඌනතාවය වාර්ෂිකව වැඩි වී තිබුණි. විස්තර පහත රූප සටහනෙහි දැක්වේ.

**රූපසටහන 2.2 - ආදායම් ඌනතාවය තථ්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස**




**මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන 2007**

**අයවැය හිඟයේ වර්ධනය**

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 වර්ෂයේ අයවැය හිඟය රු.බිලියන 2,126ක් වී තිබු අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.11ක් වී තිබුණි. 2023 වර්ෂයේ අයවැය හිඟය රු.බිලියන 2,584ක් වී තිබුණු අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 9.35ක් වී තිබුණි. 2006 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා සමස්ත කාල පරාසය පුරාවට අයවැය හිඟයක් පැවැතුණු අතර, 2006 වර්ෂයේදී පැවැති රු.බිලියන 300ක අයවැය හිඟය 2024 වර්ෂය වන විට රු.බිලියන 2,126ක් දක්වා වර්ධනය වී තිබුණි. එම කාලපරාසය තුළ ඉහළම අයවැය හිඟය 2023 වර්ෂයේදී වාර්තා වී තිබුණි. 2006 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට සියයට 5.55ක සිට සියයට 14.08ක් දක්වා පරාසයක පැවතුණි. 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ ( අගෝස්තු 08 දින දක්වා බලාත්මකය.) 3(අ) වගන්තිය ප්‍රකාරව තත්‍ය අයවැය හිඟය තත්‍ය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පැවතිය යුතුව තිබුණු සියයට 5 ක සීමාව, එම කාල පරිච්ඡේදය තුළ කිසිම වර්ෂයකදී පවත්වා ගෙන නොතිබුණි. 2006 සිට 2024 දක්වා අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස පහත දැක්වේ.

**රූපසටහන 2.3 - අයවැය හිඟය ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස**




**මූලාශ්‍රය - මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තා සහ රජයේ මූල්‍ය ප්‍රකාශන 2006-**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ආර්ථික විවරණයේ සඳහන් අයවැය හිඟය**

රජයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වන අයවැය හිඟය හා ශ්‍රී ලංකා මහ බැංකුවේ 2024 වාර්ෂික ආර්ථික විවරණයේ (මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ සංඛ්‍යා සටහන් අනුව) සඳහන් වන අයවැය හිඟය අතර වෙනස් අගයන් වාර්තා කර තිබුණි. මේ සම්බන්ධයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවෙන් විමසීම් කළ විට රජයේ මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණ වර්ගීකරණය අනුව පිළියෙල කර ඇති බවත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ සඳහන් අයවැය හිඟය ආර්ථික වර්ගීකරණය අනුව ගණනය කර ඇති බවත් දන්වා තිබුණි. 2024 වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව අනුව අයවැය හිඟය රු.බිලියන 2,039.9ක් වී තිබුණි. කෙසේවුවද රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම හිඟය රු.බිලියන 2,126.19ක් වී තිබුණි. ඒ අනුව රු.බිලියන 86.29 ක වෙනසක් පැවැතුණි.

**අයවැය හිඟය මූල්‍යනය**

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව ඉකුත් වර්ෂයේ අයවැය හිඟය වූ රු.බිලියන 2,583 ට සාපේක්ෂව 2024 වර්ෂයේදී, එය රු. බිලියන 2,126ක් වූයෙන් අයවැය හිඟය රු.බිලියන 457කින් එනම් සියයට 17.7කින් අඩු වී තිබිණි. 2024 වර්ෂයේදී අයවැය හිඟය පියවා ගැනීමට ශුද්ධ වශයෙන් විදේශ ණය රු.බිලියන 333ක් හා ශුද්ධ වශයෙන් දේශීය ණය රු.බිලියන 1,868ක් ලබා ගැනීමට සිදු වී තිබුණි.

**ණය ශේෂය වර්ධනය වීම**

වාර්ෂිකව අයවැය හිඟය වර්ධනයවීම හමුවේ ණය ලබා ගැනීම් ප්‍රමාණයද වැඩි වී තිබුණි. රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2024 වර්ෂය අවසාන වන විට රජය විසින් ගෙවිය යුතු ණය ශේෂය ලෙස රු.බිලියන 29,627ක් වී තිබුණි. එම ශේෂය දේශීය ණය වශයෙන් රු.බිලියන 18,893ක්ද, විදේශ ණය වශයෙන් රු.බිලියන 10,734ක් වශයෙන් පැවතුණි. 2023 වර්ෂයේදී රජයේ ණය ශේෂය රු.බිලියන 29, 150ක් වී තිබුණි. ඒ අනුව, 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී ණය ශේෂය රු.බිලියන 478 කින් හෙවත් සියයට 1.64 කින් වැඩි වී තිබුණි. 2006 වර්ෂයේ පැවැති රු.බිලියන 2,431ක ණය ශේෂය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 82.72ක් වී තිබු අතර, 2024 වර්ෂය අවසාන වන විට ණය ශේෂය රු.බිලියන 29,627ක් වී තිබුණු අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 99.09ක් වී තිබුණි. තවද, 2013 අංක 15 දරන සංශෝධිත රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3(ඊ) වගන්තිය ප්‍රකාරව රජයේ බැරකම් දළ දේශිය නිෂ්පාදිතයෙන් සියයට 80 කට වඩා අඩු විය යුතුව තිබුණත්, 2024 වර්ෂය අවසානයේදී අනෙකුත් බැරකම් හැර රජයේ ණය බැරකම පමණක් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 99.09ක් වී තිබුණි. මෙම සීමාව ඉක්මවීමේ තත්ත්වය 2020, 2021 හා 2022 වර්ෂ වලදී ද පැවතුණි. විස්තර පහත රූපසටහනේ දැක්වේ.

**රූප සටහන 2.4 - රාජ්‍ය ණය ශේෂය ද.දේ.නි.ප්‍රතිශතයක් ලෙස**




මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන 2007 සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා

**රජයේ ණය**

2024 වර්ෂයේ මූලික ණය ගැනීමේ වැඩසටහන අනුව, සැලසුම්ගත භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම රු.මිලියන 2,409,700 ක් වී තිබුණ ද, 2024 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 3,071,892 ක් භාණ්ඩාගාර බැඳුම්කර මඟින් ණය ලබා ගෙන තිබුණි. ඒ අනුව, රු.මිලියන 662,192 ක් හෙවත් සැලසුම්ගත ප්‍රමාණය ඉක්මවා සියයට 27 ක් භාණ්ඩාගාර බැඳුම්කර මඟින් ණය ලබා ගෙන තිබුණි.

2024 වර්ෂයේ කාර්යසාධන සැලැස්මට අනුව විදේශීය ණය හා ප්‍රදාන ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සහ සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම පහත පරිදි විය.

**වගු අංක 2.10 - 2024 වර්ෂයේ කාර්යසාධන සැලැස්මට අනුව ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සහ සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම (එ.ජ. ඩො. මිලියනවලින්)**

| සංවර්ධන පාර්ශ්වකරුවන් | ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව ප්‍රදාන ඇතුලත්ව | සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම ප්‍රදාන ඇතුලත්ව | විචලනය | විචලනය, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස (% ) |
|---|---|---|---|---|
| ලෝක බැංකුව | 397 | 564.9 | 167.9 | 42 |
| ආසියානු සංවර්ධන බැංකුව | 600 | 862.1 | 262.1 | 44 |
| චීනය | 281 | 51.9 | (229.1) | (82) |
| ජපානය | 59 | 37.3 | (21.7) | (37) |
| කොරියාව | 39 | 4.3 | (34.7) | (89) |
| මැදපෙරදිග රටවල් සහ ඔපෙක් අරමුදල | 83 | 39.3 | (43.7) | (53) |
| දකුණු ආසියානු රටවල් | 124 | - | (124) | (100) |
| රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල් | 122 | 7.94 | (114.06) | (93) |
| IFAD ඇතුළු එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන | 48 | 16.4 | (31.6) | (66) |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 0 | 334 | 334 | - |
| එකතුව | **1,753** | **1,918** | | |

මූලාශ්‍රය - වර්ෂයේ කාර්යසාධන සැලැස්ම

**ප්‍රතිලබ්ධි වටිනාකම**

2024 වර්ෂයේ ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවේ මුළු වටිනාකම එ.ජ.ඩොලර් මිලියන 1,753ක් වුවද, සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම එ.ජ.ඩො. මිලියන 1,918ක් වීම හේතුවෙන් සත්‍ය ප්‍රතිලබ්ධි

වටිනාකම, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවට වඩා එ.ජ.ඩොලර් මිලියන 165කින් එනම්, සියයට 9.4කින් පමණ වැඩි වී තිබුණි. ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකුව ලබා ගත් ණයවල සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සමඟ සසඳන විට, පිළිවෙළින් සියයට 42 සහ 44 කින් වැඩි වී තිබුණි.

චීනය, ජපානය, කොරියාව, මැදපෙරදිග රටවල් සහ ඔපෙක් අරමුදල, දකුණු ආසියානු රටවල්, රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල් හා IFAD ඇතුළු එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනයන්ගෙන් ලබා ගැනීමට අපේක්ෂා කළ ණය සියයට 37 සිට 93 දක්වා පරාසයක විහිදී තිබුණි.

2024 වර්ෂය අවසානයේදී දකුණු ආසියාතික රටවලින් ණය ලබා ගැනීමට ඇස්තමේන්තු කළද, වර්ෂය අවසාන වන විටත් එම ණය ලබාගෙන නොතිබුණි.

2024 වර්ෂය තුළ ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවට අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් (IMF) කිසිදු ප්‍රතිලබ්ධිවීමක් අපේක්ෂා නොකළද එ.ජ.ඩො. මිලියන 334 ක් ප්‍රතිලබ්ධි වී තිබුණි.

**වර්ෂයේදී දේශීය හා විදේශීය ණය ලබා ගැනීම**

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 වර්ෂයේදී විදේශීය ණය රු. මිලියන 579,957ක් ද, දේශීය බැංකු නොවන ණය (භාණ්ඩාගාර බිල්පත් මඟින් ශුද්ධ ණය ගැනීම් ඇතුළත්ව) රු.මිලියන 2,973,903ක් ද, වශයෙන් එකතුව රු.මිලියන 3,553,860ක ණය ලබා ගෙන තිබුණි. එය ඉකුත් වර්ෂයේ ලබාගෙන තිබුණු රු.මිලියන 8,373,233ක ණය ප්‍රමාණය (භාණ්ඩාගාර බිල්පත් මඟින් ශුද්ධ ණය ගැනීම් ඇතුළත්ව) සමඟ සැසඳීමේදී, රු.මිලියන 4,819,373කින් හෙවත් සියයට 57.56කින් අඩුවීමකි. 2024 වර්ෂයේදී රජය දේශීය ණය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වා තිබුණි. විස්තර පහත වගු අංක 2.11 හි දැක්වේ.

වගු අංක **2.11 - රජය විසින් ලබා ගත් දේශීය හා විදේශීය ණය**

| විස්තරය | **2024** රු.මිලියන | **2023** රු.මිලියන |
|---|---|---|
| විදේශීය ණය ගැනීම් | 579,957 | 831,951 |
| දේශීය ණය ගැනීම් | | |
| • භාණ්ඩාගාර බිල්පත් (ශුද්ධ) | (22,040) | (33,929) |
| • භාණ්ඩාගාර බැඳුම්කර | 3,071,892 | 7,614,523 |
| • විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (ව්‍යාපෘති නොවන) | (75,949) | (39,656) |
| • සංවර්ධන බැඳුම්කර | - | 344 |
| මුළු දේශීය ණය ගැනීම් | 2,973,903 | 7,541,282 |
| වර්ෂය තුළ ලබා ගත් මුළු ණය ප්‍රමාණය | **3,553,860** | **8,373,233** |

**මූලාශය - රජයේ මූල්‍ය ප්‍රකාශන 2023 හා 2024**

**ගෙවිය යුතු මුළු රජයේ ණය ශේෂය**

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුළු රජයේ ණය ශේෂය (බැංකු අයිරාව හැර) රු.මිලියන 29,627,610 ක් වූ අතර, එය 2023 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 29,150,389 ක් වූ මුළු රජයේ ණය ශේෂය (බැංකු අයිරාව හැර) සමඟ සැසඳීමේදී රු.මිලියන 477,221 කින් හෙවත් සියයට 1.64 කින් වැඩිවී තිබුණි. 2023 හා 2024 වර්ෂය අවසානයට පැවති මුළු රජයේ ණය පිළිබඳ විස්තරයක් පහත 2.12 වගුවෙ හි දැක්වේ.

වගු අංක 2.12 - වර්ගීකරණය කරන ලද වර්ෂය අවසානයට පැවති ණය ශේෂය

| විස්තරය | දෙසැම්බර් 31 දිනට ශේෂය | |
|---|---|---|
| | 2024 | 2023 |
| | රු.මිලියන | රු.මිලියන |
| භාණ්ඩාගාර බිල්පත් | 4,070,414 | 4,092,454 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 14,130,862 | 12,021,359 |
| විදේශ ව්‍යවහාර මුදලින් දේශීය ණය | - | 77,742 |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (ව්‍යාපෘති) | 16,267 | 20,269 |
| සුහුරුපාය ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ලබා ගත් ණය | 3,413 | 3,982 |
| භාණ්ඩාගාර බැඳුම්කර (සක්‍රීය වගකීම් කළමනාකරණ පනත) | 8,000 | 23,000 |
| විශ්‍රාම පාරිතෝෂික ණය | 40,783 | 44,854 |
| කල්බදු ණය හිමියන් | 1,031 | 1,313 |
| දේශීය කාලීන ණය පහසුකම් | | - |
| මහජන බැංකුව | 159,823 | |
| ලංකා බැංකුව | 462,783 | |
| රජය ඇප වූ ලංකා ඛනිජතෙල් සංස්ථාව | - | 788,682 |
| **මුළු දේශීය ණය** | **18,893,378** | **17,073,655** |
| විදේශීය (ව්‍යාපෘති) | 6,918,540 | 7,301,756 |
| විදේශ මුදලින් කාලීන ණය පහසුකම් | 715,520 | 709,741 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 3,100,172 | 4,065,237 |
| මුළු විදේශීය ණය | 10,734,231 | 12,076,734 |
| මුළු රජයේ ණය ශේෂය | **29,627,610** | **29,150,389** |
| ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතය | **29,899,000** | **28,103,000** |
| මුළු රජයේ ණය ශේෂය ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස | 99.09 | 103.73 |

මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන 2023 හා 2024

**උපරිම බැරකම් සීමාව ඉක්මවීම**

2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත (සංශෝධිත පරිදි) ප්‍රකාරව, යම් වර්ෂයක් අවසානයට පැවතිය හැකි උපරිම බැරකම් වටිනාකම එම වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත දළ දේශීය නිශ්පාදනයෙන් සියයට 80 නොඉක්මවිය යුතුව තිබුණත්, 2024 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකළ විදේශ ණයද සැලකිල්ලට

ගත්විට 2024 වර්ෂයේදී එම සීමාව සියයට 94.39 කින් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. විස්තර වගුව 2.13හි දැක්වේ.

**වගු අංක 2.13 - උපරිම බැරකම් සීමාව ඉක්මවීම**

| **බැරකම්** | **2024 දෙසැම්බර් 31 දිනට බැරකම් වටිනාකම රු.බිලියන** |
|---|---|
| බැංකු අයිරාව | 105 |
| රජයේ ණය (රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව) | 29,627 |
| මහ බැංකු අත්තිකාරම් | - |
| මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත නොකළ බැරකම්: | |
| - ගිණුම්ගත නොකළ විදේශ ණය | 01 |
| මුළු බැරකම් | 29,733 |
| ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතය | 31,500 |
| මුළු බැරකම් ඇස්තමේන්තුගත දළ දේශීය නිශ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | 94.39 |

**මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන**

**රාජ්‍ය ව්‍යාපාර ණය සඳහා බැංකු වෙත ලබාදී ඇතිඇපකර හා සහන ලිපිවල වටිනාකම**

මහා භාණ්ඩාගාරයේ ඇපකර මත රාජ්‍ය ව්‍යවසායන් විසින් ලබාගෙන තිබුණු ණය සඳහා බැංකු වෙත ලබාදී ඇති ඇපකර හා සහන ලිපිවල වටිනාකම වූ රු.බිලියන 1,454ක් සහ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකකවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ප්‍රකාශනවල ඇතුළත් රු.බිලියන 84ක වටිනාකම්ද ඉහත බැරකම් තුළට ඇතුළත් කර නොමැත.

**ඒක පුද්ගල ණය ප්‍රමාණය**

ඉහත තොරතුරු අනුව, මුළු රජයේ ණය, මධ්‍ය වාර්ෂික ජනගහනය සමඟ සැසඳීමේදී 2012 දෙසැම්බර් 31 දිනට රු. 264,811ක් වූ ඒක පුද්ගල ණය වටිනාකම 2024 දෙසැම්බර් 31 දිනට රු. 1,351,871ක් දක්වා වැඩිවී තිබුණි. එසේම එය, 2023 දෙසැම්බර් 31 දිනට රු.1,322,793ක් වූ ඒක පුද්ගල ණය ප්‍රමාණය සමඟ සැසඳීමේදී රු.29,078කින් හෙවත් සියයට 2.19කින් පමණ වැඩිවී තිබුණි. 2024 වර්ෂයේ හා ඉකුත් වර්ෂ 12ක ඒක පුද්ගල ණය ප්‍රමාණය රූපසටහන 2.5හි දැක්වේ.

**රූපසටහන 2.5 - ඒක පුද්ගල ණය ප්‍රමාණය**




**මූලාශ්‍ර - රජයේ මූල්‍ය ප්‍රකාශන 2007 සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා**

**රජයේ ආදායම අඩුවී ණය වාරික හා පොලී ගෙවීම වැඩිවීම**

2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂය අවසානයට පවතින ශුද්ධ ණය ගැනීම් (දේශීය හා විදේශීය) රු.මිලියන 477,220 කින් වැඩි වී තිබුණු අතර ණය සඳහා පොලී ගෙවීම් 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී රු.මිලියන 233,901 කින් හෙවත් සියයට 9.53 කින් වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂවලදී මෙන් 2024 වර්ෂයේදී ද ණයවාරික හා පොලී ගෙවීමට රැස්කළ ආදායම ප්‍රමාණවත් වී නොතිබුණි. විස්තර රූපසටහන 2.6 හි දැක්වේ.

**රූපසටහන 2.6 - ණය වාරික හා පොලී ගෙවීමට රැස්කළ ආදායම ප්‍රමාණවත් නොවීම**




**මූලාශ්‍රය - රජයේ මූල්‍ය ප්‍රකාශන 2013- 2024**

**රාජ්‍ය ව්‍යවසායන් සඳහා රජයේ ප්‍රාග්ධන දායකත්වය**

2024 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, රාජ්‍ය ව්‍යවසායන් 156ක් සඳහා වන ප්‍රාග්ධන දායකත්ව වටිනාකම රු.මිලියන 2,493,231ක් වූ අතර, 2023 දෙසැම්බර් 31 දිනට එම වටිනාකම රු. මිලියන 2,407,633ක් විය. ඒ අනුව, වර්ෂයට අදාළව රාජ්‍ය ව්‍යවසායන් සඳහා ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 85,598කින් හෙවත් සියයට 3.55කින් ඉහළ ගොස් තිබුණි. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මඟින් අධීක්ෂණය කරනු ලබන රාජ්‍ය ව්‍යවසායන් 335ක් අතරින් රාජ්‍ය ව්‍යවසායන් 52ක් ජාතික ඉහළ තලයකට පරිවර්තනය කිරීමෙහිලා උත්ප්‍රේරණ කාර්යයක් සිදු කරන ලෙස හඳුනාගෙන ඇති අතර එම ක්‍රමෝපායිකව වැදගත්වන රාජ්‍ය ව්‍යවසායන් 52හි 2023 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

**අඛණ්ඩව අලාභ ලබන රාජ්‍ය ව්‍යවසායන්**

2024 දෙසැම්බර් 31 දිනට රජය විසින් රු.මිලියන 218,245ක ප්‍රාග්ධන දායකත්වය සපයා තිබූ රාජ්‍ය ව්‍යවසායන් 6 ක 2023 දෙසැම්බර් 31 දිනට එම වටිනාකම රු.මිලියන 204,367ක් වූ අතර, එම ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනට ඒවායේ ශුද්ධ වත්කම් (මුළු වත්කම් - මුළු බාහිර වගකීම්) රු.මිලියන 412,450ක සෘණ අගයක් වී තිබුණි. ඒ අනුව, රජයේ මූල්‍ය

ප්‍රකාශනවල මූල්‍ය වත්කම් යටතේ මෙම ප්‍රාග්ධන දායකත්වයන් දක්වා ඇති නමුත්, එහි වටිනාකම පූර්ණ වශයෙන් හානිකරණය (impairment) වී, අදාළ ආයතන මුළුමනින්ම බාහිර වගකීම් යටතේ පවත්වාගෙන යන තත්ත්වයකට පත්ව ඇති බව නිරීක්ෂණය විය. අදාළ ආයතන අඛණ්ඩව අලාභ ලැබීම හේතුවෙන් රඳවා ගත් ලාභය ඍණ අගයක් ගැනීම මේ සඳහා මූලික වශයෙන් හේතු වී තිබුණි.

**ප්‍රාග්ධන දායකත්වය හානිකරණයට ලක්වෙමින් පවතින රාජ්‍ය ව්‍යවසායන්**

2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1,935,428ක රජයේ ප්‍රාග්ධන වටිනාකමක් සහිත රාජ්‍ය ව්‍යවසායන් 05ක, එම ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම්වල අගය රු.මිලියන 550,744ක් වී තිබුණි. ඒ අනුව, මෙම රාජ්‍ය ව්‍යවසායන්වල ආයෝජනය කර ඇති ප්‍රාග්ධන දායකත්ව වටිනාකම හානිකරණයට (impairment) ලක් වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

**ශුද්ධ වත්කම් හානිකරණය වන රාජ්‍ය ව්‍යවසායන්**

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යවසායන් 156 ක් සඳහා ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 2,407,633ක් වූ අතර, එයින් රු.මිලියන 2,344,598 ක් ක්‍රමෝපායික වශයෙන් වැදගත් සේ සලකන රජයේ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම් ඇතුළු රාජ්‍ය ව්‍යවසායන් 47ක ආයෝජනය කර තිබුණි. එසේ වුවද, මෙම ක්‍රමෝපායික වශයෙන් වැදගත් සේ සලකන රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් වටිනාකම රු. මිලියන 2,161,258ක් වී තිබුණි. ඒ අනුව, එම ආයතනවල රජයේ ප්‍රාග්ධන දායකත්වය එම ආයතනවල ශුද්ධ වත්කම්වලට සාපේක්ෂව ඍණ සියයට 7.6කින් හෙවත් ඍණ රු. මිලියන 183,340කින් හානිකරණය වී ඇති බව නිරීක්ෂණය විය.

**සමස්ත ශුද්ධ අලාභය**

2023 වර්ෂය තුළදී රජය විසින් ආයෝජනය කරන ලද ක්‍රමෝපායික වශයෙන් වැදගත් සේ සලකන රාජ්‍ය ව්‍යවසායන් 52කට අදාළව එකතුව රු.මිලියන 378,702ක ශුද්ධ ලාභයක් උපයා තිබුණ ද, මේ තුළ රාජ්‍ය සංස්ථා 07කට අදාළව රු.මිලියන 5,093ක අලාභයක් ද, ව්‍යවස්ථාපිත මණ්ඩල 02 කට අදාළව රු.මිලියන 324ක අලාභයක්ද, රජය සතු සමාගම් 03කට අදාළව රු.මිලියන 1,086ක අලාභයක්ද ලබා ඇති බව නිරීක්ෂණය විය.

**ද්‍රවශීලතා දුෂ්කරතාවයන්ට මුහුණ දීමේ අවධානම**

2023 වර්ෂය අවසානය වන විට ක්‍රමෝපායික වශයෙන් වැදගත් සේ සලකන රාජ්‍ය ව්‍යසායන් 08කට අදාළව ජංගම අනුපාතය දුර්වල තත්ත්වයක පැවතුණි. විශේෂයෙන්ම ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සහ ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවේ ජංගම අනුපාතය පිළිවෙලින් 0.15ක් හා 0.17ක් වැනි ඉතාමත් පහළ අගයක පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව, මෙම රාජ්‍ය ව්‍යවසායන් ද්‍රවශීලතා දුෂ්කරතාවයන්ට මුහුණ දීමේ ඉහළ අවධානමක් ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

**අධි ප්‍රාග්ධන තෝලන තත්ත්වය**

2023 වර්ෂය අවසානය වන විට ක්‍රමෝපායික වශයෙන් වැදගත් සේ සලකන රාජ්‍ය ව්‍යවසායන් 16ක් සම්බන්ධයෙන් අධි ප්‍රාග්ධන තෝලන තත්ත්වයක් නිරීක්ෂණය විය. තවද, මුළු හිමිකාරීත්වය සෘන අගයක් ගෙන ඇති රාජ්‍ය ව්‍යවසායන්ද නිරීක්ෂණය වූ අතර එම ආයතන මුළුමනින්ම දිගුකාලීන ණය මඟින් මූල්‍යනය කර තිබුණි. ඒ අනුව මෙම සියලු ආයතන ඉහළ මූල්‍ය අවධානමකට (Financial Risk) මෙන්ම අඛණ්ඩ පැවැත්ම පිළිබඳ දැඩි අවධානමකට මුහුණ දී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.

**වර්ෂය තුළ රජයට අයත් ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වයේ වැඩිවීම**

රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 වර්ෂය තුළ රජයට අයත් ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වයේ වැඩිවීම රු.මිලියන 87,285ක් වූ අතර, ඉන් රු.මිලියන 33,674ක් එනම් සියයට 38ක් එක් එක් ආයතනවල පුනරාවර්තන ස්වරූපයේ එනම් ණය සහ ණය පොළී ගෙවීම් සහ වැටුප් හා වේතන ගෙවීම් සඳහා මහා භාණ්ඩාගාරය වෙතින් නිදහස් කරන ලද මුදල්වලින් සමන්විත විය.

# 3. මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා භාණ්ඩාගාර මෙහෙයුම් කටයුතු

## මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

**ප්‍රතිපාදන උපයෝජනයේ ප්‍රගතිය**

වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා ගෙන නොතිබූ රජයට අයත් ප්‍රතිව්‍යුගතකරණ ඒකකය, සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය සහ මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහ ප්‍රතිසංස්කරණ වැඩ සටහන (ADB) යන ව්‍යාපෘති හා වැඩසටහන්වල වැය විෂයයන් 4ක් සඳහා එකතුව රු.මිලියන 956 ක් පරිපූරක ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. සමාජ ආරක්ෂණ ව්‍යාපෘතියේ එක් වැය විෂයයක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් රු. මිලියන 430ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද, රු. මිලියන 375 ක් ඉතිරි වී තිබුණි.එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 87 ක් වී තිබුණි.

**ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

සමාලෝචිත වර්ෂයේ දේශීය අරමුදල් උපයෝජනයෙන් ක්‍රියාත්මක වූ අන්තර් භාණ්ඩාගාර කළමනාකරණ හා තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.මිලියන 588කින් රු.මිලියන 541ක් උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි.

## රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණ ඒකකය

**ඒකකයේ ක්‍රියාකාරීත්වය**

රජය සතු ව්‍යාපාර ප්‍රතිව්‍යුහගතකරණය කිරීමට අදාළව එවකට මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ පිහිටුවා තිබූ රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගතකරණ ඒකකය 2022 දෙසැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වී තිබුණි. එසේ වුවද රජය සතු ව්‍යාපාර ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තියේ 02 වන මූලධර්මයෙහි සඳහන් පරිදි, පාලක සමාගමක් පිහිටුවීම හා 2023 මැයි මස 15 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි ප්‍රතිව්‍යුහගතකරණය සඳහා ලැයිස්තුගත කර ඇති ආයතන 72ක් පාලක සමාගමේ අනුබද්ධිත සමාගම් ලෙස පැවරීමට තීරණයකර තිබුණද, 2024 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රතිව්‍යුහගතකරණය සඳහා වූ පාලක සමාගම ස්ථාපිත කර නොතිබුණි.

තවද, එම පාලක සමාගම වෙත පවරාගෙන, ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජනා වී තිබු සංදේශයේ ඇමුණුම 01 ලැයිස්තුවේ සඳහන්, ආයතන 08 ක් පාලක සමාගම වෙත පවරා ගැනීමකින් තොරව ප්‍රතිව්‍යුහගතකරණය යටතේ බැහැර කිරීම් (Divesting) ක්‍රියාවලිය සඳහා ගනුදෙනු උපදේශකවරුන් තෝරාගෙන ඔවුන්ගේ සහාය යටතේ මෙම ආයතන සඳහා ලංසු කැඳවීමේ ක්‍රියාවලියට අවතීර්ණ වී තිබුණි. ඒ අනුව, තෝරාගත් ආයතන 08 න් ආයතන 07 ක් සඳහා ගණුදෙනු උපදේශකවරු පත්කිරීම සඳහා 2023 වර්ෂයේ අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. ගණුදෙනු උපදේශකවරුන් වශයෙන් ගිවිසුම්ගත වූ විදේශීය ආයතන දෙකක් සඳහා අමාත්‍යාංශයේ අංක 18/62P දරන පොදු තැන්පත් ගිණුමෙන් රු.මිලියන 193 ක මුදලක් 2024 වර්ෂයේදී ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

අලාභ ලබන අකාර්යක්ෂම ආයතන කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස පවත්වාගෙන යාම මෙහි මූලික අරමුණ වුවද, පළමු අදියරයේදි බැහැර කිරීමේ ක්‍රියාවලිය සඳහා තෝරාගත් ආයතන 08 න් ආයතන 04 ක් 2022 සහ 2023 වර්ෂයන්හිදි බදු පෙර ලාභ උපයා තිබු බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද, මෙම ආයතන සඳහා භාණ්ඩාගාරය වෙතින් මූල්‍ය දායකත්වයක් ලබාදී නොතිබු අතර අංක MF/052/CM/2022/177 හා 2022 අගෝස්තු 31 දිනැති අමාත්‍යමණ්ඩල සංදේශයේ 4 ඡේදයේ (i) ප්‍රකාරව, මෙම ආයතන ප්‍රතිව්‍යුහගතකරණය කිරීම සම්බන්ධයෙන් සිදුකල අධ්‍යන වාර්තාවන්හි අඩංගු තොරතුරු පිළිබඳව විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

2023 සහ 2024 යන වර්ෂයන් දෙක සඳහා රාජ්‍ය සතු ව්‍යාපාර ප්‍රතිව්‍යුහගතකරණ ඒකකය පවත්වාගෙන යාම වෙනුවෙන් එකතුව රු.මිලියන 121 වැයකර තිබූ අතර එයින් රු. මිලියන 58 ක් හෙවත් මුළු පරිපාලන වියදමින් සියයට 48ක් එම ඒකකයේ වැටුප් ගෙවීම වෙනුවෙන් වැය කර තිබුණි. කෙසේ වුවද, විගණනය වෙත ලද තොරතුරු අනුව, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණ ඒකකයේ (SOE) කටයුතු 2025 පෙබරවාරි මාසයේදී තාවකාලිකව අත්හිටුවා තිබූණි.

## රාජ්‍යය පෞද්ගලික හවුල්කාරිත්ව ජාතික නියෝජිතායතනය

**නියෝජිතායතයේ ක්‍රියාකාරිත්වය**

2022 සැප්තැම්බර් 13 දින අනුමත කල අංක MF/051/CM/2022/176 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ 03 ඡේදයේ පරිදි රාජ්‍ය සේවා කාර්යක්ෂමව ඉටු කිරීමත් හා ආයෝජන දිරිමත් කිරීම සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයෙන් යුත් ආකෘතිය මඟින් ක්‍රමවේදයක් හඳුන්වාදීම අරමුණු කර රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිව නියෝජිතායතනය පිහිටුවා තිබුණි. 2024 ඔක්තෝබර් 31 දින වනවිට මෙම නියෝජිතායතනය විසින් 2023 වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘති 12ක් ඇතුළුව ව්‍යාපෘති 14ක් මෙම ක්‍රමය යටතේ ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබූ අතර 2024 සැප්තැම්බර් 30 මේ ක්‍රමය යටතේ තවදුරටත් ව්‍යාපෘති 72ක් ක්‍රියාත්මක කිරීම සඳහා ලැයිස්තුගත කර තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට නියෝජිතායතනය ස්ථාපිත කර වර්ෂ දෙකක් ගත වුවද, ඊට අදාල, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව වැඩසටහන සඳහා වූ පනත විධිමත් පරිදි ස්ථාපිත නොවීම හේතුවෙන් දැනට මෙම ක්‍රමය යටතේ හඳුනාගෙන ආරම්භකර ඇති ව්‍යාපෘති හා ආරම්භ කිරීමට යෝජිත ව්‍යාපෘති නිශ්චිත කාලරාමුවකට අනුව අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, විගණනය වෙත ලද තොරතුරු අනුව, මෙම ඒකකයේ කටයුතු 2025 පෙබරවාරි 25 දින වන විට තාවකාලිකව අත්හිටුවා තිබුණි.

## බදු අභියාචනා කොමිසම් සභාව

2025 ජනවාරි 31 දින වනවිට බදු අභියාචනා කොමිෂන් සභාවේ ලියාපදිංචි කර ඇති එහෙත් විසඳා අවසන් නොවූ අභියාචනා 506ක් පැවති අතර ඊට අදාල බදු වටිනාකම රු.මිලියන 110,395ක් වී තිබුණි. මේ තුළ රු. බිලියනය ඉක්මවූ එකතුව රු.මිලියන 70,494ක් වූ අභියාචනා 29ක් හා රු.මිලියන 100ත් 1000 ත් අතර එකතුව රු.මිලියන 33,096ක් වූ අභියාචනා 107ක් ඇතුළත්වී තිබුණි. 2011 වර්ෂයේ සිට 2024 වර්ෂය අවසානය තෙක් ලියාපදිංචි වී තිබුණද කිසිඳු විභාග කිරීමක් ආරම්භ කර නොතිබූ බදු වටිනාකම රු.මිලියන 3,408ක්වූ අභියාචනා 27ක් හා විභාග කිරීම ආරම්භ කර ඇතත් නිශ්චයන් ලබා දී නොතිබූ එකතුව රු.මිලියන 106,990ක් වූ අභියාචනා 483 ඇතුළත් වී තිබුණි. තවද, 2022 වර්ෂයේ සිට 2025

ජනවාරි 28 දින දක්වා අභියාචනා විභාග කිරීම අවසන් වුවත්, අවසන් නිශ්චය ලබා දී නොමැති වූ ‘Reserved Cases’ 233ක් පැවැති අතර ඊට අදාළ බදු මුදලෙහි වටිනාකම රු.මිලියන 36,514ක් වී තිබුණි. මෙසේ බදු අභියාචනා විසඳීමේ ක්‍රියාවලියේ අවසන් අදියරේ කටයුතු දීර්ඝ කාලයක් නිම වී නොතිබීමෙන් කොමිෂන් සභාවේ තීන්දු අනුව, රජයට අයකරගත හැකිව තිබිය හැකි අදායම් එකතුකර ගැනීමේ සැළකිය යුතු ප්‍රමාදයක් සිදුවන බව නිරීක්ෂණය විය.

## කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

**දත්ත පද්ධතිය පවත්වාගෙන යාම**

භාණ්ඩාගාර ලේකම් සහ මුදල් හා ක්‍රමසම්පාදන ලේකම්ගේ අංක DMS/E/1/99 හා 1999 මැයි 05 දිනැති චක්‍රලේඛය අනුව පිහිටුවන ලද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රථම පියවර වශයෙන්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව තුළ පොදු දත්ත මූලාශ්‍රයන් පිහිටුවීමට හා විවිධ නියෝජිත ආයතන අතර අපිළිවෙලට විසිර පවත්නා දත්ත, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව යටතේ ඒකාබද්ධ කොට යාවත්කාලීන කොට කේන්ද්‍රගත කිරීමට යෝජනා වී තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ලෙසට රාජ්‍ය අංශයේ සහ පළාත් රාජ්‍ය සේවයේ සේවක පිරිස පිළිබඳ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණි. එසේවුවද, දෙපාර්තමේන්තුව පිහිටුවා සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 24ක පමණ කාලයක් ගතවී තිබුණ ද, දත්ත පද්ධතියක් නිර්මාණය කර අදාල යාවත්කාලීන තොරතුරු පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.

**තත්‍ය කාර්ය මණ්ඩල තොරතුරු පවත්වාගෙන යාම**

2017 අගෝස්තු 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, සියලුම රාජ්‍ය ආයතනවල නිලධාරීන් බඳවා ගැනීම්, ඉල්ලා අස්වීම්, සේවය අත්හැර යාම්, සේවයෙන් පහ කිරීම්, විශ්‍රාම ගැනීම් සහ මිය යෑම් වැනි කරුණුවලට අදාළව සිදුවන වෙනස්වීම් දක්වමින් රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩලය පිළිබඳ දත්ත පද්ධතිය පවත්වාගෙන යාමේ හා යාවත්කාලීන කිරීමේ වගකීම, දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණද, එබඳු තොරතුරු පද්ධතියක් පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.

**කාර්ය මණ්ඩල සමාලෝචනය** 2017 ජනවාරි 21 දිනැති අංක 01/2017 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය පරිදි, රාජ්‍ය ආයතනවල කාර්යයන් ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාමට අවශ්‍ය අවම කාර්ය මණ්ඩලය හඳුනාගෙන, ඒ පිළිබඳව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කිරීමට හා එම තොරතුරු පදනම්ව කාර්ය මණ්ඩල සමාලෝචන කමිටුවක් මගින් එක් එක් ආයතනයට අවශ්‍ය ප්‍රශස්ත කාර්ය මණ්ඩලය තීරණය කිරීමට නියමිතව තිබුණි. එසේවුවද, 2024 දෙසැම්බර් 31 දින වන විටත් රාජ්‍ය ආයතන 1027 ක් අතරින් ආයතන 765ක කාර්ය මණ්ඩල සමාලෝචන වාර්තාවන් ලබා ගැනීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි.

## ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

**කාර්යභාරයන් ඉටු කිරීම** 2024 වර්ෂයේ විවිධ රේඛීය අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වූ විශාල සහ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති 226ක් පැවති අතර, ඒ අතරින් ව්‍යාපෘති 120ක් දේශීය අරමුදල් හා ණය මගින් ද, ව්‍යාපෘති 106ක් විදේශීය ණය හා ප්‍රදාන මගින් ද මූල්‍යනය කර තිබුණි. කෙසේ වුවද 2024 වර්ෂයේදී නිම කිරීමට නියමිතව තිබූ ව්‍යාපෘති 110ක් අතරින් ව්‍යාපෘති 23 ක් පමණක් අවසන් කර තිබූ අතර, වර්ෂ අවසානය වන විට කාර්යසාධන ගැටළු හේතුවෙන් ව්‍යාපෘති 02 ක් අත්හිටුවා තිබුණු අතර ව්‍යාපෘති 85 ක් අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වී තිබුණි. එසේම, 2024 වර්ෂයදී මෙම ව්‍යාපෘති සඳහා දළ වශයෙන් රු.බිලියන 705ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණද, වර්ෂය අවසාන වන විට රු. බිලියන 402ක් හෙවත් ප්‍රතිපාදනයෙන් සියයට 57ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය ඉහළ නැංවීම සඳහා වූ දෙපාර්තමේන්තුවේ අරමුණු අපේක්ෂිත පරිදි සම්පූර්ණයෙන් ඉටුකරගත හැකිවන ලෙස කටයුතු මෙහෙයවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබූ බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව අනුව වර්ෂය තුළ ව්‍යාපෘති ක්ෂේත්‍ර චාරිකා පරීක්ෂණ 79ක් ඉලක්කකර තිබුණද, ව්‍යාපෘති 41ක් පමණක් ආවරණය කර තිබුණි.

**අනාර්ථික ගනුදෙනු** දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වන ව්‍යාපෘති ප්‍රගති අධීක්ෂණය හා කළමණාකරණ සඳහා අත්‍යවශ්‍ය දත්ත රැස්කිරීමේ හා ඇගයීමේ ප්‍රධාන මාධ්‍යක් ලෙසට භාවිතා කිරීම සඳහා ජාතික

සංවර්ධන තොරතුරු පද්ධතිය (NDIS) සඳහා නව තාක්ෂණය යොදා ගනිමින් වෙබ් පදනම් කර ගත් ව්‍යාපෘති අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා, 2021 වර්ෂයේදී විවෘත මිල කැඳවා බදු සහිත රු. මිලියන135.72ක කොන්ත්‍රාත් වටිනාකමකට සමාගමක් වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2022 අගෝස්තු 31 දින මෙම කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබුණු අතර, 2024 දෙසැම්බර් 31 දින වනවිටත්, අදාල තොරතුරු පද්ධතිය නවීකරණය කර ගැනීමට අපොහොසත්වී තිබුණි. ඒ අනුව, ව්‍යාපෘති කළමණාකරණයේදී ඒවා සමාලෝචනය, වාර්තා කිරීම, සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කිරීම වැනි අවස්ථාවලදී මතුවන ගැටළු නිරාකරණය හා සම්බන්ධීකරණය අවම කාර්යක්ෂමතාවයකින් යුතුව ක්‍රියාත්මක වන බවට නිරීක්ෂණය විය.

## කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය

**කාර්යභාරයන් ඉටු කිරීම**

රජයේ සියලු වත්කම් මධ්‍යගතව ලේඛනගත කිරීම තුළින් රජයේ වත්කම් කළමනාකරණය, වත්කම් පිළිබඳ පිරිවැය කළමනාකරණය හා අධීක්ෂණය කිරීම අරමුණු කොටගෙන 2017 වර්ෂයේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද අයවැය යෝජනාවක් අනුව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය පිහිටුවා තිබුණි. ඒ අනුව ඉඩම්, ගොඩනැගිලි, මෝටර් රථ, නැව්, ගුවන් යානා, යන්ත්‍රෝපකරණ ආදිය ද ඇතුළත් දේශීයව හා විදේශීයව රජය සතු සියලු වත්කම් මධ්‍යගතව ලේඛනගත කිරීම මෙම කාර්යාලය ඉටු කළ යුතු ප්‍රමුඛ කාර්යයක් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ අනුව, 2024 දෙසැම්බර් 31 දින වනවිට මෙම කාර්යාලය පිහිටුවා වසර 07ක් ඉක්මගොස් තිබුණ ද, ඉහත දක්වන ලද සියලු වත්කම් ඇතුළත් කොට මධ්‍යගතව ලේඛනගත සකස්කිරීමට හා ඒවා යාවත්කාලීන කිරීමට කාර්යාලය අපොහොසත්වී තිබුණි.

## රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**හිඟ ආදායම් අය කර ගැනීම**

මු.රෙ 128 (2) ඉ ප්‍රකාරව, රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධව රාජ්‍ය ආදායම පිළිබඳ ගණන්දීමේ නිලධාරියකුගේ වගකීම වුවත්, 2010 වර්ෂයට පෙර සිට පැවත එන හා 2024 දෙසැම්බර් 31 දිනට වූ රු.මිලියන 62.78ක්වූ හිඟ

සමාජ වගකීම් බදු මුදලින් වර්ෂය තුළ කිසිදු බදු මුදලක් අයකර ගෙන නොතිබූ අතර ඊට අදාලව සාධනීය පියවරක් ගැනීමට 2024 දෙසැම්බර් 31 දින වන විටත් දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

## වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම**

සාර්ක් කලාපීය රටවල් 8 ක සහභාගීත්වයෙන් පිහිටුවාගෙන ඇති දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (සැෆ්ටා / SAFTA) සඳහා ශ්‍රී ලංකාව 2005 වර්ෂයේදී අත්සන් කර තිබුණි. මෙම වෙළඳ ගිවිසුමේ වෙළඳාම ලිහිල්කරණ වැඩසටහනේ දෙවන අදියර අවසාන බාණ්ඩය යටතේ සකස් වී ඇති රේගු සංකේතාංක 50 (සංකේත 8 කින් යුත්) සඳහා වර්තමානයේ ක්‍රියාත්මක වන තීරු බදු කපා හැරීම සියයට 7.5 හා සියයට 6 ක ප්‍රමාණය 2018 දෙසැම්බර් මාසය වන විට සියයට 5 දක්වා අඩු කිරීමට යෝජනා කර තිබුණ ද, එකී කටයුතු ඉටුකිරීමට දෙපාර්තමේන්තුව 2024 දෙසැම්බර් 31 දින වන විටත් අපොහොසත්වී තිබුණි.

**බංගලාදේශය - ශ්‍රී ලංකාව අතර වරණීය වෙළඳ ගිවිසුම (BS-PTA)**

ශ්‍රී ලංකාව හා බංගලාදේශය අතර වරණීය වෙළඳ ගිවිසුමකට එළඹීම සම්බන්ධයෙන් වන සාකච්ඡා ආරම්භ කිරීම සඳහා 2021 ජුනි 14 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය දී තිබුණි. එම කාර්යයට අදාළව ඉදිරිපත් කර තිබූ දත්ත අනුව, 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ශ්‍රී ලංකාව හා බංගලාදේශය අතර වෙළඳාමෙන් යහපත් වෙළඳ ශේෂයන් සහ ඉහළ ආනයන ආවරණ අනුපාතයක් දෙරට අතර වෙළඳාම මඟින් අය කර ගෙන තිබුණි. ඒ අනුව, බංගලාදේශය - ශ්‍රී ලංකාව අතර වරණීය වෙළඳ ගිවිසුම (BS-PTA) අත්සන් කිරීමට අදාළ වැඩ සැලැස්මක් (Work Plan) සඳහා එකඟතාවයකට පැමිණ, දෙරට අතර ගිවිසුම අත්සන් කිරීම 2022 ජනවාරි මාසයට යෙදී තිබුණ ද, එකඟතාවය අනුව එකී කටයුතු ඉටුකිරීම සඳහා 2024 දෙසැම්බර් 31 දින දක්වාත් අපොහොසත්වී තිබුණි.

**චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම**

චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ එකඟතාවයට එළඹීම සම්බන්ධ සාකච්ඡා 2014 වර්ෂයේ ආරම්භ කර 2017 වර්ෂය දක්වා

පවත්වා තිබුණි. 2022 වර්ෂයේදී සාකච්ඡා නැවත ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණු අතර, 2024 දෙසැම්බර් 31 දින වන විටත් සාකච්ඡා මට්ටමේ පවතින බව නිරීක්ෂණය විය.

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**සර්වර් පරිගණකයේ ආරක්ෂාව**

දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි සෘජුවම බලපාන සර්වර් පරිගණක කාමරයෙහි ස්ථාපිත කර ඇති අඛණ්ඩ උෂ්ණත්වය නියාමනය සඳහා අත්‍යවශ්‍ය (precision air cooling system) සිසිලන පද්ධති දෙකෙන් Teenair වර්ගයේ යන්ත්‍රය වසර 02ක සිට අක්‍රියව පවතින අතර Liebert වර්ගයේ යන්ත්‍රයේ මාස 09ක පමණ සිට කාර්මික දෝෂයක් පවතින බවත් තාවකාලික සිසිලන අවශ්‍යතාවය සඳහා පවතින Frostair වර්ගයේ සාමාන්‍ය සිසිලන පද්ධතියද අක්‍රීයව පවතින බවත් නිරීක්ෂණය විය. ඒ අනුව, සර්වර් පරිගණක තුළ ඇති ජාතික වශයෙන් ඉතා වැදගත් දත්තවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් මේ දක්වා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොමැති බවට නිරීක්ෂණය විය.

**මිලදී ගත් UPS යන්ත්‍ර ක්‍රියාත්මක නොවීම**

දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදනයට පෙර නිසි අධ්‍යයනයක් සිදු කිරීමකින් තොරව 2014 දෙසැම්බර් 29 දින රු. මිලියන 16.32ක් ගෙවා UPS යන්ත්‍ර 18ක් මිලදී ගෙන තිබූ අතර මිල දී ගත් දින සිටම ක්‍රියාත්මක කර නොමැති යන්ත්‍ර 02 ක් ඇතුළුව සියළු යන්ත්‍ර වාර්තාවේ දිනය වූ 2025 මැයි 30 දින වනවිට අක්‍රීය තත්ත්වයේ බව නිරීක්ෂණය විය. මේ සඳහා කාර්යසාධන සුරක්ෂණයද ලබාගෙන නොතිබුණි. මෙම යන්ත්‍රවල සේවා කටයුතු සඳහා ගිවිසුම් 05ක් යටතේ රු. මිලියන 17.03ක් ගෙවා තිබුණි. ඒ අනුව, ජාතික වශයෙන් ඉතාමත් වැදගත් හා වටිනා දත්ත විශාල ප්‍රමාණයක් මෙහෙයවනු ලබන පරිගණක ඇතුලු වටිනා යන්ත්‍ර UPS යන්ත්‍ර නොමැතිව අනාරක්ෂිතව ක්‍රියාත්මකවන බවට විගණනයට අනාවරණය විය.

**පිරිවිතරවලට අනුකූල නොවූ පරිගණක මිලදී ගැනීම**

2023 දෙසැම්බර් 29 දින රු. මිලියන 2.98කට මිලදී ගෙන තිබූ ලැප්ටොප් පරිගණක 10 ක සාම්පල අදාල පිරිවිතර වලට අනුකූලතාවය පරීක්ෂාකර තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් මිලදී ගැනීම නිර්දේශ කර නොතිබුණු අතර සියළු පරිගණක

දෙපාර්තමේන්තුවට ලැබීමෙන් පසු ඒවා දෙපාර්තමේන්තු පිරිවිතරයට අනුකූල නොවන බවට තොරතුරු තාක්ෂණ අංශය විසින් 2024 ජනවාරි 08 දින නිර්දේශකර තිබුණි. එසේ වුවද අදාල නිර්දේශ නොසලකා 2024 පෙබරවාරි 16 සහ සැප්තැම්බර් 03 දිනවලදී සම්පූර්ණ වටිනාකම ගෙවීමට කටයුතු කර තිබුණි.

## තක්සේරු දෙපාර්තමේන්තුව

**හිඟ ආදායම්**

2024 වර්ෂය ආරම්භයේ පැවැති හිඟ තක්සේරු ආදායම රු. මිලියන 896.49න් 2024 වර්ෂය තුළදී රු. මිලියන 149.76ක් හෙවත් සියයට 16.7 ක් පමණක් අයකරගෙන තිබුණි. තවද, විගණනය වෙත ඉදිරිපත්කරන ලද තොරතුරු අනුව, 2024 වර්ෂය අවසානයේ පැවැති රු. මිලියන 748.73ක් වූ මුළු හිඟ තක්සේරු ආදායමෙන් සියයට 90.47 ක් එනම් රු. මිලියන 677.34ක් ආයතන 10 කට අදාළව වන අතර ඉන් සියයට 66.48 ක ප්‍රතිශතයක් නාගරික සංවර්ධන අධිකාරිය (UDA), S.W.R.D බණ්ඩාරණායක අනුස්මරණ ජාතික පදනම හා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යන ආයතනවලින් අය කර ගතයුතු බව නිරීක්ෂණය විය.

2008-2013 කාලච්ඡේදයට අදාලව UDA සහ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවවෙන් අයවිය යුතු හිඟ තක්සේරු ආදායම පිළිබඳව විධිමත් වාර්තා තබා නොගැනීම හේතුවෙන් පිළිවෙලින් රු. මිලියන 171.81ක් හා රු. මිලියන 9.55ක් වාර්තාවේ දිනය වූ 2025 මැයි 31 දින දක්වා අයකර ගැනීමට නොහැකිව ඉදිරියට ගෙන එමින් පවතී. තවද, හිඟ ආදායම් වාර්තාව අනුව ආයතනය හඳුනා ගත නොහැකි ලිපි ගොනු 04කට, ගොනු අංකය හෝ සඳහන් නොවූ තක්සේරු ආදායම් ගොනු 04කට අදාලව එකතුව රු. මිලියන 0.84ක හිඟ ආදායම් පැවැතුණි.

**වාහන තක්සේරු කිරීම**

හානියට පත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට අයත් වාහනයක හානි පිරිවැය තක්සේරු කිරීමට අදාලව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පරීක්ෂක නිලධාරියෙකුගේ නිර්දේශය හා එදිනම එම වාහනය භෞතිකව පරීක්ෂා කරන ලද දෙපාර්තමේන්තුවේ සහකාර තක්සේරුකරුගේ පරීක්ෂණ වාර්තාව පිළිබඳව නොසළකා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වයඹ ප්‍රාදේශීය ඉංජිනේරු කළමනාකරු විසින් පොලීසිය වෙත නිකුත්

කරන ලද තක්සේරු වාර්තාවක් පදනම් කරගෙන ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු විසින් නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු වෙත යොදන ලද සටහනකට අනුව වාහනයේ හානිපූර්ණ පිරිවැය රු. මිලියන 11.00ක් ලෙස වාර්තාකර තිබුණි.

**තක්සේරු අගයන් අඩුවීම**

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය සඳහා අංක 321/1/ඒ හයිලෙවල් පාර, මාකුඹුර, පන්නිපිටිය ලිපිනයේ පිහිටි ගොඩනැගිල්ල කුලියට ගැනීම සඳහා 2016 දෙසැම්බර් 15 දිනට නිකුත් කරන ලද තක්සේරු වාර්තාවට අනුව මාසික කුළිය රු.1,250, 000 ක් ලෙස තක්සේරු කර වාර්තා කර තිබුණි. එම ගොඩනැගිල්ල වෙනුවෙන් වසර 07කට පසු 2024 පෙබරවාරි 14 දිනට නිකුත් තර තිබූ තක්සේරු වාර්තාවට අනුව මාසික කුලිය රු.800,000ක් ලෙස එනම් මුල් තක්සේරු වටිනාකමට වඩා සියයට 36ක් අඩුවෙන් තක්සේරු කර වාර්තාකර තිබුණි. තවද, ඒ පිළිබඳව වැඩිදුර පරීක්ෂා කිරීම සඳහා 2016 වර්ෂයේ තක්සේරු ලිපි ගොනුව විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2022 මැයි 09 දින සිදුවූ දේපළ හානි වාර්තා කිරීම**

2022 මැයි මස 09 දින රටේ ඇති වූ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් සිදුවූ දේපළ හානි වෙනුවෙන් තක්සේරු වාර්තා නිකුත් කිරීම පිළිබඳව නියදි පරීක්ෂණයට අනුව අදාල මූලික තක්සේරු වාර්තා ලබාදීමෙන් පසුව අමාත්‍ය මණ්ඩල තීරණ සහ ජනාධිපති නියෝග, දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ඉල්ලීම් සහ දේපළ අයිතිකරුවන්ගේ ඉල්ලීම් සැලකිල්ලට ගෙන ප්‍රධාන තක්සේරුකරු විසින් එකී තක්සේරු අගයන්ගේ වටිනාකම් සියයට 22 සිට සියයට 158 දක්වා පරාසයකින් වැඩිකර තිබුණි. ඒ අනුව, තක්සේරු 16කට අදාලව මුල් තක්සේරු වාර්තාවලට සාපෙක්ෂව දෙවන තක්සේරු වාර්තාවෙන් තක්සේරු වටිනාකම් එකතුව රු. මිලියන 384.08 සිට රු. මිලියන 580.15ක් දක්වා සියයට 51 ක වැඩිවීමක් වාර්තාකර තිබුණි.

## රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

**ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වසා දැමීම**

2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ

පනතේ විධිවිධාන අනුව ව්‍යවස්ථාපිත නොවන අරමුදල් 13ක් වසා දැමීමට නිර්දේශ කර තිබුණ ද, එයින් අරමුදල් 2ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු අවසන් කර නොතිබුණි.

**e-GP පද්ධතිය පවත්වාගෙන යාම**

e-GP පද්ධතිය සංවර්ධනය කිරීමේ මූලික ගිවිසුමට 2019 නොවැම්බර් 25 දින එළඹ තිබුණ ද, 2025 මාර්තු 31 දින වන විටත් මිල සැදැහුම් ක්‍රමය යටතේ පමණක් ලංසු කැඳවීමට පද්ධතිය සංවර්ධනය කර තිබුණු අතර e-GP පද්ධතිය හරහා ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම අපේක්ෂිත ආයතන සංඛ්‍යාව මෙම පද්ධතියට ලියාපදිංචි කර ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි. 2025 මාර්තු 31 දින වන විට ජාතික හා ජාත්‍යන්තර ලංසු කැඳවීම යටතේ භාණ්ඩ ප්‍රසම්පාදනයට හැකිවන ලෙස පද්ධතිය සැකසීමට සැලසුම් කර තිබුණද 2025 මාර්තු 31 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

තවද, විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය සැකසීමේ කොන්ත්‍රාත්තුව සඳහා රු. මිලියන 71.50 කට පෞද්ගලික ආයතනයක් සමඟ 2019 නොවැම්බර් 25 දින ගිවිසුම් ගත වී තිබුණද 2021 දෙසැම්බර් 31 වන විටත් කොන්ත්‍රාත්කරු ප්‍රමාණවත් කාර්යසාධනයක් පෙන්වා නොතිබුණි. එසේ තිබියදීත් මෙම පද්ධතියේ නව අනුවාදය නිර්මාණය සඳහා මුල් කොන්ත්‍රාත් වටිනාකමට රු. මිලියන 81.37ක් ඇතුලත් කර රු.මිලියන 152.87ක් වූ කොන්ත්‍රාත් වටිනාකමකට මාස 20ක කාලයක් තුල පද්ධතිය සැකසීම සඳහා උක්ත කොන්ත්‍රාත් සමාගම සමඟ 2023 මාර්තු 22 දින මුල් කොන්ත්‍රාත්තුවට අතිරේකයක් අත්සන් කර තිබුණි. 2025 ජූනි 30 දින වන විට ගිවිසුම්ගත දින සිට මාස 27ක කාලයක් ගතවී ඇතත් නව ගිවිසුම යටතේත් අපේක්ෂිත කාර්යභාරය පද්ධති සංවර්ධක විසින් ඉටු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. ඉහළ කාර්යසාධනයන් ලබාගත හැකි විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදයකට රාජ්‍ය ප්‍රසම්පාදනය අනුගත කර ගැනීමේ ක්‍රියාවලිය වසර 06කට ආසන්න කාලයක් ප්‍රමාද වී පැවතුණු බවත් නිරීක්ෂණය විය.

## තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

**තොරතුරු පද්ධති**

භාණ්ඩාගාරයෙහි පවතින තොරතුරු පද්ධතින්හි මෘදුකාංග, දෘඩාංග මෙහෙයුම් සහ නඩත්තු කිරීම කිරීම සඳහා 2018 සැප්තැම්බර් 14 දින පෞද්ගලික සමාගමක් සමඟ රු. මිලියන 84.24ක් වටිනාකම් සහිත ගිවිසුමකට එළඹ තිබුණි. එහි වගකීම් කාලයෙන් පසු විවෘත තරඟකාරී ලංසු කැඳවීමක් සිදු නොකර පෙර සිටි කොන්ත්‍රාත්කරු වෙතම ලංසුව පිරිනමා තිබූ අතර ඒ සඳහා සාධාරණ තහවුරුවක් තාක්ෂණික ඇගයීම් කමිටුව හා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් ලබා දී නොතිබුණි. තවද, මේ සඳහා වසරක කාලයක් වෙනුවෙන් සේවා නඩත්තු ගිවිසුමකට එළඹීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය දී තිබුණ ද, මාස 40ක නඩත්තු කාලයකට ගිවිසුම් ගත වීම සම්බන්ධයෙන් තාක්ෂණික කමිටු නිර්දේශයක් හා ප්‍රසම්පාදන කමිටු අනුමැතියක් නොතිබුණු අතර මේ සඳහා රු. මිලියන 46.02ක් ගෙවීම් සිදු කර තිබුණි.

# බැංකු කටයුතු



2024 වසර අවසන් වන විට, බැංකු අංශය බලපත්‍රලාභී බැංකු 30කින්, එනම් විදේශ බැංකු ශාඛා 11ක් ද ඇතුළුව බලපත්‍රලාභී වාණිජ බැංකු 24කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු හයකින් සමන්විත විය. 2024 වසර තුළ දී, බැංකු ශාඛා 13ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 368ක් ස්ථාපිත කරන ලද අතර, බැංකු ශාඛා 10ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 24ක් වසා දමන ලදී. ඒ අනුව, 2024 වසර අවසානය වන විට සමස්ත බැංකු ශාඛා ඒකක සංඛ්‍යාව සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව පිළිවෙලින් 7,613ක් දක්වා සහ 7,286ක් දක්වා ඉහළ ගොස් ඇත.

**වගු අංක 2.14 - බැංකු, බැංකු ශාඛා හා අනෙකුත් බැංකු ඒකක ව්‍යාප්ති**

2.2 සංඛ්‍යා සටහන: බැංකු, බැංකු ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක ව්‍යාප්තිය

| වර්ගීකරණය | 2023 අවසානයට (අ) | 2024 අවසානයට (ආ) |
|---|---|---|
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | | |
| i. මුළු බලපත්‍රලාභී වාණිජ බැංකු සංඛ්‍යාව | 24 | 24 |
| දේශීය බැංකු | 13 | 13 |
| විදේශීය බැංකු | 11 | 11 |
| ii. මුළු බලපත්‍රලාභී වාණිජ බැංකු ඒකක සංඛ්‍යාව | 6,816 | 6,907 |
| ශාඛා (ඇ) | 2,934 | 2,936 |
| දේශීය බැංකු | 2,889 | 2,895 |
| විදේශීය බැංකු | 45 | 41 |
| ශිෂ්‍ය ඉතුරුම් ඒකක | 3,882 | 3,971 |
| iii. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර | 6,439 | 6,782 |
| **බලපත්‍රලාභී විශේෂිත බැංකු** | | |
| i. මුළු බලපත්‍රලාභී විශේෂිත බැංකු සංඛ්‍යාව | 6 | 6 |
| ජාතික මට්ටමේ ඉතිරි කිරීමේ බැංකු | 1 | 1 |
| නිවාස ණය ආයතන | 2 | 2 |
| අනෙකුත් බලපත්‍රලාභී විශේෂිත බැංකු | 3 | 3 |
| ii. මුළු බලපත්‍රලාභී විශේෂිත බැංකු ඒකක සංඛ්‍යාව | 705 | 706 |
| ශාඛා (ඇ) | 705 | 706 |
| ජාතික මට්ටමේ ඉතිරි කිරීමේ බැංකු | 267 | 268 |
| නිවාස ණය ආයතන | 64 | 64 |
| අනෙකුත් බලපත්‍රලාභී විශේෂිත බැංකු | 374 | 374 |
| iii. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර | 503 | 504 |
| **මුළු බැංකු ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක සංඛ්‍යාව** | 7,521 | 7,613 |
| **මුළු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව** | 6,942 | 7,286 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ශිෂ්‍ය ඉතුරුම් ඒකක හැර සියලුම බැංකු ඒකක

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**බැංකු අංශයේ වත්කම්**

2024 වසර තුල බැංකු අංශය එහි වත්කම් පදනම අනුව අඛණ්ඩව ප්‍රසාරණය වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් ආයෝජනය වැඩි වීම හේතු විය. මෙම අංශයේ මුළු වත්කම් පදනම 2024 තුල දී රු.බිලියන 1,781.3කින් වැඩි වී වසර අවසානය වන විට රුපියල් ට්‍රිලියන 22.2ක් ලෙස වාර්තා වූ අතර, 2023 වසර අවසානයේ පැවති වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 5.0ක වර්ධනයට සාපේක්ෂව, 2024 වසර අවසානයේ සියයට 8.7ක වර්ධනයක් වාර්තා කරන ලදී. වත්කම් ප්‍රසාරණයට ප්‍රධාන වශයෙන් දායක වූ ආයෝජන, 2024 වසර තුල රු.බිලියන 1,783.8කින් වැඩි වූ අතර, 2023 වසර

අවසානයේ පැවති වාර්ෂික ලක්ෂ්‍යාමය පදනම මත සියයට 23.1ක වර්ධනයට සාපේක්ෂව, 2024 වසර අවසානයේ දී සියයට 24.4ක වර්ධනයක් වාර්තා කරන ලදී. තවද, 2023 වසරේ ජූනි මාසයේ සිට වරින් වර ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති පොලී අනුපාත අඩුකිරීම් හරහා මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම සහ වෙළඳපොල ද්‍රවශීලතාවය සැලකිය යුතු ලෙස ඉහල යෑම, ණය වර්ධනයේ පහත වැටීමේ ප්‍රවණතාවය ආපසු හැරවීමට සහ වත්කම්වල ගුණාත්මක භාවයේ පිරිහීම පාලනය කිරීමට හේතු විය. ඒ අනුව, ණය සහ ලැබිය යුතු දෑ, 2023 අවසානයේ පැවති වාර්ෂික ලක්ෂ්‍යාමය පදනම මත සියයට 2.6ක සංකෝචනයේ සිට, 2024 අවසානයේ දී සියයට 4.1ක වර්ධනයක් දක්වා වැඩි විය.

**බැංකු අංශයේ වගකීම්**

2024 වසර අවසානයේ දී බැංකු අංශයේ සමස්ත වගකීම්වලින් හා හිමිකම්වලින් සියයට 81.0ක් නියෝජනය කරන ලද තැන්පතු, බැංකු අංශයේ අරමුදල සැපයීමේ ප්‍රධාන ප්‍රභවය ලෙස අඛණ්ඩව පැවති අතර, හිමිකම් සහ ණය ගැනීම් සමස්ත වගකීම්වලින් හා හිමිකම්වලින් පිළිවෙලින් සියයට 9.2ක් සහ සියයට 5.8ක් නියෝජනය කරන ලදී. 2024 වසර තුල සමස්ත තැන්පතු රු.බිලියන 1,338.9කින් වර්ධනය වූ අතර, කාලීන තැන්පතු වැඩි වීම එයින් සියයට 82.9කට දායක විය. 2024 වසර අවසන් වන විට සමස්ත තැන්පතුවලින්, කාලීන තැන්පතු සියයට 67.6ක් වූ අතර, ඉතුරුම් තැන්පතු සහ ඉල්ලුම් තැන්පතු පිළිවෙලින් සියයට 25.1ක් සහ සියයට 6.2ක් විය. ජංගම හා ඉතුරුම් ගිණුම් අනුපාතය, 2023 වසරේ සිට 2024 වසර දක්වා සියයට 32.3ක සිට සියයට 31.2ක් දක්වා සුළු වශයෙන් පහල යන ලදී. බැංකු අංශයේ සමස්ත ණය ගැනීම් 2023 වසරේ දී සියයට 25.3ක සංකෝචනයක් වාර්තා කරමින් රු.බිලියන 474.2කින් පහත වැටීමට සාපේක්ෂව, 2024 වසරේ දී සියයට 8.4ක සංකෝචනයක් පෙන්නුම් කරමින් රු.බිලියන 117.4කින් පහල යන ලදී. මෙම අඩු වීමට ප්‍රධාන වශයෙන් 2024 වසරේ දී විදේශ මුදල් ණය ගැනීම් එ.ජ.ඩොලර් මිලියන 281.8කින් අඩු වෙමින් සියයට 27.0ක සංකෝචනයක් වාර්තා කිරීම අතරතුර, රුපියල් ණය ගැනීම ද සියයට 0.2කින් සංකෝචනය වී එනම්, රු.බිලියන 2.3කින් පහත වැටීම හේතු විය.

රූපසටහන **2.15 -** බැංකු අංශයේ වත්කම් සහ වගකීම් සංයුතිය

**2.3 සංඛ්‍යා සටහන: බැංකු අංශයේ වත්කම් සහ වගකීම් සංයුතිය**

| අයිතමය | 2023 (අ) | | 2024 (ආ) | | වෙනස (%) | |
|---|---|---|---|---|---|---|
| | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) | 2023 | 2024 |
| **වත්කම්** | | | | | | |
| ණය සහ ලැබිය යුතු දෑ | 11,020.8 | 54.0 | 11,473.7 | 51.7 | -2.6 | 4.1 |
| ආයෝජන | 7,299.9 | 35.8 | 9,083.7 | 41.0 | 23.1 | 24.4 |
| වෙනත් (ඇ) | 2,073.7 | 10.2 | 1,618.2 | 7.3 | -4.5 | -22.0 |
| **වගකීම්** | | | | | | |
| තැන්පතු | 16,630.5 | 81.5 | 17,969.4 | 81.0 | 8.7 | 8.1 |
| ණය ගැනුම් | 1,397.4 | 6.9 | 1,280.0 | 5.8 | -25.3 | -8.4 |
| ප්‍රාග්ධන අරමුදල් | 1,765.5 | 8.7 | 2,043.2 | 9.2 | 10.5 | 15.7 |
| වෙනත් | 601.0 | 2.9 | 883.1 | 4.0 | -7.3 | 46.9 |
| **මුළු වත්කම්/වගකීම්** | 20,394.4 | 100.0 | 22,175.7 | 100.0 | 5.0 | 8.7 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුදල් හා බැංකු ශේෂයන්, ස්ථාපනයන්, ප්‍රති විකුණුම් ගිවිසුම් සහ ස්ථාවර වත්කම් ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූපසටහන **2.16 -** බැංකු අංශයේ තැන්පතු සංයුතිය

**2.4 සංඛ්‍යා සටහන: බැංකු අංශයේ තැන්පතු සංයුතිය**

| අයිතමය | 2023 (අ) | | 2024 (ආ) | | වෙනස (%) | |
|---|---|---|---|---|---|---|
| | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) | රුපියල් බිලියන | ප්‍රතිශතය (%) | 2023 | 2024 |
| ඉල්ලුම් තැන්පතු | 1,082.5 | 6.5 | 1,109.6 | 6.2 | 1.7 | 2.5 |
| ඉතුරුම් තැන්පතු | 4,292.5 | 25.8 | 4,502.6 | 25.1 | 15.8 | 4.9 |
| ස්ථාවර තැන්පතු | 11,045.8 | 66.4 | 12,155.9 | 67.6 | 6.3 | 10.1 |
| වෙනත් තැන්පතු | 209.7 | 1.3 | 201.2 | 1.1 | 58.1 | -4.1 |
| **මුළු තැන්පතු** | 16,630.5 | 100.0 | 17,969.4 | 100.0 | 8.7 | 8.1 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**බැංකු අංශයේ 3 වන අදියර යටතේ පවතින ණය අනුපාතය**

තෙවන අදියර යටතේ පවතින ණය අනුපාතය මගින් නිරූපණය කෙරෙන බැංකු අංශයේ අක්‍රීය ණය අනුපාතය, 2023 වසර අවසානයට සාපේක්ෂව 2024 වසර අවසානයේ දී අඩු වීමක් පෙන්නුම් කල නමුත් තවදුරටත් ඉහල මට්ටමක පැවතුණි. වසර තුල ණය ගුණාත්මකභාවයේ වර්ධනයක් පෙන්නුම් කරමින්, අක්‍රීය ණය අනුපාතය, 2023 වසර අවසානයේ පැවති සියයට 12.8 සාපේක්ෂව 2024 වසර අවසානයේ දී සියයට 12.3 දක්වා සුළු වශයෙන් පහල ගියේය. ණය ගුණාත්මකභාවය වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2024 අවසානයේ සමස්ත ණය ප්‍රමාණයේ වර්ධනය සහ අක්‍රීය ණය ප්‍රමාණයේ සුළු සංකොචනයයි. මෙයින් පෙන්නුම් කරන්නේ වැඩිදියුණු වූ සාර්ව ආර්ථික තත්වයන් ණය සැපයුම සහ ආපසු ගෙවීම් කෙරෙහි ඇති කරන ධනාත්මක බලපෑමයි. තවද, අක්‍රීය ණය සඳහා වෙන් කිරීම්වල සියයට 10.1ක වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සිදු වූ වර්ධනය මගින්, 2023 වසර අවසානයේ සියයට 49.0ක් වූ අක්‍රීය ණය සඳහා වන වෙන්කිරීම් ආවරණ අනුපාතය, 2024 වසර අවසානයේ දී සියයට 54.1 දක්වා වැඩිදියුණු විය.

**බැංකු අංශයේ ද්‍රවශීලතාවය**

ද්‍රවශීලතා ආවරණ අනුපාත (Liquidity Coverage Ratios) සහ ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (Net Stable Funding Ratio) මඟින් පෙන්නුම් කෙරෙන පරිදි බැංකු අංශයේ ද්‍රවශීලතාව 2024 වසරේ දී වර්ධනය විය. රුපියල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය 2023 වසර අවසානයේ පැවති සියයට 340.9 සිට 2024 වසර අවසානයේ දී සියයට 349.9 දක්වා ඉහල ගිය අතර, එමඟින් බැංකුවලට ඔවුන්ගේ රුපියල් ද්‍රවශීලතා අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් තරම් රුපියල්වලින් නාමනය කරන ලද උසස් තත්වයේ ද්‍රවශීල වත්කම් තිබූ බව පිළිබිඹු විය. බැංකු අංශයේ සමස්ත ද්‍රවශීලතාවයේ දර්ශකයක් වන සියලු මුදල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය ද, 2023 වසර අවසානයේ පැවති සියයට 288.4ට සාපේක්ෂව 2024 වසර අවසානයේ සියයට 313.8 දක්වා වැඩිදියුණු විය.

**බැංකු අංශයේ ලාභදායීත්වය**

ප්‍රධාන වශයෙන් ශුද්ධ පොලී ආදායම වැඩි වීම සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම වෙනුවෙන් පෙර දී කර තිබූ ණය හානිකරණ වෙන්කිරීම් ආපසු හැරවීම හේතුවෙන් වසර තුල දී ලාභදායීතාව සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කරන ලදී. 2024 තුල බැංකු අංශයේ පොලී ආදායම සියයට 13.7කින් පහල ගිය නමුත්, පොලී වියදම් සියයට 29.5කින් අඩු වීම හේතුවෙන් ශුද්ධ පොලී ආදායම සියයට 28.2කින් වැඩි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2023 වසර අවසානයේ සියයට 3.7ක්ව පැවති ශුද්ධ පොලී ආන්තිකය, 2024 වසර අවසානයේ දී සියයට 4.3ක් දක්වා වැඩි විය. 2024 වසර තුල දී ප්‍රධාන වශයෙන් සේවක පිරිවැය රු.බිලියන 54.5කින් වැඩි වීම හේතුවෙන් පොලී නොවන වියදම් රු.බිලියන 73.9කින් වැඩි වූ අතර, ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හා සබැඳි ණය හානිකරණ වෙන්කිරීම් ආපසු හැරවීම හේතුවෙන්, ණය හානිකරණ හා අනෙකුත් අලාභ වෙන්කිරීම් රු.බිලියන 238.1කින් අඩු විය. 2024 මූල්‍ය වර්ෂය සඳහා බැංකු අංශය විසින් එකතු කල අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු, මූල්‍ය සේවා සඳහා වන අනෙකුත් බදු සහ සංස්ථාපිත බදු ඇතුළුව මුළු බදු ලෙස රු.බිලියන 409.3ක් ගෙවන ලද අතර, එය 2023 මූල්‍ය වර්ෂය සඳහා රු.බිලියන 184.4ක් විය. නියාමන වාර්තාකරණයට අනුව, 2024 සඳහා වන සංස්ථාපිත බදු පෙර ලාභය රු.බිලියන 563.1ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව රු.බිලියන 272.0ක ඉහල යෑමකි. 2024 වසර තුල දී බැංකු අංශයෙහි බදු පසු ලාභය රු.බිලියන 309.7ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව සියයට 60.8ක වර්ධනයකි. මෙය වත්කම් මත ප්‍රතිලාභ (බදු පෙර) අනුපාතය 2023 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 1.5 සිට 2024 වසර අවසානය වන විට සියයට 2.6 දක්වා වැඩි වීම මගින් මෙන්ම හිමිකම් මත ප්‍රතිලාභ (බදු පසු) අනුපාතය 2023 වසරේ දී පැවති සියයට 11.5 සිට 2024 වසරේ දී සියයට 15.6 දක්වා වැඩි වීම මගින් ද පිළිබිඹු විය. තවද, ප්‍රධාන වශයෙන් මෙහෙයුම් පිරිවැය ඉහල යෑම හේතුවෙන්, බැංකු අංශයේ කාර්යක්ෂමතාවය 2023 වසර අවසානයේ දී පැවති සියයට 40.5 සිට 2024 වසර අවසානයේ දී සියයට 40.7 දක්වා සුළු වශයෙන් පිරිහීමට ලක්විය.

බැංකු කටයුතු

රූපසටහන 2.17 - සංඛ්‍යා අංශයේ ලාභදායීත්වය

2.5 සංඛ්‍යා සටහන: බැංකු අංශයේ ලාභදායීත්වය

| අයිතමය | 2023 (අ) | | 2024 (ආ) | |
|---|---|---|---|---|
| | වටිනාකම (රුපියල් බිලියන) | වත්කම්වල සමාගයේ ප්‍රතිශතයක් ලෙස (%) | වටිනාකම (රුපියල් බිලියන) | වත්කම්වල සමාගයේ ප්‍රතිශතයක් ලෙස (%) |
| **ශුද්ධ පොලී ආදායම** | 714.6 | 3.7 | 916.0 | 4.3 |
| පොලී ආදායම් | 2,610.2 | 13.4 | 2,252.0 | 10.5 |
| පොලී වියදම් | 1,895.6 | 9.7 | 1,336.0 | 6.2 |
| **පොලී නොවන ආදායම** | 207.4 | 1.1 | 183.8 | 0.9 |
| ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම් | 132.2 | 0.7 | 147.0 | 0.7 |
| **පොලී නොවන වියදම** | 373.4 | 1.9 | 447.3 | 2.1 |
| සේවක පිරිවැය | 189.9 | 1.0 | 244.4 | 1.1 |
| ණය සහ වෙනත් අලාභ සඳහා වෙන්කිරීම් | 171.6 | 0.9 | -66.5 | -0.3 |
| **බදු පෙර ලාභය (එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු, මූල්‍ය සේවා මත අනෙකුත් බදු සහ සංස්ථාපිත බදු අඩු කිරීමට පෙර)** | 377.0 | 1.9 | 719.0 | 3.4 |
| එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු සහ මූල්‍ය සේවා මත අනෙකුත් බදු | 85.9 | 0.4 | 155.9 | 0.7 |
| සංස්ථාපිත බදු | 98.5 | 0.5 | 253.4 | 1.2 |
| **බදු පසු ලාභය** | 192.6 | 1.0 | 309.7 | 1.4 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**බැංකු අංශය සමස්තයක් වශයෙන් ප්‍රාග්ධන අවශ්‍යතාවයන්ට අනුකූල වීම**

2024 වසර තුල දී, බැංකු අංශය සමස්තයක් වශයෙන් ප්‍රාග්ධන අවශ්‍යතාවයන්ට අනුකූල විය. අභියෝගාත්මක ව්‍යාපාරික තත්වයන් මඟින් පැන නැඟිය හැකි අවදානම් හේතුවෙන් සිදු විය හැකි අලාභ අවශෝෂණය කර ගැනීමට සහ බැංකු අංශයේ ශක්තිමත් භාවය වර්ධනය කර ගැනීම උදෙසා, උසස් තත්වයේ ප්‍රාග්ධනය එක්රැස් කිරීමට බැංකු දිරිමත් කරන ලදී. එහි ප්‍රතිපලයක් ලෙස, බැංකු විසින් 2024 වසර තුල දී කොටස් ප්‍රාග්ධනය රු.බිලියන 30.3කින් වැඩි කිරීම හරහා පළමු ස්ථර ප්‍රාග්ධනය ඉහල නංවාගෙන ඇත. වසර තුලදී බැංකු අංශයේ නියාමන ප්‍රාග්ධනය සියයට 6.8ක වර්ධනයක් වාර්තා කල අතර, එම වර්ධනයෙන් සියයට 53.0ක වැඩි වීමට පළමු ස්ථර ප්‍රාග්ධනය දායකත්වය දැක්වීය. 2024 වසර අවසානයේ සමස්ත ප්‍රාග්ධන අනුපාතය සියයට 18.4ක් ලෙස පැවති අතර, පළමු ස්ථර ප්‍රාග්ධන අනුපාතය 2023 වසර අවසානයේ පැවති සියයට 15.2ට සාපේක්ෂව 2024 වසර අවසානයේ සියයට 14.9 දක්වා සුළු වශයෙන් අඩු විය.

රූපසටහන **2.18 -** බැංකු අංශයේ නියාමන ප්‍රාග්ධන සංයුතිය

2.6 සංඛ්‍යා සටහන: බැංකු අංශයේ නියාමන ප්‍රාග්ධන සංයුතිය

| අයිතමය | රුපියල් බිලියන | | සංයුතිය (%) | |
|---|---|---|---|---|
| | 2023 (අ) | 2024 (ආ) | 2023 (අ) | 2024 (ආ) |
| ප්‍රථම ස්ථරය : ප්‍රාග්ධන | 1,395.1 | 1,455.5 | 100.0 | 100.0 |
| කොටස් ප්‍රාග්ධනය | 385.8 | 416.1 | 27.7 | 28.6 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල් | 87.7 | 88.7 | 6.3 | 6.1 |
| නොබෙදූ ලාභ | 720.0 | 710.5 | 51.6 | 48.8 |
| පොදු හා අනෙකුත් සංචිත | 332.3 | 330.4 | 23.8 | 22.7 |
| වෙනත් | 93.1 | 70.8 | 6.7 | 4.9 |
| නියාමක ගැලපීම් | -223.8 | -161.0 | -16.0 | -11.0 |
| දෙවන ස්ථරය : ප්‍රාග්ධන | 291.9 | 345.4 | 100.0 | 100.0 |
| ප්‍රත්‍යාගණන සංචිත | 44.1 | 52.6 | 15.1 | 15.2 |
| උපකාරක ණය | 147.9 | 196.8 | 50.7 | 57.0 |
| පොදු වෙන්කිරීම් සහ වෙනත් | 100.5 | 97.4 | 34.4 | 28.2 |
| නියාමක ගැලපීම් | -0.6 | -1.5 | -0.2 | -0.4 |
| සමස්ත නියාමන ප්‍රාග්ධන පදනම | 1,687.0 | 1,800.9 | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

**බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා මෑතකාලීනව සිදු කරන ලද ප්‍රතිසංස්කරණ**

- තාවකාලික ද්‍රවශීලතා අර්බුදයක් ඇති බැංකුවලට හදිසි ණය සහ අත්තිකාරම් ලබා දීම පිළිබඳ පවත්නා රාමුව ශක්තිමත් කිරීම.
- මූල්‍ය ස්ථායිතා අරමුදල ස්ථාපිත කිරීමට සහ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ ආයතනික විධිවිධාන සහ මූල්‍ය ධාරිතාව වැඩිදියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම.
- අර්බුදවල බලපෑම් අවම කිරීම යනාදිය සඳහා මූල්‍ය අංශයේ අර්බුද කළමනාකරණය පිළිබඳව ශ්‍රී ලංකා මහා බැංකුව සහ මුදල් අමාත්‍යාංශය අතර ප්‍රතිපත්ති සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ මූල්‍ය අංශයේ අර්බුද කළමනාකරණ කමිටුව පිහිටුවීම.
- 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත බලාත්මක කිරීම.
- විශාල ගනුදෙනු නිරාවරණ සීමාවන් සංශෝධනය කිරීම.
- වත්කම්වල ගුණාත්මක බව පිළිබඳ සමාලෝචනය සහ බැංකු ප්‍රති ප්‍රාග්ධනීකරණය කිරීමේ උපාය මාර්ගය සකස් කිරීම.
- ආයතනික යහපාලනය ශක්තිමත් කිරීම.

- ○ බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර යළි පන ගැන්වීමේ ඒකක පිහිටුවීම සහ සහන සැලසීමේ ක්‍රියාමාර්ග.

**රූපසටහන 2.19 - බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ඉහල නැංවීමට ගත් උපාය මාර්ග**




## ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව යනු ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ කේන්ද්‍රීය ස්ථානය උසුලනු ලබන ආයතනයයි. 2023 සැප්තැම්බර් මාසයේ දී සම්මත වූ 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මඟින් 1950 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව අර්ධ ස්වාධීන ආයතනයක් ලෙස ස්ථාපනය කළ 1949 අංක 58 දරන මුදල් නීති පනත අවලංගු විය. මෙම නව පනත යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුව නෛතික පුද්ගලභාවයක් සහිත සංස්ථාපිත ආයතනයක් ලෙස පිහිටුවා ඇත.

මෙම නව පනත යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුව ස්වාධීන සහ වගකීම් සහගත විය යුතුය. නෛතික පුද්ගලභාවයක් සහිත ආයතනයක් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය සඳහා වගකිව යුතුය. මහ බැංකු පනතට අනුව, මහා භාණ්ඩාගාර ලේකම් තවදුරටත් මහ බැංකුවේ තීරණ ගැනීමේ කිසිදු ආයතනයක කොටසක් නොවේ.

නව පාලන ව්‍යුහය සාමාන්තර තීරණ ගැනීමේ මණ්ඩල දෙකකින් සමන්විත වේ. ඒවා නම්, මහ බැංකු අධිපතිවරයා විසින් නායකත්වය දරනු ලබන, පාලක මණ්ඩලය (පා.ම.) සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය (මු. ප්‍ර. ම.) යි.

අ ) **පාලක මණ්ඩලය** – ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය අධීක්ෂණය කිරීමේ වගකීම සහ මුදල් ප්‍රතිපත්තිය හැර ශ්‍රී ලංකා මහ බැංකුවේ පොදු ප්‍රතිපත්තිය නිර්ණය කිරීම.

ආ) **මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය** – ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සහ දේශීය මිල ස්ථායිතාව සාක්ෂාත් කර ගැනීමට සහ පවත්වා ගෙන යෑම සඳහා නම්‍යශීලී උද්ධමනය ඉලක්කගත කිරීමේ රාමුව හා අනුකූලව නම්‍යශීලී විනිමය අනුපාතික පාලනයක් ක්‍රියාත්මක කිරීම.

සමස්තයක් වශයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව එහි ප්‍රාථමික අරමුණට අමතරව, සඵලදායී ලෙස සම්පත් උපයෝගීතාව උපරිම කරන අතරතුර, හිතකර හා ස්ථාවර ආර්ථික සහ මූල්‍ය පද්ධතියක් පවත්වා ගැනීම පෙරදැරිව කටයුතු කරයි. එබැවින්, එහි නව ප්‍රාථමික සහ අනෙක් අරමුණු වන්නේ:

අ ) **ප්‍රාථමික අරමුණ:** දේශීය මිල ස්ථායිතාව සාක්ෂාත් කර ගැනීම සහ පවත්වාගෙන යෑම - ප්‍රාථමික අරමුණ හඹා යෑමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිමවුම එහි විභව මට්ටම කරා ස්ථායීකරණයවීම පිළිබඳව සලකා බැලිය යුතු ය.

ආ) **අනෙක් අරමුණ:** මූල්‍ය පද්ධති ස්ථායිතාව පවත්වා ගෙන යෑම - අනෙක් අරමුණ හඹා යෑමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය පද්ධතියේ සංවර්ධනය සහ කාර්යක්ෂමතාව සලකා බැලිය යුතු ය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් එහි අධිපතිවරයා තවදුරටත් කටයුතු කරනු ඇත. අධිපතිවරයාට අමතරව, නියෝජ්‍ය අධිපතිවරු, සහකාර අධිපතිවරු සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් ඉහළ කළමනාකාරීත්වය සමන්විත වේ. ශ්‍රී ලංකා මහ බැංකුව දෙපාර්තමේන්තු 29කින් සහ ප්‍රාදේශීය කාර්යාල 6කින් සමන්විත වෙයි. සහකාර අධිපතිවරයකු හරහා අධිපතිවරයාට හෝ නියෝජ්‍ය අධිපතිවරයකුට වාර්තා කරන අධ්‍යක්ෂකවරයකු (හෝ ඊට සමාන නිලධාරියකු) විසින් දෙපාර්තමේන්තු මෙහෙයවෙනු ලබයි. තවද, රජයේ ආර්ථික කටයුතු උපදේශක මෙන් ම රජයේ බැංකුකරු ලෙස ද මහ බැංකුව කටයුතු කරයි.

## විගණන නිරීක්ෂණ

**සේවා අංශයේ අපනයන ඉපයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම**

මුදල් නීති පනත/2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි විධිවිධාන ප්‍රකාරව, බැංකුව විසින් නිකුත් කළ රීතිවලට අනුව, සෑම භාණ්ඩ සහ/ හෝ සේවා අපනයනකරුවෙකුම, අපනයනය කරන ලද සියලු භාණ්ඩ සහ/ හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට සපයන ලද සේවාවලට

අදාළව අපනයන ඉපයීම්, අදාල පරිදි භාණ්ඩ නැව්ගත කරන ලද දිනයේ සිට හෝ සේවාවන් සැපයූ දිනයේ සිට දින 180ක් ඇතුළත අනිවාර්යෙන්ම ශ්‍රී ලංකාව වෙත ගෙන්විය යුතුය. අපනයන ඉපයීම් ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැනීම් කාර්යක්ෂමව අධීක්ෂණය කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින්, අපනයන ඉපයීම් අධීක්ෂණ පද්ධතිය බැංකුව විසින් 2022 ජුනි මස හඳුන්වා දුන් අතර, එම පද්ධතිය මගින් අපනයන ඉපයීම් නියමිත කාලසීමාව තුළ ගෙන්වා ගැනීම් සහ අපනයන ඉපයීම් දේශීය ව්‍යවහාර මුදල්වලට පරිවර්තනය කිරීම අධීක්ෂණය කිරීමට පහසුකම් සපයයි. බැංකුව, ශ්‍රී ලංකා රේගුව සහ බලයලත් වෙළඳුන් මෙම පද්ධතියේ ප්‍රධාන සහභාගීකරුවන් තිදෙනා වේ. සේවා අපනයනයන් ශ්‍රී ලංකා රේගුව හරහා සිදු නොවන බැවින් එම අපනයන ඉපයීම් බලයලත් වෙළඳුන් විසින් සපයනු ලබන තොරතුරු සමඟ සැසඳිය නොහැකි වේ. එබැවින්, ඉහත පද්ධතිය මගින් සේවා අපනයන ඉපයීම් ගෙන්වා ගැනීම සම්පූර්ණ වශයෙන්ම අධීක්ෂණය නොවන බව නිරීක්ෂණය විය.

**බැංකුවේ නෝට්ටු ඇසුරුමක (බණ්ඩලයක) අඩුවීමක් වාර්තා වීම**

2023 අප්‍රේල් 20 දින බැංකුව විසින් නිකුත් කළ මාධ්‍ය නිවේදනය අනුව, 2023 අප්‍රේල් 11 දින ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු අතරතුරේදී, මහබැංකුවේ අභ්‍යන්තරයේ වූ සුරක්ෂිතාගාරයක් තුළ රු.මිලියන 5ක් (රුපියල් 5,000 නෝට්ටු) වටිනාකමක් සහිත නෝට්ටු ඇසුරුමක (බණ්ඩලයක) අඩුවීමක් අනාවරණය වී තිබුණි. මේ සම්බන්ධව අභ්‍යන්තර විමර්ශනයක් වහා අරඹන ලද අතර, කොටුව පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, 2024 සැප්තැම්බර් 15 දින වන විටත්, මෙම නෝට්ටු ඇසුරුමක (බණ්ඩලයක) අඩුවීම සඳහා වගකිව යුතු කිසිදු පාර්ශවයක් හඳුනාගෙන නොතිබුණි.

**බැංකුව විසින් උද්ධමන ඉලක්ක ළඟාකර ගැනීම**

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 26(1) වගන්තිය ප්‍රකාරව, බැංකුව විසින් ළඟාකර ගත යුතු උද්ධමන ඉලක්කය දැක්වෙන මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමක් අමාත්‍යවරයා සහ බැංකුව විසින් අත්සන් කළ යුතුය. අමාත්‍යවරයා සහ බැංකුවේ අධිපතිවරයා 2023 ඔක්තෝබර් 03 දින (2023.10.05 දිනැති අංක 2352/20 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ ප්‍රකාශ කළ පරිදි) මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමට එළඹුණු අතර ඒ අනුව, එකඟ වූ

මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම යටතේ, බැංකුව කාර්තුමය මතුපිට උද්ධමන අනුපාතිකය සියයට 5ක මට්ටමේ පවත්වා ගැනීමට ඉලක්ක කර ගත යුතුය. තවද, පනතේ 26(5) වගන්තියේ අවශ්‍යතාවය සඳහා උද්ධමන ඉලක්කය සඳහා වන ආන්තිකය ප්‍රතිශතාංක +(-) 2ක් වේ. ඒ අනුව, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත අදාල කාර්තුවේ මාස තුන සඳහා වන මාසික කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනසෙහි සරල සාමාන්‍ය 2023 වර්ෂයේ අවසාන කාර්තුව සඳහා සහ 2024 වර්ෂයේ පළමු කාර්තු දෙක සඳහා පිළිවෙලින් සියයට 2.97ක්, සියයට 4.4ක් හා සියයට 1.37ක් විය. එබැවින්, 2023 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා සහ 2024 අප්‍රේල් සිට ජූනි දක්වා කාලය තුළ සත්‍ය උද්ධමනය, ඉලක්කගත උද්ධමනයට වඩා අඩු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, අනුක්‍රමික කාර්තු දෙකකදී කාර්තුමය උද්ධමන අනුපාතිකය සියයට 5 වඩා සියයට 2කින් අඩු/වැඩි නොවී ඇති නිසාවෙන් උද්ධමන ඉලක්ක උල්ලංඝණය කිරීමක් සිදුවී නොතිබුණි.

## ලංකා බැංකුව

ලංකා බැංකුව 1938 අංක 53 දරන ලංකා බැංකු ආඥාපනත යටතේ 1939 අගෝස්තු 01 දින නියමිත පරිදි සංස්ථාපනය කරන ලද, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ ස්ථාපිත බලපත්‍රලාභී වාණිජ බැංකුවකි. ගෝලීය බැංකුකරණයේ ශ්‍රී ලාංකීය සලකුණ බවට පත්වෙමින් ගනුදෙනුකාර කේන්ද්‍රීයගත නව්‍ය මූල්‍ය පහසුකම් පිරිනමන ජාතියේ බැංකුකරුවා වීම ලංකා බැංකුවේ දැක්ම වන අතර, ගෝලීය බැංකුකරණයේ නැවුම් අත්දැකීම් ගණුදෙනුකාර ප්‍රජාව වෙත ළඟා කරලමින් සේවක පරිපූර්ණත්වය මත ගොඩ නැංවූ වඩාත් කාර්යක්ෂමවූත් නවීන තාක්ෂණවේදයන් මුසු වූත් මූල්‍ය සේවාවන් හරහා සියලු පාර්ශවකරුවන් වෙත වටිනාකම් උත්පාදනය කිරීම එහි මෙහෙවර වේ.

## විගණන නිරීක්ෂණ

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 64,387ක ලාභයක් වූ අතර ඊට අනුරූපව පෙර වර්ෂයේ ලාභය රු.මිලියන 26,694ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 37,693ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර සුරැකුම් බැඳුම්කරය රු.බිලියන 14.1ක් ප්‍රතිවර්තනය කිරීම, ණය හානිකරණයේ රු.මිලියන 20,343ක ප්‍රතිවර්තනය හා පහළ අනුපාතයකට තැන්පතු අළුත් කිරීම යන කරුණු බලපා ඇත.

**ඉහළම අක්‍රිය ණය ශේෂ 10 හි එකතුව මුළු ණය සහ අත්තිකාරම් ශේෂයෙන් සැලකිය යුතු අගයක් ගෙන තිබීම**

2024 දෙසැම්බර් 31 දිනට ඉහළම අක්‍රිය ණය ශේෂ 10 හි එකතුව රු.මිලියන 46,250.44ක් වූ අතර එය එදිනට මුළු ණය හා අත්තිකාරම් ශේෂයෙන් සියයට 1.90 ක ප්‍රතිශතයක් විය. එසේම පෙර වර්ෂයට සාපේක්ෂව එය රු.මිලියන 8,857.02ක එනම් සියයට 23.69ක වැඩි වීමක් වන අතර එය එදිනට බැංකුවේ III වන අදියරේ මුළු ණය සහ අත්තිකාරම් ශේෂයන් සියයට 12.41ක ප්‍රතිශතයකි.

**දේපළ නැවත අත්පත් කර ගැනීමේ ප්‍රමාදයන්**

බැකුව විසින් අත්පත් කර ගත් දේපළ 06 ක් 2020 සහ 2021 වසරවල දී ශ්‍රී ලංකා යුද හමුදාවට නිරෝධායන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ආවරණ අනුමැතිය සහිතව තාවකාලිකව භාර දී ඇත. කෙසේ වුවද, බැංකුවට එම දේපල නැවත අත්පත් කර ගැනීමට නොහැකි වීම හේතුවෙන්, දේපල සාධාරණ වටිනාකමකට වෙන්දේසි කර අක්‍රිය ණය පහසුකම් පියවා තව දුරටත් අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමට නොහැකිවී ඇත. මේ වන විට භාණ්ඩාගාරය හා ආරක්ෂක අමාත්‍යාංශය සමඟ සාකච්ඡා ආරම්භ කිරීමට උත්සාහ දරමින් සිටී.

**"ලංකා පේ" හරහා සිදුකරන CEFT සහ ATM ගනුදෙනු සැසඳීමේ ක්‍රියාවලිය**

"ලංකා පේ" හරහා සිදුකරන CEFT සහ ATM ගනුදෙනු සඳහා යෝග්‍ය සැසඳීමේ ක්‍රියාවලියක් නොමැත. ඒ අනුව 2024 දෙසැම්බර් 31 දිනට CEFT ගනුදෙනුවලට සම්බන්ධ පොදු ලෙජර ගිණුම් 04ක් හා සැසඳීමේ ලේඛන අතර රු.මිලියන 597ක වෙනසක් හඳුනා ගන්නා ලද අතර ATM ගනුදෙනුවලට සම්බන්ධ පොදු ලෙජර ගිණුම් 04 ක් හා සැසඳීමේ ලේඛන අතර රු.මිලියන 52.7ක වෙනසක් හඳුනාගෙන ඇත.

නිසි දෛනික සැසඳීමේ ක්‍රියාවලියක් නොමැතිකම අභ්‍යන්තර වංචා සහ දෝෂ සඳහා සැලකිය යුතු අවදානමක් ඇති කරන අතර එමඟින් බැංකුවේ කීර්ති නාමයට හානි සිදුවිය හැකිය.

## මහජන බැංකුව

1961 අංක 29 දරණ මහජන බැංකු පනත යටතේ මහජන බැංකුව සංස්ථාපනය කරන ලද අතර 1988 අංක 30 දරන බැංකු පනත යටතේ ස්ථාපිත බලපත්‍රලාභී වාණිජ බැංකුවකි. මහජන බැංකු පනතේ 4 වන වගන්තිය සහ එහි සංශෝධන ප්‍රකාරව බැංකුවේ අරමුණු වනුයේ ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය, ග්‍රාමීය බැංකුකරණය, කෘෂිකර්මය සහ කර්මාන්ත සංවර්ධනය කිරීමට සහාය වීම සහ උකස් තැරැව්කාර ව්‍යාපාරය කරගෙන යාම සහ වාණිජ බැංකුවක් වශයෙන් කටයුතු කිරීමයි.

2024 දෙසැම්බර් අවසන් වන විට බැංකුවේ මුළු වත්කම් පදනම රු. මිලියන 3,297,799ක් ලෙස වාර්තා වූ අතර බැංකුවේ මුළු තැන්පතු පදනම රු.මිලියන 2,854,704ක් විය. බැංකුව 2024 වර්ෂයේදී බදු ගෙවීමට පෙර ලාභය රු.මිලියන 41,583.7ක් වාර්තා කරන ලදී.

## විගණන නිරීක්ෂණ

2024 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ දළ ණය සහ අත්තිකාරම් රු.මිලියන 1,671,180ක් ලෙස වාර්තා වී ඇති අතර එය පෙර වසර අවසානයට සාපේක්ෂව රු.මිලියන 175,210ක අඩුවීමක් පෙන්නුම් කරයි. 2024 දෙසැම්බර් 31 වන දිනට අදියර 2 සහ අදියර 3 කාණ්ඩය යටතේ වර්ගීකරණය කර ඇති ණය රු.මිලියන 490,822ක් වූ අතර එය බැංකුවේ දළ ණය සහ අත්තිකාරම්වලින් සියයට 29.4ක් නියෝජනය කරයි.

2024 දෙසැම්බර් 31 දිනට මධ්‍යම රජයට සහ රාජ්‍ය ව්‍යවසායයන්ට අයත් මුළු අයවිය යුතු ණය සහ අත්තිකාරම් රු.මිලියන 455,957ක් හෙවත් බැංකුවේ මුළු ණය සහ අත්තිකාරම් කළඹෙන් සියයට 27.28ක් ලෙස වාර්තා වී ඇත. කෙසේ වෙතත්, රාජ්‍ය ව්‍යවසායයන් ගෙන් අයවිය යුතු ණය ශේෂයන් පෙර වසරට සාපේක්ෂව රු.මිලියන 325,445කින් හෙවත් සියයට 41.65කින් අඩු වී තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට රජයේ ආයෝජන සහ රජයෙන් ලැබිය යුතු අනෙකුත් දෑ රු.මිලියන 1,505,120ක් වූ අතර ඒ අනුව, මධ්‍යම රජයට සහ රාජ්‍ය ව්‍යවසායයන්ට ඇති මුළු නිරාවරණය රු.මිලියන 1,961,077ක් වූ අතර එය බැංකුවේ මුළු වත්කම්වලින් සියයට 59.47ක් නියෝජනය කරයි.

1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8(1) වගන්තියට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් දස දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද, 2024 දෙසැම්බර් 31 වන දින වන විට අධ්‍යක්ෂවරුන් 5 දෙනෙකු මගින් පමණක් අධ්‍යක්ෂ මණ්ඩලය පිහිටුවා ඇත. තවද,

2025 ජනවාරි 01 දින සිට බලපැවැත්වූ 2024 අංක 05 දරන බැංකු පනතේ මාර්ගෝපදේශ අනුව බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 7 ට නොඅඩු සහ 13 ට නොවැඩි විය යුතුය. කෙසේ වෙතත්, 2025 ජූනි 30 වන දින වන විට අධ්‍යක්ෂවරුන් 5 දෙනෙකු මඟින් පමණක් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත විය.

## ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත යටතේ ජනතාවට මූල්‍ය සේවා සැපයීමේ නියැලී සිටි සුවිශේෂී ආයතන 4ක් ඒකාබද්ධ කරමින් පිහිටුවන ලද අතර, 1988 අංක 30 දරන බැංකු පනත මඟින් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස හඳුනාගෙන ඇත.

බැංකුවේ සියළුම පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලමින් ගනුදෙනුකරුවන්ගේ ඉතිරිකිරීම් හා ආයෝජනයන් ප්‍රශස්ථ කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය විසඳුම් ලබා දීමේ ප්‍රධාන මෙහෙවර යටතේ ශාඛා බැංකු කටයුතු, ආයතනික බැංකු කටයුතු, ජාත්‍යන්තර බැංකු කටයුතු හා භාණ්ඩාගාර බැංකු කටයුතු යන ක්ෂේත්‍රයන් 4ක් ඔස්සේ බැංකුව එදිනෙදා කටයුතු කරනු ලබයි.

## විගණන නිරීක්ෂණ

**ණය සහ අත්තිකාරම්**

බැංකුවේ දළ ණය සහ අත්තිකාරම්වල වටිනාකම 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 561,314ක් වන අතර මෙය පසුගිය වර්ෂයේ රු.මිලියන 548,898 සමග සැසඳීමේදි සියයට 2.3ක වැඩි වීමකි. මුළු දළ ණය හා අත්තිකාරම්වලින් රු.මිලියන 259,160ක් එනම් සියයට 46.17ක් පුද්ගලික ණය හා නිවාස සහ දේපල ණය යටතේ ලබා දී තිබුණි. තවද, රු.මිලියන 119,691ක් එනම් සියයට 21.3ක් හා රු.මිලියන 28,122ක් එනම් සියයට 5ක් ලබා දී තිබුණේ පිළිවෙලින් උකස් ණය සහ සේවක ණය වශයෙනි.

**මාලදිවයිනේ පුද්ගලික සමාගමකට ලබා දී තිබූ විදේශ ණය**

මුළු ණය හා අත්තිකාරම්වලින් රු.මිලියන 3,518ක් විදේශ ණය වන අතර එම සම්පූර්ණ වටිනාකම වනුයේ 2018 වර්ෂයේදි මාලදිවයිනේ පුද්ගලික සමගමකට ලබා දි තිබූ එ.ජ.ඩොලර් මිලියන 9ක් සහ 2024 දෙසැම්බර් 31 දිනට ඒ මත ගණනය කරන ලද හිඟ පොලිය වේ. මෙම ණය මුදල ලබා දීමට පෙර විස්තීරණ ණය ඇගයීමක් හෝ අවදානම් තක්සේරුවක් සිදු කළ බවට සාක්ෂි විගණනයට අනාවරණය නොවුනි. ප්‍රාග්ධන මුදල් ආපසු ගෙවීම සඳහා බැංකුව විසින් ලබා දී තිබූ වසරක මුලික සහන කාලය 2022 දක්වා වරින් වර

දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත්, ණය ගැණුම්කාර සමාගම විසින් 2024 දෙසැම්බර් 31 දක්වා කිසිදු ප්‍රාග්ධන ආපසු ගෙවීමක් සිදු කර නොතිබුණි. මෙම ණය මුදල අක්‍රීය ණය මුදලක් ලෙස වර්ගකර තිබූ අතර මේ දක්වා මේ සම්බන්ධ තාක්ෂණික කුසලතා හා නිපුණතාවයක් ඇති ස්වාධීන පාර්ශවයක් විසින් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර නොමැති බව ද නිරීක්ෂණය විය.

**බද්ධ දේපළ ණය අයකර ගැනීම**

2020 දෙසැම්බර් 23 දින බැංකුව විසින් පුද්ගලයින් දෙදෙනෙකු වෙත රු.මිලියන 164.73ක බද්ධ දේපළ ණයක් ලබා දී තිබුණි. ණය ගැණුම්කරු වාරික දෙකක් පමණක් ගෙවා තිබුණු අතර 2025 ජූලි 21 දිනට එහි මුළු හිඟ ණය ශේෂය රු.මිලියන 220.75ක් විය. මෙම ණය මුදලට අදාල දේපළ 2024 පෙබරවාරි 06 වන දින පැවති වෙන්දේසියෙන් පසුව බැංකුව වෙත පවරාගෙන තිබුණු අතර 2024 ජූලි 04 දිනැති තක්සේරු වාර්තාවට අනුව එහි වෙළඳපොළ වටිනාකම රු.මිලියන 197.4ක් විය. ඒ අනුව, ඉතිරි හිඟ ශේෂය වන රු.මිලියන 23.35 අයකර ගැනීම අවිනිශ්චිත වේ.

**වංචනික ක්‍රියාකාරකම්වලින් වූ අලාභ**

2025 ජූනි 30 දිනට වංචනික ක්‍රියාකාරකම් 104කින් බැංකුවට සිදු වූ මුළු අලාභය රු.මිලියන 118.37ක් වූ අතර ඉන් රු.මිලියන 74.49ක් අයකර ගෙන නොතිබුණි. වංචනික සිද්ධීන් දාහතරකින් බැංකුවට සිදු වූ රු.මිලියන 84.84ක මුළු අලාභය කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් සිදු කර තිබුණු අතර එම අලාභවල 2025 ජූනි 30 දිනට අය නොකර පවතින ශේෂය රු.මිලියන 46.68ක් හෙවත් මුළු අලාභයෙන් සියයට 55 ක් විය. වංචනික සිද්ධීන් හතළිස් නවයක් 2021 සිට 2024 දක්වා සිදුවී ඇති ස්වයංක්‍රිය ටෙලර් කාඩ්පත් ආශ්‍රිත වංචාවන් වේ. ඉන් රු.මිලියන 3.22ක වටිනාකමකින් යුත් වංචා 39ක්, තුන්වැනි පාර්ශවයක් විසින් ගෙවුම් යෙදුමක් හරහා හැක් කරන ලද කාඩ්පත් ආශ්‍රිත තොරතුරු භාවිතයෙන් මාර්ගගත ගණුදෙනු සිදු කිරීම මඟින් කර තිබුණු අතර විගණිත දිනය වූ 2025 ජූනි 30 දින දක්වා එම සිද්ධීන් 39 සඳහා කිසිදු රක්ෂණ වන්දියක් ලැබී නොතිබුණි. තවද, මෙම වංචනික ක්‍රියාකාරකම්වල වසර පහකට වඩා පැරණි රු.මිලියන 40.48ක අලාභ සම්බන්ධ වංචනික ක්‍රියාකාරකම් ඇතුළත් වේ.

## නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනත (සංශෝධිත 2003 අංක 15 දරන පනත හා 2011 අංක 45 දරන පනත) යටතේ සංස්ථාපනය කරන ලද අතර, 1988 අංක 30 දරන බැංකු පනත මඟින් බලපත්‍රලාභී විශේෂ බැංකුවක් බවට පත් විය. පනතේ අංක 12(අ) හා සංශෝධිත වලට අනුව බැංකුවේ අරමුණ වනුයේ, සියළුම ශ්‍රී ලාංකිකයන්ගේ නිවාස සිහිනය සැබෑ කිරීමට නිවාස ආශ්‍රිත මූල්‍ය සම්පාදනයේ අවිවාදාත්මක වෙළඳපොල නායකයා බවට පත් වීමය.

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව මුළු ශාඛා 39ක් සහ කාර්ය මණ්ඩලය 494ක් යොදාගෙන තම බැංකු කටයුතු පවත්වාගෙන යන අතර 2024 වර්ෂය අවසානයේ දී BB+(lka) ණය ශ්‍රේණිගත කිරීමකින් යුක්ත විය.

### විගණන නිරීක්ෂණ

**ණය සහ අත්තිකාරම්**

2024 දෙසැම්බර් 31 දිනට දළ මුළු හිඟ ණය සහ අත්තිකාරම් ශේෂය රු.මිලියන 43,226ක් වූ අතර, එය පසුගිය වර්ෂයේ රු.මිලියන 43,621ක් විය. එදිනට අදියර 3 ණය ශේෂය රු.මිලියන 21,029ක් විය. අදියර 3 ණය ශේෂය තුල රු.මිලියන 667ක් වනුයේ එකම සමූහයේ සමාගම් 2ක් සඳහා ලබා දුන් ණය මුදලෙහි ප්‍රාග්ධනය සහ පොලිය වේ. පසුගිය වර්ෂයේ අදියර 3 ණය ශේෂය වන රු.මිලියන 18,948 සමග සැසඳීමේදී එය රු.මිලියන 2,081ක වැඩිවීමකි. තවද 2024 දෙසම්බර් 31 දිනට, අදියර 3 ණය සඳහා රු.මිලියන 2,595ක් හානිකරණ ප්‍රතිපාදන ලෙස වෙන්කර තිබුණු අතර එය පසුගිය වසරෙහි රු.මිලියන 2,047.5ක් විය.

**ගනුදෙනුකරුවන්ගෙන් වැඩිපුර අය කරන ලද දඩ පොලිය**

2013 ජූලි සිට 2024 අගෝස්තු දක්වා දඩ පොලී අනුපාත සම්බන්ධයෙන් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මහා බැංකුවේ උපදෙස් හා චක්‍රලේඛන වලට අනුව, සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් (LCB) සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් (LSB) විසින්ම, දැනටමත් ලබා දී ඇති ණය පහසුකම් ඇතුළුව සියලුම ණය සහ අත්තිකාරම් සඳහා අය කරන ලද දඩ පොලී අනුපාත, අනුමත සීමාව ඉක්මවා හෝ හිඟ මුදල් සඳහා, කල් ඉකුත් වූ කාල සීමාව තුළ වාර්ෂිකව පදනම් ලකුණු 200 නොඉක්මවන මට්ටමකට අඩු කළ යුතුය (2019 ඔක්තෝබර් සිට 2020 අගෝස්තු දක්වා වාර්ෂිකව පදනම් ලකුණු 400 නොඉක්මවන මට්ටමකට).

කෙසේ වෙතත්, තනි අනුපාත නොසලකා සහ එම ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස්වලට පටහැනිව, 2017 සිට 2024 අගෝස්තු 31 දක්වා සියලුම ණය වර්ගයන් සඳහා බැංකුව ඒකාකාර දඩ පොලී අනුපාත අය කර ඇත. තවද, එම කාල පරිච්ඡේද තුළ බැංකුව සියයට 16 සිට සියයට 30 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ දඩ පොලී අනුපාත අය කර ඇති අතර මෙම අනුපාත, අඩු පොලී අනුපාත යටතේ කලින් ලබා දී ඇති ණය සඳහා අදාළ විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ගනුදෙනුකරුවන් ගෙන් වැඩිපුර දඩ පොලීය අය කරන ලදී.

2023.01.01 සිට 2023.12.31 දක්වා සහ 2017.01.01 සිට 2022.12.31 දක්වා කාලය තුළ බැංකුව විසින් අය කරන ලද අතිරික්ත දඩ පොලියට අදාළව පිළිවෙලින් රු.149,813,905ක් සහ රු.58,214,455ක් වූ මුදල 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර තිබුණි.

**පියවීම ප්‍රතික්ෂේප කරන ලද සේවක අර්ථසාධක අරමුදල් ණය**

2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉදිරිපත් කරන ලද අර්ථසාධක අරමුදල් ණය 70 ක් පියවීම ප්‍රතික්ෂේප කරන ලදී. එම ණය අතරින් ණය 52 ක් සම්පූර්ණයෙන් පියවා ගැනීම සඳහා 2022 වර්ෂයට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදල් ප්‍රේෂණය කර තිබූ නමුත් කාර්යය මණ්ඩලයේ පැවති නොසැලකිලිමත්භාවය හේතුවෙන් එම ණය සම්පූර්ණයෙන්ම පියවා ගැනීමට බැංකුව අපොහොසත් වී තිබුණි. එනම් සමහර පියවීම් ප්‍රමාද වී සිදු කර තිබීම, සමහර සම්පූර්ණ පියවීම් වෙනුවට මාසික වාරික ලෙස පියවීම් සිදු කර තිබීම, පැරණි පද්ධතියේ ණය යාවත්කාලීන කර නොතිබීම සහ නව පද්ධතියට මාරු කර නොතිබීම හේතුවෙන් පියවා නොතිබීම සහ ණය ශේෂය ශූන්‍ය ලෙස සලකා 14 පෝරමය නිකුත් කර තිබීම යනාදියයි. තවද, පසු වර්ෂයන්හිදී, එම ණය සඳහා අමතර පොලී සහ දඩ මුදල් එකතු වී තිබුණු අතර, 2024 දෙසැම්බර් 31 දිනට අර්ථසාධක අරමුදල් ණය 43ක් සඳහා මුළු හිඟ මුදල රු.මිලියන 9.46ක් වූ අතර ඉතිරි ණය 9 සම්පූර්ණයෙන් අයකරගෙන තිබුණි.

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත මගින් 2010 වසරේ පළාත් සංවර්ධන බැංකු හයක් ඒකාබද්ධ කරමින් ශ්‍රී ලංකාවේ ස්ථාපිත රජය සතු බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පිහිටුවන ලදි. රජය සතු ජාතික මට්ටමේ බැංකුවක් ලෙස බැංකුවේ අරමුණු වන්නේ ප්‍රධාන වශයෙන් කෘෂිකර්මය, කර්මාන්ත, වෙළෙඳ, වාණිජ, පශු සම්පත්, ධීවර වැනි සමස්ත කලාපීය ආර්ථික සංවර්ධන කටයුතු සඳහා පහසුකම් සැලසීම සහ ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවලට සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට මූල්‍ය ආධාර ලබා දීමෙන් කාන්තාවන් සවිබල ගැන්වීමත්ය.

### විගණන නිරීක්ෂණ

2024 වසර සඳහා බැංකුවේ වත්කම් මත ප්‍රතිලාභය (ROA) සියයට 1.03 ක් වූ අතර එය බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශය සඳහා සියයට 1.4 (BT) ක් විය. තවද, 2024 වර්ෂය සඳහා බැංකුවේ කොටස් මත ඉපයුම් ප්‍රතිලාභ අනුපාතය (ROE) 5.85ක් වූ අතර එය, බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශය සඳහා සියයට 12.4 ක් විය.

**තනතුරු පුරප්පාඩු හා වැඩබැලීමේ පත්කිරීම්**

2024 වර්ෂය තුළ බැංකුවෙහි සාමාන්‍යාධිකාරී, ප්‍රධාන තොරතුරු නිලධාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය, විශේෂ ව්‍යාපෘති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම්) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුනර්ජීවන සහ ප්‍රතිසාධන) යන තනතුරු වැඩබැලීමේ පදනම මත පත් කර තිබුණු අතර ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ ප්‍රධාන අවදානම් නිලධාරී යන තනතුරු පුරප්පාඩුව පැවතුණි. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2013 දෙසැම්බර් 02 දින නිකුත් කරන ලද මාර්ගෝපදේශයෙහි 3(1)(iii) ඡේදය ප්‍රකාරව, බලපත්‍රලාභී විශේෂිත බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලය, 7 දෙනෙකුට නොඅඩු සහ 13 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය. එසේ වුවද, 2024 දෙසැම්බර් 31 දින වන විට බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් 6 දෙනෙකුගෙන් පමණක් සමන්විත විය. 2024 වර්ෂය සඳහා, 2024 නොවැම්බර් 08 වන දින දක්වා මහා භාණ්ඩාගාරයෙන් අධ්‍යක්ෂවරයෙකු පත් කර නොතිබුණු අතර 2024 වර්ෂයේ 4 වන කාර්තුවේදී කොටස් හිමි බැංකු තුනෙන් අදාළ අධ්‍යක්ෂවරුන් තිදෙනා ද පත් කර නොතිබුණි.

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත සහ එම පනතට සිදු කරන ලද සංශෝධන යටතේ සංස්ථාපනය කරන ලද 1988 අංක 30 දරණ බැංකු පනත යටතේ ස්ථාපිත බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි. මෙම පනතේ 2 වන වගන්තියට අනුව මෙම බැංකුවේ අරමුණ වන්නේ නීති විධිවිධානයන්ට අනුකූලව මූල්‍ය හා වෙනත් ආධාර ලබා දීමෙන් කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ නිවාස යන අංශ සංවර්ධනය සඳහා සහාය දැක්වීමයි. බැංකුව විසින් 2016 වර්ෂයෙන් පසු නව ශාඛා ස්ථාපිත කර නොතිබූ අතර 2024 වසර අවසන් වන විට දිවයින පුරා ශාඛා 25කින් යුතුව ක්‍රියාත්මක විය.

## විගණන නිරීක්ෂණ

**2024 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය**

2024 වර්ෂය තුලදී බැංකුව රු.මිලියන 157.79ක බදු පෙර ලාභයක් සහ රු.මිලියන 32.04ක බදු පසු ලාභයක් වර්තා කර තිබුණි. මෙම ලාභයන් පිළිවෙලින් පෙර වර්ෂයේ බදු පෙර අලාභය සහ බදු පසු අලාභය වූ රු.මිලියන 1164.78ක් සහ 1,003.13ක් සමග සැසඳීමේදී සැලකිය යුතු වර්ධනයකි. 2023 වර්ෂයේ රු .මිලියන 8,732.59 සිට 2024 වර්ෂයේ රු.මිලියන 5,392.22 දක්වා පොලී වියදම සියයට 38කින් අඩුවීම මෙම වර්ධනයට බලපා ඇත. 2023 වර්ෂයේ සියයට සෘණ 2.01ක් වූ වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය 2024 වර්ෂය වන විට සියයට 0.28ක් දක්වා වර්ධනය වී ඇත.

**ණය අත්තිකාරම් සහ අක්‍රිය ණය අනුපාතය**

2023 වර්ෂයේ බැංකුවේ ණය සහ අත්තිකාරම් රු .මිලියන 38,603ක් වූ අතර 2024 වර්ෂයේදී එය රු.මිලියන 41,730 දක්වා සියයට 8.1ක වර්ධනයක් පෙන්නුම් කලද, මුළු අක්‍රිය ණය අනුපාතය 2023 වර්ෂයේ සියයට 23.07 සිට 2024 වර්ෂයේ සියයට 29.13 දක්වා ඉහල ගොස් ඇති අතර මුළු අක්‍රිය ණය අනුපාතයෙහි ප්‍රතිශතාත්මක වැඩිවීම සියයට 26.27කි.

**අවම නියාමන ප්‍රාග්ධන අවශ්‍යතාවය**

2017 අංක 05 සහ 2022 අංක 04 දරන බැංකු පනත් විධාන මගින් නියම කර ඇති පරිදි රු.මිලියන 7,500ක අවම නියාමන ප්‍රාග්ධන අවශ්‍යතාවය 2024 දෙසැම්බර් 31 දිනට පෙර බැංකුව විසින් සම්පූර්ණ කර නොමැත. 2024 දෙසැම්බර් 31 දිනට වාර්තාගත ප්‍රාග්ධනය රු.මිලියන 4,787 වූ අතර ප්‍රාග්ධන හිගය රු.මිලියන 2,713කි.

**අධ්‍යක්ෂ මණ්ඩලය** 1984 අංක 29 දරන රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකු (සංශෝධන) පනතට අනුව සුදුසුකම්ලත් පුද්ගලයින් නව දෙනෙකු අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කළ යුතු වුවද අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන්නේ අධ්‍යක්ෂවරුන් හය (06) දෙනෙකුගෙන් පමණි.

## ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ සංස්ථාපිත වූ සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලද පොදු සීමිත වගකීම් සහිත සමාගමකි. තවද, එය 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස ස්ථාපිත කර තිබුණි. 2016 රජයේ අයවැයෙන් ඉදිරිපත් කරන ලද යෝජනාවට අනුකූලව ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් 2019 ඔක්තෝබර් 11 දින සිට ක්‍රියාත්මක වන පරිදි සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව සම්පූර්ණයෙන්ම අත්පත් කර ගෙන ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ 2024 ජනවාරි 11 දිනැති ලිපියට අනුව, බැංකුව 2024 මාර්තු 31 වන විට ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමග ඒකාබද්ධ කිරීමේ කටයුතු අවසන් කළ යුතුව තිබු අතර බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකගේ 2025 අප්‍රේල් 10 දිනැති ලිපිය මගින් මේ සඳහා 2025 ජුනි 30 දක්වා දින දීර්ඝ කිරීමක් ලබාදී තිබුණි. කෙසේ වුවත්, මෙම වාර්තා කරන දිනය දක්වා ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමග ඒකාබද්ධ කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

## බැංකු නොවන මූල්‍ය ආයතන අංශය

### මුදල් සමාගම්

මුදල් සමාගම් අංශය 2024 වසර තුල දී සැලකිය යුතු ප්‍රසාරණයක් වාර්තා කල අතර, ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාවය අවම නියාමන අවශ්‍යතාවයන්ට වඩා ඉහලින් පවත්වා ගනිමින් ශක්තිමත්ව පැවතුණි. මෙම අංශයේ වත්කම් පදනම 2023 වසර අවසානයේ දී පැවති සියයට 5.7ක වර්ධනයට සාපේක්ෂව 2024 වසර අවසානය වන විට සියයට 13.9කින්, එනම් රු.බිලියන 23.2 කින් වර්ධනය වී රු.බිලියන 1,930.7ක් දක්වා ඉහල ගියේය. දළ අක්‍රීය ණය අනුපාතය 2023 වසර අවසානයේ පෙන්නුම් කළ සියයට 18.0ට සාපේක්ෂව, 2024 වසර අවසානයේ දී සියයට 11.3 දක්වා පහල යාමෙන් පිලිබිඹු වන පරිදි, මුදල් සමාගම් අංශයේ ණයවල ගුණාත්මකභාවය ඉහල ගොස් ඇත. මුදල් සමාගම් අංශයේ ද්‍රවශීලතාවය, 2024 වසර තුල දී අවම නියාමන මට්ටමට වැඩි ඉහල අගයක පවත්වා ගැනීමට හැකි විය.

2024 වසර අවසානයේ දී අවම ද්‍රවශීල වත්කම් අවශ්‍යතාවය වූ රු.බිලියන 115.8ට එරෙහිව එම වසරේ දී මෙම අංශය සතුව පැවති සමස්ත නියාමන ද්‍රවශීල වත්කම් ප්‍රමාණය රු.බිලියන 220.9ක් වූ අතර, 2023 වසර අවසානයේ වාර්තා වූ රු.බිලියන 151.5ක ද්‍රවශීලතා අතිරික්තයට සාපේක්ෂව 2024 වසර අවසානයේ රු.බිලියන 105.1ක ද්‍රවශීලතා අතිරික්තයක් වාර්තා කරන ලදී. 2024 වසර අවසාන වන විට මුදල් සමාගම් අංශයේ මුළු වගකීම්වලින් සියයට 54.7ක් වූ පාරිභෝගික තැන්පතු තවදුරටත්

වගකීම්වලින් ප්‍රමුඛත්වය ගත් අතර, හිමිකම් හා ණය ගැනීම් මුළු වගකීම්වලින් පිළිවෙලින් සියයට 24.3ක් සහ සියයට 15.8ක් ලෙස වාර්තා විය. 2024 වසර තුලදී තැන්පතු රු.බිලියන 1,056.4ක් දක්වා සියයට 13.0කින්, එනම් රු.බිලියන 121.4 කින් වර්ධනය විය. මේ අතර, 2024 වසර තුල දී ණය ගැනීම් රු.බිලියන 305.4ක් දක්වා සියයට 15.3කින්, එනම් රු.බිලියන 40.5කින් වර්ධනය විය. මුදල් සමාගම් අංශයේ ප්‍රාග්ධන පදනම 2023 වසර අවසානයේ දී රු.බිලියන 329.1 සිට 2024 වසර අවසානයේ රු.බිලියන 357.4 දක්වා රු.බිලියන 28.3කින් වර්ධනය වූ අතර එය වසර තුල සියයට 8.6ක වර්ධනයක් වාර්තා කළේය.

## මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී

1982 වර්ෂයේ දී දිවයිනේ ප්‍රථම සහ එකම විශේෂිත වෙළඳ බැංකුව වශයෙන් මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සංස්ථාපනය කරන ලදී. 1991 වර්ෂයේදී මෙම සමාගම කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත කරන ලද අතර 2000 දී කල්බදු මූල්‍යකරණ සමාගමක් ලෙස කටයුතු කිරීම සඳහා බලපත්‍රය ලබා ගන්නා ලදී . 2014 වර්ෂයේදී මෙම සමාගම මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ලෙස නැවත නම් කරන ලද අතර 2015 වර්ෂයේ දී මූල්‍ය ව්‍යාපාර පනත යටතේ මුදල් ව්‍යාපාර කටයුතු සිදු කිරීම සඳහා බලයලත් බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී. සමාගමේ දැක්ම වන්නේ ජාතියට නව්‍යකරණ ව්‍යාපාර විසඳුම් සපයන්නා බවට පත්වීමයි. වර්තමානයේදී සමාගම ශාඛා 47ක ජාලයක් තුලින් දිවයින පුරා ක්‍රියාත්මක වන අතර ශ්‍රී ලංකාව තුළ පමණක් ක්‍රියාත්මක වේ.

## විගණන නිරීක්ෂණ

**සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේ සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 240.45ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව පෙර වර්ෂයේ ලාභය රු.මිලියන 20.8ක් විය .ඒ අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 219.6ක වැඩිදියුණු වීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුල මුළු මෙහෙයුම් ආදායම රු.මිලියන 975.7කින් වැඩිවීම මෙම මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. ඉන් වැඩි ප්‍රමාණයක් රජයේ සුරැකුම්පත් හා ලැයිස්තුගත කොටස් විකිණීමෙන් ලද ලාභ වේ. වර්ෂය අවසානයේදී සමාගමේ වත්කම සියයට 19.3ක වැඩිවීමක් පෙන්නුම් කළ අතර, සමාගමේ ශේෂ පත්‍රය 2024 දෙසැම්බර් අවසානය වන විට රු.බිලියන 40.2ක් දක්වා වැඩි වී තිබුණි. බැංකු හා මූල්‍ය ආයතනවල ස්ථාපනය කර තිබූ තැන්පතු රු.මිලියන 371.2කින්

අඩු වීම සහ රජයේ සුරැකුම්පත් හා ලැයිස්තුගත සමාගම්වල සිදු කර තිබූ මූල්‍ය ආයෝජන රු.මිලියන 373.5කින් වැඩිවීම සහ ණය සහ ලැබීම් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 36.1කින් වැඩිවීම එසේ වත්කම් වැඩිවීමට ප්‍රධාන ලෙස බලපා තිබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව බැංකුවේ තැන්පතු පදනම වැඩිවී තිබුණේ සියයට 2.0ක් වූ අඩු ප්‍රමාණයකිණි.

2024 වර්ෂය අවසානයට සමාගමේ ස්ථර I ප්‍රාග්ධන සහ සමස්ත ප්‍රාග්ධන අනුපාත පිළිවෙලින් සියයට 11.97ක් සහ 14.45ක් වූ අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුවේ අවම නියාමන අවශ්‍යතාවය සපුරා තිබුණද 2023 වර්ෂය අවසානයට සියයට 13.60 සහ 16.75ක් ලෙස පැවති අගයට වඩා පහල අගයක් ගන්නා ලදී.

**අක්‍රීය ණය**

2024 වර්ෂයේදී අයකරගත නොහැකි අක්‍රීය ණය 87කට අදාලව එකතුව රු.මිලියන 108.7ක් ලියා හැර තිබුණි.

2024 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන අක්‍රීය ණය ගණුදෙනුකරුවන් 10 දෙනාගේ දළ හිඟ ශේෂ එකතුව රු.මිලියන 1,578.82ක් වන අතර එය එදිනට සමාගමේ මුළු දළ අක්‍රීය ශුද්ධ ණය හා අත්තිකාරම්වලින් සියයට 26.77ක් නියෝජනය කරයි.

# රක්ෂණ කටයුතු

2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීම් පනත සහ එහි සංශෝධන මගින් රක්ෂණ සමාගම්,රක්ෂණ තැරැව්කාර සමාගම්, රක්ෂණ නියෝජිතයින් සහ අලාභ ගැලපුම්කරුවන් නියාමනය සහ අධීක්ෂණය සඳහා අදාළ නීතිමය රාමුව සපයන අතර ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරය අවංකව පවත්වාගෙන යාම සඳහා රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණින් රක්ෂණ නියාමන කොමිෂන් සභාව රක්ෂණ ක්ෂේත්‍රයට අදාල නීති රීති, රෙගුලාසි හා චක්‍රලේඛ පනවමින් ශ්‍රී ලංකාව තුළ රක්ෂණ කර්මාන්තයේ අධීක්ෂණ වගකීම ඉටු කරනු ලබයි.

2024 වසර අවසාන වන විට සමාගම් විසිනවයක් (29) රක්ෂණකරුවන් ලෙස ක්‍රියාත්මක විය. ක්‍රියාත්මක වූ සමාගම් 29න් එක් සමාගමක් සංයුක්ත රක්ෂණකරුවෙක් වූ අතර, සමාගම් 15ක් දිර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සමාගම් ලෙස ද, සමාගම් 13ක් සමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ලෙස ද පවත්වාගෙන යමින් තිබුණි. ඉහත ආයතන වලින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්, ජාතික රක්ෂණ භාරකාර අරමුදල් මණ්ඩලය සහ පීපල්ස් රක්ෂණ සමාගම යන ආයතන සහ රක්ෂණ ක්ෂේත්‍රයේ නියාමන ආයතනය වන රක්ෂණ නියාමන කොමිෂන් සභාව ද විගණකාධිපතිවරයාගේ විගණනයට යටත් වේ.

## රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය

**මුළු වත්කම්**

2024 වර්ෂය අවසන් වන විට රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම් රු.මිලියන 1,219,269ට ළඟා වී ඇති අතර එය පෙර වසරට සාපේක්ෂව සියයට 7.6ක වර්ධනයකි. 2023 වර්ෂයට සාපේක්ෂව මෙම වසරේ වර්ධන වේගය සියයට 11.7ක අඩු වීමක් පෙන්නුම් කරයි. එසේම 2024 වර්ෂයේ දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් රු.මිලියන 921,171ක් වූ අතර එය ප්‍රධාන වශයෙන් රජයේ ණය සුරැකුම්පත්වල රු.මිලියන 495,085ක ආයෝජනය මගින් නියෝජනය විය.

2024 වර්ෂයේ දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් සහ 2020 සිට 2024 දක්වා වූ වසර පහ තුළ රක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම්වල වර්ධනය අංක 2.7 රූපසටහන මඟින් නිරූපනය කරනු ලබයි.

රූපසටහන 2.7 **2020 සිට 2024 දක්වා මුළු වත්කම්**




මූලාශ්‍රය. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වාර්ෂික වාර්තා
* 2024 - සංඛ්‍යා ලේඛන අත්පොත

රූපසටහන 2.8 මගින් 2020 සිට 2024 දක්වා වූ වසර පහ තුළ රක්ෂණ ව්‍යාපාරයේ ලාභදායීතාවය පෙන්නුම් කරයි.

රූපසටහන 2.8 **2020 සිට 2024 දක්වා ලාභය**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වාර්ෂික වාර්තා
*** 2024 - සංඛ්‍යා ලේඛන අත්පොත**

**ලාභදායි බව** 2024 වර්ෂයේදී රක්ෂණ කර්මාන්තය තුළ ක්‍රියාත්මක රක්ෂණ ආයතන රු.මිලියන 59,945ක මුළු ලාභදායිතාවයක් වාර්තා කළ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 7.4ක වර්ධන වේගයකි. 2022 වසරට සාපේක්ෂව 2023 සහ 2024 වර්ෂ දෙක තුළ ලාභදායීත්ව වර්ධනයෙහි සැලකිය යුතු අඩු වීමක් පෙන්වයි. පසුගිය වර්ෂයට සාපේක්ෂව දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ ලාභදායීත්වයේ සියයට 11.4ක ඉහළ යාමක් පෙන්වන අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ලාභදායීත්වය සියයට 5.5ක පසු බැමක් පෙන්වයි.

## ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 1961 අංක 2 දරණ රක්ෂණ සංස්ථා පනතේ විධිවිධාන යටතේ රජය සතු සංස්ථාවක් ලෙස ස්ථාපිත කරන ලදී. 1993 වර්ෂයේ දී, 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ සංස්ථාව සම්පූර්ණ රජය සතු සීමිත වගකීම් සහිත සමාගමක් බවට පරිවර්තනය කරන ලද අතර, එහි සියයට 100ක කොටස් හිමිකාරීත්වය දැරුවේ භාණ්ඩාගාර ලේකම්වරයා ය. රජයේ පෞද්ගලීකරණ වැඩසටහන යටතේ, සමාගම 2003 දී පෞද්ගලීකරණය කරන ලද අතර වසර හයක කෙටි කාලයක් පෞද්ගලික කළමනාකරණය යටතේ පැවතුණි.පෞද්ගලීකරණය අවලංගු කරමින් 2009 ජුනි 04 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවට අනුව, කොටස් සියයට 99.97ක් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම් වෙත පැවරීමෙන් අනතුරුව රාජ්‍ය සමාගමක් ලෙස ක්‍රියාත්මක වේ.

රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ සහ රජයේ මග පෙන්වීම්වලට අනුකූලව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් 2024 පෙබරවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි නීතිමය ප්‍රතිව්‍යුහගත කිරීමකට භාජනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස සමාගම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ලෙස වෙනම නීතිමය ආයතන තුනක් ලෙස ස්ථාපනය කරන ලදි.

# විගණන නිරීක්ෂණ

## ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්

**අනුමත සේවක සංඛ්‍යාව යාවත්කාලීන නොකිරීම**

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි සේවක සංඛ්‍යාව යාවත්කාලීන කර නොමැති අතර කළමණාකාරීත්වය තවමත් 2019/2020 දී අනුමත කරන ලද සේවක සංඛ්‍යාව භාවිතා කරමින් තීරණ ගන්නා බවත් නිරීක්ෂණය වී තිබුණි.

**අනුප්‍රාප්තික සැලැස්මක් නොමැති වීම**

රාජ්‍ය අංශ ව්‍යවසායන් (State Owned Enterprises) සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි මාර්ගෝපදේශ 3.4 ප්‍රකාරව සෑම රාජ්‍ය ව්‍යවසායක්ම තම මානව සම්පත් අවශ්‍යතා නිසි ලෙස හඳුනාගත යුතු අතර, එවැනි සැලසුමක් තුළින් පුරප්පාඩු, නිර්මාණය කළ යුතු නව තනතුරු සහ තනතුරු සඳහා අවශ්‍ය කුසලතා හඳුනාගත යුතුය. කෙසේ වෙතත් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් සමාගම් දෙකෙහිම අනුප්‍රාප්තික සැලැස්මක් නොමැති බව නිරීක්ෂණය වී තිබුණි.

**පද්ධති අධීක්ෂණය සිදු නොවීම**

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් සමාගම් දෙකෙහි විශේෂිත පරිශීලක ගිණුම් (Privileged User Account) පිළිබඳව නිසි අධීක්ෂණයක් සිදු නොවන බව නිරීක්ෂණය විය. පද්ධතිය තුළ විශේෂිත පරිශීලක ගිණුම් අඛණ්ඩ නිරීක්ෂණය කිරීම සහ නිතිපතා සමාලෝචනය කිරීමකින් තොරව පැවතීම නීත්‍යානුකූල නොවන පද්ධති ප්‍රවේශයට ඉඩ සැලසීමක් ලෙස නිරීක්ෂණය වී තිබුණි.

**ප්‍රතිරක්ෂණය**

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සමාගම එක් ප්‍රතිරක්ෂණකරුවෙකු මත පමණක් මූලිකව රැඳී සිටින බව නිරීක්ෂණය විය. ඒ සඳහා රු.මිලියන 673ක් වාරික වශයෙන් 2023 වර්ෂයේදී ගෙවා තිබුණි. ප්‍රතිරක්ෂණය, රක්ෂණ ක්ෂේත්‍රයේ පවතින අවදානම් කළමනාකරණය කිරීමේ ප්‍රධාන උපාය මාර්ගයක් වුවද, එක් ප්‍රතිරක්ෂණකරුවෙකු මත පමණක් විශ්වාසය තැබීම තුළ අවදානම් ඒකරාශී වීමේ (Concentration Risk) තත්ත්වයක් ඇති විය හැකි බව නිරීක්ෂණය වී තිබුණි.

**සම්බන්ධිත පාර්ශව ගණුදෙනු සමාලෝචන කමිටුවක් නොතිබීම**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ D.5.2. වගන්තියට අනුව කාර්තුමය වශයෙන් රැස්වන, ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂකවරු තිදෙනෙක්ගෙන් සමන්විත, සම්බන්ධිත පාර්ශව ගණුදෙණු සමාලෝචිත කමිටුවක් ස්ථාපිත කළ යුතුය. මෙහි සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්

කරණු ලැබිය යුතුය. කෙසේ වෙතත් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් යන සමාගම් මෙවැනි කමිටුවක් පවත්වාගෙන නොයන බව නිරීක්ෂණය වී තිබුණි.

## පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී

**ප්‍රතිරක්ෂණ අයකරගැනීම් හා අතිරික්ත රක්ෂණ වාරික**

2024 දෙසැම්බර් 31 දින වන විට දින 365 ක කාලය ඉක්මවූ ගෙවන ලද රක්ෂණ වන්දි හිමිකම් සඳහා වන ප්‍රතිරක්ෂණ ඉල්ලීම්වලින් රු.මිලියන 21ක හිඟ මුදල ප්‍රතිරක්ෂණ ලැබිය යුතු ලෙස පැවතුණි. ඉහත සඳහන් හිඟ මුදල තුළ රු.මිලියන 11ක මුදලක් විදේශ ප්‍රතිරක්ෂණකරුවන්ගෙන් ද රු.මිලියන 9ක මුදලක් ජාතික රක්ෂණ භාරකාර අරමුදල වෙතින්ද අය වීමට ඇත.

2024 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 228ක දින 365 ඉක්ම වූ අතිරික්ත වශයෙන් ලද වාරික ශේෂයන් පවතින බව නිරීක්ෂණය වූ අතර දින 365 ඉක්ම වූ ගෙවිය යුතු මෝටර් රථ හිමිකම් රු.මිලියන 238ක මුදලක් පැවතුණි.

## ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (සංශෝධිත පරිදි) යටතේ (‘‘පනත’’) පිහිටුවන ලද ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (කොමිෂන් සභාව) ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම, අධීක්ෂණය කිරිම හා විධිමත් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතුය.

**ආයුගණකවරු බඳවා ගැනීම**

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතට (සංශෝධිත පරිදි) අනුව, පනතේ අධීක්ෂණ සහ නියාමන කාර්යයන් ඉටු කිරීම සඳහා රක්ෂණ ආශ්‍රිත දැනුම සහ ක්‍රියාකාරී දැනුම ඇති සුදුසුකම්ලත් වෘත්තිකයන් කොමිෂන් සභාව සතුව තිබිය යුතු නමුත්, 2016 වසරේදී අනුමත කරන ලද ආයුගණක තනතුර වසර 8ක් පමණ පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය.

කොමිෂන් සභාව 2024 අගෝස්තු 01 දින සිට බල පැවැත්වෙන පරිදි වසර දෙකක් සඳහා ඉන්දියාවේ පෞද්ගලික උපදේශකයෙකුගෙන් ආයුගණක උපදේශන සේවාව ලබා ගැනීමට තීරණය කර තිබූ අතර 2024 වර්ෂය සඳහා රු.මිලියන 44.7ක් වැයකර තිබුණි. සිදු කරන ලද

නියැදි විගණනයට අනුව, ඉහත උපදේශකවරයා ශ්‍රී ලංකාවේ රක්ෂණ සමාගම් දෙකක් සඳහා ආයුගණක වාර්තා නිකුත් කර ඇති බව නිරීක්ෂණය විය. මේ අනුව මෙය කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම්වල ස්වාධීනත්වයට බලපෑමක් ඇති කළ හැකි බව නිරීක්ෂණය විය.

**ගොඩනැගිලි කුලියට ගැනීම**

නිල කටයුතු සිදු කිරීම සඳහා ආර්ථික වශයෙන් ලාභදායී ස්ථානයක් තෝරා නොගෙන, බදු ගිවිසුමක් යටතේ, ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ නැගෙනහිර කුළුණේ 11 වන මහලේ වර්ග අඩි 8,741කින් සමන්විත කාර්යාල අවකාශයක් කොමිෂන් සභාව විසින් ලබාගෙන තිබුණි. 2024 වර්ෂයේදී, කුලී සහ සේවා ගාස්තු සඳහා රු.මිලියන 44.3ක්, වාහන නැවැත්වීමේ ගාස්තු සඳහා රු.මිලියන 1ක් සහ විදුලිය සඳහා රු.මිලියන 3.2ක් (එකතුව රු.මිලියන 48.5)ක් කොමිෂන් සභාව විසින් දරා තිබුණි. ගොඩනැගිල්ලේ බදු කුලී වියදම 2024 වර්ෂයේ මුළු වියදමෙන් සියයට 13ක් සහ මුළු ආදායමෙන් සියයට 10ක් නියෝජනය කර තිබුණි. ආර්ථික වශයෙන් ශක්‍ය විකල්ප පරිශ්‍ර පිළිබඳව විශ්ලේෂණය නොකර, 2024 ඔක්තෝබර් 01 සිට 2029 ඔක්තෝබර් 01 දක්වා තවත් වසර පහක් සඳහා බදු ගිවිසුම අලුත් කර තිබුණි.

**කාර්ය මණ්ඩලය සඳහා ගෙවීම්**

කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය සඳහා අනුමත කරන ලද නිශ්චිත "වැටුප් වැඩි කිරීමේ ප්‍රතිපත්තියක්" නොතිබුණු අතර සේවකයින් සඳහා බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR), වැටුප් පරිමාණය සහ වැටුප් කේත සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

## රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

**ආරක්ෂණ අරමුදලේ භාවිතය**

රක්ෂණ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 103 වගන්තිය ප්‍රකාරව "රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල" ලෙස හැඳින්වෙන අරමුදලක් ස්ථාපිත කළ යුතු අතර, පනතේ 7 වන වගන්තිය යටතේ, "සෙස් ආදායම" එහි ආදායම ලෙස බැර කළ යුතුය. රක්ෂණ ඔප්පු හිමියන්ගේ පොදු ආරක්ෂාව සඳහා සහ ඒ වෙනුවෙන් සාදන ලද රීති මගින් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වෙනත් විශේෂිත අරමුණක් සඳහා අරමුදල

භාවිතා කළ යුතුය. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් සියයට 0.03 ක එනම් රු.මිලියන 4.5ක මුදලක් කොමිෂන් සභා අරමුදලෙන් මහජන දැනුවත් කිරීමේ වියදම් සඳහා කොමිෂන් සභාව වැය කර ඇති බව නිරීක්ෂණය විය. එබැවින්, මෙම අරමුදල සැලකිය යුතු කාලයක් රක්ෂණ ඔප්පු හිමියන්ගේ පොදු ආරක්ෂාව සඳහා භාවිතා කර නොමැති බව නිරීක්ෂණය විය.

## ජාතික රක්ෂණභාර අරමුදල

**අභ්‍යන්තර පාලන දුර්වලතා**

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ප්‍රධාන දත්ත සහිත ඒකාබද්ධ පද්ධතියක් මණ්ඩලය සඳහා නොතිබුණි. එබැවින්, හිමිකම් අයදුම්පත් භාර ගැනීමේදී අක්‍රමිකතා, හිමිකම් තොරතුරු නැතිවීම, හිමිකම් අයදුම්පත්වල දෝෂ නිවැරදි කිරීමේ ප්‍රමාදයන් සහ හිමිකම් ගෙවීම් ක්‍රියාවලියේ අනවශ්‍ය ප්‍රමාදයන් සිදුවී තිබුණි. 2025 පෙබරවාරි 28 දින වන විට රජයේ සේවකයින් සහ විශ්‍රාමිකයන් සඳහා වන අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමයන්හි මුළු රක්ෂණ ඔප්පු හිමියන් සංඛ්‍යාව 1,362,886ක් වූ අතර 2025 මැයි 30 වන දින වන විටත් අග්‍රහාර රක්ෂණ ඔප්පු හිමියන්ගේ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ විස්තර ලබා දීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ හිමිකම් රු.මිලියන 3,233.7ක් වූ අතර සමාලෝචනයට භාජනය වන වර්ෂය සඳහා ගෙවන ලද ප්‍රතිරක්ෂණ හිමිකම් රු.මිලියන 192.3ක් සහ එ.ජ.ඩොලර් 12,387ක් විය. ප්‍රතිරක්ෂණ හිමිකම් පිළිබඳ තොරතුරු වාර්තා කිරීම හා පවත්වාගෙන යාම සඳහා එක්සෙල් පත්‍ර (Excel sheet) භාවිතා කර තිබුණි. එබැවින්, ප්‍රතිරක්ෂණ හිමිකම් හැසිරවීම සඳහා නිසි පද්ධතියක් නොමැති බව නිරීක්ෂණය විය.

# ජාතික ආරක්ෂක අංශය

## ආරක්ෂක අමාත්‍යාංශය

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 06ක් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 16ක් ක්‍රියාත්මකව පැවතුණි. ආරක්ෂක අමාත්‍යාංශය වෙත 2024 වාර්ෂික අයවැය මගින් සිදුකර තිබූ ශුද්ධ ප්‍රතිපාදනය, වියදම හා ඉතිරිය පහත පරිදි වේ.

**රූපසටහන 2.9 - ලබා දී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය හා වියදම**




| | ආරක්ෂක අමාත්‍යාංශය | ශ්‍රී ලංකා යුධ හමුදාව | ශ්‍රී ලංකා නාවික හමුදාව | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව |
|---|---|---|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන | 34,794 | 219,717 | 82,684 | 69,199 | 21,780 | 335 |
| ශුද්ධ වියදම රු.මිලියන | 22,013 | 218,646 | 82,369 | 58,553 | 21,367 | 326 |
| ඉතිරිය රු.මිලියන | 12781 | 1,071 | 315 | 10,646 | 413 | 09 |

**මූලාශ්‍රය - 2024 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන**

සමාලෝචිත වර්ෂය තුල සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## විගණන නිරීක්ෂණ

**ත්‍රිවිධ හමුදාව සඳහා අමු හා වියළි ආහාර සැපයීමේ තරගකාරීත්වය සීමාවීම**

ත්‍රිවිධ හමුදාව සඳහා අමු හා වියළි ආහාර සැපයීමේ ප්‍රසම්පාදනය මධ්‍යගතව සිදු කරන නමුත් ලංසු ඉදිරිපත් කිරීමේදී ඒ ඒ කඳවුරු අනුව ලංසු ඉදිරිපත් කිරීමේ අවස්ථාව ලබා දී ඇත. එසේ වුවද,

සැපයුම් ප්‍රමාණයන් අනුව බාණ්ඩගත කර ඒ ඒ බාණ්ඩයන් සහ සුදුසු පරිදි වෙන වෙනම හඳුනාගත් පූර්ව සුදුසුකම් හඳුන්වා දී නොතිබුණි. මේ අනුව නිෂ්පාදකයාගේ අධිකාරිත්ව සහතික ඉදිරිපත් කිරීම, දක්වා ඇති සන්නම් නාම යටතේ මිලගණන් කැඳවීම හා නියැදි (Sample) ඉදිරිපත් කිරීම, එලවළු පළතුරු ආදිය සඳහා තත්ත්ව සහතික ඉල්ලීම යනාදී මහා පරිමාණික සැපයුම්කරුවන්ට පමණක් ඉටුකළ හැකි සුදුසුකම් කුඩා පරිමාණ සැපයුම්කරුවන් විසින්ද ඉටුකළ යුතුව පැවතුණි. මෙම තත්වය ප්‍රසම්පාදනයේ තරඟකාරිත්වය ප්‍රවර්ධනය අවම වීමට හා ඉදිරිපත්වන මිල ගණන් ඉහලයාමට හේතුවී තිබුණි. ත්‍රිවිධ හමුදාවන්ට අයත් කඳවුරු 147ක් සඳහා, විවිධ ආහාර කාණ්ඩ 217 කට අදාල සැපයුම් අවස්ථා 2,088ක් පමණ පැවතියද, ඉහත තත්වය මත සැපයුම්කරුවන් 24ක් විසින් සියළුම සැපයුම් අවස්ථා හිමිකරගෙන තිබූ අතර 2023 වර්ෂයේ මුළු සැපයුමෙන් සියයට 36 ක් හෙවත් රු.බිලියන 34.9ක සැපයුම් හා 2024 වර්ෂයේ මුළු සැපයුමෙන් සියයට 33ක් හෙවත් රු.බිලියන 28ක සැපයුම් එක් සැපයුම්කරුවෙකු හිමිකරගෙන තිබුණි. තවද, 2023 හා 2024 වර්ෂවලදී මුළු සැපයුමෙන් සියයට 90ක් හෙවත් රු.බිලියන 76කට අධික සැපයුම්, ලංසුකරුවන් 06 දෙනෙකුට හා ඉතිරි සියයට 10 ලංසුකරුවන් 18ක් වෙත බෙදීගොස් තිබුණි.

**කාලීනව ගාස්තු සංශෝධනය නොවීම**

2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 1/2015 හි (05) ඡේදයේ සහ මුදල් රෙගුලාසි 128 (2) (එ) විධිවිධානවලට අනුව, අවශ්‍ය විටෙක විවිධ සේවාවන් සඳහා අය කරනු ලබන ගාස්තු කාලෝචිත ලෙස සංශෝධනය කළ යුතු වුවත්, 1996 අංක 22 දරන තුවක්කු (සංශෝධන) පනත යටතේ තුවක්කු භාවිතයට අයකරනු ලබන ගාස්තු සඳහා කාලීනව සංශෝධනය කර නොතිබුණි. මේ අනුව රු.10ක සිට රු.2000 දක්වා වූ ගාස්තු මත වර්ෂ 29 ක පමණ කාලයක සිට බලපත්‍ර නිකුත් කිරීම හා අළුත් කිරීම ක්‍රියාත්මක වන බැවින් සැලකිය යුතු රාජ්‍ය ආදායමක් වාර්ෂිකව අහිමිවන බව නිරීක්ෂණය විය.

**බලපත්‍ර රහිතව ගිනි අවි සන්තකයේ තබා ගැනීම**

තුවක්කු ආඥා පනතෙහි 182 අධිකාරියෙහි 22(1) හා 29(1) වගන්ති ප්‍රකාරව බලපත්‍රයක් දරනු ලබන්නේ නම් මිස, යම් තුවක්කුවක් තම භාරයේ තබා ගැනීම, සන්තකයේ තබා ගැනීම හෝ පාවිච්චි කිරීම

කරනු නොලැබිය යුතු බව සඳහන් වුවද, 2024 දෙසැම්බර් 31 දිනට බලපත්‍ර අළුත් නොකල ගිනි අවි සංඛ්‍යාව 7,125ක් වී තිබුණි.

**ගිනි අවි සංඛ්‍යාලේඛන අතර පරස්පරතා පැවතීම**

තුවක්කු බලපත්‍ර ආඥාපනතේ 182 අධිකාරයෙහි 27වන ජේදය ප්‍රකාරව බලපත්‍ර අධිකාරීවරයා වන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පවත්වාගත යුතු තුවක්කු බලපත්‍ර ලේඛණ අනුව 1995 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන (වගා ආරක්ෂක සහ දේපළ ආරක්ෂාව සඳහා) කාර්යන් සඳහා නිකුත්කර තිබුණු බලපත්‍ර සංඛ්‍යාව 25,064ක් විය. නමුත්, විගණනයට ඉදිරිපත් කළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ඉදිරිපත් කරන ලද කාර්තු වාර්තා සමඟ සැසඳීමේදී 2024 දෙසැම්බර් 31 දිනට ගිණි අවි බලපත් සංඛ්‍යාව අතර බලපත්‍ර 12,981ක වෙනසක් පැවතුණි.

**සහන සේවා මධ්‍යස්ථානයේ අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීම**

ජාතික සහන සේවා මධ්‍යස්ථානය විසින් ආපදාවට ලක් වූවන් සහ අවදානම් සහිත ස්ථානවල පදිංචිකරුවන් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ නිවාස 5,025 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව නිවාස 4,898 ක වැඩ ආරම්භ කර තිබූ නමුත් එයින් නිවාස 1,179 ක ඉදිකිරීම් අතහැර දමා තිබුණි. තවද මෙම ව්‍යාපෘතියට 2024 වර්ෂය අවසන් වනවිට රු.මිලියන 583.83ක් වැය කර තිබුණු නමුත්, යටිතල පහසුකම් නොමැතිවීම සහ අවදානම් සහගත ස්ථානවලින් පදිංචිකරුවන් ඉවත්වීම ප්‍රතික්ෂේප කිරීම යනාදී හේතුමත ඉදිකල නිවාසවල පදිංචි නොවීමේ තත්ත්වයක් ද නිරීක්ෂණය විය.

2016 ඔක්තෝබර් 04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ අංක 06, 07 හා 08 දරන ගොඩනැගිලි කඩිනමින් නිමකර, දැනට කුලී පදනම මත පවත්වාගෙන යනු ලබන කාර්යාල පරිශ්‍ර එම ගොඩනැගිලි වල ස්ථානගත කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු බවට අමාත්‍යාංශ ලේකම් වරයාට නියමකර තිබුණද ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය 2009 වර්ෂයේ සිට කුලියට ගත් ගොඩනැගිල්ලක පවත්වා ගෙන යමින් තිබුණි. එහෙත් වර්ග මීටර් 19,000 පමණ වූ මහල් 09කින් සමන්විත අංක 08 දරන ගොඩනැගිල්ල 2021 ජනවාරි මාසය වනවිට ඉදිකිරීම් අවසන්කර තිබුණත් පූර්වෝක්ත අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කටයුතු නොකිරීම හේතුවෙන් 2021 මැයි සිට 2024 නොවැම්බර් දක්වා කාලයට ආසන්න වශයෙන් රු.මිලියන 211.6ක් ගොඩනැගිලි කුලී වශයෙන් අමතරව වැය කිරීමට සිදුව තිබුණි.

කෙසේ වුවද, 2024 දෙසැම්බර් 31 දින අදාළ තනතුර අහෝසි කර තිබුණි.

**නිල වාහනවලට අමතරව වාහන භාවිතා කිරීම**

භාණ්ඩාගාර ලේකම්ගේ 2022 ජූනි 02 දිනැති රාජ්‍ය වියදම් පාලනය කිරීම මැයෙන් ආරක්ෂක ලේකම් අමතනලද ලිපිය මගින් ත්‍රිවිධ හමුදාවේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සඳහා නිල වාහන අනුයුක්ත කිරීමේදී අනුමත හිමිකමට පමණක් වාහන භාවිතය සීමා කිරීම, නිල හිමිකම සහිත නිළධාරීන් සඳහා එක් වාහනයක් පමණක් වෙන්කිරීම ඇතුළු අධික ඉන්ධන වියදම් සීමා කිරීම සඳහා ක්‍රමවේද භාවිතා කළයුතු බව අවධාරණය කර තිබුණද අමාත්‍යාංශයට අනුයුක්ත හමුදා නිළධාරීන් විසින් නිත්‍ය සේවා ස්ථානයෙන් නිලවාහන සහ ඉන්ධන ලබාගෙන තිබියදී අමාත්‍යාංශයට අයත් වාහන හා ඉන්ධන භාවිතාකර තිබුණු අවස්ථා පැවති බව නියැදි පරීක්ෂාවලදී නිරීක්ෂණය විය.

**අමාත්‍යාංශය වෙත වාහන මුදාහැරීම**

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අයත්/ කුලී පදනම මත ලබාගත් වාහන 11ක් හා යතුරු පැදියක් ඉන්ධන සහිතව ආරක්ෂක අමාත්‍යාංශය වෙත පරිහරණය සඳහා මුදාහැර ඇති බව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් විගණනය වෙත දන්වා තිබුණු නමුත් එම වාහන ආරක්ෂක අමාත්‍යාංශයේ පාලන අංශය විසින් භාරගෙන නොමැති බවත්, ආරක්ෂක අමාත්‍යාංශයේ සංචිතය තුළ එම වාහන රාජකාරි සඳහා අනුයුක්ත කර නොමැති බවත් අමාත්‍යාංශය විසින් විගණනයට වාර්තා කර තිබුණි.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

**හිඟ ගුවන් යානා කුලී ආදායම්**

2024 වර්ෂය අවසානය වන විට වසර 06ත් 21ත් අතර කාලපරාසයන් තුළ පැවත එන රු.මිලියන 12.7ක හිඟ ගුවන් යානා කුලී ආදායම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**ඉඩම් සහ ගොඩනැගිලි අයිතිය**

ගුවන් හමුදාව විසින් ඉඩම් හෙක්ටයාර් 639 ක් සහ ගොඩනැගිලි 07 ක් නීත්‍යානුකූලව අයිතිය පවරා ගැනීමකින් තොරව දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් පවතින අතර, එහි නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමේ කටයුතු ඉතා මන්දගාමී ස්වභාවයක පැවතුණි. තවද 2001 වර්ෂයේදී කටුකුරුන්ද කඳවුර වෙත පරිත්‍යාග ලෙස ලැබී ඇති

අක්කර 01 පර්චස් 7.9ක ඉඩම අනවසර පදිංචිකරුවන් තිදෙනෙකු අත්පත්කරගෙන ඇතත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**රක්ෂණාවරණ නොමැති හා ලියාපදිංචි නොකළ වාහන**

විවධ වර්ගයේ වාහන 833ක් සහ යතුරුපැදි 396ක් රක්ෂණාවරණයක් නොමැතිව ධාවනයට යොදවා තිබුණු අතර, ලියාපදිංචි නොකළ විවිධ වර්ගයේ වාහන 625 ක් සහ යතුරු පැදි 113 ක් පරිහරණය කරමින් පැවතුණි.

**අලාභයන් සම්බන්ධව ප්‍රමාණවත් ක්‍රියා මාර්ග නොගැනීම**

ගුවන් හමුදාවේ විවිධ වත්කම් වලට සිදු වූ වසර 10 කට වැඩි සිද්ධි 15 කට අදාළව රු.මිලියන 71 ක අලාභයන්ද, වසර 05 ට වැඩි වසර 10 ට අඩු සිද්ධි 12 කට අදාළව රු.මිලියන 89 ක අලාභයන්ද සම්බන්ධව ප්‍රමාණවත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

## ශ්‍රී ලංකා යුධ හමුදාව

**අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද ගණනය කිරීමේ අඩුපාඩු**

අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) ගණනය කිරීමේ අඩුපාඩු හේතුවෙන් මාස 24 ක කාලයක් සඳහා රු.මිලියන 112 ඉක්මවූ බදු ආදායමක් රජයට අහිමි වී තිබුණි.

**මහනුවර පල්ලෙකැලේ රෝහල**

මහනුවර පල්ලෙකැලේ රු.මිලියන 1,393ක් පමණ වැයකර අළුතින් ඉදිකල රෝහල 2021 ජූලි මස සිට රෝහල් කටයුතු සඳහා විවෘත නොකර පැවතුණි.

**ආදායම් කළමනාකරණයේ අඩුපාඩු**

හමුදාවේ කාර්ය මණ්ඩලය 1,586ක්, වාහන 115 ක්, වර්ග අඩි 249,074 ක ගොඩනැඟිලි හා ඉඩම් අක්කර 113ක සම්පත් භාවිතා කර තිබුණද, යුද්ධ හමුදා ගොවිපලවල් 18 ක් හා සුභසාධක හෝටල් 05 ක් මඟින් 2024 වර්ෂයේ රු.මිලියන 1,357 ඉක්මවූ ආදායමක් රැස්කර තිබුණද, ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම, වාර්තා කිරීම හා ආදායම මත ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කිරීම් සම්බන්ධ ගැටළු නිරවුල්ව නොතිබුණි.

## ශ්‍රී ලංකා නාවික හමුදාව

**වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් වියදම් දැරීම**

2024 වර්ෂයේදී ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ඉන්ධන සඳහා රු.මිලියන 373.98 ක් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙනුවෙන් ද ,වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ව්‍යාපෘති වෙනුවෙන් නාවික හමුදාවේ නිලධාරීන් හා නාවිකයන් යෙදවීම වෙනුවෙන් රු.මිලියන 369.95 ක් ද ප්‍රතිපූර්ණය කරගැනීමකින් තොරව වැයකර තිබුණි.

**ගොඩනැගිලි 135 ක වටිනාකම් මූල්‍ය ප්‍රකාශන තුල නිරූපණය නොවීම**

නැගෙනහිර, බටහිර,උතුරු,උතුරු මැද, දකුණු,වයඹ හා ගිණිකොණ යන නාවික විධානයන්ට අයත් ගොඩනැගිලි 135 ක වටිනාකම තක්සේරු කරවා නොගැනීම මත මූල්‍ය ප්‍රකාශන තුල මූල්‍ය නොවන වත්කම් යටතේ ඇතුළත් කර නොතිබුණි.

**ව්‍යවස්ථාපිත නොවන අරමුදල් පවත්වා ගැනීම**

2020 අගෝස්තු 08 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 සහ 2024 නොවැම්බර් 06 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2024 අනුව ව්‍යවස්ථාපිත නොවන අරමුදල් පවත්වාගෙන යාම නොකළ යුතු බවත් ව්‍යවස්ථාපිත නොවන අරමුදල් තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් එම අරමුදල් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට කටයුතු කල යුතු බවද වැඩිදුරටත් දක්වා තිබුණි. නාවික හමුදාව විසින් නාවික හමුදා මාලිමා සත්කාරක සේවාව, නාවික හමුදා ඉන්ධන පිරවුම්හල, තල්මසුන් නැරඹීමේ ව්‍යාපෘතිය හා නාවික කෘෂි ව්‍යාපෘතිය නමින් නාවික හමුදාවේ භෞතික හා මානව සම්පත් භාවිතාකර ව්‍යවස්ථාපිත නොවන අරමුදල් 04 ක් පවත්වාගෙන යන අතර එම අරමුදල් 04 ට අදාළව බැංකු ගිණුම් 41 ක් පවත්වාගෙන යයි. ඉහත චක්‍රලේඛ අනුව ඒවායේ ක්‍රියාකාරීත්වය අවසන් කර අරමුදල් විසුරුවා හැරීම හෝ අරමුදල පවත්වාගෙන යාමට සාධාරණ හේතු තිබේ නම් එම අරමුදල් පාර්ලිමේන්තු පනත් මගින් නීතිගත කිරීම 2025 මැයි මස දක්වා සිදුව නොතිබුණි.

## සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

**අලාභ අයකර නොගැනීම**

වැලිසර විශේෂ ව්‍යාපෘතිය මඟින් පවත්වා ගෙන ගිය පිටත බලකා වෙතින් වාර්තා කරන ලද භට පිරිස් සඳහා ආහාර ලබාදීමේ ක්‍රියාවලිය හා බලකා මඟින් නිෂ්පාදනය කරනු ලබන සහල්/ධාන්‍ය අලෙවි කිරීමේ ක්‍රියාවලියේදී සිදු වූ රු.මිලියන 20.8ක අක්‍රමිකතාවය සම්බන්ධව කිසිදු සටහනක් හානි පාඩු ලේඛනයේ හෝ මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුලත් කර නොතිබුණි. තවද, එම අලාභ අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

හානි හා පාඩු සිද්ධීන් 10කට අදාළව මණ්ඩල වාර්තා අනුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් රු.මිලියන 6.3ක් අයකර ගැනීමට නිර්දේශ කර තිබුණද 2024 වර්ෂය අවසාන වන විටත් එම මුදල් අය කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**හිඟ ආදායම්**

2022 හා 2023 වර්ෂවලදී සහල් අලෙවියෙන් මැදිරිගිරිය උහන හා මහඔය බලකා වෙත ලැබිය යුතු එකතුව රු.මිලියන 2.26ක් ව්‍යාපෘති අංශය විසින් හඳුනාගෙන හිඟ ආදායම් තුල වාර්තා කර නොතිබුණි.

**නිශ්කාර්ය වත්කම්**

කැබිතිගොල්ලෑව බලකාගේ ක්‍රියාත්මක හරිතාගාර මිරිස් ව්‍යාපෘතිය සඳහා 2021 සහ 2022 වර්ෂවලදී බලකාය වෙත ලැබී තිබූ වටිනාකම රු.මිලියන 3.26ක් වූ තොග අයිතම 19 ක් සහ වටිනාකම හඳුනාගත නොහැකි තොග අයිතම 22 ක් වර්ෂ 02 ත් 03 ත් අතර කාලයක සිට නිශ්කාර්යව පැවතුණි.

## ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

**නව පනතක් සම්පාදනය නොකිරීම**

2009 අංක 41 දරන ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු පනත පරිවින්න කර නව පනතක් සම්පාදනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 16/2249/703/093 දරන 2016 නොවැම්බර් 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාදී තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විටත් එම කටයුතු ඉටුකර නොතිබුණි.

**අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය පිළිබඳ පසුවිපරම් සිදුනොවීම**

2024 වර්ෂයේදී අත්අඩංගුවට ගෙන තිබූ මත්ද්‍රව්‍ය අතරින් KENNDU LEAVES නමැති මත්ද්‍රව්‍ය කි.ග්‍රෑ.15,067ක් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම

සඳහා ශ්‍රී ලංකා රේගුවටද අනෙකුත් මත්ද්‍රව්‍ය සියල්ලම ශ්‍රී ලංකා පොලීසියටද භාරදී තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව පසුවිපරම් සිදුකර නොතිබුණි.

**මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

රු.මිලියන 98 ඇස්තමේන්තුගත වියදමක් යටතේ වෙරළ ආරක්ෂක වරුණ ආයතනය සඳහා නේවාසික, පරිපාලන පහසුකම් සහිත නව සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා කටයුතු සැලසුම් කර තිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2022 හා 2023 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.මිලියන 10 ක් හා රු.මිලියන 35 ක් බැගින් රු.මිලියන 45 ක් වෙන් කර තිබුණද එකී වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 4.91ක් හා රු.මිලියන 13.71ක් වශයෙන් එකතුව රු.මිලියන 18.62 ක සත්‍ය වියදමක් දරා තිබූ බවට තොරතුරු ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද, ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය ශූන්‍ය බවට තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

**වෙනත් වැය ශීර්ෂ මගින් වියදම් දැරීම**

2024 වර්ෂයේ දෙපාර්තමේන්තුව සතු නෞකා, යාත්‍රා සහ දෙපාර්තමේන්තුව භාවිතා කරන වාහන වෙනුවෙන් ප්‍රතිපූර්ණය කිරීමකින් තොරව නාවික හමුදාවෙන් රු.මිලියන 373.98ක් වූ ඉන්ධන ලබාගෙන තිබූ අතර. එම වියදම දෙපාර්තමේන්තු වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

## කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

**මුද්‍රණාලය ආදායම්, වියදම් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් නොකිරීම**

2023 මාර්තු 08 දින නීත්‍යානුකූල පදනමකින් තොරව විශ්ව විද්‍යාලයේ මුද්‍රණාලය ස්වාධීන ආයතනයක් ලෙස කටයුතු කිරීමට කළමනාකරණ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. 2023 මාර්තු 13 දින රු. මිලියන 5 ක් මුද්‍රණාලය වෙත ලබා දී තිබුණි. තවද, 2023 මාර්තු 07 සිට 2023 දෙසැම්බර් 31 දක්වා මුද්‍රණාල ආදායම, වියදම හා 2023 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය පිළිවෙලින් රු.මිලියන 18.5ක්, රු.මිලියන 8.43ක් හා රු.මිලියන 4.5ක්ද, 2024 වර්ෂයේ මුද්‍රණාල ආදායම, වියදම, 2024 දෙසැම්බර් 31 දිනට තොගය සහ මුදල් ශේෂ පිළිවෙලින් රු.මිලියන 19.11ක්, රු.මිලියන 15.56ක්,

රු.මිලියන 5.66ක් සහ රු.මිලියන 0.81ක් මූල්‍ය ප්‍රකාශන තුල ඉදිරිපත් කර නොතිබුණි.

**ශ්‍රවණාගාරය සඳහා පුටු මිලදී ගැනීමට**

විශ්වවිද්‍යාල ශ්‍රවණාගාරය සඳහා රු.මිලියන 84.85ක් වටිනා පුටු 1,275ක් මිලදී ගැනීමට 2023 මාර්තු 10 දින අත්සන් කරන ලද ගිවිසුමේ 35.1 ප්‍රකාරව දෝෂ සඳහා වගකීම් කාලය වසරක් විය. මෙම පුටු 2023 නොවැම්බර් 14 දින විශ්වවිද්‍යාලය වෙත ලැබී තිබූ නමුත් ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් සම්පූර්ණ නොවීම හේතුවෙන් ඉදිකෙරෙමින් පවතින ශ්‍රවණාගාර ගොඩනැගිල්ල තුල 2024 දෙසැම්බර් 31 දින වනවිටත් නිශ්කාර්යව ගබඩා කර තිබුණි.

**නිශ්කාර්ය වත්කම්**

2025 මාර්තු 31 දින වන විට වගකීම් කාලය ඉක්ම වූ රු.මිලියන 13.99 ක් වටිනා වෛද්‍ය උපකරණ අයිතම 14 කට අයත් ඒකක 136 ක් දීර්ඝ කාලයක සිට ගබඩා තුළ නිශ්කාර්යව පැවති අතර එම අයිතම 2018, 2019 හා 2021 වර්ෂවලදී ගබඩාවට ලැබී තිබුණි. තවද හෘද උරස් ඒකකය සඳහා 2022 හා 2023 වර්ෂ තුළ මිලදී ගෙන තිබූ රු. මිලියන 186.51 ක් වටිනා වෛද්‍ය උපකරණ අයිතම 02 කට අයත් ඒකක 05 ක් වර්ෂ 1ත් 2ත් දක්වා කාලයක සිට නිශ්කාර්යව ගබඩා කර තිබුණු අතර ඒ තුළ වූ රු.මිලියන 58.2 ක් වටිනා වෛද්‍ය උපකරණ අයිතමයකට අදාල ඒකක 03 ක වගකීම් කාලය ඉක්මවා ගොස් තිබුණි. එසේම 2017 වර්ෂයේ මිලදී ගන්නා ලද රෝහල් ඇඳන් 14 ක් විගණිත දින වන විටත් භාවිතයට නොගෙන ගබඩා කර තිබුණි.

**ශික්ෂණ රෝහලට අයත් ඉඩම පවරා ගැනීම**

කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් හෙක්ටයාර් 21.5815ක භූමියේ විශ්වවිද්‍යාලයීය ශික්ෂණ රෝහල ස්ථාපිතකර තිබුණි. එම භූමියෙහි ඉදිකර තිබුණු ශික්ෂණ රෝහලට අයත් ගොඩනැගිලිවල වටිනාකම රු.මිලියන 45,385.48ක් වූ අතර, භූමිය සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.මිලියන 1,216.88ක පිරිවැයක්ද දරා තිබුණි. 2024 වර්ෂය අවසන්වන විට ඉදිකිරීම් අවසන්කර වර්ෂ 08 කට අධික කාලයක් ගතවී ඇතත් අදාල ඉඩම පවරාගැනීම අවසන්ව නොතිබුණි.

**හිඟ ආදායම්**

KDU Hotel ආයතනයෙන් ලැබිය යුතු රු. මිලියන 6 ක් වූ බදු කුලී ආදායම 2024 වර්ෂයේ ආදායමට අයකර ගෙන නොතිබුණි. එමෙන්ම සැලසුම් හා සංවර්ධන මූල්‍ය ආයතනයෙන්, විශ්වවිද්‍යාල

රෝහලෙන් සහ ලෝක ආහාර වැඩසටහනෙන් විදුලිය හා ජලය සැපයීම වෙනුවෙන් අයවිය යුතු රු.මිලියන 5.31ක මුදලක් අය නොවී වර්ෂ 01 ත් 04 ත් අතර කාලයක් ගත වී තිබුණි. තවද, විශ්වවිද්‍යාල සිසුන්, ස්ථිර සේවකයින් සහ කැඩෙට් නිලධරයන් විසින් ගිවිසුම් උල්ලංඝණය කිරීම හේතුවෙන් ලැබිය යුතු වූ රු.මිලියන 119.47ක මුදලක් වර්ෂ 2 ත් 5 ත් අතර කාල පරාසයක් තුළ අයකර ගත යුතුව පැවතුණි.

**නිශ්කාර්ය තොග**

අවශ්‍යතාවය නිසි ලෙස හඳුනාගැනීමකින් තොරව 2021 වර්ෂයේ දී මිලදී ගන්නා ලද රු.මිලියන 2.79ක් වටිනා කම්බි 675 ක ප්‍රමාණයක් දක්ෂිණ මණ්ඩපයේ ගබඩා තුල නිශ්කාර්යව ගොඩගසා තිබුණු අතර, මෙම කම්බි තොග විශ්වවිද්‍යාලය විසින් ප්‍රයෝජනවත් ආර්ථික කටයුත්තකට යෙදවීමට හෝ අලෙවිකර ආදායමක් උපයා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

**ඌන උපයෝජිත වත්කම්**

විශ්වවිද්‍යාල රෝහලේ වාට්ටු අංක 5A, 7A හා 7B සහ දැඩි සත්කාර ඒකක 02, 03 හා 04 යන අංශ 2022 මැයි සිට 2024 වර්ෂය අවසානය දක්වා උපයෝජනයෙන් තොරව පැවති අතර, ඒ තුල පැවති රු.මිලියන 210.2ක් වටිනා වෛද්‍ය උපකරණද නිශ්කාර්යව පැවතුණි.

**කල් ඉකුත් වූ ඖෂධ**

විශ්වවිද්‍යාල රෝහල තුළ 2024 වර්ෂය අවසන් වන විට ඖෂධ හා එන්නත් ඒකක 363,012 ක් කල් ඉකුත් වී තිබූ අතර, එහි වටිනාකම රු.මිලියන 16.44ක් විය. ඒ අනුව එම ඖෂධ කල් ඉකුත් වීමෙන් පසුව ගබඩා හා රෝහලේ විවිධ අංශ තුල වර්ෂ 1 ත් 6 ත් අතර, කාල පරාසයන් තුළ පවතින බවත් නිරීක්ෂණය විය.

**චක්‍රලේඛවලට අනුගත නොවූ ගෙවීම් හා අලාභ**

2024 පෙබරවාරි 28 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2024 හි 11.4 වගන්තිය අනුව නිල වාහනයක් ලැබීමට සුදුසුකම් ලද නිලධාරියෙකු ඕනෑම සේවා නියුක්තියක් යටතේ රජයට අයත් ව්‍යාපාර කිහිපයක සේවය කලද, එම නිලධාරියා සඳහා එක් වාහනයක් පමණක් සැපයිය යුතු වුවත් 2024 වර්ෂයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ඉන්ධන සහ රියදුරු සමඟ වාහන 03 ක් නිලධාරීන් තිදෙනෙකුට ලබාදී තිබියදී විශ්වවිද්‍යාල රෝහල විසින් ද වෙන්කල වාහන 03 ක් ඉහත නිලධාරීන්ට ලබා දීම හේතුවෙන් කුලී වියදම ලෙස රු.මිලියන 2.4 ක් සහ ඉන්ධන වියදම ලෙස රු.මිලියන 1.32ක්

ඉහත චක්‍රලේඛයට පටහැනිව ගෙවා තිබුණි. තවද 2024 වර්ෂය තුළදී නිසි කලට විදුලි බිල්පත් නොපියවීම හේතුවෙන් දඩ මුදල් ලෙස රු.මිලියන 5.87ක් ගෙවීමෙන් විශ්වවිද්‍යාලයට පාඩුවක් සිදුව තිබුණි.

## ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය

**හිඟ පාඨමාලා ගාස්තු**

2023 වර්ෂයේ සිට විද්‍යාලයට අයවිය යුතු හිඟ පාඨමාලා ගාස්තුව ඇ.එ.ඩොලර් 286,815 ක් හෙවත් රු.මිලියන 83ක් වුවද එය අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**ඉඩම් අයිතිය නිත්‍යානුකූලව පවරා නොගැනීම**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් අක්කර 11 පර්චස් 10 ක භූමි ප්‍රමාණයක, රු.මිලියන 557ක් වැයකර විද්‍යාලය විසින් විවිධ ඉදිකිරීම් කර තිබුණ ද, එම ඉඩමේ නිත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## රණවිරු සේවා අධිකාරිය

**හිඟ ණය**

2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අත්තිකාරම් නොපියවීම, මාපිය රැකවරණ මුදල් ගෙවීමේ අක්‍රමිකතාවයන් හා සේවය හැර ගිය සේවිකාවකගෙන් අය විය යුතු වශයෙන් පැවති එකතුව යුතු රු.මිලියන 7.3ක් වර්ෂය අවසානය දක්වාම අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**විනය පරිපාටිය**

අධිකාරිය පිහිටුවා වසර 25 කට අධික කාලයක් ගතවුවද විනය පරිපාටියක් සකස්කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**නිෂ්කාර්ය ඉඩම්**

2009 වර්ෂයේ දී අධිකාරිය වෙත පරිත්‍යාග ලෙස ලැබී තිබුණු තක්සේරු වටිනාකම රු.මිලියන 27ක් වූ අක්කර 01, රූඩ් 03, පර්චස් 22 ක ඉඩම හා ගොඩනැගිල්ල භාවිතාකර සෞඛ්‍ය අධ්‍යාපන සම්පත් පර්යේෂණ හා තොරතුරු කේන්ද්‍රයක් පිහිටුවීමට සැලසුම් කර තිබුණ ද, අදාළ වත්කම වර්ෂය අවසානය වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

# අධිකරණ හා බන්ධනාගාර කටයුතු

අධිකරණ අමාත්‍යාංශය, ඒ යටතේ වන දෙපාර්තමේන්තු 09කින් හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතන 12කින් පිහිටුවා ඇති අතර, නීති විද්‍යාලය මෙම අමාත්‍යාංශය යටතේ ගැසට්කර තිබෙන නමුත්, ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදුකර නොතිබුණි.

රටේ මහජනතාව විශ්වාස කරන නීති පද්ධතියක් හා සාධාරණ ශ්‍රී ලංකාවක් යන දැක්ම යටතේ, ජනතාව කේන්ද්‍ර කරගත් කාර්යක්ෂම අධිකරණ පරිපාලනය මගින් ශ්‍රී ලංකාවේ ජනතාව සඳහා ස්ථාවර සාධාරණ සහ නිදහස් පරිසරයක් ඇති කිරීම මගින් පහත අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂිතය.

- ❖ ඵලදායී හා කාලෝචිත නීති ප්‍රතිසංස්කරණ
- ❖ ප්‍රතිපත්ති සංවර්ධන මූල පිරීම්
- ❖ ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම හා සම්බන්ධ වීම.
- ❖ ප්‍රජා නීති සේවා

2024 වර්ෂයේදී අධිකරණ අමාත්‍යාංශය (අධිකරණ පරිපාලනය ඇතුළත්ව) හා දෙපාර්තමේන්තු 09ක් වෙත එකතුව රු.මිලියන 48,557ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, 2024 වර්ෂය අවසන් වන විට එයින් එකතුව රු.මිලියන 40,347ක් උපයෝජනය කර තිබුණි. විස්තර පහත වගුවේ දැක්වේ.

**රූපසටහන් අංක 2.10 - 2024 වර්ෂයේදී අධිකරණ අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු 09ක් වෙත ලබා දී තිබූ ප්‍රතිපාදන හා උපයෝජනය**




| | අධිකරණ අමාත්‍යාංශය | අධිකරණ පරිපාලනය | ණය සහන දායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | නීතිපති දෙපාර්තමේන්තුව | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව | ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් | නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනය | 14227 | 12426 | 81 | 16880 | 1891 | 176 | 424 | 27 | 1501 | 732 | 192 | 48557 |
| සත්‍ය වියදම | 7371 | 12254 | 69 | 16206 | 1808 | 156 | 393 | 21 | 1239 | 662 | 168 | 40347 |
| ඉතිරි ප්‍රතිපාදනය | 6856 | 172 | 12 | 674 | 83 | 20 | 31 | 6 | 262 | 70 | 24 | 8210 |

**මූලාශ්‍රය - අධිකරණ අමාත්‍යාංශය**

## අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

**පුහුණු ඒකකයේ වැඩසටහන් නොපැවැත්වීම**

අධිකරණ නිලධාරීන් පුහුණු කිරීමේ ඒකකයේ ක්‍රියාකාරකමක් වන පරිගණක පුහුණු වැඩසටහන් සිදුකිරීම වර්ෂය තුළ ආරම්භකර නොතිබුණු අතර, පරිගණක ඒකකය ද, ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි. පරිගණක විද්‍යාගාරයේ පවතින CPU 23ක්, හා Monitor 26ක් හා UPS 39ක් හා ලිබඩු උපකරණ නිෂ්කාර්යව පැවතුණි.

**අධිකරණ පරිපාලනය**

2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය නිලධාරීන් 66 දෙනෙකුගෙන් රු.මිලියන 8.26ක් ද, මියගිය නිලධාරීන් 30 දෙනෙකුගෙන් රු.මිලියන 4.45ක් ද, වැඩ තහනම්කර ඇති නිලධාරීන් 71දෙනෙකුගෙන් රු.මිලියන 10.16ක් ද සහ සේවය අතහැර ගොස් සිටින නිලධාරීන් 80දෙනෙකුගෙන් රු.මිලියන 12.12ක් ද වශයෙන් එකතුව රු.මිලියන 34.99ක ණය ශේෂයක් අයවිය යුතුව තිබුණි.

## ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

**කාර්යසාධනය**

2024 දෙසැම්බර් 31 දිනට විසඳීමට තිබුණු තථ්‍ය නඩු සංඛ්‍යාව 745ක් වූ අතර, එය වර්ෂය තුළ විසඳීමට තිබුණු 2,058ක් වූ මුළු නඩු සංඛ්‍යාවෙන් සියයට 36ක අගයක් ගෙන තිබුණි. මේ තුළ ප්‍රධාන මණ්ඩලයේ නඩු 109ක් ද, කොළඹ ශාඛාවේ නඩු 113ක් ද, ගම්පහ, කුරුණෑගල, සහ ගාල්ල ශාඛා කාර්යාලවල නඩු සංඛ්‍යාව පිළිවෙලින් 293ක්, 154ක්, සහ 76ක් ලෙස ඉතිරි වී තිබුණි. ඒ අනුව වර්ෂය තුළ විසඳීමට තිබුණු නඩු සංඛ්‍යාව හා සැසඳීමේදී 2024 දෙසැම්බර් 31 දිනට ඉතිරි නඩු සංඛ්‍යාවෙහි වැඩිම ප්‍රතිශතය ගම්පහ ශාඛාවෙන් වූ අතර, එය සියයට 39ක අගයක් ගෙන තිබුණි.

## නීතිපති දෙපාර්තමේන්තුව

**පවිත්‍රතා කොන්ත්‍රාත්තුව**

1998 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වාම අඛණ්ඩව වර්ෂ 25ක් එකම පවිත්‍රතා ආයතනයක් වෙතම කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු අතර, 2021 නොවැම්බර් 22 දින සිට 2024 දෙසැම්බර් 10 දින දක්වා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් නොමැතිව අදාළ ආයතනය වෙත රු.මිලියන 39.54ක මුදලක් පවිත්‍රතා සේවා වෙනුවෙන් ගෙවීම් කර තිබුණි.

## නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

**කාර්යසාධනය**

දෙපාර්තමේන්තුව විසින් 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත්කර ඇති කාර්යසාධන වාර්තාව අනුව 2024 ජනවාරි 01 දිනට කෙටුම්පත්කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් භාරදී නීතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් 289ක් සහ 2024 ජනවාරි 01 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් 96ක් වූ මුළු ඉල්ලීම් 385න් දීර්ඝ කාලීනව උපදෙස් නොමැතිව වසන ලද ගොනු 95ක් පැවති අතර, 2024 දෙසැම්බර් 31 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් 45ක ප්‍රමාණයක් ඉතිරි වී පැවතුණි.

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

බන්ධනාගාර නේවාසිකයන් විධිමත් පුනරුත්ථාපනය මගින් නීති ගරුක මානව හිතවාදී පුද්ගලයන් බවට පත්කර ශිෂ්ඨ සම්පන්න සමාජයක් බිහිකිරීමට දායක වීම හා බන්ධනාගාර නිලධාරීන් අභිප්‍රේරණය සහ දෙපාර්තමේන්තු කණ්ඩායම් හැඟීම ගොඩනැගීම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අරමුණු වේ.

**වත්කම් ඌණ උපයෝජනය**

බන්ධනාගාර ආයතන 09ක් සඳහා රු.මිලියන 123.76ක මුදලක් වැය කර පාර්සල් හා බොඩි ස්කෑනර් මැෂින් 10ක් මිලදී ගැනීම සඳහා මිලදීගත් දින සිට 2022 වර්ෂය දක්වා අලුත්වැඩියා නඩත්තු කටයුතු සඳහා රු.මිලියන16.35ක් වශයෙන් එකතුව රු.මිලියන 140.11ක වියදමක් දරා තිබුණද, 2024 දෙසැම්බර් 31 දිනය වන විටත් ආයතන 08ක පාර්සල් ස්කෑනර් යන්ත්‍ර 04ක් සහ බොඩි ස්කෑනර් යන්ත්‍ර 04ක් වසර 04ත් මාස 04ත් අතර කාලයක සිට අක්‍රියව පැවතුණි.

**වාහන කළමනාකරණයේ අඩුපාඩු**

බන්ධනාගාර ආයතන 21ක් සතුව පවතින භාවිතයට ගත නොහැකිව අපහරණය සඳහා නිර්දේශ වී අවුරුදු 05 කාලයක් ගත වී ඇතත්, 2024 දෙසැම්බර් 31 දින වන විටත් අපහරණ කටයුතු සිදුකර නොමැති වාහන සංඛ්‍යාව 33ක් විය.

**අයිතිය පවරා නොගත් ඉඩම්**

බන්ධනාගාර ආයතනවල ඉඩම් කැබලි 49ක අක්කර 357.8139ක් වූ ඉඩම් ප්‍රමාණයක හිමිකම පවරාගැනීම සිදුකර නොතිබුණ ද, මෙම ඉඩම් බන්ධනාගාර, සිරමැදිරි, එළිමහන් සිරකඳවුරු, පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා ගොවිපොළවල් වශයෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණි.

**වැලිකඩ බන්ධනාගාරය ප්‍රතිස්ථාපනය කිරීමේ යෝජනාව**

බන්ධනාගාර තදබදය අවම කිරීම සඳහා බොරැල්ලේ පිහිටි වැලිකඩ බන්ධනාගාර සංකීර්ණය (බන්ධනාගාර මූලස්ථානය, වැලිකඩ බන්ධනාගාරය, කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය, බන්ධනාගාර රෝහල, කාන්තා අංශය හා මැගසින් බන්ධනාගාරය) හොරණ මිල්ලෑව ප්‍රදේශයේ ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියක් සැලසුම්කර තිබුණි. හෙක්ටයාර් 16.436ක් පමණ වන එම ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට 2022 නොවැම්බර් 16 දින නිදහස් දීමනා ක්‍රමයක් මගින් පවරාගෙන තිබුණ ද, හොරණ මිල්ලෑව ප්‍රදේශයේ පිහිටි ඉඩම බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත පවරාදී නොතිබුණි. 2024 ජනවාරි 11 දින රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව අනුව බොරැල්ල පිහිටි ඉඩමේ වටිනාකම රු.මිලියන 31,844.85ක් වූ අතර, හිමිකම පවරා නොතිබීම හේතුවෙන් 2024 වර්ෂය තුළ ගිණුම්ගතකර නොතිබුණි. කොළඹ පිහිටි ප්‍රධාන බන්ධනාගාර ඉදිකිරීම සිදුනොකිරීම තුළින් බන්ධනාගාර තදබදය නිසා පෙරටත් වඩා ගැටලු රාශියකට බන්ධනාගාර දෙපාර්තමේන්තුව වර්තමානයේ මුහුණදී තිබුණි.

**මළාපවාහන ප්‍රතිකාරක පද්ධති ක්‍රියාත්මක නොවීම**

බන්ධනාගාර ආයතන 05ක මළාපවාහන ප්‍රතිකාරක පද්ධති (Treatment Plant) පැවතිය ද, බෝගම්බර සහ බූස්ස යන බන්ධනාගාර දෙකෙහි පමණක් එම පද්ධති ක්‍රියාකාරීව පවතින බවත්, බූස්ස බන්ධනාගාරයේ මළාපවාහන ප්‍රතිකාරක පද්ධතිය යන්ත්‍රසූත්‍ර සහ නළ පද්ධතිය නවීකරණය කිරීම අවශ්‍ය වන අතර, පොළොන්නරුව, අගුණකොළපැලැස්ස, යාපනය යන බන්ධනාගාර ආයතනවල සහ බෝගම්බර බන්ධනාගාර නිලධාරීන්ගේ නිලනිවාස හා බැරැක්ක ආශ්‍රිත මළාපවාහන ප්‍රතිකාරක පද්ධති ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති බවත්, අගුණකොළපැලැස්ස බන්ධනාගාරයේ මළාපවාහන ප්‍රතිකාරක පද්ධතිය නිසි අයුරින් ක්‍රියාත්මක නොවන බැවින් මල අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය නොකර මුදාහැරීම නිසා පාරිසරික හා සමාජීය ගැටලු රාශියක් ඇතිව තිබුණි. මෙම පද්ධතිවල යන්ත්‍ර සූත්‍ර හා භූගත නළ පද්ධති නිසි ලෙස ක්‍රියාත්මක නොවීම මගින් අපිරිසිදු ජලය සෘජුවම බාහිර පරිසරයට බැහැරවීම ආදී ගැටළු හේතුවෙන් සිදුවන පාරිසරික හානිය වළක්වා ගැනීම සඳහා මේ දක්වා තිරසර ක්‍රියාමාර්ගයක් ලබාගෙන නොතිබුණි. බන්ධනාගාර 07ක

මළාපවාහන පද්ධතිවල ගලිවළවල් කඩාවැටීම භූගත නළ මාර්ග කැඩීයාම, මළාපවාහන පද්ධතිය ප්‍රමාණවත් නොවීම නිසා නිරතුරුව උතුරා යාම හේතුවෙන් පාරිසරික හා සමාජීය ගැටළු රාශියක් සිදුව තිබුණි.

**දඬුවම් කාලය අවසන්වීමට පෙර පැනයාම/මිදීයාම**

දඬුවම් කාලය අවසන්වීමට පෙර නීත්‍යානුකූල නොවන ආකාරයෙන් පැනගිය/මිදීගිය සිරකරුවන් හෝ සැකකරුවන් සංඛ්‍යාව පසුගිය වසර 06ක කාලපරිච්ඡේදය තුළ 995ක් ද, නැවත අත්අඩංගුවට නොගත් සංඛ්‍යාව 554ක් ද වී තිබුණි.

**CCTV කැමරා පද්ධතිය අක්‍රියවීම**

2024 ජුනි 31 දින වන විට බන්ධනාගාර ආයතන 14ක CCTV කැමරා 792ක් සවිකර තිබූ අතර, ඉන් කැමරා 458ක් පමණක් ක්‍රියාකාරී තත්ත්වයේ පවතින අතර, කැමරා 334ක් එනම් සියයට 42ක් වසර දෙකකට අධික කාලයක සිට අක්‍රියව පැවතුණි.

**බන්ධනාගර රැඳවියන්ගේ නිෂ්පාදන කටයුතු**

බන්ධනාගාර ආයතන 08ක බ්ලොක් ගල් නිෂ්පාදනය, කම්මල් අංශය, වඩු කර්මාන්තය, ලී ඉරුම් අංශය, වාහන සේවා අංශය, බේකරි අංශය, කොහු ඉදල් අංශය සහ මල් පෝච්චි අංශය යන කර්මාන්ත අංශයන් අක්‍රිය වී තිබූ තත්ත්වයක් හෙළිදරව් විය. තවද, එම ආයතනවල නිෂ්පාදන අලෙවි කිරීම සඳහා යොදා ඇති ක්‍රමවේදයන් පරීක්ෂාවේදී ආයතන 06ක නිෂ්පාදන අලෙවි කිරීම සඳහා එම බන්ධනාගාර තුළ අලෙවිසැල් පිහිටුවා නොතිබූ අතර අලෙවිසැල් පිහිටුවා ඇති ආයතන 07ක එම අලෙවිසැල්වල ඉඩකඩ ප්‍රමාණවත්ව නොපැවතින බව නිරීක්ෂණය විය.

**බන්ධනාගාරවල ධාරිතාවය ඉක්මවා පැවතීම**

2024 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර දෙපාර්තමේන්තුව තුළ සිර/සැක කරුවන්ගේ අනුමත ධාරිතාව 10,395ක් වුව ද, එදිනට තථ්‍ය ධාරිතාවය 28,278ක් වීමෙන් රැඳවියන් 17,883ක් ධාරිතාවය ඉක්මවා බන්ධනාගාර පද්ධතිය තුළ රඳවා තිබූ බවත්, එය සියයට 272ක ඉහළ යාමක් ලෙසත් නිරීක්ෂණය විය. තව ද, 2025 මැයි 29 දින වන විටත් කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය තුළ රැඳවිය හැකි රැඳවි ධාරිතාව 465ක් වුව ද, එදිනට තථ්‍ය ධාරිතාව 2,206ක් වීමෙන් රැඳවියන් 1,741ක් ධාරිතාවය ඉක්මවා රඳවා තිබූ අතර, එය සියයට 474ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

2014 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ බන්ධනාගාර ධාරිතාවය ඉක්මවා රඳවා සිටි රැඳවියන් ප්‍රමාණය පහත පරිදි විය.

**වගු අංක 2.20   *2014 සිට 2024 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ බන්ධනාගාර ධාරිතාවය**

| වර්ෂය | සම්මත ප්‍රමිතීන්ට අනුව බන්ධනාගාර තුළ නේවාසිකව තබාගත හැකි රැඳවියන් සංඛ්‍යාව | දෛනික රැඳවි ජනගහනයේ සාමාන්‍යය | රඳවා සිටින රැඳවියන් සංඛ්‍යාවේ ප්‍රතිශතය |
|---|---|---|---|
| **2014** | 11,762 | 19,108 | 162.5 |
| **2015** | 11,762 | 17,996 | 153.0 |
| **2016** | 11,762 | 17,478 | 148.6 |
| **2017** | 11,762 | 19,278 | 163.9 |
| **2018** | 11,762 | 20,384 | 173.3 |
| **2019** | 11,762 | 24,446 | 207.8 |
| **2020** | 13,241 | 25,991 | 196.3 |
| **2021** | 11,291 | 18,337 | 162.4 |
| **2022** | 10,395 | 21,979 | 211.4 |
| **2023** | 10,395 | 27,562 | 265.1 |
| **2024** | 10,395 | 28,278 | 272.0 |

**මූලාශ්‍රය   *2024 වර්ෂයේ සංඛ්‍යා ලේඛන වාර්තාව - බන්ධනාගාර දෙපාර්තමේන්තුව**

**මත්ද්‍රව්‍ය සම්බන්ධ රැඳවියන්**

ලංකාවේ 2024 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය වැරදි මත සිරගත වූවන් සංඛ්‍යාව 31,314ක් වූ අතර, සැකකරුවන් සංඛ්‍යාව 67,117ක් විය. 2024 වර්ෂය තුළ බන්ධනාගාරය වෙත සෘජු ඇතුළත් කිරීම්වලින් සියයට 65.5ක් මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධ රැඳවියන් විය. සමාලෝචිත වර්ෂය තුළ බන්ධනාගාරය වෙත සෘජු ඇතුළත් කිරීම් තුළින් නැවත නැවත සිරගතවූවන් සංඛ්‍යාව 34,488ක් වන අතර, ඔවුන් හඳුනාගැනීමට විධිමත් ක්‍රමවේදයක් පවා බන්ධනාගාරය සතුව නොමැතිවීමත්, දැනට නැවත නැවත සිරගතවන සිරකරුවන් හඳුනාගනු ලබන්නේ එම සිරකරුවන් විසින්ම ලබාදෙන වාචික තොරතුරු මත වේ. තවද, 2024 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර ආයතන 27ක සුළු දඩමුදල් ගෙවා ගැනීමට නොහැකිව බන්ධනාගාරගත වී ඇති සිරකරුවන් සංඛ්‍යාව 3,258ක් බව හෙළිදරව් වූ අතර, පවතින බන්ධනාගාර තදබදයට මෙම තත්ත්වය හේතුවක් වී තිබුණි.

**රස පරීක්ෂක වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය**

අධිකරණ මගින් බන්ධනාගාරගත කර ඇති සැකකරුවන්ට අදාළව පොලීසිය විසින් රසපරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන නඩු භාණ්ඩවලට අදාළව රසපරීක්ෂක වාර්තා ඉදිරිපත් නොවීම නිසා 2024 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර ආයතන 20ක සැකකරුවන් 9,560දෙනෙක් විය.

**ජංගම දුරකතන**

බන්ධනාගාර ආයතන 20ක් තුළින් 2024 දෙසැම්බර් 31 දිනට අත්අඩංගුවට ගන්නා ලද ජංගම දුරකථන 3,738ක්, බැටරි 3,229ක්, චාජර් 524ක් හා සිම්පත් 2,999ක් වන අතර, මෙම උපකරණ බන්ධනාගාර රැඳවියන් අතට පත්නොවීමට විධිමත් පියවරගත යුතු බවත්, රැඳවියන් අතට පත්වීම හේතුවෙන් විවිධ නීතිවිරෝධී ක්‍රියාවන් සිදුවන බවත් හෙළිදරව් විය.

**තනතුරු පුරප්පාඩු**

රැඳවියන් හා සෘජුව සම්බන්ධ වන ජේලර්, පුනරුත්ථාපන නිලධාරි, සැරයන් හා නියාමක තනතුරුවල පුරප්පාඩු 1,376ක් විය. එය සමස්ත නිලධාරි පුරප්පාඩු ගණනින් සියයට 76ක් පමණ වේ. තවද, 2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ තථ්‍ය කාර්යමණ්ඩලය තුළ ජ්‍යෝෂ්ඨ මට්ටමේ වෛද්‍ය නිලධාරින් 17දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.

**ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ තනතුරු සඳහා වූ කාර්යමණ්ඩලය 2013 වර්ෂයේදී අනුමතකර ඇති අතර, එය එවකට දෙපාර්තමේන්තු නිලධාරි අවශ්‍යතාවය හා රැඳවියන් ප්‍රමාණයට සාපේක්ෂව ප්‍රමාණවත් වුව ද, දෛනිකව අධිකරණය මගින් බන්ධනාගාරගත කරනු ලබන සිර හා සැක ප්‍රමාණය විශාල සංඛ්‍යාවක් වීම මත අනුමත කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවන අතර, එය වර්තමාන අවශ්‍යතාවයන්ට ගැළපෙන ලෙස විශ්ලේෂණය කොට සංශෝධනයකර නොතිබුණි. තනතුරු 04ක් සඳහා 2025 මැයි 08 දින වන විටත් අනුමත කළ බඳවාගැනීමේ පටිපාටියක් නොතිබුණි.

## ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

**ඉලක්ක කළ පරිදි මධ්‍යස්ථාන ඉදි නොකිරීම**

අනුරාධපුර, කැකිරාව විශෝධන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා වර්ෂය තුළදී රු.මිලියනයක් ඇස්තමේන්තුකර තිබුණ ද, වර්ෂය තුළදී රු.මිලියන 0.064ක් වැයකර අදාළ ඉඩමෙහි මැනුම් කටයුතු පමණක් සිදුකර තිබුණි.

තවද, පුත්තලම අධිකරණයේ ප්‍රජා විශෝධන කාර්යාල නව ගොඩනැගිල්ලේ ඉදිකරනු ලබන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සඳහා දෙපාර්තමේන්තුවේ 2010 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ අධිකරණ අමාත්‍යාංශය විසින් රු.මිලියනයක් වියදම් කර තිබුණ ද, එහි ඉදිකිරීම් කටයුතු අවසන්කර නොතිබුණු බව නිරීක්ෂණය විය. එසේම පුත්තලම අධිකරණයේ පැවති ප්‍රජා විශෝධන කාර්යාලය 2022 ජුනි මාසයේ හදිසියේ ඇති වූ ගින්නකින් විනාශව තිබූ අතර, කාර්යාලයේ තිබූ පරිගණක යන්ත්‍රය හා එහි සියලු කොටස්, ඡායා පිටපත් යන්ත්‍රය, ඇඟිළි සළකුණු යන්ත්‍රය හා අනෙකුත් කාර්යාල උපකරණ සම්පූර්ණයෙන් විනාශ වී ගොස් තිබුණ ද, දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂයේදී ද, ඒ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු ආරම්භකර නොතිබුණු අතර, විනාශ වූ ස්ථානය වෙනුවට වෙනත් තාවකාලික ස්ථානයක් සොයාගැනීමට හෝ අඩක් ඉදිකරන ලද ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු අවසන්කර ගැනීමට කටයුතුකර නොතිබුණි.

**දණ්ඩන මුදල් අයකර නොගැනීම**

ප්‍රජා විශෝධන නිලධාරියෙකු 2019 ඔක්තෝබර් 01 දින සිට 2023 අගෝස්තු 14 දින දක්වා විදේශ රැකියාවක් සඳහා නිවාඩු ලබා තිබූ අතර, මෙම නිලධාරියාගේ නිවාඩු කාලය අවසන් වී තිබුණ ද, 2023 අගෝස්තු 15 දින සේවයට වාර්තාකර නොතිබුණි. මෙම නිලධාරියාට එදින සිට සේවය අතහැර යාමේ නිවේදනය 2024 ජුනි 04 දින නිකුත්කර තිබුණ ද, ගිවිසුම් ප්‍රකාරව ඔහුගෙන් අයකරගත යුතු වූ රු.මිලියන 1.11ක දණ්ඩන මුදල අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

## ආණ්ඩුවේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුව

**රස පරීක්ෂක වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය**

2024 වර්ෂය ආරම්භයේදී දෙපාර්තමේන්තුවේ අධිකරණ විද්‍යා අංශයට හා ආහාර විද්‍යා අංශයට පරීක්ෂණයට භාජනය කර විශ්ලේෂණ වාර්තා නිකුත්කිරීම සඳහා පිළිවෙළින් නඩු භාණ්ඩ 16,237ක් සහ 1,585ක් තිබුණු අතර, වර්ෂය තුළදී පිළිවෙළින් නඩුභාණ්ඩ 44,172ක් සහ 20,352ක් ලැබී තිබුණි. මින් වර්ෂය තුළදී අධිකරණ විද්‍යා අංශය විසින් නඩුභාණ්ඩ 33,446ක් ද, ආහාර විද්‍යා අංශය විසින් නඩු භාණ්ඩ 18,680ක් ද, විශ්ලේෂණය කර වාර්තා ඉදිරිපත්කර තිබුණි. මේ අනුව වර්ෂය අවසානයට අධිකරණ විද්‍යා

අංශයට හා ආහාර විද්‍යා අංශයට පිළිවෙළින් නඩුභාණ්ඩ 26,963ක් සහ 3,257ක්, එනම් සියයට 45ක් සහ සියයට 15ක් විශ්ලේෂණයකර වාර්තා ඉදිරිපත් කිරීමට ඉතිරි වී තිබුණි. තවද, විශ්ලේෂණයකර වාර්තා ඉදිරිපත් කිරීමට තිබූ නඩුභාණ්ඩ 30,220න් නඩුභාණ්ඩ 4,028ක් එනම් සියයට 13ක් 2017-2023 කාලපරිච්ඡේදයට අදාළව පැවතුණි.

**දත්ත ගබඩා කිරීම**

2016 වර්ෂයේදී KOICA ප්‍රදානයක් ලෙස දෙපාර්තමේන්තුවට ලැබී තිබූ IBM Storwize V3700 වර්ගයේ උපකරණය තුළ 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ඩිජිටල් අපරාධ විශ්ලේෂණ විද්‍යාගාරය මගින් නිකුත්කර ඇති පරීක්ෂණ වාර්තාවලට අදාළ දත්ත ගබඩාකර තිබුණි. මෙම උපකරණය සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසයේදී ක්‍රියා විරහිත වී තිබූ අතර, මේ හේතුවෙන් මෙම Storage Server උපකරණය තුළ ගබඩාකර තිබූ දත්ත නැවත ලබාගැනීමට නොහැකි තත්ත්වයක් මතුවී ඇති අතර, එම උපකරණය වර්ෂය තුළදී නැවත අලුත්වැඩියාකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

විවිධ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් හරහා අධිකරණ නිලධාරින්ගේ වෘත්තීමය විශේෂතාව සහ යුක්තියේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම පිණිස ඉහළ මට්ටමේ දැනුමක් සහ කුසලතාවයක් අධිකරණ නිලධාරින්ට ලබාදීම හරහා ආයතනයේ දැක්ම සාක්ෂාත්කර ගැනීම මෙහෙවර වේ.

**නීති දත්ත ගබඩා පද්ධතිය**

රු.මිලියන 3.52ක් වටිනාකමකින් යුත් නීති දත්ත ගබඩා පද්ධතිය 2017 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

## අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

**වන්දි ප්‍රදානය සඳහා යෝජනා ක්‍රමයක් නොමැතිවීම**

අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අරමුදලෙන් වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස්කර එය පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම කළ යුතු වුව ද, අධිකාරිය පිහිටුවා වර්ෂ 8ක් ගත වුව ද, ඒ අනුව කටයුතුකර නොතිබුණි. මේ නිසා අධිකාරිය විසින් ආදායම් රැස්කිරීම කළ ද, වන්දි ගෙවීමට නිසියාකාර ක්‍රමවේදයක් සකස්කර නොතිබීම නිසා වන්දි ගෙවීම සැලකිය යුතු ලෙස අඩුවී තිබුණි.

## 1. සෞඛ්‍යය අමාත්‍යාංශය

ශ්‍රී ලාංකීය ජනතාව වෙත සලසා දිය හැකි සහ ඔවුනට ප්‍රවේශ විය හැකි උසස් තත්ත්වයේ ප්‍රවර්ධනාත්මක, රෝග නිවාරක, රෝග සුවකාරක හා පුනරුත්ථාපනීය සේවා හරහා සාක්ෂාත් කර ගත හැකි ඉහළම සුවතා මට්ටම ළඟා කර ගනිමින් ශ්‍රී ලංකාවේ සමාජ හා ආර්ථික සංවර්ධනයට දායක වීම මෙහෙවර කරගත් සමස්ත ශ්‍රී ලාංකීක සෞඛ්‍ය පද්ධතියම පාලනය කිරීම සඳහා වගකිව යුතු රාජ්‍ය ආයතනයක් ලෙස මහජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂා කිරීම සඳහා තීරණාත්මක කාර්යය භාරයන් සෞඛ්‍ය අමාත්‍යාංශය ඉටුකල යුතුව පැවතුණි.

2024 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට රු.මිලියන 433,085ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එයින් රු.මිලියන 364,523ක් පමණක් උපයෝජනය කර තිබුණි.ඒ අනුව රු.මිලියන 68.56ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

### විගණන නිරීක්ෂණ

**පනත සංශෝධනය නොකිරීම**

1952 අංක 12 දරන සෞඛ්‍ය පනත වර්තමාන වෙනස්කම්වලට ගැලපෙන ආකාරයට සංශෝධනය කිරීමට වගකිව යුතු පාර්ශවයන් කටයුතු කර නොතිබුණි. 1987 අංක 42 දරන පළාත් සභා පනත සම්මත කිරීමත් සමඟ මෙම පනත සංශෝධනය කළ යුතුව තිබුණද 2024 වර්ෂය දක්වා ඒ සඳහා කටයුතු කර නොතිබුණි

**ජාතික සෞඛ්‍ය සභාව**

ජාතික සෞඛ්‍ය සභාව 2006 වර්ෂයෙන් පසුව රැස්වී නොතිබුණි.

**රෝහල් මණ්ඩල හා රෝහල් කමිටු පත් නොකිරීම හා කමිටු වාර්තා ඉදිරිපත් නොකිරීම**

විෂය භාර අමාත්‍යවරයා විසින් රෝහල් මණ්ඩල (Hospital Board) හා රෝහල් කමිටු (Hospital Committees) පත්කළ යුතු අතර එම රෝහල් මණ්ඩල හා රෝහල් කමිටු අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කළ යුතු වුවත්, පනතේ විධිවිධාන අනුව රෝහල් මණ්ඩල හා කමිටු පත්කිරීමක් සිදුකර නොතිබුණි. අමාත්‍යාංශය විසින් රෝහල් මණ්ඩල කිසිදු රෝහලකට අදාළව පත්කර නොමැති බවත් රෝහල් 37ක් සඳහා පමණක් රෝහල් කමිටු පත්කර ඇති බවත් නිරීක්ෂණය විය. නමුත් මෙම කමිටු සංයුතිය හා කමිටු සභාපති පත්කිරීම පනතේ විධිවිධාන වලට අනුව සිදුකළ බවක් විගණනයට තහවුරු නොවුණි. එසේම මෙම කිසිදු රෝහල් කමිටුවක් රජයේ ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි.

තවද, 10(5) වගන්තිය අනුව රෝහල් කමිටු රැස්වීම් වාර්තාවල පිටපත් හා පනතේ 14 වගන්තිය අනුව වාර්ෂික වාර්තා අමාත්‍යාංශය වෙත ලබාදිය යුතු වුවද රෝහල් කමිටු පත්කරන ලද රෝහල් 37 කින් රෝහල් 8ක් පමණක් කමිටු වාර්ෂික වාර්තා ඉදිරිපත් කර තිබුණු අතර කිසිදු රෝහලක් විසින් කමිටු රැස්වීම් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

**ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා නොකිරීම**

2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, සියලුම රජයේ ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මගින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීමට පියවර ගත යුතු වේ. තවද, 2017 මැයි 12 දිනැති අංක DMS/0016 දරන භාණ්ඩාගාර ලේකම් විසින් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත නිකුත් කර තිබුණු ලිපිය ප්‍රකාරව, සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කළ හැකි පරිදි ඇඟිලි සලකුණු යන්ත්‍ර 2017 ජූලි 01 දින සිට ක්‍රියාත්මක නොකරන්නේ නම් වර්තමාන වැටුපට අනුව අතිකාල දීමනා නොගෙවීමට වග බලා ගත යුතු විය. නමුත් අමාත්‍යාංශය විසින් අමාත්‍යාංශයට, එයට අයත් රෝහල් හා ආයතන සඳහා රු.මිලියන 31.08ක් වැය කර ස්ථාපිත කර තිබුණු ඇඟිලි සලකුණු යන්ත්ර 213ක් භාවිතයට නොගෙන නිෂ්ක්‍රීයව පැවති අතර වර්තමාන වැටුප පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදීද වැටුප් සඳහා රු.මිලියන 45,333ක් ද අතිකාල හා නිවාඩු දින වැටුප් සඳහා රු.මිලියන 39,717.63ක් ද වශයෙන් මුළු මුදල රු.මිලියන 85,050.63ක් ගෙවා තිබුණි.

**සේවය හැරයාම් සහ බැඳුම්කර අය නොවීම්**

වර්තමානය වන විට සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ පශ්චාත් උපාධි පාඨමාලාවට අදාළ පුහුණුව සඳහා විදේශ ගත වන, විදේශ රැකියා සඳහා මෙන්ම අනෙකුත් හේතුන් මත විදේශගත වන වෛද්‍යවරුන් සේවයෙන් ඉවත්වයාමේ හා සේවය අතහැරයාමේ සැලකිය යුතු වර්ධනයක් සහ ඒ හේතුවෙන් මෙම වෛද්‍යවරුන්ගෙන් රජයට අයවිය යුතු මුදල් ඉහළ යාමේ ප්‍රවනතාවයක් නිරීක්ෂණය විය.

එසේ වුවද, අභ්‍යන්තර පාලන පද්ධතීන්වල පවත්නා දුර්වලතා හේතුවෙන් මෙම වෛද්‍යවරුන්ගෙන් අයවිය යුතු මුදල් කාලීනව අය නොවීමේ සහ අයකරගැනීම කල්ගත කර තිබීම තුළ අයකරගැනීමේ

හැකියාව අවදානමකට ලක්වී තිබුණු බව අනාවරණය විය. ගිවිසුම්වලට එළඹ සිටියද, එම ගිවිසුම් කඩකළ වෛද්‍යවරුන් 705 ක ගෙන් රු.මිලියන 1,156.56ක්ද, විගණනයට පෞද්ගලික ලිපිගොනු ඉදිරිපත් නොකළ වෛද්‍ය නිලධාරීන් 116කගෙන් රු.මිලියන 119.40ක් හා සේවය හැරගොස් තිබුණු එහෙත් රජය සමඟ ගිවිසුම් බැඳුම්කර නොමැති වෛද්‍ය නිලධාරීන් 05 ක් වෙත වැඩිපුර ගෙවන ලද වැටුප් හා දීමනා සහ අයවීමට ඇති ණය ශේෂ ලෙස රු.මිලියන 1.04ක් අය කර ගැනීමට වගකිවයුතු නිලධාරීන් කාර්යක්ෂමතාවයකින් හා වගකීමකින් කටයුතු කර නොමැති බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

## සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

**අවශ්‍යතාවයට අඩුවෙන් ත්‍රිපෝෂ බෙදා හැරීම**

ශ්‍රී ලංකාවේ මන්දපෝෂණය තුරන් කර නිරෝගී ජාතියක් ගොඩනැගීමේ අරමුණින් පෝෂණය අවශ්‍ය සියලු ගැබිණි සහ කිරිදෙන මව්වරුන් ඇතුළු අපේක්ෂිත ප්‍රතිලාභීන්ට ත්‍රිපෝෂ නිෂ්පාදනය කර නොමිලේ බෙදාහැරීම ත්‍රිපෝෂ සමාගමේ ප්‍රධාන කාර්යභාරය ලෙස දක්වා ඇති අතර ඒ අනුව ඉලක්කගත ප්‍රතිලාභීන්ට අතිරේක ආහාර වේලක් ලෙස ත්‍රිපෝෂ සැපයීම පිළිබඳ පරීක්ෂාවේදී ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල (RDHS) ඇතුළු රෝහල් හා ආයතන 39ක් සඳහා සමාලෝචිත වර්ෂයේ ත්‍රිපෝෂ අවශ්‍යතාවය මාස්ටර් බෑග් 493,905ක්ව පැවති අතර වර්ෂයේදී බෙදාහරින ලද මාස්ටර් බෑග් ප්‍රමාණය 274,198 ක් වූ අතර එය අවශ්‍යතාවයෙන් සියයට 55.51ක අඩු අගයක් වී තිබුණි.

## පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව

**පෞද්ගලික සෞඛ්‍ය ආයතන නියාමනය**

රට තුළ ක්‍රියාත්මක පෞද්ගලික සෞඛ්‍ය සේවාවන් සපයන සමස්ථ ආයතන පද්ධතියෙන් මහජනතාවට සාධාරණ, වගකීම් සහිත, දැරිය හැකි අයකිරීම් යටතේ ආරක්ෂිත, කාර්යක්ෂම සෞඛ්‍ය සේවාවක් සපයන බවට සහතික විය හැකි ආකාරයේ නියාමනයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තීරණ ගත හැකි ආකාරයේ පාලක මණ්ඩල සංයුතියක් සහිතව නව පාර්ලිමේන්තු පනතක් සම්මත කර ක්‍රියාත්මක කිරීම හෝ 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත මඟින් පිහිටුවා ඇති පෞද්ගලික සෞඛ්‍ය

සේවා නියාමන සභාවේ සංයුතිය පෞද්ගලික සෞඛ්‍ය ආයතන නියාමනය සඳහා තීරණ ගැනීමේ රාජ්‍ය අංශයේ හැකියාව වැඩි වන ආකාරයට සංශෝධනය කිරීමට, ශ්‍රී ලංකාවේ පෞද්ගලික සෞඛ්‍ය සේවාව නියාමනය කිරීමේ ක්‍රියාවලියේ කාර්යසාධනය ඇගයීම සම්බන්ධයෙන් 2024 ජූලි 10 දින නිකුත් කරන ලද විශේෂ විගණන වාර්තාව මගින් නිර්දේශ කර තිබුණද ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොමැති බව නිරීක්ෂණය විය.

**පෞද්ගලික වෛද්‍ය ආයතන ශ්‍රේණිගත කිරීම**

2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 10(ඇ) වගන්තිය ප්‍රකාරව පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් සලසනු ලබන පහසුකම්වලට අනුව ඒවා වර්ග කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ දක්වා ඇත. නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විටත් පෞද්ගලික වෛද්‍ය ආයතන ශ්‍රේණිගත කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණු අතර මේ හේතුවෙන් ගාස්තු නියාමනය කිරීමේ කටයුතුද ක්‍රියාත්මක වී නොතිබුණි.

### සුවසැරිය පදනම

**රීති සාදා දීම**

2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම පනතේ 18 (5) සහ 25 (1) උප වගන්ති ප්‍රකාරව මණ්ඩලය විසින් අරමුදලින් මුදල් ගෙවීම සම්බන්ධයෙන් රීති සකස්කළ යුතු අතර 25(1) උප වගන්තියේ සඳහන් කරුණු සම්බන්ධයෙන්ද රීති සකස් කරනු ලැබිය හැකිය. එසේ පදනම විසින් සාදනු ලබන සෑම රීතියක්ම අමාත්‍යවරයා විසින් අනුමත කර ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 2. වෛද්‍ය සැපයීම්

සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් අංශය (MSD) දිවයින පුරා පිහිටි රජයේ සෞඛ්‍ය සේවා ආයතන සඳහා සියලුම ඖෂධ, ශල්‍ය උපකරණ, රසායනාගාර උපකරණ, විකිරණශීලී ද්‍රව්‍ය සහ මුද්‍රිත ආකෘති පත්‍ර සැපයීම සඳහා වගකිව යුතු මධ්‍යම සංවිධානය වේ. පෞද්ගලික රෝහල් ඇතුළුව රටේ සියලුම රෝහල් සඳහා අන්තරායකර ඖෂධ සපයන එකම සැපයුම්කරු වෛද්‍ය සැපයීම් අංශය වේ. වෛද්‍ය සැපයීම් කාර්යභාරය ඉටු කිරීමේදී ජාතික ඖෂධ නියාමන අධිකාරිය ඖෂධ තත්ත්ව පාලනය හා නියාමනයෙන්ද, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ඖෂධ ආනයනය හා දේශීය මිලදී ගැනීම් මගින්ද, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ඖෂධ නිෂ්පාදනයෙන්ද වෛද්‍ය සැපයීම් අංශයට සහාය වේ.

**වෛද්‍ය සැපයීම් අංශය ඖෂධ තොග ලැබීම සටහන් නොකිරීම හා භාවිතයට නොගැනීම**

ලෝක බැංකුවේ ණය ආධාර යටතේ ක්‍රියාත්මක කරන ලද කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන මත එක්සත් ජාතීන්ගේ ව්‍යාපෘති සේවා කාර්යාලය (UNOPS) හරහා 2023 වර්ෂයේ රුධිරගත සීනි මට්ටම මනින ශල්‍ය අයිතමයේ ඒකක මිලියන 5ක් ඇණවුම් කර තිබුණි. එයින් රු.මිලියන 109.5ක් වටිනා ඒකක මිලියන 2.5ක් වෛද්‍ය සැපයීම් අංශය වෙත ලැබී තිබුණු නමුත් එයට අදාළ ලේඛන නොලැබුණු බව සඳහන් කරමින් අවු.01 මාස 09කට ආසන්න කාලයක් එම භාණ්ඩ ලැබීම් සටහන් කර නොතිබුණු අතර රෝහල්වලටද බෙදා හැර නොතිබීම හේතුවෙන් 2024 ඔක්තෝබර් සහ 2025 ජනවාරි 31 දින වන විට වෛද්‍ය සැපයීම් අංශ ගබඩා තුළදීම කල් ඉකුත් වී තිබුණි. UNOPS ආයතනය හරහා ලබා දෙන වෛද්‍ය සැපයීම් සම්බන්ධීකරණය සඳහා වෛද්‍ය සැපයීම් අංශය තුළ ව්‍යාපෘති සම්බන්ධීකාරකවරයකුද පත්කර තිබියදීත්, නිලධාරීන්ගේ නොසැලකිලිමත්කම හේතුවෙන් මෙම කල් ඉකුත් වීම සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය. තවද, වෛද්‍ය සැපයීම් අංශය තුළ ඒකක මිලියන 2.5ක තොග පැවතියදී එම තොගය රෝහල් වෙත නිකුත් නොකිරීම නිසා 2023 වර්ෂය තුළදීද රෝහල් විසින් රු.මිලියන 52ක දේශීය මිලදී ගැනීම් සිදුකර තිබුණි. තවද, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා ඊට පෙර ඒකකයක් රු.11 බැගින් මිලදී ගන්නා ලද මෙම අයිතම UNOPS ආයතනය හරහා ඒකකයක් රු.43 බැගින්ද දේශීය මිලදී ගැනීම් යටතේ රෝහල් විසින් ඒකකයක් රු. 83ත් රු.112ත් අතර ඉහළ මිල ගණන්වලටද මිලදී ගෙන ඇති බවද නිරීක්ෂණය විය. ඒ අනුව කල් ඉකුත් වූ Blood Glucose Strips ඒකක මිලියන 2.5ක් සඳහා පිරිවැය හා නිෂ්කාශන ගාස්තුද එම තොග රෝහල්වලට බෙදා නොහැරීම මත දේශීය මිලදී ගැනීම් සඳහා යොමු වීමේ අතිරේඛ පිරිවැයද හේතුවෙන් රජයට රු.මිලියන 198කට අධික පාඩුවක් සිදු වී තිබුණි.

**ඖෂධ, ශල්‍ය හා රසායනාගාර ද්‍රව්‍ය තත්ත්වයෙන් අසමත්වීම්**

රජයේ රෝහල් සඳහා නිකුත් කළ වෛද්‍ය සැපයීම් අතරින් රු.මිලියන 4,213ක් වටිනා ඖෂධ, ශල්‍ය හා රසායනාගාර ද්‍රව්‍ය තත්ත්වයෙන් අසමත්වීම මත 2024 වර්ෂයේදී භාවිතයෙන් ඉවත් කර තිබුණු අතර තවත් රු.මිලියන 1,367.9ක් වටිනා ඖෂධ තත්ත්වයෙන් අසමත් වීම මත තාවකාලිකව භාවිතය අත්හිටුවා තිබුණි.

තත්ත්වයෙන් අසමත්වීමට හේතු වශයෙන් ඇතැම් ඖෂධවල දෘෂ්‍ය අංශු පැවතීම, බ්‍රිතාන්‍ය හා එක්සත් ජනපද ඖෂධවේදී පිරිවිතරයන්ට අනුකූල නොවීම, ලේබල් කිරීමේ මාර්ගෝපදේශයන්ට අනුකූල නොවීම, වර්ණය වෙනස් වීම, පෙති කැඩීයාම, වීදුරු කැබලි පැවතීම, අහිතකර ප්‍රතික්‍රියාවන් ඇතිවීම ආදී කරුණු හඳුනාගෙන තිබුණු අතර එලෙස තත්ත්වයෙන් අසමත්ව භාවිතයෙන් ඉවත් කළ වෛද්‍ය සැපයීම් අතර බැක්ටීරියා ආසාදන, සමේ රෝග, මානසික රෝග, දියවැඩියා, අක්මා රෝග සඳහා භාවිතා කරන ඖෂධ හා ප්‍රතිජීවක ඖෂධ තිබුණි.

**ඖෂධවල තත්ත්වය පරීක්ෂා නොකිරීම හා රෝගීන්ට හානි සිදුවීම**

වෛද්‍ය සැපයීම් අංශය විසින් රෝහල් වෙත ඖෂධ නිකුත් කිරීමට පෙර ඇතැම් ඖෂධවල තත්ත්වය පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොමැති වීම හේතුවෙන් 2023 වර්ෂයේදී අක්ෂි රෝගීන් සඳහා භාවිතා කරන ලද Prednisolone Acetate Eye Drop ඖෂධය තත්ත්වයෙන් අසමත් වී කොළඹ ජාතික අක්ෂි රෝහලේ හා නුවරඑළිය දිස්ත්‍රික් රෝහලේ රෝගීන් කිහිපදෙනෙකු අක්ෂි ආසාත්මිකතාවයන්ට ලක්වී තිබුණ අතර, නුවරඑළිය රෝහලේ රෝගීන් 17 දෙනෙකුගෙන් 12 දෙනෙකු ස්ථිරවම එක් ඇසක පෙනීම අහිමි වී තිබුණු බවත් තවත් රෝගීන් තිදෙනෙකුගේ සියයට 70කට වඩා පෙනීම අහිමි වී ඇති බවත් අනාවරණය විය. සිදුවීමෙන් වර්ෂ 02 කට පසු 2025 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයක් මත ඉහත රෝගීන් 17 දෙනාට කරුණා සහගත දීමනාවක් ලෙස රු.මිලියන 14.7ක් ගෙවා ඇති නමුත් එම ඖෂධය භාවිතයෙන් අගතියට පත් වූ අනෙකුත් රෝහල්වල රෝගීන් සම්බන්ධව විමර්ශන සිදුකර, අදාළ රෝගීන්ට වන්දි ලබා දීමට කටයුතු කර නොතිබුණි. තවද, අදාළ ඖෂධය සැපයූ සමාගමෙන් වන්දි ලබා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණු අතර තත්ත්වයෙන් අසමත් ඖෂධ සපයන සමාගම්වලින් වන්දි ලබා ගැනීමට අදාළ ප්‍රතිපාදන ප්‍රසම්පාදන ලියවිලිවලට ඇතුළත් කිරීමට හා මෙවැනි සැපයුම්කරුවන් අසාධු ලේඛනගත කිරීමට අදාළ ක්‍රියාමාර්ගයන් ගැනීමට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව කටයුතු කර නොතිබුණි.

**කල් ඉකුත්වීම් හා අසමත්වීම් පිරිවැය අය නොකිරීම**

වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂ විසින් 2023 ඔක්තෝබර් 09 හා 18 දිනවල නිකුත් කරන ලද අංක MSD/Q/P/2023/56 හා MSD/Q/Special/2023/4 දරන චක්‍රලේඛ මඟින් Human Immunoglobulin හා Rituximab යන ඖෂධ තත්ත්වයෙන් අසමත් වීම මත භාවිතයෙන් ඉවත් කර තිබුණද 2023 ජනවාරි 13 සැපයුම්කරු වෙත නිකුත් කරන ලද අංක ICL/EOI/P1/174/2022 දරන ගැණුම් ඇණවුමේ 9 ඡේදය ප්‍රකාරව රු.මිලියන 180ක් වූ අදාළ ඖෂධවල පිරිවැය හා සියයට 25ක් වූ පරිපාලන වියදම් අදාළ සමාගමෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයීම් අපහරණය කිරීමේ ක්‍රියාවලියේ පවතින අඩුපාඩු**

තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයීම් අපහරණය කිරීම වෙනුවෙන් මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි වූ හා මීට පෙර මිල ගණන් ඉදිරිපත් කළ ආයතනවලින් වෛද්‍ය සැපයීම් අංශය විසින් 2022 වර්ෂයේදී මිල ගණන් කැඳවීමක් සිදුකර තිබුණි. ඒ අනුව අවම මිල ඉදිරිපත් කළ ලංසුකරු කිලෝග්‍රෑමයකට රු.99.84 බැගින් ඉල්ලා තිබුණද, මිල ගණන් ඉදිරිපත් කළ වෙනත් සමාගමක් විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළ ලිපියකට අනුව 2018 ජූනි 26 දින සිට වසර 10ක් දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශය, එම පුද්ගලික සමාගම සහ මධ්‍යම පරිසර අධිකාරිය අතර ත්‍රෛපාර්ශවීය ගිවිසුමක් ක්‍රියාත්මක වන බව සඳහන් කර තිබුණි. ඒ අනුව අවම ලංසුව වූ රු.99.84 වෙනුවට ත්‍රෛපාර්ශවීය ගිවිසුමේ ගිවිසුම්ගත වටිනාකම වූ කිලෝග්‍රෑමයකට රු.260 බැගින් ගෙවීමට එකඟ වී තිබුණි. ඒ අනුව 2022 නොවැම්බර් 01 දින සිට අපහරණ කටයුතු එම පුද්ගලික සමාගම වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. ත්‍රෛපාර්ශවීය ගිවිසුමේ විෂය පථය විධිමත්ව පරීක්ෂා කිරීමකින් තොරව අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළද, බස්නාහිර, මධ්‍යම හා දකුණ යන පළාත්වලින් බැහැර අනෙකුත් පළාත් අදාළ ගිවිසුමෙන් ආවරණය නොවන බව පසුව අනාවරණය වී තිබුණි. ඒ අනුව අනෙකුත් පළාත් සඳහා ලංසු කැඳවීමකින් තොරව තාක්ෂණික ඇගයීම් කමිටු හා ප්‍රසම්පාදන කමිටු අනුමැතීන් ලබා දී 2023 හා 2024 වර්ෂවල රු.මිලියන 123ක් ගෙවා තිබුණි. ත්‍රෛපාර්ශවීය ගිවිසුම මඟින් සියලුම පළාත්වල රෝහල්වලින් එකතුවන සයිටොටොක්සික් (Cytotoxic)

අපද්‍රව්‍ය ආවරණය කරන නමුත් ඊට පටහැනිව සයිටොටොක්සික් හෝ සයිටොටොක්සික් නොවන ලෙස වර්ග කිරීමක් සිදුනොකර බස්නාහිර, දකුණ සහ මධ්‍යම පළාත්වල හැර අනෙකුත් පළාත්වල කල් ඉකුත් වූ සායනික අපද්‍රව්‍ය අපහරණ කටයුතුද අවස්ථා 33කදී වෛද්‍ය සැපයීම් අංශය විසින් මෙම පුද්ගලික සමාගම වෙත පවරා කිලෝග්‍රෑම් 208,520ක් අපහරණය කිරීම සඳහා රු.මිලියන 62.4ක ගෙවීම් සිදුකර තිබුණි.

**සෞඛ්‍ය අංශ හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු**

විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ලබාදී තිබුණු රු.මිලියන 100ක ප්‍රදානය උපයෝජනය කරගෙන පිළිකා රෝගීන් සඳහා අත්‍යාවශ්‍ය ඖෂධ අයිතම 15ක් මිලදී ගැනීම සඳහා දින 02කට අඩු කාලයක් තුළ හදිසි මිල කැඳවීමක් සිදුකර තිබුණි. එහෙත් ඖෂධ තොග ලැබීමට දින 80ත් 191ත් අතර කාලයක් ගතකර තිබීමෙන් “හදිසි අවශ්‍යතාවය” යන්න සැපයුම්කරුවන්ට මිල ඉදිරිපත් කිරීම සඳහා පමණක්ම අදාළ වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

**ගුදම් ගාස්තු ගෙවීමට සිදුවීම**

ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන ශක්තිමත් කරමින් කාර්යක්ෂම එන්නත් කළමනාකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට 2024 වර්ෂයේදී ශීත ලොරි රථ 10ක් හා කැබ් රථ 21ක් එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල වෙතින් වසංගත රෝග විද්‍යා අංශයට ලබා දී තිබුණි. මෙම රථ නිෂ්කාශන කටයුතුවලට මාස තුනකට ආසන්න කාලයක් ගතවීම මත ලොරි රථ 10 සඳහා රු.මිලියන 66ක් වූ රේගු හා නිෂ්කාශන ගාස්තුවලට අමතරව රු.මිලියන 36ක ගුදම් ගාස්තුවක් ගෙවීමට සිදුව තිබුණු අතර නිෂ්කාශනයෙන් පසුව ලියාපදිංචිය සිදු කරන තෙක් 2024 ජූනි 28 දින සිට මාස 08කට ආසන්න කාලයක් වෛද්‍ය සැපයීම් අංශ ගබඩා පරිශ්‍රයේ රථ වාහන අංගනය තුළ කිසිදු ප්‍රයෝජනයක් නොමැතිව ගාල්කර තිබුණි.

**පරිත්‍යාග නිසිලෙස සම්බන්ධීකරණය නොකිරීම**

2024 වර්ෂයේදී විදේශීය ආයතනවලින් වෛද්‍ය සැපයීම් අංශයට ලද පරිත්‍යාග වරායෙන් නිෂ්කාශනය කිරීම සඳහා අවස්ථා 38කදී රු.මිලියන 321.4කට අධික ප්‍රමාද ගාස්තු හා ගුදම් ගාස්තු ගෙවා ඇති බවත්, ඉන් අවස්ථා 07කදී ශීත බහාලුම් සඳහා විදුලි පිරිවැය රු.මිලියන 65.3ක්ද ඇතුළුව රු.මිලියන 115.5ක් ප්‍රමාද ගාස්තු හා ගුදම් ගාස්තු ලෙස ගෙවා තිබුණු බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

**රු.මිලියන 7.6ක තැන්පතු ආපසු අයකර නොගැනීම**

මේ වන විට අහෝසි කර ඇති ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය පවත්වාගෙන ගිය HQ Colombo ගොඩනැගිල්ලේ පළමු මහලෙහි Rare wing කොටස සහ පස්වන මහල බදු කුලී පදනම මත ලබාගැනීමේ දී ආරක්ෂිත තැන්පතු හා විදුලිය තැන්පතු ලෙස අදාළ පුද්ගලික සමාගමට ගෙවා තිබුණු රු.මිලියන 7.6ක මුදල 2025 ජුනි 30 දිනට ගිවිසුම්ගත කාලය අවසන් වී මාස 20ක කාලයක් ගත වී ඇතත් මෙතෙක් ආපසු අයකරගෙන නොතිබුණි.

## ජාතික ඖෂධ නියාමන අධිකාරිය

**ඖෂධ දත්ත පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රමාදය**

ඖෂධ දත්ත පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමේ (Revamping the Medicine Database) කොන්ත්‍රාත්තුව 2020 නොවැම්බර් 11 දින රු.මිලියන 6.9කට පෞද්ගලික ආයතනයක් වෙත ප්‍රදානය කර තිබුණ ද, විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණු අතර වැඩ අවසන් කිරීම පිළිබඳ සහතිකයක් ලබා ගැනීමෙන් තොරව 2021 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 4.7ක් ගෙවා තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පද්ධතිය නිෂ්කාර්යව පැවතුණි.

**ඇතැම් තොරතුරු මකා දැමීම**

අධිකාරියේ දත්ත පද්ධතිය ස්වයංක්‍රීයකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 29කට වර්ෂ 05ක කාලයක් සඳහා පෞද්ගලික සමාගමක් වෙත ප්‍රදානය කර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 12.2ක් ගෙවා තිබුණි. නමුත් අදාළ පෞද්ගලික සමාගමේ නොසැලකිල්ලෙන් හෝ හිතාමතා මෙම දත්ත පද්ධතියට ඇතුළත් කර තිබුණු ඇතැම් තොරතුරු මකා දමා තිබුණු අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන කටයුතු අවසන් වන තෙක් මෙම සේවාව අක්‍රිය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පත්කළ විශේෂඥ කමිටුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව මගින් පද්ධතියෙන් මකා දමා තිබුණු දත්ත නැවත ස්ථාපනය කළ නොහැකි බව දන්වා තිබුණු අතර සිදු වූ පාඩුව අය කර ගැනීමට හෝ අදාළ සමාගමට විරුද්ධව ඉදිරි ක්‍රියාමාර්ගයන් ගැනීමට කටයුතු කර නොතිබුණි.

**විලවුන් වර්ග නියාමනය**

ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත බලාත්මක වීමත් සමඟ එතෙක් ශ්‍රී ලංකාව තුළ ඖෂධ, උපකරණ හා විලවුන් නියාමනය සම්බන්ධයෙන් බලාත්මකව පැවති 1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනත ඉවත් කර තිබුණද විලවුන් නියාමනයට අදාළ වගන්ති ජාතික ඖෂධ නියාමන පනතට ඇතුළත් කර නොතිබුණි. එබැවින් 2017 ඔක්තෝබර් 10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව යෝජිත නව විලවුන් පනත සම්මත කර ක්‍රියාත්මක කරන තෙක් පැවති විලවුන්, උපකරණ සහ ඖෂධ පනතේ විධිවිධාන භාවිතා කර විලවුන් නියාමනය සිදු කිරීමට ජාතික ඖෂධ නියාමන අධිකාරියට පවරා තිබුණි.

## රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

**අතිරේක ගබඩා ගාස්තු**

සංස්ථාව විසින් ප්‍රසම්පාදනය කර වෛද්‍ය සැපයුම් අංශයට සපයන ලද ඖෂධ හා ශල්‍ය අයිතම වෛද්‍ය සැපයුම් අංශයට යැවීමේදී එහි ගබඩා ප්‍රමාණවත් නොවීම මත තොග ආපසු හරවා එවීම හේතුවෙන් එම තොග සඳහා වූ අතිරේක ගබඩා පිරිවැය වශයෙන් රු.මිලියන 152.84ක් හා ප්‍රසම්පාදනයට අදාල ලිපිලේඛන වල පවත්නා අඩුපාඩු හෝ ලිපිලේඛන නොමැති වීම නිසා වෛද්‍ය සැපයුම් අංශය තොග භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් එම තොග බාහිර ගබඩාවල ගබඩා කිරීමේ පිරිවැය වශයෙන් රු.මිලියන 7.9ක් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ජුලි දක්වා සංස්ථාව විසින් වැයකර තිබුණි.

**ඖෂධ නිෂ්පාදන සංස්ථාව ලංසු ඉදිරිපත් නොකිරීම**

2023 හා 2024 වර්ෂවල රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිෂ්පාදිත ඖෂධ වර්ග ප්‍රසම්පාදනය සඳහා ලංසු ආරාධනා කළද, ඖෂධවල මිල වෙනස් වීම්වලදී ඒ සඳහා අනුගත නොවීම, නියමිත සැපයුම් කාල සීමාවන්වලදී ඖෂධ භාර නොගැනීම, ඇතැම් ඖෂධ තොග ගබඩා කර තබාගෙන කල් ඉකුත්වීමේ දිනය ළංවන විට ගුණත්ව සහතික හා ඖෂධවල ආයුකාලය වැඩිකර ගැනීමට ඉල්ලීම් සිදු කිරීම හා කල් ඉකුත් වන ඖෂධ වෙනුවෙන් නව තොගයක් ප්‍රතිස්ථාපනය කරන මෙන් ඉල්ලීම් සිදුකිරීම වැනි හේතූන් මත අදාළ ලංසු සඳහා ඖෂධ නිෂ්පාදන සංස්ථාව ලංසු ඉදිරිපත් නොකරන අවස්ථා පැවැති බව නිරීක්ෂණය විය. ඒ අනුව රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ මිල ගණන්වලට වඩා වැඩි මිල ගණන් යටතේ වෙනත් පාර්ශවයන්ගෙන් අදාළ ඖෂධ මිලදී

ගැනීමට සිදුවී තිබුණි. යථෝක්ත හේතුව නිසා 2023 වර්ෂයේ පමණක් ඇණවුම් 3ක් වෙනුවෙන් රු.මිලියන 159.75ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

**අසමත් හා නැති වූ තොග පිරිවැය**

වෛද්‍ය සැපයුම් අංශයට තත්ත්වයෙන් අසමත් හා හානි වූ ඖෂධ සපයා තිබීම වෙනුවෙන් දරන ලද පිරිවැය, පරිපාලන ගාස්තු හා එම තොග විනාශ කිරීමේ වියදම් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීම සඳහා 2024 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කර තිබුණු හරපත් වටිනාකම රු.මිලියන 5,573.64ක් වූ නමුත් එයින් රු.මිලියන 2,996.65ක් 2025 මාර්තු 31 දින වන විටත් අයකර ගැනීමට නොහැකිව තිබුණි. එම හරපත් අතර අසාදු ලේඛනගත සැපයුම්කරුවන්ගෙන් අයකර ගත යුතු රු.මිලියන 1,651.98ක්ද 2025 මාර්තු 31 දින වන විටත් අවසාන සිහි කැඳවීමේ ලිපි යොමු කර ඇති සැපයුම්කරුවන්ගෙන් අයකර ගත යුතු රු.මිලියන 279.45ක්ද පවතින බැවින් එම මුදල් අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

**එකම ගනුදෙනුවක් සඳහා දෙවතාවක් මුදල් ලබා ගැනීම**

Meropenem Injection 1 g හා 500mg එන්නත් කුප්පි 788,590 ක් ප්‍රසම්පාදනය සඳහා ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල විසින් 2022 සැප්තැම්බර් 19 දින රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත එ.ජ.ඩොලර් මිලියන 02ක් ලබා දී තිබිය දී ඖෂධ මිලදී ගැනීමෙන් පසුව රු.මිලියන 742.83ක් එම මිලදී ගැනීම වෙනුවෙන් වෛද්‍ය සැපයුම් අංශයෙන් අයකරගෙන තිබුණි. එමෙන්ම 2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මඟින් සෞඛ්‍ය සංවර්ධන අරමුදල හරහා සංස්ථාවට ප්‍රදානය කරන ලද එ.ජ.ඩොලර් 500,000ක් ඖෂධ අයිතම 18ක් මිලදී ගැනීම සඳහා භාවිතා කර එම ඖෂධ මිලදී ගැනීමෙන් පසුව හරපත් වෛද්‍ය සැපයුම් අංශය වෙත නිකුත් කිරීම තුළින් අතිරේකව රු.මිලියන 111.37ක මුදලක් ලබා ගෙන තිබුණි. තවද, පිළිකා රෝගීන් වෙනුවෙන් අවශ්‍ය ඖෂධ හා උපකරණ මිලදී ගැනීම සඳහා විදේශ සේවා නියුක්ති කාර්යංශය මඟින් ලබා දී තිබූ රු.මිලියන 100ක් භාවිතා කරමින් ඖෂධ අයිතම 15ක් ප්‍රසම්පාදනය කිරීමේදී ප්‍රසම්පාදනයට අදාලව රු.මිලියන 100ක් සංස්ථාවට ලබා දී තිබියදීත් නැවත වරක් රු.මිලියන 138.21ක හරපත් වෛද්‍ය සැපයුම් අංශය වෙත නිකුත් කර තිබුණි.

## රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

**යෝජිත ලෝටස් ෆාමා නව නිෂ්පාදනාගාර ව්‍යාපෘතිය**

යෝජිත ලෝටස් ෆාමා නව නිෂ්පාදනාගාරය තුළ රටේ මූලික ඖෂධ අවශ්‍යතාව ආවරණය කෙරෙන නිෂ්පාදන කර්මාන්ත ශාලා 05ක් පිහිටුවීමට සැලසුම් කර තිබුණු අතර වසර 03කට පසුව ඉන් ප්‍රථම අදියර ලෙස මුඛ මාර්ගයෙන් ලබා දෙන සාමාන්‍ය ඖෂධ නිපදවීම සඳහා වන කර්මාන්ත ශාලාවක් පිහිටුවීම වෙනුවෙන් එ.ජ.ඩොලර් මිලියන 13.1කට සමාන රු.මිලියන 4,349.2ක වියදමක් ඇස්තමේන්තු කර තිබුණි. අපේක්ෂිත නිෂ්පාදනාගාර 03ක් ඉදිකිරීමට රු.මිලියන 322.4 වැයකර අක්කර 65ක් මිලදීගෙන තිබුණි. අදාල ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබුණු අතර 2025 මැයි 27 දින වන විටත් ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි.

**තනතුරු පුරප්පාඩු**

සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු 08ක් අනුමත වී තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනට එයින් තනතුරු 4ක් පුරප්පාඩු වී තිබුණි.

**බද්ධ ව්‍යාපාරවලින් මිල විචලනයන් අය නොකිරීම**

සංස්ථාවේ වෙළඳ ණයගැති වෛද්‍ය සැපයීම් ගිණුම් තුළ ඇතුළත් 2018 වර්ෂයේ සිට 2024 දක්වා වෛද්‍ය සැපයීම් අංශයට සපයා ඇති බද්ධ ව්‍යාපාර ඖෂධ වලට අදාල ඉන්වොයිසි සඳහා ඖෂධ මිල විචලනයන් මත හා නියමිත කාල සීමාවට ඖෂධ නොසැපයීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස වෛද්‍ය සැපයීම් අංශය විසින් සංස්ථාවෙන් අය කරන ලද රු.මිලියන 1,106.42ක මුදල බද්ධ ව්‍යාපාරවලින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**ඖෂධ ලියාපදිංචිය අළුත් කිරීමේ ප්‍රමාදයන්**

2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත 64(1) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචිය අළුත්කළ යුතු ඖෂධ 08කට අදාල ලියකියවිලි ඖෂධ නියාමන අධිකාරියට නිසි කාලසීමාව තුල ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ඖෂධ සඳහා ලියාපදිංචිය අළුත් කිරීමට දින 107ත් 219ත් අතර පරාසයක කාල සීමාවක් ප්‍රමාද වී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් Flucloxacillin Capsule BP 500 mg හා Mebendazole Tab USP 100 mg යන ඖෂධවල ලියාපදිංචි සහතික පිළිවෙලින් 2024 දෙසැම්බර් 16 හා 17 දින කල් ඉකුත් වී තිබීමත් සංස්ථාව විසින් නියමිත දිනවලට එම සහතික නැවත අළුත් කර ගැනීමට කටයුතු නොකිරීමත් පිළිවෙලින්

2025 ජනවාරි 29 හා පෙබරවාරි 01 දින නැවත ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ලියාපදිංචිය අළුත් කිරීමත් හේතුවෙන් වෛද්‍ය සැපයීම් අංශයෙන් ඉල්ලුම් කරන ලද අදාළ ඖෂධ ඇණවුම් වෙනුවෙන් ඖෂධ සැපයීමට සංස්ථාවට නොහැකි වී තිබුණි. ඒ අනුව 2024 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.මිලියන 26.18ක් වූ ඖෂධ සංස්ථාවේ වෛද්‍ය සැපයීම් අංශ ගබඩාව තුළ ඉතිරිව තිබුණි.

## ශ්‍රී ලංකාවේ පෞද්ගලික සෞඛ්‍ය සේවාව නියාමනය කිරීමේ ක්‍රියාවලියේ කාර්යසාධනය ඇගයීම පිළිබඳ කාර්යසාධන විගණන වාර්තාවේ ඇතුළත් වූ ප්‍රධාන විගණන නිරීක්ෂණ

**ප්‍රතීතන කටයුතු සම්බන්ධව නියෝග සකස් කර නීතියක් බවට පත් කර නොතිබීම**

2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 13(1) වන වගන්තිය අනුව සභාවේ උපදෙස් මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින්, පෞද්ගලික වෛද්‍ය ආයතන සඳහා ප්‍රතීතනය කිරීමේ යෝජනා ක්‍රමයක් ක්‍රමවත්ව දක්වා ක්‍රියාවේ යොදනු ලැබිය යුතු බවත්, ප්‍රතීතනය සඳහා වූ නිර්ණායක, සංයුක්ත වන පහසුකම්, සේවා සහ වෙනත් යම් සාධක නිශ්චිතව දැක්වෙන සියලු විස්තර ඒ නියමයෙහි ඇතුළත් විය යුතු බව දක්වා තිබුණද, 2023 ජුනි 30 දින වන විටත් මෙම ප්‍රතීතන කටයුතු සම්බන්ධව නියෝග සකස් කර නීතියක් බවට පත් කර නොතිබුණි.

**පනතේ කර්තව්‍යයන් ඉටුකිරීම පිණිස රීති සෑදීම**

පනතේ 19(1) වගන්තිය අනුව සභාව විසින් රීති සාදනු ලැබිය හැකි බව දක්වා ඇති අතර 19(2) වගන්තිය අනුව සභාව විසින් සාදනු ලබන කිසිදු රීතියක් අමාත්‍යවරයා විසින් අනුමත කර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක් බලාත්මක නොවන බව දක්වා ඇත. ඒ අනුව පනතේ දක්වා ඇති රීති සෑදිය හැකි කරුණු 14කින් කිසිදු කරුණක් සම්බන්ධයෙන් රීති සකස් කර නොතිබුණු අතර මාර්ගෝපදේශ 11 ක් පමණක් පිළියෙල කර තිබුණි. මෙම මාර්ගෝපදේශය සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබුණු බව තහවුරු නොවුණු අතර මෙම මාර්ගෝපදේශ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි.

**පෞද්ගලික වෛද්‍ය ආයතන පවත්වාගෙන යාම සඳහා ලියාපදිංචිය අත්‍යවශ්‍ය බව**

2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 2(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, සියළුම පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි විය යුතු අතර ලියාපදිංචි විය යුතු පෞද්ගලික වෛද්‍ය ආයතන හඳුනාගැනීමට, ලියාපදිංචි කරවීමට හා ලියාපදිංචි නොවන ආයතන සම්බන්ධයෙන් පනතේ 4 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට නියාමන සභාව විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණද සියළු පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි වී නොතිබුණි.

**පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචිය අලුත් කිරීම**

2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 3(3) වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලියාපදිංචි කිරීමේ සහතිකයක් එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කාලයකට වලංගු විය යුතු බව දක්වා ඇති අතර, 3(4) වගන්තිය අනුව ලියාපදිංචි කිරීමේ සහතිකයක් එකී ලියාපදිංචිය ඉකුත් වන දිනට මසකට පෙරාතුව සහ නියමිත අලුත් කිරීමේ ගාස්තු ගෙවීමෙන් පසු අලුත් කරනු ලැබිය යුතුය ලෙස දන්වා ඇත. නමුත් පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව විසින් මෙවැනි ක්‍රමවේදයක් පසුගිය වසර 17ක් තිස්සේ පවත්වා ගෙන ගොස් නොතිබුණි.

**නියෝගයන් සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබීම**

2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 3 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 18 වන වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග 2007 අගෝස්තු 13 දිනැති අංක 1510/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකර තිබුණි. පෞද්ගලික වෛද්‍ය ආයතනයක් පවත්වාගෙන යාමට ලියාපදිංචි වූ තැනැත්තා විසින් අනුගමනය කළ යුතු කාර්යභාරය මෙම ගැසට් නිවේදනයේ සඳහන් වන අතර එහි (අ) ඡේදය ප්‍රකාරව කල් ඉකුත් නොවූ ඖෂධ ලබාදීම සිදුකළ යුතු බවත්, (ආ) ඡේදය ප්‍රකාරව සෞඛ්‍ය අමාත්‍යංශය විසින් නම් කරන ලද අත්‍යවශ්‍ය ඖෂධ රඳවා තබා ගත යුතු බවත් සඳහන් කර ඇත. පෞද්ගලික සෞඛ්‍ය සේවා ආයතන මගින් රෝගීන්ට ඖෂධ නිකුත් කිරීමේදී 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි (National Medicines Regulatory Authority -NMRA) පනතට

අනුව වරින් වර අති විශේෂ ගැසට් පත්‍ර මගින් පළකරනු ලබන ඖෂධවල උපරිම සිල්ලර මිල සම්බන්ධ නියමයන්ටද අනුගත විය යුතු බවට කොන්දේසි/මගපෙන්වීම් ඇතුළත් කරමින් අදාළ නියෝගයන් සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.(2022 වසරේ නිකුත් කර තිබුණු අංක 2077/55 දරන ඖෂධ සඳහා උපරිම සිල්ලර මිල නියම කිරීමේ ගැසට් පත්‍රය)

මේ හේතුවෙන් ඇතැම් පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් පවත්වාගෙන යනු ලබන ඖෂධ අලෙවිහල් (Pharmacy) වලින් නේවාසික රෝගීන් සඳහා ලබාදෙන ඖෂධ සඳහා අසාධාරණ මිළ ගණන් අයකිරීම් පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශයට/ පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවට ලැබී තිබුණු පැමිණිලි 8ක් හා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට ලැබී තිබුණු පැමිණිලි 3ක් සම්බන්ධ තොරතුරු නියැදි විගණනයේදී නිරීක්ෂණය විය.

**පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානවල අපද්‍රව්‍ය ක්‍රමවත්ව බැහැර කිරීම**

පෞද්ගලික වෛද්‍ය ආයතන/මධ්‍යස්ථානවල අපද්‍රව්‍ය ක්‍රමවත්ව බැහැර කිරීම /විනාශ කිරීම සම්බන්ධව තීන්දු තීරණ ගැනීම සිදු කිරීම හා තාවකාලිකව පදනම මත ඒ ඒ පළාත් සභා වෙත අපද්‍රව්‍ය බැහැර කිරීමට අවශ්‍ය උපකරණ (Incinerator Machine) ලබා දීම සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් කිරීම අරමුණු කර ගත් තාක්ෂණික ඇගයීම හා අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අනු කමිටුව 2017 වර්ෂයේ සිට 2023 ජුනි 30 තෙක් රැස්වී නොතිබුණි. මෙම අනු කමිටුව සඳහා පත්කරන ලද මුළු සමාජිකයින් 05 දෙනාගෙන් පෞද්ගලික ආරෝග්‍යශාලා හා සාත්තු නිවාස සංගමයේ නියෝජිතයන් සංඛ්‍යාව තිදෙනෙකු විය. මෙම අනු කමිටු සඳහා නෛතික කරුණු වලට සම්බන්ධ නීති අංශයේ නියෝජිතයා සම්බන්ධ කර නොතිබුණි.

**පෞද්ගලික වෛද්‍ය ආයතන වර්ග කිරීම්**

2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 10 වගන්තියෙහි, මෙම සභාවේ කාර්ය සහ කර්තව්‍ය දක්වා ඇති අතර එහි 10(ඇ) වගන්තිය අනුව ඒ ඒ පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් සලසනු ලබන පහසුකම්වලට අනුව ඒවා වර්ග කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ දක්වා ඇත. නමුත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් පෞද්ගලික වෛද්‍ය ආයතන

ශ්‍රේණිගත කිරීමේ කටයුතු අවසන් කර නොතිබූ අතර මේ හේතුවෙන් ගාස්තු නියාමනය කිරීමේ කටයුතුද ඇනහිට තිබුණි.

## 2022 හා 2023 වර්ෂවල ඖෂධ අවශ්‍යතාවය, ප්‍රසම්පාදනය, සැපයුම, බෙදාහැරීම හා නියාමනය පිළිබඳ විශේෂ විගණන වාර්තාවේ ඇතුළත් වූ ප්‍රධාන විගණන නිරීක්ෂණ

**ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පරිදි කටයුතු කර නොතිබීම**

ඖෂධ අයිතම 285 හි අභිලාෂ කැඳවීම ඇගයීම සඳහා සෞඛ්‍ය ලේකම් විසින් පස් දෙනෙකුගෙන් සමන්විත ඇගයීම් කමිටුවක් පත්කර තිබුණු අතර ප්‍රසම්පාදන අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කළ වෛද්‍යවරයා ද එම ඇගයීම් කමිටු සාමාජිකයකු ලෙස පත් කර තිබුණු බවත්, ඇතැම් පිළිකා සඳහා වන විශේෂිත ඖෂධ ඇගයීම් සඳහා තාක්ෂණික දැනුමැති කිසිදු විශේෂඥ වෛද්‍යවරයකු හෝ ඒ සම්බන්ධ තාක්ෂණික දැනුමැති ප්‍රවීණයකු පත්කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය. හදිසි මිලදී ගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ දක්වා ඇති පරිදි තාක්ෂණික ඇගයීම් කමිටු පත් නොකළද හදිසි මිලදී ගැනීම් කමිටුව විසින් තාක්ෂණික විශේෂඥයන්ගේ උපදෙස් ලබාගැනීමට කටයුතු කළ යුතු වුව ද, එපරිදි කටයුතු කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

**ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අනුමැතිය ලබාගැනීම**

ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් අධිකාරිය විසින් 2019 ඔක්තෝබර් 15 දිනැති ව මාර්ගෝපදේශයක් පිළියෙළ කර තිබුණු අතර ඊට අනුකූලව ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අනුමැතිය ඊට අදාළ තාක්ෂණික අනුකමිටුව මඟින් ලබා ගත යුතුය. ඉන්දියානු ණය යෝජනා ක්‍රමය සහ වෙනත් විදේශ ණය ආධාර ව්‍යාපෘති හරහා ඖෂධ මිල දී ගැනීම් සිදු කිරීම සඳහා ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමට වේගවත් යාන්ත්‍රණයක් සකස් කරන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් අවසරය ලබා දී තිබුණි. ඒ අනුව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරි විසින් ඉහත සඳහන් කරන ලද අනුකමිටුව වෙත යොමු කිරීමෙන් තොරව තමා විසින් ම ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමට හැකිවන පරිදි Special Pathway නමැති වේගවත් යාන්ත්‍රණයක් නිර්දේශ කර අනුමැතිය සඳහා 2022 සැප්තැම්බර් 16 දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබුණි.

**ලියාපදිංචියෙන් නිදහස් කිරීම තුළින් රෝගීන්ට ඇතිවිය හැකි බලපෑම**

ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අනුකමිටුව අභිබවා Special Pathway ක්‍රමය හරහා ප්‍රධාන විධායක නිලධාරී විසින් ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීම සඳහා අනුමැතිය ලබා දීම තුළින් ගුණාත්මය, ආරක්ෂාව, ප්‍රත්‍යක්ෂභාවය සහ මිල සාධාරණත්වය පිළිබඳව තහවුරුවක් නොමැති ඖෂධ රට තුළට ආනයනය කිරීමේ සහ රෝගීන් සඳහා භාවිතා කිරීමේ අවදානමක් පවතින බව විගණනයේ දී නිරීක්ෂණය විය.

**හදිසි මිලදී ගැනීම් ක්‍රියාවලියේ අවිධිමත්භාවය හේතුවෙන් ව්‍යාජ ඖෂධ මිල දී ගැනීම**

සැපයුම්කරුවන් විසින් 2023 මැයි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළදී එන්නත් කුප්පි 22,500න් රු.මිලියන 169ක් වටිනා කුප්පි 3,985ක් වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණු අතර එම අංශය විසින් රු.මිලියන 36ක් සැපයුම්කරු වෙත ගෙවා තිබුණි. වෛද්‍ය සැපයීම් අංශය වෙත ලැබුණු සියළුම එන්නත් කුප්පි 2023 මැයි 30 දින සිට ජාතික රෝහල්, ශික්ෂණ රෝහල්, පළාත් රෝහල් හා ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශ වෙත නිකුත් කර තිබුණි. එම ඖෂධය රෝගීන් විසින් භාවිතා කිරීමෙන් පසු කොළඹ, මහනුවර ජාතික රෝහල් සහ මාතලේ හා මාතර දිස්ත්‍රික් මහ රෝහල්වල රෝගීන්ට බරපතල අහිතකර ප්‍රතික්‍රියා (Serious of Adverse reaction) ඇතිවී තිබුණු බව ජාතික ඖෂධ නියාමන අධිකාරියට 2023 සැප්තැම්බර් මාසයේදී වාර්තා වී තිබුණි.

**විධිමත් අනුමැතියකින් තොරව සැපයුම්කරු වෙත ගෙවීම්**

ගෙවීම් අත්හිටුවා තිබුණු රු. මිලියන 248 ක් ජාතික ඖෂධ නිතිගත සංස්ථාවේ සභාපතිවරයාගේ නිර්දේශය මත නියමිත ප්‍රසම්පාදන කමිටුවල අනුමැතියක් හෝ වෙනත් විධිමත් අනුමැතියක් ලබා ගැනීමකින් තොරව 2022 අගෝස්තු හා නොවැම්බර් මාසවලදී සැපයුම්කරු වෙත ගෙවා තිබුණි.

**නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම**

2015 ජනවාරි 15 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ රාජ්‍ය ආයතනවල සිදු වී ඇතැයි සැලකෙන දූෂණ හා වංචා පිළිබඳ සොයා බැලීමේ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවට අනුව "හර්ටිකැඩ්" වෙළෙඳ නාමය යටතේ "ට්‍රස්ටසුමබ්" පිළිකා ඖෂධය පුද්ගලික සමාගමක් හරහා මෙරටට ආනයනය කිරීමේදී සිදුකර ඇති

වංචා, දූෂණ හා අක්‍රමිකතා සම්බන්ධ වගකිව යුතු සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන් සම්බන්ධව නිර්දේශයන් සිදුකර තිබුණු නමුත් එම වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව එම නිර්දේශයන් කිසිවක් ක්‍රියාත්මක කිරීමට අදාළ බලධාරීන් කටයුතු කර නොතිබුණි.

## කොළඹ ජාතික රෝහල

**සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ කොන්ත්‍රාත්තුව විධිමත්ව ක්‍රියාත්මක නොකිරීම**

කොළඹ ජාතික රෝහලේ සායනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් අවශ්‍ය බහාලුම් සපයා නොමැති තත්ත්වයක් තුළ ඒ පිළිබඳ සැලකිලිමත් නොවී 2017 ජනවාරි 01 දින සිට 2019 මාර්තු මස 31 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ බැහැර කරන ලද සායනික අපද්‍රව්‍ය කි.ග්‍රෑ.1,012,139ක් සඳහා කි.ග්‍රෑ 1කට රු.28.24ක් ලෙස බහාලුම් ගාස්තුද ඇතුළත් කරමින් එකතුව රු. මිලියන 28.58ක් සැපයුම්කරු වෙත ගෙවා තිබුණි. එසේම 2019 අප්‍රේල් 01 දින සිට 2022 ජුලි 31 දක්වා වූ මාස 40 ක කාලපරිච්ඡේදය තුළ සායනික අපද්‍රව්‍ය කි.ග්‍රෑ.2,628,815ක් බැහැර කිරීමට අදාළව කි.ග්‍රෑ.1ක් සඳහා රු.3.81 බැගින් රු.මිලියන 10.01ක බහාලුම් ගාස්තුව ද ඇතුළත් කර ගෙවීම් සිදුකර තිබුණි. මෙම වැඩිපුර ගෙවූ බහාලුම් ගාස්තු පිරිවැය නැවත අයකර ගැනීම සඳහා ගණනය කිරීමේදී ඉහත අපද්‍රව්‍ය ඇසුරුම් කරන ලද බහාලුම් සංඛ්‍යාව පදනම් කර ගනිමින් ගණනය කිරීම හේතුවෙන් රු.මිලියන 10.38ක් අඩුවෙන් ගණනය කර තිබුණි.

තවද, විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2019 අප්‍රේල් 01 දින සිට 2022 ජුලි 31 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව පමණක් සායනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා මිලදී ගන්නා ලද බහාලුම් සඳහා රු.මිලියන 44.27ක මුදලක් වැය කර තිබුණි. එහෙත් එම කාලයට අදාළව කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීම සඳහා ගණනය කරන ලද මුදල රු.මිලියන 5.01ක් පමණක් වූයෙන් එම කාලයට අදාළව තවදුරටත් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත යුතු මුදල රු.මිලියන 39.26ක් බව නිරීක්ෂණය විය.

**UPS උපකරණයෙහි බැටරි දුර්වලවීම හේතුවෙන් MRI Scanner යන්ත්‍රය ක්‍රියා විරහිත වීම**

කොළඹ ජාතික රෝහලේ ස්ථාපිත MRI Scanner යන්ත්‍රය ඉහළ වෝල්ටීයතාවයකින් හා විදුලිය ඇණහිටීමකින් ආරක්ෂා කර ගනිමින්

පවත්වා ගැනීම සඳහා භාවිතා කරනු ලබන UPS උපකරණයෙහි බැටරි දුර්වල බව 2020 අගෝස්තු 26 දින අනාවරණය කරගෙන වසර 04කට වැඩි කාලයක් ගතව තිබුණද එම UPS උපකරණය යථාවත් කිරීමට අදාළ අංශ අපොහොසත් වී තිබුණි. මේ හේතුවෙන් 2024 වර්ෂයට අදාළව පමණක් අවස්ථා 05කදී මෙම යන්ත්‍රය ක්‍රියා විරහිත වී තිබුණි.

කෙසේ වුවද, 2023 ඔක්තෝබර් 10 දින ඒකකයක් රු.105,000 බැගින් රු.මිලියන 10.08ක් වැයකර UPS උපකරණය සඳහා බැටරි 96 මිලදී ගෙන තිබුණි. එම බැටරි 96 අතරින් බැටරි 32ක් පමණක් 2023 ඔක්තෝබර් 17 දින UPS උපකරණයේ ස්ථාපිත කිරීම සඳහා ජාතික රෝහල වෙත ලබා දී තිබුණි. එම බැටරි 32ක් MRI Scanner යන්ත්‍රයේ විදුලි පද්ධතිය සමඟ සම්බන්ධ නොකර UPS උපකරණයෙහි ස්ථාපිත කර තිබුණු අතර ඉතිරි බැටරි 64 ද සමඟින් බැටරි 96ක් UPS උපකරණය හා ස්ථාපිත කර යන්ත්‍රයට සම්බන්ධතාවය ලබාදීම අවශ්‍යව තිබුණි. ඒ සඳහා ජාතික රෝහල විසින් කේබල් මිලදී ගැනීමට කටයුතු කිරීමේදී ප්‍රසම්පාදන අවශ්‍යතාවය හඳුනාගෙන පිරිවිතර හා ලංසු ලේඛන සකස් නොකිරීම හේතුවෙන් කේබල් මිලදී ගැනීමට දීර්ඝ කාලයක් ගතවීමෙන් බැටරි ප්‍රසම්පාදනයෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

බැටරි නිෂ්පාදන ආයතනයෙහි පරිශීලක අත්පොතෙහි සඳහන් කරුණු අනුව UPS බැටරි ගබඩා කිරීමේ උෂ්ණත්වය හා කාලය අනුව UPS බැටරිවල ධාරිතාවය වෙනස්වන බැවින් ජාතික රෝහලෙහි වර්ෂයකට ආසන්න කාලයක් MRI Scanner යන්ත්‍රයේ පරිපථයට සම්බන්ධ නොකර පවතින බැටරි 32 හි ධාරිතා මට්ටම පිළිබඳ නැවත පරීක්ෂා කිරීමක් සිදු කළ යුතුව පැවතියද, එසේ සිදු කළ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. තවද ඉතිරි බැටරි 64 න් 40 ක් රිජ්වේ ආර්‍යා ළමා රෝහල වෙත ලබාදීමට කටයුතු කර තිබුණු අතර තවදුරටත් ඉතිරි බැටරි 24 හි භාවිතය පිළිබඳ කිසිදු සටහනක් විගණනයට ඉදිරිපත් නොවීය.

## සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහල

**MRI ස්කෑන් යන්ත්‍රය ක්‍රියාවිරහිත වීම**

සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහල තුළ 2005 වර්ෂයේ ස්ථාපිත කර තිබූ MRI ස්කෑන් යන්ත්‍රයෙහි සිලින්ඩරයක් වැදීම හේතුවෙන් 2018 වර්ෂයේදී රු.මිලියන 15.81ක් වැයකර අලුත්වැඩියා කර තිබුණි. එම අලුත්වැඩියාවෙන් දින 05කට පසු එම යන්ත්‍රය අලුත්වැඩියා කළ නොහැකි පරිදි ක්‍රියාවිරහිත වී තිබීම සම්බන්ධයෙන් රෝහල විසින් පරස්පර අදහස් ඉදිරිපත් කර තිබුණු අතර ඒ සඳහා විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. එසේම අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පැවති මෙම යන්ත්‍රය සම්බන්ධයෙන් පසුගිය කාලයකට අදාළව 2019 මාර්තු 18 දින සේවා ගිවිසුමකට එළඹ ඒ සඳහා රු.මිලියන 3.63ක සේවා ගාස්තුවක් සමාගමකට ගෙවා තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විටත් යන්ත්‍රය යථා තත්ත්වයට පත්කර නොතිබුණි.

**පරිගණකගත පද්ධති භාවිතා නොකිරීම**

සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහලේ සපයන සේවාවන් පරිගණකගත කිරීම සඳහා E-Health System වැඩසටහනක් ස්ථාපිත කිරීමට අවස්ථා 02කදී මිල ගණන් කැඳවා තිබුණු අතර දෙවන අවස්ථාවේදී රු.මිලියන 19.49ක වටිනාකමකට එනම් මුල් අවස්ථාවට වඩා රු.මිලියන 0.87ක වැඩි මිලකට කොන්ත්‍රාත්තුව පවරා තිබුණි. මුල් අවස්ථාවේ වර්ෂ 05ක කාලයකට අලුත්වැඩියාවන් හා ප්‍රතිස්ථාපනයන් ගාස්තු රහිතවද අවු. 25ක වගකීම් කාලය, ලෙස තිබූ වාසිදායක තත්ත්වය වෙනුවට වසර 03ක වගකීම් කාලයක් හා වගකීම් කාලයෙන් පසුව වසර 10ක් සඳහා රු.මිලියන 3.5ක මුදලකට නඩත්තු හා සේවා වසර 10ක් ලෙස රජයට අවාසිදායක අයුරින් කොන්ත්‍රාත්තුව පවරා තිබුණි. එසේම, මෙම ප්‍රසම්පාදන කටයුතු අමාත්‍යාංශය විසින් සිදු කළ යුතු වුවත්, රෝහල් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින් සිදුකර පසුව අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගෙන තිබුණි. කෙසේ වෙතත් 2019 නොවැම්බර් 19 දින වැඩ නිමකර භාර දී තිබූ මෙම ව්‍යාපෘතිය 2024 දෙසැම්බර් 31 දින වන විටත්, සක්‍රීය කරවා ගැනීමට කිසිදු සැලසුමක්, තාක්ෂණික උපකරණ මිලදී ගැනීමකින් හෝ තොරව මුළුමනින්ම අක්‍රීය වී පැවතුණි.

## පොළොන්නරුව ජාතික වෘක්කවේද විශේෂිත රෝහල

**නිෂ්කාර්ය වත්කම්**

මෙම රෝහලෙහි පර්යේෂණ හා සංවර්ධන අංශය පිහිටුවීම සඳහා චීන රජයෙන් ප්‍රදාන ලෙස ලැබී තිබූ වර්ග 20කට අදාළ උපකරණ ඒකක 55ක් එම අංශය පිහිටුවා නොතිබීම හේතුවෙන් නිෂ්කාර්යව රෝහලේ ගබඩා කර තිබුණි. තවද, නිෂ්කාර්යව පවතින මෙම උපකරණ භාවිතා නොකිරීම හේතුවෙන් තාක්ෂණික වශයෙන් යල් පැනීමට ඇති හැකියාව පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි.

පොළොන්නරුව ජාතික වෘක්කවේද විශේෂිත රෝහලේ රුධිර කාන්දුකරණ ඒකකයේ පවතින රුධිර කාන්දුකරණය සඳහා භාවිතා කරන Hemodialysis යන්ත්‍ර 04ක් විගණන දිනය වූ 2025 පෙබරවාරි 13 වන විට අක්‍රිය මට්ටමේ පවතින බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

2021 වර්ෂයේ ආරම්භ කරන ලද පොළොන්නරුව ජාතික වෘක්කවේද විශේෂිත රෝහලේ වෛද්‍ය දැඩි සත්කාර ඒකකය විගණිත දින වූ 2025 පෙබරවාරි 10 දින දක්වා වර්ෂ 03කට අධික කාලයක් ගත වී තිබුණද, ක්‍රියාකාරී මට්ටමේ නොපැවතුණ අතර එය ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමට වගකිය යුතු පාර්ශවයන්ගේ අවධානය යොමු වී නොතිබුණි.

## හලාවත මහ රෝහල

**හදිසි අනතුරු ඒකකය ඉදිකිරීම අතහැර දැමීම**

හදිසි අනතුරු ඒකකයක් ඉදිකිරීමේ දැඩි අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් රු.මිලියන 501.21ක ඇස්තමේන්තු මුදලකට දින 609ක් තුළ නිම කිරීම සඳහා 2018 ජනවාරි 15 දින ඒකකයේ ඉදිකිරීම් වැඩ ආරම්භ කර තිබුණද, මෙම ඉදිකිරීම 2024 වර්ෂය අවසාන වන විට අත්හැර දමා තිබුණි.

**වාට්ටු සංකීර්ණය ඉදිකිරීම අතහැර දැමීම**

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් 2018 පෙබරවාරි 19 ආරම්භ කරන ලද රු.මිලියන 583.77ක ඇස්තමේන්තු වටිනාකමක් සහිත මහල් 05කින් සමන්විත වෛද්‍ය වාට්ටු සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම 2020 වර්ෂය අවසන් වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණද,එහි ඉදිකිරීම් නවතා තිබුණු බව නිරීක්ෂණය විය.

**ශල්‍යාගාරයක් හා දැඩි සත්කාර ඒකකයක් ඉදිකිරීම**

රෝහලේ පවතින දැඩි ඉඩකඩ හිඟය සඳහා ශල්‍යාගාරයක් හා දැඩි සත්කාර ඒකකයක් ඉතා ඉක්මනින් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් සාමාන්‍ය ගොඩනැගිල්ලක් ඉදිකිරීමට යන කාලය අවම කරනු පිණිස යකඩ භාවිතයෙන් තාවකාලික ගොඩනැගිල්ලක් මාස 06 ක් තුළ ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කර තිබුණද 2024 වර්ෂය අවසාන වන විටත් මෙම ගොඩනැගිල්ලේ 02 වන මහලේ වැඩ අවසන් කර නොතිබුණි. මෙම ප්‍රමාදය සඳහා කොන්ත්‍රාත්කරුගේ නොසැලකිලිමත්භාවය, සැලසුම් පිළියෙල කිරීමට පෙර අවශ්‍යතා හඳුනා නොගැනීම නිසා පසුව සැලසුම් වෙනස් කිරීම, ඉදිකිරීම් භූමිය පිළිබඳව ශක්‍යතා අධ්‍යනයකින් තොරව සැලසුම් හා ඇස්තමේන්තු පිළියෙල කිරීම, බිල්පත් ගෙවීම් ප්‍රමාදයන් ආදි කරුණු හේතු වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.මිලියන 85.18ක් වූ මෙම ඉදිකිරීමේ ඇස්තමේන්තු වියදම රු.මිලියන 131.95ක් දක්වා වැඩි කිරීමට කොන්ත්‍රාත්කරු 2021 මැයි 31 දින ඉල්ලා තිබුණි.

## මහනුවර ජාතික රෝහල

**විද්‍යුත් මගී ප්‍රවාහන රථ හා විද්‍යුත් ගිලන් රථ භාවිතයෙන් ඉවත් කිරීම**

මහනුවර ජාතික රෝහල විසින් රෝගී සත්කාර සේවාවේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින් 2018 පෙබරවාරි 08 දින රු.මිලියන 18.02ක මුදලක් වැයකර විද්‍යුත් මගී ප්‍රවාහන රථ 06ක් හා විද්‍යුත් ගිලන් රථ 04ක් මිලදී ගෙන තිබුණි. විද්‍යුත් රථ සඳහා වූ පිරිවිතර හා තෝරා ගත් ලංසුකරුගේ පිරිවිතර සැසඳීමේදී ප්‍රමාණාත්මක තාක්ෂණික බැහැරවීම් පැවති බව තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව මගින් පෙන්වා දී තිබුණි. තවද මෙම රථවල වැඩිදියුණු කිරීම් සිදුකිරීමට නිර්දේශ කර තිබුණද එම රථ පූර්ව පරීක්ෂාවක් හෝ වැඩිදියුණු කිරීමක් සිදු කර වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වුවද මෙම රථ මිලදීගෙන වසර 2 කට පසු කඳු ඇදීම සඳහා රථවල එන්ජින් ධාරිතාවය ප්‍රමාණවත් නොවීම හා බැටරි ආරෝපණය රඳා නොපැවතීම මත භාවිතයෙන් ඉවත්කර තිබුණි. ලංසු ලේඛනවල පිරිවිතර අංක 4 (b) අනුව වසර 05ක නඩත්තු ගිවිසුමකට එළඹිය යුතු වුවද විද්‍යුත් වාහන

සැපයුම්කරු සමඟ එවැනි නඩත්තු ගිවිසුමකට එළඹීමටද කටයුතු කර නොතිබුණි.

## අනුරාධපුර ශික්ෂණ රෝහල

**ආරක්ෂක සේවා ලබා ගැනීම**

අනුරාධපුර ශික්ෂණ රෝහලේ ආරක්ෂක සේවාව රජයට අනුබද්ධ පෞද්ගලික සමාගමක් වෙත වසර 20කට වැඩි කාලයක සිට අඛණ්ඩව ප්‍රදානය කර තිබුණි. එම සමාගමට එරෙහිව විවිධ පාර්ශව වෙතින් පැමිණිලි ඉදිරිපත් කර තිබුණ නමුත්, ප්‍රසම්පාදන තීරණ ගැනීමේදී ඒ සම්බන්ධව අවධානයක් යොමු නොකර 2024 ඔක්තෝබර් 01 දින සිට 2025 මාර්තු 31 දින දක්වා වූ මාස 06ක කාල සීමාවක් සඳහා රු.මිලියන 23.97ක වටිනාකමකට තරඟකාරී මිල ගණන් කැඳවීමෙන් තොරව අදාළ සමාගම වෙතම නැවත වරක් කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. තවද, පෞද්ගලික ආරක්ෂක සමාගමේ සේවකයන්ගේ දෛනික පැමිණීම, පිටවීම හා සේවා මුර සඳහා යොදවනු ලබන සේවකයන් ප්‍රමාණය ආදිය සත්‍ය වශයෙන්ම තහවුරු කර ගැනීම සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කර නොමැති බව නිරීක්ෂණය විය.

**අපද්‍රව්‍ය දහන යන්ත්‍රය ක්‍රියා විරහිත වීම**

අනුරාධපුරය ශික්ෂණ රෝහල සතු Metamizer යන්ත්‍රය හා Incinerator යන්ත්‍ර සක්‍රීය තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම හා නව Incinerator යන්ත්‍රය අක්‍රීය තත්ත්වයට පත්වීම නිසා සායනික අපද්‍රව්‍ය ඉවත් කිරීම වෙනුවෙන් 2023 වර්ෂයේදී, 2024 පළමු මාස දෙක හා 2024 අගෝස්තු හා ඔක්තෝබර් යන කාලවලදී පිළිවෙලින් බාහිර පාර්ශවයක් වෙත රු.මිලියන 39.95, රු.මිලියන 24.14, රු.මිලියන 49.09ක් ලෙස එකතුව රු.මිලියන 113.18ක් ගෙවා තිබුණි. ඉහත සඳහන් උපකරණ අලුත්වැඩියා කර භාවිතයට ගැනීම මගින් බාහිර පාර්ශවයන්ට ගෙවනු ලබන මුදල අවම කර ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබුණි.

**Erb XL 360 විශ්ලේෂණ යන්ත්‍රය ඌන උපයෝජනය**

අනුරාධපුර ශික්ෂණ රෝහලේ ජීව රසායන විද්‍යා රසායනාගාරයේ වූ Erb XL 360 විශ්ලේෂණ යන්ත්‍රය, නව විශ්ලේෂණ යන්ත්‍රයක් රෝහලට ලැබීම මත වසර කිහිපයක සිට අවම මට්ටමකින් ප්‍රයෝජනයට ගෙන තිබූ අතර එය සුදුසු පරිදි නැවත ප්‍රයෝජනයට

ගැනීම හෝ වෙනත් සුදුසු පාර්ශවයක් වෙත පැවරීම කෙරෙහි රෝහල් බලධාරීන්ගේ අවධානය යොමු කර නොතිබුණි.

## උතුරු කොළඹ ශික්ෂණ රෝහල

**නිල නිවාස නිෂ්කාර්යව පැවතීම**

උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ විවාහක වෛද්‍යවරුන් සඳහා වෙන් කරන ලද රෝහලේ සිට කිලෝමීටර 2.5ක් පමණ දුරින් පිහිටි ඇලපිටිවල නිවාස සංකීර්ණයේ උපලේඛනගත නිවාසයක් හා පොදු සේවා නිවාස 25ක් පැවතුණි. 2025 ජනවාරි 15 හා 16 යන දිනවලදී මෙම නිවාසවල සිදු කළ භෞතික පරීක්ෂාවේදී නිවාසවලින් 19ක කිසිවෙකු හෝ පදිංචි වී නොසිටින බව නිරීක්ෂණය විය. එයින් නිවාස 18ක් වසර 4කට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පවත්නා බව විගණනයට අනාවරණය වූ අතර නිසි ලෙස නඩත්තු නොකිරීම හේතුවෙන් නිවාස අවට පරිසරය වල්බිහිවෙමින් පැවතුණි.

## කෑගල්ල ශික්ෂණ රෝහල

**අපද්‍රව්‍ය කළමනාකරණය**

රජයේ රෝහල්වල සායනික අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කෑගල්ල ශික්ෂණ රෝහලට එ.ජ.ඩොලර් 701,335.83ක් වූ Metamizer යන්ත්‍රයක් සපයා තිබුණද, එය ක්‍රියා වීම හා එයින් ඉවත් කරන අවශේෂ ද්‍රව්‍ය බැහැර කිරීමට ක්‍රමවේදයක් නොමැති වීම මත එම යන්ත්‍රය 2024 අප්‍රේල් 25 දින සිට භාවිතයට ගැනීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

**දාහකය නිෂ්කාර්යව පැවතීම**

කෑගල්ල ශික්ෂණ රෝහලෙහි දෛනිකව එකතු වන සායනික අපද්‍රව්‍ය ඇතුළු සාමාන්‍ය පරිසරයට සෘජුව බැහැර කළ නොහැකි විනාශ කළ යුතු කිලෝග්‍රෑම් 365කට ආසන්න අපද්‍රව්‍ය දහනය කිරීම සඳහා රු.මිලියන 17ක් පමණ වැයකර දාහකයක් (Incinerator) ඉදිකර 2024 ජූනි 7 දින වන විට එහි ක්‍රියාකාරීත්වය පරීක්ෂා කර තිබුණි. එහෙත් රෝහලේ කාර්ය මණ්ඩලය වෙත දාහකය ක්‍රියාත්මක කිරීම පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා දී නොතිබීම හා දාහකය විධිමත්ව රෝහල වෙත භාර දී/ භාර ගෙන නොතිබීම හේතුවෙන් එය ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ අනුව අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් එකකට රු. 185ක් වැය කර පුද්ගලික සමාගමක් මගින් අපද්‍රව්‍ය ඉවත් කිරීමට සිදුව තිබුණු අතර ඒ සඳහා ආසන්න වශයෙන් වර්ෂයකට රු.මිලියන 24ක් පමණ නිෂ්කාර්යව වැය කිරීමට සිදුව තිබුණි.

**යන්ත්‍ර නිෂ්කාර්යව පැවතීම**

කෑගල්ල ශික්ෂණ රෝහල විසින් 2019, 2020 හා 2021 යන වර්ෂවලදී මිලදී ගන්නා ලද රු.මිලියන 34.48ක් වටිනා යන්ත්‍ර 04ක් මිලදී ගැනීමේදී අවශ්‍යතාවය සහ යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධව විධිමත් ශක්‍යතා අධ්‍යනයක් කිරීමෙන් තොරව මිලදී ගැනීම හේතුවෙන් මෙම යන්ත්‍ර ප්‍රයෝජනයට ගැනීමෙන් තොරව නිෂ්කාර්යව පැවති අතර අවශ්‍ය වෙනත් රෝහලකට ලබා දීමටද කටයුතු කර නොතිබුණි.

## ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය

**රසායනාගාර පරීක්ෂණ මිල ගණන් සංශෝධනය**

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය විසින් පවත්වනු ලබන රසායනාගාර පරීක්ෂණ මිල ගණන්, පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කිරීමකින් තොරව සංශෝධනයකර තිබූ අතර සිදු කරන ලද නියැදි පරීක්ෂාවට අනුව රෝහලට අහිමි වූ ආදායම රු.මිලියන 9.56ක් වී තිබුණි.

**ඉහළ ලාභ ආන්තිකයක් අය කිරීම**

මණ්ඩලයේ සාමාන්‍ය හා ගෙවන වාට්ටුවලට ඇතුළු වන රෝගීන් සඳහා හදිසි ඖෂධ දේශීයව මිලදී ගැනීමේදී හා බිල්පත් සැකසීමේදී පිළිවෙලින් සියයට 10ක් හා 30ක් ලෙස ලාභ ආන්තිකයක් පවත්වා ගත යුතු වුවද නියැදි විගණන පරීක්ෂාවේදී සාමාන්‍ය වාට්ටුවල රු.මිලියන 5.97ක වටිනාකම ඇති බිල්පත් 18ක සියයට 49ත් සියයට 767ත් අතර ලාභ ආන්තිකයක්ද, ගෙවන වාට්ටුවල රු.මිලියන 35.98ක වටිනාකම ඇති බිල්පත් 21ක සියයට 30ත් සියයට 422ත් අතර ලාභ ආන්තිකයක්ද අයකර තිබූ බව නිරීක්ෂණය විය.

**මිලදී ගත් රෝගී ඇඳන් භාවිතා කල නොහැකි වීම**

විෂය පිළිබඳ දැනුමක් සහිත නිලධාරියෙකු තාක්ෂණික ඇගයීම් කමිටුවට පත් නොකර රු.මිලියන 16.22ක් වටිනා වෙනස් කල හැකි රෝගී ඇඳන් හා මෙට්ට (Adjustable Patient Bed with Mattress) 50ක් මිලදී ගෙන තිබුණි. එයින් ඇඳන් 40ක් පමණක් සැපයුම්කරු විසින් සපයා තිබුණු අතර එම ඇඳන්ද විවිධ දෝෂ හේතුවෙන් භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි.

**දීර්ඝ කාලයක් එකම ඇණවුම ක්‍රියාත්මක කිරීම**

2023 වර්ෂයේදී Ceftriaxone 1g Injection නම් ඖෂධයෙන් ඒකක 32,700ක් රු.400 බැගින් රු.මිලියන 13.08කට මිලදී ගැනීමට ගැනුම්

ඇණවුම් හා ප්‍රතිග්‍රහණ ලිපි අදාළ සැපයුම්කරුට ලබා දී තිබුණද 2023, 2024 හා 2025 වර්ෂයන්හි පිළිවෙලින් ඒකක 3,000ක්, 13,000ක් හා 14,000ක් ලෙස ඒකක 30,000ක් පමණක් ලබා ගෙන තිබුණි. තවද වටිනාකම රු.මිලියන 2.28ක් වූ ඒකක 5,700 ක් 2025 මැයි 30 දින දක්වාම ලබා දී නොතිබුණි. මේ අනුව වාර්ෂික ඖෂධ අවශ්‍යතාවය නිසි පරිදි පුරෝකථනය නොකිරීම හේතුවෙන් හා දීර්ඝ කාලයක් එකම ඇණවුම ක්‍රියාත්මක කිරීමෙන් තරඟකාරී අඩු මිලකට මිලදී ගැනීමේ අවස්ථා අහිමි වී තිබුණි.

## ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල

**අරමුදල් ඌන උපයෝජනය**

රිජ්වේ ආර්යා ළමා රෝහල සඳහා දස මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා උපකරණ මිලදීගැනීම වෙනුවෙන් Little Heart ව්‍යාපෘතිය යටතේ 2024 වර්ෂය අවසානය වනවිට රැස් කරන ලද මහජන අරමුදල්වල එකතුව රු.මිලියන 707.57ක් වුවද, එම අරමුදල්වලින් 2024 වර්ෂය තුළ කිසිදු මුදලක් වැයකර නොතිබුණි. මීට අමතරව එම රෝහලේ ශල්‍යාගාර සංකීර්ණය වැඩිදියුණු කිරීම සඳහා පරිත්‍යාගශීලියෙකු විසින් 2020 වර්ෂයේ ලබා දී තිබුණු රු.මිලියන 42.03ක් හා ශල්‍යකර්ම සඳහා අවශ්‍ය පරිභෝජන ද්‍රව්‍ය මිලදීගැනීම සඳහා 2023 හා 2024 වර්ෂවල ලැබී තිබුණු රු.මිලියන 22.72ක පරිත්‍යාග මුදල් අදාළ කාර්යයන් ඉටුකිරීම සඳහා යෙදවීමට කටයුතු කර නොතිබුණි. තවද 2024 දෙසැම්බර් 31 දිනට අපේක්ෂා රෝහල සඳහා වූ පරිත්‍යාග ගිණුමේ රු. මිලියන 461.33ක මුදලක් ශේෂව පැවති අතර 2022, 2023 හා 2024 වර්ෂයන්හිදී කිසිදු ඵලදායී කාර්යයක් සඳහා මෙම අරමුදල් භාවිතා කර නොතිබුණි.

**යාපනය ව්‍යාපෘතිය**

2012 මැයි 04 දිනැති අංක අමප/12/0489/509/022 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව උතුරු පළාතේ පිළිකා රෝගීන් සඳහා වූ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා (Trail Project) සෞඛ්‍ය අමාත්‍යාංශය, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල සහ ආධාරක ආයතනය වන භාරකාර සමාගමක් අතර අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ තෙලිප්පලේ මූලික රෝහලේ විකිරණ ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම හා යාපනය ශික්ෂණ රෝහලේ ළමා ප්‍රතිකාර ඒකකය සඳහා වෛද්‍ය උපකරණ ලබා දීමට යෝජිතව පැවතුණි. තෙලිප්පලේ රෝහලේ විකිරණ ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම වෙනුවෙන් යථෝක්ත භාරකාර

සමාගම රු. මිලියන 218.6ක් ආධාර වශයෙන් ලබා දී තිබුණි. ගිවිසුම අනුව Jaffna Project නමින් අදාළ භාරකාර සමාගම විසින් එකතු කරනු ලැබූ ආධාර මුදල් සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් දේපළක් වන බැවින් 2024 මාර්තු 31 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ එසේ එකතු කළ රු. මිලියන 75.96ක මුදලක් ගිවිසුම ප්‍රකාරව යාපනය ශික්ෂණ රෝහලේ පිළිකා ඒකකය වැඩිදියුණු කිරීම සඳහා නොයොදවා එම සමාගම භාරයේ රඳවාගෙන තිබුණි.

**පොදු අරමුදල උපයෝජනය**

2024 දෙසැම්බර් 31 දින වන විට පොදු අරමුදලේ සමුච්චිත ආදායම රු. මිලියන 712.41ක් වූ අතර පනතේ අරමුණු ඉටුකිරීම වෙනුවෙන් 2024 වර්ෂය තුළදී පොදු අරමුදල්වලින් වැයකර තිබුණු මුදල රු.මිලියන 90.32ක් පමණක් විය. මේ අනුව අරමුදලේ මුදල් උපයෝජනය සියයට 13ක පහළ මට්ටමක පැවතුණි.

## අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

**පුනරුත්ථාපන මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර ලබා ගැනීම හා යාවත්කාලීන කිරීම**

2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පනතට අනුශාංගිකව නිකුත් කරන ලද 2010 මැයි 12 දිනැති අංක 1653/19 -2010 දරන ගැසට් පත්‍රයේ නියෝග අංක 2 අනුව ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් රැක බලා ගැනීම හා පුනරුත්ථාපනය කිරීමේ කාර්යය සඳහා නියෝග ප්‍රකාරව බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව පවත්වා ගෙන යා නොහැකි වුවද, 2024 වර්ෂය අවසන් වන විට රට තුළ පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන 26ක් පැවති අතර පෞද්ගලික පුනරුත්ථාපන මධ්‍යස්ථාන 13ක පමණක් බලපත්‍ර ලියාපදිංචිය යාවත්කාලීන කර තිබුණි. ඒ අනුව 2025 මැයි 16 විගණන දින වන විට ඉතිරි පෞද්ගලික මධ්‍යස්ථාන 13ක් වසර 02 කට වැඩි කාලයක් තිස්සේ බලපත්‍ර රහිතව පවත්වා ගෙන ගොස් තිබුණි.

**බදු ඉඩම් අපේක්ෂිත කාර්යයට ප්‍රයෝජනයට නොගැනීම**

2014 අප්‍රේල් 30 දින, තිස් අවුරුදු බදු පදනම මත රු.මිලියන 4.08කට ලබා ගෙන තිබූ හෝමාගම පිටිපන පිහිටි ඉඩමෙහි මත්ද්‍රව්‍ය එන්නත් කරගන්නා පුද්ගලයින් හට ප්‍රතිකාර කිරීමට හා ඔවුන්ව පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා අංක 124/2013 දරන මණ්ඩලීය පත්‍රිකාව මගින් නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගෙන තිබුණි. එසේ වුවද එම ඉඩම

අපේක්ෂිත කාර්යය වෙනුවෙන් යොදා නොගෙන වසර 10ක කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවති අතර ඉඩමට අදාල බදු ඔප්පුව ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

තිස් අවුරුදු බදු පදනම මත ලබාගත් නව දිගන්තය පරිශ්‍රයෙහි ශ්‍රී ලංකා නාවික හමුදා ශ්‍රම දායකත්වය සහ තාක්ෂණික සහයෙන් රු.මිලියන 7.05ක ඇස්තමේන්තු වටිනාකමකට ඉදිකිරීමට සැලසුම් කර තිබූ නව ප්‍රතිකාර සහ පුනරුත්ථාපන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සඳහා 2021 වර්ෂයේදී රු.මිලියන 5ක් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු අතර ගොඩනැගිල්ල අර්ධ වශයෙන් ඉදිකර අතරමඟ නවතා තිබුණි. මෙම ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිමකර භාවිතයට ගැනීම සඳහා රු.මිලියන 7.72ක ඇස්තමේන්තුවක් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් 2024 සැප්තැම්බර් 07 දින මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණද, 2025 මැයි 23 විගණිත දින වනවිටත් එහි වැඩ ආරම්භ කර නොතිබුණි.

**පුනරුත්ථාපන මධ්‍යස්ථාන ඌන උපයෝජනය**

මණ්ඩලයට අයත් නව දිගන්තය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙහි පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් ඉදිකර තිබුණු රු.මිලියන 12.8ක් පමණ වටිනා ගොඩනැගිල්ල හා ජාත්‍යන්තර ආයතනයක ආධාර මත ඉදි කර තිබුණු රු.මිලියන 7.84ක් වටිනා ගොඩනැගිල්ල යන ගොඩනැගිලි 2 හි පුද්ගලයින් 62ක් පුනරුත්ථාපනය කළ හැකි පරිදි සියලු ලී බඩු හා උපකරණවලින් සමන්විතව තිබුණත් 2024 වර්ෂය තුල එම ගොඩනැගිලි ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් පුනරුත්ථාපන කටයුතු සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. මධ්‍යස්ථාන භූමියෙහි පවතින දැනට භාවිතා කරන පැරණි ගොඩනැගිල්ල තුළ පුද්ගලයින් 60ක් පුනරුත්ථාපනය කළ හැකිව පැවතුනද පුද්ගලයින් 12ත් 37 අතර ප්‍රමාණයක් පමණක් පුනරුත්ථාපනය කරනු ලබන බව නිරීක්ෂණය විය.

**කාන්තා පුනරුත්ථාපන මධ්‍යස්ථානය**

2024 වර්ෂය තුලදී රු.මිලියන 11.64ක් වැය කරමින් පවත්වා ගෙන ගොස් තිබුණු තලංගම පිහිටි පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙහි කාන්තා පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් පැවතියද, 2021 වර්ෂයෙන් පසු කිසිදු කාන්තා සේවාලාභියෙකු පුනරුත්ථාපනය කර නොතිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට එම මධ්‍යස්ථානයෙහි අනුයුක්ත කර තිබුණු

කාන්තා නිලධාරීන් සංඛ්‍යාව 09ක් වූ අතර, 2025 වර්ෂය ආරම්භයේදී බඳවා ගත් කාන්තා නිලධාරීන් 07 දෙනෙකුද ඇතුළුව කාන්තා නිළධාරීන් 16ක් එම මධ්‍යස්ථානයට අනුයුක්ත කර තිබුණි.

# දේශීය වෛද්‍ය

## දේශීය වෛද්‍ය අංශය - සෞඛ්‍යය අමාත්‍යාංශය

හෙළ වෙදකමින් සැමට සුවසෙත සැලසීම දේශීය වෛද්‍ය අංශයේ දැක්ම වේ. ශ්‍රී ලාංකීය අනන්‍යතාවය රැකෙන අයුරින් පර්යේෂණ සහ නවීන තාක්‍ෂණය උපයෝගී කර ගනිමින් සමස්ථ ප්‍රජාවට සුවසෙත සලසා මානව ශක්තීන් වර්ධනය කිරීම තුළින් ඔවුන් ජාතික ආර්ථික හා තිරසාර සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා දායක කරවීම ආයතනයේ මෙහෙවර වේ.

මෙම කාර්යන් ඉටු කිරීම සඳහා අමාත්‍යාංශයේ සෘජු අධීක්‍ෂණය යටතේ ආයුර්වේද දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, හෝමියෝපති වෛද්‍ය සභාව සහ හොමියෝපති රෝහල ක්‍රියාත්මකව පවතී.

**ප්‍රතිපාදන හා උපයෝජනය**

සමාලෝචිත වර්ෂය තුළ ඉහත සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ දේශීය වෛද්‍ය අංශයේ මූලධන වියදම් සඳහා රු.මිලියන 26ක් ද, පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 439.89ක් ද, ප්‍රතිපාදනය කර තිබුණු අතර මූලධන ප්‍රතිපාදනවලින් සියයට 59ක් හෙවත් රු.මිලියන 15.56ක් ද, පුනරාවර්තන ප්‍රතිපාදනවලින් සියයට 95.66ක් හෙවත් රු.මිලියන 420.81ක් ද වැය කර තිබුණි. දේශීය වෛද්‍ය අංශය, හෝමියෝපති රෝහල, හෝමියෝපති වෛද්‍ය සභාව සහ රාජ්‍ය අමාත්‍ය කාර්යාලය යන ආයතනවල සාමාන්‍ය පරිපාලනය පවත්වාගෙන යාම හැර දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් ප්‍රමාණවත් දායකත්වයක් දේශීය වෛද්‍ය අංශය මඟින් සිදු වී නොතිබුණි.

**කළමණාකරණ දුර්වලතා**

හෝමියෝපති රෝහල ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රසායනාගාර විද්‍යාඥයෙකු නොමැති වුවද, 2003 වර්ෂයේදී සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් රසායනාගාර විද්‍යාඥයකු සඳහා රසායනාගාර උපකරණ 07ක්, වායු සමීකරණ යන්ත්‍රයක් හා කබඩ් ලබා දී තිබුණි. මෙම උපකරණ වසර 20 කට වැඩි කාලයක් නිශ්කාර්යව පැවතුණි.

**සහාය කාර්ය මණ්ඩලයට ඉන්ධන දීමනා ලබා දීම**

ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද 2022 සැප්තැම්බර් 09 දිනැති අංක PS/CSA/00/1/4/1 දරන රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාරව සහය කාර්ය මණ්ඩලයේ අනෙකුත් නිලධාරීන් සඳහා වාහන 02ක් පමණක් වෙන්කර දිය යුතු බව දක්වා තිබුණද, රාජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලයේ සහාය නිලධාරීන් 04 දෙනෙකු සඳහා 2023 වර්ෂයේදී හා සහාය නිලධාරීන් 05 දෙනෙකු සඳහා 2024 වර්ෂයේදී පිළිවෙලින්

රු.මිලියන 2.42ක් හා රු.මිලියන 2.16ක ඉන්ධන දීමනා ලබාදී තිබුණි.

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

ආයුර්වේද හා දේශීය වෛද්‍ය ක්‍රම තුළින් සැමට සුවසෙත ළඟාකර දීම ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දැක්ම වේ. ආයුර්වේද හා පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය, සංවර්ධනය හා අනන්‍යතාව සුරක්ෂිත කිරීම තුළින් සැමට සුවසෙත ළඟා කර දීම සඳහා ජාතික මට්ටමින් වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම දෙපාර්තමේන්තුවේ මෙහෙවර වේ.

දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඉටු කිරිම සඳහා දෙපාර්තමේන්තුව විසින් ආයුර්වේද ශික්‍ෂණ රෝහල් 4ක් ද, ආයුර්වේද පර්යේෂණ රෝහල් 6ක් ද, ඔසු උයන් 7ක් ද සහ බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනය, දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය සහ ආයුර්වේද වෛද්‍ය සභාව නම් ආයතන 3 ද පවත්වාගෙන ගොස් තිබුණි.

**ශාරීරික සුවතා මධ්‍යස්ථාන ඉදිකිරීම**

ශාරීරික සුවතා මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 100ක ප්‍රතිපාදන වෙන්කරවා ගෙන තිබුණ ද එම කාර්යය ඉටු කර නොතිබුණි. මූලධන වැය විෂයයන් 06ක් සඳහා සලසාගෙන තිබුණු රු.මිලියන 472.50ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 366.60ක් හෙවත් සියයට 29 ත් 85 ත් අතර පරාසයක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.

**පංචකර්ම මධ්‍යස්ථාන නියාමනය**

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව ආයුර්වේද ආරෝග්‍ය ශාලාවක්, ඖෂධ නිෂ්පාදනාගාරයක්, ඖෂධ ශාලාවක් හෝ බෙහෙත් ගබඩාවක් පවත්වාගෙන යාමට ආයුර්වේද කොමසාරිස් විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු වුවද, පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ විධිවිධාන පනතට ඇතුළත් කර නොතිබුණු බැවින් පංචකර්ම වෛද්‍ය ක්‍රම භාවිතය නියාමනය කළ නොහැකිවී තිබුණි.

**අතිකාල දීමනා පාලනය**

2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 (iv) ඡේදය ප්‍රකාරව සියළුම රජයේ ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරිම මඟින් නිලධාරින් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වාර්තා තබාගත යුතු බවට උපදෙස් හා විධිවිධාන නිකුත් කර ඇතත් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයකින් තොරව පැමිණීමේ ලේඛන පමණක් පදනම් කර ගනිමින් සමාලෝචිත වර්ෂයේදී ආයුර්වේද රෝහල් 11 ක

නිලධාරින් 1,614 දෙනෙකුට වැටුප්, අතිකාල හා නිවාඩු දින වැටුප් හා වෙනත් දීමනා ලෙස රු.මිලියන 94.45ක් ගෙවා තිබුණි.

**ආයුර්වේද ප්‍රජා ප්‍රවර්ධන වැඩසටහන**

ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන 2001 වර්ෂයේ සිට 2005 දක්වා නියමු ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර එහි සාර්ථකත්වය අනුව 2005 වර්ෂයේ සිට අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා සේවා ව්‍යාප්ත කළ යුතු වුවද, අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2005 වර්ෂයේ සිට 2021 දක්වා රු.මිලියන 877.2ක් වැය කර තිබුණි. නමුත් 2022 වර්ෂයේ සිට වෙනම එම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන සලසා නොගෙන සංවර්ධන වැඩසටහනේ රෝගී ප්‍රතිකාර සේවා ව්‍යාපෘතිය යටතේ වැටුප්, දීමනා, ගිවිසුම්ගත සේවා ඇතුළු පුනරාවර්තන වියදම් සඳහා පමණක් ප්‍රතිපාදන සලසාගෙන සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් 205දෙනෙකුට වැටුප් දීමනා හා අනෙකුත් වියදම් සඳහා රු.මිලියන 173.7ක් වැයකර තිබුණි. ඒ අනුව අනෙකුත් දිස්ත්‍රික්ක ආවරණය කරමින් ව්‍යාප්ත කිරීමට තරම් සාර්ථකව ක්‍රියාත්මක නොවූ මෙම ව්‍යාපෘතියට අදාළ පුනරාවර්තන වියදම් පමණක් දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් මගින් ආවරණය කරමින් ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන තව දුරටත් පවත්වාගෙන යාමට කටයුතු කිරීම විගණනයේ දී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

**කළමනාකරණ තොරතුරු පද්ධතිය**

ආයුර්වේද දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියම ඇතුළත්වන පරිදි කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) සැකසීම සඳහා 2021 හා 2022 වර්ෂයේදී රු.මිලියන 25 බැගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණු නමුත් එම කාර්යය සමාලෝචිත වර්ෂයේදී ද ඉටුකර නොතිබුණි.

**කාර්යාලීය ගෘහ භාණ්ඩ මිලදී ගැනීම**

කාර්යාලීය ගෘහභාණ්ඩ මිලදී ගැනීමට තාක්ෂණික පිරිවිතරයන්ට අනුකූලතාවය දක්වා ඇති ලංසුකරුවන් දෙදෙනාගෙන් අවම ලංසුව ඉදිරිපත් කරන ලද ආයතනය සතුව නිම කරන ලද භාණ්ඩ නොමැති බවට දුරකථනයෙන් ලබා ගන්නා ලද තොරතුරු මත පදනම්ව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මෙම ලංසුව ප්‍රතික්ෂේප කර

තිබුණි. තාක්ෂණික පිරිවිතරයන්ට අනුව සියලුම භාණ්ඩ සඳහා වසර 03ක වගකීම් කාලයක් අවශ්‍ය බව දක්වා තිබියදී, වසරක හා වසර 02 ක වගකීම් කාලයක් සහිත ආයතන 02 ක් වෙතින් රු.මිලියන 6.06ක් වූ කාර්යාලීය ගෘහභාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. තවද, තාක්ෂණික පිරිවිතරයන්ට අනුව වසර 03ක වගකීම් කාලයක් තිබිය යුතු වුවත් වසරක වගකීම් කාලයක් සහිත හා ලංසු ලේඛන ප්‍රකාරව වානේ ඝණත්වය මි.මි. 0.8 - මි.මි. 0.7ක්වූ Workmen Locker සැපයිය යුතු වුවත් සැපයීමේදී වානේ ඝණත්වය මි.මි. 0.6ක්වූ අඩු වානේ ඝණත්වය සහිත Workmen Locker සපයා තිබුණි.

**බොරැල්ල ආයුර්වේද ජාතික රෝහල ඌන උපයෝජිතව පැවතීම**

2024 වර්ෂයේදී ද බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ නව අට මහල් ගොඩනැගිල්ලේ සාමාන්‍ය වාට්ටු ඇඳන් 288ක ධාරිතාවයෙන් 120ක් හෙවත් සියයට 42ක්ද, රෝහලේ පැරණි සාමාන්‍ය වාට්ටුවල ඇඳන් 274කින් 76ක් හෙවත් සියයට 28ක්ද ඌන උපයෝජිතව පැවැති බවද නවගොඩනැගිල්ලේ නවීන කාමර පහසුකම්වලින් සමන්විත ඇඳන් 88ක ධාරිතාවයෙන් යුක්ත ගෙවන වාට්ටු සියල්ලම සහ පැරණි ගෙවන වාට්ටු 32කින් 08ක් ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

**පර්යේෂණ රෝහල් ක්‍රියාකාරීත්වය**

පාරම්පරික වෛද්‍ය ක්‍රම, බෝ නොවන රෝග නිවාරණ, යුනානි ආයුර්වේද, වකුගඩු රෝග, ආයුර්වේද සාහිත්‍ය, ආයුර්වේද මූලධර්ම, ආයුර්වේද චිකිස්සාව හා ආයුර්වේද ඖෂධ පිළිබඳ පර්යේෂණයන් සිදු කිරීම සඳහා ආයුර්වේද පර්යේෂණ රෝහල් 07ක් ස්ථාපිත කර තිබුණද, නාවින්න ආයුර්වේද පර්යේෂණායතනයේ හැර සියළුම පර්යේෂණ රෝහල්වල ආයුර්වේද පර්යේෂණ වාර්තා, ප්‍රකාශන හෝ නව ඖෂධ හඳුන්වා දීමක් සිදු කර නොතිබුණි.

තවද, ආයුර්වේද පර්යේෂණ රෝහල් 06ක් සඳහා පර්යේෂණ කාර්යය මණ්ඩලයක් අනුමත කරගෙන නොතිබුණු අතර බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණ ආයතනය සඳහා එක් එක් විෂය ක්ෂේත්‍රයට අදාළව පර්යේෂණ නිලධාරි තනතුරු 18ක් හා පර්යේෂණ සහායක තනතුරු 12ක් අනුමත කරගෙන තිබුණද, ඉන් කිසිවෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## ආයුර්වේද වෛද්‍ය සභාව

**සභාවේ ලේකම් පත් කිරීම**

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 111 වන කොටසේ (19) (1) (අ) වගන්තිය ප්‍රකාරව, සභාව විසින් එම සභාවේ ලේකම් වශයෙන්ද කාර්ය මණ්ඩලයේ ප්‍රධාන නිලධාරියා වශයෙන්ද කටයුතු කළ යුතු ලේඛකාධිකාරී වරයෙකු පත්කළ යුතු වුවද, එම තනතුරට ස්ථිර පදනමින් ලේඛකාධිකාරිවරයකු පත්කිරීමට කටයුතු නොකර කොන්ත්‍රාත් පදනමට සහ වැඩ බැලීමේ පදනමට දිගින් දිගටම බඳවා ගැනීම් සිදුකර තිබුණු බැවින් සභාවේ පරිපාලන කටයුතු විධිමත්ව සිදු කිරීමට බාධාකාරී තත්ත්වයක් උද්ගතව පැවැති බව නිරීක්ෂණය විය.

**ආයුර්වේද වෛද්‍යවරුන් නියාමනය**

2014 ඔක්තෝබර් 15 දිනැති අංක 1884/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත ආයුර්වේද වෛද්‍ය සභා රීති ප්‍රකාරව සභාවේ ලියාපදිංචි සියළුම වෛද්‍යවරුන් වර්ෂ 05කට වරක් සිය ලියාපදිංචිය අළුත් කරගත යුතු වුවද 2024 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 05 ඉක්ම වූ වෛද්‍යවරුන් 585ක් ලියාපදිංචිය අළුත් කරගෙන නොතිබුණි.

## ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

**නිෂ්කාර්ය යන්ත්‍ර**

2015 වර්ෂයේදී ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් මිලදීගෙන තිබුණු පිරිවැය රු.මිලියන 20.98ක්වූ යන්ත්‍රෝපකරණ 09ක් සංස්ථාවට බාරදී තිබුණද, එම යන්ත්‍රෝපකරණ තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. එම යන්ත්‍රෝපකරණ 09න් සංස්ථා පරිශ්‍රයෙහි යන්ත්‍ර 05ක් පමණක් පැවතුණ බවත් ඉන් Pharmaceutical Grade Ro Water System යන්ත්‍රය පමණක් භාවිතයට ගනු ලබන අතර විගණිත දිනය වූ 2025 ජුනි 12 දක්වා යන්ත්‍ර 04ක් නිශ්කාර්යව තිබුණි.

**අවිධිමත් බඳවාගැනීම්**

සංස්ථාවේ හිටපු කළමනාකාර අධ්‍යක්ෂක විසින් කළමනාකාර තනතුර 02ක් සඳහා ඉල්ලුම් කරන ලද අයදුම්කරුවන් දෙදෙනෙකුට, ඔහුට අයත් සමාගම් දෙකක සේවය කළ බවට ව්‍යාජ සේවා සහතික ලබා දී තිබුණු අතර අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයකු වශයෙන්ද කටයුතු කර අදාළ තීරණ ගැනීම සඳහාවූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමටද සහභාගී වී අවශ්‍ය සේවා පළපුරුද්ද නොමැති මෙම අයදුම්කරුවන් තෝරා ගැනීමට කටයුතු කර තිබුණි.

**සම්බන්ධිත පාර්ශව පිළිගැටුම්**

සංස්ථාවේ සැපයුම්කරුවෙකුවූ සමාගමක් සහ සංස්ථාවේ හිටපු කළමනාකාර අධ්‍යක්ෂකවරයා අතර සම්බන්ධතාවයක් පවත්නා බව නිරීක්ෂණය වූ බැවින් සහ මෙම කළමනාකරණ අධ්‍යක්ෂවරයා අතර සංස්ථාව සම්බන්ධිත පාර්ශව පිළිගැටුමක් (Conflict of Interest) පවතින බව තහවුරු විය. නාමික සමාගමක් වූ මෙම සමාගමේ නම භාවිතා කර සංස්ථාව වෙත ප්ලාස්ටික් බෝතල් ලබාදීමට මෙම නිළධාරියා කටයුතු කර තිබුණි. සංස්ථාව මෙම නාමික සමාගමෙන් 2023 හා 2024 වර්ෂයන්හි පිළිවෙලින් රු.මිලියන 10.89ක හා රු.මිලියන 23.22ක ද්‍රව්‍ය මිලදීගෙන තිබුණි. සංස්ථාවට ප්ලාස්ටික් බෝතල් සැපයුම සඳහා ලියාපදිංචි සැපයුම්කරුවෙකු නොවූ මෙම සමාගම සැපයුම්කරු ලෙස තෝරාගත් අවස්ථාවලදී අදාළ ප්‍රසම්පාදන කමිටුවලට කළමනාකාර අධ්‍යක්ෂක ද සාමාජිකයෙකු වශයෙන් සහභාගී වී තිබුණි.

**නිෂ්පාදන දිරිදීමනා ගෙවීම**

සංස්ථාව විසින් අඛණ්ඩව විධිමත් අනුමැතියකින් තොරව රු.මිලියන 15 ඉක්මවා වැඩිවන මාසික නිෂ්පාදන පිරිවැය මත පදනම්ව සංස්ථාවේ සියළුම අංශවල සේවකයන්ට මාසිකව රු.මිලියන 02ත් රු.මිලියන 06ත් අතර මුදලක් නිෂ්පාදන දිරිදීමනා වශයෙන් ගෙවා තිබුණි. 2023 වර්ෂයේ රු.මිලියන 82.45ක් වූ මෙම දිරිදීමනා වියදම 2024 වර්ෂයේදී රු.මිලියන 65.98ක් විය. එසේ වුවද, අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා නොගෙන නිෂ්පාදනය කරනු ලබන බොහෝ නිෂ්පාදනයන් ගබඩාව තුළදීම හෝ අලෙවිසැල් තුළ කල් ඉකුත් වීමට ලක්වන අතර 2022 හා 2023 වර්ෂයන්හි එසේ කල් ඉකුත් වූ හා හානිවූ තොග වටිනාකම පිළිවෙලින් රු.මිලියන 12.88ක් හා රු.මිලියන 7ක් වී තිබුණි. ගුණාත්මකභාවය පිළිබඳ දෝෂ හේතුවෙන් ගබඩා වෙත 2023 හා 2024 වර්ෂයන්හි ආපසු භාරදෙන නිෂ්පාදනයන්හි වටිනාකම රු.මිලියන 2.57ක් වී තිබුණි. මේ අනුව, නිෂ්පාදන දිරි දීමනා ගෙවීමේදී සංස්ථාවට ආදායම් උපයාගත නොහැකිවූ ගුණාත්මකභාවය පිළිබඳ දෝෂයන් හා කල් ඉකුත්වූ නිෂ්පාදනයන් සඳහාද දිරි දීමනා ගෙවීමට කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය.

**සංස්ථාවේ නිෂ්පාදන අලෙවිය හා ආදායම**

සංස්ථාවේ සමස්ථ විකුණුම් අදායම් ඇස්තමේන්තුව රු.මිලියන 1,862.51ක් වූ අතර තත්‍ය ආදායම රු.මිලියන 1,519.77ක් විය. තත්‍ය

ආදායමෙන් සියයට 81ක් රාජ්‍ය අංශයෙන් හා සියයට 19ක් පෞද්ගලික අංශයෙන් ලැබී තිබුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී පෞද්ගලික අංශයේ අලෙවි ආදායම සියයට 26 සිට 19 දක්වා අඩුවී තිබුණි. වෙළඳ පොළ අවශ්‍යතා නිසිපරිදි හඳුනා නොගැනීමත්, වෙළඳ පොළ මිලට සාපේක්ෂව විකුණුම් මිල වැඩිවීම, නව ප්‍රචාරණ හා අලෙවි ප්‍රවර්ධන ක්‍රම උපායන් භාවිතා නොකිරීම, විකුණුම් අදායම අඩුවීමට හේතුවී තිබුණු අතර, වෙළඳපොළ මිලට සාපේක්ෂව විකුණුම් මිලකට රාජ්‍ය අංශයට අලෙවි කිරීම තුළින් සංස්ථාව අයුතු ලෙස ආදායම් උපයා තිබුණි. තවද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව මිල කැඳවීමකින් තොරව රාජ්‍ය අංශය විසින් සෘජුව සංස්ථාව වෙතින් පමණක් ඖෂධ මිලදී ගනු ලබන බවත් කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකි බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

**ඒකාබද්ධ පරිගණක මෘදුකාංග පද්ධතිය**

සංස්ථාවේ සෑම අංශයක්ම ආවරණය වන ආකාරයට ඒකාබද්ධ පරිගණක මෘදුකාංග පද්ධතියක් (ERP System) ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 30ක මුදලක් වර්ෂ 05ක කාලයක් සඳහා මාසික රු.මිලියන 0.50 බැගින් ගෙවීමේ ක්‍රමවේදයක් තුළින් පුද්ගලික සමාගමක් වෙත ලංසුව පිරිනමා තිබුණි. සංග්‍රහයේ 5.4.10(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද, ලංසු ලේඛන ප්‍රකාරව මෙම පද්ධතිය සති 28ක කාලයක් තුළ ස්ථාපිත කළයුතු වුවත් මාස 02ක කාල ප්‍රමාදයක් දක්නට වූ අතර විධිමත් ලිඛිත ගිවිසුමකට නොඑළඹීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට නොහැකි වී තිබුණි. පරිගණක මෘදුකාංග පද්ධති ස්ථාපිත කර සේවක පුහුණු කිරීම ලබා දී තිබියදී සංස්ථාව විසින් ආරම්භක ශේෂයන් එම පද්ධතියට ඇතුළත් කිරීමට හා කටයුතු කර නොතිබීමෙන් විගණිත දිනය වූ 2025 අගෝස්තු දක්වා එනම් මාස 09කට ආසන්න කාලයක් එම පද්ධතිය හා මෙම ERP පරිගණක මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කිරීමට මිලදී ගන්නා ලද රු.මිලියන 6.30ක් වටිනා පරිගණක හා අනෙකුත් උපාංග ඒකක 79ක් නිශ්කාර්යව පැවතුණි.

**රස බෙහෙත් නිෂ්පාදනාගාරයක් ඉදිකිරීම**

රෝගීන්ගේ රස බෙහෙත් අවශ්‍යතාවය සපුරාලීමේ හා නිරෝගී සමාජයක් ගොඩ නැගීමේ අරමුණින් රු.මිලියන 45.73 ඇස්තමේන්තු පිරිවැයක් සහිත රස බෙහෙත් නිෂ්පාදනාගාරයක් ඉදිකිරීම,

රු.මිලියන 37.00ක භාණ්ඩාගාර ප්‍රතිපාදන මත 2018 අගෝස්තු 25 දින ආරම්භ කර තිබුණි. 2020 ජනවාරි 02 දක්වා රු.මිලියන 12.14ක් වැය කර ඉදිකිරීම්වලින් සියයට 30ක් නිමකර තිබුණද සැලසුම් හා අධීක්ෂණ දුර්වලතා හේතුවෙන් එදින සිට ඉදිකිරීම් තාවකාලිකව නතර කර තිබුණි. 2025 ජුනි 30 වන විට වසර 06ක් ගතවී තිබුණු නමුත් අදාළ ඉදිකිරීම් නැවත ආරම්භ කර නොතිබුණු අතර එම ව්‍යාපෘතිය වෙනුවෙන් වැයකර තිබූ මුදල අනාර්ථික බවට පත්ව තිබුණි.

# සන්නිවේදන හා මාධ්‍ය

භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස ඇතුළුව නිවැරදි තොරතුරු දැන ගැනීමේ ජනතා අයිතිය තහවුරු කරන තොරතුරු, දැනුම හා මතවාදයන් සමබර සන්නිවේදනයක් සඳහා උචිත ජනමාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම මෙන්ම රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "විනිවිදභාවයෙන් යුතු ජන මාධ්‍ය සංස්කෘතියක් හඳුන්වා දීම" සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ වූ ආයතන දාහතකින් ක්‍රියාත්මක වේ.

## ජනමාධ්‍ය අමාත්‍යාංශය

**ආදායම අහිමිවීම**

ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය 2015 වර්ෂයේදී රු.මිලියන 6.58ක වටිනාකමකට මිලදී ගන්නා ලද ඩී.සී.පී. යන්ත්‍රය 2019 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 තෙක් ක්‍රියාත්මකව නොපැවතීම නිසා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ඉදිකර තිබූ රු.මිලියන 56.5ක වටිනාකමින් යුතු සිනමාශාලාව මේ දක්වා ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබුණි. මේ අනුව මණ්ඩලයට ලැබිය යුතුව තිබූ රු.මිලියන 14.76ක ආදායමක් අහිමි වී තිබුණි.

**අපේක්ෂිත කාර්යයන් ඉටු නොකිරීම**

භෞමික රූපවාහිනි විකාශන අංකිතකරණ ව්‍යාපෘතිය වෙනුවෙන් 2021 වර්ෂයේ සිට 2025 අප්‍රේල් 30 දින දක්වා රු.මිලියන 32.7ක් වියදම් කර තිබුණ අතර මෙම වියදමින් සියයට 99 වැඩි ප්‍රමාණයක් වැටුප් හා වේතන වෙනුවෙන් වැය කර තිබුණ ද අපේක්ෂිත පරිදි කාර්යභාරයන් ඉටු කර නොතිබුණි.

## ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

**ඌන උපයෝජිත ඉඩම්**

සංස්ථාවට අයත් අක්කර 748ක් ඉඩම් භාවිතා නොකර ඌන උපයෝජිතව පවතින අතර කාලීනව තක්සේරු කිරීමක්ද සිදුකර නොතිබුණි.

**ස්වෙච්ඡා විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය**

ආයතනයේ සේවක අවශ්‍යතාවයන් හඳුනා නොගෙන සේවකයින්ට ස්වෙච්ඡා වන්දි ක්‍රමය යටතේ විශ්‍රාම ගැනීමට ඉඩ සැලසීම නිසා අත්‍යවශ්‍ය කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු පවතින අතර ආයතනයේ ක්‍රියාකාරීත්වයට සෘජු බලපෑමක් ඉන් ඇති වී තිබුණි.

## ඉන්ඩිපෙන්ඩන්ට් ටෙලිවිෂන් නෙට්වර්ක් ලිමිටඩ්

**සමාගමේ මූල්‍ය තත්ත්වය**

2015 වර්ෂයේ සමාගමෙහි ස්කන්ධ ප්‍රාග්ධනය රු.මිලියන 3,198ක් වූ අතර, 2023 වර්ෂයේදී රු.මිලියන 490ක් දක්වා අඛණ්ඩව අඩු වී 2024 වර්ෂයේ දී රජයේ මුදල් ප්‍රතිපාදන හේතුවෙන් රු.මිලියන 587ක් දක්වා එය වැඩි වී තිබුණි. සමාගම 2016 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අඛණ්ඩව අලාභ ලබා තිබූ අතර 2024 වර්ෂයේ අලාභය රු.මිලියන 13කි. සමාගම යටතේ පවතින අයිටීඑන්, ලක්හඬ හා වසන්තම් එෆ්එම් හි අලාභයන් පිළිවෙලින් රු.මිලියන 1.9ක්, රු.මිලියන 22.6ක් සහ රු.මිලියන 1.8ක් වී තිබුණි.

## ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

**සංස්ථාවේ මූල්‍ය තත්වය පිරිහීම**

2024 වර්ෂය අවසන් වන විට සංස්ථාවේ ශුද්ධ වත්කම් රු.මිලියන 631ක සෘණ අගයක් වූ අතර 2023 වර්ෂයේ දී එය රු.මිලියන 568ක සෘණ අගයක් ගෙන තිබුණි. 2024 ජනවාරි 01 දිනට රු.මිලියන 1,459.9ක් වූ රඳවාගත් ලාභයේ සෘණ ශේෂය 2024 වර්ෂයේ රු.මිලියන 255ක අලාභය සහ වර්ෂය තුළදී සිදුකරන ලද පෙර වර්ෂ ගැලපුම්වලින් පසුව 2024 වර්ෂය අවසානය වන විට රු.මිලියන 1,763ක සෘණ වටිනාකමක් දක්වා තවදුරටත් පිරිහී තිබුණි. 2023 වර්ෂයේ දී රු.මිලියන 600.8ක සෘණ කාරක ප්‍රාග්ධන තත්ත්වය 2024 වර්ෂයේදී රු.මිලියන 760 දක්වා තවදුරටත් වර්ධනය වී තිබුණි.

**ක්‍රියාකාරී සැලැස්මේ අඩුපාඩු**

සංස්ථාව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද ,එය 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ 7.1 ප්‍රකාරව සංස්ථාවේ කර්තව්‍ය, බලතල හා කාර්යය ඉටු කරගත හැකි ආකාරයට සකස් කර නොතිබුණි. 2024 වර්ෂය වෙනුවෙන් සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි කාල වකවානු අනුව ව්‍යාපෘති කාර්යයන්වල ඇති ව තිබූ ප්‍රමාදය මත අලෙවි කටයුතු සඳහා කාලය ප්‍රමාණවත් නොවීමෙන් 2024 වර්ෂයේ 3, 4 හා 5 ශ්‍රේණිය සඳහා මුද්‍රණය කරන ලද වටිනාකම රු.මිලියන 3.6ක් වූ නැණ මිහිර ප්‍රශ්නෝත්තර පොත් 15,176ක් හා 2024

වර්ෂයට පෙර මුද්‍රණය කරන ලද පොත් 16,662ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් නොවිකිණී ඉතිරිව ගබඩාවේ පැවතුණි.

## සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

**පරිපාලිත සමාගමේ මෙහෙයුම් කටයුතු ආරම්භ නොකිරීම**

1985 වර්ෂයේ දී දේපල සංවර්ධන ව්‍යාපාරයේ නිරතවීම සඳහා ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම ආරම්භ කර තිබුණද, 2017 වර්ෂයේ සිට කිසිදු මෙහෙයුම් ක්‍රියාකාරකමක් සිදුකර නොතිබුණි. තවද, නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීම සඳහා 1985 වර්ෂයේදී මිලදී ගත් 2021 වර්ෂයේදී රු.මිලියන 733කට නැවත තක්සේරු කළ හෝකන්දර ප්‍රදේශයේ පිහිටි අක්කර 8ක ඉඩම මිලදී ගත් දින සිට නිෂ්කාර්යව පැවතුණි.

**ලැබිය යුතු මුදල් අයකර නොගැනීම**

2024 වර්ෂයේදී බාහිර මුද්‍රණ කටයුතු වෙනුවෙන් සමාගමේ වාණිජ මුද්‍රණ අංශයට ලැබිය යුතු රු.මිලියන 25.81ක් ද, පුවත්පත් අලෙවි නියෝජිතයන්ගෙන් ලැබිය යුතු රු.මිලියන 12.12ක් හා නියෝජිතත්වය අහෝසි කල පුවත්පත් නියෝජිතයන්ගෙන් ලැබිය යුතු රු.මිලියන 41.77ක් ද, නීතිමය කටයුතු සඳහා යොමු කල ණයගැතියන්ගෙන් අය විය යුතු රු.මිලියන 75.84ක් ද, සමාගම ග්‍රාහක පදනම මත ලබා දී තිබු පුවත්පත් හා වාර සඟරා සඳහා ලැබිය යුතු රු.මිලියන 14.24ක් හා දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට පුවත්පත් සැපයීම වෙනුවෙන් ලැබිය යුතු රු.මිලියන 2.20ක් ද ලෙස, එකතුව රු.මිලියන 172ක් 2024 වර්ෂය අවසාන වන විටත් අය කරගැනීමට නොහැකිව තිබුණි.

## ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

**පනතට ප්‍රකාරව කාර්යයන් ඉටු නොවීම**

1973 අංක 05 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 8(6) වගන්තිය ප්‍රකාරව පුවත්පත් භාවිතය හා පුවත්පත්වල අවශ්‍යතා පිළිබඳ පර්යේෂණ පැවැත්වීම මණ්ඩලයේ අරමුණක් වුවද 2024 වර්ෂයේ ඊට අදාලව කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි.

උක්ත පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව පුවත්පත් ලියාපදිංචි කිරීම් හා එසේ ලියාපදිංචි කිරීම් වෙනුවෙන් ගාස්තු අයකිරීම සඳහා ද නියෝග සාදන ලැබිය හැකි වුවත් තාක්ෂණික දියුණුවත් සමග e-පුවත්පත් ප්‍රකාශනය ක්‍රමයෙන් වර්ධනය වී ඇති අතර එම පුවත්පත් ලියාපදිංචිය සම්බන්ධයෙන් පනතේ විධිවිධාන සංශෝධනය කර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

## රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

**අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් නියෝග කර ඇති කොන්දේසි සපුරා ගැනීමෙන් තොරව දීමනා ලබා ගැනීම**

1998 ජනවාරි අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් නියෝග කර ඇති කොන්දේසි සපුරාලීමෙන් අනතුරුව වාණිජ මුද්‍රණ දීමනාව ලබා ගැනීමට හැකියාව ඇති නමුත් දෙපාර්තමේන්තුව විසින් මේ දක්වා එම කොන්දේසි ක්‍රියාත්මක කිරීමකින් තොරව අඛණ්ඩව දීමනා ලබා ගෙන තිබුණි. එසේම, එහි නියෝග පරිදි දීමනා ගණනය කිරීම සඳහා පාදක මුදල රු. මිලියන 40 ලෙස දක්වා ඇති නමුත් එම පාදක මුදල 1998 වර්ෂයේ තීරණය කර තිබූ මුදලක් වූ අතර 2024 වර්ෂයට අදාළ වන පරිදි එය වෙනස් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. ඒ අනුව, 2024 වර්ෂයේදී සමස්ත දීමනා ලෙස රු.මිලියන 1,371ක් ගෙවා ඇති අතර එය විධායක ශ්‍රේණියේ නිලධාරීන් සඳහා සිය මූලික මාසික වැටුප මෙන් 49 ගුණයක උපරිමයක් දක්වා ද, අනෙකුත් සියළුම සේවකයින් සඳහා සිය මූලික මාසික වැටුප මෙන් 67 ගුණයක උපරිමයක් දක්වා විවිධ පරාසයන් තුළ දීමනා වශයෙන් ගෙවා තිබුණි.

**වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ලබා දුන් ප්‍රතිපාදන මඟින් දීමනා ලබා ගැනීම**

මැතිවරණ කටයුතු සඳහා දීමනා ගෙවීමේදී ඡන්ද පත්‍රිකා (Ballet) මුද්‍රණය කිරීම වෙනුවෙන් දිනකට පැය 12ක කාලයක් පදනම් කරගෙන එනම් සම්පූර්ණ දිනයම සේවකයාගේ දායකත්වය මත ඡන්ද පත්‍රිකාව මුද්‍රණ කිරීම යන පදනම මත ඡන්ද පත්‍රිකා මුද්‍රණ දීමනාව ගෙවා තිබුණ ද, එම කාලය තුළදී ම වාණිජ මුද්‍රණ කටයුතු ඉටුකිරීම වෙනුවෙන් වාණිජ මුද්‍රණ

දීමනාව ද, මාණ්ඩලික නිලධාරීන්ට ගෙවා තිබුණ අතර මුද්‍රණ කටයුතු ඉටු කිරීම වෙනුවෙන් කැලි ගණන දීමනාවද අනෙකුත් කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි. ඒ අනුව, පූර්ණ කාලීනව එකම කාලයක් තුළ සේවකයින් ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරිය ඉටු කිරීම වෙනුවෙන් හිමි වැටුපද දිනකට පැය 12ක දායකත්වයක් සහිත ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම වෙනුවෙන් (Ballet) මුද්‍රණ දීමනාව ද, එම කාලය තුළදී ම මාණ්ඩලික නිලධාරීන් විසින් වාණිජ මුද්‍රණ දීමනාව ද, අනෙකුත් නිලධාරීන්ට විසින් කැලි ගණන දීමනාව ද ලබාගෙන තිබුණි.

**අවිධිමත් ගනුදෙනු**

දෙපාර්තමේන්තුවේ විශේෂ දීමනා සහ වෙනත් දීමනා ගෙවීම සඳහා අංක 211-01-01-1003 සහ අංක 211-01-02-1003 දරන වැය විෂයන් මඟින් ප්‍රතිපාදන වෙන් කර ඇති අතර දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයෙහි 2024 ජූලි මස කැලි ගණනට දීමනා ලෙස රු.මිලියන 11.24ක මුදලක් අනුමැතියක් නොමැතිව ගෙවීම් කිරීම සඳහා අතිකාල හා නිවාඩු දින වැටුප්වලට අදාළ 211-01-02-1002 යන වැය විෂයේ ප්‍රතිපාදන යොදා ගෙන තිබුණි.

## රාජ්‍ය මුද්‍රණ සංස්ථාව

**දිරි දීමනා යෝජනා ක්‍රමය අනුමත කර ගැනීමකින් තොරව දිරි දීමනා ගෙවීම**

සංස්ථාව විසින් සේවක කාර්ය සාධනය ඇගයීම කළ හැකි පරිදි දිරිදීමනා යෝජනා ක්‍රමය සකසා රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අනුමැතිය ලබාගත යුතු වුවද එසේ අනුමැතියක් නොමැතිව 2023 වර්ෂයේ රු.මිලියන 52.57ක් ද 2024 වර්ෂයේ රු.මිලියන 43.65ක් ද මුදලක් දිරි දීමනා ගෙවා තිබුණි. එයට අතිරේකව 2024 වර්ෂයේ සේවක අභිප්‍රේරණය ඉහළ නැංවීමේ අරමුණින් දිරි දීමනා ලෙස එක් සේවකයෙකුට රු.25,000 බැගින් සේවකයින් 478කට රු.මිලියන 11.95 ක් මුදලක් ගෙවා තිබුණි.

**සැලසුම්කරණයකින් තොරව අභ්‍යාස පොත් මුද්‍රණය කිරීම**

2024 වර්ෂයේ සංස්ථාව විසින් ක්‍රවුන් (crown) අභ්‍යාස පොත නිෂ්පාදනය කර ඇති අතර, මෙම පොත් 200,000 ක් මුද්‍රණය කිරීමට අදාළ කිසිඳු

සැලැස්මක් හෝ වෙළඳපල සමීක්ෂණයක් හෝ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබාගෙන නොතිබුණි. මුද්‍රණය කර තිබූ පොත්වලින් සියයට 27 ක් පමණක් 2024 දෙසැම්බර් 31 දිනට අලෙවි වී තිබුණි. ඒ අනුව 2024 වර්ෂය අවසානයට පිරිවැය රු.මිලියන 6.11ක් වූ පොත් 48,251ක ප්‍රමාණයක් අළෙවි නොකර ගබඩාවේ පැවතුණි.

## තැපැල් දෙපාර්තමේන්තුව

**අතිකාල දීමනා ගෙවීමේදී නිසි තහවුරු කිරීමක් සිදු කර නොගැනීම**

ඇඟිලි සළකුණු යන්ත්‍රයක් සවිකර තිබුණද ඇඟිලි සළකුණු යන්ත්‍රයේ පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සලකා බැලීමකින් තොරව පස්වරු 16.15 ට තැපැල් මූලස්ථානයෙන් පිටත්වන සේවකයින් රාත්‍රී 7, 8, 9, 10 යන වේලාවල්වල රාජකාරී සිදු කළ බව සාවද්‍ය ලෙස දක්වා රු.මිලියන 7.02ක අතිකාල දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි.

ඇඟිලි සළකුණු යන්ත්‍රයක් සවිකර නොතිබියදී මධ්‍යම තැපැල් හුවමාරුවේ 2023 ජනවාරි සිට 2024 මැයි 31 දින දක්වා සේවකයන් 28,403කට රු.මිලියන 651.14ක් ද පාලක (විමර්ශන) කාර්යාලයේ 2020 ජනවාරි 01 දින සිට 2024 මැයි 31 දින දක්වා සේවකයන් 07 කට රු.මිලියන 4.06ක් ද, දිසා ගිණුම් කාර්යාල 14 විසින් 2024 ජනවාරි සිට ජූනි දක්වා රු.මිලියන 373.87ක් ද අතිකාල දීමනා ගෙවා තිබුණි.

**නිෂ්කාර්යය වියදම්**

තැපැල් දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේදී රු.මිලියන 6.55ක් වැය කර Miniature Sheets of Sri Lanka ප්‍රකාශන පිටපත් 500ක් ද සිහිවටන පත්‍රිකා 59,000ක් ද මුද්‍රණය කර තිබුණි. යුරෝ 6,415ක්ද වැයකර සිහිවටන පත්‍රිකා රඳවනද මිලදීගෙන තිබුණි. 2024 මාර්තු 13 විගණන දින වන විටත් කිසිදු ප්‍රකාශනයක් අලෙවි කර නොතිබුණි.

## කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගම

Citrus Leisure PLC සමාගම **සමඟ ගිවිසුම්ගත වීම**

Citrus ගිවිසුම හා එහි ක්‍රියාකාරීත්වය පරීක්ෂාවේදී 2023 මැයි 31 දින සමාගම සහ Citrus Leisure පුද්ගලික සමාගම අතර එළඹි ගිවිසුමේ 8.1

වගන්තිය ප්‍රකාරව දළ ආදායමෙන් සියයට 3.5ක්ද, දළ මෙහෙයුම් ලාභයෙන් සියයට 20ක්ද, ගිවිසුමේ 8.2 වගන්තිය ප්‍රකාරව මුළු කාර්ය මණ්ඩල පිරිවැයෙන් සියයට 10 ක්ද වශයෙන් කළමනාකරණ ගාස්තුවක් ගෙවීමට එකඟ වී තිබුණි. යම්කිසි වර්ෂයක දළ මෙහෙයුම් අලාභයක් ලැබුණු විට ක්‍රියා කරන ආකාරය පිළිබඳ ප්‍රතිපාදන ගිවිසුමට ඇතුළත් වී නොතිබුණු අතර යම්කිසි වර්ෂයක ශුද්ධ අලාභයක් ලැබුවේ නම් එය සමාගම විසින් දරාගත යුතු බවත් විගණනයට නිරීක්ෂණය විය.

## ශ්‍රී ලංකා පදනම

**පාඨමාලා ලියාපදිංචිය නොකිරීම**

1995 සැප්තැම්බර් 07 දිනැති අංක 887/8 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව තෘතීයික හා වෘත්තීය පුහුණු පාඨමාලා පවත්වනු ලබන ආයතන, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) තම ආයතන විසින් පවත්වනු ලබන පාඨමාලා ලියාපදිංචි කර, වාර්ෂිකව ලියාපදිංචිය අළුත් කළ යුතුය. පදනම විසින් 2024 දෙසැම්බර් 31 දින වන විටත් පවත්වාගෙන යනු ලබන පාඨමාලා සඳහා තාවකාලික ලියාපදිංචියක් පමණක් ලබා ගෙන තිබුණි.

## මොබිටෙල් (පුද්ගලික) සමාගම

මොබිටෙල් (පුද්ගලික) සමාගම ශ්‍රී ලංකාවේ ජාතික ජංගම දුරකථන සේවා සපයන්නා වන අතර, ජංගම දුරකථන සේවා, අධිවේගී බ්‍රෝඩ්බෑන්ඩ්, රෝමිං, ව්‍යාපාරික විසඳුම් (enterprise solutions), ජංගම දුරකථන හරහා කෙරෙන මුදල් ගනුදෙනු (M Cash) සහ අනෙකුත් අතිරේක සේවා (VAS) ඇතුළු විශාල සේවා පරාසයකින් යුතු සමාගමකි. 1993 දී ස්ථාපිත වූ සමාගම, 2002 ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී (SLT) සමාගමට, සියයට 100 පූර්ණ අයිතිය සහිත පරිපාලිත සමාගමක් බවට පත්ව තිබුණි.

රු.මිලියන 78.2ක් වූ වසර පහකට වඩා වැඩි කාලයක් පවතින විවිධ සැපයුම්කරුවන්ට ගෙවිය යුතු මුදල් සම්බන්ධව ඉන්වොයිසියන් ලැබී ඇති නමුත් 2024 දෙසැම්බර් 31 දිනට ගෙවීම් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය.

**රූපසටහන 2.11 - වසර 05කට වැඩි කාලයක් සැපයුම්කරුවන්ට ගෙවීමට ඇති මුදල්**




| | |
|---|---|
| **වාහන අපහරණය කිරීම** | සමාලෝචිත වරෂයේදී සමාගම විසින් ලැන්ඩ් රෝවර් රථයක්, බවුසරයක් සහ ටේලර් ත්‍රිත්වයක් අපහරණය කර තිබුණි. අදාල වත්කම් බැහැර කිරීමට අදාල නිසි අනුමැතිය ලැබී මාස 5කට වැඩි කාලයක් අදාල ඉවත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට ගත කර තිබීමෙන් හා අදාල වත්කම් තක්සේරු වටිනාකමට වඩා අඩුවෙන් විකිනීමට සිදුවීමෙන් රු.මිලියන 4.9ක අලාභයක් සමාගමට සිදුවී තිබුණි. |
| **වාහන ඇණිය කළමනාකරණය** | වටිනාකම රු.මිලියන 16.68ක් වූ ජංගම දුරකථන සංඥා ගුණාත්මක භාවය පරීක්ෂා කිරීමට භාවිත කරන ඩීටී ටූල්ස් නැමැති විශේෂ උපකරණයක් සවිකර ඇති වෑන් රථය අදාල කාරණය සඳහා පමණක් භාවිත කිරීමකින් තොරව සංචිත වාහනයක් ලෙසද භාවිත කිරීමෙන් අදාල උපකරණය අනාරක්ෂිත වී තිබුණි. |
| **මෙහෙයුම් ප්‍රතිඵලය** | සමාලෝචිත වසර සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 1,877 ලාභයක් ලෙස වාර්තා වූ අතර, පෙර වසරේ එය රු.මිලියන 1,825 අලාභයක් විය. ඒ අනුව මූල්‍ය කාරයක්ෂමතාවය රු.මිලියන 3,702ක වර්ධනයක් පෙන්වයි. මෙම මූල්‍ය ප්‍රතිඵලය වැඩිවීමට බලපෑ ප්‍රධාන හේතු වන්නේ පාරිභෝගිකයන් සමඟ ඇති වූ ගිවිසුම් මඟින් ලැබුණු ආදායම් රු. මිලියන 3,144කින් ඉහළ යාමයි. |

රූපසටහන 2.12 - වසර 05කට වැඩි කාලයක් සැපයුම්කරුවන්ට ගෙවීමට ඇති මුදල්



# විදේශ කටයුතු

ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ නියමුවා ලෙස ලොව සියලුම රටවල් සමඟ මිත්‍රශීලී සබඳතා පවත්වා ගනිමින් ජාත්‍යන්තර ප්‍රජාව තුළ වගකීම දරන රටක් බවට පත්වීම සඳහා ශ්‍රී ලංකා රජයේ විදේශ ප්‍රතිපත්තියට අනුකූලව ශ්‍රී ලාංකීය ජාතික අභිලාෂයන් ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම, විදහා දැක්වීම, සුරක්ෂා කිරීම, සහ ශ්‍රී ලාංකේය ජාතික අභිලාෂයන්ට අනුකූලව ජාත්‍යන්තර සබඳතා කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම අමාත්‍යාංශයේ මෙහෙවර වේ.

ඉහත මෙහෙවර ඉටුකිරීම සඳහා විදේශීය වශයෙන් මහකොමසාරිස් කාර්යාල 12ක්, තානාපති කාර්යාල 36ක්, එක්සත් ජාතීන්ගේ නිත්‍ය දූතමණ්ඩල 2ක්, නියෝජ්‍ය මහකොමසාරිස් කාර්යාල 1ක්, කොන්සල් ජනරාල් කාර්යාල 10ක් හා නියෝජිත කාර්යාල 1ක් වශයෙන් ගෝලීයව ව්‍යාප්ත වී ඇති විදේශ දූතමණ්ඩල 62කින් සමන්විත ජාලයක් පවත්වාගෙන යනු ලබයි. ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය ද මෙම අමාත්‍යාංශය මගින් අධීක්ෂණය කරනු ලබයි.

ඉහත සඳහන් කාර්යභාර්‍ය ඉටුකිරීම සඳහා 2024 වර්ෂයේ දී විදේශ කටයුතු අමාත්‍යාංශයට රු.මිලියන 19,612ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 16,972ක් පමණක් උපයෝජනයකර තිබුණි.

## විගණන නිරීක්ෂණ

**විදේශයන්හී මියගිය / ආපදාවන්ට ලක් වූ ශ්‍රී ලාංකිකයන්ට හිමි වන්දි මුදල් ගෙවීම**

විදේශ රටවල දී සිදු වූ අනතුරු හා මියයෑම් වෙනුවෙන් වන්දි නොගෙවන ලද 2014 වර්ෂයට පෙර සිට පැවත එන ලිපිගොනු 340ක් හා 2015 සිට 2023 කාලපරිච්ඡේදයට අදාළ ලිපිගොනු 1,435ක් වැඩ අවසන් නොකළ වන්දි ලිපිගොනු ලෙස කොන්සියුලර් අංශයේ පැවතුණි.

**අග්‍රිම නිරවුල් නොකිරීම**

විදේශ කටයුතු අමාත්‍යාංශයේ අග්‍රිම ගිණුම් දෙකක් පැවති අතර, ඒවායෙහි පිළිවෙලින් රු.මිලියන 25.89ක් හා රු.මිලියන 1399.84ක් වශයෙන් එකතුව රු.මිලියන 1425.73ක ශේෂයක් පැවතුණි.

i. රු.මිලියන 25.89ක් වූ අග්‍රිම ශේෂය 2013 වර්ෂය හා ඊට පෙර වර්ෂවලට අදාළව නොපිය වූ උපඅග්‍රිම ශේෂයක් වන අතර, එම ශේෂයෙන් රු.මිලියන 13.15ක් අවස්ථා 22ක දී විදේශ දූත මණ්ඩල

සේවය සඳහා විදේශගත වූ කාර්යමණ්ඩලයට ලබාදෙන ලද භාවිතයට නොගන්නා නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු ද, රු.මිලියන 10.5ක් අවස්ථා 26ක දී වෙනත් කාර්යයන් සඳහා ලබාදුන් උප අග්‍රිම ද රු.මිලියන 2.23ක් වසා දමන ලද ෆැන්ක්ෆර්ට් දූත මණ්ඩලයට අදාළ නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු ද විය.

**රූප සටහන 2.13 - විදේශ කටයුතු අමාත්‍යාංශයේ අග්‍රිම ගිණුම 7002-0-0-35-13**




**මූලාශ්‍රය - විදේශ කටයුතු අමාත්‍යාංශය**

ii. රු.මිලියන 1399.84ක ශේෂයක් පවතින අනෙක් අග්‍රිම ගිණුමේ විදේශ දූතමණ්ඩල සේවය සඳහා විදේශගත වූ කාර්යමණ්ඩලයට ලබාදෙන ලද නොපියවූ උපඅග්‍රිම ශේෂය රු.මිලියන 420.75ක් විය. ඉන් රු.මිලියන 349.33ක් දූතමණ්ඩල කාර්යමණ්ඩලය පදිංචි නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු ද රු.මිලියන 57.90ක්

දූතමණ්ඩල කාර්යමණ්ඩල පදිංචි වී නොමැති නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු ද රු.මිලියන 9.13ක් වසාදමන ලද දූත මණ්ඩල තුනකට අදාළ නිවාස සඳහා තබා තිබූ ආරක්ෂිත තැන්පතු ද රු.මිලියන 4.37ක් අනෙකුත් නොපිය වූ උපඅග්‍රිම ශේෂයක් ද විය.

**රූපසටහන 2.14 - විදේශ කටයුතු අමාත්‍යාංශයේ අග්‍රිම ගිණුම 7002-0-01-35-24**




**මූලාශ්‍රය - විදේශ කටයුතු අමාත්‍යාංශය**

# විදේශ රැකියා

ශ්‍රී ලංකාව ස්වභාවික සම්පත් බහුල රටක් වුවද විදේශ වෙළඳපලේ අනම්‍ය ඉල්ලුමක් සහිත නිෂ්පාදන සඳහා වූ තාක්ෂණික හා ප්‍රාග්ධන ඌනතාවය නිසා තවදුරටත් ප්‍රාථමික භාණ්ඩ අපනයනය කරන රටක තත්ත්වයේ රැඳී සිටීමට සිදු වී ඇත. සීමිත ජල විදුලි බල ශක්තීන් හැර අනෙකුත් සියලුම බල ශක්ති අවශ්‍යතා සඳහා විදේශ වෙළඳපල වෙත යාමට සිදු වීම මගින් රටේ ආනයන අපනයන පරතරය දිගින් දිගටම අවාසිදායක තත්ත්වයක පැවතුණි. මෙම තත්ත්වයෙන් ජයගැනීම සඳහා හොඳම විසඳුම අනම්‍ය ඉල්ලුමක් සහිත විදේශ ශ්‍රම වෙළඳපලක් බිහි කිරීම වන අතර ඒ සඳහා සුදුසු විදේශ පුහුණු ශ්‍රම බලකායක් බිහි කළ යුතුය. මෙම අවශ්‍යතාවය ඉටු කිරීම සඳහා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ අධීක්ෂණය හා මෙහෙයවීම යටතේ, විදේශ රැකියා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ රජයේ කාර්යභාරය ඉටුකිරීමේ ප්‍රමුඛතම ආයතනය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වන අතර පහත සඳහන් ආයතනික ව්‍යුහය මගින් එහි සේවාව පුළුල් කර තිබුණි.

- විදේශ දූත මණ්ඩල 15 ක කම්කරු සුභසාධන අංශ පිහිටුවා තිබීම.
- විදේශ රැකියා සඳහා පිටත්ව ගොස් විවිධ ගැටළු වලට මුහුණ දුන් විගමනිකයන් තාවකාලිකව රඳවා ගැනීම සඳහා රැඳවුම් නිවාස 05 ක් මෙම සුභසාධන අංශ යටතේ පවත්වාගෙන යාම.
- විගමනික ශ්‍රමිකයන් හුරුකිරීමේ සහ පුහුණු කිරීමේ කටයුතු වෙනුවෙන් දිවයින පුරා පුහුණු මධ්‍යස්ථාන 10 ක් පවත්වා ගෙන යාම.
- විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රාදේශිය කාර්යාල 09 ක් ස්ථාපිත කර තිබීම.

2024 වර්ෂය තුළ කාර්යාංශය විසින් තම සේවාව තුළින් එකතුව රු. මිලියන 10,639ක ආදායමක් උපයා තිබුණු අතර මුළු වියදම රු. මිලියන 3,726ක් වී තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට කාර්යාංශය සතු මුළු ආයෝජන වටිනාකම රු. මිලියන 22,200 ක් වී තිබුණි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ තොරතුරු අනුව 2024 වර්ෂයේ කාර්යාංශයේ ලියාපදිංචි වී රැකියා සඳහා පිටත්ව ගිය සංඛ්‍යාව 314,786 ක් වී තිබුණි.

**පිරිමි: 186,674 (59.30%)**

**කාන්තා: 128,112 (40.70%)**

වගු අංක 2.21 - 2024 වර්ෂයේ කාර්යාංශයේ ලියාපදිංචි වී රැකියා සඳහා පිටත්ව ගිය සංඛ්‍යාව

| පුහුණු | | | | අර්ධ පුහුණු | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| පිරිමි | කාන්තා | එකතුව | % | පිරිමි | කාන්තා | එකතුව | % | |
| 127,928 | 116,539 | 244,467 | 77.66 | 58,746 | 11,573 | 70,319 | 22.34 | 314,786 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ තොරතුරු

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය හා ඒ යටතේ වන ව්‍යවස්ථාපිත ආයතන විසින් විදේශ රැකියා අංශයට අදාළ කාර්යය හා කර්තව්‍ය ඉටුකිරීම සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

**විගමණික ශ්‍රමිකයින් වෙත ගෙවිය යුතු මුදල් නොගෙවීම**

2008 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළදී විගමණික ශ්‍රමිකයින් වෙත ගෙවීම සඳහා රක්ෂණ ආවරණ ප්‍රතිලාභ හා වෙනත් ප්‍රේෂණ ලෙස විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත ලද රු.මිලියන 72.72ක් අදාළ කාලය තුළ ගෙවීමට කටයුතු නොකර 2023 වර්ෂයේදී කාර්යාංශයේ ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි. තවද, 2019 සිට 2024 දක්වා කාලයට අදාළව විගමණික ශ්‍රමිකයින් වෙත ගෙවීම සඳහා ලද රු.මිලියන 78.34ක මුදලක්ද ගෙවීමට 2024 දෙසැම්බර් 31 දක්වා කටයුතු කර නොතිබුණි.

**ඊශ්‍රායල් විගමණික ශ්‍රමිකයින්ගෙන් වැඩියෙන් මුදල් අය කිරීම**

ඊශ්‍රායල් රාජ්‍යය වෙත ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රැකියා සඳහා 2024 අප්‍රේල් 04 සිට අගෝස්තු 13 දින දක්වා කාලය තුළ විදේශගත වීමට අයදුම් කර තිබූ 1,125 දෙනෙකුගෙන් බඳවා ගැනීමේ ගාස්තු ලෙස එ.ජ.ඩොලර් 1,000 ක ට සමාන රු.311,000 බැගින්වූ මුදලක් අයකරගෙන තිබුණද, ඊශ්‍රායල් රජය හා ශ්‍රී ලංකා රජය අතර අත්සන් කරන ලද සංශෝධිත ගිවිසුම අනුව, අයකළ යුතු මුදල එ.ජ.ඩොලර් 502කට සමාන රු.154,000 ක් වීම හේතුවෙන් රු.මිලියන 176.25 වැඩියෙන් අයකර තිබූ අතර එම මුදල් කාර්යාංශය විසින් රඳවාගෙන තිබුණි.

**ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් නොවූ වැඩ සටහන්**

**(i) පිළිකා රෝගීන් සඳහා ඖෂධ හා උපකරණ මිලදී ගැනීම**

විදේශගතව සිටින ශ්‍රමිකයින්ගේ පවුල්වල සාමාජිකයින් අතර හා විදේශගතව සිට ආපසු මෙරටට පැමිණ ඇති ශ්‍රමිකයින් අතර පිළිකා රෝගවලින් පෙළෙන අය සිටිය හැකි බැවින් 2023 පෙබරවාරි 04 දිනට යෙදන ජාත්‍යන්තර පිළිකා දිනය නිමිතිකොට ගෙන රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා අත්‍යාවශ්‍ය ඖෂධ හා උපකරණ මිලදී ගැනීම සඳහා වැඩපිළිවෙලක් සකස් කරන ලෙස අමාත්‍යවරයා විසින් 2022 දෙසැම්බර් 23 දින ඉල්ලීමක් කර තිබුණි. ඒ අනුව, 2023 ජනවාරි 20 දින ගනු ලැබූ විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මගින් 2023 ජනවාරි 23 දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සංවර්ධන අරමුදල වෙත රු. මිලියන 100ක් ලබා දී තිබුණි. එහෙත් එම මුදල් අදාළ ඖෂධ හා උපකරණ මිලදී ගැනීමට යෙදවුයේද යන්න තහවුරු කරගෙන නොතිබුණි.

**(ii) ‘‘ජයගමු ශ්‍රී ලංකා ’’ වැඩසටහන සඳහා වැය කිරීම්**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයට අනුබද්ධිත සියලුම ආයතන විසින් සපයනු ලබන සේවාවන්, ජංගම සේවා මාලාවක් ලෙස ‘‘ජයගමු ශ්‍රී ලංකා (Glocal fair) ’’ නමින් 2024 ජනවාරි 31 දින සිට ජූලි 28 දින දක්වා දිස්ත්‍රික්ක 24ක් ආවරණය කරමින් වැඩසටහන් මාලාවක් පවත්වා තිබූ අතර ඒ සඳහා කාර්යාංශය විසින් රු. මිලියන 1,259.75ක් වැයකර තිබුණි. ඒ තුළ විගමණික ශ්‍රමිකයින්ගේ සුභසාධන කටයුතු සඳහා දරන ලද රු.මිලියන 257.02ක් ඇතුළත් වී තිබුණු අතර, කාර්යාංශයේ සෘජු අරමුණුවලින් බැහැරව වෙළදකුටි මිලදී ගැනීම, ස්මාර්ට් බෝඩ් මිලදී ගැනීම, සහභාගිවූවන් සඳහා සංග්‍රහ වියදම් හා මාධ්‍ය ප්‍රචාරණ කටයුතු ආදිය සඳහා වැය කරන ලද රු.මිලියන 1,002.72 ක් ද මේ තුළ ඇතුළත් වී තිබුණි. විදේශ රැකියා නියෝජිතායතන වෙත වෙළද කුටි මිලදී ගැනීම සඳහා කාර්යාංශයේ සෙස් බදු ආදායම් අරමුදල් භාවිතා කර එක් වෙළද කුටියක් රු.500,000 බැගින් වැඩසටහන් 24 ක් සඳහා කුටි 920 ක් ලබා ගැනීම වෙනුවෙන් රු.මිලියන 542.8 ක් එක් පුද්ගලික ආයතනයක් වෙත ගෙවීම් කර තිබුණු අතර විදේශ රැකියා නියෝජිතායතන 115 ක් පමණක් මෙම වැඩසටහනට සම්බන්ධ වී තිබුණි. වැඩසටහනට සම්බන්ධ

වූ නියෝජිතායතන 28 ක් මගින් 2024 ජූලි 31 දින සිට 2025 අප්‍රේල් 30 දින දක්වා කාලය තුළ ශ්‍රමිකයින් 840 දෙනෙකු පමණක් විදේශ ගත කර තිබූ අතර නියෝජිතායතන 87 ක් මඟින් කිසිවකු විදේශගත කර නොතිබුණු බවද නිරීක්ෂණය විය. ඒ අනුව විදේශීය ශ්‍රම වෙළඳපොල වෙත ශ්‍රමිකයින් යොමු කිරීම ප්‍රවර්ධනය සඳහා මෙම වැඩ සටහන් පවත්වා තිබුණද, දරන ලද වියදමට සාපේක්ෂව එම අරමුණ ඉටු කර ගත නොහැකිව තිබුණු බව නිරීක්ෂණය විය. තවද, දීපව්‍යාප්තව ක්‍රියාත්මක කළ මෙම වැඩසටහන් සඳහා සමස්ත නියෝජිත ආයතන 1019 නියෝජනය වන පරිදි නියෝජිත ආයතන තෝරා ගැනීමේ ක්‍රමවේදයක් භාවිතා කර නොතිබූ අතර කාර්යාංශය විසින් අයදුම්පත් කැඳවා මුලින් ඉල්ලුම්කළ නියෝජිත ආයතන අනුපිළිවෙල අනුව තෝරා ගැනීම් සිදුකිරීම හේතුවෙන් ආයතන 48 ක් වැඩසටහන් 5 ත් 19ත් අතර හා නියෝජිත ආයතන 11ක් වැඩසටහන් 20 ත් 24 ත් අතර සංඛ්‍යාවකට සහභාගි වී තිබුණි. එම නියෝජිත ආයතන 11 න් 4 ක්ම කාර්යංශයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුට අයත් ආයතන වී තිබුණි.

**(iii) ශ්‍රමික සුභසාධනය වැඩ සටහන් සඳහා අමාත්‍යාංශය වෙත මුදල් ලබා දීම්**

විදෙස් ගත සේවය අවසන් කර පැමිණ තිබූ ශ්‍රමිකයින්ගේ සුභසාධන කටයුතු සිදු කිරීම සඳහා කාර්යාංශයේ පවතින ප්‍රතිසංවිධාන අංශය මගින් 2024 වාර්ෂික ක්‍රියාකාරි සැළැස්මට අනුව වැඩසටහන් 04 ක් සඳහා රු.මිලියන 44.04ක් වැය කර ප්‍රතිලාභ ලබාදී තිබුණි. එසේ තිබියදී මෙම අරමුණ සඳහාම කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශය මගින් “විගමණික හරසර” නමින් පළාත් මට්ටමේ රැස්වීම් 03 ක් පැවැත්වීම සඳහා ජේ්‍යෂ්ඨ අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීමකට අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත රු.මිලියන 62.75ක් අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණද, එමගින් විදෙස් ගත සේවය අවසන් කර පැමිණ තිබූ ශ්‍රමිකයින් වෙත ලබා දී තිබූ ඍජු සුභසාධන කටයුතු නිශ්චිතව හඳුනාගත නොහැකි විය. තවද, අදාළ මුදල් ජනාධිපතිතුමාගේ, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යවරයාගේ සහ කම්කරු හා විදේශ රැකියා රාජ්‍ය අමාත්‍යවරයාගේ සුබපැතුම් 3 ක් ඇතුළත් ලිපිගොනු 15,000 ක් මුද්‍රණය සඳහා රු. මිලියන 1.93ක් ද, ශ්‍රමිකයන් ප්‍රවාහනය සඳහා රු.මිලියන 8.23ක්ද , ආහාරපාන

සඳහා රු. මිලියන 14.85ක්ද සහ රැස්වීම පැවැත්වීමට ශාලාවක් සකස් කිරීම හා වෙනත් වියදම් සඳහා රු. මිලියන 37.73ක් ද වශයෙන් වැයකර තිබුණි.

**(iv) Smart Youth වැඩසටහන**

රැකියා වෙළෙඳපොළ පිළිබඳව හා දේශීය සහ විදේශීය රැකියා අවස්ථා පිළිබඳ තොරතුරු ලබා දීමේ අරමුණින් කාර්යාංශය විසින් 2024 ජනවාරි 31 දින සිට ජූලි 28 දින දක්වා දිස්ත්‍රික්ක 25ක ජයගමු ශ්‍රී ලංකා නමින් දින දෙකක වැඩසටහන් සතිපතා ක්‍රියාත්මක කර තිබුණි. මේ අතර එම අරමුණ සඳහාම එම කාලය තුළ ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් පැවැත්වීමට සැලසුම් කළ Smart Youth දිස්ත්‍රික් වැඩසටහන් 15 ක් සඳහා සහභාගී වීමට රු.මිලියන 9.4ක් වැය කිරීමට කාර්යාංශය විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව ගාල්ල සහ කුලියාපිටිය යන ප්‍රදේශයන්හි 2024 ජූනි හා ජූලි මාසවලදී පවත්වා තිබූ දෙදින වැඩසටහන් දෙකක් සඳහා සහභාගි වී තිබූ අතර රු. මිලියන 3.19 ක් වැය කර තිබුණි.

**සුභසාධක අරමුදල් නිෂ්කාර්යව වැයකිරීම**

ප්‍රථම වරට විදේශගතවන ගෘහ සේවිකාවන්ට රු.10,000ක් වටිනා සතොස වවුචර් පත් ලබාදීම සඳහා 2023 ඔක්තෝබර් 18 දින රු.මිලියන 138.6 කට වවුචර් පත් 14,000ක් මිලදීගෙන තිබූ අතර 2025 මැයි 07 දින වන විටත් එම වවුචර්පත්වලින් රු.මිලියන 25.25ක් වටිනා වවුචර්පත් ප්‍රධාන කාර්යාලයේ ඉතිරිවී තිබුණි. රු. මිලියන 52.37ක් වටිනා වවුචර්පත් 5,237 ක් විදේශගතවූ ගෘහ සේවිකාවන්ගේ පවුල් වෙත බෙදා දීම සඳහා හඳුනාගෙන තිබුණද, ගෘහ සේවිකාවන්ගේ නිවැරදි තොරතුරු කාර්යාංශයේ දත්ත පද්ධතිය තුළ ඇතුළත් කර නොතිබීම හේතුවෙන් පළාත් කාර්යාලවලට ලබා දී තිබූ වවුචර්පත් එම කාර්යාල තුළ පැවතුණි. ඒ අනුව වවුචර්පත් මිලදීගෙන මාස 20 කට අධික කාලයක් ගතව තිබුණද රු.මිලියන 77.62ක් වටිනා වවුචර්පත් ප්‍රතිලාභීන් වෙත බෙදා දීමට නොහැකි වී තිබීම හේතුවෙන් මෙම මුදල වෙනත් ආයෝජනයක යෙදවීමෙන් උපයාගත හැකිව තිබූ ආදායම සුභසාධක අරමුදලට අහිමි වී තිබුණි.

**විදේශ දූත මණ්ඩල සේවයට එකම අවස්ථාවක බඳවා ගැනීමේ පටිපාටි දෙකක් අනුව බඳවා ගැනීම**

1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 14 (1) වගන්තිය අනුව ''කාර්යාංශයේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ලිඛිත විධාන දෙනු ලැබිය හැකිය යන වගන්තිය යටතේ 2023 මාර්තු 08 දින ලබාගෙන තිබූ අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව 2023 අප්‍රේල් 06 දින විදේශ දූත මණ්ඩල සේවයේ තනතුරු සඳහා පැරණි බඳවා ගැනීමේ පටිපාටිය අනුව අයදුම්පත් කැඳවා තිබුණි. එම අවස්ථාවේදී අයදුම්කළ බාහිර අයදුම්කරුවන්ගෙන් පිරිසක් නියමිත සුදුසුකම් සපුරා නොතිබුණි. කෙසේ වුවද, විෂයභාර අමාත්‍යවරයා විසින් නව බඳවා ගැනීමේ පටිපාටිය අනුව එම පුරප්පාඩු සඳහාම නැවත වරක් බාහිර අයදුම්කරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවන ලෙස 2023 සැප්තැම්බර් 07 දින කාර්යාංශයේ වැඩබලන සභාපති වෙත අමාත්‍ය මණ්ඩල අනුමැතියට පටහැනිව නැවතත් ලිඛිත නියෝගයක් ලබාදී තිබුණි. ඒ අනුව පැරණි බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා නොමැති 08 දෙනෙකු ඇතුළුව බාහිර අයදුම්කරුවන් 14 දෙනෙකු හා පැරණි බඳවා ගැනීමේ පටිපාටිය අනුව තෝරා ගන්නා ලද 19 දෙනෙකු ඇතුලු බාහිර අයදුම්කරුවන් 33 දෙනෙකු අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුකූල නොවන ලෙස කාර්යාංශය විසින් බඳවා ගෙන තිබුණි. කෙසේ වුවද, විදේශ දූත මණ්ඩල සේවයේ යොදවා තිබූ මෙම නිලධාරීන්ගෙන් නිලධාරීන් 25 දෙනෙකු 2025 අගෝස්තු 15 දින වන විට ආපසු කැඳවා තිබූ බව නිරීක්ෂණය විය.

## ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගම

**සමාගම පිහිටුවීමේ අරමුණු ඉටුවී නොතිබීම**

රජයේ පූර්ණ හිමිකාරිත්වය ඇතිව ආරම්භ කර තිබූ මෙම විදේශ රැකියා ඒජන්සි සමාගම මගින් රජයේ සුරක්ෂිතතාවය මත සාපේක්ෂව අඩු පිරිවැයකින් සහ සීමාවකින් තොරව ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් රැකියා සඳහා යොමු කිරීමේ හැකියාව පැවතුණි. එහෙත් 2023 හා 2024 වර්ෂ වලදී පිළිවෙලින් ලැබී තිබුණු රැකියා ඇබෑර්තු සංඛ්‍යාව 2100 ක් හා 2556 ක් වූ අතර, විදේශගත කර තිබූ සංඛ්‍යාව පිළිවෙලින් 460 ක් හා 419 ක්

පමණක් වී තිබුණි. බාහිර පාර්ශ්වයන් මාර්ගයෙන් රැකියාවන් සොයා ගන්නා ලද ශ්‍රමිකයින් සමාගම මඟින් කාර්යාංශයේ ලියාපදිංචි කර විදේශගත කර තිබූ අතර. එම සංඛ්‍යාව පිළිවෙලින් 203ක් හා 114ක් විය. ඒ අනුව මෙම සමාගම උපරිම කාර්යක්ෂමතාවයකින් තම කාර්යය ඉටු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා නිෂ්කාර්ය වැය කිරීම්**

විදේශ රැකියා අවස්ථා නංවාලීම සඳහා “Glocal fair” (ජයගමු ශ්‍රී ලංකා) නම් වූ දීපව්‍යාප්ත වැඩසටහන 2024 ජනවාරි 31 දින සිට 2024 ජූලි 28 දින දක්වා දිස්ත්‍රික්ක 24 ක් ආවරණය කරමින් පවත්වා තිබුණි .එම වැඩසටහන් 24 ටම සහභාගී වීම සඳහා කාර්යාංශය විසින් රු.මිලියන 12 ක් වැය කර විදේශ සේවා නියුක්ති ඒජන්සි සමාගමට අවස්ථාව ලබාදී තිබුණු අතර, එම සමාගම විසින්ද ඒ සඳහා රු. මිලියන 1.35ක් වැය කර වැඩසටහන් 24කට සහභාගි වී තිබුණි. එහෙත් 2024 අගෝස්තු 01 දින සිට 2025 අප්‍රේල් 30 දින දක්වා කාලය තුළ විදේශගත කර තිබූ ශ්‍රමිකයින් සංඛ්‍යාව 13 ක් තරම් ඉතා අඩු සංඛ්‍යාවක් වී තිබුණි.

**අවලංගු වූ රැකියා ගිවිසුමක් භාවිතා කර සයිප්‍රස් රාජ්‍ය වෙත ශ්‍රමිකයින් විදේශගත කිරීම.**

2018 වර්ෂයේදී සයිප්‍රස් රාජ්‍යයෙන් ලැබී තිබූ රැකියා ඇණවුමෙහි වලංගු කාලය 2020 නොවැම්බර් 08 දින අවසන් වී තිබුණු නමුත් 2024 ඔක්තෝබර් දක්වා කාර්යාංශය විසින් ඒකපාර්ශවිකව රැකියා ඇණවුම දීර්ඝ කිරීමක් සිදුකර තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව ශ්‍රමිකයින් විසින් පෞද්ගලිකව සොයා ගන්නා ලද සයිප්‍රස් රාජ්‍යයේ රැකියා සඳහා කාර්යාංශයේ සෘජුවම ලියාපදිංචි කිරීම වෙනුවට අදාළ වීසා බලපත්‍රය ඒජන්සි සමාගම වෙත ගෙන්වාගෙන ශ්‍රමිකයකුගෙන් ඒ සඳහා රු.35,000ක් බැගින් 53 දෙනෙකුගෙන් රු.මිලියන 1.855 ක පරිපාලන ගාස්තුවක් අයකර කාර්යාංශයේ ස්වයං ලියාපදිංචිය (Self-Registration) සඳහා යොමුකර තිබුණි. ශ්‍රමිකයන් විසින් පෞද්ගලිකව සොයා ගන්නා ලද සයිප්‍රසයේ රැකියා සඳහා ශ්‍රමිකයකුගෙන් රු.35,000ක් පරිපාලන ගාස්තුවක් අය කිරීම මතභේදයට තුඩුදෙන කරුණක් වේ.

**විගමණික ශ්‍රමිකයින් වෙත ගෙවිය යුතු මුදල් නොගෙවීම**

දකුණු කොරියාව බලා යාම සඳහා නැවත ගෙවීමේ ගාස්තුවක් ලෙස 2006 වර්ෂයේ සිට එක් අයෙකුගෙන් රු.50,000ක් බැගින් අයකරගෙන

තිබූ අතර 2024 දෙසැම්බර් 31 දිනට එසේ අයකල මුදල් ශේෂය රු.මිලියන 15.26ක්ව පැවතුණි. එම මුදල් පියවීමට කටයුතු කර නොතිබුණි.

**ගෙවිය යුතු වියදම් තහවුරු නොවීම**

සමාගම විසින් දකුණු කොරියාවට විදේශගත කර තිබූ වෑද්දුම් ශිල්පීන්ගේ සියළු වියදම් පියවීම සඳහා 2023 පෙබරවාරි මාසයේදී එක් විගමණික ශ්‍රමිකයෙකුගෙන් රු.මිලියන 2.58 බැගින් 175 දෙනෙකුගෙන් එකතුව රු.මිලියන 451.58ක මුදලක් අයකරගෙන තිබුණි. එයින් සේවකයින් 77 දෙනෙකු සඳහා සම්බන්ධීකරණ ගාස්තු ලෙස රු.මිලියන 15.4ක් හා කොරියානු සමාගමක් වෙත කොමිස් මුදල් ලෙස රු.මිලියන 18.82 ක් ලෙස එකතුව රු. මිලියන 34.22ක් ගෙවීමට පැවතියද එම වියදම් නිරවුල් කිරීමට 2024 දෙසැම්බර් 31 දක්වාම කටයුතු කර නොතිබුණි.

**විගමණික ශ්‍රමිකයන්ගෙන් වැඩිපුර අයකිරීම්.**

කාර්යාංශය විසින් 2024 ජනවාරි සිට නොවැම්බර් 13 දක්වා ඊශ්‍රායලයේ කෘෂි කාර්මික හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රැකියා සඳහා විදේශගත කරන ලද විගමණික ශ්‍රමිකයින් 6,959 දෙනෙකුගෙන් ටිකට්පතක් සඳහා මිල රු.295,000ක ස්ථාවර මිලක් සමාගම විසින් අයකර තිබුණි. 2024 නොවැම්බර් 13 දින සිට දෙසැම්බර් 24 දින දක්වා කාලය තුළ ටිකට්පතක සාමාන්‍ය මිල රු.163,275ත් රු.156,000ත් අතර පරාසයක පැවතුණි. ඒ අනුව ආසන්න වශයෙන් එක් අයෙකුගෙන් රු.115,000 ක් බැගින් 6,959 දෙනෙකුගෙන් රු.මිලියන 800.28කට ආසන්න මුදලක් වැඩිපුර අයකරගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

**අවිධිමත් ලෙස විදේශ සංචාර ලබාදීම**

2024 ජනවාරි 24 දිනැති අංක 08/2024 දරන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පෝලන්ත රාජ්‍යයෙන් ලැබී තිබූ රැකියා ඇනවුමක් සඳහා යැයි දක්වමින් ශ්‍රමිකයින් වෙත නව වීසා ලබා ගැනීමේ දින වෙන් කර ගැනීමට සමාගමේ කාර්යාල කාර්ය සහායකයෙකු, රියදුරු මහතුන් දෙදෙනෙකු හා තොරතුරු තාක්ෂණ සහකාර කළමනාකරුවෙකු ඉන්දියාවේ නවදිල්ලි නුවර හා චෙන්නායි වෙත අවස්ථා තුනකදී සභාපතිවරයාගේ අනුමැතිය මත විදේශගතව තිබුණි. ඒ සඳහා රු.

මිලියන 6.52ක් වැයකර තිබුණද අදාළ කාර්යය ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**වීසා ලබා ගැනීම සඳහා ශ්‍රමිකයින් අවිධිමත් ලෙස ඉන්දියාව බලා රැගෙන යාම**

2023 අගෝස්තු 09 දින සිට 13 දින දක්වා සමාගමේ සභාපති හා සාමාන්‍යාධිකාරී විසින් රු. මිලියන 2.24ක් වැයකර පෝලන්තය බලා සංචාරය කර තිබූ අතර එමගින් ලැබුණු රැකියා ඇණවුම් සංඛ්‍යාව සඳහා කිසිවකු අයදුම්කර නොතිබුණි. එහෙත් 2023 වර්ෂයේදී දකුණු කොරියාවට විදේශගත වීමේ අපේක්ෂාවෙන් ඒජන්සි සමාගම වෙත ගුවන් ගමන් බලපත්‍ර භාරදී තිබූ අයදුම්කරුවන් 10 දෙනෙකු වෙත ලොතරැයි ක්‍රමයක් මගින් පෝලන්තයේ ලැබුණු රැකියා අවස්ථාව සඳහා ඔවුන්ගේ එකඟතාවය ලබාදෙන ලෙස දන්වා තිබුණි. එම ශ්‍රමිකයන්ට වීසා ලබාගැනීම සඳහා සමාගම විසින් රු.මිලියන 6.52ක් වැය කර 2024 අප්‍රේල් 09 දින සිට දින 14ක්ද , ශ්‍රමිකයින් විසින් රු.මිලියන 8ට ආසන්න මුදලක් වැය කර දෙවන වරට මැයි 14 සිට ජුනි 15 දක්වා දින 33 ක්ද චෙන්නායි වෙත රැගෙන ගොස් තිබුණද, අදාළ රැකියා ඇනවුම ලබාගැනීමට අපොහොසත් වී තිබුණි. ඒ අනුව සමාගම විසින් වැය කරන ලද එකතුව රු.මිලියන 8.76ක් සහ ශ්‍රමිකයින් විසින් ආසන්න වශයෙන් වැය කරන ලද රු.මිලියන 08ක මුදලක් නිෂ්කාර්යය වියදම් වී තිබුණි.

**විධිමත් අනුමැතියකින් තොරව විදේශගත කිරීම සඳහා කටයුතු කර තිබීම**

2023 දෙසැම්බර් 05 දින ඊනෙට් සහ පීබා නැමැති ආයතන හරහා ඊශ්‍රායලයේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රැකියා ඇණවුමක් ලැබී තිබූ අතර ඒ අනුව 2023 දෙසැම්බර් 29 දින එක් ශ්‍රමිකයෙකුගෙන් රු.මිලියන 1.63ක් අය කිරීමට කාර්යංශයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. 2024 ජනවාරි මාසයේදී ශ්‍රමිකයින් 22 දෙනෙකු විදේශගත කිරීම සඳහා පුද්ගලික රෝහලකින් වෛද්‍ය පරීක්ෂණ සිදු කර ගන්නා ලෙස සමාගම විසින් දැනුම් දීම අනුව අදාළ ශ්‍රමිකයින් විසින් එකතුව රු.803,000ක් වැය කර වෛද්‍ය පරීක්ෂණ සිදු කරගෙන තිබුණද අදාළ විදේශගත කිරීම කාර්යාංශය විසින් අවලංගු කර තිබුණි. ඒ අනුව අදාළ ශ්‍රමිකයින් විසින් වැය කරන ලද මුදල් 2024 ජූලි 29 දින සමාගමේ මුදලින් නැවත පියවීම හේතුවෙන් එම වියදම සමාගමට පාඩුවක් වී තිබුණි.

# සංචාරක

බොහෝ ආසියාතික රටවල් විදේශ විනිමය ඉපයීමේ ප්‍රධාන මාර්ගයක් වශයෙන් සංචාරක කර්මාන්තයේ නියැලෙන අතර සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ස්ථාපනය, වැඩිදියුණු කිරීම හා සංචාරක ප්‍රවර්ධනය කෙරෙහි ප්‍රමුඛතාවයක් ලබා දෙයි. ශ්‍රී ලංකාව කලාපයේ බොහෝ රටවලට වඩා සංචාරක ආකර්ෂණය දිනා ගන්නා රටක් වුවද සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු නොකිරීම හා සංචාරකයන්ට අවශ්‍ය මූලික පහසුකම් දියුණු නොකිරීම තුළ සංචාරක කර්මාන්තය විශාල පසුබෑමකට ලක් වී තිබේ.

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ දැක්ම මතකයේ රැඳෙන, අව්‍යාජ සහ විවිධත්ව අත්දැකීම් සඳහා ලොව විශිෂ්ඨතම දූපත ලෙස හඳුනා ගැනීම වන අතර මෙහෙවර ශ්‍රී ලංකාවේ ස්වභාවික සහ සංස්කෘතික උරුමය පිළිබිඹු කරනු ලබන සමාජමය වශයෙන් පිළිගන්නා, පරිසරයට වගකියනු ලබන සහ ප්‍රජාවන්ට සහ රටට ආර්ථික ප්‍රතිලාභ අත්පත් කර දෙන අතිවිශේෂ අත්දැකීම් ලබාදෙන ඉහළ වටිනාකමක් සහිත ගමනාන්තයක් බවට පත්වීම වේ.

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ සංචාරක අංශය යටතේ ව්‍යවස්ථාපිත ආයතන 4 ක් ක්‍රියාත්මකව පැවතුණි.

**ව්‍යවස්ථාපිත ආයතනවල ඉපයීම, උපයෝජනය කිරීම සහ රජයට ලබා දුන් දායකත්වය**

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ III පරිච්ඡේදය යටතේ පිහිටුවා ඇති සංචාරක සංවර්ධන අරමුදලට රැස් කර ගන්නා අපගමන බද්ද (Embarkation Levy) සහ සංචාරක සංවර්ධන බදු (Tourism Development Levy) මුදල් පහත ආයතන වෙත, ශ්‍රී ලංකාව සංචාරක හා චාරිකා ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය හා ඊට අදාළ කාර්යයන් සඳහා භාවිතා කිරීමට බෙදා හරිනු ලබන අතර එසේ බෙදා හරින ලද ආදායම ද ඇතුළුව මුළු ආදායම, වර්ෂය තුළ වැය කිරීම හා 2024 වර්ෂයේදී රජයට ලබා දුන් දායකත්වය ලෙස භාණ්ඩාගාරය වෙත ලබා දුන් ප්‍රේෂණ පිළිබඳ තොරතුරු පහත වේ.

වගු අංක **2.22 - 2024** වර්ෂය තුළ ව්‍යවස්ථාපිත ආයතනවල ඉපයීම,උපයෝජනය කිරීම සහ රජයට ලබා දුන් දායකත්වය

| ආයතනය/අරමුදල | උපයන ලද ආදායම (රු.මිලියන) | රජයට ලබා දුන් දායකත්වය (රු.මිලියන) | මුළු වියදම (රු.මිලියන) |
|---|---|---|---|
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 1,357 | 0 | 610 |
| ශ්‍රී ලංකා ප්‍රවර්ධන කාර්යාංශය | 5,892 | 500 | 2,130 |
| ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය | 1,192 | 100 | 730 |
| ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය | 320 | 0 | 385 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදල | 6,987 | 15 | 6,972 |
| **එකතුව** | 15,748 | 615 | 10,827 |

**මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**

**සංචාරකයින් පැමිණීම හා ආදායම වෙනස් වීම**

2023 වර්ෂයේදී ශ්‍රී ලංකාව වෙත විදේශ සංචාරකයින් 1,487,303 ක් පැමිණ තිබූ අතර 2024 වර්ෂයේදී එම සංඛ්‍යාව සියයට 38 කින් වැඩිවී විදේශීය සංචාරකයින් 2,053,465 දෙනෙකු පැමිණ තිබුණි. කෝවිඩ් වසංගතය හේතුවෙන් වරින් වර වසා දමා තිබුණු රට ක්‍රමයෙන් ප්‍රකෘති තත්ත්වයට පත් වීම හා රටේ පැවති දේශපාලන හා ආර්ථික අස්ථාවරත්වය යම් සමනයකට පත්වීම මීට හේතු වී තිබුණි. සංචාරක අමාත්‍යාංශය සහ ඒ යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් ආයතනවල කාර්යයන් හා කර්තව්‍යයන්ගේද තිබුණු සීමාවීම් ඉවත්වීම මෙම සංචාරකයින්ගේ පැමිණීම වැඩිවීම නිසා සිදු වී තිබුණි. 2024 වර්ෂයේ සංචාරකයින්ගේ පැමිණීම ඉකුත් වසර පහ සමඟ සසඳා පහත රූපසටහනෙහි දැක්වේ.

**රූපසටහන 2.15 - පසුගිය වර්ෂ 5 තුළ ශ්‍රීලංකාවට විදේශ සංචාරකයින්ගේ පැමිණීම**




| | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|
| පැමිණි විදේශ සංචාරකයින් සංඛ්‍යාව | 1,913,702 | 507,704 | 194,495 | 719,978 | 1,487,303 | 2,053,465 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූපසටහන 2.16 - 2016 සිට 2024 දක්වා සංචාරක කර්මාන්තයෙන් ලද අදායම්**




| | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|
| සංචාරක කර්මාන්තයෙන් ලද ආදායම් (රු. මිලියන) | 512,293 | 598,356 | 711,961 | 646,362 | 124,189 | 100,620 | 362,426 | 677,360 | 957,298 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූපසටහන 2.17 - 2017 සිට 2024 දක්වා සංචාරක කර්මාන්තයෙන් ලැබී තිබුණු අදායම හා වර්ධනය**




| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|
| සංචාරක කර්මාන්තයෙන් ලද ආදායම (එ.ජ. ඩොලර්) | 3925 | 4381 | 3607 | 682 | 506 | 1136 | 2067 | 3168 |
| වර්ධනය (එ.ජ.ඩොලර්) | | 456 | -774 | -2925 | -176 | 630 | 931 | 1101 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## විගණන නිරීක්ෂණ

### සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ සංචාරක අංශය

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට ලබාදුන් ප්‍රතිපාදන**

දිස්ත්‍රික් ලේකම් කාර්යාල 07 කට ලබාදුන් සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘති 12 කට අදාළ රු.මිලියන 229 ක ප්‍රතිපාදන, 2024 දෙසැම්බර් 31 වන විටත් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණ හෙයින් අමාත්‍යාංශය විසින් නැවත පවරා ගැනීමට කටයුතු කර තිබුණි.

**ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

උද්භිද උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය සහ කිතුල්ගල සංචාරක තීරය සංවර්ධනය කිරීමට අදාළ ව්‍යාපෘති දෙකකට පිළිවෙළින් රු.මිලියන 55 ක් හා රු.මිලියන 24 ක් ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී වෙන්කර තිබුණද එම ව්‍යාපෘතිවල වැඩ ආරම්භ කර නොතිබුණි.

## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**ඌන උපයෝජිත වත්කම්**

රු.මිලියන 99 ක් වැය කොට වර්ෂ දෙකකට පෙර ප්‍රතිසංස්කරණය කර තිබුණු කළමනාකරණ නිල නිවාස, තැපැල් ගොඩනැගිල්ල හා සේවක නිල නිවාස 2025 ජුනි 30 දින වන විටත් ඌන උපයෝජිතව පැවැතිණි.

තවද, රු.මිලියන 108.26 ක් වැය කොට 2019 වර්ෂයේ බෙන්තොට ඉදිකර තිබුණු සාප්පු 08, ප්‍රදර්ශන ශාලාව හා අවන්හල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඌන උපයෝජිතව පැවැති අතර මේ නිසා උපයාගත හැකිව තිබුණු රු.මිලියන 12.38 ක බදු කුලී ආදායම අහිමි වී තිබුණි.

**සංචාරක පොලිස් ඒකක ඉදිකිරීම**

උණවටුන, කල්පිටිය, ගල්කිස්ස, ඒත්තුගල යන ප්‍රදේශවල සංචාරක පොලිස් ඒකක හතර ඉදිකිරීමට අදාළව එක් ඒකකයක් සඳහා රු.මිලියන 5.61 බැගින් රු.මිලියන 22.44 ක කොන්ත්‍රාත්තුව, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකර, කාර්යසාධන සුරක්ෂණ ද ලබා නොගෙන 2021 ඔක්තෝබර් 28 දින ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීමෙහි පමණක් නිරත වී සිටින සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව වෙත පිරිනමා තිබුණි. පසුව මෙම ඉදිකිරීම ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව විසින් වෙනත් උප කොන්ත්‍රාත් සමාගමක් වෙත අධිකාරියේ අනුමැතිය නොමැතිව භාර දී තිබුණි. මින් ගල්කිස්ස සංචාරක පොලිස් ඒකකයේ ඉදිකිරීම් කටයුතු පමණක් නිම කර තිබුණු අතර ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කිසිදු ඉංජිනේරුවරුන්ගේ අධීක්ෂණයට ලක්වී නොතිබුණි. සිදුවූ කාල ප්‍රමාදය හේතුවෙන් නව කොන්ත්‍රාත් මිල රු.මිලියන 8.53 ක් ලෙස වෙනස් කර තිබූ අතර ඉන් රු.මිලියන 6.36 ක මුදලක් ගෙවා තිබුණි . 2024 පෙබරවාරි 20 දින පොලිස් ඒකකය විවෘත කර තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විටත් විවිධ අඩුපාඩු හේතුවෙන් එම පොලිස් ඒකකය රාජකාරි කටයුතු සඳහා යොදවාගෙන නොතිබුණි.

## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදල

**දත්ත පද්ධතියක් නොමැතිවීම**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි විය යුතු සියළුම සංචාරක ආයතන හා සංචාරක සේවා සපයන ආයතන පිළිබඳ දත්ත

පද්ධතියක් අරමුදල සතුව නොමැති බැවින්, වාර්ෂික සංචාරක සංවර්ධන බදු ආදායම, ලැබිය යුතු බදු ආදායම නිවැරදිව ගණනය කිරීමට නොහැකි වී තිබුණි.

**හඳුනා නොගත් තැන්පතු පැවතීම**

2016 සිට 2024 වර්ෂය දක්වා ලියාපදිංචි සංචාරක ආයතන විසින් අරමුදලේ බැංකු ගිණුම වෙත සෘජුවම බැරකර තිබුණු රු.මිලියන 1,828.53 ක් අදාළ ආයතන වෙත ප්‍රේෂණය නොකර ජංගම වගකීම් වල හඳුනා නොගත් තැන්පතු ලෙස රඳවා ගෙන තිබුණි.

**සංචාරක සංවර්ධන බදු භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකිරීම**

2024 වර්ෂයට පෙර, ලියාපදිංචි සංචාරක ආයතනවල දළ ලාභයෙන් ලැබී තිබුණු සියයට 0.5 ක සංචාරක සංවර්ධන බද්ද වන රු.මිලියන 5.81 ක් භාණ්ඩාගාරය වෙත යැවිය යුතු වුවත් එම මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණි.

තවද අරමුදල විසින් අදාළ ආයතන වෙත ලබා දිය යුතු රු.මිලියන 2,602.9 ක් ප්‍රේෂණය නොකර රඳවා ගෙන තිබුණු බවද නිරීක්ෂණය විය.

## ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

**සංචාරක සන්නාමය වෙනස්කිරීම**

සංචාරකයින්ගේ පැමිණීම වර්ධනය කර ගැනීම සඳහා පසුගිය වර්ෂ 15 ක් තුළ ශ්‍රී ලංකා සංචාරක සන්නාමය පස්වරක් වෙනස් කර තිබු අතර 2023 වර්ෂයේ දී ඒ සඳහා රු.මිලියන 10.02 ක් වැය කර තිබුණ ද මේ සඳහා නිසි අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

**ලැබියයුතු ණය ශේෂ**

සමාලෝචිත වර්ෂය අවසාන වන විට කාර්යංශයට ලැබිය යුතු ණය ශේෂය රු.මිලියන 2,434.7 ක් වූ අතර ඉන් වර්ෂ 05 ට වැඩි අගය හා වර්ෂයකට වැඩි අගය පිළිවෙළින් රු.මිලියන 3.53 ක් හා රු.මිලියන 64.47 ක් වුවද මෙම දිගු කාලීන ණය ශේෂයන් අය කර ගැනීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි.

## ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

2005 අංක 38 දරන සංචාරක පනතින් සංචාරක වෙළඳ හා ප්‍රවර්ධන කටයුතු සඳහා ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය හා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ස්ථාපිත කර තිබුණ අතර මයිස් (MICE) එක්ස්පෝ (EXPO) සහ අනෙකුත් ප්‍රදර්ශන මෙම ආයතන දෙක එකතු වී සිදු කරනු ලබයි. 2021 නොවැම්බර් 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE) හිදී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය ඒකාබද්ධ කළයුතු බවට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට නිර්දේශ ලබා දී තිබුණ ද ඒ සඳහා කටයුතු නොකර එකම අරමුණක් වෙනුවෙන් වියදම් දරමින් මෙම ආයතන වෙන වෙනම පවත්වා ගෙන යමින් පැවතුණි.

## ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

| | |
|---|---|
| **දීමනා ගෙවීම් පදනමට නිලධාරීන් යෙදවීම** | 2018 පෙබරවාරි 22 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ගෙන තිබුණු ලොන්ඩ්‍රි මෙහෙයුම් නිලධාරි (Laundry Operations Officer) තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු බඳවා ගෙන නොතිබුණු අතර මේ සඳහා දීමනාවක් ගෙවීමේ පදනම මත නිලධාරියෙකු යොදවා තිබුණි. එබැවින් මාසික වේතනය වන රු.77,655 ක් වෙනුවට දීමනා ලෙස එම නිලධාරියාට රු.275,200 ක් මාසිකව ගෙවීමෙන් වර්ෂය තුළ අනුමත කළ වැටුපට වඩා රු.මිලියන 2.3 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| **තොරතුරු පද්ධතියක් ස්ථාපිත නොකිරීම** | ආයතනය මඟින් කළමනාකරණය කරනු ලබන සමුද්‍රා හෝටලයෙහි කාමර වර්ෂ 05 ක් තුළ නවීකරණය කිරීමට කටයුතු කර නොතිබුණු අතර කාමර සඳහා අය කරන ගාස්තු ද වර්ෂ 10 කින් සංශෝධනය කර නොතිබුණි. මෙම හෝටලය ආරම්භ කර වසර 15 කට අධික කාලයක් ගත වී තිබුණත්, පාරිභෝගිකයන්ගේ ඇණවුම් භාරගැනීමේදී ඊට සම්බන්ධ තොරතුරු අදාළ අංශ දැනුවත් කිරීමට සහ අදාළ සේවාවන් සැපයීම පිළිබඳ තොරතුරු ලබා ගැනීමට යාවත්කාලීන කළ පරිගණකගත තොරතුරු පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි. |

## හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම

හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම 2011 දෙසැම්බර් 21 දින සංස්ථාගත කර තිබුණ අතර සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ හම්බන්තොට හයට් රීජන්සි හෝටලය ඉදිකර සත්කාර සේවා සැපයීමේ නිරත වීමයි. මෙය සැලකිය යුතු ආයෝජනයක් වුවත්, 2015 දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ව්‍යාපෘතිය අත්හිටවූ දින සිට කිසිදු ඉදිකිරීම් කටයුත්තක් සිදු කර නොතිබුණි. විගණිත දිනය වන විට කිසිදු ප්‍රගතියක් නොමැතිව වසර ගණනාවක් ගෙවීතිබූ අතර ඉඩමද ප්‍රයෝජනයට නොගෙන පැවතුනි. කෙසේ වෙතත්, එය අරඹා  වසර 13 ක් ගතවී ඇතත්, සමාගමේ මෙහෙයුම් ආරම්භ කර නොතිබුණි. මෙම කාලය තුළ සමාගම  ආදායමක් උපයා නොගෙන ආසන්න වශයෙන් රු.මිලියන 466 ක පමණ වියදමක් දරා තිබුණි.

## ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

| | |
|---|---|
| **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම** | උද්‍යාන 05 කට අයත් හෙක්ටෙයාර් 355.8744 ක වපසරියකින් යුතු ඉඩම් හා මහවැලි අධිකාරිය සතුව පවතින පුහුණු මධ්‍යස්ථානය හා වියලි කළාපීය උද්භිද උද්‍යානයට අයත් හෙක්ටයාර් 124.8423 ක වපසරියකින් යුත් ඉඩම් 02 ක්ද ඇතුළුව හෙක්ටයාර් 480.7167 ක ඉඩම් (1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 224 වගන්තිය අනුව ) පවරා ගැනීමේ කටයුතු 2024  දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. |
| **උද්‍යානයේ පිටවීමේ පර්යන්තයේ පිහිටි ගොඩනැගිල්ල බදුදීම** | රාජකීය උද්භිද උද්‍යානයේ පිටවීමේ පර්යන්තයේ පිහිටි ගොඩනැගිල්ල ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව 2023 දෙසැම්බර් 22 දින සිට 2033 දෙසැම්බර් 21 දක්වා අවුරුදු 10 ක කාලයකට එකඟ වී වසර දෙකක කාලයකට ගිවිසුම් ගතවී  ලක්සල ආයතනය වෙත බදුදී තිබුණි. ගොඩනැගිල්ල බදුදීමට. රජයේ තක්සේරුව ලැබීමට පෙර මාසික වාරිකය රු.412,500 ක් ලෙස ගිවිසුම්ගත වීමෙන් නව තක්සේරුව අනුව මාසික බදු කුලිය සංශෝධනය කරන බවට කොන්දේසියක් බදු ගිවිසුමට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් 2024 දෙසැම්බර් 03 දිනැතිව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කර ඇති වර්තමාන මාසික කුලිය වන රු. මිලියන 0.85ක් අයකර නොගැනීමෙන්  2024 වර්ෂය සඳහා රු. මිලියන 5.25 ක බදු කුලී ආදායමක් අහිමිවී තිබුණි. |

**කැෆටේරියා ආපනශාලාව බදුදීම**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4 වගන්තියේ විශාල බැහැරවීමක් වන පූර්ව සුදුසුකම් ඉදිරිපත් කර නොතිබියදී අදාළ පළාත් පාලන ආයතනයෙන් ලබාගත් තහවුරු ලේඛනවල සහතික කළ පිටපතක් නැවත ඉදිරිපත් කරන ලෙස දන්වා කැපටේරියා ආපනශාලාව 2024/2025 වර්ෂය සඳහා බදුදී තිබුණි. උපරිම ලංසුව රු.මිලියන 1.22 ක්ව තිබියදී මෙම ලංසුකරුවකුට රු.මිලියන 0.79 ක මාසික බදු මුදලකට ආපනශාලාව බදුදීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කිරීමෙන් 2024 මාර්තු මස 01 දින සිට 2025 පෙබරවාරි මස 28 දින දක්වා මාස 12 ක කාලයකට රු.මිලියන 5.22 ක අලාභයක් සිදුකර තිබුණි.

**කිරිහල බදුදීම**

තවද, පූර්ව සුදුසුකම් ඉදිරිපත් කර නොතිබියදී ඒ පිළිබඳ තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ නොසළකා ප්‍රසම්පාදන කැඳවීමෙන් පසු ලබාගත් වෙළඳ බලපත්‍රයක් මත පදනම්ව කිරිහල පෞද්ගලික ආයතනයක් වෙත මසකට රු.මිලියන 0.79 කට බදු දී තිබුණි. ලංසුව පිරිනැමීමෙන් අනෙක් උපරිම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනයේ මාසික බදු මුදල වන රු. මිලියන.1.22 ක කුලිය ලබා ගැනීමේ අවස්ථාව අහිමිවීමෙන් වසරකට ආයතනයට රු.මිලියන 5.26 ක පාඩුවක් සිදුකර තිබුණි.

**වත්කම් කළමනාකරණය**

සුවහස් මල්වගාකරුවන් වෙත බෙදා දීම සඳහා 2021 හා 2023 වර්ෂවල මිලදී ගෙන තිබූ රු. මිලියන 6.88 ක් වටිනා අයිතම 17 ක් අදාළ මල්වගාකරුවන් වෙත බෙදා දීමට කටයුතු නොකර වසර 01 ත් වසර 03 ත් අතර කාලයක් ගබඩා කර තිබුණි. තවද UV ප්‍රතිරෝධක පොලිතීන් හා සෙවන දැල් රෝල් 13 ක් දීර්ඝ කාලයක් අනාරක්ෂිත ලෙස තබා තිබුණි.

උද්භිද උද්‍යාන 04 ක් සතුව පවතින රු. මිලියන 15.08 ක් වටිනා ගොල්ෆ් කාර් රථ 08 ක් සහ වටිනාකම හඳුනාගත නොහැකි ගොල්ෆ් කාර් රථ 02 ක් ඇතුළුව ගොල්ෆ් කාර් රථ 10 ක් මාස 01 ත් අවුරුදු 03 ත් අතර කාල පරාසයක් තුළ භාවිතයෙන් තොරව පැවතීම හේතුවෙන් උපයාගත හැකිව තිබූ ගොල්ෆ් කාර් රථ ආදායම අහිමි වී ගොස් තිබුණි.

**කළමනාකරණ දූර්වලතා**

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ එල්ලෙන පාලම අසල ඇති උද්‍යාන පිවිසුම් මාර්ගය සහිත ඉඩමෙන් යටිනුවර ප්‍රාදේශීය ලේකම් විසින් දෙපාර්තමේන්තුව වෙත 2020 ඔක්තෝබර් 08 දින හෙක්ටයාර් 0.3658 ක භූමිය වාහන ගාල්කිරීම සඳහා පවරාදී වසර 04 ක කාලයක් ගතවී ඇතත්, මෙම ඉඩම ලබාගැනීමේ අරමුණ වෙනුවෙන් භාවිත කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## සංචාරක සංවර්ධන ප්‍රදේශ සහ සංචාරක සංවර්ධන ව්‍යාපෘති සංචාරක කර්මාන්තයට දායකකර ගැනීම පිළිබඳ කාර්යසාධන විගණනය

**පනතේ අවශ්‍යතාවයන්**

2005 අංක 38 දරන සංචාරක කටයුතු පිළිබඳ පනතේ 26 (3) වගන්තිය ප්‍රකාරව සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත කරගෙන යා හැකි සංචාරක කටයුතු, වාණිජ හා වෙනත් කටයුතු නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකි වුවත් ඉහත සංචාරක සංවර්ධන කලාප 14 සඳහාම විගණිත දින වූ 2023 සැප්තැම්බර් 30 දින දක්වා එලෙස නියෝග සෑදීමට කටයුතු කර නොතිබුණි.

තවද, ඒ ප්‍රදේශය ඇතුළත වූ පහසුකම් පිළිබඳව ලැයිස්තු හා සංචාරකයන්ගේ සිත් ඇද ගන්නා ස්ථාන ලෙස හැඳිනිය හැකි ඓතිහාසික හෝ පාරිසරික රුචිය ඇති කරන ස්ථාන ද එකී නියෝගවලට ඇතුළත් කළ හැකිය. කෙසේ වෙතත්, පනත බලාත්මක වීමෙන් පසු ප්‍රකාශයට පත් කරන ලද කල්පිටිය, කුච්චවේලි සහ ඉරණවිල යන සංචාරක ප්‍රදේශයන්ට අදාළව උක්ත වගන්තිය පරිදි එවැනි ආකර්ශනීය ස්ථාන ඇතුළත් නොකර මායිම් පමණක් ඇතුලත් කර ප්‍රදේශ නම් කර තිබුණි. නව පනත බලාත්මක කිරීමට පෙර ප්‍රකාශ කර තිබූ සංචාරක ප්‍රදේශ 11 හිද එවැනි ආකර්ශනීය ස්ථාන සඳහන් කර නොතිබුණි.

පනතේ 26(1) වගන්තිය ප්‍රකාරව සංචාරක සංවර්ධන ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කිරීම අධිකාරියේ නිර්දේශ මත සිදුවිය යුතු වුවද, අධිකාරිය විසින් 2005 වර්ෂයට පසු නම් කළ ප්‍රදේශ 3 කට අදාළව අමාත්‍යවරයාට ඉදිරිපත් කරන ලද කිසිදු නිර්දේශයක් විගණනයට ඉදිරිපත් නොවීය.

**පහසුකම් ඇති කිරීම සඳහා අවධානය අඩු වීම**

2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ හඳුනාගත් සංචාරක සංවර්ධන කලාපයන්ට අදාළව නව පහසුකම් ස්ථාපිත කිරීම හෝ පවත්නා පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමුව ඇති බවක් එම කාලය තුල අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා පරිශීලනයේදී තහවුරු නොවුණි.

**පාසිකුඩා සංචාරක සංවර්ධන ප්‍රදේශය**

පාසිකුඩා සංචාරක සංවර්ධන ප්‍රදේශය සඳහා 2013 වර්ෂයේ පිළියෙළ කරන ලද ප්‍රධාන සැලසුම තුළ ස්ථාපිත කල යුතු පහසුකම් 39 ක් හඳුනාගෙන තිබුණු අතර ඉන් ස්ථාපිත කර තිබුණේ මලාපවහන පිරිපහදු කිරීමේ පද්ධතිය,ජල ටැංකිය,නිකේතන කාර්යාලය සහ සනීපාරක්ෂක පහසුකම් සහිත ගොඩනැගිල්ල පමණි. 2023 සැප්තැම්බර් මස වන විට අනෙකුත් පහසුකම් ස්ථාපිත කර නොතිබූ අතර ස්ථාපිත කළ පහසුකම් අතුරින් සනීපාරක්ෂක පහසුකම් සහිත ගොඩනැගිල්ලද භාවිතා නොකොට අත්හැර දමා තිබුණි. තවද, එම ප්‍රදේශයට පැමිණෙන සංචාරකයන්ට, විධිමත් ප්‍රවේශ මාර්ග සහ පොදු රථ ගාලක්, වීදි ආලෝක පහන්, පානීය ජලය වැනි අත්‍යවශ්‍ය පහසුකම් සපයා ගැනීමේ දුෂ්කරතා පැවති අතර ප්‍රදේශය තුල නිරන්තරයෙන් ගැවෙසෙන සතුන් ප්‍රදේශයේ පවිත්‍රතාවයට හා සංචාරකයින්ගේ ආරක්ෂාවට තර්ජනයක් වන බව නිරීක්ෂණය විය. මෙම පහසුකම් ස්ථාපිත නොකිරීම මත එම ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ නියැලෙන ව්‍යවසායකයින්ට කර්මාන්තයේ නිරත වීමටද ඉන් බාධා මතුවී තිබුණි.

**කුච්චවේලි සංචාරක සංවර්ධන ප්‍රදේශය**

කුච්චවේලි සංචාරක ප්‍රදේශය සහ ව්‍යාපෘතිය සඳහා 2019 දී සකස් කළ ප්‍රධාන සැලසුමේ ප්‍රදේශයට අදාලව ඇතිකළ යුතු අත්‍යවශ්‍ය පහසුකම් අතර ප්‍රධාන වශයෙන්ම මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ජල පහසුකම් වැඩි දියුණු කළ යුතු බවට හඳුනාගෙන තිබුණි. කෙසේ වුවද, විධිමත් මාර්ග පද්ධතියක් සහ ජල සැපයුමක් ප්‍රදේශය ආශ්‍රිතව සිදුකර නොතිබුණි. මීට අමතරව ප්‍රදේශය තුල සංචාරක ව්‍යාපෘති සඳහා ප්‍රමාණවත් විදුලි සැපයුමක් මෙන්ම සංචාරකයින් සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම්ද ප්‍රදේශය තුළ ප්‍රමාණවත් පරිදි නොමැති බවද භෞතික නිරීක්ෂණයේදී පැහැදිලි වුණි. මෙම පහසුකම් ඇති කිරීම සම්බන්ධයෙන් අධිකාරියේ අවධානය යොමු වී

නොතිබුණි. මේ හේතුවෙන් සංචාරක ආකර්ෂණීය ස්ථාන එම ප්‍රදේශයේ පැවතියද සංචාරකයින්ගේ පැමිණීම අවම මට්ටමක පැවතුණි. තවද සංචාරක ව්‍යාපෘති සඳහා එම ප්‍රදේශයට ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට බාධාවක්ද මින් මතුවී තිබුණි.

**ව්‍යාපෘතිය තුළ සංවර්ධනය කළ යුතු යටිතල පහසුකම් ඇතුළුව අනෙකුත් පහසුකම් ක්‍රියාත්මක කිරීම**

ජනරජයේ ජනාධිපති විසින් නිදහස් දීමනා ලෙස 2010 වර්ෂයේදී කල්පිටිය දූපත් 11ක ඉඩම්ද, 2012 වර්ෂයේදී එක් දූපතකට අදාලව ඉඩම් අධිකාරිය වෙත පවරා දී විගණිත දින වූ 2022 නොවැම්බර් 30 දින වන විට වසර 10-12 අතර කාලයක් ගතවුවද, කල්පිටියේ ප්‍රධාන සැලැස්මේ අන්තර්ගතවූ සංචාරකයින් සඳහා ජැටි හා තට්ටු, ජල සම්පාදන යෝජනා ක්‍රම, ජල ගබඩා, මධ්‍යගත විදුලි බලාගාර, ජල පවිත්‍රාගාර, කසල සහ ඝන අප ද්‍රව්‍ය පිරිපහදු යන්ත්‍ර, විදුලි උත්පාදන බලාගාර ( සූර්යබලාගාර හා සුළං බලාගාර ), වෙරළ ඉදිරිපස සංවර්ධනය, පොදු ප්‍රදේශ ආලෝකමත් කිරීම, ලවන ඉවත් කිරීමේ ශාක, විදුලි සම්ප්‍රේෂණ ස්ථාන, තොරතුරු මධ්‍යස්ථාන, ඇවිදීමේ මාර්ග වැනි යටිතල පහසුකම් සැපයීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

**බදු මුදල් අයකර ගැනීමට අපොහොසත්වීම**

2022 නොවැම්බර් 30 වන විටත් බදු දී තිබුණු දූපත් පහකට අදාල රු. මිලියන 59.03ක මුදලක් බදුකරුවන් පස්දෙනෙකුගෙන් අයකර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

**ඉඩම් අයෝජන කටයුතු සඳහා යොමු කිරිමට දීර්ඝ කාලයක් ගත වීම**

2010 වර්ෂයේදි කල්පිටිය දූපත් 06කට අයත් ඉඩම් අක්කර 457.44ක ඉඩම් ප්‍රමාණයක් ජනාධිපති විසින් නිදහස් දීමනා ලෙස ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත පවරා තිබුණද එම ඉඩම් අයෝජන කටයුතු සඳහා යොමු කිරිමට දීර්ඝ කාලයක් (වර්ෂ 11-09) ගත වි තිබුණි.

## ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම

**කියුබ් ලංකා ලෙෂර් ප්‍රොපර්ටීස් පුද්ගලික සමාගම**

සමාගම සමග වූ බදු ගිවිසුමේ 5.2.7 පරිදි කාලානුරූපී සංක්‍රමණික ධීවර ප්‍රජාවගේ ප්‍රයෝජනය සඳහා ගිවිසුමේ ආරම්භක දිනය වන 2010 සැප්තැම්බර් 02 දින සිට දින 90 ඇතුළත දූපතේ යටිතල පහසුකම් සංවර්ධනය සහ ගොඩනැගිලි සඳහා අධිකාරිය විසින් නම්කළ සංවර්ධන ගිණුමට රු. මිලියන 60 මුදලක් බදුකරු විසින් ගෙවිය යුතු වුවත් එවැනි මුදලක් ගෙවා තිබුණු බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. තවද අධිකාරිය විසින් සංක්‍රමණික ධීවර ප්‍රජාව සහ නීත්‍යානුකූලව ධීවර කටයුතුවල නියැලෙන ධිවර ප්‍රජාවගේ තනි ප්‍රයෝජනය සඳහා ජැටියක්ද සංවර්ධනය කළ යුතු වුවත් එපරිදිද කටයුතු කර නොතිබුණි.

ගිවිසුමේ 9.1 වගන්තිය ප්‍රකාරව ගිවිසුමේ ආරම්භක දිනයේ සිට සමාගම විසින් මාස 36 තුළ වාණිජ මෙහෙයුම් ආරම්භ කළ යුතු වුවද එපරිදි කටයුතු කර නොතිබුණු අතර ගිවිසුමේ 5.2 වගන්තිය පරිදි සෑම මාසික වාරිකයක්ම ඊට පෙර මාසයේ අවසාන දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු වුවද 2022 නොවැම්බර් 30  දින වන විට රු. මිලියන 50.80 හිඟ බදු කුලී වටිනාකමක් නොගෙවා තිබියදී පිළිවෙලින් ගිවිසුමේ 17.1.1 හා 17.1.2 වගන්ති ප්‍රකාරව ගිවිසුම අවලංගු කළ හැකි වුවද අධිකාරිය විසින් විගණන දිනය වන 2022 නොවැම්බර් 30  දින තෙක් අධිකාරිය හා බැඳි ගිවිසුම අහෝසි කිරීමට කටයුතු කර නොතිබුණි. තවද සමාගම හා අධිකාරිය අතර ඇතිකරගත් ගිවිසුම අහෝසි නොකර එම දූපත ඇතුළු කල්පිටිය දූපත් 12 සඳහා නව ආයෝජකයින් තෝරාගැනීම සඳහා 2019 ජූලි 21 හා 2019 ඔක්තෝම්බර් 13 සන්ඩේ ඔබ්සර්වර් පුවත්පත් මගින් යෝජනා කැඳවා තිබුණි.

**නියුකියර්ස් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම**

ගිවිසුමේ 6.1.2 වගන්තිය ප්‍රකාරව ගිවිසුමේ ආරම්භක දිනයේ සිට සමාගම විසින් මාස 6 තුළ මූලික නිෂ්කාශන කටයුතු සිදු නොකිරීම, ගිවිසුම් ගත දිනය වන 2022 අප්‍රේල් 20 දින ලබා දී තිබුණු එක් බදු වාරික මුදල පමණක් ගෙවා තිබීම නිසා ගිවිසුමේ 5.1.1 හා 5.1.3 වගන්ති ප්‍රකාරව බදු මුදල් නොගෙවීම වැනි කරුණු මත ගිවිසුමේ 15.1.2 වගන්තිය ප්‍රකාරව ගිවිසුම අවලංගු කළ හැකි වුවද අධිකාරිය

විසින් විගණන දිනය වන 2022 නොවැම්බර් 30 දින තෙක් ගිවිසුම අහෝසි කිරීමට කටයුතු කර නොතිබුණි.

**සමගි හෝටෙල් ඇන්ඩ් ට්‍රැවල්ස් පුද්ගලික සමාගම**

අධිකාරිය හා සමාගම අතර 2020 දෙසැම්බර් 14 දින සින්න ඉරමතිව් දූපත සම්බන්ධයෙන් ඇති කරගත් ගිවිසුමේ 6.1.2 වගන්තිය ප්‍රකාරව ගිවිසුමේ ආරම්භක දිනයේ සිට සමාගම විසින් මාස 6 තුළ මූලික නිෂ්කාශන කටයුතු සිදු නොකිරීම, මාස 19 අධික කාලයක් බදු වාරික මුදල් ගෙවා නොතිබීම නිසා ගිවිසුමේ 5.1.1 හා 5.1.3 වගන්ති ප්‍රකාරව කටයුතු නොකිරීම මත ගිවිසුමේ 15.1.2 වගන්තිය ප්‍රකාරව ගිවිසුම අවලංගු කළ හැකි වුවද අධිකාරිය විසින් විගණන දිනය වන 2022 නොවැම්බර් 30 දින තෙක් අධිකාරිය හා බැදි ගිවිසුම අහෝසි කිරීමට කටයුතු කර නොතිබුණු අතර එම සමාගම සමග 2022 මාර්තු 07 දින ඉරමතිව් බටහිර දූපත සම්බන්ධයෙන් ද ගිවිසුම් ගතව තිබුණි.

අධිකාරිය සතු ඉඩම්වල සංචාරක ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා තෝරාගත් සියලු ආයෝජකයින් (දේශීය/විදේශීය) සමග බදු ගිවිසුම අත්සන් කරන අවස්ථාවේදී කාර්ය සාධන ඇපකරයක් ලබාගත යුතු බව අංක MTCA/PLD/03/01/92 හා 2022 ජනවාරි 18 දිනැති ලිපියෙන් ලේකම් සංචාරක අමාත්‍යාංශය විසින් අනුමත කර තිබුණද අධිකාරිය හා නියුකියර්ස් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම අතර 2022 අප්‍රේල් 20 දින සින්න ආරච්චල් දූපත සම්බන්ධයෙන් ගිවිසුම් පිලියෙළ කිරීමේදී ඒ සම්බන්ධ වගන්ති ගිවිසුමට ඇතුළත් කර නොතිබුණ අතර සමගි හෝටෙල් ඇන්ඩ් ට්‍රැවල්ස් පුද්ගලික සමාගම අතර 2022 මාර්තු 07 ඇති කරගත් ගිවිසුම් ප්‍රකාරව රු. මිලියනයක කාර්ය සාධන ඇපකරයද ලබා ගෙන නොතිබුණි

2010 වර්ෂයේදි කල්පිටිය දූපත් 2 කට අයත් අක්කර 1388.04 ක ඉඩම් ප්‍රමාණයක් ජනාධිපතිවරයා විසින් නිදහස් දීමනා ලෙස අධිකාරිය වෙත ලැබී විගණිත දිනය වූ 2022 නොවැම්බර් 30 දින වන විට වර්ෂ 12 කාලයක් ගත වුවද අධිකාරිය විසින් එම ඉඩම් අයෝජකයකු හඳුනාගෙන බදු දීමට කටයුතු කර නොතිබුණි.

**අපේක්ෂිත කාර්යයන් ඉටු නොකිරීම**

2012 සැප්තැම්බර් 26 දිනැති අංක 091/519/1377/12 දරන අමාත්‍ය මණ්ඩල 1 පත්‍රිකාවේ (ඇ) ඡේදය පරිදි සමස්ත ව්‍යාපෘතිය ප්‍රදේශය ප්‍රශස්ත ලෙස භාවිතයට ගත හැකි පරිදි වර්ෂ හයක කාලයක් තුළ

අදියර තුනකට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද 2012 වසරේ සිට මේ වන විට වසර 10 ක් ගතවී තිබුණත් පළමු අදියර පමණක් ක්‍රියාත්මක මට්ටමේ පැවතුණි. ඒ අනුව දෙවන සහ තුන්වන අදියර යටතේ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වූ කාර්යයන් ඉටු කිරීමට කළමනාකරණය අසමත් වී ඇති අතර ,මේ හේතුවෙන් යාල පලටුපාන සංචාරක කලාපය තුළ විවිධාංගීකරණය වූ පාරිසරික අත්දැකීමක් සංචාරක ලබාදීමට අපේක්ෂා කළ ද එය ඒපරිද්දෙන් ලබාදීමට හැකියාව ලැබී නොතිබුණි.

**ආයෝජකයින් තෝරා ගැනීමේ දුර්වලතා හා එනයින් භූමිය ඌන උපයෝජිතව පැවතීම**

එම පත්‍රිකාවේ 4.1 ඡේදය පරිදි පළමු අදියර දී විශේෂයෙන්ම පාරිසරික ලැගුම් කුටි සඳහා පමණක් වෙරළ ආසන්න භූමි භාගයෙන් අක්කර 7ක් බැගින් වූ බිම් කැබලි 7ක් නම්කළ ආයෝජනයින් හතරදෙනෙකුට ලබා දිමට අනුමැතිය හිමිව තිබුණු අතර එම ආයෝජනයින් හතරදෙනාට අමතරව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන් නම් නොකළ වෙනත් ආයෝජනයින් තුන්දෙනෙකුට ද 2013/03/14 අංක දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් අනුමැතිය ලබා දී තිබුණි. කෙසේවුවද, අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ එකී ආයෝජකයින් තිදෙනාම විගණන දිනය වූ 2022 නොවැම්බර් 30 දින වන විටත් මෙහෙයුම් කටයුතු අරම්භ කර නොතිබුණු අතර අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන් නම් කරන ලද ආයෝජකයින්ගෙන් දෙදෙනෙකු පමණක් මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණි. ඒ අනුව මෙහෙයුම් ආරම්භ නොකළ ආයෝජකයින්ගේ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂාවේ දී අලාභයන් පැවතීම සහ බදු ගත් දේපල ඇපයට තබා ණය ලබා ගැනීමට ඉල්ලුම් කිරීම අනුව එකී ආයෝජකයින්ට ව්‍යාපෘතීන් සඳහා මූල්‍යනය කිරීමේ හැකියාව ද පහළ මට්ටමක පවතින බව හෙළිදරව් විය. එකී තත්ත්වය “ආයෝජකයින් තෝරාගැනීමේ කමිටුවේ” අවධානයට ළක් වූවාද යන්න විගණනයේ දී ගැටලු සහගත විය. මෙමගින් ආයෝජනයට සුදුසු අක්කර 35 ක භූමි ප්‍රමාණයක් වර්ෂයේ 12 කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි.

**ආයෝජකයින් සිය ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරිම**

එම පත්‍රිකාවේ 2.2.1.1 ඡේදය මගින් ආයෝජනය මුළුමනින්ම දේශීය හෝ විදේශීය සහයෝගීත්වයෙන් ඉදිපත් කළ හැකි වූ අතර රුපියල්

මිලියන 300  ට සමාන හෝ ඊට වඩා වැඩි ආයෝජනයන් සලකා බලිමට අපේක්ෂා කර තිබුණි. ඉඩම් කැබලි 7ක්  ආයෝජකයන්ට ලබාදීම මගින් කලාපය තුළ රුපියල් මිලියන 2,100 ආයෝජනයක් අපේක්ෂා කළද ආයෝජකයින් 5 ක් සිය ව්‍යාපෘති  ක්‍රියාත්මක නොකිරිම හේතුවෙන්  රුපියල් මිලියන 1,500 ක ආයෝජනයක් මෙම කලාපය තුළින් ජනිතවීම නැවතී තිබුණි.  තවද, මෙමගින් අපේක්ෂා කළ කාමර ධාරීතාවය සහ රැකියා ප්‍රමාණයට ලගා විමට හැකියාව ලැබි නොතිබුණි.

2010 සැප්තැම්බර් මස 17 දිනැති අංක 1671/29 දරන ගැසට් නිවේදනය මගින් නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අක්කර 576 ක් වූ භූමි ප්‍රදේශය සංචාරක සංවර්ධන කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර තිබුණි.

නැවත 2011 මාර්තු 25 වන දින ගරු ජනාධිපතිවරයා විසින් ඉන් අක්කර 387 ක ප්‍රමාණයක් නිදහස් ප්‍රදානයක්  වශයෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ප්‍රදානය කොට පවරා දී තිබුණි.

**පාසිකුඩා සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය**

සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පාසිකුඩා ජාතික නිවාඩු නිකේතනය පරිශ්‍රය තුල ඉඩම් බදු දීම සඳහා සමාගම් 14 ක් සමග ගිවිසුම් ගතව තිබූ අතර ඉන් සමාගම් 12 ක් වර්තමානය වන විට ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබයි.

අදාල ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන සැලසුම සකස් කිරීමට Sri Lanka Institute of Architect සහ Design Consortium (Pvt) Limited යන ආයතන සමග ත්‍රෛපාර්ශවික ගිවිසුමකට එළඹ තිබූ අතර ඒ අනුව ප්‍රදේශය තුල සිදු කල යුතු සංවර්ධන කටයුතු හා ස්ථාපිත කල යුතු සේවාවන් හඳුනාගෙන තිබුණි.

# ආයෝජන ප්‍රවර්ධන

ශ්‍රී ලංකාව කලාපයේ වඩාත් තිරසර ආයෝජන ගමනාන්තය බවට පත් කිරීම හා අගය එකතු කළ අපනයන පදනමකට සහ තිරසර ආයෝජනය ආකර්ෂණය කරගනිමින්, ගුණාත්මක සමාජ ආර්ථික සංවර්ධනයක් ශ්‍රී ලංකාව තුළ ඇති කිරීම ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර වේ. අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩල/රජය සතු ව්‍යාපාර 05ක් ක්‍රියාත්මකව තිබුණි.

- තොරතුරු තාක්ෂණ උද්‍යාන
- ටෙක්නො පාක් ඩිවලොප්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්
- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
- කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

2024 වර්ෂයේදී අමාත්‍යාංශයට රු.මිලියන 3,793ක ශුද්ධ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර 2024 වර්ෂය අවසාන වන විට රු.මිලියන 2,538ක් පමණක් උපයෝජනය කර තිබුණු හෙයින් ප්‍රතිපාදන ඉතිරි වීම රු.මිලියන 1,255ක් විය. උපයෝජනය කර තිබුණු මුදලින් රු.මිලියන 986ක් කොළඹ වරාය නගරය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ද, රු.මිලියන 217ක් නව ආර්ථික කලාප පිහිටුවීම සඳහා ද, රු.මිලියන 189ක් අපනයන සංවර්ධන මණ්ඩලයට ද, රු.මිලියන 76ක් ආයෝජන හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ද, යාපනය හා මන්නාරම තොරතුරු තාක්ෂණ උද්‍යාන පුනරාවර්තන වියදම් වශයෙන් රු.මිලියන 15ක් ද උපයෝජනය කර තිබුණි.

**රූප සටහන 2.18 ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ 2024 වර්ෂයේ වියදම හා ඉතිරිය**




**මූලාශ්‍රය** ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

## තොරතුරු තාක්ෂණ උද්‍යාන

**තොරතුරු තාක්ෂණ උද්‍යාන කාර්යය මණ්ඩලය**

ප්‍රජාවගේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරිම අරමුණු කරගෙන 2001 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ උද්‍යාන 2ක්, යාපනය සහ මන්නාරම යන ප්‍රදේශවල පිහිටුවා තිබුණි. තවද, 2025 මාර්තු 25 වනවිට ගාල්ල හා කුරුණෑගල තාක්ෂණික උද්‍යාන ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. තොරතුරු තාක්ෂණ උද්‍යාන සඳහා නිශ්චිත කාර්යය මණ්ඩල හා බඳවා ගැනීමේ පටිපාටි සකස් කර නොතිබුණු නමුත් යාපනය උද්‍යානය සඳහා 47 දෙනෙකු ද, මන්නාරම උද්‍යානය සඳහා 12 දෙනෙකු ද බඳවා ගෙන තිබුණි. එසේ වුවද 2024 වර්ෂය වන විට යාපනය හා මන්නාරම තොරතුරු තාක්ෂණ උද්‍යානවල කාර්ය මණ්ඩලය පිළිවෙලින් 7 දෙනෙකු හා 6 දෙනෙකු දක්වා අඩු වී තිබුණි. බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර නොතිබීම හේතුවෙන් යාපනය තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විධායක නිලධාරි තනතුර සඳහා සංවර්ධන නිලධාරි සේවයේ දෙවන ශ්‍රේණියේ නිලධාරියකු බඳවාගෙන තිබුණි. කෙසේ වෙතත් මෙම උද්‍යානවල පවතින සේවක පුරප්පාඩු, සිසුන් ආකර්ෂණය කිරීමේ වැඩසටහන් හා නව පාඨමාලා හඳුන්වා දීම පිළිබඳව අමාත්‍යාංශය අවශ්‍ය පියවරගෙන නොතිබුණි.

**තාක්ෂණික උද්‍යාන ක්‍රියාකාරිත්වය**

යාපනය හා මන්නාරම උද්‍යාන දෙකෙන් අපේක්ෂිත පාඨමාලා ගාස්තු ආදායම පිළිවෙලින් රු.මිලියන 1.1ක් හා රු.මිලියන 2.6ක් වුවද ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව අඩු වීම (156 ක් පමණි) හේතු කොට ගෙන රාජ්‍ය ආදායමට එකතු කර ගත හැකිව තිබුණේ රු.මිලියන 0.9ක් පමණි. මෙම උද්‍යාන නඩත්තුව හා පාඨමාලා පැවැත්වීම සඳහා 2024 වර්ෂයේදී රු.මිලියන 15.3ක් වැය කර තිබුණි.

**නව තොරතුරු තාක්ෂණ උද්‍යාන ඉදිකිරීම**

ගාල්ල හා කුරුණෑගල තාක්ෂණික උද්‍යාන ඉදි කිරීම සඳහා අත්තිකාරම් ගෙවීම වෙනුවෙන් 2021 වර්ෂයේදී මහජන බැංකුවෙන් හා ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් රු.මිලියන 750 බැගින් එකතුව රු.මිලියන 1,500ක ණය මුදලක් ටෙක්නෝ පාර්ක් ඩිවලොප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ලබා ගෙන තිබුණු අතර එම ණය මුදල් හා ගෙවිය යුතු පොලිය සඳහා මහා භාණ්ඩාගාරය ඇප වන බව ණය ගිවිසුමෙහි දක්වා තිබුණි. ණය මුදල් ගෙවීම සඳහා වර්ෂ දෙකක සහන කාලයක් ලබා දී, මේ වන විට එම සහන කාලය ඉක්ම වී තිබුණද එම ණය වාරික 2024 දෙසැම්බර් 31 දින වන විටත් ගෙවීම් කර නොතිබුණු

අතර මහජන බැංකුවෙන් 2025 අප්‍රේල් 30 දින ලැබුණු ශේෂ සනාථන ලිපිය අනුව එම ණය මුදල මත පොලිය ලෙස රු.මිලියන 478ක මුදලක් ද, ප්‍රමාද පොලී ගාස්තු අදාළ අය කිරීම් ලෙස රු.මිලියන 3.6ක මුදලක්ද වශයෙන් බැංකුවට ගෙවිය යුතු මුළු මුදල රු.මිලියන1,231.6ක් වී තිබුණි.

තවද, ගාල්ල හා කුරුණෑගල තාක්ෂණික උද්‍යාන ඉදි කිරීම් පිළිබඳ 2024 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති උපදේශකගේ තත්ත්ව වාර්තාව අනුව සහතික කරන ලද බිල්පත් වටිනාකම්, කොන්ත්‍රාත්තුව අත්හිටුවීමේ හිමිකම්පෑම්, ප්‍රමාද ගාස්තු, තවමත් සහතික නොකළ වැඩ වෙනුවෙන් යනාදී ලෙස රු.මිලියන 3,721.6ක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතුව තිබුණි.

## ටෙක්නො පාර්ක් ඩිවලොප්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ්

**සමාගමේ අක්‍රිය තත්ත්වය**

ටෙක්නෝ පාර්ක් ඩිවලොප්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම 2021 සැප්තැම්බර් 29 දින රජයේ සම්පූර්ණ කොටස් හිමි සමාගමක් වශයෙන් සංස්ථාපනය කර, අංක 2289/43 හා 2022 ජූලි 22 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙත පවරා තිබුණ ද 2022 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රියාත්මකව නොතිබුණු අතර එදින සිට එක් එක් මූල්‍ය වර්ෂයට අදාළව එහි මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව

**යෝජිත ආයෝජන සිදු කිරීම තහවුරු කිරීම**

2014 සැප්තැම්බර් 11 දිනැති අංක 1879/14 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව, කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් ව්‍යාපෘති සමාගම විසින් යෝජිත ආයෝජනය වූ එ.ජ.ඩොලර් මිලියන 1,337ක මුදල වර්ෂ 8ක් ඇතුළත ආයෝජනය කළ යුතු වුවද එම මුදල ආයෝජනය අදාළ කාල සීමාව තුළ කර තිබේදැයි තහවුරු කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය අපොහොසත් විය.

**ඉලක්කගත පරිදි නිම කිරීම**

වරාය නගර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ලබා දුන් අදියර 1හි ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පිළිබඳ තොරතුරුවලට අනුව, ව්‍යාපෘතියේ මාර්ග, පාලම් හා උද්‍යාන අලංකරණ කටයුතු 2024 මාර්තු 31 දින වන විට සියයට 100ක් අවසන් කළ යුතු වුවද, 2025 ජනවාරි 31 දිනට මාර්ග පද්ධතියේ වැඩ සියයට 74කුත් මඟී පාලම් සියයට 73කුත්

උද්‍යාන අලංකරණ කටයුතු සියයට 77කුත් පමණක් ඉදිකිරීම් අවසන් කර තිබුණි.

**යටිතල පහසුකම් ආයතනවල ගිවිසුම්වලට එළඹීම**

2016 අගෝස්තු 12 දින අත්සන් කරන ලද ත්‍රෛපාර්ශ්වික ගිවිසුමට අනුව වරාය නගර සීමාව දක්වා යටිතල පහසුකම් සැපයීම ශ්‍රී ලංකා රජයේ වගකීමක් වන නමුත් එලෙස යටිතල පහසුකම් සපයන නියෝජිතායතන එනම් ලංකා විදුලිබල මණ්ඩලය, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ කොළඹ නගර සභාව සමඟ 2024 දෙසැම්බර් 31 දින වන විටත් අමාත්‍යාංශය විසින් කිසිදු ගිවිසුමකට එළඹී නොතිබුණි.

**රජය සතු ඉඩම් කොටසේ ඉදිකිරීම් නොකිරීම**

ත්‍රෛපාර්ශවීය ගිවිසුමට අනුව අලෙවි කළ හැකි ඉඩම්වලින් ව්‍යාපෘති සමාගමට හෙක්ටයාර් 116ක් හා ශ්‍රී ලංකා රජයට හෙක්ටයාර් 62ක් වශයෙන් ඉඩම් වෙන් කර තිබුණු අතර ව්‍යාපෘති සමාගමට අයත් ඉඩම් කොටස් මේ වන විටත් ඉදිකිරීම් (තාවකාලික/ස්ථිර) ආරම්භ කරමින් ආදායම් ඉපයිය හැකි තත්ත්වයකට පත් කර ඇති නමුත් 2025 අප්‍රේල් 22 වන විටත් ශ්‍රී ලංකා රජය සතු ඉඩම් කොටස්හි කිසිදු ඉදිකිරීමක් සිදු කර ආදායමක් ලබා ගත හැකි මට්ටමකට පත් කර නොතිබුණි.

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

**ඉඩම් ඌන උපයෝජන**

2024 දෙසැම්බර් 31 දිනට කලාප 16ක් අතරින් එකතුව අක්කර 1,834.43ක් කිසිදු ආයෝජනයකින් තොරව හිස්ව පැවති අතර කලාපවලට අයත් නොවන අක්කර 789.87ක් වූ ඉඩම් කැබලි 13ක් 2024 දෙසැම්බර් 31 වන දිනට හිස්ව පැවතුණි.

**ලැබිය යුතු මුදල්**

2024 දෙසැම්බර් 31 දිනට ආයෝජන මණ්ඩලයේ අනුමත ආයතනවලින් ලැබිය යුතු මුදල රු.මිලියන 1,843.5ක් වූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 25ක වැඩිවීමකි. එම වටිනාකමෙන් රු.මිලියන 383.8ක් හෙවත් සියයට 21ක් වර්ෂ 4කට වඩා වැඩි කාලයක් හිඟව පැවතුණි.

**පරිසර බලපත්‍ර සඳහා පරිසර අධිකාරියේ එකඟතාවය ලබා නොගැනීම**

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතට අනුව පොදු අපජල පවිත්‍රාගාරයක් පවත්වා ගෙන යන කලාප සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු වුවද 2024

දෙසැම්බර් 31 දින වන විට ආයෝජන මණ්ඩලයේ කලාප 8ක පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අළුත් කර නොතිබුණි. එසේම, 1992 අංක 49 දරන මහ කොළඹ ආර්ථික කොමිසම (සංශෝධිත) පනතේ 20 (අ) වගන්තියට අනුව මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය මත පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, ආයෝජන මණ්ඩලය වෙත පවරා තිබෙන නමුත් කලාප 10කට අයත් ආයතන 210කට අදාළව මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය ලබා ගැනීමකින් තොරව 2023 හා 2024 වර්ෂවලදී ආයෝජන මණ්ඩලය විසින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර තිබුණි.

# වෙළඳ හා වාණිජ

පාරිභෝගිකයින්ගේ අයිතීන් ආරක්ෂා කරමින් තරඟකාරී දේශීය වෙළෙඳ ජාලයක් හරහා ජනතාව වෙත අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය ලබා දීම සඳහා කටයුතු කිරීම පිණිස පිහිටුවා ඇති වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයත් ඒ යටතේ දෙපාර්තමේන්තු 06ක් හා ව්‍යවස්ථාපිත ආයතන 07 ක් හා විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන 18ක් ක්‍රියාත්මකව පැවතුණි.

2024 වර්ෂය වෙනුවෙන් රු.මිලියන 3,255 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 2,268 ක් උපයෝජනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

වගු අංක 2.23 - වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය ඒ යටතේ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන 2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන ලබාදීම් හා උපයෝජනය

| දෙපාර්තමේන්තුව /අමාත්‍යාංශය | මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන | මුළු වියදම රු.මිලියන |
|---|---|---|
| වෙළඳ අමාත්‍යාංශය | 1,749 | 1,015 |
| මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව | 219 | 207 |
| පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය | 507 | 507 |
| සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 115 | 82 |
| සමූපකාර සේවක කොමිෂන් සභාව | 25 | 20 |
| ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | 434 | 235 |
| සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 94 | 90 |
| ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය | 63 | 63 |
| ජාතික සමුපකාර සංවර්ධන ආයතනය | 49 | 49 |
| | **3,255** | **2,268** |

මූලශ්‍රය - වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

**අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල නීති අණපනත් යාවත්කාලීන නොකිරීම**

පාරිභෝගිකයා වඩාත් සුරක්ෂිත කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල නීති අණපනත් යාවත්කාලීන හා සංශෝධන කටයුතු කඩිනම් කලයුතු නමුත් 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත, 2003 අංක 36 දරන ජාතික බුද්ධිමය දේපල

පනත හා 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිත සේවා පනත 2024 වර්ෂය අවසන් වන විටත් සංශෝධනය කර නොතිබුණි.

**ඌන උපයෝජිත වාහන**

2021 සැප්තැම්බර් 28 දිනැති අමප/21/1543/313/053 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් වෙනත් අමාත්‍යාංශ හා ආයතනවලට අයත් දැනට අමාත්‍යාංශය විසින් පරිහරණය කරනු ලබන වාහන අමාත්‍යාංශය වෙත විධිමත්ව පවරා ගැනීම සඳහා අනුමැතිය ලැබී තිබුණද 2025 මාර්තු 30 දින වන විට වාහන 21 ක් පවරාගෙන නොතිබුණි. අමාත්‍යාංශයේ පරිහරණය සඳහා ඇති වාහන 32 ක් සඳහා අවුරුදු 02 ක පමණ කාලයක සිට අනුයුක්ත කර ඇති රියදුරන් සංඛ්‍යාව 07 ක් පමණක් වීමෙන් වාහන 20ක් පමණ ඌන උපයෝජිතව පැවතුණි.

**වෙළඳසැල් කුලී අයකර නොගැනීම**

අමාත්‍යාංශය විසින් කුලී පදනම මත ලබාගෙන ඇති ගොඩනැගිල්ලේ බිම් මහලේ වර්ග අඩි 2,178 ක ප්‍රමාණයක ස්ථාපිත කර ඇති වෙළඳසැල තුළ 2022 ඔක්තෝබර් සිට 2023 අගෝස්තු දක්වා සමූපකාර තොග වෙළඳ සංස්ථාව විසින්ද, 2023 අගෝස්තු සිට විගණිත දින දක්වා උමන්දාව ග්‍රීන් හට් නැමති ආයතනය විසින් ද ව්‍යාපාර කටයුතු කරගෙන ගොස් තිබුණු අතර ඒ සඳහා 2022 ඔක්තෝබර් සිට 2024 දෙසැම්බර් 31 දක්වා හිඟ කුලී මුදල්, විදුලි බිල්පත් හා ජල බිල්පත් වෙනුවෙන් එකතුව රු.මිලියන 6.23 ක මුදලක් අයවීමට තිබුණි. තවද විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයකින් තොරව මසකට රු.මිලියන 0.25ක් බැගින් උක්ත වෙළඳසැල කුලියට දීමට ගිවිසුම්ගත වී තිබුණද, එම භූමි ප්‍රමාණය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් මාසිකව රු.මිලියන 0.32 ක කුලියක් ගෙවා තිබූ බැවින් 2023 සැප්තැම්බර් සිට 2024 වර්ෂය අවසානය දක්වා රු.මිලියන 1.6 ක අලාභයක් සිදු වී තිබුණි.

## සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

**සමාගම් පනතේ නියමයන්ට අනනුකූලව කටයුතු නොකිරීම**

සමාගම් පනතේ 131 (1) හා (2) වගන්ති අනුව ලියාපදිංචි සමාගම් 121,284 ක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික වාර්තා ගොනු කළයුතු වුවද, සමාගම් 119,295 ක් එනම්, සියයට 98 ක් එම නියෝගය පරිදි කටයුතු කර නොතිබුණි. තවද ඉකුත් වර්ෂවලදී වාර්ෂික වාර්තා

ගොනුකර නොතිබූ සමාගම් 112,586 කින් සමාගම් 107,123 ක් ද එනම් සියයට 95 ක් එම නියෝගය පැහැර හැර තිබුණි. මෙලෙස වාර්ෂික වාර්තා ගොනු නොකිරීම නිසා 2024 ජූනි 30 දිනට හඳුනාගත් මුළු හිඟ ආදායම රු.මිලියන 3,560 ක් විය. සමාගම් පනතේ 131(4) වගන්තිය අනුව වාර්ෂික වාර්තාවක් සෑම වර්ෂයකටම වරක් සමාගම් රෙජිස්ට්රාර් වෙත භාර නොදුන් විට රුපියල් ලක්ෂයක් නොඉක්මවූ දඩයකට හා පැහැර හැරීම සිදුකළ සමාගමේ සෑම නිලධාරියෙකුම රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් වියයුතු වුවද ඊට අනුකූලව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

**අරමුදලේ මුදල් සාවද්‍ය ආයෝජනය**

2007 වර්ෂයේදී ඊ සර්විසස් ලංකා සමාගමේ සියයට 35 ක රාජ්‍ය දායකත්වය වෙනුවෙන් එම සමාගමේ සාමාන්‍ය කොටස් හා වරණීය කොටස් මිලදී ගැනීම සඳහා වෙළඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යාංශ ලේකම් වෙත ගෙවා තිබූ රු.මිලියන 90 ක් සාවද්‍ය ලෙස අරමුදලේ ආයෝජනයක් ලෙස දක්වා තිබුණි.

**අවිධිමත් ගනුදෙනු**

අංක අමප/21/1342/304/113 හා 2021 ජූලි 26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ලෙස 2021 ජූලි 06 දින සිට වසර 03ක් සඳහා නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල්වරයෙකු පත්කර ඔහුට සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර සඳහා හිමි වැටුප් හා දීමනා ලෙස සමාගම් දෙපාර්තමේන්තුවෙන් රු.මිලියන 4.5 ක් හා නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල්වරයෙකුට හිමි දීමනා ලෙස 2021 අගෝස්තු සිට 2024 ජූනි 24 දක්වා සමාගම් අරමුදලින් රු.මිලියන 9.1 ක් ගෙවා තිබුණි.

## සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව

**නාරාහේන්පිට රජවාස වෙළඳ ප්‍රදර්ශනාගාර ව්‍යාපෘතිය**

2023 වර්ෂයේදී නාරාහේන්පිට රජවාස වෙළඳ ප්‍රදර්ශනාගාර ව්‍යාපෘතියේ බදු ගිවිසුම ප්‍රකාරව මාසික විදුලි බිල්පත්, ජල බිල්පත් හා දුරකථන බිල්පත් ඇතුළු සේවා ගාස්තු දෙවන පාර්ශවය විසින් දැරිය යුතු වුවද 2023 වර්ෂයට අදාල විදුලි වියදම් සහ ජල ගාස්තු වශයෙන් රු.මිලියන 6.1 ක් සමාගම විසින් දරා තිබුණු අතර ව්‍යාපෘතියෙන් රු.මිලියන 5.1 ක ශුද්ධ අලාභයක් ලබා තිබුණි.

**වේයන්ගොඩ ගබඩාව හා මඩකලපුව රජවාස ව්‍යාපෘතිය**

සමාගම විසින් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් කුලී පදනම මත ලබාගෙන තිබූ වේයන්ගොඩ ගබඩාව 2023 පෙබරවාරි සිට 2024 පෙබරවාරි දක්වා නිශ්කාර්යව පැවතියද රු.මිලියන 2.4 ක බදුකුලියක් ගෙවා තිබුණි. තවද මඩකලපුව රජවාස ව්‍යාපෘතිය සඳහා 2021 සැප්තැම්බර් සිට 2023 ජුනි දක්වා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් කුලියට ගෙන තිබූ ගොඩනැගිල්ල නවීකරණය කිරීම 2024 ජුලි 30 දින වන විටත් අවසන් වී නොතිබීම හේතුවෙන් කිසිදු ආදායමක් උපයා නොතිබූ අතර එම දෙපාර්තමේන්තුවට ගෙවා තිබූ රු.මිලියන 5.7 ක කුලිය නිශ්කාර්ය වියදමක් විය.

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

**ගිවිසුම් කඩකිරීම හේතුවෙන් වන්දි මුදල් ගෙවීමට සිදුවීම**

අනාරක්ෂිත හා තත්ත්වයෙන් බාල නිෂ්පාදන මඟින් පාරිභෝගිකයන් සුරක්ෂිත කිරීම සඳහා හඳුනාගත් නිෂ්පාදන කීපයක් සම්බන්ධයෙන් ආරක්ෂිත ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා ස්විට්සර්ලන්තයේ සමාගමක් සමඟ 2014 ජනවාරි මස 24 දින ගිවිසුමකට එළඹ තිබුණි. ඒ සම්බන්ධයෙන් නිකුත් කර තිබූ විධාන අංක 49 නිශ්ප්‍රභා කරවා ගැනීම සඳහා භාණ්ඩ නිෂ්පාදන සමාගම් කීපයක් විසින් අධිකාරියට විරුද්ධව මහා අධිකරණයේ ගොනු කර තිබූ ඉල්ලුම්පත්‍රය සඳහා මහා අධිකරණය මගින් විධානය ක්‍රියාත්මක කිරීම වලක්වමින් අතුරු නියෝගයක් නිකුත් කිරීම හේතුවෙන් සමාගම සමඟ එළඹි ගිවිසුමට අනුකූලව ව්‍යාපෘතියේ කටයුතු ඉදිරියට කරගෙන යාමට නොහැකිවී තිබුණි.

ගිවිසුම ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ගිවිසුම්ගත සමාගම විසින් ඒකපාර්ශවීයව ගිවිසුම අවලංගු කර ගිවිසුම් ප්‍රකාරව සම්පූර්ණ ආයෝජන මුදල වන රු.බිලියන 2.716 ක මුදලක් ගෙවන ලෙස ඉල්ලා අධිකාරියට එරෙහිව 2018 වර්ෂයේදී ජාත්‍යන්තර බේරුම්කරණ අධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණි. බේරුම්කරණ නඩුව සඳහා අවසාන ප්‍රදානය එනම්, 2022 මැයි 10 දින ලබා දී තිබුණු නියෝගය අනුව අධිකාරිය විසින් සමාගම වෙත රු.බිලියන 2.716 ක් ද, බේරුම්කරණ ගාස්තුව වශයෙන් ඇ.ඩො. 325,000 ක මුදලක් ද ගෙවියයුතු විය. බේරුම්කරණ නඩුවේ අවසාන ප්‍රදානයට එරෙහිව

2022 ජූලි 07 දින අධිකාරිය විසින් කොළඹ වාණිජ මහාධිකරණයේ පෙත්සමක් ගොනු කර තිබූ අතර එය තවදුරටත් විභාග වෙමින් පැවතුණි. තවද 2024 මැයි 07 දින පැවති පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කමිටු රැස්වීමේදී ද ගිවිසුම සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විනයානුකූලව සහ නීතිමය පියවර ගන්නා ලෙස නියෝග කර තිබුණද වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි.

## ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

**ප්‍රධාන අරමුණ ඉටු නොවීම**

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් ලෙස හඳුනාගෙන තිබූ දකුණු ආසියාතික කලාපීය රටවල සහයෝගිතා සංවිධානයේ කොළඹ ප්‍රඥප්තිය හා 16 වන සමුළු රැස්වීම අනුව මෙට්‍රික් ටොන් 8000 ක විශේෂිත සහල් සංචිතයක් පවත්වා ගැනීම යන කාර්යය ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර තිබුණ ද 2024 වර්ෂයේදී ඒ වෙනුවෙන් කිසිදු ප්‍රතිපාදනයක් සිදුකර නොතිබූ අතර කිසිදු සහල් සංචිතයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. ඒ අනුව ආරක්ෂිතව, අඛණ්ඩව, පෝෂ්‍යදායී ධාන්‍යමය ආහාර සෑම නිවසකටම යන දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව කටයුතු කර ඇති බව නිරීක්ෂණය නොවිය.

**හිඟ ගබඩා කුලී**

2024 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුව විසින් කුලියට දී ඇති ගබඩා හා පරිශ්‍ර 32 ක් සඳහා පෞද්ගලික අංශයේ ආයතන 15 කින් රු.මිලියන 36.63 ක් ද, ගබඩා 21 ක් සඳහා රාජ්‍ය ආයතන 07 කින් රු.මිලියන 75.77 ක් ද, සන්තකය ලබා ගැනීම හා හිඟ ගබඩා කුලී අය කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති ගබඩා 04 ක් සම්බන්ධයෙන් ආයතන 04 කින් රු.මිලියන 30.75 ක් ද, කුලියට ලබා දී නැවත පවරාගෙන තිබුණු ගබඩා 27 ක් සම්බන්ධයෙන් රු.මිලියන 47.12 ක් ද වශයෙන් රු.මිලියන 190.27 ක හිඟ ගබඩා කුලී අයකරගෙන නොතිබුණි.

## සමූපකාර සංවර්ධන අරමුදල

**අයකර නොගත් ණය හා පොලී**

අත්‍යාවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම සඳහා ණය ලබාදීමට ආරම්භ කර, අරමුදල යටතේ පවත්වාගෙන යනු ලබන චක්‍රීය අරමුදලෙන් 2010 සිට 2024 වර්ෂය දක්වා රු.මිලියන 659 ක් ණය ලබාදී තිබුණි. එහිදී සමූපකාර සමිති 04 ක් සමඟ එළඹ තිබූ ගිවිසුම පරිදි ණය වාරික අයකර නොගැනීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 12.3 ක් වූ වාරික හිඟව පැවති අතර 2025 අප්‍රේල් 30 දිනට එසේ හිඟවූ වාරික මුදල් ශේෂය රු.මිලියන 18.1 ක් දක්වා වැඩි වී තිබුණි. එසේම 2011 හා 2012 වර්ෂවලදී සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමූපකාර සංගමයට ලබාදී තිබූ රු.මිලියන 191ක ණය මුදලින් 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 64.4 ක් තවදුරටත් අයවිය යුතුව පැවති අතර, ණය ගිවිසුම් අනුව ණය ලබාගෙන මාස දෙකක් ඇතුළත ණය පියවිය යුතු වුවත් වසර 12 ක් ගතවී තිබුණ ද ණය ශේෂය හා රු.මිලියන 3.6 ක් වූ පොළිය අයකරගෙන නොතිබුණි. තවද 2011 වර්ෂයේදී සමූපකාර තොග වෙළඳ සංස්ථාවට ලබා දී තිබූ රු.මිලියන 152.5 ක ණය මුදලින් රු.මිලියන 60 ක් 2012 වර්ෂයේදී අයවී තිබුණු අතර, 2024 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයවිය යුතු ණය ශේෂය රු.මිලියන 92.5 ක් ව පැවතුණි. තවද, අරමුදල යටතේ පවත්වාගෙන යනු ලබන කෘෂි නිෂ්පාදන අලෙවි සංවර්ධන අරමුදලින් විවිධ සේවා සමූපකාර සමිති 14 කට ලබාදුන් ණයවලින් 2024 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 11 ක ණය ශේෂය සහ ඊට අදාළ රු.මිලියන 1.9 ක පොළිය අය කරගෙන නොතිබුණි.

## සමූපකාර අතිරික්ත අරමුදල

**අයකර නොගත් ණය හා පොලී**

ලැබිය යුතු භාණ්ඩාගාර නියෝජ්‍ය ණය ලෙස දක්වා තිබූ 2000 වසරේ භාණ්ඩාගාරයට ලබාදුන් පරිපාලන ණය සඳහා ලැබිය යුතු පොළිය රු.මිලියන 81.87 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, අක්‍රිය ණය උපලේඛන අනුව 1989 සිට 2006 වර්ෂය දක්වා කාලය තුළ අරමුදලින් සමූපකාර සමිති 41 කට අවස්ථා 55 කදී ලබා දී තිබුණු එකතුව රු.මිලියන 122.8 ක් වූ ණය මුදලින් 2024 ජනවාරි 01 දිනට අයවීමට පැවති රු.මිලියන 86.9 ක ශේෂයෙන් ණය ලබාදී වසර 18 ත් 35 ත් අතර කාලයක් ගත වී තිබුණද අයවීමට තිබූ රු.මිලියන 81.7 ක් වූ

ණය ශේෂ හා රු.මිලියන 90.6 ක් වූ පොලී 2024 වර්ෂයේදී ද අයකර ගෙන නොතිබුණි.

## ලංකා සතොස ලිමිටඩ්

**අලෙවියට නුසුදුසු තොග**

අලෙවියට නුසුදුසු තොගයන් කාලීනව අලෙවිසැල් වලින් ඉවත් කිරීමට පියවර නොගැනීම හා වෙළඳ තොග ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අකාර්යක්ෂමතා හේතුවෙන් පැලියගොඩ ගබඩාව තුල වසර 6කට වඩා පැරණි රු.මිලියන 124.01ක් වටිනා භාණ්ඩ තොගයක් ඉවත් කිරීමට කටයුතු කිරීමෙන් තොරව ගබඩාවේ රඳවා තිබුණි.

## පාරිභෝගිකයා ආරක්ෂා කිරීමෙහිලා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ දායකත්වය පිළිබඳ සිදුකරන ලද කාර්යසාධන විගණන වාර්තාවේ ඇතුළත් ප්‍රධාන නිරීක්ෂණ

**පනත යටතේ නිකුත් කර ඇති පොදු විධාන**

1979 අංක 01 දරන පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමේ පනත,1987 අංක 01 දරන සාධාරණ වෙළඳ කොමිෂන් පනත, 1950 මිල පාලන පනත යන පනත් තුන අහෝසි කරමින් 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත මඟින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවා තිබුණි. ඒ අනුව 1979 අංක 01 දරන පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමේ පනත යටතේ නිකුත් කර තිබූ පොදු විධාන 62 ක්ද, අධිකාරී පනත යටතේ ද ක්‍රියාත්මක විය යුතු බව අධිකාරියේ පනතේ 73 වගන්තිය යටතේ දක්වා තිබුණි. එසේ වුවද, ඒවායේ වර්තමානයට ගැලපීම සම්බන්ධයෙන් පත් කල කමිටුව විසින් ඉන් විධාන 22 කට අදාල නව විධාන 14 ක් නිකුත් කිරීමට ද, විධාන 19 ක් සම්බන්ධයෙන් තවදුරටත් සලකා බැලීමෙන් අනතුරුව විධාන නිකුත් කිරීමට ද, විධාන 21 ක් අවලංගු කිරීමට ද අධ්‍යක්ෂ මණ්ඩලය වෙත 2019 නොවැම්බර් 01 දින යෝජනා ඉදිරිපත් කර තිබුණ ද එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2003 අංක 09 දරන පාරිභෝගික අධිකාරි පනතේ සංශෝධන කටයුතු 2004 වර්ෂයේදී ආරම්භ කර වර්ෂ කීපයකදී පනතේ වගන්ති 30 ක් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබූ අතර නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව ඒ සම්බන්ධයෙන් සංශෝධන වගන්ති ඇතුළත් වාර්තාවක් 2022 ජූනි 23 දින වෙළඳ වාණිජ හා

ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතරම පනත සංශෝධන කටයුතුද අවසන් වී නොතිබුණි.

**උපරිම සිල්ලර මිල සලකුණු කිරීම**

උපරිම සිල්ලර මිල ලකුණු කර තිබිය යුතු බවට වන විධානයක් 2006 ඔක්තෝම්බර් 13 දින විධාන අංක 08 න් නිකුත් කර තිබුණු අතර එහි භාණ්ඩ වර්ග 56 ක් ලැයිස්තුගත කර තිබුණ ද 2007 ජූලි 11 දින නිකුත් කරන ලද විධාන අංක 12 න් හා එම විධානය අවලංගු කරමින් 2022 නොවැම්බර් 01 දින නිකුත් කරන ලද විධාන අංක 87 න් ද උපලේඛනයේ ඇතුලත් කර තිබුණේ රස කැවිලි (චුයින්ගම් ඇතුළුව), චොකලට්, බිස්කට්, කේක්, සුවඳ සබන් යන භාණ්ඩ වර්ග 05 ක් සඳහා පමණි.

**ගැසට් නිවේදනයේ ඇතුලත් නොකරන ලද භාණ්ඩ**

ශ්‍රී ලංකා රේගුවේ දත්ත අනුව නූඩල්ස්, පැස්ටා, චීස් වැනි භාණ්ඩ වාර්ෂිකව විශාල වශයෙන් ආනයනය කරනු ලැබුව ද 2022 නොවැම්බර් 01 දින නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ එම භාණ්ඩ ඇතුලත් කර නොතිබීම හේතුවෙන් එම භාණ්ඩ මිල ලකුණු කිරීම සඳහා අධිකාරියට හැකියාවක් නොතිබුණි.

**අධිකාරියේ තරඟකාරි ප්‍රවර්ධන අධ්‍යයනය පිළිබඳ වාර්තාවේ ඇතුළත් කරුණු**

I. උපරිම සිල්ලර මිල සම්බන්ධව විධාන අංක 12 අනුගමනය කරන ආනයනකරුවන් ප්‍රමාණය ඉතා කුඩා ප්‍රමාණයක් වන බව හඳුනා ගෙන තිබුණු අතර බොහෝ ආනයනකරුවන් රටට ගෙන්වනු ලබන භාණ්ඩ මත වන බදු ගෙවීම පැහැර හැරීමට උත්සහ දරන බව දක්වා තිබුණි.

II. වෙළෙඳපොලේ පවතින බොහෝ ආනයනික භාණ්ඩ නියමිත ක්‍රමවේදයෙන් බැහැරව රේගුවෙන් නිදහස් කෙරෙන බව හෝ බෑග්වල ආනයනය කරන බව (Baggages) හෝ නියමිත ක්‍රමවේදයට ආනයනය කල ද රේගුවෙන් නිදහස් කල පසු වෙනස් කිරීම් වලට ලක් කරන බව නිරීක්ෂණය කර තිබුණි.

III. ඒ අනුව විධාන අංක 12 හි සඳහන් කරුණු උපරිම සිල්ලර මිල සහතික කිරීම අනුගමනය නොකරන ආනයනකරුවන්ට සමාගම්වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ගවලට යෑමට තරම් ශක්තිමත් නොවන බවත්, උපරිම සිල්ලර මිල සහතික කිරීමෙන් තොරව වෙනත් ආකාරවලින් (Baggage) රටට ආනයනය කරන ලබන භාණ්ඩ වෙළඳපොලේ විකිණීමට පවතින බවත් එම අධ්‍යනයේදී හඳුනාගෙන තිබුණි.

එම අධ්‍යනයේදි නිරීක්ෂණය කර තිබුණු ඉහත කරුණු සම්බන්ධයෙන් ඒවා වළක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අධිකාරිය වර්තමානය වන විට ද අපොහොසත් වී තිබුණි.

**අහිතකර සාම්පල් සම්බන්ධ ක්‍රියා කිරීමේ ප්‍රමාදයන්**

සාම්පල පරීක්ෂා කිරීමේදී අහිතකර ප්‍රතිඵල ලද සාම්පල සම්බන්ධව ඉහත කාලය තුල තිබුණු අවස්ථාවන් 60 ක් නිරීක්ෂණය විය. එම ප්‍රමාද කාලය මාස 03 සිට මාස 22 කාල පරාසයක පැවතුණි.

**පැමිණිලි සම්බන්ධ ක්‍රියා කිරීමේ ප්‍රමාදයන්**

පාරිභෝගික පැමිණිලි අංශය වෙත ලද පැමිණිලි නියැදියක් පරීක්ෂා කිරීමේදී එම පැමිණිලි විසඳීමට අධිකාරියට මාස 11 සිට මාස 34 ක කාල පරාසයක් ගත වී තිබුණද පැමිණිලිකරුට සහනයක් සිදුවී නොමැති බව නිරීක්ෂණය විය.

2015 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුල නීති අංශයේ ලියාපදිංචි කරන ලද පැමිණිලි 1,888 කින් පැමිණිලි 296 ක් සම්බන්ධයෙන් 2022 දෙසැම්බර් 31 දින වන විට විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණු අතර පැමිණිලි 211 කට නියෝග නිකුත් කර තිබුණද ඉන් පැමිණිලි 33 කට අදාලව නියෝග අත්සන් කර නොතිබුණි.

සහන අපේක්ෂාවෙන් පාරිභෝගික ජනතාවට පැමිණිලි ඉදිරිපත් කිරීමට විධිමත් දත්ත පද්ධතියක් හා ඊට සම්බන්ධ කළ හැකි දුරකථන පද්ධතියක් පැවතිම තුල පෙර සඳහන් කල ආකාරයට පැමිණිලිකරු වෙත කෙටි පණිවිඩයක්, මාර්ගගත පැමිණිල්ලේ අංකය හා විමර්ශනයේ ප්‍රගතිය දැනුම්දීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

**දිස්ත්‍රික් සම්බන්ධ වන පරිදි දත්ත පද්ධතියක් නොවීම**

සියලු දිස්ත්‍රික් කාර්යාල සමඟ සම්බන්ධ කිරීමෙන් දත්ත ඇතුලත් කිරීමට හැකි වන පරිදි ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

# ප්‍රජා ප්‍රවාහනය

ශ්‍රී ලංකාව, කලාපය තුළ ප්‍රමුඛතම මහජන කේන්ද්‍රීය ප්‍රවාහන පද්ධතිය සහිත රට බවට පත් කිරීම දැක්ම කරගත් ප්‍රවාහන, මහා මාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ මෙහෙවර වන්නේ ජනතාවගේ ජීවන තත්ත්වයන් නගා සිටුවීම උදෙසා නව්‍යතම තාක්ෂණික ක්‍රමෝපායන් භාවිතා කරමින් ඉතා උසස් ප්‍රවාහන යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම, සංවර්ධනය සහ තිරසරව පවත්වාගෙන යාමයි.

## විගණන නිරීක්ෂණ

### ප්‍රවාහන, මහා මාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ප්‍රවාහන අංශය

**කාර්යභාරය අවසන් නොවී අතහැර දමනලද ව්‍යාපෘති**

ප්‍රවාහන අමාත්‍යාංශය විසින් ප්‍රවාහන ක්ෂේත්‍රයේ විවිධ සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති අතරින් සහසර බස් සේවා නවීකරණ ව්‍යාපෘතිය සහ කුරුණෑගල - හබරණ දුම්රිය ව්‍යාපෘතිය රු.මිලියන 1,578.65ක් වැයකර තිබිය දී ව්‍යාපෘති අඩු භෞතික ප්‍රගතියක් අත්කරගෙන තිබීම, ව්‍යාපෘති සංකල්පය ප්‍රායෝගික නොවීම, අතිරේක ප්‍රතිපාදන අවශ්‍ය වීමේ අවදානම, ව්‍යාපෘතිය යටතේ ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු සඳහා වූ ක්‍රියාකාරකම් දැනටමත් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් ආයතන විසින් කටයුතු කෙරෙමින් පැවතීම යන කරුණු මත 2023 වර්ෂයේ දී වසා දමා තිබුණි. තවද, කුරුණෑගල - හබරණ දුම්රිය ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 282.2ක් වන්දි වශයෙන් ගෙවා තිබුණු ඉඩම් ඒකක 149ක් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කර රජය වෙත විධිමත්ව පවරාගෙන නොතිබුණු අතර වන්දි ලැබූවන් විසින් එම ඉඩම් පරිහරණය කෙරෙමින් පැවතුණි.

**ගෙවීම් තහවුරු කර ගත නොහැකි වූ වාහන 6ක් කොන්ත්‍රාත්කරු භාරයේ පැවතීම**

මාතර කතරගම නව දුම්රිය මාර්ග ව්‍යාපෘතියේ කාර්යභාරය අවසන් කර 2020 දෙසැම්බර් 31 කටයුතු වසා දැමීමට පියවර ගෙන තිබුණද, ව්‍යාපෘති කටයුතු සඳහා මිලදීගෙන ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නමින් ආනයනය කර අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා රේගුව වෙත රු.මිලියන 23.3ක් ආනයන බදු හා ගාස්තු වශයෙන් ගෙවා තිබුණු ටොයෝටා Hilux ඩබල් කැබ් රථ 06ක් සඳහා ප්‍රසම්පාදන පිරිවැය ප්‍රවාහන අමාත්‍යාංශය විසින් දරන ලද්දේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය සාක්ෂි ප්‍රවාහන

අමාත්‍යාංශය සතුව නොතිබීම හේතුවෙන් වාහනවල අයිතිය තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි. මෙම වාහන මේ වන විට කොන්ත්‍රාත්කරු භාරයේ පැවතුණද, ගෙවීම් තහවුරු කර ගැනීමට 2024 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වාහන අස්ථානගතවී තිබීම**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වී ඇති කාර් රථ 7ක්, ලොරි රථයක් සහ මෝටර් සයිකල් 2ක් වශයෙන් වාහන 10ක් පිළිබඳව තොරතුරු නොමැති වී තිබුණු අතර එම වාහන අමාත්‍යාංශය භාරයේ භෞතිකව නොතිබුණි. එමෙන්ම මෙම වාහනවල වටිනාකම් අමාත්‍යාංශයේ වත්කම් ගිණුම්වලට ද ඇතුළත් වී තිබුණි.

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ මගී හා භාණ්ඩ ප්‍රවාහනයේ වඩාත් විශ්වසනීය ප්‍රවාහන සැපයුම්කරු දැක්ම ලෙසත් ආරක්ෂිත, විශ්වාසදායි හා කාර්යක්ෂම දුම්රිය ප්‍රවාහන සේවාවක් සැපයීම මෙහෙවර ලෙසත් ක්‍රියාත්මක ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව මගීන්ට සහ භාණ්ඩ ප්‍රවාහනයට කාලෝචිත සහ විශ්වාසනීය සේවා සහතික කිරීම, දුම්රිය මෙහෙයුම්වල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, ඉහළ ආරක්ෂිත ප්‍රමිතීන් ස්ථාපිත කිරීම මඟින් දුම්රිය සේවයේ ආරක්ෂාව, යටිතල පහසුකම් නවීකරණය, දුම්රිය මෙහෙයුම්වල හොඳම භාවිතයන් මඟින් මගීන්ගේ සුවපහසුව සහ තෘප්තිය ඉහළ නැංවීම යන කාර්යභාරය වූ අතර දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය ඇතුලු උප දෙපාර්තමේන්තු 14කින් දුම්රිය දෙපාර්තමේන්තුව සමන්විතවී ඇත.

**ගමන්වාර අවලංගු වීම හා ප්‍රමාද වීම**

2024 වර්ෂයේ දුම්රිය ගමන්වාර නගරාන්තර, තැපැල් හා සීඝ්‍රගාමී, මිශ්‍ර දුම්රිය, මගී දුම්රිය, භාණ්ඩ ප්‍රවාහන දුම්රිය හා රේල්බස් වශයෙන් සමස්ථ සැලසුම් කළ දුම්රිය ගමන්වාර 125,036කින් දුම්රිය ගමන් වාර 5,305ක් හෙවත් සියයට 4.2ක් අවලංගු වී තිබුණි. තවද ධාවනය කළ දුම්රිය ගමන්වාරවලින් සියයට 49ක් එනම් ගමන්වාර 58,693ක් මිනිත්තු 10 සිට මිනිත්තු 60 දක්වා කාල පරාසයන් තුළ ප්‍රමාද වී ධාවනය වී තිබුණි.

**පොදු ප්‍රවාහනය සඳහා දායකත්වය**

දිගු කාලයක සිට ශ්‍රී ලංකාවේ සමස්ත මගී ප්‍රවාහනයෙන් සියයට 6ක් හා භාණ්ඩ ප්‍රවාහනයෙන් සියයට 6.5ක් දායකත්වයක් ලබාදෙන දුම්රිය සේවය එකී දායකත්වය ඉහළ නංවා ගැනීමට අපොහොසත් වී තිබූ අතර 1934 වර්ෂයේදී දුම්රිය මාර්ගස්ථ ජාලය කි.මී.1,521ක් වුවද

වර්තමානය වන විට එය කි.මී.1,475ක් දක්වා කි.මී.46කින් අඩුවී තිබුණි.

**අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග**

දුම්රිය මාර්ග පද්ධතිය ආශ්‍රිතව ප්‍රධාන හා අප්‍රධාන හරස් මාර්ග 1,362 ක් පවතින අතර එයින් 185 පෞද්ගලික හරස් මාර්ග වන අතර, 1,177 දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ආරක්ෂා කළ යුතු හරස් මාර්ගයන් වේ. දෙපාර්තමේන්තුව විසින් ආරක්ෂා කළ යුතු හරස් මාර්ගයන්ගෙන් දුම්රිය ගේට්ටු ක්‍රියාත්මක වන හරස් මාර්ග සංඛ්‍යාව 300ක් ද, දුම්රිය මාර්ග සංඥා ක්‍රියාත්මක වන හරස් මාර්ග සංඛ්‍යාව 438ක් ද, ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයන් යොදවා ඇති හරස් මාර්ග සංඛ්‍යාව 439ක් ද වේ. තවද, මෙම හරස් මාර්ග 439න් 200ක් සඳහා අතින් ක්‍රියාත්මක වන ගේට්ටු සවිකර ඇති අතර, ඉතිරි හරස් මාර්ග 239 අනාරක්ෂිත තත්ත්වයේ පැවතියද ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබුණි. මෙම අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග පැවතීමත්, හරස් මාර්ග සඳහා යොදවා ඇති ආරක්ෂණ ක්‍රමවේදයන් නිසි පරිදි ක්‍රියාත්මක නොවීමත් හේතුවෙන් 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වූ වර්ෂ 05ක කාලය තුළ හරස් මාර්ග අනතුරු 385ක් සිදුවී තිබූ අතර එයින් පුද්ගල මරණ 37ක් හා තුවාල වීම් 105ක් වාර්තා වී තිබුණි.

## ඉන්දියානු ණය ආධාර යටතේ ක්‍රියාත්මක මහව සිට ඕමන්ත දක්වා දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

**ඉවත් කරන ලද සිල්පර හා රේල්පීලි**

දුම්රිය මාර්ගය අලුතින් ඉදි කිරීම සඳහා දුම්රිය මාර්ගයේ පැරණි සිල්පර හා රේල්පීලි ගලවා ඉවත් කළ යුතු අතර කොන්ත්‍රාත් ගිවිසුමෙහි අයිතම 7.1 වගන්තිය ප්‍රකාරව එම සිල්පර හා රේල්පීලි ගලවා ළඟම දුම්රිය ස්ථානයට ගෙනගොස් භාර දිය යුතු වුවද, ගිවිසුම් ප්‍රකාරව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. කොන්ත්‍රාත්කරු විසින් අදියර 01 හා අදියර 02 යටතේ ගලවා ඉවත් කරන ලද සිල්පර කොට 159,626 සහ රේල් පීලි 106,464ක් මහව සිට ඕමන්තෙ දක්වා දුම්රිය මාර්ගය දෙපස ස්ථාන 1,024ක ගොඩගසා තිබීමෙන් එම තොග 2025 මාර්තු 31 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පැවතුණු බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

**උමං මාර්ගයක් ඉදි කිරීම**

මහව ඕමන්තෙ දුම්රිය මාර්ගය ඉදිකිරීමේ සැලසුම් අදියරේදී ඇතුළත් නොවූ අලි ඇතුන් සඳහා මාර්ගය මාරුවීමට යෝජිත උමඟ සඳහා වන අමතර පිරිවැය එ.ජ.ඩො. 331,336.90 (රු.මිලියන 90.40 ක් ආසන්න වශයෙන්) ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. ඒ අනුව ගල්ගමුව ප්‍රදේශයේ දුම්රිය මාර්ගය කැනීම් කර මීටර් 10ක් දිග සහ මීටර් 05ක් උස උමඟක් ඉදි කරමින් පැවතුණි. එම ස්ථානයේ තාවකාලිකව යොදවා තිබූ පාලමක් මතින් දුම්රිය ගමන් කරන අතර අලිමංකඩ සඳහා උමඟ ඉදි කිරීම පිළිබඳව මුල් අදියරේදී හඳුනාගෙන සැලසුම් කර නොතිබීම මේ සඳහා හේතු වී තිබුණි.

**සංඥා පද්ධතිය ඉදි නොකිරීම**

මෙම මාර්ගය ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී මහව සිට අනුරාධපුරය දක්වා වූ කොටසෙහි සංඥා පද්ධතිය මෙම කොන්ත්‍රාත් විෂය පථයට ඇතුළත් නොවූ අතර සංඥා පද්ධතිය සකස් කිරීම ඊට සමගාමීව ආරම්භ කර නොතිබුණි. නවීකරණය කළ කොටසෙහි දුම්රිය ධාවනය 2025 අප්‍රේල් සිට සංඥා පද්ධතිය නොමැතිව ආරම්භ කර තිබූ නමුත් පැයට කිලෝමීටර 100ක වේගයෙන් දුම්රිය ධාවනය කිරීම ප්‍රමාද වුවද, එම අරමුණ ඉටුකර ගත නොහැකිව පැවතුණි.

**දුම්රිය එන්ජින්, බලවේග කට්ටල, මඟී මැදිරි හා ගැල් උපයෝජනය**

2024 දෙසැම්බර් 31 වනවිට දෙපාර්තමේන්තුව සතුව සමස්ත දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල 267ක ඇණියක් පැවති අතර, එයින් අවුරුදු 30ට වැඩි 122ක් ද, අවුරුදු 20ත් 30ත් අතර 31ක් ද, අවුරුදු 10ත් 20ත් අතර 66ක් ද, අවුරුදු 10ට අඩු 48ක් ද වශයෙන් වූ අතර ඒවායෙන් 103ක් හෙවත් සියයට 38ක ප්‍රතිශතයක් 2025 අප්‍රේල් වන විටත් ධාවනයෙන් ඉවත් කර තිබුණි. ධාවනයෙන් ඉවත් කරන ලද එන්ජින් 39ක් දුම්රිය නැවතුම්පළවලද, 64ක් රත්මලාන දුම්රිය වැඩපොළෙහි ද වසර 01 සිට වසර 08ක කාලයක් තිස්සේ ගාල්කර තිබුණු අතර සමස්ත මඟී මැදිරි 1,662න් 187ක් ද, ගැල් 1,705කින් 889ක් ද නිෂ්කාර්යව පැවතුණි.

**අන්තර්ජාලය මඟින් දුම්රිය ආසන වෙන් කිරීම**

විශාල මඟී ඉල්ලුමක් පවතින කොළඹ කොටුව - බදුල්ල දුම්රිය සඳහා දිනපතා දුම්රිය 04ක් ධාවනය කරනු ලබන අතර අන්තර්ජාලය මඟින් ආසන වෙන් කිරීම පෙර දින පෙ.ව.10.00ට විවෘත වන අතර තත්පර 01ක් තුළ ආසනවලින් සියයට 58කට වැඩි ප්‍රමාණයක් ද, පැයක කාලයක් තුළ ආසන සියල්ලම ද වෙන්කර අවසන් වූ අවස්ථා

සහ එක් හැඳුනුම්පතකට ආසන 05ක් වෙන් කළ හැකි වුවද, එක් හැඳුනුම්පතකට ආසන 24 සිට ආසන 182ක් දක්වා ආසන වෙන්කර තිබුණු අවස්ථා පැවතුණි. වැඩිවන ඉල්ලුම සපුරාලීම සඳහා වූ විකල්ප යෝජනා පිළිබඳ බලධාරීන්ගේ අවධානයට යොමුකර නොතිබුණි. තවද මෙම අන්තර්ජාල ආසන වෙන් කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කරන සමාගම සහ දුම්රිය දෙපාර්තමේන්තුව අතර ගිවිසුම 2023 දෙසැම්බර් 31 දින අවසන් වී තිබුණද ගිවිසුම යාවත්කාලීන කිරීමට හෝ නව ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.

**ඌන උපයෝජිත වත්කම්**

දුම්රිය දෙපාර්තමේන්තුවේ රත්මලාන යාන්ත්‍රික වැඩපළ ජපන් ආධාර යටතේ ඉදි කරන ලද එන්ජින් අලුත්වැඩියාව සහ පරීක්ෂා කිරීම සඳහා යොදා ගනු ලබන Testing Room, රුමේනියන් ආධාර යටතේ ඉදි කරන ලද තීන්ත ඉවත් කිරීම සඳහා යොදා ගනු ලබන Shot Blasting Room හා සිරස් අතට සවි කර ඇති Press Machine යන යන්ත්‍ර හා යන්ත්‍රාගාර රත්මලාන යාන්ත්‍රික අංගනයේ වර්ෂ ගණනාවක් සිට නිශ්කාර්යව පැවතුණි. තවද, කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය (CSRP) මගින් දෙපාර්තමේන්තුවට ලබා දී තිබූ රු.මිලියන 1,081.3ක් වූ බැකෝ යන්ත්‍ර 05ක් සහ ට්‍රැක් මෝටර් කාර් යන්ත්‍රයක් ආනයනයේදීම අඩුපාඩු සහිතව පැවතීම හේතුවෙන් ධාවන තත්ත්වයට ගැළපෙන ලෙස සකස් කරමින් කාර්යයයේ යෙදවීමට සිදුවී තිබුණි.

**කැලණිය - පැරණි දුම්රිය පාලම අබලන් වී පැවතීම**

පේරාදෙණිය විශ්ව විද්‍යාලය මඟින් 2002 වර්ෂයේදී සිදු කරන ලද ශක්‍යතා අධ්‍යයන වාර්තාව පරිදි කැළණිය පැරණි දුම්රිය පාලම 2022 වර්ෂය වන තෙක් භාවිතා කළ හැකි ලෙස වාර්තා කර තිබුණි. පාලම ඉදිරි වසරකින් හෝ දෙකකින් අනිවාර්යයෙන් ඉවත් කළ යුතු වුවත් ඒ සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව හෝ ප්‍රවාහන අමාත්‍යාංශය විසින් ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පෙර සූදානමක් විගණනයට ඉදිරිපත් නොවුණි.

**දුම්රිය පීලි පැනීම් හා විහද්ධ වීම්**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104 (3) රෙගුලාසිය ප්‍රකාරව 2020 සිට 2024 වර්ෂය දක්වා කාලය ඇතුළත දුම්රිය පීලි පැනීම් 585ක්, ගැටීම් 13ක් හා විහද්ධවීම් 62ක් යන සිද්ධීන් 660ක් වාර්තා වී ඇති අතර එයින් අනතුරු 572ක්

සිදුවී වර්ෂ 01 සිට වර්ෂ 04 දක්වා කාලයක් ගතවී තිබුණද, මුදල් රෙගුලාසි 104 (3) පරීක්ෂණ කටයුතු අවසන් වී නොතිබුණි.

**හිඟ ආදායම් අයකර නොගැනීම**

සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඉඩම් බදු කුලී ආදායම්, දුම්රිය බලපත්‍ර ආදායම්, භාණ්ඩ ආදායම් සහ වෙනත් ආදායම් වශයෙන් වූ රු.මිලියන 2,902.22ක ආදායමක් ද, ඛනිජතෙල් පිරවුම්හල් පවත්වාගෙන යාම සඳහා බදු ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව ලබා දී තිබුණු රක්ෂිත ඉඩම් 11කින් 2014 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා ලැබිය යුතු රු.මිලියන 125.83ක ආදායමක් ද, තෙල් පිරවුම්හල් පවත්වාගෙන යාම සඳහා බදු ලබා දී ඇති දුම්රිය රක්ෂිත ඉඩම් 27කින් 1963 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වූ කාලයට අයත් රු.මිලියන 96.43ක ආදායමක් ද වශයෙන් වූ රු.මිලියන 222.26ක හිඟ බදු ආදායම් දීර්ඝ කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩම් වල සවිකර ඇති සන්නිවේදන කුළුණු 177කින් කුළුණු 76ක් සඳහා 2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා බදු අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

## ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

**නිෂ්පාදන ඉලක්ක සපුරා නොගැනීම**

ගමනාගමන මණ්ඩලයේ රථ ඇණියේ භාවිතයට අවශ්‍ය අමතර කොටස් හා බස් බොඩි අළුත්වැඩියාව මණ්ඩලය සතු ප්‍රාදේශීය වැඩපල 12ක් මගින් සිදු කරනු ලබන අතර, 2024 වර්ෂය සඳහා එම වැඩපල වෙත පෙරසවි ටයර්, එන්ජින්, ස්ටාටර් මෝටර්, බස් බොඩි, ගියර් පෙට්ටි, ඕල්ටනේටර්, ඉන්ධන පොම්ප හා ඉන්ධන විදින නිෂ්පාදන වශයෙන් වූ ඒකක 17,928ක නිෂ්පාදන ඉලක්කයන් ලබාදී තිබුණද, නිෂ්පාදනය කර තිබූ ඒකක ප්‍රමාණය 3,831ක් පමණක් විය. එයින් පෙරසවි ටයර් නිෂ්පාදනය අපේක්ෂිත නිෂ්පාදනයෙන් සියයට 16ක් ද, අනෙකුත් නිෂ්පාදන සියයට 50කට අඩු මට්ටමක ද පැවතුණි.

**ගමන් සේවා වාර ගණන අඩුකිරීම**

රථ ඇණිය ප්‍රමාණවත් හා ශක්තිමත් නොවීම හේතුවෙන් රජරට, ඌව සහ වයඹ ප්‍රාදේශීය කාර්යාලයන්ට අයත් ඩිපෝවන් විසින් දුර ගමන් සේවා 77ක් සහ ධාවනය කළ යුතු කෙටි ගමන් සේවා 167ක් 2024

වර්ෂය තුළදී ධාවනය කර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 3,053ක පමණ ආදායමක් අහිමි වී තිබුණි.

**අධිභාර ගෙවීම**

නියමිත දිනට පෙර සේවක අර්ථසාධක දායක මුදල් නොගෙවීම මත රු.මිලියන 26.5ක් අධිභාර වශයෙන් ද නියමිත දිනට පෙර භාරකාර අරමුදලට දායක මුදල් නොගෙවීම මත රු.මිලියන 3ක් අධිභාර වශයෙන් ද 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතේ 05 (1) වගන්තිය ප්‍රකාරව සේවකයන් සේවයෙන් ඉවත්වූ දිනයේ සිට මාසයක් ඇතුළත ගෙවිය යුතු පාරිතෝෂික මුදල එලෙස දින 30ක් ඇතුළත ගෙවීමට කටයුතු නොකිරීම මත රු.මිලියන 5ක මුදලක් ද වශයෙන් රු.මිලියන 34.5ක් අධිභාර වශයෙන් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

**පාරිසරික බලපත්‍ර ලබා ගැනීම**

2008 ජනවාරි 25 දිනැති අංක 1533 /16 දරන අති විශේෂ ගැසට් පත්‍රය සහ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත ප්‍රකාරව ගමනාගමන මණ්ඩලයට අයත් සියලුම ඩිපෝ පරිශ්‍රයන්හි සහ ප්‍රාදේශීය වැඩපලවල ඇති අංගනවල ඉන්ධන හා ලිහිසි තෙල් අපද්‍රව්‍ය සහ ප්ලාස්ටික් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පිළිගත් අනුමත ක්‍රමවේදයක් අනුගමනය කර පාරිසරික බලපත්‍රයක් ලබා ගත යුතු වුවත්, මණ්ඩලයට අයත් ඩිපෝ 109න් ඩිපෝ 52ක් හා ප්‍රාදේශීය වැඩපල 12න් ප්‍රාදේශීය වැඩපල 08ක් මෙම පාරිසරික බලපත්‍රය සමාලෝචිත වර්ෂය අවසන් දිනය වන විට ද ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

**අන්තරායක ඖෂධ පාලක මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ නොතිබීම**

බර වාහන රියදුරන් සඳහා සිදු කරන මුත්‍රා පරීක්ෂාව අදියර 3 ක් අසමත් වන අවස්ථාවල දී එම රියදුරන් සඳහා වෛද්‍ය සහතික නිකුත් කිරීම සිදු කරනුයේ ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය මගින් සිදු කරන රුධිර පරීක්ෂණයකින් අනතුරුව මත්ද්‍රව්‍ය අඩංගු නොවන බවට තහවුරු කරන ලද වාර්තාවකින් පසුව බව සඳහන් කර තිබුණ ද, එවැනි පරීක්ෂාවක් සිදු කිරීම සම්බන්ධයෙන් ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය සහ ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹීමට 2025 මැයි 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

## ජාතික ගමනාගමන කොමිෂන් සභාව

**බස් රථවල ප්‍රමිති පරීක්ෂාවක් සිදු නොකිරීම**

1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 26 වගන්තිය ප්‍රකාරව මහජනයාගේ ආරක්ෂාව සහ පහසුව සුරක්ෂිත කිරීම පිණිස සෑම මගී සේවා අවසර පත්‍රයක් සඳහාම ප්‍රමිති පරීක්ෂාවන් සිදු කල යුතුය. 2024 දෙසැම්බර් 31 දිනට ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් අන්තර් පළාත් මගී ප්‍රවාහන සේවා සැපයීමට අවසර පත්‍ර 3,200ක් පමණ නිකුත් කර තිබුණද, බස් රථ 1,685ක් සඳහා, එනම් සියයට 53ක පමණ ප්‍රමිති පරීක්ෂාවන් සිදු කර නොතිබුණි.

තවද, අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව අන්තර් පළාත් මගී ප්‍රවාහන බස්රථවල ප්‍රමිතීන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් පරීක්ෂා කර ගැනීම සඳහා තීරණය කර තිබුණි. ඒ සඳහා සාමාන්‍ය සේවා බස් රථ සඳහා මෝටර් රථ පරීක්ෂක මහතුන් නිශ්චිතව හඳුනාගෙන ලේඛන ගත කිරීමටත්, ඔවුන්ට බස් රථවල ප්‍රමිති පරීක්ෂාව සඳහා මාර්ගෝපදේශ මාලාවක් ලබා දීමටත් ව්‍යාපෘතියක් 2024 ජූලි මස ආරම්භ කර තිබුණද, එය ක්‍රියාත්මක කර නොතිබුණි.

# මහාමාර්ග

ජාතික, පළාත් සහ ග්‍රාමීය මාර්ගද ඇතුලත්ව රටේ මාර්ග ජාලය වැඩිදියුණු කිරීම මඟින් මඟී ජනතාවට සිය ගමනාන්තය සඳහා පහසුවෙන් ප්‍රවේශ වීමට හැකි වීම, ඉන්ධන පිරිමැස්ම, ගමනාගමන පිරිවැය අවම වීම, මාර්ග තදබදය අවම වීම යන සාධක හේතුවෙන් මහාමාර්ග අංශය සඳහා සිදුකරනු ලබන ආයෝජනය ඉතා ඉහළ ආර්ථිකමය වටිනාකමකින් යුක්ත වේ. ශ්‍රී ලංකාවේ ජාතික මහාමාර්ග ජාලය 2024 වර්ෂය අවසන් වන විට ආසන්න වශයෙන් කි.මී.12,568කින් යුක්ත වන අතර එය “ඒ” ශ්‍රේණියේ මහාමාර්ග දුර කි.මී. 4,217.42කින් ද, “බී” ශ්‍රේණියේ මහාමාර්ග දුර ආසන්න වශයෙන් කි.මී. 8,037.98කින්ද, අධිවේගී මාර්ග දුර ප්‍රමාණය ආසන්න වශයෙන් කි.මී. 312කින්ද, පාලම් 4,254කින් ද සමන්විත වේ.

**රූප සටහන 2.19 - ශ්‍රී ලංකාවේ ජාතික මහාමාර්ග ජාලය**




**මූලාශ්‍රය - ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු**

**ප්‍රතිපාදන උපයෝජනය**

2024 වර්ෂයේදී ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වැය ශීර්ෂය සඳහා රු.මිලියන 356,485ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබාදී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 254,377ක් උපයෝජනය කර තිබුණි. ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය සඳහා 2024 වර්ෂය හා ඊට පෙර වසර 05ක් සඳහා ලැබී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය, වියදම් කළ ප්‍රමාණය හා ඉතිරිය පහත පරිදි විය.

**රූප සටහන 2.20 - පසුගිය වසර 6ක කාලපරිච්ඡේදය තුළ අමාත්‍යාංශයට ලබා දී තිබුණු ප්‍රතිපාදන, උපයෝජනය සහ ඉතිරිය**




| | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|
| ප්‍රතිපාදනය (රු.මිලියන) | 284,665 | 298,027 | 410,118 | 272,062 | 377,837 | 356,485 |
| වියදම (රු.මිලියන) | 177,644 | 258,646 | 230,297 | 214,962 | 250,575 | 254,377 |
| ඉතිරිවීම (රු.මිලියන) | 107,021 | 39,381 | 179,821 | 57,100 | 127,262 | 102,108 |

**මූලාශ්‍රය - වාර්ෂික මූල්‍ය ප්‍රකාශන**

2019 සිට 2024 දක්වා වූ ඉකුත් වසර 06ක කාලය තුල ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත ලබාදී තිබුණු සමස්ථ ප්‍රතිපාදනය රු.මිලියන 1,999,194ක් වූ අතර සමස්ථ වියදම රු.මිලියන 1,386,501ක් වූයෙන් සමස්ථ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 612,693ක් හෙවත් සියයට 31ක් උපයෝජනය කර නොතිබුණි.

## විගණන නිරීක්ෂණ

## මාර්ග සංවර්ධන අධිකාරිය

**උපදේශන සභාව පත් නොකිරීම**

විෂය භාර අමාත්‍යවරයා වෙත උපදෙස් ලබා දීම සඳහා 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 6(1) වගන්තිය යටතේ මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාවක් පිහිටුවිය යුතු අතර, මෙම කමිටුව විසින් උසස් මහාමාර්ග ප්‍රතිපත්තියක් සකස් කිරීම, මාර්ග තත්ත්වය වැඩිදියුණු කිරීම, මාර්ග පිළිබඳ පර්යේෂණ, මාර්ග සැලසුම්, මාර්ග සංවර්ධන තාක්ෂණය සහ ආරක්ෂණ පියවර සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් ලබාදිය යුතුය. නමුත් මෙම උපදේශන සභාව සඳහා සාමාජිකයින් පත්කර නොතිබීම හේතුවෙන් අදාල කාර්යභාරය ඉටුවී නොතිබුණි.

**දිස්ත්‍රික් මාර්ග පද්ධති සම්බන්ධීකරණ කමිටු පත් නොකිරීම**

2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 7(1) වගන්තිය යටතේ දිවයිනේ එක් එක් දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් මාර්ග පද්ධති සම්බන්ධීකරණ කමිටු පත්කළ යුතු අතර, මාර්ග පද්ධති සංවර්ධනය හා නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම, සංවර්ධනය හා නඩත්තු කටයුතු සම්බන්ධීකරණය සහ නඩත්තුව, ව්‍යාපෘති යම් පාර්ශවයකට භාර කිරීම සහ අධීක්ෂණය, මාර්ග සංවර්ධන ව්‍යාපෘති භාරගෙන ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කිරීම ආදී කර්තව්‍යන් ඉටුකල යුතුවේ. නමුත් මෙම කමිටු සඳහා සාමාජිකයින් පත්කිරීම සිදුකර නොතිබීම හේතුවෙන් අදාල කාර්යභාරය ඉටුවී නොතිබුණි.

**නැවත පදිංචි කිරීම සඳහා නිවාස ඉදිකිරීම**

නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක්වන අනවසර පවුල් 1,100ක් සඳහා නිවාස ලබා දීම වෙනුවෙන් 2021 වර්ෂයේ සිට 2025 දක්වා වාරික 05කින් රු.මිලියන 2,388.85ක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවීමට 2021 ජූලි 14 දින ගිවිසුම් ගත වී තිබුණු අතර, අදාළ නිවාස කොලොන්නාව, මාලිගාවත්ත සහ හේනමුල්ල නිවාස ව්‍යාපෘති මඟින් ලබා ගැනීමට සැලසුම් කර තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 1,440ක් වූ වාරික 03ක් ගෙවා අවසන් කර, වාරික 02 ක එකතුව වූ රු.මිලියන 948.85ක් ගෙවීමට නියමිතව තිබූ නමුත් කිසිදු නිවාසයක් අධිකාරිය වෙත භාරදී නොතිබුණි.

**නිෂ්කාර්ය වත්කම්**

ජනාධිපති කාර්යසාධන බලකාය විසින් එක් යන්ත්‍රයක් රු.මිලියන 31.57ක් වූ Aggregate Chip Spreaders යන්ත්‍ර 11ක්, 2010 වර්ෂයේ දී රු.මිලියන 347.37කට ආනයනය කර අධිකාරිය වෙත ලබා දී තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නඩත්තු කරන මාර්ග කාපට් ඇතිරූ A සහ B කාණ්ඩයේ මාර්ග වීම හේතුවෙන් මෙම වර්ගයේ යන්ත්‍රවල අවශ්‍යතාවය මතු වී නොතිබුණු නමුත්, ඒවා භාවිතා කරන පළාත් සභා හෝ පළාත් පාලන ආයතන වෙත එම යන්ත්‍ර පවරාදීමට කටයුතු නොකර වර්ෂ 14ක් නිශ්කාර්යව අධිකාරිය යටතේ රඳවාගෙන 2024 වර්ෂයේදී රු.මිලියන 9.36ක වටිනාකමකට අපහරණය කර තිබුණි.

**අධිවේගී මාර්ගවල ගාස්තු එකතු කිරීමේ ක්‍රමවේදයේ පවතින අඩුපාඩු**

2019 නොවැම්බර් සිට 2024 ජුලි දක්වා වූ වර්ෂ 04 මාස 09ක් තුළ අධිවේගී මාර්ග ප්‍රවේශ ටිකට් පත් (Entry Tickets) 133,840,213ක් නිකුත් කර තිබුණු අතර, ඉන් වාහන 18,291,430 ක් සඳහා පිටවීමේ ටිකට් පත් (Exit Ticket) නිකුත් කර නොතිබීම හේතුවෙන් එම කාලය තුළ අධිවේගී මාර්ගයන්හි ගමන්කළ වාහනයකින් අයකළ සාමාන්‍ය ගාස්තුව පදනම් කරගෙන සිදු කළ ගණනය කිරීම් අනුව, අධිකාරියට අහිමි වූ ආදායම දළ වශයෙන් රු.මිලියන 4,614.47ක් පමණ වන අතර දෛනික ආදායම් අහිමි වීම රු.මිලියන 01ට ආසන්න වී තිබුණි. ඒ අනුව අධිවේගී මාර්ග ආදායම් විවිධ උපක්‍රම භාවිතා කර සාවද්‍ය පරිහරණයට හා වංචාවන්ට ලක්කර තිබිය හැකි නමුත් ඒ පිළිබඳ, වගකිව යුතු මුදල් අයකැමිවරුන් ඇතුළු කාර්ය මණ්ඩලය හඳුනාගෙන විනයානුකූලව කටයුතු කිරීමට හා එම අඩුපාඩු වලක්වා ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමට අධිවේගී මාර්ග කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

තවද, 2019 වර්ෂයේ සිට වසර 04 මාස 09ක කාල සීමාව තුළ අධිවේගී මාර්ග ප්‍රවේශ වීමේ කවුළුවේ සිටි අයකැමිවරුන් විසින් තම අභිමතය පරිදි හෝ නොසැලකිල්ල හේතුවෙන් වාහනයේ වර්ගය වෙනස් කරන (Category Change) ලද ටිකට්පත් 241,964 ක් නිකුත් කර තිබුණි. මෙවැනි අවස්ථා පාලනය කිරීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර පාලනයක් හඳුන්වා දී නොතිබුණු බවද නිරීක්ෂණය විය.

**වාහන පාලනය**

මෝටර රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියට අනුව අධිකාරිය නමින් හා පෙර පැවැති දෙපාර්තමේන්තුව නමින් හෝ අධිකාරිය වෙත පවරන ලද RCDC ආයතනය නමින් හෝ ලියාපදිංචි වී නොමැති වාහන 71ක්ද, අධිකාරිය විසින් පවත්වා ගෙන යනු ලබන වත්කම් ලේඛනයෙහි ඇතුළත් වී නොමැති එහෙත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අධිකාරිය නමින් ලියාපදිංචිව හා පෙර පැවති දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි වී ඇති වාහන 1206 ක්ද පැවතිය ද අදාළ වෙනස්කම් නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**ණය තොරතුරු නොමැතිවීම හා රජයේ හිමිකම් ගිණුම් නොතැබීම**

මහා භාණ්ඩාගාරය අනුමත කර තිබූ රු.මිලියන 581,000ක ණය සීමාව හා භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන සහනදායී ලිපි (letter of comfort) යටතේ අධිකාරියේ ස්ථාවර තැන්පතු ඇපයට තබා 2014 සිට 2021 දක්වා කාලය තුල ලබා ගත් ණය මුදලින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට දේශීය වාණිජ බැංකු 05ක් වෙත ගෙවීමට පැවති රු.මිලියන 233,054ක ණය හා රු.මිලියන 88,515ක ණයකර භාවිතාකළ ආකාරය, එම ණය ආයෝජනය කර ඉදිකරන ලද මාර්ග පිලිබඳ තොරතුරු හා ණය ලබා ගත් මූලාශ්‍ර, දිනය, ණය මුදල, එක් එක් මාර්ගය සඳහා ප්‍රාග්ධනිත කළ ණය ගැණුම් පිරිවැය, ඇපකර, සහන කාලය, ආපසු ගෙවීමේ කාලය, ණය ප්‍රතිව්‍යුහගත කිරිම්, ණය වාරික ගෙවීම්, පොලී ගෙවීම් ආදී තොරතුරු අධිකාරිය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි.

මෙම ණය ලබාගැනීමට ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 02කට අදාළව 2020 වර්ෂයේදී ගෙන තිබූ අමාත්‍ය මණ්ඩල තීරණ අනුව, ණය මුදල්වලට අදාළ පොලී වියදම් සහ අනෙකුත් පිරිවැයන් පියවීම සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපාදන හිමිකම් දායකත්ව වශයෙන් සටහන් නොකර සමාලෝචිත වර්ෂයේදී වැය කල රු.මිලියන 48,195ක් හා 2021, 2022 හා 2023 වර්ෂයන්හි දී වැය කර තිබූ රු.මිලියන 137,271.96ක් ඇතුළුව රු.මිලියන 185,466.96ක ප්‍රතිපාදන ප්‍රාග්ධන ප්‍රදාන (Capital contribution) ලෙස ගිණුම් තැබීම හේතුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් රජයේ දායකත්වය නිවැරදිව නිරූපණය කර නොතිබුණි.

## මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය

**අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව ක්‍රියා කිරීම**

මාර්ග හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2019 නොවැම්බර් 25 දින ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කල “සෑම ව්‍යාපෘති යෝජනාවක් ම නිසි ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් සමඟ ඇගයීම සහ නිර්දේශ කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය” යන නිරීක්ෂණයට යටත්ව ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දීමට 2019 දෙසැම්බර් 18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී

තීරණය කර තිබුණි. එහෙත් ඒ අනුව කටයුතු නොකර 2020-2022 කාල සීමාව තුළ දුර කි.මී. 17,847කින් යුත් මාර්ග 13,160ක් සඳහා රු.මිලියන 394,508.09ක ඇස්තමේන්තු අනුඥාත කොට කොන්ත්‍රාත්කරුවන් සමඟ ගිවිසුම්ගත වීමට හා 2024 සැප්තැම්බර් 30 දිනට රු.මිලියන.190,516.15ක වියදම් දැරීමට රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන මත මාර්ග සංවර්ධන අධිකාරිය කටයුතු කර තිබුණි.

**අතරමඟ නවතා දමන ලද මාර්ග සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළ**

අංක 79/2023 දරන හා 2023 දෙසැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව අතරමඟ නවතා දමන ලද මාර්ග සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළ සඳහා වෙන් වූ රු.බිලියන 28ක මුදල නැවතත් සංශෝධනය කර එම ප්‍රතිපාදන වටිනාකමින් රු.බිලියන 20ක් මාර්ග කි.මී. 1500 වැඩි දියුණු කිරීමේ වැඩසටහනට වෙන් කර දීමේ යෝජනාව 2024 ජනවාරි 25 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඒ අනුව නව මාර්ග මෙම වැඩසටහනට ඇතුළත් නොකළ යුතු බව සඳහන් වුවද එයට පටහැනිව අධිකාරියට අයත් නොවන නව මාර්ග කි.මී 973.5ක් සංවර්ධනය කිරීම ආරම්භ කර තිබුණි.

**බැඳුම්කර කාලය දීර්ඝකර නොගැනීම**

මාර්ග කි.මී 100,000 ව්‍යාපෘතිය යටතේ පළාත් 09ක කොන්ත්‍රාත් 29ක් සඳහා ලබා දී තිබුණු රු.මිලියන 245.8ක් වූ වැඩ පූර්ව අත්තිකාරම් මුදල්වලට අදාළ අත්තිකාරම් බැඳුම්කර 2021, 2022 සහ 2023 වර්ෂවලදී කල් ඉකුත් වීමට පෙර බැඳුම්කර කාලය දීර්ඝකර ගැනීමට සහ බැඳුම්කර අදාළ බැංකුවට ඉදිරිපත් කර මුදල් කර ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

**ඇස්ෆෝල්ට් ඇතිරීමට වෙනම කොන්ත්‍රාත්තුවක් ලෙස ප්‍රදානය කිරීම**

මාර්ග කි.මී 100,000 ව්‍යාපෘතිය යටතේ පිරිනමන ලද වටිනාකම රු.මිලියන 50ට අඩු කොන්ත්‍රාත් පැකේජවල මාර්ගයන්හි ඇස්ෆෝල්ට් ඇතිරීමට වෙනම කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික්ක 22ක 2022 වර්ෂයේදී කොන්ත්‍රාත් අතරමඟ නතර කරන විට Agregate Base Cord (ABC) ඇතිරීම සම්පූර්ණයෙන්ම අවසන් කරන ලද මාර්ගවල 2024 සැප්තැම්බර් 30 දිනට ඇස්ෆෝල්ට් ඇතිරීමේ භෞතික ප්‍රගතිය සියයට 80ට වඩා අඩුවෙන් මාර්ග 405 ක් පැවති අතර එම දුර ප්‍රමාණය කි.මී.

591.03ක් වී තිබුණි. ඒ අනුව, පළමු අදියර යටතේ ABC සම්පූර්ණයෙන් ඇතිරීම සඳහා දරන ලද වියදම නිශ්කාර්ය වියදම් බවට පත් වී තිබුණි.

**පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමේ දෝෂ**

මාර්ග කි.මී 100,000 ව්‍යාපෘතියට අදාළ පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී පිරිවැයට සියයට 20ක් එකතු කර එම වටිනාකම මත සියයට 4.2ක පරිපාලන පිරිවැයක් සහ සියයට 10ක අසම්භාව්‍යන් සඳහා ප්‍රතිශතයක් ලෙස පිරිවැයට සියයට 30කට වැඩි අගයක් එකතු කර ලංසුකරුට ඉදිරිපත් කර ඒ සඳහා උපරිම වට්ටමක් ලබා දීමේ ක්‍රමය අනුගමනය කර තිබුණි. සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී තෝරා ගත් පැකේජ 11ක ඉංජිනේරු ඇස්තමේන්තු සලකා බැලීමේ දී සමස්ථ ලාභයෙන් සියයට 12ක එනම්, රු.මිලියන 11.47ක වට්ටමක් අධිකාරියට ලැබෙන විට සියයට 88ක් එනම්, රු.මිලියන 83.13ක ලාභයක් කොන්ත්‍රාත්කරුවන්ට උපයා ගැනීමට අවස්ථාව සලසා දී තිබුණු බව නිරීක්ෂණය විය.

## රාජ්‍ය සමාගම්

**රාජ්‍ය සමාගම් 03 ක මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම**

ජාතික විගණන පනතේ 16(1),(2) වගන්ති හා 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික මූල්‍ය ප්‍රකාශ හා කාර්යය සාධන වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කර තිබුණු සී/ස මගනැඟුම ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ (පුද්.) සමාගම, මගනැඟුම ඉමල්ෂන් නිෂ්පාදන (පුද්.) සමාගම සහ සී/ස අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්.) සමාගම යන රාජ්‍ය සමාගම් 03 නියමිත දින පසු වී පිළිවෙලින් දින 350, 350 සහ 2,907 ක් ගත වී ඇතත් මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික කාර්යසාධන වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

# වරාය හා නාවික

දකුණු ආසියානු කලාපයේ උපරිම තරඟකාරිත්වයකින් යුතු සාමුද්‍රික සේවා මධ්‍යස්ථානය වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම තුළින් සියලුම සේවාලාභීන්ට හිතකාමී ඉහළ මට්ටමේ සාමුද්‍රිය සේවාවන් මධ්‍යස්ථානය ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම සඳහා වන දැක්මකින් යුතුව ක්‍රියාත්මක වන වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයෙහි වරාය හා නාවික අංශය යටතේ ක්‍රියාත්මක වන වෙළඳ නාවික ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, සීමාසහිත ලංකා නැව් සංස්ථාව, ජය කන්ටේනර් ටර්මිනල් පුද්ගලික සමාගම, වරාය කළමනාකරණ හා උපදේශණ සේවා සමාගම හා මාගම්පුර වරාය කළමනාකරණ (පුද්) සමාගම ලෙස දෙපාර්තමේන්තු 01ක්, හා ව්‍යවස්ථාපිත ආයතන 05ක් ස්ථාපිතව පැවතුණි.

2024 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම සඳහා වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයට රු. මිලියන 9,316ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර 2024 වර්ෂය අවසන්වන විට එයින් රු.මිලියන 1,796ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව 2024 වර්ෂය තුළ රු.මිලියන 7,520ක් උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

**රූපසටහන 2.21 - වාර්ෂික ප්‍රතිපාදන, තථ්‍ය වියදම හා ඉතිරිය**




**මූලාශ්‍රය - 2024 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන**

## වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය

**වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ අරමුණුවලට අනුකූල නොවන වියදම්**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට පවරා ඇති සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවිය යුතු වූ ණය පියවීම සඳහා 2017 දෙසැම්බර් 14 දින රාජ්‍ය බැංකුවකින් ලබා ගන්නා ලද රු.මිලියන 3,951ක ණය මුදලට වාර්ෂිකව සියයට 33.30ක පොලියක් (පොළී අනුපාතය වෙනස් වේ) සමඟ වසර 15ක කාලයක් තුළ ගෙවිය යුතු වන රු.මිලියන 11,797ක ණය මුදල හා වාරික මුදල (පොලිය ඇතුලත්ව) ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් අමාත්‍යාංශය වෙත පවරා තිබුණි. මේ අනුව 2024 වර්ෂයේදී ණය වාරිකය හා පොලිය ලෙස පිළිවෙළින් රු.මිලියන 329ක් හා රු.මිලියන 354ක් ලෙස රු.මිලියන 683ක් අමාත්‍යාංශයේ විෂය පථයට අයත් කාර්යයක් නොවුවද අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ ගෙවීම් කර තිබුණි.

## ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්

**සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතට අනුකූල නොවීම**

අංක 25/2022 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතට අනුව තෙල් පොම්ප කිරීමේ ගාස්තු බදු නිදහස් සේවාවක් ලෙස සැලකිය නොහැකි බැවින් 2022 ඔක්තෝබර් සිට 2024 දෙසැම්බර් 10 දක්වා කාලයට අදාල රු.මිලියන 27ක තෙල් පොම්ප කිරීමේ ගාස්තු මත අයකල යුතු බදු මුදලක් අයකර ගැනීමකින් තොරව ඉන්වොයිස් කර ඇති බැවින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට එම බදු මුදල ප්‍රේෂණය කිරීමට නොහැකි වී තිබුණි.

## ශ්‍රී ලංකා වරාය අධිකාරිය

**ජාත්‍යන්තර ස්ථානය**

2024 වර්ෂය සඳහා ලෝක වරාය මෙහෙයුම් පිළිබඳව නිකුත් කරන ලද ඇල්ෆා ලයිනර් වාර්තාව (Alpha Liner Report) අනුව කොළඹ වරාය විසිසම ඒකක (Twenty Equivalent Units) 7,792,069ක මෙහෙයුම් සිදුකරමින් ලෝකයේ වරායන් අතර 25 වෙනි ස්ථානයේ රැඳී සිටි අතර 2023 වර්ෂයට සාපේක්ෂව නැව් බඩු මෙහෙයුම් කටයුතුවල සියයට 12.1ක වර්ධනයක් දක්නට ලැබුණි. තවද, 2023 වර්ෂයේ කොළඹ වරාය විසිසම ඒකක (Twenty Equivalent Units)

6,949,912ක නැව් බඩු මෙහෙයුම් සිදු කරමින් ලෝකයේ වරායන් අතර 24 ස්ථානයේ රැඳී සිට තිබුණි.

**නැව් බඩු මෙහෙයුම් කටයුතු**

කොළඹ, ගාල්ල, හම්බන්තොට සහ ත්‍රිකුණාමලය යන ප්‍රධාන වරායන් වෙත 2020 වර්ෂයේදී පැමිණි නැව් සංඛ්‍යාව 4,337ක් වී තිබුණත්, 2024 වර්ෂය වන විට එම සංඛ්‍යාව 4,605ක් දක්වා වැඩිවී තිබුණි. එසේම මෙහෙයවන ලද විසිසම (TEUs) බහාලුම් ඒකක ගණන 2020 දී විසිසම ඒකක මිලියන 6.85 ක සිට 2024 වර්ෂයේදී විසිසම ඒකක මිලියන 7.79 ක් දක්වා වැඩි වී තිබුණි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බහාලුම් හැසිරවීම 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී විසිසම ඒකක මිලියන 7,792 ක් දක්වා විසිසම ඒකක 843 කින් එනම්, සියයට 12.1කින් වර්ධනය වී තිබුණි. එසේම මෙහෙයවන ලද සම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණය 2020 වර්ෂයේදී මෙ.ටො.මිලියන 8.9ක සිට 2024 වර්ෂය වන විට මෙ.ටො.මිලියන 7.4ක් දක්වා අඩුවී තිබුණි. විස්තර වගුව 2.24 හි දැක්වේ.

වගු අංක **2.24 - ප්‍රධාන වරායන්වල මෙහෙයවන ලද බහාලුම් ඒකක හා සම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණය**

| විස්තරය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| **පැමිණි නැව් සංඛ්‍යාව** | 4,337 | 4,180 | 4,073 | 4,823 | 4,605 |
| **මෙහෙයවන ලද විසිසම (TEUs) බහාලුම් ඒකක ගණන (ඒකක ‘000)** | 6,854 | 7,249 | 6,862 | 6,949 | 7,792 |
| **මෙහෙයවන ලද සම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණය (ටොන් ‘000)** | 8,894 | 9,229 | 6,249 | 6,271 | 7,370 |

**මූලාශ්‍රය - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2024 වර්ෂයේ කාර්යසාධන සමාලෝචන වාර්තාව**

**යාත්‍රා ආගමනය**

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී 2024 වර්ෂයේදී කොළඹ වරාය වෙත යාත්‍රා පැමිණීම යාත්‍රා 269කින් හෙවත් සියයට 6.35කින් අඩු වී තිබුණි. මධ්‍යම සහ කුඩා ප්‍රමාණයේ යාත්‍රා වෙනුවට විශාල ප්‍රමාණයේ යාත්‍රා පැමිණීම හේතුවෙන් 2019 වර්ෂයෙන් පසුව 2021 වර්ෂය දක්වා බහාලුම් යාත්‍රා පැමිණීමේ ක්‍රමික අඩුවීමක් නිරීක්ෂණය වූ නමුත් 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ බහාලුම්ගත යාත්‍රා 603ක එනම් සියයට 18ක වර්ධනයක් නිරීක්ෂණය වූ අතර 2024 වර්ෂයේදී එය බහාලුම් යාත්‍රා 368ක එනම්, සියයට 9.5ක පසුබෑමක් නිරීක්ෂණය විය. වෙනත් යාත්‍රා පැමිණීම 2023 වර්ෂයට සාපේක්ෂව

සියයට 24 ක් වර්ධනයක් නිරීක්ෂණය විය. විස්තර රූපසටහන 2.22 හි - වර්ගීකරණය සහිතව හා රූපසටහන 2.23 හි පරිදි වේ.

**රූපසටහන 2.22 - කොළඹ වරායට යාත්‍රා පැමිණීම**




| | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|
| බහලුම්ගත | 3,604 | 3,281 | 3,180 | 3,287 | 3,890 | 3,522 |
| සාම්ප්‍රදායික | 77 | 64 | 62 | 31 | 32 | 54 |
| වෙනත් | 517 | 461 | 433 | 330 | 315 | 392 |

**මූලාශ්‍රය - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2024 වර්ෂයේ කාර්යසාධන සමාලෝචන වාර්තාව**

**රූපසටහන 2.23 - කොළඹ වරායට යාත්‍රා පැමිණීම (ආගමනය) - මුළු යාත්‍රා සංඛ්‍යාව**




| | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|
| පැමිණි මුළු යාත්‍රා සංඛ්‍යාව | 4,198 | 3,806 | 3,675 | 3,648 | 4,237 | 3,968 |

**මූලාශ්‍රය - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2024 වර්ෂයේ කාර්යසාධන සමාලෝචන වාර්තාව**

**පර්යන්ත මෙහෙයුම් කටයුතු**

කොළඹ වරාය විසින් 2001 වර්ෂයේදී බහාලුම් ඒකක 1,626,616ක් මෙහෙයවා තිබූ අතර 2024 වර්ෂය වන විට එම සංඛ්‍යාව බහාලුම් ඒකක 7,792,069 දක්වා වර්ධනය වී තිබූ නමුත් මෙම බහාලුම් මෙහෙයුම් කටයුතුවලදී කොළඹ වරාය තුළ, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෙළඳපොල කොටස 2001 වර්ෂයේ සිට 2024 වර්ෂය අවසානය දක්වා වර්ෂ විසි තුනක කාලය තුළ සියයට 81ක සිට සියයට 31ක් දක්වා පහත වැටී තිබුණි. කොළඹ වරාය තුළ වරාය අධිකාරියේ මෙහෙයුම් කටයුතු 2021 වර්ෂය දක්වා ජය බහාලුම් පර්යන්තය (JCT) මගින් පමණක් සිදු කර තිබූ අතර 2021 වර්ෂයේ සිට කොළඹ නැගෙනහිර බහාලුම් පර්යන්තය (CECT) මෙහෙයුම් කටයුතු සඳහා එකතු විය. දිගුකාලීන බදු පදනම මත දකුණු ආසියානු

පිවිසුම් පර්යන්තය (SAGT) 2001 වර්ෂයේදී මෙහෙයුම් කටයුතු ආරම්භ කර සියයට 26ක වෙළඳපොළ කොටසක්ද, කොළඹ ජාත්‍යන්තර බහාලුම් පර්යන්තය (CICT) 2013 වර්ෂයේදී මෙහෙයුම් ආරම්භ කර සියයට 43ක වෙළඳපොළ කොටසක්ද 2024 වර්ෂය වන විට හිමිකරගෙන තිබුණි. පසුගිය වර්ෂ පහක බහාලුම් හැසිරීම පිළිබඳ විස්තර වගුව 2.25 පරිදි වේ.

වගු අංක **2.25 - පසුගිය වර්ෂ පහක බහාලුම් හැසිරීම පිළිබඳ විස්තර**

| වර්ෂය | SLPA (වාර්ෂික පර්යන්ත ධාරිතාවය බහාලුම් විසිසම ඒකක මිලියන 2.75) | වෙළඳපල කොටස | SAGT (වාර්ෂික පර්යන්ත ධාරිතාවය බහාලුම් විසිසම ඒකක මිලියන 1.950) | වෙළඳපල කොටස | CICT (වාර්ෂික පර්යන්ත ධාරිතාවය බහාලුම් විසිසම ඒකක මිලියන 2.9) | වෙළඳපල කොටස | එකතුව බහාලුම් විසිසම ඒකක |
|---|---|---|---|---|---|---|---|
| **2020** | 2,097,804 | 31 | 1,872,052 | 27 | 2,884,906 | 42 | 6,854,762 |
| **2021** | 2,198,334 | 30 | 1,838,693 | 25 | 3,212,331 | 45 | 7,249,358 |
| **2022** | 1,925,895 | 28 | 1,752,236 | 26 | 3,184,053 | 46 | 6,862,184 |
| **2023** | 1,965,131 | 28 | 1,763,863 | 26 | 3,220,918 | 46 | 6,949,912 |
| **2024** | 2,413,162 | 31 | 2,025,840 | 26 | 3,353,067 | 43 | 7,792,069 |

මූලාශ්‍රය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ **2024** වර්ෂයේ කාර්යසාධනය සමාලෝචන වාර්තා

**රූපසටහන 2.24 - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත මෙහෙයුම් කටයුතු**




**මූලාශ්‍රය - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2024 වර්ෂයේ කාර්යසාධනය සමාලෝචන වාර්තාව**

ඉහත දත්ත අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියට බහාලුම් මෙහෙයවීම සඳහා හිමිව තිබුණු වෙළඳපොල කොටස ක්‍රමානුකූලව පුද්ගලික අංශය වෙත නතු වෙමින් පැවතුණි. අධිකාරියේ බහාලුම් මෙහෙයුම් කටයුතු (JCT) සම්බන්ධ පර්යන්ත උපයෝජන අනුපාතය (Berth Occupancy Ratio) සලකා බැලීමේදී 2020 සිට 2024 වර්ෂය දක්වා එය පිළිවෙලින් සියයට, 72ක්, 70ක්, 63ක්, 58ක් හා 76 වී තිබුණි. ඒ අනුව අධිකාරියේ පර්යන්ත උපයෝජන අනුපාතය 2024 වර්ෂයේදී 2023 වර්ෂයට සාපේක්ෂව සියයට 31කින් වැඩි වී තිබුණි. SAGT හා CICT බහාලුම් පර්යන්තයන්හි ධාරිතාවය පිළිවෙලින් විසිසම ඒකක මිලියන 1.95ක් හා මිලියන 2.9ක් වුවද, 2024 වර්ෂයේ සත්‍ය බහාලුම් මෙහෙයුම් පිළිවෙලින් විසිසම ඒකක මිලියන 2.02ක් හා විසිසම ඒකක මිලියන 3.35ක් වූ අතර SAGT හා CICT පර්යන්තයන් උපරිම ධාරිතාවයද ඉක්මවා තිබුණි. නමුත් අධිකාරියේ සියලු පර්යන්තයන්වල (JCT සහ CECT) ධාරිතාවය විසිසම ඒකක මිලියන 2.75ක් වුවද, 2024 වර්ෂයේ සත්‍ය බහාලුම් මෙහෙයුම් විසිසම ඒකක මිලියන 2.41ක් එනම් සියයට 87ක් පමණක් උපයෝජනය කර තිබුණි.

**කොළඹ නැගෙනහිර බහාලුම් පර්යන්තයේ (CECT) ඌන උපයෝජනය හා ව්‍යාපෘතියේ වැඩ ප්‍රමාදවීම්**

JCT පර්යන්තයේ ධාරිතාවය ප්‍රමාණවත් නොවීම මත CECT පර්යන්තය ඉදිකිරීම සඳහා කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියට අදාළව ලංකා බැංකුවෙන් අරමුදල් සම්පාදිතව බහාලුම් විසිසම ඒකක මිලියන 0.8ක වාර්ෂික ධාරිතාවයක් සහිත ඉදිකිරීම් පිරිවැය රු.මිලියන 11,168ක් වූ මීටර් 18ක ගැඹුරැති හා මීටර් 440ක් දිගැති නැගෙනහිර බහාලුම් පර්යන්තයේ අදියර 1 හි ඉදිකිරීම් කටයුතු 2015 මැයි මාසයේ අවසන් කර තිබුණි. නමුත් බහාලුම් හැසිරවීම සඳහා අවශ්‍ය දොඹකර නොතිබීම හේතුවෙන් JCT සඳහා මිලදී ගත්, නෞකාවේ සිට ගොඩබිම දක්වා මෙහෙයුම් කටයුතු සිදුකළ හැකි දොඹකර තුනක්, 2020 පෙබරවාරි 07 දිනැති අංක PA/HD/25 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි CECT හි සවිකර, එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණි.

2021 පෙබරවාරි 01 දිනැති අංක. අමප/21/0198/328/005/ටිබීආර් දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් CECT පර්යන්තය සංවර්ධනය කිරීම, මෙහෙයුම් උපකරණ මිලදී ගැනීමට අනුමැතිය ලබාදී තිබුණි. 2024 වර්ෂය තුළදී ගැඹුර මීටර් 14.25ට වැඩි විශාල ප්‍රමාණයේ බහාලුම් නෞකා 62ක් පර්යන්තය වෙත පැමිණ තිබූ අතර බහාලුම් 167,028ක් පර්යන්තය තුළ මෙහෙයවා තිබුණි. 2021 වර්ෂයේ සියයට 43ක්ව පැවති පර්යන්ත ධාරිතා උපයෝජන අනුපාතය (Capacity

Utilization) 2024 වර්ෂයේදී සියයට 63ක් දක්වා වැඩිවී තිබුණි. CECT හි බහාළුම් අංගනයේ අදියර I හි මෙහෙයුම් කටයුතු වර්ධනය කිරීමට අවශ්‍ය වූ බැවින් අදියර II හි භාවිතා කිරීම ද අරමුණු කර විශාල පරිමාණයේ STS දොඹකර 12ක් හා රේල් පීලි මත සවිකර ක්‍රියාකරන ස්වයංක්‍රීය ගැන්ට්‍රි දොඹකර 40ක් (ARMG Cranes) එ.ජ.ඩො. මිලියන 282.56 කට මිලදීගෙන තිබුණි. 2025 ජුනි 06 දින වන විට දොඹකර සියල්ලම අධිකාරිය වෙත ලැබී තිබුණද STS දොඹකර 06ක් පමණක් මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගන්නා අතර Phase II හි Reclamation Area හි ඉදිකිරීම් ප්‍රමාදය හේතුවෙන් ඉතිරි STS දොඹකර 06ක් සහ ARMG දොඹකර සියල්ලම Commissioning කටයුතු අවසන් නොකොට කිසිදු මෙහෙයුම් කටයුත්තක් සඳහා යොදා ගැනීමකින් තොරව නිෂ්කාර්යයව පැවතුණි.

දොඹකර අංගනය සහ බහාලුම් අංගනය අතර බහාලුම් හුවමාරු කිරිමේ මාධ්‍යයක් ලෙස භාවිත කිරීම සඳහා Straddle Carriers මිලදී ගැනීමට 2021 වර්ෂයේ සිට මේ දක්වා අවස්ථා 4ක් යටතේ ලංසු කැඳවා තිබූ නමුත් එම ක්‍රියාවලිය ආරම්භ කිරීමට ප්‍රථම උපකරණ වර්ගය, අවශ්‍ය ප්‍රමාණය, පිරිවිතරයන් යනාදිය පිළිබඳව නිසි අධ්‍යනයක් නොකිරීම මත එක් එක් ලංසු කැඳවීම් අවස්ථාවලදී තීරණවල වෙනස්කම් හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. එම ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා දින 446ක කාලයක් ගත වන බව නිශ්චය කර තිබූ අතර, එම ප්‍රමාදවීම නිසා CECT අදියර II හි ඉදිකිරීම් කටයුතු අවසන් වීමට නියමිත 2026 ජූලි මස වන විට එම උපාංග මිලදී ගැනීමට නොහැකි වීමෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත කාර්යයන් නියමිත කාලය තුල ආරම්භ කිරීමට නොහැකිවීමේ අවදානමක් පැවතුණි.

**කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණ කටයුතු**

උතුරු නැගෙනහිර පිවිසුම් කලාප සංකල්පය සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය, ඉන්දියානු එක්සිම් බැංකුව සමඟ එ.ජ ඩොලර් මිලියන 45.27ක ණය මුදලක් ලබා ගැනීමට ගිවිසුම් ගත වී තිබුණි. නමුත් එම ණය මුදල ප්‍රමාණවත් නොවේ යැයි පුරෝකථනය කර .එ.ජ ඩොලර් මිලියන 16.23ක අතිරේක මුදලක් සමඟ එ.ජ ඩොලර් මිලියන 61.5ක් දක්වා එම ණය මුදල ඉහළ නංවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇතත් ඉන්දියානු රජය එය අනුමත කර

නොතිබුණි. එබැවින් වරායෙහි ඉදිකිරීම් කටයුතු මෙතෙක් ආරම්භ කර නොතිබුණි. එසේම ණය මුදලින් එ.ජ ඩොලර් මිලියන 0.905 (රු. මිලියන 268.9) ක් පමණක් වැයකර තිබුණු අතර ලබා නොගත් ණය සඳහා කැපකිරීමේ ගාස්තු (commitment charges) ලෙස ගෙවා තිබුණු එ.ජ ඩොලර් 43,941.27 (රු.මිලියන 12.8) ක මුදලක් සහ ණය පොළිය ලෙස ගෙවා තිබුණු එ.ජ ඩොලර් 53,235.41 (රු.මිලියන 15.94) ක මුදලක් ද අනාර්ථික වියදමක් වී තිබුණි.

තවද එ.ජ.ඩොලර් මිලියන 16.23ක අතිරේක පිරිවැය, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් (PPP) මත පදනම්ව මූල්‍යායනය කිරීමට කරන ලද ඉල්ලීමට ප්‍රතිචාරිකව 2024 මාර්තු 15 දිනැති රාජ්‍ය තාන්ත්‍රික සටහන මගින් එ.ජ ඩොලර් මිලියන 63.65ක විශේෂ මූල්‍ය ප්‍රදානයක් ලබා දීමට ඉන්දියානු රජය තීරණය කර තිබුණ ද, ඉන්දියානු රජය විසින් එවන ලද අවබෝධතා ගිවිසුමෙහි පැවති ගැටලුකාරි කරුණු මත මේ වන තෙක් අවසාන නිගමනයකට එළඹ නොතිබුණු අතර මෙම ව්‍යාපෘතිය මෙතෙක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් රජය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශය යටතේ රු.මිලියන 4,591ක් වෙන් කර තිබුණ ද එයින් කිසිවක් උපයෝජනය කර නොතිබුණි.

**විධිමත්ව ඉඩම් පවරා දී නොතිබීම**

ඩී.ආර්.විජේවර්ධන මාවතේ පිහිටි වටිනාකම රු.මිලියන 628.5ක් වූ අක්කර 02 රූඩ් 03 පර්චස් 9.61ක් වූ ඉඩම නෙළුම් කුළුණ ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත භුක්තිය භාරදී තිබූ සහ කැනල් අංගනය (බටහිර) කොළඹ 01 කෙලින් වීදියට හා ඕල්කට් මාවතට මායිම් වන වටිනාකම රු.මිලියන 947.5ක් වූ අක්කර 02ක ඉඩම් රේගු දෙපාර්තමේන්තුවට ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ලබාදී තිබූ නමුත් එම ඉඩම් වෙනුවෙන් වන්දි මුදල් 2024 දෙසැම්බර් 31 දින දක්වා අධිකාරියට ලැබී නොතිබුණි.

තවද, කොළඹ 10 විජේවර්ධන මාවතේ නෙලුම් කුලුන අසල ඇති ඉඩම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ලබාදීම වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය වන රු.මිලියන 37.9 තුළ වර්ෂ 2ත් 5ත් අතර සහ වර්ෂ 05 ඉක්මවූ නිරවුල් නොවූ ශේෂ පිළිවෙලින් රු.මිලියන 29.7ක් සහ රු.මිලියන 10ක් පැවතුණි. මෙම ඉඩමට අදාලව කල් බදු ගිවිසුමකට ද එළඹ

නොතිබූ අතර මේ වන විටත් මෙම මුදල් අයකර ගැනීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි.

එසේම, සිරිල් සී පෙරේරා මාවතේ පිහිටි වටිනාකම රු.මිලියන 83.723ක් වූ අක්කර 01 රූඩ් 02 පර්චස් 14.9ක් වූ ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරාගෙන තිබූ නමුත් නීත්‍යානුකූල හුවමාරුවීම් කටයුතු 2024 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.

**අධිකාරියට පවරාදී නොමැති කොටස් හිමිකම**

1999 වර්ෂයේදී දකුණු ආසියා පිවිසුම් පර්යන්ත (South Asia Gateway Terminal Ltd-SAGT) සමාගම ආරම්භ කරන අවස්ථාවේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ලබාදුන් දොඹකර තුනක අගය හුවමාරු කර ගැනීම සඳහා රු.මිලියන 141.63ක වටිනාකමට එම සමාගමෙහි කොටස් අධිකාරිය වෙත ලබාදෙන බවට එකඟ වී තිබුණි. කෙසේ වුවද, 2024 වර්ෂය අවසන් වන තෙක් අදාල කොටස් හිමිකම අධිකාරිය වෙත ඒ අනුව ලබාදී නොතිබුණි.

**පරිපාලිත සමාගම් සඳහා ප්‍රතිපත්ති සකස් නොකිරීම**

2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමග නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ සංස්ථාපිත යහපාලන මාර්ගෝපදේශය අනුව පරිපාලිත සමාගම් සඳහා මව් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කරන ලද පරිපාලිත සමාගම් ප්‍රතිපත්තියක් (Board approved subsidiary policy) සකස් කර ඒ අනුව කටයුතු කල යුතු වුවත් අධිකාරිය සතු පරිපාලිත සමාගම් සඳහා එවැනි ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි.

**පරිපාලිත සමාගමක් විසින් ලබා ගත් ණය වෙනුවෙන් ඇප වීම**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලිත සමාගමක් ලෙස මාගම්පුර වරාය කළමනාකරණ සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2013 ජූලි 05 වන දින සංස්ථාපනය කර තිබුණු අතර කළමනාකරණ ගිවිසුමක් මගින් හම්බන්තොට වරායේ මෙහෙයුම් කළමනාකරණය සමාගම වෙත පවරා තිබුණි. සමාගම විසින් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ලබාගත් බලපත්‍රයක් මඟින් හම්බන්තොට වරායේ ඉන්ධන සැපයුම්කරුවෙකු ලෙස මෙහෙයුම් ආරම්භ කළ අතර ඒ සඳහා 2014 වර්ෂයේදී සමාගම පුද්ගලික

බැංකුවකින් එ.ජ ඩොලර් මිලියන 24ක ණය මුදලක් ලබාගෙන තිබුණි. ඒ අනුව ගබඩා කිරීම සහ ජාත්‍යන්තර නෞකාවලට ප්‍රති අපනයනය කිරීම අරමුණු කරගෙන ඉන්ධන ආනයනය කර තිබුණි. කෙසේ වෙතත්, මූලික වශයෙන් ලෝක වෙළඳපලේ තෙල් මිල පහත වැටීම හේතුවෙන් සමාගමට ඉන්ධන සැපයුම මඟින් සැලකිය යුතු පාඩුවක් සිදුවී තිබුණු බැවින් එයින් ණය මුදල හා පොළිය ලෙස ඇ.එ.ජ ඩොලර් මිලියන 26.49 (රු.මිලියන 9,617) ක් මෙම වාර්තාවේ දින වන විටත් පියවා නොතිබුණි. 2017 නොවැම්බර් සිට සමාගමේ මෙහෙයුම් කටයුතු නතර කර තිබූ අතර ණය පියවීම සඳහා සමාගම සතු ප්‍රමාණවත් වත්කම් නොවූයෙන් බැංකුව විසින් මෙම ණය අයකර ගැනීම සඳහා පරිපාලිත සමාගමට හා අධිකාරියට විරුද්ධව නඩු දෙකක් 2020 වර්ෂයේ කොළඹ දිසා අධිකරණයේ පවරා තිබුණු අතර 2023 වර්ෂය අවසාන වන විටද නඩු කටයුතු අවසන්ව නොතිබුණි. තවද, බස්නාහිර පළාත් ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක HC (Civil) 97/2021/CO දරන නඩු තීන්දුව ප්‍රකාරව 2022 ජුනි මස 01 වන දින සිට ඈවරකරුවකු පත්කර සමාගම ඈවර කිරීමේ කටයුතු දැනට සිදුකරගෙන යනු ලබන අතර මේ වන තෙක් මෙම සමාගමේ ඈවර කටයුතු අවසන් වී නොතිබුණි.

**මානව සම්පත් කළමනාකරණය**

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 ඡේදය සහ 2013 ජනවාරි 23 දිනැති අංක DMS/F1/3/3-1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ලිපිය අනුව යම් ආයතනයක් විසින් බඳවා ගැනීමේ කාර්යය පටිපාටියක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවත් අධිකාරිය විසින් කෙටුම්පත් බඳවාගැනීමේ හා උසස්කිරීමේ පටිපාටි සකස්කර තිබුණද ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## සී/ස ලංකා නැව් සංස්ථාව

**සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය**

සී/ස ලංකා නැව් සංස්ථාව ශ්‍රී ලංකාවේ නාවික ආනයන අපනයන ප්‍රවාහන කාර්යයෙහිලා පහසුකම් සැපයීම සඳහා පිහිටුවා ඇති රාජ්‍ය හිමිකාරිත්වය ඇති ව්‍යවසායක් වන අතර මෙම සමාගම විසින් රාජ්‍ය අනුග්‍රහය ද සහිත ව සිලෝන් බ්‍රීස් හා සිලෝන් ප්‍රින්සස් නමින් නැව්

දෙකක හිමිකාරිත්වය ලබාගෙන තිබුණි. සමාගම විසින් වර්තමානයේ දී නාවික ගමනාගමනය හා හිමිකාරිත්වය, නාවික යාත්‍රා කුලියට ලබා දීම, (Chartering), යාත්‍රා නොවන මෙහෙයුම් පොදු වාහක (NVOCC) සහ සැපයුම් සේවා (Logistics) පිළිබඳ කළමණාකරණ සේවා සැපයීම යන මෙහෙයුම් කටයුතුවල නියැළී තිබුණි.

**රූපසටහන 2.25 - නැව් සංස්ථා සමාගමේ ආදායම් හා වියදම් - (2015-2024)**




**මූලාශ්‍රය - සීමා සහිත ලංකා නැව් සංස්ථාව**

2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව සමාගමේ ලාභය රු.මිලියන 763.21ක් වූ අතර සමුච්චිත අලාභය රු.මිලියන 9,979.20ක් විය. තවද, 2024 මාර්තු 31 දිනට සමාගමේ ශුද්ධ වත්කම්වල අගය රු.මිලියන 8,358.20ක සෘණ අගයක් ගෙන තිබුණි.

**රාජ්‍ය අංශය විසින් නැව් මගින් භාණ්ඩ ආනයනය**

2005 මැයි 06 දිනැති අංක 415 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2016 පෙබරවාරි 18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ ලිපි අංක 03 හි දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව කටයුතු කරමින් රාජ්‍ය අංශයේ ආනයන භාණ්ඩ ප්‍රවාහනය සමාගම හරහා සිදු කිරීමට පහසුකම් සලසා තිබුණ ද, 2019 අප්‍රේල් 01 සිට 2024 මාර්තු 31 දක්වා වර්ෂ 5 තුළ සී/ස ලංකා නැව් සංස්ථාව හරහා භාණ්ඩ ආනයනය කරන ලද රාජ්‍ය ආයතන ගණන සාපේක්ෂව අඩුවෙමින් පැවතුණු අතර 2024

වර්ෂයේ දී රාජ්‍ය ආයතන 23කින් ලද ආනයනයන් පමණක් ඉටු කර තිබුණි. තරඟකාරී නැව් ගාස්තු ක්‍රමයක් මත රාජ්‍ය ආනයනයන්ගෙන් වැඩි ප්‍රතිශතයක් සමාගම වෙත නතුකර ගැනීමට කටයුතු කිරීම මගින් ලාභදායිත්වය වර්ධනය කර ගැනීමේ හැකියාව පැවතුණ ද සමාගමේ ප්‍රවාහන ගාස්තුව, ආනයනයට සම්බන්ධ සැපයුම්කරුවන්ගේ නැව් ගාස්තුවලට වඩා වැඩිවීම හේතුවෙන් 2023/24 වර්ෂයේ දී අත්හැරීමේ නිවේදන 53ක් නිකුත් කිරීමට සිදුවී තිබුණි.

## වෙළඳ නාවික ලේකම් කාර්යාලය

**මූල්‍ය කාර්යසාධනය**

ශ්‍රී ලංකාවේ වෙළඳ නාවික කටයුතු පරිපාලන භාර හා සමුද්‍ර කටයුතු අධීක්ෂණය කිරීමේ සමස්ථ වගකීම වෙළඳ නාවික ලේකම් කාර්යාලය මගින් ඉටු කරනු ලබන අතර 2024 වර්ෂයේදී ලේකම් කාර්යාලයේ පුනරාවර්තන හා මූලධන වියදම් එකතුව රු.මිලියන 171ක් හා ආදායම් ලැබීම් රු.මිලියන 224ක් විය.

## ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශක සේවා සමාගම

**සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියට සහාය සේවාවන් සැපයීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියයට 40ක හා ලංකා නැව් සංස්ථාවේ සියයට 15ක කොටස් ප්‍රාග්ධනයකින් යුතුව සමාගම පිහිටුවා ඇත. 2024 වර්ෂයේ සමාගමේ සමස්ත ආදායම රු.මිලියන 254.60ක් වූ අතර සමස්ත වියදම රු.මිලියන 245.82ක් විය. ස්ථාවර තැන්පතු ආයෝජන පොළී ආදායම හේතුවෙන් සමස්තයක් ලෙස සමාගම ලාභදායී තත්ත්වයක් පෙන්වූව ද, 2022, 2023 හා 2024 වර්ෂයන්හි දී රු. මිලියන 8.01, රු.23.50 සහ රු. මිලියන 10.42 වශයෙන් සමාගම අඛණ්ඩ මෙහෙයුම් පාඩු ලබා තිබූ අතර එම කාලසීමාව තුළ සමාගමේ ද්‍රවශීලතා තත්ත්වය සියයට 1.7 සිට සියයට 1.09 දක්වා පහත වැටීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කර ඇත.

**ලැබිය යුතු ආදායම්**

වරාය අධිකාරියට අයත් Macculum Gate පරිශ්‍රයේ භෝජනාගාරයක් 2008 සිට 2023 දක්වා පවත්වා ගෙනයාම සඳහා තෙවන පාර්ශවයක් සමග ගිවිසුම් ගතවී තිබූ අතර ඒ වෙනුවෙන් රු.මිලියන 4.5ක මුදලක් සමාගමට අයකර ගත යුතුව තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විටත් එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

සමාගම විසින් සිදුකරනු ලබන ගාලුමුවදොර පිටිය පරිපාලනය ව්‍යාපාරයට අදාළව ගාලුමුවදොර පිටියේ වෙරළ තීරයට යාබදව පිහිටා ඇති භූගත කඩ කාමර 42න් (B-Zone) කඩ කාමර 03ක් 2025 මැයි වන විටත් බදු දීමට නොහැකි වී තිබූ අතර ගාලුපාරට යාබදව පිහිටා ඇති භූගත කඩකාමර 20 (A-Zone) න් 16 ක් හා වෙරළ තීරයට යාබදව පිහිටා ඇති භූගත කඩ කාමර 42 (B-Zone) න් 11 ක් තාවකාලිකව වසා දමා තිබුණි.

# ගුවන් සේවා අංශය

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය (එවකට සංචාරක රාජ්‍ය අමාත්‍යාංශය) යටතේ ගුවන් සේවා අංශය ක්‍රියාත්මක වන අතර එහි දැක්ම කලාපයේ ප්‍රමුඛතම ගුවන් ප්‍රවාහන මධ්‍යස්ථානය ලෙස ශ්‍රී ලංකාව ස්ථාපනය කිරීමයි. අදාළ ආර්ථික අංශවල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා ගුවන් ප්‍රවාහන සේවා කාර්යක්ෂම, ආරක්ෂිත සහ පරිශීලක හිතකාමී සේවාවන් බවට පත් කිරීම ගුවන් සේවා අංශයෙහි මෙහෙවර වේ. ගුවන් සේවා ක්ෂේත්‍රය යටතේ සිවිල් ගුවන් සේවා අධිකාරිය, සීමාසහිත ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම සහ එහි පාලිත සමාගම් ක්‍රියාත්මකව පැවතුණි. නමුත් 2024 නොවැම්බර් 25 දින සිට සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම සහ එහි පරිපාලිත සමාගම් මුදල්, සැලසුම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතට පවරා තිබුණි.

## ගුවන් තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

**බඳවා ගැනීමේ පටිපාටිය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා නොගැනීම.**

සමාගම විසින් කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පටිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**ඒකාබද්ධ අරමුදලට ලාභ කොටස් ගෙවීම.**

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.3 ඡේදය ප්‍රකාරව, 2022, 2023 හා 2024 වර්ෂ සඳහා සමාගම විසින් ඒකාබද්ධ අරමුදලට බෙදා හැරිය යුතු බදු පසු ලාභයෙන් සියයට 30ක කොටස ලෙස ගණනය කල හැකි මුදල රු.මිලියන 16,280ක් වන නමුත් ඒකාබද්ධ අරමුදලට සත්‍ය වශයෙන් ගෙවා තිබූ මුදල රු.මිලියන 7,336ක් එනම් සියයට 45ක් පමණක් වී තිබුණි.

**අධි සංඛ්‍යාත සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය පිහිටුවීම.**

තලංගම අකුරේගොඩ අක්කර 52ක භූමිභාගයේ පිහිටුවා තිබූ සමාගමේ අධි සංඛ්‍යාත සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය සහිත ඉඩම, ආරක්ෂක අමාත්‍යාංශ ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම සඳහා පවරාගෙන තිබුණි. මේ හේතුවෙන් නව මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා විකල්ප ඉඩමක් ලබා දීමට හා මධ්‍යස්ථානයේ ඉදිකිරීම් සඳහා රු.මිලියන 161ක් ලබා දීමට අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව සීතාඑළිය කඳපොළ වනාන්තරයෙන් මේ සඳහා ඉඩමක් වෙන් කර දී තිබුණද,

ඉඩමේ අයිතිය සමාගමට පවරාගෙන නොතිබුණු අතර අරමුදල් ද ලැබී නොතිබුණි.

**මත්තල ගුවන්තොටුපළ මෙහෙයුම් ආදායම**

2024 වර්ෂය තුළ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළේ මෙහෙයුම් පිරිවැය හා ආදායම පිළිවෙලින් රු.මිලියන 3,600.8ක් හා රු.මිලියන 242.2ක්ව තිබූ අතර, ඒ අනුව මෙහෙයුම් අලාභය හා බදු පසු ශුද්ධ අලාභය පිළිවෙලින් රු.මිලියන 3,358.6ක් සහ රු.මිලියන 879.7ක් වී තිබුණි. 2024 දෙසැම්බර් 31 වන විට එහි මෙහෙයුම් කටයුතුවලින් ජනිත සමුච්චිත ශුද්ධ අලාභය රු.මිලියන 39,369ක් වී තිබුණි. ගුවන්තොටුපළ හරහා වාර්ෂිකව ගුවන් මඟින් මිලියනයක් මෙහෙයවීමට අපේක්ෂා කර තිබුණද වාර්තා අනුව වසර හයක් තුළ මඟින් 321,577ක් පමණක් මෙහෙයවා තිබුණි. මේ අනුව රු.මිලියන 36,564ක (එ.ජ.ඩොලර් මිලියන 247.7) ආයෝජනය ඵලදායී ලෙස භාවිතා කර නොමැති බව නිරීක්ෂණය වන අතර, ඉදිකිරීම සඳහා භාවිතා කරන ලද විදේශ ණය සඳහා 2024 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 2,053ක පොලියක් සමාගම අඛණ්ඩව ගෙවා තිබුණි.

## බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධන ව්‍යාපෘතිය (BIADP) අදියර II පියවර 2

**ව්‍යාපෘතිය සඳහා මූල්‍ය සම්පාදනය**

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ මඟීන් හැසිරවීමේ ධාරිතාව වැඩි කිරීම සහ ගුවන්තොටුපළ යටිතල පහසුකම් පුළුල් කිරීම අරමුණු කරගෙන ආරම්භ කර තිබූ මෙම ව්‍යාපෘතිය මූල්‍ය ණය සඳහා ජපන් යෙන් මිලියන 74,397ක මූල්‍ය පහසුකම් ලබාගැනීමට අදාලව 2012 සහ 2016 වර්ෂවල දී ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) සමග ගිවිසුම් අත්සන් කර තිබුණි. 2024 දෙසැම්බර් 31 වන විට ජපන් යෙන් මිලියන 26,862.38ක් පමණක් ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කර තිබුණි. ණය මුදල් ඌන උපයෝජනය හේතුවෙන් 2013 අප්‍රේල් 22 සිට 2024 දෙසැම්බර් 31 දක්වා බැඳීම් ගාස්තු (commitment charges) ලෙස සමාගම විසින් ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය වෙත ජපන් යෙන් මිලියන 247.9කට සමාන රු.මිලියන 351.8ක් ගෙවා තිබුණු අතර, 2024 දෙසැම්බර් 31 දින දක්වා වන පොළිය ලෙස ජපන් යෙන් මිලියන 35.7කට සමාන රු.මිලියන 61.2 ක් ගෙවිය යුතුව තිබුණි.

**ව්‍යාපෘතිය සැලසුම්කිරීම සහ උපදේශන සේවා ගාස්තු ගෙවීම**

2009 වර්ෂයේ දී වාර්ෂික මගීන් හැසිරවීමේ වර්තමාන ධාරිතාවය මිලියන 6 සිට මිලියන 12ක් දක්වා වැඩිකිරීමේ ව්‍යාපෘතියට අදාල සැලසුම් සහ උපදේශන සේවා ලබා ගැනීම සඳහා අංක අමප/07/2283/312/030 හා 2007 දෙසැම්බර් 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ජපන් හවුල් සමාගමක් තෝරාගෙන තිබුණි. අදාල සමාගම විසින් සැලසුම් සකස් කිරීමට 2009 සිට 2012 දක්වා වසර 04 ක් ගත කර තිබුණු අතර ඒ සඳහා සමාගම විසින් රු.මිලියන 344.5ක් ගෙවා තිබුණි. 2013 වර්ෂයේ දී මගීන් හැසිරවීමේ ධාරිතාව මිලියන 6 සිට මිලියන 15 දක්වා වැඩි කිරීම සඳහා ගොඩනැගිල්ලේ වහලය වෙනස් කිරීම ඇතුළුව ව්‍යාපෘතිය ප්‍රතිනිර්මාණය කිරීමට තීරණය කිරීම හේතුවෙන් පළමු සැලසුම ක්‍රියාත්මක කිරීමට නොහැකිවී තිබූ අතර ඒ අනුව එම සැලසුම වෙනුවෙන් වැය කර තිබූ වියදම, අනාර්ථික වී තිබුණි.

ව්‍යාපෘතිය ප්‍රතිනිර්මාණය කිරීමටද ඉහත හවුල් සමාගම තෝරා ගෙන තිබූ අතර ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවා ලබා ගැනීමට ජපන් හවුල් උපදේශන සමාගමක් සමග 2014 මාර්තු 3 වන දින ගිවිසුමකට එළඹ තිබුණි. ආයතනයේ අවශ්‍යතා අනුව 2016, 2023 සහ 2024 වර්ෂවලදී එම ගිවිසුම සංශෝධනය කිරීම හේතුවෙන් ගිවිසුම් කාලය 2028 ජූලි දක්වා මාස 127 කින් දීර්ඝ කර මුළු උපදේශණ සේවා ගාස්තුව ලෙස ඇමරිකානු ඩොලර් 1,480,319ක්, ජපන් යෙන් මිලියන 3425.5ක් සහ ශ්‍රී ලංකා රු.මිලියන 1,731.8ක් ගෙවීමට සමාගම එකඟ වී තිබුණි. ගිවිසුම ආරම්භයේ සිට 2025 මාර්තු 31 දක්වා සැලසුම් සහ උපදේශන සේවා ගාස්තු ලෙස ශ්‍රී ලංකා රු.මිලියන 4,563.4ක් (ජපන් යෙන් මිලියන 2,772.4කට සමාන) ගෙවා තිබුණි

මෙම ව්‍යාපෘතියට අදාල ඉදිකිරීම් කටයුතු A,B හා C පැකේජ යටතේ සිදුකිරීමට 2014 වර්ෂයේ දී තීරණය කර තිබූ අතර, නැවත A හා C පැකේජ ඒකාබද්ධ කර A පැකේජය සහ B පැකේජය ලෙස ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණි. මේ අනුව ව්‍යාපෘති සැලසුමේ ඇතුළත් අයිතම කිහිපයක් විෂයය පථයෙන් ඉවත් කර තිබුණි.

**දුරස්ථ ගුවන් යානා අංගනය සහ ධාවන පථය- B පැකේජය**

මෙම පැකේජයේ ඉදිකිරීම් සඳහා අඩුම ලංසුවක් සමග 2017 පෙබරවාරි 28 දින ගිවිසුම් අත්සන් කර තිබුණු අතර මාස 30ක කොන්ත්‍රාත් කාලයකින් යුතු මෙම පැකේජය යටතේ ඉදිකිරීම් කටයුතු 2019 ඔක්තෝම්බර් 24 දින අවසන් කිරීමට නියමිතව තිබුණද එහි කටයුතු 2022 ජනවාරි 26 දින අවසන් කර තිබුණි. මෙමගින් ගුවන් තොටුපළේ පවතින ගුවන් යානා නැවැත්වීමේ ස්ථාන සංඛ්‍යාව 25 සිට 48 දක්වා වැඩි කිරීම අරමුණ වී තිබුණි. ඒ අනුව ඉදිකිරීම් කටයුතු 2022 ජනවාරි 26 දින අවසන් කර රු.මිලියන 8,448.6කට ප්‍රාග්ධනීත කර තිබුණ ද ගුවන් යානා නැවැත්වීමේ ස්ථාන 23 න් 5 ක් පැකේජය A හි ඉදිකිරීම් හේතුවෙන් වසා දමා තිබූ අතර, 14ක් ප්‍රශස්ත භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි. මෙහෙයුම් අකාර්යක්ෂමතා මගහැරීමට ගුවන්යානා නැවැත්වීමේ ස්ථාන නැවත සලකුණු කිරීම උපදේශන සමාගමේ මුදලින් සිදුකිරීමට 2024 පෙබරවාරි 12 දින උපදේශන සමාගම සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණද, 2025 මැයි 05 වන දින වන විටත් එහි වැඩ ආරම්භ කර නොතිබුණි.

**මගී පර්යන්ත ගොඩනැගිල්ල හා ආශ්‍රිත කටයුතු - A පැකේජයේ ඉදිකිරීම්**

මගී පර්යන්ත ගොඩනැගිල්ල හා ආශ්‍රිත ඉදිකිරීම් කටයුතු ජපන් සමාගමක් වෙත ජපන් යෙන් මිලියන 41,553.9ක් සහ රු.මිලියන 35,135.8කට සමාන රු.මිලියන 105,569.7කට 2020 මාර්තු 04 දින ප්‍රදානය කර තිබූ අතර කොන්ත්‍රාත්තුවේ වැඩ 2023 දෙසැම්බර් 13 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. 2022 අප්‍රේල් 12 දිනැතිව ශ්‍රී ලංකාවේ විදේශ රාජ්‍ය ණය මුල්‍යනය කිරීම පිලිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය පිළිබඳව මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කල චක්‍රලේඛය හේතුවෙන් ව්‍යාපෘතියට ණය වාරික මුදාහැරීම JICA ආයතනය විසින් අත්හිටුවීමේ ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්කරු, 2022 දෙසැම්බර් 09 දින ඉදිකිරීම් කටයුතු නතර කර තිබුණි. මෙම අවස්ථාව වන විට කොන්ත්‍රාත් කාල සීමාවෙන් වසර 2ක් ගත වී තිබුණු අතර භෞතික ප්‍රගතිය සියයට 30ක් විය යුතු වුවද, තත්‍ය ප්‍රගතිය සියයට 5.44ක් පමණක් තිබිය දී කොන්ත්‍රාත්කරුගේ සහතික කළ වැඩ සඳහා මෙන්ම කොන්ත්‍රාත්තුව නතර කිරීම

හේතුවෙන් AASL ආයතනයට භාරගැනීමට සිදු වූ ද්‍රව්‍ය වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 37,311.3ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. මෙයට අමතරව කොන්ත්‍රාත්කරු ගේ අයකිරීම් අවසන් වන තුරු ඊට අදාල මාසික වියදම් සහ ප්‍රමාද වූ ගෙවීම් සඳහා මූල්‍ය ගාස්තුද අවසන් ගෙවීමට ඇතුලත් විය හැකි අතර තවද ව්‍යාපෘතියේ විවාදගත අයිතම සම්බන්ධයෙන් විවාද මණ්ඩලයකට යොමු කිරීමේ අයිතිය කොන්ත්‍රාත්කරු සතු වන අතර එය අවසන් ගෙවීම් වැඩි වීමට හේතුවක් විය හැක. එහෙත් මෙම අසම්භාව්‍ය වගකීම 2024 මූල්‍ය වාර්තාවලට ඇතුළත් කර නොතිබුණි.

කොන්ත්‍රාත්කරුගෙන් භාරගත් ද්‍රව්‍ය අතුරින් ඉන්වොයිස් වටිනාකම රු.මිලියන.1995ක් වටිනා ද්‍රව්‍ය හා උපකරණ පෞද්ගලික ගබඩා 2ක තැන්පත් කර තිබුණු අතර, ඒ තුළ කල් ඉකුත් වූ ද්‍රව්‍ය ද ඇතුලත්ව තිබුණි. මෙම පෞද්ගලික ගබඩා වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 60.3ක ගබඩා කුළී ගෙවා තුබූ අතර පවතින තත්වය අනුව ව්‍යාපෘතිය නැවත ආරම්භ කරන තුරු ද්‍රව්‍ය සඳහා ගබඩා කුළී ගෙවීමට සිදු වනු ඇත.

ඉදිකිරීම් නතරකිරීම හේතුවෙන් හඳුනාගත් ආරක්ෂාකාරී වැඩ (Identified Protective works) සහ හඳුනාගත් වැඩ විෂය පථයක් (Identified scope of works) ක්‍රියාත්මක කිරීම සඳහා පෞද්ගලික සමාගමක් සමග මුළු වටිනාකම රු.මිලියන 3732.9ක ගිවිසුම් 2 ක් අත්සන් කර 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1,328.7ක් ගෙවා තිබුණි.

මේ අනුව A පැකේජයේ ඉදිකිරීම් සඳහා රු.මිලියන 38,640ක් හා උපදේශන සේවා ගාස්තු සහ ව්‍යාපෘති කළමණාකරණ ඒකකයේ වැටුප් ඇතුළුව රු.මිලියන 43,735.7ක් වූ කෙරීගෙන යන වැඩ (WIP) මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි.

මෙම ව්‍යාපෘතිය නැවත අරම්භ කිරීම සඳහා 2024 සැප්තැම්බර් 24 දින සිට 2024 දෙසැම්බර් 23 දින දක්වා ලංසු කැඳවා තිබුණු අතර 2025 මාර්තු 25 දින දක්වා නැවතත් ලංසු ඉදිරිපත් කිරීම අවසන් කර මේ වන විට ඊට අදාළ ඇගයීම් කටයුතු සිදු කරමින් පැවතුණි.

## ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

**ගුවන් සේවා සංවර්ධන සැලැස්ම**

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 7 (ඇ) වගන්තිය ප්‍රකාරව, අධිකාරිය විසින් ශ්‍රී ලංකාව සඳහා ගුවන් සේවා සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතු වුවද, 2025 ජුනි 12 දිනය වන විටත් එබඳු සැලැස්මක් සකස් කර නොතිබුණි.

**පනත සඳහා නියෝග සකස් කිරීම**

උක්ත පනතේ 9 වගන්තිය ප්‍රකාරව, පනතේ දෙවන සහ තුන්වන උපලේඛනවල දක්වා ඇති පරිදි, ගුවන් තොටුපළ 14කින් සහ ගුවන් යානා පහසුකම් 8ක් සහ ඒ ආශ්‍රිත ඉඩම්වලින්, ගුවන් තොටුපළ 10ක් පැවරීම සඳහා පනත බලාත්මක වී වසර 21කට පසුවත්, අදාළ නියෝග ගැසට් පත්‍ර මගින් ප්‍රසිද්ධ කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

**අපගමන බද්ද සඳහා සුරක්ෂණ ලබා දීම**

2023 ජනවාරි 11 දිනැති අංක 2314/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අතිරේක සාමාන්‍ය) ගැසට් පත්‍රය ප්‍රකාරව, ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන මගී ගුවන් ගමන් ක්‍රියාත්මක කරන ගුවන් සමාගම් විසින්, එකතු කරන අපගමන බද්ද සඳහා සුරක්ෂණයක් ලෙස මුදල් ප්‍රමාණයක් හෝ බැංකු ඇපකරයක් ලබා දිය යුතුය. කෙසේ වෙතත්, ගුවන් සමාගම් 08ක් රු.මිලියන 4,611.7ක බැංකු ඇපකර ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි.

**අනුමැතියකින් තොරව දීමනා ගෙවීම.**

2024 වර්ෂය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අධිකාරියේ නිලධාරීන්ට විශේෂ දීමනා, කළමනාකරණ දීමනා සහ අතුරු දීමනා ලෙස එකතුව රු.මිලියන 60.6ක් ගෙවා තිබුණි. තවද මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අංක DMS/1748 හා 2015 අප්‍රේල් 09 දිනැති ලිපියට පටහැනිව, නිලධාරීන් දෙදෙනෙකුගේ අවශ්‍ය බලපත්‍ර/සහතික සත්‍යාපනය නොකර, අධිකාරිය විසින් රු.මිලියන 2.9ක තාක්ෂණික දීමනා ගෙවා තිබුණි.

**තොරතුරු තාක්ෂණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම.**

2021 දෙසැම්බර් 06 වන දින, අපගමන බද්ද සහ විදේශ විකුණුම් අධිභාර බදු එකතු කිරීමට අදාළ තොරතුරු තාක්ෂණ පද්ධතිය ආරම්භ කර තිබූ අතර, අපේක්ෂිත නිම කිරීමේ දිනය 2022 පෙබරවාරි 20 දිනය විය. කෙසේ වෙතත්, 2025 මැයි 26 වන විටත්, ව්‍යාපෘතිය අසම්පූර්ණව පැවති අතර, ඉලක්කගත ගුවන් සේවා 32න් එකක් පමණක් ප්‍රතිචාර දක්වා තිබුණි. ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 6.2ක් වැයකර තිබුණි.

**බාහිර තාක්ෂණික සහායක වියදම්**

2024 වර්ෂය තුළ නම් කරන ලද (designated) නිලධාරීන් තෝරා ගැනීම සහ සම්බන්ධ කර ගැනීම සඳහා විධිමත් ක්‍රියා පටිපාටියක් ස්ථාපිත නොකර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අධිකාරිය විසින් සිවිල් ගුවන් සේවා පරීක්ෂකවරුන් 20 දෙනෙකු සේවයේ යොදවා බාහිර තාක්ෂණික සහායක වියදම් ලෙස, රු.මිලියන 38.6ක් වැයකර තිබුණි.

**හිඟ අපගමන බද්ද මත අය කෙරෙන ප්‍රමාද පොලී**

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද අංක හා EL/01/2023 හා 2023 ජනවාරි 12 දිනැති විධානයේ 09 වන ඡේදයට අනුව, 2024 දෙසැම්බර් 31 වන දිනට ගුවන් සමාගම් නවයකින් අය විය යුතු රු.මිලියන 25,878.2ක හිඟ අපගනමන බද්ද මත ගණනය කරන ලද ප්‍රමාද පොලිය රු.මිලියන 3,821කි. කෙසේ වෙතත්, මෙම හිඟ පොලී ගාස්තු අයකර ගැනීමට අධිකාරිය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## ශ්‍රී ලන්කන් ගුවන් සමාගම

**ගුවන් ගමන් ප්‍රමාදවීම**

2022/23 මූල්‍ය වර්ෂය තුළ ගුවන් ගමන් ප්‍රමාදයන් සහ බාධා කිරීම් හේතුවෙන් ගුවන් සමාගමට එ.ජ. ඩොලර් 784,000 ක් අමතරව වැය කිරීමට සිදුව තිබුණි. 2022 අප්‍රේල් 01 සිට 2023 සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ ගුවන් ගමන් වාර 548ක් පැය 3 සිට පැය 56 දක්වා ප්‍රමාද වී තිබුණි. ප්‍රමාදයන් සඳහා ප්‍රධාන හේතු ලෙස ප්‍රතිස්ථාපන ගුවන් යානා නියමිත වේලාවට ලබා ගැනීමට නොහැකි වීම, සේවා කළ නොහැකි නියෝ එන්ජින් ගොඩබිම පැවතිම, ගුවන් යානා, අමතර කොටස් ලබා ගැනීමට දිගු කාලයක් ගත වීම සහ සමාගමේ මුදල් ප්‍රවාහ තත්ත්වය යන කරුණු හඳුනාගෙන තිබුණි.

**ගුවන්යානා ඇණිය**

සමාගමේ අවශ්‍යතා තක්සේරුවට අනුව, ගුවන් යානා 27ක් අවශ්‍ය වුවද, වත්මන් ගුවන් යානා ඇණිය ගුවන් යානා 21කින් පමණක් සමන්විත වී තිබුණි. 2024 අප්‍රේල් 20 වනවිට, මෙම ගුවන් යානාවලින් නවයක්, විවිධ කාල පරාසයන් තුළ සේවයෙන් බැහැර කර තිබුණි. එසේ වුවද ගුවන් සමාගම 2023 වසරේ සිට මෙම සේවයෙන් බැහැර ගුවන් යානා සඳහා රු.මිලියන 6,404.76ක් කල් බදු කුලී ලෙස ගෙවා තිබුණි. තවද, එන්ජින් අලුත්වැඩියා වියදම්, මූලික ඇස්තමේන්තු ඉක්මවා තිබූ අතර, එය මුදල් ප්‍රවාහ ගැටළුවලට සහ සේවයෙන් බැහැර ගුවන් යානා අලුත්වැඩියා කිරීම තවදුරටත් ප්‍රමාද වීමට තුඩු දිය හැකි බව නිරීක්ෂණය විය.

**පාඩු සඳහා ප්‍රතිපාදන සිදුකිරීම**

2015 දී A350 ගුවන් යානාවල එන්ජින් නඩත්තු කිරීම සඳහා එළැඹුණු කොන්ත්‍රාත් ගිවිසුම, කඩකිරීමක් හේතුවෙන් අදාළ සමාගම ව්‍යාපාර පාඩුව සඳහා හිමිකම් පෑමක් ගොනු කර තිබුණි. 2024 ජනවාරි 25 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින්, මෙම කඩකිරීමේ මූල්‍ය බලපෑම ආවරණය කිරීම සඳහා ප්‍රතිපාදනයක් සිදු කිරීම අනුමත කර තිබුණි. ඒ අනුව සමාගම විසින් Rolls Royce සමඟ ගිවිසුම කඩ කිරීමේ පිරිවැය පිළිබිඹු කරමින් 2024/25 වර්ෂ සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල උපචිත පොලී ඇතුළුව රු.මිලියන 11,837.12ක (එ.ජ. ඩොලර් මිලියන 33ට සමාන) ප්‍රතිපාදනයක් සිදුකර තිබුණි.

**එන්ජින් දෝෂ සහිත ගුවන් යානා නඩත්තුව**

ශ්‍රී ලන්කන් ගුවන් සමාගම එහි A320 neo ගුවන් යානා ඇණිය CFM LEAP එන්ජින් 13කින් සමන්විත ගුවන් යානා හයක් ක්‍රියාත්මක කරන අතර ඉන් 11ක් ගෝලීයව පැතිරුණු එන්ජින් ගැටළුවක් හේතුවෙන් දැනට ක්‍රියා විරහිතව පවතී. පවතින කල්බදු ගිවිසුම් යටතේ මෙම එන්ජින් අලුත්වැඩියා කිරීම ගුවන් සමාගමේ වගකීම වන බව අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගෙන ඒ අනුව 2023/24 වර්ෂය සඳහා එම වියදම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම අනිවාර්ය කර තිබුණි. මෙම එන්ජින් අක්‍රියවීම් හඳුනාගත් ආකාරය සහ එකල මෙවැනි අවදානම් තිබියදීත් ගුවන් සමාගම එම එන්ජින් තෝරා ගැනීම පිළිබඳව පැහැදිලි කිරීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. ඊට අමතරව, 2024 මාර්තු 31 දිනට ගෙවිය යුතු වෙළෙඳ ණයහිමියන් ලෙස සමාගම රු.මිලියන 14,795.36ක් වාර්තා කර

තිබුණි. මෙම මුදලින් රු.මිලියන 11,572.39ක් 2024/25 මූල්‍ය වර්ෂය තුළ ගෙවා තිබුණු අතර රු.මිලියන 6,185.70ක් පෙර මූල්‍ය කාලපරිච්ඡේදවලට නැවත ගලපා තිබුණි.

තවද, පෙර වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂය තුළ ගුවන් යානා සහ අමතර එන්ජින් සඳහා කෙටි කාලීන කල්බදු කුලිය රු.බිලියන 10,219කින් වැඩි වී තිබුණි. එන්ජින් දෝෂ හේතුවෙන් ඇති වූ මූල්‍ය බර මෙම කල්බදු පිරිවැයෙහි සැලකිය යුතු ඉහළ යාමට මූලික හේතුවක් වී තිබුණි.

# කෘෂිකර්මාන්තය

ආහාර සුරක්ෂිතතාව හා ජාතික සමෘද්ධිය උදෙසා කාර්යක්ෂම, ඵලදායී හා ශක්තිමත් කෘෂිකාර්මික අංශයක් ඇති කිරීම තම දැක්ම ලෙසත්, ස්වාභාවික සම්පත් තිරසාර කළමනාකරණය තුළින් සමාජීය වශයෙන් පිළිගත් නව්‍ය හා වාණිජමය නැඹුරුවකින් යුතුව, ගෝලීය තරඟකාරී නිෂ්පාදනයක් බිහි කරන ව්‍යවසායකත්ව කෘෂිකර්මාන්තයක් සාක්ෂාත් කර ගැනීම තම මෙහෙවර ලෙසත් හඳුනාගත් කෘෂිකර්ම අමාත්‍යාංශය වර්තමානයේදී කෘෂිකර්ම අංශය, පශු සම්පත් සංවර්ධන අංශය, පොහොර අංශය හා ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන අංශය ලෙස ක්‍රියාත්මක වේ.

## විගණන නිරීක්ෂණ

### කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

**වාහන අලුත්වැඩියාව**

2021 ජූනි 21 දින ග්‍රාමීය ආර්ථික අංශයේ රේන්ජ් රෝවර් ජීප් රථයක එංජිම පණගැන්වීමට නොහැකි තත්ත්වයකට පත්වීමට බලපෑ නිශ්චිත කරුණු හා ඊට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි. 2021 වර්ෂයේදී රු.මිලියන 3.08කට ඉටුකර ගැනිමට හැකියාව තිබූ මෙම අලුත්වැඩියාව වසර 3කට පසු රු.මිලියන 9.04කට සිදු කිරීම සඳහා දේශීය නියෝජිත ආයතනය වෙත භාරදී තිබීමෙන් මුල් වටිනාකම මෙන් තුන් ගුණයක් වැයකිරීමට සිදු වී තිබුණි.

**කාලීන ණය හා ණය පොලි ගෙවීම්**

පෙර පැවති සී/ස ලංකා පොහොර සමාගම හා සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ආනයනය කරන ලද පොහොර සඳහා වූ ණයවර ලිපි කල්පිරෙන අවස්ථාවේදී අදාළ සැපයුම්කරුවන්ට ගෙවීම් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් නොලැබීම මත කෙටිකාලීන ණය මගින් පියවීම් කළ එකතු වටිනාකම රු.මිලියන 43,742.56ක් අදියර 05ක් යටතේ වන සේ එකතු වටිනාකම රු.මිලියන 47,465.63ක කාලීන ණය බවට බැංකුව පරිවර්තනය කර තිබුණි. 2024 වර්ෂයේදී එම මුදල් පියවීමට අදාළ රු.මිලියන 3,401.11ක් ණය පොලී අමාත්‍යාංශය විසින් වැයකර තිබුණි.

**ආර්ථික මධ්‍යස්ථාන**

2017 හා 2018 වර්ෂයන්වලදී වැඩ ආරම්භ කර 2024 දෙසැම්බර් 31 දින වන විට පිළිවෙලින් රු.මිලියන 279.8ක්, රු.මිලියන 304ක් හා රු.මිලියන 191ක් වැයකර මඩකලපුව, වවුනියාව හා යාපනය යන විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයන්හි ඉදිකිරීම් අවසන් කර තිබුණද

2025 මැයි 31 දිනය වන විටත් එම මධ්‍යස්ථාන විවෘත කර නොතිබුණි.

**ආරක්ෂිත තැන්පතු ආපසු ලබා නොගැනීම**

කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබාගැනිම වෙනුවෙන් පෞද්ගලික සමාගමක් සමඟ 2016 අප්‍රේල් 08 සිට පස් අවුරුදු කාලසීමාවක් සඳහා අංක 2178 දරන බදු ගිවිසුමට එළඹ තිබුණි. එහි කොන්දේසි ප්‍රකාරව ගොඩනැගිලි පරිශ්‍රය බදු දීමනාකරුට 2020 ජනවාරි 31 දින භාරදී තිබුණි. එසේ වුවද බදු දීමනාකරු වෙත ගෙවන ලද රු.මිලියන 63ක ආපසු ගෙවිය යුතු ආරක්ෂිත තැන්පතුව 2025 සැප්තැම්බර් 30 දින වනවිටත් අයකර ගෙන නොතිබුණි.

**පේදුරුතුඩුව පශු වෛද්‍ය කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘති**

අමාත්‍යාංශයේ පශු සම්පත් අංශය මධ්‍යකාලීන පශු සම්පත් සංවර්ධන වැඩසටහන යටතේ පේදුරුතුඩුව පශු වෛද්‍ය කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු සඳහා 2022 මූල්‍ය වර්ෂයේදී ආරම්භක අත්තිකාරම හා පළමු බිල්පතට අදාළව රු.මිලියන 6.82ක් ගෙවීම් කර තිබුණි. එසේ වුවද කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත අවිධිමත් ලෙස ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන එම ගොඩනැගිල්ල ඉදිකිරීමේ දෙවන අදියර වශයෙන් 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර කොන්ත්‍රාත්කරු වෙත රු.මි.10.7ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණ ද, එහි භෞතික ප්‍රගතිය සියයට 3ක් වැනි ඉතා අඩු මට්ටමක පැවතුණි.

**භෞතිකව නොපවතින ශේෂ**

අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන ගොවීන්ගේ භාරකාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළ රු.මිලියන 7.2ක ඉතිරිකිරීමේ ගිණුමේ ශේෂයක් පෙන්වා තිබුණද සත්‍ය වශයෙන්ම එබඳු ශේෂයක් නොපවතින අතර පෙර වර්ෂවල සිට පැවත එන එකතුව රු.මිලියන 201.4 ශේෂයන් අයකර ගැනීමේ හැකියාව අවිනිශ්චිත වන හෝ සත්‍ය වශයෙන් නොපවතින ශේෂයන් වන අතර ඒ සඳහා හානිකරණ වෙන් කිරීම් ද සිදු කර නොතිබුණි.

**ගොවීන්ගේ භාරකාර අරමුදල පවත්වා ගෙන යාම**

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි මු.රෙ.876(3) පරිදි ව්‍යවස්ථාපිත නොවන අරමුදල්

වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කොට ඒවායේ මුදල් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අතර තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් පාර්ලිමේන්තු පනතක් මගින් නීති ගත කළ යුතු වුවත් ගොවීන්ගේ භාරකාර අරමුදල සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

**මුදල් රඳවා ගැනීම්**

1994 මාර්තු 9 දිනැති ගොවීන්ගේ භාරකාර අරමුදලේ භාරකාර ඔප්පුවෙහි 3(1) උප වගන්තියෙන් පරමාර්ථ ඉටු වන අයුරින් ව්‍යාපෘතීන් සැලසුම් නොකර 2024 වර්ෂය අවසානයේ බැංකු ගිණුම්වල රු.මිලියන 112.9ක් හා ආයෝජනවල රු.මිලියන 1,237.6ක් රඳවාගෙන පැවතුණි.

**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ලබා දී ඇති ණය**

2002 සිට 2004 වර්ෂය දක්වා අවස්ථා 9 කදී ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත එකතුව රු.මිලියන 102.7ක ණය මුදලක් ලබාදී ඉන් රු.මිලියන 9ක් වසරක් තුළදී නැවත අරමුදලට පියවීමටත්, රු.මිලියන 93.7ක් මහනුවර පිහිටි මහබෙරියතැන්න වත්ත නමැති ඉඩම විකුණූ වහාම පියවීමටත් ගිවිසුම් ප්‍රකාරව එකඟ වී තිබුණි. එහෙත් එකඟවන අවස්ථාව වන විටදී ද බාහිර පාර්ශවයකට එම ඉඩම 99 අවුරුදු බදු දී තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට ණය මුදල් ලබාදී වසර 21ක් ගතවී තිබුණ ද නොපියවූ ණය ශේෂය රු.මිලියන 43.5ක් සහ ඒ සඳහා උපචිත පොලිය රු.මිලියන 98ක් හිඟව පැවතුණි.

**ණය අයකර නොගැනීම හා සහතික ලබා නොදීම**

2018 වර්ෂයේදී රන් ගෙවිලිය සමාජ ව්‍යවසාය පොදු සමාගමට වසරක කාලයකින් ගෙවීමේ පදනම මත රු.මිලියන 5.96ක පොලී රහිතව ලබා දුන් ණය මුදල අයකර ගැනීමට හා ව්‍යාපෘති කාල රාමුව අනුව 2019 මාර්තු වන විට ගෙවිලියන්ගේ වී නිෂ්පාදනය වෙනුවෙන් ලබා දීමට සැලසුම් කල GAP (Good Agriculture Practice) සහතිකය ලබා දීමට 2025 සැප්තැම්බර් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට ලබා දුන් ණය**

2015 වර්ෂයේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ බඩ ඉරිඟු වගා කරන ගොවීන් 10,000ක් වෙත ලබා දීමට ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත රු.මිලියන 90ක් වසරක් ඇතුළත අයකර ගැනීමේ කොන්දේසිය යටතේ ලබා දී තිබුණි. එයින්

රු.මිලියන 10.9ක ශේෂය වසර 9ක් ගත වී තිබුණද එම දෙපාර්තමේන්තුවෙන් අයකරගෙන නොතිබුණි.

තවද, 2020 වර්ෂයේදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත බඩ ඉරිඟු ණය ලෙස සහ පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා ලබා දුන් රු.මිලියන 225න් රු.මිලියන 10.8ක් අයවිය යුතු කාල සීමාව ඉක්මවා ඇතත් 2025 ජූනි 30 දින වන විටත් අය කරගෙන නොතිබුණි.

**අත්තිකාරම් නොපියවීම**

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත වී සහල් කිරීම, සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය, පුරන් කුඹුරු අස්වැද්දීම, වට්ටක්කා මිළදී ගැනීම හා බිත්තර වී ලබාගැනීම යන කාර්යයන් සඳහා ලබා දුන් රු.මිලියන 19ක අත්තිකාරම් වසර 3ත් වසර 24ත් අතර කාලයක සිට පියවා නොතිබුණි.

## ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

**ඩිජිටල් කුඹුරු ඉඩම් නාමලේඛන සකස් කිරීමේ ව්‍යාපෘතිය**

සමාලෝචිත වර්ෂයේ දී ඩිජිටල් කුඹුරු ඉඩම් නාමලේඛන සකස් කිරීමේ ව්‍යාපෘතිය යටතේ කුඹුරු ඉඩම් 1,600,000ක් ලියාපදිංචි කිරීමට සැලසුම් කර රු.මිලියන 26.05ක ප්‍රතිපාදනයක් නිදහස් කර තිබුණි. එසේ වුවද ප්‍රතිපාදිත මුදලින් රු.මිලියන 25.06ක් හෙවත් සියයට 96ක් වැයකර ලියාපදිංචි කර තිබූ කුඹුරු ඉඩම් ප්‍රමාණය 38,495ක් වූ අතර එය ඉලක්කගත ප්‍රමාණයෙන් සියයට 2.4ක් පමණක් වී තිබුණි.

**පැරඹුට් වගා වැඩසටහන**

පැරඹුට් වගා වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 21ක අක්කර 10,000ක් වගා කිරීම සඳහා රු.මිලියන 241.4ක ප්‍රතිපාදනයක් නිදහස් කර රු.මිලියන 63.6ක් හෙවත් ප්‍රතිපාදනයෙන් සියයට 26ක් වියදම් කර අක්කර 613ක් පමණක් වගා කර තිබුණි. එය ඉලක්කගත වගා අක්කර ප්‍රමාණයෙන් සියයට 6.3ක වැනි අඩු අගයක් වී තිබුණි.

**කැපුම් මල් වගාව සඳහා ආරක්ෂිත ගෘහ සකස්කිරීමේ ව්‍යාපෘතිය**

ක්‍රියාකාරී සැලැස්මට අනුව 2024 වර්ෂය තුළදී මෙම ව්‍යාපෘතිය යටතේ ආරක්ෂිත ගෘහ 30 සකස් කිරීම සඳහා රු.මිලියන 31.04ක ප්‍රතිපාදනයක් නිදහස් කර එයින් රු.මිලියන 29.92ක් හෙවත් සියයට 96ක් වැය කර තිබුණද සකස් කිරීමේ කටයුතු වර්ෂය තුළදී නිම කර නොතිබුණි.

**සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ හා පුරන් කුඹුරු නැවත වගා කිරීමේ ජාතික වැඩසටහන**

සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ හා පුරන් කුඹුරු නැවත වගා කිරීමේ ජාතික වැඩසටහන යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ 2024 දෙසැම්බර් 31 දිනට කුඹුරු ඉඩම් ලෙස ලේඛන ගත වී තිබුණු ඉඩම් අතරින් A කාණ්ඩයට අයත් පුරන් කුඹුරු අක්කර 590.30ක්ද, B කාණ්ඩයට අයත් පුරන් කුඹුරු අක්කර 232.465ක් ද, C කාණ්ඩයට අයත් පුරන් කුඹුරු අක්කර 833.78ක් ද හඳුනාගෙන තිබුණද අදාළ කුඹුරු ඉඩම් නැවත අස්වැද්දීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එම වැඩසටහන යටතේ 2023 වර්ෂය තුළදී දිස්ත්‍රික් කාර්යාලය විසින් මධ්‍යස්ථාන 27ක අක්කර 215ක ප්‍රමාණයක් අස්වැද්දීම සඳහා රු.මිලියන 8.07ක් වැය කර තිබුණද, 2024 දෙසැම්බර් 31 දින වනවිටත් ඉන් මධ්‍යස්ථාන 11ක පුරන් කුඹුරු අක්කර 24.3045ක වී වගා කර නොතිබුණු බැවින් වැය කල රු.මිලියන 1.626ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

**අත්හළ වැව් ප්‍රතිසංස්කරණය**

කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඇති මුළු වැව් සංඛ්‍යාව 5,636කින් ගොවිජන සේවා මධ්‍යස්ථාන 24කට අදාළව ප්‍රයෝජනයට ගත නොහැකි ලෙස සලකා අතහැර දැමූ වැව් සංඛ්‍යාව 149ක් විය. එම වැව් යටතේ කුඹුරු අක්කර 108,413කින් පෝෂණය වන ගොවීන් සංඛ්‍යාව 125,063ක් වුවද, 2024 වර්ෂය තුළදී අත්හැරී ඇති වැව් 02ක් පමණක් ප්‍රතිසංස්කරණය කර තිබුණි.

**තිරසර ගෙවතු වගා වැඩසටහන**

2024 වර්ෂයේදී කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ තිරසර ගෙවතු වගා වැඩසටහන යටතේ ඉලක්කගත ගෙවතු සංඛ්‍යාව 21,200ක් වූ අතර ගෙවතු පිහිටුවීම සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබා දුන් ගෙවතු සංඛ්‍යාව 6,299ක් වූයෙන් ගෙවතු පිහිටුවීමේ ප්‍රගතිය සියයට 30ක් වැනි ඉතා පහළ මට්ටමක පැවතුණි.

**ගබඩා නිශ්කාර්යව පැවතීම**

2021 වර්ෂය තුළදී ලෝක බැංකු ආධාර යටතේ රු මිලියන.88.72ක් වැය කර කුඩා හා මධ්‍ය පරිමාණ ගොවීන්ගේ, ක්ෂේත්‍ර බෝග වගාකරුවන්ගේ බෝග ගබඩා කිරීම සඳහා දිස්ත්‍රික්ක 06ක මෙ.ටොන් 900ක ධාරිතාවයෙන් යුත් ගබඩා 11ක් ඉදිකර ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත පවරාදී ඇතත් ඒවා නිශ්කාර්යව පැවතුණි.

**ගොවිජන කේන්ද්‍රීය පරිපාලනය සහ සංවර්ධනය**

2024 වර්ෂය තුළ ගොවිජන සංවර්ධන අරමුදල මඟින් ගොවිජන කේන්ද්‍රීය පරිපාලනය සහ සංවර්ධනය සඳහා රු.මිලියන 9.6ක් වැයකර තිබුණද අඳ ගොවියන් සඳහා වන්දි ගෙවීම, ගොවි විනිශ්චය සභා ප්‍රතිසංස්කරණය කිරීම යන ක්‍රියාකාරකම් ඉටු කර නොතිබුණි.

**තොරතුරු පද්ධතිය**

ගොවිජන සංවර්ධන අරමුදල මගින් ගොවිජන සේවා මධ්‍යස්ථාන 4ක ගොවි බැංකු හා ගොවිජන කාරක සභා සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා රු.මිලියනයක් ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද එම කාර්යය 2024 වර්ෂය තුළ නිම කිරීමට කටයුතු කර නොතිබුණි.

**නොපියවූ අත්තිකාරම්**

ගොවිජන සංවර්ධන අරමුදල මගින් ගොවිජන සේවා මධ්‍යස්ථාන සැපයුම් වැඩි දියුණු කිරීම සහ සංවර්ධනය, අලෙවි ප්‍රවර්ධන කටයුතු, නිලධාරීන් හා ගොවි ප්‍රජාව පුහුණු කිරීම සඳහා අත්තිකාරම් ලෙස මධ්‍යස්ථාන නිලධාරීන් වෙත ලබා දී තිබුණු රු.මිලියන 29.58ක් 2025 වර්ෂයේ ජූනි 30 දින වන විටත් පියවා නොතිබූ අතර ඉන් රු.මිලියන 7.28ක් වසරකට වැඩි කාලයක සිට නිරවුල් නොවී පැවතුණි.

## සීමාසහිත කොමර්ෂල් පොහොර සමාගම

**රජයේ දායක මුදල්**

2016 වර්ෂයේ සහනාධාර පොහොර නිකුත් කිරීම නතර කොට ගොවීන්ට මුදල් ලබා දීමේ ක්‍රමයට සහනාධාර ප්‍රතිපත්තිය වෙනස් කිරීම හේතුවෙන් 2016 පෙබරවාරි 29 දිනට සමාගම සතුව රු.මිලියන 2,112.47ක් වූ සහනාධාර පොහොර සඳහා රජයේ දායකය ඉතිරිව තිබුණි. එම මුදල භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකොට පොහොර ආනයනයට ලබා ගත් කෙටි කාලීන ණය මත වූ පොලී වියදම් හා වෙනත් වියදම් ලෙස රු.මිලියන 780.1ක් කපා හැර තිබූ අතර 2024 මාර්තු 31 දිනට භාණ්ඩාගාරයට නොගෙවා රඳවාගත් වටිනාකම රු.මිලියන 1,332.37ක් වී තිබුණි.

**විනිමය අනුපාත වෙනස්වීම මත ඉතිරි වූ මුදල් ප්‍රේෂණය නොකිරීම**

2021 වර්ෂයේදී ආනයනය කරන ලද KCL පොහොර වෙනුවෙන් විදේශීය සැපයුම්කරුට ගෙවිය යුතුව තිබූ එ.ජ.ඩොලර් 5,707,739.40ක් විදේශ විනිමය හිඟවීම මත නියමිත දිනයේදී ගෙවීම් කර නොතිබූ අතර පසුව එම මුදල් සැපයුම්කරු වෙත වාරික

වශයෙන් ගෙවීමට එකඟව ඒ සඳහා අවශ්‍ය මුදල් භාණ්ඩාගාරයෙන් සතියකට එ.ජ.ඩොලර් 250,000 බැගින් බැංකු ගිණුම වෙත නිදහස් කර තිබූ අතර බැංකු ගාස්තුද ඇතුළුව සැපයුම්කරුට ගෙවිය යුතු සියලුම මුදල් ගෙවා අවසන්කළ පසු එම ලද මුදලින් විදේශ විනිමය අනුපාත වෙනස්වීම මත සමාගම සතුව තවදුරටත් රු.මිලියන 31.8ක මුදලක් ඉතිරි වී ඇතත් එය නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණි.

## සීමාසහිත ලංකා පොහොර සමාගම

**මෙහෙයුම් අලාභ ලැබීම**

සමාගම වර්ෂ ගණනාවක සිට දිගින් දිගටම මෙහෙයුම් අලාභ ලබා තිබූ අතර පූර්ව වර්ෂ 5ක කාලයක සිට 2024 වර්ෂය දක්වා මෙහෙයුම් අලාභ ප්‍රතිශතය සියයට 04 සිට සියයට 157 දක්වා වර්ධනය වී තිබුණද පොහොර විකුණුම් ආදායම් වැඩිකර ගනිමින් අලාභ අවම කරගැනීමට ඉහළ කළමනාකාරීත්වය අපොහොසත් වී තිබුණි.

## ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

**බඩඉරිඟු ආනයනය හා බෙදාහැරීම**

2024 වර්ෂයේදී ලංකාවේ සත්ත්ව ගොවිපල සඳහා සහන මිලට බෙදාහැරීම වෙනුවෙන් බඩඉරිඟු මෙ.ටොන් 25,000ක් ආනයනය සඳහා විවෘත ටෙන්ඩර් පරිපාටියෙන් තොරව පුද්ගලික ආයතන 3ක් තෝරාගෙන බෙදා හැරීමේ කටයුතු ද එම ආයතනය වෙතම පවරා තිබුණි. 2024 දෙසැම්බර් 31 දින වන විට මෙ.ටොන් 25,000න් මෙ.ටොන් 9,917ක් අදාල ආයතන විසින් ආනයනය කර සුළු පරිමාණ නිෂ්පාදකයින් වෙත බෙදා හැර තිබුණද සහන මිලට බෙදා හැරීම සිදුවී ඇති බවට මණ්ඩලය විසින් අධීක්ෂණය කර නොතිබුණි.

## හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

**පර්යේෂණ සිදුකිරීම**

2024 වර්ෂයේදී රු.මිලියන 11.61ක් වැය කර පර්යේෂණ 11ක් නිම කිරීමට සැලසුම් කර තිබුණද, 2024 වර්ෂයට අදාළව එක් පර්යේෂණයක් පමණක් අවසන් කර තිබුණි.

## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**පනතේ අවශ්‍යතා ඉටු නොකිරීම**

2000 අංක 43 දරන රක්ෂණ පාලන පනතේ අංක 12(3)(1) වගන්තිය හා 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල පනතේ 29 වගන්තිය ප්‍රකාරව කෘෂිකාර්මික නොවන රක්ෂණ කාර්යයන් වන තෙවන පාර්ශව රක්ෂණ කටයුතු සඳහා රක්ෂණ නියාමන කොමිසමේ අධීක්ෂණයක් හා එහි නීති රීති ප්‍රකාරව අනුගමනය කලයුතු අවශ්‍යතා ඉටු කර නොතිබුණි.

**දීර්ඝ කාලීනව වැඩ බැලීමේ පත්වීම් ලබාදීම්**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13:4 වගන්තියට පටහැනිව එක් නිලධාරියෙක් අධ්‍යක්ෂ (පාලන) තනතුරෙහිද නිලධාරීන් 05දෙනෙකු සංවර්ධන නිලධාරි තනතුරෙහිද, මාස 07 සිට අවුරුදු 4 දක්වා ද 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන කාර්ය පටිපාටි රීති සඳහා වන අති විශේෂ ගැසට් පත්‍රයේ IX පරිච්ඡේදයේ 131 වගන්තියට පටහැනිව තනතුරු 09ක් සඳහා නිලධාරින් 22ක් මාස 06 සිට අවුරුදු 10 දක්වා ද කාලය දීර්ඝ කරමින් වැඩ බැලීමේ පදනමට සේවයේ යොදවා තිබුණි.

**අනුමැතියකින් තොර ගෙවීම්**

2022 ඔක්තෝබර් 06 දිනැති හා අංක 06/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව වයස අවුරුදු 60 ඉක්ම වූ නිලධාරීන් 4 දෙනෙකු සේවයේ යොදවා අනුමැතියක් නොමැතිව වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 6.8ක් ගෙවීම් කර තිබුණි.

**නිරවුල් නොකළ වන්දි මුදල්**

2017 සහ 2018 වර්ෂවල කෘෂිකාර්මික හානි සිදු වූ ගොවීන් 8,185කට අදාළ රු.මිලියන 70.8ක වන්දි මුදල්, තොරතුරු නොගැලපීම හේතුවෙන් වාණිජ බැංකු මඟින් ආපසු එවා ඇතත්, අදාළ ගොවීන් හඳුනාගෙන එම මුදල නිරවුල් කිරීමට හෝ නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට වසර 7ක කාලයක් තුළ කටයුතු කර නොතිබුණි.

**කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතිය**

ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC) සමඟ ඒකාබද්ධව කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පස්ධතිය ගොඩනැගීම සඳහා එක්සත් ජාතින්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් 2022 වර්ෂයේදී රු. මිලියන 20.4ක මුදලක් මණ්ඩලය වෙත ලබාදී තිබුණු අතර එම වර්ෂයේදී ඒ සඳහා රු. මිලියන 23ක් වැය කර තිබුණි. කෙසේ වුවද,

2024 වර්ෂය වන විටත් වන්දි ගණනය කිරීම සහ වන්දි ගෙවීමේ ක්‍රියාවලිය සඳහා එම පද්ධති භාවිතා කර නොතිබුණි.

මණ්ඩලයේ කළමනාකරණ තොරතුරු පද්ධතිය සඳහා ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් (ERP System) නිර්මාණය කර ප්‍රධාන මොඩියුල 09ක් යටතේ ආයතනයේ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා 2023 මාර්තු 01 දින සිට මාස 06ක් තුළ නිම කිරීමට ගිවිසුම්ගතව 2023 වර්ෂය වන විට රු. මිලියන 72ක් ගෙවා තිබුණි. පසුව ගිවිසුම් කාලය 2025 අප්‍රේල් 01 දක්වා දීර්ඝ කරගෙන තිබුණද, 2025 ජුනි 30 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

**අනපේක්ෂිත සිදුවීම් සංචිත අරමුදල**

2024 දෙසැම්බර් 31 දිනට අනපේක්ෂිත සිදුවීම්වලින් පැන නඟින හිමිකම් වෙනුවෙන් ගොඩනඟා තිබූ සංචිත අරමුදලේ ශේෂය රු.මිලියන 588.5ක් වුවත් “අනපේක්ෂිත සිදුවීම්” පිළිබඳව නිර්වචනය කර රීති ගොඩනගාගෙන නොතිබීම හේතුවෙන් වසර 22ක කාලයක සිට මෙම අරමුදල භාවිතයට ගෙන නොතිබුණි.

**දිරිදීමනා ගෙවීම්**

2022 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත තෙවැනි පාර්ශව රක්ෂණ ආදායමින් සියයට 5ක් වෙන් කර ගොඩනැඟූ දිරිදීමනා අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 38.4ක් විය. එම අරමුදලින් 2022,2023 හා 2024 වර්ෂවලදී පිළිවලින් රු.මිලියන 8.4ක් රු.මිලියන 8.7ක් සහ රු.මිලියන 10.4ක් වශයෙන් දිරිදීමනා ගෙවීම් කර ඇතත් මෙම අරමුදල පිහිටුවීමට සහ දිරිදීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**සේවක රක්ෂණය**

2024 පෙබරවාරි 28 දිනැති හා අංක 01/2024 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 වගන්තිය ප්‍රකාරව රජය සතු ව්‍යාපාරවල අරමුදල් සුභසාධන සංගම් හෝ වෙනත් කිසිදු සුභසාධන කටයුත්තක් සඳහා මාරු නොකළ යුතු වුවත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත කෘෂි රක්ෂණ මණ්ඩලයේ අරමුදලින් එහි සේවකයින්ට රක්ෂණ ආවරණයක් ලබා දීම සඳහා සේවක වෛද්‍ය රක්ෂණ අරමුදලක් ගොඩනගා ඒ වෙනුවෙන් 2024 වර්ෂයේදි මණ්ඩලයේ දායකත්වය රු.මිලියන 5.2ක් ලබාදී තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ශේෂය රු.මිලියන 36.3ක් වි තිබු අතර එම අරමුදල පිහිටුවීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය යටතේ ක්‍රියාත්මක අරමුදල්

### ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය

**අඛණ්ඩ පැවැත්ම**

යෝජනාක්‍රමයේ මුළු වත්කම් රු.මිලියන 3,062.1ක් සහ මුළු වගකීම් රු.මිලියන 94,351.6 ක් වූයෙන් වත්කම් ඉක්මවූ වගකීම් රු.මිලියන 91,289.5ක්ද, මුළු ජංගම වත්කම් රු.මිලියන 1,125 ක් සහ මුළු ජංගම වගකීම් රු.මිලියන 3,222ක් වූයෙන් ජංගම වත්කම් ඉක්මවූ ජංගම වගකීම් රු.මිලියන 2,097ක් ද වන අතර භාණ්ඩාගාරයේ දායකත්වයක් නොමැතිව යෝජනා ක්‍රමය පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක පවතින නිසා යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම ගැටළු සහගත වේ.

**ජීව දත්ත තොරතුරු යාවත්කාලීන නොකිරීම**

ගොවීන්ගේ ජීව දත්ත තොරතුරු යාවත්කාලීන නොකිරීම හේතුවෙන් මියගිය සහ වෙනත් හේතුන් මත හිමිකම් ලබාගැනීමට ඉදිරිපත් නොවන ගොවීන්ගේ විශ්‍රාම වැටුප දිගින් දිගටම තැපැල් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර 2024 වර්ෂයේ දී ගොවීන් විසින් භාර නොගැනීම නිසා තැපැල් දෙපාර්තමේන්තුව විසින් ආපසු එවූ විශ්‍රාම වැටුප රු.මිලියන 469.3ක් වූ අතර 2024 වර්ෂය අවසානයට එම දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ශේෂය රු.මිලියන 99.2ක් විය. එම ශේෂයන් සෑදී ඇති ආකාරය හා එක් එක් ගොවීන් පිළිබඳ විස්තර ඇතුළත් තොරතුරු පද්ධතියක් නොවූ බැවින් ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කර ගත නොහැකි ව තිබුණි.

**දායකත්ව තොරතුරු යාවත්කාලීන නොවීම**

2021 වර්ෂයේ නව බඳවාගැනීම් ආරම්භ කිරීමෙන් පසු, 2025 ජනවාරි 09 දින වන විට, එකවර මුදල් ගෙවූ දායකයින් 1,205 දෙනෙකු ද, අර්ධ වාර්ෂික වාරික මුදල් ගෙවන දායකයින් 2,210 දෙනෙකු ද, මාසික වාරික මුදල් ගෙවන දායකයින් 1,477 දෙනෙකු යෝජනා ක්‍රමයේ දායකත්වය ලබාගෙන සිටි අතර ඒ ඒ දායකයින්ට අනුව දායක මුදල් අයවීම් හඳුනාගැනීමටත්, දායකයින්ගේ සක්‍රීය හෝ අක්‍රීය බව හඳුනා ගැනීමටත්, අක්‍රීය වූ දායකයින්ගේ වාරික මුදල් භාර නොගැනීමටත් හැකිවන පරිදි පවතින තොරතුරු පද්ධතිය හෝ ලිපිගොනු පවත්වාගෙන ගොස් නොතිබුණි.

## ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

**අඛණ්ඩ පැවැත්ම**

යෝජනා ක්‍රමයේ මුළු වත්කම් රු.මිලියන 743.3ක් සහ මුළු වගකීම් රු.මිලියන 6,125.3ක් වුයෙන් වත්කම් ඉක්මවූ වගකීම් රු.මිලියන 5,382ක මෙම අවාසිදායක තත්ත්වය මත යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම ගැටළු සහගත වේ.

**පනතේ පරමාර්ථ ඉටු නොවීම**

1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනතේ 5 (1) වගන්තිය ප්‍රකාරව 2018 වර්ෂයෙන් පසු නව දායකයින් බඳවා ගැනීම් සිදු නොකිරීම හා 7 වගන්තිය ප්‍රකාරව වයස අවුරුදු 60 සම්පූර්ණ වූ ධීවරයන් 26,093 දෙනෙකුට විශ්‍රාම වැටුප් ප්‍රදානය කර නොතිබීම මත යෝජනා ක්‍රමයේ 3 වන වගන්තියෙන් අපේක්ෂිත පරමාර්ථ ඉටුවී නොතිබුණි. තවද 2007 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලය තුළ රු.මිලියන 5.5ක් හිඟ විශ්‍රාම වැටුප් ලෙස 2024 දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගතකර ඇතත් ධීවරයන් වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි.

## ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

**වාහනය පවරා නොගැනීම**

2022 දෙසැම්බර් 31 දින වනවිට ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව හා CARP-ICRAF Tree Domestication ව්‍යාපෘතිය නිම වී ඇතත් ව්‍යාපෘතිය වෙනුවෙන් භාවිතා කල ටොයෝටා කැබ් රථය 2025 සැප්තැම්බර් 30 දින වන විටද ප්‍රතිපත්ති සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**නොනිමි වැඩ**

2019 වර්ෂයේදී රු.මිලියන 12.3ක වටිනාකමට ප්‍රතිපත්ති සභාව පිහිටි ගොඩනැගිල්ලට කොටසක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සමඟ ඇති වූ අවබෝධතා ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව වැඩ නිම කළ යුතු දිනය 2020 අප්‍රේල් 30 වුවත් 2025 ජනවාරි 31 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි.

## අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**අපනයන ප්‍රවර්ධන ආධාර ලබාදීම**

අමාත්‍යවරයා විසින් නියෝග සෑදීමකින් තොරව 2024 වර්ෂය තුළ රු.මිලියන 289.96ක අපනයන ප්‍රවර්ධන ආධාර ප්‍රතිලාභීන් වෙත ගෙවා තිබුණි.

**සැලැසුම් සකස් කිරීම**

2015 වර්ෂයෙන් පසුව සංයුක්ත සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. 2024 වර්ෂයේ ගිණුම් කාරක සභාවේ නියෝගයක් පැවතියද 2025 මාර්තු 31 දින වන විටත් ඒ පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි.

**පැළ තවාන්වල උපරිම ධාරිතාවය හා නිමැවුම**

දෙපාර්තමේන්තුවේ පැළ තවාන්වල පැළ නිෂ්පාදනය ධාරිතාවය තීරණය කිරීමේදී පදනම් කරගනු ලබන නිර්ණායකයන් මොනවාද යන්න තහවුරු නොවුණි. දැනට එම පැළ තවාන්වල පවතින උපරිම ධාරිතාවය හා වර්තමාන නිෂ්පාදනය සැලකූ විට විශාල වෙනස්කම් පැවති අතර එය සියයට 18 සිට සියයට 64 දක්වා පරාසයක පැවතුණි. මේ අනුව ක්ෂේත්‍රගත කළ හැකි වූ පැළ ප්‍රමාණය 1,181,742 කින් අඩු වී පැවතුණි.

**කෘෂිකාර්මික භෝග ව්‍යාප්තිය සිදු කිරීම**

දෙපාර්තමේන්තුවේ මූලික හා ප්‍රධාන කාර්යයක් වනුයේ අපනයන කෘෂිකාර්මික භෝග ව්‍යාප්තිය සිදු කිරීම වන අතර ඒ සඳහා පසුගිය වසර 11ක කාලය තුළ රු.මිලියන 2,507ක් වැය කර තිබුණද, 2012 වර්ෂයට සාපේක්ෂව 2023 දෙසැම්බර් 31 දින වන විට භෝග වර්ග 05ක ක්ෂේත්‍රයේ පවතින බිම් ප්‍රමාණය අක්කර 15,875කින් හෙවත් සියයට 21කින් අඩු වී තිබුණි.

**ඉඩම් පවරා නොගැනීම**

මුල්හාල්කැලේ පැල තවාන පිහිටි, ප්‍රමාණයෙන් අක්.05 රූඩ් 01ක ඉඩම 1980 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුව විසින් භුක්ති විඳිනු ලබන නමුත් විධිමත් පරිදි දෙපාර්තමේන්තුව වෙත අත්කරගැනීමේ කටයුතු සිදු කර නොතිබුණි. එම ඉඩමෙන් අක්කර 02 රූඩ් 2 පර් 5ක ප්‍රමාණයක්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් පුද්ගලික සමාගමක් වෙත වසර 30ක කාලයක් සඳහා බදු ලබාදී තිබුණි. ඊට අමතරව දෙපාර්තමේන්තුව පරිහරණය කරන අක්කර 365ක ඉඩම් කොටස් 30ක් 2024 වර්ෂයේ අවසන් දින වන විටත් අයිතිය පවරා ගෙන නොතිබුණි.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**බලපත්‍ර ලබා නොගැනීම**

1980 අංක 37 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 26 වන වගන්තිය යටතේ නිකුත් කළ අංක 1655/7 දරන 2010 මැයි 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව විගණිත දිනය වූ 2025 පෙබරවාරි 27 දින වන විට වෙළෙඳසැල් 05 ක් 2024 වර්ෂය සඳහා ලබා ගත යුතු වාර්ෂික බලපත්‍රය ලබා නොගෙන වෙළඳාම් කටයුතු සිදු කරමින් පැවතුණි.

**අධි ගෙවීම්**

අනුරාධපුර ශ්‍රී මහා බෝධියේ උඩමළුව පරිශ්‍රයේ අදියර 03ක් යටතේ රු.මිලියන 45.20ක වියදමින් ඉදිකර තිබූ හෙල බොජුන්හල සඳහා රු.මිලියන 1.82 ක අධි ගෙවීමක් කර තිබුණි.

**ව්‍යාජ ගෙවීම්**

2022 මැයි සිට 2023 දෙසැම්බර් දක්වා කාලය තුල උඩරදැල්ල බීජ අර්තාපල් නිෂ්පාදන ගොවිපලේ සේවය කරන කොන්ත්‍රාත් කම්කරු සේවයේ අයෙකු විසින් ඩීසල්, පෙට්‍රල්, ඔයිල් හා ග්‍රීස් මිලදී ගැනීම වෙනුවෙන් පිළියෙළ කරන ලද ව්‍යාජ බිල් පත්‍ර භාවිතා කර රු.මිලියන 3.13ක් පෞද්ගලික ඉන්ධන පිරවුම්හලක් වෙත ගෙවීමට කටයුතු කර තිබුණි.

**ඩීසල් ගබඩා කිරීමේ ටැංකි 04ක් මිලදී ගැනීම**

බීජ නිෂ්පාදන ගොවිපලවල් සඳහා එකක් රු.මිලියන 2.41ක් බැගින් වූ ඩීසල් ගබඩා කිරීමේ ටැංකි 04ක් මිලදී ගැනීමේදී ටැංකියක් රු.මිලියන 2.50කට ඇස්තමේන්තු කර තිබූ නමුත් වර්තමානයේ මෙම ඩීසල් ගබඩා කිරීමේ ටැංකියක වෙළඳපල මිල රු.මිලියන 1.45ක් වන බව විගණන පරීක්ෂාවේදී අනාවරණය විය. ඒ අනුව ටැංකි 04ක් සඳහා රු.මිලියන 9.63ක් ගෙවීම් කිරීම හේතුවෙන් අවම වශයෙන් රු.මිලියන 4.20ක අලාභයක් සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය. තවද, මෙම ටැංකි මිලදීගෙන 2025 පෙබරවාරි වන විට වසර 02කට අධික කාලයක් නිෂ්කාර්යයව පැවතුණි.

**සූර්යබල වීථි ලාම්පු ස්ථාපිත කිරීම**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (බීජ) කාර්යාල හා බීජ නිෂ්පාදන ගොවිපලවල් තුළ 2023 හා 2024 වර්ෂයන්වල රු.මිලියන 35.43ක් වටිනා සූර්යබල වීථි ලාම්පු 474ක් ස්ථාපිත කිරීම වෙනුවෙන් 2023 සහ 2024 වර්ෂයන් තුල වීථි ලාම්පුවක් සඳහා පිළිවෙලින් රු.46,000ක් සහ රු.55,000ක් ලෙස පදනම් රහිතව ඇස්තමේන්තු කර කිබුණි. එහෙත් අදාල පිරිවිතර හා සන්නාම සහිත

වීපී ලාම්පුවක මිල රු.17,250ක් බව විගණනයේදී අනාවරණය වුවත් අවම වශයෙන් රු.මිලියන 13.63ක අලාභයක් සිදු වී තිබුණි.

**බීජ නිෂ්පාදනය**

කුණ්ඩසාලේ රජයේ බීජ නිෂ්පාදන ගොවිපලේ පසුගිය කන්න 04ක අපේක්ෂිත මුළු බීජ නිෂ්පාදනය කි.ග්‍රෑ.10,530ක් වුවද, රු.මිලියන 20.71ක පිරිවැයක් දරා බීජ කි.ග්‍රෑ.2,717ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. එය අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 25ක් වැනි ඉතා අඩු මට්ටමක් විය.

තවද, පැල්වෙහෙර නියෝජ්‍ය අධ්‍යක්ෂ (බීජ) කාර්යාලය සඳහා 2024 යල කන්නයට අදාළව කොන්ත්‍රාත් බීජ වැඩ සටහන යටතේ බෝග වර්ග 03ක් සඳහා ලබා දී තිබූ කි.ග්‍රෑ.33620ක ඉලක්කයෙන් කි.ග්‍රෑ. 21320ක ප්‍රමාණයක් හෙවත් සියයට 63ක් අත්පත් කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

.

එසේම මීපිළිමාන රජයේ බීජ අර්තාපල් නිෂ්පාදන ගොවිපලේ 2021 යල කන්නයට සාපේක්ෂව 2023 යල කන්නයේ බීජ අර්තාපල් නිෂ්පාදනය සියයට 50 කින් පහළ ගොස් තිබූ අතර 2021/ 2022 මහ කන්නයට සාපේක්ෂව 2023/2024 මහ කන්නයේ බීජ අර්තාපල් නිෂ්පාදනය සියයට 43 කින් පහළ ගොස් තිබුණි.

අනුරාධපුර ගොවිපල් යාන්ත්‍රික පුහුණු මධ්‍යස්ථාන පරිශ්‍රයේ විධිමත් ඉංජිනේරු සැලැස්මක් හා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව රු.මිලියන 13,31ක පිරිවැයකට Ones stop අලෙවිසැලක් හා කෘෂි උපකරණ කුලියට ලබා දීමේ මධ්‍යස්ථානයක් ඉදිකර ඒ සඳහා රු.මිලියන 11,73කට මිලදීගෙන තිබූ කෘෂි උපකරණ භාවිතයට නොගෙන වසර 05කට අධික කාලයක් නිෂ්කාර්යයව පැවති අතර, රු.මිලියන 7,13ක පිරිවැයකට බටඅත කෘෂි තාක්ෂණික උද්‍යානය තුළ ඉදිකර තිබූ Ones stop අලෙවිසැලද ඌන උපයෝජිතව පැවතුණි.

## ශ්‍රී ලංකා හදබිම අධිකාරිය (ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරිය)

**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කෝටාව යටතේ බඩඉරිඟු ආනයනය**

බඩඉරිඟු ආනයනයට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට ලද කෝටාවෙන් 2023 වර්ෂය තුළ මෙට්‍රික් ටොන් 21,250ක් ද, 2024 දී මෙට්‍රික් ටොන් 25,000ක් ද ආනයනය

කිරීමට හදබිම අධිකාරියට අවසර ලබා දී තිබුණි. එහෙත් හදබිම අධිකාරිය විසින් අධිකාරියේ මුදල් යොදවා බඩඉරිඟු ආනයනය කර සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිර්නායක අනුව බෙදා හැරීමට කටයුතු කර නොතිබුණ අතර, අධිකාරිය විසින් අභිමතය පරිදි තෝරාගත් පෞද්ගලික ආනයනකරුවන් තිදෙනෙකු හට පහසුකම් සලසා රු.මිලියන 130.55ක කොමිස් මුදලක් ලබා ගැනීමට අධිකාරිය කටයුතු කර තිබුණි. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව කෝටාව ලබා දී ඇත්තේ සුළු පරිමාණ සත්ත්ව ආහාර නිෂ්පාදකයින් අරමුණු කර බෙදාහැරීමට වුවද, බඩඉරිඟු බෙදා හැරීම සම්බන්ධයෙන් ආයතනය ඉදිරිපත් කළ ලැයිස්තුවේ සඳහන් ගොවිපලවල් මධ්‍ය හා මහා පරිමාණයේ ඒවා බවත්, බඩඉරිඟු මෙට්‍රික් ටොන් 10,000 ක් ආනයනය කළ ආනයනකරුවෙකුගේ බෙදාහැරීම් ලැයිස්තුව පරීක්ෂා කිරීමේදී ලැයිස්තුවේ සඳහන් කිසිදු ගොවිපලක් වෙත අදාළ ආනයනික සමාගමෙන් බඩඉරිඟු ලබා දී නොතිබුණ බවත්, 2024 ඔක්තෝබර් 23 දින සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

**සිංහල හා හින්දු අලුත් අවුරුදු සමය වෙනුවෙන් උඳු ආනයනය**

2024 සිංහල හා හින්දු අලුත් අවුරුදු සමය වෙනුවෙන් වතුකරයේ ද්‍රවිඩ ජනතාවට අවශ්‍ය උඳු ඇට මෙට්‍රික්ටොන් 500ක් ආනයනය කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශයේ විසින් අධිකාරිය වෙත අවසර ලබා දී තිබුණි. හදබිම අධිකාරිය විසින් ලැබී තිබුණ අවසරය උපයෝගී කර ගෙන සියලුම ආනයනික ලේඛනවල හදබිම අධිකාරියේ නම සඳහන් කරමින් තොරාගත් පෞද්ගලික ආයතනයක මුදල් උපයෝගී කර ගෙන භාණ්ඩ ආනයනය සිදු කර තිබුණි. භාණ්ඩ එම ආයතනයට ලබා දී අධිකාරිය විසින් රු.මිලියන 8ක කොමිස් මුදලක් ලබාගෙන තිබුණි. කැබිනට් අනුමැතිය ලබා දී තිබුණේ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් අවශ්‍ය උඳු ආනයනය කිරීමට වුවද, 2024 අප්‍රේල් 30 දින සිට 2024 මැයි 03 දින දක්වා කාලසීමාව තුළ උඳු ඇට ගුදම්වලින් නිදහස් කර පිටකොටුවේ තොග අලෙවිකරුවන් වෙත අදාළ පෞද්ගලික් ආයතනය විසින් ප්‍රවාහනය කර තිබුණ බව නිරීක්ෂණය විය

**අයවැය සීමාවන් ඉක්මවා වැය කිරීම්**

රාජ්‍ය ආයතනයක් ලෙස වාර්ෂික අනුමත අයවැය සීමාවන් තුළ ආයතනයේ කටයුතු මෙහෙයවා ගත යුතු වුවද, උඳු සහ බඩඉරිගු ආනයනකරුවන්ගෙන් ලබා ගන්නා රු.මිලියන 138.55ක කොමිස් මුදලින් අධිකාරිය විසින් නිලධාරීන්ගේ ණය ගෙවීම සඳහා වන චක්‍රීය ණය අරමුදලට රු.මිලියන 8ක් හා නිලධාරීන්ට ටැබ් පරිගණක මිලදී ගැනීම සඳහා රු.මිලියන 5.79ක මුදලක්ද වාර්ෂික අනුමත අයවැය සීමාවන් ඉක්මවා වැයකර තිබුණි.

# පශු සම්පත්

ශ්‍රී ලංකාව නාගරික ජනගහණයට වඩා ග්‍රාමීය ජනගහණයක් ජීවත්වන රටක් වන අතර ග්‍රාමීය ජනතාව බොහෝ විට ප්‍රාථමික කර්මාන්තයන්හි නියැලෙන පිරිසක් වේ.ඒ අනුව මෙම ග්‍රාමීය ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය වූ කෘෂි හා සත්ව නිෂ්පාදන මිලදී ගැනීම ඒවා සඳහා හොඳ මිලක් ලබා දීම හා නිෂ්පාදනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම හා ප්‍රාථමික නිෂ්පාදන ද්විතීය නිෂ්පාදන බවට පරිවර්තනය කර ඒවා විදේශ වෙළඳපොළ වෙත යොමු කිරීම ඊට සම්බන්ධ රාජ්‍ය ආයතනවල කාර්යභාරය විය යුතුය. ඒ අනුව ශ්‍රී ලංකාවේ පශු සම්පත් අංශයට අදාළ කාර්යභාරය පහත සඳහන් පරිදි විය.

ඉහත කාර්යභාරය ඉටු කිරීම සඳහා මෙම අංශයට අදාළ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා මිල්කෝ පෞද්ගලික සමාගම මගින් ඉටුකරන ලද කාර්යයන් සම්බන්ධයෙන් සිදුකළ විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු පහත සාරාංශ කර දක්වා ඇත.

## විගණන නිරීක්ෂණ

**කිරි ගවයින් ආනයනය කිරීම සඳහා අත්තිකාරම් ලබාදීම**

කිරි ගවයින් ආනයනය කිරීමේ ව්‍යාපෘතියේ තුන්වන අදියර යටතේ වර්ෂ 02ක කාලයක් ඇතුළත ගැබ්ගත් කිරි ගවයින් 20,000ක් ආනයනය කිරීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව එ.ජ.ඩොලර් මිලියන 73.95ක ණය මුදලක් ලබා ගැනීම සඳහා ඔස්ට්‍රේලියාවේ අපනයන මූල්‍ය රක්ෂණ සමාගම හා නෙදර්ලන්තයේ රොබෝ බැංකුව සමඟ ගිවිසුම් ගතව තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ තුන්වන අදියර II පියවර යටතේ කිරිදෙනුන් 15,000ක් ආනයනය කිරීම සඳහා අදාළ කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20ක් වූ අත්තිකාරම් මුදල් ලෙස එ.ජ.ඩොලර් මිලියන 11.09ක් (රු.මිලියන 1,749.67) ආනයනයට පෙර කළ යුතු මූලික කාර්යයන් ඉටු කිරීමකින් තොරව වර්ෂ 10කට පමණ පෙර එනම් 2007 වර්ෂයේදී ලංසු කැඳවීම මගින් තෝරා ගන්නා ලද සැපයුම්කරු වූ ඔස්ට්‍රේලියාවේ වෙලාර්ඩ් රුරල් එක්ස්පෝර්ට් ආයතනය (Wellard Rural Exports Pvt Limited, Australia) වෙත ගෙවීම් කර තිබුණි. එම අත්තිකාරම් ගෙවීම් කිරීමේදී 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.5 උප වගන්තිය ප්‍රකාරව අත්තිකාරම් සුරක්ෂණයක් තබා ගැනීමට ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. ඉහත යෝජිත කිසිම සතෙකු හෝ කිසිදු ප්‍රතිලාභයක් 2025 පෙබරවාරි 27 දින වන විට ද ශ්‍රී ලංකා රජයට ලැබී නොතිබීම

හේතුවෙන් රු.මිලියන 1,749.67 (එ.ජ.ඩොලර් මිලියන 11.09) ක අත්තිකාරම් මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

## මිල්කෝ පුද්ගලික සමාගම

**දියර කිරි මිලදී ගැනීම.**

අපේක්ෂිත වෙළඳපොළ කොටස ළඟා කරගැනීම සඳහා ඉලක්කගත නිෂ්පාදනය සිදු කිරීමට ප්‍රධාන යෙදවුම් වන දියර කිරි රටෙහි සමස්ත නිෂ්පාදනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් මිලදී ගැනීම අත්‍යවශ්‍ය කරුණක් වේ. එහෙත් සමාගම විසින් සිය නිෂ්පාදන කටයුතු සඳහා 2020 සිට 2024 දක්වා වර්ෂයන් තුළදී කිරි මිලදී ගැනීම පහළ මට්ටමක පැවතුණි. විස්තර පහත පරිදි වේ.

වගු අංක 2.26 - සමස්ථ කිරි එකතු කිරීම්වලින් සමාගමේ උපයෝජනය

| වර්ෂය | දියර කිරි එකතුවීම් (සමාගමේ වාර්තා අනුව) ලීටර් (මිලියන) | සමස්ථ කිරි නිෂ්පාදනය (ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව) ලීටර් (මිලියන) | කිරි මිලදී ගැනීම සියයට |
|---|---|---|---|
| **2020** | 67.29 | 491.54 | 13.68 |
| **2021** | 67.91 | 513.31 | 13.22 |
| **2022** | 47.54 | 506.45 | 9.38 |
| **2023** | 39.78 | 504.15 | 7.89 |
| **2024** | 48.59 | 521.71 | 9.31 |

**මූලාශ්‍රය - මිල්කෝ සමාගම, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව**

**නිශ්කාර්ය වත්කම්**

2022 වර්ෂයේදී මිලදීගෙන දිගන කර්මාන්තශාලාව තුළ ස්ථාපිත කර තිබූ රු.මිලියන1.19ක්වූ අයිස්ක්‍රීම් ක්‍රීම් යන්ත්‍රයෙහි දර්ශන තිරය 2023 සැප්තැම්බර් මාසයේදී ක්‍රියා විරහිත වී තිබූ අතර, එය 2025 මාර්තු 04 දින වන විටත් නිසි පරිදි අලුත්වැඩියා කර නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා උපයෝජනය කර නොතිබුණි. තවද කොළඹ කර්මාන්තශාලාවෙන් මාරු කරන ලද අයිස්ක්‍රීම් නිෂ්පාදන යන්ත්‍රය ද එදිනට භාවිතා නොකර නිශ්ක්‍රීයව පැවතුණි.

දිගන කර්මාන්තශාලාවේ පවතින වටිනාකම රු.මිලියන 15.445ක් වූ අයිස්ක්‍රීම් බඳුන් (Cup & Corn Filler) නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රය වසර 12 කාලයක සිට භාවිතයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි. තවද ඩෙස්මි ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීමට නියමිතව තිබූ නව ශීතාගාරයක

අංගෝපාංග වන Cooling Room Doors 17 ක් සහ Cooling Room Panels ආසන්න වශයෙන් 100කට වැඩි ප්‍රමාණයක් භාවිතයට ගැනීමකින් තොරව නිෂ්ක්‍රියව පැවතුණි.

**ඌන ධාරිතා උපයෝජනය**

දිගන කර්මාන්තශාලාවේ UHT කිරි නිෂ්පාදන යන්ත්‍ර 03, අයිස් ක්‍රීම් නිෂ්පාදන යන්ත්‍ර 04 හා කල්කිරි නිෂ්පාදන යන්ත්‍රයන්හි සමස්ත ධාරිතාවය 2024 වර්ෂයේදී පිළිවෙලින් ලීටර් 7,862,400ක්ද, අයිස් ක්‍රීම් ලීටර් 5,616,000ක්ද, ජීවානුහරිත කිරි ලීටර් 1,800,000ක් වුවද 2024 වර්ෂයේ තත්‍ය සාමාන්‍ය නිෂ්පාදනය පිළිවෙලින් ලීටර් 4,561,288 ක්ද, අයිස් ක්‍රීම් ලීටර් 2,069,657ක්ද, ජීවානුහරිත කිරි ලීටර් 133,856ක්ද වූයෙන් වාර්ෂික නිෂ්පාදන ධාරිතාවය පිළිවෙලින් සියයට 58ක්, සියයට 37ක් හා සියයට 7.4ක් පමණක් ලඟා කරගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

## ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

**අපේක්ෂිත කිරි නිෂ්පාදනය හා තත්‍ය කිරි නිෂ්පාදනය**

2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වූ ක්‍රියාකාරී සැලසුම් අනුව මණ්ඩලයේ අපේක්ෂිත කිරි නිෂ්පාදනය සහ තත්‍ය කිරි නිෂ්පාදනය පහත පරිදි අඩුවී තිබුණි.

වගු අංකය 2.27 - **2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා මණ්ඩලයේ අපේක්ෂිත කිරි නිෂ්පාදනය සහ තත්‍ය කිරි නිෂ්පාදනය**

| වර්ෂය | ක්‍රියාකාරී සැලසුම අනුව අපේක්ෂිත කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන) | තත්‍ය කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන) | අඩුවීම (ලීටර් මිලියන) |
|---|---|---|---|
| **2019** | 17.91 | 12.43 | 5.48 |
| **2020** | 15.11 | 12.03 | 3.08 |
| **2021** | 15.22 | 9.7 | 5.52 |
| **2022** | 12.54 | 6.43 | 6.11 |
| **2023** | 8.92 | 4.87 | 4.05 |
| **2024** | 7.18 | 4.15 | 3.03 |

මූලාශ්‍රය - ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු

## සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**කුණ්ඩසාලේ මධ්‍යම කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානය**

දේශීය කුකුලන් ප්‍රවර්ධනය සඳහා පර්යේෂණ කටයුතු සිදු කිරීමට මෙම මධ්‍යස්ථානය ක්‍රියාත්මක වන නමුත් මෙහි කුකුලන් ඇති කිරීම සඳහා පර්යේෂණ කටයුතු සිදු කිරීම 2018 වර්ෂයෙන් පසු සිදු කර නොතිබුණි. එමෙන්ම උපරිම ධාරිතාවය 5,420ක් වූ කුකුල් කූඩුවල කුකුලන් ඇති කිරීම 1976ක් එනම් සියයට 36ක් පමණක් වී තිබුණි.

**ඉඹුලන්දණ්ඩ පශු පර්යේෂණ ආයතනය**

ඉදිරි වර්ෂ 05ක් තුළ එළුවන් 250ක් ක්ෂේත්‍රගත කිරීම, වාණිජ ගොවිපලවල් ඇති කිරීම, බෝයර් වර්ගයේ එළු ශුක්‍රාණු නිපදවීම යන අරමුණු වෙනුවෙන් 2019 වර්ෂයේදි රු.මිලියන 37.34ක් වැය කර බෝයර් වර්ගයේ එළුවන් 100 ක් ආනයනය කර තිබුණි. එය සෞඛ්‍ය නිර්ණායක හා ලෝක සෞඛ්‍ය සංවිධාන මාර්ගෝපදේශයන්ගෙන් බැහැරව 2024 දෙසැම්බර් 31 දිනට මධ්‍යස්ථානයේ රෝගී තත්ත්වයේ එළුවන් 141ක් පමණක් ඉතිරි වී පැවතුණ අතර, මේ අනුව ව්‍යාපෘතියේ අරමුණු මුළුමනින්ම ඉටු වී නොතිබුණි. එමෙන්ම රෝගී එළුවන් (CEA රෝගී) අපහරණයට ගෙන තිබූ තීරණය වර්ෂයක අධික කාලයක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් 2024 වර්ෂයේ අවසානයට එම රෝගී එළුවන් නඩත්තුව සඳහා රු.මිලියන 75.34ක් ද ඔවුන්ගේ ආනයනික වැය ද ඇතුළුව එකතුව රු.මිලියන 112.68ක් වූ වියදම් නිෂ්කාර්යය වී තිබුණි.

**තෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානය**

2000 වර්ෂයේදී ජමුනාපාරි එළුවන් ව්‍යාප්ත කිරීම වෙනුවෙන් තෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානය ආරම්භ කර තිබුණු නමුත් ඉකුත් වර්ෂ 05 තුළ අදාළ ව්‍යාපෘතියේ අරමුණ වූ එළුවන් ප්‍රජාව වෙත ලබා දීම එළුවන් 213 සිට 31ක් දක්වා ශීඝ්‍රයෙන් පහත වැටී තිබුණි.

**පොළොන්නරුව කෘතීම සිංචන මධ්‍යස්ථානය**

වියළි කාලයට අදාළව දෙමුහුන් ගව වර්ගවල ශුක්‍ර නිෂ්පාදනය හා දෛනික කෘතීම සිංචන පුහුණු කිරීමේ අරමුණින් අක්කර 100ක වපසරියක මධ්‍යස්ථානය පිහිටුවා ඇත. ගවයින් 48කින් 39ක් රෝගී වීම හේතුවෙන් වර්ෂ 02කට අධික කාලයක් මධ්‍යස්ථානය පූර්ණ වශයෙන් අක්‍රිය වී පැවතුණි. රෝගී සතුන් අපහරණය සඳහා කඩිනම් මැදිහත් වීමක් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් සිදු නොකිරීම හේතුවෙන් වටිනාකම රු.මිලියන 3.07ක් වූ ගව

ශුක්‍ර වඩි 55,270ක අපේක්ෂිත නිෂ්පාදනය වර්ෂයකට අධික කාලයක සිට නතර වී තිබුණි.

2024 වර්ෂයේදී මධ්‍යස්ථානයේ වියදම් වෙනුවෙන් රු.මිලියන 9.45ක් වැයකර තිබුණද එය පූර්ණ වශයෙන් අකර්මණ්‍යය වී තිබූ බව නිරීක්ෂණය විය.

**මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

ගන්නෝරුව පශු පර්යේෂණ ආයතනයේ මුදල් නිලධාරිනිය (සරප්) විසින් සිදු කර තිබූ රු.මිලියන 14.75ක මූල්‍ය අක්‍රමිකතාවය සම්බන්ධව මු.රෙ.104(4) පූර්ණ පරීක්ෂණ වාර්තා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිකුත් කර නොතිබුණි. මූල්‍ය අක්‍රමිකතාවයට අදාළව සෘජුව වගකීමට බැඳෙන මුදල් නිලධාරිනියට (සරප්) එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණ ද මෙම අක්‍රමිකතාවයට වගකීමට බැඳෙන අනෙකුත් පාර්ශවයන් වෙනුවෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## ඉඩම් අමාත්‍යාංශය

**බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

බිම්සවිය වැඩසටහන 1998 වර්ෂයේ දී නියාමන වැඩසටහනක් ලෙස ආරම්භ වී වර්තමානය වනවිට වසර 26 ක් වනවිට ඒ සඳහා දරා ඇති වියදම රු.මිලියන 9,357 ක් වී තිබුණි. හිමිකම් සහතික ලබා දී ඇති සංඛ්‍යාව 462,922 ක් වන අතර ගැටළුකාරී ලෙස පැවති ඉඩම් කැබලි වලට අදාළව පසෙක තබා ඇති ලිපිගොනු සංඛ්‍යාව 500,739 ක් විය. දිවයිනපුරා මෙම වැඩසටහන් ක්‍රියාත්මක විමට හා සහතික නිකුත් කිරිමට 2024 දෙසැම්බර් 31 දින වන විට ඉතිරිවී ඇති ඉඩම් කැබලි මිලියන 16 ක් පැවතීමත් මෙම ඉඩම් කැබලි ප්‍රමාණයට හිමිකම් සහතික ලබාදීමට ඉදිරියට වසර 66 ක් පමණ ගත වන බවත් ඒ සඳහා දළ වශයෙන් රු.මිලියන 60,000 ක් පමණ වැය වන බව අතීත සංඛ්‍යාලේඛණ අනුව නිරීක්ෂණය වන අතර එම වැඩසටහන කාර්යක්ෂමව ඉටුකිරීමට සුදුසු අභ්‍යන්තර වැඩපිළිවෙලක් අමාත්‍යාංශය විසින් සකස් කර නොතිබුණි.

**වාහන අනතුරු**

සංචාරක අමාත්‍යාංශය සතු ජීප් රථයක් 2019 වර්ෂයේදී අනතුරකට ලක්වීමෙන් පසුව ශ්‍රී ලංකා සංචාරක සම්මේලනය කාර්යාංශය වෙත භාරදී තිබුණි. 2023 නොවැම්බර් 23 දින රු.මිලියන 11.52ක අලුත්වැඩියා වියදමක් එම කාර්යාංශය මඟින් සිදු කර සිදුකර තිබුණු අතර එම වාහනය වසර පහක කාලයක් භාවිතා කිරීම සඳහා කාර්යාංශයට පවරා දී නැවත අමාත්‍යාංශය වෙත පවරා ගෙන ඇතත්, රජයේ දේපලකට සිදුවූ හානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 102,104,105 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.එසේම මෙම ජීප් රථය වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 වන විට කාර්යංශය විසින් වැය කර තිබුණු රු.මිලියන 12.4 ක මුදල ප්‍රතිපූර්ණය කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

**උරුමය වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

උරුමය වැඩසටහන ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ජනාධිපති ලේකම් කාර්යාල වැය ශීර්ෂයක් යටතේ ඉඩම් අමාත්‍යංශයට රු.මිලියන 18.83 ක්ද ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට රු.මිලියන 111.58 ක් ලෙස මුළු

ප්‍රතිපාදනය රු.මිලියන 130.41 ක් ලබාදී තිබුණි.එම ප්‍රතිපාදනයෙන් අමාත්‍යාංශය රු.මිලියන 14.48 ක් හා දෙපාර්තමේන්තුව රු.මිලියන 71.88 ක් ලෙස දරන ලද මුළු වියදම රු.මිලියන 86.36 ක් විය.මෙම වැඩසටහන යටතේ 2024 වර්ෂය තුළ ලබාදීමට සැලසුම්කරන ලද ඔප්පු ප්‍රමාණය 40,000 ක් වුවත් සත්‍ය වශයෙන් ලබා දුන් ඔප්පු ප්‍රමාණය 22,362 ක් විය. මෙම වැඩසටහන කඩිනම් වැඩසටහනක් ලෙස ආරම්භ කිරීමෙන්, දිරිදීමනා වෙනුවෙන් අමාත්‍යාංශය රු.මිලියන 5.04 ක් හා දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 7.26 ක් ලෙස එකතුව රු.මිලියන 12.3ක් වැයකර ඇතත් දිරිදීමනා ගෙවීමට රේටයන් ගණනය කිරීම හා නිලධාරින් විසින් රාජකාරී කාලය තුළ ඉටුකරනු ලැබූ උරුමය ඔප්පු ලබාදීමේ කටයුතු සඳහා දීමනා ලබාදීම සඳහා භාණ්ඩාගාර අනුමැතියක් ගෙන නොතිබුණි.

## ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

**ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොකිරීම**

සෑම රාජ්‍ය ආයතනයකට ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් නිලධාරීන්ගේ පැමිණීම සහ පිටවීම අත්සන් කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතු වුවත්, මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 57 සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර ස්ථාපිත කර නොතිබුණි.එසේම එම කාර්යාල වල ස්ථිර පදනමින් බඳවාගත් අධීක්ෂණ නිලධාරීන් නොමැතිකම නිසා රාජකාරී ඉටු කිරීම මත හා වැඩ බැලීමේ පත්වීම් සිදුකිරීම නිසා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය. 2024 වර්ෂයේ වැටුප් හා වේතන, වෙනත් දීමනා, අතිකාල හා නිවාඩු දින වැටුප් හා ගමන් වියදම් ලෙස රු.මිලියන 724.95 ක් දරා ඇතත් එම වියදම් සත්‍ය බවට තහවුරු කල හැකි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

**මිනුම් කළ කොටස් නොමැති වීම**

2023 වර්ෂයේ සිට මිනින්දෝරු දෙපාර්තුමේන්තුව විසින් බිම් කැබලි මැනීම් කර භාරනොදීම හේතුවෙන් කැස්බෑව ප්‍රාදේශීය කාර්යාලයේ ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ නිලධාරීන්ට රාජකාරී ඉටු කිරීම සඳහා මිනුම් කරන ලද බිම් කැබලි නොමැති තත්ත්වයක් නිරීක්ෂණය විය.ඒ අනුව එම රාජකාරි කාලය වෙනුවෙන් නිලධාරීන්ට ගෙවූ රු.මිලියන

9.14 ක් වූ වැටුප් හා වේතනයන්ට සරිලන සේවයක් ලබා ගෙන නොතිබුණි.

**නිල නිවාස භාවිතා නොකිරීම**

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා වෙනුවෙන් 2020 සැප්තැම්බර් මාසයේ රු. මිලියන 25.07ක වියදමින් ඉදි කල නිල නිවස අදාල අරමුණ සඳහා භාවිතා නොකර දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් දෙදෙනකුට ලබා දී ඇතත් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව නිවාස කුලිය අයකර නොතිබුණි.

ඉ

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

**නොදියුණු වටිනාකම අයකර නොගැනීම**

වර්ෂ කිහිපයක සිට ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් සංවර්ධනය කර බාහිර පාර්ශ්වයන් වෙත බැහැර කර ඇති ඉඩම් අක්කර 321 පර්චස් 3.03 කට අදාළව ඉඩම් සංවර්ධනය කිරීමට පෙර පැවති නොදියුණු වටිනාකම වූ රු.මිලියන 59.78 ක මුදල දෙපාර්තමේන්තුව විසින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**ඉඩම් කළමනාකරණ තොරතුරු පද්ධතිය**

ඉඩම් බදු දීම හා සම්බන්ධ කාර්යක්ෂම සේවාවක් සැපයීම අරමුණු කර රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (E-slims) ආරම්භ කර වර්ෂ 05 ක කාලයක් තුළදී පද්ධතියෙහි වැඩ අවසන් කර ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 119.6 ක් ඇස්තමේන්තු කර ඒ සඳහා දරා ඇති වියදම රු.මිලියන 226.90 ක් වුවත් 2025 අප්‍රේල් 10 දින වන විටත් මෙම පද්ධතිය මගින් ලබා ගැනීමට බලාපොරොත්තු වූ කාර්යසාධන මට්ටම ළඟා කර ගෙන නොතිබුණි.

**මුහුදු වැලි කැණීම්**

ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් මුහුදු වැලි ඉවත් කිරීමේ ගිවිසුමක් 2018 ජනවාරි 16 දින ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත් කර ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් මුහුදු වැලි ඉවත් කිරීමේ ගිවිසුමක් 2018 ජනවාරි 16 දින විදේශීය සමාගමක් සමග අත්සන් කර ඒ අනුව 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ රු.මිලියන 6,778.04 ක් වටිනාකමට මුහුදු වැලි අලෙවි කර සංස්ථාව විසින් ආදායම උපයාගෙන තිබුණි. 1947 අංක 08 දරන රාජ්‍ය සන්තක ඉඩම්

පිළිබඳ ආඥා පනතේ 58 සිට 67 දක්වා වගන්තිවලට අනුව මුහුදු පතුලෙන් යම් ද්‍රව්‍යයක් ලබා ගන්නේ නම් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් අනුමැතිය අනුව සිදුකළ යුතු බව සඳහන්ව ඇති අතර ඒ සඳහා ගාස්තුවක් අය කළ යුතු බවද සඳහන් වී තිබුණි. නමුත් රු.මිලියන 6,778.04 ක් වූ වටිනා වැලි ඉවත් කිරීමේදී ලබාගත් අනුමැතියක් හෝ යම් මුදලක් රජයට අයකර ගත් බවට සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවුණි.ඒ අනුව මෙම ක්‍රියාවලියේදී අවම වශයෙන් රු.මිලියන 271.1 කට ආසන්න පාඩුවක් රජයට සිදුවී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

**අතර මග නතර කළ ව්‍යාපෘති**

කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ 2019 වර්ෂයේ දී ශක්‍යතා අධ්‍යයනයකින්, නිසි සැලසුමකින් හා ප්‍රතිපාදන පවතීද යන්න ගැන සොයා බැලීමකින් තොරව දෙපාර්තමේන්තුව වෙත අයිතිය පවරා ගැනීමකින් තොරව පර්චස් 30 ක බිම් කොටසක් සංචාරක බංගලාවකට ලබාගෙන එම ගොඩනැගිල්ලෙහි කොටසක් පමණක් ඉදිකර තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැය කර ඇති මුදල රු.මිලියන 10.42 ක් වූ අතර බංගලාවෙහි ඉදිකිරීම් වැඩ නිම නොකර රු.මිලියන 0.33 ක ලී බඩු උපකරණද මිලදී ගෙන තිබුණි. ඉදිකිරීම් කටයුතු නවතා දමා ඇති මෙම ගොඩනැගිල්ල නිසි ප්‍රයෝජනයකින් තොරව විනාශ වෙමින් පැවතුණි.

**ඉන්ධන දීමනා ලබා දීම**

උරුමය ඔප්පු බෙදාදීමේ ජාතික ව්‍යාපෘතිය සඳහා ඉන්ධන දීමනා සඳහා හිමිකම් නොමැති ජනපද නිලධාරීන්ට හා ඉඩම් නිලධාරීන් වෙත මාසිකව රු.2,000 බැගින් 2024 අප්‍රේල් 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා මාස 09 ක කාලයක් වෙනුවෙන් 2024 ඔක්තෝබර් 16 දින රු.මිලියන 1.19 ක මුදලක් ගෙවීම කර තිබුණි.

**බදු මුදල් අහිමි වීම**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2022 නොවැම්බර් 10 දිනැති අංක 4/10/ පොදු / බදු සහන (L2 ) ලිපිය මගින් බදු පදනමින් ලබාදුන් බදුගොණු 08 ක් සම්බන්ධයෙන් බදු අය කල යුතු ආකාරය දන්වා තිබීම නිසා රජයට රු.මිලියන 70.52 ක බදු මුදලක් අහිමි වී තිබුණි.

## මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මැනුම් කාල ප්‍රමාදයන්**

දෙපාර්තමේන්තුව වෙත 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මැනුම් වර්ග 09 ක් යටතේ ලැබී ඇති මුලු මැනුම් ඉල්ලීම් සංඛ්‍යාව 139,668 ක් වුවත් 2024 දෙසැම්බර් 31 දිනට නිම කළ සංඛ්‍යාව 106,173 ක් විය. ඒ අනුව එදිනට නිම නොකළ සංඛ්‍යාව 33,495 ක් හෙවත් සියයට 24 ක් විය. එම සම්පූර්ණ නොකළ මැනුම් ඉල්ලීම් පිළිබඳ කාල ප්‍රමාදයන් පහත පරිදි විය.

**වගු අංකය 2.28 - මැනුම් ඉල්ලීම් නිම නොකළ මැනුම්**

| මැනුම් ඉල්ලීම් ලැබුණු වර්ෂය | නිම නොකළ මැනුම් ඉල්ලීම් සංඛ්‍යාව | ප්‍රමාද කාලය වර්ෂ |
|---|---|---|
| 2020 හා ඊට පෙර | 9,708 | 04 ට වැඩි |
| 2021 | 4,133 | 03 ට වැඩි |
| 2022 | 4,995 | 02 ට වැඩි |
| 2023 | 6,132 | 01 ට වැඩි |
| 2024 | 8,527 | 01 ට අඩු |
| එකතුව | 33,495 | |

**මූලාශ්‍රය - මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ**

**දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය**

දියතලාව මැනුම් සහ සිතියම්ගත කිරීමේ ආයතනයේදී මැනුම් සහ සිතියම්කරණය පිළිබඳව විවිධ පාඨමාලා පැවැත්වීම සඳහා පිහිටුවා ඇති මෙම ආයතනය විවිධ ගොඩනැගිලි අංග 121 කින් සමන්විත අක්කර 61 ක භූමිභාගයක් තුළ ඉතා විශාල භෞතික සම්පත් සහිතව පිහිටා ඇතත් 2022 සිට 2026 දක්වා වර්ෂ 4 ක පාඨමාලාව සඳහා සිසුන් 22 කින් සමන්විත එක් කුඩා උපාධි කණ්ඩායමක් පමණක් අධ්‍යන කටයුතුවල නිරතව සිටිති. ආධුනික මිනින්දෝරුවරුන් බඳවා ගැනීම් නොමැති අවස්ථාවක උපාධි පාඨමාලාව සඳහාද සිසුන් නොමැති තත්වයක් ද නිරීක්ෂණය විය.

## ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

**ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සැකසීම**

ශ්‍රී ලංකාවේ භූමි සම්පත් ප්‍රශස්ත හා තිරසාර ලෙස කළමනාකරණය කිරීම සඳහා ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනයට 2018 අගෝස්තු මාසයේදී අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව ප්‍රධාන කාර්යයක් වන ශ්‍රී ලංකාව සඳහා ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සකස්කිරීම සහ කාලීන අවශ්‍යතාවයන් අනුව එය සංශෝධනය කිරීමට සකස් කළ අවසන් කෙටුම්පත ඉඩම් හා සංචාරක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සැකසීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

## ඉඩම් මැනුම් සභාව

**පැමිණිලි විභාග කිරීම**

මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විෂමාචාර පිළිබඳව මහජනතාව විසින් සභාව වෙත ඉදිරිපත් කෙරෙන පැමිණිලි විභාග කිරීම කළ යුතු වුවද 2024 වර්ෂයට පෙර ලැබී තිබුණු පැමිණිලි 149 හා 2024 වර්ෂයේදී ලැබී තිබුණු පැමිණිලි 56 ද ඇතුළුව 205 ක් වූ පැමිණිලි අතුරින් පැමිණිලි 163 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විසඳා නොතිබුණි.

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

**ගෙවිය යුතු වන්දි**

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ප්‍රකාරව වතු සමාගම් වලින් හා පුද්ගලයින්ගෙන් පවරාගත් ඉඩම් වෙනුවෙන් ගෙවිය යුතු වන්දි මුදල 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 215.48 ක් වූ අතර ඒ සඳහා ඉදිරිපත් කල උපලේඛන දෙකෙහි (අදියර I හා II) වන්දි ගෙවීම් සම්බන්ධයෙන් පිළිගත හැකි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ශේෂයේ නිරවද්‍යතාව තහවුරු කර ගත නොහැකි විය.

**සේවකයින්ට ඉඩම් ලබා දීම**

1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 44 (ඕ) වගන්තියට පටහැනිව කොමිෂන් සභාව විසින් සේවයෙහි යොදවා ගෙන සිටින තැනැත්තන් සඳහා අර්ථ සාධක අරමුදලක් පිහිටුවීම හා සුභසාධන හා විනෝද ක්‍රීඩා පහසුකම් සහ නිවාස හා නේවාසිකාගාර හා වෙනත් ඉඩකඩ සැපයීම සිදුකල යුතුය යන්න පදනම්ව කොමිෂන් සභාවේ

වසර 5ක අඛණ්ඩ සේවයක් හිමි සේවකයෙකු හට පර්ිවස් එකක් රු.1,000 ක වටිනාකමට පර්වස් 20 බැගින් ලබා දීමට අදාළව විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නිලධාරින් 395 ක් වෙත ඉඩම් අක්කර 49 පර්වස් 35.64 ක් ලබා දී තිබුණි. ඉදිරියේදී ඉඩම් ලබා දීමේ අරමුණින් කොමිෂන් සභාවේ සේවකයින් 120 දෙනෙකුගෙන් රු.10,000 බැගින් රු.1,200,000 ක් වටිනා අත්තිකාරම් මුදලක් ද ලබාගෙන තිබුණි.

**අවිධිමත් බඳවා ගැනීම**

2018 ජුනි 27 දිනැති අංක අමප/18/1126/829/002 දරන කැබිනට් තීරණය මගින් බඳවා ගත් නිලධාරීන් 16 දෙනෙකු වෙත බඳවා ගැනීමට අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබිය දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් තොරව ස්ථිර පත්වීම් ලබාදී පර්වස් එකක් රු.1,000 ක වටිනාකමට පර්වස් 20 බැගින් ඉඩම් ද ලබාදී තිබුණි.තව ද ඉන් එක් අයෙකු 2025 පෙබරවාරි මස කොමිෂන් සභාවේ සේවය අතහැර ගොස් තිබුණි.

**ඔප්පු ප්‍රදානෝත්සව පැවැත්වීම**

උරුමය ඔප්පු ප්‍රදානෝත්සවයට සමගාමීව 'සැමට හිමි බිමක්' ඔප්පු ප්‍රධානෝත්සවය 2024 මාර්තු 30 දින මහනුවර බෝගම්බර ක්‍රීඩාංගනයේදී පවත්වා එහිදි ඔප්පු 2,700 ක් පමණ බෙදා දී තිබූ අතර ඒ සඳහා රු, මිලියන 10.10ක වියදමක් දරා තිබුණි.

# වාරිමාර්ග



## වාරිමාර්ග අමාත්‍යාංශය

පෙර පැවති වාරිමාර්ග අමාත්‍යාංශය වර්තමානය වන විට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයෙහි වාරිමාර්ග අංශය ලෙස වාරි ජලය සැපයීම තුළින් රටේ කෘෂිකාර්මික සංවර්ධනයට දායකවෙමින් ගොවි ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීමත්, ඉන් ඔබ්බට යමින් පානීය, කාර්මික හා විදුලි උත්පාදනය යන බහුවිධ අරමුණු ඔස්සේ ජලසම්පත් සංවර්ධනය හා කළමනාකරණය පිණිස සුවිශේෂී වූ කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

එවකට පැවති වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තුවක්, ව්‍යවස්ථාපිත මණ්ඩල 02 ක් රාජ්‍ය සමාගම් 02 ක් හා ප්‍රධාන ව්‍යාපෘති 09 ක් ක්‍රියාත්මකව පැවතුණි.

2024 වර්ෂයේදී වාරිමාර්ග අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුව වෙත එකතුව රු.මිලියන 88,857ක ශුද්ධ ප්‍රතිපාදනයක් පාර්ලිමේන්තුව විසින් ලබාදී තිබුණු අතර 2024 වර්ෂය අවසාන වන විට එයින් රු.මිලියන 62,193ක් පමණක් උපයෝජනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

වගු අංකය 2.29 - වාරිමාර්ග අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව වෙත 2024 වර්ෂය සඳහා ලබාදී තිබූ ප්‍රතිපාදන හා ප්‍රතිපාදන උපයෝජනය

| | වාරිමාර්ග අමාත්‍යාංශය රු. මිලියන | වාරිමාර්ග දෙපාර්තමේන්තුව රු. මිලියන | එකතුව රු. මිලියන |
|---|---|---|---|
| **ශුද්ධ ප්‍රතිපාදන** | 60,760 | 28,097 | 88,857 |
| **වියදම** | 44,782 | 17,411 | 62,193 |
| **ඉතිරිය** | 15,978 | 10,686 | 26,664 |

**මූලාශ්‍රය - 2024 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන**

## විගණන නිරීක්ෂණ

**මොරගහකන්ද ජලවිදුලි බලාගාරයේ උත්පාදිත විදුලිය වෙනුවෙන් අයකිරීම්**

අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව මොරගහකන්ද ජල විදුලි බලාගාර ව්‍යාපෘතියට අදාළව ජල විදුලිය විකිණීම වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ආදායම රු.මිලියන 447.32 ක් වූ අතර ඉන් රු.මිලියන 434.41ක් ප්‍රවර්තන වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වාද, රු.මිලියන 12.91ක් 2023, 2022 හා 2021 වර්ෂයන්ට අදාලව හිඟව හිට පැවතුණි. මාසිකව ලැබිය යුතු ආදායම් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදී, අනතුරුව ලැබීම්

ප්‍රමාදය සඳහා පොළී මුදලක් ද අයකල හැකි වන පරිදි ගිවිසුම්ගතව නොතිබීම මෙම අයවීම් ප්‍රමාදය සඳහා බලපා තිබුණි.

**ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතියේ වැඩ නවතා දැමීම**

ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය ඉදිකිරීම ඇ.එ.ජ.ඩො.මිලියන 690කට චීන ඉදිකිරීම් සමාගමක් වෙත ප්‍රදානය කර කොන්ත්‍රාත් ගිවිසුම දෙපාර්ශවය විසින් 2014 නොවැම්බර් 05 දින අත්සන් කර තිබුණි. ව්‍යාපෘතිය 2014 වර්ෂයේ ආරම්භ කර 2017 වර්ෂයේ නිම කිරීමට සැලසුම් කර තිබුණු අතර, වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 5ක් වූ ඇ.එ.ජ.ඩො.මි 34.5කට සමාන රු.මිලියන 4,011.04ක් කොන්ත්‍රාත්කරු වෙත 2015 ජනවාරි 07 දින වන විට ගෙවා තිබුණි. එසේ වුවද මෙම ව්‍යාපෘතිය හේතුවෙන් ඇතිවිය හැකි පාරිසරික බලපෑම් පිළිබඳව පවතින අවිනිශ්චිතතාව මත විධිමත් විමර්ෂණයක් කිරීමට ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව විසින් නියම කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය 2015 වර්ෂයේ සිට නවතා තිබුණි.

එසේ පාරිසර බලපෑම ඇගයීමේ වාර්තාවක් ලබා ගැනීම සඳහා මහවැලි උපදේශන කාර්යාංශය සමග 2017 අප්‍රේල් සේවා ගිවිසුමකට එළඹ තිබුණි. එහි සංශෝධිත වටිනාකම රු.මිලියන 38.85ක් වූ අතර, එයින් රු.මිලියන 16.5ක් ගෙවා තිබුණි. එම වාර්තාව 2024 අගෝස්තු 27 දින ලබා දී තිබුණ ද, 2025 අප්‍රේල් 30 දින වන විටද මේ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලැබී නොතිබුණි.

මේ අනුව 2023 දෙසැම්බර් 31 දින දක්වා ඉහත වියදම් ද ඇතුළුව රු.මිලියන 4,091.21ක් රජය විසින් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කර තිබුණ ද මෙතෙක් ආර්ථිකයට ඉන් කිසිදු ප්‍රතිලාභයක් අත් වී නොතිබුණි. මේ සඳහා ප්‍රධාන වශයෙන් ව්‍යපෘතිය ආරම්භ කිරීමට පෙර ව්‍යපෘතිය ඇගයීමට ලක් නොකිරීම (project Appraisal) හා පාරිසරික බලපෑම් ඇගයීම් සිදු කර, විධිමත් පූර්ව අනුමැතීන් ලබා නොගෙන කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹීම වැනි ප්‍රධාන ව්‍යාපෘති කළමනාකරණ අඩුපාඩු බලපා තිබුණි.

**මාදුරු ඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය**

මාදුරු ඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය 2012 වර්ෂයේ සිට වර්ෂ 11 ක් තුළ ක්‍රියාත්මක කිරීමට 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා එකතුව රු.මිලියන 14,500ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද, ව්‍යාපෘති

කටයුතු ආරම්භ කිරීම 2021 දක්වා වසර 10 ක කාලයක් ප්‍රමාද වී තිබුණි. පසුව 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු.මිලියන 1,689ක් වෙන්කර තිබුණු අතර, 2023 වර්ෂය දක්වා ඉන් වැයකර තිබුණු මුදල රු.මිලියන 906.34ක් විය. මෙම සංවර්ධන ව්‍යාපෘතිය තුළින් කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර 14,000ක් වගා කළ හැකි වීමත්, මෙම වකවානුව තුළ ක්‍රියාත්මක අනෙකුත් ව්‍යාපෘතීන් හා සාපේක්ෂව වැඩිම ප්‍රතිලාභයක් අත්වන හා පරිසරයට වන හානිය අවම මට්ටමක පැවති නමුත් මෙම ව්‍යාපෘතිය සඳහා වැඩි ප්‍රමුඛතාවයක් දක්වා නොතිබුණි.

**උමා ඔය හැරවීමේ ව්‍යාපෘතිය**

උමා ඔය හැරවීමේ ව්‍යාපෘතිය 2015 වර්ෂයේ ආරම්භ කර 2024 වර්ෂයේ අප්‍රේල් වන විට මූලස්ථායි ඉදිකිරීම් නිමකර වාරිමාර්ග අමාත්‍යාංශය වෙත භාරදී තිබුණි. මෙහි ඉහළ නිම්නයේ ඉදිකිරීම්වලට අදාළව හාලි ඇල, වැලිමඩ හා ඌව පරනගම බල ප්‍රදේශවල ගොවිබිම් අහිමි වූ පවුල් 279 දෙනෙකු සඳහා පහළ නිම්නයේ වැල්ලවාය හා හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවලින් ගොඩ සහ මඩ ඉඩම් ලබාදීමට කටයුතු කළ ද, එසේ හඳුනාගෙන තිබූ ඉඩම්වල අනවසර පදිංචිකරුවන් විසින් අල්ලා ගැනීම, දැඩි වනගහනය, වන අලි තර්ජන, පදිංචි ස්ථානයේ සිට අධික දුරක් පැවතීම, පාරිසරික හා සමාජ විෂමතාවයන්ට හැඩ ගැසීම් වැනි දුෂ්කරතා මත එම ඉඩම් ලබා ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණු අතර, එම ගැටලුව මේ දක්වාම විසඳී නොතිබුණි. තවද මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන උමගෙහි ඇති වූ ජල කාන්දුව සඳහා කොන්ත්‍රාත්කරු විසින් වින්දිත පාර්ශව වෙත ගෙවිය යුතු වන්දි වෙනුවෙන් රජය විසින් ගෙවා තිබුණු රු.මිලියන 1,127.59ක් කොන්ත්‍රාත්කාර ඉරාන සමාගමෙන් අය විය යුතු වුවත් එම මුදල 2025 අප්‍රේල් 30 දින දක්වා අය කරගෙන නොතිබුණි.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**දැදුරු ඔය විදුලිබල ව්‍යාපෘතියෙන් උත්පාදිත විදුලිය වෙනුවෙන් අයකිරීම්**

දැදුරු ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් විදුලිබල මණ්ඩලයේ පූර්ණ අයිතිය ඇති උප සමාගමක් සමග 2017 ඔක්තෝබර් 13 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණු අතර

උක්ත අවබෝධතා ගිවිසුමේ 7.1 වගන්තියට අනුව උප සමාගම විසින් මාසිකව උත්පාදනය කරනු ලබන විදුලිය, විදුලිබල මණ්ඩලයට විකිණීමෙන් ලැබෙන ආදායමෙන් සියයට 15ක් පුරස්කාර ගෙවීම් ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ගෙවීමට එකඟ වී තිබුණි. ඒ අනුව 2021 ජනවාරි සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ අයවිය යුතු මුදල රු.මිලියන 54.19ක් වී තිබූ නමුත් එම සමාගම 2024 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 7.09ක් පමණක් ගෙවා තිබුණි. ඒ අනුව 2024 දෙසැම්බර් 31 දිනට උප සමාගමෙන් අයවිය යුතු හිඟ මුදල රු.මිලියන 47.10ක් විය.

**උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය**

ජල විදුලි බල නිෂ්පාදනයෙන් පසු උමා ඔය සිට කිරිඳි ඔය ද්‍රෝණියට වාර්ෂිකව හරවා එවනු ලබන ඝන මීටර් මිලියන 145ක පමණ ජල ස්කන්ධය උපයෝගී කරගෙන කිරිඳි ඔය ද්‍රෝණියේ පවතින උග්‍ර ජල අවශ්‍යතාවය සඳහා යොදා ගැනීම උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වූ අතර, මෙහි ඉදිකිරීම් 2013 වර්ෂයේදී ආරම්භ කර 2022 වර්ෂය වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව 2024 දෙසැම්බර් 31 දක්වා කාලය දීර්ඝ කරගෙන තිබුණු අතර, මෙම ව්‍යාපෘතියට අවුරුදු 12කට අධික කාලයක් ගත කර තිබුණි.

කාර්යසාධන වාර්තාවට අනුව ව්‍යාපෘතියේ අනුමත ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 17,914.20න් 2024 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 17,689.01ක මුදලක් වැය කර සියයට 97.44ක භෞතික ප්‍රගතියක් ලබා කර ගෙන තිබූ බවට සඳහන් කර තිබුණද, 2024 දෙසැම්බර් 23 දින වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉතිරි වැඩ හා ඉදිකිරිමට අපේක්ෂිත නව වැඩ කාර්යයන්ද ඇතුළත් කර රු.මිලියන 22,017ක් දක්වා ඇස්තමේන්තු වටිනාකම සංශෝධනය කර, රු.මිලියන 4,147.38ක අමතර මුදලක් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කර තිබුණි. එහෙත් ඒ සඳහා 2025 අප්‍රේල් 30 දින දක්වා අනුමැතිය ලැබී නොතිබුණු අතර, මෙහි ඉදිකිරීම 2024 නොවැම්බර් අග සිට නවතා දමා තිබුණි. කිරිඳි ඔය ද්‍රෝණිය වෙතට ජලය හරවා එවීම සඳහා වූ මූලස්ථායි වැඩ හා ජල විදුලි බලාගාරයේ ඉදිකිරීම් 2024 අප්‍රේල් මස වනවිට නිමකර, සැලසුම් කළ ජලය ඝන මීටර මිලියන 145ක ප්‍රමාණය මෙම ද්‍රෝණිය වෙත මුදා හරිමින් පැවතිය ද, පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සැලසුම් කළ

නිර්මිතයන් ඊට සමගාමීව 2025 අප්‍රේල් මස වන තෙක් පූර්ණ ලෙස නිම නොවීම නිසා ව්‍යාපෘතියෙන් අපේක්ෂා කළ වගා ඉඩම් ඇතුළු අනෙකුත් ප්‍රතිලාභ කාලීනව ලගා කර ගැනීමට නොහැකි වී තිබුණි. ව්‍යාපෘතිය ආරම්භයට පෙර මෙම ප්‍රදේශයන්හි යල හා මහ දෙකන්නයේ වගා තීව්‍රතාව වූ අක්කර 18,232 ව්‍යාපෘතිය නිමවීමෙන් පසු අක්කර 48,132 දක්වා යල, මහ හා අතරමැදි කන්න වශයෙන් වැඩිකර ගැනීමට සැලසුම් කර තිබුණද, දැනට මෙහි වගාකරන මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 26,369ක් පමණක් වී තිබුණි.

පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අලි කොටආර හා හඳපානාගල ජලාශ ඉදිකිරීමේදී හා ඇල මාර්ග තැනීමේදී වැල්ලවාය ප්‍රදේශයෙන් අත්පත් කරගත් දේපළ වෙනුවෙන් 2025 ජනවාරි 31 දින වන විට ඉඩම් කට්ටි 119ක් සඳහා වන්දි ගෙවා නොතිබුණ අතර, එයින් ඉඩම් කට්ටි 70ක් සඳහා තක්සේරු වාර්තා ලබා ගැනීමට මේ දක්වා ක්‍රියාකර නොතිබුණි.

**පහළ මල්වතු ඔය සංවර්ධන ව්‍යාපෘතිය**

අනුරාධපුර දිස්ත්‍රික්කය සහ වවුනියා දිස්ත්‍රික්කය යාකරමින් තන්තිරිමලේ බෝගොඩ දී මල්වතු ඔය හරස් කර පහළ මල්වතු ඔය ජලාශය සෘජු ශ්‍රම පදනම මත ඉදිකිරිම 2016 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය වසර 08ක් තුළ එනම් 2024 නිම කිරිමට සැලසුම් කර තිබූ අතර 2025 දෙසැම්බර් 31 දක්වා කාල දිගුවක් ඉල්ලා තිබුණි. මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 22,900ක් විය. 2017 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු.මිලියන 4,275ක ප්‍රතිපාදන මේ සඳහා ලබා දී තිබුණද, අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට සමස්ථ මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 1817.44 ක් හා භෞතික ප්‍රගතිය සියයට 7.03ක් ව පැවතුණි.

**ඊරු වැව -මහකනදරාව පෝෂිත ඇල ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය රු.මිලියන 2,000 ඇස්තමේන්තුවක් යටතේ 2024 - 2026 කාලය තුළදී අනුරාධපුර ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය විසින් නිම කිරිමට සැලසුම් කර තිබුණි. 2024 වර්ෂය තුළ මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 1,000ක ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් රු.මිලියන 375.78 පමණක් වැය කර තිබුණු අතර, 2024

දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය සියයට 12.2ක් විය.

**යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය**

යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය රු.මිලියන 48,355.3ක ඇස්තමේන්තු වටිනාකමක් යටතේ 2012 වර්ෂයේ ආරම්භකර 2021 වර්ෂයේ අවසන් කිරීමට මුලිකව සැලසුම් කර තිබුණද එම කාලය 2024 දෙසැම්බර් 31 දක්වා දීර්ඝකර තිබුණු අතර, එදිනට රු.මිලියන 41,953ක් වැය කර තිබුණි.

හොරොව්පොතාන හා ගෝමරන්කඩවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවලට අයත් ගොඩ සහ මඩ නව ඉඩම් හෙක්ටයාර් 1515 කට වාරි පහසුකම් සපයා වගාවන්ට එක් කිරිමේ මුලික අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණද, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව නිදහස් කිරීමට එකඟවී තිබුණු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 865.45ක් විය. මෙම ඉඩම් ප්‍රමාණයෙන් 2025 මාර්තු 25 දින වන විට නව කුඹුරු ඉඩම් හෙක්ටයාර් 773.68ක් පමණක් වගාකිරිම සඳහා වාරි පහසුකම් සපයා තිබුණු අතර, හෙක්ටයාර 741.38ක් වගා කිරීම සඳහා ගොවින් වෙත ලබා දි නොතිබුණි. තවද ව්‍යාපෘතිය නිසා කුඹුරු ඉඩම් අහිමි වුවන් වෙනුවෙන් උපරිමය අක්කර 1.5 බැගින් ලබා දිමට සැලසුම් කර තිබුණද, ඒ සඳහා අවශ්‍ය කුඹුරු ඉඩම් හඳුනාගෙන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නිදහස් කරගෙන නොතිබීම හේතුවෙන් කුඹුරු ඉඩම් ලබා දිමට නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් කුඹුරු ඉඩම් වෙනුවට පවුල් ඒකක 540ක් සඳහා රු.මිලියන 1.8 බැගින් රු.මිලියන 972ක අතිරේක වන්දි මුදලක් 2025 මාර්තු 27 දින වන විට ගෙවා තිබුණි.

**ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

මහාපරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණය හා කඩිනම් කිරීමේ (RAMP) කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක PMO/DEV-11/01/01/MTG/SEP-02 හා 2022 ඔක්තෝබර් 07 දිනැතිව, වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් අමාත්‍ය ඒ ඒ ව්‍යාපෘති වෙනුවෙන් නිර්දේශ ඉදිරිපත් කර තිබුණි. එම නිර්දේශ හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තා පරික්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

**කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය**

කුඹුක්කන්ඔය ජලාශ ව්‍යාපෘතිය, රු.මිලියන 32,397.3ක ඇස්තමේන්තුවක් යටතේ 2015 වර්ෂයේ ආරම්භකර වසර 6 කින් නිමකිරීමට සැලසුම් කර තිබුණ ද, උක්ත ලිපියේ දැක්වෙන පරිදි "මෙම ව්‍යාපෘතිය විදේශ ණය ආධාර සහිත විශේෂ ඉල්ලීමක් නොමැති (Unsolicitted) යෝජනාවකින් ආරම්භ වූ ව්‍යාපෘතියක් වන බැවින් අදාළ අරමුදල් සම්පාදනය පිළිබඳව නිශ්චිත තීරණයක් භාණ්ඩාගාරයෙන් ලැබෙන තෙක් මෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් කිසිවක් ආරම්භ නොකිරීමට කටයුතු කිරීම" ලෙසට නිර්දේශ කර තිබුණි. එසේ වුවද ව්‍යාපෘතිය සඳහා අරමුදල් සම්පාදනය පිළිබඳව නිශ්චිත තීරණයක් භාණ්ඩාගාරයෙන් වර්තමානය දක්වා ලබාගෙන නොතිබුණි. ඒ හේතුවෙන් 2015 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වැය කළ රු.මිලියන 521.54 ක් නිෂ්කාර්යව පැවතුණි.

**කුඩාවිලච්චිය ජලාශය ප්‍රතිසංස්කරණය කිරීම**

රු.මිලියන 6,000ක ඇස්තමේන්තුවක් යටතේ මෙම ජලාශයේ ප්‍රතිසංස්කරණයන් 2021 වර්ෂයේ ආරම්භ කර 2023 වර්ෂයේ නිම කිරීමට සැලසුම් කර තිබුණි. මෙය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභයන් ලෙස, අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුද්ගලයන් 25,000කට පානීය ජලය සැපයීම, මහවිලච්චිය මහා වාරි යෝජනා ක්‍රමයේ බෝග තීව්‍රතාවය 1.57 සිට 2.0 දක්වා වැඩි කිරීම, අලි මිනිස් ගැටුම අවම කිරීම, පුරා විද්‍යා ස්ථාන තවදුරටත් විනාශ වීමෙන් ආරක්ෂා කිරීම, අනුරාධපුරයේ යෝජිත ඖෂධ කලාපය සඳහා ජලය සැපයීම, විල්පත්තු ජාතික වනෝද්‍යානයේ වන සතුන්ට අවශ්‍ය ජල පහසුකම් සැපයීම හා මෝදරගම් ආරු ගංගාවේ පාරිසරික තුලනය සඳහා ජල ගලනය සහතික කිරීම දක්වා තිබුණි. උක්ත ලිපිය අනුව නව කාර්මික ජනපද ඉදිකිරීම වෙනුවට දැනට පවත්නා කාර්මික ජනපද පමණක් ඉදිරියට ක්‍රියාත්මක කළ යුතු බවට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති බැවින් ඒ අනුව ඔයාමඩුව ඖෂධ නිෂ්පාදන කාර්මික ජනපදය ඉදිරි වර්ෂ දෙක තුළ ක්‍රියාත්මක වන බවට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් තහවුරුවක් ලබා ගැනීමටත්, එසේ නොවන්නේ නම් ව්‍යාපෘතිය නවතා දැමීමටත් කමිටුව නිර්දේශ කර තිබුණි. ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මේ සම්බන්ධයෙන් තහවුරුවක් ලබාගෙන නොතිබුණි. කුඩා විලච්චිය ජලාශය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ වලින් එක්

ප්‍රතිලාභයක් වූ “අනුරාධපුරයේ යෝජිත ඖෂධ කලාපය සඳහා ජලය සැපයීම” යන අරමුණ පමණක් සැලකිල්ලට ගෙන මුළු ව්‍යාපෘතියම නතර කිරීමට උක්ත කමිටුව විසින් තීරණය කර තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වැය කරන ලද රු.මිලියන 162.14ක පිරිවැය නිශ්කාර්යව පැවතිණි.

**මොනරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරි සංවර්ධන ව්‍යාපෘතිය**

රු.මිලියන 2,500ක ඇස්තමේන්තුවක් යටතේ 2016 වර්ෂයේ ආරම්භ කර 2024 වර්ෂයේ නිම කිරීමට අපේක්ෂිතව මොනරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරි සංවර්ධන ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. උක්ත ලිපියේ දැක්වෙන පරිදි මෙම ව්‍යාපෘතියට අයත් දෙටගමුව වැව ඇතුළු ක්‍රියාත්මක කෙරෙමින් පවතින ඌරාඋල වැව, පයිලේගම වැව හා මොරගොල්ල වැවෙහි මේ වන විට සිදු කරමින් පවතින ක්‍රියාකාරකම් පමණක් ප්‍රයෝජනයට ගත හැකි පරිදි තිරසාර ලෙස නිම කර ව්‍යාපෘතිය මෙම වර්ෂය තුළ අවසන් කිරීමට නිර්දේශ කර තිබුණි. නමුත් ඒ අනුව කටයුතු නොකර 2024 වර්ෂයේ සිට ඉදිකිරීම් අත්හැර දමා තිබුණි. ඒ හේතුවෙන් 2016 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කරන ලද රු.මිලියන 1,221.21ක් නිෂ්කාර්යව පැවතිණි.

**හිඹිලියාකඩ වත්තේගෙදර වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය කිරීම**

හිඹිලියාකඩ වත්තේගෙදර වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, රු.මිලියන 7,155ක ඇස්තමේන්තුවක් යටතේ 2020 වර්ෂයේ ආරම්භ කර 2024 වර්ෂයේ නිම කිරීමට සැලසුම් කර තිබුණි. උක්ත ලිපියේ දැක්වෙන පරිදි සොරොව්වේ හා වත්තේගෙදර වැව් බැම්මෙහි ඉදිකිරීම් අවසන් කොට ව්‍යාපෘතියෙහි අනෙකුත් ක්‍රියාකාරකම් තාවකාලිකව නවතාලීම ලෙස නිර්දේශ කර තිබුණද එම ඉදිකිරීම් නිම නොකර 2024 මාර්තු මස සිට ඉදිකිරීම් අත්හැර දමා තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා 2020 වර්ෂයේ සිට 2024 මාර්තු දක්වා වැය කරන ලද රු. මිලියන 664.40ක පිරිවැය නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

**මහගල්ගමුව පෝෂිත ඇළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

2011 සැප්තැම්බර් 11 දින ලද අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත මහා/මධ්‍යම පරිමාණ වාරිමාර්ග ව්‍යාපෘති

පිළිබඳ දස අවුරුදු සැලැස්ම 2014 වර්ෂයේ ආරම්භ කර තිබූ අතර, ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 500ක් වී තිබුණි. 2014 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු.මිලියන 374.95ක් වැය කර කිලෝ මීටර් 14ක් දිග ඇල මාර්ගයේ තැනින් තැන කැණීම් කර තිබූ නමුත්, ඇල මාර්ගයේ එක් කොටසක් හෝ නිසි පරිදි සකස් කර නොතිබුණි. 2024 වර්ෂයේ සිට මෙම ව්‍යාපෘතිය අත්හැර දැමීම නිසා ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද පිරිවැය ඵලදායි වියදමක් වී නොතිබුණි.

**අනවසර ඉදිකිරීම් හා වගාකිරීම්**

1946 අංක 32 දරන වාරිමාර්ග අඥා පනතේ 285 වැනි පරිච්ඡේදයේ 64 වැනි වගන්තිය අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඒ යටතේ පාලනය වන ප්‍රධාන හා මධ්‍ය පරිමාණ ජල යෝජනා ක්‍රම, ප්‍රධාන ගංගා ද්‍රෝණි, ජලපෝෂක හා රක්ෂිතයන්හි ආරක්ෂාව, අනවසර ඉදිකිරීම් හා වගා කටයුතු පාලනය, ජලය අපවිත්‍ර කිරීමෙන් වළක්වා ගැනීම, අනවසර ජල භාවිතා කිරීම් පාලනය කිරීම හා වාරිමාර්ග යෝජනා ක්‍රමයන්හි නඩත්තුව සම්බන්ධ විධිමත් නියාමනයක් සිදුකිරීමට අවශ්‍ය නිර්ණායක නිකුත්කර නොතිබුණි.

වාරිමාර්ග ආඥා පනතේ 65 වැනි වගන්තිය අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 31කට අයත් වැව් ජලාශ අමුණු ආශ්‍රිත අනවසර ඉදිකිරීම් හෝ අනවසර වගාකිරීම් 619 ක් හදුනාගෙන තිබූ නමුත් ඒ අනවසර කටයුතු සම්බන්ධයෙන් වාරිමාර්ග ආඥා පනත හෝ රජයේ ඉඩම් (සන්තකය ආපසු ගැනීමේ) පනත යටතේ පවතින ප්‍රතිපාදනයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි.

වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ 2014 දෙසැම්බර් 01 දිනැති අංක 08/2014 දරන චක්‍රලේඛයෙහි 1 හා 3 ඡේද ප්‍රකාරව දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන වැව් හා ජලාශවල රක්ෂිත ප්‍රදේශ සීමා හඳුනාගෙන එහි වපසරිය පිළිබඳ තොරතුරු පවත්වාගෙන යා යුතු විය. එහෙත් දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන වැව්, ජලාශ හා අමුණු සංඛ්‍යාව 387ක් වුවද 2021 වර්ෂයේ විගණනයට ලබා දුන් එම වැව්, ජලාශ හා අමුණු සංඛ්‍යාව 291ක් වූ අතර ඉන් 251ක රක්ෂිත සීමා පිළිබඳ විස්තර දක්වා නොතිබුණි. 2024 වසරට අදාළව වැව්, ජලාශ හා අමුණු පිළිබඳ රක්ෂිත සීමා ද ඇතුළත් තොරතුරු ඉල්ලුම්

කිරීමේදී මෙම රක්ෂිත සීමා පිළිබඳ විස්තර නොමැතිව තොරතුරු ඉදිරිපත්කර තිබුණි.

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

**උරුමය වැඩසටහන යටතේ පරම අයිතිය ලබාදීම**

මහවැලි කලාප 10 ආශ්‍රිතව "උරුමය වැඩසටහන" 2024 වර්ෂයේ ආරම්භ කර, පළමු හා දෙවන අදියර තුළ මහවැලි ජනපදිකයින් 204,002කට ඉඩම් ආඥා පනතේ 02 වගන්තිය යටතේ ඔප්පු බෙදාදීමට ඉලක්ක කර තිබුණි. මෙහිදී ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ මහවැලි ජනපදිකයින් සතුව පැවති ප්‍රදාන පත්‍ර හා අවසර පත්‍ර 69,774ක් ඉඩමෙහි පරම අයිතිය ලබාදීමේ අරමුණින් අධිකාරිය වෙත ආපසු භාරගෙන තිබුණි. 2024 දෙසැම්බර් 31 දින වන විට ඔප්පු 26,669ක් පමණක් ලියාපදිංචි කර නැවත ජනපදිකයින් වෙත බෙදාදී තිබුණි. එය සම්පූර්ණ ඉලක්කයෙන් සියයට 13.2ක් වූ අතර 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 38.8ක් මෙම වැඩසටහන සඳහා අධිකාරිය වැයකර තිබුණි.

එසේ වුවද, ඉඩම් සංවර්ධන ආඥා පනතේ මූලික අරමුණ වූයේ කෘෂිකාර්මික සහ නේවාසික කටයුතු සඳහා රාජ්‍ය භූමිය බෙදාදීම, භාවිතය සහ කළමනාකරණය කිරීමයි. මෙමගින් ඉඩමක් නොමැති පුද්ගලයන්හට නේවාසික සහ කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් ලබාදීමත්, එමගින් ඵලදායී ලෙස කෘෂිකාර්මික කටයුතු සඳහා රාජ්‍ය භූමිය භාවිතා කිරීම මගින් ආහාර සුරක්ෂිතතාවය ඇති කරමින් ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමත්, අඩු ආදායම්ලාභී ජනතාවට ප්‍රමුඛතාවය දීම මගින් තමන් වෙත සාධාරණය ඉටුකිරීමත්, කෘෂිකාර්මික භූමිය කුඩා කැබලිවලට බෙදීයාම වැළැක්වීම හා කෘෂිකාර්මික ඉඩම් කොටස් ආර්ථිකමය ඒකකයන් වශයෙන් පවත්වාගෙන යාම, භූමිය විකුණා දැමීම, කුලියට දීම හෝ ණය සඳහා ආවරණය කිරීම වැනි ගනුදෙනු සීමා කිරීමත්, එමගින් භූමි භාවිතය පිළිබඳව රාජ්‍ය පාලනය පවත්වාගෙන යාමත් තහවුරු කර තිබුණි. කෙසේ වෙතත් මෙම නව "උරුමය වැඩසටහන" යටතේ පරම අයිතිය ජනතාවට ලබාදීම තුළින් ඉහත අරමුණු කිසිවක් ඉටු කරගත නොහැකි වන බවට විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

**නව කොට්ඨාශ කාර්යාල පිහිටුවීම**

රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම උදෙසා වලව කලාපය තුළ නව කොට්ඨාශ කාර්යාල තුනක් ගොඩකවෙල, වැලිගෙපොල හා කොළොන්න යන බලප්‍රදේශ තුළ 2024 වර්ෂයේ ස්ථාපනය කර තිබුණි. මෙම කාර්යාල පිහිටුවීම සඳහා මූලිකව රු.මිලියන 4.02ක් වැයකර තිබූ අතර, ඊට අමතරව මාසිකව ගොඩනැගිලි කුලී වශයෙන් රු.මිලියන 0.1ක මුදලක්ද 2025 අප්‍රේල් මාසය දක්වා ගෙවා තිබුණි. මෙම කාර්යාල පිහිටි භූමිය තුළ ඉඩම් පරිපාලන කටයුතු හා වාරි පද්ධති නඩත්තු කිරීම මහවැලි අධිකාරිය විසින් සිදුනොකරන අතර, මෙම කාර්යාල තුන මඟින් ප්‍රධාන වශයෙන් සිදු කරනුයේ ද්‍රව්‍ය ආධාර බෙදාදීම පමණක් වී තිබුණි.

**එක් කොට්ඨාශ කාර්යාලයක් යටතේ පමණක් ආධාර ලබා දීම**

වලව කලාපය තුළ කොට්ඨාශ කාර්යාල 10ක් පැවතියද අඩු ආදායම්ලාභීන්ට ආධාර ලබාදීම යටතේ වැසිකිළි සාදා දීම සඳහා කලාපයට වෙන් කරන ලද රු.මිලියන 27.5ක සම්පූර්ණ මුදලම කොලොන්න කාර්යාලය වෙත ලබාදී තිබුණි. එමෙන්ම මෙම වැසිකිළි සාදා දීමේදී මීට පෙර භාවිතා කරන ලද ක්‍රමවේදයන් අනුව ප්‍රතිලාභියා හට එම ආධාර මුදල් ලබා නොදී, ගොවි සංවිධාන වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම හේතුවෙන් එක් වැසිකිළියක් සඳහා රු.මිලියන 0.12ක මුදලක් වැඩිපුර ලබාදී තිබුණි. තවද මේ සඳහා ප්‍රතිලාභීන් තෝරා ගත් ආකාරය විගණනයට ඉදිරිපත් නොවූ අතර, විගණනය විසින් සිදුකළ නියැදි පරීක්ෂාවේදී එයින් අඩු ආදායම්ලාභීන් නොවන පුද්ගලයින්ටද ආධාර ලබාදී තිබූ බව නිරීක්ෂණය විය.

**සුළු හා මධ්‍ය පරිමාණ ණය**

අධිකාරිය ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හරහා ඒකාබද්ධව මහවැලි කලාපවල ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය මූලික පහසුකම් සලසා දෙමින් කෘෂිකාර්මික, සත්ත්ව පාලන, අගය එකතු කළ හා වෙනත් කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන දේශීය විදේශීය වෙළෙඳ පොළට එක් කිරීම තුළින් මහවැලි ජනපදිකයින්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම අරමුණු කරගෙන ක්‍රියාත්මක කර තිබූ සුළු හා මධ්‍ය පරිමාණ ණය යෝජනා ක්‍රම 3 න් මහවැලි සවිය හා මහවැලි සුරකුම් ණය යෝජනා ක්‍රම යටතේ ණය දීම සඳහා 2006, 2010, 2017 වර්ෂවල ලබාදුන් රු.මිලියන 151.94ක මුදලින් 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට

රු.මිලියන 131.1ක් ණය ලෙස ලබාදී තිබුණි. මෙම මහවැලි සවිය හා මහවැලි සුරකුම් ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලෙස ලබා දුන් මෙම මුදල සඳහා බැංකුව අයකර ගන්නා පොළියෙන් කිසිදු මුදලක් අධිකාරිය වෙත ලබා දී නොතිබුණි.

**පාරිසරික ඇගයීම් වාර්තා සකස් කිරීම**

මහවැලි බී කලාපයට අයත් කන්දකාඩු ප්‍රදේශයේ අක්කර 3,770ක භූමි ප්‍රදේශයක කෘෂිකර්ම හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තා සකස් කිරීමේ කොන්ත්‍රාත්තුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට රු.මිලියන 6.54කට 2021 සැප්තැම්බර් 28 දින ප්‍රදානය කර, එයින් රු.මිලියන 3.21ක් ගෙවා තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව මෙම ඉඩමේ හිමිකම ජාතික පශු සම්පත් මණ්ඩලය වෙත පැවරීම හේතුවෙන් කොටසක් පමණක් නිමකර තිබූ මෙම පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව පැවරිය යුත්තේ කුමන ආයතනය වෙතද හා මීට අදාළ ඉදිරි ගෙවීම් කුමන ආයතනයකින් දැරිය යුතුද යන්න පිළිබඳ නිශ්චිත එකඟතාවයකට එළඹීමට අපොහොසත් වීම මත අදාළ පාරිසරික ඇගයීම් වාර්තාව අවසන් කර නොතිබුණි. නිසි සැලසුමකින් තොරව මෙසේ වැය කරන ලද රු.මිලියන 3.21ක මුදල වර්තමානය වනවිට නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

**කෘෂිබෝග නිශ්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

මහවැලි බී කලාපයේ කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන යටතේ කෘෂි භෝග නිෂ්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අක්කර 540ක පමණ භූමි ප්‍රමාණයක් මුතුවැල්ල වැලිකන්ද ප්‍රදේශයෙන් ලබා දීමට 2020 වර්ෂයේ සැලසුම් කර තිබුණි. මෙම ආයෝජන ව්‍යාපෘතිවල පාරිසරික බලපෑම් ඇගයීම සඳහා කොළඹ විශ්ව විද්‍යාලය වෙත රු.මිලියන 2.62ක් 2021 හා 2022 වර්ෂවලදී ගෙවා තිබුණද, සැලසුම් කළ වර්ෂයේ සිට වර්ෂ 05කට අධික කාලයක් ගතවී තිබුණද, කිසිදු ආයෝජන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**මත්ස්‍ය ඇඟිල්ලන් නිශ්පාදන ව්‍යාපෘතිය**

මහවැලි අධිකාරියේ බලප්‍රදේශයේ ජලාශවලට අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් මහවැලි කලාප ආශ්‍රිතව නිෂ්පාදනය කරගැනීමට වැඩසටහනක් 2021 වර්ෂය තුළ ආරම්භ කර තිබුණි. ඒ අනුව සී, එච්, හුරුළුවැව සහ වලව යන කලාපවල පොකුණු පද්ධති ඉදිකිරීමට සැලසුම් කර තිබූ නමුත්, 2025 මැයි 20 වන විට එච් කලාපයේ

පමණක් පොකුණු ඉදිකිරීමේ කටයුතු අවසන් කර තිබුණි. අනෙකුත් කලාප සඳහා රු.මිලියන 2.04ක් වැය කර තිබුණද, පොකුණු ඉදිකිරීමේ කටයුතු සැලසුම් කළ පරිදි නිමකර නොතිබුණු බැවින් එම මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

**දේපළ බදු දීම්**

දිගන නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය යටතේ ආයෝජන ව්‍යාපෘතියක් ලෙස බැහැර කර ඇති දොරගල තේ කර්මාන්තශාලාව හා ඉඩම 1992 වර්ෂයේ සිට පුද්ගලික සමාගමක් වෙත බදු පදනම යටතේ ලබා දී තිබුණි. මෙම දේපල දීර්ඝකාලීන බදු පදනම යටතේ බදුදීමට 2012 වර්ෂයේ අනුමැතිය ලබාදී තිබුණද, බදු ගිවිසුමකට එළඹුණු බවට සාක්ෂි ලිපිගොනුවේ නොතිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට මෙම දේපල සඳහා රු.මිලියන 0.81ක බදු හිඟයක් පැවතිය ද, 2024 දෙසැම්බර් 18 දින විගණනය විසින් සිදු කරන ලද වාරක පරීක්ෂාවේදී අදාළ කර්මාන්තශාලාව යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සමඟ වසා දමා තිබුණි.

**කොත්මලේ ඌණගල්ඔය වතු බංගලාව**

කොත්මලේ ඌණගල්ඔය වතු බංගලාව පරිසර හිතකාමී නිවාඩු නිකේතනයක් ලෙස පවත්වා ගෙන යාමට 2017 අගෝස්තු 16 දින සිට පුද්ගලයෙකුට බැහැර කර තිබුණි. නැවත මෙම දේපල 2023 අගෝස්තු මාසයේ අළුත්වැඩියා කර පවත්වාගෙන යාම සඳහා පුද්ගලික සමාගමකට පවරා දී තිබූ අතර, 2024 දෙසැම්බර් මස 18 දින විගණනය විසින් සිදුකළ වාරක පරීක්ෂාවේදී බංගලාවේ ගේට්ටුව වසා අඟුලු ලා තිබුණි. අළුත්වැඩියා කටයුත්තක් සිදු කර ඇති බව බාහිරින් නිරීක්ෂණය නොවීය.

**අත්පත් කරගත් ඉඩමක් ආපසු පැවරීම**

කොත්මලේ ව්‍යාපෘතිය සඳහා ජනාවාස ඇති කිරීමේ අරමුණ ඇතිව කොටගල පිහිටි හැරින්ටන් වතුයායේ වාරින් ක්‍රොස් ඉඩමෙන් අක්කර 48.35ක ඉඩමක් රු.මිලියන 4.76ක් ගෙවා 1985 අගෝස්තු 20 දින අධිකාරිය විසින් අත්පත් කර ගෙන තිබුණි. නමුත් අරමුණෙන් බැහැරව 1994 පෙබරවාරි 04 දින මෙම ඉඩම් කොටසෙන් අක්කර 25.47ක් ලංකා වතු කම්කරු කොංග්‍රස් කාර්මික ආයතනයක් වෙත ලබාදී තිබුණි. කෙසේ වුවද 2025 මැයි 20 දින වන විට එම ඉඩම අසංවර්ධිත තත්ත්වයේ පැවති අතර, එහි ජනාවාස ඇති කිරීමක් හෝ වගාවක් හෝ ස්ථාපිත කිරීමක් සිදුකර නොතිබුණි.

**අධි තාක්ෂණික හරිතාගාර ස්ථාපිත කිරීම සඳහා වන නියමු ව්‍යාපෘතිය**

මහවැලි කලාප තුළ දේශගුණික අවබලපෑම් අවම කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත අධි තාක්ෂණික හරිතාගාර ස්ථාපිත කිරීම සඳහා වන නියමු ව්‍යාපෘතියට 2019 වර්ෂයේදී පුද්ගලික සමාගමක් වෙත කොත්මලේ පැරණි කොට්ඨාශ කාර්යාල පරිශ්‍රයේ ඇති හෙක්ටයාර 0.3035ක භූමියක් ලබාදී තිබුණි. මෙම ව්‍යාපෘතිය මඟින් මහවැලි කලාපවල (වික්ටෝරියා හා එච් කලාපයේ) මහවැලි නිලධාරීන් හා ගොවීන් 100 දෙනෙකු සඳහා තාක්ෂණික පුහුණුව ලබා දීමටත්, රැකියා අවස්ථා ලබා දීමටත් එකඟවී තිබුණි. එසේ වුවද, 2019 වර්ෂයේ සිට මෙම සමාගම විසින් භුක්ති විඳින මෙම ඉඩම් කොටස සඳහා එදින සිට මේ දක්වා කිසිදු බදු මුදලක් අයකර නොතිබුණු අතර, මිනින්දෝරු සැලැස්මක් සකසා විධිමත් ලෙස බැහැර කර නොතිබුණි. 2024 දෙසැම්බර් 18 දින සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී මෙහි හරිතාගාර දෙකක් ඉදිකොට වගාවක් පවත්වාගෙන යන බව නිරීක්ෂණය වූ අතර, එකඟ වූ පරිදි මහවැලි නිලධාරීන් හා ගොවීන් වෙනුවෙන් පුහුණු කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි.

# බලශක්ති අංශය

## බලශක්ති අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ බලශක්ති කේන්ද්‍රය බවට පත් කිරීමේ දැක්මෙන් හා ජාතික අවශ්‍යතා සපිරෙන පරිදි, අඩු වියදම් බලශක්තිය සඳහා ප්‍රවේශය වැඩි කරමින් ඉන්ධන ආනයනය කළමනාකරණය හා දේශීයව නව බලශක්ති ප්‍රභවයන් බලශක්ති මිශ්‍රණයට එකතු කිරීම සහ නියමිත නීති සහ අණ පනත්වලට අනුකූලව බලශක්ති විෂයයට අදාල ප්‍රතිපත්ති සම්පාදනය හා නියාමනය මඟින් පරිසර හිතකාමී තිරසර බලශක්ති සැපයුමක් තහවුරු කිරීම මෙහෙවර කර ගනිමින් බලශක්ති අමාත්‍යාංශය ක්‍රියාත්මක වේ.

## විගණන නිරීක්ෂණ

**ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම**

2019 වර්ෂයේ දී ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපායමාර්ගවලට අනුව බලශක්ති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා කාර්තුමය පරාසයන් තුළ රැස්විය යුතු ජාතික මෙහෙයුම් කමිටුව, 2024 වර්ෂය තුළ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණු අතර සෑම වසර දෙකකට වරක්ම කාර්යසාධන කාලරාමුව සංශෝධනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වුවත් 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වසර 05ක් ගතව ඇතත් අදාළ කාර්යසාධන කාලරාමුව අවශ්‍ය පරිදි සංශෝධනය කර නොතිබුණි.

එසේම සුළං සහ සූර්ය බලශක්තිය වැනි විචල්‍ය පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන්ගෙන් ජනනය කරන විදුලිය විදුලිබල පද්ධතියට අවශෝෂණය කිරීමේදී ඇතිවන තාක්ෂණික ගැටළු විසඳා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ අධ්‍යයනයන් සිදුකර නොතිබුණු අතරම පොදු ස්ථාන ආලෝකකරණය ද ඇතුළුව ග්‍රාමීය, නාගරික සහ ප්‍රධාන මාර්ග ආලෝකකරණය සඳහා ආලෝකකරණ ප්‍රමිත 2020 වර්ෂය තුළ අමාත්‍යාංශය විසින් හඳුන්වා දී අනිවාර්යය පදනමින් ක්‍රියාවට නැංවීමට නියමිතව තිබුණ ද, අදාල ප්‍රමිත මේ දක්වා ප්‍රකාශයට පත්කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**ආදායම**

2023 අප්‍රේල් 25 දිනැති අමප/23/0632/621/031 අංක දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලිහිසිතෙල් කර්මාන්තයේ නියැලෙන ආයතනයන්ගෙන් වාර්ෂික ස්ථාවර ලියාපදිංචි ගාස්තුව වශයෙන් රු.මිලියන 6ක මුදලක්ද, ඊට අමතරව වාර්ෂික විකුණුම් පරිමාව පාදක

කරගනිමින් එම වට්නාකමින් සියයට 0.9ක මුදලින්, වාර්ෂික ස්ථාවර ලියාපදිංචි ගාස්තුව අඩුකොට ඉතිරි මුදල විචලා ලියාපදිංචි ගාස්තුව ලෙස අයකළ යුතුය. අමාත්‍යාංශය විසින් 2023 හා 2024 වර්ෂ සඳහා විචලා ලියාපදිංචි ගාස්තු නිවැරදිව ගණනය කර අයකර ගැනීමට හෝ හිඟ විචලා ලියාපදිංචි ආදායම, හිඟ ආදායම් ප්‍රකාශයට හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් 2023 වර්ෂයට අදාලව ප්‍රසිද්ධ කරන ලද ලිහිසිතෙල් වෙළඳපොළ තොරතුරු පදනම් කරගනිමින් 2023 හා 2024 වර්ෂ සඳහා විගණනය විසින් ගණනය කරන ලද අයකරගත යුතු හිඟ ලිහිසි තෙල් විචලා ලියාපදිංචි ගාස්තු ආදායම රු. මිලියන 231ක් විය.

**මන්නාරම් ද්‍රෝණියේ ඛණිජතෙල් ගවේෂණ කටයුතු**

මන්නාරම් ද්‍රෝණියේ එම් - 2(M-2) ගවේෂණ බිම් කොටසේ (SL 2007-01-001) ඛනිජතෙල් ගවේෂණ කටයුතු සඳහා පෞද්ගලික සමාගමක් 2007 වර්ෂයේදී තෝරාගෙන තිබූ අතර 2011 වර්ෂයේදී එම සමාගම විසින් ස්වාභාවික වායු නිධි දෙකක් සොයාගෙන තිබුණි. මන්නාරම් ද්‍රෝණියේ එම් - 2(M-2) ගවේෂණ බිම් කොටසෙන් සොයාගත් ස්වාභාවික වායු නිධි සංවර්ධනය හා නිෂ්පාදන කටයුතු සඳහා සුදුසු ආයෝජකයෙකු අන්තර්ජාතික තරඟකාරී යෝජනා කැඳවීමේ ක්‍රියාවලියක් මඟින් තෝරා ගැනීමට අවශ්‍ය තාක්ෂණික හා අලෙවිකරණ උපදේශන සහය ලබාගැනීම සඳහා විදේශීය සමාගමක් 2016 දෙසැම්බර් 14 දින පත් කරගෙන තිබූ අතර එම කාර්ය සඳහා අමාත්‍යාංශය විසින් එ.ජ.ඩොලර් 300,000 ක් එනම් එවකට පැවති විනිමය අනුපාත අනුව රු.මිලියන 46.61ක් වැයකර තිබුණි. ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් සම්පත් ගවේෂණය, සංවර්ධනය, උකහා ගැනීම සහ කළමනාකරණය යන කාර්යයන් නියාමනය කිරීමේ පරමාර්ථ ඇතිව ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය 2021 වසරේදී ස්ථාපිත කර තිබූ නමුත් වායු නිධි සංවර්ධනය හා නිෂ්පාදන කටයුතු සඳහා සුදුසු ආයෝජකයෙකු සොයාගැනීමට 2024 දෙසැම්බර් 31 දක්වා නොහැකි වී තිබුණි.

**හම්බන්තොට බැටරි බලශක්ති ගබඩා පද්ධති ව්‍යාපෘතිය**

2024 වර්ෂයේ සැලසුම්කර තිබූ ඇස්තමේන්තුගත පිරිවැය එ.ජ.ඩොලර්. 11,900,000 වන කොරියානු රජයේ ආධාර යටතේ ඉදිකිරීමට නියමිත හම්බන්තොට බැටරි බලශක්ති ගබඩා පද්ධති

ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂයේදී රු.මිලියන 3,239ක භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙන්කර තිබුණද, අදාල ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

**විදේශාධාර ව්‍යාපෘති**

විදේශාධාර ව්‍යාපෘති යටතේ රු.මිලියන 47,658ක් වටිනා සංවර්ධන ව්‍යාපෘති 15ක් ක්‍රියාත්මක වන අතර ඉන් ව්‍යාපෘති 07ක ප්‍රවර්ථන වර්ෂයට අදාල මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය සියයට 51කට වඩා අඩු මට්ටමක පවතින බව ව්‍යාපෘති ප්‍රගති වාර්තා අනුව නිරීක්ෂණය විය.

## ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම)

මණ්ඩලය විසින් පහත සඳහන් මූලාශ්‍ර වලින් පසුගිය වර්ෂ 04 ඇතුළත විදුලිය සම්පාදනය කර ගෙන තිබුණි. 2021 සිට 2024 දක්වා වර්ෂ අවසානය තෙක් ස්ථාපිත කරන ලද විදුලි බලාගාරවල ධාරිතාව සහ 2021 සිට 2024 දක්වා විදුලිබලය ජනනය කරන ලද මූලාශ්‍ර පහත රූප සටහන්වල දැක්වේ.

**රූපසටහන 2.26 – 2024 වර්ෂය අවසානයේ මුළු ස්ථාපිත කරන ලද විදුලි බලාගාරවල ධාරිතාවය**




මූලාශ්‍රය - ලංකා විදුලිබල මණ්ඩලයේ සංඛ්‍යා ලේඛන වාර්තාව 2021-2024

**රූපසටහන 2.27 – 2021 සිට 2024 දක්වා ජනනය කරන ලද විදුලිබලය**




මූලාශ්‍රය - ලංකා විදුලිබල මණ්ඩලයේ සංඛ්‍යා ලේඛන වාර්තාව 2021-2024

**මණ්ඩලය සහ ලංකා විදුලි (පුද්ගලික) සමාගම විසින් පසුගිය වර්ෂ 04 ඇතුළත සිදු කරන ලද විදුලි අලෙවිය (විදුලි පරිභෝජනය) සහ පාරිභෝගික ගිණුම් සංඛ්‍යාව පහත රූප සටහන්වල දැක්වේ.**

**රූපසටහන 2.28 – 2024 වර්ෂයේ පැවති පාරිභෝගික ගිණුම් සංඛ්‍යාව**




**මූලාශ්‍රය : ලංකා විදුලිබල මණ්ඩලයේ සංඛ්‍යා ලේඛන වාර්තාව 2021-2024**

**රූප සටහන 2.29 - 2021 සිට 2024 දක්වා විදුලි පරිභෝජනය**




**මූලාශ්‍රය - ලංකා විදුලිබල මණ්ඩලයේ සංඛ්‍යා ලේඛන වාර්තාව 2021-2024**

## මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵල

2015 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා පසුගිය වසර 10ක් තුළ ලංකා විදුලිබල මණ්ඩලයේ උපයන ලද වාර්ෂික මෙහෙයුම් ලාභය/(අලාභය) සහ වාර්ෂික ශුද්ධ ලාභය/(අලාභය) පහත රූප සටහනේ දැක්වේ.

**රූපසටහන 2.30 - 2015 සිට 2024 දක්වා මණ්ඩලයේ මූල්‍ය කාර්ය සාධනය**




මූලාශ්‍රය - ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන 2015-2024

## විගණන නිරීක්ෂණ

**අඩුම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය**

සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 24 (1) (ඇ) වගන්තියට අනුකූල වීම සඳහා මණ්ඩලය විසින් 2018 – 2037 කාලපරිච්ඡේදය සඳහා පිළියෙල කරන ලද 2018 - 2037 අඩුම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව, 2018, 2019, 2020 සහ 2021 වර්ෂයන් තුළදී එකතුව මෙගාවොට් 2,032ක ධාරිතාවයකින් යුත් නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සැලසුම් කරන ලද එකතුව මෙගාවොට් 2,032ක ධාරිතාවයෙන් 2021 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 661.6ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

එසේම 2022-2041 සංශෝධිත සැලැස්ම අනුව, 2022 වර්ෂයේදී එකතුව මෙගාවොට් 544ක ධාරිතාවයකින් යුත් පුනර්ජනනීය බලශක්ති බලාගාර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු නමුත් 2022 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 211ක ධාරිතාවයකින් යුත් නව පුනර්ජනනීය බලශක්ති බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. 2023-2042 සංශෝධිත සැලැස්ම අනුව මෙගාවොට් 607ක සහ මෙගාවොට් 1,094ක ධාරිතාවයකින් යුත් බලාගාර පිළිවෙළින් 2023 සහ 2024 වර්ෂවල දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු නමුත් 2024 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 1052ක ධාරිතාවයකින් යුත් නව බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. මණ්ඩලය විසින් සකස්කර තිබුණු අඩුම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම සහ එය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පහත රූප සටහනේ දැක්වේ.

**රූපසටහන 2.31 - අඩුම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම සහ එය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය**




**මූලාශ්‍රය. ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු**

**දීර්ඝකාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය**

2018 - 2027 දිගුකාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම යටතේ 2019 වර්ෂයේදී වහාම ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගෙන තිබූ එක් සම්ප්‍රේෂණ යෝජනාවක් ද, 2021 වර්ෂය සඳහා හඳුනාගත් සම්ප්‍රේෂණ යෝජනා හයක් සහ 2023 වර්ෂය සඳහා හඳුනාගත් සම්ප්‍රේෂණ යෝජනා තුනක් 2024 දෙසැම්බර් 31 වන දින දක්වා ආරම්භ කර නොතිබුණි. තවද, එම සැලැස්ම මගින් 2023 වර්ෂය සඳහා හඳුනාගත් නව කොටුමා උපපොළ යෝජනා දහයක් සහ සම්ප්‍රේෂණ මාර්ග හා භූගත කේබල් යෝජනා එකොළහක් 2024 දෙසැම්බර් 31 වන දින දක්වාම ආරම්භ කර නොතිබුණි.

**බලපත්‍රයක් නොමැති නිෂ්පාදකයින්ගෙන් බලශක්තිය මිලදී ගැනීම**

සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 7 (1) සහ 43 (1) වගන්තිවලට පටහැනිව නියාමකගෙන් අධිකාරි බලය ලබා නොගෙන හා උත්පාදන බලපත්‍රයක් ලබා ගෙන නොතිබුණු විශ්‍රාම ලත් ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් දෙනෙකුගෙන් (අයි.පී.පී) 2024 වර්ෂය තුළදී රු. මිලියන 1,719.62ක වූ ගිගාවොට් පැය 24.93ක බලශක්ති මිලදී ගෙන තිබුණි.

**බලපත්‍රලත් සාම්ප්‍රදායික නොවන පුනර්ජනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය**

2022 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලය තුළදී ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) වෙතින් බලපත්‍ර නිකුත් කරන ලද එකතුව මෙගාවොට් 2,115.4ක ධාරිතාවක් සහිත ව්‍යාපෘති අතරින්, එකතුව මෙගාවොට් 467.5ක ධාරිතාවක් සහිත සාම්ප්‍රදායික නොවන පුනර්ජනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා පමණක් විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කර තිබුණි.

**අනුමැතිය රහිත විවිධ දීමනා ගෙවීම්**

නියැදි විගණන පරීක්ෂණයට අනුව වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන 2008 අප්‍රේල් 09 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද දීමනා ලැයිස්තුවට ඇතුළත් නොවූ දීමනා වෙනුවෙන් 2024 වර්ෂය සඳහා පමණක් රු. මිලියන 1,060.02ක් ගෙවා තිබුණි. තවද, එකී අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වෘත්තීය දීමනාවට හිමිකම් ඇති නිලධාරීන්ට රඳවා ගැනීමේ දීමනාව නොගෙවිය යුතු වුවත් වෘත්තීය දීමනාවට හිමිකම් ඇති නිලධාරීන් 601 දෙනෙකු සඳහා 2024 වර්ෂය තුළදී රඳවා ගැනීමේ දීමනා ලෙස රු. මිලියන 191.3ක් ගෙවා තිබුණි. මෙසේම 2013 සිට 2024 දක්වා දේපළ ණය සඳහා අය කරන ලද පොළියෙන් 2/3ක් ලෙස, භාණ්ඩාගාර අනුමැතිය රහිතව , ප්‍රතිපූරණය කරන ලද මුළු පොළී මුදල රු. මිලියන 19,384.8ක් වී තිබුණි.

**වෙළඳ ණය අය කර ගැනීමේ ප්‍රමාදය**

2024 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 6,413.25ක් මාස 6 කට වැඩි කාලයක සිට හිඟව පැවති අතර එයින් රු. මිලියන 2,343.91ක් වසර 5කට වැඩි කාලයක සිට හිඟව පැවතුණි.

**අනෙකුත් ණය අය කර ගැනීමේ ප්‍රමාදයන්**

2024 දෙසැම්බර් 31 දිනට අනෙකුත් ණයගැති ශේෂය රු. මිලියන 20,429.02 වූ අතර, 2024 වර්ෂය අවසන් වන දිනට රු. මිලියන 10,546.2ක් වර්ෂයකට වැඩි කාලයක සිට හිඟව පැවතුණි. එයින්, පූජනීය ස්ථානවලින්, විවිධ ණයගැතියන්ගෙන් සහ රජයේ ආයතනවලින් අයකර ගත යුතු පිළිවෙලින් රු. මිලියන 23.86ක්, රු මිලියන 252.75ක් සහ රු. මිලියන 80.42ක් වූ ශේෂයන් වසර පහකට

වැඩි කාලයක සිට අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව පැවතුණි. එසේම ගල් අඟුරු සමාගමෙන් ලැබිය යුතු රු. මිලියන 714.96ක් වසර දහයකට වැඩි කාලයක සිට අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව හිඟව පැවතුණි.

**ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල නොවීම**

2021-2023 කාලය සඳහා අමාත්‍ය මණ්ඩලය තීරණයක් අනුව ඉහළ නංවන ලද ප්‍රසම්පාදන අධිකාරී සීමාවන් 2023 දෙසැම්බර් අවසන් වන විට කල් ඉකුත් වී තිබුණු අතර, එදින සිට 2006 ප්‍රසම්පාදන අත්පොත සඳහා වන 35 සහ 40 අතිරේක (supplementary) යටතේ නියම කර ඇති ප්‍රසම්පාදන අධිකාරී සීමාවන්ට අනුකූල විය යුතු විය. එහෙත් මණ්ඩලය විසින් ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඉහළ නංවන ලද ප්‍රසම්පාදන අධිකාරී සීමාවන් 2024 අගෝස්තු 29 දක්වා අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණි. සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයට අනුව, 35 සහ 40 අතිරේකවල විධිවිධානවලට පටහැනිව 2024 ජනවාරි 01 සිට 2024 අගෝස්තු 29 දක්වා කාලය තුළදී මණ්ඩලය විසින් එකතුව රු. මිලියන 1,976.7ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත වැඩ, භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන කාර්යයන් 20ක්, ආරම්භ කර තිබූ බව නිරීක්ෂණය විය.

තවද, 35 වන අතිරේකයට පටහැනිව, 2021 ඔක්තෝබර් 12 වන දින පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021 නොවැම්බර් 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ, භාණ්ඩ සහ සේවා සඳහා මණ්ඩලයේ පුද්ගල අධිකාරී සීමාවන් ඉහළ නංවාගෙන තිබුණි. සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයට අනුව, 35 සහ 40 අතිරේකවල ඇතුළත් විධිවිධානවලට පටහැනිව 2021 නොවැම්බර් 02 සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලය තුළදී මණ්ඩලය විසින් එකතුව රු. මිලියන 55.43ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත වැඩ, භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන කාර්යයන් 27ක්, ඉහළ පුද්ගල අධිකාරී සීමාවන් යටතේ ආරම්භ කර තිබූ බව නිරීක්ෂණය විය.

**විදුලිය මිළදී ගැනීමේදී වැඩිපුර ගෙවීම් අයකර ගැනීම**

වෙස්ට් කෝස්ට් පවර් (පුද්) සමාගෙමන් විදුලිය මිළදී ගැනීමේදී ගිවිසුමේ කොන්දේසි ක්‍රියාත්මක නොකිරීම මත වැඩිපුර ගෙවා තිබූ බලශක්ති ගාස්තු, පණගැන්වීමේ ගාස්තු සහ ප්‍රමාද පොලිය, පරාමිතීන් කිහිපයක් සඳහා දෙපාර්ශවයම එකඟ වන ලද අඩු කළ අගයන් මත

ගණනය කර අයකර ගැනීමට දෙපාර්ශවය එකඟව තිබුණද, 2024 දෙසැම්බර් 31 දිනට  වැඩිපුර ගෙවා තිබූ තථ්‍ය මුදල ගණනය කර, ප්‍රමාද පොළිය සමඟ අයකර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

**මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු**

ෆයිලින් වැඩ අවසන් කරන ලද මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2021 අගෝස්තු 02 දින රු.මිලියන 4,774.60කට ප්‍රදානය කර තිබියදී, 2023 මාර්තු 14 වන දින ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, පළමු වන මහල නිම කිරීමෙන් පසු ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක ඉදිකිරීම අවසන් කිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව, ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 13.2ක් ලෙස පවතින විට 2023 අගෝස්තු 15 වන දින කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. 2023 අගෝස්තු 15 වන දින සිට ව්‍යාපෘතිය සඳහා පුනරාවර්තන වියදම් (වැටුප්, ඉන්ධන, වාහන අලුත්වැඩියා ආදිය) සඳහා රු. මිලියන 11.5ක මුදලක් වැය කර තිබුණු අතර  2024 වර්ෂය අවසානයේදී ඉදිකිරීමට අදාල කෙරීගෙන යන වැඩ ගිණුමේ රු. මිලියන 1,496.6ක් පැවතුණි. එබැවින්, ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු සඳහා මණ්ඩලය විසින් දරන ලද වියදම් නිෂ්ක්‍රියව පැවති බව නිරීක්ෂණය විය.

**අත්හැර දමා ඇති ව්‍යාපෘති**

මණ්ඩලයේ ප්‍රධාන ජනන සැලැස්ම තුලින් හඳුනාගත් සීතාවක ගඟ ජල විදුලි ව්‍යාපෘතිය 2022 වන විට ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණි. 2021 සැප්තැම්බර් 30 වන විට, මණ්ඩලය ආරම්භක කටයුතු සඳහා රු. මිලියන 301.19ක් වියදම් කර තිබුණද, ඉන්පසුව ව්‍යාපෘතිය අවසන් කර මෙගාවොට් 7ක කුඩා ජල විදුලි බලාගාර දෙකක් සංවර්ධනය කිරීම සඳහා මුලින් මෙම ව්‍යාපෘතිය කළමනාකරණය කරන ලද ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමට නැවත පැවරීමට තීරණය කර තිබුණි.

තවද, 2019 සැප්තැම්බර් 24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ලක්විජය බලාගාරය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා මණ්ඩලය විසින් රු. මිලියන 167.31ක් වැයකර  ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කර තිබුණි. එහෙත් 2021 සැප්තැම්බර් 13 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක්  මත පදනම්ව 2021 ඔක්තෝබර් 26 දින ව්‍යාපෘතිය වසා දමා තිබුණි. ඒ අනුව, මණ්ඩලය විසින් මෙම ව්‍යාපෘති සඳහා දරන ලද වියදම් අනාර්ථික වී තිබුණි.

**ආයෝජන සමාගමක් විසින් සිදු කර තිබූ අලාභ**

2014 වර්ෂයේදී එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී හරහා 2008 සහ 2009 වර්ෂවල මණ්ඩලයේ අර්ථසාධක අරමුදලට අයත් රු. මිලියන 2,312.76ක් විශ්‍රාම වැටුප් අරමුදලට අයත් රු. මිලියන 400.4ක් ද භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර තිබූ අතර මධ්‍යම තැන්පතු පද්ධතියේ, අරමුදල නමින් මෙම ආයෝජනයට අදාළ සුරැකුම්පත් නොමැති බව 2015 වර්ෂයේදී අනාවරණය වී තිබුණි. කෙසේ වෙතත්, 2018 දී කල් පිරෙන දින දක්වා වූ උපචිත කූපන් පොළිය සමඟ ආයෝජිත මුදල අයකර ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් අදාළ සමාගමට එරෙහිව වසර 2 කට වැඩි ප්‍රමාදයකින් පසුව සිවිල් නඩු දෙකක් ගොනු කර තිබුණි. 2024 දෙසැම්බර් 31 වන විට නඩු දෙකම විභාග වෙමින් පැවතුණි. තවද, ඒ වන විට අරමුදලේ සේවය කළ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ඔවුන්ගේ වෘත්තීමය නොසැලකිලිමත් බව සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ අතර ඔවුන්ට ලංකා විදුලිබල මණ්ඩලයේ සේවයෙන් විශ්‍රාම යාමටද ඉඩ ලබා දී තිබුණි.

## ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල

**අරමුදලේ රීතිවලට පටහැනිව කටයුතු කිරීම**

ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල් රෙගුලාසිවල රීති අංක 31 ප්‍රකාරව කම්කරු කොමසාරිස්වරයාගේ සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතියට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මගින් මින්මතු ඕනෑම අවස්ථාවක දී කලින් කලට හෝ ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙම රීති හෝ ඒවායින් යමක් විවර්තනය කිරීම, වෙනස් කිරීම, විකරණය කිරීම, නැවත සෑදීම හෝ පරිච්ඡින්න කිරීම නීත්‍යානුකූල විය යුතුය. කෙසේ වෙතත්, එම අනුමැතීන් ලබා ගැනීමෙන් තොරව සහ 2003 අර්ථසාධක අරමුදල් රෙගුලාසි පරිදි ගැසට් නිවේදනයක් හරහා සංශෝධන ප්‍රකාශයට පත් නොකර, කළමනාකරණ කමිටුවේ බලතල හා රාජකාරි, ආයෝජන බලතල සහ සාමාජිකයින්ට ණය ප්‍රදානය කිරීමට අදාළ රීති අරමුදල විසින් සංශෝධනය කර තිබුණි. ඒ අනුව, ඉහත රීතිවලට පටහැනිව එකතුව රු. මිලියන 64.1ක අධ්‍යාපන ණය 64ක් සහ එකතුව රු. මිලියන 6,618.3ක දේපළ ණය 4945ක් 2024 වර්ෂය තුළදී ලබා දී තිබූ බව නිරීක්ෂණය විය.

## ලංකා විදුලි (පුද්ගලික) සමාගම

**සැපයුම්කරුවන්ට වැඩියෙන් ගෙවීම්**

2024 නොවැම්බර් 12 දිනැති සූර්ය බලශක්ති සැපයුම්කරුවන්ගේ විදුලිය මිලදී ගැනීමේ ගාස්තු සංශෝධනයට (ලංකා විදුලි බල මණ්ඩලය) පටහැනිව 2023 වර්ෂයේ පැවති මිල ගණන් අනුව මුදල් ගෙවා තිබීම හේතුවෙන්, බලශක්ති සැපයුම්කරුවන් 551 දෙනෙකු සඳහා රු.මිලියන 38ක් වැඩිපුර ගෙවා තිබුණු අතර, 2024 දෙසැම්බර් 31 දින දක්වා මෙම මුදල අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## ලංකා ගල් අඟුරු සමාගම

**ගල් අඟුරු අඩුවෙන් සැපයීම**

විදේශීය ගල් අඟුරු සමාගමකින් වර්ෂ දහයක කාලයක සිට අයවිය යුතු රු. මිලියන 590ක් ලංකා ගල් අඟුරු සමාගම විසින් එකඟ වූ බේරුම්කරණ ක්‍රමයක් යටතේ 2024 වර්ෂය අවසන් වන විටත් අය කර ගෙන නොතිබුණි.

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

**ඛනිජ තෙල් වෙළඳපොළ**

2024 වර්ෂයේ දේශීය ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය මෙට්‍රික් ටොන් 4,470,063 ක් වූ අතර ඉන් මෙට්‍රික් ටොන් 3,031,716 ක් නැතහොත් සියයට 68කට වැඩි සැපයුමක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) මඟින් සිදු කර තිබුණි. 2024 වර්ෂයේදී සමස්ථ ඛනිජ තෙල් ආනයනය කිරීම සඳහා රු. බිලියන 774ක් සංස්ථාව විසින් වැය කර තිබුණි.

**සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵල සහ ශුද්ධ වත්කම් වල තත්ත්වය**

2024 වර්ෂයේදී සංස්ථාව රු. මිලියන 32,931ක ශුද්ධ ලාභයක් වාර්තා කර තිබුණු අතර එය ඉකුත් වර්ෂයේ රු. මිලියන 120,310ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සංස්ථාවේ ශුද්ධ ලාභය රු. මිලියන 87,380කින් අඩු වී තිබුණි. ඉකුත් වර්ෂයේ රු. මිලියන 1,194,087ක්ව පැවති පිරිපහදු ඛනිජ තෙල් නිෂ්පාදවල දේශිය විකුණුම් වටිනාකම 2024 වර්ෂයේදී රු.මිලියන 822,850ක් දක්වා රු. මිලියන 371,237කින් අඩු වී තිබුණි. මෙම විකුණුම් වටිනාකමේ අඩුවීම සඳහා ඉකුත් වර්ෂයට සාපේක්ෂව ප්‍රධාන පිරිපහදු ඛනිජ තෙල්

නිෂ්පාදන වර්ග හතරක (04) විකුණුම් ප්‍රමාණය සියයට18 සිට සියයට 28ක ප්‍රමාණයකින් අඩුවී තිබීම සහ එම පිරිපහදු බනිජ තෙල් නිෂ්පාදන වර්ග හතරෙහි (04) විකුණුම් මිල සියයට 3 සිට සියයට 11 දක්වා පරාසයකින් අඩු වී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**රූප සටහන 2.32 - 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා සංස්ථාවේ ආදායම, විකුණුම් පිරිවැය, විදේශ විනිමය අනුපාතයේ විචලනය සහ බදු පසු ශුද්ධ ලාභය/අලාභය**




මුලාශ්‍රය - සංස්ථාවේ විගණිත මූල්‍ය ප්‍රකාශන

**ඉදිරි සුරකුම් ගනුදෙනු (හෙජින්) හේතුවෙන් සිදු වූ පාඩුව**

2007 සිට 2009 දක්වා කාලය තුළ සංස්ථාව විසින් බණිජ තෙල් ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් සිදු කර තිබූ හෙජින් ගනුදෙනුවලට අදාළව සිදු කරන ලද විගණන පරීක්ෂණයට අනුව, එම ගනුදෙනුවලින් රටට සිදු වූ මුළු පාඩුව රු. මිලියන 14,028ක් වී තිබුණි. තවද, සංස්ථාවට එරෙහිව එ.ජ.ඩො. මිලියන 8.6ක අයිතියක් සඳහා පෞද්ගලික වාණිජ බැංකුවක් විසින් කොළඹ වාණිජ මහ අධිකරණයේ නඩුවක් පවරා තිබෙන අතර එම නඩුව 2024 වර්ෂය අවසානය වන විටද විභාග වෙමින් පැවතුණි.

**මාසික උපයෝගිතා ගාස්තු (Monthly Utility Fees) අය නොකිරීම**

2013 ඔක්තෝම්බර් 29 දිනැති අංක 38/1140 දරන අධ්‍යක්ෂක මණ්ඩල තීරණයට අනුව, සංස්ථාව සතු සියලුම අලෙවි නියෝජිත (CODO) පිරවුම්හල්වලින් සහ භාණ්ඩාගාරය සතු බෙදුම්කරුවන් විසින් පවත්වාගෙන යනු ලබන (TODO) පිරවුම්හල්වලින් මාසික උපයෝගිතා ගාස්තුවක් (MUF) 2014 ජනවාරි 01 දින සිට බල

පැවැත්වෙන පරිදි අයකර ගැනීමට තීරණය කර තිබුණි. කෙසේ වෙතත් මෙම තීරණය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, CODO සහ TODO පිරවුම්හල් 220ක් අතරින් අලෙවිකරුවන් 11 දෙනෙකුගෙන් පමණක් මාසික උපයෝගිතා ගාස්තුව අය කරගෙන තිබුණි. ඒ අනුව, 2024 දෙසැම්බර් 31 දිනට සංස්ථාවට අයවිය යුතුව පැවැති රු. මිලියන 7,228ක මුදල අයකර ගැනීමට මේ දක්වා සංස්ථාව අපොහොසත් වී තිබුණි.

**ජංගම LP ගෑස් පිරවුම් යන්ත්‍රය මිලදී ගැනීම**

2008 වර්ෂයේ දී සංස්ථාව විසින් ද්‍රව ගෑස් වෙළඳාමට පිවිසීම සඳහා සැලසුම් සකස්කර ඒ සඳහා රු.මිලියන 25ක් වටිනා ජංගම ද්‍රව ගෑස් (LP) පිරවුම් යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. එය භාවිතා කල හැකි තත්ත්වයට ගෙන ඒම සඳහා අමතර වියදම් ලෙස රු.මිලියන 12ක් පමණ වැයකර තිබුණු අතර වත්කම මිලදී ගත් දින සිට මේ දක්වා මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කර නොතිබුණු අතර දරන ලද සමස්ථ වියදම නිශ්කාර්යයව පැවතුණි. තවද මෙම යන්ත්‍රය පිළිබඳව 2015 වර්ෂයේ දී අභ්‍යන්තර පරීක්ෂණයක් හා 2020 වර්ෂයේ දී අමාත්‍යාංශය මඟින් ද පරීක්ෂණ සිදුකර තිබු නමුත් එම පරීක්ෂණ මඟින් වගකිව යුත්තන් නිශ්චය කර නොතිබුණි. එම විමර්ශන වාර්තා මඟින් ලබාදී තිබුණු මග පෙන්වීම් ද සංස්ථාව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

**ඛනිජ තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල්කිරීම සැලසුම් පරිදි සිදු නොකිරීම**

බලශක්ති සැලසුම් අනුව වර්ෂ 2008 -2010 දී දෛනික පිරිපහදු ධාරිතාවය බොරතෙල් බැරල් 50,000 සිට 100,000 දක්වා ඉහල නැංවීමටත්, 2014-2015 දී පිරිපහදුව අලුත්වැඩියා කිරීම සහ පිරිසැකසුම් ආකෘති අධ්‍යනය (දෛනික පිරිපහදු ධාරිතාවය බැරල් 50,000-70,000 දක්වා ඉහල නැංවීමත් ඇතුලත්ව) සඳහා සැලසුම් කර තිබුණු නමුත් එම සැලසුම් ක්‍රියාත්මක කර නොතිබුණි. එසේම 2020-2021 දී දෛනිකව බොරතෙල් බැරල් 100,000ක් පිරිපහදු කිරීම සඳහා නව තෙල් පිරිපහදුවක් සපුගස්කන්ද පරිශ්‍රය ආශ්‍රිතව ස්ථාපිත කිරීම සඳහා සිදුකල ශක්‍යතා අධ්‍යනය ආදි ව්‍යාපෘති කටයුතු සඳහා රු.මිලියන 1,742ක් පමණ වැයකර තිබුණද අපේක්ෂිත පිරිපහදු සංකීර්ණය ඉදිකර නොතිබුණි. බලශක්ති සැලසුම් ක්‍රියාත්මක නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස 1970 දශකයේ ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් අවශ්‍යතාවයෙන් සීයයට 100ක් සපුගස්කන්ද ඛනිජතෙල්

පිරිපහදුව මගින් සපුරා ගෙන තිබුණ ද වර්තමානය වන විට මෙම තත්ත්වය සියයට 25ක් දක්වා (නැප්තා හැර) පහත වැටී තිබුණි.

**ගිවිසුම් ප්‍රකාරව, වත්කම් හෝ වටිනාකම් සංස්ථාව වෙත ලබා නොදීම**

ලංකා ඛනිජ තෙල් නීති ගත සංස්ථාව යටතේ ක්‍රියාත්මක වූ බෙදුම්කරුවන් විසින් ක්‍රියාත්මක කරන (DODO) ඉන්ධන පිරවුම්හල් 344ක් 2024 වර්ෂය අවසාන වන විට ගිවිසුම් මගින් සමාගම් 3ක් වෙත පවරා දී තිබුණි. එම ගිවිසුම් ප්‍රකාරව, පවරන ලද ඉන්ධන පිරවුම්හල්වල පැවති සංස්ථාව සතු වත්කම් නැවත සංස්ථාව වෙත භාර දීම හෝ වත්කම්වල වෙළඳපොල වටිනාකම සංස්ථාව වෙත ගෙවීමට කටයුතු කළ යුතු වුවත් රු. මිලියන 52.4ක වටිනාකමකින් යුත් පිරවුම්හල් තෙල් ගබඩා ටැංකි 38ක් ඇතුළුව පවරන ලද සංස්ථාවේ වත්කම් අයිතම 357ක් සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

එසේම සංස්ථාව විසින් එක් පෞද්ගලික සමාගමක් වෙත පවරන ලද උපකරණ සම්බන්ධයෙන් වාර්ෂික කල්බදු ගිවිසුමකට එළඹී තිබුණු අතර එය 2024 ජුනි 30 දිනෙන් කල් ඉකුත් වී තිබුණි. අනෙකුත් සමාගම් දෙකට ලබා දී තිබුණු පිරවුම්හල් 194ක වත්කම් සම්බන්ධයෙන් ඉහත සඳහන් පරිදි කල්බදු ගිවිසුමකට හෝ එළඹී නොතිබුණි. ඒ අනුව සමාගම්වලට පවරන ලද පිරවුම්හල්වල ඇති සංස්ථාව සතු වත්කම් භාවිතය වෙනුවෙන් කල්බදු ආදායමක් උපයා ගැනීමේ අවස්ථාව සංස්ථාවට අහිමි වී තිබුණි.

**අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට පටහැනිව අලෙවි නියෝජිත කොමිස් ගෙවීම**

2019 ජුලි 30 දිනැති අංක 05/1231 දරන අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයට අනුව ඛනිජ තෙල්වල දේශීය වෙළඳපොළ මිල උච්චාවචනයන්ගේ බලපෑම හේතුවෙන් බෙදුම්කරුවන්ට ගෙවනු ලබන කොමිස් ප්‍රමාණය උච්චාවචනයවීමෙන් සංස්ථාවට සහ බෙදුම්කරුවන්ට වන අහිතකර බලපෑම බැහැර කිරීම සඳහා පහත පරිදි ඉහළ හා පහළ සීමාවන්ට යටත්ව DODO පිරවුම්හල් සඳහා සියයට 3ක හා CODO පිරවුම්හල් සඳහා සියයට 2.75ක කොමිස් ප්‍රතිශතයන් තීරණය කර තිබුණි.

වගු අංක **2.30** - දේශීය වෙළඳපොළ මිල උච්චාවචනයන්ගේ බලපෑම හේතුවෙන් බෙදුම්කරුවන්ට ගෙවනු ලබන කොමිස් ප්‍රමාණය

| | පෙට්‍රල් | | ඩීසල් | |
|---|---|---|---|---|
| | 92 Oct | 95 Oct | LAD | LSD |
| **Upper Cap** | Rs.162 | Rs.170 | Rs.121 | Rs.145 |
| **Lower Cap** | Rs.117 | Rs.128 | Rs.95 | Rs.110 |

මූලාශ්‍රය - ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු

එසේ වුවද, ඉහත අධ්‍යක්ෂක මණ්ඩල තීරණයට පටහැනිව, ඉහළ සීමාවන් සලකා බැලීමකින් තොරව සංස්ථාව විසින් බෙදුම්කරුවන්ට අලෙවි නියෝජිත කොමිස් මුදල් ගෙවා තිබුණි. ඒ අනුව 2021 ජූනි 12 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා වැඩිපුර ගෙවූ මුළු අලෙවි නියෝජිත කොමිස් මුදල රු. මිලියන 37,678ක් වී තිබුණි. මෙයින් රු.මිලියන 75ක් බෙදුම්කරුවන්ගෙන් නැවත අයකරගෙන තිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් ගරු අධිකරණයේ නඩු කිහිපයක් පවරා තිබෙන අතර එම නඩු 2024 වර්ෂය අවසාන වන විටද විභාග වෙමින් පැවතුණි.

## ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

**සෙස් බද්ද පැනවීමේ ක්‍රමවේද සකස් නොකිරීම**

පනත ප්‍රකාරව මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි අනුප්‍රමාණ අනුව ගණන් බලනු ලබන සෙස් බද්දක් ආනයනය කරනු ලබන සියළුම පාශානිභූත ඉන්ධන නිෂ්පාදන මත පැනවීම, අයකිරීම සහ ගෙවීම කරනු ලැබිය යුතු වුවද ඒ සඳහා ක්‍රමවේද සකස් නොකිරීම හේතුවෙන් අදාල ගාස්තු අයකිරීමට නොහැකි වී තිබුණි.

## ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව

**නියාමනය සඳහා කාර්ය පටිපාටියක් සකස් නොකිරීම**

පනත ප්‍රකාරව පරමාණුක බලශක්ති මණ්ඩලයද ඇතුළුව සියළු තැනැත්තන් විසින් සිදුකරන අයනීකාරක විකිරණ සම්බන්ධිත සෑම ක්‍රියා පිළිවෙතක්ම බලපත්‍ර ලබා දී නියාමනය කිරීමේ වගකීම සභාව සතුය. ඒ අනුව මණ්ඩලය විසින් සැපයිය යුතු ද්වීතියික කාර්යයක් වූ

විකිරණශීලීතා මට්ටම් මිනුම් කිරීම, විකිරණ මිනුම් උපකරණ ක්‍රමාංකන සේවය, මාත්‍රාමිතික සේවය සහ වැඩබිම් අධීක්ෂණ සේවා වැනි සේවාවන් අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා පනතේ 12(ඕ) වගන්තියේ බලතල ප්‍රකාරව සභාව විසින් කාර්ය පටිපාටි සහ යාන්ත්‍රණයක් සකස්කළ යුතු වුවත් සභාව විසින් එවැනි කාර්ය පටිපාටි සහ යාන්ත්‍රණයක් පිළියෙළ කර ගැසට් කර නොතිබුණි.

**විකිරණශීලි ප්‍රභවයන් නියාමනය සඳහා ජාතික ක්‍රමෝපාය සැලැස්ම සකස් නොකිරීම**

2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 46 වගන්තිය ප්‍රකාරව හිමිකම් නොමැති විකිරණශීලී ප්‍රභවයන්වල පාලනය නොපමාව ලබාගැනීම හෝ නැවත ලබාගැනීම සඳහා සකස් කළ යුතු ජාතික ක්‍රමෝපායක් සකස් කර නොතිබුණි.

## ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

**ප්‍රමාද වූ ප්‍රාග්ධන ව්‍යාපෘති**

කොළොන්නාව ගබඩා පර්යන්තය සඳහා ඉන්ධන ටැංකි 6ක් (15,000m³ ටැංකි 3ක්, 7,000m³ ටැංකි 2ක්, සහ 5,000m³ ටැංකි 1ක්) ඉදිකිරීම සඳහා එ.ජ.ඩොලර් මිලියන 12.68කට කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කිරීම සඳහා 2019 සැප්තැම්බර් 18 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේදී පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර 2023 වර්ෂයේදී කොන්ත්‍රාත්තුව යටතේ වැඩ නිම කළ යුතු විය. කොන්ත්‍රාත්කරු අපේක්ෂිත ප්‍රගතිය ලබා නොගැනීම හේතුවෙන් කොන්ත්‍රාත් ගිවිසුම අනුව සේවා යෝජක විසින් ඉහත කොන්ත්‍රාත්තුව 2022 ජනවාරි 19 දින අවසන් කර තිබුණි. එදිනට සමාගම විසින් ඉහත කොන්ත්‍රාත්තුව සඳහා රු.මිලියන 328.11ක් වැය කර තිබුණි. එසේ වුවද ඉහත ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස් නිම කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් මෙතෙක් ගෙන නොතිබුණි.

**උපදේශන වාර්තාව ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය**

2022 දෙසැම්බර් 14 දිනැති අංක 232 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව බෙදාහැරීමේ ක්‍රියාවලියේ සිදුවූ වංචාවක් සම්බන්ධයෙන් ලබා දී තිබූ අභ්‍යන්තර විමර්ශන වාර්තාවකට අනුව විකුණුම් හා බෙදාහැරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ව්‍යෝහාරික විගණනයක් සිදුකිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය කර තිබුණි. ඒ අනුව 2023 ජුනි 26 දින

පෞද්ගලික උපදේශක ආයතනයක් සමඟ උපදේශන සේවයක් ලබා ගැනීම සඳහා රුපියල් මිලියන 8.6ක පිරිවැයකට උපදේශන ගිවිසුමකට එළඹ තිබුණි . ඉහත සේවාව සම්බන්ධයෙන් 2024 ජූලි 29 දින අත්තිකාරමක් ලෙස රු. මිලියන 5.8ක මුදලක් ගෙවා තිබුණි. එම ගිවිසුමෙහි අංක 2.3 යටතේ දක්වා තිබූ කොන්ත්‍රාත්තු කොන්දේසි අනුව ඉහත සේවාව දින 60කින් අවසන් කළ යුතුව තිබුණු අතර ඒ අනුව 2023 අගෝස්තු 25 දින අවසන් වාර්තාව ලබා දිය යුතුව තිබුණි. කෙසේ වුවද, ගිවිසුම අවසන් වී වසර 2ක් ගත වී තිබුණද එකඟ වූ පරිදි අවසන් වාර්තාව සමාගම වෙත නිකුත් කර නොතිබුණි .

## ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම

**ඌන උපයෝජිත වත්කම්**

ඔරුගොඩවත්ත පිහිටි රු.මිලියන 992.74ක් වටිනා පර්චස් 509.1ක ඉඩම 2012 වර්ෂයේ සිට භාවිතයට ගෙන නොතිබුණි.

**වට්ටම් ලබාදීමේ ක්‍රමවේදයක් නොමැති වීම**

2024 වර්ෂය සඳහා ලබා දෙන ලද අධික වට්ටම් හේතුවෙන් තොග ගනුදෙනුකරුවන් දෙදෙනෙකුගෙන් සමාගමට රු. මිලියන 11.41ක ශුද්ධ මෙහෙයුම් අලාභයක් සිදු වී තිබුණි. තොග ගනුදෙනුකරුවන්ට වට්ටම් ලබා දීම සඳහා නිසි ක්‍රමවේදයක් නොමැති වීම මේ සඳහා හේතු වී තිබූ බව නිරීක්ෂණය විය.

**බෝයා පහසුකම් නවීකරණය සීමා වීම**

සමාගම සතු කෙරවලපිටිය පිහිටි බෝයා පහසුකම (CBM Facility) ප්‍රමාණවත් වනුයේ මෙට්‍රික් ටොන් 3,500 - 5,000 ත් අතර කුඩා ප්‍රමාණයේ ගබඩා පහසුකම් පවතින නැව් හැසිරවීමට පමණි. නමුත් වර්තමානය වන විට ලෝක ගෑස් ප්‍රවාහනය තුළ මෙට්‍රික් ටොන් 20,000 - 100,000 ත් අතර ප්‍රමාණයේ ඉතා විශාල නැව් යොදා ගනු ලබන නිසා සමාගම සතු බෝයා පහසුකමේ සීමිත වීම මත සමාගමට වඩා අඩු මිලකට ගෑස් මිලදී ගැනීමට පවතින හැකියාව සීමා වී ඇති බව නිරීක්ෂණය විය.

## ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම

**විධිමත් ගිවිසුමකට එළඹ නොතිබීම**

සමාගම එහි සහෝදර සමාගම වන ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් (LGLL) සමාගම වෙත සපයනු ලබන සේවාවන්හි නියමයන් සහ කොන්දේසි පිළිබඳ විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

**ප්‍රාග්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම**

ඔක්සිජන් පිරවුම්හලක් ඉදිකිරීම, ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් අතිරේක ක්‍රියාකාරිත්වයක් ඇති කිරීම,ගබඩා පුළුල් කිරීමේ ව්‍යාපෘතියක් ලෙස භාවිතා කිරීම සහ වෙනත් අදාළ ක්‍රියාකාරකම් සඳහා කෙරවලපිටියේ අක්කර 22ක ඉඩම සහ ගොඩනැගිල්ල සඳහා මුළු කල්බදු කුලියෙන් කොටසක් ලෙස සමාගම 2021 වර්ෂයේ දී ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාවට රුපියල් මිලියන 500ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, සමාගමේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් 2024 වර්ෂය අවසානය දක්වා ඉහත ඉඩම සමාගමට බදු දීමට ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාවට කැබිනට් අනුමැතිය ලබා දී නොතිබුණි. එබැවින්, ඉහත ගෙවීමෙන් සමාගම මේ දක්වා කිසිදු ප්‍රතිලාභයක් ලබාගෙන නොතිබුණි.

# නාගරික සංවර්ධන හා නිවාස

2024 වර්ෂයේදී අදාළ කාර්යභාරයන් ඉටුකිරීම සඳහා නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයට හා ඒ යටතේ පැවති දෙපාර්තමේන්තු 04කට රු.මිලියන 55,785ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් සලසා දී තිබුණි. 2024 වර්ෂය අවසන් වන විට එයින් රු.මිලියන 40,223ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර රු.මිලියන 15,562ක් හෙවත් සියයට 27ක් පහත පරිදි ඉතිරි කර තිබුණි.

**වගු අංකය 2.31 - 2024 වර්ෂයේදී අදාළ කාර්යභාරයන් ඉටු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සහ ප්‍රයෝජනය**

| | නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | රජයේ කර්මාන්තශාලාව | භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ශුද්ධ ප්‍රතිපාදනය | 52,462 | 2,213 | 610 | 263 | 237 | 55,785 |
| වියදම | 37,814 | 1,389 | 594 | 237 | 189 | 40,223 |
| ඉතිරිය | 14,648 | 824 | 16 | 26 | 48 | 15,562 |

මූලාශ්‍රය - 2024 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

අදාළ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව සිදු කළ නියැදි විගණන පරීක්ෂාවලදී අනාවරණය වූ ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## නාගරික සංවර්ධන ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය

**උතුරු නැගෙනහිර යුද්ධයෙන් අවතැන් වූ පවුල් සඳහා නිවාස/ ඉඩම් ලබා දීමේ ව්‍යාපෘතිය**

උතුරු නැගෙනහිර යුද්ධයෙන් අවතැන් වූ පවුල් සඳහා නිවාස/ ඉඩම් ලබා දීමේ ව්‍යාපෘතිය යටතේ 2016 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා උතුරු නැගෙනහිර පළාත්වල දිස්ත්‍රික්ක 08ක නිවාස 36,736ක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 29,813ක් අමාත්‍යාංශය විසින් වැයකර තිබුණි. තවද යුද්ධය නිම වී වසර 15ක් ගත වී තිබුණද, යුද්ධයෙන් අවතැන්වූවන් තවදුරටත් හඳුනා ගනිමින් පැවති බැවින් නැවත පදිංචි කිරීමේ කටයුතුද නිමා කර නොතිබුණි. ව්‍යාපෘතිය යටතේ 2024 වර්ෂයට පෙර වැඩ ආරම්භ කල නිවාස 115ක සහ 2024 වර්ෂය තුළ වැඩ ආරම්භ කරන ලද නිවාස 207ක වැඩ 2024 වර්ෂය අවසානය දක්වාම නිමකර නොතිබුණි.

**මිනුවන්ගොඩ වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

රු.මිලියන 180.6ක කොන්ත්‍රාත් වටිනාකමක් යටතේ අදියර 3කින් 2018-2024 කාලසීමාව තුළ මිනුවන්ගොඩ වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීම් ව්‍යාපෘතිය නිමකර තිබුණි. රු.මිලියන 89ක ඇස්තමේන්තුගත වටිනාකමක් සහිත මෙහි පළමු අදියර දින 556ක කාල ප්‍රමාදයකින් පසුව 2021 ජූලි 08 දින අවසන් කිරීම නිසා ප්‍රමාද දඩ ලෙස රු.මිලියන 8.9ක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන තිබුණි. එහෙත් කොන්ත්‍රාත්කරු විසින් ඊට එරෙහිව ආරවුල් බේරුම්කරණ මණ්ඩලයට පැමිණිලි කර තිබුණු අතර, උපදේශක ඉංජිනේරු විසින් අනුමත කර තිබුණු දින දීර්ඝ කිරීම් සඳහා අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබා නොදීම සහ එය සාධාරණීකරණය කිරීමට හේතු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ආරවුල් බේරුම්කරණ මණ්ඩලයේ නිර්දේශ අනුව දෙපාර්ශවයේ එකඟතාව මත කොන්ත්‍රාත්කරුට රු.මිලියන 12.8ක් ගෙවීමට අමාත්‍යාංශයට සිදු වී තිබුණි. නමුත් අනුමැතිය ලබා නොදීම සාධාරණීකරණය කිරීමට හේතු ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ නිළධාරීන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

තවද රු. මිලියන 9.6ක් (වැට් රහිත) වැයකර ස්ථාපනය කර තිබූ විදුලි සෝපානය ප්‍රයෝජනයට නොගෙන 2024 දෙසැම්බර් 31 දක්වාම නිෂ්කාර්යව පැවතුණි.

**අවිස්සාවේල්ල පොදු වෙළඳපොළ ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතීම**

පොදු වෙළඳපොළ ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත් සමාගමට අමාත්‍යාංශය විසින් රු.මිලියන 113ක් ගෙවා තිබූ අතර, ගොඩනැගිල්ලේ වැඩ නිම කර 2024 අප්‍රේල් 10 දින අවිස්සාවේල්ල නගර සභාව වෙත භාර දී තිබුණි. 2022 වර්ෂයේදී අදාළ විෂයපථය සීමා කිරීම නිසා කඩ කාමරවල ප්‍රමාණය කුඩා වීමත්, කඩකාමර නියමිත පරිදි වෙළඳාම් කටයුතු පහසුවෙන් කර ගත හැකි ලෙසට ස්ථාපිත නොකිරීමත් හේතුවෙන් මෙම ගොඩනැගිල්ල නගර සභාව වෙත භාර දී වසරකට අධික කාලයක් ගත වී තිබුණද කඩහිමියන් විසින් කඩ කුලියට ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව මෙම වෙළඳ සංකීර්ණය ඉදිකිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

**මහර පරිපාලන හා වාණිජ සංකීර්ණ ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතීම**

අමාත්‍යාංශය විසින් රු.මිලියන 400 ක් වැයකර ඉදිකරන ලද මහර පරිපාලන හා වාණිජ සංකීර්ණ ගොඩනැගිල්ල අදාළ පාර්ශවයන්ට භාර දීමට කටයුතු නොකිරීම නිසා 2019 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා වසර 6ක් නිෂ්කාර්යව පැවතුණි. අමාත්‍යාංශය විසින් මෙම ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

**කොටගල තෙත්බිම් උද්‍යානය නිෂ්කාර්යව පැවතීම**

රු.මිලියන 75.6ක් වැය කර වැඩ අවසන් කරන ලද කොටගල තෙත්බිම් උද්‍යානය නිසි පරිදි නඩත්තු නොකර අතහැර දමා තිබීමෙන් අපේක්ෂිත අරමුණු ලබා කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් වැය කරන ලද මුදල් නිෂ්ඵල වී තිබුණි. තවද අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා ගැනීමෙන් තොරව අත්පත් කර ගෙන තිබුණු අමතර හෙක්ටයාර් 7ක භූමිය වසර 4ක පමණ සිට නිෂ්කාර්යව පැවතුණි.

**බෙලිඅත්ත අම්පිටිය වැව ඇවිදින මංතීරුව හා භූ දර්ශන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

රු.මිලියන 65.8ක් වැයකර ඉදිකරන ලද බෙලිඅත්ත, අම්පිටිය ඇවිදින මංතීරුව නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යයව පැවතුණි. තවද ව්‍යාපෘති භූමිය වල් බිහි වී තිබීම නිසා පාරිසරික ගැටලු රැසක් ද ඇතිවී තිබුණි.

**පූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමිගම ව්‍යාපෘතියේ නිවාස සඳහා ජල පහසුකම් ලබා දී නොමැති වීම**

ව්‍යාපෘතියේ නිවාස සඳහා ජල පහසුකම් සැපයීම වෙනුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට 2021 දෙසැම්බර් 27 දින රු.මිලියන 56ක් (වැට් සහිත) ලබා දී තිබුණි. උක්ත ව්‍යාපෘතිය වර්ෂයක් තුළ නිම කළ යුතු වුවද, 2024 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 03ක් ඉක්මවා තිබුණු අතර මුළු මුදලම ගෙවා තිබියද අවශ්‍ය ජල පහසුකම් ලබා දී ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා දීමට නොහැකි වී තිබුණි.

**තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය සම්පූර්ණ කල නොහැකි වීම**

මෙම ව්‍යාපෘතිය යටතේ පිටිපන තලගල (අදියර 1) මාර්ගය හා බටහිර අන්තර් හුවමාරු මාර්ගය ඉදිකිරීම සඳහා 2024 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය විසින් රු.මිලියන 1,369.21ක් වැයකර තිබුණි. ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටලුවක් හේතුවෙන් මෙම මාර්ගයන්හි වැඩ අවසන් කිරීමට නොහැකිව ව්‍යාපෘතිය අතරමඟ අවසන් කර තිබුණි. ඒ හේතුවෙන් මාර්ගය ඉදිකිරීමෙන් ලබා ගැනීමට අපේක්ෂිත ප්‍රතිලාභ මහජනයාට ලබා දීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි.

**බොරලැස්ගමුව බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම අතරමඟ අතහැර දැමීම**

අඩක් නිමකර තිබුණු බොරලැස්ගමුව බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අන්‍යෝන්‍ය එකඟතාවය මත අතරමඟ නතරකර 2023 ජනවාරි 08 දින අවසන් කර රඳවුම් මුදලින් රු.මිලියන 5.8ක් කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කර තිබුණි. ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට අමාත්‍යාංශය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් 2024 දෙසැම්බර් 31 වන විටත් ගෙන නොතිබුණු බැවින් එම ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් මෙතෙක් වැය කරන ලද රු.මිලියන 249ක මුදල නිෂ්කාර්යය වියදමක් වී තිබුණි.

**අම්පාර සතිපොළ සංවර්ධන ව්‍යාපෘතිය අතරමඟ අතහැර දැමීම**

ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 294 ක් වූ අම්පාර සතිපොළ සංවර්ධන ව්‍යාපෘතිය, සියයට 52 ක භෞතික කාර්යසාධනයක් හා රු. මිලියන 64.27ක මූල්‍ය කාර්යසාධනයක් ළඟා කර ගැනීමෙන් අනතුරුව වැඩ නවතා තිබීම හේතුවෙන් ඒ සඳහා දරන ලද වියදම නිෂ්කාර්ය වී තිබුණි.

**යාපනය නගර සභා ගොඩනැගිල්ල ඉදිකිරීම**

සංශෝධිත කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 3,769ක් වූ මෙම ඉදිකිරීම් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2022 සැප්තැම්බර් 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් නතර කර ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස් නිම කිරීමේ වගකීමත් සමඟම සමස්ථ ගොඩනැගිල්ල යාපනය නගර සභාවට පැවරීමට තීරණය කර තිබුණද අමාත්‍යාංශය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. 2024 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශය විසින් රු. මිලියන 183ක් වැයකර

තිබුණු අතර 2024 දෙසැම්බර් 31 වන විට මෙහි භෞතික ප්‍රගතිය සියයට 85ක් හා මූල්‍ය ප්‍රගතිය සියයට 48ක් එනම් වියදම රු.මිලියන 1,819.64ක් වී තිබුණි. තවද වසර 02ක් තුළ නිම කිරීමට අපේක්ෂා කල මෙම ව්‍යාපෘතිය ආරම්භ කර වසර 6කට ආසන්න කාලයක් ගත වී තිබුණත් 2024 දෙසැම්බර් 31 දිනවන විටත් නිම කර නොතිබුණි. තවද ව්‍යාපෘතියේ අධීක්ෂණ හා උපදේශන ආයතනය වන නාගරික සංවර්ධන අධිකාරිය සතුව ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැති වීම මෙම ව්‍යාපෘතියේ දුර්වල කාර්‍යසාධනයට බෙහෙවින් බලපා තිබුණු නමුත් ඒ පිළිබඳ සැලකිල්ලක් නොදක්වා අධිකාරියට උපදේශන ගාස්තු ලෙස රු.මිලියන 98.6ක්ද ගෙවා තිබුණි.

## නාගරික සංවර්ධන අධිකාරිය

**සංවර්ධන සැලසුම් පිළියෙල කිරීම**

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරියේ (සංශෝධන) පනත II කොටසේ 8 (අ) (i) වගන්තිය ප්‍රකාරව සංවර්ධන බල ප්‍රදේශ ආවරණය වන පරිදි අධිකාරිය විසින් සංවර්ධන සැලසුම් පිළියෙල කළ යුතුය. ඒ අනුව ප්‍රකාශිත සංවර්ධන බල ප්‍රදේශ 284ක් සඳහා සංවර්ධන ප්‍රදේශ 169ක් ආවරණය වන පරිදි සංවර්ධන සැලසුම් 169ක් පිළියෙල කළ යුතු වුවද 2024 දෙසැම්බර් 31 දිනට සංවර්ධන ප්‍රදේශ 115ක් ආවරණය වන පරිදි සංවර්ධන සැලසුම් 69ක් පමණක් පිළියෙල කර තිබුණි.

**නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියේ ඌන ප්‍රගතිය**

අධිකාරිය විසින් 2011 වර්ෂයේදී ආරම්භ කොට ක්‍රියාත්මක කරනු ලැබූ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියෙන් ඉදිකිරීමට යෝජිත වූ නිවාස ඒකක 68,000කින් 2024 දෙසැම්බර් 31 දිනට නිවාස ඒකක 14,381ක් පමණක් ඉදිකර එයින් නිවාස ඒකක 50ක් තවදුරටත් භාවිතයට නොගෙන හිස්ව පැවතුණි. තවද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ඉදිකරන ලද වතු ඉඩම් 29කට අදාළ ඉඩම්වල අයිතිය අධිකාරිය වෙත මේ දක්වා පවරා ගෙන නොතිබීම, 2021 වර්ෂය අවසාන වන විට ඉදිකරන ලද නිවාස සංකීර්ණ 22ක් අතුරින් නිවාස යෝජනා ක්‍රම 08කට අදාළ ඉඩම් අධිකාරිය වෙත පවරා ගෙන නොතිබීම, නිවාස සංකීර්ණ 05ක් සඳහා සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සහතිකය නොමැති

වීම හේතුවෙන් එම නිවාස ව්‍යාපෘතිවල පරිපාලනය කළමනාකරණ කමිටුවලට පැවරීමට නොහැකි වී තිබීම හා 2024 දෙසැම්බර් 31 වන විට භාර දී තිබූ නිවාස ඒකකවලින් කුලී සහ ජල බිල්පත් වෙනුවෙන් එකතුව රු.මිලියන 170.48ක් අයකර ගෙන නොතිබීම යන කරුණු විගණනයේදී නිරීක්ෂණය විය.

**කොළඹ 05 මයුර පෙදෙසේ ඉඩම අඩු තක්සේරුවක් මත බදු දීම**

අධිකාරියට අයත් කොළඹ 05 මයුර පෙදෙසේ පර්චස් 56.5ක විශාලත්වයෙන් යුතු ඉඩම එවකට අධිකාරියේ අභ්‍යන්තර තක්සේරු කමිටුවේ සභාපති වූ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉඩම්) කිසිදු සාධාරණ හේතුවක් නොදක්වා පිළිගත් තක්සේරු ක්‍රමවේදය අනුගමනය නොකරමින් තක්සේරු වටිනාකමෙන් සියයට 70කට ආසන්න ප්‍රමාණයකින් අඩුකර රු. 200,000ක් වැනි වූ මාසික කුලියකට විධිමත් බදු ගිවිසුමකටද එළඹීමෙන් තොරව පුද්ගලික ආයතනකට 2016 ජූනි සිට නොවැම්බර් දක්වා මාස 06ක කාලයකට බදු ලබා දී තිබුණි. තවද එම මාස 06ක කාලය ඉක්ම වීමෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියද ලබා ගැනීමකින් තොරව 2020 දෙසැම්බර් 31 දින දක්වා වසර 3 ½ කට එම ඉඩම යළි බදු දීමට කටයුතු කර තිබුණි. එසේ වුවද බදුකරුගෙන් ඉඩම පරිහරණය කළ කාලය සඳහා ද මාසික කුලියද අය කර නොතිබුණි. මේ නිසා අධිකාරියට සිදුව තිබූ සමස්ථ පාඩුව වූ රු.මිලියන 20කට අධික වටිනාකම අදාළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට 2024 දෙසැම්බර් 31 දක්වාම කටයුතු කර නොතිබුණි.

**බදු ගිවිසුම් පරිදි සංවර්ධන කටයුතු සිදු නොකිරීම**

අක්කර 2 රූඩ් 2 පර්චස් 21.4ක් වූ කොළඹ කොටුව ඩී.ආර්.විජේවර්ධන මාවතට මායිම්ව පිහිටි ඉඩම ප්‍රසිද්ධ මිල කැඳවීමෙන් තොරව 2007 වසරේ සිට මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් වෙනුවෙන් පුද්ගලික සමාගමකට අවුරුදු 50කට දීර්ඝකාලීනව බදු දී තිබුණි. රජයේ තක්සේරු වටිනාකමින් රු.මිලියන 330ක් අඩුවෙන් අයකර අදාළ ඉඩම සමාගමට බදු දීම හේතුවෙන් අධිකාරියට දැරීමට සිදු වී තිබූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. එසේම, 2024 දෙසැම්බර් 31 දින දක්වාම මෙම ඉඩමේ කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර රථ වාහන ගාලක් ලෙස භාවිතා කරමින් පැවතුණි.

**කොළඹ කොටුව ට්‍රාන්ස්වර්ක් චතුරශ්‍ර ඉඩමේ සංවර්ධන කටයුතු සිදු නොකිරීම**

මෙම ඉඩම රු.මිලියන 4,999.7කට දේශීයව ස්ථාපිත විදේශීය පෞද්ගලික සමාගමක් වෙත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා 2013 සිට 2016 කාලපරාසය තුළ ගිවිසුම 04ක් මගින් බදු දී තිබුණි. කෙසේ නමුත් 2021 වර්ෂය වන විට ව්‍යාපෘතිය නිමවීමට අපේක්ෂිත වුවද, 2024 වර්ෂය අවසාන වන විටත් ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ අපේක්ෂිත සම්පූර්ණ මහල් 81කින් සමන්විත වූ ගොඩනැගිල්ලෙන් මහල් 60ක් සඳහා ගොඩනැගිලි සැකිල්ල පමණක් ඉදිකර තිබුණි. ඉඩමේ බදු වටිනාකම හා වෙළඳපල වටිනාකම අතර වෙනස වූ රු.මිලියන 1,290.04ක් ව්‍යාපෘතිය සම්පූර්ණ කල පසුව ඉදිකරන නේවාසික ඒකක විකිණීමේදී අයකර ගැනීමට අපේක්ෂිත වුවද සංවර්ධන ව්‍යාපෘතිය තාක්ෂණික හේතු මත අත්හිටුවා තිබීමෙන් මෙම වටිනාකම තවදුරටත් අයකර ගැනීමට නොහැකිව තිබුණි.

**පන්නිපිටිය වීරමාවතේ පිහිටි නිවාස බදුකරුවන්ගෙන් අයකර ගත යුතු වූ ගාස්තු**

පන්නිපිටිය වීරමාවතේ පිහිටි නිවාස 500කින් යුත් නිවාස යෝජනා ක්‍රමය A,B,C,D සහ E ලෙස කුළුණු 05කින් සමන්විත අතර මෙම නිවාස ව්‍යාපෘතියෙහි B කුළුණෙහි පිහිටි නිවාස 71 ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් වෙත, ඒ සඳහා කුලිය භාණ්ඩාගාරයෙන් අයකර ගැනීමේ පදනම මත ලබා දී තිබුණි. කෙසේ නමුත් මෙම නිවාස ඒකක වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට අධිකාරියට අයවිය යුතු ජල ගාස්තුව, විදුලි ගාස්තුව සහ කළමනාකරණ ගාස්තුවෙහි එකතුව රු.මිලියන 16.98ක් තවදුරටත් හිඟ හිටිව පැවතුණි.

**කිරුළපන දුම්රියපොළ මාවතේ ඉඩම නිෂ්කාර්යව පැවතීම**

කිරුළපන දුම්රියපොළ මාවතේ අක්කර 37 රූඩ් 01 පර්චස් 8.43ක් පමණ ඉඩම 1950 අංක 09 දරන ඉඩම් අත්කර ගැනිමේ පනතේ 38(අ) අතුරු වගන්තිය යටතේ පොදු කටයුත්තක් සඳහා යැයි සඳහන් කරමින් 1984 ජුනි 26 දිනැති අංක 303/4 දරන ගැසට්පත්‍රය මගින් අධිකාරිය වෙත පවරා ගෙන තිබුණ අතර, 1986 වසරේ සිට මේ දක්වා වසර 39ක් ගත වුවද පවරා ගත් භූමියෙන් අක්කර 20ක් පමණ කුමන හෝ භාවිතයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. තවද මෙම ඉඩමෙහි අනවසර පුද්ගලයින් පදිංචි වීම හා ඔවුන් ඉවත් කිරීමට නීතිමය පියවර ගැනීමට සිදු වීම, අනවසර ලෙස කසල බැහැර කිරීම

මත විවිධ සෞඛ්‍ය ගැටළු මතුවීම, ඉඩම් කැළෑ බවට පත් වී තිබීම සහ විවිධ සමාජ අපචාර සඳහා යොදා ගැනීම වැනි ගැටළුකාරී තත්ත්වයන්ද උද්ගතව පැවතුණු බව නිරීක්ෂණය විය.

**බොරැල්ල නගර මධ්‍යයෙහි පිහිටි පොලිස් දෙපාර්තමේන්තුවට ලබා දී ඇති ඉඩම**

1949 වර්ෂයේ සිට ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් පොලිස් දෙපාර්තමේන්තුවේ පරිහරණය සඳහා ලබා දී තිබූ බොරැල්ල නගර මධ්‍යයෙහි පිහිටි අක්කර 04 රූඩ් 02 පර්චස් 17.09කින් යුත් ඉඩමෙන් පර්චස් 37.5ක ඉඩම් කොටස පදික වෙළඳුන් සඳහා තාවකාලික කඩකාමර ඉදිකර දීම සඳහා අධිකාරිය විසින් පවරා ගෙන තිබුණි. නමුත් ඉඩම් ආඥාපනතේ 6(1) වන වගන්තිය ප්‍රකාරව පොලිස් දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබා ගැනීමකින් තොරව භාණ්ඩාගාරයේ රු.මිලියන 27.6ක අරමුදලක් උපයෝජනය කර කඩකාමර 95කින් සමන්විත දෙමහල් ගොඩනැගිල්ලක් 2002 වර්ෂයේදී ඉදිකර තිබුණි. එහෙත් මෙම කඩකාමර දිගුකාලයක් වසා දමා ඇති බවත්, ඇතැම් කඩකාමරවල අනවසර ලෙස පදිංචිව විවිධ විෂමාචාරවලට යොදාගන්නා බවත්, වෙළඳ සංකීර්ණය ඇතුළත හා පිටත කැලි කසළ පවතින බවත් නිරීක්ෂණය විය.

**මීතොටමුල්ල නාගරික උද්‍යානය ඉදිකිරීම**

මීතොටමුල්ල පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ නාගරික උද්‍යානයක් ඉදිකිරිම සඳහා 2017 වර්ෂයේදී නායයාමකට ලක් වූ කසල කන්ද ස්ථායීකරණය කිරීම සඳහා බිලැන්කට් ලේයරයක් යෙදීම හා හරිතාගාර වායු විමෝචන ඒකක ස්ථාපනය කිරිමේ කොන්ත්‍රාත්තුව 2020 ජූනි 09 දින රු.මිලියන 269.5කට පෞද්ගලික ආයතනයක් වෙත ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 441.74ක් අධිකාරිය විසින් දරා තිබූ නමුත් සැලසුම් කළ පරිදි උද්‍යානයක් ඉදිකර නොතිබූ අතර ස්ථායීකරණය කරන ලද කසල පිහිටි ස්ථානය වර්තමානය වන විට වල් බිහි වී අතහැර දමා තිබෙන බවත් මෙම ස්ථානයේ ස්ථාපිත කිරීමට සැලසුම්කරණ ලද අපජලය බැහැර කිරීමේ පද්ධතියෙන් සියයට 30ක් පමණක් සහ වායු විමෝචන පද්ධතියෙන් සියයට 25ක් පමණක් වැඩ නිමකර තිබූ බවටත් නිරීක්ෂණය විය.

**අවිස්සාවේල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පවරා ගත් ඉඩම් නිෂ්කාර්යව පැවතීම**

අවිස්සාවේල්ල නගර සංවර්ධනය යටතේ, අධිකාරිය වෙත පවරා ගෙන තිබූ අක්කර 43ක වපසරියකින් යුතු ඉඩමෙන් අක්කර 33ක් පවරා ගෙන වසර 26 ගෙවී තිබුණද, කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පවතින බවටද කැලෑ වැවී තිබීමත් කුණුකසල බැහැර කිරීම හා විවිධ සමාජ අපචාර සඳහා යොදා ගැනීමද අනවසර වගාකිරීමද නිරීක්ෂණය විය. තවද ඉඩම් අත්කරගැනීමේ සාමාන්‍ය පරිපාටියෙන් බැහැරව 38 (අ) අතුරු වගන්තිය යටතේ මෙම ඉඩම් කඩිනමින් පවරා ගැනීම හේතුවෙන් ඉඩම්හිමියන්ගේ වන්දි මුදලට අමතරව රු.මිලියන 14.99ක පොලී මුදලක් ගෙවීමටද අධිකාරියට සිදු වී තිබුණි.

**අක්‍රිය කුලීහිමියන්**

2025 පෙබරවාරි 28 දිනට ක්‍රියාකාරී කුලීහිමියන් 4,670කින් 3,551ක් එනම්, මුළු කුලීහිමියන්ගෙන් සියයට 76ක් පමණ ගිවිසුම් ප්‍රකාරව නියමිත කුලී මුදල් නොගෙවීම මත අක්‍රීය කුලී හිමියන් ලෙස පවතින බව නිරීක්ෂණය විය.

**වාහන පරිපාලනය**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියට අනුව අධිකාරිය නමින් ලියාපදිංචි නමුත් භෞතිකව නොපවතින වාහන 23ක් වූ අතර එයින් වාහන 03ක් අස්ථානගත වී ඇති බවටත්, තොරතුරක් සොයා ගත නොහැකි වාහන 20ක් ඇති බවටත් විගණනයට හෙළිදරව් විය.

## ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

**සැමට සෙවණ ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය**

ආදර්ශ ගම්මාන වැඩසටහන යටතේ ගම්මාන 2,562ක නිවාස 64,407ක් ඉදිකිරීම ආරම්භ කර තිබූ අතර එයින් ඉඩම් ගැටළු හා වෙනත් හේතු මත නිවාස 18,696ක ඉදිකිරීම් සීමා කර තිබුණි. මෙම වැඩසටහන් සඳහා රු.මිලියන 34,890.72ක මුදලක් ඇස්තමේන්තුගත කර තිබූ අතර 2025 මැයි 31 දින වන විට ගම්මාන 383ක් පමණක් විවෘත කර තිබුණි. ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවාස වලින් 16,171ක් පමණක් නිම කර තිබූ අතර නිවාස 29,540ක් අවිච්ඡේදව පවතී.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06ක ග්‍රාම නිලධාරී වසම් 50ක ආදර්ශ ගම්මාන 100ක නිවාස 2,283 ඉදිකිරීම් 2016 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර ඒ සඳහා ප්‍රතිපාදිත මුදල රු. මිලියන 1,212ක් විය. 2024 ජූලි 31 දින වන විට එයින් රු. මිලියන 457ක මුදලක් පමණක් නිදහස් කර තිබුණු අතර ගම්මාන 16ක් පමණක් සම්පූර්ණයෙන් ඉදිකර විවෘත කර තිබුණි.

**නිවාස ව්‍යාපෘති යටතේ ලබා දෙන ලද ණය ආපසු අයකර නොගැනීම**

වර්ෂ 1984-1989 කාල වකවානුවේදී ක්‍රියාත්මක කර තිබූ වැඩසටහනක් වන නිවාස දස ලක්ෂය වැඩසටහන යටතේ ලබා දී තිබූ ණය මුදල්වලින් රු. මිලියන 277ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් අයවිය යුතුව පැවතුණි. තවද 1990-1992 වර්ෂවල ක්‍රියාත්මක කරන ලද නිවාස පහළොස් ලක්ෂයේ වැඩසටහන යටතේ ලබා දුන් ණය මුදල්වලින් 2024 දෙසැම්බර් 31 දින වන විට වසර 32ක් ගත වී ඇතත් රු. මිලියන 188ක් අයකර ගැනීමට නොහැකි වී පැවතුණි.

## ඉන්දියානු ආධාර ග්‍රාමශක්ති ආදර්ශ ගම්මාන ඉදිකිරීම

2017 වසරේ ක්‍රියාත්මක කල දීප ව්‍යාප්ත ඉන්දියානු ආධාර ග්‍රාමශක්ති ආදර්ශ ගම්මාන ඉදිකිරීම පිළිබඳ 2024 ජූලි 31 දිනට ප්‍රගතිය පහත පරිදි වේ.

**වගු අංකය 2.32 - ග්‍රාමශක්ති ආදර්ශ ගම්මාන ඉදිකිරීම් වැඩසටහනේ 2024 ජූලි 31 දිනට ප්‍රගතිය**

| | ව්‍යාපෘතිය | ප්‍රතිපාදනය රු.මිලියන | ඇස්තමේන්තුගත නිවාස සංඛ්‍යාව | 2024 ජූලි 31 දිනට ප්‍රගතිය | | අවිච්ඡේද නිවාස සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | | | | රු.මිලියන | නිවාස සංඛ්‍යාව | |
| i. | දීප ව්‍යාප්ත නිවාස ව්‍යාපෘතිය | 300 | 600 | 296 | 497 | 103 |
| ii. | දකුණු පළාත් ග්‍රාම ශක්ති ආදර්ශ ගම්මාන | 300 | 600 | 213 | 99 | 501 |
| iii. | උතුරු පළාත් ග්‍රාම ශක්ති ආදර්ශ ගම්මාන | 300 | 600 | 178 | 129 | 471 |
| iv. | හම්බන්තොට දිස්ත්‍රික්කය | 300 | 600 | 128 | 23 | 577 |

**මූලාශ්‍රය: ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු**

මේ අනුව 2024 දෙසැම්බර් 31 දින වනවිටත් මෙම වැඩසටහනේ ප්‍රමාණවත් ප්‍රගතියක් ලබා නොතිබූ බව නිරීක්ෂණය විය.

## ඕෂන් වීව් ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම

**දෙල්කඳ ඉඩම විකිණීම**

සමාගම විසින් 2018 වර්ෂයේදී මිලදී ගෙන තිබූ දෙල්කඳ පිහිටි පර්චස් 100 ක ඉඩමක නිවාස 70කින් සමන්විත සහාධිපත්‍ය නිවාස ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කර තිබුණු නමුත් 2024 වර්ෂය අවසානය දක්වා එම සැලසුම් ක්‍රියාත්මක කර නොතිබුණු අතර අදාළ ඉඩම විකිණීමට 2023 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබුණි.

**කහතුඩුව නිවාස ව්‍යාපෘතිය අදියර II**

කහතුඩුව අදියර II ව්‍යාපෘතිය යටතේ නිවාස 36ක් ඉදිකිරීමට යෝජනා කර තිබුණද ඉන් නිවාස 11ක වැඩ පමණක් 2021 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. එමෙන්ම කහතුඩුව නිවාස ව්‍යාපෘතිය අදියර I යටතේ 2016 ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවාස 11න් නිවාස 07ක් පමණක් විකුණා අවසන් කර තිබුණ අතර නිවාස අංක 25 හා 26 වැඩ අවසන් කර තිබුණද විකිණීමට නොහැකි වී තිබුණි. ව්‍යාපෘතිය ආරම්භ කර වසර 09ක් ඉක්මවා තිබුණද 2024 වර්ෂය අවසන් වන විටද නිවාස අංක 08 හා 09 හි වැඩ අවසන් කිරීමට නොහැකි වී තිබුණි.

**නුවරඑළිය මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම**

සමාගමට හා නුවරඑළිය මහනගර සභාවට හිමිකාරීත්වයක් නැති අක්කර 01 සහ පර්චස් 44.68ක ඉඩමක මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා නුවරඑළිය මහ නගර සභාව හා ඕෂන් වීව් ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම ද්විපාර්ශවික ගිවිසුමකට 2016 වර්ෂයේදී එළඹ තිබුණි. ඒ සඳහා සමාගම විසින් 2016 වර්ෂයේ සිට 2019 ජූනි දක්වා පස පරීක්ෂාව, මූලික සැලසුම් පිළියෙල කිරීම, ප්‍රචාරණ කටයුතු, මිනුම් කටයුතු හා වෙනත් වියදම් සඳහා එකතුව රු. 10.95වියදමක් දරා තිබුණි. එසේම 2022 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 10ක් වෙන්කර තිබුණද 2024 වර්ෂය අවසානය දක්වා ඉඩම නිරවුල් කර ගැනීමට හා ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි.

## සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

**නිරවුල් කර නොතිබුණු පැමිණිලි**

අධිකාරිය වෙත ලැබී තිබුණු පැමිණිලිවලින් 55 ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණු අතර මෙයින් පැමිණිලි 04ක් ලැබී වසර 07කට වැඩි කාලයක්ද, පැමිණිලි 15ක් ලැබී වසර 03-07 ත් අතර කාලයක්ද, පැමිණිලි 22ක් ලැබී වසර 01-03 ත් අතර කාලයක් ගත වී තිබුණි. මෙම පැමිණිලි අතර, අනවසර ඉදිකිරීම් සම්බන්ධ පැමිණිලි 20ක්, ජල කාන්දුවීම් සම්බන්ධ පැමිණිලි 10ක් හා දේපල පිඹුරු ලියාපදිංචි නොකිරීම සම්බන්ධ පැමිණිලි 14 ක්ද විය.

**කළමනාකරණ සංස්ථා පිහිටුවීම**

සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කළ දින සිට මාස 03ක් ඇතුළත කළමනාකරණ සංස්ථා පිහිටුවීම සිදුකළ යුතු අතර ඒ අනුව 2024 වර්ෂය තුළ රාජ්‍ය අංශයේ කළමනාකරණ සංස්ථා 04ක් හා පෞද්ගලික අංශයේ කළමනාකරණ සංස්ථා 35ක් පිහිටුවීමට ඉලක්ක කර තිබුණි. එසේ වුවද 2024 වර්ෂය අවසානයේදී රාජ්‍ය අංශයේ එක් කළමනාකරණ සංස්ථාවක්වත් හෝ පිහිටුවා නොතිබුණු අතර පෞද්ගලික අංශයේ කළමනාකරණ සංස්ථා 03ක් පමණක් පිහිටුවා තිබුණි.

## ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

**ජාතික භෞතික සැලසුම පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම**

දෙපාර්තමේන්තුව ස්ථාපිත කර වසර 24කට වැඩි කාලයක් ගත වුවත් ජාතික භෞතික සැලසුම පිළියෙල කර ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වී තිබුණි

**ප්‍රාදේශීය භෞතික සැලසුම්**

2024 වර්ෂය තුළදී මධ්‍යම, ඌව සහ නැගෙනහිර යන පළාත් 3 සඳහා ප්‍රාදේශීය භෞතික සැලසුම් සකස් කිරීමට හා මධ්‍යම පළාතේ සංවේදී පරිසරයක් සඳහා උපදේශන මාලාවක් සකස් කිරීමට සැලසුම් කර තිබුණද අදාළ කටයුතු සම්පූර්ණ කර නොතිබුණි.

**කාර්යභාරයන් ඉටු නොකිරීම**

අනුරාධපුර පූජා නගර භූමියේ ජනාවාස ව්‍යාප්තිය සීමා කිරීම හා අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා ලෝලුගස්වැව නගර නිර්මාණ ව්‍යාපෘතිය 2006 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජනා සම්මත වී තිබු

නමුත් එය නිසි ලෙස සිදු නොවීම නිසා 2016 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල තීරණයකින් නැවත අනුමත කර ගෙන තිබුණි. ඒ අනුව 2017 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු.මිලියන 1,053ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. එයින් රු.මිලියන 13.5ක් එනම් සියයට 1ක් පමණක් 2024 වැය කර ව්‍යාපෘති කාර්යාලය පමණක් ඉදිකර තිබුණි. මේ අනුව වසර 08ක් ගත වුවද අපේක්ෂිත අරමුණට ළඟා වීමට නොහැකි වී තිබු අතර නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙළ කිරීම සඳහා රාජ්‍ය ආයතන 04කින් උපදේශකවරු බඳවා ගැනීමට තීරණය කර තිබු නමුත් එම කටයුතු නිසි පරිදි සිදු නොවීම මත එම කාර්යයද අසාර්ථක වී තිබුණි.

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

**නිවාස යෝජනා ක්‍රම පිහිටි ඉඩම් පවරා නොගැනීම**

ඉඩම් පවරාගැනීමේ කටයුතු අවසන් නොවීම හා සභාධිපත්‍ය සහතික ලබා ගැනීම ප්‍රමාද වීම මත 2024 වර්ෂය අවසාන වන විට අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබූ පුනස්ථාපන පදනම සහ විකුණුම් පදනම මත ඉදිකරන ලද නිවාස ඒකක 1,719 කින් නිවාස ඒකක 1,115 ක් සඳහා නිවාසහිමියන් වෙත ඔප්පු ලබා දීම සිදුකර නොතිබුණි.

**අධිකාරියේ නිලධාරීන්ට නිවාස ලබා දීම**

2020 දෙසැම්බර් 22 දිනැති අමප/20/1844/306/055 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රජයේ තක්සේරුකරුගේ තක්සේරු වටිනාකමට සියයට 20ක අගයක් එකතු කර විකුණුම් මිල තීරණය කර නිවාස ඒකක බැහැර කළ යුතු වුවද, ඊට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් අනුව නිවසක විකුණුම් මිල ලෙස රජයේ තක්සේරුව පමණක් අයකර අධිකාරියේ නිලධාරීන් 24 දෙනෙකු සඳහා නිවාස ලබා දීම හේතුවෙන් රජයට රු. මිලියන 20.68ක මුදලක් අහිමි වී තිබුණි. තවද 2024 වර්ෂය අවසානයට අධිකාරියේ කාර්ය මණ්ඩලයට විකුණන ලද නිවාස ඒකක වලින් රු. මිලියන 92.09ක් අධිකාරියට ලැබිය යුතුව තිබුණි.

**ලුනාව නිවාස ව්‍යාපෘතියේ නිවාස බිත්තිවලින් ජලය කාන්දු වීම**

සැලසුම් කිරීමේ හා ගොඩනැගීමේ (Design and Build) ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරනු ලැබූ මොරටුව ලුනාව නිවාස ව්‍යාපෘතිය ජනතා අයිතියට පත්කර මාස 06ක් ඉකුත් වීමත් සමගම එම

නිවාසවල බිත්තිවලින් ජලය කාන්දු වන බවට පැමිණිලි ලැබී තිබුණි. එහෙත් ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු වූ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් හා රු. මිලියන 6.43ක් ගෙවා ව්‍යාපෘති කළමනාකරු වූ රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවෙන් මෙම දෝෂයන් සඳහා කිසිදු මුදලක් අයකර ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.

**අධිකාරියට අහිමි වූ බදු ආදායම**

අධිකාරිය සතුව පවතින බදු දීමෙන් බදු ආදායම් උපයාගත හැකි රු.මිලියන 44.78ක් වටිනා සහස්පුර වාණිජ ඒකක 67ක් හා වටිනාකම හඳුනාගෙන නොතිබූ සේවා ඒකක 57ක් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත නිදහස් දීමනා පදනමට අධිකාරිය යටතේ ඇති කළමනාකරණ සංස්ථාවකට බැහැර කිරීම හේතුවෙන් එම බදු ආදායම් අධිකාරියට අහිමි වී තිබුණි.

## ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLDCC)

**රත්ගම සංවර්ධන ව්‍යාපෘතිය ප්‍රතිපාදන නොමැතිව ක්‍රියාත්මක කිරීම**

2021 ජූලි 28 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 8403 මඟින් රත්ගම නගර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී තිබුණද මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව අනුමැතිය ලබා ගෙන නොතිබුණි. කෙසේ වෙතත් 2022 මැයි 05 දින පැවති අමාත්‍ය මණ්ඩල සංදේශ සමාලෝචන කමිටු මගින් දැනුම් දී ඇති පරිදි මෙම ව්‍යාපෘතිය රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා වන ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව ව්‍යාපෘතිය ඉදිරියට කර ගෙන යන්නේ නම් භාණ්ඩාගාරයේ අරමුදල් භාවිතා නොකොට වෙනත් මූලාශ්‍රයන් භාවිතා කර අරමුදල් සපයා ගන්නා ලෙස දන්වා තිබූ අතර, 2023 ජූලි 24 දිනැති ලිපිය මගින්ද සංස්ථාව විසින් මෙම ව්‍යාපෘතියට අදාළ මූල්‍ය ප්‍රතිපාදන සලසාගත යුතු බවත් මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවන ලෙසට කටයුතු කරන ලෙසත් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී තිබුණි.

කෙසේ වෙතත් එම උපදෙස් නොතකා වැය විෂය අංක 123-02-21-002-2506 මගින් ගංවතුර පාලන ක්‍රියාකාරකම් වන කොළඹින් පිටත ජලාපවහන වැඩිදියුණු කිරීම සහ නාගරික භූමි අලංකරණය යන කාර්යයන් සඳහා වෙන් කරන ලද මුදලින් රු.මිලියන 458.09ක් සංස්ථාව විසින් මෙම ව්‍යාපෘතියේ වියදම් පියවා ගැනීමට භාවිතා කර තිබුණි. ඒ අනුව සංස්ථාව සහ අමාත්‍යාංශය විසින් වාර්ෂික අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන වෙන් නොවූ කාර්යයක් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව මෙම මුදල් වැය කර තිබුණු බව නිරීක්ෂණය විය. මෙම බිල්පත් අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම පිළිබඳ විගණනයේදී ගැටළුකාරී විය.

**කොතලාවල අන්තර් හුවමාරුව ආශ්‍රිතව රේඛිය උද්‍යානයක් ඉදිකිරීම**

වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන සලසා ගැනීමකින් තොරව ඉහළ කළමනාකරණයේ අභිමතය පරිදි 2020 දෙසැම්බර් 15 දින ආරම්භ කර තිබූ අතුරුගිරිය කොතලාවල අධිවේගි මාර්ග අන්තර් හුවමාරුව ආශ්‍රිතව රේඛිය උද්‍යානයක් ඉදිකිරීමේ සහ ජලාපවහන වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා සංසථාවේ මුදල් රු. මිලියන 195.03ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා වූ අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් පරිදි ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව ව්‍යාපෘති යෝජනාව සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණි. ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂය අවසානය දක්වා රු.මිලියන 3.06ක පමණ නඩත්තු වියදමක් දැරීමටද සංස්ථාවට සිදු වී තිබුණි. තවද 2023 ජූනි 20 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව අතුරුගිරිය රේඛිය උද්‍යාන ව්‍යාපෘතිය වෙනුවෙන් සංස්ථාව වැය කරන ලද රු.මිලියන 195.03ක වටිනාකම අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කිරීමකින් තොරව ආයතන සමාජ වගකීම් වියදමක් ලෙස 2023 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කර තිබුණි.

**විකුණුම් මුදල් ඒකාබද්ධ අරමුදලට බැර නොකිරීම**

සංස්ථාවට නිදහස් රඳවා ගැනීමේ පදනම මත (Free Hold Basis) රජය විසින් ලබා දී තිබූ මුතුරාජවෙල පිහිටි අක්කර 02ක පමණ ඉඩම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විකිණීමෙන් පසු ඒ සඳහා දැරූ

සංවර්ධනය කිරීමේ වියදම් අයකර ඉතිරි මුදල රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කල යුතු විය. එම ඉඩම 2019 දෙසැම්බර් 17 දින රු. මිලියන 272.62කට විකුණා තිබු නමුත් අදාළ සංවර්ධන වියදම වූ රු. මිලියන 21.02ක් අඩුකර, ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වූ ඉතිරි රු. මිලියන 251.60ක් 2025 මැයි දක්වාම බැරකර නොතිබු අතර එම වගකීම් හඳුනා ගෙන ඒ සඳහා මූල්‍ය ප්‍රකාශන තුළ වෙන් කිරීම්ද සිදුකර නොතිබුණි.

**මැදමුලන අනුස්මරණ මධ්‍යස්ථානය ඉදිකිරීමේ පාඩු හා අලාභ**

මැදමුලන අනුස්මරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් අයවිය යුතු බවට අධිකරණය වෙත වාර්තා කළ හා සංස්ථාවේ ගිණුම්වල දැක්වුණු වටිනාකම අතර වෙනස රු. මිලියන 47.37ක් විය. එම වියදම ව්‍යාපෘතිය වෙනුවෙන් නොදැරූ වියදමක් ලෙස හඳුනා ගෙන තිබීම හේතුවෙන් එම අමතරව වැයකළ වියදම සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂා කර ඒ සඳහා වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතු වුවත් ඊට පටහැනිව මු.රෙ.113 ප්‍රකාරව මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2021 ජූනි 28 දිනැති අංක MRW/5404 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගත් තීරණයට අනුව පොත්වලින් කපා හැරීම සඳහා සංස්ථාව විසින් කටයුතු කර තිබුණි.

**බේරේ වැව පිරිසිදු කිරීම සඳහා යන්ත්‍ර මිලදී ගැනීම**

රොන් මඩ ඉවත් කර බේරේ වැව පිරිසිදු කිරීම සඳහා වූ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් අයවැය ඇස්තමේන්තුව මගින් 2019 වර්ෂයේදී රු.මිලියන 800ක භාණ්ඩාගාර ප්‍රතිපාදන සලසා දී තිබු අතර එයින් රු. මිලියන 530ක් යන්ත්‍ර උපකරණ ප්‍රසම්පාදනයට වෙන් කර තිබුණි. එම වෙන්කළ මුදලින් යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා රු.මිලියන 310කට ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය හිමිව තිබුණද ඊට පටහැනිව ප්‍රසම්පාදනයට අදාළ ප්‍රතිපාදන සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත යන්ත්‍රසූත්‍ර මිලදී ගැනීම සඳහා රු.මිලියන 434.48කට අවිධිමත් ආකාරයට කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. එමෙන්ම එක් යන්ත්‍රයක් සඳහා මුදල් ගෙවීමට ප්‍රමාද වීම හේතුවෙන් රු.මිලියන 10.89ක අමතර පොළී මුදලක් ගෙවීමට සිදු වී තිබුණි. උක්ත ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී රජයට දැරීමට සිදු වූ අලාභය

සම්බන්ධයෙන් ඊට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීමට කටයුතු කරන ලෙස අමාත්‍ය මණ්ඩල ලේකම්වරයාගේ 2021 අප්‍රේල් 09 දිනැති ලිපිය මගින් දන්වා තිබූ නමුත් 2024 දෙසැම්බර් දක්වා ඒ සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීමට පියවර ගෙන නොතිබුණි. තවද, මෙසේ මිලදී ගන්නා ලද යන්ත්‍ර අතරින් රු.මිලියන 330.09ක් වටිනා යන්ත්‍ර 02ක් වසර 5ක කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

**වැලි කැණීම සහ පොම්ප කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව අවිධිමත් ලෙස අවසන් කිරීම**

ඉදිකිරීම් කර්මාන්තය සඳහා වැලි සැපයීම සඳහා වෙරළෙන් ඔබ්බෙහි පිහිටි මුහුදු වැලි කියුබික් මීටර් මිලියන 4ක් කැණීම සහ පොම්ප කිරීම සඳහා සංස්ථාව 2018 වර්ෂයේදී විදේශීය පෞද්ගලික සමාගමක් සමඟ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. එසේ වුවද ගිවිසුම්ගත විෂය පථය සම්පූර්ණ කර ගැනීමට පෙර සාධාරණ හේතුවකින් තොරව ඉහළ කළමනාකාරීත්වය විසින් සිය අභිමතය පරිදි 2020 අප්‍රේල් 10 දින ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණි. එහිදී ගිවිසුම කඩකිරීම හේතුවෙන් සංස්ථාවට දැරීමට සිදු වන මූල්‍ය අලාභ පිළිබඳ සලකා බැලීමක් සිදුකර නොතිබුණි. ව්‍යාපෘතිය සඳහා වැය වන අමතර පිරිවැය, කොන්ත්‍රාත්කරු විසින් ඉටුකළ යුතු කාර්යයන් සම්බන්ධයෙන් ගිවිසුම් කොන්දේසි පරිදි කොන්ත්‍රාත්කරුට නිසි පරිදි උපදෙස් ලබා නොදීම, කොන්ත්‍රාත්කරු සමඟ පැවති ලිඛිත ගිවිසුම අවසන් වීමට ප්‍රථම කොන්ත්‍රාත්කරුවා වෙනත් ව්‍යාපෘතියකට නිදහස් කිරීම වැනි කරුණු කෙරෙහි සංස්ථාව අවධානය යොමු නොකිරීම විගණනයේදී ප්‍රශ්නකාරී විය. මේ සම්බන්ධයෙන් අගතියට පත් පාර්ශවය විසින් බේරුම්කරණයට යොමුව තිබූ අතර එම තීන්දුව මගින් අදාළ විදේශිය පෞද්ගලික සමාගමට එ.ජ.ඩොලර් 2,073,976ක් (රු.මිලියන 753.08ක්) වන්දි ලෙස ගෙවීමට සංස්ථාවට නියම කර තිබුණි. ඒ අනුව සංස්ථාව විසින් 2022 මූල්‍ය ප්‍රකාශවල සම්පූර්ණ මුදල ගෙවිය යුතු වන්දි ලෙස හඳුනා ගෙන තිබුණි. ඊට අමතරව සංස්ථාව විසින් කොන්ත්‍රාත්කරු වෙනුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවන ලද ආදායම් බදු මුදල් එ.ජ.ඩොලර් 181,484.21ක් (රු.මිලියන 60.2) අඩුකර ගැනීමෙන් අනතුරුව, කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු වන්දි මුදල සහ අවසාන බිල්පතට අදාළව එ.ජ.ඩොලර් 4,035,777.18ක් (රු.මිලියන

1,338.87ක්) 2023 නොවැම්බර් මාසයේදී කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. මෙලෙස විශාල වන්දි මුදලක් ගෙවීමට සිදුවීම සංස්ථාවේ ද්‍රවශීලතාවයට අහිතකර ලෙස බලපාන බව නිරීක්ෂණය විය. කෙසේ වුවද සංස්ථා නිලධාරීන් නොසැලකිලිමත් ලෙස කටයුතු කිරීම නිසා එළඹ තිබූ ගිවිසුමේ කොන්දේසි පරිදි මෙම වන්දි මුදල ගෙවීමට සිදුව තිබූ නමුත් මේ සඳහා වගකිව යුතු වූ පාර්ශව හඳුනා ගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි හා පාඩු සම්බන්ධයෙන් අදාළ බලධාරීන් වෙත දැනුම් දී නොතිබූ අතර අදාළ පාඩුව සම්බන්ධ සිදුකළ යුතු මූලික හා ද්විතික පරීක්ෂණ 2024 වර්ෂය අවසාන වන විටත් පවත්වා නොතිබුණි.

**අනවසර ඉඩම් ගොඩකිරීම් පාලනය කිරීම හා අධීක්ෂණය**

1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 2(ආ) 1 වගන්තිය අනුව දිවයින පුරා පළාත් මට්ටමින් පිහිටි පහත් වගුරු බිම්, නිසරු හෝ මඩ ඉඩම් හඳුනා ගෙන අනවසර ඉඩම් ගොඩකිරීම් පාලනය කිරීම හා අධීක්ෂණය කිරීමට හැකිවන පරිදි ඒවා ගැසට් නිවේදන මගින් ප්‍රසිද්ධ කිරීමට සංස්ථාව වෙත බලය පවරා තිබුණද 2024 වර්ෂය අවසානයට සංස්ථාව විසින් එලෙස ගැසට් කරන ලද පළාත් ගණන 07කට සීමා වී තිබුණි. මායිම් ගැසට් කර තිබුණු ප්‍රදේශවල සිදු වන අනවසර ගොඩකිරීම් හා අනවසර පදිංචිවීම් වැළැක්වීමටද සංස්ථාව අපොහොසත් වී තිබුණි. එමෙන්ම ඉහත පනතේ 8 (අ) වන වගන්තිය අනුව ගොඩකිරීමට හා සංවර්ධනය කිරීමට පවරා ගනු ලබන ඉඩම්, සංස්ථාව විසින් ගොඩනැගිලි ඉදිකිරීමට, කර්මාන්ත වාණිජ්‍ය හා කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් වැඩිදියුණු කළ යුතු වේ. එලෙස සංස්ථාව විසින් 1995 වර්ෂයේදී සංවර්ධන කටයුතු සඳහා පවරා ගත් මුතුරාජවෙල හා මුදුන් ඇල ප්‍රදේශවල ඉඩම් අක්කර 800ක ප්‍රමාණයෙන් 2024 වර්ෂය අවසාන වනවිට වර්ෂ 29 ක කාලයක් ඉක්මවා තිබුණද වැඩිදියුණු කළ ප්‍රමාණය අක්කර 400ක් එනම්, සියයට 50ක් වී තිබුණි.

## ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම (REDECO)

**මුහුදු වැලි ඇසුරුම් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අතරමඟ නතර කිරීම නිසා සිදුව තිබූ පාඩු**

ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මව් සංස්ථාවේ කළමනාකරණ තීරණයකට අනුව සමාගම විසින් රු.මිලියන 382.5ක් වැයකර 2018 වසරේ ක්‍රියාත්මක කර තිබූ මුහුදු වැලි ඇසුරුම් කිරීමේ ව්‍යාපෘතිය මව් ආයතනයේ තීරණයක් මත 2020 වර්ෂයේදී අවසන් කර තිබුණි. අදාළ ව්‍යාපෘතිය පවත්වා ගෙන යනු ලැබූ සංස්ථාව සතු ඉඩම සහ වැලි ඇසුරුම් කිරීම සඳහා සමාගම විසින් ඉදිකර තිබූ පිරිවැය රු.මිලියන 301.28ක් වූ ගොඩනැගිල්ල 50 වසරක දිගුකාලීන බදු පදනම මත පෞද්ගලික සමාගමක් වෙත 2021 වර්ෂයේදි මව් සංස්ථාව විසින් බදු ලබා දී තිබුණි. එමෙන්ම ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව චීනයෙන් ආනයනය කරන ලද පෙර සැකසූ වානේ ව්‍යුහයකින් යුත් උක්ත ගොඩනැගිල්ල මව් සංස්ථාව විසින් රු.මිලියන 326.30කට තක්සේරු කර 2021 වර්ෂයේදී පවරා ගෙන තිබුණි. එම තක්සේරු වටිනාකමින් මව් සංස්ථාව විසින් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වැයකිරීමට සමාගමට ලබා දී තිබූ මුදල වූ රු.මිලියන 178.07ක්ද, සංස්ථාව මගින් ලබා දුන් කාරක ප්‍රාග්ධන මුදල වූ රු.මිලියන 40ක්ද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සියයට 12 වාර්ෂික පොළියකට සංස්ථාව මගින් ලබා දුන් රු.මිලියන 200ක ණය මුදලේ පොළිය වූ රු.මිලියන 49.46ක්ද අඩු කිරීමෙන් පසු ඉතිරි රු.මිලියන 58.77ක් පමණක් ඉහත ණය මුදල් සඳහා හිලව් කරගෙන තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකළද තවදුරටත් රු.මිලියන 141.23ක් වූ ණය මුදල් හා වසර 5කින් පසු අදාළ වන පොළියද මව් සංස්ථාවට ගෙවීමට සිදු වී තිබුණි.

තවද, විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව චීනයෙන් ආනයනය කළ පෙර සැකසූ ව්‍යුහයකින් යුත් වානේ සැකිල්ල වෙනුවෙන් හා අදාළ ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් සමාගම වැයකරන ලද මුළු වියදම රු.මිලියන 211.93ක් වූ අතර මෙම වානේ ගොඩනැගිලි සැකිල්ල මිලට ගැනීමේදී සිදු වූ අක්‍රමිකතා පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට සමාගම විසින් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ හා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පැමිණිලි කර ඇති අතර එම පැමිණිලි 2024 වර්ෂය අවසාන වන විටත් විභාග වෙමින් පැවතුණි.

වැලි ඇසුරුම් කිරීම සඳහා රු.මිලියන 13.79ක් වැයකර පොලිසැක් බෑග් 500,000ක් චීනයෙන් ආනයනය කර තිබූ අතර එම වර්ගයේම බෑග් දේශීය සැපයුම්කරුවකුගෙන් රු.මිලියන 12.13කට මිලදී ගත හැකිව පැවති නමුත් ඉදිරිපත් කරන ලද සාම්පල්වල ආයතනයේ නම මුද්‍රණය කර නොමැති බව දක්වමින් එම ලංසු ප්‍රතික්ෂේප කර තිබුණි. කෙසේ වුවද ආනයනය කර තිබූ බෑග්වලද ආයතනයේ නම මුද්‍රණය කර නොතිබූ බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් රු.මිලියන 1.67ක අලාභයක් සමාගමට දැරීමට සිදු වී තිබුණු නමුත් ඒ පිළිබඳ වගකිව යුතු පුද්ගලයන් නිශ්චය කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මිලදී ගන්නා ලද පොලිසැක් බෑග්වලින් වැලි ඇසුරුම් කිරීම සඳහා බෑග් 5,355ක් පමණක් භාවිතා කර තිබුණු අතර තවත් බෑග් 54,000ක් මුදල් අයකර ගැනීමකින් තොරව මව් සංස්ථාව වෙත විකුණා තිබුණි. බෑග් 1,645ක් අපතය ලෙසද බෑග් 2,595 ක් වෙනත් කාර්යයන් සඳහා ද භාවිතා කර තිබුණු අතර ඉතිරි බෑග් 436,405ක් ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමකින් තොරව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක්ද රහිතව සාමාන්‍යාධිකාරිතුමාගේ අනුමැතිය මත රු.මිලියන 5.88කට 2022 වර්ෂයේදී විකුණා දමා තිබූ අතර මේ අනුව වැලි ඇසුරුම් බෑග් මිලදී ගැනීමේ ගනුදෙනුවෙන් රු.මිලියන 7.74කට අධික අලාභයක් සමාගමට සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය.

## එල්. ආර්.ඩී.සී. සේවා සමාගම (LRDC)

**එකතු කළ අගය මත නොගෙවීම**

සමාගමට 2025 ජුනි 24 දින වන විට රු.මිලියන 140.26ක එකතු කළ අගය මත බදු ගෙවිය යුතුව පැවති අතර ඒ හේතුවෙන් එකතු කළ අගය මත බදු පනත අනුව දඩ මුදල් හා පොළී මුදල රු.මිලියන 50.26ක් වුයෙන් ගෙවිය යුතු මුළු වටිනාකම රු.මිලියන 190.52ක් විය. එකතු කළ බදු වටිනාකම සමාගමේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා යොදා ගැනීම මෙම තත්ත්වයට සෘජුව බලපා තිබුණි.

**අධි මිලදී ගැනීම**

අලෙවිය සඳහා සමාගම විසින් 2018 වර්ෂයේදී ඩොලර් 49,537.90කට (රු.මිලියන 8.73) මිලදී ගෙන තිබූ CCTV උපකරණ 1,669 කින් 2024 වර්ෂය තුළ උපකරණ 278ක් පමණක් අලෙවි කර

තිබූ අතර රු.මිලියන 2.28ක් වටිනා ඒකක 547ක් 2024 වර්ෂය අවසාන වන විටත් ඉතිරිව පැවතුණි.

වෙළඳපලෙහි අවශ්‍යතාවය පිළිබඳව නිවැරදිව හඳුනා නොගෙන 2018 වර්ෂයේදී රු.මිලියන 2.34ක ආනයනය කර තිබූ Hand Held Metal Detectors with Chargers 1,000කින් ඒකක 481ක් හා රු. මිලියන 6.77ක් වැය කර ආනයනය කරන ලද අයිතම 8කට අදාළ ඒකක 731ක ආරක්ෂක උපකරණ 2024 වර්ෂයේදී ද අලෙවි කිරීමට නොහැකිව තිබුණි. භාණ්ඩ අලෙවි කිරීමට නොහැකි වීම හේතුවෙන් හා තාක්ෂණික යල් පැනීම් හේතුවෙන් 2021 වර්ෂයේදී එම උපකරණවලින් රු.මිලියන 5.18ක තොග කපාහැරීමක් සිදු කර තිබුණි. තවද මෙම ගනුදෙනුව සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණයක්ද 2021 වර්ෂයේ සිට සිදු වෙමින් පවතින නමුත් සමාගම විසින් එම ගනුදෙනු සම්බන්ධ කිසිදු පරීක්ෂණයක් සිදු කර නොතිබුණි.

# ඉදිකිරීම් සහ ඉංජිනේරු

ඉදිකිරීම් හා ඉංජිනේරු අංශය ප්‍රධාන ප්‍රාග්ධන වත්කම් හා යටිතල පහසුකම් ගොඩනගන්නා වන හෙයින් අනිකුත් අංශයන්හී වර්ධනයට ශක්තිමත් පදනමක් සපයනු ලබයි. ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය 2024 වර්ෂය තුලදී මෑත කාලීනව අත්විඳින ලද අයහපත් තත්ත්වයන් මඟහැර නැවත ගොඩනැගෙමින් හා සෙමින් යථාතත්ත්වයට පත්වෙමින් පැවතුනි. ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවට හා එහි ප්‍රකාශනවලට අනුව 2023 වර්ෂයේ ඉදිකිරීම් අංශයේ එකතු කළ අගය වූ සියයට 21.8ක සෘණ අගය 2024 වර්ෂයේ සියයට 7.3ක් දක්වා වැඩි වී තිබුණි. තවදුරටත් සැලසුම් අධියරේ සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ඇති වූ ප්‍රමාදයන් වළක්වා මෙම නැගීම අඛණ්ඩව පවත්වා ගැනීමට රාජ්‍ය හා පෞද්ගලික මහා පරිමාණ ව්‍යාපෘති කඩිනම්ව ක්‍රියාත්මක කළ යුතු වේ.

ඉදිකිරීම් සහ ඉංජිනේරු අංශයට ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව, ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය සහ ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව යන ආයතන 07 නාගරික සංවර්ධන හා නිවාස ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේද, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සහ මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේද රාජ්‍ය ඉදිකිරීම් සහ නිර්මාණ නීතිගත සංස්ථාව ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේද ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් යටතේද ක්‍රියාත්මක වී තිබුණි.

## ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

**පනතේ අරමුණු ඉටු නොකිරීම**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති කාර්යයන් අතරින් පනතේ 33 වගන්තියට අනුව විදේශීය උපදේශකවරුන් අධිකාරියේ ලියාපදිංචිවීම සඳහා ලියාපදිංචිවීමේ ක්‍රියා පටිපාටි නියම කිරීම, පනතේ 51 වන ඡේදය ප්‍රකාර කාර්මික ආරවුල් තීරකකරණයට අදාල ක්‍රියාපටිපාටි සකස් කිරීම සහ පනතේ 55 වන වගන්තියට අනුව තොරතුරු ලේකම් කාර්යාලයක් ස්ථාපිත කර එහි කර්තව්‍ය හා කාර්යය පටිපාටි සහ කාර්යයසාධන ප්‍රමිති නියම කිරීම යන කාර්යයන් ඉටු කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

උක්ත පනතේ 46 වගන්තිය පරිදි අධිකාරිය විසින් සම්මත ලංසු ලේඛන (Standard Bidding Documents) පිළියෙල කළයුතු වුවද, ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය විසින් පිළියෙල කර තිබුණු ලංසු ලේඛන SBD – 03 (ප්‍රසම්පාදන - වැඩ - Minor), SBD – 02

(ප්‍රසම්පාදන - වැඩ - Major), SBD - 04 (සැලසුම් හා ඉදිකිරීම් - Design and Build) කාලීනව සංශෝධනය කර නොතිබුණි.

**නව බදු ගිවිසුම්වලට නොඑළඹීම**

(අ) අධිකාරියේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම ටවර් හෝල් රඟහල පදනමට අයත් වූ අතර එහි ගොඩනැගිල්ල ටවර් හෝල් රඟහල මඟින් ඉදිකර නොතිබුණි. එම ගොඩනැගිල්ලේ මෙම කාර්යාලය පවත්වා ගැනීමට කලින් බදු ගිවිසුමේ වටිනාකමට සමානව රු.මිලියන 6කට නැවතත් වසර 30ක් සඳහා 2023 වර්ෂයේ දී ද එම පදනම සමඟ ගිවිසුම් ගත වී ගෙවීම් කර තිබුණි. කුලී මුදල සංශෝධනය නොවීම සම්බන්ධයෙන් පසුකාලීනව ලබා දුන් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ටවර් හෝල් රඟහල පදනම වෙත රු.මිලියන 145ක හිඟ බදු මුදලක් ගෙවීමට අධිකාරියට සිදු වී තිබුණ ද, එම අගය ගණනය කළ ආකාරය පැහැදිලි කර නොතිබුණි. ඒ අනුව දැනට පවතින බදු ගිවිසුම අවලංගු කිරීම, සංශෝධනය කිරීම හෝ නව ගිවිසුමකට එළඹීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත රු.මිලියන 25 ක අත්තිකාරම් මුදලක් 2024 සැප්තැම්බර් 06 දින අධිකාරිය විසින් ගෙවා තිබුණි.

(ආ) අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානයේ ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට අයත් වන අතර අධිකාරිය විසින් ඒ තුළ ඉදිකරන ලද ගොඩනැගිලිවල පිරිවැය රු.මිලියන 306.15ක් විය. මෙම ඉඩම සම්බන්ධයෙන් විධිමත් බදු ගිවිසුමකට එළඹීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි. එසේම ගල්කුලම පිහිටි අධිකාරියේ මෙහෙයුම් ශිල්පී පුහුණු පාසල (OTC) හා කතරගම සංචාරක බංගලාව පිහිටි ඉඩම් සඳහා ද අදාළ පාර්ශවයන් සමග මෙතෙක් නිශ්චිත බදු ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

**අපේක්ෂිත පරිදි නිපුණ ශිල්පීන් බිහි නොකිරීම**

ඉදිකිරීම් යන්ත්‍ර පුහුණු විදුහලේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රජය 2018 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු. මිලියන 163.37ක ප්‍රතිපාදනයක් ලබා දී තිබුණු අතර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රයට යොමුකරන නිපුණ ශිල්පීන් ප්‍රමාණය 1000 ඉක්මවීමට

බලාපොරොත්තු වුවද 2024 වර්ෂයේ පුහුණු පාඨමාලා 10ක් මඟින් නිපුණ ශිල්පීන් 577ක් පමණක් බිහි කර තිබුණි. ඒ අනුව රජය විසින් අවශ්‍ය පහසුකම් සපයා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණ ඉටු වී නොතිබුණි. තවද සැලසුම් කර තිබූ පුහුණු වැඩ සටහන් 11ක් පමණ වර්ෂ කිහිපයක සිටම පවත්වා නොතිබුණ අතර ක්‍රියාකාරී සැලැස්ම අනුව ඇතැම් පුහුණු වැඩසටහන් සඳහා ලද ආදායම මෙන්ම සහභාගී වූ පිරිසද අඩු මට්ටමක පැවතුණි. ඒ අනුව ඇතැම් පාඨමාලාවන් පැවැත්වීමෙන් වියදම ආවරණය කර ගැනීමට ප්‍රමාණවත් ආදායමක් ද ලැබී නොතිබුණි.

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

**වත්කම් පවරා නොගැනීම**

දෙපාර්තමේන්තුව සතු දියතලාව ඉඩම ප්‍රාදේශීය ලේකම් විසින් පවරා ගෙන ඇති අතර ඒ වෙනුවට හපුතලේ ඉබ්බන් ආර ප්‍රදේශයේ ඉඩමක් ලබාදීමට නියමිත බව දන්වා තිබුණ ද, ඔප්පු ලබා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. තවද, කල්බදු ක්‍රමය යටතේ මිලදී ගත් වටිනාකම රු. මිලියන 30.4 ක වාහන 04 ක් කල්බදු කාලය අවසන් වී පැවතුණද දෙපාර්තමේන්තුවට අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**දේපල පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික නිකුත් කිරීම**

2018 අගෝස්තු 15 දිනැති 2018 අංක 23 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනතෙහි 3.(3)(1) උපවගන්තිය ප්‍රකාරව සහාධිපත්‍ය දේපළ ලියාපදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික කරමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලිඛිත ප්‍රකාශයක් එම සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කරන අවස්ථාවේදී නිකුත් කළ යුතුය. මෙය පනත ආරම්භ වන දින සිට වසර පහක කාලසීමාවක් සඳහා ක්‍රියාත්මක විය යුතු බව පනතෙහි 2 වන වගන්තිය මඟින් දක්වා තිබුණු අතර 2023 අගෝස්තු 18 දින වන විට එම කාල සීමාව අවසන් වී තිබූ නමුත් දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වීමේ ප්‍රමාදය හේතුවෙන් මෙම ක්‍රියාදාමය සම්පූර්ණ කර නොතිබුණි.

## රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

**නිල නිවාස අවභාවිතය**

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ සේවක නිල නිවාස පිහිටි සංහිඳ සෙවණ මහල් නිවාස සංකීර්ණයේ නිවාස 60කින් යුත් මහල් 06ක් පරීක්ෂා කිරීමේදී නිවාස වසා දැමීම නිසා නිවාස 33ක් පරීක්ෂා කර නොතිබූ අතර පරීක්ෂා කල නිවාස 27න් නිවාස 06ක් කුලියට ලබා දී ඇති බව නිවාස පරීක්ෂණ මණ්ඩලය වාර්තා කර තිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6.4 ඡේදය ප්‍රකාරව නිවාස අතුරු බදු දීම, මුදල් ගෙවා නවතින අමුත්තන් සහ නේවාසිකයන් තබා ගැනීම තහනම් බව දක්වා ඇතත් නිල නිවාස හිමි නිලධාරීන් තිදෙනෙකු නිවාස කුලියට ලබා දී ඇති බව හඳුනාගෙන තිබුණද ඔවුන් පදිංචියෙන් ඉවත් කිරීම හෝ විනයානුකූලව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි.

**ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 22.20ක් තැපැල් දෙපාර්තමේන්තුවෙන් අයකරගෙන තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 10ක පමණ පහල මට්ටමක පැවතුණි. ඉදිකිරීම් ආරම්භ කර වසර 06ක කාලයක් ගත වූවද ව්‍යාපෘතිය නිමකර දීමට හෝ ලද මුදල් ආපසු ගෙවීමට හෝ කටයුතු කර නොතිබුණි.

**තොග පාලනය**

රජයේ කර්මාන්තශාලාවේ පැවති පැරණි පරිගණක මෘදුකාංග පද්ධතියෙහි දුර්වලතා හේතුවෙන් අක්‍රමවත්ව ක්‍රියාත්මක වූ තොග පාලනය, තොග ඇණවුම් කිරීම, මිලදී ගැනීම්, ඇස්තමේන්තු සැකසීම ආදී කටයුතු නිසියාකාරව ක්‍රියාත්මක කිරීම සඳහා පැවති පද්ධතිය වැඩි දියුණු කිරීම වෙනුවෙන් රු.මිලියන 2.95ක් 2021 දෙසැම්බර් 31 දින පුද්ගලික ආයතනයකට ගෙවා තිබුණි. පරිසණක මෘදුකාංග පද්ධතිය මඟින් යලි ඇනවුම් මට්ටමේදී ගබඩා ඇනවුම ස්වයංක්‍රියව නිර්මාණය වී අනුමැතිය සඳහා ඉදිරිපත් වන බවට පිරිවිතරයන්හි දක්වා තිබුණද එම කාර්යය පද්ධතියෙන් සිදු වී නොතිබුණි.

**මානව සම්පත් කළමනාකරණය**

2024 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුවී ඇති තනතුරු 477ක පුරප්පාඩු පිරවීමට හෝ අවශ්‍යතාවයන්ට අනුව තනතුරු සංඛ්‍යාව සංශෝධනය කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

## සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව

**වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් නොකිරීම**

සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව විසින් 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

සමාගම විසින් භාවිතා කරනු ලැබූ පරිගණක සර්වර් යන්ත්‍රය 2019 වර්ෂයේ දී වෛරස් ආක්‍රමණයක් හේතුවෙන් අක්‍රීය වූ බවත් එම අවස්ථාවේ දත්ත උපස්ථවල (Backups) ගබඩා කර නොතැබීම හේතුවෙන් ගිණුම් පිළියෙල කිරීමට අවශ්‍ය තොරතුරු නොමැති වීම සම්බන්ධයෙන් 2022 අප්‍රේල් 19 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග මත 2022 අප්‍රේල් 28 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කර තිබුණද එහි වර්තමාන තත්ත්වය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**උපායමාර්ගික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම**

වර්ෂ 03කට නොඅඩු කාලයක් සඳහා උපායමාර්ගික සැලැස්මක් හා ඊට අනුරූපීව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර සෑම මුදල් වර්ෂයක් ආරම්භ වීමට දින 15කට පෙර අදාළ සැලසුම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ කර නොතිබුණි.

**අග්‍රාමාත්‍ය/ පස්වන විධායක ජනාධිපති නිල නිවසේ අළුත්වැඩියා හා නවීකරණ කටයුතු**

2021 ඔක්තෝබර් 26 දිනැති අංක අමප 21/1779/302/002/-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අග්‍රාමාත්‍ය/ පස්වන විධායක ජනාධිපති නිල නිවසේ අළුත්වැඩියා හා නවීකරණ කටයුතු සඳහා අනුමැතිය ලබා දී තිබුණි.

මෙම නවීකරණ කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් සහ ගිවිසුම්ගතවීමක් නොමැතිව රු.මිලියන 10 ක මුදලක් ගෙවමින් ගෘහ නිර්මාණ ශිල්පියෙකු තෝරාගෙන තිබුණි. තෝරාගනු ලැබූ ගෘහ නිර්මාණ ශිල්පිගේ වාචික උපදෙස් මත ව්‍යාපෘතියට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට ඔහු විසින් නම් කරනු ලැබූ සැපයුම්කරුවන් 16 දෙනෙකුගෙන් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීමෙන් තොරව ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ ගැනුම් ඇනවුම් මත ද්‍රව්‍ය මිලදී

ගෙන මෙම නිල නිවාස ව්‍යාපෘතියට නිකුත් කර ඒවා සංස්ථාව නමින් ඉන්වොයිස් කර තිබුණි.

සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද වාර්තා අනුව 2023 දෙසැම්බර් 31 දිනට නවීකරණ කටයුතු වෙනුවෙන් සැපයුම් කරන ලද භාණ්ඩ වෙනුවෙන් මුදල් අයකර ගැනීම සඳහා රු.මිලියන 639.22ක් වූ ඉන්වොයිස් 590ක් අග්‍රාමාත්‍ය ලේකම් වෙත නිකුත් කර තිබූ අතර එයින් රු.මිලියන 554.58ක් අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රතිපාදන මත ඒකාබද්ධ අරමුදලින් ප්‍රතිපූරණය කර තිබුණි. රු.මිලියන 84.64ක් 2024 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රතිපූරණය කර නොතිබුණි.

**වත්කම් කළමණාකරනය**

(අ) මොරටුව, අනුරාධපුර හා අම්පාර ප්‍රදේශවල පිහිටි සමාගම යටතේ ඇති අක්කර 3 රූඩ් 3, පර්චස් 37 ක ඉඩම් වෙනුවෙන් ඔප්පු ලබාගෙන නොතිබුණි.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කොට එම වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**අනුමත කාර්ය මණ්ඩලයක් නොමැති වීම**

සේවක සංඛ්‍යාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවාගෙන නොතිබුණි.

**මුදල් පොත් සහ බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල නොකිරීම**

2024 වර්ෂය සඳහා ආරම්භක හා අවසාන ශේෂයන් සඳහන් කරමින් මුදල් පොත් පවත්වාගෙන ගොස් නොතිබූ අතර ලැබීම් හා ගෙවීම් මුදල් පොත් ලෙස වෙන වෙනම ලේඛණයන් පවත්වා තිබුණි. තවද සක්‍රීය බැංකු ගිණුම් 04ක් සඳහා නිසිපරිදි බැංකු සැසඳුම් පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව

**ඉංජිනේරුවරුන්ගේ වෘත්තීමය වැරදි හැසිරීම් පරීක්ෂා නොකිරීම**

ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීය වැරදි හැසිරීම්වලට අදාළව යම් කාරණා පිළිබඳව පරීක්ෂණ පැවැත්විය යුතු වුවද ඉංජිනේරු වෘත්තියේ නියැලෙන වෘත්තිකයන් විසින් අනුගමනය කළ යුතු බවට හඳුන්වා දී තිබූ වෘත්තීය ආචාරධර්ම අනුව ඉංජිනේරුවන් විසින්

කටයුතු සිදු කරන්නේද යන්න පිළිබඳ හඳුනාගැනීමට හා පරීක්ෂා කිරීමට අදාලව අභ්‍යන්තර පටිපාටින් හඳුන්වාදී නොතිබුණි.

**ඉංජිනේරු සභාවේ සාමාජිකයින් ලියාපදිංචි කිරීම**

2017 අංක 04 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනතේ 14 (1) වගන්තිය අනුව එම පනතේ 15 වන හෝ 18 වන වගන්තිය යටතේ ඉංජිනේරු වෘත්තිකයකු ලෙස ලියාපදිංචි වී ඇත්නම් මිස එම ඉංජිනේරු වෘත්තිකයා ඉංජිනේරු වෘත්තිය හා සම්බන්ධ කටයුතුවල නියැලීම සිදු නොකළ යුතුය. ඒ අනුව ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) හා ශ්‍රී ලංකා ව්‍යවස්ථාපිත ඉංජිනේරු ආයතනය (IIESL) යන ආයතන දෙකෙහි ලියාපදිංචි සාමාජිකයින් ඉංජිනේරු සභාවේ සාමාජිකයින් ලෙස ලියාපදිංචි කිරීමට යෝජිතව ඇති අතර ඉහත ආයතන දෙකෙහි 2024 වර්ෂයේ ඉංජිනේරු වෘත්තියේ නියැලෙන 29,891 ක් සාමාජිකත්වය ලබාගෙන තිබූ නමුත් ඉන් 17,072 ක් එනම් සියයට 57.11 ක් පමණක් ඉංජිනේරු සභාවේ ලියාපදිංචිය ලබාගෙන තිබුණි.

වගු අංකය **2.33 - 2024** වර්ෂයේ **IESL/IIESL** හා සභාවේ ලියාපදිංචි ඉංජිනේරු සංඛ්‍යාව

| කාණ්ඩය | IESL/IIESL ක්‍රියාකාරී සමාජික සංඛ්‍යාව | සභාවේ ලියාපදිංචි සංඛ්‍යාව | සභාවේ ලියාපදිංචි ප්‍රතිශතය |
|---|---|---|---|
| වරලත් ඉංජිනේරු | 6,708 | 5,340 | 80 |
| ආශ්‍රිත ඉංජිනේරු | 13,162 | 9,267 | 70 |
| අනුබද්ධ ඉංජිනේරු | 113 | 93 | 82 |
| සංස්ථාගත ඉංජිනේරු | 2,079 | 572 | 28 |
| ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන් | 7,829 | 1,800 | 23 |
| | **29,891** | **17,072** | **57** |

මූලාශ්‍රය - වාර්ෂික වාර්තාව **2024** - ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව

## ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය

**උපායමාර්ගික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම**

මණ්ඩලයේ නියම කරන ලද අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එහි උපායමාර්ගික සැලැස්ම සකස් කළයුතු අතර අවසන් කරන ලද උපායමාර්ගික සැලැස්ම සමඟ ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය ඉදිරිපත් කළ යුතු වුවද, මණ්ඩලය විසින් පනතේ සඳහන්

කාර්යභාරයන් ඉටු කරන ආකාරය දැක්වෙන උපායමාර්ගික සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ කාර්යයන්වල ප්‍රගතිය සමාලෝචනයට අදාළ දත්ත මණ්ඩලය සතුව නොතිබුණි.

**අනුමත ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා නොගැනීම**

සේවයේ යෙදවිය යුතු සේවක සංඛ්‍යාව තීරණය කිරීම, සේවකයන් පත් කිරීම, උසස් කිරීම සේවයෙන් ඉවත් කිරීම සහ විනය ක්‍රියාමාර්ග ගැනීම මෙන්ම වැටුප් , දීමනා සහ පාරිතෝෂික ලබා දීම මණ්ඩලයේ වගකීමක් වුවද මණ්ඩලයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා දක්ෂ හා ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම සඳහා අනුමත කාර්යය මණ්ඩලයක් හා බඳවා ගැනීමේ සහ උසස්වීම් පටිපාටියක් සකස් කර නොතිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් සියලුම නිලධාරීන් සහ සේවකයන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති අතර ඉන් නිලධාරීන් 16 දෙනෙකුගේ කොන්ත්‍රාත් කාලය 2024 දෙසැම්බර් 31 දිනට වසර 01 සිට 18 දක්වා විහිදී තිබුණි.

## ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

**අලාභ වාර්තා කිරීම**

2024 වර්ෂයේ ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) අංශයේ මෙහෙයුම් ලාභය රු.මිලියන 86.49ක් වුවද, එහි ඇති අංශ 13න් 7ක සමාලෝචිත වර්ෂය සඳහා එකතුව රු.මිලියන 34.34ක මෙහෙයුම් අලාභයක් වාර්තාකර තිබුණි. තවද උපදේශන අංශයේ සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 72.49ක මෙහෙයුම් ලාභයක් වාර්තා කර තිබුණද, එහි ඇති අංශ 20න් 8ක එකතුව රු.මිලියන 130.47ක මෙහෙයුම් අලාභයක් වාර්තා කර තිබුණි.

**ණයගැති ශේෂ අයකර නොගැනීම**

2024 වර්ෂය අවසානයේ මුළු ණයගැති ශේෂය රු.මිලියන 5,188.58ක් වූ අතර එහි ඇතුළත් ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) අංශයේ වර්ෂ 3–5 අතර ණයගැති ශේෂයන් සහ වර්ෂ 5 ඉක්මවූ ණයගැති ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 200.29ක් සහ රු.මිලියන 1342.39ක් විය. උපදේශන අංශයේ වර්ෂ 3–5 අතර සහ වර්ෂ 5 ඉක්මවූ ණයගැති ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 658.45ක් සහ රු.මිලියන 130.94ක් විය. ඒ අනුව කාර්යාංශයට ලැබිය යුතු ණයගැති මුදල් කාලීනව එකතු කර ගැනීමට කටයුතු කර නොතිබුණු

අතර, සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.මිලියන 40.99ක් හා රු.මිලියන 14.85ක් වූ වෙළඳ ලැබිය යුතු දෑ සහ රාජ්‍ය ආයතන 8ක ව්‍යාපෘති 10කින් ලැබිය යුතු ශේෂයෙන් හානිකරණ අලාභ ලෙස වෙන්කර තිබුණි. මෙම ශේෂයන් අයකර ගැනීමට විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

**ණයහිමි ශේෂ නොගෙවීම**

2024 වර්ෂය අවසානයේ මුළු ණයහිමි ශේෂය රු.මිලියන 2,103.68ක් වූ අතර එහි ඇතුළත් ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) අංශයේ වර්ෂ 3–5 අතර ණයහිමි ශේෂයන් සහ වර්ෂ 5 ඉක්මවූ ණයහිමි ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 162.76ක් සහ රු.මිලියන 696.83ක් ද, උපදේශන අංශයේ වර්ෂ 3–5 අතර ණයහිමි ශේෂයන් සහ වර්ෂ 5 ඉක්මවූ ණයහිමි ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 3.89ක් සහ රු.මිලියන 40.08 ක් විය. ඒ අනුව කාර්යාංශය විසින් ණයහිමි ශේෂ කාලීනව පියවීමට කටයුතු කර නොතිබුණි.

**දීර්ඝකාලීනව නිරවුල් කර නොගත් අන්තර් ආයතන ශේෂ**

2024 වර්ෂය අවසාන වන විට පරිපාලිත සමාගමෙන් රු.මිලියන 1,569.4ක් කාර්යාංශයට ලැබිය යුතුව පවතින අතර මේ සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර නිසි සහ යාවත්කාලීන ගිවිසුම් පවත්වාගෙන ගොස් නොතිබුණි. මෙම ශේෂය නිරවුල් කිරීමට හෝ ආයතනයන්හි ඉදිරි ගනුදෙනු මෙහෙයවීම සම්බන්ධයෙන් කිසිදු ඵලදායි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර 2017 වසරේ සිට අඛණ්ඩව මෙම ශේෂය ඉහළ ගොස් තිබුණි.

**මූල්‍ය අක්‍රමිකතා හා අවභාවිතාවන්**

කාර්යාංශයට අයත් පරිපාලිත සමාගමේ අනුරාධපුර මෙහෙයුම් කාර්යාලයේ 2016 ජනවාරි 01 සිට 2020 ජුනි 22 දක්වා සිදුව ඇතැයි සැලකෙන විෂමාචාරයන් හේතුවෙන් පරිපාලිතය විසින් ප්‍රධාන මෙහෙයුම් ඉංජිනේරුවරයාව 2021 ජනවාරි 11 දින සිට වැඩ තහනමකට ලක් කර තිබුණු නමුත් සමාගමේ සභාපතිවරයා විසින් 2021 මැයි 24 දිනැති ලිපියෙන් අදාළ නිලධාරියා වැඩ තහනමට ලක් කළ දිනය වූ 2021 ජනවාරි 11 දින සිටම මෙම කාර්යාංශයේ සේවකයකු ලෙස නැවත සේවයේ පිහිටුවා තිබුණි. ඒ සම්බන්ධයෙන් කාර්යාංශය හෝ පරිපාලිත සමාගම කිසිදු විමර්ශනයක් සිදු නොකිරීම තුළින් මූල්‍ය අක්‍රමිකතා හා අවභාවිතයන් අවම කර ගැනීමට නිසි අධිකාරීන් විසින් කටයුතු කර නොතිබුණි.

**නිරවුල් කර නොගත් ලැබිය යුතු හා ගෙවිය යුතු රඳවා ගැනීම් ශේෂ**

කාර්යාංශය විසින් කාලානුරූපව ව්‍යාපෘති පසුවිපරම් කර රඳවාගැනීම් මුදල් නිදහස් කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.මිලියන 2,712.45ක ලැබිය යුතු රඳවා ගැනීම් ශේෂය තුල වසර 3 සිට 5 දක්වා රු.මිලියන 691.21ක් ද, වසර 05ට වැඩි රු. මිලියන 944ක්ද පැවතුණි. එමෙන්ම වර්ෂය අවසානයට ජංගම වගකීම් යටතේ පෙන්වනු ලබන ගෙවිය යුතු රඳවා ගැනීම් ශේෂය රු.මිලියන 2,392.75ක් වූ අතර මෙම ගෙවිය යුතු රඳවා ගැනීම් ශේෂය තුළ වසර 3 සිට 5 දක්වා වූ රු.මිලියන 756.86ක් සහ වසර 05ට වැඩි රු.මිලියන 574.52ක් නිරවුල් කර නොතිබුණි.

**නිරවුල් නොකල ලැබිය යුතු හා ගෙවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්**

සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු හා ගෙවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් (Mobilization Advance) පිළිවෙලින් රු.මිලියන 2,245.99ක් හා රු.මිලියන 2,643.84ක් වූ අතර, එහි ඇතුළත් වසර 05ට වැඩි ලැබිය යුතු හා ගෙවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් පිළිවෙලින් රු.මිලියන 643.07ක් හා රු.මිලියන718.53ක් මේ දක්වා නිරවුල් වී නොතිබුණි.

**වත්කම් ඌණ උපයෝජනය**

කාර්යාංශය සතු වාහන 43ක් භාවිතයට නොගෙන විවිධ ස්ථානවල ගාල් කර තිබුණු අතර, ඒවා අලුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ අපහරණය කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

**අනුමැතිය නොමැති දීමනා ගෙවීම**

සමාලෝචිත වර්ෂය තුළ කාර්යාංශයේ සේවයේ නියුතු වෘත්තිකයින් 186 දෙනෙකු සඳහා තම පෞද්ගලික වාහන භාවිතා කර තම වාසස්ථානයේ සිට කාර්යාලය වෙත යෑම සහ ඒම වෙනුවෙන් භාණ්ඩාගාර අනුමැතිය රහිතව 2011 දෙසැම්බර් 22 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත එකතුව රු.මිලියන 29.90ක් ප්‍රවාහන දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.

**නිසි ලෙස ගිවිසුම් පවත්වා නොගැනීම**

වැටුප් රහිත නිවාඩු මත විදේශගතවීම් වෙනුවෙන් කාර්යාංශය සමඟ නිළධාරීන් 13 දෙනෙකු එකතුව රු.මිලියන 17.08ක බැඳුම්කර ගිවිසුම් ඇතිකර ගෙන තිබුණු අතර බැඳුම්කර ගිවිසුම් කඩකල නිළධාරීන් 08 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.මිලියන 6.56ක් අයකර ගැනීමට කාර්යාංශයට නොහැකි වී තිබුණි.

**අන්තර් ආයතන ශේෂය තුල ඇතුලත් හිඟ ණය ශේෂ**

කාර්යාංශයේ ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් අංශයට (EPC) අයත් මූලික කාර්යාල 12ක් විසින් පරිපාලිත සමාගමේ මූලික කාර්යාල වෙත අවස්ථා 15කදී තාවකාලික ණය (Temporary loans) ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට පැවති රු.මිලියන 766.34ක මුළු ණය මුදල තුළ එකතුව රු.මිලියන 526.80ක් වසර 2 සිට 4 දක්වා ද එකතුව රු.මිලියන 260.14ක් වසර 5ක් ඉක්මවා අයවිය යුතුව පැවතුණි. මෙම ණය මුදල් ආපසු අයකර ගැනීමේ සැලැස්මක් සකස් කර නොතිබුණි.

## මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික ) සමාගම

**හිඟ ණයගැති ශේෂ**

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අනුව, මුළු ණයගැති ශේෂය රු. මිලියන 3049.96ක් වූ අතර එයින් රු.මිලියන 313.43ක් සහ රු. මිලියන 152.85ක් පිළිවෙළින් වසර 03-05 අතර කාලයක් සහ වසර 05කට වැඩි කාලයක් හිඟව පවතින නමුත් එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**අභ්‍යන්තර පාලනයේ දුර්වලතා**

මනා වැඩ බෙදීමක් (Segregation of duty) නොමැති වීම ERP මුරපද රහස්‍ය නොවීම හා දකුණු පළාත් මූලික කාර්යාලයේ ගිණුම් අංශයේ පැවති අභ්‍යන්තර පාලනයේ දුර්වලතා හේතුවෙන් එහි ගබඩා සහකාරවරයෙකු ලෙස කටයුතු කළ නිළධාරියෙක් විසින් 2021 ජනවාරි 01 දින සිට 2024 ජූනි 13 දින දක්වා කාලපරාසය තුල සමාගමට අයත් බැංකු ජංගම ගිණුම් හතරකින් එකතුව රු.මිලියන 50.06ක මුදලක් වංචා කර ලබාගෙන තිබුණු බව සමාගමේ ප්‍රධාන විධායක නිලධාරිවරයා විසින් පත්කරන ලද මූලික විමර්ශන කමිටුවක් මගින් අනාවරණය කරගෙන තිබුණු අතර වගකිව යුතු

පාර්ශවයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග සහ විනය ක්‍රියාමාර්ග ගැනීමට සමාගම විසින් කඩිනමින් කටයුතු කර නොතිබුණි.

**ගිවිසුම් ප්‍රකාර ක්‍රියා නොකිරීම**

2023 පෙබරවාරි 28 දින ශ්‍රී ලංකා හදබිම අධිකාරිය සමඟ ඒකාබද්ධව කුකුල් අභිජනන ව්‍යාපෘතියක් සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන්කර 2025 අප්‍රේල් මස 09 දින ඒකාබද්ධ ව්‍යාපාර ගිවිසුමකට (Joint venture agreement) එළඹ තිබුණි. ගිවිසුම අනුව පළමු වසර 06 තුළ අදාළ කොන්දේසි යටතේ ශුද්ධ ලාභයෙන් සියයට 70ක් සමාගමට හා සියයට 30ක් අධිකාරියට ලෙස ලාභ බෙදාගැනීමට එකඟ වී තිබුණි. හදබිම අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.මිලියන 3.56ක ශුද්ධ ලාභයක් උපයා තිබුණද ගිවිසුම් ප්‍රකාරව සමාගම වෙත ලාභ බෙදීමක් සිදුව නොතිබුණු අතර සමාගම වෙත ලැබිය යුතු ලාභ මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන නොතිබුණි.

එමෙන්ම සමාගම සහ ශ්‍රී ලංකා හදබිම අධිකාරිය ඒකාබද්ධව සිදුකල පල්ලෙකැලේ සහ කොත්මලේ ගොවිපලවල් සඳහා පොලිටනල් ගෘහ හඳුන්වාදීමේ ව්‍යාපෘතිය (Introducing new poly tunnels for vegetable cultivation at Pallekale and Kothmale farms) සම්බන්ධයෙන් 2023 පෙබරවාරි 28 දින අවබෝධතා ගිවිසුමක් අත්සන්කර තිබුණද ඊට අදාල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබුණේ 2023 මාර්තු 18 දින වන අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් දෙපාර්ශවය අතර විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

## ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල

**ඇපකර මුදල් අය නොවීම**

කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්යයසාධනය අඩුවන අවස්ථාවලදී සේවායෝජකයන් ඇපකර මුදල් අරමුදලෙන් ඉල්ලුම් කරන අතර 2024 වර්ෂයේ දී රු. මිලියන 31.80ක් ඇපකර මුදල් කිරීමට අරමුදලට සිදුවී තිබුණි. ඒ අනුව 2024 දෙසැම්බර් 31 දින වන විට සේවායෝජකයන් වෙත අරමුදල විසින් ගෙවා තිබුණු එකතුව රු.මිලියන 102.90ක් නැවත අරමුදලට අයකර ගත නොහැකිව තිබුණි. මේ සම්බන්ධයෙන් බේරුම්කරණය ඇතුළු නීතිමය ක්‍රියාමාර්ගවල තීන්දු අරමුදලේ වාසියට ලැබී තිබුණද අදාල මුදල් අයකර ගැනීමට නොහැකිව තිබුණි.

**කොන්ත්‍රාත්කරුවන් වෙත මුදා නොහරින ලද මාර්ගස්ථ මුදල්**

කිලෝමීටර් 100,000 ක ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් 310කගේ සහතික කරන ලද බිල්පත්වලට ගෙවීම් කිරීම සඳහා ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා අරමුදල වෙත රු.මිලියන 35,080.23ක් ලබාදී තිබුණු අතර එයින් රු.මිලියන 34,449.18ක් පමණක් කොන්ත්‍රාත්කරුවන් වෙත නිදහස් කර තිබුණි. නොගෙවූ මුදලින් රු.මිලියන 157.83ක් 2024 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් මාර්ගස්ථ මුදල් (Transits Money) ගිණුමේ රඳවාගෙන තිබුණි. මෙයින් රු.මිලියන 64.57 ක් වසර 01 - 03ක කාලයක සිටද, රු.මිලියන 19.23ක් වසර 03- 05 ක කාලයක සිටද රඳවාගෙන තිබුණු අතර එහි ඇතුළත් සම්පූර්ණයෙන් වැඩ නිමවා තිබුණු ව්‍යාපෘතීන් 105කට අදාළ රු.මිලියන 51.92ක මුදලද කොන්ත්‍රාත්කරුවන් වෙත මුදා හැර නොතිබුණි. තවද වෙනත් විවිධ පාර්ශ්වයන් විසින් අරමුදල වෙත ලබාදී තිබුණු මුදල්වලින් 2024 දෙසැම්බර් 31 දිනට අදාළ කොන්ත්‍රාත්කරුවන් වෙත පියවා නොතිබූණු මුදල රු.මිලියන 41.69ක් විය.

**ලාභ මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකිරීම**

අරමුදල 1999 වර්ෂයේ දී ආරම්භ කර තිබුණු අතර 2000 සිට 2005 දක්වා කාලය තුළ අවස්ථා හතරකදී මහා භාණ්ඩාගාරයෙන් රු.මිලියන 55ක ප්‍රාග්ධන ප්‍රදානයක් ලබා දී තිබුණි. එහෙත් වාර්ෂික ලාභ මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබූණු අතර 2020 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 949.79ක් වූ රඳවා ගත් ඉපැයීම්වලින් රු.මිලියන 500ක් "යටිතල පහසුකම් සඳහා ප්‍රතිපාදන" නම් සංචිත ගිණුමකට මාරු කර නිෂ්කාර්යව පැවතුණි.

**කළමනාකරණ තොරතුරු පද්ධතිය සකස් කිරීම ප්‍රමාද වීම**

අරමුදල සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) නිර්මාණය කර සංවර්ධනය කිරීම වෙනුවෙන් 2015 වර්ෂයේදී ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමඟ රු.මිලියන 2.98ක වටිනාකමකට ගිවිසුම්ගත වී එකතුව රු. මිලියන 2.08ක් හෙවත් කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 70ක් 2015 සහ 2016 වර්ෂවල දී අදාළ ආයතනය වෙත ගෙවා තිබුණු අතර එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මෘදුකාංග සංවර්ධන අත්තිකාරම් මුදල් ලෙස ජංගම නොවන වත්කම්

යටතේ දක්වා තිබුණි. මුදල් ගෙවා වර්ෂ 09ක් පමණ ගත වුවද 2025 මාර්තු 31 වන දින දක්වාම මෙම කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) සකස් කිරීම අවසන් කර නොතිබුණි.

## රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

**නොගෙවූ ණය මුදල් සහ බදු**

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සංස්ථාව විසින් සංස්ථාවේ දේපළ හා භාණ්ඩාගාර ඇප මත බැංකුවලින් ලබාගෙන තිබෙන රු.මිලියන 1,807.62ක ණය මුදලක්ද, ගෙවිය යුතු එකතු කළ අගය මත බදු රු.මිලියන 1,700.28ක් හා එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකිරීම මත පනවා ඇති අධිභාරය රු.මිලියන1,267.34ක්ද 2024 වර්ෂය අවසානය දක්වාම ගෙවා නොතිබුණි.

**ලැබිය යුතු රඳවා ගැනීම් සහ ලැබිය යුතු ප්‍රමාද ගාස්තු අයකර නොගැනීම**

සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ලැබිය යුතු රඳවාගැනීම් ලෙස රු. මිලියන 574.13ක් දක්වා තිබුණු අතර, එයින් වර්ෂ 03ත් 05ත් අතර ශේෂය රු.මිලියන 237.41ක් ද, වර්ෂ 05ට වැඩි ශේෂය රු.මිලියන 202.80ක්ද විය.

2024 දෙසැම්බර් 31 දිනට සංස්ථාව විසින් ඉටු කරන ලද ව්‍යාපෘති ප්‍රමාදවීම මත බිල්පත්වලින් අඩුකර ගන්නා ලද ප්‍රමාද ගාස්තු (Liquidated Damages) රු.මිලියන 264.26ක් මූල්‍ය ප්‍රකාශන තුල ලැබිය යුතු ශේෂ ලෙස දක්වා තිබුණු අතර එම ශේෂය තුල වර්ෂ 05 ට වැඩි ශේෂය රු.මිලියන 176.35 ක් වන අතර, මෙම ශේෂ අයකර ගැනීමට ඇති හැකියාව අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

**අක්‍රීය වත්කම්**

බෝපිටිය කොන්ක්‍රීට් අංගනය සඳහා රු.මිලියන 11.35ක්වැය කර 2022 වර්ෂයේ දී ඉල්ලුම්කළ පිරිවිතරයන්ට වෙනස් පිරිවිතරයන් සහිතව මිලදීගෙන තිබූ හයිඩ්‍රොලික් පොම්පය සමඟ ස්ට්‍රෙසින් ජැක් යන්ත්‍රයක (Stressing Jack with the Hydraulic Pump) රේගුවෙන් නිදහස් කර ගැනීමට ප්‍රමාද වී තිබුණු අතර, තෙල් කාන්දු වීම හේතුවෙන් මිලදී ගත් දින සිටම භාවිතයෙන් තොරව අක්‍රීය තත්ත්වයෙන් පැවතුණි.

## ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

**සේවක අර්ථසාධක දායක මුදල් නොගෙවීම**

2022 වර්ෂයේ මාර්තු මස සිට 2024 දෙසැම්බර් මස දක්වා සේවා සේවක දායක මුදල් ලෙස රු.මිලියන 69.67ක්ද ඒ මත අධිභාරය ලෙස රු.මිලියන 45.80ක්ද 2006 වර්ෂයේ සිට 2015 වර්ෂයේ ජූලි මස දක්වා ජීවන වියදම් දීමනාව මත සේවා සේවක දායක මුදල් ලෙස රු.මිලියන 61.09ක්ද ඒ මත අධිභාරය ලෙස රු.මිලියන 30.55ක් ද වශයෙන් එකතුව රු.මිලියන 207.11ක් 2024 දෙසැම්බර් 31 දින වන තෙක්ම සේවක අර්ථසාධක අරමුදලට සංස්ථාව විසින් ගෙවා නොතිබුණි.

**සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක මුදල් නොගෙවීම**

2023 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් මස දක්වා දායක මුදල් ලෙස රු.මිලියන 1.39ක්ද 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ජීවන වියදම් දීමනාව මත දායක මුදල් ලෙස රු.මිලියන 12.32ක්ද ඒ මත අධිභාරය ලෙස රු.මිලියන 6.16ක් ද වශයෙන් එකතුව රු.මිලියන 19.87ක් 2024 දෙසැම්බර් 31 දින වන තෙක්ම සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට සංස්ථාව විසින් ගෙවා නොතිබුණි.

**හිඟ බදු නොගෙවීම**

සංස්ථාව විසින් 2013 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා හිඟ ආදායම් බදු සහ අධිභාර එකතුව රු.මිලියන 16.19ක් ද, 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා හිඟ ආර්ථික සේවා ගාස්තු රු.මිලියන 97.75ක් ද, 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ජාතිය ගොඩනැඟීමේ බදු රු. මිලියන 65.21ක් හා ඒ මත පනවන ලද අධිභාර රු. මිලියන 12.57ක් වශයෙන් එකතුව රු.මිලියන 77.78ක් ද, 2010 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ගෙවිය යුතු එකතු කළ අගය මත බදු රු. මිලියන 1,423.33ක් හා ඒ මත පනවන ලද අධිභාරය රු.මිලියන 913.08ක් වශයෙන් එකතුව රු.මිලියන 2,336.41ක් ද 2024 දෙසැම්බර් 31 දින වන විට ගෙවා නොතිබුණි.

**රාජ්‍ය බැංකු වලින් ලබාගත් නොපියවූ ණය ශේෂ**

සංස්ථාව දේපල හා භාණ්ඩාගාර ඇප මත රාජ්‍ය බැංකුවලින් ලබා ගෙන තිබූ ණය මුදල වූ රු.මිලියන 2,877.43ක් හා ඊට අදාලව ගෙවිය යුතු වූ පොලිය රු. මිලියන 1,829.87ක්ද 2024 වර්ෂය අවසානය දක්වාම ගෙවීමට කටයුතු කර නොතිබුණි.

# අධ්‍යාපන

ඕනෑම රටක අනාගත අභිවෘද්ධිය තීරණය කරන ප්‍රධාන සාධකය එරටේ අධ්‍යාපනය සඳහා සිදුකරන ආයෝජනයයි. ශ්‍රී ලංකාවේ සාක්ෂරතාවය බොහෝ දියුණු රටවල් අභිබවා ගොස් තිබුණද, සාම්ප්‍රදායික අධ්‍යාපන රටාවන් තවදුරටත් අනුගමනය කිරීම නිසා ලෝක ශ්‍රම ඉල්ලුමට සරිලන තාක්ෂණික දැනුමක් සහිත ශ්‍රමිකයින් දැනට පවතින අධ්‍යාපන ක්‍රමය තුළින් බිහිකිරීමට නොහැකි වී තිබේ. එම නිසා නවීන අධ්‍යාපන ක්‍රමවේදයන් තුලින් දැනුමෙන් හා තාක්ෂණික හැකියාවෙන් පිරිපුන් සමාජයක් බිහිකිරිම අධ්‍යාපන අංශයේ වගකීමයි. එම වගකිම ඉටුකිරීම අරමුණ කරගත් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තු 02ක් හා ව්‍යවස්ථාපිත ආයතන 02ක් ක්‍රියාත්මකව පැවතුණි. එම ආයතන සඳහා ප්‍රතිපාදිත මුදල් හා වැය කිරීම පිළිබඳ විස්තර පහත පරිදි වේ.

**වගු අංකය 2.34 - 2024 වර්ෂය සඳහා අධ්‍යාපන අංශය සඳහා වූ ප්‍රතිපාදන හා වැය කිරීම්.(රු.මිලියනවලින්)**

| විස්තරය | අධ්‍යාපන අමාත්‍යාංශය | විභාග දෙපාර්තමේන්තුව | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | ජාතික අධ්‍යාපන ආයතනය | ජාතික අධ්‍යාපන කොමිසන් සභාව | එකතුව |
|---|---|---|---|---|---|---|
| ප්‍රතිපාදනය | 171,912 | 11,354 | 176 | 504 | 80 | 184,026 |
| උපයෝජනය | 136,741 | 7,645 | 137 | 504 | 60 | 145,087 |
| ඉතිරිය | 35,171 | 3,709 | 39 | 0 | 20 | 38,939 |
| ඉතිරියේ ප්‍රතිශතය(%) | 20.4 | 32.6 | 22.1 | - | 25 | |

මූලාශ්‍රය - 2024 මූල්‍ය ප්‍රකාශන

**ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් අනුමත කරගෙන නොතිබීම**

1991 අප්‍රේල් 19 දිනැති අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ විධිවිධාන අනුව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන් සකස් කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 1992, 2003, 2016 හා 2021 වර්ෂවලදී අධ්‍යාපන අමාත්‍යාංශයට නිර්දේශ ඉදිරිපත් කර තිබුණු නමුත් 2025 සැප්තැම්බර් 30 දින වනවිටත් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් අනුමත කරගෙන නොතිබුණි.

**ක්‍රීඩා පාසල්වල ක්‍රියාකාරීත්වය**

2025 ජුනි 30 දින වන විට ක්‍රීඩා පාසල් 23ක් අධ්‍යාපන අමාත්‍යාංශයේ ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා ශාඛාව යටතේ පවතින නමුත් ඒ අතරින් පාසල් 06ක් අක්‍රීය තත්ත්වයේ පැවතුණි. එදිනට ක්‍රීඩා පාසල්වල අධ්‍යාපනය ලබන මුළු සිසුන් 799 දෙනෙකු වූ නමුත්

ක්‍රීඩා පාසල් සඳහා සිසුන් බඳවා ගැනීමේදී හා ක්‍රියාත්මක වීමේදී එම සිසුන් දක්ෂතාවය දක්වන ක්‍රීඩාව හඳුනා ගැනීමක් සිදුකර ඊට අදාළ දත්ත පද්ධතියක් පවත්වාගෙන නොතිබුණි.

**චක්‍රලේඛවලට පටහැනිව අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුලත් කිරීම**

2023 අප්‍රේල් 25 දිනැති අංක 17/2023 දරන චක්‍රලේඛයේ 6.0 ඡේදයේ විධිවිධානවලට පටහැනිව හා අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුලත් කල හැකි බාණ්ඩ 07ට සුදුසුකම් නොලබන හා සාධාරණීකරණය කල නොහැකි හේතූන් පදනම් කරගෙන 2024 අප්‍රේල් 25 දින සිට 2024 ජූලි 26 දින දක්වා කාලය තුලදී දිවයිනේ ජනප්‍රිය පාසල් 106කට සිසුන් 528ක් ඇතුලත් කිරීමට අධ්‍යාපන ලේකම්වරයා විසින් කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය.

**හිමි නොවන දීමනා ගෙවීම්**

2024 ජුනි 27 දිනැති අංක 18/2015 (V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 ඡේදයෙහි විධිවිධාන අනුව විදුහල්පති තනතුර දරන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධරයන්ට, විදුහල්පතිවරුන්ට හිමිවන විශේෂ දීමනාව ගෙවිය නොහැකි වේ. එහෙත්, බස්නාහිර පළාතට අයත් කලාප අධ්‍යාපන කාර්යාල 11න් ලබා ගත් තොරතුරු අනුව 2024 ජූලි සිට 2024 දෙසැම්බර් දක්වා කාලය තුළ පාසල් 72ක අධ්‍යාපන පරිපාලන සේවයට අයත් විදුහල්පතිවරුන් 58 දෙනෙකුට විධායක ශ්‍රේණියේ නිලධාරින්ට හිමි විශේෂ දීමනාව සහ විදුහල්පති දීමනාව යන දිමනා වර්ග දෙකම ගෙවීම් කිරීම හේතුවෙන් රු.මිලියන 2ක් වැඩිපුර ගෙවා තිබුණි.

**ක්‍රියාකාරි සැලැස්ම අපේක්ෂිත පරිදි ඉටු නොකිරීම**

ක්‍රියාකාරි සැලැස්ම අනුව 2024 වර්ෂයේ අපේක්ෂිත කාර්යයන් සඳහා වූ මුළු ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 30,095ක් වුවද ප්‍රගති වාර්තාව අනුව සත්‍ය වියදම රු.මිලියන 10,567ක් වී තිබුණි. ඒ අනුව ලබා කර නොගත් ක්‍රියාකාරකම් මුළු ප්‍රතිපාදන ප්‍රමාණයෙන් රු.මිලියන 19,528ක් හෙවත් සියයට 65ක් ඉතිරි වී තිබුණු අතර අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට නොහැකි වී තිබුණි.

**අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත නොකිරීම**

2016 පෙබරවාරි 12 දිනැති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම් නියෝග අංක 09 පරිදි පාසල් සිසුන්ගේ හා ගුරුවරුන්ගේ තොරතුරු ඇතුළත් ක්‍රමවත් පරිගණක පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කරන ලෙස නියෝග කර ඉන් පසුව අවස්ථා 5ක් තුළදී කාරක සභාවේ සාකච්ඡා කර තිබුණු නමුත් 2025 ඔක්තෝබර් 10 දින වන විටත් ක්‍රමවත් ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**සාමාන්‍ය අධ්‍යාපනය ඩිජිටල් පරිවර්තනයකට ලක්කිරීම සඳහා වූ ව්‍යාපෘතිය අරමුණුගත පරිදි ක්‍රියාත්මක නොකිරීම**

සාමාන්‍ය අධ්‍යාපනය ඩිජිටල් පරිවර්තනයකට ලක් කිරීම සඳහා වූ ව්‍යාපෘති යෝජනාවක් යටතේ යෝජිත ඉදිරි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ප්‍රමුඛ පාසල් ලෙස හඳුනා ගන්නා ලද පාසල් 1500 අතුරින් පාසල් 500ක් සඳහා එ.ජ.ඩොලර් මිලියන 20ක චීන ආධාර ලැබීමට නියමිතව තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ පාසල් 500ක් සඳහා සම්ප්‍රේෂණ සුහුරු පුවරු සහිත පන්ති කාමර 450ක් (Delivering class room) ප්‍රතිග්‍රාහක සුහුරු පුවරු සහිත පන්ති කාමර 50ක් (Receiving class room) සහ එම කටයුතු මෙහෙයවීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය තුළ ජාල මෙහෙයුම් ඒකකයක් (Data centre), චිත්‍රාගාරයක් (Studio room) සම්මන්ත්‍රණ කාමරයක් (Conference room) ලබා දීමට අපේක්ෂිතව තිබුණි. එහෙත් එම සුහුරු පුවරු 500ක් වූ චීන ආධාරය ලැබී නොතිබියදී විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වියදමින් රු.මිලියන 1,762ක් වටිනා සුහුරු පුවරු 1,000ක් සහ ඊට අදාල අනිකුත් උපකරණ මිලදී ගැනීම සහ අනිකුත් සේවාවන් රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව හරහා සිදුකර ගැනීමට ලද අමාත්‍ය මණ්ඩල අනුමැතියන් අනුව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ප්‍රසම්පාදනය සිදුකර තිබුණි. 2024 ඔක්තෝබර් 07 දින එම සුහුරු පුවරු 1,000 පත්තලගෙදර ගබඩාවට ලැබී තිබුණු අතර 2025 ජුනි 30 දිනට වසර 03ක වගකීම් කාලයෙන් මාස 09ක් පුරා නිෂ්කාර්යව ගබඩා කර තිබුණි. 2025 ජුනි 30 දින වන විටත් අදාළ ආධාර ලැබී නොතිබුණු නමුත් සුහුරු පුවරු 1000ක් මිලදී ගැනීමේ ක්‍රියාවලිය තුල ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූල

නොවීම්, අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිසි පරිදි තොරතුරු ඇතුලත් නොකිරීම යන අඩුපාඩු සහිතව සිදුකර තිබුණු අතර 2025 ජුනි 30 දින වන විටත් අරමුණු ඉටු කර ගැනීම සඳහා වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

**පිරිවිතර සමග නොගැලපෙන භාණ්ඩ ගබඩාවට භාරගැනීම**

2024 මාර්තු 13,14 හා 15 යන දිනයන්හී දී ගබඩාවට සපයා තිබූ රු.මිලියන 78ක් වූ ලැප්ටොප් පරිගණක 328ක්, ලංසු ඇගයීමේදී ඉදිරිපත් කළ සාම්පල අනුව වූ පිරිවිතරවලට සර්වසම බව පිළිගත නොහැකිව තිබියදී භාරගැනීමට කටයුතු කර තිබුණි. කෙසේ වුවද අදාළ සමාගම මුදල් නොගෙවීම සම්බන්ධයෙන් නඩු පවරා තිබුණු අතර 2025 සැප්තැම්බර් 25 දිනවන විටද එම නඩු කටයුතු අවසන් වී නොතිබුණු අතර රු.මිලියන 78ක් වටිනා ලැප්ටොප් පරිගණක 328 අවුරුදු 01 මාස 07ක පමණ කාලයක සිට ගබඩාවේ නිශ්කාර්යව පැවතුණි.

**ආදි ශිෂ්‍ය සංගම්වල ක්‍රියාකාරිත්වයන්**

වර්තමානයයේදී පාසල් තුළ ක්‍රියාත්මක වන ආදි ශිෂ්‍ය සංගම් විසින් පාසල තුළ පෞද්ගලික ආයතන හරහා පිහිනුම් තටාක හා පාසල් ක්‍රීඩා පිට්ටනි කළමනාකරණය කිරීම, පාසල තුළ සංගීත සංදර්ශන පැවැත්වීම වැනි බොහෝ ක්‍රියාකාරකම් මඟින් පාසලේ සම්පත් / දේපළ භාවිතා කරමින් මුදල් ඉපයීමේ කාර්යයන්හි යෙදී සිටින බව නිරීක්ෂණය වේ. මේ සම්බන්ධයෙන් 2023 දෙසැම්බර් 29 දිනැති 52/2023 චක්‍රලේඛය නිකුත් කලද නිසි අධිකාරියක් සිදු නොකිරීම හේතුවෙන් චක්‍රලේඛය උල්ලංඝනය වන අවස්ථා පවතින නමුත් වර්තමානයට ගැලපෙන ලෙස ආදි ශිෂ්‍ය සංගම් ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පොදු උපදෙස් ඇතුළත් කර චක්‍රලේඛයක් නිකුත් කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

**ඉසුරුපාය ගොඩනැගිලි සංකීර්ණයේ 7 සහ 8 මහල ඌන උපයෝජනය**

ඉසුරුපාය ගොඩනැගිලි සංකීර්ණය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ 6, 7 සහ 8 මහල් ඉදිකිරීමේ කටයුතු සම්බන්ධයෙන් එකතුව රු.මිලියන 459ක් වූ ගිවිසුම්ගත වටිනාකමක් සහිත, 2014 හා 2018 වර්ෂවල වැඩ ආරම්භ කර තිබුණු ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 2ක් විගණිත දිනය වූ 2025 මාර්තු 31 දින වන විට වැඩ අවසන් නොකර අතරමග නවතා දමා තිබුණි. තවද, 2020 දෙසැම්බර් 28 දින ශබ්ද

විකාශන පද්ධතියක් (Sound system) සහ ශ්‍රවණාගාර පුටු 859ක් සඳහා එකතුව රු.මිලියන 21ක් ගෙවීම් කර තිබුණු අතර, එම උපකරණ ලබාගෙන වසර 5ක පමණ කාලයක් ගත වී තිබුණද, අදාළ ඉදිකිරීම් කටයුතු අවසන් නොවී ඇති බැවින් එම උපකරණවල වගකීම් කාලය අවසන් වීම, උපකරණවලට හානි වීම මෙන්ම තාක්ෂණිකව යල්පැනීම සිදුවෙමින් පැවතුණි.

**වෙනිවැල්කොළ විශේෂ අධ්‍යාපන ආයතනයේ ක්‍රියාකාරිත්වය**

2013 සැප්තැම්බර් 05 දින අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹ තිබුණු තීරණය අනුව 2015 වර්ෂයේ සිට 2024 වර්ෂය අවසානය දක්වා ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 7ක් යටතේ එකතුව රු.මිලියන 341ක් වැය කර පන්ති කාමර, ශ්‍රවණාගාරයක්, පුස්තකාලයක්, නේවාසිකාගාර, භෝජනාගාරයක්, ජල ප්‍රතිකාර තටාකයක්, වෘත්තීය පුහුණු ගොඩනැගිල්ලක්, සහ ක්‍රීඩාගාරයක් සහිත ක්‍රීඩා පිටියක් ද සහිතව කහතුඩුව වෙනිවැල්කොළ ප්‍රදේශයේ විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා ශිෂ්‍යෝද්‍යා විශේෂ හා අන්තර්කරණ ජාතික ආයතනය ස්ථාපිත කර තිබුණි. එහෙත් ආයතනය ස්ථාපිත කර වසර 10ක් ගත වී තිබුණද විගණිත දිනය වූ 2025 මාර්තු 27 දින වන විට ආයතනයේ විශේෂ අවශ්‍යතා ඇති නේවාසික නොවන දරුවන් 58 දෙනෙකු පමණක් අධ්‍යාපනය ලබමින් පැවතුණි. එමෙන්ම 2025 මාර්තු 31 දිනට අධ්‍යයන කාර්ය මණ්ඩලය 08ක් හා අනධ්‍යයන 12ක් ඇතුළුව 20 දෙනෙකු සේවයේ යොදවා තිබූ අතර, 2024 වර්ෂය සඳහා එකතුව රු.මිලියන 107ක් වූ මුදලක් අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පමණක් වැයකර තිබුණි. මේ නිසා ආයතනයේ මානව හා භෞතික සම්පත් ඌණ උපයෝජිතව පවත්නා බව නිරීක්ෂණය විය.

**ආයතනික විභාග පැවැත්වීමට රාජ්‍ය ආයතන 02 කින් ප්‍රතිපාදන වෙන්කර තිබීම.**

2024 වර්ෂයේදී විභාග දෙපාර්තමේන්තුව විසින් ආයතනික විභාග 238ක් පැවැත්වීම සඳහා රු.මිලියන 920ක ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණු අතර වර්ෂය තුළදී වෙනත් දෙපාර්තමේන්තුවල ආයතනික විභාග 86ක් රු.මිලියන 147ක මුදලක් එම ආයතනවලින් ලබාගෙන පවත්වා තිබුණි. මේ හේතුවෙන් රු.මිලියන 603ක ප්‍රතිපාදන ඉතිරිව පැවති අතර එකම කාරණයට දෙවරක් ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

**පෙළපොත් නැවත භාවිතය**

2020 සිට 2024 දක්වා වසර 05ක කාලය තුල ජාතික පාසල් හා පළාත් පාසල් 10,096ක් හා පිරිවෙන් 822ක් සඳහා පෙළපොත් වර්ග 412කට අදාල පිටපත් මිලියන 172ක් රු.මිලියන 36,077ක් වැයකර මුද්‍රණය කර පාසල් සිසුන් අතර නොමිලේ බෙදා දී තිබුණි. 1-11 ශ්‍රේණි සඳහා 2017 වර්ෂයේ පෙළපොත් නැවත භාවිතය හැකි උපරිම කාලයක් දක්වාද 2008,2020 හා 2022 වර්ෂවලදී එක් වර්ෂයක මුද්‍රිත පෙළපොත් පිටපත් සංඛ්‍යාවෙන් සියයට 30 සිට 60 දක්වා පරාසය තුල වූ ප්‍රතිශතයක් ඊළග වර්ෂයේදී නැවත භාවිතා කලයුතු බව චක්‍රලේඛ මඟින් විධිවිධාන පනවා තිබුණ ද, 2020 - 2024 කාලසීමාවට අදාළ සමස්ත දත්ත පරීක්ෂාවේදී සත්‍ය වශයෙන් පෙළපොත් ඊළග වර්ෂයේදී නැවත භාවිතා කිරීමේ ප්‍රතිශතය සියයට 08 සිට 24 දක්වා වූ අවම පරාසයක පවතින බව නිරීක්ෂණය විය.

**පර්යේෂණ වාර්තා සැලකිල්ලට නොගැනීම**

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ලබාදුන් තොරතුරු අනුව 2022-2024 කාලසීමාව තුළදි රු.මිලියන 3ක් වැයකර පර්යේෂණ යෝජනා 8ක් නිමකර තිබුණි. ඊට අදාල පර්යේෂණ වාර්තා නිමකර අධ්‍යාපන අමාත්‍යංශය ඇතුළු අදාල ආයතනවලට ලබාදී තිබුණු නමුත් 2025 පෙබරවාරි 05 දින දක්වාම ඒවායේ ප්‍රතිඵල පිළිබඳව සමාලෝචනයට ලක්කර නොතිබුණි. ඒ හේතුවෙන් කොමිෂන් සභාව සිදුකල පර්යේෂණ වාර්තා තුළින් ජාතික අධ්‍යාපන ක්ෂේත්‍රයට සිදුකරන බලපෑම (Impact) හඳුනා ගත නොහැකි විය.

**භාණ්ඩාගාර එකඟතාවයකින් තොරව විදේශ ප්‍රදාන ලබා ගැනීම**

කොරියානු රජයේ බ්‍රිජ් සේජෝන් ශ්‍රී ලංකා (Bridge Sejong Sri Lanka) ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 69ක මුදලක් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් හා එකඟතාවයකින් තොරව 2014 වර්ෂයේ සිට ලබා ගැනීමට ජාතික අධ්‍යාපන ආයතනය කටයුතු කර තිබුණි.

**අග්‍රහාර රක්ෂණ ක්‍රමයේ සේවක දායකත්වය රජයේ අරමුදලින් ගෙවීම**

2017-2024 කාලසීමාව තුල අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර තිබුණු අතර භාණ්ඩාගාර අනුමැතියක් ලබා ගැනීමකින් තොරව රක්ෂණ ක්‍රමය සඳහා වූ දායකත්ව මුදලින් කොටසක් රජයේ අරමුදල්වලින් දැරීමට කටයුතු කර තිබුණි. එලෙස

2023 හා 2024 වර්ෂවලදී දායකත්ව මුදල් ලෙස රු.මිලියන 3ක් රජයේ අරමුදලින් ගෙවා තිබුණි.

**මූලික වැටුපෙන් සියයට 50 ඉක්මවා සම්පත්දායක දීමනා ගෙවීම**

මූලික වැටුපෙන් සියයට 50 ඉක්මවා 2014 - 2020 කාලසීමාවේදී නිලධාරීන් 35 දෙනෙකුට ගෙවා තිබුණු සම්පත්දායක දීමනා මුදල, 2024 දෙසැම්බර් 31 වන විටත් රු.මිලියන 6ක් වූ අතර ඉන් 2024 වර්ෂය තුළදී නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු.මිලියන 0.4ක් පමණක් අයකර තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 5.6ක ශේෂයක් තව දුරටත් අයවිය යුතුව පැවතුණි.

**විෂයමාලා ප්‍රතිසංස්කරණ සිදුකිරීම වසර 2ක් ප්‍රමාදවී තිබීම**

විෂයමාලා ප්‍රතිපත්තිය අනුව, ජාතික අධ්‍යාපන ආයතනය විසින් වසර අටකට වරක් විෂයමාලා ප්‍රතිසංස්කරණයක් සිදුකල යුතු අතර 2015 වර්ෂයේදී සිදුකල විෂයමාලා ප්‍රතිසංස්කරණයෙන් පසුව 2023 වර්ෂයේ දී විෂයමාලා ප්‍රතිසංස්කරණයක් සිදුකල යුතු වුවත්, 2025 මැයි 31 දින වන විට වසර 2ක් ප්‍රමාද වී තිබුණද විෂයමාලා ප්‍රතිසංස්කරණයක් සිදුකර නොතිබුණි.

**විද්‍යා/ගණිත විෂයධාරා යටතේ පෙළපොත් නොතිබියදී සම්පත් පොත් සකසා අලෙවි කිරීම**

උසස් පෙළ විෂයධාරාවල විෂයයන් අනුව විෂයමාලා රාමුව සකස් කිරීමක් සිදුකර තිබුණු නමුත්, උසස් පෙළ විෂයයන් සඳහා පෙළපොත් සැකසීමට මැදිහත්වීමක් සිදුනොකර ජාතික අධ්‍යාපන ආයතනය විසින්, විද්‍යා/ගණිත විෂයධාරා යටතේ විෂයයන් සඳහා පමණක් සම්පත් පොත් සකසා අලෙවි කිරීමක් සිදුකරමින් පැවතුණි.

## අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

### විගණන නිරීක්ෂණ

**පෙළපොත් සඳහා අමතර ඉල්ලීම්**

භාවිතයට සුදුසු තත්වයේ පැරණි පොත් භාවිතා කිරීමට උපදෙස් ලබානොදීම හේතුවෙන් 2021 වර්ෂයේ 6, 7, 8, 9 ශ්‍රේණි ප්‍රධාන විෂයන් සඳහා රු.මිලියන 46,08ක් වටිනා පොත් පිටපත් 532,452ක ප්‍රමාණයක් අමතර ඉල්ලීම් ලෙස පාසල් වෙත ලබාදී තිබුණි. මේ අනුව අමතර ඉල්ලීම් වැඩිවීම තුළින් රජයට විශාල වැය බරක් දැරීමට සිදුවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

**වාර්ෂිකව නව පෙළපොත් මුද්‍රණය**

2017 මාර්තු මස 23 දිනැති හා EPD/සං/04/2017/04 ව්‍යාපෘති අංක දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 2017/01 හි භාවිතා කළ පොත් යළි සිසු භාවිතයට ගැනීම සම්බන්ධයෙන් සියලුම විදුහල්පතිවරුන් සහ පරිවේනාධිපතිවරුන් දැනුවත් කර තිබියදී එම චක්‍රලේඛය අනුව කටයුතු කිරීමට පාසල් පද්ධතිය උනන්දු කිරීමකින් හා පසු විපරම් කිරීමකින් තොරව 2021 වර්ෂයේ 6, 7, 8, 9 ශ්‍රේණි සඳහා ප්‍රධාන විෂයයන්ට අවශ්‍ය සියයට 100ක් වූ රු.මිලියන 905.89ක් වටිනා පොත් පිටපත් 10,643,000ක ප්‍රමාණයක් හා 2022 වර්ෂයේ රු.මිලියන 606.64ක් වටිනා පොත් පිටපත් 7,118,900ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කර තිබුණි.

2021 වර්ෂයේ පෙළපොත් භාවිතය අවම මට්ටමක පැවති පසුබිමක 2022 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් ද 6, 7, 8, 9 වසර ප්‍රධාන විෂයන් සඳහා පොත් පිටපත් 7,118,900ක් රු.මිලියන 606.64ක් වැය කරමින් මුද්‍රණය කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි.

**ඉවත්කරන පොත්වල අගය ගිණුම්වල පෙන්වීම**

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ විෂය අංක 21302 පොත් මුද්‍රණය හා බෙදාහැරීමේ අත්තිකාරම් ගිණුම් කටයුත්තට අදාලව 2008 වර්ෂයේ ලද අමාත්‍ය මණ්ඩල තීරණ දෙකක් අනුව විෂය නිර්දේශ වෙනස් වීම හා විවිධ ආකාරයේ හානිවලට භාජනය වීම හේතුවෙන් රු.312.83ක් වටිනා පොත් භාවිතයෙන් ඉවත් කර තිබූ අතර, මෙම වටිනාකම 2017 වර්ෂයේ ගිණුම්වලින් ඉවත් කර තිබුණි. නැවතත් 2018 ජනවාරි 01 සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා භාවිතයට ගත නොහැකි පොත්වල වටිනාකම රු.මිලියන 93.42ක් ලෙස දෙපාර්තමේන්තුවේ අවසන් ගිණුම් අනුව පෙන්වා දී තිබුණි.

**2023 වර්ෂය වෙනුවෙන් පෙළපොත් මුද්‍රණයට අදාළ ප්‍රසම්පාදන කටයුතු**

2023 වර්ෂයට අවශ්‍ය පෙළපොත් මුද්‍රණය කිරීම සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු 2022 මාර්තු 07 දින තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කිරීමත් සමඟ ආරම්භ කර තිබුණු අතර දෙපාර්තමේන්තුව මාස දහයකට ආසන්න කාලයක් ප්‍රසම්පාදන කටයුතු නිම කිරීම වෙනුවෙන් ලබාගෙන තිබුණි. ඒ අනුව 2023 වර්ෂය වෙනුවෙන් පෙළපොත් මුද්‍රණය කිරීම සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව 2022

දෙසැම්බර් 20 දින සිට 28 දින දක්වා මුද්‍රණ ආයතන 20ක් සමගත් 2023 ජනවාරි 11 දින මුද්‍රණ ආයතන 02ක් සමගත් ගිවිසුම්ගත වී තිබුණි. පොත් මුද්‍රණය කිරීමට පෙර අකුරු ඇමිණීම, පළමු දෙවන හා තෙවන සෝදුපත් ඉදිරිපත් කිරීම, පෙරටු පිටපත් 10ක් ඉදිරිපත් කිරීම හා මුළු පිටපත් ප්‍රමාණය මුද්‍රණය හා බැඳීම යනාදී කටයුතු සිදු කිරීමට සැලකිය යුතු කාලයක් ගතවන බැවින්, පොත් මුද්‍රණය කර ගබඩාවට ලබාදීම සඳහා ගිවිසුම්ගත වූ දින සිට මාස තුනක කාලයක් මුද්‍රණ ආයතන වෙත ලබා දී තිබුණි. එසේ වුවද මුද්‍රණ ආයතන 14ක් වෙතින් 2023 ජනවාරි 30 දිනට පෙර පෙළපොත් පිටපත් 3,361,400ක් ගබඩාවට ලබා දී තිබුණි. පොත් මුද්‍රණය කිරීමට ගිවිසුම්ගත වී මාසයක් ගතවීමට පෙර පෙළපොත් ගබඩාවට ලබාදීම ප්‍රායෝගික තත්ත්වයක් නොවන බව පසුගිය වර්ෂ ගණනාවක් පුරා විගණනයට නිරීක්ෂණය විය.

**පාසල් වාරය ආරම්භයට පෙර පෙළපොත් ලබාදීමට අසමත්වීම**

2023 වර්ෂයේ පළමු පාසල් වාරය මාර්තු 20 දින ආරම්භ කර තිබුණු අතර පළමු පාසල් වාරය ආරම්භ වීමට ප්‍රථම මුද්‍රණ නීතිගත සංස්ථාවෙන් ගබඩාව වෙත පෙළපොත් පිටපත් 697,700ක් පමණක් ලැබී තිබුණි. ඒ අනුව රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත මුද්‍රණය කිරීමට ලබා දුන් පෙළපොත් පිටපත් 14,006,600ක් පළමු වාරයේ පාසල් ආරම්භ කිරීමට පෙර ගබඩාවට ලබා දීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

**පෞද්ගලික මුද්‍රණාල මඟින් පොත් මුද්‍රණය හා ලැබීම් ප්‍රමාදය**

රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවට මුද්‍රණය කිරීමට ලබා දුන් පෙළපොත් 2023 අප්‍රේල් 18 දිනට පෙර මුද්‍රණය කර ගබඩාවට ලබා දෙන ලෙස අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සංස්ථාව දැනුවත් කර තිබුණද, මුද්‍රණය කිරීමට ලබා දුන් පෙළපොත් වර්ග 93න් 30ක් 2023 අප්‍රේල් 17 දින වන විට මුද්‍රණය කර ලබා දීමට නොහැකි බව සංස්ථාව විසින් දැනුම් දීමෙන් පසුව මුද්‍රණය කිරීමට නොහැකි එම පෙළපොත් වර්ග 30 පෞද්ගලික මුද්‍රණාල මඟින් මුද්‍රණය කරවා ගැනීමට අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශයට යටත්ව අංක 23/0681/607/057 හා 2023 අප්‍රේල් 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණි. මෙම පොත් වර්ග 30 මුද්‍රණ ධාරිතාවය, අතීත කාර්ය සාධනය ශ්‍රම

ධාරිතාවය සහ මූල්‍යමය හැකියාව යන සාධක පිළිබඳ අවධානය යොමුකර පෞද්ගලික මුද්‍රණ ආයතන 22ක් වෙත රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවට පොත මුද්‍රණය කිරීමට අනුමත කරන ලද මිල ගණන් යටතේම මුද්‍රණය සඳහා ලබා දීමට අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව 2023 අප්‍රේල් 18 දින තීරණය කර තිබුණි. මෙම පොත් පිටපත් 4,048,100ක ප්‍රමාණය 2023 මැයි 10 දිනට පෙර මුද්‍රණය කර ගබඩාවට භාරදිය යුතු බව ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කර තිබුණි. මුද්‍රණ ඇණවුම ලබා දීමෙන් පසු මාසයකට වඩා අඩු කාලයක් තුළ පෙළපොත් මුද්‍රණය කිරීම අපහසු වීම හා ප්‍රායෝගික තත්ත්වයක් නොවීමත් මත 2023 මැයි 10 දින වන විට මෙම පෙළපොත් වර්ග 30න් පිටපත් 4,048,100ක ප්‍රමාණයක් මුද්‍රණය කර ගබඩාවට ලබා දීමට මුද්‍රණ ආයතනවලට නොහැකි වී තිබුණි. 2023 වර්ෂයේ පළමු පාසල් වාරය ආරම්භ කර මාස 02ක් අවසන් වන තුරු මෙම පෙළපොත් දිවයින පුරා පාසල්වලට බෙදාහැරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. මේ ආකාරයට පාසල් පෙළපොත් ප්‍රමාදවී පාසල් සිසුන්ට ලබා දීමෙන් දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට සිදුවන අහිතකර බලපෑම පිළිබඳ දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

**අතිරේක පොත් මුද්‍රණය**

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට අයත් සංවර්ධන අංශය යටතේ අදාළ විෂය භාර නිලධාරියාගේ මැදිහත් වීම මත නව අතිරේක පොත් අවශ්‍යතාවය තීරණය කරන අතර, සංඛ්‍යාන කමිටුවක් විසින් මුද්‍රණය කළ යුතු පිටපත් ප්‍රමාණය කොපමණ ද යන්න තීරණය කරනු ලැබේ. 2022 වර්ෂයට අදාළ රු.මිලියන 19.54 වටිනාකමක් ඇති අතිරේක පොත් වර්ග 22කට අදාළ පිටපත් 108,000 මුද්‍රණය කර තිබුණි. මේ ආකාරයට අතිරේක පොත් මුද්‍රණය කර තිබුණද, අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගැනීම නිසා හෝ අලෙවි ප්‍රවර්ධන ක්‍රමයන් මඟින් ළමුන් දැනුවත් නොකිරීම නිසා හෝ ප්‍රමාණය ඉක්මවා මුද්‍රණය කිරීම හේතුවෙන් අලෙවි වීමකින් තොරව වර්ෂ 05ත් 12ත් අතර කාලයක සිට පැවත එන රු.මිලියන 140.44ක වටිනාකමකින් යුත් පොත් 494,428ක ප්‍රමාණයක් 2022 දෙසැම්බර් මස 31 දින වන විටත් ගබඩාවේ ඉතිරි වී තිබුණි.

**බ්‍රේල් පොත් මුද්‍රණකරුවන්**

බ්‍රේල් පොත් මුද්‍රණය කිරීමේ කාර්යය ඉටු කිරීම සඳහා මේ වන විට බ්‍රේල් මුද්‍රණාලයේ ජ්‍යෙෂ්ඨ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු පමණක් සිටින අතර 2029 වර්ෂයේ ඔහු සේවයෙන් විශ්‍රාම යාමට නියමිත නමුත්, එම තනතුර වෙනුවෙන් බ්‍රේල් පොත් මුද්‍රණය පිළිබඳ දැනුමක් ඇති පුද්ගලයෙකු බඳවා ගැනීමට හෝ මුද්‍රණාලය තුළ සිටින පුද්ගලයෙකු පුහුණු කිරීමට හෝ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කිසිදු සැලැස්මක් නොතිබුණු බව නිරීක්ෂණය විය.

බ්‍රේල් මුද්‍රණාලය සතුව පොත් මුද්‍රණය කිරීම සඳහා බ්‍රේල් බොක්ස් මුද්‍රණ යන්ත්‍ර 04ක් පැවතිය ද ඉන් මුද්‍රණ යන්ත්‍ර 02ක් අක්‍රිය තත්ත්වයේ පවතී. තවද එම මුද්‍රණ යන්ත්‍ර 02 මඟින් දිනකට මුද්‍රණය කළ හැක්කේ පොත් පිටපත් 40ත් 60ත් අතර සුළු ප්‍රමාණයකි. මෙම මුද්‍රණ යන්ත්‍ර මඟින් එකවර විශාල පොත් ප්‍රමාණයක් මුද්‍රණය කිරීමට හැකියාවක් නොමැති වීම හේතුවෙන් දවසේ වැඩි කාලයක් එම යන්ත්‍ර ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. එවිට යන්ත්‍ර නිතර නිතර අක්‍රිය වී මුද්‍රණ කටයුතු කාර්යක්ෂමව ඉටුකරගෙන යාමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

**පොත් තොග ශේෂ**

2021 අධ්‍යයන වර්ෂය සඳහා පෙළපොත් බෙදාහැරීමේ කටයුතු 2020 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණයෙන් අවසන් වී තිබුණද තොග ශේෂය පොත් 20,000 ඉක්ම වූ පෙළපොත් වර්ග 128කට අයත් රු.මිලියන 593.84ක් වටිනා පෙළපොත් 4,761,461ක තොගයක් 2021 ජනවාරි 31 දින වන විට ගබඩාවේ ඉතිරි වී තිබුණි.

**පොළපොත් පාසල්වෙත ලබාදීමේ ප්‍රමාදය**

2022 වර්ෂයේ පළමු පාසල් වාරය අප්‍රේල් 18 දින ආරම්භ කර තිබුණු අතර, 2022 දෙසැම්බර් මාසය දක්වා පෙළපොත් පාසල් වෙත බෙදා හැර තිබුණි. අදාළ වර්ෂයේ මැයි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා බෙදාහරින ලද පෙළපොත් පිටපත් සංඛ්‍යාව 22,082,941කි. පළමු පාසල් වාරය ආරම්භ වීමට පෙර, පාසල් සඳහා අවශ්‍ය පෙළපොත් ලබා දීමට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව කටයුතු කළ යුතු වුවද, 2022 වර්ෂය වෙනුවෙන් මුද්‍රණය කරන ලද මුළු පෙළපොත් පිටපත් 32,831,750ක ප්‍රමාණයෙන් පොත් පිටපත් 22,082,941ක් එනම් මුළු පෙළපොත් පිටපත්වලින් සියයට 67ක් 2022 වර්ෂයේ පළමු පාසල් වාරය ආරම්භ වීමට ප්‍රථම නියමිත කාලයේදී පාසල් වෙත බෙදා හැරීමට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**ඩිජිටල් පොත් ප්‍රවර්ධනය කිරීම**

අධ්‍යාපනය තුළින් සමාජ ඒකාබද්ධතාවය සඳහා ඉවහල්වන පොතක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් 2019 වර්ෂයේදී රු.මිලියන 01ක් ද, 2020 වර්ෂයේ දී රු.මිලියන 15ක ද වියදම් සැලසුම් කර තිබුණි. මෙහි දී විවිධ ලේඛකයන් විසින් රචනා කරන ලද ළමා පොත් මුද්‍රණයට තෝරා ගැනීම සඳහා පවත්වන ලද වැඩමුළුවලට සහභාගී වූ සම්පත්දායකයන් සහ දෙපාර්තමේන්තු නිලධාරීන් වෙනුවෙන් දීමනා ගෙවීම සඳහා 2019 වර්ෂයේදී රු.මිලියන 1.09ක් දෙපාර්තමේන්තුව වැය කර තිබුණි.

මෙලෙස විශාල මුදලක් වැයකර ළමා පොතක් මුද්‍රණයට තෝරා ගැනීම සම්බන්ධයෙන් වැඩමුළු පවත්වා තිබුණු අතර, එහිදී සමීක්ෂණයට ලක් කරන ලද ලේඛකයන් 36ක් විසින් ඉදිරිපත් කරන ලද අත්පිටපත් 64න් එක් පිටපතක්වත් මුද්‍රණයට සුදුසු නොවන බවට දෙපාර්තමේන්තුව තීරණය කර තිබුණි. ඒ අනුව ළමා පොතක් මුද්‍රණයට තෝරාගැනීම වෙනුවෙන් පවත්වන ලද වැඩමුළු සඳහා වැයකළ මුදල් නිෂ්ඵල වී තිබුණි.

මේ ආකාරයට පවත්වන ලද වැඩමුළුවලින් මුද්‍රණය සඳහා පොතක් තෝරා ගැනීමට නොහැකිවීම හේතුවෙන් පසුව එම වැඩමුළුවලට සහභාගී වූ ලේඛකයෙකු ලවා පොතක් ලියා පළ කිරීමට දෙපාර්තමේන්තුව තීරණය කර තිබුණු අතර, ඒ සඳහා රු.මිලියන 5.76ක් වැයකර සිංහල භාෂාවෙන් පොත් පිටපත් 155,475ක් හා දෙමළ භාෂාවෙන් පිටපත් 73,475ක් මුද්‍රණය කර තිබුණි.

GEMP ව්‍යාපෘතියෙහි 2019 - 2024 ක්‍රියාත්මක කිරීමේ සැලසුමට හා ලෝක බැංකු ගිවිසුමේ ප්‍රතිපාදන නිදහස් කිරීම හා බැඳුණු දර්ශකවලට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 6.69ක් වැය කර ලැප්ටොප් පරිගණක, පරිගණක යන්ත්‍ර සහ UPS මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ අරමුදල් භාවිතයෙන් e තක්සලාව වැඩසටහන සඳහා 2021 වර්ෂයේදී රු.මිලියන 27.01ක් වැය කරමින් ඩිජිටල් ඉගෙනුම් ආධාරක වීඩියෝ 551ක් නිෂ්පාදනය කර තිබුණු අතර එයින් වීඩියෝ 431ක් 2022 වර්ෂයේදී e තක්ෂලාව වෙබ් සර්වරයට උඩුගත කිරීමට කටයුතු කර තිබුණි. එම උඩුගත කරන වීඩියෝවල එක් වීඩියෝවක සාමාන්‍ය නැරඹුම් වාර ගණන

150ක් වැනි ඉතා අඩු මට්ටමක පවතින විටත් ඒ පිළිබඳ සැලකිලිමත් නොවී 2022 වර්ෂයේදී රු.මිලියන 25.47ක් වැයකරමින් e තක්සලාව සඳහා ඩිජිටල් ඉගෙනුම් ආධාරක වීඩියෝ 490ක් නිෂ්පාදනය කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණු අතර ඉන් වීඩියෝ 420ක් පමණක් e තක්සලාව වෙබ් සර්වරයට උඩුගත කර තිබුණි.

# උසස් අධ්‍යාපනය

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සහශ්‍ර දෙකක් තරම් ඈතට දිව යන දිගු ඉතිහාසයකට හිමිකම් කියන අතර ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ද අධ්‍යාපනය මූලික අයිතිවාසිකමක් වශයෙන් දක්වා ඇත. ශ්‍රී ලංකාවේ ජනගහනය සතුව, සියයට 92ක සාක්ෂරතා මට්ටමක් පවතී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ස්ථාපිත කර ඇති විශ්වවිද්‍යාල 17ක් හා උසස් අධ්‍යාපන ආයතන 18 ක් සහ විද්‍යායතන 02 ක් ක්‍රියාත්මක වෙමින් පවතී.

2024 වර්ෂය තුල උසස් අධ්‍යාපන අංශය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පිළිවෙලින් රු.මිලියන 30,615 ක් හා රු.මිලියන 72,711 ක ප්‍රතිපාදන භාණ්ඩාගාරය විසින් ලබා දී තිබූ අතර 2024 වර්ෂය අවසන් වන විට එයින් පිළිවෙලින් රු.මිලියන 26,199 සහ 71,227 ක් උපයෝජනය කර තිබුණි.

**රූපසටහන 2.33 – 2024 වර්ෂය තුළ උසස් අධ්‍යාපන අංශය හා විශ්ව විද්‍යාල කොමිසන් සභාව වෙත ලබා දී තිබූ ප්‍රතිපාදන හා ප්‍රතිපාදන උපයෝජන**




**මූලාශ්‍රය - විශ්ව විද්‍යාල කොමිෂන් සභාව**

ඉහත ප්‍රතිපාදන උපයෝජනය පිළිබඳ සිදුකල විගණනයේදී අනාවරණය වූ නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## විගණන නිරීක්ෂණ

### විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**බැඳුම්කර කඩකර තිබීම හේතුවෙන් අය විය යුතු මුදල් අයකරගෙන නොතිබීම**

විශ්වවිද්‍යාල ඇතුළුව උසස් අධ්‍යාපන ආයතන 19 ක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ බැඳුම්කර කඩකල නිලධාරීන් 587 දෙනෙකුගෙන් 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.මිලියන 2,840 ක් හා 2009 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් මෙහෙයවනු ලබන පශ්චාත් උපාධි අධ්‍යයන ප්‍රදාන ලබාගත් අධ්‍යයන නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයකර ගත යුතු රු.මිලියන 18 ක් අයකර ගෙන නොතිබුණි.

**මුල් කුලී ගිවිසුම අවලංගු නොකර නව ගොඩනැගිල්ල ලබා ගෙන තිබීම**

කොමිෂන් සභාව විසින් 2017 වර්ෂයේ දී මාසික කුලිය රු.මිලියන 0.35කට ලබා ගෙන තිබුණු වර්ග අඩි 3,337කින් යුත් ගොඩනැගිල්ලක ඉඩ ප්‍රමාණවත් නොවීම සහ ප්‍රවාහන අපහසුතා පැවතීම මත එම කල්බදු ගිවිසුම අවලංගු කර වර්ග අඩි 7,000 කින් සමන්විත වූ ගොඩනැගිල්ලක් රු. මිලියන 0.95ක කුලියට ලබා ගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය 2020 නොවැම්බර් 09 දින ලැබී තිබුණි. නමුත් මුල් කුලී ගිවිසුම අවලංගු නොකර නව ගොඩනැගිල්ල කුලියට ලබා ගෙන තිබීම හේතුවෙන් 2021 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා තවදුරටත් එම ගොඩනැගිල්ල වෙනුවෙන් එකතුව රු.මිලියන 16.8ක් කුලී වශයෙන් ගෙවා තිබුණි.

**උපකාර ඉල්ලා සිටිය හැකි ජංගම යෙදුමක් සංවර්ධනය කිරීම**

නවක වදය/ලිංගික හිරිහැර කිරීම්වලදී සිසුන්ට/ කාර්ය මණ්ඩලයට වහාම උපකාර ඉල්ලා සිටිය හැකි ජංගම යෙදුමක් සංවර්ධනය කිරීම වෙනුවෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා තොරතුරු හා

සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමඟ ගිවිසුමකට එළඹ, රු.මිලියන 0.715ක වැයකර තිබුණද එය සංවර්ධනය කර නොතිබුණි.

## සබරගමුව විශ්වවිද්‍යාලය

**ශිෂ්‍ය පුරප්පාඩු**

2019/2020 අධ්‍යයන වර්ෂයේ සිට වර්ෂ 04 ක, පීඨ 8 ක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත සිසුන් සංඛ්‍යාවට වඩා සිසුන් 1,079 ක් පුරප්පාඩු සහිතව ලියාපදිංචි කර තිබීමෙන් අදාළ පාඨමාලා සඳහා අපේක්ෂාවෙන් සිටි හා සුදුසුකම්ලත් සිසුන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වී තිබුණි.

**නිෂ්පාදන වාණිජකරණය නොකිරීම හා පුරස්කාර ලබා නොගැනීම**

AHEAD ව්‍යාපෘතිය මඟින් පර්යේෂණ, නවෝත්පාදන හා වාණිජකරණයන් (Research innovation & commercialization) දිරිගැන්වීම සඳහා පර්යේෂණ කරන්නන් හට 2018 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු. මිලියන 230 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර එයින් රු.මිලියන 206.35 ක් ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් උපයෝජනය කර තිබුණි. ඉහත ප්‍රතිපාදනයෙන් ව්‍යාපෘති 03 ක නිෂ්පාදන 07 ක් 2021, 2022 සහ 2023 වර්ෂයන්හිදී වාණිජකරණය කර තිබුණු අතර රු. මිලියන 85 ක ප්‍රතිපාදනවලට අදාල ප්‍රදාන 02 ක් අපේක්ෂිත අරමුණට ළඟා වී නොතිබුණි. තවද මෙම වාණිජකරණය කරන ලද නිෂ්පාදන 07 න් නිෂ්පාදන 05 ක් සඳහා විශ්වවිද්‍යාලයට ලැබිය යුතු පුරස්කාර/ බලපත්‍ර මුදල් ලබා ගැනීමට 2024 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**නිශ්කාර්ය පුහුණු උපකරණ**

AHEAD ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ කෘෂි පීඨයේ අපනයන කෘෂිකර්ම අධ්‍යනාංශය වෙනුවෙන් 2022 සැප්තැම්බර් 14 දින මිලදී ගෙන තිබුණු රු. මිලියන 3 ක් වූ Tea roller, Tea dryer හා Roll breaker යන උපකරණ සිසුන්ගේ අධ්‍යයන කටයුතු වෙනුවෙන් භාවිතා කර නොතිබුණි. එමෙන්ම ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා 2019 ඔක්තෝබර් 30 දින මිලදී ගෙන තිබුණු රු. මිලියන 3.13 ක් වූ NUVE වර්ගයේ ශිතකරණය (Freezer) ඊට ගැලපෙන වායුසමීකරණ පහසුකම් සහිත

සුදුසු ස්ථානයක ස්ථානගත නොකිරීම හේතුවෙන් 2023 ජුලි 01 දින සිට අක්‍රීය තත්ත්වයේ තිබුණි.

## කොළඹ විශ්වවිද්‍යාලය

**භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව වැයකිරීම්**

2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 03 (viii) ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර නොමැති කිසිඳු දීමනාවක්, සුභසාධන වැඩසටහන් සංවර්ධන සභායන් හෝ සහනාධාර ලබාදීම් නතර කල යුතු බව සඳහන් කර තිබියදී, 2023 හා 2024 වර්ෂවලදී සේවක සුභසාධන අරමුදල් සඳහා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු.මිලියන 68.73 ක් වැය කර තිබුණි.

**භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව ආයෝජනය කිරීම්**

2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛ ලිපියේ 5 ඡේදය ප්‍රකාරව බැඳුම්කර කඩකරන ආචාර්යවරුන්ගෙන් අයකරගත් අරමුදල් රාජ්‍ය ආදායමට බැර කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයට අයකරගෙන තිබූ රු.මිලියන 200.97 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

**අරමුදල් උපයෝජනය නොකිරීම**

අරමුදල් ගිණුම් 47 ක පැවති එකතුව රු.මිලියන 134.67 න් කිසිඳු මුදලක් අරමුණුගත කාර්යයන් වෙනුවෙන් වර්ෂය තුළ උපයෝජනය කර නොතිබුණි.

**ගොඩනැගිලි අළුත්වැඩියාව**

බිලුම්ෆොන්ටන් නේවාසිකාගාරයේ පිටුපස පිහිටි ගොඩනැගිල්ල අළුත්වැඩියාව සහ වැඩි දියුණු කිරීම සඳහා රු.මිලියන 17.24 (වැට් රහිත) ක ඇස්තමේන්තුවක් සකස්කර 2019 අගෝස්තු 20 වන දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබූ අතර එය 2020 අගෝස්තු 20 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. ඒ සඳහා රු.මිලියන 3.237ක වැඩ අත්තිකාරම් මුදලක් 2019 ඔක්තෝබර් 22 දින ලබා දී තිබුණු අතර එවකට සිටි නියෝජ්‍ය ලේඛකාධිකාරි (වෛද්‍ය) ගේ උපදෙස් මත කොන්ත්‍රාත්කරු විසින් නියමිත ගොඩනැගිල්ල නොව වෙනත් ගොඩනැගිල්ලක පින්තාරු කිරීම සහ නාන කාමර අළුත්වැඩියාව කර ඇති බවත් නියමිත

ගොඩනැගිල්ලේ වැඩ ප්‍රමාණපත්‍ර අනුව සිදුකර නොමැති බවත් ලිපිගොනු පරීක්ෂාවේදී අනාවරණය විය.

**අයිතිය පවරා නොගත් ඉඩම්** මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් රු.මිලියන 25.268 ක් වටිනා හෙක්ටයාර 19.23 ක වපසරියකින් යුතු ඉඩම් කැබලි 07 ක් 2024 වර්ෂය අවසන්වන විටත් විශ්වවිද්‍යාලය වෙත පවරා ගෙන නොතිබුණි.

## සෞන්දර්ය හා කලා විශ්වවිද්‍යාලය

**අනුමැතියකින් තොර ගෙවීම්** 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2020 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 03 (viii) ඡේදය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල අනුමතියකින් තොරව සුභසාධන වැඩසටහන් සඳහා වෙන් කිරීම් නොකළ යුතු වුවද එයට පටහැනිව සේවක සුභසාධන ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක කර තිබූ සේවක වෛද්‍ය රක්ෂණ ක්‍රමය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 1.84 ක් ගෙවා තිබුණි.

**අනාර්ථික වියදම්** 2022 වර්ෂයේ නර්තන පීඨය වෙනුවෙන් වසර 03 ක් සඳහා බදු පදනම මත ලබාගන්නා ලද ගොඩනැගිල්ලක් සඳහා වසර 02 ක කුලිය ඇතුළුව අනෙකුත් ආරම්භක වියදම් සමඟ එකතුව රු.මිලියන 116.85ක මුදලක් ද කාමර වෙන්කිරීම (Partition), කාපට් දැමීම වැනි ගොඩනැගිල්ල සුදුසු තත්වයට පත් කිරීම සඳහා රු.මිලියන 28.7ක් ද වැය කර තිබුණි. මෙම ගොඩනැගිල්ල වසරක පමණ පූර්ව උපයෝජනයෙන් පසුව ප්‍රදේශවාසීන් විසින් අධික බෙර ශබ්දය සම්බන්ධයෙන් කරන ලද පැමිණිලි හේතුවෙන් වසර 02 කට පසු ගිවිසුම අවසන් කර තිබුණි. ගොඩනැගිලි උපයෝජන අවශ්‍යතාව සම්බන්ධයෙන් අවධානය යොමු කර එයට ගැලපෙන පරිශ්‍රයක් සොයා ගැනීමෙන් තොරව මෙම ගොඩනැගිල්ල බද්දට ගැනීම හේතුවෙන් වැය කරන ලද රු.මිලියන 28.73ක් අනාර්ථික වී තිබුණි.

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සටහන් නොකිරීම** සෑම උසස් අධ්‍යාපන ආයතනයකම සේවයේ නියුක්ත තැනැත්තෙක්ම පැමිණෙන වේලාව සහ පිටවන වේලාව පැමිණීමේ ලේඛණයක සටහන්

කල යුතු වුවද අධ්‍යයන කාර්යමණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව 2024 වර්ෂය සඳහා රු.මිලියන 3,448.6 ක වැටුප් හා දීමනා ගෙවීම් කර තිබුණි.

**අනුමැතිය නොලත් ගෙවීම්**

නිසි අනුමැතියකින් තොරව රජයේ අරමුදල් භාවිතා කරමින් රක්ෂණ ක්‍රම, සහන ණය යෝජනා ක්‍රම සහ වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක නොකළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ සේවක අභ්‍යන්තර රක්ෂණ ක්‍රමයක් සඳහා රු.මිලියන 38.23 ක් වැය කර තිබුණි.

**බැඳුම්කර කඩකිරීම වෙනුවෙන් අයකරගත් මුදල්**

2023 ජනවාරි 18 දිනැති BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ලිපිය සහ 2023 ජූලි 04 දිනැති අංක 05/2023 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම වෙනුවෙන් අයකල මුදල් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, 2024 වර්ෂය තුල එලෙස අයකර ගත් රු.මිලියන 144.9 ක මුදලින් චක්‍රලේඛ ප්‍රකාරව රු. මිලියන 19.58 ක ගුවන් ටිකට් වියදම අඩුකර, ඉතිරි රු. මිලියන 125.3 ක මුදල භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

**සංයුක්ත සැලැස්ම යාවත්කාලීනනොකිරීම**

2021-2025 කාල සීමාව සඳහා සකස් කරන ලද සංයුක්ත සැලැස්ම 2024 වර්ෂය සඳහා යාවත්කාලීන කර නොතිබුණි.

**විදේශ ප්‍රදාන සෘජුව ලබා ගැනීම**

2019 ජූලි 25 දිනැති අංක SC&PMU/Grant/19 හා 2020 අගෝස්තු 14 දිනැති අංක SC&PMU/Grant/20 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය සහ 2020 ඔක්තෝබර් 02 දිනැති අංක ERD/AE/GEN/16 දරන මුදල් අමාත්‍යාංශ ලිපිවල විධිවිධානවලට අනුකූල නොවන සේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවයකින් තොරව 2024 වර්ෂය තුළදී රු.මිලියන 185 ක්වූ විදේශ පර්යේෂණ ප්‍රදාන 13 ක් ලබාගෙන තිබුණි.

## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

**පර්යේෂණ දීමනා ලබාදීමේ අඩුපාඩු**

2023 වර්ෂයේදී පර්යේෂණ දීමනා ලබාගත් නිලධාරීන් 43 දෙනෙකු අවසන් පර්යේෂණ වාර්තා නිකුත් කිරීමේදී මාස 3 සිට මාස 10 දක්වා කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි. තවද පර්යේෂකයන් 42 දෙනෙකු විසින් 2023 වර්ෂයේදී පර්යේෂණ කමිටු අනුමැතිය සහිතව වර්ෂයක කාලයක් තුළදී නිමකිරීමේ පදනම මත ආරම්භ කරන ලද රු.මිලියන 17.9 ක් වූ පර්යේෂණ නිම කර නොතිබියදී 2024 වර්ෂය තුළදී එම නිලධාරීන් සඳහා නව පර්යේෂණ යෝජනා වෙනුවෙන් රු.මිලියන 17 ක් පර්යේෂණ දීමනා ලෙස විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණි.

## මොරටුව විශ්වවිද්‍යාලය

**දැව සැලසුම් හා නවෝත්පාදන මධ්‍යස්ථානය ඉදි කිරීම.**

වාස්තු විද්‍යා පීඨයේ දැව සැලසුම් හා නවෝත්පාදන මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා විද්‍යා,තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය 2019 වර්ෂයේදී රු.මිලියන 5 ක් විශ්වවිද්‍යාලය වෙත ලබා දී තිබුණි. ව්‍යාපෘති සැලැස්මට අනුව ව්‍යාපෘති කටයුතු 2020 වර්ෂයේදී නිම කළ යුතු වුවත්, ප්‍රමාණ පත්‍රය සහ ප්‍රසම්පාදන ලියවිලි සකස් කිරීම සඳහා රු.මිලියන 0.05 ක් 2023 වර්ෂයේදී වැයකර, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයෙන් හා පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන තිබුණ ද 2024 වර්ෂය අවසානය දක්වාම මෙම ව්‍යාපෘතියට අදාළ කාර්යයන් කිසිවක් සිදුකර නොතිබුණි.

## තාක්ෂණික ආයතනය (NDT)

**ශිෂ්‍ය නේවාසිකාගාර සංකීර්ණය ඉදිකිරීම්**

ආයතනය නැවත ස්ථානගත කිරීම හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 8,821ක් වැයකර ඉදිකරන ලද ගොඩනැගිලි සංකීර්ණයක් 2017 වර්ෂයේදී ආයතනයේ අධ්‍යක්ෂ විසින් භාර ගෙන තිබුණි. එම අවස්ථාවේදී ශිෂ්‍ය නේවාසිකාගාර සංකීර්ණයේ ගොඩනැගිලි 02හි කාමර 26 බැගින් වූ මහල් දෙකක් ඉදි කිරීමත් ,ඉදිකළ මහල් 02ක කාමර වෙන්කිරීම සහ ගොඩනැගිලි 02හි වහලවල් ඉදිකිරීමත් සම්පූර්ණයෙන්ම සිදුකර නොතිබුණි. එම වර්ෂයේ සිට 2025අප්‍රේල්

දක්වාම එම ගොඩනැගිලිවල වහල ඉදිකර නොතිබුණු බැවින් දීර්ඝ කාලයක සිට දේශගුණික විපර්යාසයන්ට මුහුණදීම හේතුවෙන් ගොඩනැගිලිවල අනෙකුත් ව්‍යුහමය කොටස් වලටද හානි සිදුවෙමින් පැවතුණි.

**ඉඩම් අයිතිය පවරා නොගැනීම** තාක්ෂණික ආයතනය ස්ථාපිත භූමිය ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට අයත් යැයි පවසමින් එකී භූමිය තාක්ෂණික ආයතනයට පවරා ගැනීම සඳහා 2007 වර්ෂයේදී ආයතනය වෙත ඉදිරිපත් කර තිබූ රු.මිලියන 175 ක රජයේ තක්සේරුව මත භූමිය පවරා ගැනීමේ අත්තිකාරමක් ලෙස රු. මිලියන 25 ක් ආයතනය විසින් ගුවන් විදුලි සංස්ථාවට ගෙවා තිබුණි. පසුව මෙම දේපළ රජයේ දේපළක් බව හඳුනාගෙන තිබීම හේතුවෙන් ගුවන් විදුලි සංස්ථාවට ගෙවූ මුදල අයකර ගැනීමට හෝ මෙම භූමිය තාක්ෂණික ආයතනයට පවරා ගැනීමට 2024 වර්ෂය දක්වාම කටයුතු කර නොතිබුණි.

## ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

**ජංගම පර්යේෂණාගාරය ඌන උපයෝජිතව පැවතීම.** විද්‍යාත්මක ප්‍රදර්ශන සඳහා යොමු කිරීම, ක්ෂේත්‍රගත පර්යේෂණ හා නව නිෂ්පාදන මහජනතාවට හඳුන්වා දීමේ අරමුණින් 2023 අප්‍රේල් මාසයේ වැඩ නිම කර තිබූ පිරිවැය රු. මිලියන 9.99 ක් වූ ජංගම පර්යේෂණාගාරයක් ලෙස සකස් කරන ලද බස් රථය වසර 2ක් තුළ කි.මී.404ක් පමණක් ධාවනය කර තිබූ අතර අවස්ථා කිහිපයක දී පමණක් විද්‍යාත්මක ප්‍රදර්ශණ සඳහා යොමු කර තිබුණු බැවින් එම ජංගම රථය ඌන උපයෝජිත තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය විය.

## කැලණිය විශ්වවිද්‍යාලය

**නව සම්මන්ත්‍රණ ශාලාව උපයෝජනය** 2023 වර්ෂයේදී පරිගණක හා තාක්ෂණ පීඨය තුළ ආසන 1000 කින් සමන්විත සම්මන්ත්‍රණ ශාලාවක් රු.මිලියන 510.95 ක් වැයකර ඉදිකර ඇතත් 2024 වර්ෂයේ අවස්ථා දෙකකදී උපාධි ප්‍රදානෝත්සව පැවැත්වීම සඳහා රු.මිලියන 4.48 ක් වැයකර කොළඹ බණ්ඩාරනායක ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වා තිබුණි.

**පුස්තකාලය ස්ථාපනය නොකිරීම.**

පරිගණක හා තාක්ෂණ පීඨ ගොඩනැගිල්ල තුළ පුස්තකාලයක් සකස් කිරීම සඳහා වර්ග මීටර් 185.8ක ඉඩකඩක් වෙන්කර තිබුණද එකී යෝජිත පුස්තකාලය 2024 දෙසැම්බර් 31 දක්වාම ස්ථාපනය කර නොතිබුණි. එහෙත් එම පුස්තකාලය වෙනුවෙන් 2019 හා 2020 වර්ෂයන් තුළ රු. මිලියන 7.93ක් වටිනා පොත් 709ක් මිලදීගෙන තිබුණු අතර එම පොත් විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයේ වර්ෂ 5කට ආසන්න කාලයක් ගොඩගසා තිබීම හේතුවෙන් එකී වියදම නිශ්කාර්ය වී තිබුණි.

**පරිගණක 5ක් අස්ථානගත වීම**

AHEAD ව්‍යාපෘතිය මඟින් විද්‍යා පීඨයට ලබාදුන් පරිගණක හා උපාංග පිළිබඳ භෞතික පරීක්ෂාවේදී රු.මිලියන 1.63 ක් වටිනා Laptop පරිගණක 05 ක් අස්ථානගතවී ඇති බව හඳුනාගෙන තිබුණත් ඒ සඳහා වගකිව යුතු අය හඳුනාගෙන අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

**අලුත්වැඩියා කටයුතු පැවතියදී රඳවුම් මුදල් නිදහස් කිරීම**

ආයතනයේ පුස්තකාල ගොඩනැගිල්ල රු.මිලියන 583.65 ක් වැය කර 2022 වර්ෂයේදී ඉදිකර තිබූ අතර 2024 ජනවාරි 31 දින ගොඩනැගිල්ල භාවිතය සඳහා විවෘත කර තිබුණි. එහෙත් ගොඩනැගිල්ල තුළට වැසි ජලය කාන්දුවීම හේතුවෙන් ගොඩනැගිලි බිත්ති කිහිප තැනකින් පුපුරා ගොස් දිය සෙවෙල බැඳී තිබුණි. එසේ වුවද ගොඩනැගිල්ල අළුත්වැඩියා කර ගැනීමකින් තොරව 2024 මාර්තු සිට 2024 අගෝස්තු දක්වා අවස්ථා තුනකදී එකතු වටිනාකම රු.මිලියන 19.67 ක් වූ රඳවුම් මුදල් කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කර තිබුණි.

## ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

**සිසු ලියාපදිංචිය අඩු වීම**

විශ්වවිද්‍යාලයේ ප්‍රධාන උපාධි පාඨමාලා වන ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධි පාඨමාලාව සහ විද්‍යාවේදී දේශීය ඖෂධ සම්පත් ගෞරව උපාධි පාඨමාලාව සඳහා පිළිවෙලින් සිසුන් 176 දෙනෙකු හා

සිසුන් 70 දෙනෙකු බඳවා ගැනීමට සැලසුම් කර තිබුණද ලියාපදිංචි වූ සිසුන් ගණන පිළිවෙලින් සිසුන් 109 දෙනෙකු හා සිසුන් 24 දෙනෙකු පමණක් වී තිබුණි.

## ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව ආයතනය (NIBM)

**වත්කම් වගකීම් තක්සේරු කිරීමකින් තොරව පරිපාලිත සමාගමේ කොටස් අයිතිය අහිමි කිරීම**

ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව ආයතනයට (NIBM) සියයට සියයක අයිතිය හිමි පරිපාලිත සමාගමක් වූ ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව විද්‍යායතනය (NSBM) 2024 ජූලි 15 වන දින එහි කොටස් අයිතිය අහෝසිකර රජය හෝ රජයට අනුබද්ධ ආයතනකින් බැහැර තෙවන පාර්ශවීය ඇපකරුවන්ගෙන් සමන්විත වූ ඇපයෙන් සීමිත සමාගමක් බවට පරිවර්තනය කර තිබුණි. අඛණ්ඩව ලාභ ලබමින් හා වර්ධනය වෙමින් පැවති ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව විද්‍යායතනයේ (NSBM) අදාල පරිවර්තන දිනට වත්කම්වල අගය සාධාරණ අගයකට තක්සේරු කර නොතිබුණු අතර එදිනට ශුද්ධ වත්කම්වල පොත් අගය රු.මිලියන 4,414.789 ක් වූ නමුත් ඇපයෙන් සීමිත සමාගම විසින් රු.මිලියන 1,627.687 ගෙවීමේ එකඟතාවය මත අයිතිය බැහැර කර තිබුණි. මෙම ගනුදෙනුව හේතුවෙන් ශුද්ධ වත්කම්වල පොත් අගයට සාපේක්ෂව රු.මිලියන 2,787 ක සෘජු අවාසියක් ආයතනයට (NIBM) සිදුවී ඇති බව නිරීක්ෂණය විය. මෙම වත්කම රජයේ අයිතියෙන් බැහැර කිරීමේ අරමුණු, අනුගමනය කරන ලද ක්‍රමවේදය හා එහි විනිවිදභාවය විගණනයේදී ප්‍රශ්නකාරී වේ.

**ප්‍රධාන ගොඩනැගිල්ල අභ්‍යන්තර නවීකරණ කටයුතු**

ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව ආයතනයෙහි ප්‍රධාන ගොඩනැගිල්ලේ පළමු, දෙවන හා තෙවන මහලෙහි යෝජිත අභ්‍යන්තර නවීකරණ කටයුතු සඳහා කොන්ත්‍රාත් ප්‍රදානයේදී 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.20 (ආ) ට පටහැනිව අනාවරණය කරන ලද නිර්ණායකවලට අමතරව අතිරේක නිර්ණායක හඳුන්වා දී නැවත ඇගයීමක් සිදු කර තිබුණි. ඒ අනුව සුදුසුකම් සපුරන ලද අවම මිල

ඉදිරිපත් කර තිබූ මුල් ආයතන දෙක අභිබවා තෙවැනියට අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනයට පිරිනැමීම හේතුවෙන් රු.මිලියන 1.48 ක පාඩුවක් ආයතනයට සිදුවී තිබුණි.

## ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

**පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සටහන් නොකිරීම.**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ සංශෝධිත ආයතන සංග්‍රහයේ 09 වෙනි පරිච්ඡේදයේ 3.1 ඡේදය අනුව පැමිණිම හා පිටවීම විධිමත් ලෙස තහවුරු කරගෙන වැටුප් හා දීමනා ගෙවියයුතු වුවත් විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩලයේ පැමිණිම හා පිටවීම විධිමත් ලෙස තහවුරු කර නොගෙන රු.මිලියන 1,388ක් වැටුප් හා දීමනා ලෙස 2024 වර්ෂය තුළදී ගෙවා තිබුණි.

**බැඳුම්කර ගිවිසුම් කඩකිරීම වෙනුවෙන්අයකල යුතු මුදල් අඩුවෙන් ගණනය කිරීම**

බැඳුම්කර ගිවිසුම් කඩකල කථිකාචාර්යවරියකගෙන් අයකල යුතු බැඳුම්කර වටිනාකම රු.මිලියන 4.67ක් අඩුවෙන් ගණනය කර තිබුණු අතර එම හිඟ බැඳුම්කර මුදල අදාල කථිකාචාර්යවරියගෙන් හෝ දෝෂ සහිතව ගණනය කළ නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ගෙන් හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**රසායනාගාර උපකරණ නිශ්කාර්යව පැවතීම**

AHEAD ව්‍යාපෘතිය මඟින් වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය, තාක්ෂණ පීඨය සහ පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨ වෙත ලබාදී තිබුණු රු.මිලියන 8 ක රසායනාගාර උපකරණ 2024 දෙසැම්බර් 31 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණු අතර රු.මිලියන 6.17ක් වටිනා රසායනාගාර උපකරණවල වගකීම් කාලය 2024 ජූනි වන විට අවසන් වී තිබුණි.

**තොග පොත් යාවත්කාලීන නොකිරීම**

වාර්තා අනුව කුලියාපිටිය නඩත්තු ගබඩාවේ 2023 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 9.19 ක තොගය, 2024 දෙසැම්බර් 20 දින පරීක්ෂා කිරීමේදී තොග පොත් දෛනිකව යාවත්කාලීන කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**ප්‍රජා මධ්‍යස්ථානය ඌන උපයෝජිතව පැවතීම**

2020 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු නිමකර වෛද්‍ය පීඨයට භාරදී තිබුණු රු.මිලියන 23.16 ක වටිනාකමින් යුත් ප්‍රජා මධ්‍යස්ථානය ඌන උපයෝජිතව පැවතුණි.

**අයිතිය පවරා නොගත් ඉඩම් පැවතීම**

1999 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලය පවත්වාගෙන යනු ලබන තක්සේරු වටිනාකම රු.මිලියන 40ක් වූ මාකඳුර පරිශ්‍රයේ අක්කර 22 ක ඉඩම් නිත්‍යානුකූලව විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

**විදේශ ප්‍රදාන සෘජුව ලබා ගැනීම**

මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය ලබාගැනීමකින් තොරව සෘජු විදේශ ප්‍රදාන මත ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක කර ඉන් ව්‍යාපෘති 03 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 53.3 ක සෘජු විදේශ ප්‍රදාන ලබා නොගත යුතු වුවද එබඳු ප්‍රදාන ලබා ගෙන තිබුණු අතර වෙනත් විදේශ ව්‍යාපෘති 02 ක් මඟින් රු. මිලියන 22.8 ක් වටිනා භාණ්ඩ සෘජුවම විශ්වවිද්‍යාලයට ලබාගෙන තිබුණි.

**අනුමැතියකින් තොරව ගෙවල් කුලී ගෙවීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රයේ VII පරිච්ඡේදයේ 6.1 වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමකින් තොරව කාර්යමණ්ඩලයේ 126 දෙනෙකු වෙනුවෙන් ගෙවල් කුලී ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 8.8 ක් ගෙවා තිබුණු අතර 2017 ජනවාරි 01 සිට 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා මෙලෙස ගෙවා තිබුණු මුදල රු.මිලියන 89.1 ක් විය.

**නිල නිවාස කුලී අඩුවෙන් අයකර තිබීම**

විශ්වවිද්‍යාලය සතු නිල නිවාස ලබා දීමේ දී නිලධාරියාගේ මාසික මූලික වැටුපෙන් සියයට 10 කට සමාන මුදලක් අය කිරීම වෙනුවට විශ්වවිද්‍යාලය විසින් පනවාගත් අතුරු ව්‍යවස්ථා මත කුලී අයකිරීම හේතුවෙන් උපකුලපතිවරයා ඇතුළු නිලධාරීන් 69 දෙනෙකුගෙන් 2024 වර්ෂයේ දී රු. මිලියන 4.6 ක් අඩුවෙන් නිල නිවාස කුලී අයකරගෙන තිබුණි.

**උපාධි පාඨමාලා සඳහා අඩුවෙන් සිසුන් බඳවාගැනීම**

2022/2023 හා 2023/2024 අධ්‍යයන වර්ෂ සඳහා උපාධි පාඨමාලා 16 ක් වෙනුවෙන් සිසුන් 3328 ක් ලියාපදිංචි කර ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දී තිබුණ ද, සිසුන් 2645 දෙනෙකු පමණක් ලියාපදිංචි වී තිබීම හේතුවෙන් සමස්ථ ධාරිතාවය උපයෝජනය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. ඒ අනුව, අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස ලියාපදිංචි නොවූ ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 21 ක් වූ අතර උපාධි පාඨමාලා සඳහා කිසිඳු විදේශ සිසුවෙකු බඳවා ගැනීමට අපොහොසත් වී තිබුණි.

**ශිෂ්‍ය නේවාසිකාගාර අවශ්‍යතාවය**

විශ්වවිද්‍යාලය සතු නේවාසිකාගාර පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සිසුන් 2287 න් සිසුන් 1783 දෙනෙකු සඳහා කුලී පදනම මත නේවාසිකාගාර 64 ක් ලබාගෙන වාර්ෂික කුලිය ලෙස රු. මිලියන 87.4 ක් සමාලෝචිත වර්ෂය තුළදී වැයකර තිබුණි. නව ශිෂ්‍ය නේවාසිකාගාර ඉදිකිරීමට අවධානය යොමු නොවීම හේතුවෙන්, 2008 ජනවාරි සිට 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා වැය කර තිබුණු නේවාසිකාගාර කුලී වියදම් එකතුව රු. මිලියන 376.2 ක් වූ අතර එම මීට අමතරව සෑම නේවාසිකාගාරයක් සඳහාම ආරක්ෂක සේවා, සනීපාරක්ෂක සේවා මෙන්ම ජලය, විදුලිය වැනි වෙනත් උපයෝගීතා සේවාවන් ද ලබා දීමට සිදු වී තිබුණි.

**අනාර්ථික වියදම්**

විශ්වවිද්‍යාලය සතුව ඌන උපයෝජිත, නිෂ්කාර්ය හා අලුත්වැඩියාකර භාවිතයට ගත හැකි තත්ත්වයේ Digital Duplicator යන්ත්‍ර 13 ක් තිබිය දී, පැරණි මාදිලියකට අයත් Digital Duplicator යන්ත්‍ර 07 ක් මිල දී ගෙන රු. මිලියන 7 ක අනාර්ථික වියදමක් සිදු කර තිබුණි.

**ගිවිසුම්වල කොන්දේසි කඩකිරීම**

ටෙන්ඩර් කොන්දේසි අනුව, ආපනශාලා සේවාව නිසියාකාරව පවත්වාගෙන යාමට අවශ්‍ය සේවකයින් සේවයේ යෙදවීමටත් නීත්‍යානුකූල වේතන ගෙවීමටත් ආපනශාලාව ඇතුළත හා ඉන් පිටත දිනපතා පිරිසිදු කිරීමටත් කොන්ත්‍රාත්කරුවන් එකඟ වී තිබිය දී, කොන්ත්‍රාත්කරුවන් ඉවුම් පිහුම් කටයුතු සඳහා බඳවා ගෙන තිබුණු සේවකයින් 13 කට විශ්වවිද්‍යාලයේ ශ්‍රම සේවා සැපයුම් ආයතනය හරහා වැටුප් හා දීමනා රු. මිලියන 7.9 ක් ද ආපනශාලා ඇතුළත හා පිටත පිරිසිදු කිරීමේ කටයුතු වෙනුවෙන් පවිත්‍රතා සේවයට අයත් සේවකයින් 08 ක් යොදවා ඒ වෙනුවෙන් රු. මිලියන 3.3 ක් ද වැටුප් හා දීමනා ගෙවා තිබුණි. මේ අනුව, 2020 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් දක්වා කාලය තුළ එකතුව රු. මිලියන 11.2 ක් වූ අලාභයක් විශ්වවිද්‍යාල අරමුදලට සිදුකර තිබුණි.

**ප්‍රමාද ගාස්තු ගෙවීම්**

විකල්ප ජල සම්පාදන ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද බිල්පත් සඳහා ගෙවීම් කිරීම ප්‍රමාද කිරීම හේතුකොටගෙන එකතු කළ අගය මත බදු වශයෙන් රු. මිලියන 0.8 ක් සමාලෝචිත වර්ෂයේ දී කොන්ත්‍රාත්කරුට අමතරව ගෙවීමට සිදු වී තිබුණු අතර ප්‍රමාදය මත කොන්ත්‍රාත්කරුට ගෙවීම සඳහා ව්‍යාපෘතියේ උපදේශක විසින් 2023 ඔක්තෝබර් 19 දින සහතික කර තිබුණු ප්‍රමාද ගාස්තුව රු. මිලියන 5.1 ක් විය. තවද ප්‍රමාද ගාස්තු සම්බන්ධ ආරවුල නිරාකරණය කර ගැනීම වෙනුවෙන් දෙපාර්ශවය විසින් රු. මිලියන 0.5 ක් බැගින් ගෙවා ආරවුල් තීරකවරයකු (Dispute Adjudicator) පත් කරගෙන තිබුණු අතර ඉහත ගෙවීම් වලට අමතරව තවදුරටත් රු. මිලියන 3.7 ක් ප්‍රමාද ගාස්තු වශයෙන් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට තීරක විසින් නියම කර තිබුණි.

## රුහුණු විශ්වවිද්‍යාලය

**අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවීම් කිරීම**

අධ්‍යාපන අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත පෞද්ගලික කොන්ත්‍රාත් සමාගමට ගෙවීමට නියමිතව තිබූ රු.මිලියන 148කින් සියයට 75කට සමාන රු.මිලියන 131ක මුදලක් අදාළ අනුමැතිය ලබා

ගැනීමකින් තොරව හා මුදල් විශ්වවිද්‍යාලය වෙත ලැබී නොතිබියදී කොන්ත්‍රාත්කරු වෙත උපකුලපති අනුමැතිය මත සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි මාසයේදී විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවා තිබුණි.

## කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යායතනය - හම්බන්තොට

**ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාද වීම.**

1995 ජූලි 14 දිනැති අංක 636 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ විධිවිධාන වලට අනුගත නොවී 2023 හා 2024 වර්ෂවල පවත්වන ලද විභාග16 ක ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා දින 23 සිට දින 347ක් දක්වා කාලයක් ගත කර තිබුණි. එසේම ප්‍රතිඵල නිකුත් නොකළ විභාග16 ක විගණිත දිනය වූ 2025 අප්‍රේල් 29 දින වන විට ප්‍රමාද කාලය දින 08 සිට 330 ක් දක්වා වූ පරාසයන් තුළ ගෙන තිබුණි.

**VAT ගෙවීම්, මාසිකව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට වාර්තා නොකිරීම**

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 123(8) වගන්තිය හා 2024 මාර්තු 21 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පලකර තිබූ අංක 2376/25 දරන ගැසට් නිවේදනයෙහි උපලේඛන I හි 04 ඡේදය ප්‍රකාරව 2024 වර්ෂයේදී අවස්ථා 101 කදී සැපයුම්කරුවන් වෙත ගෙවන ලද රු.මිලියන 2.655 ක VAT බදු පිළිබඳ තොරතුරු මාසිකව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**විභාග අසමත් වීම**

ඉකුත් හා 2024 වර්ෂයේදී පවත්වා තිබුණු විභාග 17 ක් සඳහා ශිෂ්‍යයින් 2136 ක් පෙනී සිට තිබුණු අතර ඉන් ශිෂ්‍යයින් 924 ක් විභාග අසමත් වී තිබුණි. ඒ අනුව විභාගය අසමත් වීමේ ප්‍රතිශතය සියයට 67 ක් දක්වා වී තිබුණු බව නිරීක්ෂණය විය.

## ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය

**ව්‍යාපෘති කාලීනව අවසන් නොකිරීම**

ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 08 ක වටිනාකමකින් යුත් සම්පත් කළමනාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධතියේ (ERP)

කාර්යයන් 2018 මැයි 31 දින වන විට අවසන් කළ යුතු වුවත් 2024 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 4.074 ක් වැය කර තිබුණද අදාල ව්‍යාපෘතිය සම්පූර්ණ කර නොතිබුණු නිසා අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට විශ්වවිද්‍යාලය නොහැකි වී තිබුණි.

**ඌන උපයෝජිතව පැවති විදේශ භික්ෂු නේවාසිකාගාරය**

විදේශ ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා බඳවා ගැනීමට සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීමකින් තොරව හා ශිෂ්‍ය නේවාසිකාගාරය ඉදිකිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර විදේශ ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා 25 නමකට නේවාසික පහසුකම් සැපයීමේ අපේක්ෂාවෙන් රු.මිලියන 80.843 ක වියදමකින් 2020 ජනවාරි 14 දින ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදිකර වැඩ අවසන් කර තිබුණි. එසේ වුවද, 2022/2023 හා 2023/2024 අධ්‍යයන වර්ෂ තුළ විදේශ ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා තුන්නමක් පමණක් බඳවා ගැනීම හේතුවෙන් නේවාසිකාගාරය ඌන උපයෝජිතව පැවතුණි.

## අග්නිදිග විශ්වවිද්‍යාලය

**කෝප් කමිටු නිර්දේශ ක්‍රියාත්මක නොවීම**

බැඳුම්කර කඩකල කථිකාචාර්යවරයෙකුගෙන් රු.මිලියන 1.73ක මුදලක් අයකර ගැනීම ආරම්භ කර තිබුනේ වසර 9 ක් ප්‍රමාද වීමෙන් පසුව 2013 වර්ෂයේදීය.එහි ප්‍රතිඵලයක් ලෙස, කථිකාචාර්යවරයා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කර තිබූ අතර, එහි තීන්දුව වූයේ ශ්‍රී ලංකාවට නැවත පැමිණ වසර හයක් ඇතුළත විශ්වවිද්‍යාලය ක්‍රියා කිරීමට අපොහොසත් වීම හේතුවෙන් අයකර ගත් මුදල ආපසු ගෙවිය යුතු බවයි. වගකිවයුතු නිලධාරීන්ගේ නොසැලකිල්ල හේතුවෙන් විශ්වවිද්‍යාලයට රු.මිලියන 1.73 ක පාඩුවක් සිදුවී තිබුණි. 2017 දී කෝප් කමිටුව මෙම කාරණය පරීක්ෂා කර වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට නිර්දේශ කර තිබුණද, විශ්ව විද්‍යාල කවුන්සිලය වසර හතකට වැඩි කාලයක් තුළ ක්‍රියා කිරීමට අපොහොසත් වී තිබුණි.

## නැගෙනහිර විශ්වවිද්‍යාලය

**අධිගෙවීම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා මාර්ගෝපදේශ වලට අනුව නිවුන් පරිගණක මේසයක් සඳහා වැඩිපුර ගෙවන ලද ඒකකයක මිල රු. 23,500 ක් විය. කෙසේවෙතත්, මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය විසින් මේසයක් සඳහා රු. 74,450 ක් ගෙවා තිබීම හේතුවෙන් නියමිත අවශ්‍යතා වලට අනුගත නොවෙමින් මේස 25 ක් සඳහා රු. මිලියන 1.274 ක් වැඩිපුර ගෙවා තිබෙන අතර එය අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

**නව ජාල සම්බන්ධතාවයට බාධා වීම.**

අතිරේක **AHEAD** අරමුදල යටතේ නව ජාලයක් ව්‍යාප්ත කිරිම, ස්ථාපනය කිරිම, සහ නඩත්තුකිරිම සඳහා පුද්ගලික සමාගමකට රු. මිලියන 6.15 ක මුදලක් ත්‍රිකුණාමල විශ්වවිද්‍යාලය විසින් ගෙවීම් කර තිබුණි. කෙසේ වෙතත්, කැණීම් කටයුතු කිරීමේ දී ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුගේ සේවකයෙකු අතින් පොළව යට තිබෙන තන්තු රැහැනකට හානිවීමෙන් ජාල සම්බන්ධතාවයට බාධාවිය. එසේ තිබියදීත් විශ්වවිද්‍යාලය විසින් හානි වූ තන්තු රැහැන යළි නිර්මාණය කිරීමට හෝ පිළිසකර කිරීමට විශ්වවිද්‍යාලය විසින් කිසිදු පියවරක් නොගන්නා ලද අතර ඒ හේතුවෙන් ජාල සේවාවට දිගින් දිගටම බාධා විය.

## පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**අනුමැතියකින් තොරව ආයෝජනය කිරීම**

1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය මුදල් අමාත්‍යවරයාගේ හා විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 3,184.71ක අතිරික්ත මුදල් ආයෝජනය කර තිබුණි.

**නිවාස කුලී අඩුවෙන් අයකිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xix වන පරිච්ඡේදයේ 5 ඡේදය ප්‍රකාරව ආයතන සංග්‍රහයේ නියමයන්ගෙන් බැහැරව විශ්වවිද්‍යාල පාලක සභාව තීරණය කරන ලද නිවාස කුලී මුදලක් අය කිරීම හේතුවෙන් 2024 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය සඳහා අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 324

දෙනෙකුගෙන් එකතුව රු.මිලියන 19.68ක කුලී මුදලක් අඩුවෙන් අයකර තිබුණි.

**වාහන ඉවත්කිරීමේ ආදායම්**

වාහන ඉවත් කිරීමේ ක්‍රියාවලිය මගින් ලද රු.මිලියන 3.30ක ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු නොකර විශ්වවිද්‍යාල ගිණුමට බැර කර තිබුණි.

**අනුමැතියෙන් තොරව ගෙවීම් සිදු කිරීම**

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව 2018 නොවැම්බර් 26 දිනැති අංක 15/2018 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලය තුළ රු.මිලියන 71.06 ක මුදලක් සේවක අග්‍රහාර රක්ෂණ දායකය වශයෙන් ජාතික රක්ෂණ භාරකාර අරමුදල වෙත විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවා තිබුණි.

**අතරමඟ නවතා දමන ලද ව්‍යාපෘති**

උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) යටතේ Construction of proposed extension to the manufacturing and industrial Engineering building of the faculty of Engineering ව්‍යාපෘතිය නිම කිරීම සඳහා කොන්ත්‍රාත් වටිනාකම වැට් රහිත රු.මිලියන 127.87 මුදලකට පෞද්ගලික ආයතනයක් සමඟ 2021 පෙබරවාරි 16 වන දින ගිවිසුම්ගතව තිබුණු අතර ගිවිසුම ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය 2022 අගෝස්තු 15 වන දින වන විට අවසන් කළ යුතු වුවද, 2023 දෙසැම්බර් 31 දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් සියයට 49ක් පමණක් වැඩ අවසන් කර තිබූ අතර රු.මිලියන 91.05ක් ගෙවීම් සිදුකර තිබුණි. විශ්වවිද්‍යාලය විසින් කාර්යසාධන බැඳුම්කරය මුදල් කර ගැනීමට යාමේදී කොන්ත්‍රාත්කරු විසින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් කාර්ය සාධන බැඳුම්කරය විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට නොහැකි වී තිබුණි.

**අයකර නොගත් වැටුප් අත්තිකාරම්**

අනධ්‍යයන සේවක වැඩ වර්ජනය සිදුකරන ලද 2024 මැයි 02 සිට 2024 ජූලි 15 දක්වා කාලසීමාව තුළදී ස්ථිර කාර්ය මණ්ඩලයේ සේවකයින් 09

දෙනෙකු සඳහා හා තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩල සේවකයින් 21ක් සඳහා ගෙවන ලද එකතුව රු. මිලියන 3.44ක්වූ වැටුප් අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර ගෙන නොතිබුණි.

**අනුමත නොවූ තනතුරු සඳහා ගෙවීම**

2017 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මක කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලයට අනුව එහි අනුමත නොවූ අධ්‍යක්ෂක තනතුරු 04 ක් සඳහා 2014 සිට 2024 වසර දක්වා එකතුව රු.මිලියන 3. 22ක් දීමනා ලෙස ගෙවා තිබුණි.

**ප්‍රමාද දඩ මුදල් ගෙවීම**

විශ්වවිද්‍යාලය විසින් නියමිත දිනට විදුලිය හා ජල බිල්පත් පියවීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2022 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා එකතුව රු.මිලියන 2.42 ක දඩ මුදල් ගෙවීමට සිදුවී තිබූ අතර ඊට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන විශ්වවිද්‍යාල අරමුදලට සිදුවූ පාඩුව අය කිරීමට කටයුතු කර නොතිබුණි.

**ගෙවිය යුතු ගිණුම්**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571(2),(3) ප්‍රකාරව ඉදිකිරීම් ව්‍යාපෘති අවසන් කර විශ්වවිද්‍යාලය වෙත භාරදී ඇති ව්‍යාපෘති 09 ක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවිය යුතු රු.මිලියන 33.43 ක රඳවාගත් ඉපයීම් හා රු.මිලියන 3.53 ක් වූ ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**ඉල්ලා අස්වීම කලින් දැනුම් නොදීම**

විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ I කොටසෙහි V වන පරිච්ඡේදයෙහි 4.1 ඡේදය හා 4.1.1 ඡේදය ප්‍රකාරව ආචාර්යවරයෙකු විසින් තම සේවයෙන් ඉල්ලා අස්වීම මාස 03 කට පෙර නියමිත කාර්යය පරිපාටිය යටතේ පාලක සභාවට ලිඛිතව දැන්විය යුතු බවත්, මාස 03 කට පෙර දැනුම් නොදෙන්නේ නම් මාස 03ක වැටුප විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු බව දක්වා ඇතත් කථිකාචාර්යවරුන් 40 දෙනෙකු සිය ඉල්ලා අස්වීම ඉදිරිපත් කළ දිනයේ සිටම සේවයට වාර්තා කර නොතිබුණද ඔවුන්ගෙන් අයකළ යුතු රු.මිලියන 9.21 ක් වූ මාස 03 ක වැටුප් 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

**ඇඟිලි සළකුණු මඟින් පැමිණීම පිටවීම තහවුරු නොකිරීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන ආයතනික චක්‍රලේඛ ලිපිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ස්ථිර හා ආධුනික කථිකාචාර්යවරුන්ගේ පැමිණීම හා පිටවීම තහවුරු කර ගැනීමකින් තොරව 2023 වර්ෂයේදී රු.මිලියන 3,385.32ක් හා 2024 වර්ෂයේදී රු.මිලියන 3,711.52ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි

**පර්යේෂණ ව්‍යාපෘති**

2018 වර්ෂයේ සිට 2024 දක්වා කාලය තුළ අවසන් කළ යුතු විශ්වවිද්‍යාලයේ පීය 07ක ක්‍රියාත්මක එකතු වටිනාකම රු.මිලියන 97.76ක් වූ පර්යේෂණ ව්‍යාපෘති 46ක් වෙනුවෙන් 2024 වර්ෂය අවසන් වන විට රු.මිලියන 86.05ක් වැයකර තිබුණු අතර එම පර්යේෂණ අවසන් කිරීමට හෝ එම ව්‍යාපෘතිවල කාලය දීර්ඝ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**අරමුදල් ඌන උපයෝජනය**

Scientific capacity development to strengthen informed decision making for improved climate policy formulation and implementation in South Asian countries (APP) ව්‍යාපෘතිය 2015 ජූලි 01 සිට 2016 ජූලි 30 දක්වා කාලය තුළ සම්පූර්ණ කිරීම සඳහා ලැබී තිබුණු රු. මිලියන 1.47ක මුදල 2024 දෙසැම්බර් 31 දින වන විට වසර 08 ක කාලයක් ගතවී තිබියදීත් අදාල කාර්යය සඳහා උපයෝජනය කිරීමකින් තොරව පැවතුණි.

තවද, පර්යේෂණ අරමුදල් 05 කට අදාල රු.මිලියන 7.31ක්, විවිධ අරමුදල් 06 කට අදාළ රු.මිලියන 4.36 හා වෙනත් අරමුදල් 08 කට අදාළ රු.මිලියන 7.70 ක මුදලක් වසරක කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි.

**ජාතික ජල සම්පාදන මණ්ඩලයට ගෙවීම**

විශ්වවිද්‍යාලයේ අපජල පද්ධතිය මහනුවර නාගරික අපජල ව්‍යාපෘතියට සම්බන්ධ කිරීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සහ මහනුවර මහනගර සභාව අතර අවබෝධතා ගිවිසුමට එලඹීමකින් තොරව 2019 වර්ෂයේ ව්‍යාපෘතිය ආරම්භකළ ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත 2020 වර්ෂයේ

අවස්ථා 2 කදී රු.මිලියන 16.85ක මුදලක් ගෙවීම් කර තිබුණි. 2021 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතියේ වැඩ නතර කර දමා තිබුණු අතර 2024 ඔක්තෝම්බර් 28 දින වන විට භෞතික ප්‍රගතිය සියයට 7.8ක් වැනි අඩු මට්ටමක පැවතුණි.

**නේවාසිකාගාර පරිශ්‍රයේ ආපනශාලාවක් ඉදිකිරීම**

මීවතුර නේවාසිකාගාර පරිශ්‍රයේ ආපනශාලාවක් ඉදිකිරීම සඳහා 2021 ඔක්තෝබර් 01 දින පෞද්ගලික ආයතනයක් සමඟ රු.මිලියන 36.81ක ගිවිසුමකට එළඹ තිබුණු අතර 2022 සැප්තැම්බර් 30 දින වන විට මෙම කර්මාන්තය නිම කර භාර දිය යුතු වුවත්, 2024 සැප්තැම්බර් 10 විගණන දින වන විටත් ගොඩනැගිල්ලේ අත්තිවාරමේ කටයුතු පමණක් නිමකර තිබුණි. තවද 2022 අගෝස්තු 04 වන දින කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතියේ වැඩ තාවකාලිකව නතර කරන බව විශ්වවිද්‍යාලය වෙත ලිඛිතව දන්වා වැඩ බිමෙන් ඉවත්ව ගොස් තිබුණු අතර මෙම ව්‍යාපෘතිය 2023 ජූනි 15 දින සිට ක්‍රියාත්මකවන ලෙස දෙපාර්ශවයේ එකඟත්වය මත ගිවිසුම අවසන් කිරීමට 2024 අගෝස්තු 25 දින පැවති විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය ලබා දී තිබුණි. තවද මෙම ව්‍යාපෘතියට අදාළ වූ රු.මිලියන1.84 ක කාර්යසාධන ඇපකරය 2024 ජූලි 13 වන දින අවසන් වීමට පෙර මුදල්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ වන විට මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කටයුතු සඳහා අදාළ ප්‍රසම්පාදන කටයුතු නැවත සිදු කරමින් පවතී.

## කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

**බාහිර කථිකාචාර්යවරුන්ගේ APIT බදු අඩුවෙන් ගෙවීම**

2023 මාර්තු 29 දිනැති අංක SEC/2023/E/01 දරන දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාළව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සහ බාහිර දේශකවරු වෙනුවෙන් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු අත්තිකාරම් පුද්ගල ආදායම් බදු මුදල රු. මිලියන 6.90 ක් වුවද, ගණනය කර ගෙවා තිබුණේ රු. මිලියන 0.72ක මුදලක් පමණක් බැවින් දේශීය ආදායම් බදු

දෙපාර්තමේන්තුව වෙත රු.මිලියන 6.19 ක බදු මුදලක් අඩුවෙන් ගෙවීම් කර තිබුණි.

**ඇඟිලි සළකුණු යන්ත්‍ර මඟින් පැමිණීම පිටවීම සළකුණු නොකිරීම**

2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතනික චක්‍රලේඛ ලිපිය ප්‍රකාරව ආයතනයේ අධ්‍යක්ෂකවරයාගේ පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් හා දීමනා ලෙස රු. මිලියන 8.06 ක් ගෙවා තිබුණි.

## ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය

**ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දුර්වලතා**

ආයතනය විසින් අධ්‍යාපනික කටයුතු සඳහා තේක්ක ලීයෙන් සාදන ලද රු. මිලියන 4.075 ක් වටිනා චිත්‍රාධාර 250 ක් මිළ දී ගෙන තිබේ. එසේ වුවත් ඒකක 100 කට වැඩි ප්‍රමාණයක් දුර්වල ගුණාත්මක තත්ත්වය හේතුවෙන් කෙටි කාලයක් තුළ දෝෂ සහගත වීමෙන් ගබඩා තුළ නිෂ්ක්‍රීයව පැවතිණි. 2024 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයේ දී මෙම දෝෂ වාර්තා කිරිමට අසමත්ව තිබූ අතර 2025 පෙබරවාරි මාසය වනවිට ප්‍රසම්පාදනයේ ගුණාත්මකභාවය සහ වත්කම් සත්‍යාපන ක්‍රියාවලින් යන දෙකෙහිම දුර්වලතා ඉස්මතුකරමින් ඒකක 100ක් අලුත්වැඩියා කරදෙන ලෙස දෘශ්‍ය හා තාක්ෂණික කලා දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින ලදී.

**ප්‍රසම්පාදනයේ සහ තත්ත්ව පාලනයේ ප්‍රමාද දෝෂ**

ආයතනය විසින් නිසි ගුණාත්මක පිරිවිතර කිරීමකින්, සත්‍යාපනය කිරිමකින් හෝ නියැදි කිරිමකින් තොරව රු. මිලියන 2.44 කට කැන්වස් පුවරු 1,000 ක් මිළ දී ගන්නා ලදී. විශාල පුවරු වලට වඩා මිළෙන් වැඩි කුඩා පුවරුවල මිළ අක්‍රමිකතා හඳුනාගන්නා ලදී. භාරදෙන ලද අයිතමවල රාමුවේ ප්‍රමාණය සහ රෙදිවල ගුණාත්මකභාවය මිළ ප්‍රකාශ වලට වඩා වෙනස් වූ අතර දෝෂ සහගත විය. මිළ දී ගැනීමේ සහ තත්ත්ව පාලනයේ බරපතළ ප්‍රමාද දෝෂ පිළිබිඹු කරමින් මෙම දෝෂ තිබිය දී ද ගෙවීම් සිදුකර තිබුණි.

**ශිෂ්‍ය කාර්යසාධනය අධීක්ෂණය කිරීම ප්‍රමාණවත් නොවීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා මාර්ගෝපදේශ චක්‍රලේඛ අංක 04/2015 සහ 09/2019 අනුව, ශිෂ්‍ය කාර්සාධනය සහ ශාස්ත්‍රීය ප්‍රමිති අධීක්ෂණය කිරීමට අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකක (IQAUs) අවශ්‍යවේ. කෙසේවෙතත්, සංගීතය විෂයෙන් (ගායනය) 27.9% ක්, නැටුම් විෂයෙන් 22.95% ක්, දෘශ්‍ය හා තාක්ෂණික කලා විෂයෙන් 20.37% ක්, සංගීතය (වයලීනය) විෂයෙන් 21.43% ක් ඇතුලුව විෂයන් කිහිපයක අසමත්වීමේ ඉහළඅනුපාතයන් විගණනයේ දී අනාවරණය විය. විශේෂයෙන්, විෂයන් දෙකක ("සමාජ සංහිදියාව සහ ශ්‍රී ලාංකික අධ්‍යයනයන් පිළිබඳ හැඳින්වීම","මූලික විද්‍යාව පිළිබඳ හැඳින්වීම") 100% ක අසමත්විමේ අනුපාතයන් වාර්තා වූ අතර ඇතැම් පාඨමාලා සඳහා සියලු සිසුන් විසින් පහළ ම සමත්විමේ ශ්‍රේණිය වන "C-" පමණක් ලබාගෙන තිබුණි.

# නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන, වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

නිපුණත්වයෙන් සපිරි ශ්‍රම බලකායක් යන දැක්ම ඇතිව දැනුමෙන්, වෘත්තීය නිපුණතාවයෙන් හා කුසලතාවයෙන් පිරි සුහුරු සමාජයක් බිහි කිරීම සඳහා පසුබිම සැකසීමේ මෙහෙවර පෙරදැරිව “පොහෙසත් රටක් ලස්සන ජීවිතයක්” රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව 2025 වර්ෂය තුලදී ඉහළ වැටුප් සහිත රැකියා නියුක්තිකයෙකු සෑම පවුලක් තුළින්ම බිහිකිරීමේ ඉලක්කය උදෙසා ආයතන 18ක් හා එක් දෙපාර්තමේන්තුවකින් සමන්විතව අමාත්‍යාංශය ක්‍රියාත්මකව පැවතුණි.

ඉහත කාර්යයභාරය ඉටුකරගනු ලැබීම සඳහා 2024 වර්ෂයේදී නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය යටතේ වෙන්කරන ලද ප්‍රතිපාදනය රු. මිලියන 13,552ක් වූ අතර 2024 වර්ෂය තුල රු. මිලියන 9,866ක් උපයෝජනය කර තිබූ අතර රු. මිලියන 3,686ක් හෙවත් සියයට 27ක් උපයෝජනය කර නොතිබුණි. එමෙන්ම කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන රු.මිලියන 2,883ක් වූ අතර 2024 වර්ෂයේ වියදම රු. මිලියන 2,746ක් වූ අතර රු. මිලියන 136ක් උපයොජනය කර නොතිබුණි.

**ප්‍රස්ථාර අංක 2.34 - 2024 වර්ෂය තුලදී කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන, වියදම සහ ඉකිරිය**




**මූලාශ්‍රය - 2024 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන**

ඉහත සඳහන් කාර්යයභාරය ඉටු කිරීම සම්බන්ධයෙන් සිදුකල නියැදි විගණන පරීක්ෂාවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## අධ්‍යාපන අමාත්‍යාංශය

### නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන අංශය

**ප්‍රතිපාදන ඌන උපයෝජනය**

පරිපූරක ඇස්තමේන්තු මගින් වෙන්කර ගනු ලබන ලද ප්‍රතිපාදන කිසිදු අවස්ථාවක ඉතිරිවීම් සිදු නොකර අදාළ කාර්යයෙහි සම්පූර්ණ වශයෙන් උපයෝජනය කලයුතු වුවත්, අමාත්‍යාංශයේ නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය විසින් 2024 වර්ෂය තුළ පරිපූරක ඇස්තමේන්තු මගින් අවස්ථා 25කදී වෙන්කරවා ගනු ලැබූ එකතුව රු.මිලියන 267.02ක ප්‍රතිපාදන වලින් රු.මිලියන 228ක් එනම් සියයට 85ක් වැය නොකර ඉතිරිකර තිබුණු අතර පුනරාවර්තන වැය විෂයයන් 03ක් හා මූලධන වැය විෂයයන් 09ක් වෙනුවෙන් වෙන්කරන ලද රු.මිලියන 1094ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි.

**වෘත්තීය පුහුණු ආයතන සඳහා බඳවා ගත් සිසුන් සංඛ්‍යාව අඩු වීම**

2024 වර්ෂය තුළ වෘත්තීය අධ්‍යාපන අංශය යටතේ ඇති වෘත්තීය පුහුණු ආයතන සඳහා බඳවාගෙන තිබූ සිසුන් සංඛ්‍යාව 105,258ක් වූ අතර එය 2022 හා 2023 වර්ෂවල බඳවාගත් සිසුන් සංඛ්‍යාව වූ පිළිවෙලින් 108,219කට හා, 120,255කට සාපේක්ෂව අඩු වීමක් නිරීක්ෂණය විය.

**නාගරික විශ්වවිද්‍යාල 05 ක් ආරම්භ කිරීම**

2021 ජනවාරි 04 දිනැති අංක 2209/14 දරන ගැසට් පත්‍රයේ සුවිශේෂී ප්‍රමුඛතා යටතේ හඳුනා ගන්නා ලද නාගරික විශ්වවිද්‍යාල 05ක් ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් 2021, 2022 සහ 2023 වර්ෂයන්හි එකතුව රු.මිලියන 500ක් ප්‍රතිපාදනය වෙන්කර තිබුණු නමුත් 2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. 2023 වර්ෂය අවසන් වන විට කෑගල්ල ප්‍රදේශයේ ගොඩනැගිල්ලක් තෝරා ගෙන ඒ සඳහා ජලබිල්, විදුලි බිල්, ආරක්ෂක වියදම් සඳහා එකතුව රු.මිලියන 17.94ක් වැයකර තිබුණද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. මේ නිසා වැයකල මුදල් නිෂ්කාර්ය වී තිබුණි.

## තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

**ලියාපදිංචි පුහුණු ආයතන**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා වෙබ් අඩවි වාර්තා අනුව 2025 මාර්තු 30 වන විට තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි පුහුණු ආයතන 3,916ක් අතරින් ක්‍රියාකාරී මට්ටමේ පවතින ආයතන 1,722ක්ද, ලියාපදිංචි කාලය ඉකුත් වී තිබූ ආයතන 1,304ක්ද, වසා දමන ලද ආයතන 844ක්ද පැවතුණද, අදාළ ආයතන වසා දැමීම හෝ ලියාපදිංචිය අළුත් නොකිරීම සම්බන්ධයෙන් හේතු වූ කරුණු අනාවරණය කරගෙන කොමිෂන් සභාව විසින් ගතයුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. 2024 වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් ජාතික නිපුණතා සම්මත පාඨමාලා 50ක් අලුතින් සංවර්ධනය කිරීමට හා 30ක් යාවත්කාලීන කිරීමට සැලසුම් කර තිබුණද, එහි ප්‍රගතිය පිළිවෙලින් 26ක් හා 22ක් වී තිබුණි.

**ජාතික වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලැස්ම සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම**

1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනතෙහි 2 පරිච්ඡේදයෙහි 11 වන වගන්තියට අනුව ජාතික වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලැස්මක් සකස්කර ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීමේ කාර්යය කොමිෂන් සභාව පිහිටුවා 2024 වර්ෂය අවසන් වන විට වසර 32ක් ගත වී තිබුණද අවසන් කිරීමට අපොහොසත් වී තිබුණි.

**තත්ත්ව කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම**

වර්ෂ 2016 යේදී නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශ ලේකම්වරයා නිකුත්කරන ලද, අංක MSDVT/SSDP/2016-1 දරණ චක්‍රලේඛයට අනුව 2017 වර්ෂයේ සිට ජාතික වෘත්තීය සුදුසුකම් (National Vocational Qualification) 1 සිට 6 දක්වා පාඨමාලා පවත්වන සියලුම ආයතන විසින් තත්ත්ව කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම අනිවාර්ය කර තිබුණි. එහෙත් 2019 වර්ෂයෙන් පසු කිසිදු ආයතනයක් මේ අනුව කටයුතු කර නොතිබුණද ඒ පිළිබඳ නියාමන ආයතනය ලෙස කොමිෂන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**පනත සංශෝධනය කිරීම**

වර්ෂ 2023 සැප්තැම්බර් 01 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ අනු කාරක සභාව විසින් ලබාදී තිබූ නිර්දේශයන්ට අනුව කොමිෂන් සභා පනතෙහි දක්වා ඇති විධිවිධාන අනුගමනය නොකරන වෘත්තීය පුහුණු ආයතන සම්බන්ධයෙන් 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනතෙහි v කොටසෙහි දක්වා තිබූ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය වන පරිදි නියෝග ලබා ගත යුතු අධිකරණය, නිශ්චිතව දැක්වෙන පරිදි පනත සංශෝධනය කිරීමේ කාර්යය 2024 වර්ෂය අවසාන වන විටත් අවසන් කර නොතිබුණි.

**අනුමත නොවන දීමනා**

භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ අනුමැතිය මත 2024 වර්ෂය තුලදී දීමනා වර්ග 16ක් ගෙවීම සඳහා එකතුව රු.මිලියන 42.34ක් වැයකර තිබුණි.

## ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය

**ස්ථාපිත පනත පරිදි කාර්යයන් ඉටු නොකිරීම.**

වර්ෂ 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනතේ II වන කොටසේ VI වන පරිච්ඡේදයේ 37 වගන්තියේ දක්වා ඇති පරිදි වෘත්තීය පුහුණුව පිළිබඳව පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් සිදුකිරීම, විවිධ දක්ෂතා වැඩිදියුණු කිරීම, ප්‍රවර්ධනය පිණිස තරඟ පැවැත්වීම, වෘත්තීය පුහුණුව සලස්වන ආයතනවල සහ වෙනත් ආයතනවල පුහුණු කිරීමේ හැකියාවන් සංවර්ධනය කිරීම වෙනුවෙන් ක්‍රියාකාරකම් සිදුකිරීම සහ වෘත්තීය පුහුණු කිරීම සම්බන්ධයෙන් තෘතියික හා වෘත්තීය කොමිෂන් සභාවට උපදෙස් ලබාදීම සම්බන්ධයෙන් කිසිදු කාර්යයක් ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් 2024 වර්ෂය තුළ සිදුකර නොතිබුණි.

**පාඨමාලා හදාරණ සිසුන් සංඛ්‍යාව අඩුවීම**

කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ සිවිල් ඉංජිනේරු අංශය වෙත 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ වාර්ෂිකව සිසුන් 100කට අධික සංඛ්‍යාවක් පාඨමාලා සඳහා බඳවාගෙන තිබූ නමුත් 2023 සහ 2024 වර්ෂ සඳහා බඳවාගත් සිසුන් සංඛ්‍යාව පිළිවෙළින් 18ක් සහ 12ක් ලෙස අඩුවී තිබුණි. Mechanical General Engineering පාඨමාලාව සඳහා 2020 වර්ෂයේ සිසුන් 87 දෙනෙකු

බඳවාගෙන තිබුණද, 2023 සහ 2024 වර්ෂයන්හිදී ඇතුලත් වූ සිසුන් සංඛ්‍යාව පිළිවෙළින් 25ක් සහ 13ක් වී තිබුණි. මේ නිසා ඔස්ට්‍රියානු ව්‍යාපෘතියක් මගින් මෙම ආයතනය වෙත ලබා දී තිබූ එකතුව රු.මිලියන 947.44ක උපකරණ 2021 වර්ෂයෙන් පසුව ලබා දී තිබුණද, එම උපකරණ කාර්යක්ෂම හා ඵලදායීව උපයෝජනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**බාහිර උපදේශකවරුන් සඳහා බඳවාගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීම**

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියට බාහිර උපදේශකවරුන් බඳවාගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණු නමුත් බාහිර උපදේශකවරුන් 307 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

## ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**නේවාසිකාගර ගොඩනැගිල්ල භාවිතා නොකිරීම**

2017 වර්ෂයේදී ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට අයත් කුච්චවෙලි හෝටල් පාසලේ ආධුනිකයින් 52 දෙනෙකුට නවාතැන් ලබාදිය හැකි අංග සම්පූර්ණ කාමර 12කින් සමන්විත දෙමහල් නේවාසිකාගාර ගොඩනැගිල්ලක් රු.මිලියන 140.21ක් වැයකර ඉදිකර තිබුණි. එහෙත් ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් ලබා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වාම ස්ථිර ජල සැපයුමක් ලබා ගැනීමට නොහැකි වීම නිසා ආධුනිකයන්ගේ නේවාසිකාගාරයක් ලෙස භාවිතා කිරීමට නොහැකි වී තිබුණි.

## වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය

**ප්‍රතීතනය ලබා ගැනීම**

වෘත්තීය කාක්ෂණ විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන ඉංජිනේරු උපාධි පාඨමාලා හතරක් සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙන් ප්‍රතීතනය ලබා ගැනීමට 2010 වර්ෂයේදී තීරණය කර වසර 15කට වැඩි කාලයක් ගත වී තිබුණද, අපේක්ෂිත මට්ටමට උපාධි පාඨමාලාවල ප්‍රමිතගත තත්ත්වයන් පවත්වා නොගැනීම හේතුවෙන් ප්‍රතීතනය ලබාගැනීමට නොහැකි වී තිබුණි. විශ්වවිද්‍යාලය මගින් 2015 වර්ෂයේ සිට පවත්වනු ලබන ගොඩනැගිලි තාක්ෂණ පාඨමාලාව (B-Tech in Building Service Technology) සඳහා

ගොඩනැගිලි සේවා ඉංජිනේරු වරලත් ආයතනයේ (Charted Institute of Building Service Engineering UK) ප්‍රතීතනය ලබා ගැනීමට අදාල අනුමැතිය රේඛීය අමාත්‍යාංශයෙන් ලැබී තිබුණද, එම ක්‍රියාවලියද අවසන් කර නොතිබුණි.

## සාගර විශ්ව විද්‍යාලය

**පරිපාලන හා වෙනත් සාමාන්‍ය කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීම**

ලෝක බැංකු ආධාර (AHEAD) යටතේ සාගර විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය කටයුතු, විභාග, මූල්‍ය, පරිපාලන හා වෙනත් සාමාන්‍ය කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා Integrated Education Management Information System (IEMIS) නමින් 2021 අගෝස්තු 31 දින සිට 2022 පෙබරවාරි 26 (දින 180) දින දක්වා වූ කාලසීමාවක් සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුමකට එළඹී තිබුණි. මෙම ව්‍යාපෘතිය මගින් රු.මිලියන 9.88ක් වැයකර නිර්මාණය කර තිබූ ආදර්ශක (Modules) 14ම 2024 වර්ෂය අවසන් වන විට භාවිතයට ගෙන නොතිබුණි.

## ජර්මානු කාර්මික අභ්‍යාස ආයතන

**උපදේශන සභාවක් පත්කිරීම**

වර්ෂ 2017 අංක 15 දරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතන පනතේ 16 වන වගන්තිය අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විමසා අදාල අමාත්‍යවරයා විසින් 06 දෙනෙකුගෙන් සමන්විත උපදේශන සභාවක් පත්කල යුතු වේ. එම උපදේශන සභාව විසින් පනතේ 04 වන වගන්තියේ සඳහන් කර ඇති කර්තව්‍යයන් ඉටු කිරීම සම්බන්ධ සියළු කාරණා පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට සහ අදාල අමාත්‍යවරයාට නිර්දේශ ලබාදිය යුතු බවත් දක්වා තිබුණද, 2024 වර්ෂය අවසානය දක්වා එවැනි උපදේශක සභාවක් පත්කර නොතිබුණි.

**ඉඩම් අයිතිය නිරවුල් නොකිරීම**

ජර්මානු කාර්මික ආයතනය භුක්ති විඳිනු ලබන අක්කර 29 හා පර්චස් 138.49ක් වූ ඉඩම් 05ක් ලංකා ගමනාගමන මණ්ඩලයට හා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු බව දක්වා තිබුණද, එම ඉඩම්වල අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

| | |
|---|---|
| **අධ්‍යක්ෂ/ විදුහල්පති නිල නිවස උපයෝජනය නොකිරීම** | ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය සතු ගල්කිස්ස පිහිටි අධ්‍යක්ෂ/ විදුහල්පති නිල නිවස 2020 වර්ෂයේ සිට කිසිදු නිලධාරියෙකු විසින් භාවිතයට ගෙන නොතිබුණු අතර ඒ සඳහා ආරක්ෂක ගාස්තු ලෙස 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය අවසානය දක්වා රු.මිලියන 4.1ක් නිශ්කාර්යව වැයකර තිබුණි. |

# රාජ්‍ය පරිපාලන කටයුතු

සිවිල් පරිපාලනයේ කේන්ද්‍රස්ථානය වෙමින් ජනතා කේන්ද්‍රීය රාජ්‍ය සේවයක් වෙනුවෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ක්‍රියාත්මක වේ. 2024 වර්ෂයේදී අමාත්‍යාංශය වෙත එකතුව රු.මිලියන 46,992ක ප්‍රතිපාදන සලසා තිබූ අතර ඉන් වර්ෂය අවසානය වන විට රු.මිලියන 23,639ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, රු.මිලියන 23,352ක් උපයෝජනය කර නොතිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25ක්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 341ක්, පළාත් පාලන ආයතන 341ක්, දෙපාර්තමේන්තු 03ක්, සංස්ථා/මණ්ඩල 05ක්, එක් කොමිෂන් සභාවක් සහ එක් සමාගමක් මෙම අමාත්‍යාංශය යටතේ වන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක වේ.

## විගණන නිරීක්ෂණ

### රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**හිඟ ගොඩනැගිලි කුලී**

2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ගොඩනැගිලි කුලිය රු.මිලියන 347ක් වූ අතර එය ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී රු.මිලියන 59කින් හෙවත් සියයට 21කින් වැඩිවී තිබීමෙන් හිඟ කුලිය කාලීනව අයකර ගැනීම දුර්වල මට්ටමක පැවැතුණි. මෙම හිඟ කුලී මුදලින් රු.මිලියන 168 ක් 2021 වර්ෂයට පෙර සිට අයවිය යුතුව පැවතුණු අතර, රු.මිලියන 30ක් මෙම අමාත්‍යාංශය යටතේ පාලනය වන රජයේ බංගලා, සංචාරක බංගලා සහ නිල නිවාසවලින් අයවිය යුතුව පැවතුණි.

තවද, අමාත්‍යාංශයට අදාළ ආදායම් සංකේතාංකයට අයත් ගොඩනැගිලි හා නිවාස මොනවාද යන්න පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් නොපවතින බැවින් සම්පූර්ණ ගොඩනැගිලි හා නිවාස කුලී නිවැරදිව ගිණුම්ගත කර ඇති බව තහවුරු නොවුණි.

**අවිධිමත් ලෙස රජයේ නිවාස උපලේඛණගත කිරීම සහ පොරොත්තු ලේඛණගත නොකර නිවාස ලබාදීම**

2003 ඔක්තෝබර් 17 දිනැති අංක 11/2003 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් මෙම අමාත්‍යාංශයේ පාලනය යටතේ යම් අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු හෝ නිලධාරීන් වෙනුවෙන් උපලේඛනගත නිවාස නොමැති බව දක්වා තිබුණි. එසේ වුවද අමාත්‍යවරයාගේ අනුමැතියෙන් පොදු නිවාස 06ක් හා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියෙන් පොදු නිවාස 16ක් උපලේඛනගත කර ලබාදී තිබුණි.

තවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 4.3.3 වගන්තිය ප්‍රකාර අමාත්‍යාංශය යටතේ පවතින රජයේ නිවාස ලබාදීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ලැබුණු වහාම පොරොත්තු ලේඛනගත කර නිවාස ලබාදීමට කටයුතු කලයුතු වුවත් අමාත්‍යාංශ ලේකම්වරයාගේ 2022 සැප්තැම්බර් 15 දිනැති අංක 20/22 දරණ චක්‍රලේඛය අනුව 2023 හා 2024 වර්ෂවලදී අයදුම්පත් කැඳවා තෝරාගත් නිලධාරීන්ට සමුළු නිවාස 41ක් ලබාදී තිබුණි.

**ස්ථානමාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොවීම**

2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටික රීතිවල XVIII පරිච්ඡේදයේ 247 ඡේදයේ සඳහන් අරමුණු ඉටුවන ආකාරයෙන් ඒකාබද්ධ හා දීපව්‍යාප්ත සේවාවල නිලධාරින්ගේ ස්ථානමාරු ක්‍රියාත්මක කර නොතිබුණු අතර අනිවාර්ය ස්ථාන මාරුවීම්වලට යටත් නිලධාරින් සඳහා ස්ථානමාරු ප්‍රතිපත්තිය විධිමත්ව ක්‍රියාත්මක කර නොතිබුණි.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ හා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන්ගෙන් ස්ථානමාරුවීම් සඳහා අයදුම්පත් ඉදිරිපත් කර තිබූ නිලධාරීන් 572 ගෙන් නිලධාරීන් 203ක් සඳහා පමණක් සහ ඒකාබද්ධ සේවයට අයත් සේවා 07ක එකම සේවා ස්ථානයක වසර 05කට වැඩි සේවා කාලයක් සේවයේ යෙදී සිටි නිලධාරීන් 45,966කින් අයදුම්පත් ඉදිරිපත් කළ නිලධාරීන් 16,531ගෙන් 5,069ක් සඳහා පමණක් ස්ථාන මාරු නියෝග ලබා දී තිබුණි.

**මානව සම්පත් පිරමීඩය සම්මත ස්වරූපයට පරිවර්තනය කිරීම**

රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ කමිටුවේ සභාපති හා අග්‍රාමාත්‍ය ලේකම් ගේ PMO/SEC/09/02 දරන 2024 අප්‍රේල් 22 දිනැති ලිපිය අනුව, සම්මත ආකාරයකට නොපවතින ආයතනික මානව සම්පත් පිරමීඩය සම්මත ස්වරූපයට පරිවර්තනය කර ගැනීම සඳහා කාර්ය මණ්ඩල සීමාවන් සංශෝධනය කර නව මානව සම්පත් පිරමීඩයක් ප්‍රක්ෂේපණය කර, අවශ්‍ය ප්‍රශස්ථ සේවක සංඛ්‍යා ගණනය කරමින් ඒ අනුව ඇතිවන පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කලයුතු වුවත් එසේ කර නොතිබුණි.

**ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන් පුහුණු කිරීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොකිරීම**

2024 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 144,139ක් හා එහි තථ්‍ය සේවක සංඛ්‍යාව 130,989ක් වූ ඒකාබද්ධ සේවයට අයත් සේවා 07ක නිලධාරීන්ගේ පත්වීම්, උසස්කිරීම් සහ මාරුකිරීම් පිළිබඳ බලධාරියා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වුවද මෙම නිලධාරීන් පුහුණු කිරීම සම්බන්ධයෙන් සැලසුම් සහගත විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. අමාත්‍යාංශය යටතේ පැවති රාජ්‍ය සේවා පුහුණු ආයතනය වසා දැමීමෙන් පසු එම කාර්ය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත පැවරී තිබුණද අමාත්‍යාංශය හෝ එම ආයතනය මෙම නිලධාරීන් පුහුණු කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

**වැඩ බැලීමේ දීමනා ගෙවීම**

ආයතන සංග්‍රහයේ 13.3 ඡේදයට අනුව, වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි. එසේ වුවද, පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා සහ සේවයට නොපැමිණෙන නිලධාරීන්ගේ කාර්යයන් ඉටුකිරීම සඳහා වැඩ බැලීමේ පදනම මත 2023-2024 වර්ෂවලදී පත්කර තිබූ විධායක ශ්‍රේණියේ නිලධාරීන් 19දෙනෙකුට හා විධායක නොවන කළමනාකරණ සේවා නිලධාරීන් 46දෙනෙකුට වැඩ බැලීමේ දීමනා වශයෙන් රු.මිලියන 4.75ක් ගෙවා තිබුණි. මෙම නිලධාරීන් තනතුරු දෙකෙහිම සම්පූර්ණ රාජකාරී ඉටුකිරීම සඳහා පත්කර තිබුණි.

**පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කාර්යය මණ්ඩල නිලධාරීන්ට හිඟ වැටුප් ගෙවීම**

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ අනුමත උපරිම පෞද්ගලික කාර්යය මණ්ඩල නිලධාරීන් සංඛ්‍යාව 06ක් වන පරිදි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනෙකුගේ පෞද්ගලික කාර්යය මණ්ඩල නිලධාරීන් 1231ක් සඳහා වැටුප් ගෙවීමට වැයකර තිබුණු රු.මිලියන 508කින් රු.මිලියන 12ක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 85 දෙනෙකුගේ පෞද්ගලික කාර්යය මණ්ඩල නිලධාරීන් 142 දෙනෙකුට පත්වීම් දිනය හා වැඩ භාරගත් දිනය අතර කාල පරිච්ඡේදය සඳහා හිඟ වැටුප් ගෙවීමට වැය කර තිබුණි. මෙම නිලධාරීන් වැටුප් ලබාගත්තද, ඒ බවට මු.රෙ. 238(5) ප්‍රකාරව වැටුප් ලේඛණවල අත්සන් කර නොතිබීම හා දිගින් දිගටම ඔවුන්ගේ පෞද්ගලික බැංකු ගිණුම් වෙත වැටුප් ගෙවා තිබූ බවද නිරීක්ෂණය විය.

**E - ග්‍රාම නිලධාරී ව්‍යාපෘතියේ ප්‍රතිපාදන ඌන උපයෝජනය**

ග්‍රාම නිලධාරීන් විසින් ජනතාවට ලබාදෙන සේවාවන් සඳහා එදිනෙදා අවශ්‍ය වන තොරතුරු රැස්කර තබාගැනීමට හා පරිශීලනය කිරීමට අවශ්‍ය දත්ත ඇතුළත් E- ග්‍රාම නිලධාරී ව්‍යාපෘතියේ පළමු අදියර නියමු ව්‍යාපෘතියක් ලෙස තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04ක ග්‍රාම නිලධාරී වසම් 133ක් තුළ රු.මිලියන 56.94ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ ක්‍රියාත්මක කිරීමටත් එහි සාර්ථකත්වය මත දෙවන අදියර ග්රාම නිලධාරී වසම් 7,000ක් ආවරණය වන පරිදි 2020 වර්ෂයේ සිට රු.මිලියන 1,689.22ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ ක්‍රියාත්මක කිරීමටත් සැලසුම් කර තිබුණි. නියමු අදියර යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04ක නිමකළ ව්‍යාපෘතීන් සම්පූර්ණයෙන් අක්‍රීය වී තිබූ අතර එහි දෙවන අදියර ලෙස දිස්ත්‍රික්ක 07ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 95ක ආරම්භ කර ඇති ව්‍යාපෘති සඳහා 2019 වර්ෂයේ සිට 2024 දක්වා රු.මිලියන 428ක් වැය කර තිබුණද අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වීමට අපොහොසත් වී තිබුණි. මේ වෙනුවෙන් 2024 වර්ෂය තුළ සලසාගෙන තිබුණු රු.මිලියන 1,150ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 117ක් පමණක් ව්‍යාපෘතියේ අරමුණු සඳහා වැයකර තිබුණි.

**පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිවල ඵලදායිත්වය**

මෙම වැඩසටහන යටතේ වූ ව්‍යාපෘතීන් වන පුලතිසි අධ්‍යාපන විද්‍යා පීඨයේ රු.මිලියන 75ක වියදමින් ඉදිකළ කාමර 72කින් සමන්විත පිරිමි ගුරුවරුන් සඳහා වන තෙමහල් නේවාසික ගොඩනැගිල්ලේ කාමර 44ක් ම නේවාසිකයින් නොමැතිව 2019 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතීම, 2019 වර්ෂයේදී රු.මිලියන 18ක් වූ ඇස්තමේන්තු වටිනාකමක් යටතේ රු.මිලියන 27ක් වැයකර අත්තනකඩවල මහා විද්‍යාලයේ ශ්‍රවනාගාරය ඉදිකර වැඩ අවසන් කර තිබුණද, 2024 වර්ෂය අවසන් වන විටත් භාවිතයට ගෙන නොතිබීම, 2018 වර්ෂයේ රු.මිලියන 2ක් වූ ඇස්තමේන්තු වටිනාකමක් යටතේ මෙත්කුසුම්ගම ගම්මානය සඳහා ලීටර් 40,000 ක ජල ටැංකියක් ඉදිකිරීමට රු.මිලියන 0.87ක් වැයකර කොන්ක්‍රීට් කණු පමණක් ඉදිකිරීමෙන් පසුව ඉදිකිරීමේ කටයුතු අතරමඟ නතර වී තිබීම, ඉදිකිරීම් අවසන් කරන ලද කදුරුවෙල දුම්රිය නිල නිවාසය 2021 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ දුම්රිය දෙපාර්තමේන්තුව වෙත භාරදී තිබුණද ඊට යාබදව වානිජ කාර්යයන් සඳහා යොදාගැනීමට ඉදිකර

තිබූ දෙමහල් ගොඩනැගිල්ල කිසිදු කාර්යයකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතීම යන කරුණු නිරීක්ෂණය විය.

**වත්කම් කළමනාකරණයේ දුර්වලතා**

2024 සැප්තැම්බර් 27 දිනට අමාත්‍යාංශයේ භාවිතයේ නොතිබුණු සහ ලිපිලේඛන මගින් තොරතුරු සනාථ කර ගැනීමට නොහැකි වූ වාහන 80ක් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර තිබුණි. ඒයින් වාහන 50ක් ඒවා භාවිතයට ගනු ලබන ආයතන වෙත විධිමත් පරිදි පවරා දීමට කටයුතු කර නොතිබුණු බව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයෙන් ලබාගෙන ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව වාර්තා විය. ඉතිරි වාහන 30ක් සම්බන්ධව තොරතුරු නොතිබුණි. තවද, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වාහන 76ක ලියාපදිංචි සහතික අමාත්‍යාංශය භාරයේ නොතිබුණු අතර ඉන් වාහන 27ක් සම්බන්ධව තොරතුරු නොතිබුණි. ඒසේම, ලියාපදිංචි වාහන 44ක් පළාත් පාලන ආයතන වෙත භාරදී ඇති බව ලේඛනවල සඳහන් වුවද, වාහන 18ක පමණක් පවරා දුන් දිනය සහ විස්තර පැවති අතර තවත් වාහන 02ක් යුද්ධයේදී විනාශ වී තිබූ බවට සනාථ කර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු නොතිබුණි.

2010 වසරේදී පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට රැගෙන එන ලද ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි වෙඩි නොවදින වාහනයක් අලුත්වැඩියාව සඳහා 2014 වර්ෂයේදී නියෝජිත ආයතනය වෙත භාර දී තිබුණු අතර, අලුත්වැඩියාව සඳහා වූ රු.මිලියන 3.24ක බිල්පත ගෙවා වාහනය නිදහස් කර ගන්නා ලෙස දැනුවත් කර තිබුණද වාහනය පිළිබඳව ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් භාවිතයට ගත නොහැකි තත්ත්වයෙන් නියෝජිත ආයතනයට අයත් ඉඩමක ගාල් කර තිබුණි.

නිලමැදුර ගොඩනැගිල්ලේ පිටතින් සවිකර ඇති Cladding සහ වීදුරු පිරිසිදු කිරීමේ ප්‍රධාන අරමුණින් 2021 වර්ෂයේ රු.මිලියන 31ක් වටිනා ගොන්ඩෝලා යන්ත්‍ර 02ක් මිලදීගෙන තිබුණද, වර්තමානය වන විටත් එය භාවිතයට ගෙන නොතිබුණි.

විදේශාධාර ව්‍යාපෘති අරමුදල්
ඌන උපයෝජනය

වගු අංක **2.35** - විදේශාධාර ව්‍යාපෘති අරමුදල් ඌන උපයෝජනය

| ව්‍යාපෘතිය | 2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මිලියන) | | 2024 වර්ෂය තුළ වැය කිරීම් (රු.මිලියන) |
|---|---|---|---|
| ඉන්කියුබේටර් සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීම-යාපනය | විදේශාධාර<br>ශ්‍රී ලංකා රජය | 50<br>15 | නැත |
| මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ වැඩසටහන | යුරෝපීය ආයෝ.බැංකු ණය<br>ශ්‍රී ලංකා රජය | 3,000<br>500 | නැත<br>18.26 |
| ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ යටිතල පහසුකම් සංවර්ධනය | එක්සත් රාජධානි ණය | 200 | නැත |
| ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුව එක්ව ක්‍රියාත්මක කර තිබූ මහකොළඹ ජලය හා අපජලය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන-03 කොටස | ශ්‍රී ලංකා රජය | 2,000 | නැත |
| නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය | ජයිකා ණය<br>ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශණය<br>ශ්‍රී ලංකා රජය | 2,000<br>2,000<br>500 | 908<br>247<br>146 |

## විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

1934 පෙබරවාරි 05 වන දින ස්ථාපිත 1972 මැයි 05 දින නැවත ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ හා අදාළ අනෙකුත් අණ පනත් යටතේ රජයේ විශ්‍රාම වැටුප් ගෙවීමද, විශ්‍රාම වැටුප් දෙපාර්තමේනතුවේ ප්‍රමුඛ වගකීම වේ. දෙපාර්තමේන්තුවේ දැක්ම ආර්ථික හා සමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක් යන්න සාක්ෂාත් කර ගැනීමට කටයුතු කරනු ලැබීමයි.

2024 වර්ෂයේදී ඉහත කාර්යභාරයන් ඉටු කිරීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එකතුව රු.මිලියන 445,473ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.මිලියන 443,434ක් උපයෝජනය කර තිබුණි. මින් විශ්‍රාමිකයින් 704,795 දෙනෙකු සඳහා රු.මිලියන 395,720ක විශ්‍රාම වැටුප්ද, විශ්‍රාමිකයින් 55,091 දෙනෙකු සඳහා රු. මිලියන 46,449ක පාරිතෝෂික ප්‍රදානයන්ද ගෙවා තිබුණි.

## විගණන නිරීක්ෂණ

**කළමනාකරණ දුර්වලතා**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන පරිදි විශ්‍රාම වැටුප් හා දීමනා ගෙවීම හේතුවෙන් 2024 වර්ෂය තුළදී මාවතගම, පූජාපිටිය, ගනේවත්ත, මහර, මාස්පොත, පානදුර, වැලිමඩ, කුණ්ඩසාලේ, වලස්මුල්ල, වීරකැටිය, ගලේවෙල, පැල්මඩුල්ල, නැගෙනහිර නුවරගම් පළාත, දමන යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දත්ත පද්ධතිය ආශ්‍රිතව සිදු කළ නියැදි පරීක්ෂාවලදී රු.මිලියන 26.73 ක් විශ්‍රාමිකයින් 114 දෙනෙකු සඳහා වැඩිපුර ගෙවීම් කර තිබුණි.

යැපෙන්නන් වෙත හමුදා සේවා වැටුප සමඟ ජීවන වියදම් දීමනාව ගෙවීම, විශ්‍රාම වැටුප් කිහිපයක් ඒකාබද්ධව ලබාගන්නා අවස්ථාවල මාසිකව ගෙවනු ලැබූ අන්තර් දීමනාව ඒකාබද්ධ විශ්‍රාම වැටුපට පමණක් ගෙවිය යුතු වුවත් එසේ ගෙවා නොතිබීම, ත්‍රිවිධ හමුදා මඟින් ගෙවනු ලබන වයස අවුරුදු 55 දක්වා වැටුප් ලබමින් සිටින විශ්‍රාමිකයින්ට හා යැපෙන්නන්ට වැටුප් පරිවර්තනය කිරීම, යළි විවාහ වන වැන්දඹුවට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපෙන් හා දීමනාවලින් සියයට 50 ක් හිමි වුවද සම්පූර්ණ වැටුප හා දීමනා ගෙවා තිබීම, අන්තර් දීමනාව හිමි නොවන විශ්‍රාමිකයින් වෙත අන්තර් දීමනාව ගෙවීම, මියගිය ත්‍රිවිධ හමුදා නිලධාරින් වෙනුවෙන් ඔවුන්ගේ අවුරුදු 55 දක්වා වැටුප් හිමි යැපෙන්නන්ට විශ්‍රාම වැටුප සමඟ රු.5,000 විශේෂ දීමනාව ගෙවීම යනාදී හේතු මේ සඳහා බලපා තිබුණි.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

**e - Land පරිගණක වැඩසටහන**

දෙපාර්තමේන්තුවේ කටයුතුවලට හා වෙනත් පාර්ශවයන්ගේ අවශ්‍යතාවයන් සඳහා, ඉඩම් ලේඛන පරීක්ෂා කිරීමේ කටයුතු මාර්ගගතව සිදුකිරීමට පහසුකම් සැලසීමට හා ලේඛන ලියාපදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ ඊ-ඉඩම් (e - Land) පරිගණක වැඩසටහන ප්‍රතිනිර්මාණය කිරීමේ කටයුතු 2016 වර්ෂයේ සිට සිදුකළ ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 09ක් ගතවී තිබුණ ද එයින් අපේක්ෂිත පරිදි සම්පූර්ණ කර නොතිබුණි.

**අඩුපාඩු හේතුවෙන් ඔප්පු ලියාපදිංචි කළ නොහැකිවීම**

නොතාරිස් ආඥා පනතේ 31 වගන්තියේ සඳහන් පරිදි නොතාරිස්වරුන් විසින් ඉඩම් ඔප්පු ලිවීමේදී පිළිපැදිය යුතු රීති අනුගමනය නොකර වැරදි අඩුපාඩුකම් සහිතව ලියා සහතික කර ලියාපදිංචි කිරීම සඳහා දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට 2021,2022,2023, සහ 2024 යන වර්ෂයන් හිදී භාරදුන් ඉඩම් ඔප්පු පිළිවෙලින් 84 ක්, 313 ක්, 711 ක් සහ 995 ක් බැගින් ඔප්පු 2,103 ක් ඒවායේ වැරදි නිවැරදි නොකිරීම හේතුවෙන් ලියාපදිංචි කිරීමට නොහැකිව විෂය ලිපිකරු වෙත රඳවා ගෙන තිබුණි.

**වාහන අනතුරු අලාභ**

දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරමින් පැවති අංක KA-8957 දරන වාහනය 2022 ජනවාරි 20 දින අනතුරකට භාජනය වීම හේතුවෙන් රු.මිලියන 1.73ක අලාභයක් ඇස්තමේන්තුකර තිබූ අතර, එහි අලුත්වැඩියා කටයුතුවලින් අනතුරුව රු. 845,205ක මුදලක් පමණක් රක්ෂණාවරණය ලෙස ලැබී තිබුණි. එමනිසා රු.890,745ක ශුද්ධ අලාභයක් දෙපාර්තමේන්තුවට සිදුවී තිබුණු අතර, මු.රෙ. 104 ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන එය අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතුකර නොතිබුණි.

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

**සිංහල-දෙමළ භාෂා පරිවර්තන මෘදුකාංගය**

පිරිවැය රු.මිලියන 10.81 ක් වූ මොරටුව විශ්ව විද්‍යාලය විසින් සකස්කර දුන් සිංහල-දෙමළ හා දෙමළ-සිංහල භාෂා පරිවර්තන මෘදුකාංගයේ නිරවද්‍යතාවය පිළිබඳ සහතිකයක් රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් විසින් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගෙන් ඉල්ලා තිබුණ ද, එය ලබාගැනීමට අපොහොසත් වී තිබුණි. මෘදුකාංගය පරිශීලකයන් 225කට ආසන්න පිරිසක් භාවිතා කරන බව දක්වා තිබුණ ද, විද්‍යුත් ලිපිනයට තොරතුරු කැඳවීමේදී කිසිවකු එය භාවිතාකර නොතිබුණි.

**ඌන උපයෝජිත වත්කම්**

විභාග පැවැත්වීම වෙනුවෙන් 2017 වර්ෂයේ රු.මිලියන 2.43ක් වැයකර ඉදිකර තිබූ ශබ්දාගාරය 2024 වර්ෂයේදී උපයෝගී කරගෙන තිබුණේ ජාතික ඇගයීම් පරීක්ෂණ (NLQ) 4ක් සඳහා අවශ්‍ය හඬපට සැකසීම සඳහා පමණි.

තවද, දෙපාර්තමේන්තුව සතු මොනිටර් 30ක් සහිත 2017දී ඉදිකළ රු.මිලියන 5.11 ක් වටිනා භාෂා විද්‍යාගාරයක් ද, මොනිටර් 18ක් සහිත ඇගයීම් මධ්‍යස්ථානයක් ද, මොනිටර් 30ක් සහිත දේශන ශාලාවක් ද පැවතියද 2024 වසරේ පාඨමාලාලාභීන් 13දෙනෙකු පමණක් සහභාගී වූ පැය 100 දෙමළ භාෂා සහතිකපත්‍ර පාඨමාලා එකක් පමණක් පවත්වා තිබුණි.

## දිස්ත්‍රික් ලේකම් කාර්යාල

### පොදු විගණන නිරීක්ෂණ

**විශ්‍රාම වැටුප් වැඩියෙන් ගෙවීම** කොළඹ, ගම්පහ, කළුතර, මහනුවර, හම්බන්තොට හා කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වැඩිපුර ගෙවූ විශ්‍රාම වැටුප් පිළිබඳ නියැදි පරීක්ෂාවකදී විශ්‍රාමිකයන් 1687කට වැඩි පිරිසකට විශ්‍රාමික තොරතුරු යාවත්කාලීන නොකිරීම, මූලික වැටුප වැඩියෙන් ගෙවීම, පාරිතෝෂිත, ජීවන වියදම් දීමනාව හා යැපීම් දීමනා ආදිය වැඩියෙන් ගෙවීම වැනි විවිධ හේතු මත වැඩියෙන් ගෙවන ලද විශ්‍රාම වැටුප්වලින් 2024 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු ශේෂය රු. මිලියන 235.20 ක් වී තිබුණි.

**ග්‍රාම ශක්ති වැඩසටහන** කොළඹ, ගම්පහ, කළුතර, හම්බන්තොට, මොනරාගල,රත්නපුර හා පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අයත් ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ග්‍රාම ශක්ති වැඩසටහන යටතේ ලියාපදිංචි සමිති පිළිබඳ නියැදි පරීක්ෂාවකදී හෙළිදරව්වූ පරිදි අක්‍රිය වූ සමිති 621කට අදාළ බැංකු ගිණුම්වල රු.මිලියන 296.60ක් 2024 දෙසැම්බර් 31 දිනට නිෂ්කාර්යව පැවතුණි.

## අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**වැඩ අවසන් නොකළ ඉදිකිරීම්** බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2015 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු. මිලියන 42.00 ක ප්‍රතිපාදන ලබා දී තිබුණ ද 2021 වර්ෂය වන විට රු.මිලියන 16.69 ක් වියදම් කරමින් ඉදිකර තිබුණු එම ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දමා තිබුණි.

නැවත 2024 වර්ෂයේ රු. මිලියන 12.87 ක් වටිනාකමැති ඉදිකිරීම් සිදුකර තිබුණ ද ආරම්භයේ සිට වසර 10 ක් පමණ ගත වී ඇතත් ව්‍යාපෘතියේ වැඩ අවසන් කර නොතිබුණි.

**වංචනික ස්වරූපයේ ගනුදෙනු**

කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක වන ගැබිණි සහ කිරිදෙන මව්වරුන් සඳහා පෝෂණ දීමනාව ලබාදීමේ වැඩසටහන යටතේ සම්මන්තුරේ සහ අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල 2022 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වවුචර් පත් බෙදා දීමේ ක්‍රියාවලිය තුළ මාණ්ඩලික නිලධාරීන්ගේ දුර්වල අධීක්ෂණය සහ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ක්‍රියාත්මක නොවීම මත විෂයභාර නිලධාරීන්ගේ දෙදෙනෙකු රු.මිලියන 5.7 ක වංචනික ස්වරූපයේ ගනුදෙනුවක් සිදුකර තිබුණි.

## අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**හිඟ බදු**

2024 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 ක රු.මිලියන 311.6 ක හිඟ බදු අයවිය යුතුව පැවතුණි.

**ගැනුම් මිලට බලපත්‍ර නිකුත් කිරීම**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 12 ක ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ගැනුම් මිලට බලපත්‍ර සකස් කිරීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස් විසින් අවසන් තේරීම් ලැයිස්තුව අනුමත කර, එවා තිබුණු ඉ.කො 144(ඒ) ආකෘති පත්‍ර 1968 ක ප්‍රමාණයක් සඳහා 2024 දෙසැම්බර් 31 දින වන විට වසරකට වඩා වැඩි කාලයක් ගතවී තිබුණද, ගැනුම් මිලට බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු නොකර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රඳවා ගෙන තිබුණි. එසේම බලපත්‍ර නිකුත් නොකිරීම නිසා දළ තක්සේරුව මත අයවිය යුතු ආදායමක් අයකර ගැනිමට නොහැකි වී තිබුණි.

## බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**අවිධිමත් ගනුදෙනු**

2024 ජූලි 26 දිනැති අංක 2394/56 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 4.2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කාලසීමාව තුළ සහ 2024 සැප්තැම්බර් 25 දිනැති අංක 2403/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 4.2 වගන්තිය ප්‍රකාරව මහ මැතිවරණය ප්‍රකාශ කර ඇති කාලසීමාව තුළ රජයේ ආයතන හරහා දේශපාලන

අපේක්ෂකයින් හා පක්ෂ නියෝජනය වන පරිදි ද්‍රව්‍ය හා උපකරණ බෙදා දීම නතර කරන ලෙස දන්වා තිබුණද ප්‍රාදේශීය ලේකම් කාර්යල 07ක ප්‍රතිලාභීන් 33,232ක් සඳහා සහල් බෙදා හැරීමේ දෙවන අදියර සහ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක අවස්ථා 47කදී රු. මිලියන 5.79ක ද්‍රව්‍ය හා උපකරණ බෙදා දී තිබුණි.

**ආර්ථිකමය නොවූ ගනුදෙනු**

අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා දීම මැයෙන් වූ අංක 24/0645/601/038-01 හා 2024 අප්‍රේල් 01 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ සම්බන්ධයෙන් 2024 අප්‍රේල් 01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අවශ්‍ය සහල් තොග මිලදී ගැනීම සහ එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉදිරිපත් වන සැපයුම්කරුවන් වෙත ප්‍රමුඛතාවය ලබා දෙමින් සැපයුම්කරුවන් තෝරා ගැනීමට උපදෙස් ලබා දී තිබුණි. එම අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ලෙස සැපයුම්කරු තෝරා ගැනීම හේතුවෙන් දිස්ත්‍රික්කයට පිටින් සහල් ප්‍රවාහනය කිරීම වෙනුවෙන් වැය කර තිබුණු රු.මිලියන 2.21ක ප්‍රවාහන පිරිවැය රජයට සිදු වූ අලාභයක් ලෙස නිරීක්ෂණය විය.

## මඩකළපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ඉන්ධන දීමනා වැඩියෙන් ගැනීම**

2024 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම්වරයාට වෙන් කර ඇති වාහනය සඳහා අනුමත කරන ලද ලීටර් 245 ක මාසික ඉන්ධන දීමනාවට අමතරව, අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2024 වර්ෂයේ ගමන් කළ කිලෝමීටර් 18,720 ක දුර ප්‍රමාණය සඳහා 2024 වර්ෂයේදී ඉන්ධන ලීටර් 3,552 ක් මිලදී ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය රු.මිලියන 1.22 ක් වැයකර තිබුණි.

**කොන්ත්‍රාත් යටතේ වැඩිපුර ගෙවීම්**

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ රු.මිලියන 34.35 ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික්කය තුළ ඉදිකිරීමට අවසර දී තිබූ ක්‍රිකට් ක්‍රීඩා පුහුණු පිටි සහ ක්‍රිකට් පුහුණු තණතීරු සම්බන්ධයෙන් පාසල් 15කට අදාළව භෞතික විගණනයක් සිදු කරන ලදී. එහිදී කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද ලේඛන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල තාක්ෂණික

නිලධාරී සහ තාක්ෂණික සහකාර විසින් පරීක්ෂා කරන ලද ලේඛන සහ සංසන්දනාත්මක සෘජු ගණනය කිරීම් සංසන්දනය කිරීමේදී, දැමූ පස් ප්‍රමාණය ඝන මීටර් 462.98 කින් අඩු වී තිබුණි. ඒ අනුව, ඉංජිනේරුවරයාගේ නිර්දේශය මත සහ දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව, පාසල් 15 ක ලේඛන අනුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කොන්ත්‍රාත්කරුවන්ට රු.මිලියන 1.97 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

**රජයේ නිලධාරින් විසින් කොන්ත්‍රාත්වලට එළඹීම**

2024 වර්ෂයේදී මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විමධ්‍යගත අයවැය යටතේ "ජයන්තිපුරම් ග්‍රාම සංවර්ධන සංගමයට" එකතුව රු.මිලියන 9.58 ක සිවිල් වැඩ ව්‍යාපෘති 2024 වර්ෂය තුළ ප්‍රදානය කර තිබුණි. "ජයන්තිපුරම් ග්‍රාම සංවර්ධන" සංගමයේ සභාපතිවරයා මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියෙකු ලෙස සේවය කරනු ලබන බවත් ඔහු " ග්‍රාම සංවර්ධන සංගමය" වෙනුවෙන් මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රු. මිලියන 9.58 ක් වටිනා සිවිල් වැඩ 05 ක් සඳහා කොන්ත්‍රාත්තු අත්සන් කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද, මුදල් අමාත්‍යාංශයේ "ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ යෝජනා ක්‍රමය" යටතේ 2021 සැප්තැම්බර් 29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2021 හි 2.2 වගන්තියට අනුව, දැනටමත් ප්‍රදානය කර ඇති කොන්ත්‍රාත්තුවල ඉතිරි කොටසෙහි මුළු වටිනාකම සහ යෝජිත කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.මිලියන 05 නොඉක්මවිය යුතු බව දක්වා ඇතත් එයට පටහැනිව මෙම ප්‍රදානයන් කර තිබූ බව නිරීක්ෂණය විය.

## කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**තාවකාලික ලිපි ගෙවීම**

**විශ්‍රාම වැටුප් ගෙවීම**

2024 වර්ෂයේ දී කොළඹ දිස්ත්‍රික්කයේ විශ්‍රාම වැටුප් ගෙවීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක විශ්‍රාමිකයන් 125 දෙනෙකු සඳහා ස්ථිර හෝ තාවකාලික විශ්‍රාම වැටුප් ලිපි ගොනුවක් නොමැතිව විශ්‍රාම වැටුප් ගෙවමින් පැවති අතර සමාලෝචිත වර්ෂයේ දී පමණක් එකතුව රුපියල් මිලියන 16.24 ක මුදලක් එසේ ගෙවා තිබුණි. තවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක විශ්‍රාමිකයන් 202ක් සඳහා තාවකාලික

විශ්‍රාම වැටුප් ලිපි ගොනු මඟින් සමාලෝචිත වර්ෂයේ දී පමණක් එකතුව රු.මිලියන 58.97 ක මුදලක් ගෙවා තිබුණි. මෙම තාවකාලික විශ්‍රාම වැටුප් ලිපි ගොනු අතරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක ලිපි ගොනු 64 ක් සඳහා අනුමැතිය ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**“සෞභාග්‍යයා නිෂ්පාදන” ගම්මාන - සීතාවක**

“සෞභාග්‍යා නිෂ්පාදන” ගම්මාන වැඩසටහන යටතේ රු.මිලියන 2.54 ක වියදමින් සීතාවක පශු නිෂ්පාදන ගම්මාන සමිතියේ සාමාජිකයන් 28 දෙනෙකු වෙත එළු පැටවුන්, කුකුළු පැටවුන් ලබා දීම, කුකුළු කූඩු හා ගව ගාල් සකසා දීම කාබනික පොහොර නිෂ්පාදන යන්ත්‍රයක් යනාදී උපකරණ ලබා දී තිබුණද ප්‍රතිලාභීන් 14 දෙනෙකු වෙත ලබාදුන් රු.මිලියන 1.3 ක වටිනා සතුන්, එම උපකරණ 2024 දෙසැම්බර් 31 දිනට ඌන උපයෝජිතව පැවතුණි. තවද ප්‍රතිලාභීන් 07 දෙනෙකු වෙත ලබා දෙන ලද එළුවන් 12 දෙනෙකු යම් යම් රෝග හේතුවෙන් මිය ගොස් තිබූ අතර මෙම සතුන් මියයෑම පිළිබඳ කිසිදු පශු වෛද්‍ය වාර්තාවක් ලබා ගෙන නොතිබුණි. එසේම ප්‍රතිලාභීන් 04 දෙනෙකු වෙත ලබා දෙන එළුවන් 07 දෙනෙකු අදාළ ප්‍රතිලාභීන් විසින් විකුණා තිබුණද එම ප්‍රතිලාභීන් වෙතින් ගිවිසුම් ප්‍රකාරව අදාළ වටිනාකම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**“සෞභාග්‍යයා නිෂ්පාදන” ගම්මාන - මොරටුව**

මොරටුව ධීවර ආශ්‍රිත සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන සමිතියේ යටතේ ලබාදී තිබුණු වටිනාකම රුපියල් මිලියන 5 ක් වූ මාළු වියලන යන්ත්‍ර 04 න් 02ක් නිෂ්පාදනය සඳහා භාවිතා නොකිරීම හේතුවෙන් බේරුවල විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ලබා දී තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඉතිරිව පැවති රු. මිලියන 2.5ක වටිනාකමින් යුතු මාළු වියලන යන්ත්‍ර 02කද උපයෝජනය කර නොතිබුණු අතර මාළු වියලන යන්ත්‍ර සමිති වෙත ලබා දීමේදී සෞභාග්‍යා කාර්යාංශය මඟින් හඳුන්වා දෙන ලද ආදර්ශ ගිවිසුම් ආකෘතිය අනුව ගිවිසුම්ගත වී නොතිබීම හේතුවෙන් එම ගිවිසුම් ආකෘතියේ අඩංගු වැදගත් මෙන්ම බලාත්මක කොන්දේසි හා අත්‍යාවශ්‍ය කරුණු ඇතුලත් නොකර ගිවිසුම් ගත වී තිබුණි.

**වාහන පාලනය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් භාවිතා කරනු ලබන වාහන 51 අතරින් 2024 දෙසැම්බර් 31 දිනට අලුත්වැඩියාව සඳහා යොමුකර ඇති ධාවන තත්ත්වයේ නොපවතින වාහන 08ක් පැවති අතර එම වාහන මාස 03 සිට මාස 45ක කාලසීමාවක සිට ධාවන කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි. තවද 2024 දෙසැම්බර් 31 දිනට වාහන 05 ක අයිතිය දිස්ත්‍රික් ලේකම් නමට පවරාගෙන නොතිබුණු අතර දිස්ත්‍රික් ලේකම් නමින් ලියාපදිංචි වී තිබූ වාහන 13 ක් දැනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නොපවතින අතර එම වාහන පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**අවිධිමත් ගෙවීම්**

2024 දෙසැම්බර් 31 දිනට රාජකාරි කටයුතු සඳහා සක්‍රීය දායකත්වයක් නොමැති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක අනිවාර්ය නිවාඩු ගැන්වූ සේවකයින් 07 දෙනෙකු හා වැඩ තහනම් කළ එක් සේවකයකු වෙත වර්ෂ 2017 - 2024 කාලසීමාව තුල වැටුප් හා දීමනා ලෙස රු. මිලියන 8.88 ක්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක අල්ලස් චෝදනා සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබූ අනිවාර්ය නිවාඩු මත සිටියදී විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2.12 වගන්තිය යටතේ විශ්‍රාම ගන්වා තිබූ ග්‍රාම නිලධාරීන් තිදෙනෙකු සඳහා වැටුප් හා දීමනා ලෙස රු. මිලියන 1.61 ක්ද ගෙවා තිබුණි.

## ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**වෙනත් වැයශීර්ෂ වෙන්කිරීම්**

**භාවිතා නොකිරීම**

විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 48ක් විසින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ගම්පහ දිස්ත්‍රික් ලේකම් වෙත වෙන්කර තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 247.2ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

**"සෞභාග්‍යයා නිෂ්පාදන" ගම්මාන - මීරිගම**

මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ වැබොඩමුල්ල මැටි නිෂ්පාදන ගම්මානයේ ප්‍රතිලාභීන් 36 දෙනෙකු වෙනුවෙන් අමුද්‍රව්‍ය, උපකරණ ආදිය මිලදී ගැනීම සහ පුහුණු වැඩසටහන් සඳහා රුපියල් මිලියන 8.6ක් වැය කර තිබුණු අතර විසිතුරු භාණ්ඩ පිළිස්සීම සඳහා විදුලි උදුන් 02ක් රුපියල් මිලියන 2.6කට මිලදී ගෙන තිබුණි. නමුත්

මෙම විදුලි උදුන් ක්‍රියාකරවීම සඳහා විශාල විදුලි ඒකක සංඛ්‍යාවක් වැය වීම හේතුවෙන් එම උදුන් භාවිතයට ගෙන නොතිබුණි.

**වාහන කළමණාකරණයේ අඩුපාඩු**

වාහන වාහනවල අයිතිය දිස්ත්‍රික් ලේකම් සතු වූ බස්රථයක් හා ඩබල් කැබ් රථ 03ක් වෙනත් ආයතන විසින් භාවිතා කරන අතර ඒවා විධිමත් පරිදි එම ආයතනවලට පැවරීමටත්, මීගමුව, කටාන හා වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් භාවිතා කරනු ලබන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට අයත් රු. මිලියන 14.7ක් වටිනා වාහන 03ක් විධිමත් පරිදි දිස්ත්‍රික් ලේකම් වෙත පවරාගැනීමටත් කටයුතු කර නොතිබුණි.

## ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ආර්ථිකමය වාසි රජයට සැලසෙන ලෙස ප්‍රසම්පාදන සිදු නොකිරීම**

අඩු ආදායම්ලාභී පවුල් සඳහා මාසයකට නාඩු සහල් කි. ග්‍රෑම් 10 බැගින් මාස 02 ක කාලයක් සඳහා බෙදා දීමට ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 හි ප්‍රතිලාභීන් 149,871 දෙනෙකු වෙනුවෙන් එහි පළමු අදියර සඳහා සහල් කිලෝග්‍රෑම් 1,498,710 ක් 2024 අප්‍රේල් මස මිලදී ගෙන තිබුණි. යථෝක්ත චක්‍රලේඛයෙහි සඳහන් පරිදි සහල් කිලෝග්‍රෑමයක් සඳහා රු.186 ක් ගෙවා තිබූ නමුත් එම කාලච්ඡේදය තුළ පාරිභෝගික භාණ්ඩ මිල වාර්තා අනුව වෙළඳපොල නාඩු කැකුළු සහල් කිලෝවක මිල රු.158 ත් රු.175 ක් වූයෙන් සහල් මිලදී ගැනීමේ දී රු.මිලියන 12.80 ක් වෙළඳපොල මිලට වැඩියෙන් මිලදී ගැනීම සඳහා අතිරේකව ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

## හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**අපනයනය සඳහා වූ කෙසෙල් වගා ව්‍යාපෘතිය**

අපනයනය සඳහා ඇඹුල් කෙසෙල් වගා ව්‍යාපෘතිය යටතේ සූරියවැව, අඟුණකොළපැලැස්ස හා අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ප්‍රතිලාභීන් 200 දෙනෙකුට එකතුව රු.මිලියන 22.11 ක්වූ කෙසෙල් පැළ සහ උපකරණ ලබා දී තිබූ නමුත්, 2024 ඔක්තෝබර් මාසය වන විට අපනයනය සඳහා වැඩ පිළිවෙළක් ආරම්භ කර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණු අතර ප්‍රතිලාභීන්ට ලබාදී තිබුණු රු.මිලියන 1.58 වූ

ප්ලාස්ටික් කූඩ හා කලර් රිබන් ඌන උපයෝජිතව පැවතුණි. එමෙන්ම කෙසෙල් අපනයනය කිරීමට රජයේ වෙනත් ව්‍යාපෘතියක් යටතේ රු.මිලියන 45.67ක් පමණ වැය කර ඉදිකර තිබුණු අපනයන මධ්‍යස්ථානය හා එහි ස්ථාපිත කර තිබූ යන්ත්‍ර සූත්‍ර නිශ්කාර්යව පැවතුණි.

**එළුවන් ලබාදීමේ ව්‍යාපෘතිය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07ක ප්‍රතිලාභීන් 233 දෙනෙකුගේ ජීවනෝපාය නඟා සිටුවීම සඳහා රු.මිලියන 16.51 වැයකර එළුවන් ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ අරමුණින් පරිබාහිරව සුරතලයට ඇති කිරීමේ අරමුණින් එළුවන් 66 දෙනෙකු ලබාගෙන තිබූ අතර, ප්‍රතිලාභීන් 36 දෙනෙකුට ලබාදී තිබුණු එළුවන් 91 දෙනෙකු අන්සතු කර තිබීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද, ව්‍යාපෘතිය යටතේ ලබාදී තිබුණු එළුවන් 699න් 113ක්, වර්ෂයක් වැනි කාලපරිච්ඡේදයක් තුල මිය ගොස් තිබුණු අතර එළුවන් (ගැහැණු සතුන්) 102ක් සඳහා පැටවුන් ලැබී නොතිබුණි. එමෙන්ම එළු කිරි හෝ මසට විකිණීමෙන් ආදායම් උපයා නොතිබීමෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

**සහල් බෙදාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙහෙයවීමෙන් සිදුකළ අඩු ආදායම්ලාභී පවුල් වෙත නොමිලේ සහල් බෙදාදීමේ වැඩසටහන යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී පවුල් වෙත නොමිලේ සහල් බෙදාදීමේ වැඩසටහන සඳහා රු.මිලියන 431.04ක් වූ සහල් කි.ග්‍රෑම් 2,317,400ක් මිලට ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කර නොතිබූ අතර, නිලධාරීන් විසින් මූල්‍ය ගනුදෙනු නිසි පිරිමැසුම්භාවයෙන් සිදු නොකිරීමෙන් වැඩසටහනේ I අදියර යටතේ රජයට රු.මිලියන 34.9ක පාඩුවක් සිදු වී තිබුණි.

**හිඟ බදුමුදල්**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් දීර්ඝකාලීන බදු පදනම මත බදු දී ඇති ඉඩම් හා දේපල වලට අදාළව බදුකරුවන් 50 දෙනෙකුගෙන් රු.මිලියන 11.51ක මුදලක් 2024 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතුව පැවතුණි.

**වන අලි අලාභහානි**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මහජනතාවගේ ජීවිතවලට හා දේපලවලට විශාල තර්ජනයක්ව පවතින වන අලි මගින් වන හානි සඳහා ස්ථිර විසඳුමක් නොවීම හේතුවෙන් 2022, 2023 හා 2024 වර්ෂවලදී වන අලි පහර දීමෙන් ජීවිත හානි 26ක්, ශාරීරික හානි 23ක් සහ දේපල හානි 255ක් වාර්තාවී තිබුණු අතර, සිදුවූ හානි සඳහා වන්දි මුදල් ලෙස එකතුව රු.මිලියන 41.18ක් ගෙවා තිබුණි. තවද, වන අලි පහරදීම හේතුවෙන් ශාරීරික හා දේපල හානිවීම් සම්බන්ධ වන්දි සඳහා, අයදුම්පත් ලැබී වසර 1-3 ත් අතර කාලයක් ගතවී ඇති අයදුම්පත් 48 ක් සහ 2024 වර්ෂයේ ලැබි තිබුණු අයදුම්පත් 28 ක් සඳහා වනජීවී ස්ථානීය පරීක්ෂණ වාර්තා ලැබී නොමැතිවීම හේතුවෙන් ගෙවීම සම්බන්ධ ඉදිරි කටයුතු විගණිත දින වූ 2025 මාර්තු 31 දින වන විටත් ප්‍රමාද වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

## මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**පාසල් පැති බැම්ම ඉදිකිරීම**

ඉංජිනේරු සැළසුම් සකස් කිරීමේදී ඇති වුණු දුර්වලතාවයක් හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 29.58 ක් වැයකර ඉදිකර තිබුණු වලල ඒ රත්නායක විදුහලේ කොන්ක්‍රීට් රඳවුම් බැම්ම ඉදිකර මාස 2 ක් තුළ ඇලවී ගොස් තිබුණි. ව්‍යුහාත්මක සහ භූ විද්‍යා විශේෂඥ උපදෙස් අනුව බැම්ම යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර පැති බැම්මේ පැවැත්ම අවිනිශ්චිත විය.

**ප්‍රමිතිගත පරිදි මාර්ග ඉදිනොකිරීම**

කැටවල හන්දියේ සිට නැහිනිවෙල දක්වා වූ මාර්ගයේ මීටර් 1500 ක් දක්වා දිගට සකස් කිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වී 2024 වර්ෂය තුළ රු.මිලියන 20.69 ක් වැය කර තිබුණි. මාර්ගයේ දිග මීටර් 850 ක් ඉදිකර තිබියදී මීටර් 920 ක් ඉදිකළ බවට බිල්පත් ඉදිරිපත් කර ඒ සඳහා ගෙවීම හේතුවෙන් ඇස්ෆෝල්ට් ඇතිරීම වෙනුවෙන් රු.මිලියන 1.54 ක්ද, කොන්ත්‍රාත්කරු වෙත ඇස්ෆල්ට් සමාගම විසින් සැපයූ බව තහවුරු කළ ප්‍රමාණයට වඩා මෙට්‍රික් ටොන් 56 ක් සඳහා රු.මිලියන 1.26 ක්ද, වශයෙන් එකතුව රු. මිලියන 2.80 ක් වැඩිපුර ගෙවා තිබුණි. ගිවිසුම්ගත වැඩ ඉටු නොකිරීම, ගිවිසුම් මාර්ගයේ දිගින් සියයට 56 ක කොටසක් පමණක් ඉදිකිරීම, සම්මත පිරිවිතර ඇස්ෆල්ට් මිශ්‍රණ සැලැස්ම කොන්ත්‍රාත්කරු වෙත ලබා

නොදීම, ඇස්ෆල්ට් අතුරන මාර්ග තලය සෑම මීටර් 05 ක පරතරයකින් යුතුව මැනුම් නොකිරීම, පිරිවිතරයන්ට අනුකූලව වැඩ බිමට ගෙනෙන ඇස්ෆල්ට්වල උෂ්ණත්වය පරීක්ෂා නොකිරීම වැනි තාක්ෂණික හා ප්‍රමිතියේ දුර්වලතාවයන් තිබියදී එම කර්මාන්තය සඳහා සම්පූර්ණ මුදලම ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

.

| | |
|---|---|
| **ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම** | මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් තැන්නලන්ද වසම තුළ ප්‍රජා ජල ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා සෘජු කොන්ත්‍රාත් ක්‍රමය අනුගමනය කර ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පවරා තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණු අතර, කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කිරීමකින්, බිල්පත්‍රයක් ඉදිරිපත් කිරීමකින් හෝ ගිවිසුමකට එළඹීමකින් තොරව රු.මිලියන 19.88 ක්වූ සම්පූර්ණ මුදලට ජාතික ජල සම්පාදන මණ්ඩලයට ගෙවා තිබුණි. නමුත් 2024 වර්ෂය අවසන් වී මාස 06 ක කාලයක් ගත වී තිබුණද, කොන්ත්‍රාත්තුව යටතේ වැඩ අවසන් කර නොතිබුණි. |
| **නැවත පදිංචිකිරීම්** | මහනුවර දිස්ත්‍රික්කයේ නාය යෑම් අධි අවදානම් තත්ත්වයන් ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක පවුල් 1,539 ක් හඳුනාගෙන තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දින වන විට වසර 01 සිට වසර 09 දක්වා වූ කාලයක් ගත වී ඇතත් පවුල් 1319 ක් නැවත පදිංචි කර නොතිබුණි. |
| **වන්දි පොලී ගෙවීම්** | මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක ඉඩම් කැබලි 53 ක වන්දි මුදල් ගෙවීමේදී ඉඩම් අත්පත් කර ගැනීමට අනුමැතිය ලද දින හා ප්‍රතිපාදන මුදල් ගෙවූ දින අතර මාස 02 සිට වර්ෂ 22 දක්වා ප්‍රමාදවීම් හේතුවෙන් අත්පත් කර ගැනීමට අදාළ වන්දි මුදලට අමතරව ඉඩම් කැබලි 36 ක් සඳහා රු.මිලියන 167.24ක වන්දි පොලී මුදලක්ද ගෙවීමට සිදු වී තිබුණි. |

## කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

| | |
|---|---|
| **අතරමඟ නවතා දමා ඇති ඉදිකිරීම්** | කළුතර දිස්ත්‍රික් ලේකම් බල ප්‍රදේශ තුළ වූ බේරුවල, හොරණ බණ්ඩාරගම, පානදුර, අගලවත්ත, දොඩංගොඩ, මතුගම හා කළුතර |

යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ තුල විවිධ ප්‍රතිපාදන මූලාශ්‍ර මගින් ලද රජයේ අරමුදල් මගින් ඉදිකිරීම් ආරම්භ කර තිබූ ආසන්න එකතු වටිනාකම රු.මිලියන 42.88 ක් වූ ගොඩනැගිලිවල ඉදිකිරීම්වලින් කොටසක් පමණක් නිමකර දීර්ඝ කාලයක් ඉතිරි කොටස් සම්පූර්ණ කිරීමකින් තොරව පවතින ගොඩනැගිලි 27 ක් හා එලෙස කොටස් ඉදිකිරීම් සඳහා වැය කළ පිරිවැය සොයාගත නොහැකි තවත් අර්ධ වශයෙන් නිමි ගොඩනැගිලි 04 ක්ද පැවතුණි. මෙම ගොඩනැගිලිවල ඉදිකිරීම් ආරම්භ කර මේ වන විට වසර 02 සිට 26 දක්වා කාලසීමාවක් ගත වී තිබුණු අතර මෙම ඇතැම් ඉදිකිරීම් අත්තිවාරමට සහ කුලුණු සඳහා යෙදූ වානේ කම්බිවලට පමණක් සීමා වී තිබූ අතර එම කොටස් ද දීර්ඝ කාලයක සිට අව් වැසිවලට නිරාවරණය වී පැවතීම හේතුවෙන් ඒවා නැවත භාවිතයට ගත නොහැකි තත්වයට පත්ව තිබීම හේතුවෙන් ඒ සඳහා වැය කළ රජයේ මුදල් නිශ්කාර්ය බවට පත්ව තිබුණි.

**වාහන කලමනාකරණයේ අඩුපාඩු**

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් භාවිතා කරනු ලබන වාහන 04 ක අයිතිය දිස්ත්‍රික් ලේකම් නමට පවරාගෙන නොතිබුණු අතර දිස්ත්‍රික් ලේකම් නමින් ලියාපදිංචි වී ඇති මෝටර් බයිසිකල් 15 ක් සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

**කමිටු ක්‍රියාකාරීත්වය**

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන විවිධ කමිටු අතරින් කමිටු 05 ක ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් සිදු කළ පරීක්ෂාවේ දී සෑම මසකට ම වරක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, පරිසර කමිටුව සහ ඩෙංගු මර්ධන කමිටුව රැස් විය යුතු වුව ද, සමාලෝචිත වර්ෂය තුළ එය වාර 04 ක් පමණක් රැස් ව තිබුණු අතර, වසරක් තුළ 03 වරක් රැස් විය යුතු දිස්ත්‍රික් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුව වසර තුළ රැස් වී තිබුණේ එක් වරක් පමණක් විය. තවද වසරක් තුළ මසකට වරක් බැගින් පැවැත්විය යුතු දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව ද සමාලෝචිත වර්ෂය තුළ රැස් වී තිබුණේ වාර 06 ක් පමණි. ඒ අනුව දිස්ත්‍රික්කය තුළ ඵලදායී, අර්ථවත් සේවාවක් පුරවැසියන් වෙත සැපයීම සඳහා යෝජිත කමිටුවල නිසි හා කාලීන ක්‍රියාකාරීත්වය අතිශය වැදගත් වන නමුත් එම කමිටුවල කාලීන ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.

**කඳුකර දශකය ව්‍යාපෘතිය**

කඳුකර දශකය 2024 – 2033 දශවිධ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ හඳුන්වා දුන් ව්‍යාපෘති වෙනුවෙන් 2024 වර්ෂයේදී අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සඳහා රු.මිලියන 71 ක් වෙන්කර තිබුණු අතර ඉන් සියයට 43 ක ප්‍රතිපාදන පමණක් සමාලෝචිත වර්ෂයේදී වියදම් කර ව්‍යාපෘති 23 ක් ක්‍රියාත්මක කර තිබුණි. එම ක්‍රියාත්මක වූ ව්‍යාපෘති වලින්ද රු.මිලියන 8.6 ක ප්‍රතිපාදන ඉතිරිව පැවතුණු අතර ක්‍රියාත්මක නොවූ ව්‍යාපෘති 09 කට අදාල රු.මිලියන 32 ක එනම් සියයට 57ක ප්‍රතිපාදන හරවා යවා තිබුණි.

**සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන**

සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබූ මණ්ඩගල කුරුඳු ගම්මාන ව්‍යාපෘතිය සඳහා කුරුඳු නිස්සාරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා සහ ප්‍රතිලාභීන් 60 දෙනෙකු සඳහා කුරුඳු පැළ හා කුරුඳු උපකරණ ලබාදීම වෙනුවෙන් රු.මිලියන 4.86 ක මුදලක් වැයකර තිබුණි. මෙහි ව්‍යාපෘති යෝජනාවට අනුව කුරුඳු නිස්සාරණ මධ්‍යස්ථානයේ අපේක්ෂිත නිෂ්පාදිතය ලෙස කුරුඳු කොළ හා පොතු භාවිතයෙන් තෙල් නිෂ්පාදනය පිළිවෙලින් මාසිකව බෝතල් 15 ක් හා 12 ක් ද වශයෙන් දක්වා තිබුණද මෙම කුරුඳු නිෂ්පාදන මධ්‍යස්ථානය ආරම්භ කර වසර 02 කට ආසන්න කාලයක් ගතවී තිබුණ අතර කුරුඳු තෙල් බෝතල් 27 ක් නිෂ්පාදනය කර තිබුණි. කෙසේ වුවද තෙල් නිස්සාරණ මධ්‍යස්ථානයේ නිෂ්පාදන කටයුතු 2024 පෙබරවාරි 10 දිනෙන් පසුව සිදුකර නොතිබුණි.

## කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ප්‍රතිපාදන ඌන උපයෝජනය**

වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය මඟින් පාසල් ක්‍රිකට් සංවර්ධන වැඩසටහන සඳහා නව පැති විකට් ඉදිකිරීම වෙනුවෙන් ලබාදුන් රු.මිලියන 15.5 ප්‍රතිපාදනයෙන්, රු.මිලියන 13.3 ක්ද සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය මඟින් දැදිගම රජ මහ විහාරයේ රථගාල සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබාදුන් රු.මිලියන 1.08 ක මුලු ප්‍රතිපාදනයමද, කෘෂිකර්ම නවීකරණ වැඩසටහන

යටතේ විවිධ කෘෂි ව්‍යාපෘති සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 7.45ක්ද උපයෝජනය නොකර ආපසු පවරාදී තිබුණි.

**රුකාෂල් කම්බි පාලම ඉදිකිරීම**

"රුකාෂල්" කම්බි පාලම අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් දෙහිඕවිට ප්‍රාදේශිය ලේකම් කාර්යාලය 2024 අගෝස්තු 12 දින අනුමත වැඩිහිටි සමිතියක් සමඟ ගිවිසුම් ගතව තිබූ අතර සමිතිය විසින් ගිවිසුම උල්ලංඝනය කරමින් ව්‍යාපෘතිය උප කොන්ත්‍රාත් ලබාදී තිබුණි. තවද, 2024 දෙසැම්බර් 31 වන විටත් අළුත්වැඩියාකිරීම් කටයුතු ආරම්භකර හෝ නොමැතිව තිබීය දී වැඩ අවසන් බවට ව්‍යාජ තොරතුරු දක්වමින් රු.මිලියන 2.94 ක මුදලක් කාර්මික නිලධාරි විසින් ලබාගෙන එම මුදලින් රු.මිලියන 2.51 ක් අවස්ථා 4 ක දී නැවත වැඩිහිටි සමිතිය වෙත බැර කර තිබුණි.

**දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම**

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2009 වර්ෂයේදී පිරිනමා තිබුණු අතර 2024 නොවැම්බර් වන විට ඒ වෙනුවෙන් රු.මිලියන 171 ක් වැයකර තිබුණි. ඒ තුළ ඇස්මේන්තු කර නොතිබුණු වැඩ විෂයන් 04 ක් වෙනුවෙන් රු.මිලියන 16.81 ක් වූ ගෙවීමක් ද සිදුකර තිබුණි. තවද එහි ඉදිකිරීම් දිගින් දිගටම ප්‍රමාද වීම මත 2023 දෙසැම්බර් 31 දින වන විට මිල විචලන ගැලපීම සඳහා රු.මිලියන 48.4 ක මුදලක් ගෙවීමට සිදුව තිබුණි.

**උරුමය වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

උරුමය වැඩසටහන සඳහා ලද රු.මිලියන 10.81 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 8.55 ක් මූලධන වියදම් ලෙස ද රු.මිලියන 1.71 ක් පුනරාවර්තන වියදම් ද ලෙස ද එකතුව රු.මිලියන 10.26 ක් වැයකර තිබුණ ද දීමනාපත්‍ර හා බලපත්‍ර 753 ක් සඳහා පමණක් ඔප්පු ලබාදී තිබුණි. මීට අමතරව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ඔප්පු බෙදාදීමට කටයුතු නොකර ප්‍රතිලාභීන් දඹුල්ල හා රුවන්වැල්ලට ප්‍රවාහනය කිරීම වෙනුවෙන් බස් රථ සඳහා රු.මිලියන 1.9 ක වියදමක්ද ශබ්ද විකාශන යන්ත්‍ර හා විදුලි සැපයුම් ලෙස රු.මිලියන 0.8 ක මුදලක් වැය කර තිබුණි.

## කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**නිෂ්කාර්ය වත්කම්**

2021 වර්ෂයේ සම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන ඒකාබද්ධ වැඩසටහන යටතේ ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සී/ස තිත්තවැල්ල මැටි කාර්මික ග්‍රාමීය සංවර්ධන සමුපාකාර සමිතිය වෙත රු.මිලියන 4.7 ක් වැය කර අලුත්වැඩියාකර දී තිබුණු පොදු පහසුකම් මධ්‍යස්ථානය හා ලබා දී තිබුණු උපකරණ භාවිතයකින් තොරව පැවතුණි.

**ජල ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම**

2014 දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කර තිබුණු ජල නල දීර්ඝ කිරීමේ ව්‍යාපෘති 02 ක් සඳහා රු. මිලියන 14.4 ක මුදලක් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ගෙවා වර්ෂ 10 කට අධික කාලයක් ගත වී තිබුණද, එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් දරන ලද වියදම නිශ්කාර්ය වී තිබුණි.

**ප්‍රාදේශීය විෂමතා අවම කිරීමේ අරමුණ ඉටු නොවීම**

ප්‍රාදේශීය සංවර්ධනය වෙනුවෙන් වෙන්කල ප්‍රතිපාදනවලින්, ප්‍රාදේශීය විෂමතා අවම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘති තෝරාගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ වෙන්කළ රු.මිලියන 95.07 ක මුළු ප්‍රතිපාදන මුදලින් ප්‍රජා සංවිධාන වෙත භාණ්ඩ බෙදා දීම සඳහා රු.මිලියන 46.34 ක් එනම්, මුළු ප්‍රතිපාදිත මුදලින් සියයට 49 ක් වෙන්කර තිබුණි.

**නිෂ්කාර්ය වත්කම්**

2021 දෙසැම්බර් 29 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මිල ගණන් කැඳවා තෝරාගත් සැපයුම්කරුවෙකු වෙතින් රු.මිලියන 5.4 ක් වැය කර මිලදී ගෙන තිබුණු මල්ටි චොපර් යන්ත්‍ර (කැබලි කිරීමේ යන්ත්‍ර) 20 ක් සමාලෝචිත වර්ෂය පුරාම භාවිතයකින් තොරව නිශ්කාර්යව පැවතුණි.

**ඉඩම් පවරාදීම**

කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි රජයට අයත්, බස්රථ නැවතුම්පල, මාලිගාපිටිය, මහජන පොල, සුසාන භූමිය, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල ඉඩම, රජපිහිල්ල තානායම, රජපිහිල්ල උද්‍යානය, මහනගර සභා පරිශ්‍රය පිහිටි ඉඩම, මැගසින් හිල් ඉඩම ඇතුළුව වාණිජ වටිනාකමින් අධික ඉඩම් 28 ක් දීර්ඝ කාලීන බදු පදනම මත නගර සභාව වෙත ලබා දී රජයට විශාල ආදායමක්

උපයෝගත හැකිව තිබියදී කුරුණෑගල මහනගර සභාව වෙත පැවරීමට කටයුතු කරමින් පැවතුණි.

**කෘෂි නිෂ්පාදන සැකසීමේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම**

ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි හෙක්ටයාර 30.704 ක (අක්කර 75) භූමිය වසර 30 ක් සඳහා 1999 ජනවාරි 18 දින ගොවි සමාගමක් වෙත බදුදී කෘෂි නිෂ්පාදන සැකසීමේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් රජය විසින් රු.මිලියන 113.6 ක් වටිනා දේපළ හා උපකරණ ලබාදී තිබුණද මෙකී අරමුණ ඉටු වී නොතිබුණු බව නිරීක්ෂණය විය. දිස්ත්‍රික් ලේකම් විසින් කෘෂිකාර්මික චක්‍රීය ණය අරමුදලින් ලබාදුන් රු.මිලියන 3 ක ණය මුදලින් තවදුරටත් රු.මිලියන 1.9 ක ශේෂයක් අයවීමට තිබුණි. මෙකී සමාගම විසින් ඔවුන්ගේ බදු අයිතිය උකසට තබා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් අවස්ථා 4 කදී ලබාගත් ණය මුදල නොගෙවීම මත දඩ මුදල් හා පොලිය ලෙස රු. මිලියන 68.87 ක මුදලක් බැංකුව වෙත ගෙවීමට එකඟ වුවද, ඒ අනුව කටයුතු නොකිරීම හා සමාගම දිගින් දිගටම අලාභ ලබමින් පසුවන තත්වයක රු. මිලියන 113.6 ක් වටිනා උපකරණ හා දේපළ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත සින්න වීමේ අවධානමක් පැවතුණි. තවද, රජයේ ඉඩම් ආඥා පනතේ 454 අධිකාරිය සහ බදු ගිවිසුමේ 9 හා 10 වන වගන්තියට පටහැනිව පෞද්ගලික සමාගමක් වෙත සහල් සැකසුම් මධ්‍යස්ථානයේ ගොඩනැගිලි හා ගොඩනැගිලි පිහිටි ඉඩම අතුරු බදු ලබාදීම හේතුවෙන් රජයට ලැබිය යුතු ආදායම් අහිමි වී තිබුණි.

## මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**කැලෑ නිෂ්පාදන ගාස්තු අය නොකිරීම**

1907 අංක 16 දරණ වන සංරක්ෂණ ආඥා පනතේ 64(2)(ඊ) වගන්තිය ප්‍රකාරව (451 වන අධිකාරිය) අනුව විෂයය භාර අමාත්‍යාවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග අංක 2216/34 හා 2021 පෙබරවාරි මස 25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව මාතලේ දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම්වල පිහිටි කලුගල් කැනීම් වැඩබිම්වලින් 2023 වර්ෂය හා 2024 වර්ෂය සඳහා අයකර ගතයුතු රු.මිලියන 20.07 ක කැලෑ නිෂ්පාදන ගාස්තු අයකර ගෙන නොතිබුණි.

**ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය නොකිරීම**

ලියාපදිංචි සැපයුම්කරුවන් ප්‍රමාණවත්ව සිටියදී ඔවුන්ගෙන් මිල කැඳවීම් ලබා නොගෙන මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ලෝක ආහාර වැඩසටහන යටතේ ගෙවතු වගා ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු. මිලියන 9.15 ක් ද , මාතලේ බර්නාඩ් අළුවිහාරේ කායවර්ධන මධ්‍යස්ථානයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා රු.මිලියන 14.16 ක්ද වැය කර තිබූ අතර, මිලදී ගෙන තිබූ කායවර්ධන උපකරණ තාක්ෂණික පිරිවිතරවලටද අනුකූලවී නොතිබුණි.

**වන්දි පොළී ගෙවීම්**

1987 රජයට ඉඩම් අත්කර ගැනීමේ ආඥා පනතෙහි 361 වගන්තියෙහි 4 ඡේදය අනුව 38 (අ) අතුරු විධානය පලකර වන්දි මුදල් ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් මාර්ග සංවර්ධනය සඳහා අත්පත් කරගත් මාතලේ හා යටවත්ත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවල පිහිටි ඉඩම් කැබලි 40 ක් වෙනුවෙන් රු. මිලියන 39.16 ක පොළී මුදලක් ගෙවා තිබුණි.

**විනිවිදභාවයෙන් තොර ගෙවීම්**

සහල් කි.ග්‍රෑම් 503,260 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු. මිලියන 94.58 ක් හා ප්‍රවාහන ගාස්තු රු. මිලියන 2.43 ක් ගෙවීම සඳහා බිල්පත්‍ර ඉදිරිපත්කර තිබූ සහල් මෝලක් අක්කරෙපත්තුවෙහි එම ලිපිනයෙහි නොමැති බව ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරි මෙන්ම අක්කරෙපත්තු මෝල් හිමියන්ගේ සංගමයේ ලේකම්වරයාද සනාථ කර තිබීම අනුව ගෙවීම් කිරීමේ විනිවිදභාවය පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. තවද, තිස්සමහාරාම සහල් මෝලකින් සහල් කිලෝ ග්‍රෑම් 117,010 ක් සැපයුම් කළ බවට රු. මිලියන 21.76 ක් හා ප්‍රවාහන වියදම් ලෙස රු.මිලියන 0.52 ක් ගෙවීම් කර තිබුණද අදාළ සහල් මෝල් හිමිකරුගේ ප්‍රකාශ අනුව ඔහු විසින් සපයා ඇත්තේ සහල් කිලෝ ග්‍රෑම් 30,000 පමණක් හා ප්‍රවාහන වියදම රු.මිලියන 0.12 ඔහු අතින් වැයකර එම සහල් ප්‍රවාහනය කර දී ඇති බැවින් රු. මිලියන 0.52 ක සාවද්‍ය ප්‍රවාහන වියදමක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් සිදු කර තිබුණි.

## මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ආර්ථිකමය වාසි රජයට සැලසෙන ලෙස ප්‍රසම්පාදන සිදු නොකිරීම**

මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2024 අප්‍රේල් 04 දිනැති හා අංක DFD/2004-1 දරන චක්‍රලේඛය ප්‍රකාරව අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් ලබාදීම වෙනුවෙන් මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක් විසින් අදියර 2 ක් යටතේ සහල් කි. ග්‍රෑම් 2,579,400 ක් මිලදී ගෙන තිබුණි. සහල් කිලෝග්‍රෑමයක් සඳහා වෙළඳපොලේ පැවති රු.150 ත් 165 අතර වූ සිල්ලර මිල ගණන් නොසලකා සහල් කිලෝග්රෑම් 01 ක් රු.186 ක්වූ වැඩි මිලට මිලදී ගැනීම හේතුවෙන් රු.මිලියන 54.54 ක්වූ මූල්‍ය පාඩුවක් රජයට සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය.

## මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**වන්දි පොලී ගෙවීම්**

වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් උමාඔය සංවර්ධන ව්‍යාපෘතියට ඉඩම් අත්පත්කර ගැනීම් සහ වන්දි ගෙවීම් වලට අදාලව ඉඩම් කට්ටි 552 ක් සඳහා රු.මිලියන 447.3ක වන්දි මුදල් ගෙවා තිබුණි. 2012 වර්ෂයේ ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා අත්පත් කර ගන්නා ලද ඉඩම් වන්දි ගෙවීම් වසර 12 ක් ප්‍රමාද වීම හේතුවෙන් ඉඩම් කට්ටි 243 ක් වෙනුවෙන් රු.මිලියන 33.5 ක අමතර පොලී මුදලක් ගෙවීමට සිදු වි තිබුණි.

**ආර්ථිකමය වාසි රජයට සැලසෙන ලෙස ප්‍රසම්පාදන සිදු නොකිරීම**

අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය නොකිරීමත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සහල් වෙළඳපල මිල ගණන් සමීක්ෂණය කර සහල් මිලදී ගැනීමට කටයුතු නොකිරීමත්, මුදල් රෙගුලාසි 156 (7) ප්‍රකාරව රජයට වාසිදායක පරිදි කටයුතු නොකිරීමත්, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2024 අප්‍රේල් 04 දිනැති අංක DFD/2024-01 දරන චක්‍රලේඛයේ 3.6 ඡේදයේ දක්වා ඇති පරිදි රජයේ වියදම් අවම වන ආකාරයට කටයුතු නොකිරීමත්, 2024 අප්‍රේල් 10 හා 2024 ජුනි 10 දිනැති ප්‍රතිපාදන අනුමත කිරීමේ ලිපිවල අංක 04 ඡේදයේ සඳහන් පරිදි වියදම් දැරීමේදී රජයේ නිතීරීති

වලට අනුව කටයුතු නොකිරීමත් නිසා මොනරාගල දිස්ත්‍රික්කය තුල සහල් මිලදී ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් රජයට රු.මිලියන 36.6 ක පාඩුවක් සිදුව තිබුණි.

**වන අලින්ගෙන් සිදුව තිබූ අලාභ**

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලය තුලදී වන අලි ඇතුළු වන සතුන්ගෙන් දේපල හානි 528 ක් ද, ශාරීරික හානි 32 ක් හා ජීවිත හානි 30 ක් වාර්තා වී තිබූ අතර ඒ සඳහා රු.මිලියන 52.6ක වන්දි මුදලක් ගෙවා තිබුණි.

## නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**අවිධිමත් ගනුදෙනු**

1941 වර්ෂයේදී පමණ ඉදිකර තිබුණු රජයේ ක්‍රීඩා සමාජ ශාලා ගොඩනැගිල්ල රු.මිලියන 21.80 ක වටිනාකමක් සහිතව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාවර වත්කමක් ලෙස ගිණුම්ගතව තිබියදී 80 දෙනෙකුගේ සාමාජිකත්වය සහිත ක්‍රීඩා සමාජයේ සාමාජිකයන් 10 දෙනෙකු පමණක් රැස්වී 2024 ජුනි 12 දින මාසික සභාවක් පවත්වා වසර 20 සඳහා මෙම ගොඩනැගිල්ල බාහිර පාර්ශවයකට රාත්‍රී සමාජ ශාලාවක් පවත්වාගෙන යාමට බදු පදනමට ලබාදී තිබුණි. මෙම රැස්වීමට සහභාගිවූ බවට අත්සන් කළ නිලධාරියෙකු එදින වෙනත් රාජකාරි කටයුත්තක නිරත වී තිබූ බැවින්, අත්සන් ලේඛනයද පිළිගත හැකි තත්ත්වයක නොවීය. චංචල දේපලක් ලෙස ව්‍යාපාරක් බදු දීම ගිවිසුමක් සකස් කර තිබුණද ඒ තුල ගොඩනැගිල්ල බදු දීම සඳහා වන කොන්දේසි ඇතුළත් කර තිබුණි. මෙම ස්ථානය සඳහා වන ක්‍රීඩා සමාජයට අයත් මත්පැන් බලපත්‍රය දිස්ත්‍රික් ලේකම්වරයාගේ රු.මිලියන 1.13 ක පෞද්ගලික වියදමින් අලුත් කර මෙම ස්ථානයේ මත්පැන් අලෙවියට ඉඩ සලසා තිබුණි. බාහිර පාර්ශවයකට බදු පදනම මත ලබාදීමට ප්‍රථම, මෙම ගොඩනැගිල්ලේ පවත්වා ගෙන යනු ලැබූ ක්‍රීඩා සංගමය සහ එහි උපකරණ ස්ථාපනය කිරීම සඳහා විමධ්‍යගත අයවැය වැඩසටහන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ 2024 වර්ෂයේ රු.මිලියන 5.20 ක ප්‍රතිපාදන මත ගොඩනැගිල්ලක් ක්‍රීඩා සමාජ ශාලා ගොඩනැගිල්ලට යාබදව ඉදිකර තිබුණි. 2024 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ අනුමත කර තිබුණු ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘති 03 කට වෙන්කරන ලද රු.මිලියන 3.20 ක ප්‍රතිපාදන අවලංගු කර මෙම ගොඩනැගිල්ල සඳහා මූල්‍ය ප්‍රතිපාදන සපයාගෙන

තිබුණි.

**කඳුකර දශකය ව්‍යාපෘතිය**

දසවිධ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක “කඳුකර දශකය 2024 - 2033” යටතේ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ලද රු.මිලියන 100ක ප්‍රතිපාදන මුදලින් ක්‍රියාත්මක කිරීමට ශක්‍යතා අධ්‍යනයන් සිදු කර 2024 මාර්තු 21 දින අනුමත කළ ව්‍යාපෘති 09 ක් ඉඩම් ගැටළු, ප්‍රජා සමිති වෙත ඉදිරිපත් නොවීම, NBRO වාර්තා නොමැති වීම, ප්‍රමාණවත් තාක්ෂණ නිළධාරීන් නොමැතිවීම හා 2024 ජූලි 22 දින ප්‍රාදේශීය සභාවට ක්‍රියාත්මක කිරීම සඳහා පවරා දුන්නද, ක්‍රියාත්මක නොකිරීම වැනි හේතූන් මත එකතුව රු.මිලියන 13.7 ක ප්‍රතිපාදන නැවත පවරා දී තිබුණි.

**යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති**

ජනාධිපති ලේකම් කාර්යාලයේ විශේෂ ව්‍යාපෘති ප්‍රතිපාදන යටතේ වතුකරයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩ සටහන යටතේ ඉදිකිරීම් 13 ක් සහ මිලදී ගැනීම් 06 ක් වෙනුවෙන් රු. මිලියන 21.00 ක් 2024 ජූලි 24 දින අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලට ප්‍රතිපාදන ලබාදී තිබුණද, 2024 දෙසැම්බර් 10 වන විට එම කාර්යයන් ඉටු නොකර මුදල් ආපසු පවරා දී තිබීමෙන් අදාළ අරමුණු ඉටු කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**නිෂ්කාර්යය වත්කම්**

ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන මත හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එළමුල්ල ගොවිජන සේවා මධ්‍යස්ථාන පරිශ්‍රයේ , ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපෘතිය මගින් 2018 වර්ෂයේදී රු. මිලියන 6.90 ක මුළු පිරිවැයක් සහිතව ඉදිකර තිබුණු බීජ බෝංචි ගබඩා කිරීමේ ගොඩනැගිල්ල හා ශීතාගාරය, විගණිත දිනය වූ 2025 ජනවාරි 31 දින වන විටත් නිශ්කාර්යව පැවතුණි.

**සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

2021 සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ රු. මිලියන 8.45 ක ප්‍රතිපාදන මත හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කෝපි බීජ නිෂ්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. විගණිත දිනය වූ 2025 ජනවාරි 31 දින වන විට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර වර්ෂ 03 කට වැඩි කාලයක් ගතවී තිබුණද, පොදු යටිතල

පහසුකම් සංවර්ධනය කිරීම යටතේ රු.මිලියන 3.23 ක් වැයකර ඉදි කරන ලද හුණුකොටුව "කෝපි බීජ ගබඩා කරන මධ්‍යස්ථානය හා ඉඩම්පිටිය හා මැටිබැඹිය ග්‍රාම නිලධාරි වසම්වල එකතුව ලෙස රු. මිලියන 0.52 ක් වැය කර නවීකරණය කරන ලද කෝපි බීජ එකතු කිරීමේ මධ්‍යස්ථාන දෙක ද, නිෂ්කාර්යව පැවතුණි. තවද, ඉඩම්පිටිය හා මැටිබැඹිය කෝපි බීජ එකතු කිරීමේ මධ්‍යස්ථාන සඳහා විදුලි සම්බන්ධතාව ලබාගෙන නොතිබීම හේතුවෙන් රු. මිලියන 1.86 ක් වැයකර මිලදී ගෙන ඇති කෝපි පොත්ත ඉවත් කිරීමේ යන්ත්‍ර" 07 ද දැනට වර්ෂ 03 කට වැඩි කාලයක් නිශ්කාර්යව පවතින බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

**ඉඩම් බදු අයකර නොගැනීම**

මුදල් රෙගුලාසි අංක 149 අනුව පැවරී ඇති වගකීම් නිසිලෙස ඉටු නොකාරීම හේතුවෙන් හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා නෝර්වුඩ් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දීර්ඝ කාලීන පදනම මත වාණිජ කටයුතු සඳහා බදු දී ඇති රජයේ ඉඩම් සඳහා රු. මිලියන 26.58 ක බදු මුදල් අයකර ගෙන නොතිබුණි.

**ඉඩම් කච්චේරි පැවැත්වීම**

2008 අගෝස්තු 20 දිනැති අංක 2008/04 දරන ඉඩම් කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරය ඉඩම් නියමානුකුල කිරීම සඳහා අඹගමුව කෝරලේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 32 කින් 18 ක් සඳහා පමණක් ඉඩම් කච්චේරි 2022 වර්ෂය තුල පවත්වා තිබුණද, ඉන් වසම් 10 කට අදාලව සහභාගි වු 537 දෙනෙකු වෙනුවෙන් බලපත්‍ර ලබාදීමට කටයුතු කර නොතිබුණි.

## පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ආදායම් සහතික නිකුත් කිරීමේ ගාස්තු අඩුවෙන් අයකිරීම**

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අංක 102 හා 1997 ජනවාරි 13 දිනැති ප්‍රාදේශීය පරිපාලන චක්‍රලේඛය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ආදායම් සහතික නිකුත් කිරීමේ දී එම ආදායමෙන් සියයට 1 ක ගාස්තු අයකළ යුතු අතර, අංක 351 හා 1997 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් එම ගාස්තුව නැවත සියයට 10 කින් වැඩි කරන ලදි. එසේම නැවත අංක 359 හා 2001 මාර්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් අයකරනු ලබන ගාස්තුව සියයට 15 කින් වැඩිකරන ලද අතර, ඒ අනුව ආදායම් සහතික සඳහා අයකරන

ගාස්තුව සියයට 1.265 ක් (සියයට 1 * සියයට 10 * සියයට 15) විය යුතු නමුත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සියයට 0.265 ක් අඩුවෙන් ආදායම් සහතික මත ගාස්තු අයකර තිබීම නිසා 2024 වර්ෂයේ රු.මිලියන.1.94 ක ආදායමක් අහිමි වී තිබුණි.

**ගැමිදිරිය ව්‍යාපෘතිය**

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ගැමිදිරිය ව්‍යාපෘතිය යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක ග්‍රාමීය සංවිධාන 160 ක් පිහිටුවා තිබූ අතර, එම ග්‍රාමීය සංවිධාන වෙත රු.මිලියන 517.7 ක මුදලක් ලබා දී තිබුණි. එම සංවිධාන විධිමත්ව අධීක්ෂණයක් නොවීම හේතුවෙන් වර්තමානය වනවිට ඇතැම් සංවිධාන අක්‍රීය වී තිබුණු අතර, අදාළ සමිති හඳුනාගෙන එම සමිති සක්‍රීය කිරීමටත් බැංකු ගිණුම්වල හා විවිධ පාර්ශව සතුව පවතින මුදල් නැවත එම සමිතිවල අරමුණු සඳහා යොමුකර ගැනීමටත් කටයුතු කර නොතිබුණු අතර, 2024 දෙසැම්බර් 31 දිනට හඳුනා ගෙන තිබූ අක්‍රීය බැංකු ගිණුම් ශේෂයන්ගේ වටිනාකම රු.මිලියන 56.6 ක් විය.

**ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්**

ගම සමඟ පිළිසඳර 2022 ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ පවුල් ඒකක සඳහා කිකිළි පැටවුන් ලබාදීම මඟින් ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය හා බිත්තර ලබාගැනීම තුළින් පවුලේ පෝෂණය ඉහළ නැංවීමේ අරමුණින් යුතුව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් පවුල් ඒකක වෙත රු.මිලියන 11.6 ක් වටිනා කිකිළි පැටවුන් 28,797 ක් ලබා දී තිබුණි. එයින් රු.මිලියන 09 ක් වටිනා කිකිළි පැටවුන් 22,265 ක් මියයාම හේතුවෙන් නැවත කිකිළි පැටවුන් ලබාදීමට සැපයුම්කරු සමඟ ගිවිසුම්ගතවී ඇතත්, සමාලෝචිත වර්ෂය තුළ දී කිකිළි පැටවුන් 3959 ක් පමණක් ලබා දී තිබුණි.

**සුවසේවා පදනම**

2000 වර්ෂයේදී වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සුව සේවා පදනම නමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජනතාවගේ සනීපාරක්ෂක පහසුකම් හා පානීය ජල පහසුකම් සැපයීමේ අරමුණින් පිහිටුවන ලද අරමුදලේ 2024 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 11.23 ක් පැවති අතර, එම මුදල් අරමුදල පිහිටවීමේ අරමුණ වෙනුවෙන් භාවිතා නොකර වර්ෂ 24 ක කාලපරිච්ඡේදයක සිට බැංකුවේ නිෂ්කාර්යව පැවතුණි.

**වී මෝල් හිමියන්ගේ අයකර ගත යුතු මුදල්**

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙහෙයවීම මත 2019/20 මහ කන්නයේ සිට 2022/23 මහ කන්නය දක්වා ක්‍රියාත්මක කරන ලද වී මිලදී ගැනීමේ වැඩසටහන් යටතේ රජයට ලැබිය යුතු සහල් කිලෝග්‍රෑම් 4,816,652 ක් ලබා නොදීම හේතුවෙන් රු.මිලියන 395ක මුදලක් තවදුරටත් වී මෝල් හිමියන්ගෙන් අයකර ගත යුතුව පැවතුණි.

**අනාර්ථික ගනුදෙනු**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිකිරීමේ අදියර III යටතේ ගෘහ භාණ්ඩ හා උපකරණ ලබා ගැනීම සඳහා වූ අංක PDF/GOV/155/CM/456 දරන හා 2019 ජුනි 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අත්‍යාවශ්‍ය ගෘහ භාණ්ඩ මිල දී ගැනීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. එමඟින් තට්ටු 02 ඇඳන් හා මෙට්ට 26 ක් රු.මිලියන 1.8 කට මිල දී ගෙන තිබුණු අතර, එයින් ඇඳන් 06 ක් භාවිතයට නොගෙන ගබඩාවේ තබා තිබුණි. තවද, මුළුතැන්ගෙයි උපකරණ රු.මිලියන 6.7 කට 2023 වර්ෂයේ දී සපයා සවි කරගත් බවට තහවුරු කර ගෙවීම් කර තිබුණද, විගණිත දින වූ 2025 අප්‍රේල් 28 දින වන විටත් එම උපකරණ සවිකර අවශ්‍යතාවයන් සඳහා භාවිතා කර නොතිබුණි.

## පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**අතරමඟ නතර කර ඇති ව්‍යාපෘති**

මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් 2019 ගම්පෙරළිය වැඩසටහන යටතේ රු.මිලියන 8.58 ක් ක් වැයකල ජල ව්‍යාපෘති 09 ක් හා 2022 ගම සමඟ පිළිසඳර වැඩසටහන යටතේ රු.මිලියන 3.36 ක් වැයකර ඉදිකර තිබුණු රජයේ ගොඩනැඟිලි 06 ක් නිම කිරීමට මූල්‍ය පහසුකම් නොලැබීම මත අතහැර දමා තිබුණි.

**e - GP මඟින්ප්‍රසම්පාදන සිදු නොකිරීම**

2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 2020 ජනවාරි 31 දිනට පෙර රජයේ විද්‍යුත් ප්‍රසම්පාදන (e - GP) පද්ධතිය තුල ප්‍රසම්පාදන අස්තිත්වයක් ලෙස ලියාපදිංචි වී චක්‍රලේඛ උපදෙස් පරිදි විනිවිදභාවයෙන් යුතුව ප්‍රසම්පාදනයන් සිදු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය වන විට වසර 05 ක් ගතවී ඇතත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**හිඟ මුදල් අයකර නොගැනීම**

රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ 2020/21 මහ කන්නයේ හා 2021 යල කන්නයේ දී වී මිලදී ගැනීමට අදාලව 2025 මාර්තු 21 දිනට දිස්ත්‍රික්කයේ සහල් මෝල් හිමියන් 20 කගෙන් වසර 4 කට වැඩි කාලයක සිට අයවිය යුතු රු.මිලියන 106.17 ක මුදල හා ඊට ආවස්ථික මූල්‍ය පොලියක් ගණනය කර රජයට අයවිය යුතු මුදල අයකර ගැනීමට හෝ සුදුසු නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කඩිනමින් ක්‍රියා කළයුතු වුවත්, එලෙස කටයුතු කර නොතිබුණි.

## රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ඛනිජ කැනීම් සඳහා ඉඩම් බදු දීම**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පනහඩුව වසමේ ඛනිජ කැනීම සඳහා හෙක්ටයාර 94.6174ක භූමි ප්‍රමාණයක් පෞද්ගලික සමාගමකට ලබා දී තිබුණි. එසේ ලබාදීමේදී අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් සකස්කර නොතිබූ අතර, පුරාවිද්‍යාත්මක වටිනාකමැති ස්ථාන හඳුනාගැනීමකින් තොරව හා බදු ගිවිසුමකට එළඹීමකින් තොරව වාර්ෂික බද්ද රු.මිලියන 6.5ක මුදලක් අයකර 2022 සැප්තැම්බර් 12 දින භුක්තිය ලබා දීමට ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කටයුතු කර තිබුණි.

## ත්‍රිකුණාමළය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**වාහන අනතුරු අලාභ**

අනතුරට ලක් වූ ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් මොන්ටේරෝ ජීප් රථයක් නැවත යතා තත්ත්වයට පත්කිරීම වෙනුවෙන් වැය වූ මිලියන 2.12 ක අලාභය රක්ෂණ ආයතනය මඟින් හානි පූරණය කරගැනීමට නොහැකි වීම හේතුවෙන් එම වටිනාකමින් රජයට අලාභයක් සිදුවී තිබුණි. තවද මරණයට පත් රියදුරාගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවට අනුව සිදුවී ඇති තුවාලවල ස්වභාවයෙන් අනතුරට ලක්වන විට රථය පදවා ඇත්තේ වාහනයේ රියදුරු නොවන බව අනාවරණවය වී තිබුණි.

**අඩු ආදායම්ලාභී නිවාස ව්‍යාපෘති**

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලබන අඩු ආදායම් ලාභීන් හා නැවත පදිංචි වූ අවතැන් පවුල් වෙනුවෙන් 2021 සහ 2023 වර්ෂ වල කන්තලේ ප්‍රාදේශීය ලේකම්

| | |
|---|---|
| | කාර්යාලය විසින් හඳුනාගෙන ලබාදුන් රු.මිලියන 0.6 නිවාස 04 ක් සහ රු. මිලියන 0.1ක නිවාස 15 ක ඉදිකිරීම් සම්පූර්ණ වී නොතිබුණි. සම්පූර්ණ නොකරන ලද නිවාස 39 ක් වෙනුවෙන් ගෙවන ලද ප්‍රතිලාභ ප්‍රමාණය මිලියන 29.4 ක් වී තිබුණි. |
| **හිඟ බදුකුළී** | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් විසින් සමාලෝචන වර්ෂය දක්වා වටිනාකම එකතුව රු.මිලියන 524.93 ක් වූ දිගුකාලීන ඉඩම් සහ ගොඩනැගිලි බදු කුලී ආදායම් දිගුකලක සිට හිඟ හිටිව පැවතුණි. |
| **වී මිලදී ගැනීම වැඩසටහන යටතේ අයකරගත යුතු මුදල්** | 2019/20 මහ කන්නයේ සිට 2022 වර්ෂ වෙනුවෙන් වී මිලදී ගැනීමේ කඩිනම් වැඩ පිළිවෙල යටතේ කන්තලේ ප්‍රාදේශීය ලෙකම් කොට්ඨාශයේ සහල් මෝල් හිමිකරුවන් 04 දෙනෙකුගෙන්ද, පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහල් මොල් හිමිකරුවන් 02 නෙකුගෙන් සහ සේරුවිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහල් මෝල් හිමියන් 02 නෙකුගෙන්ද ලෙස මෝල් හිමියන් 08 දෙනෙකුගෙන් ලැබිය යුතු එකතු වටිනාකම රු.මිලියන 49.77 ක් වූ වටිනාකම් මුදල් වර්ෂ 04 ක කාලයක් ඉක්ම ගියද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අයකරගෙන නොතිබුණි. |

## වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

| | |
|---|---|
| **වවුනියා ආර්ථික මධ්‍යස්ථානය** | ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් රු.මිලියන 291.63ක ඇස්තමේන්තු ගත වියදමකින් ඉදි කරන ලද වව්නියා ආර්ථික මධ්‍යස්ථානය වර්තමානයේ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින අතර 2018 වර්ෂයේ දී ඉදිකිරීම් අවසන් කර වව්නියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත මෙම ආර්ථික මධ්‍යස්ථානය භාර දී තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විටත් එය අපේක්ෂිත කාර්යය සඳහා භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, 2018 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු.මිලියන 14.03 ක මුදලක් ආරක්ෂක සේවා ගාස්තු, පිරිසිදු කිරීමේ වියදම් සහ ජල ගාස්තු වෙනුවෙන් වියදම් කර ඇති බවත් නිරීක්ෂණය විය. |

## ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### විගණන නිරීක්ෂණ

**වෙළඳපොල තත්වය**

2011 වර්ෂයේ දී සියයට 7.4ක් වූ ගෝලීය තේ නිෂ්පාදන කොටස සහ සියයට 17.1ක් වූ ගෝලීය තේ අපනයන වෙළඳපොළ කොටස සමාලෝචිත වර්ෂය වන විට පිළිවෙලින් සියයට 3.7ක් හා සියයට 13ක් දක්වා පහළ ගොස් තිබුණු බව තේ කමිටු ප්‍රවෘත්ති අතිරේකය (Supplement to Annual Bulletin of Statistics 2024) අනුව නිරීක්ෂණය වූ අතර, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ නිෂ්පාදන සහ ප්‍රවර්ධන කටයුතු සඳහා පිළිවෙලින් රු.මිලියන 10,128ක් හා රු.මිලියන 5,439.6ක පමණ වියදමක් 2011 සිට 2024 කාලපරිච්ඡේදය සඳහා සිදුකර තිබුණ ද, ගෝලීය සන්දර්භය තුළ ශ්‍රී ලංකා තේවලට හිමි ස්ථානයත් වෙළෙඳපොළත් ක්‍රමිකව අහිමි වී යාමක් සිදුව ඇති බව නිරීක්ෂණය විය.

## ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය

**බැඳුම්කර කඩකිරීම්**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xv පරිච්ඡේදයේ 4:7 වගන්තිය අනුව අධ්‍යයන කටයුතු සඳහා වැටුප් සහිත නිවාඩු ලබා විදේශගත වී බැඳුම්කර කොන්දේසි කඩකළ නිලධාරීන් 04දෙනෙකුගෙන් වර්ෂ 02 සිට වර්ෂ 34 දක්වා කාලයක් තුළ මණ්ඩලයට අයවිය යුතු එකතුව රු.මිලියන 3.87ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

**ඌණ උපයෝජිත උපකරණ**

ටයර් මධ්‍යස්ථානයට අයත් 2020 වර්ෂයේ දී ස්ථාපනය කර තිබුණු රු.මිලියන 20ක් වටිනා Gas Chromatography-Mass Spectrometry (GC-MS) උපකරණය සහ රු.මිලියන 15.9ක් වටිනා ICP-OES උපකරණ පසුගිය වර්ෂවල අවස්ථා 111ක දී පමණක් සාම්පල් පරීක්ෂා කිරීම සඳහා භාවිතා කර තිබුණු බැවින් එම උපකරණ ඌණ උපයෝජිතව පැවති අතර මණ්ඩලයට ආදායම් ජනනය කිරීමට නොහැකි වී තිබුණි.

**නිශ්කාර්ය වත්කම්**

2017 වර්ෂයේ අයවැය සාකච්ඡාවට අනුව, රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්වය හරහා ව්‍යාපාරික ආකෘතියක් ලෙස රබර් නිෂ්පාදන සැලසුම් කිරීම සහ කාර්යසාධනය ඇගයීම සඳහා අංශුමාත්‍ර පරිමිත සේවාකරණ මධ්‍යස්ථානයක් (FEAS CENTER) පිහිටුවීම සඳහා රු.මිලියන 50ක් වෙන්කර තිබුණු අතර, එම මුදලින් රු.මිලියන 49.7ක් භාවිතා කර 2019 වර්ෂයේ දී එම මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කර තිබුණ ද, 2023 ඔක්තෝබර් මාසයේ සිට එනම් වසර දෙකකට ආසන්න කාලයක සිට මධ්‍යස්ථානයේ කාර්යයන් සම්පූර්ණයෙන්ම නවත්වා තිබුණු බැවින් අදාළ ගොඩනැගිල්ල හා රු.මිලියන 38.9ක් පිරිවැය වූ පරිගණක හා මෘදුකාංග, යන්ත්‍ර, ලීබඩු හා කාර්යාල උපකරණ සියල්ල නිශ්කාර්යව පැවතුණි.

**ජීව ඉන්ධන දැව වර්ග හඳුන්වාදීමේ නියමු ව්‍යාපෘතිය**

එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය සමග 2017 වර්ෂයේ දී ගිවිසුම්ගතව 2022 වර්ෂයේ දී අවසන් කිරීමට නියමිතව තිබුණු කුඩා රබර් ඉඩම් හිමියන් සඳහා ජීව ඉන්ධන දැව වර්ග හඳුන්වාදීමේ නියමු ව්‍යාපෘතියෙහි කාර්යයන් සාර්ථකව නිම නොකිරීම හේතුවෙන් ඒ සඳහා ලැබී තිබුණු රු.මිලියන 10.4ක මුදලින් රු.මිලියන 4.3ක් එනම් සියයට 40ක මුදලක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් ඉතිරිව තිබුණි.

## රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

**වගාව අත්හැර දැමූ වගාකරුවන්ගෙන් සහනාධාර නැවත අයකිරීම**

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රබර් වගාකරුවන් සඳහා වගා සහනාධාර ලබාදෙන අතර, වගාව අත්හැර දැමූ විට ලබාදුන් සහනාධාර මුදල් වගාකරුවන්ගෙන් නැවත අයකර ගත යුතු ය. එහි දී දිස්ත්‍රික්ක 15කට අදාළව රබර් නැවත වගාකරුවන් 6,021 දෙනෙකුගෙන් 727දෙනෙකු වගාව අත්හැර දැමීම නිසා රු.මිලියන 27.8ක් ද, නව රබර් වගාකරුවන් 5,605 දෙනෙකුගෙන් 2,844දෙනෙකු වගාව අතහැර දැමීම නිසා රු.මිලියන 24.7ක්ද දෙපාර්තමේන්තුවට අයවිය යුතුව තිබුණි.

කෘෂිකර්ම

**ක්ලෝන අසාර්ථකවීම**

රබර් පර්යේෂණ ආයතනය, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ පැළ තවාන් වෙත හඳුන්වා දී තිබූ RRISL 2001 ක්ලෝනය සම්බන්ධ ගැටලු පැවතීම හේතුවෙන් 2023 වර්ෂය අවසාන වන විට මෙම පැළ නිකුත්කිරීම තාවකාලිකව අත්හිටුවා තිබුණු අතර, එම ක්ලෝනය අසාර්ථක ක්ලෝනයක් වීම මත 2024 වර්ෂයේ මැරුණු පැළ හැර තවාන්වල ඉතිරිව තිබුණු මෙම ක්ලෝනයට අයත් පැළ විනාශකර තිබුණු අතර, විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව පැළයක් නිෂ්පාදනය කිරීමට සාමාන්‍යයෙන් රු.225ක් පමණ වැය වන බවත් ඒ අනුව තවාන් 03කට අදාළව RRISL 2001 අසාර්ථක ක්ලෝනය යටතේ රු.මිලියන 6.41ක් වූ පැළ 28,521ක් විනාශකර තිබුණු බවක් නිරීක්ෂණය විය.

## පොල් පර්යේෂණායතනය

**සුදු මැස්සා හානිය පාලනය**

1972 මාර්තු 30 දිනැති ලංකාණ්ඩුවේ ගැසට්පත්‍රයේ 1 වැනි කොටස 1 ඡේදයේ 1වැනි උපලේඛනයේ 1 වගන්තිය ප්‍රකාරව පළිබෝධ නිවාරණය කිරීම හා සුවකිරීම පොල් පර්යේෂණ මණ්ඩලයේ කාර්යයක් වුව ද, 2019 වර්ෂයේ සිට පැතිර යන සුදු මැස්සා හානිය නිවාරණය කිරීම හෝ සුවකිරීමට මණ්ඩලය අපොහොසත්වීම හේතුවෙන් සුදුමැස්සා හානිය පසුගිය වසර 06 තුළ ශ්‍රී ලංකාවේ පොල් වගාව ආශ්‍රිතව සීඝ්‍රයෙන් පැතිර ගොස් තිබුණි.

## ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

**සේ.අ. හා සේ.භා. අරමුදල දායක නොගෙවීම**

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 හා 16 වන වගන්ති සහ 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් පනතේ 02 වන කොටසේ 16(1) වගන්ති ප්‍රකාරව 2000 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු.මිලියන 695.6ක සේවක අර්ථසාධක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගෙවීමට කටයුතු කර නොතිබුණි. මේ නිසා 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු අධිභාර මුදල රු.මිලියන 85.9ක් විය. වතු කාර්යමණ්ඩලයේ අර්ථසාධක අරමුදල (ESPS) වෙත නිසිපරිදි දායක මුදල් නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේ දී ගෙවිය යුතු මුදල රු.මිලියන 89.8ක් ද ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සංගමය (CPPS) වෙත ගෙවිය යුතු මුදල රු.මිලියන 22ක් ද විය. සේවා නියුක්තිකයන්ගේ භාරකාර

අරමුදල සඳහා 2000 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ගෙවිය යුතු දායක මුදල රු.මිලියන 47.5ක් වන අතර ගෙවිය යුතු අධිභාර මුදල රු.මිලියන 10.4ක් විය.

**සිටුවන ලද පැළ ක්ෂේත්‍රය් නොමැති වීම**

වලහන්දූව රාජ්‍ය වතුයාය නවීන තාක්ෂණය යොදාගනිමින් ආදර්ශ වතුයායක් ලෙස සංවර්ධනය කිරීමේ වගා ව්‍යාපෘතියට අදාළව 2022 හා 2023 වර්ෂවල දී සිදුකරන ලද පොල්, කුරුඳු හා තේ වගාවන් පිළිබඳව 2024 මැයි මාසයේදී සිදුකරන ලද භෞතික පරීක්ෂාවේ දී සිටුවන ලද පොල් පැළ 1551න් පැළ 1114ක්, සිටුවන ලද කුරුඳු පැළ 28,800න් 21,488ක් සිටුවන ලද තේ පැළ 27,500න් තේ පැළ 14,077ක් වගා භූමිය තුළ නොමැති බව තහවුරුකර තිබුණි. මේ සඳහා වගකිව යුතු නිලධාරින්ගෙන් අදාළ වියදම් අයකර ගැනීමට මේ දක්වා කළමනාකාරීත්වය කටයුතුකර නොතිබුණි.

## උක් පර්යේෂණ ආයතනය

**පර්යේෂණ කටයුතු සිදු නොකිරීම**

කන්තලේ සීනි කර්මාන්තශාලාව ආරම්භ කිරීමේ අරමුණින් ඊට අවශ්‍ය බීජ උක් සැපයීම, ප්‍රදේශයට සුදුසු උක් ප්‍රභේද තෝරාගැනීම ඇතුළුව පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සැපයීම අරමුණු කරගෙන 2011 වර්ෂයේ දී කන්තලේ සීනි කර්මාන්තායතනය සතු ඉඩමෙන් අක්කර 400ක භූමි ප්‍රමාණයක් හා ගොඩනැගිලි 13ක් උක් පර්යේෂණ ආයතනයට ලබා දී තිබුණු අතර, ආයතනය විසින් 18දෙනෙකුගෙන් යුත් කාර්යමණ්ඩලයක් අනුයුක්තකර 2024 වර්ෂය දක්වා වසර 13ක කාලය තුළ පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් වශයෙන් රු.මිලියන 147.5ක් වැයකර තිබුණ ද, කන්තලේ සීනි කර්මාන්තායතනය ආරම්භ නොකිරීම නිසා එම පිරිවැය නිෂ්කාර්ය වී තිබුණි.

ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා ජාතික රක්ෂණභාර අරමුදල මගින් රක්ෂණාවරණය ලබාගත යුතු බව ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් 2017 වර්ෂයේ දී දැනුම් දී තිබුණ ද ඒ පිළිබඳව අවධානය යොමු නොකර ආයතනය විසින් 2024 වර්ෂයේ දී ද භාණ්ඩාගාර අරමුදල් යොදා ගනිමින් රු.මිලියන 7.82ක වෛද්‍යාධාර දීමනා ගෙවා තිබුණි.

## කුරුණෑගල වැවිලි සමාගම

**සුදු පොල්තෙල් නිෂ්පාදන කර්මාන්තශාලාවක් ඉදිකිරීම**

දොඩම්ගස්ලන්ද පළාත් වතු සමූහයට අයත් හොලොන්ගොල්ල බෙදුමේ සුදු පොල්තෙල් නිෂ්පාදන කර්මාන්තශාලාවක් ඉදිකිරීම සඳහා යන්ත්‍රසූත්‍ර මිලදී ගැනීම විධිමත් පරිදි අවශ්‍යතා හඳුනාගෙන සැලසුමකට අනුකූලව එකවර ප්‍රසම්පාදනය කර නොතිබුණි. තෝරාගත් සැපයුම්කරුවන්ගෙන් පළමු අවස්ථාවේ දී රු.මිලියන 9.6ක යන්ත්‍ර මිලදීගෙන යළි මිල ගණන් කැඳවීමකින් තොරව තාක්ෂණික හා ප්‍රසම්පාදන කමිටු නිර්දේශ මත නැවත වරක් එම සැපයුම්කරුවන්ගෙන්ම රු.මිලියන 3.5ක් වටිනා යන්ත්‍ර මිලදීගෙන තිබුණි. ඒ අනුව 2023 වර්ෂයේ දී රු.මිලියන 13.1ක් වැයකර යන්ත්‍ර උපකරණ මිලදීගෙන වර්ෂ 02ක් ගත වී තිබුණ ද, ඒවා පොල්තෙල් නිෂ්පාදන කාර්යයට නොයොදවා සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිෂ්කාර්යව ගබඩාකර තිබුණි.

## හලාවත වැවිලි සමාගම

**භූමිය සංවර්ධනය සඳහා පස් ඉවත් කිරීම**

සමාගම සතු පොල් ඉඩම්වල එලදාව අඩු බැවින් ඛනිජ වැලි මිශ්‍ර පස් ඉවත්කර පොල් පැළ සිටුවා භූමිය සංවර්ධනය කිරීමට අදාළව සභාපතිවරයා ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනාවක් අනුව, මුක්කුතොඩුවාව වතු යායෙහි වැලි ඉවත්කිරීමේ අදියර 1 හා 2 ව්‍යාපෘති පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට පවරා 2021 වර්ෂයේ ආරම්භකර ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය අනුමත කිරීමේදී අදාළ රාජ්‍ය ආයතන විධිමත් අධ්‍යයනයක් සිදුකර තිබුණු බව හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී විධිමත් අධීක්ෂණයක් සිදුකළ බව විගණනයට නිරීක්ෂණය නොවුණි. භූමියෙන් ඉවත් කර රැගෙන යන පස් ප්‍රමාණය තහවුරුකර ගැනීම ඇතුළු ව්‍යාපෘතිය අධීක්ෂණ කටයුතු සඳහා විධිමත් අභ්‍යන්තර පාලනයක් ස්ථාපිතකර නොතිබුණු අතර, සවිකර තිබුණු CCTV පද්ධතිය තුළ ද මසක කාලසීමාවක දත්ත පමණක් ගබඩා වී තිබුණි. ව්‍යාපෘතියේ අදියර 1 හා 2 යටතේ කොන්ත්‍රාත්කරුවන් ඉවත් කරගත් පස් කියුබ් 11,792.2ක් වෙනුවෙන් සමාගම රු.මිලියන 84.5ක් අයකර ගෙන තිබුණ ද, පාංශු පැතිකඩ මිනුම් වාර්තා අනුව ඛනිජ වැලි මිශ්‍ර පස් කියුබ් 71,888ක් භූමියෙන් ඉවත්කරගෙන තිබුණි. කෙසේ වුව ද,

වැඩිපුර ඉවත්කර ගත් ඛනිජ වැලි මිශ්‍ර පස් කියුබ් 60,095.8 හා ඊට අදාළ සියයට 50ක අධිභාරය ද සමග රු.මිලියන 650.55ක් අයකර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. භූමියෙන් පස් ඉවත්කර වසර 4ක් පමණ ගත වී තිබුණ ද, භූමිය සංවර්ධනය කර පොල් පැළ සිටුවීමට සමාගම පියවරගෙන නොතිබුණු බව ද විගණනයේ දී නිරීක්ෂණය විය.

**සමාරම්භක උත්සව වියදම්**

ජාතික පොල් වගා කිරීමේ දිනය වෙනුවෙන් 2023 වර්ෂයේ දී පලෙලයි වතුයායට අයත් අක්කර 20ක පමණ භූමියක් සංවර්ධනය කර පොල් වගාකිරීම සඳහා ක්‍රියාත්මක කර තිබුණු වැඩසටහනට සමගාමීව පවත්වන ලද සමාරම්භක උත්සවය වෙනුවෙන් ඉඩම් සැකසීම, වැටවල් සැකසීම, ඉන්ධන හා වෙනත් වියදම්, උපකරණ මිලදීගැනීම, ආහාර හා නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් රු.මිලියන 5.19ක් හලාවත වැවිලි සමාගම විසින් වැය කර තිබුණ ද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් උක්ත වියදම නිෂ්කාර්ය වී තිබුණි.

**එකතු කළ අගය මත බදු අය නොකිරීම**

සමාලෝචිත වර්ෂයේ වැලි විකිණීමට අදාළව ඉන්වොයිස් නිකුත්කිරීමේ දී එකතු කළ අගය මත බදු (VAT) රු.මිලියන 1.8ක් කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර නොතිබුණු අතර, එම බදු මුදල සමාගම විසින් ගෙවා තිබුණි.

## ලංකා සීනි සමාගම

**සෙවනගල කර්මාන්ත ශාලාවේ ධාරිතාවය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය**

ඉකුත් වර්ෂයේ දී ආරම්භ කර තිබුණු සෙවනගල කර්මාන්ත ශාලාවේ ධාරිතාවය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක තත්වයට පත් කර නොතිබුණි. ඒ සඳහා ආනයනය කර තිබුණු රු.මිලියන 201.78ක යන්ත්‍ර භාවිතයට ගැනීමට පෙර වගකීම් කාලය ඉකුත් වී තිබුණු අතර ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය නොකර රු.මිලියන 7.72ක යන්ත්‍ර ආනයනය කර තිබුණි. යන්ත්‍ර ආනයන ක්‍රියාවලියේ දුර්වලතා හේතුවෙන් රු.මිලියන 3.62ක ප්‍රමාද ගාස්තු ගෙවා තිබුණු අතර යන්ත්‍ර සවිකිරීම සඳහා ඉන්දියාවේ සිට පැමිණි සැපයුම්කරුගේ සේවකයන් වෙත ආහාරපාන සහ ප්‍රවාහන පහසුකම් ලබදීම සඳහා රු.මිලියන 2.82ක්

වැයකර තිබුණු නමුත් සැපයුම්කරු සමග ඇතිකරගෙන තිබුණු ගිවිසුමෙහි ඒ පිලිබඳ කොන්දේසි ඇතුලත්ව නොතිබුණි.

**දැව්තෙල් මිලදීගැනීම**

පැල්වත්ත හා සෙවනගල ඒකකවල බොයිලේරු සඳහා දැව්තෙල් මිලදී ගැනීමේදී ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් මිලදී නොගෙන, ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය නොකර බාහිර පුද්ගලයෙකු වෙත දැව්තෙල් සැපයුම් ටෙන්ඩරය පිරිනමා තිබුණි. එම සැපයුම්කරු විසින් පිරිපහදු කළ දැව්තෙල් වෙනුවට නැව් සහ යන්ත්‍රවලින් ඉවත් කරන ලද පිරිපහදු නොකළ ප්‍රමිතියෙන් තොර කලු තෙල් සපයා තිබුණු අතර සමාගම ඒ වෙනුවෙන් රු.මිලියන 341.69ක ගෙවීම් කර තිබුණි. මෙම ප්‍රමිතියෙන් තොර කලු තෙල් භාවිතා කිරීම හේතුවෙන් වරින් වර බොයිලේරුව අක්‍රිය වී තිබුණු දින 46 ක කාලය තුල සමාගමට රු.මිලියන 300ක් වටිනා එතනෝල් ලීටර් 600,000ක නිෂ්පාදනයක් අහිමි වී තිබුණි.

# ජල සම්පාදන හා ජලාපවහන

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රයේ ජලය හා සනීපාරක්ෂාව පිළිබඳ තිරසාර සංවර්ධන ඉලක්ක 06ට අනුව සියළු දෙනාටම ජලය හා සනීපාරක්ෂාව ලබා ගැනීම සහ තිරසාර කළමනාකරණය සහතික කිරීම බලාපොරොත්තු වේ. ඉහත ඉලක්කයන් මූලික කරගත් රටෙහි සමස්ථ ජල සැපයුම සම්බන්ධයෙන් වූ රජයේ කාර්යභාර්ය ඉටුකිරීම සඳහා ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය සහ ඒ යටතේ වූ ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය, චීන ශ්‍රී ලංකා පර්යේෂණ ප්‍රදාන ව්‍යාපෘතිය යනාදි ආයතන පිහිටුවා තිබුණි. 2024 වර්ෂයේ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ රු.මිලියන 70,702.21ක්ද, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ රු.මිලියන 2,212.85ක්ද වශයෙන් වාර්ෂික අයවැය ප්‍රතිපාදන ලැබී තිබුණු අතර පිළිවෙලින් රු.මිලියන 31,810.02ක් හා රු.මිලියන 1,389.20ක් එනම් සියයට 45ක් හා සියයට 63ක් ඉහත කී ආයතන දෙක මගින් මෙම ක්ෂේත්‍රය සඳහා උපයෝජනය කර තිබුණි.

## ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය

### ජල සම්පාදන අංශය

සැමට ආරක්ෂිත පානීය ජලය සහ සනීපාරක්ෂාව යන දැක්ම යටතේ පිහිටුවා ඇති ජල සම්පාදන අමාත්‍යාංශයේ සමස්ත ජනගහනයට ආරක්ෂිත හා ප්‍රමාණවත් පානීය ජල පහසුකම් ලබා දීම සඳහා අවශ්‍ය ප්‍රවේශය සහතික කිරීමටත්, සැමට ප්‍රමාණවත් හා සාධාරණ සනීපාරක්ෂක පහසුකම් සහතික කිරීමත් ප්‍රධාන අරමුණු වේ.

අමාත්‍යාංශයේ කාර්යයන් ඉටු කිරීම සඳහා 2024 වර්ෂයේ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ජල සම්පාදන අංශය සඳහා රු.මිලියන 65,130.25ක් ද, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව සඳහා රු.මිලියන 2,212.85ක් ද වශයෙන් වාර්ෂික අයවැය ප්‍රතිපාදන ලැබී තිබුණු අතර පිළිවෙලින් රු.මිලියන 30,222.87ක් හා රු.මිලියන 1,389.20ක් එනම් සියයට 46ක් හා සියයට 63ක් පමණක් උපයෝජනය කර තිබුණි.

## විගණන නිරීක්ෂණ

### ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය

**ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්** ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 263 නියෝගය ප්‍රකාරව හදිසි අත්‍යවශ්‍ය කරුණක් සඳහා ඉඩමේ අයිතිය 38(අ) අතුරු විධානය මගින් භාරගත් ජල සම්පාදන ව්‍යාපෘති 05ක් සඳහා සහ බදුල්ල නාගරික අපජල හා මලාපවහන පද්ධතියේ

පිරිපහදු ඒකකය ඉදිකිරීම සඳහා අත්පත් කර ගන්නා ලද ඉඩම් වෙනුවෙන් 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා අවස්ථා 11ක දී රු.මිලියන 138.10ක වන්දි මුදල් සහ රු.මිලියන 10.86ක පොලී මුදල් ගෙවා තිබුණද, 2024 ජුනි 30 දින වන විටත් අදාළ ජල සම්පාදන ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු සිදුකර නොතිබුණි.

**ජංගම ජල පරීක්ෂණ රථය උපයෝජනය නොකිරීම**

ජල තාක්ෂණය සඳහා වූ චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ හා ආදර්ශන මධ්‍යස්ථානය වෙත චීන රජයේ ප්‍රදානයක් ලෙස 2020 වර්ෂයේදී ලැබී තිබූ රු.මිලියන 40.44ක් වටිනා ජංගම ජල පරීක්ෂණ රථය ලැබී 2024 දෙසැම්බර් වන විට වර්ෂ 04කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද කිසිදු ජල පරීක්ෂණ කටයුත්තක් සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතිණි. එසේ වුවද ජංගම රථයේ නඩත්තු කටයුතු සඳහා රු.මිලියන 0.89ක් වැය කර තිබුණු නමුත් රථය පරීක්ෂණ කටයුතු සඳහා යොදා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

**වන්දි ගෙවීමේ ප්‍රමාදය සඳහා පොලී ගෙවීම්**

ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38 හා 38(අ) වගන්තිය ප්‍රකාරව අත්පත් කර ගන්නා ඉඩම් සඳහා 38 නියෝගය නිකුත්කර වන්දි මුදල් ගෙවන දිනය දක්වා ඉඩම් හිමියා වෙත පොලී මුදල් ගෙවිය යුතු වේ. එසේ 38 නියෝගය නිකුත්කර ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල සම්පාදන ව්‍යාපෘති වෙනුවෙන් අත්පත්කර ගත් ඉඩම් වෙනුවෙන් වර්ෂ 2 කට පසු වන්දි මුදල් ගෙවීම නිසා රු.මිලියන 5.27ක්ද වසර 5 කට පසු වන්දි මුදල් ගෙවීම නිසා රු.මිලියන 8.11ක්ද පොලී වශයෙන් 2024 වර්ෂයේ ජනවාරි සිට ජූලි දක්වා ගෙවා තිබුණි.

**මණ්ඩලය වෙත අත්තිකාරම් ලබාදීම**

අමාත්‍යාංශය මගින් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ලබාදී තිබූ ප්‍රතිපාදන මගින් කොන්ත්‍රාත් 66ක් සඳහා 2021 සහ 2022 වර්ෂ තුළ එකතුව රු.මිලියන 2,588.77ක අත්තිකාරම් මුදල් ලබාදී තිබුණද අදාළ මුදල් උපයෝගී කරගෙන කොන්ත්‍රාත් කාර්යයන් නිම කිරීමට හෝ වැඩ නොකරනු ලබන හෝ වැඩ අතරමඟ නවතා ඇති ව්‍යාපෘතිවලට අදාළ අත්තිකාරම් මුදල් නැවත අයකර ගැනීමට

විගණන දිනය වූ 2025 මාර්තු වන විටත් කටයුතු කර නොතිබුණි.

**පාඩු හා හානි**

රාජකාරි කටයුතු වෙනුවෙන් රාජ්‍ය අමාත්‍ය කාර්යාලයට ලබා දී තිබූ රු.මිලියන 1.39ක වටිනාකමකින් යුතු කැමරා උපකරණ, මුද්‍රණ යන්ත්‍රයක් හා ලැප්ටොප් පරිගණකයක් අමාත්‍යවරයාගේ දේශපාලන කාර්යාලයේ තිබී 2022 මැයි 09 දින රටේ ඇති වූ කලබල හේතුවෙන් විනාශ වී තිබුණි. මෙම උපකරණ හදිසි තත්ත්වයක් මත සම්පූර්ණයෙන්ම විනාශ වීම, උපකරණ භාරව සිටි නිලධාරීන්ට පාලනය කළ හැකි සීමාවෙන් බැහැරව වූ සිදුවීමක් ලෙස මීට අදාළව මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව 2023 මැයි 11 දින ඉදිරිපත් කර තිබූ පරීක්ෂණ වාර්තාවෙහි දක්වා තිබුණි. එහෙත් අමාත්‍ය කාර්යාලයෙහි පරිහරණය සඳහා ලබාදී තිබූ මෙම උපකරණ අවසරයකින් තොරව අමාත්‍ය කාර්යාලයෙන් පිටතට ගෙනයාම හා ඉන්පසු විනාශවීම පිළිබඳව පරීක්ෂණ කමිටුවේ අවධානය යොමුවී නොතිබුණි.

## ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

**නීතිමය පසුබිම**

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සඳහා 2014 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී වර්ෂ 10ක් ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාල පනත සම්මත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමට අදාල කැබිනට් පත්‍රිකාවේ සඳහන් ප්‍රජා ජල යෝජනා ක්‍රමවලට අදාලව ප්‍රජා මූල සංවිධාන සඳහා ව්‍යවස්ථා, චක්‍රලේඛ, ගිවිසුම් සම්පාදනය කිරීම, එම සංවිධාන විසින් කරනු ලබන කාර්යයන් අධීක්ෂණය, සාධාරණ ගාස්තු අය කිරීමේ ක්‍රමවේදයන් සකස් කිරීම හා පවත්වාගෙන යාම වැනි කාර්යයන් සිදු කිරීමට දෙපාර්තමේන්තුවට නෛතික පසුබිමක් නොතිබුණි.

**ජාතික ප්‍රතිපත්තියක් සකස් නොකිරීම**

දෙපාර්තමේන්තුව ආරම්භ කර වර්ෂ 09ක් ඉක්ම ගොස් ඇතත් දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යයන් ලෙස හඳුනාගෙන

ඇති ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක ක්ෂේත්‍රයට අදාළ සියළු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල සහය ඇතිව ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම හා යාවත්කාලීන කිරීම මෙන්ම ජල යෝජනා ක්‍රමයන්ට ලබා ගන්නා ජලයෙහි ගුණාත්මක භාවය පරීක්ෂා කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

**අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) නොලැබීම**

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මඟින් පුත්තලම දිස්ත්‍රික්කයේ ජල ව්‍යාපෘති 04ක් සඳහා ජලය පිරිපහදු කිරිමේ මධ්‍යස්ථාන 04ක් ඉදිකර පිරිපහදු යන්ත්‍ර (Package Plant) සපයා සවිකිරිම සඳහා වූ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් වෙත 2022 මාර්තු 24 වන විට රු.මිලියන 16.38ක් ගෙවා තිබුණි. මෙම පිරිපහදු යන්ත්‍ර මඟින් ලබාදෙන ජලයේ ගුණාත්මකබව පිළිබඳ පාරිභෝගික විශ්වාසය නොමැතිවීම, එම ව්‍යාපෘති ආසන්නයේම නැනෝ තාක්ෂණය මඟින් ජලය පිරිපහදු කරනු ලබන ව්‍යාපෘති පැවතිම වැනි හේතූන් මත ජල ඉල්ලුම අඩුවී විගණිත දින වූ 2024 අගොස්තු 29 දින වනවිට මෙම යන්ත්‍ර ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි. ඒ අනුව ඒ සඳහා වැය කරන ලද සම්පූර්ණ මුදල නිෂ්කාර්ය වී තිබුණි.

**ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැතිවීම**

දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන සනීපාරක්ෂක පහසුකම් ලබා දීමේ ව්‍යාපෘතිය මඟින් 2020, 2021 හා 2022 වර්ෂ තුළදී පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභි පවුල් 120ක් සඳහා රු.මිලියන 0.04 බැගින් රු.මිලියන 4.80ක් ගෙවා තිබුණි. නිසි අධීක්ෂණයක් යටතේ එම කටයුත්ත සිදු නොකිරීම හේතුවෙන් අදාළ ඉදිකිරීම් විගණිත දිනය වූ 2024 අගෝස්තු වන විටත් අවසන් කර නොමැතිව පවතින බව නිරීක්ෂණය විය.

**ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ ප්‍රමාදයන්**

(i) ප්‍රජා ජල අභිමානි වැඩසටහන යටතේ 2020-2021 වර්ෂවල ඉදිකිරීම් ආරම්භ කරන ලද ව්‍යාපෘතීන් 244 න් 205 ක්ද 2019-2020 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කළ ව්‍යාපෘතීන් 05 ක්ද විවිධ හේතූන් මත 2024 දෙසැම්බර් 31 වන විටත් අවසන් වී නොතිබූ අතර ඒ සඳහා රු.මිලියන

4

1,754.06ක මුදලක් වැය කර තිබුණි. ව්‍යාපෘති ආරම්භ කර වසර 5 ක් ඉක්ම ගොස් තිබුණද මෙම ව්‍යාපෘති අවසන් කර ජනතාවට අවශ්‍ය ජල පහසුකම් ලබාදීමට අපොහොසත් වී තිබූ බව නිරීක්ෂණය විය.

(ii කැගල්ල දිස්ත්‍රික්කයේ මැණික්කඩවර හා මහ පල්ලේගම ගම්මානවල පවුල් 800 ක ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දීමේ අරමුණින් 2019 වර්ෂයේ ආරම්භ කර තිබූ ජල ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති භූමිය නායයෑමට ලක්වීම හේතුවෙන් 2024 වර්ෂයේදී රු.මිලියන 25.11ක ඇස්තමේන්තු පිරිවැයක් මත බැම්මක් ඉදිකිරීම සඳහා නව කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන තිබුණි. එසේම නාය යෑම ලක්වන විට ළිඳ, ගබඩා ටැංකිය, පොම්පාගාරය, පැති බැම්ම ඉදිකිරිමට හා ජලනල හා උපාංග මිලදී ගැනීම වෙනුවෙන් රු.මිලියන 32.86ක් වැය කර තිබුණි. එසේම රු.1.46ක් වැයකර ඉදිකර තිබූ ලිදෙහි ජලය ප්‍රමාණවත් නොවීම නිසා භාවිතයටගෙන නොතිබුණි. මහපල්ලේගම ගම්මානය සඳහා පොම්පාගාරය හා ජලය බෙදා හැරීමේ පද්ධතියක් ඉදි කිරීම සඳහා රු.මිලියන 40.30ක 2024 ජූලි 24 දින පුද්ගලික ආයතනයක් වෙත පිරිනමා තිබුණි. ගිවිසුම ප්‍රකාරව මෙම කොන්ත්‍රාත්තුව 2024 නොවැම්බර් 01 දින අවසන් කල යුතු වුවත් 2024 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 17.72ක මුදලක් වැයකර තිබුණු අතර වැඩ අවසන් කර නොතිබුණි.

**නැනෝ පිරිපහදු යන්ත්‍ර සවිකිරිම**

වකුගඩු රෝගයෙන් පීඩා විඳින ජනතාව වෙනුවෙන් දිස්ත්‍රික්ක 11ක නැනෝ පිරිපහදු යන්ත්‍ර 140ක් මාස 10ක් තුළ සවි කිරීම සඳහා 2021 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 400.39කට පෞද්ගලික ආයතනයකට කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි. ඉන් දිස්ත්‍රික්ක 04ක ප්‍රතිලාභීන් 5414කට ජලය සැපයීමේ අරමුණින් ස්ථාපනය කරන ලද පිරිවැය රු.මිලියන 47.37ක් වූ නැනෝ පිරිපහදු යන්ත්‍ර 18ක් 2025 පෙබරවාරි වන විට ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි. එමෙන්ම ප්‍රතිලාභීන් 25,497කට රු.මිලියන 183.45ක් වැය කර දිස්ත්‍රික්ක 04ක ස්ථාපනය කරන ලද නැනෝ පිරිපහදු යන්ත්‍ර 54කින් ජලය

5

සැපයීමට හැකි වී තිබුණේ ප්‍රතිලාභීන් 3835කට පමණි. එමෙන්ම 2025 පෙබරවාරි වන විටත් ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 45.71ක් වූ ප්‍රතිලාභීන් 7310කට ජලය සැපයීමට සැලසුම් කළ පිරිපහදු යන්ත්‍ර 22ක් ස්ථාපනය කර නොතිබුණි.

කිලිනොච්චිය, වව්නියාව, මුලතිව් යන දිස්ත්‍රික්කවල වටිනාකම රු.මිලියන 193.89ක නැනෝ පිරිපහදු යන්ත්‍ර 50ක් ස්ථාපනය කිරීමට සැලසුම් කර තිබුණ ද රු.මිලියන 19.62ක වැඩ කොටස් ඉටුනොකර රු.මිලියන 174.27ක් වූ අවසන් බිල්පත 2024 නොවැම්බර් මාසයේදී ගෙවා තිබුණි. මෙහිදී යන්ත්‍ර සවිකිරිම අනුමත ප්‍රමිතියට අනුව සිදු කර නොතිබුණු බව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වී තිබුණු අතර විදුලි උපාංග සවි නොකර තිබියදී හා ස්ථාන කිහිපයක ජල මෝටර් හා පොම්ප නොතිබියදී ඉංජිනේරුවරයා හා තාක්ෂණික නිලධාරි විසින් වැඩ නිම කල බවට ලබාදුන් සහතික මත ගෙවීම් කර තිබුණු බව නිරීක්ෂණය විය.

**ව්‍යාපෘති උපකරණ අනාරක්ෂිතව තැබීම**

(i) ප්‍රජා ජල අභිමානි වැඩසටහන යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ඉදිකර තිබූ ප්‍රජා ජල ව්‍යාපෘති 07ක් 2024 ඔක්තෝබර් වනවිටත් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් 2023 දෙසැම්බර් මාසයේදී එම ව්‍යාපෘති සඳහා ලබා දී තිබූ රු.මිලියන 23.49ක් වටිනා PVC ජල නලද රු.මිලියන 10.11ක් වටිනා වතුර මීටර් ද නිවෙස්වල, විහාරස්ථානවල හා පොදු ස්ථානවල අනාරක්ෂිතව ගොඩ ගසා තිබූ අතර ඒ පිළිබඳ දෙපාර්තුමේන්තුව දැනුවත් කර තිබුණද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) මැණික්කඩවර සිසලස පානීය ජල ව්‍යාපෘතිය සඳහා මිලදීගෙන තිබූ රු.මිලියන 4.31ක් වූ ජල පොම්ප හා උපාංගද රු.මිලියන 4.29ක් වූ ජලමනු 945ක්ද වසර 02ට ආසන්න කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන ගබඩා කර තිබුණි. එමෙන්ම 2020 ඔක්තෝබර් මාසයේදී රු.මිලියන 9.11ක් වැයකර මිලටගෙන තිබූ ජලනල හා උපාංගවලින් වැඩි ප්‍රමාණයක්ද 2024 දෙසැම්බර් 31 දක්වා ප්‍රයෝජනයට නොගෙන අනාරක්ෂිත ස්ථානවල ගබඩා කර තිබූ අතර ඒවායින් වානේ/ යකඩ ජල පද්ධති

6

සම්බන්ධ කෙරෙන උපාංග විනාශයට පත්වෙමින් පැවතුණි.

(iii) 2023 දෙසැම්බර් මාසයේදී දිස්ත්‍රික්ක 07ක ප්‍රජා මූල සංවිධාන 08ක් වෙත රු.මිලියන 11.31ක් වැයකර ලබා දී තිබූ ජල මීටර් 1208කින් රු.මිලියන 9.27ක් වටිනා ජල මීටර් 908ක් 2025 මාර්තු 31 දින වන විටත් භාවිතයටගෙන නොතිබුණි.

**අලාභ අයකර නොගැනීම**

දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කර තිබූ ප්‍රජා ජල ව්‍යාපෘති සම්බන්ධයෙන් 2021-2024 අතර කාලපරිච්ඡේදය තුළ සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවන්වලදී ජල ව්‍යාපෘති ඉදිකිරීමේ කොන්ත්‍රාත්වල ඉටු නොකරන ලද කාර්යයන් හා වැඩිපුර ගෙවීම් සිදුකල අවස්ථා 23ක් අනාවරණය වූ අතර ඒ සඳහා රු.මිලියන 20.34ක් ගෙවා ඇති බවද අනාවරණය කර තිබුණි. එම අනාවරණයන්ට අදාළව මූලික පරීක්ෂණ පවත්වා නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී දෙපාර්තමේන්තුව මඟින් මාර්ගෝපදේශ චක්‍රලේඛ මඟින් නිරන්තරයෙන්, හඳුන්වා දී තිබූ කරුණු පිළිබඳව සැලකිලිමත් වන ලෙස උපදෙස් හා තරයේ අවවාද කිරීමේ ලිපි පමණක් අදාළ නිලධාරින්ට නිකුත් කර තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව හා පාඩු සිදු කළ නිලධාරින්ට එරෙහිව ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට හෝ රජයට සිදු වූ අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

ශ්‍රී ලංකාව තුළ ආරක්ෂිත පානීය ජලය සැපයීම සහ සනීපාරක්ෂාව සැපයීම සඳහා පහසුකම් සපයන ප්‍රධාන ආයතනය වන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සඳහා 2020 - 2025 වර්ෂ වෙනුවෙන් පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්මෙහි සංශෝධිත ඉලක්ක සහ ඊට අදාල කාර්යය සාධනය පහත පරිදි විය.

වගු අංක 2.36 - කාර්ය සාධන දර්ශකයන්හි ඉලක්ක හා ප්‍රගතිය

| කාර්ය සාධන දර්ශකය | ඒකකය | 2024 | |
|---|---|---|---|
| | | ඉලක්ක | ළඟා කරගත් ප්‍රමාණය |
| ආරක්ෂිත පානීය ජල ආවරණය | ජනගහනයෙන් % | - | 98.8 |
| ආරක්ෂිත නල ජල ආවරණය | ජනගහනයෙන් % | 69.7 | 50.2 |
| නව ජල සැපයුම් සම්බන්ධතා | සංඛ්‍යාව | 151,274 | 118,274 |
| ආරක්ෂිත නල මලාපවහන පහසුකම් | ජනගහනයෙන් % | 2.07 | 2.08 |
| **ආදායම් නොලබන ජල සැපයුම්** | | | |
| කොළඹ නගරය | පිරිපහදු කල ජලයෙන් % | 19.01 | 19.24 |
| දිවයින පුරා | පිරිපහදු කල ජලයෙන් % | 24.82 | 24.80 |

**මූලාශ්‍රය - ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු**

**රජයේ දායකත්වය**

මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දින වන විට රජයේ මැදිහත්වීම මත මණ්ඩලය විසින් දේශීය හා විදේශීය මූලාශ්‍ර වලින් ව්‍යාපෘති සඳහා ලබාගත් ණය ප්‍රමාණය රු.මිලියන 286,272ක් වී තිබුණු අතර වර්ෂය තුළ විවිධ ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා එයින් රු.මිලියන 27,585ක් වැය කර තිබුණි. එමෙන්ම 2024 දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා ලබාගත් ණය සහ ඊට අදාල පොලිය එකතුව රු.මිලියන 136,091ක් රජයේ වගකීම් බවට පත් කර තිබුණි. එමෙන්ම මණ්ඩලයේ සෘජු හා වක්‍ර අධීක්ෂණය යටතේ 2024 වර්ෂය නිම වන විට ක්‍රියාත්මක වෙමින් පැවති ජල සම්පාදන ව්‍යාපෘති 28ක් සඳහා දේශීය හා විදේශීය මූල්‍ය ආයතනයන්හි සහ රජයේ දායකත්වයන්ගේ එකතුව රු.මිලියන 479,162ක් වී තිබුණි.

**රූපසටහන 2.35 - ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අරමුදල් මූලාශ්‍ර හා මූල්‍ය ප්‍රගතිය**




මූලාශය: ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කළමනාකරණ තොරතුරු වාර්තාව, 2024

**ව්‍යාපෘති කාල ප්‍රමාදයන්**

නියමිත කාලය තුළ නිම කර අදාළ ප්‍රතිලාභීන්ට අවශ්‍ය සේවාව ලබා දීමට නොහැකිවීම මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ මූලික සහ පොදු අඩුපාඩුවක් වී තිබුණු අතර ඉහත ව්‍යාපෘති අතරින් ව්‍යාපෘති 17ක් නිමවිය යුතු කාලය ඉක්මවා අවස්ථා 01 සිට අවස්ථා 11 දක්වා කාලය දීර්ඝ කිරීම් ලබා දී තිබුණි. ඒ අනුව එම ව්‍යාපෘති අපේක්ෂිත කාලය ඉක්මවා ආසන්න වශයෙන් වර්ෂ 0.5 සිට 7ක් දක්වා ගතවී තිබුණත් 2024 වර්ෂය නිමවන විටත් නිම නොකර පැවතුණි. එම ව්‍යාපෘති 17හි කාලප්‍රමාදයන් සම්බන්ධව විස්තර පහත ප්‍රස්ථාරය මඟින් දැක්වේ.

9

**රූප සටහන 2.36 - ව්‍යාපෘති නිම කිරීමේ කාල ප්‍රමාදයන්**




මූලාශ්‍රය : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු

ඉහත සඳහන් පරිදි අසාමාන්‍ය ලෙස ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම හේතුවෙන් එම ජල සම්පාදන ව්‍යාපෘතිවලින් ප්‍රතිලාභ අපේක්ෂාවෙන් සිටින ජනතාවට අවශ්‍ය සේවාව නියමිත පරිදි ලබාදීමට නොහැකිවීම සහ මණ්ඩලයට ලැබීමට ඇති ආදායම් නියමිත කාලයට නොලැබීමෙන් සිදුවන පාඩු ආවරණය කර ගැනීම සඳහා ජල ගාස්තු වැඩිකිරීම වැනි අහිතකර ප්‍රතිඵලයන්ට මුහුණදීමට ජල පාරිභෝගිකයන්ට සිදුවී තිබුණි.

**දීමනා ගෙවීම්**

රජයේ ඒකාබද්ධ අරමුදලට බදු සහ ලාභය බෙදා හැරීමට පෙර මාසික ඵලදායිතා දීමනාව ලෙස ගෙවන ලද රු.මිලියන 444.60ක මුදලට අමතරව රු.මිලියන 286.76ක් ඵලදායිතා දිරි දීමනාවක් හා ඒකාබද්ධ අරමුදලට ගෙවීමකින් තොරව 2024 වර්ෂයේ ප්‍රසාද දීමනාව ලෙස රු.මිලියන 149.03ක් ගෙවා තිබුණි.

**වැඩියෙන් ගෙවන ඉන්ධන දීමනා ආපසු අයකිරීම්**

2022 ජනවාරි සිට 2023 ජූලි දක්වා කාලය තුළදී මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරීවරුන් සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් විසින් රු.මිලියන 7.45ක ඉන්ධන ලීටර් 23,313ක් වැඩිපුර භාවිතා කර තිබුණු අතර චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සිදු කරන ලද මෙම ඉන්ධන භාවිතය සඳහා දරන ලද වියදම ප්‍රතිපූරණය කිරීමට 2025 අප්‍රේල් දක්වා කටයුතු කර නොතිබුණි.

**රඳවා ගැනීමේ මුදලින් පිරිවැය අයකර නොගැනීම**

ජලසම්පාදන මණ්ඩලයේ කද්දුව පොම්පාගාරය සඳහා රු.මිලියන 45.93ක් වටිනා පොම්ප හතරක් ප්‍රසම්පාදනය කිරීමේදී සිදුවී ඇති බවට වාර්තා වී තිබූ අක්‍රමිකතාවයක් සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශනයකට අනුව මණ්ඩලය විසින් දරන ලද රු.මිලියන 4.9ක පිරිවැය අයකර ගැනීමට නිර්දේශ කර තිබුණි. ඊට අදාල කාර්යසාධන බැඳුම්කරය කල් ඉකුත් වී තිබූ අතර රු.මිලියන 2.6ක රඳවා ගැනීමේ මුදල පියවා ගැනීමෙන් පසු ඉතිරි රු.මිලියන 2.3 අයකර ගැනීමට 2025 අප්‍රේල් දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් මණ්ඩලය විසින් ගෙන නොතිබුණි.

**වාහන කලමණාකරණයේ අඩුපාඩු**

හෙම්මාතගම ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසුවත් ව්‍යාපෘතිය මඟින් මිලදී ගන්නා ලද රු.මිලියන 65.78ක් වටිනා වාහන හතරක් ව්‍යාපෘති අරමුණුවලින් බැහැරව භාවිතා කර තිබුණු අතර ව්‍යාපෘතිය මඟින් මසකට රු.422,000ක් ගෙවමින් කුලියට ගත් තවත් එක් වාහනයක් භාවිතා කල කාර්යයන් සහ පාර්ශවයන් නිශ්චිතව හඳුනාගැනීමට විගණනයට නොහැකි විය. කෙසේ වෙතත්, 2023 සිට වාහන ආනයනය තාවකාලිකව අත්හිටුවා තිබියදී, මුදල්, ආර්ථික ස්ථායිකරණය සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා ව්‍යාපෘති අරමුණු සඳහා පමණක් එම වාහන ආනයනය කිරීමට අනුමැතිය ලබා තිබුණද, කොන්ත්‍රාත් ගිවිසුමේ 4.5.4 උප කොන්දේසියට පටහැනිව, ජපානයෙන් අලුත්ම තත්ත්වයේ වාහන ආනයනය කිරීම වෙනුවට තායිලන්තයෙන් භාවිතා කළ/පිළිසැකසුම් කළ වාහන ව්‍යාපෘතිය විසින් ආනයනය කර තිබුණි.

**මණ්ඩලය මගින් පෞද්ගලික පරිශ්‍රයන් සඳහා ආරක්ෂාව ලබාදීම**

2021 අගෝස්තු සිට 2024 මැයි දක්වා කාලය තුළදී සාමාන්‍යාධිකාරීවරයාගේ අනුමැතිය මත මණ්ඩලයේ හිටපු සභාපතිවරයාගේ පෞද්ගලික පරිශ්‍රයන් සඳහා මණ්ඩලයේ සේවයට බඳවාගත් ආරක්ෂක නිලධාරීන්ගේ සේවාවක් සැපයීම හේතුවෙන් මණ්ඩලයට රු.මිලියන 5.8ක අලාභයක් සිදුවී තිබුණි.

11

**කොන්ත්‍රාත් අත්තිකාරම් මුදල් අයකර ගැනීමට අපොහොසත්වීම**

(i) පාලනය කළ හැකි ගැටළු නිසි ලෙස කළමනාකරණය නොකිරීම හේතුවෙන්, ගිරිදර ජල සම්පාදන ව්‍යාපෘතිය කොන්ත්‍රාත්කරු විසින් 2024 ජුනි 13 වන දින අවසන් කර තිබුණි. ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් මාස 10ක් ගතවී ඇතත්, 2025 අප්‍රේල් වන විටත් කොන්ත්‍රාත් අත්තිකාරම් මුදලින් රු.මිලියන 35.61ක් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ii) 2019 නොවැම්බර් 18 වන දින නිම කිරීමේ අපේක්ෂාවෙන් පිරිනමන ලද අංක PR/RSC/(NC)/ D&B/ මැදිරිගිරිය/2016/300 දරන කොන්ත්‍රාත්තුව 2024 ජූලි 15 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණු අතර එය සියයට 13.19 ක මන්දගාමී ප්‍රගතියක් වාර්තා කර තිබුණි. 2018 අගෝස්තු 01 වන දින ලබාදෙන ලද අත්තිකාරම් මුදලින් රු.මිලියන 118.38ක් අයකර ගැනීමෙන් තොරව පවතින අතර කොන්ත්‍රාත් කොන්දේසි අංක 8.7 අනුව රු.මිලියන 123 ක ද්‍රවශීලතා හානි මුදල් මණ්ඩලය විසින් ඉල්ලා නොතිබුණි.

(iii) මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත්වලට අදාළව ලබා දී තිබූ රු.මිලියන 1,710ක අත්තිකාරම්වලින් රු.මිලියන 364.71ක් වසර තුනකට වැඩි කාලයක් තිස්සේ පියවා ගැනීමෙන් තොරව පැවතුණි. තවද, කාර්යය සාධන බැඳුම්කර නොමැති වීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන් හතර දෙනෙකු වෙත ලබා දී තිබූ රු.මිලියන 31ක අත්තිකාරම් අයකර ගත නොහැකි තත්ත්වයක පැවතුණි.

**බාහිර ආයතනවල තැන්පත් කළ මුදල් නැවත අය කර ගැනීම**

බාහිර ආයතනවල තැන්පත් කර තිබූ එකතුව රු.මිලියන 75ක් වූ ආපසු ලබාගත හැකි කෙටි කාලීන තැන්පතු වසර තුනක් තිස්සේ අයකර ගැනීමෙන් තොරව පැවති අතර අදාළ ලියකියවිලි නොමැති වීම හේතුවෙන් ඉන් රු.මිලියන 11.95ක් අයකර ගත නොහැකි තත්ත්වයක පැවතුණි. එමෙන්ම රේඛීය අමාත්‍යාංශයට ලබා දුන් රු.මිලියන 4.37ක අත්තිකාරමක් වසර එකොළහක් තිස්සේ නැවත අයකර ගැනීමෙන් තොරව හිඟව පැවතුණි.

# කර්මාන්ත හා නිෂ්පාදන

තාක්ෂණය, දැනුම සහ නවෝත්පාදන චින්තනය මත පදනම් වූ හිතකර පරිසරයක් නිර්මාණය තුළින් විවිධාංගීකරණය වූ, ඉහළ අගය එකතු කළ, නව කාර්මික නිෂ්පාදන, පරිසර හිතකාමී ක්‍රමවේදයන් භාවිතය, ඉහළ වෙළඳපොළ ප්‍රවේශ අවස්ථා සහ සැමට ප්‍රතිලාභ ලැබෙන කර්මාන්ත සංවර්ධනයක් වෙනුවෙන් දිරිගැන්වීම සඳහා කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය කටයුතු කරනු ලබයි. අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තුවක් ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථා 12ක් සහ සමාගම් 12ක් ක්‍රියාත්මක වේ.

2024 වර්ෂයේදී ඉහතින් සඳහන් කාර්යභාරය ඉටුකිරීම සඳහා කර්මාන්ත සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයට රු.මිලියන 9,101.7ක ශුද්ධ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර 2024 වර්ෂය අවසාන වන විට රු.මිලියන 7,548.5ක් පමණක් උපයෝජනය කර තිබූ අතර එදිනට රු.මිලියන 1,553.2ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

මුදල් උපයෝජනය කරන ලද අංශ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

**රූපසටහන 2.37 - 2024 වර්ෂයේ කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ වියදම**




**මූලාශ්‍රය : කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු**

## විගණන නිරීක්ෂණ

**කර්මාන්ත ආරම්භ නොකරන ලද කර්මාන්ත පුර**

අක්කර 200ක භූමි ප්‍රමාණයක් තුළ රයිගම කර්මාන්තපුරය පිහිටුවීම සඳහා 2017 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු.මිලියන 905ක් වැයකර තිබූ නමුත් කර්මාන්තපුරය ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ව්‍යාපෘති සැලැස්මක් සකස් කර නොතිබුණි. 2024 වර්ෂය අවසාන වනවිටත් එහි කිසිදු කර්මාන්තයක් ආරම්භ කර නොතිබුණි.

රජයේ ඉඩම් අක්කර 281.399ක ක්‍රියාත්මක කිරීමට යෝජිත තවත් කර්මාන්තපුර 9ක් සංවර්ධනය සඳහා රජය විසින් රු.මිලියන 1542ක් වැයකර තිබුණත් 2024 දෙසැම්බර් 31 දක්වා ඒවායේ කිසිදු කර්මාන්තයක් ආරම්භ කර නොතිබුණි.

**ඉඩම් ඌන උපයෝජනය**

දිස්ත්‍රික්ක 21ක කර්මාන්තපුර ආරම්භ කිරීම සඳහා වෙන්කරන ලද ඉඩම් ප්‍රමාණය අක්කර 1,340ක් වූ නමුත් කර්මාන්තපුර සඳහා එයින් අක්කර 741.50ක් පමණක් වෙන්කර තිබූ හෙයින් අක්කර 598.50ක ඉඩම් 2024 වර්ෂය අවසන් වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

**බදු ගිවිසුම් අත්සන් නොකිරීම**

කර්මාන්තකරුවන් වෙත ඉඩම් වෙන්කිරීමේදී නිකුත් කරනු ලබන ඉඩම් වෙන්කිරීම් ලිපියට අනුව ඉඩම් වෙන්කිරීමෙන් පසුව අවුරුදු 35ක දීර්ඝකාලීන බදු ගිවිසුමක් අත්සන් කලයුතු වුවද කර්මාන්තපුර 30ක කර්මාන්තකරුවන් 347ක් සමඟ එබඳු බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

**ආයතනික අරමුණු ඉටු නොකිරීම**

1957 අංක 49 දරන කාර්මික සංස්ථා පනත මගින් පිහිටුවා ඇති ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ දැක්ම, ශ්‍රී ලංකා සිමෙන්ති කර්මාන්තයේ දියුණුව සඳහා මඟපෙන්වීම සහ නායකත්වය ලබා දීම වන අතර මෙහෙවර ලෙස රටේ අවශ්‍යතා සපුරාලීම සඳහා ගුණාත්මක සිමෙන්ති හා අනෙකුත් සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණවත් ලෙස සැපයීම සහතික කිරීම දක්වා තිබුණි. එසේ වුවද වර්තමානය වන විට සංස්ථාව විසින් සිමෙන්ති හෝ සිමෙන්ති ආශ්‍රිත කිසිඳු නිෂ්පාදනයක් සිදු කරනු නොලබන අතර අරුවක්කාලු හුණුගල් නිධිය බදු දීමෙන් ලද බදු ආදායම වූ රු.මිලියන 115.77ක බදු මුදල හා කොල්ලුපිටියේ

පිහිටි ඉඩම රථගාලක් සඳහා බදු දීමෙන් ලැබී තිබුණු ආදායම වූ රු.මිලියන 9.83ක් වූ කුලී ආදායම හා ආයෝජන කටයුතුවලින් උපයා ගෙන තිබූ රු.මිලියන 32.49ක ආදායම 2024 වර්ෂයේ සංස්ථාවේ ප්‍රධාන ආදායම් මාර්ග වී තිබුණි.

**අයකර ගත යුතු මුදල්**

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත රාජ්‍ය සමාගම විසින් කන්කසන්තුරෙහි පිහිටි සංස්ථාවට අයත් තෙල් ටැංකි 2ක් හා නළ පද්ධති ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව භාවිතයට ගෙන තිබුණු අතර 2010 වර්ෂයේ සිට 2024 වර්ෂය අවසානය දක්වා සංස්ථාව වෙත අයවිය යුතු බවට තක්සේරු කර තිබූ රු.මිලියන 234.72ක මුදලක් හා සංස්ථාව සතු කොල්ලුපිටිය ඉඩම හා ගොඩනැගිල්ල රණවිරු සේවා අධිකාරියට බදු දීම වෙනුවෙන් 2002 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා අයවිය යුතුව පවතින කුලී ආදායම් රු.මිලියන 1.96ක් 2024 වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි.

## ලංකා පිඟන් සංස්ථාව

**අවිධිමත් ලෙස ඉඩම් බදු දීම**

තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් හා රේඛීය අමාත්‍යාංශ අනුමැතියක් ලබා නොගෙන සංස්ථාව සතු වැළඩ කර්මාන්තශාලාව ඇතුළුව අක්කර 9 රූඩ් 1 පර්චස් 31ක් වූ ඉඩම 2023 සැප්තැම්බර් 5 දින සිට වර්ෂ 5ක කාලයක් සඳහා බදු දී තිබුණි.

**ඉඩම් හා ගොඩැගිලි සඳහා නීත්‍යානුකූල අයිතිය නොමැති වීම**

2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබූ රු.මිලියන 172.06ක් වූ අක්කර 47 රූඩ් 01 පර්චස් 37.2ක් වූ ඉඩම් හා එහි ඉදිකර ඇති රු.මිලියන 9.73ක ගොඩනැගිලි සඳහා නීත්‍යානුකූල අයිතිය සංස්ථාව සතුව නොපැවතුණි. තවද සංස්ථාව විසින් භාවිතා කරනු ලබන බංගදෙනිය, යටියන, වැළඩ, ඇලයාපත්තුව, බිංගිරිය, උස්වැව හා ඔඩ්ඩුසුඩාන් යන ස්ථානයන්හි පිහිටි අක්කර 119 රූඩ් 1 පර්චස් 37.84ක් වූ ඉඩම් සඳහා ද නීත්‍යානුකූල අයිතිය සංස්ථාව සතුව නොපැවතුණ බව නිරීක්ෂණය විය.

**නිෂ්කාර්යව පවතින වත්කම්**

සංස්ථාව සතුව කර්මාන්තශාලා 9ක් තිබූ අතර එයින් 7ක්ම 2002 - 2018 අතර කාලය තුළ නිෂ්පාදන කටයුතු නවතා දමා තිබූ අතර එයින් බංගදෙනිය, ඇලයාපත්තුව, යටියන හා බිංගිරිය කම්හල් හා

අදාළ ඉඩම් අක්කර 96 රූඩ් 16 පර්චර්ස් 100 ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි. තවද නිෂ්පාදන කටයුතු නවතා දමා ඇති කම්හල් 7හි රු.මිලියන 10.46ක අමුද්‍රව්‍ය තොගයක්ද රු.මිලියන 10.28ක සාමාන්‍ය තොගයක්ද වර්ෂ 1 සිට වර්ෂ 14 දක්වා කාල පරාසයන් තුළ නිෂ්කාර්යව පැවතුණි.

**නිෂ්පාදන කාර්යසාධනය අවම වීම**

මෙහෙයුම් කටයුතු සිදු කරමින් පවතින එරගම හා මහියංගනය යන කම්හල් 2හි 2024 වර්ෂයේ සත්‍ය නිෂ්පාදනය ඒකක 992,525ක් වූ අතර ඉකුත් වර්ෂයේ නිෂ්පාදනය ඒකක 1,118,444ක් වීමෙන් නිෂ්පාදනය ඒකක 125,919කින් එනම් සියයට 11කින් අඩු වී තිබුණු බව නිරීක්ෂණය විය.

එරගම කම්හලේ ඒකක නිෂ්පාදන පිරිවැය හා සැසඳීමේදී මහියංගනය කම්හලේ ඒකක නිෂ්පාදන පිරිවැය රු.246කින් වැඩි බව නිරීක්ෂණය විය. තවද එරගම කම්හලේ සියයට 25ක් වූ දළ ලාභ අනුපාතය මහියංගනය කම්හලේ සියයට 93ක් ලෙස වාර්තා වී තිබුණි.

මහියංගන කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන පිරිවැය ඉහළ යාම හේතුවෙන් 2024 වර්ෂයේ ආරම්භක මාස 03හි පමණක් නිෂ්පාදන කටයුතු සිදු කර තාවකාලිකව නවතා දමා තිබුණි. එසේ නිෂ්පාදන කටයුතු නවතා දමා තිබුණද කම්හල නඩත්තුව සඳහා මාසිකව රු.මිලියන 2ත් - 2.5ත් අතර මුදලක් වැයකිරීමට සිදුව තිබුණි.

**අනුමැතියකින් තොරව වැටුප් වැඩි කිරීම**

සංස්ථාව අඛණ්ඩව අලාභ ලබමින් පවතින වාතාවරණයක් තුළ හා ආයතනයේ ද්‍රවශීලතාවය පිළිබඳව සැලකිලිමත් වීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත 2024 ජනවාරි සිට සංස්ථාවේ සියළු සේවකයින්ගේ වැටුප් රු.15,000කින් වැඩි කිරීමට කටයුතු කර තිබුණි.

## ජාතික ශිල්ප සභාව

**අමුද්‍රව්‍ය බැංකු විධිමත් පරිදි ආරම්භ නොකිරීම**

වේවැල්, පිත්තල, මැටි සහ අනෙකුත් විශේෂිත සම්ප්‍රදායික සහ ග්‍රාමීය කර්මාන්ත සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය ලබා ගැනීමට පහසුකම් පුළුල් කිරීම සඳහා අමුද්‍රව්‍ය බැංකු ආරම්භ කිරීමට 2021 දෙසැම්බර් 31 දින රු.මිලියන 10.55ක් වටිනා උපකරණ වර්ග 21කින් අයිතම 248ක් මිලදීගෙන තිබුණද 2024 නොවැම්බර් 25 දින දක්වාම එම

බැංකු ක්‍රියාත්මක කර නොතිබීම නිසා එම උපකරණ නිෂ්කාර්යව පැවතුණි.

**නිෂ්කාර්ය වියදම් දැරීම**

ජාතික හා ජාත්‍යන්තර වශයෙන් නිෂ්පාදන මාර්ගගත ක්‍රමයට අලෙවි කිරීම සඳහා වෙබ් අඩවියක් ආරම්භ කිරීම වෙනුවෙන් 2021 හා 2022 වර්ෂවල දී රු. මිලියන 12.50ක් වැයකර තිබූ අතර 2024 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ වෙබ් අඩවිය හරහා උපයා තිබූ සමස්ත ආදායම රු.30,225ක් පමණක් වී තිබුණි.

**කාවන්තිස්සපුර ගම්මානය නිෂ්කාර්යව පැවතීම**

2013 වර්ෂයේ සිට දීර්ඝකාලීන බදු පදනම මත කාවන්තිස්සපුර ගම්මානය ඉදිකිරීම සඳහා හෙක්ටයාර් 1.6187ක භූමියක් තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගෙන ඉන්දිය රජයේ මූල්‍ය ආධාර රු.මිලියන 18.43ක් හා සභාව විසින් රු.මිලියන 8.74ක් වැයකර ඉදිකිරීම් කර තිබුණි. එහෙත් 2024 වර්ෂය තුළදී ද අදාළ භූමිය හා ගොඩනැගිලි ඵලදායීව උපයෝජනය කර නොතිබූ අතර භූමිය සඳහා බදු කුලී වශයෙන් රු.මිලියන 36.76ක් හා 2024 වර්ෂය සඳහා ආරක්ෂක හා වෙනත් වියදම් වශයෙන් රු.මිලියන 1.40ක්ද සභාව විසින් වැය කර තිබුණි.

## ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය

**නව නිෂ්පාදන ආරම්භ නොකිරීම**

2023 පෙබරවාරි මාසයේ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී 2019 වර්ෂයේදී මිලදී ගත් වටිනාකම රු.මිලියන 11.69ක් වූ HTHPS Dyeing යන්ත්‍රය භාවිතයෙන් කෙසෙල් පට්ටා නූල් වානිජකරණය කිරීමට තීරණයක්ගෙන තිබුණද 2024 වර්ෂය අවසානය දක්වාම කෙසෙල් පට්ටා නූල් සැකසීම ආරම්භ කර නොතිබුණි.

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

**පනතට අනුකූල නොවන පරිදි අරමුදල් පැවැත්වීම**

පනතේ 20(1) වගන්තිය ප්‍රකාරව අධිකාරිය වෙත ලැබෙන සියලු මුදල් හා පරිත්‍යාග අධිකාරියේ අරමුදලට බැර කළ යුතු බවත්, තැගි මුදල් ගෙවීම එම අරමුදල භාවිත කරමින් සිදු කළ යුතු බවත් දක්වා තිබුණද ඉල්ලම් වෙන්දේසි කිරීමේදී ලැබෙන මුදල් සහ අධිකාරිය විසින් නියම කරන ලද දඩ මුදල් බැර කිරීම සඳහා ත්‍යාග අරමුදල නම් අරමුදලක්ද, මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ යෙදෙන තැනැත්තන්ගේ ජීවිත හා ශරීරාංග අනතුරුවලින් ආරක්ෂා වීමට ගත

යුතු ආරක්ෂක පියවර විධිමත් කිරීම සඳහා මැණික් ගැරීම් සුහසාධක අරමුදල නම් අරමුදලක් ද, ස්වර්ණාභරණ නිෂ්පාදකයින්ගේ තාක්ෂණික සංවර්ධනය උදෙසා ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල නම් අරමුදලක්ද වශයෙන් අරමුදල් 03ක් ස්ථාපිත කර තිබුණි. ප්‍රධාන අරමුදලට අතිරේකව අරමුදලක් පවත්වා ගෙන යයි නම් භාණ්ඩාගාර අනුමැතිය මත සිදු කළ යුතු නමුත් එවන් අනුමැතියකින් තොරව 2024 දෙසැම්බර් 31 දිනට ත්‍යාග අරමුදලේ රු.මිලියන 70.92ක ශේෂයක්ද, මැණික් ගැරීම් සුහසාධක අරමුදලේ රු.මිලියන 40.74ක ශේෂයක්ද, ස්වර්ණාභරණ සංවර්ධන අරමුදලේ රු.මිලියන 101.45ක ශේෂයක්ද, සහිතව පවත්වා ගෙන ගොස් තිබුණි.

**රඳවා ගැනීම් බදු ප්‍රේෂණය නොකිරීම**

2024 වර්ෂය සඳහා රැස්කරන ලද රු.මිලියන 513.5ක් හා 2024 වර්ෂයට පෙර රැස් කරගත් රු.මිලියන 491.42ක එකතු කළ රඳවා ගැනීම් බදු දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

**අනාර්ථික වියදම් දැරීම**

අධිකාරිය විසින් රු.මිලියන 19ක පිරිවැයකට ආයතනයේ භාවිතය සඳහා මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමට 2016 වර්ෂයේ මෘදුකාංග සැපයුම් ආයතනයක් සමඟ මාස 11ක කාලයක් සඳහා ගිවිසුම්ගත වී තිබූ අතර 2024 වර්ෂය වන විට රු.මිලියන 10.92ක් ගෙවා තිබුණි. ප්‍රසම්පාදන කටයුතු සිදු කර වසර 08ක් ගතව තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විටත් මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීම සාර්ථකව අවසන් කර නොතිබුණි.

**මැණික් කුළුණ ගොඩනැගිල්ල බදු දීම**

අධිකාරිය විසින් ජාත්‍යන්තර මැණික් වෙළඳ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා ඉදිකරන ලද මැණික් කුළුණ ගොඩනැගිල්ලෙහි අවුරුදු 30කට බදු පදනම මත ලබා දීමට යෝජිත කඩ සාප්පු 27න් කඩ සාප්පු 13ක් හා ආපනශාලාව වසරකට වැඩි කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි. තවද බදු පදනම මත ලබා දී තිබූ කඩ කාමර 05කට අදාළව 2024 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු. මිලියන 2.18ක කුලී මුදලක් හිඟව පැවතුණි.

**ආරක්ෂිත ඇප තැන්පතු අයකර නොගැනීම**

මැණික් හා ස්වර්ණාභරණ ව්‍යාපාරිකයන්ට කඩ කාමර ලබා දීම සඳහා අධිකාරිය සහ ලෝක වෙළඳ මධ්‍යස්ථාන සමාගම අතර ඇති

කර ගෙන තිබූ බදු කුලී ගිවිසුම 2021 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් කර තිබුණද, අධිකාරිය විසින් 2004 - 2018 කාලය තුළ සමාගමට වරින් වර ගෙවා තිබූ රු.මිලියන 4.31ක් වූ ආරක්ෂිත ඇප තැන්පතු නැවත අයකර ගෙන නොතිබුණි.

**යන්ත්‍ර ඌන උපයෝජිතව/ නිෂ්කාර්යව පැවතීම**

මැණික් ගල් තාපකරණයට ලක් කර තිබේද නැත්ද යන්න හඳුනා ගැනීම සඳහා එකතුව රු.මිලියන 16.38ක් පිරිවැය වූ FTIR යන්ත්‍ර දෙකක් රත්නපුර කාර්යාලය හා ප්‍රධාන කාර්යාලය සඳහා 2013 හා 2020 වර්ෂවල මිලටගෙන තිබුණු අතර, යන්ත්‍ර මිලදී ගත් දින සිට 2025 මාර්තු මාසය දක්වා එම යන්ත්‍ර මගින් සහතික පත් 07ක් පමණක් නිකුත් කර තිබුණි. 2020 වර්ෂයේ මිලදී ගත් යන්ත්‍රයේ මිලදී ගැනීම් ගිවිසුම අනුව නිෂ්පාදිත ආයතනය විසින් නිලධාරීන් දෙදෙනෙකු සඳහා ලබා දීමට එකඟ වී ඇති විදේශ පුහුණුව වසර 05 ක් ගත වී ඇතත් 2024 දෙසැම්බර් 31 දින දක්වා ලබාගෙන නොතිබුණු අතර, මෙම යන්ත්‍ර සඳහා සේවා ගිවිසුම්වලටද එළඹ නොතිබුණි. වර්තමානය වනවිට පුහුණු ශ්‍රමිකයන් හා දත්ත ගොනු නොමැති වීම නිසා යන්ත්‍ර උපරිම කාර්යක්ෂමතාවයෙන් ක්‍රියාත්මක කළ නොහැකිව තිබුණි.

අධිකාරිය සතුව පවතින වටිනා ලෝහ විශ්ලේෂණය කිරීම සහ මුද්‍රා තැබීම සඳහා යොදා ගනු ලබන Lesser Marking යන්ත්‍ර 06ම 2024 මාර්තු 15 දින වන විට අක්‍රිය වී තිබීම මත එදින සිට Manual Hallmarking පමණක් සිදු වන අතර විගණිත දිනය වූ 2025 මැයි 28 දින දක්වාම එම යන්ත්‍ර අලුත්වැඩියා කර නොතිබුණි. පිරිවැය රු.මිලියන 52.54ක් වූ ඵලදායි ජීවකාලය අවසන් වී නොමැති මෙම යන්ත්‍ර 06 අලුත්වැඩියාවන් හා සේවා කිරීම් සම්බන්ධයෙන් ගිවිසුම් ගතවීද නොතිබුණු අතර මේ හේතුවෙන් යන්ත්‍ර භාවිතයෙන් තොරව අක්‍රියව තැබීමට සිදු වී තිබුණි. තවද 2020 වර්ෂයේ මිලදී ගත් Lesser Marking යන්ත්‍ර දෙක මිලදී ගැනීමේ ගිවිසුම අනුව නිලධාරීන් දෙදෙනකු වෙත නිෂ්පාදන සමාගම විසින් ලබා දීමට එකඟ වී ඇති විදේශීය පුහුණුව වසර 04ක් ගත වී ඇතත් අධිකාරියේ නිලධාරීන් සඳහා ලබා ගැනීමට කටයුතු නොකර අදාළ යන්ත්‍රය මිලදී ගැනීමේ බිල්පත තුළ ඇතුළත් රු.මිලියන 0.90ක නිලධාරීන් පුහුණු කිරීමේ පිරිවැය 2025 පෙබරවාරි 27 දින නැවත අයකර ගෙන තිබුණි.

## අපනයන සංවර්ධන මණ්ඩලය

**හිමිකම් නොලබන ගෙවීම්**

ප්‍රවාහන දීමනාව සඳහා සුදුසුකම් නොලබන PL, MA සහ JM වැටුප් කාණ්ඩ යටතේ මණ්ඩලයේ සේවය කරන සේවකයින් 166 දෙනෙකුට 2024 වර්ෂයේදී එකතුව රු.මිලියන 15.54ක් වූ ප්‍රවාහන දීමනා මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

## ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

**වාර්ෂිකව වත්කම් සත්‍යාපනය නොකිරීම හා අක්‍රිය, නිෂ්කාර්ය වත්කම් පැවතීම**

2016 අප්‍රේල් 11 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ 2017 වර්ෂයේදී මාකඳුර කර්මාන්ත පුරයේ පෙරවැඩුම් තාක්ෂණ හුවමාරු මධ්‍යස්ථානයක් (Incubator and Technology Transfer Center) ලෙස කොටස් අයිතියෙන් සියයට 60 ක් අධිකාරියට හිමි වන අයුරින් සීමාසහිත සමාගමක් ආරම්භ කර තිබුණි. සමාගමේ වත්කම් ලේඛනය අනුව රු.මිලියන 21.19ක් වටිනා යන්ත්‍ර 30ක් සමාගම සතුව පැවතියද, වාර්ෂික වත්කම් සත්‍යාපනයක් සිදුකර නොතිබූ අතර 2024 දෙසැම්බර් 31 වන විට ඉන් යන්ත්‍ර 9ක් වර්ෂ 2කට අධික කාලයක සිට අක්‍රියවද යන්ත්‍ර 04ක් නිෂ්කාර්යවද පැවතුණි.

## විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

**1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනතට අනුකූල නොවීම**

1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත 2(ඇ) වගන්තිය ප්‍රකාරව SLS ලාංඡනය භාවිතය සඳහා බලපත්‍ර නිකුත් කළ විට නිරතුරුවම, නිෂ්පාදිත අදාළ ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල වීම තහවුරු කිරීම වෙනුවෙන් තත්ත්ව පද්ධතිය සතුටුදායක ලෙස ක්‍රියාත්මක කිරීම සහ බලපත්‍ර කොන්දේසිවලට අනුකූල වීම සත්‍යාපනය කිරීම සඳහා විවෘත වෙළඳපොලෙන් නිෂ්පාදිතයේ නියැදි ලබා ගෙන පරීක්ෂාවන් සිදුකළ යුතුය. 2024 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ 924ක් සඳහා ප්‍රමිති සහතික ලාංඡනය (SLS) ලබා දී තිබුණද 2024 වර්ෂයේදී වෙළඳපොල සමීක්ෂණ සිදුකර තිබුණේ භාණ්ඩ වර්ග 183ක් එනම් සියයට 20ක් සඳහා පමණක් බව නිරීක්ෂණය විය.

**ඒකාබද්ධ අරමුදලට ලාභාංශ/ අයබදු ගෙවා නොමැති වීම**

2024 දෙසැම්බර් 23 දිනැති අංක PED/03/2024 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව 2023 මූල්‍ය වර්ෂය තුළ ලාභ උපයා ඇති නමුත්, ලාභයෙන් අවම වශයෙන් සියයට 30ක් ඒකාබද්ධ අරමුදලට ලාභාංශ/ අයබදු ලෙස ගෙවා නොතිබුණු බව නිරීක්ෂණය විය. එබඳු ආයතන ලාභදායිත්වය මත පදනම්ව කාර්ය මණ්ඩලය වෙත ප්‍රසාද දීමනා ගෙවීම සඳහා හිමිකම් නොලැබුවද ආයතනය විසින් 2023 වර්ෂයේදී ප්‍රසාද දීමනා ලෙස සේවකයන්ට රු.මිලියන 799ක් ගෙවා තිබුණි.

## නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

**නිෂ්කාර්යව පවතින උපකරණ**

2016 - 2018 වර්ෂවල මිලදී ගත් රු.මිලියන 29.3ක් වූ උපකරණ 08 ක් වසර 05කට අධික කාලයක සිට පුස්තකාලය හා සන්නිවේදන අංශයේ හා කර්මාන්ත සේවා අංශයේ නිෂ්කාර්යව පැවතුණි.

**නිම නොකල ව්‍යාපෘති**

**Tea quality colour separating System**

**ව්‍යාපෘතිය ආරම්භ කර නිසි පරිදි නිම නොකිරීම**

2012 වර්ෂයේදී ආරම්භ කරන ලද Tea Quality Grading & Colour Separating System ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂය වන විට එකතුව රු.මිලියන 13.17ක් වියදම් කර තිබුණු අතර 2023 ජනවාරි නිමකළ යුතු ව්‍යාපෘතිය 2025 අප්‍රේල් මාසය වන විටත් නිමකර නොතිබුණි. 2022 ජනවාරි 01 දින ආරම්භ කර තිබූ එහි තාක්ෂණික පැවරීමේ ව්‍යාපෘතියෙන් අපේක්ෂිත එක් අරමුණක් වූ පුද්ගලික සමාගමක් මගින් ආතර් සී.ක්ලාක් මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩලය වෙත EPGA තාක්ෂණය පැවරීම සම්පූර්ණ කර නොතිබුණි.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙනුවෙන් පුරාවිද්‍යා ගවේෂණ හා කැණීම් කටයුතු සඳහා ඡායාරූප ලබා ගැනීමේ අරමුණින් 2016 වර්ෂයේදී රු.මිලියන 10.56ක් වූ නියමුවන් රහිත ගුවන් යානයක් මිලදී ගෙන එය ක්‍රියාත්මක කිරීමට රු.110,320ක් වැයකර අවශ්‍ය පුහුණුව හා පියාසර කිරීමට අවශ්‍ය අවසරය ලබා ගෙන තිබුණද මිලදී ගත් දින සිට විගණිත දිනය වන 2025 අප්‍රේල් 22 වන විටත් අදාළ කාර්යය සඳහා යොදා ගෙන නොතිබුණි.

**ආයතනික අරමුණු ඉටුකර ගැනීමට පවතින මුදල් ආයෝජනවල යෙදවීම**

ආයතනයේ මූලික අරමුණ දේශීය පදනමක් සහිත නවීන තාක්ෂණ හැකියාවන් දියුණු කිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධනය තුළින් නවෝත්පාදන මධ්‍යස්ථානයක් බවට පත්වීම වුවත් එම අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි ප්‍රමුඛතාවය මත කටයුතු නොකර, 2024 වර්ෂය අවසානය වන විට රු.මිලියන 139.70ක් භාණ්ඩාගාර බිල්පත්වල හා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

## ජාතික පර්යේෂණ සභාව

**ව්‍යාපෘති පර්යේෂණවල කාර්යසාධනය**

පර්යේෂණ ව්‍යාපෘති නිමකර මාස 03ක් ඇතුළත අවසන් වාර්තාව භාරදිය යුතු බවට ව්‍යාපෘති මාර්ගෝපදේශවල නියම කර තිබුණද ව්‍යාපෘතිය නිමකර මාස 03ත් වර්ෂ 4ත් අතර කාල පරාසයක් ප්‍රමාද වී තිබුණද 2025 අප්‍රේල් 30 වන විටත් නිමකල ව්‍යාපෘති 25ක් සම්බන්ධයෙන් අවසන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

2015 - 2019 අතර වර්ෂවල ආරම්භ කළ 2016 - 2022 වර්ෂවල නිමකළ යුතු භාණ්ඩාගාර ප්‍රදාන එකතු වටිනාකම රු.මිලියන 24.55කින් යුතු පර්යේෂණ ව්‍යාපෘති 07කින් ව්‍යාපෘති 03ක් වසර 04ත් 07ත් අතර කාලයක් ගත වී තිබුණද 2025 අප්‍රේල් මස වන විටත් නිම කර නොතිබුණි.

පර්යේෂණ ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හැකියාව හඳුනා නොගැනීම හේතුවෙන් වර්ෂ 2017 - 2024 අතර නිම කිරීමට නියමිතව පැවති එකතුව රු.මිලියන 89.83ක භාණ්ඩාගාර ප්‍රදාන ලබා ගෙන තිබූ පර්යේෂණ 12ක් ක්‍රියාත්මක නොකර අත්හිටුවා තිබූ අතර එම මුදල්ද නිෂ්කාර්යව ජංගම ගිණුම්වල පැවතුණි.

# ධීවර කටයුතු

ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපයට අයත් වර්ග කිලෝ මීටර් 517,000ක මුහුදු ප්‍රදේශය, වර්ග කිලෝ මීටර් 21,500ක දේශීය ජල තීරයකින්ද, වර්ග කිලෝ මීටර් 4,180ක කලපු, ගං මෝයවල් හා අභ්‍යන්තර ජලාශ මනා ලෙස වගකීම් සහිතව භාවිතා කරමින් ජාතික ආර්ථිකයට ඉහළ දායකත්වයක් සපයන තිරසාර ධීවර කර්මාන්තයක් බිහිකිරීම තුළින් ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 36.85ක් ලෙස මහජනතාවගේ පෝෂණ මට්ටම පවත්වා ගැනීම, අපනයන වෙළඳපල ඉලක්ක කර ගත් විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය, ධීවර කර්මාන්තය ආශ්‍රිතව ව්‍යාවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායන් දිරිමත් කිරීම හා ධීවර ප්‍රජාවගේ සුභසාධන කටයුතු පුළුල් කිරීම හා එලදායී බැංකු හා රක්ෂණ ක්‍රම හඳුන්වා දීම අපේක්ෂිත අරමුණු වී තිබුණි. එම අරමුණු ඉටුකර ගැනීම සඳහා ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ එක් දෙපාර්තමේන්තුවක් හා ව්‍යවස්ථාපිත ආයතන 5ක් හා එක් කළමනාකරණ භාරයක් 2024 වර්ෂයේදී ක්‍රියාත්මකව පැවතුණි.

2024 වර්ෂයේදී ධීවර අමාත්‍යාංශය සහ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත එකතුව රු.මිලියන 11,019ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, වර්ෂය අවසන් වන විට එයින් රු.මිලියන 8,877ක් පමණක් උපයෝජනය කර තිබුණි.

**වගු අංකය 2.37 - 2024 වර්ෂයේදී ප්‍රතිපාදන වෙන්කිරීම හා උපයෝජනය කිරීම**

| | ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන | වියදම රු.මිලියන | ඉතිරිය රු.මිලියන |
|---|---|---|---|
| ධීවර අමාත්‍යාංශය | 9,255 | 7,945 | 1,310 |
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 1,764 | 932 | 832 |
| එකතුව | 11,019 | 8,877 | 2,142 |

**මූලාශ්‍රය - 2024 මූල්‍ය ප්‍රකාශන**

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ව්‍යවස්ථාපිත ආයතන හා කළමනාකරණ භාරය විසින් ඉහත සඳහන් කාර්යභාරයන් ඉටුකිරීම සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

**ගන්දර ධීවර වරාය ඉදිකිරීම**

2023 දෙසැම්බර් 06 දින ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණු ගන්දර ධීවර වරාය ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් කාලය 2024 දෙසැම්බර් 23 දක්වා දින දීර්ඝ කරගෙන තිබුණි. එදින වනවිට ඉදිරිපත් කර තිබූ අන්තර් ගෙවීම් සහතික 38ක් සඳහා අමාත්‍යාංශය විසින් මුදල් ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් අදාළ කොන්ත්‍රාත් සමාගම වෙත 2024 දෙසැම්බර් 31 දින වනවිට රු.මිලියන 206.83ක ප්‍රමාද පොලී ගෙවීම් කර තිබුණි.

**ඉස්සන් වගා කිරීමේ ව්‍යාපෘතිය**

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය විසින් 2023 හා 2024 වර්ෂවලදී කලපු තුළ ඉස්සන් පසු කීටයන් තැන්පත් කිරීමේ ව්‍යාපෘතිය මඟින් පසු කීටයන් 15,000,000 නිෂ්පාදනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණු නමුත් ප්‍රගති වාර්තා අනුව පසු කීටයන් 3,444,000 පමණක් තැන්පත් කර තිබුණි. මව් සතුන් රෝගකාරක වීම හේතුවෙන් උක්ත ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි. නමුත් 2023 හා 2024 වර්ෂ තුළ ව්‍යාපෘතිය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් රු.මිලියන 20.32ක් වැයකර තිබුණි.

## ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

**පණිවිඩ හුවමාරු උපකරණ**

ධීවර කටයුතුවල නිරතවීමේදී දෙපාර්තමේන්තුව හා ධීවර යාත්‍රා අතර පණිවිඩ හුවමාරු කිරීම සඳහා පවතින ගුවන් විදුලි යන්ත්‍රවලින් සෝදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන 06ක භාවිතා කරන ගුවන් විදුලි යන්ත්‍ර වසර 20කට වඩා පැරණි යන්ත්‍ර වන අතර, එම යන්ත්‍රවල ක්‍රියාකාරිත්වය සියයට 50ක මට්ටමේ පැවතුණි. තවද, කොළඹ, මිරිස්ස, නිල්වැල්ල, කිරින්ද යන සෝදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන 04හි ගුවන් විදුලි යන්ත්‍ර 2024 දෙසැම්බර් 31 දින වන විට අක්‍රියව පැවතුණි. මෙම පැරණි ගුවන් විදුලි යන්ත්‍ර නිෂ්පාදනය කර තිබූ ආයතන විසින් එම මොඩලයේ ගුවන් විදුලි යන්ත්‍ර නිෂ්පාදනය නවත්වා ඇති බැවින් එම යන්ත්‍ර අලුත්වැඩියා කටයුතු සිදු කිරීමටද අපහසු වී තිබුණි.

**නව සන්නිවේදන උපකරණ මිලදී ගැනීම**

දෙපාර්තමේන්තුව වෙත 250W ධාරිතාවෙන් යුත් ගුවන්විදුලි සන්නිවේදන උපකරණ 05ක් නැවත මිලදී ගැනීම සඳහා 2024 පෙබරවාරි මාසයේදී ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර කැඳවීම් කර මෙම ගුවන් විදුලි

සන්නිවේදන උපකරණ 05 මිලදී ගැනීම සඳහා ජපන් සමාගමක් තෝරා ගෙන තිබුණද එහි දේශීය නියෝජිත ඉහත 2019 වර්ෂයේ ගුවන් විදුලි උපකරණ මිලදී ගත් ආයතනය වීම හේතුවෙන් කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර නොතිබුණි. එමෙන්ම ඒ පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගැනීම සඳහා යොමු වී තිබුණද මෙම ගැටලුව නිරාකරණය කර නොගැනීම හේතුවෙන් 2025 මැයි 20 දින වන විටත් උපකරණ මිලදී ගෙන නොතිබුණි.

## ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

**නිෂ්කාර්ය මත්ස්‍ය අභිජනනාගාර**

මත්ස්‍ය නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේ මූලික අරමුණින් එකතුව රු.මිලියන 894.77ක් වැය කරමින් මත්ස්‍ය අභිජනනාගාර 5ක් ඉදිකරනු ලැබුවද, 2020 සිට 2024 වර්ෂය දක්වා එම අභිජනනාගාර 5න් මත්ස්‍ය අභිජනනාගාර 03ක් ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි.

**නිෂ්කාර්ය ඉඩම්**

අධිකාරිය විසින් ජලජීවී වගා ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් හෙක්ටයාර් 142.69ක් වූ රජයේ ඉඩම් 05ක්, රජයේ ඉඩම් භාර දීම මත ලබාගෙන තිබුණද, එම ඉඩම් ජලජීවී වගා ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් උපයෝගී කර ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. එසේම අධිකාරියට හිමිකාරිත්වය නොමැති හෙක්ටයාර් 1,361.76ක ඉඩම් 04ක් සහ වපසරිය හඳුනා ගත නොහැකි ඉඩමක් සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රු.මිලියන 107.6ක මුදලක් වැයකර තිබුණද 2024 දෙසැම්බර් 31 දක්වා එම ඉඩම්වල කිසිදු ව්‍යාපෘතියක් ආරම්භ කර නොතිබුණි.

**හිඟ බදු අය නොකිරීම**

මඩකලපුව පුදුකුඩිරිප්පුහි පිහිටි ඉස්සන් අභිජනනාගාරය 2021 වර්ෂයේ දෙසැම්බර් 02 දින සිට වසර 05ක කාලසීමාවක් සඳහා පුද්ගලික සමාගමක් වෙත බදු දී තිබූ අතර බදු කාලසීමාව අවසන් වීමට පෙර එනම් 2024 ජූලි 01 දින මෙම ගිවිසුම අවසන් කර තිබුණි. ගිවිසුමේ 21 වන කොන්දේසිය අනුව ගිවිසුම්ගත කාලපරිච්ඡේදයට පෙර බදු ගිවිසුම අවසන් වුවහොත් අධිකාරියට සිදුවන අලාභය පියවා ගැනීම සඳහා වාර්ෂික බදු මුදලින් සියයට 50කට සමාන එනම් රු.මිලියන 3ක කාර්යසාධන බැඳුම්කරයක් ලබා ගත යුතු වුවද එවැනි කාර්යයසාධන බැඳුම්කරයක් ලබා ගෙන නොතිබුණි. අදාළ සමාගම

විසින් අධිකාරියේ නිලධාරීන් වෙත අභිජනනාගාරය සහ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ආපසු භාර දී තිබුණ ද අධිකාරියට අයවිය යුතු රු.මිලියන 5.88ක් වූ හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**කොන්ත්‍රාත් පාඩු**

වැලිකන්ද හා සෙවනපිටිය මත්ස්‍ය අභිජනනාගාර ඉදිකිරීම් කොන්ත්‍රාත් අසාර්ථක වීම මත කොන්ත්‍රාත් කාලය සඳහා දීර්ඝ කාල දිගුවක් ලබා දී පසුව එම කොන්ත්‍රාත් ඇවර කිරීම මත සමථකරණය වෙත යොමු වී තිබුණි. එහිදී සමාගමට ගෙවීමට තීරණය වූ මුදල ගෙවීමට අධිකාරිය එකඟ නොවීම නිසා බේරුම්කරණය වෙත යොමු වී තිබුණි. අධිකාරිය බේරුම්කරණය වෙත සාධාරණ කරුණු දැක්වීම මගින් වාසිසහගත තීරණ ලබා ගැනීමට අපොහොසත් වීම මත අයකර ගත් ප්‍රමාද ගාස්තු එයට අදාළ පොලිය සහ කොන්ත්‍රාත්කරුට ආදායම් අහිමි වීමට අදාළව රු.මිලියන 55.39ක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට සිදු වී තිබුණි. තවද රු.මිලියන 14.36ක් වූ කාර්යයසාධන බැඳුම්කරයද නියමිත කාලය තුළ මුදල් කර නොගැනීම නිසා එකතුව රු. මිලියන 69.75ක් අධිකාරියට අහිමි වී තිබුණි.

## ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය

**නිෂ්කාර්ය ඉඩම්**

කල්පිටිය කුඩාව ප්‍රදේශයේ බහු විශේෂ මත්ස්‍ය අභිජනනාගාර සංකීර්ණයක් ඉදිකිරීම සඳහා අක්කර 03ක ඉඩමක් 2022 පෙබරවාරි 16 දින සිට අවුරුදු 30ක කාලයකට බදු ගෙන බදු ගැනීමට පෙර එනම් 2020 වර්ෂයේදී එම ඉඩමේ සංවර්ධන කටයුතු සඳහා රු.මිලියන 1.63ක් වැයකර තිබුණු නමුත් මෙම ඉඩම අදාළ අරමුණු සඳහා යොදා නොගෙන ඌන උපයෝජිතව පැවතුණි.

**අභිජනනාගාර ඉදිකිරීම නවතා දැමීම**

2020 වර්ෂයේ ආරම්භ කළ කල්පිටිය අභිජනනාගාර සංකීර්ණයක් ඉදිකිරීම සහ 2019 වර්ෂයේ ආරම්භ කළ බහු විශේෂ අභිජනනාගාරයක් ඉදිකිරීමේ ව්‍යාපෘති 2024 දෙසැම්බර් 31 වන විට නවතා දමා තිබූ හෙයින් ඒ සඳහා වැය කළ එකතුව රු.මිලියන 1.82ක් වූ වියදම් නිෂ්කාර්ය වී තිබුණි.

## ලංකා ධීවර සංස්ථාව

**පාරිතෝෂිත දඩ මුදල් ගෙවීම**

1983 අංක 12 දරන පාරිතෝෂිත මුදල් ගෙවීම් පනත අනුව පාරිතෝෂිත අරමුදල් සඳහා හිමිකම් ලබන යම් සේවකයකු ඉවත්වීමේදී දින 30ක් ඇතුළත එකී හිමිකම් ලබන පාරිතෝෂිත මුදල්

ගෙවිය යුතු වුවද එම පාරිතෝෂිත මුදල් නියමිත දිනවලදී ගෙවීම් නොකිරීම නිසා විගණිත දිනය වන 2024 සැප්තැම්බර් 30 දින වන විට ගෙවිය යුතු මුළු පාරිතෝෂිත දඩ මුදල රු.මිලියන 5.78ක් වී තිබුණි.

**මත්ස්‍ය පිරිසැකසුම් ඒකකයක් ඉදිකිරීම**

2017 පෙබරවාරි 27 දින අමාත්‍යාංශය විසින් සංස්ථාව වෙත රු.මිලියන 65ක මුදලක් මත්ස්‍ය පිරිසැකසුම් ඒකකයක් ඉදිකිරීම සඳහා ලබා දී තිබූ අතර 2018 දෙසැම්බර් 31 දින වන විට එයින් රු.මිලියන 28.02ක් වැයකර තිබූ අතර ඉතිරි රු.මිලියන 36.98ක් 2017 හා 2018 වර්ෂවලදී සාමාන්‍ය වියදම් වෙනුවෙන් වැයකර තිබුණි. තවද එම ඒකකයේ ඉදිකිරීම් 2024 ඔක්තෝබර් 04 වන විටත් අවසන් කර නොතිබුණි.

**ටින් මාළු කර්මාන්තශාලා ව්‍යාපෘතිය**

ටින්මාලු කර්මාන්තශාලාවක් ඇරඹීමේ පරමාර්ථයෙන් රුසියානු සමාගමක් සමඟ 2003 වසරේ ඇතිකර ගත් බද්ධ ව්‍යාපාරය සඳහා සංස්ථා දායකත්වය ලෙස ඉඩම් අක්කර 01 ½ කින් යුත් ඉඩමක් විකුණුම්කර ඔප්පුවකින් පවරා තිබුණි. මෙය රු.මිලියන 110ක ආයෝජන දේපළක් ලෙස සලකා තිබුණ ද මේ දක්වා ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණු අතර කිසිදු ආදායමක් සංස්ථාව වෙත ලැබී නොතිබුණි. තවද සංස්ථාව විසින් සමාගම වෙත පැවරූ එම ඉඩම නීත්‍යානුකූලව නැවත ලබා ගැනීම සඳහා කොළඹ දිසා අධිකරණයේ අංක DLM 15/2018 දරන නඩුව පවරා තිබුණි.

## ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

**පැරැලිය නැංගුරම්පොළෙහි මෙහෙයුම් කටයුතු**

පැරැලිය නැංගුරම්පොළෙහි මෙහෙයුම් කටයුතුවලින් 2022 වර්ෂයේදී රු.මිලියන 14.37ක ආදායමක් උපයා තිබුණද 2023 හා 2024 වර්ෂවලදී කිසිදු මෙහෙයුම් කටයුත්තක් සිදු කර නොමැති බැවින් ආදායමක් ලැබී නොතිබුණි. එසේ වුවද නැංගුරම්පොළෙහි මෙහෙයුම් කටයුතු වෙනුවෙන් 2023 හා 2024 වර්ෂවලදී පිළිවෙලින් රු.මිලියන 5.06ක් හා රු.මිලියන 0.33ක් වැයකර තිබුණි.

**හිඟ බදු කුලී ආදායම්**

2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු බදු කුලී ආදායම රු.මිලියන 186.65ක් අතරින් රු.මිලියන 127.17ක ශේෂයක් අවුරුදු 5කට වඩා

පැරණි ණයගැති ශේෂ වූ බැවින් ඒවා අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

## පෑළියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපළ සංකීර්ණ කළමනාකරණ භාරය

**මධ්‍යම මත්ස්‍ය වෙළඳපළ සංකීර්ණ කළමනාකරණ භාරය** පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණ කළමනාකරණ භාරය ආරම්භ කර 2024 වර්ෂය අවසානය වනවිට වසර 12ක් ගත වී තිබුණද කළමනාකරණ භාරය පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට කටයුතු කර නොතිබුණි. තවද මත්ස්‍ය වෙළඳපල සංකීර්ණය තුළ මසුන් හැසිරවීම සෞඛ්‍යානුකූලව සිදුකිරීමට වෙළඳාම් කරනු ලබන මත්ස්‍ය ආහාර සෞඛ්‍ය හා ගුණාත්මකභාවය නියමිත ප්‍රමිතියක පවත්වා ගෙන යන බවට සහතික කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශයන්ද හඳුන්වා දී නොතිබුණි.

**අහිමි වූ බදු කුලී ආදායම්** කළමනාකරණ භාරය විසින් තොග වෙළඳසැල් සඳහා වන බදු ගිවිසුම් ප්‍රකාරව මාසික බදු මුදල සෑම වසර 5කට වරක්ම තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව මත පදනම්ව සංශෝධනය කළ යුතු වුවද 2024 ජනවාරි 01 දින සිට සංශෝධනය කළ යුතු බදු මුදල් සංශෝධනය කර තිබුණේ 2024 ජුනි 01 දින සිට විය. ඒ හේතුවෙන් එක් කඩ කාමරයකට රු.15,000 බැගින් කඩ කාමර 154කට මාස 5ක් සඳහා රු.මිලියන 11.55 බදු කුලී ආදායමක් අහිමි වී තිබුණි.

# පරිසර

පරිසර

## පරිසර අමාත්‍යාංශ

තිරසර සංවර්ධිත ශ්‍රී ලංකාවක් යන දැක්ම හා තිරසර ස්වභාවික සම්පත් කළමනාකරණය තුළින් පරිසර ආරක්ෂණය තහවුරු කරමින් තිරසර පරිසර කළමනාකරණය සඳහා නායකත්වය ලබාදීම පරිසර අමාත්‍යාංශයේ මෙහෙවර වේ. එම මෙහෙවර ඉටු කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය හා ඒ යටතේ දෙපාර්තමේන්තු 05ක් ව්‍යවස්ථාපිත මණ්ඩල/රාජ්‍ය ආයතන 03 ක්, ස්වයං මූල්‍යයන ආයතන 04ක් රාජ්‍ය අරමුදල් 04ක් යන ආයතන විසින් අමාත්‍යාංශයට නියමිත කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකළ යුතුව තිබුණි.

2024 වර්ෂයේදී ඉහත සඳහන් කාර්යභාරය ඉටුකිරීම සඳහා පරිසර අමාත්‍යාංශය වෙත රු.මිලියන 2,281ක ශුද්ධ ප්‍රතිපාදන පාර්ලිමේන්තුව මඟින් ලබා දී තිබුන අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එයින් රු.මිලියන 1,998ක් පමණක් උපයෝජනය කර තිබුණි. මේ අනුව වර්ෂය අවසානයට ඉතිරිය රු.මිලියන 283ක් විය.

**රූපසටහන 2.38 – 2024 වාර්ෂික ප්‍රතිපාදන උපයෝජනය හා ඉතිරිය**




**මූලාශ්‍රය - වාර්ෂික මූල්‍ය ප්‍රකාශන**

ඉහත සඳහන් කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් නියැදි විගණනයේදී අනාවරණය වූ වැදගත් හා ප්‍රමාණාත්මක විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

වගු අංකය 2.38 - අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම.

| | වැය විෂය | විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය (රු.මි.) | සත්‍ය වියදම (රු.) | මූල්‍ය ප්‍රගතිය(%) |
|---|---|---|---|---|---|
| i. | 160-02-03-148-2507(13) | කෘෂි කර්මාන්ත වනාන්තර හා වෙනත් ඉඩම් පරිහරණ ක්ෂේත්‍ර සඳහා ඉහළ විනිවිදභාවයකින් යුත් රාමුවක් සකස් කිරීම | 137 | 32 | 24 |
| ii. | 160-02-03-151-2507(13) | පළමු හා දෙවන ද්විපාර්ශික විනිවිදභාවය පිළිබඳ වාර්තා සහ හතරවන ජාතික සන්නිවේදන වාර්තාව සකස් කිරීමේ ව්‍යාපෘතිය | 13 | 3 | 20 |

මූලාශ්‍රය - පරිසර අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන

අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යාපෘති 02 ක 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය සියයට 50කට වඩා අඩු මට්ටමක පැවතුණි.

## දේශගුණ විපර්යාස අවම කිරීමේ ක්‍රියාකාරී සහයෝගීතා ව්‍යාපෘතිය

**ජාතික දේශගුණ විපර්යාස සඳහා වූ දත්ත හුවමාරු ජාලකරණ පද්ධතිය**

දේශගුණ විපර්යාස අවම කිරීමේ ක්‍රියාකාරී සහයෝගීතා ව්‍යාපෘතිය මඟින් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීමට යෝජනා වූ ජාතික දේශගුණ විපර්යාස සඳහා වූ දත්ත හුවමාරු ජාලකරණ පද්ධතිය (National Climate Change Data Sharing Network) ස්ථාපිත කිරීම සඳහා සහ උපකරණ මිලදී ගැනීම සඳහා රු.මිලියන 46.37ක් වැයකර තිබුණද, 2025 මාර්තු 31 දිනවන විටත් මෙම පද්ධතිය අපේක්ෂිත අරමුණු ඉටුකර ගත හැකි පරිදි ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති බව නිරීක්ෂණය විය. මේ පිළිබඳව පසුගිය විගණන වාර්තා මඟින් ද පෙන්වා දී තිබූ අතරම 2021 නොවැම්බර් 19 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොපවතින බව සඳහන් කර තිබුණු අතර අදාල අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ඇතිකර ගනිමින් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයක් පැවතිය යුතු බව හා මෙම පද්ධතිය දිගින් දිගටම පසුවිපරම් කිරීමේ අවශ්‍යතාවයද අවධාරණය කර තිබුණි.

**වත්කම් කළමනාකරණය**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් ලබා ගත් තොරතුරු අනුව පරිසර අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර තිබුණු වාහන සංඛ්‍යාව 251ක් වූ අතර ඊට අමතරව අමාත්‍යාංශය විසින් භාවිතා

කරනු ලබන වාහන 06ක් සඳහා අමාත්‍යාංශය නමින් පවතින ලියාපදිංචි කිරීමේ සහතික විගණනය වෙත ඉදිරිපත් කරන ලදී. එම සියළු දත්ත අනුව පරිසර අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වී ඇති මුළු වාහන සංඛ්‍යාව 257ක් වුවත් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති භෞතිකව පැවති වාහන සංඛ්‍යාව 55ක් විය. මෙම වාහන 55 තුල ඇතුලත් වාහන 03ක් වෙනත් ආයතන විසින් භාවිතා කරන බවද නිරීක්ෂණය විය. ඉතිරි වාහන 202 එවකට රේඛීය අමාත්‍යාංශය යටතේ පැවති අනෙකුත් ආයතන වෙත පැවරීම් කළ බවට හෝ අපහරණය කළ බවට හෝ අතුරුදහන් වූ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**කළමනාකරණ දුර්වලතා**

පරිසර අමාත්‍යාංශය පිහිටි සොබාදම් පියස කාර්යාලීය ගොඩනැඟිල්ල ඉදිකිරීම් කටයුතු අවසන් කර ආපසු භාරගත් දිනයේ සිට එම ගොඩනැඟිල්ලේ නඩත්තු සේවා කටයුතු එය ඉදිකරන ලද ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය වෙත භාර දී තිබුණි. 2019 දෙසැම්බර් 27 දින අමාත්‍යාංශ ලේකම් හා අදාළ ආයතනයේ අතිරේක සාමාන්‍යාධිකාරී අතර 2018 අගෝස්තු 21 දින සිට 2023 අගෝස්තු 20 දින දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් සොබාදම් පියස ගොඩනැඟිල්ලේ නඩත්තු කටයුතු සඳහා රු.මිලියන 43.16ක ඇස්තමේන්තු පිරිවැයකට ගිවිසුමකට එළඹ තිබුණු නමුත් එම කාර්යය සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

## ජල සම්පත් මණ්ඩලය

**භූගත ජල විමංසන පද්ධතියක් ස්ථාපිත කිරීම**

භූගත ජල විමංසන තොරතුරු ජාලයක් (Ground Water Monitoring Network) ස්ථාපිත කිරීම සඳහා වූ නියමු ව්‍යාපෘතිය, වකුගඩු රෝගය විශාල වශයෙන් ව්‍යාප්ත වී ඇති අනුරාධපුරය, පොළොන්නරුව, මොණරාගල සහ පුත්තලම ලෙස තෝරා ගත් දිස්ත්‍රික්ක 4 ක ක්‍රියාත්මක කිරීම සඳහා 2015 ජූලි 29 දිනැති අංක අමප/15/1087/644/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් නෙදර්ලන්තයේ ආයතනයක් සමඟ 2017 ඔක්තෝබර් 03 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර ව්‍යාපෘතියේ කටයුතු 2022 දෙසැම්බර් 31 දින අවසන් කර තිබුණි.

පරිසර

මෙම ව්‍යාපෘතියේ පිරිවැය වූ යුරෝ මිලියන 20.63 හෙවත් රු.මිලියන 5,521න් සියයට 85ක් එනම් නෙදර්ලන්තයේ බැංකුවකින් වාර්ෂිකව සියයට 1.45 බැගින් වූ සහන පොලී අනුපාතයක් මත වර්ෂ 10ක් තුළ සමාන වාරික 20කින් ආපසු ගෙවිය යුතු වූ අතර ඉතිරි සියයට 15 ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුව වෙතින්, වසර 3ක සහන කාලයකින් පසු 2025 දෙවන අර්ධ වර්ෂයේ සිට වසර 15කින් ගෙවීමට රජය විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය 2022 වර්ෂයේ නිම කර තිබුණද, එහි මූලික කාර්යයක් වූ දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සිදු කර නොතිබූ අතර මණ්ඩලයට අයත් වැඩබිම් කාර්යාලයේ එක් කොටසක දත්ත මධ්‍යස්ථානය පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය.

**ප්‍රධාන කාර්යාලීය ස්ථානය වෙනස් කිරීම**

ජල සම්පත් මණ්ඩලය 1978 වර්ෂයේ සිට පවත්වාගෙන ගොස් තිබූ කොළඹ 07 හෙක්ටර් කොබ්බැකඩුව මාවතේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ඉඩම සඳහා 2013 වර්ෂයේ සිට වාර්ෂිකව රු.මිලියන 12.77ක බදු මුදලක් ගෙවා බදු බලපත්‍රයක් ලබා ගන්නා ලෙස තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම්වරයා මණ්ඩලය වෙත දැනුම් දී තිබුණද, ඊට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් විසින් 2019 වර්ෂයේදී කොළඹ මහාධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි. පසුව ඉඩමේ භුක්තිය පිළිබඳව සමථයකට පත්වන ලෙස නීතිපතිවරයා විසින් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් ලබා දී තිබියදී නීතිපතිවරයාගේ උපදෙස් පරිදි කටයුතු නොකර අවුරුදු 45ක් පමණ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගිය පරිශ්‍රය එවකට අග්‍රාමාත්‍යවරයා භාවිතා කළ නිළ නිවස පුළුල් කිරීමේ කාර්යය සඳහා යොදා ගැනීමට භාරදී තිබුණි. ප්‍රධාන කාර්යාලය 2021 ජූලි 18 දින සිට 2022 ජූලි 15 දක්වා රාජගිරිය ප්‍රදේශයේ පෞද්ගලික කුලී ගොඩනැගිල්ලකද, 2022 අගෝස්තු 01 දින සිට නාවල කොස්වත්ත ප්‍රදේශයේ පෞද්ගලික ගොඩනැගිල්ලක ද පවත්වාගෙන ගොස් තිබුණි. ඒ සඳහා 2021 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා ගොඩනැගිලි කුලී ලෙස රු.මිලියන 42.51ක් ගෙවා තිබුණි.

**ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

මණ්ඩලයේ 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සහ 2024 දෙසැම්බර් 31 දින එහි ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක භූගත ජල අධ්‍යයන සහ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ජල සැපයුම් යෝජනා ක්‍රමයේ භූගත ජල කළමනාකරණය සහ සංවර්ධනය යන ක්‍රියාකාරකමෙහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් අපේක්ෂිත මට්ටමින් සියයට 68ක් හා සියයට 22ක් ලෙසද වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ විදේශ ප්‍රදාන මත ක්‍රියාත්මක IWWRMP ව්‍යාපෘතියේ භූගත ජල සම්පත් කළමනාකරණය ශක්තිමත් කිරීමේ ක්‍රියාකාරකමෙහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 34ක් හා 13ක් වශයෙන් පවතින බව නිරීක්ෂණය විය.

## ශ්‍රී ලංකාවේ ජාතික උද්‍යානවල තෘණ භූමි සංරක්ෂණ ක්‍රියාවලිය ඇගයීම සම්බන්ධයෙන් නිකුත්කරන ලද කාර්යසාධන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණ

**ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව**

ශ්‍රී ලංකාවේ ජාතික උද්‍යානවල තෘණ භූමි කළමනාකරණය සම්බන්ධයෙන් කළමනාකරණ සැලසුම් පාදක කරගත් ක්‍රියාවලියක් පමණක් පවතිනු ලබන අතර තෘණ භූමි කළමනාකරණය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් හා ඒ මත පදනම් වූ උපායමාර්ගික සැලසුම් ක්‍රියාත්මක වීමක් නිරීක්ෂණය නොවුණි. ආයතනික කාර්යභාරය, අරමුණු, ආයතන අතර සම්බන්ධතාවය, ක්‍රියාකාරකම් යනාදිය නිශ්චිතව හඳුනාගැනීමට හැකි වුවත්, ජාතික ප්‍රතිපත්තියක් නොමැති වීම නිසා එම කාර්යයන් අපේක්ෂිත පරිදි ඉටු වී නොතිබුණ බව නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකාවේ ජාතික උද්‍යානවල තෘණ භූමි කළමනාකරණය සම්බන්ධයෙන් විධිමත්, කාලීන සහ සමස්ථ ආවරණය වන නීති පද්ධතියක අවශ්‍යතාවය විගණනයේ දී අනාවරණය වුවද, ඒ සම්බන්ධයෙන් මේ වන තෙක් නිසි අවධානය යොමු වී නොතිබුණි.

ශ්‍රී ලංකාවේ ජාතික උද්‍යාන වල තෘණ භූමි කළමනාකරණය සඳහා 2009 අංක 22 දරන වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත අදාල වන අතර පනතේ 4.2.අ.(1) වගන්තිය මඟින් ජාතික රක්ෂිත භූමි සඳහා සහ අභයභූමි සඳහා කළමනාකරණ සැලැසුම් පිළියෙල කිරීමට අදාල ප්‍රතිපාදන දක්වා තිබුණ ද, විගණනය

පරිසර

සඳහා භාජනය වූ ජාතික උද්‍යාන අතුරින් හෝර්ටන්තැන්න, කවුඩුල්ල, මින්නේරිය සහ ලුණුගම්වෙහෙර යන ජාතික උද්‍යානවල කළමනාකරණ සැලසුම් යාවත්කාලීන කර නොතිබුණි. තවද මෙම කළමනාකරණ සැලසුම් මඟින් අදාල ජාතික උද්‍යානවල තෘණ භූමි කළමනාකරණය සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණ බව නිරීක්ෂණය විය.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විශේෂ අවධානයක් යොමු කොට සංරක්ෂණය කළ යුතු තෘණ භූමි ලෙස හඳුනාගන්නා ලද මෙම ජාතික උද්‍යාන වල තෘණ භූමි සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මීට අමතරව වික්ටෝරියා, රන්දෙණිගල, රන්ටැඹේ අභය භූමිය සහ රාවණා ඇල්ල යන අභය භූමි තුළ පිහිටි තෘණ භූමි සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කොට සංරක්ෂණය කළ යුතු තෘණ භූමි ලෙස හඳුනාගෙන තිබුණ ද මේවා සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් විගණිත දින වන 2022 සැප්තැම්බර් 23 දින වන විටත් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**තෘණ භූමි වල පැවැත්ම සම්බන්ධයෙන් පවතින තර්ජන**

වර්තමානයේදී තෘණ භූමිවල පැවැත්ම සම්බන්ධයෙන් පවතින තර්ජන ලෙස ආක්‍රමණශීලී ශාඛවල සීඝ්‍ර ව්‍යාප්තිය, ගෘහාශ්‍රිත ගවයන් අනවසරයෙන් රක්ෂිත භූමි තුළට ඇතුලු කිරීම, නිතර ඇතිවන අධික වර්ෂාපතන හා නියං කාලයේදී සිදුවන ගිනිගැනීම් වැනි විවිධ කාලගුණ විපර්යාසයන් නිසා තෘණ භූමි නඩත්තුව අඛණ්ඩව සිදු කිරීමට බාධා ඇතිවීම යනාදිය හඳුනාගෙන තිබුණි. එසේ වුවද ආක්‍රමණශීලී ශාඛවල සීඝ්‍ර ව්‍යාප්තිය, ගෘහාශ්‍රිත ගවයන් අනවසරයෙන් රක්ෂිත භූමි තුළට ඇතුලු කිරීම වැනි බාධා අවම කර ගැනීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණු බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

විගණනයට භාජනය වූ ජාතික උද්‍යානවල ඇති තෘණ භූමි සියල්ලකම ආක්‍රමණික ශාක පැතිරී තිබුණු අතර ඒවා තෘණ භූමිවල පැවැත්මට තර්ජනයක්ව පවතින බව නිරීක්ෂණය විය.

එක් එක් ජාතික උද්‍යානවල අනවසර ලෙස සිදු කරන වගාවන් එහි ජෛව පද්ධතියේ පැවැත්මට අහිතකර ලෙස බලපාන අතර,

පරිසර

නෛතික වශයෙන් හඳුනාගෙන ඇති භූමි ප්‍රමාණයන් වල වපසරිය ක්‍රමයෙන් හීන වීම මගින් දැඩි පාරිසරික හා සමාජ ගැටළු ගණනාවක් ඇතිවීමට ඉඩකඩ තිබෙන බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද ඉහත පරිදි ජාතික උද්‍යානවල භූමි ප්‍රමාණයන් උද්‍යානයේ වෙසෙන සතුන්ට අහිමි වීම එම සතුන්ගේ පැවැත්මට හානිකර විය හැකි වන අතර සතුන්ගේ ආහාර හා වාසස්ථාන අවම වීමටද බලපානු ලබන කරුණක් බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මේ සඳහා අදාල වන නීති රීති පැවතියද එම නීති රීති ක්‍රියාත්මක වීමේදී යම් යම් බලපෑම් මත එම නීති රීති නිසි පරිදි ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය. අදාල නිලධාරීන්ට බලය ක්‍රියාත්මක කිරීමට පවතින අවහිරතාද මේ සඳහා හේතුවී තිබුණි.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ජාතික උද්‍යාන ගැසට් පත්‍ර මගින් ප්‍රකාශ කිරීමේදී ඒවායේ මායිම් තීරණය කර මායිම් ගල් යොදා සලකුණු කළ යුතු වුවද එසේ සිදු කර නොතිබුණි.

**තෘණ භූමි සංරක්ෂණය සඳහා මූලා ප්‍රතිපාදන වෙන් කිරීම**

තෘණ භූමි සංරක්ෂණය සම්බන්ධයෙන් නිසි සැලැස්මක් නොතිබීම, අඛණ්ඩව ප්‍රතිපාදන නොලැබීම, ප්‍රමුඛතාගත කිරීමේදී තෘණ භූමි සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් වන ප්‍රමුඛතාවය පැහැදිලිව හඳුනා නොගැනීම වැනි හේතුන් ප්‍රතිපාදන ප්‍රමාණාත්මකව නොලැබීමට හේතුවිය හැකි බව නිරීක්ෂණය විය. වර්තමානයේ පවතින ආර්ථික අර්බුදය හමුවේ ප්‍රතිපාදන වෙන් නොකිරීම සාධාරණ වුවත්, මෙම තත්ත්වයට පෙර රට සාමාන්‍යකරණය වී තිබියදී පවා එසේ සිදුකර නොතිබුණි.

## මධ්‍යම පරිසර අධිකාරිය

**නිෂ්කාර්ය වියදම්**

පෙතියාකන්ද කොම්පෝස්ට් අංගනය 2018 වර්ෂයේදී වැඩ නිම කර මධ්‍යම පරිසර අධිකාරිය විසින් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය වෙත භාර දී තිබුණු නමුත් මේ දක්වා එහි කිසිදු මෙහෙයුම් කටයුත්තක් සිදු කර නොතිබුණි. කාර්යාල සංකීර්ණය ඇතුළු ගොඩනැගිලි වල් බිහි වී තිබූ අතර වටිනාකම රු.මිලියන 49.4ක් වූ දකුණු කොරියානු රජය මගින් ලබා දී තිබූ පයිරොලයිසිස් යන්ත්‍රය දිරාපත් වෙමින් පැවතුණි. ඒ අනුව, වාර්ෂික නඩත්තු වියදම හැර මෙම කොම්පෝස්ට් අංගනය ප්‍රතිස්ථාපනය හා පවත්වා ගැනීම

වෙනුවෙන් වැය කරන ලද රු.මිලියන 231.7ක් වූ මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

**නිෂ්කාර්ය වත්කම්**

විමෝචනවලින් මුදාහරිනු ලබන දූෂ්කාරක වායු මිනුම් කිරීම සඳහා 2016 වර්ෂයේදී රු.මිලියන 7.0ක් වටිනා උපකරණ කට්ටලයක් අධිකාරිය විසින් මිලදීගෙන තිබුණද එම උපකරණ මිලදීගෙන වර්ෂ 8කට අධික කාලයක් එනම් 2024 දෙසැම්බර් 31 දක්වාම භාවිතයට ගෙන නොතිබුණි. තවද මීතෙන් හා මීතෙන් නොවන හයිඩ්‍රොකාබන් හා වාෂ්පශීලි කාබනික සංඝටක විශ්ලේෂණය කිරීම අරමුණු කර 2016 වර්ෂය තුළදී රු.මිලියන 3.3ක වටිනාකමට මිලදීගෙන තිබූ විශ්ලේෂණ යන්ත්‍රය 2021 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි.

අප ජලයේ රසායනික පරීක්ෂාවන්ට අමතරව ක්ෂුද්‍ර ජීවී පරීක්ෂණ (Micro Biology Analysis test) සිදු කිරීම සඳහා සේවාලාභී ඉල්ලුම් වැඩි වීම මත හා එම පරීක්ෂණ කටයුතු වෙනුවෙන් ජල නියැදි ලබා ගෙන ප්‍රධාන කාර්යාලය වෙත යොමු කිරීම සඳහා ප්‍රවාහන වියදම අධික වීම නිසා එම පරීක්ෂණ කටයුතු දකුණු පළාත් රසායනාගාරය තුළම සිදු කිරීමට කටයුතු සලස්වමින් 2020 හා 2021 වර්ෂවලදී රු.මිලියන 2ක වටිනාකමින් යුතු උපකරණ කට්ටලයන් දකුණු පළාත් කාර්යාලයේ රසායනාගාරය වෙත ලබා දී තිබුණි. එහෙත් ක්ෂුද්‍ර ජීවී පරීක්ෂණ කටයුතු ආරම්භ කර නොතිබීම නිසා එම උපකරණ කට්ටල අධ්‍යක්ෂ නිල නිවාසයේ නිෂ්කාර්යව ගබඩා කර තිබුණි.

**ගොඩනැගිලි කුළී**

මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල 24 අතුරින් 15ක් පුද්ගලික හිමිකරුවන් සතු ගොඩනැගිලිවල සහ 02ක් රජයට අයත් ගොඩනැගිලිවල කුලී පදනමින් පවත්වාගෙන යමින් පැවති අතර ගොඩනැගිලි කුලිය ලෙස වාර්ෂිකව රු.මිලියන 24ක් වැය කර තිබුණි.

**පරිසර ආරක්ෂණ බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූල නොවීම**

පරිසර අධිකාරියේ බී - 52 කාණ්ඩය යටතේ ලියාපදිංචි වී ඇවි තෙල් පිරිපහදු කිරීම, ප්‍රවාහනය හා ගබඩා කිරීම සම්බන්ධ කාර්යයන් වෙනුවෙන් 2024 වර්ෂයට පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා තිබූ කර්මාන්ත 35ක් අතුරින් පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීම සඳහා පවත්වා ගත යුතු අනුකූලතාවයන් වන තෙල් ඉතිරීම් මඟින් පස මතුපිට ජලය හෝ භූගත ජලය දූෂණය වීම වැලැක්වීමට කටයුතු

නොකල ආයතන 07ක්ද, වර්ෂාවකදී තෙල් ටැංකිවලට වතුර පිරී උතුරා යාම වැළැක්වීමට වහලක් මඟින් ආවරණය කල යුතු වුවද එසේ සිදු නොකරන ලද ආයතන 08ක්ද, දැවිතෙල් ගබඩාවේ ක්‍රියාකාරීත්වය නිසා ජනිත වන අපද්‍රව්‍ය විවෘත භූමියේ ගොඩගසා තිබූ කර්මාන්ත 11ක්ද, නිසි අන්දමින් ගිනි නිවීමේ උපකරණ පවත්වා නොගත් කර්මාන්ත 06ක් ද පැවති බව නිරීක්ෂණය විය.

## වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

**හිඟ ආදායම වාර්තා නොකිරීම**

2019, 2020 සහ 2021 වර්ෂවලදී ධීවර වරාය පහකින් වැලි ඉවත් කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම වෙනුවෙන් අය කර ගත යුතු රු.මිලියන 8.3ක හිඟ ආදායමක් පැවතියද ගණන්දීමේ නිළධාරීන් විසින් භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීමේදී හිඟ ආදායම් නොමැති බව වාර්තා කර තිබුණි.

**අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමේ නියෝග ක්‍රියාත්මක කිරීම**

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව, 2012 සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ බලපත්‍ර නොමැතිව සිදුකළ ඉදිකිරීම් කඩා ඉවත් කිරීම් සඳහා නියෝග 3,039ක් නිකුත් කර තිබූ නමුත්, එයින් නියෝග 2,825ක් ක්‍රියාත්මක කර නොතිබුණි .

තවද, 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතේ 31(4) වගන්තිය අනුව, අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා දරන ලද පිරිවැය අදාළ පුද්ගලයාගෙන් අය කර ගත යුතුය. එසේ වුවද 2015 සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ දෙපාර්තමේන්තුව විසින් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා වැය කර තිබූ රු.මිලියන 4ක් වූ මුදලින් රු.මිලියන 3.5ක් අය කර නොතිබූ බව නිරීක්ෂණය විය.

**හිඟ මුදල් අයකර නොගැනීම**

2017 සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ, ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් සමාගම විසින් අවසරපත්‍ර ප්‍රමාණය ඉක්මවා වැලි කැණීම් සිදු කිරීම වෙනුවෙන් අයවිය යුතු මුදල රු.මිලියන 79.4ක් වූ අතර, 2024 අවසානය වන විටත් එයින් රු.මිලියන 60.1ක් අය කර

නොතිබූ අතර අයකර ගැනීම සඳහා කිසිදු ලිඛිත එකඟතාවයක් හෝ ගිවිසුමක්ද නොපැවතුණි.

## වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදල

**ත්‍යාග මුදල් නොගෙවීම්**

2024 වර්ෂයට පෙර පවරන ලද නඩු 198ක් සඳහා ත්‍යාග අරමුදල වෙත ලැබී තිබූ රු.මිලියන 1.8කින්, නඩු 173කට අදාළව අරමුදල වෙත ලැබී තිබූ රු.මිලියන 1.7ක් ත්‍යාග ලැබීමට සුදුසුකම් ඇති තැනැත්තන් නිශ්චය කර ගෙවීම් කිරීමකින් තොරව සෘජුවම මහා භාණ්ඩාගාරය වෙත යවා තිබුණි. මේ හේතුවෙන් ත්‍යාග අරමුදල පිහිටුවීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපොහොසත් වී තිබුණු බව නිරීක්ෂණය විය.

# වනාන්තර සහ වනජීවී

"වන ජීවින් හා වන සම්පත සුරැකි තිරසර දේශයක්" දැක්ම කරගත් "වනජීවී හා වන සංරක්ෂණය මගින් ජෛව විවිධත්වය පෝෂණය කිරීම අරමුණු කර ගනිමින් ස්ථානීය හා පරිබාහිරව සත්ත්ව සංරක්ෂණයද තිරසර දැව කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය, නියමු ආයතන සම්බන්ධීකරණය, මෙහෙයවීම හා ක්‍රියාවට නැංවීම සඳහා නායකත්වය සැපයීම" යන මෙහෙවර ඉටුකිරීම සඳහා වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය 2024 සැප්තැම්බර් 26 දක්වා ක්‍රියාත්මකව පැවති අතර 2024 සැප්තැම්බර් 27 සිට එම අමාත්‍යාංශය පරිසර අමාත්‍යාංශය යටතේ වනජීවී සංරක්ෂණ අංශය ලෙස ස්ථාපිත කර තිබුණි. වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු තුනක්, ව්‍යවස්ථාපිත ආයතනයක් සහ ව්‍යවස්ථාපිත අරමුදල් තුනක් ක්‍රියාත්මකව පැවතුණි.

2024 වර්ෂයේදී අදාළ කාර්යභාරය ඉටුකිරීම සඳහා වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයට හා දෙපාර්තමේන්තු 03 ට රු.මිලියන 9,082ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් සලසා දී තිබුණි. 2024 වර්ෂය අවසන් වන විට එයින් රු.මිලියන 7,282ක් උපයෝජනය කර තිබුණු අතර රු.මිලියන 1,800ක් ඉතිරි කර තිබුණි.

**වගු අංක 2.39 - වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය හා අදාළ දෙපාර්තමේන්තු වෙත 2024 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන හා ප්‍රතිපාදන උපයෝජනය**

| | ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන | මුළු වියදම රු.මිලියන | ඉතිරිය රු.මිලියන |
|---|---|---|---|
| වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය | 395.00 | 184.96 | 210.04 |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 4,930.00 | 3,542.37 | 1,387.63 |
| සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | 845.84 | 773.38 | 72.46 |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 2,911.87 | 2,781.44 | 130.43 |
| **එකතුව** | **9,082.71** | **7,282.15** | **1,800.56** |

මූලාශ්‍රය - වාර්ෂික මූල්‍ය ප්‍රකාශන -2024

## විගණන නිරීක්ෂණ

### වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**අලි මිනිස් ගැටුම**

2024 වර්ෂය තුළදී විදුලි වැටවල් ඉදිකිරීම සඳහා රු.මිලියන 53.5ක්, අලි වෙඩි හා රබර් උණ්ඩ මිලදී ගැනීම සඳහා රු.මිලියන 351.7ක් හා එහි නඩත්තුව සඳහා (මුරකුටි ඉදිකිරීම) රු.මිලියන 74ක්ද ඇතුළුව 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලය තුළ පමණක් අලි වැට ඉදිකිරීම හා එහි නඩත්තු කටයුතු සඳහා රු.මිලියන 2,835.1ක් වැයකර තිබුණි. 2024 දෙසැම්බර් 31 දින වන විට ඉදිකර ඇති විදුලි

වැටවල සම්පූර්ණ දිග ප්‍රමාණය කිලෝමීටර් 5,620ක් විය. එසේ වුවද, පසුගිය වර්ෂ 05 තුළ සිදු වූ අලි මරණ, වන අලින් නිසා සිදු වී තිබූ මිනිස් මරණ හා දේපළ හානි පහත පරිදි වී තිබුණි.

වගු අංක 2.40 - පසුගිය වර්ෂ 05 තුළ වන අලින් නිසා සිදු වී තිබූ මිනිස් මරණ හා දේපළ හානි

| | 2024 | 2023 | 2022 | 2021 | 2020 | එකතුව |
|---|---|---|---|---|---|---|
| වන අලි මරණ | 388 | 488 | 439 | 375 | 327 | **2,017** |
| මිනිස් මරණ | 157 | 184 | 145 | 142 | 113 | **741** |
| ශාරීරික හානි | 202 | 239 | 179 | 58 | 75 | **753** |
| දේපළ හානි | 3,756 | 3,429 | 2,668 | 1,326 | 850 | **12,029** |

මූලාශ්‍රය - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු

**සංචාරක ස්ථාන නඩත්තු කිරීම හා පහසුකම් සැපයීම**

මින්නේරිය වනෝද්‍යානය සහ එහි පරිසර පද්ධතිය හා ජීවීන් පිළිබඳ සංචාරකයන්ට අවබෝධයක් ලබා දීමේ අරමුණින් උද්‍යාන පිවිසුමේ තනා ඇති කෞතුකාගාරය නිසි නඩත්තුවක් හා නවීකරණයක් කර නොතිබීම නිසා අපවිත්‍ර වී තිබීමෙන් එම කෞතුකාගාරය ප්‍රදර්ශනය කිරීමට සුදුසු මට්ටමේ නොතිබුණි.

තවද මින්නේරිය වන උද්‍යානය ආරම්භ කර වසර 27ක් පමණ ගත වී තිබුණද, සංචාරකයින්ගේ මූලික අවශ්‍යතාවයක් වන පිරිසිදු පානීය ජලය සපයා දීමට 2024 දෙසැම්බර් 31 දින දක්වාම දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

එසේම හෝර්ටන්තැන්න ජාතික උද්‍යානයට ඇතුළු වන ප්‍රධාන පිවිසුම් දොරටුව වන පට්ටිපොල පිවිසුම නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා අබලන් තත්වයේ පවතින බව නිරීක්ෂණය විය.

**වත්කම් උපයෝජනය නොකිරීම**

කවුඩුල්ල වනෝද්‍යානය තුළ පිහිටි මැණික් සොරොව්ව සංචාරක බංගලාවේ නවීකරණ කටයුතු රු.මිලියන 3.5ක වියදමකින් 2024 අප්‍රේල් මාසයේ නිම කර තිබුණද, 2025 අප්‍රේල් වන විටත් එය සංචාරකයන් සඳහා විවෘත කර නොතිබුණි.

**ජල කළමනාකරණය සඳහා අවබෝධතා ගිවිසුම**

මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය හේතුවෙන් මින්නේරිය හා කවුඩුල්ල ජලාශ නිරන්තරයෙන් ජලය පිරී තිබීම නිසා වැව් පිටිවල තෘණ ආහාරයට ගැනීමට පැමිණෙන අලි ඇතුන් සඳහා ආහාර

ප්‍රමාණවත් නොවීමෙන් වන අලින් ගම් වැදීමෙන් අලි මිනිස් ගැටුම උග්‍රවීම වැලැක්වීම හා සංචාරක කර්මාන්තය රැක ගැනීම වෙනුවෙන් මින්නේරිය සහ කවුඩුල්ල ජලාශවල ජල කළමනාකරණය සම්බන්ධ පාර්ශවයන් සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීමට තීරණය කර තිබුණද, 2024 ඔක්තෝබර් 31 දින වන විටත් එවැනි අවබෝධතා ගිවිසුමකට එළඹ නොතිබුණි.

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**ඉඩම් අයිතිය පවරා නොගැනීම**

2024 දෙසැම්බර් 31 වන විටත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් හෙක්ටයාර 79.38ක ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**කල් ඉකුත් වූ තැන්පත්**

2024 දෙසැම්බර් 31 වන විට වසර 02 ක් ඉක්ම වූ රු.මිලියන 327ක තැන්පතු රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි.

**වනාන්තර කළමනාකරණ සැලසුම් අනුමත නොකිරීම**

2024 දෙසැම්බර් 31 වන විට රක්ෂිත හා සංරක්ෂිත වනාන්තර 512ක් සඳහා කළමනාකරණ සැලසුම් පිළියෙල කර තිබුණද, ඒ අතරින් සැලසුම් 459ක් අනුමත කර නොතිබීම නිසා ඒවා ක්‍රියාත්මක කළ නොහැකිව පැවතුණි.

ජෛව විවිධත්වය, පස සහ ජලය සංරක්ෂණය, ජාන සම්පත හා දුර්ලභ හා වඳවීමේ තර්ජනයට ලක්ව ඇති වන හා සත්ත්ව හා වෘක්ෂලතා විශේෂ සුරක්ෂිත කිරීම යන අරමුණු ඉටුකර ගැනීම සඳහා රක්ෂිත හා සංරක්ෂිත වනාන්තර ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම හා ඒවා සඳහා කළමනාකරණ සැලසුම් සකස් කිරීම සිදු කල ද, වනාන්තර 897ක් රක්ෂිත හා සංරක්ෂිත ලෙස ගැසට් මඟින් ප්‍රකාශයට පත්කර වර්ෂ 01ත් 19ත් දක්වා වූ දීර්ඝ කාල පරාසයන් ගත වී තිබුණද, අදාළ කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**ඩ්‍රෝන කැමරා මිලදී ගැනීම**

දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 3.4ක් වැය කර ඩ්‍රෝන කැමරා 06ක් 2023 දෙසැම්බර් මාසයේදී මිලදීගෙන තිබූ අතර මේ සඳහා ලැබී තිබූ ලංසු ලේඛන විගණනය වෙත ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් විය. තවද ලංසු සුරක්ෂණ ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

| | |
|---|---|
| **ධාවනයෙන් තොරව පවතින වාහන** | වාහන 143ක් වර්ෂ 03කට වැඩි කාලයක සිට භාවිතයෙන් තොරව පැවති අතර ඒවා අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| **හානි හා පාඩු** | 2017 සිට 2023 දක්වා වූ කාලය තුළ සිදුව තිබූ රු.මිලියන 1ක් වූ හානි හා පාඩු සිද්ධි 10ක් සම්බන්ධයෙන් මු.රෙ.104 (3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීමටත්, 2013 සිට 2024 දක්වා වූ වර්ෂ 11ක කාලය තුළ සිදුව තිබූ රු.මිලියන 5.5ක් වූ හානි හා පාඩු සිද්ධි 15ක් සම්බන්ධයෙන් මු.රෙ.104 (4) ප්‍රකාරව පූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමටත් 2025 අප්‍රේල් 11 දින වන විටත් කටයුතු කර නොතිබුණි. |
| **තිරසර සංවර්ධන ඉලක්ක** | තිරසර සංවර්ධන ඉලක්ක යටතේ කඳුකර ජෛව විවිධත්වය සඳහා වැදගත් ආරක්ෂිත ප්‍රදේශ/ භූමි ආවරණය කිරීම හඳුනාගෙන තිබුණද, 2024 වර්ෂයේ මෙම තිරසර සංවර්ධන ඉලක්කය ඉටුකර ගැනීම සඳහා කිසිදු කාර්යයක් සිදු කර නොතිබුණි. |

## ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

| | |
|---|---|
| **වත්කම් ඌන උපයෝජනය** | අක්කර 500ක පමණ වපසරියකින් යුතු රිදියගම සෆාරි උද්‍යානයේ අක්කර 150ක භූමි ප්‍රමාණයක් භාවිතයට ගෙන නොතිබුණි. |
| **මාර්ගෝපදේශයන් නොමැති වීම** | දෙපාර්තමේන්තුව සතු එකම සෆාරි උද්‍යානය වන රිදියගම සෆාරි උද්‍යානය ආරම්භ කර වසර 09ක් පමණ ගත වී තිබුණද, එම උද්‍යානය ක්‍රියාත්මක කිරීමට අදාළව නිශ්චිත මාර්ගෝපදේශයන් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. |
| **කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම** | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට 894ක් වූ අනුමත සේවක සංඛ්‍යාවෙන් 173ක් පුරප්පාඩු වී පැවති අතර ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 11ක් ද්විතියික මට්ටමේ තනතුරු 37ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 125ක් ඇතුළත් වී තිබුණි. |

## වන සත්ත්ව සංරක්ෂණ අරමුදල

| | |
|---|---|
| **බලපත්‍ර ගාස්තු සංශෝධනය නොකිරීම** | 2019 ජුනි 13 දිනැති අංක 01/2010(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව සියලුම රාජ්‍ය ආයතන විසින් |

සපයනු ලබන්නා වූ විවිධ සේවාවන් සඳහා ඒ වන විට අය කරනු ලබන ගාස්තු සියයට 15කින් ඉහළ දැමිය යුතු වුවද, 2006 පෙබරවාරි 20 දිනැති අංක 1433/4 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ජාතික රක්ෂිතයක හෝ අභය භූමියක පිහිටි ජලාශයක මසුන් ඇල්ලීමට භාවිත කරනු ලබන ධීවර යාත්‍රා සඳහා අය කරනු ලබන රු.250ක බලපත්‍ර ගාස්තුව 2024 වර්ෂය අවසන් වන විටත් සංශෝධනය කර නොතිබුණි.

## සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල

**වත්කම් උපයෝජනය නොවීම**

2017 වර්ෂයේ සිට රු.මිලියන 139.8ක් වැය කර සත්ව කලාප (Australian, Leopard & Cheetah zone) ඉදිකර අවසන් කර තිබුණද සත්ව කලාපවලට අවශ්‍ය සතුන් ලබා ගැනීමේ නිසි ක්‍රමවේදයක් සකස් කර නොතිබීම නිසා එම කලාපවලට අවශ්‍ය සතුන් නොමැති වීමෙන් ඉදිකිරීම් නිෂ්කාර්යව පැවතුණි. ඒවා නිසි ලෙස නඩත්තු නොකිරීම නිසා විනාශ වෙමින් පැවති අතර එසේ විනාශ වෙමින් පැවති ඔස්ට්‍රේලියානු කලාපය තුළ සතුන් කොටු කර තැබීමට රු.මිලියන 12.90ක් වැය කර 2019 වසරේදී ඉදිකරන ලද ගොඩනැගිල්ල සහ ගුහාවල ඡායාරූප පහත දැක්වේ.

**රූපසටහන 2.39 - 2019 වසරේදී ඉදිකරන ලද ගොඩනැගිල්ල සහ ගුහා**



|  |  |
|---|---|

**ස්වයංක්‍රිය ටිකට්පත් නිකුත් කිරීමේ පද්ධතිය**

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව මගින් දිවයින පුරා ක්‍රියාත්මක සත්වෝද්‍යාන සඳහා ස්වයංක්‍රිය ටිකට්පත් නිකුත් කිරීමේ පද්ධතියක් ස්ථාපනය කර පවත්වාගෙන යනු ලබන අතර පද්ධතිය ආයතනය යටතට නිල වශයෙන් පවරාගෙන නොතිබීම, පද්ධතියේ අඛණ්ඩ ක්‍රියාකාරීත්වය, දිවයින පුරා පද්ධතියේ ඒකකාරීභාවය සහ ස්ථාවර භාවය සහ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නියමිත අධීක්ෂණ ක්‍රමයක් සකස් කර නොතිබීම සහ නඩත්තු සහ යාවත්කාලීන කිරීම් සඳහා වගකිව යුතු නිලධාරීන් පත් කර නොතිබීම යන පරිපාලනමය ගැටළු පැවතුණි.

**ඌන උපයෝජිත වත්කම්**

සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සඳහා ආහාර නිෂ්පාදනය කිරීමේ අරමුණින් පවත්වා ගෙන යන අක්කර 71ක වපසරියකින් යුතු කහපොල ගොවිපල ඉඩමෙහි අක්කර 41ක් පමණ වූ භූමි ප්‍රමාණය නිෂ්කාර්යව පැවතුණි.

## රාජ්‍ය දැව සංස්ථාව

**හිඟ ආදායම**

2024 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ශේෂ ගිණුමේ පැවති රු.මිලියන 1,241.8ක ශේෂය තුළ වසර 2ත්, 4ත් අතර කාල පරාසයන් තුළ අය නොවී පවතින රු.මිලියන 378.8ක් සහ වසර 4 ක කාලය ඉක්මවූ රු.මිලියන 87.8ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**නොනිමි භාණ්ඩ**

2024 දෙසැම්බර් 31 දිනට බූස්ස නිෂ්පාදනාගාරයෙහි පැවති රු.මිලියන 20.4ක් වූ කෙරිගෙන යන වැඩ තුළ 2011 වර්ෂයේ සිට පැවත එන නොනිමි තොග පවතින බව නිරීක්ෂණය විය. මෙම

නිෂ්පාදනාගාර සංකීර්ණයේ ගෘහභාණ්ඩ නිෂ්පාදනය කෙටි වැඩ ගිවිසුම් මත බාහිර කොන්ත්‍රාත්කරුවන් මගින් ඉටුකරවා ගන්නා අතර එක් කාර්යයක් නිමකිරීමට පෙර නැවත නැවත කාර්යයන් ලබා දී ඒ වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුවන් 26ක් වෙත කොන්ත්‍රාත් මුදලින් රු.මිලියන 11.4ක් කොටස් වශයෙන් ගෙවා තිබුණි.

**කාර්යසාධනය**

2022 වර්ෂයේ ඝන මීටර් 103,121ක් වූ කඳන් නිෂ්පාදනය 2023 සහ 2024 වර්ෂවලදී පිළිවෙලින් ඝන මීටර් 93,103ක් සහ ඝන මීටර් 87,176 දක්වා අඩු වී තිබූ අතර 2022 වර්ෂයේ අලෙවි කර තිබුණු කඳන් දැව ප්‍රමාණය ඝන මීටර් 102,491ක් වූ අතර 2023 වර්ෂයේදී ඝන මීටර් 85,378 දක්වා පහළ ගොස් තිබුණි.

2022 වර්ෂයේ ඝන මීටර් 3,432 ක්වූ ඉරු දැව නිෂ්පාදනය 2024 වර්ෂයේදී ඝන මීටර් 2,456 දක්වා ද 2022 වර්ෂයේ අලෙවි කර තිබුණු ඉරු දැව ප්‍රමාණය ඝන මීටර් 3,441 ක්වූ අතර එය 2024 වර්ෂයේදී ඝන මීටර් 2,087 දක්වා ද පහළ ගොස් තිබුණි.

2022 වර්ෂයේ රු.මිලියන 428ක්වූ අලෙවි ආදායම 2023 හා 2024 වර්ෂවල රු.මිලියන 303ක් හා රු.මිලියන 288ක් ලෙස 2022 වර්ෂයට සාපේක්ෂව සියයට 29කින් හා 33කින් පමණ පහත ගොස් තිබුණි.

**ගෘහ භාණ්ඩ අලෙවිය**

වාර්ෂික විකුණුම් අවශ්‍යතාවය මත නිෂ්පාදන අවශ්‍යතාවය පුරෝකථනය නොකිරීම නිසා බුස්ස නිෂ්පාදනාගාරයේ 2023 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 76.1ක් වූ ගෘහ භාණ්ඩ අයිතම 428කින් එක් ගෘහ භාණ්ඩයක්වත් 2025 ජුනි 30 දින වන විටත් අලෙවි වී නොතිබුණි. තවද සංස්ථාවේ ගෘහභාණ්ඩ නිෂ්පාදන සහ අලෙවි ක්‍රියාවලියේදී දිගින් දිගටම අලාභයන් වාර්තා වී තිබුණු නමුත්, එය ලාභදායී මට්ටමකට ගෙන ඒම සඳහා සංස්ථාවේ අවධානය යොමු වී නොතිබුණි.

**දම්වැල් කියත් මිලදී ගැනීම හා ඌන උපයෝජනය**

අධිකරණ ක්‍රියාවලිය විසින් රාජසන්තක කර සංස්ථාවට භාර දී ඇති දම්වැල් කියත්ද ඇතුළුව මුළු දම්වැල් කියත් 814ක් 2022 පෙබරවාරි වන විට සංස්ථාව සතුව පැවතියදී සංස්ථාව විසින් 2021 සහ 2022 වර්ෂවල පූර්ණ හෙලීම්වලින් සියයට 97ක් සහ වන අපරාධ හා පරිත්‍යාග දැව ඉවත් කිරීම්වලින් සියයට 85ක් කොන්ත්‍රාත්කරුවන්

මගින් සිදු කර තිබුණි. තවද සංස්ථාවේ කලාප මට්ටමින් කියත් 19ක අවශ්‍යතාවයක් පමණක් දක්වා තිබියදී ඒ පිළිබඳව සැලකිල්ලට නොගෙන වන වගා හෙළීම්, තුනී කිරීම් හා අනතුරුදායක ගස් ඉවත් කිරීම් කටයුතු සඳහා 200ක අවශ්‍යතාවයක් පවතින බව දක්වා අමාත්‍ය මණ්ඩලය වෙත තොරතුරු ඉදිරිපත් කර, ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම තාවකාලිකව අත්හිටුවා තිබියදී 2023 වර්ෂයේදී රු.මිලියන 35.8කට (වැට් බදු සහිතව) දම්වැල් කියත් 100ක් මිලදී ගෙන තිබුණි. ඉහත අවශ්‍යතාවය වෙනුවෙන් දම්වැල් කියත් මිලදී ගෙන තිබුණද පූර්ණ හෙළීම් කටයුතු සහ පරිත්‍යාග දැව ඉවත් කිරීම සඳහා 2023 වර්ෂයේදී රු.මිලියන 572.4ක්ද 2024 වර්ෂයේදී රු.මිලියන 435.5ක්ද කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා තිබුණි. තවද දම්වැල් කියත් ක්‍රියාකරු තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 40ක්ද 2025 ජුනි 30 දිනට තථ්‍ය සේවක සංඛ්‍යාව 23ක්ද වූ අතර ඒ තුළ අනියම් සහ දෛනික සේවකයින් 7 දෙනෙකුද ඇතුළත් වී තිබුණි.

**සේවක අර්ථ සාධක අරමුදල් පනත හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනත අනුව කටයුතු නොකිරීම නිසා සිදු වී තිබූ අලාභ**

1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් (සංශෝධිත) පනත සහ1980 අංක 46 දරන සේවා නියුක්තකයින්ගේ භාර අරමුදල් පනත්වල ප්‍රතිපාදනයන්ට අනුව සංස්ථාව කටයුතු නොකිරීම හේතුවෙන් 2006 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලයට අදාළව එම අරමුදල්වලට අධිභාර වශයෙන් රු.මිලියන 122.2ක් සහ සේවකයන් විසින් ගෙවිය යුතු දායක මුදල් රු.මිලියන 126.8ක් සංස්ථාව විසින් ගෙවීම නිසා සංස්ථාවට රු.මිලියන 249ක අලාභයක් සිදු වී තිබුණි.

# කාන්තා හා ළමා කටයුතු

ළමයින් හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා ආරක්ෂාව තහවුරු කරන හිතකර සංවේදී සමාජයක් බිහිකිරීමේ අපේක්ෂාවෙන් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය යටතේ කාන්තා, ළමා කටයුතු අංශය සහ සමාජ සවිබල ගැන්වීමේ අංශය ක්‍රියාත්මක වන අතර ඒ යටතේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව හා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය යන ආයතනයක් ක්‍රියාත්මක වේ.

## ප්‍රතිපාදන හා වියදම්

2024 වර්ෂයේදී ඉහත සඳහන් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව හා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත එකතුව රු.මිලියන 20,083ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් ලබා දී තිබුණු අතර, 2024 වර්ෂය අවසන් වන විට එයින් රු.මිලියන 13,854ක් පමණක් උපයෝජනය කර තිබුණි.

වගු අංක 2.41 - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය යටතේ 2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන හා වියදම්

| | ප්‍රතිපාදනය රු.මිලියන | වියදම රු.මිලියන | ඉතිරිය රු.මිලියන |
|---|---|---|---|
| කාන්තා,ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය | 19,227 | 13,027 | 6,200 |
| පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 496 | 484 | 12 |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | 360 | 343 | 17 |
| **එකතුව** | **20,083** | **13,854** | **6,229** |

මූලාශ්‍රය - 2024 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

## කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය

**සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන පිළිබඳ තොරතුරු පද්ධතියක් නොපැවතීම.**

පාරම්පරික කර්මාන්තවල යෙදෙන්නන්, ස්වයං රැකියාවල යෙදෙන අඩු ආදායම්ලාභීන් හා නිෂ්පාදන ආදායම් නොමැති හා මුදල්, තාක්ෂණය හා වෙළඳපොළ සොයා ගත නොහැකි කුඩා ව්‍යවසායකයන් නිෂ්පාදනයේ ප්‍රබල කොටස්කරුවන් කර ගනිමින් තෝරා ගත් ගම්මානවල ජීවත් වන අඩු ආදායම්ලාභී ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම පිණිස 2021 වර්ෂයේ ආරම්භ කර තිබූ "සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන" පිහිටුවීමට හා පැවති නිෂ්පාදන ගම්මාන වැඩිදියුණු කිරීම් වෙනුවෙන් 2021 සිට 2024 අතර කාලය තුළ රු.මිලියන 2,563.89ක් වැයකර තිබුණද මෙම ව්‍යාපෘතිය මඟින් පිහිට

වූ හා සංවර්ධනය කළ නිෂ්පාදන ගම්මාන හා ඒවායේ වර්තමාන තත්ත්වය පිළිබඳ දත්ත ඇතුළත් තොරතුරු පද්ධතියක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

**ජාතික කාන්තා කමිටුව පත් නොකිරීම**

ශ්‍රී ලංකා කාන්තා ප්‍රඥප්තියේ 17(2) ව්‍යවස්ථාව අනුව පත් කරන කමිටු සාමාජිකයින් 15 දෙනෙකුගෙන් සමන්විත ජාතික කාන්තා කමිටුව මාස 02කට වරක් හෝ අවශ්‍යතාවය අනුව හැකිතාක් නිරතුරුව රැස්විය යුතු වුවත්, අදාළ කමිටු සාමාජිකයින් පත් නොකිරීම හේතුවෙන් 2024 වර්ෂය තුළ සහ පෙර වර්ෂ 1 ½ක කාලයක් තුළ මෙහෙයුම් කමිටු සහ අනුකමිටු රැස්වීම් පවත්වා මෙහෙයුම් සහ අධීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි.

## පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

**අවදානමට ලක්වන දරුවන් පිළිබඳ අවධානය යොමු නොකිරීම**

ජාතික ප්‍රතිපත්තීන් හා ජාතික ප්‍රමිතීන්ට අනුකූලව අනාථ, අත්හළ හා අසරණ ළමයින්ද, නීතිමය ගැටළුවලට මුහුණ දුන් ළමයින්ද සුවිශේෂී කර ගනිමින් සියළු ළමයින්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගනිමින්, ඔවුනට සමාන අවස්ථාවන් උදාකර දීම, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මෙහෙවර වුවද, බරපතල අවදානමට ලක්වන වීදි දරුවන්, වෙරළ ආශ්‍රිත, වතු ආශ්‍රිත ආන්තික ප්‍රජාවගේ දරුවන් හඳුනාගෙන එම දරුවන් සම්බන්ධ දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාමට, ඔවුන්ගේ අයිතීන් තහවුරු කිරීමට හා එම දරුවන්ගේ අයිතිවාසිකම් කඩවීම වැළැක්වීම සඳහා අවධානය යොමු කර ඒ පිළිබඳ වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**නීති හා අණපනත් යාවත්කාලීන නොකිරීම**

නීති හා අණපනත් කාලීන අවශ්‍යතාවයට ගැළපෙන ලෙස සංශෝධනය කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වුවද, 1941 අංක 24 දරන දරුවන් හදාවඩා ගැනීමේ ආඥා පනත කාලීන අවශ්‍යතාවයට ගැළපෙන ලෙස සංශෝධනය කර නොතිබුණි.

**ශ්‍රී ලාංකික දරුවන් දරුකමට හදාවඩා ගැනීම සඳහා ලබා දීම**

විදේශ රටවලට ශ්‍රී ලාංකික දරුවන් දරුකමට හදාවඩා ගැනීම සඳහා 2019 වර්ෂයේ සිට 2024 නොවැම්බර් 11 දින දක්වා කාලය තුළ දරුවන් 41 දෙනෙකු ලබා දී තිබූ අතර, 1992 අංක 15 දරන ළමයින් දරුකමට හදා ගැනීමේ (සංශෝධන) පනතේ 10 (ඇ) වගන්තියෙහි අ, ආ, ඇ ඡේද මඟින් දක්වා ඇති පරිදි හදාවඩා ගැනීම සඳහා ලබා

දුන් දරුවන් පිළිබඳව දරුවන් ලබා දී අවුරුදු 10ක් දක්වා පසුවිපරම් වාර්තා ලබා ගත යුතු වුවද, එම පසුවිපරම් වාර්තා නිසි පරිදි අඛණ්ඩව ලබා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**පුහුණු මධ්‍යස්ථාන නිෂ්කාර්යව පැවතීම**

අපයෝජනයට සහ විවිධ ගැටළුවලට මුහුණ දුන් ගැහැණු දරුවන්ට උපදේශන සේවා සැපයීම, ජීවන කුසලතා වර්ධනය, වෘත්තීය පුහුණුව තුළින් සමාජගත කිරීම සඳහා ස්ථාපිත කර ඇති පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය 2021 වර්ෂයේ කොවිඩ් අන්තර් ප්‍රතිකාර මධ්‍යස්ථානය ලෙස භාවිතා කිරීමෙන් පසු 2023 ජුනි 06 දින නැවත භාර දී තිබුණද 2024 දෙසැම්බර් 31 දක්වා භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් දරුවන් 80 දෙනෙකුට පමණ පුහුණු පාඨමාලා හා උපදේශන සේවා ලබා ගැනීමේ අවස්ථා අහිමිව තිබූ අතර පුහුණු උපකරණ සහිත මෙම මධ්‍යස්ථානය නිෂ්කාර්යව පැවතුණි. තවද දෙපාර්තමේන්තුවට අයත් පානදුර ගොරකාන පිහිටි ජාතික පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානයේ නිලධාරීන් 60කට පමණ පුහුණුවීම් කළ හැකි වායු සමීකරණය කළ සියළුම පහසුකම් සහිත පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානයද 2023 ජුනි 06 දින සිට නිෂ්කාර්යව පැවතුණි.

**අරමුණුවලින් බැහැර වැය කිරීම්**

කෙටිකාලීන මූල්‍ය සහාය ලබා දීමේ ව්‍යාපෘතියක් වෙනුවෙන් දෙපාර්තමේන්තුව වෙත යුනිසෙෆ් ආයතනය විසින් ප්‍රදානය කර තිබූ රු.මිලියන 27.7ක් මුදලෙන්, 2024 වර්ෂය අවසානය දක්වා කිසිදු මුදලක් වැය කර නොතිබුණි. එපරිදිම 2023 වර්ෂයේ ලබා දුන් ආධාරවලින් උපයෝජනය නොකළ රු.මිලියන 14.34ක් වැය කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුමක් 2024 වර්ෂය සඳහා සකස් කර තිබූ අතර එයින් රු.මිලියන 11.4ක් යුනිසෙෆ් ආයතනයේ අරමුණු වූ ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, මූලික අවශ්‍යතා සපුරාලීම, ළමුන්ගේ හැකියාවන් කරා ළඟා වීමට ඇති අවස්ථා පුළුල් කිරීම හා මුල් ළමාවිය සංවර්ධනය යනාදී අරමුණු ඉටු කිරීම සඳහා වූ වැඩසටහන්වලින් බැහැරව දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ වියදම් සඳහා වැය කර තිබූ බව නිරීක්ෂණය විය.

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම**

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ 14(අ) හා (ඊ) වගන්ති ප්‍රකාරව ළමා අපචාර වැළැක්වීම හා එවැනි අපචාරවලට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර

කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් 2019 ඔක්තෝබර් 29 වන දින අනුමත කර තිබූ නමුත් 2024 වර්ෂය අවසාන වන විටත් එය ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි.

**ජාතික දත්ත පද්ධතියක් සකස් කර නොතිබීම**

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ 14(ක) වගන්තිය ප්‍රකාරව අධිකාරිය පිහිටුවා වසර 26කට අධික කාලයක් ගත වී තිබුණ ද අධිකාරියේ මූලික අරමුණක් වූ ජාතික දත්ත පද්ධතියක් සකස් කර එය පවත්වා ගැනීමට නොහැකි වී තිබීම හේතුවෙන් පනතේ 14(උ), (ඌ) හා (ජ) වගන්ති අනුව ළමා අපචාරවලට අදාල නීති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නියාමනය කිරීම හා ළමයින්ගේ සුරක්ෂිතභාවය සහ ළමා අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් වන තොරතුරු සැපයීමට නොහැකි වී තිබුණි.

**ළමා අපචාර සම්බන්ධයෙන් පැමිණිලි විභාග කිරීම**

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ 14(ඉ),(උ), (ඌ), (ඒ), (ඕ) යන වගන්ති ප්‍රකාරව 2014 වර්ෂයේ සිට 2025 අප්‍රේල් 30 දින දක්වා අධිකාරිය වෙත ළමා අපචාර සම්බන්ධයෙන් පැමිණිලි 107,663ක් ලැබී තිබුණු අතර එයින් පැමිණිලි 46,813ක් හෙවත් සියයට 43ක විමර්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි. මේ හේතුවෙන් ළමා අපචාරවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සහ රැකවරණය සලසා සියළු ආකාර ළමා අපචාරවලට අදාළ නීති ක්‍රියාත්මක කිරීම, නියාමනය, සියලු විමර්ශන නඩු කටයුතුවල ප්‍රගතිය සමාලෝචනය, අපචාර පිළිබඳ පැමිණිලි භාරගැනීම හා නීති බලධාරීන් වෙත යොමු කිරීම වැනි අරමුණු කාලීනව ඉටුකිරීමට නොහැකි වී තිබුණි.

**නිෂ්කාර්ය වත්කම්**

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් 2016 වර්ෂයේදී වසර 30ක බදු පදනම මත රු.මිලියන 18.31ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා මාදිවල ප්‍රදේශයේ ඉඩමක් පවරාගෙන වසර 08කට අධික කාලයක් ගත වී තිබුණද, කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

# මහජන ආරක්ෂාව

2020 නොවැම්බර් 20 දිනැති අංක 2202/25 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් එතෙක් අභ්‍යන්තර ආරක්ෂක අංශය ලෙස පැවති විෂයය පථය සංශෝධනයකර කැබිනට් අමාත්‍යාංශයක් ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශය පිහිටවනු ලැබී ය. රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව 2024 වර්ෂයට සකස්කරන ලද සැලසුම්වලට අනුව මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් පවත්වා ගනිමින් රට තුළ සියලුම පුරවැසියන්ට බියෙන් සැකෙන් තොරව නිදහසේ ජීවත්වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමත්, පුරවැසි අනන්‍යතාවය තහවුරු කිරීමත්, දේශීය හා විදේශීය පුද්ගලයන් සඳහා ආගාමික හා විගාමික කාර්යයන් සඳහා පහසුකම් සැලසීමත්, ජාතික ආර්ථිකයට ශක්තියක් වන ලෙසට රට තුළ ක්‍රියාත්මක රාජ්‍ය නොවන සංවිධාන ජාලය නියාමනය කිරීමත්, මත්ද්‍රව්‍ය උවදුර මැඩලීම ද ප්‍රධාන වශයෙන් අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන මඟින් සිදුකෙරේ.

මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා පොලීසිය, විශේෂ කාර්ය බලකාය, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය යන ආයතන අයත් වී තිබුණි.

## විගණන නිරීක්ෂණ

### විශේෂ කාර්යය බලකාය

**එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී**

එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී (Formed Police Unit) සඳහා විශේෂ කාර්ය බලකා නිලධාරීන් යෙදවීමට අදාළ ව්‍යාපෘතිය සඳහා 2024 සැප්තැම්බර් වන විට රු. මිලියන 2000කට ආසන්න වියදමක් කර තිබූ බව නිරීක්ෂණය විය. මෙම ව්‍යාපෘතිය තුළින් විදේශ විනිමය උපයාගැනීම, නිලධාරීන්ගේ නිපුණතා සංවර්ධනය, ජාත්‍යන්තර වශයෙන් අත්දැකීම් ලබාගැනීම, නිලධාරීන්ගේ ආර්ථික තත්ත්වය ශක්තිමත්කර ජීවන තත්ත්වය ඉහළ නැංවීම වැනි කරුණු අරමුණු කරගෙන ප්‍රමාණවත් ප්‍රතිලාභ ලැබී නොතිබූ බව නිරීක්ෂණය විය.

**සාමසාධක රාජකාරී සඳහා වාහන යොදා ගැනීම**

ව්‍යාපෘතිය වෙනුවෙන් මිලදීගන්නා ලද රු.මිලියන 1,264.02ක් වටිනා වාහන 53ක් 2018 වර්ෂයේ සිට විගණිත දිනය දක්වා කඳවුරු 17ක ගාල්කර තිබුණු අතර, එම වාහන නඩත්තු කටයුතු සඳහා 2024 දෙසැම්බර් 31 දක්වා වැය රු.මිලියන 3.02ක් වී තිබුණි.

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

**මෘදුකාංග සංවර්ධන කටයුතු**

2024 වර්ෂයේදී මෘදුකාංග සංවර්ධනය යටතේ වාහන නඩත්තු, ඉන්වෙන්ට්‍රි, මානව සම්පත් II, දත්ත සංක්‍රමණ මොඩියුලයන් ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 54.2ක් ඇස්තමේන්තු කර තිබුණි. එසේ වුවද අදාළ කාර්ය සැලසුම් කළ පරිදි ඉටුකර නොතිබුණි.

පිරිවැය රු.මිලියන 29.85ක් වූ මානව සම්පත් කළමනාකරණ මොඩියුලයෙහි අදියර-I ස්ථාපිත කිරීම වෙනුවෙන් 2023 දෙසැම්බර් 29 දින රු.මිලියන 16.20ක් ගෙවීම් කර තිබුණි. එහෙත් පද්ධතියට අදාළව සිදුකළ යුතුව තිබු UAT (User Accepting Testing) පරීක්ෂාව හා වගකිව යුතු නිලධාරියෙකුගේ විධිමත් නිර්දේශයකින් තොරව අදාළ ගෙවීම සිදුකර තිබුණි. 2025 ජූනි 30 දින දක්වා මෙම මොඩියුලය ආයතනය තුළ ස්ථාපිත කර භාවිතයටගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**මෙහෙයුම් කටයුතු**

**පරිගණකගත කිරීම**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් දෙපාර්තමේන්තුවේ ගමන් බලපත්, වීසා, පුරවැසි සහතික, ප්‍රත්‍යන්ත පාලන කටයුතු, පුද්ගල පරිපාලන ආදී කටයුතු රාශියක් පරිගණක පද්ධතිය ඇසුරින් සිදුකරනු ලැබීම සඳහා පුද්ගලික සමාගමක් සමඟ 2003 ජූනි 16 දින ගිවිසුමකට එළැඹ තිබුණි. ඒ සඳහා වූ පරිගණක පද්ධති නඩත්තු වියදම් ද ගෙවමින් 2003 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වසර 22 කාලයක් පුද්ගලික සමාගම වෙතින් සේවා ලබාගනිමින් තිබුණි. දෙපාර්තමේන්තුව විසින් අදාළ පරිගණක පද්ධති පවත්වාගෙන යාම මුළුමනින්ම දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

පද්ධති පවත්වාගෙන යාම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව සහ පුද්ගලික සමාගම සමඟ පවත්වාගෙන යනු ලබන ගිවිසුම් කාලානුරූපීව යාවත්කාලීන කිරීම සිදුකර නොතිබූ අතර, ගිවිසුම් කාලය අවසන් වී මාස කිහිපයකට පසුව පෞද්ගලික ආයතනය විසින් සකසන ලද ගිවිසුම හා ආයතනය සපයන සේවා සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව සෑහීමකට පත්වන බවට පාලක (තොරතුරු තාක්ෂණ) විසින් ලබාදෙන සහතිකය අනුව ගිවිසුම යාවත්කාලීන කර තිබූ අතර, ගිවිසුම අලුත් කිරීමේදී ජනවාරි 01 ලෙස පෙරදාතම දිනය යොදා ගිවිසුම අළුත්කර තිබුණි.

## පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

**ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම**

2016 අංක 08 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ 5(2)(1) වන හා 15(14) වන වගන්ති ප්‍රකාරව, ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන සහ වයස අවුරුදු 15ට එළැඹ ඇති හෝ එළැඹෙන සෑම තැනැත්තෙකුටම කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් එම තැනැත්තාට ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු වුව ද, 2024 ජනවාරි 01 දිනට ජාතික හැඳුනුම්පතක් නිකුත් නොකරන ලද අයදුම්පත් 1,055,461ක් පැවතුණි. සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව වෙත අයදුම්පත් 985,209ක් ලැබී තිබූ බැවින්, මුළු අයදුම්පත් 2,040,670ක් සඳහා ජාතික හැඳුනුම්පත් නිකුත් කළ යුතු වුව ද, 2024 වර්ෂය තුළදී නිකුත් කළ ජාතික හැඳුනුම්පත් ප්‍රමාණය 431,960ක් පමණක් වී තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට ජාතික හැඳුනුම්පතක් නිකුත් නොකරන ලද අයදුම්පත් 1,608,710ක් පැවති අතර, එදිනට දෙපාර්තමේන්තුව සතුව පැවති පෙර මුද්‍රිත කාඩ්පත් ප්‍රමාණය 667,820ක් පමණක් වී තිබුණි. ඒ අනුව ප්‍රමාණවත් පෙර මුද්‍රිත කාඩ්පත් ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණු බව නිරීක්ෂණය විය. මීට අමතරව 2024 වර්ෂයේදී පාසල් අයදුම්කරුවන් සඳහා තොරතුරු තහවුරු කිරීමේ ලිපි 588,402ක් නිකුත් කර තිබුණි.

## ශ්‍රී ලංකා පොලීසිය

**අනුමත කාර්යමණ්ඩලය**

ශ්‍රී ලංකා පොලීසිය ප්‍රාදේශීය පොලිස් කොට්ඨාශ 45කින් හා ක්‍රියාකාරී පොලිස් කොට්ඨාස 74කින් සමන්විත වන අතර, දිවයින පුරා පිහිටි පොලිස් ස්ථාන සංඛ්‍යාව 607ක් වේ. මෙම පොලිස් කොට්ඨාස හා පොලිස් ස්ථානයන්හි නිලඇඳුම් කාර්ය මණ්ඩලය ලෙස 79,718ක්ද, පොලිස් සහායක සේවා කාර්ය මණ්ඩලය ලෙස 1,114ක්ද සිවිල් කාර්ය මණ්ඩලය ලෙස 6,491ක්ද ලෙස එකතුව 87,323ක් සේවය කරන අතර සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව 27,849ක් විය. කෙසේ වුවද, පොලිස් කොට්ඨාස හා පොලිස් ස්ථානවල රාජකාරී ස්වභාවය පිළිබඳ අධ්‍යයනයකින් පසු නිශ්චිතව හඳුනාගත් අනුමත කාර්ය මණ්ඩලයක් නොතිබුණු බව නිරීක්ෂණය විය.

**නිද්‍රාජනක ද්‍රව්‍ය සිද්ධි සඳහා නඩු පැවරීම්**

ශ්‍රී ලංකා පොලීසිය මඟින් අත්අඩංගුවට ගනු ලබන නිද්‍රාජනක ද්‍රව්‍ය වන ගංජා, අබිං, හෂීෂ්, හෙරොයින්, මොෆීන්, කොකේන්, අයිස්, බාබුල්,

මාවා, මත්පෙති, මත්මුද්දර සහ වේදනා නාශක පෙති වැනි සිද්ධීන් සඳහා 2022 වර්ෂයේදී 142,632ක්ද, 2023 වර්ෂයේදී 175,781ක්ද සහ 2024 වර්ෂයේ 222,785ක්ද ලෙස නඩු පැවරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව 2022 වර්ෂයට සාපේක්ෂව 2024 සිද්ධීන් වාර්තා වීම සියයට 56කින් ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය විය.

**රිය අනතුරු**

2024 වර්ෂයේ මාරක රිය අනතුරු 2272ක් වාර්තා වී තිබුණු අතර, ඉන් මියගිය සංඛ්‍යාව 2381ක් විය. බරපතල තුවාල ලැබූ සංඛ්‍යාව 6,762ක් විය. පෙර වර්ෂයට සාපේක්ෂව මාරක රිය අනතුරු සියයට 3කින් ද, බරපතල තුවාල අනතුරු සියයට 10කින් ද, අනතුරු මඟින් මියගිය සංඛ්‍යාව සියයට 3කින් ද වැඩි වී තිබේ.

**ප්‍රසම්පාදනය**

ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් සැරයන් හා පොලිස් කොස්තාපල් නිලයන් සඳහා පීක් කැප් 75,000ක් විදේශීය සැපයුම්කරුවෙකුගෙන් ලබාගැනීම සඳහා එළඹ තිබූ රු.මිලියන 93.45ක් වූ ප්‍රසම්පාදන ගිවිසුම ප්‍රමාණාත්මක හේතු නොමැතිව ප්‍රතික්ෂේපකර 2011 අගෝස්තු 30 දින අවලංගු කිරීමට කටයුතු කර තිබුණි. මේ අනුව, සැපයුම්කාර ආයතනය විසින් එම ප්‍රසම්පාදනය අවලංගු කිරීම නීතිවිරෝධි බව සඳහන් කරමින් ශ්‍රී පොලිසියට විරුද්ධව බේරුම්කරණය සඳහා යොමුවී තිබුණු අතර, 2023 වර්ෂය දක්වාම බේරුම්කරණ ක්‍රියාවලිය තිරණය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම හේතුවෙන් 2023 ජනවාරි 26 දක්වා වූ කාලසීමාව සඳහා සැපයුම්කරුගේ ගබඩා ගාස්තු, නීති ගාස්තු සහ ප්‍රමාද වීම මත පොළිය හා විදේශ විනිමය අනුපාත වැඩිවීමේ අවාසිය ද ශ්‍රී ලංකා පොලීසියට දැරීමට සිදුවී තිබුණි. ඒ අනුව රු.මිලියන 289.13ක් ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙවා පීක් කැප් 60,000 ලබා ගැනීමට සිදුවී තිබුණි. ප්‍රසම්පාදනය අවලංගු කිරීම නිසා රු.මිලියන 93.45ක ප්‍රසම්පාදන වටිනාකම රු.මිලියන 289.13 දක්වා වර්ධනය වී තිබුණි. මේ අනුව රු.මිලියන 195.68ක මහජන මුදලක් අදාළ සැපයුම්කරු වෙත වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණු අතර, පීක් කැප් නිෂ්පාදනය කර වසර 12කට අධික කාලයක් ගතවීමෙන් පසු ශ්‍රී ලංකා පොලීසියට ලබාගැනීමට සිදුවී තිබුණි. මෙම පීක් කැප් තොගය භාවිතා කිරීමට නුසුදුසු තත්ත්වයෙන් පැවතුණු අතර, රු.මිලියන 12.67ක් වටිනා පීක් කැප් 3288ක් මුළුමනින්ම භාවිතයට ගත නොහැකි බැවින්, විනාශ කිරීම සඳහා ප්‍රධාන සැපයුම් ගබඩාවේ රඳවා තිබුණි.

**හබරාදූව "නිලසෙවන" නිවාස යෝජනා ක්‍රමය**

හබරාදූව "නිලසෙවන" යෝජනා ක්‍රමයෙන් නිවසක් රු.මිලියන 3.8 බැගින් රු.මිලියන 729.6කට නිවාස 192ක් මිලදී ගැනීමට 2017 දෙසැම්බර් 29 දින ගිවිසුමකට එළැඹ තිබුණි. 2019 අප්‍රේල් 02 දින වන විට රු.මිලියන 500ක අත්තිකාරම් ගෙවා තිබුණු අතර, මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වූ රාජ්‍ය සේවකයන් හට නිවාස ලබා දීම වුවත්, 2025 වර්ෂයේ ස්ථානීය විගණන පරීක්ෂණයක් සිදු කරන විටත් මෙම ව්‍යාපෘතියෙන් කිසිදු නිවසක් පොලිස් නිලධාරීන් හට පදිංචිය සඳහා ලබා දීමට නොහැකි වී තිබුණි. 2025 ජනවාරි මාසය වන විටත් මෙම නිවාස පවරා ගැනීමට අදාළ කාර්යයන් ද අවසන්ව නොතිබුණි. මෙම නිවාස ඒකක 128 සඳහා ගෙවිය යුතු මුදල රු.මිලියන 486.4ක් වුව ද, ඒ සඳහා ශ්‍රී ලංකා පොලීසිය රු.මිලියන 500ක් ගෙවා තිබීම නිසා රු.මිලියන 13.6ක රජයට අයත් මුදලක් බාහිර පාර්ශවයක් තුළ වසර 06කට වැඩි කාලයක් රඳවා තැබීමට ඉඩහැර තිබීම මඟින් රජයට මූල්‍යමය පාඩුවක් සිදුකර තිබුණු අතර, අත්තිකාරම් ඇප සුරැකුමද නිදහස් කිරීමට කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය.

**නාගරික රථවාහන ගොඩනැගිල්ල ඉදිකිරීම**

2006 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබූ කොළඹ නාගරික රථවාහන කොට්ඨාශයේ නවාතැන් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2024 ඔක්තෝබර් මාසය වන විට රු.මිලියන 237.73ක් කොන්ත්‍රාත්කරුට සහ රු.මිලියන 8.79ක උපදේශන සේවා ආයතනයට ගෙවා තිබුණි. එය එකඟ වූ වටිනාකමින් සියයට 61ක් පමණ වන නමුත්, ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 46ක් පමණ විය. 2021 වර්ෂයේ සිට ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබුණු අතර, වාණිජ මහාධිකරණයේ නඩු තීන්දුවක් ප්‍රකාරව ඉදිකිරීම් සමාගම ඈවරකර තිබීම හේතුවෙන් විධිමත් පරිදි ඉදිකිරීම් නොකිරීමේ වගකීම කොන්ත්‍රාත්කරුට පැවරිය නොහැකිව තිබුණි.

**ගොඩනැගිලි කුලියට ගැනීම්**

2024 වර්ෂය අවසාන වන විට ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් කාර්යාල 80ක්, පොලිස් ස්ථාන 121ක්, පොලිස් මුරපොල 15ක්, නිල නිවාස හා හට

නිවාස 106ක් සහ ගබඩා 09ක් පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිලි 331 කුලී ගෙවීමේ පදනමට ලබාගෙන තිබුණු අතර, 2024 වර්ෂය සඳහා ගොඩනැගිලි කුලිය ලෙස රු.මිලියන 738ක් ගෙවා තිබුණි. ඒ තුළ මාසයකට රු.මිලියන 10.4 බැගින් වර්ෂයකට රු.මිලියන 124.8ක් ගෙවා ශ්‍රී ලංකා පොලීසියේ නීති විරෝධි වත්කම් හෝ දේපොළ විමර්ශන කොට්ඨාසය, ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාසය, තැනැත්තන් වෙළෙඳාම් ජාවාරම මැඩලීම හා සමුද්‍රීය ආරක්‍ෂක කොට්ඨාසය සහ මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන කොට්ඨාසය පවත්වාගෙන යාම සඳහා කොළඹ 05 ප්‍රදේශයේ පෞද්ගලික සමාගමකට අයත් ගොඩනැගිල්ලක් ද විය.

**CCTV කැමරා පද්ධතියක් ස්ථාපිත කිරීම**

ජීවමාන වීඩියෝ දර්ශන ලබාගනිමින් ආවේක්ෂණ කටයුතු සිදුකිරීම, මාර්ග නීති උල්ලංඝණය කිරීම් නිරීක්ෂණය කිරීම සහ කොළඹ නගරයේ රථවාහන ගමනාගමනය පාලනය කිරීම, කොළඹ නගරයට පැමිණෙන සහ කොළඹ නගරයේ ජීවත්වන ජනතාවගේ සහ දේපොළවල ආරක්ෂාව තහවුරු කිරීම ආදී වූ සුවිශේෂ කාර්යභාරයන් ඉටුකිරීමේ අරමුණින් කොළඹ නගරයේ ප්‍රධාන ස්ථාන 33ක කැමරා 108ක් ස්ථාපිත කර තිබුණ ද, 2024 අගෝස්තු වන විට ඉන් ස්ථාන 06ක් සම්පූර්ණයෙන් ද ඇතුළුව ස්ථාන 23ක කැමරා 37ක් ද අක්‍රීය වී තිබුණි.

මෙම කැමරා පද්ධතිය ආරම්භ කරන කාලය වන විට පරිගණක මෙහෙයුම් පද්ධතිය (OS) ලෙස භාවිතා කරන ලද Windows XP යෙදුම භාවිතා කරමින් මෙහෙයුම් කටයුතු ආරම්භකර තිබුණු අතර, 2014 වර්ෂයෙන් පසු මයික්‍රොසොෆ්ට් ආයතනය Windows XP සඳහා ලබාදෙන පහසුකම් නවතා දමා තිබුණ ද, 2024 අගොස්තු 15 දින වන විටත් කැමරා පද්ධතිය Windows XP යෙදුම මඟින් මෙහෙයවමින් පැවතුණි. මෙසේ ඉතා පැරණි තාක්ෂණයක් භාවිතා කිරීම හේතුවෙන් කැමරා පද්ධතිය පවත්වාගෙන යාම දැඩි අපහසුතාවයකට පත්ව තිබුණු අතර, නව තාක්ෂණය කරා යොමුවීමේ අවශ්‍යතාවය විගණනය නිරීක්ෂණය කෙරේ.

# කම්කරු



## කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

**කම්කරු නීති සම්පාදනයේ ප්‍රමාදයන්**

රජයේ ජාතික ප්‍රතිපත්තිය මත පිහිටා කම්කරු විෂයන්ට අදාලව ප්‍රතිපත්ති සම්පාදනය, වැඩසටහන් සැලසුම් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසු විපරම දක්වා ඇතත්, වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි කම්කරු නීති ප්‍රතිසංස්කරණයන්ගෙන් (unified Labour Law Reform) අවසන්ව නොතිබීම හා 2024 වර්ෂයේ දී නව නීති සංශෝධනයන් 2 ක් පමණක් සිදුවී තිබුණි.

**කම්කරු වන්දි ගෙවීම් ක්‍රියාවලිය විධිමත් නොකිරීම**

නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම සහ තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යය ලෙස දක්වා තිබුණද, වන්දි ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව සේවක වන්දි ගෙවීම් ක්‍රියාවලිය අනුගමනය කිරීමේ දී දීර්ඝ කාලයක් ගතවීම සහ වන්දි කොමසාරිස් කාර්යාලයේ ලිපිගොනු තොරතුරු පරිගණක ගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබීම හේතුවෙන් යාවත්කාලීන තොරතුරු ලබා ගැනීමේ ප්‍රමාදයන් පැවතුණි.

**විගමනික හරසර වැඩසටහන පැවැත්වීම**

ආර්ථික අර්බුදය තුරන් කිරීමෙහිලා “විගමනික ශ්‍රමිකයන් විසින් ලබා දුන් මහඟු දායකත්වය ඇගයීම පිණිස විගමනික හරසර වැඩසටහනක් පැවැත්වීම” සඳහා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා 2024 ජුනි 26 දින ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශයට අදාලව දකුණු, උතුරු සහ බස්නාහිර පළාත්වල වැඩසටහන් තුනක් (03) පැවැත්වීමට අනුමැතිය ලබා දී තිබුණි. උතුරු පළාතේ උත්සවය සංවිධානය කිරීම වෙනුවට 2024 ජුලි 21 දින කුරුණෑගල (වයඹ පළාත) උත්සවයක් සංවිධානය කර පවත්වා තිබූ බව නිරීක්ෂණය වූ අතර, මෙම ක්‍රියාවලිය අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව ක්‍රියාකිරීමක් ලෙස නිරීක්ෂණය කෙරේ. විගමනික ශ්‍රමිකයන් උදෙසා උපහාර පැවැත්වීමට පවත්වන ලද විගමනික හරසර වැඩසටහන සඳහා රු.මිලියන 63ක මුදලක් උත්සවාකාර වැඩසටහන් වෙනුවෙන් වැයදරා තිබූ නමුත්, උත්සව අවස්ථාවේ ලබාදුන් අහාරපාන හැර ඉදිරි සුබසාධනය සඳහා ස්වයං රැකියා හෝ වෙනත් ප්‍රතිලාභ ලැබී

නොතිබුණි. ශ්‍රමිකයන් වෙත උපහාර පිදීම සඳහා ජනාධිපතිතුමාගේ, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගේ සහ රාජ්‍ය අමාත්‍යතුමාගේ සුභ පැතුම් තුනක් සහිතව ලිපිගොනුවක් ප්‍රදානය කිරීමට රු.මිලියන 1.93 ක වැය බරක් දරා තිබුණි. අදාල විගමනික ශ්‍රමිකයන් උත්සව සඳහා කැඳවාගෙන ඒමට බස්රථ 226ක් සඳහා ලංකා ගමනාගමන මණ්ඩලය වෙත රු.මිලියන 8.04ක් වැය කර තිබුණි.

## කම්කරු දෙපාර්තමේන්තුව

**පොදු තැන්පත් ගිණුම් ශේෂ නිරවුල් නොකිරීම**

කම්කරු දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම තුල 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 821.97ක් පැවති අතර 2015 ට පෙර පැවති EPF (වන්දි හා පාරිතෝෂික) හි එකතුව රු.මිලියන 7.02ක මුදල් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුනි. 2016 වර්ෂයේ සිට 2024 දක්වා පැවති රු.මිලියන 349.19ක මුදලින් 2025 අප්‍රේල් වන විට තවදුරටත් නිරවුල් කිරීමට ඇති ශේෂය රු.මිලියන 311.59ක් විය. 2024 වර්ෂයට අයත් හිමිකම් ගිණුම්වල කාර්යාල තුනක නියැදි පරීක්ෂාවකදී අදාල දිස්ත්‍රික් කාර්යාලවලට යවා ඇති නමුත් 2025 මැයි මාසය වන විටත්, මැද කොළඹ, බටහිර කොළඹ හා දකුණු කොළඹ කාර්යාලවලින් රු.මිලියන 2.16ක ශේෂයක් ගෙවීමට පැවතුනි.

## සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

**අනිවාර්ය ඉතුරුම් සෘජුවම බැංකු වෙත ප්‍රේෂණය නොකිරීම**

2024 දෙසැම්බර් 31 දිනට සමෘද්ධිලාභින්ගේ සහනාධාර මුදලින් අනිවාර්ය ඉතුරුම් ලෙස රඳවාගෙන බැංකු මූල්‍ය අංශය සතුව රු.මිලියන 30,356.57ක් වූ අනිවාර්ය ඉතුරුම් මුදල් පවතින අතර මෙම වටිනාකමින් රු.මිලියන 29.51ක් හඳුනා නොගත් අනිවාර්ය ඉතුරුම් මුදලක් පැවතුණි. මෙම සියළු මුදල් ආයෝජන වශයෙන් තැන්පත් කර තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනට ආයෝජන පොළිය රු.මිලියන 4,461.47ක් වේ. බැංකු මූල්‍ය අංශය විසින් 2024 වර්ෂයේ අනිවාර්ය ඉතුරුම් මුදල් ආයෝජන කර ඇතත් බැංකු වෙත ලබා දි ඇත්තේ සියයට 1 ක් වැනි අඩු පොලි අනුපාතයකි. නමුත් බැංකු විසින් අනිවාර්ය ඉතුරුම් සඳහා සමෘද්ධිලාභීන් වෙත ගෙවිය යුතු පොලිය අංක 2024/133/01 දරන කළමනාකරණ තීරණය ප්‍රකාරව සියයට 3.6 කි. අනිවාර්ය ඉතිරිකිරීම්

මුදල් සෘජුවම බැංකුව වෙත ප්‍රේෂණය නොකර බැංකු මූල්‍ය අංශය තුළ රඳවාගෙන ආයෝජනය කිරීම තුළින් ප්‍රජාමූල බැංකුව විසින්ම ආයෝජනය කර ලබාගත හැකි පොලී ආදායමට වඩා අඩු පොලියක් හිමිවීම හා එම මුදල් ජනතාවගේ ජීවනෝපාය සංවර්ධන කටයුතු වෙනුවෙන් ණයට දීමේ හැකියාව අවම වීම වැනි අවාසි සහගත තත්වයක් ද ඇති වී තිබුණි.

**නිරවුල් නොකල තැන්පතු ශේෂයන්**

පොදු තැන්පත් ගිණුමේ කාල විශ්ලේෂණ වාර්තා අනුව 2024 වර්ෂයට අදාලව ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල තැන්පත් වර්ග 04 ක් පවත්වාගෙන යන අතර එයට අදාල නිරවුල් නොකළ තැන්පත් ශේෂය රු.මිලියන 2,387.24කි. ඉන් අවුරුදු 1-2 අතර ශේෂය රු.මිලියන 2.03 ක්ද අවු 2-5 අතර ශේෂය රු.මිලියන 3.91ක්ද අවුරුදු 5 ට වැඩි ශේෂය රු.මිලියන 2,375.75 ක් ද විය.

**පනත ප්‍රකාරව අරමුදල පිහිටුවා නොතිබීම**

2013 අංක 1 දරන දිවිනැගුම ආඥාපනතේ 36 වගන්තිය යටතේ දිවිනැගුම සංවර්ධන අරමුදල පිහිටුවනු ලැබිය යුතු වන අතර, දෙපාර්තමේන්තුවට ලැබෙන සියළු ප්‍රදාන, ත්‍යාග පනත යටතේ පිහිටුවන ලද බැංකු හා බැංකු සමිති විසින් ත්‍යාග වෙනත් දායක මුදල්, බැංකුවල ලාභයෙන් අමාත්‍යවරයා නිශ්චය කරනු ලබන මුදල් ප්‍රතිශතයක් වශයෙන් සියළු ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැරකර ඉන් පසුව පාර්ලිමේන්තුවේ අනුමැතිය ඇතිව දිවිනැගුම සංවර්ධන අරමුදලට බැරකල යුතු වුවත් අරමුදල මේ දක්වා පිහිටුවා නොතිබුණි. දිවිනැගුම සංවර්ධන අරමුදල පිහිටුවීමට භාණ්ඩාගාරයේ විරෝධතාවයක් නොමැති බව 2021 මැයි 03 දින දන්වා තිබුණි.

**රටවිරු නිවාස ණය යෝජනා ක්‍රමය මඟින් අයවිය යුතු ණය ශේෂ අයකර නොගැනීම**

රටවිරුවන් සඳහා නිවාස ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර ණය ආපසු නොගෙවීම නිසා හෝ වෙනත් ක්‍රියාකාරකමක් නිසා සමෘද්ධි අධිකාරියට සිදුවන පාඩුවක් හෝ වියදමක් වෙතොත් එය බෙදී යන ආකාරයෙන් ක්‍රියා කිරීමට එකඟව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් 2013 වර්ෂයේදී රු.මිලියන 100ක මුදලක් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය වෙත ලබාදී තිබුණි. ඒ අනුව සමෘද්ධි බැංකු විසින් රටවිරුවන් 11,929 ක් සඳහා රු.මිලියන 3,547.13ක මුදලක් ණය

වශයෙන් නිකුත් කර තිබුණි. රට විරුවෝ නිවාස ණය ව්‍යාපෘතිය සඳහා සමෘද්ධි අධිකාරිය හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අතර 2012 මාර්තු 07 දින වසර 5 ක කාලයක් සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබූ අතර එය 2018 මාර්තු 06 දිනෙන් අවසන් වී තිබුණි. නව අවබෝධතා ගිවිසුම කඩිනමින් අත්සන් කර ණය ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබා දී තිබූ නමුත් දෙපාර්ශවය විසින් නව අවබෝධතා ගිවිසුමකට එළඹ නොතිබුණි. ඒ අනුව තවදුරටත් අයවිය යුතු ණය ශේෂය රු. මිලියන 102.59ක් වී තිබුණි.

**ප්‍රජාමූල බැංකුවල කොටස්කරුවන්ට ගෙවිය යුතු ලාභාංශ නොගෙවීම**

2015 වර්ෂයේ සිට 2022 දක්වා ප්‍රජාමූල බැංකු මූල්‍ය ප්‍රකාශන විගණනය කර සත්‍ය හා සාධාරණ මත නිකුත් කර ඇති මූල්‍ය ප්‍රකාශන 784 ක් අතරින් මූල්‍ය ප්‍රකාශන 34 ක බොල් ණය අනුපාත ඉහළ යාම හේතුවෙන් ලාභ විසර්ජනය සඳහා අවසර ලබා දී නොතිබුණු අතර 2025 පෙබරවාරි 27 දිනට ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත ලැබී තිබුණු විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන 9,441 කින් ලාභ විසර්ජනය සඳහා අවසර ලබා දී තිබුණේ මූල්‍ය ප්‍රකාශන 2,145 ක් සඳහා පමණි. මේ හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට කොටස්කරුවන්ට ගෙවිය යුතු රු.මිලියන 9,710ක ලාභාංශ ගෙවීමට නොහැකි වී තිබුණි.

## සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල

**අරමුදල මඟින් ප්‍රතිලාභීන්ට ප්‍රතිලාභ ගෙවීම සීමා වීම**

අරමුදලේ ප්‍රධාන අරමුණ ලෙස ස්වකීය ජීවන තත්ත්වය කිසියම් ආකාරයකින් අවගමනය වීමට ඉතා ආසන්න සුදුසු පවුල්වලට එකී අවගමනයට එරෙහි ආරක්ෂණ පියවරක් ලෙස මූල්‍යාධාර සැපයීම සිදු කරන ලදි. ඒ යටතේ ප්‍රධාන වශයෙන් උපත්, නිවුන්දරු උපත්, විවාහ, රෝහල් ගතවීම, මරණ සහ සිප්දොර ශිෂ්‍යත්ව වන අපේක්ෂිත හා අනපේක්ෂිත සිදුවීම් සඳහා රක්ෂණ ක්‍රමවේදයක් වශයෙන් ප්‍රතිලාභ ලබා දී තිබුණි. නමුත් සමෘද්ධි ප්‍රතිලාභ නතර වීම තුළ පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිලාභ ගෙවීම රු.මිලියන 1,422.44කින් එනම් සියයට 68 කින් අඩු වී තිබුණි. නමුත් මෙම වර්ෂයේ ප්‍රතිලාභී ගෙවීම් තුළ 2023 වර්ෂයට අදාළ ගෙවීම් ද ඇතුළත්ව තිබුණි.

## සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල

**අරමුදලේ ප්‍රධාන අයහාරය අහිමිවීම**

සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රතිලාභීන් 1,355 කට රු.මිලියන 662.60ක මුදලක් විශේෂ නිවාස වැඩසටහන යටතේ ලබා දී තිබුණු අතර ආයෝජන පොලී තුලින් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 355.37ක් පමණක් අරමුදලට ලැබී තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුලදී අරමුදලේ ආයෝජන මුදලින් රු.මිලයන 143.90ක් උපලබ්ධි කර තිබුණි. ඒ අනුව අරමුදලේ හා ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහන නතර වීම සමඟ අරමුදලේ ප්‍රධාන අයහාරය අහිමි වීම, අරමුණු ඉටුකර ගැනීම සඳහා අරමුදලේ පැවැත්ම පිළිබඳ ගැටළුකාරී තත්ත්වයක් මතු වී තිබුණි.

## ශ්‍රම ව්‍යසනා අරමුදල

**පාසල් උපකරණ බෙදාහැරීමේ දුර්වලතා**

ව්‍යසන අවස්ථාවලදී සේවා නියුක්තිකයන්ට හෝ ඔවුන්ගේ යැපෙන්නන්ට මූල්‍යමය හා වෙනත් ප්‍රතිලාභ සැපයීම සඳහා ශිෂ්‍යත්ව වැඩසටහනට හා ආපදා සහන වැඩසටහනට රු.මිලියන 8 ක් වෙන් කර තිබුණද, සැලසුම් කර තිබූ ශිෂ්‍යත්ව 100 න් 9 ක් පමණක් ලබා දී තිබූ අතර මේ සඳහා රු.මිලියන 0.47ක් පමණක් වැය කර තිබුණි.

## සේවක අර්ථ සාධක අරමුදල

**සාමාජිකයින්ගේ කේවල ගිණුම්වලට බැර නොවූ මුදල්**

2024 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදලෙහි සාමාජික ගිණුම් ශේෂය වූ රු.මිලියන 4,289,544න් රු.මිලියන 91,943ක් විවිධ හේතු මත එක් එක් සාමාජික ගිණුම්වලට බැර කිරීමෙන් තොරව පැවතුණි.

සාමාජික අරමුදල තුල ඇති කම්කරු කොමසාරිස් ගිණුමේ සේවායෝජකයින්ට එරෙහිව නඩු පැවරීමෙන් අයකරගෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ රඳවාගෙන ඇති රු.මිලියන 13,393ක්, නඩු පැවරීමෙන් අයකරගෙන නිරවුල් කරන තුරු කම්කරු දෙපාර්තමේන්තුවේ පොදු තැන්පතු ගිණුමක රඳවාගෙන තිබූ රු.මිලියන 388ක් හා සේවායෝජකයින්ගේ නමින් වෙන් වෙන්ව පවත්වාගෙන යනු ලබන

"ජංගම වර්ෂයේ දායක මුදල් අංක 01" නමින් වූ ගිණුමේ 2024 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 74,849ක ශේෂය අදාළ සාමාජිකයන් වෙත විභජනය කර නොතිබුණි. විවිධ හේතු මත සාමාජිකයින්ට නොගෙවා රඳවාගත් ප්‍රතිලාභ හා හිමිකම් නොපෑ ප්‍රතිලාභ වශයෙන් 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1,074ක් ද, ඌන/ අතිරික්ත දායක මුදල් හා ප්‍රතිලාභ ගෙවීම් වශයෙන් පිළිවෙලින් රු.මිලියන 2,753ක් හා රු.මිලියන 514ක් ද සාමාජික අරමුදල යටතේ තවදුරටත් නිරවුල් කිරීමට පැවතුණි.

**සේවක අර්ථසාධක අරමුදලෙහි ආයෝජන මත ප්‍රතිලාභ අඩුවීම**

අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට ලැයිස්තුගත සමාගම් 22ක සිදුකර තිබූ රු.මිලියන 19,970ක් වූ සාමාන්‍ය කොටස් ආයෝජනයන් සඳහා 2024 වර්ෂයේදී ද, ලැයිස්තුගත සමාගම් 9ක සිදුකර තිබූ රු.මිලියන 6,936ක් ක්වූ සමාන්‍ය කොටස්වල ආයෝජනයන් සඳහා 2019 වර්ෂයේ සිට 2024 දක්වා ලාභාංශ ආදායම් ලැබී නොතිබුණි. ඉදිකිරීමට නියමිත හෝටල් සංකීර්ණයක් වෙනුවෙන් 2013 වර්ෂයේදී ලැයිස්තුගත නොවූ සමාගම්වල රු.මිලියන 5,000 ක් ආයෝජනය කර තිබූ අතර ආයෝජනය සිදු කර වර්ෂ 11 ක් ගත වී තිබුණද එම හෝටල් සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු මේ දක්වාම ආරම්භ නොවීම හේතුවෙන් ආයෝජනයෙන් කිසිදු ප්රතිලාභයක් අරමුදලට ලැබී නොතිබුණි.

**සේවක අර්ථසාධක අරමුදලෙහි ලියාපදිංචි විය යුතු සේවායෝජකයින් ලියාපදිංචි කර නොගැනීම**

සේවක අර්ථසාධක අරමුදලෙහි ලියාපදිංචි නොවී සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි පමණක් ලියාපදිංචි වී තිබූ සේවායොජකයින් සංඛ්‍යාව 2024 දෙසැම්බර් 31 දිනට 22,764ක් වූ අතර එම සේවායෝජකයන්ගෙන් එදිනට සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලයට ලැබී තිබූ දායක මුදල්වල එකතුව රු.මිලියන 505ක් විය. ඒ අනුව එම සේවායෝජකයින් අතරින් අරමුදලෙහි ලියාපදිංචි විය යුතු එහෙත් ලියාපදිංචිවීම පැහැර හැර ඇති සේවායෝජකයින් හඳුනාගෙන ලියාපදිංචි කිරීම සඳහා මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය වී සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි.

**සේවක අර්ථසාධක අරමුදලෙහි ලියාපදිංචි සේවායෝජකයින් සම්බන්ධව අධීක්ෂණයක් නොතිබීම**

සේවක අර්ථසාධක අරමුදලේ ලියාපදිංචි සෑම සේවායෝජක ආයතනයක්ම දිස්ත්‍රික් කම්කරු කාර්යාලයකට හා කම්කරු නිලධාරියෙකුට වෙන්කර කාලීනව අධික්ෂණය කල යුතු වුවද, සේවක අර්ථසාධක අරමුදල් අධීක්ෂණ දත්ත පද්ධතිය අනුව කම්කරු දෙපාර්තමේන්තුවේ කලාප 24ට අදාලව අරමුදලෙහි ලියාපදිංචි සේවායෝජක ආයතන 81,987 කට වැඩි ප්‍රමාණයක් උප කලාපවලට වෙන් කර නොතිබුණ අතර ඉන් ආයතන 76,306 ක් සක්‍රිය ආයතන ලෙසද ආයතන 7,335 ක් අක්‍රිය ආයතන ලෙසද නිරික්ෂණය විය. එම සක්‍රිය ආයතනවලින් ආයතන 75,675 ක් සඳහා එසේ කම්කරු නිලධාරියෙකු නම් නොකිරිම හේතුවෙන් එම ආයතන සම්බන්ධයෙන් අධික්ෂණයක් සිදු වී නොතිබුණි.

## ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

**අපේක්ෂිත අරමුණු ඉටු නොකිරීම**

1999 අංක 33 දරන පනතින් සංශෝධිත 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩල පනත හා 2006 සැප්තැම්බර් 25 දිනැති අංක 1464/05 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද රෙගුලාසි අංක 04 අනුව ව්‍යවස්ථාපිත ප්‍රධාන අරමුණ වන විශ්‍රාම වැටුප් හිමිකම ලබා නොසිටින හෝ විශ්‍රාම වැටුප් සහිත තනතුර නොදරන සියලු සේවා නියුක්තිකයන් වෙත සමාජ ආරක්ෂණ හා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම. ඒ අනුව ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ට සලසා දීමට අපේක්ෂිත අරමුණු ඉටු නොකිරීම හේතුවෙන් කාර්ය සාධනය අපේක්ෂිත මට්ටමට වඩා අඩු ප්‍රමාණයක පැවතුණි.

**විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වූ සාමාජිකයන් ඉවත්වීම**

සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට විශ්‍රාම වැටුප් ක්‍රමයට නව දායකයින් බඳවා ගැනීමේදී අය කල පළමු වාරික මුදල් එකතුව රු.මිලියන 163.29ක් වූ අතර වාර්ෂික රැස් කිරීම් රු.මිලියන 261.77ක් විය.2024 වර්ෂයේ අරමුදලේ ආදායම වූ රු.මිලියන 769.55ක මුදල සාමාජිකයින්ගේ දායක මුදලින් හා ආයෝජන පොලී ආදායම්වලින්

සමන්විත වූ අතර ප්‍රධාන ආදායම වන සාමාජිකයින්ගේ දායක මුදල්වලින් සමාලෝචිත වර්ෂය තුළදී සාමාජිකයන් 539 ක් විශ්‍රාම වැටුප හිමිවන දිනට පෙර හා පසු ඉවත්වීම හේතුවෙන් රු.මිලියන 22.12ක් ආපසු ගෙවා තිබුණි.

## සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් මණ්ඩලය

**සාමාජිකයින්ගේ ගිණුම්වලට බැර නොකල දායක මුදල්**

සේවායෝජකයින් විසින් මණ්ඩලය වෙත ප්‍රේෂණය කරනු ලබන සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් ඒ ඒ සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර කළ යුතු වුවද, 1981 සිට 2014 වර්ෂය දක්වා හා 2015 සිට 2023 වර්ෂය දක්වා පිළිවෙලින් රු.මිලියන 14ක් හා රු.මිලියන 597 ක් බැර කර නොතිබුණි.

**ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීමට අපොහොසත් වීම**

නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් මණ්ඩලයේ කාර්යයන් හා සේවාවන්හි කාර්යක්ෂමතාව හා ඵලදායිතාවය වැඩි කිරීම සඳහා මණ්ඩලය හා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය අතර 2016 නොවැම්බර් 27 දින ගිවිසුමකට එළඹ 2021 ඔක්තෝබර් ව්‍යාපෘති කටයුතු නිම කිරීමට සැලසුම් කර තිබුණි. එමෙන්ම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ඉතා අත්‍යවශ්‍යයැයි හඳුනාගනු ලැබූ දෘඩාංග මිලදී ගැනීම වෙනුවෙන් රු.මිලියන 145.7ක් වැය කර තිබුණද, ඉන් රු.මිලියන 18.6ක් වටිනා උපකරණ 2025 මාර්තු අවසානය වන විටත් ගබඩාවේ නිෂ්කාර්යව රඳවා තිබුණි. සේවා ඒකක පිහිටුවීම දැනට පවතින පද්ධතියෙන් නව පද්ධතියට නිවැරදි දත්ත මාරු කිරීම් කටයුතු, විභජනය නොවූ දායක මුදල් හා Lanka Clear සම්බන්ධ කටයුතු නිමකර අරමුණු ඉටුකර ගැනීමට මණ්ඩලය මේ දක්වා අපොහොසත් වී තිබුණි.

**නිෂ්කාර්ය වත්කම්**

මිලදී ගැනීමේ අවශ්‍යතා ප්‍රමාණ නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම මත 2018 වර්ෂයේ සිට 2024 දක්වා මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා බෙදා දීමට මිලදීගෙන තිබූ වටිනාකම රු.මිලියන 3.5 ක් වූ නිල ඇඳුම් තොගයක් වසර 2 ත් - 6 ත් අතර කාලයක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව ගබඩාවේ රඳවා තිබුණි.

**විභජනය නොකල මුදල්**

2022 දෙසැම්බර් 22 දිනැති අංක 2311/39 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව 2023 පෙබරවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි අවම වශයෙන් සේවා නියුක්තිකයන් 15 ක් තම සේවයේ නියුක්තව සිටින සෑම සේවායෝජකයකුම ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් මණ්ඩලය වෙත දායක මුදල් හා මාසික වාර්තා ඉදිරිපත් කළයුතු අතර ප්‍රමාදයකින් තොරව දායක මුදල සාමාජිකයන්ට විභජනය කිරීමට සැලැස්වීම මෙම ක්‍රියාමාර්ගයේ මූලික අරමුණු වී තිබුණද සක්‍රීය හා අක්‍රීය ආයතනවලට අදාලව විභජනය නොකල මුදල 2015 වර්ෂයේ සිට 2022 හා 2023 වර්ෂයට අදාලව පිළිවෙලින් රු.මිලියන 171 හා රු.මිලියන 117 වී තිබුණි.

## ආසියානු සංවර්ධන බැංකුවේ ණය ආධාර මත සිදුකරනු ලැබූ ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

### විගණන නිරීක්ෂණ

**වයස අවුරුදු 70 ට වඩා වැඩි වැඩිහිටි පුද්ගලයන් සඳහා දීමනා ගෙවීම්**

(i) අඩු ආදායම්ලාභී වැඩිහිටි පුද්ගලයන්ගේ දීමනා ගෙවීම් කිරීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තුගත කළ ප්‍රතිලාභීන් සංඛ්‍යාව එක් එක් මාසය සඳහා 132,500ක ප්‍රමාණයක් බැගින් වුවද ගෙවීම් කිරීම සඳහා සමෘද්ධි බැංකු වෙත මුදල් බැර කරන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව 115,000 කට ආසන්න සංඛ්‍යාවක් වූයෙන් අදාල ඇස්තමේන්තු කිරීම් සියයට 13ක පමණ ඉහළ අගයක් ගන්නා ලද බව නිරීක්ෂණය විය.

(ii) ශ්‍රී ලංකාවේ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පවතින ප්‍රධාන ආයතනය වන ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ තොරතුරු ප්‍රකාරව සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා එක් එක් මාසය වෙනුවෙන් හඳුනාගත් පොරොත්තු ලේඛන ගත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 131,978 ක් වුවද 2022 සැප්තැම්බර්, ඔක්තෝබර් සහ නොවැම්බර් මාස සඳහා පිළිවෙළින් 115,037, 115,018ක් හා 115,753 ක් වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාවකට ගෙවීම් කිරීම සඳහා සමෘද්ධි බැංකු වෙත මුදල් බැර කර තිබුණි. ඒ අනුව හඳුනාගත් පොරොත්තු ලේඛන ගත ප්‍රතිලාභීන් සහ බැංකු වෙත මුදල් බැර කරන ලද ප්‍රතිලාභීන් අතරෙහි සියයට 13ක පමණ වෙනසක් නිරීක්ෂණය විය.

(iii) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2022 සැප්තැම්බර්, ඔක්තෝබර් සහ නොවැම්බර් මාස සඳහා ගෙවීම් කිරීම සඳහා සමෘද්ධි බැංකු වෙත මුදල් බැර කරන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාවත් සමෘද්ධි බැංකු විසින් සත්‍ය වශයෙන් මුදල් ගෙවන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාවත් සසඳා බැලීමේදී, අතිරේක දීමනා (top-up) සඳහා බැංකු වෙත මුදල් බැර කර ඇති ප්‍රමාණය සියයට 11 සිට 13 ක පමණ ඉහළ අගයක් ගන්නා බවත් පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් වූ කළ එය සියයට 28 ක පමණ ඉහළ අගයක් ගන්නා බවත් නිරීක්ෂණය විය. මේ හේතුවෙන් ගෙවීම් කිරීමට සමෘද්ධි බැංකු වෙත බැර කරන ලද මුදල්වලින් අතිරේක දීමනා සියයට 11-14 අතර ප්‍රමාණයක්ද පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභී දීමනා සියයට 28ක පමණ ප්‍රමාණයක්ද සමෘද්ධි බැංකු වෙත ඉතිරිවී ඇති බවත් ඒ අනුව සත්‍ය වශයෙන් ගෙවිය යුතු ප්‍රතිලාභීන් නිවැරදිව හඳුනාගැනීමක් වී නොමැති බවත් නිරීක්ෂණය විය.

**ප්‍රතිලාභීන් ද්විකරණය වීම්**

(i) ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැඩිහිටි අතිරේක දීමනා(top-up) ගෙවීම් සඳහා ලැබී තිබූ මුදලින් සමාලෝචිත කාලපරිච්ඡේදයේ සෑම මසක් අවසානයටම සියයට 10කට ආසන්න මුදලක් ඉතිරිව තිබූ අතර ප්‍රතිලාභීන් ද්විකරණය වී තිබීම මෙම තත්ත්වයට හේතු වී තිබූ බව නිරීක්ෂණය විය. එසේම පොරොත්තු ලේඛනය ප්‍රතිලාභීන් සඳහා ලැබී තිබූ මුදලින්ද සමාලෝචිත කාලපරිච්ඡේදයේ සෑම මසක් අවසානයටම සියයට 14ත් 18ත් අතර ප්‍රමාණයක් ඉතිරිව තිබූ අතර ඒම තත්ත්වයටද ප්‍රතිලාභීන් ද්විකරණය වී තිබීම හේතු වී තිබූ බව නිරීක්ෂණය විය.

(ii) අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේද අතිරේක දීමනා ගෙවීම් සඳහා ලැබී තිබූ මුදල්වලින් සියයට 06ත් 08ත් අතර ප්‍රමාණයක් ඉතිරිව තිබූ අතර මෙම තත්ත්වයටද ද්විකරණය වීම් හේතු වී තිබුණි.

(iii) පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැඩිහිටි අතිරේක දීමනා ගෙවීම සඳහා ලැබී තිබූ මුදලින් සෑම මාසයක් අවසානයටම සියයට 33කට ආසන්න මුදලක් ඉතිරිව තිබූ අතර ප්‍රතිලාභීන් ද්විකරණය වීම හේතු වී තිබුණි.

(iv) ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් සඳහා ගෙවීමට ලැබී තිබූ මුදලින් සියයට 12කට ආසන්න ප්‍රමාණයක් සෑම මසක් අවසානයේම ඉතිරිව තිබූ අතර මෙම තත්ත්වයටද ප්‍රතිලාභීන් ද්විකරණය වීම් හේතු වී තිබුණි.

2022 වසර අවසාන වන විට සමෘද්ධි බැංකුව වෙත ඉතිරිව තිබූ මුදල් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ගෙන්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන තිබුණද අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ප්‍රතිලාභීන් නිවැරදිව හඳුනාගැනීමට කටයුතු නොකිරීම මෙසේ ද්විකරණයක් ඇතිවීමට හා සමෘද්ධි බැංකු වෙත වැඩිපුර මුදල් ගලායෑමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

**ගෙවීම් කිරීමේ දී ඒකාකාරී ක්‍රමයක් අනුගමනය නොකිරීම**

මෙම ව්‍යාපෘතිය යටතේ දීමනා ලබා දීමේදී එතෙක් වැඩිහිටි දීමනා වැඩසටහනට ඇතුලත්ව සිටි වැඩිහිටියන් මෙන්ම පොරොත්තු ලේඛනගතව සිටි වැඩිහිටියන්ද සමෘද්ධි බැංකු ගිණුමක් ආරම්භ කල යුතුව තිබුණි. මෙම ක්‍රමය මගින් අපේක්ෂා කර තිබුණේ පවත්නා මුදල් මාරු කිරීමේ ක්‍රමවේදයන් (Existing Cash Transfer Mechanisms) නිරනුකූල (Streamline) කිරීම වේ.

ඒ අනුව වැඩිහිටියන් සඳහා දීමනා ලබා දීමේදී සැප්තැම්බර්, ඔක්තෝබර් හා නොවැම්බර් මාසවලට අදාලව වැඩිහිටි දීමනා සමෘද්ධි බැංකු හරහා ගෙවීමට කටයුතු කර තිබුණද 2022 දෙසැම්බර් හා 2023 ජනවාරි සඳහා රජය ප්‍රතිපාදන මගින් ලබා දී තිබූ දීමනා නැවතත් පෙර පරිදිම තැපැල් කාර්යාල හරහා ලබා දීමට කටයුතු කර තිබූ බව භෞතික පරීක්ෂණයන් සිදුකළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාලව කළ පරීක්ෂාවන්හී දී නිරීක්ෂණය විය.
මේ අනුව සමෘද්ධි බැංකු ගිණුම් ආරම්භ කර ගෙවීම තුලින් අපේක්ෂා කරන ලද පවත්නා මුදල් මාරු කිරීමේ ක්‍රමවේදයන් නිරනුකූල කිරීමේ (Streamline) අරමුණෙන් බැහැර වන බව නිරීක්ෂණය විය.

විගණනයේ දී තෝරා ගත් දිස්ත්‍රික්ක අනුව ප්‍රතිලාභ සැලසුම් කිරිම හා ප්‍රතිලාභ ගෙවීමේදී හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය ඉල්ලුම් කළ ප්‍රතිලාභීන්ට

වඩා ප්‍රතිලාභීන් 5ක් වෙනුවෙන්  මුදල් ගෙවා තිබුණු අතර අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල හා මඩකලපුව දිස්ත්‍රික්ක සඳහා ප්‍රතිලාභීන් 418ක් සඳහා මුදල් ප්‍රමාණවත් වී නොතිබුණි.

# ක්‍රීඩා සහ තරුණ කටයුතු

## තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

ජාතික ආර්ථිකයට සක්‍රියව දායකත්වයක් ලබාදෙන තරුණ ප්‍රජාවක් බිහිකිරීම හා විනය ගරුක, ක්‍රීඩාශීලී සමාජයක් තුළින් ඒකාබද්ධ හා සමෘද්ධිමත් දේශයක් ගොඩනැගීමට දායක වීම තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ මෙහෙවර වී තිබුණි. එම ප්‍රතිඵලය අත්කර ගැනීම සඳහා තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තුමේන්තුව ඇතුළුව ව්‍යවස්ථාපිත ආයතන 11ක්, ක්‍රීඩා අරමුදලක් හා දැනට ක්‍රියාකාරී තත්ත්වයේ පවතින ක්‍රීඩා සංගම් 67ක් ක්‍රියාත්මකව පැවතුණි.

2024 වර්ෂයේ දී තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තුමේන්තුව වෙත එකතුව රු.මිලියන 12,540ක ශුද්ධ ප්‍රතිපාදන පාර්ලිමේන්තුව මගින් ලබා දී තිබුණු අතර 2024 වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 3,708ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තරය රූසටහනෙහි දැක්වේ.

**රූපසටහන 2.40 - තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තුමේන්තුව වෙත 2024 වර්ෂය සඳහා ලබා දී තිබුණු ශුද්ධ ප්‍රතිපාදන හා වැය කිරීම්**




| | ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන | වියදම | ඉතිරිය |
|---|---|---|---|
| තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය | 9,758 | 6,325 | 3,433 |
| ක්‍රීඩා සංවර්ධන දෙපාර්තුමේන්තුව | 2,782 | 2,507 | 275 |
| එකතුව | 12,540 | 8,832 | 3,708 |

මූලාශය : **තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයෙ හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තුමේන්තුවේ 2024 මූල්‍ය ප්‍රකාශන**

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තුමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන නියැදි විගණනයේ දී අනාවරණය වූ වැදගත් හා ප්‍රමාණාත්මක විගණන නිරීක්ෂණ සම්පිණ්ඩනය කර පහත දක්වා ඇත.

## විගණන නිරීක්ෂණ

**ජාත්‍යන්තර ජයග්‍රහණ**

2024 වර්ෂයේ දී ශ්‍රී ලංකා ක්‍රීඩකයින් ප්‍රධාන ජාත්‍යන්තර තරඟාවලි 26කට සහභාගී වී ජයග්‍රහණ ලෙස රන් 17ක්, රිදී 24ක් සහ ලෝකඩ 23ක් වශයෙන් පදක්කම් 64ක් ලබා ගෙන තිබුණි. තව ද ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායම විසින් 2024 ආසියානු ශූරතාවය ද, ශ්‍රී ලංකා පිරිමි ක්‍රිකට් කණ්ඩායම විසින් නවසීලන්තය සමඟ පැවති ටෙස් තරඟාවලි ශූරතාවය ද, 20න් පහල මධ්‍යම ආසියානු කාන්තා වොලිබෝල් කණ්ඩායම අනුශූරතාවය ද, ශ්‍රී ලංකා නෙට්බෝල් කණ්ඩායම විසින් ආසියානු අනුශූරතාවය ද දිනා ගැනීමට සමත් වී තිබුණි.

## තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

**වාහන භෞතිකව නොපැවතීම**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් තොරතුරු අනුව ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් නමින් ලියාපදිංචි කළ වාහන 17ක් අමාත්‍යාංශය සතුව භෞතිකව නොතිබුණු අතර එම වාහන වර්තමානයේදී කුමන ආයතන සතුව පවතින්නේ ද යන්න පිළිබඳව සොයා බලා නැවත අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට හෝ අදාළ ආයතනවලට පවරා දීමට හෝ කටයුතු කර නොතිබුණි.

**කාර්යභාරයන් ඉටු නොකිරීම**

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් අතරින් පොදු මහජනතාවගේ ශාරීරික සුවතාවය සැලසීමට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය කිරීම සහ දේශීය, විදේශීය රැකියා අවස්ථා සඳහා ගැලපෙන පරිදි තරුණ මානව සම්පත් බැංකුවක් ආරම්භ කිරීම යන කාර්යයන් ඉටු කරගැනීමට අමාත්‍යාංශය මේ දක්වා කටයුතු කර නොතිබුණි.

**සම්බන්ධිත පාර්ශ්වයන්ගේ එකඟතාවයෙන් තොරව ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

ක්‍රීඩා අමාත්‍යාංශයට අයත් හෙක්ටයාර් 34.5ක් වන නුවරඑළිය ඉඩමක ඉදිකිරීමට යෝජිතව තිබූ උන්නතාංශ ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ණය සැලසුම් ගාස්තු ලෙස යුරෝ 264,492.34ක් එනම් රු.මිලියන 51.05ක් ගෙවා තිබුණත්, 2021 වර්ෂයේදී ව්‍යාපෘතිය නවතා දැමීම හේතුවෙන් ඒ සඳහා වැය කළ මුළු වියදම නිෂ්කාර්ය වී තිබුණි. ඊට අමතරව මෙම ව්‍යාපෘතිය අතරමඟ නවතා දැමීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් යුරෝ 23,026,417.76ක වන්දි මුදලක් ද

ව්‍යාපෘතියේ උපදේශන ආයතනය වන මොරටුව විශ්ව විද්‍යාලය විසින් රු.මිලියන 378.07ක වන්දි මුදලක් ද ඉල්ලුම් කර තිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය අවලංගු කිරීම හේතුවෙන් කොන්ත්‍රාත් සහ උපදේශන ආයතන විසින් ඉදිරිපත් කල හිමිකම් පෑම අධ්‍යනය සඳහා විශේෂඥ උපදේශනයට 2024 වර්ෂය තුල රු.මිලියන 3.65ක් ද ගෙවා තිබුණි.

**අරමුදල් ඌණ උපයෝජනය**

ක්‍රිකට් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම තුලින් ප්‍රාදේශිය මට්ටමින් ක්‍රිකට් ක්‍රිඩාව ඉහල නංවා කුසලතා සහිත ක්‍රිකට් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 3000ක් හඳුනා ගැනීමේ අරමුණ ඇතිව රු.මිලියන 1,500ක ප්‍රතිපාදනයන් 2024 වර්ෂය තුල වෙන් කරවාගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය පාසල් 373ක ක්‍රියාත්මක කිරීම සඳහා ඉන් රු.මිලියන 507.88ක් පමණක් උපයෝජනය කර තිබූ අතර රු.මිලියන 992.12ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය. තව ද, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල පාසැල් බොහෝමයක ව්‍යාපෘතිය යටතේ වූ කාර්යයන් සාර්ථකව නිම කර නොතිබූ බවද නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

## ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

**අවිධිමත් ගනුදෙනු**

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තුමේන්තුව, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය හා පෞද්ගලික සන්නිවේදන සමාගමක් එක්ව සංවිධානය කර රු.මිලියන 39.06ක් වැය කර ශ්‍රී ලංකා ස්පෝට් ෆියෙස්ට්‍රා වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. එසේ වුවද, ඉහත ආයතන අතර ගිවිසුමකට එළඹ නොතිබුණු අතර පෞද්ගලික සන්නිවේදන සමාගමක් මඟින් වැඩසටහන සඳහා ලබා දී තිබුණු දායකත්වය හා වැඩසටහන ක්‍රියාත්මක කළ දින 03 තුල පවත්වා ගෙන ගොස් තිබුණු ආහාර පාන අළෙවි සැල් තුලින් උපයා ගන්නා ලද කිසිදු ආදායමක් හෝ අනුග්‍රාහක මුදලක් දෙපාර්තමේන්තුව වෙත ලැබි නොතිබුණි.

මෙම වැඩසටහනට සමගාමීව පැවැත්වීමට සැලසුම් කල ක්‍රීඩා තරඟාවලි සඳහා රු.මිලියන 16.8ක මුදලක් නිදහස් කර තිබුණද එයින් රු.මිලියන 3.5ක් වැය කර පැවැත්වීමට සැලසුම් කරන ලද හොකී තරඟය පවත්වා නොතිබීම හේතුවෙන් ඒ වෙනුවෙන් වැය කර තිබූ රු.මිලියන 1.53ක මුදලක් නිශ්කාර්ය වී තිබුණි.

මෙම වැඩසටහන පැවැත්වීම සඳහා කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව ඉසව් කළමනාකරණ ආයතනයක් තෝරා ගෙන තිබුණු අතර එම ආයතනයෙන් ලබාගත් සේවාවලට සමාන සේවාවන් ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම විසින්ද ලබා දී තිබීමෙන් එම ආයතනයට ගෙවන ලද රු.මිලියන 19.19ක වියදම් විනිවිදභාවයකින් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය.

වැඩසටහන පැවැත්වීමට නියමිතව තිබූ දින කිහිපයකට පසු ජනාධිපතිවරණය කැඳවීමට නියමිතව තිබූ බැවින් ක්‍රීඩා උළෙලට සමගාමීව ක්‍රියාත්මක කිරීමට යෝජිත සංගීත සංදර්ශනය නොපවත්වන ලෙස මැතිවරණ කොමිෂන් සභාව විසින් දැනුම් දී තිබියදී එම උපදෙස්වලට පටහැනිව ආහාර ප්‍රවර්ධන වැඩසටහන්, සංගීත සංදර්ශන යනාදිය පවත්වා තිබුණු අතර ඒ සඳහා ජාතික තරුණ සේවා සභාව හා තරුණ සේවා පුද්ගලික සමාගම විසින්ද රු.මිලියන 16.32ක් වියදම් කර තිබුණි.

**මාතලේ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය**

මාතලේ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ අත්හිට වූ ව්‍යාපෘති දෙකක් වෙනුවෙන් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයෙන් අයකර ගැනීමට ඇති රු.මිලියන 6.4ක් වූ අත්තිකාරම් මුදල් අදාළ ආයතනය බුන්වත් වීම නිසා අයකර ගැනීමට නොහැකිව පැවතුණි.

**වැඩිදියුණු කිරීමේ වැය වත්කම් ලෙස ගිණුම්ගත නොකිරීම**

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තුමේන්තුව විසින් වර්ෂ කිහිපයකට පෙර ඉදි කරන ලද ටොරින්ටන් හොකී ක්‍රීඩාංගනය සහ මාතලේ හොකී ක්‍රීඩාංගනය වැඩිදියුණු කිරීම සඳහා 2024 වර්ෂයේ දී පිළිවෙළින් රු.මිලියන 154.19ක් හා රු.මිලියන 165.7ක් වැය කර තිබුණ ද වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

**විධිමත් දත්ත පද්ධතියක් පවත්වා නොගැනීම**

නිපුණතා සහිත මලල ක්‍රීඩකයන් හඳුනාගැනීම සඳහා සෑම ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයක්ම ක්‍රීඩකයන්ගේ හැකියාවන් හා නිපුණතාවයන් වැඩිදියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් සැපයීම හා ක්‍රීඩකයන්ගේ ජීව දත්ත, සහභාගි වූ තරඟ අවස්ථා, ක්‍රීඩා තරඟ තරඟාවලීන්, නියෝජනය කළ කණ්ඩායම්, ඔවුන්ගේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු සහ තේරීම්, ශ්‍රේණිගත කිරීම් හා වර්ග කිරීම්වලින් සමන්විත විධිමත් දත්ත පද්ධතියක්

පවත්වාගෙන යා යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් එලෙස කටයුතු කර නොතිබුණි.

**ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල නොවීම**

2024 වර්ෂයේදී ක්‍රීඩා උපකරණ කට්ටල 200ක් මිලදී ගැනීම සඳහා රු.මිලියන 16.59ක් වැය කර තිබුණු අතර, මෙම මිලදී ගැනීමේදී කිසිදු ප්‍රසම්පාදන මාර්ගෝපදේශයක් අනුගමනය කර නොතිබුණි. තවද, එම උපකරණ කට්ටල 200 කුමන පාර්ශවයන්හට ලබාදුන්නේද යන්න තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවූ අතර 2024 දෙසැම්බර් 31 දින වනවිට ක්‍රීඩා උපකරණ කට්ටල 68ක් අදාළ පාර්ශවයන් වෙත බෙදා නොදී නිශ්කාර්යව ගබඩාකර තිබුණු අතර උපකරණ කට්ටල බෙදාදීම් සම්බන්ධව විධිමත් ක්‍රමවේදයක් සකසා ඒ සඳහා නිසි අනුමැතියක්ද ලබාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

**ඒ වීසා ලබා නොගැනීම**

2024 අප්‍රේල් 03 දින සිට අප්‍රේල් 22 දක්වා කිරිගිස්ථානයේදී පැවැත්වූ Senior Asian Wrestling Tournament, Asian Olympic Games Qualifiers and Training Programme – 2024 සඳහා පුහුණුකරු ඇතුළු ක්‍රීඩක ක්‍රීඩිකාවන් 06 දෙනෙකු සහභාගිවීමට ආරාධනා පත්‍රයේ සඳහන් පරිදි ඒ වීසා ලබා ගැනීමට කටයුතු නොකිරීම නිසා වීසා ගැටළුවක් ඇති වී අදාළ ගුවන් යානය මග හැරී තිබුණි. එම නිසා පළමු අවස්ථාවේදී ටිකට් මිලදී ගැනීමට දැරූ රු.මිලියන 1.49ක් වැයකර ලබා ගත් ගුවන් ටිකට්පත් ආපසු පැමිණීමේ දී පමනක් භාවිතා කර තිබුණි. පසුව ඒ වීසා හරහා අදාළ තරඟාවලියට පිටත්වීම සඳහා නැවත රු.මිලියන 1.19ක් වැය කර තිබුණි. මේ නිසා රජයට රු.මිලියන 1.19ක් වැඩියෙන් වැය කිරීමට සිදුව තිබූ අතර ක්‍රීඩකයින්ට දින 05ක් පමණ ප්‍රමාද වී අදාළ තරඟාවලිය සහ වැඩසටහන් සඳහා සහභාගි වීමට සිදු වී තිබුණි.

## ක්‍රීඩා වෛද්‍ය ආයතනය

**මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර නොගැනීම**

නවීන තාක්ෂණය භාවිතා කරමින් දක්ෂතා හඳුනාගැනීමේ ක්‍රියාවලියට උපකාර කිරීම, සියලුම ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම, ශාරීරික යෝග්‍යතා ආබාධ සඳහා ප්‍රතිකාර සඳහා යොමු කිරීම සහ අවශ්‍ය විටෙක අදාළ අනෙකුත් සියලුම වෛද්‍ය තොරතුරු සම්බන්ධයෙන් බලයලත් නිලධාරීන් සඳහා ක්‍රීඩකයන්ගේ

වෛද්‍ය වාර්තා ලබා දීම යන අරමුණු ඉටු කර ගැනීම සඳහා රු.මිලියන 6.89ක මෘදුකාංගයක් සකස් කර තිබුණ ද ඉන් අපේක්ෂිත අරමුණු ආයතනය විසින් ඉටුකර ගෙන නොතිබුණි.

**මානව කාර්යසාධන විද්‍යාගාරය ආරම්භ නොකිරීම**

මානව කාර්යසාධන විද්‍යාගාරය ස්ථාපනය කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත 2024 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 273.67ක් ගෙවා තිබුණු අතර 2025 අප්‍රේල් 22 දින වන විටත් පරීක්ෂණාගාරයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණි. මේ හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල අත්පත් කර ගත නොහැකි තත්ත්වයක් උද්ගත වී තිබුණි.

## නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය

**වත්කම් කළමනාකරණය**

ඇඹිලිපිටිය නායකත්ව සංවර්ධන මධ්‍යස්ථාන භූමිය තුල පෞද්ගලික දේපල හා පෞද්ගලික පදිංචිකරුවන් සිටින බැවින් නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයට මෙම භූමිය නිරවුල්ව භාවිතා කිරිමට නොහැකි වි තිබුණි.

**කාර්යය මණ්ඩලය**

නායකත්ව සංවර්ධන මධ්‍යස්ථානය 1985 වර්ෂයේ ආරම්භ කර තිබූ අතර මධ්‍යස්ථානය සඳහා අනුමත කර ඇති කාර්යය මණ්ඩලය සඳහා අවශ්‍යතාවය පරිදි නව තනතුරු ඇතුලත් කර සංශෝධනය කර නොමැති බව නිරීක්ෂණය විය. වර්තමානයේ මෙම මධ්‍යස්ථානය තුල භෞතික ඉදිකිරිම් හා අලුත්වැඩියාවන් බහුලව ඇති අතර කාර්මික නිලධාරියෙකු නොමැති බවත්, ශාරීරික යෝග්‍යතා පුහුණුවීම් ලබා දීම සඳහා සහ අලුතින් සකස් කර ඇති Out Bounding ක්‍රියාකාරකමෙහි කටයුතු කිරිම සඳහා පුහුණු නිලධාරීන් කාර්යය මණ්ඩලය තුල නොමැති බවත් නිරීක්ෂණය විය.

## ජාතික ක්‍රීඩා අරමුදල

**Fox Hill Super Cross 2024 තරඟාවලිය සඳහා වන්දි ගෙවීම**

ශ්‍රී ලංකා යුධ හමුදාව සහ ක්‍රීඩා සංගමයක් විසින් 2024 වර්ෂය තුල දී සංවිධානය කරන ලද Fox Hill Super Cross 2024 තරඟාවලියේ දී සිදු වූ අනතුරින් මරණයට පත් වූවන් 08 දෙනෙකු හා තුවාලකරුවන් 16 දෙනෙකු සඳහා අරමුදල විසින් පිළිවෙලින් රු.මිලියන 8ක සහ රු.මිලියන

4ක වන්දි මුදලක් ගෙවීමට සිදු වී තිබුණි. පූර්ණ රක්ෂණාවරනයක් ලබාගෙන නොතිබීම හේතුවෙන් මෙම වන්දි මුදල රජය විසින් දැරීමට සිදු වී තිබූ අතර මෙම අලාභය තරඟාවලිය සංවිධානය කරන ලද පාර්ශවයෙන් අය කර ගැනීමට කටයුතු නොකර හිටපු ක්‍රීඩා අමාත්‍යවරයාගේ නිර්දේශ මත අරමුදල විසින්ම වැය කර තිබූ බවද නිරීක්ෂණය විය.

**ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම සඳහා ආධාර ලබාදීම**

ජාතික ක්‍රීඩා අරමුදල මගින් ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම සඳහා ආධාර ලබාදීමේදී ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක කිහිපයක පාසල් වෙත පමණක් ආධාර ලබාදී තිබුණු අතර සමස්ත දිවයිනම ආවරණය වන පරිදි අවශ්‍යතාවයන් හඳුනා ගෙන ක්‍රීඩා උපකරණ ලබාදීමේ වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

**ජාත්‍යන්තර තරඟාවලින් සඳහා සහභාගී වූවන්ට ආධාර හා අනුග්‍රහයන් ලබාදීම**

විවිධ ජාත්‍යන්තර තරඟාවලින් සඳහා සහභාගී වූ ක්‍රීඩක ක්‍රීඩකාවන් හා පුහුණුකරුවන් සඳහා ආධාර හා අනුග්‍රහයන් ලබාදීම වෙනුවෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කර එය අනුගමනය කිරීම වෙනුවට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තුමේනතුව වෙත වරින් වර විවිධ පුද්ගලයින් සහ පාර්ශව විසින් යොමු කරන ඉල්ලීම් මත අරමුදල විසින් මුදල් නිදහස් කරන බව විගණනයේදී නිරීක්‍ෂණය විය. ඒ අනුව 2024 වර්ෂය තුලදී රු.මිලියන 8.33ක මුදලක් ලබා දී තිබුණ අතර එම මුදල් නිශ්චිත අරමුණු සඳහා යොදවා ගත්තේ ද යන්න පිළිබඳ පසුවිපරමක් ද අරමුදල මඟින් සිදුකර නොතිබුණි. තවද, ශ්‍රී ලංකාව නියෝජනය කරමින් අනිවාර්යයෙන්ම සහභාගී විය යුතු තරගාවලින් සොයා බලා ඒ සඳහා ආධාර හා අනුග්‍රහයන් දැක්වීම වෙනුවට අවිධිමත් පරිදි එම ක්‍රියා සිදුවන බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ අතර එම අරමුදල් ලබා දීමේ දී අදාල ජාත්‍යන්තර ක්‍රීඩා සංගම් වෙතින් තහවුරු කර ගැනීමකින් තොරව අරමුදල් නිදහස් කර ඇති බවද නිරීක්ෂණය විය.

**සැලසුම් කරන ලද කාර්යයන් පිළිබඳ ලේඛනයක් ඉදිරිපත් නොකිරීම**

අරමුදලේ සැලසුම් කරන ලද කාර්යයන් පිළිබඳ ලේඛනයක් මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් නොකිරීමෙන් ජාතික ලොතරැයි මණ්ඩලයෙන් 2024 වර්ෂය හා පෙර වර්ෂවලට අදාලව අරමුදල වෙත

ලැබිය යුතු පිළිවෙලින් රු.මිලියන 156.27ක් හා රු.මිලියන 367.26ක් ලැබී නොතිබුණි. ඒ හේතුවෙන් අරමුදලේ කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාමේ අරමුණින් මාස 03කින් පසුව කල්පිරීමට නියමිතව තිබූ රු.මිලියන 29.37ක ස්ථාවර තැන්පතුව දින 47කින් ඉවත් කර ගැනීමට සිදු වී තිබුණි.

## ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය

**සංයුක්ත සැලැස්ම**

ඉදිරි වසර 10 සඳහා ආයතනික සැලැස්ම සකස් කිරීම සඳහා 2024 අගෝස්තු 15 වන දින පෞද්ගලික සමාගමකට රු.මිලියන 3.3ක අත්තිකාරමක් ගෙවා තිබුණ ද එම සැලසුම 2025 ජුනි 30 වන දින දක්වාම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ඉදිරිපත් කර නොතිබුණි.

**ක්‍රිකට් ක්‍රීඩකයින්, දේශීය උපදේශකයින් සහ සම්බන්ධීකාරකවරුන්ගෙන් APIT බදු අය නොකිරීම**

2023 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රිකට් ක්‍රීඩකයින්, දේශීය උපදේශකයින් සහ සම්බන්ධීකාරකවරුන් වෙත කරන ලද ඕනෑම ගෙවීමක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය, අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) අඩු කළ යුතු වුවද, 2023 සහ 2024 වසරවල ඔවුන් වෙත ගෙවා තිබූ පිළිවෙලින් රු.මිලියන 860.43ක් සහ රු.මිලියන 2,355.93ක් වූ මුදල වෙනුවෙන් ඉහත පාර්ශවයන්ගෙන් අදාළ ආදායම් බදු අයකර දේශීය ආදායම් දෙපාර්තුමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

**එකතු කළ අගය මත බදු (VAT) හා රඳවා ගැනීමේ බදු (WHT)**

2024 දෙසැම්බර් 31 දිනට වසර 05කට වැඩි කාලයක සිට අය නොවී පවතින රු.මිලියන 135.8ක හා රු.මිලියන 28.24ක පිළිවෙලින් එකතු කළ අගය මත බදු (VAT) සහ රඳවා ගැනීමේ බදු (WHT) අය කර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**ක්‍රීඩාපිටි සඳහා නව විදුලි පහන් ආලෝකකරණ පද්ධතියක් සවිකිරීම**

ආර්.ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ සහ රංගිරි දඹුල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ නව විදුලි පහන් ආලෝකකරණ පද්ධතිය (floodlights system) ස්ථාපනය කිරීමේදී, ඉහත ක්‍රීඩාංගණ දෙකෙහි පෙර පැවති පිළිවෙලින් රු.මිලියන 20.03ක් සහ රු.මිලියන 17.61ක් පිරිවැය වූ විදුලි පහන් ආලෝකකරණ පද්ධති ඉවත් කර තිබුණි. එලෙස ඉවත් කරන ලද පද්ධතියට අයත් රු.මිලියන 9ක් වටිනා අයිතම

06ක් 2024 ජූලි 24 වන දින කොළඹ ක්‍රිකට් සමාජයට (CCC) ලබා දී තිබූ අතර ඉතිරි අයිතම 2025 මැයි 31 වන විටත් භාවිතයට නොගෙන පැවතුණි.

**අනුග්‍රාහක අයිතිවාසිකම් ආදායම**

2018 වසරේ ශ්‍රී ලංකා කණ්ඩායමේ දකුණු අප්‍රිකානු සංචාරය වෙනුවෙන් ලැබිය යුතු අනුග්‍රාහක අයිතිවාසිකම් ආදායම රු.මිලියන 37.56ක් (එ.ජ. ඩොලර් 187,084.75) 2024 වර්ෂය අවසන් වන විටත් අයකර නොතිබුණි.

**මොරටුව උසස් කාර්යසාධන මධ්‍යස්ථානය ඉදිකිරීම**

උසස් කාර්යසාධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා මොරටුව ප්‍රදේශයෙන් පර්චස් 57.62ක ඉඩමක් වසර 10කට බදු ගැනීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය 2022 සැප්තැම්බර් 24 වන දින මොරටුව ප්‍රදේශයේ ක්‍රිකට් සමාජයක් සමඟ බදු ගිවිසුමකට එළඹ තිබුණි. කෙසේ වෙතත්, රු.මිලියන 7.5ක ආපසු ගෙවිය යුතු තැන්පතුවක් සහ රු.මිලියන 7.5ක බදු කුලිය ගෙවීමෙන් පසුව විවිධ හේතූන් මත මෙම මධ්‍යස්ථානයේ ඉදිකිරීම් අත්හිටුවා තිබුණි.

**මහනුවර යෝජිත උසස් තාක්ෂණ පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම**

මහනුවර යෝජිත උසස් තාක්ෂණ පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා 2017 අප්‍රේල් 20 වන දින මහනුවර ප්‍රදේශයෙන් අක්කර 1, රූඩ් 3 සහ පර්චස් 20.2ක ඉඩමක් රු.මිලියන 26.5ක ප්‍රතිෂ්ඨාවකට වසර 30ක කල්බදු පදනමක් සඳහා ලබාගෙන තිබුණි. තව ද, ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමකින් තොරව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2024 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 23.93ක් වැය කර තිබුණි. මේ අතර, ඉදිකිරීම් කටයුතු ආරම්භ කර වසර හතක් (07) ගතවී ඇතත් 2024 දෙසැම්බර් 31 දක්වාම ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.

## සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

**අරමුදල් ඌණ උපයෝජනය**

2024 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව රු.මිලියන 320ක මූලික ඇස්තමේන්තුවක් මත ප්‍රාග්ධන ව්‍යාපෘති 12ක් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබුණද 2024 වර්ෂය තුළ ව්‍යාපෘති 06ක් සඳහා පමණක් රු.මිලියන 149ක් වැයකර ක්‍රියාත්මක කර තිබුණු බැවින් ඉන් රු.මිලියන

171ක් එනම් සියයට 53ක් උපයෝජනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**අහිමි වූ අදායම්** ආගමික වැඩසටහනක් පැවැත්වීම වෙනුවෙන් අධිකාරිය සතු පරිශ්‍රයක් අධිකාරියේ සම්මත රේටවලට වඩා අඩු රේටයන් යටතේ ආගමික ආයතනයක් වෙත වෙන් කරවා දීම තුළින් අධිකාරියට රු.මිලියන 10ක පාඩුවක් සිදුවී තිබුණු අතර එලෙස වෙන් කිරීමේදී අයකළ යුතුව තිබූ රු.මිලියන 3.4ක ආපසු ගෙවීමේ තැන්පතු ද ලබාගෙන නොතිබුණි.

## ජාතික යෞවුන් සේනාංකය

**දීර්ඝ කාලීනව අය නොවී පවතින අත්තිකාරම්** 2024 දෙසැම්බර් 31 දිනට වර්ෂ 08කට වඩා වැඩි කාලයක සිට ඉදි කිරීම් අතහැර දමා තිබීමෙන් අය නොවී පවතින වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂය රු.මිලියන 99.86ක් වූ අතර, එම මුදල අය කර ගැනීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**පනත සංශෝධනය කිරීමේ ප්‍රමාදය** සේනාංකයේ කාර්යයන් කාර්යශමව හා ඵලදායීව ඉටු කිරීම සඳහා පවතින පනත සංශෝධනය කල යුතු බවට අමාත්‍ය මණ්ඩලය විසින් 2011 වසරේ දී තීරණයකට එලඹ තිබුණ ද, වර්ෂ 14ක් ගත වීමෙන් පසුව ද එම තීරණය ක්‍රියාත්මක කර නොබුණි.

**තනතුරු පුරප්පාඩු** සේනාංකයේ ප්‍රධාන කාර්යයන් වූ යොවුන් සංවර්ධනය, රැකියා පුහුණුව සහ වෘත්තිමය අධ්‍යාපනය කාර්යක්ෂව හා ඵලදායීව කර ගෙන යාම සඳහා අවශ්‍ය මධ්‍යස්ථානාධිපති සහ උපදේශක තනතුරු 251ක් දිගටම පුරප්පාඩු වී පැවතීම සේනාංකයේ අරමුණු කරා ලගා වීම හා පාඨමාලාවල ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනීම කෙරෙහි දැඩිව බලපා තිබුණි.

## ජාතික තරුණ සේවා සභාව

**බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනයෙහි ඉදිකිරීම් ප්‍රගතිය** වටිනාකම රු.මිලියන 147.45ක්වූ බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනයෙහි ඉදිකිරීම්, ප්‍රසම්පාදන කටයුතු අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව මගින් කළ යුතු වුවද, එම කොන්ත්‍රාත් වටිනාකම ඒකක 02කට බෙදා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මගින් සිදුකර තිබුණි. තවද, මෙම

ඉදිකිරීම් කටයුතු සඳහා 2018 වර්ෂයේදී ගෙවන ලද රු.මිලියන 18.08ක අත්තිකාරම් මුදල වසර 06කින් පසුව 2024 වර්ෂයේදී නැවත අයකරගෙන තිබුණු අතර ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණි.

**පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු නොකිරීම**

1979 අංක 69 දරන ජාතික තරුණ සේවා සභා පනතේ 4(ඊ), 5(2)(උ) සහ 5(2)(ඌ) වගන්ති ප්‍රකාරව තරුණ තරුණියන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට නැඹුරු කිරීමට ගොවිපොළවල් ආරම්භ කිරීම අරමුණ වුවද, සභාවේ පවතින ගොවිපොළ 10ක පුහුණු පාඨමාලා පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.

**යෞවන සමාජ සම්මේලනය සමඟ පවත්නා අවිධිමත් සම්බන්ධතාවයන්**

1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31(9)(අ) වගන්තිය යටතේ පුණ්‍යායතනයක් ලෙස පිහිටුවා ඇති ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය නීත්‍යානුකූල නොවන පදනමකින් සභාව සමග සම්බන්ධ වී, සාමාජිකයන් 10 දෙනෙකුට 2018 වර්ෂයේ සිට මසකට රු.750ක් බැගින් සභාව විසින් දීමනා ගෙවා තිබුණි. තවද සභාවේ නිළධාරීන් දෙදෙනෙකුද, ස්ථිරවම මුදාහැර තිබූ අතර රු.මිලියන 1.49ක් ගෙවා තිබුණි.

**13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන**

2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන දියත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් මුදාහරින ලද එකතුව රු.මිලියන 168.97ක මුදලින් සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.මිලියන 2.80 ඉතිරි කර තිබූ අතර .පාඨමාලා සඳහා ලියාපදිංචි හා අවසන් ඇගයීමට ලක්කළ සිසුන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු නොමැතිවීමෙන් පාඨමාලාවල කාර්යසාධනය නිශ්චය කර ගැනීමටත්, ඇගයීමටත් නොහැකි විය. තවද, මෙ සම්බන්ධයෙන් පසුවිපරම් කිරීමක් සිදුකර නොතිබුණි.

**මානව සම්පත් කළමනාකරණය**

1994 සිට 2014 දක්වා කාල පරිච්ඡේදය තුළ දේශපාලන හේතූන් මත විවිධ ගැටළුවලට මුහුණු දුන් අයට සහන සැලසීම සඳහා අමප අංක 17/0186/734/005 දරන හා 2017 පෙබරවාරි 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි විශ්‍රාම නිලධාරීන්ගෙන් යුත් කමිටුවක් පත් නොකර ඊට පටහැනිව පත් කරන ලද කමිටුවලින් නිර්දේශ ලබා ගනිමින් නිලධාරීන්

40 දෙනෙකු සඳහා අධි සේවක පදනමින් ද්විත්ව උසස්වීම් ලබා දී වන්දි ලෙස රු.මිලියන 2.1ක් ගෙවා තිබුණි.

## ජාතික ක්‍රීඩා සංගම් හා සම්මේලන

**මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම**

දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින ක්‍රීඩා සංගම් හා සම්මේලනවල සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන එක් එක් මූල්‍ය වර්ෂය අවසාන වී මාස දෙකක් ඇතුලත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුව ද, ශ්‍රී ලංකා ජාතික අංගම්පොර සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන 2013 වර්ෂයේ සිට ද, සර්ෆින් සහ අත්පන්දු සම්මේලන 2021 වර්ෂයේ සිට ද, ශ්‍රී ලංකා එල්ලේ සහ මුයි තායි සංගමය 2022 වර්ෂයේ සිට ද, සැහැල්ලු පන්දු ක්‍රිකට්, බේස් බෝල්, ජාතික රෝද සපත්තු යන සංගම් හා සම්මේලන විසින් 2023 වර්ෂයේ සිට ද විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

# භූ විද්‍යා හා පතල් කැණීම්

## භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය 2009 අංක 66 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනත මගින් පිහිටුවා ඇත.

## විගණන නිරීක්ෂණ

**ඉඩම් පුනරුත්ථාපනය නොකිරීම**

2009 අංක 66 දරන පනතින් සංශෝධිත 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ 52(2) වගන්තිය ප්‍රකාර බලපත්‍ර දරන්නෙකු විසින්, ඔහුගේ බලපත්‍රයෙන් බලය දෙන ලද කටයුතු අවසන් වූ පසු හෝ ඔහුගේ බලපත්‍රයේ කාලය ඉකුත්වන දිනය යන දින දෙකෙන් කලින් එළැඹෙන දිනයේ දී, කාර්යාංශය සෑහීමකට පත්වන පරිදි ඉඩම් පුනරුත්ථාපනය කළ යුතු වුව ද, 2025 අගෝස්තු 11 දින වන විට බලපත්‍රලාභීන් 2,713ගෙන් ලබා ගත් රු.මිලියන 462.26ක පුනරුත්ථාපන බැඳුම්කරවලට අදාළ මුදල් කාර්යාංශය තුළ රඳවාගෙන තිබුණි. එයින් රු.මිලියන 316.64ක් වටිනා බලපත්‍ර 1,742ක භූමි පුනරුත්ථාපන කටයුතු සිදුකරවා ගැනීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි. තව ද, මුදල් කරවා ගැනීමට කාර්යාංශය අපොහොසත් වී තිබූ බැඳුම්කර රු.මිලියන 62.56ක බලපත්‍ර 268කට අදාළ පුනරුත්ථාපන කටයුතු ද සිදුකරවා ගැනීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි.

**ගවේෂණ බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදය සංශෝධනය නොකිරීම**

2024 ඔක්තෝබර් 08 වන දින ප්‍රකාශයට පත්කළ අංක SCAppeal 137/2017 දරන ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව ප්‍රකාරව කාර්යාංශය විසින් බලපත්‍ර ලබාදීමේ දී ඒ සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන් සඳහා සම අවස්ථාවක් ලබාදිය හැකිවන ආකාරයට බලපත්‍ර ලබාදිය යුතු විය. එසේ වුව ද, පවත්නා ක්‍රමවේදය, නඩු තීන්දුවට අනුකූලව නැවත සමාලෝචනය කළ යුතු බව කාර්යාංශය තීරණය කර ඒ අනුව එම ක්‍රමවේදය යළි සකස් කරන තෙක් ගවේෂණ බලපත්‍ර නිකුත් කිරීම කාර්යාංශය විසින් එදින සිට තාවකාලිකව අත්හිටුවා තිබුණි. එසේ වුව ද, එම ක්‍රමවේදය 2025 මැයි 30 දින වන විටත් සකස්කර නොතිබුණු අතර,

ප්‍රධාන ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස හඳුනාගත හැකි ගවේෂණ බලපත්‍ර නිකුත්කිරීම තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් 2025 මැයි 30 වන විට අයදුම්කරුවන් 50දෙනෙකුගෙන් ලද රු.මිලියන 75.32ක බලපත්‍ර ගාස්තු, අත්තිකාරම් ගිණුමේ රඳවා තබා ගැනීමට කාර්යාංශයට සිදුවී තිබුණි.

**ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් ස්ථාපිත නොකිරීම**

ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් (ERP) ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 1.63ක් වැයකර තිබුණ ද, 2023 පෙබරවාරි 20 දින එම කාර්යය ක්‍රියාත්මක නොකිරීමට කාර්යාංශය තීරණයකර තිබුණි. එසේ වුව ද, කාර්යාංශයේ වර්තමාන මෙහෙයුම් හා මූල්‍ය අවශ්‍යතාවයන්ට ගැළපෙන ආකාරයට ERP පද්ධතියක් ස්ථාපිත කිරීම අත්‍යාවශ්‍ය වුවත්, මේ දක්වා ඒ සඳහා කටයුතු නොකර වසර 20කට වඩා පැරණි, කාර්යාංශයේ මෘදුකාංග පද්ධතිය වාර්ෂිකව රු.මිලියන 1.04ක නඩත්තු වියදමක් දරා භාවිතා කරමින් පවතී. ERP පද්ධතිය ස්ථාපිත කිරීමේ අරමුණින් රු.මිලියන 20.39කට මිලදී ගත් පරිගණක 60 මේ වන විට ප්‍රාදේශීය කාර්යාල වෙත ලබා දී තිබුණි.

**බලපත්‍ර ගාස්තු වෙනුවෙන් ලද චෙක්පත් අගරුවීම**

බලපත්‍ර ගාස්තු වෙනුවෙන් 2017 සිට 2022 කාලපරිච්ඡේදයේ දී කාර්යාංශය වෙත ලැබී තිබූ රු.මිලියන 1.28ක චෙක්පත් 13ක් අගරු වී තිබුණ ද, ඒවා අයකර ගැනීමට කාර්යාංශය කටයුතුකර නොතිබුණි.

**රාජ්‍ය භාගය අයකර නොගැනීම**

2024 වර්ෂය අවසානයට බලපත්‍ර 51ක් සඳහා රු.මිලියන 10.54ක ලැබිය යුතු රාජ්‍ය භාගයක් ජංගම වත්කමක් ලෙස ගිණුම්ගතකර තිබුණ ද, මෙම වටිනාකම අයකර ගැනීමට අදාළ කිසිදු නීතිමය හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් කාර්යාංශය විසින් ගෙන නොතිබුණි.

**කල් ඉකුත් වූ බැඳුම්කර**

2012 වර්ෂයේ සිට 2025 අගෝස්තු 11 දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී කැණීම් බලපත්‍ර 362කට අදාළ රු.මිලියන 80.87ක් වටිනා බැඳුම්කර, මුදල් කරවා ගැනීම සඳහා අදාළ බැංකු වෙත ඉදිරිපත්කර තිබුණ ද, එම මුදල් කාර්යාංශය වෙත ලැබී නොතිබුණු අතර, වර්තමානය වන විට මෙම බැඳුම්කර කල් ඉකුත් වී තිබුණි. ඊට අමතරව රු.මිලියන 15.75ක් වටිනා බැඳුම්කර 75ක් 2020 වර්ෂයේ දී කල් ඉකුත්වීමට පෙර මුදල් කර ගැනීම සඳහා බැංකු වෙත ඉදිරිපත් කිරීමක් ද සිදුකර නොතිබුණි. ඒ අනුව

රු.මිලියන 96.62ක බැදුම්කර මුදලක් කාර්යාංශයේ පසුවිපරමක් සිදු නොවීම හේතුවෙන් ලබාගත නොහැකි වී තිබුණි.

**අනවසර ලෙස වැලි ඉවත්කිරීම**

හලාවත වැවිලි සමාගමට අයත් පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි මුක්කුතොඩුවාව වතුයායේ වැලි ඉවත්කිරීම සඳහා පුද්ගලික සමාගමක් වෙත මාසික නිෂ්පාදන පරිමාව කියුබ් 500කට නොවැඩි සහ කැණීම් කළ හැකි මුළු කියුබ් ප්‍රමාණය කියුබ් 9,400 නොවැඩි යන කැණීම් කොන්දේසි යටතේ අංක IML/C/HO/N/17006 දරන කාර්මික කැණීම් බලපත්‍රය නිකුත් කර තිබුණි. මෙම බලපත්‍රය 2023 දෙසැම්බර් 14 දින සිට 2024 සැප්තැම්බර් 13 දක්වා අවස්ථා 3ක දී අලුත්කර තිබුණි.

එසේ වුව ද, ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම විසින් 2024 දෙසැම්බර් මස 19 වන දින නිකුත්කරන ලද කැණීම් කරන ලද වැලි පරිමාව ඇස්තමේන්තු කිරීමේ වාර්තාව ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් වැලි කියුබ් 36,531 සිට 45,561ක පරාසයක වැලි තොගයක් ඉවත්කර කියුබ් 1,594ක් සඳහා පමණක් රාජ්‍යභාගය ලෙස රු.මිලියන 0.69ක් කාර්යාංශය වෙත ගෙවා තිබුණි. වාර්තාවේ පහළ පරාසය පමණක් සැලකිල්ලට ගැනීමේ දී කියුබ් 34,937ක් සඳහා රු.මිලියන 12.73ක රාජ්‍යභාගය ගෙවා නොතිබුණි.

තව ද, වැලි කියුබ් 2,920ක් පමණක් ප්‍රවාහනය කිරීම සහා බලපත්‍ර කාර්යාංශය වෙතින් ලබාගෙන තිබිය දී වාර්තාවේ පහළ පරාසය සලකා බැලීමේ දී කියුබ් 33,611ක වැලි තොගයක් බලපත්‍ර රහිතව ප්‍රවාහනයකර තිබුණි. එසේම 2024 සැප්තැම්බර් 13 දක්වා බලපත්‍රය අලුත් කිරීමට අදාළව පැන වූ නව කොන්දේසිය ප්‍රකාරව කාලසීමාව ඉකුත්වන දිනයේ දී කැණීම් කරන ලද භූමිය කාර්යාංශය සෑහීමකට පත්වන පරිදි පුනරුත්ථාපනය කළ යුතු බව දක්වා තිබුණ ද, මෙම පුනරුත්ථාපන කටයුතු අවශ්‍ය පරිදි සිදුකර තිබේ ද යන්න පරීක්ෂා කිරීමට පුත්තලම ප්‍රාදේශීය කාර්යාලය විසින් 2025 මැයි 31 දින වන විටත් කටයුතුකර නොතිබුණි.

**මානව සම්පත් කළමනාකරණයේ අකාර්යක්ෂමතා**

2023 දෙසැම්බර් 21 දින සිට අනිවාර්ය නිවාඩු යවා තිබුණු අධ්‍යක්ෂ (මානව සම්පත්) සම්බන්ධයෙන් මූලික විමර්ශනය 2024 සැප්තැම්බර් 10 පවත්වා තිබුණි. නිලධාරියාට විරුද්ධව චෝදනා නැගීමට තරම් ප්‍රමාණවත් හේතු සාධක ඇති බව මූලික විමර්ශනය මගින් බැලූ බැල්මට පෙනී යන්නේ නම්, අදාළ විනය බලධරයා විසින්, චෝදනා පත්‍රයක් නිලධාරියා වෙත විධිමත්ව නිකුත් කළ යුතු වුව ද, එසේ කර නොතිබුණු අතර, විධිමත් විනය පරීක්ෂණය ද පවත්වා නොතිබුණි. එබැවින් වසර 1 ½ට වැඩි කාලයක් සඳහා ඔහුගෙන් සේවයක් නොලබා වැටුප් ගෙවමින් පැවතුණු අතර, 2025 මැයි දක්වා එසේ ගෙවා ඇති මුදල රු.මිලියන 1.89ක් විය.

2024 මැයි 17 දිනැති 344 වන කළමනාකරණ මණ්ඩල රැස්වීමේ තීරණය ප්‍රකාරව 2024 ජූලි 15 දින සිට මානව සම්පත් උපදේශකවරයෙකු කොන්ත්‍රාත් පදනමින් කාර්යාංශය වෙත බඳවාගැනීමට හා ඔහුගේ වැටුප ලෙස මානව සම්පත් අධ්‍යක්ෂකගේ මූලික වැටුප යොදාගැනීමට අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව මානව සම්පත් අධ්‍යක්ෂවරයාට ගෙවිය යුතු මූලික වැටුප රු.81,670ක්ව තිබිය දී රු.175,000 බැගින් 2024 ජූලි 15 වන දින සිට 2025 අප්‍රේල් 15 දින දක්වා ගෙවා තිබුණ අතර, මෙහි දී වැඩියෙන් වැටුප් ලෙස රු.මිලියන 0.84ක් ගෙවා තිබුණි. එසේම කාර්යාංශයේ මානව සම්පත් සැලැස්ම පිළියෙල කිරීම සහ මානව සම්පත් විගණනයක් සිදු කිරීමට අදාළ කාර්යභාරය මෙම උපදේශකවරයා වෙත පවරා තිබුණ ද, එම කටයුතු ඉටුකර තිබේ ද තහවුරු කරගත නොහැකි විය.

නීති විරෝධී ලෙස සිදුවන ඛණිජ කැණීම්, සකස්කිරීම්, වෙළඳාම් කිරීම් වැටලීමේ අරමුණින් බලගැන්වීමේ ඒකකයක් ස්ථාපිතකර තිබුණ ද, අනුමත බලගැන්වීමේ නිලධාරී තනතුරු 06න් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් තනතුරු 3ක් දිගින් දිගටම පුරප්පාඩුව පැවතීම හේතුවෙන් නීති විරෝධී වැටලීම් සිදුකිරීමට බාධාවක් වී තිබුණි.

## ජීඑස්එම්බී ටෙක්නිකල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ පරිපාලිත සමාගමක් වන අතර, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් 2001 සැප්තැම්බර් 12 දින ස්ථාපිත කරන ලද සමාගමකි. සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 66.67ක් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ද, සියයට 16.67ක් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් ද, සියයට 16.67 ක් සී/ස ලංකා පොස්පේට් සමාගම විසින් ද දරනු ලබයි.

පතල් කැණීම් කර්මාන්තයෙහි සමාජීය පිරිවැය ලෙස කළමනාකරණය කිරීමට හැකියාව ලබාදීම පිණිස ඛණිජ ගවේෂණය හා වාණිජ පතල් කැණීම, පරීක්ෂණ, ශක්‍යතා අධ්‍යයනයන් හා පාරිසරික බලපෑම් අධ්‍යයනයන් ව්‍යාපෘති කළමනාකරණ සහාය, භූ විද්‍යාත්මක තොරතුරු හා භූ තාක්ෂණික උපදේශනය සහ ඛණිජ නිෂ්පාදන සඳහා අලෙවිකරණ සහාය ලබාදීම යන ක්ෂේත්‍රයන් තුළ තාක්ෂණික සේවා ලබාදීම තුළින් භූ විද්‍යා හා පතල් කැණීම් කර්මාන්තය සඳහා පහසුකම් සැලසීම මෙම සමාගමේ මෙහෙවර වේ.

**කන්තලේ සිරිමංගලපුර වැලි කැණීම් මධ්‍යස්ථානය**

කන්තලේ සිරිමංගලපුර වැලි විකුණුම් මධ්‍යස්ථානය 2023 වර්ෂයේ ආරම්භ කර තිබුණ ද, මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත කාර්යය ආරම්භ කිරීමට සමාගම අපොහොසත් වී තිබුණු පසුබිමක ව්‍යාපෘතියට අදාළ ක්‍රියාකාරකම් නවතා දැමීමට 2024 ජනවාරි මස 26 දින අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. මෙහි දී ව්‍යාපෘතිය සඳහා අනුයුක්ත කර තිබූ නිලධාරින්ගේ වැටුප්, ප්‍රවාහන වියදම් සහ නවාතැන් වියදම් සඳහා ගෙවූ රු.මිලියන 1.77ක සමස්ත වියදම නිෂ්කාර්යව පැවතුණි.

**මූතූර් වැලි කැණීම් මධ්‍යස්ථානය**

සමාගම විසින් ත්‍රිකුණාමලය පරෙයිපඤ්ඤම් ප්‍රදේශයේ 2020 වර්ෂයේ අගෝස්තු මස ආරම්භ කරන ලද මූතූර් වැලි කැණීම් ව්‍යාපෘතිය දිගින් දිගටම පාඩු ලබන තත්ත්වයක් පැවතීම හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීමට 2022 වර්ෂයේ කටයුතුකර තිබුණ ද, 2022 වර්ෂයේදීම මෙම ව්‍යාපෘතියේ කටයුතු නවතා දමා තිබුණු අතර, ඒ සඳහා 2024 ජූලි 25 දින අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘතියෙහි 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු.මිලියන 8.06ක සමස්ත මූල්‍ය අලාභයක් ලබා තිබුණි.

**කොටිකම්බොක්ක තිරුවානා නිධිය**

2017 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම්කළ කොටිකම්බොක්ක තිරුවානා නිධිය කැණීම් කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු 2025 අප්‍රේල් 07 දින වන විටත් ආරම්භ කර නොතිබුණු අතර, පරිපාලන වියදම්, මිනුම් කටයුතු, ස්ථාවර වත්කම් මිලටගැනීම, සේවක වැටුප් ගෙවීම් සහ උපදේශන දීමනා වෙනුවෙන් 2017 වසරේ සිට 2024 වර්ෂය අවසානය දක්වා රු.මිලියන 27.87ක් නිශ්කාර්යව දරා තිබුණි.

**මානව සම්පත් පරිපාලනයේ අකාර්යක්ෂමතා**

සමාගමේ හිටපු කළමනාකරු (පරිපාලන හා මහජන සම්බන්ධතා) 2019 මැයි 16 දින සිට ආයතනයේ සේවය හැර යන ලද්දෙකු සේ සලකා සේවයෙන් ඉවත් කිරීම හේතුවෙන් එම නිලධාරියා සමාගමට එරෙහිව කොළඹ කම්කරු විනිශ්චය අධිකාරියේ නඩු පවරා තිබුණි. එම නඩුවේ තීන්දුව ප්‍රකාරව අදාළ නිලධාරියාගේ සේවය අවසන් කිරීම අසාධාරණ බවට කම්කරු විනිශ්චය සභා අධිකාරිය නිගමනයකර තිබූ අතර, ඒ වෙනුවෙන් රු.මිලියන 1.52ක් නිලධාරියාට හා නීති ගාස්තු ලෙස රු.මිලියන 0.40ක් සමාගම විසින් ගෙවා තිබුණි. සමාගමේ දුර්වල මානව සම්පත් පරිපාලනය හේතුවෙන් රු.මිලියන 1.93ක් මෙසේ නිෂ්කාර්යව සමාගමට දැරීමට සිදුව තිබුණි.

# ආපදා කළමනාකරණය

ශ්‍රී ලංකාවේ භූමිය ඇතුළත සිදුවන්නා වූ ව්‍යසන නිසා මනුෂ්‍ය ජීවිත හා පරිසරයට වන තර්ජන හා අනතුරුවලින් ආරක්ෂාකර ගැනීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සහ ජාතික සැලැස්මක් පිළියෙල කළ යුතු අතර, එය ක්‍රියාත්මක කළ යුතු ය.

ආපදා කළමනාකරණය සඳහා ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ආපදා කළමනාකරණ අංශයක්, දෙපාර්තමේන්තුවක් සහ ව්‍යවස්ථාපිත ආයතන 2ක් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක වේ.

## විගණන නිරීක්ෂණ

### ආපදා කළමනාකරණ අංශය - ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය

**නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය**

මධ්‍යස්ථානය විසින් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2017 වර්ෂයේ දී නිවාස 5025ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ඉන් නිවාස 4898ක වැඩ ආරම්භකර තිබූ නමුත් නිමකර තිබුණේ නිවාස 2558ක් පමණි. ආරම්භකර තිබූ නිවාස 1179ක ඉදිකිරීම් අතහැර දමා තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනය වන විට රු.මිලියන 583.83ක් වැයකර තිබූ නමුත් යටිතල පහසුකම් නොමැතිවීම සහ අවදානම් ලෙස හඳුනාගත් ස්ථානවලින් පදිංචිකරුවන් ඉවත්වීම ප්‍රතික්ෂේප කිරීම යන හේතු මත ඉදිකළ නිවාසවල පදිංචි නොවීමේ තත්ත්වයක් නිරීක්ෂණය විය. මේ අනුව ප්‍රතිලාභීන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සැකසීම, මාර්ගෝපදේශ සංශෝධනය කිරීම සහ අවදානම් සහිත ස්ථාන ස්ථායීකරණය කිරීම සිදුකළ යුතු බවට හඳුනාගෙන තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

**වත්කම් කළමනාකරණයේ අඩුපාඩු**

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සතුව පැවති භාවිතා නොකරන ජල බවුසර් 133කින් 78ක් වෙනත් ආයතන වෙත පවරා දී තිබූ නමුත් එය පොත්වලින් ඉවත් කිරීමට කටයුතුකර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ දී බවුසර 33ක් වෙනත් ආයතන වෙත ලබාදීමට ලේකම්තුමාගේ අනුමැතිය ලැබී තිබුණ ද, විධිමත් පරිදි පවරාදීමට කටයුතුකර නොතිබුණි. තව ද, වසර 3කට අධික කාලයක් භාවිතා නොකිරීම හේතුවෙන් බවුසර් 3ක් අක්‍රීයව පැවතුණි.

## ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

**පනත සඳහා අවශ්‍ය සංශෝධන සිදුනොකිරීම**

2012 ජූලි 05 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව අන්තර් කාලීන කළමනාකරණ කමිටුව ස්ථාපිතකිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණ ද, 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතට අවශ්‍ය සංශෝධන 2024 දෙසැම්බර් 31 දින වන විටත් සිදුකර නොතිබුණි.

**හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සකස්කිරීම**

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 04 වගන්තිය ප්‍රකාරව මධ්‍යස්ථානයේ ප්‍රධානම කාර්යයක් වන ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම කෙටුම්පත්කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. තව ද, සෑම දිස්ත්‍රික්කයකටම මෙහෙයුම් සැලැස්මක් සකස්කළ යුතු නමුත්, දිස්ත්‍රික්ක 7ක සැලසුම් සකස්කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.

**ආපදා අවම කිරීමේ පොදු උපදෙස් මාලාව අනුව කටයුතු නොකිරීම**

2024 ජනවාරි 31 දිනැති පොදු උපදෙස් මාලාවේ ඇමුණුම 01හි 2 (ii) ප්‍රකාරව මහජන විරෝධය අවම වන ආකාරයට ව්‍යාපෘතිය තෝරානොගැනීම නිසා ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 2.96ක් වූ කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට, තලපිටිය මැදිකැලේ මාර්ගය ආශ්‍රිතව පවතින ගල් පෙරලීමේ අවදානම ඉවත්කිරීමේ ව්‍යාපෘතිය අඩක් නිමකිරීමෙන් පසු ප්‍රදේශවාසීන්ගේ විරෝධය මත අතරමග නවතා දමා තිබුණි. අඩක් නිමකිරීම නිසා ආපදා අවදානම ඉහළ ගොස් තිබූ අතර, අපේක්ෂිත අරමුණට ළඟාවීමට නොහැකි වී තිබුණි.

**කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 10ක් වූ දෙපස පැති බැමි පමණක් සකස්කළ යුතුව තිබූ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 7 කණුව සිට කොටිකාපිටිය යන මාර්ගයේ අලි අඩි ඔඩය හරහා ඇති කොන්ක්‍රීට් පාලම සකස්කිරීමේ ව්‍යාපෘතිය නියමිත කාලයේ දී සිදුනොකිරීම නිසා ඇදහැලුණු අධික වර්ෂාවත් සමග පාලම සම්පූර්ණයෙන් කඩාවැටීම නිසා පූර්ණ වශයෙන් ඉදිකිරීමට සිදු වී තිබුණි.

## කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

**ඩොප්ලර් රේඩාර් පද්ධතිය ස්ථාපනය කිරීමේ ප්‍රමාදය**

කාලගුණ තොරතුරු නිරීක්ෂණය කිරීමට, පුරෝකථනය කිරීමට හා බෙදාහැරීමට, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ධාරිතාව දියුණු කිරීමේ අරමුණින්, ඩොප්ලර් රේඩාර් පද්ධතිය පුත්තලම කාලගුණ මධ්‍යස්ථාන භූමියේ ස්ථාපනය කිරීම සඳහා JICA අධාර වැඩසටහන යටතේ 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය වන විට රු.මිලියන 1,965.08ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. නමුත් 2024 දෙසැම්බර් 31 දිනට වැයකර තිබුණේ රු.මිලියන 0.740ක් පමණි. රේඩාර් පද්ධතිය ඉදිකිරීමේ කටයුතු 2020 වර්ෂය අවසානයේ දී අවසන්කළ යුතු වුවත්, ගිවිසුම්ගත වී වසර 06ක් (2019-2025) ගත වී ඇතත්, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සහ උපකරණයේ නිෂ්පාදන කටයුතු ජපානයේ දී ආරම්භකර තිබුණේ 2024 දෙසැම්බර් මාසයේ දී ය. මේ හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 25ක් පමණක් වී තිබුණි.

**ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා පද්ධති උපයෝජනය හා නඩත්තුව**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ සවිකර ඇති ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන 37න් මධ්‍යස්ථාන 04ක් අක්‍රියව පවතින අතර, මධ්‍යස්ථාන 02ක් ඉවත්කර තිබුණි. හදිසි කාලගුණ වෙනස්වීම් තත්ත්වයන්හි දී ස්වයංක්‍රීය දත්ත ලබාගැනීමේ හැකියාව ඉතා වැදගත්වන නමුත්, අක්‍රියව පවතින මෙම මධ්‍යස්ථානවල නඩත්තු කටයුතු සිදුකර ක්‍රියාකාරී තත්ත්වයට පත්කර ගැනීමට කටයුතුකර නොතිබුණි. එසේම දිවයින පුරා සාම්ප්‍රදායික වැසි මාපක 460ක් විසිරී පවතින අතර, වර්තමාන ක්‍රියාකාරීත්වය හා දත්ත ලැබීම් අනුව සාම්ප්‍රදායික වැසිමාපක 420කින් පමණක් දත්ත ලබාගැනීම සිදුවන අතර, වැසි මාපක 40කින් දත්ත අඛණ්ඩව නොලැබේ. මෙම වැසි මාපකවල නඩත්තු කටයුතු සිදුනොකරන අතර, ඉවත්කර තිබූ මධ්‍යස්ථාන සංඛ්‍යාව 03ක් විය. තව ද, දෙපාර්තමේන්තුව විසින් ස්ථාපනයකර ඇති ස්වයංක්‍රීය වර්ෂාමාන 122ක් පවතින අතර, 2024 දෙසැම්බර් 31 දිනට වර්ෂාමාන 84ක් පමණක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවති අතර 33ක් අක්‍රීය වී තිබුණි. නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් ඉවත්කර ඇති මධ්‍යස්ථාන සංඛ්‍යාව 05ක් විය.

**පළාලි ගුවන්තොටුපළ සඳහා ගුවන්තොටුපළකාළගුණ අනාවැකි (TAF) නිකුත් නොකිරීම**

අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) නිර්දේශ අනුව ගුවන්තොටුපළ සඳහා කාලගුණ විද්‍යා දත්ත ලබාදීමේ ප්‍රධාන අරමුණක් වනුයේ ගුවන් මඟීන් සහ ගුවන්තොටුපළ කාලගුණ විපත්වලින් ආරක්ෂා කිරීම වේ. යාපනය කාර්යාලය මගින් නිකුත්කරන කාලගුණ තොරතුරු සහ ගණිතමය ආකෘතිමය දත්ත උපයෝගී කරගෙන  කටුනායක කාලගුණ විද්‍යා කාර්යාලය විසින් පළාලි ගුවන්තොටුපළ සඳහා ගුවන්තොටුපළ කාලගුණ අනාවැකි (TAF) නිකුත්කරනු ලැබේ. නමුත් එම කාර්යාලයට අනාවැකිවල නිරවද්‍යතාවය තහවුරුකර ගැනීමට ස්ථානීය දත්ත නොමැතිවීම නිසා ගුවන්තොටුපළ කාලගුණ අනාවැකි නිකුත්කිරීම 2023 ජුනි 01 දින සිට නවතා තිබුණි.

**භූමි ප්‍රදේශවල අයිතිය පවරා නොගැනීම**

අනුරාධපුරය. මඩකළපුව, කටුගස්තොට, මහඉලුප්පල්ලම, මන්නාරම, කුරුණෑගල, වව්නියාව, මුලතිව්, හම්බන්තොට, ගාල්ල යන කාලගුණ විද්‍යා ප්‍රාදේශීය කාර්යාල පිහිටි භූමි ප්‍රදේශ 10ක අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට  2024 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතුකර නොතිබුණි.

## ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

**අනුකූලතා සහතික (COC) ලබානොගැනීම**

ගොඩනැගිල්ලක් ඉදිකිරීමෙන් පසුව එම ගොඩනැගිල්ල භාවිතයට ගැනීමට පෙර අනුමත සැලසුම් සහ රෙගුලාසි වලට අනුකූල වන බවට අනුකූලතා සහතිකයක් (COC) ලබාගත යුතු වුවද, සංවිධානයේ ප්‍රධාන කාර්යාලය පිහිටි රු. මිලියන 768ක් වටිනාකම වූ නව ගොඩනැගිල්ල සඳහා අනුකූලතා සහතිකය ලබාගෙන නොතිබුණි.

**ස්වයංක්‍රීය වර්ෂාමාන අක්‍රීයව පැවතීම**

අවදානම් සහිත දිස්ත්‍රික්ක 14ක 2024 දෙසැම්බර් 31 දිනට නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් නිකුත්කිරීම සඳහා දත්ත ලබා ගැනීමට ස්වයංක්‍රීය වර්ෂාමාන 330ක් ස්ථාපිතකර තිබූ අතර, ඉන් සක්‍රීයව පවතින ස්වයංක්‍රීය වර්ෂාමාන පද්ධති 251ක් අතරින් පද්ධති 192ක

දායකත්වය පමණක් ලබාගෙන නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් නිකුත්කර තිබුණි.

**නායයාම් කලාප සිතියම්ගත කිරීමේ ප්‍රමාදය**

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නායයෑම් පර්යේෂණ හා ආපදා කළමනාකරණ අංශය (LRRMD) මගින් දිස්ත්‍රික්ක 13ක වර්ග කිලෝමීටර 32,593ක භූමි ප්‍රමාණයක් ආවරණය වන පරිදි 1:50000ක පරිමාණයේ නායයෑම් කලාප සිතියම්ගත කිරීම 2022 වර්ෂයේ නිමකර තිබූ අතර, ප්‍රමුඛතා පදනමක් මත ඉන් වර්ග කිලෝමීටර 25,649ක් සඳහා පමණක් 1:10000 පරිමාණයට සිතියම්ගත කිරීමේ කටයුතු වර්ග කිලෝමීටර 10,560ක් ආවරණය වන පරිදි සිදුකර තිබුණි. එම සිතියම් ප්‍රමාණය පදනම්කර ගෙන සංවිධානය විසින් නිවාස, වෙළෙඳ, පාසල් හා ආගමික ගොඩනැගිලි 84,755ක් අවදානම් ප්‍රදේශවල පවතින බව හඳුනාගෙන තිබුණ ද, අවදානම් මට්ටම අධි, මධ්‍යම හා අවම ලෙස හඳුනා ගැනීමක් සිදුකර නොතිබුණි. තව ද, ප්‍රමුඛතා පදනම මත තෝරාගත් වර්ග කිලෝමීටර 25,649 තුළින් වර්ග කිලෝමීටර 15,089ක ප්‍රමාණයක් 1:10000 පරිමාණයට සිතියම්ගතකර නොතිබූ බැවින් එම බිම් ප්‍රමාණය තුළ අධි අවදානමක් සහිත ගොඩනැගිලි කොපමණ ප්‍රමාණයක් පවතී ද යන්න හඳුනාගෙන නොතිබුණි.

**භාණ්ඩාගාර ප්‍රතිපාදන අනුමත කාර්යයන් සඳහා උපයෝජනය නොකිරීම**

ව්‍යාපෘති 2ක්, වැඩසටහනක් හා බදුල්ල සහ කළුතර විද්‍යාගාර පහසුකම් සහිත කාර්යාල ඉදිකිරීම යන කාර්යයන් සඳහා ලබා දී තිබුණු රු.මිලියන 236.77ක් වූ භාණ්ඩාගාර ප්‍රතිපාදන අදාළ කාර්යයන් සඳහා නොයොදවා 2024 දෙසැම්බර් 31 දින වන විට ද ස්ථාවර තැන්පතුවල ආයෝජනයකර තිබුණි.

**ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය**

2023 හා 2024 වර්ෂවල නායයාම් අවදානම් අවමකිරීමේ ව්‍යාපෘති 07ක් (Landslide Mitigation Project) සඳහා මහභාණ්ඩාගාරයෙන් ලැබුණු මුදලින් රු.මිලියන 134.28ක මුදලක් 2024 වර්ෂය අවසාන වන විටත් ඉතිරිව පැවති අතර, එම ව්‍යාපෘති 2025 ජූනි මාසය වන විටත් අවසන් වී නොතිබුණි.

**ස්ථායිකරණ ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය**

ව්‍යාපෘති ණය ගිවිසුමට අනුව ණයදෙන ඒජන්සිය විසින් ලබාදෙනු ලැබූ ඇස්තමේන්තු මුදල එ.ජ.ඩොලර් මිලියන 101.3ක් වූ රු.මිලියන 18,396.03ක් විය. එයින් 2024 දෙසැම්බර් 31 දින වන විට උපයෝජනයකර තිබුණේ එ.ජ. ඩොලර් මිලියන 29.63ක් වන රු.මිලියන 8,486.93ක් පමණි. එය ප්‍රතිපාදන මුදලින් සියයට 29.24 ක් වූ අතර, භෞතික ප්‍රගතිය සියයට 58.32ක් විය. නමුත් ණය ගිවිසුමේ නිශ්චිතව ව්‍යාපෘති ක්‍රියාකාරකම් වර්ෂ 5ක් තුළ අවසන්කළ යුතු බව සඳහන් වුවද, එසේ කිරීමට නොහැකි වී තිබුණි.

ණයදෙන ඒජන්සි ආයතනයේ "ව්‍යාපෘති මෙහෙවර" වාර්තාවේ ඉදිකිරීම් කටයුතු අවසන්කිරීමෙන් පසු එහි තිරසාර නඩත්තු කටයුතු අදාළ ආයතනය වෙත ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය විසින් පැවරිය යුතු බව සඳහන් වුවත්, රු.මිලියන 1,308.77ක් වැයකර තිබූ ඉදිකිරීම් අවසන්, කොන්ත්‍රාත් 13ක් සඳහා එසේ සිදුකර නොතිබුණි.

## ශ්‍රී ලංකාවේ සිදුවන ස්වභාවික ව්‍යවසනවලින් වන ආපදාවන් කළමනාකරණය සඳහා සම්බන්ධිත ආයතනවල කාර්යසාධනය පිළිබඳ කාර්යසාධන විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණ

1. ස්වභාවික ව්‍යසනවල බලපෑම අවම කිරීම සඳහා රජයේ පවතින නීතිරීති හා ප්‍රතිපත්ති ප්‍රමාණවත් විය යුතු අතර ඒවා ක්‍රියාත්මක කිරීමේ වගකීම් දරන ආයතන එම නීති රාමුව තුළ කටයුතු කල යුතු වේ. පහත පරිදි අදාළ පනත්වලට අදාළ විධිවිධාන ක්‍රියාත්මක නොවීම හා ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය කාලීනව යාවත්කාලීන කිරීම සඳහා වැඩපිළිවෙලක් නොතිබීම මගින් ආපදා කළමනාකරණය කාර්යක්ෂමතාවයකින් ඉටුකිරීමට අදාළ සම්බන්ධිත ආයතනවලට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.

   i. 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 17වන වගන්තිය ප්‍රකාරව සභාවට අයත් වූ අරමුදලක් පවත්වා ගත යුතු වුවද ජාතික සභාවේ මෙතෙක් එවැනි අරමුදලක් පිහිටුවා නොතිබුණි.

   ii. පනතේ 20වන වගන්තිය ප්‍රකාරව ස්වකීය කර්තව්‍ය ඉටුකිරීම සඳහා සහ මේ පනත පරිපාලනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යයි සභාව සලකන නිලධරයන්, සේවකයන් හා අනුයෝජිතයන් පත්කිරීම සභාවට හැකි වුවද එවැනි පත්කිරීම් සිදුකර නොතිබුණි.

iii. මෙම පනතේ සංශෝධන සඳහා අනුමැතිය ලැබෙන තෙක් අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 04/2012 අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණ හා මූල්‍ය පාලනය, අධීක්ෂණය හා මෙහෙයවීම සඳහා අන්තර්කාලීන කමිටුවක් ස්ථාපිත කර තිබූ අතර අවුරුදු 10කට අධික කාලයක් ගත වී තිබුණද, අදාල සංශෝධනවලට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා නොතිබීමෙන් වාර්ෂිකව අන්තර්කාලීන කමිටු වෙනුවෙන් ආසන්න වර්ෂ 05ක්(2017 සිට 2021 දක්වා) තුළ රු.මිලියන 1.4ක් ගෙවීමට සිදු වී තිබුණි.

iv. ශ්‍රී ලංකාවේ ව්‍යසන කළමනාකරණය සම්බන්ධයෙන් වූ ජාතික ප්‍රතිපත්තිය 2014 වර්ෂයේ සකස්කර තිබූ නමුත් ඉන් පසුව නව අවශ්‍යතාවයන් හඳුනා ගනිමින් ආපදා කළමනාකරණය සම්බන්ධව ජාතික ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යාමට හෝ නව ප්‍රතිපත්තියක් පිළියෙල කිරීම සඳහා වූ වැඩපිළිවෙලක් නොතිබුණි.

v. 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව මධ්‍යස්ථානයේ මූලික කාර්යයක් වන ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ අවශ්‍ය සංශෝධන සිදුකර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නව ආපදා කළමනාකරණ සැලසුම පිළියෙල කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

2. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් සුනාමි හා සුළිසුලං සඳහා පූර්ව දැනුම් දීමේ කුළුණු 77ක් දිවයිනේ වෙරළබඩ ප්‍රදේශ ආවරණය වන පරිදි දිස්ත්‍රික්ක 14ක ස්ථාපිත කර තිබුණි. මෙම කුළුණු 77ම පුනරුත්තාපන හා නඩත්තු කටයුතු සිදුකිරීම වෙනුවෙන් 2016 දෙසැම්බර් 16 දින පුද්ගලික ආයතනයක් සමග ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙනුවෙන් එවකට පැවති ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වර්ෂ 05ක් සඳහා වැට් බදු සහිතව රු.මිලියන 135ක් වූ වටිනාකමකට ගිවිසුම් අත්සන් කර තිබුණි. මෙම කුළුණු 77න් වර්තමානය වනවිට කුළුණු 55ක් අක්‍රිය වී ඇති අතර කුළුණු 22ක් පමණක් ක්‍රියාකාරී තත්වයේ පවතී. මෙම කුළුණු වෙනුවෙන් 2016 සිට මේ දක්වා පුද්ගලික ආයතනය වෙත රු.මිලියන 90ක් සහ වර්තමානය වන විට එහි නඩත්තු කටයුතු වෙනුවෙන් රු.576,185 ක මුදලක් වැය කර තිබුණද, එම කුළුණු ස්ථාපිත කිරීමෙන් අපේක්ෂිත අරමුණ වර්තමානය වන විට ඉටුකර ගැනීමට නොහැකි වීමෙන් වැඩසටහනේ ඵලදායීත්වය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. පූර්ව දැනුම් දීමේ කුළුණු වෙනුවට වර්තමානයේ වෙනත් විකල්ප කෙරෙහි අවධානය යොමු වී තිබූ බව නිරීක්ෂණය විය.

3. **වියළි කාලගුණය හේතුවෙන් සිදුවන හානිය අවමකිරීම සඳහා භෞතික පහසුකම් සැපයීම.**

දිවයිනට බලපානු ලබන වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් තම දෛනික පානීය ජල අවශ්‍යතා සපුරාගත නොහැකිව සිටින මහජනතාව සඳහා පානීය ජල අවශ්‍යතාව සපුරාලීමට

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් දිවයිනේ සියලුම දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශ වෙත ට්‍රැක්ටර් බවුසර් 191 ක්, ලොරි බවුසර් 133 ක් හා ජල ටැංකි 11,936 ක් ලබා දී ඇත. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

i. මෙම ට්‍රැක්ටර් බවුසර් තුල ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් එක් එක් දිස්ත්‍රික්ක සඳහා 2013 සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ රු.මිලියන 316කට මිලදී ගෙන තිබූ ට්‍රැක්ටර් බවුසර් 179 ක්, 2016 වර්ෂයේ ආසියානු සංවර්ධන බැංකුවේ පරිත්‍යාග ලෙස රු.මිලියන 22ක වටිනාකමකට ලැබී තිබූ ට්‍රැක්ටර් බවුසර් 12 ක් ඇතුලත්ව තිබුණි.

ii 2021 වර්ෂයේ පෙබරවාරි මාසයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත බෙදා දුන් ට්‍රැක්ටර් බවුසර් පවතින ස්ථානය තහවුරු කර ගැනීමට ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය එක් එක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙතින් තොරතුරු විමසීමේදී අම්පාර, අනුරාධපුරය, මොණරාගල, කුරුණෑගල යන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබාදී තිබූ ට්‍රැක්ටර් බවුසර් 05ක් එම කාර්යාලවල නොමැති බව දන්වා තිබුණි.

iii ඉහත ට්‍රැක්ටර් බවුසර් 191 න් 188 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත 2021 වර්ෂයේ මාර්තු 03 වන දින පැවරූ බව විගණනයට දන්වා තිබුණි. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ අරමුණු වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා සහන කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම සිදු කරන බව ආයතනික අරමුණු ලෙස දක්වා ඇති නමුත්, ඉහත ට්‍රැක්ටර්, බවුසර් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත පවරාදීමෙන් පසු ඒ පිළිබඳව පසුවිපරමක් කළ බවට තොරතුරු නිරීක්ෂණය නොවීය. රු.මිලියන 316ක රජයේ මුදලක් වැයකර මිලදී ගෙන තිබූ ට්‍රැක්ටර් බවුසර් පිළිබඳව පසුවිපරමක් සිදු නොකර දිස්ත්‍රික් කාර්යාල වෙත පවරා තිබීම හේතුවෙන් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය බලාපොරොත්තු වූ පානීය ජල අවශ්‍යතා සඳහා පහසුකම් සැපයීමේ අරමුණ කොතෙක් දුරට ඉටු වී ඇත්ද යන්න නිරීක්ෂණය කළ නොහැකි විය.

iv ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් 2015 සහ ඊට පෙර වර්ෂවල සිට 2021 වර්ෂය දක්වා ජල ටැංකි 12,236 ක් දිස්ත්‍රික්ක 25 තුළ බෙදා දී තිබූ අතර එම ජල ටැංකි දිස්ත්‍රික් කාර්යාලවල පවතින බවත්, පානීය ජල අවශ්‍යතා සඳහා භාවිතා කිරීමට සුදුසු තත්ත්වයක පවතින බවත්, ජලටැංකි පවුල් සඳහා බෙදා දීම පිළිබඳවත් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය පසුවිපරමක් සිදුකරන බවට තොරතුරු නිරීක්ෂණය නොවීය.

## නගර සංවර්ධන ව්‍යාපෘති

වගු අංක 2.42 - නාගරික සංවර්ධන අංශයේ ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ණය ආධාර මුදල | | ව්‍යාපෘති කාලය | | 2024.12.31 දිනට උපයෝජනය | | 2024.12.31 දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | එ.ජ.ඩොලර්. මිලියන | රු.මිලියන | ආරම්භක දිනය | ව්‍යාපෘති කාලය | එ.ජ.ඩොලර්. මිලියන | රු.මිලියන | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
| 1 | අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය (AIUDP) | EURO 52 | 8,149.96 | 2016 දෙසැම්බර් 01 | වර්ෂ 5 | EURO 9.21 | 2,754.08 | 28.16 | 60.91 |
| 2 | නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතිය (UPPF) | 5.27 | 1,064.79 | 2019 මාර්තු 06 | වර්ෂ 3 | 1.6 | 523.42 | 40.35 | 100 |
| 3 | කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය දීමේ ව්‍යාපෘතිය (SCURP) | 200 | 35,164 | 2019 ජුලි 22 | වර්ෂ 6 | 90.12 | 25,236.94 | 54.59 | 23.39 |

මූලාශ්‍රය - මූල්‍ය වාර්තා නාගරික සංවර්ධන අංශය

## අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය (AIUDP)

**ණය මුදල් ඌන උපයෝජනය**

කැබිනට් තීරණයකට අනුව ව්‍යාපෘති කාලය 2025 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබූ අතර ණය ගිවිසුම අනුව සංවර්ධනය සඳහා වන ප්‍රංශ නියෝජිතායතනය එකඟ වූ ණය මුදල වන යුරෝ මිලියන 52 ක මුදලින් 2024 දෙසැම්බර් 31 දිනට යුරෝ මිලියන 5.97 ක් එනම් ණය මුදලින් සියයට 12ක තරම් අඩු ප්‍රමාණයක් උපයෝජනය කර තිබුණි.

ණය පහසුකම් ගිවිසුමට අනුව පැකේජ 12 ක ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට අපේක්ෂා කළද, 2024 වර්ෂය අවසානය දක්වා පැකේජ 7 ක ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර හෝ නොතිබුණි.

**අපේක්ෂිත කාර්යසාධනය ළඟා කර නොගැනීම**

ව්‍යාපෘතිය යටතේ සිදු කිරීමට අපේක්ෂිත පැකේජ 12 න් රු. මිලියන 2,123.19 ක් වටිනා පැකේජ 05 ක් පමණක් ආරම්භ කර තිබූ අතර 2022 දෙසැම්බර් 31 වන දින පැකේජ 2 ක් පමණක් නිම කර තිබුණි. 2023 වර්ෂයේ මාස 04 සිට 07 දක්වා ප්‍රමාදයකින් පසු අංක 3 සහ 4 පැකේජ නිම කරන ලද අතර දුර්වල ඉදිකිරීම් අධීක්ෂණය සහ සැලසුම් පිළියෙල කිරීමේ දුර්වලතා ඊට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

තවද ජාතික මෙහෙයුම් මැදිරිය විසින් දේශීය අරමුදල් උපයෝජනය කරමින් 2024 වර්ෂයේදී රු. මිලියන 2,070ක ප්‍රතිපාදන මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබුණි. නමුත් ණය සපයන ආයතනය සමඟ එම මුදල ප්‍රතිපූර්ණය කරන ආකාරය සම්බන්ධයෙන් ගිවිසුමක් මඟින් එකඟතාවයකට එළඹී නොතිබුණි.

**අනුමත සීමාවන් ඉක්මවා විචලතාවන් සඳහා ඉඩදීම**

අනුරාධපුර දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාලව, ඇස්තමේන්තුගත වටිනාකමින් සියයට 10ක ශුද්ධ මිල විචල්‍යතාවක් දක්වා ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශවලට යටත්ව අනුමත කළ හැකි වුව ද, ඊට පටහැනිව ඇස්තමේන්තුගත වටිනාකමින් සියයට 23ක් වූ රු. මිලියන 196ක් දක්වා වූ විචලතා නියෝග 29ක් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් අනුමත කර ගෙවා තිබුණි.

## නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතිය (UPPF)

**ගිවිසුම් කාලය දීර්ඝ කිරීම**

ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු සියල්ල 2020 වර්ෂය අවසාන වන විට නවතා දමා තිබුණු අතර නැවත ගිවිසුම් කාලය 2024 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි.

**ව්‍යාපෘති විෂයපථය සීමා කිරීම**

මෙම ව්‍යාපෘතිය සංරචක 3ක් යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා දඹුල්ල, ත්‍රිකුණාමලය, කුරුණෑගල හා රත්නපුර දිස්ත්‍රික්ක තෝරාගෙන 2019 සිට 2022 දෙසැම්බර් 31 දක්වා රු. මිලියන 418.29 ක් වැයකර තිබුණි. කාලය දීර්ඝ කිරීමේදී ත්‍රිකුණාමලය හා දඹුල්ල යන දිස්ත්‍රික්ක සඳහා පමණක් ප්‍රමුඛතාවය දීමට තීරණය කිරීම හේතුවෙන් කුරුණෑගල හා රත්නපුර යන දිස්ත්‍රික්ක සඳහා වැය කර තිබූ මුදල් නිෂ්කාර්ය වී තිබුණි.

මෙම ව්‍යාපෘතිය 2019 මාර්තු 06 වන දින ආරම්භ කරන ලද අතර 2022 මාර්තු 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. නමුත් වැඩ කටයුතු නිසි ලෙස සිදු නොකිරීම හේතුවෙන් එකඟ වූ ණය මුදලින් එ.ජ. ඩොලර් මිලියන 1.33 කට සමාන රු. මිලියන 434.59 පමණක් වියදම් තිබුණි.

## කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහය දීමේ ව්‍යාපෘතිය (SCURP)

**ගිවිසුම් කාලය දීර්ඝ කිරීම**

ව්‍යාපෘතිය ආරම්භ කර වසර 5 යි මාස 6 කට පසු 2024 දෙසැම්බර් 31 වන විට භාවිත කර තිබුණේ ව්‍යාපෘතිය සඳහා එකඟ වූ එ.ජ.ඩොලර් මිලියන 200 ක ණය මුදලෙන් එ.ජ.ඩොලර් මිලියන 77.28 කට සමාන රු. මිලියන 21,640.51ක් පමණි.

**අකාර්යක්ෂම අරමුදල් භාවිතය**

ව්‍යාපෘතියේ අකාර්යක්ෂම අරමුදල් භාවිතය හේතුවෙන් එ.ජ.ඩොලර් මිලියන 200ක ණය මුදලින් එ.ජ.ඩොලර් මිලියන 70 ක් අඩු කිරීමටත් එ.ජ.ඩොලර් මිලියන 82ක් වූ ශ්‍රී ලංකා රජයේ දායකත්වය එ.ජ.ඩොලර් මිලියන 28 දක්වා එ.ජ.ඩොලර් මිලියන 54 කින් අඩු කිරීමට කැබිනට් මණ්ඩලය තීරණය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 3 වන අදියරේ ව්‍යාපෘති කටයුතු අත්හිටුවා ඇති අතර නිවාස ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1272 කින් අඩු කර තිබුණි. සංශෝධිත ගිවිසුම අනුව ඉඩම් ප්‍රතිසංවර්ධනය සඳහා පුද්ගලික හවුල්කාර දායකත්වය සම්පූර්ණයෙන් ඉවත් කර තිබුණි. නමුත් 2024 වර්ෂයේ දී එ.ජ.ඩොලර් මිලියන 28 ක් නැවත ව්‍යාපෘතිය වෙනුවෙන් ලබා දීමට කැබිනට් අනුමැතිය ලබා දී තිබුණි.

**කොළඹගේ මාවත හා ස්ටේඩියම්ගම නිවාස යෝජනා ක්‍රම**

කොළඹගේ මාවත නිවාස ඒකක 624 ක් ඉදිකිරීම් ව්‍යාපෘතියේ හා ස්ටේඩියම්ගම නිවාස 1000 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ අවසන් අදියරේ පැවතියද, ව්‍යාපෘතියේ මළාපවහනය කොළඹ මහනගර සභා මළාපවහන පද්ධතියට යා කිරීමට මූලිකව යෝජනා වී තිබුණ ද වර්තමානයේ එම පද්ධතියේ පවතින ගැටලු හේතුවෙන් ව්‍යාපෘතියේ වැඩ අවසන් කර ජනතා අයිතියට පත්කල නොහැකි තත්ත්වයක් පැන නැගී තිබුණි.

**ඇපල්වත්ත නිවාස යෝජනා ක්‍රමය**

රු.මිලියන 4,473.50 ක ඇස්තමේන්තුගත වටිනාකමක් සහිත ඇපල්වත්ත නිවාස ඒකක 700 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය මඟින් නිවාස ඒකක 700 ක් ඉදිකිරීමට යෝජිතව පැවතුණි. 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව මෙම ව්‍යාපෘතියේ සමස්ත ඉදිකිරීමේ කටයුතුවලින් සියයට 93 ක් නිමකිරීමට අපේක්ෂා කර තිබුණු නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විට සියයට 40.47 ක කාර්යසාධනයක් පමණක් ළඟාකර ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

**අවිධිමත් කොන්ත්‍රාත් අවලංගු කිරීම**

2023 අගෝස්තු 21 වන දින ගැටළු වැළැක්වීමේ විනිශ්වය මණ්ඩලය විසින් ලබා දුන් තීරණය අධ්‍යයනය කිරීමේදී කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි අංක 15.2 හි සඳහන් උප කොන්දේසිවල දක්වා ඇති පියවර ක්‍රමානුකූලව අනුගමනය නොකර පෞද්ගලික ඉදිකිරීම් සමාගමක් සමඟ ඇතිකරගත් කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුට රු.මිලියන 294.53 ක මුදලක් ගෙවීමට සිදු වී තිබුණි.

## සෞඛ්‍යය අංශයේ ව්‍යාපෘති

**වගු අංක 2.43 - සෞඛ්‍ය අංශ සම්බන්ධ ව්‍යාපෘති දත්ත**

| අනු අං. | ව්‍යාපෘතියේ නම | ණය/ ආධාර මුදල | | කාලය | | 2024/12/31 දිනට උපයෝජනය | | 2024/12/31 දිනට ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | එ.ජ.ඩොල ර්. මිලියන | රු. මිලියන | ආරම්භක දිනය | ව්‍යාපෘති කාලය | එ.ජ.ඩොල ර් මිලියන | රු. මිලියන | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
| 1 | සෞඛ්‍ය පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | ණය - 37.50 | 6,937.50 | 2018 දෙසැම්බර් 01 | වසර 6 | 26.28 | 5,986.12 | 70 | ඉදිරිපත් කර නොමැත |
| | | ආධාර - 12.50 | 2,312.50 | 2018 දෙසැම්බර් 01 | වසර 6 | 7.49 | 1,695.72 | 60 | ඉදිරිපත් කර නොමැත |
| | | දේශීය - 10.00 | 1,850.00 | 2018 දෙසැම්බර් 01 | වසර 6 | 2.55 | 591.67 | 32 | ඉදිරිපත් කර නොමැත |
| 2 | සෞඛ්‍ය පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යණය | ණය - 110.00 | 21,975.00 | 2021 නොවැම්බර් 17 | වසර 4 | 56.28 | 16,405.27 | 51 | ඉදිරිපත් කර නොමැත |
| | | ආධාර - 03.00 | 598.50 | 2021 නොවැම්බර් 17 | වසර 4 | 0.11 | 32.90 | 3 | ඉදිරිපත් කර නොමැත |
| | | දේශීය - 10.00 | 1,995.00 | 2021 නොවැම්බර් 17 | වසර 4 | 0.81 | 248.64 | 12 | ඉදිරිපත් කර නොමැත |
| 3 | කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සහ කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සඳහා දෙවන අතිරේක මූල්‍යණය | ණය - 209.11 සංශෝධනය 225.72 | 41,717.45 සංශෝධනය 45,031.15 | 2020 අප්‍රේල් 04 | වසර 3 මාස 08 | 218.2 | 43,308.35 | 97 | 95.50 |
| 4 | කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය - තෙවන අතිරේක මූල්‍යණය | ණය - 100.00 සංශෝධනය 86.76 | 21,000.00 සංශෝධනය 18,219.60 | 2021 සැප්තැම්බර් 27 | වසර 2 මාස 03 | 86.76 | 18,219.60 | 100 | ඉදිරිපත් කර නොමැත |
| 5 | අත්‍යවශ්‍ය ඖෂධ සහ වෛද්‍ය සැපයුම් ප්‍රසම්පාදනය සඳහා එ.ජ.ඩොලර් මිලියන 100 ක හදිසි ආධාර ව්‍යාපෘතිය. | ණය - 100.00 සංශෝධනය 60.00 | 35,000.00 සංශෝධනය 21,000.00 | 2022 ජූලි 18 | වසර 3 මාස 05.50 | 28.16 | 9,391.85 | 47 | 70.00 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 6 | ප්‍රථමික සෞඛ්‍ය සේවා සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය - සංරචක i (මධ්‍යම මට්ටම) | ණය - 50.845 | 8,030.46 | 2019 ජනවාරි 23 | වසර 5 | 24.3 | 3,849.00 | 48 | ඉදිරිපත් කර නොමැත |
| 7 | ප්‍රථමික සෞඛ්‍ය සේවා සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය - සංරචක ii | ණය - 14.22 සංශෝධනය 5.22 | 2,590.74 සංශෝධනය 951.03 | 2019 පෙබරවාරි 01 | වසර 4 මාස 11 | 3.92 | 839.12 | 75 | ඉදිරිපත් කර නොමැත |
| 8 | කොවිඩ් 19 එන්නත් ප්‍රතිචාරාත්මක ප්‍රතිසාධන ව්‍යාපෘතිය | ණය - 150 සංශෝධනය 106.4 | 30,000.00 සංශෝධනය 22,981.43 | 2021 අගෝස්තු 19. 2022 දෙසැම්බර් 31 දින ඇවර කරන ලදී. | වසර 2 මාස 10 | 106.4 | 22,981.43 | 100 | ඉදිරිපත් කර නොමැත |
| | | දේශීය - 11.85 සංශෝධනය 8.48 | 2,370.00 සංශෝධනය 1,838.43 | 2021 අගෝස්තු 19. 2022 දෙසැම්බර් 31 දින ඇවර කරන ලදී. | වසර 2 මාස 10 | - | 25 | 1 | ඉදිරිපත් කර නොමැත |
| 9 | සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය. | ණය (ජපන් යෙන්) 10,639.00 | 15,915.00 | 2018 ඔක්තෝබර් 20 | වසර 7 | ජපන් යෙන් 243.10 | 437.19 | 2 | ඉදිරිපත් කර නොමැත |
| | | දේශීය | 713 | 2018 ඔක්තෝබර් 20 | වසර 7 | - | 107.23 | 15 | ඉදිරිපත් කර නොමැත |

මූලාශ්‍රය -සෞඛ්‍ය අංශ ව්‍යාපෘති මූල්‍ය හා ප්‍රගති වාර්තා

**ගිවිසුම් අනුව විගණකාධිපතිවරයා විසින් විගණනය නොකළ ව්‍යාපෘති**

සෞඛ්‍ය අමාත්‍යාංශ වැය විෂයයන් යටතේ 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා විදේශ ආධාර ව්‍යාපෘති 22 ක් වෙනුවෙන් රු.මිලියන 52,086.35 ක ප්‍රතිපාදන වෙන්කර ඉන් රු. මිලියන 22,045.07 ක මුදලක් වැයකර තිබුණි. නමුත් එකී විදේශ ආධාර ව්‍යාපෘතිවලට අදාළ ගිවිසුම් අනුව විගණකාධිපතිවරයා ව්‍යාපෘති විගණක ලෙස නිශ්චිතව හඳුනාගෙන නොමැති බැවින් විගණකාධිපතිවරයාට එකී ව්‍යාපෘති සම්බන්ධයෙන් විගණනයක් සිදුකර විගණන වාර්තා නිකුත් කිරීමට ප්‍රතිපාදන නොතිබුණි.

## ප්‍රාථමික සෞඛ්‍ය සේවා සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය සංරචකය II

**භාණ්ඩ ලැබීමට පෙර ගෙවීම් කිරීම**

2024 ජූලි 31 වන දින ස්මාර්ට් පුවරු සහ පැනල් 22 ක් සහ ප්‍රොජෙක්ටර් 20ක් මිලට ගැනීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට රු.මිලියන 18.43 ක් ගෙවා තිබුණි. එම භාණ්ඩ අදාළ ආයතන වෙත භාරදීම 2024 අගෝස්තු 28 දින සිට සැප්තැම්බර් 06

දින දක්වා සිදු කර තිබුණි. ඒ අනුව, භාණ්ඩ ලැබීමට පෙර ගෙවීම සිදු කර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

## සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (HSEP)

**ඉදිකිරීම් පැහැර හැරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග නොගැනීම**

2022 ජනවාරි 25 වන දිනට හපුතලේ ප්‍රාදේශීය රෝහලේ බාහිර රෝගී අංශයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරු සමඟ 2021 අප්‍රේල් 09 වන දින ගිවිසුමක් අත්සන් කර තිබුණු අතර, නිම කරන ලද වැඩ කොටස් සඳහා අවස්ථා 03 කදී රු. මිලියන 8.01 ක් ගෙවා තිබුණි, කෙසේ වුවද, කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතිය අතර මග නතර කිරීම හේතුවෙන්, 2023 පෙබරවාරි 03 වන දින ගිවිසුම අවලංගු කිරීම සිදු කර තිබුණි. ව්‍යාපෘතියේ ඉදිකිරීම් පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත යුතු රු. මිලියන 1.97 ක මුදලක්, ව්‍යාපෘතිය අවසන් වී වසර 02 කට වැඩි කාලයක් ගත වී තිබුණද, විගණන දිනය වූ 2025 මාර්තු 10 වන දින දක්වා අයකර ගෙන නොතිබුණු අතර ඉදිකිරීම් පැහැර හැරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට එරෙහිව නීතිමය පියවරද ගෙන නොතිබුණි.

## අත්‍යවශ්‍ය ඖෂධ සහ වෛද්‍ය සැපයුම් ප්‍රසම්පාදන සඳහා එක්සත් ජනපද ඩොලර් මිලියන100 ක හදිසි ආධාර ව්‍යාපෘතිය

**ප්‍රසම්පාදන උපදේශකයන් බඳවා ගැනීම**

2022 ජුනි 30 දිනැති අංක DMS/7777/HSEP/VO/11දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය ප්‍රකාරව ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන නිලධාරීන් දෙදෙනෙකු පත් කිරීම අනුමත කර තිබුණි. එසේම 2023 අප්‍රේල් 04 දින පවත්වන ලද ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් වාර්තාවේ අංක 4.3 ඡේදය අනුව ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතුවලට අදාළ සේවක අවශ්‍යතා මේ අවස්ථාවේදී සම්පූර්ණ කළ නොහැකි බවත්, ඒ සඳහා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයට අනුමත කර ඇති තනතුරු 09 තුළින් අභ්‍යන්තරව හුවමාරු කර ගන්නා ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇති බව සඳහන් කර තිබුණි. නමුත් ඊට පටහැනිව ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන උපදේශකයන් දෙදෙනෙකු බඳවාගෙන රු.මිලියන 1.69ක උපදේශක ගාස්තු ගෙවා තිබුණි.

**අනුමත සීමාව ඉක්මවා ප්‍රසම්පාදනයන් සිදුකිරීම**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය ලෙස විගණනයට ඉදිරිපත් කරන ලද ලිපියේ සඳහන් පරිදි වෙළඳපොල මිල සැදහුම් ක්‍රමය සඳහා ලබාදී තිබූ සීමාව රු. මිලියන 73 ක් වුවත් එම සීමාව ඉක්මවා එකතුව රු.මිලියන 666.58 ක වටිනාකමින් යුත් ප්‍රසම්පාදනයන් 06ක් සිදුකර තිබුණි.

**ලංසුකරුවන්ට විශේෂ සැලකිල්ලක් දැක්වීම**

Transfusion Drugs ප්‍රසම්පාදනය සඳහා 2024 ජුනි 04 දින පලකරන ලද ප්‍රසම්පාදන දැන්වීමට අනුව ලංසු කාලය සති දෙකක් විය. මේ සඳහා ලංසු දෙකක් ලැබී තිබුණු අතර ලංසු විවෘත කිරීම 2024 ජුනි 18 දින සිදු කර තිබුණි. තාක්ෂණික ඇගයීම් වාර්තාව 2024 ජූලි 29 දින සකස් කර තිබුණද, පළමු ලංසුකරු ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) ලියාපදිංචි සහතිකය ලංසු විවෘත කරන ලද දිනට ලබා ගෙන නොතිබුණු බැවින් තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් තිදෙනාගෙන් දෙදෙනකු පළමු ලංසුකරුට ලංසුව ප්‍රදානය කිරීම සඳහා වූ නිර්දේශයට එකග වී නොතිබුණි. කෙසේ වෙතත් මෙම තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. 2024 අගෝස්තු 09 දින නැවත තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවක් සකස්කර පළමු ලංසු කරුට ලංසුව ලබා දීම නිර්දේශ කර තිබුණි. එකී නිර්දේශය 2024 අගෝස්තු 26 දින ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබුණි. මේ අනුව යථෝක්ත ඖෂධයෙන් vials 200,000 ක් එකක් එ.ජ.ඩොලර් 6.90 බැගින් එ.ජ.ඩොලර් 1,380,000 කට සැපයීම සඳහා 2024 සැප්තැම්බර් 18 දින ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව පළමු ලංසුකරුගේ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) ලියාපදිංචි සහතිකය වලංගු වන තෙක් තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය ලබාදීම ප්‍රමාදකර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

## කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර දැක්වීම් සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සහ එම ව්‍යාපෘතියේ දෙවන අතිරේක මූල්‍යනය

**වෛද්‍ය සැපයීම් බිල්පත් මගින් තහවුරු නොවීම**

හම්බන්තොට පැරණි දිස්ත්‍රික් මහ රෝහල බෝවන රෝග රෝහලක් බවට පත් කිරීම සඳහා ව්‍යාපෘති අරමුදල් රු. මිලියන 424.63 ක් වැය

කර ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණද, අදාළ අරමුණ සඳහා එම ඉදිකිරීම් භාවිතා නොකරන බව අනාවරණය විය. එසේම 2024 අප්‍රේල් 30 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද සැපයුම්කරුවන්ගේ නාමමාත්‍ර ඉන්වොයිස් පදනම් කරගෙන වෛද්‍ය සැපයීම් මිලදී ගැනීම සඳහා රු. මිලියන 7,790.84 ක් ව්‍යාපෘතිය විසින් අදාළ සැපයුම්කරුවන්ට ගෙවා තිබුණු අතර ඊට අදාළව ඉදිරිපත් කරන ලද වාණිජ ඉන්වොයිස්වල වටිනාකම රු. මිලියන 6,587.28ක් පමණක් වූයෙන් රු. මිලියන 1,072.77 කට අදාළ වාණිජ ඉන්වොයිස් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එබැවින් මෙම වෛද්‍ය සැපයීම් සත්‍ය ලෙසම ලැබුණු බවට විගණනයේදී තහවුරු නොවීය.

**විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම**

වෛද්‍ය සැපයීම් මිලදී ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) වෙත රු. මිලියන 5,424.31 ක මුදලක් ගෙවා තිබුණි. UNICEF ආයතනය විසින් නිකුත් කරන ලද ගැණුම් ඇණවුම් 5 කට අදාළ වෛද්‍ය සැපයීම් විදේශීය සැපයුම්කරුවන් විසින් සපයා තිබුණි. විගණනයට ඉදිරිපත් කළ ඉන්වොයිස් අනුව මෙම ගැණුම් ඇණවුම් 5 යටතේ පිරිවැය එ.ජ. ඩොලර් 3,968,681.18 ක්වූ වෛද්‍ය සැපයීම් අයිතම 12 කට අයත් ඒකක 101,343 ක් සැපයූ බව දැක්වුවද එම වෛද්‍ය සැපයීම් ලැබුණේ කුමන ආයතනයකටද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එසේම එක්සත් ජාතීන්ගේ ව්‍යාපෘති සේවා කාර්යාලය (UNOPS) හරහා මිලදී ගත් වෛද්‍ය උපකරණ හා වෛද්‍ය සැපයීම්වල පිරිවැය 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 3,672.02ක් ලෙස දක්වා තිබුණද ඊට අදාළ උපලේඛනය අනුව එම අගය රු. මිලියන 1,709.89 ක් විය. ඒ අනුව රු. මිලියන 1,962.13 ක් වෙනුවෙන් විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**වත්කම් ගිණුම් ගත නොකිරීම**

ඉහත සඳහන් ප්‍රාථමික සෞඛ්‍ය සේවා සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය සංරචකය II, සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (HSEP), සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යකරණය, අත්‍යවශ්‍ය ඖෂධ සහ වෛද්‍ය සැපයුම් ප්‍රසම්පාදන සඳහා එ.ජ.ඩොලර් මිලියන100 ක හදිසි ආධාර ව්‍යාපෘතිය, කොවිඩ්

19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සහ එම ව්‍යාපෘතියේ දෙවන අතිරේක මූල්‍යණය යන ව්‍යාපෘති 5 යටතේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම සඳහා රු. මිලියන 12,442.36ක් වැය කර තිබුණද එම වත්කම් අමාත්‍යාංශයේ හෝ වත්කම් පවරන ලද ආයතනවල හෝ මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම් ගත කිරීම පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## බලශක්ති අංශයේ ව්‍යාපෘති

### හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (අදියර I)

**මොරගොල්ල ජල ව්‍යාපෘතිය**

ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද මොරොගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය මුදල් යටතේ එ.ජ.ඩොලර් මිලියන 113.86 ක් වෙන් කර තිබුණු අතර එයින් එ.ජ.ඩොලර් මිලියන 94.65 ක් වටිනා කොන්ත්‍රාත් පැකේජ 04ක් 2018 වර්ෂයේ සිට ප්‍රදානය කර තිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය හේතුවෙන් එයින් සියයට 84 ක් නියෝජනය කරන එ.ජ.ඩොලර් මිලියන 79.76 ක් පමණක් ණය කාලසීමාව වූ වර්ෂ 10ක් අවසානයේදී වියදම් කර තිබුණි. එබැවින්, ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු සම්පූර්ණ කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව මගින් එ.ජ.ඩොලර් මිලියන 15 ක අතිරේක මූල්‍යනය පහසුකමක් ලබා ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලයට සිදුවී තිබුණි. ප්‍රගති වාර්තාවට අනුව, 2024 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 84.8 සහ සියයට 84.3 ක් ලෙස පැවතුණි.

**විදුලිබල සැපයුමේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ සහායක ව්‍යාපෘතිය**

ව්‍යාපෘතියේ පැකේජ 04 යටතේ කිලෝමීටර් 285 ක දිගකින් යුත් කිලෝවොට් 33 කුළුණු මාර්ග සහ කිලෝවොට් 33 ක ගැන්ට්‍රි 13 ක් ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව 2019 මැයි 30 වන දින එ.ජ.ඩොලර් මිලියන 23.29 හා රු. මිලියන 3,025.33 කට ප්‍රදානය කර තිබුණු අතර දින 730 ක් ඇතුළත නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත්, 2025 මාර්තු 31 දක්වා අවස්ථා 04 කදී දින 1,251 කින් කාලය දීර්ඝ කිරීම් ලබාදී තිබුණු අතර 2024 වර්ෂය

අවසානයේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 70.5 සහ සියයට 73.8 ලෙස වාර්තා කර තිබුණි.

## හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (අදියර II)

**පාදුක්ක හොරණ සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම**

ව්‍යාපෘතියේ පැකේජය 2 ලොට් බී2 යටතේ ක්‍රියාත්මක පාදුක්ක - හොරණ 132kV, කිලෝමීටර් 25ක සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව 2019 පෙබරවාරි 28 වන දින එ.ජ.ඩොලර් මිලියන 3.83කට ප්‍රදානය කර තිබුණු අතර අවස්ථා 04 කදී දින 710 ක කාලයක් දීර්ඝ කිරීමෙන් පසු 2024 මාර්තු 31 වන දින නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, සිවිල් වැඩ සහ ස්ථාපන කටයුතු සියයට 70කින් අඩුකරමින් හා කොන්ත්‍රාත් මිල එ.ජ.ඩොලර් මිලියන 2.79ක් ලෙස සංශෝධනය කර ඉතිරි වැඩ ලංකා විදුලිබල මණ්ඩලය විසින් සම්පූර්ණ කිරීමට යටත්ව 2024 ජනවාරි 04 වන දින කොන්ත්‍රාත්තුවේ විෂයපථය අඩුකර තිබුණි. විගණිත දින වූ 2025 ජූනි 02 දිනවන විටත් රු. මිලියන 954.98ක් වටිනා විදේශයන්ගෙන් සපයන ලද උපකරණ සහ අත්‍යාවශ්‍ය අමතර කොටස් ලංකා විදුලිබල මණ්ඩලය වෙත භාරදීමකින් තොරව කොන්ත්‍රාත්කරුගේ ගබඩාවල පැවතුණු අතර ලංකා විදුලිබල මණ්ඩලය ඉතිරි වැඩ ආරම්භ කර නොතිබුණු බව නිරීක්ෂණය විය. එබැවින්, ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණි.

**උපපොළවල් වැඩි දියුණු කිරීම හා කෙරවලපිටිය ස්විචින් ස්ටේෂනයක් ඉදිකිරීම**

ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක අම්බලන්ගොඩ හා පන්නල කොටුමා උපපොළ වැඩිදියුණු කිරීම සහ 132/33 KV 31.5 MVA අමතර ට්‍රාන්ස්ෆෝමර් 2ක් සැපයීම හා කෙරවලපිටිය 220 KV ස්විචින් ස්ටේෂනයක් ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත් දෙකෙහි කොන්ත්‍රාත් කොන්දේසිවලට පටහැනිව ඉතිරි වැඩ සඳහා පිළිවෙළින් රු.මිලියන 163.54, එ.ජ.ඩොලර් 199,500 හා රු.මිලියන 13.86 බැංකු ඇපකර ලබාගෙන කොන්ත්‍රාත්කරුවන් වෙත මුදල් ගෙවා තිබුණු අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය. තවද, කෙරවලපිටිය 220 KV

ස්විච් ස්ටේෂනය ඉදිකිරීමෙහි ඉතිරි වැඩ සඳහා ඉහත පරිදි අත්තිකාරම් ලබාදීමෙන් පසුව වැඩ විෂය පථය රු. මිලියන 4.70කින් අඩුකර තිබුණි.

## කෘෂිකර්ම හා වැවිලි අංශ ව්‍යාපෘති

**වගු අංක 2.44 - කෘෂිකර්ම හා වැවිලි අංශයේ ක්‍රියාත්මක ව්‍යාපෘති**

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ණය /ආධාර මුදල | | ව්‍යාපෘති කාලය | | 2024/12/31 දිනට උපයෝජනය | | 2024/12/31 දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | එ.ජ.ඩොලර් මිලියන | රු.මිලියන | ආරම්භක දිනය/වර්ෂය | ව්‍යාපෘති කාලය | එ.ජ.ඩොලර් මිලියන | රු.මිලියන | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
| 1 | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය | 110.00 | 19,800 | 2019 මැයි 7 | වසර 07 | 86.45 | 25,479.16 | 69 | 76 |
| 2 | කුඩාපරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන | 54.40 | 8,893 | 2017 ජුනි 26 | වසර 08 | 71.2 | 18,330.00 | 68 | 82 |
| 3 | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය | 42.70 | 12,596.50 | 2022 අගෝස්තු | වසර 06 | 2.06 | 626.22 | 3 | 15 |
| 4 | කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය - අදියර 01 | 48.62 | 10,800 | 2016 ඔක්තෝබර් 15 | වසර 8 | 83.3114 | 9616.341 | 99 | 87 |
| 5 | කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය - අදියර 02 | 88.10 | 24,618.20 | 2017 ජනවාරි 01 | වසර 8 | 82.71 | 22,264.18 | 94 | 100 |

මූලාශ්‍රය -කෘෂිකර්ම හා වැවිලි ව්‍යාපෘති අංශ මූල්‍ය හා ප්‍රගති වාර්තා

## දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය

**ඩ්‍රෝන තාක්ෂණය පදනම් සිතියම්**

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් දකුණු පළාතේ ඩ්‍රෝන කරණයේ අවශ්‍යතාවය හඳුනාගෙන නොතිබියදීත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ පුංචි අප්පු ජඳුර වැව පුනරුත්ථාපනය සඳහා අත්සන් කරන ලද කොන්ත්‍රාතුවට ඇතුළත් නොවූ සහ අවශ්‍යතාවය හඳුනා නොගත් ඩ්‍රෝන තාක්ෂණය පදනම් කරගෙන සිතියම් ලබා ගැනීම් සඳහා කොන්ත්‍රාත්කරු වෙත රු. මිලියන 2.24 ගෙවා තිබුණි. කොන්ත්‍රාත් අධීක්ෂණ නිලධාරියා වන දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගේ නිර්දේශය නොමැතිව දකුණු පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂකවරයාගේ අනුමැතිය මත කොන්ත්‍රාත්කරු විසින් පුද්ගලික ආයතනයකින් ඩ්‍රෝන සිතියම් ලබාගැනීමේ කාර්යය ඉටුකරගත් බව

දක්වා තිබුණද, ව්‍යාපෘතිය වෙතට අදාළ සිතියම් ලැබී නොතිබුණි. අවශ්‍යතාවයක් නොමැතිව හා අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමකින් තොරව කොන්ත්‍රාත්කරු වෙත එම ගෙවීමට අනුමැතිය ලබාදුන් දකුණු පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරයා සම්බන්ධයෙන් අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන

**වැඩසටහනේ කාර්යසාධනය**

වැඩසටහන මඟින් වාණිජමය වශයෙන් අරමුණු කරගත් නිෂ්පාදන සහ අලෙවිකරණ පද්ධතියට සම්බන්ධ කුඩා පරිමාණ කුටුම්භයන් 57,000 කගේ ආදායම සහ ආහාරයන්හි ගුණාත්මක බව තිරසාර ලෙස ඉහළ නැංවීම අරමුණ විය. ඒ අනුව වාණිජ හවුල්කාරිත්වයට ප්‍රවේශය හා වාණිජ වැඩසටහන් කළමණාකරණය සහ ප්‍රතිපත්ති යන සංරචක 03 ක් යටතේ වැඩසටහනේ කටයුතු ක්‍රියාත්මක වේ. වැඩසටහනේ කටයුතු 2017 ජුනි 26 දින ආරම්භ කරන ලද අතර 2023 ජුනි 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණද පසුව වැඩසටහනේ කටයුතු අවසන් කිරීමේ දිනය 2025 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි. 2024 දෙසැම්බර් අවසාන වන විට මූල්‍ය ප්‍රගතිය සියයට 68 ක් වී තිබුණු අතර භෞතික ප්‍රගතිය සියයට 81.8 ක් වී තිබුණි. ඒ අනුව 2025 ජුනි වනවිට වැඩසටහනේ කාර්යයන් පූර්ණ ලෙස අවසන් කළ නොහැකි බව නිරීක්ෂණය විය.

**බිංදු ජල සැපයුම මඟින් වගා කිරීම**

ආරක්ෂිත ගෘහ හා බිංදු ජල සැපයුම් පද්ධතියක් ඉදිකර සලාද පිපිඤ්ඤා,මාළු මිරිස් හෝ හඳුන්වාදෙන වෙනත් භෝගයක් වගා කිරීම මඟින් තරුණ ව්‍යවසායකයින් ගොඩ නැංවීම අරමුණු කොට පුද්ගලික ආයතනයක් සමඟ වැඩසටහන ගිවිසුම් ගත වී තිබුණි. ඒ අනුව ප්‍රතිලාභීන් 25 ක් සඳහා ලැබිය යුතු රු.500,000 ක් බැගින් රු.මි.15.5 ක ණය මුදල බැංකුව විසින් එම ආයතනයේ ගිණුමට බැර කර තිබුණි. එහෙත් ජල සැපයුම් පද්ධතිය හා අනෙකුත් ද්‍රව්‍ය සඳහා මෙම ණය මුදල වියදම් කළ ආකාරය වෙනුවෙන් බිල්පත් ඉදිරිපත් කිරීමට ප්‍රවර්ධක ආයතනය අපොහොසත් වූ බැවින් එක් ප්‍රතිලාභියෙකු වෙනුවෙන් අදාළ ණය මුදලම යෙදවූ බවට සාක්ෂි නොවීය. ගිවිසුම් ප්‍රකාරව ප්‍රවර්ධක ආයතනය විසින් තාක්ෂණික නිර්දේශයන් හා උපදෙස් ලබාදෙන බවට එකඟ වී තිබුණද එම උපදෙස් ලබා දී

නොමැති බවත් ඒ හේතුවෙන් වගාවන් විනාශ වී තිබුණු බවටත් තොරතුරු ඉදිරිපත් කර තිබුණි. පාදුක්ක ප්‍රදේශයේ පුද්ගලයින් 07 දෙනෙකු ප්‍රතිලාභී නාම ලේඛනයේ සඳහන් වුවද එම ආරක්ෂිත ගෘහ 07 ම ආරක්ෂිත ආයතනයේම සේවයේ නිරත වූ ඉහත සමාගමේ අධ්‍යක්ෂවරයෙකුට අයත් භූමියක පවත්වාගෙන යන බවට නිරීක්ෂණය විය. ප්‍රවර්ධක ආයතනය SAPP වැඩසටහනෙහි නියෝජනයක් වුවත් අදාළ සමාගම තම වගකීම් පැහැර හැර තිබුණද ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීමට SAPP වැඩසටහන කිසිදු මැදිහත්වීමක් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**ග්‍රාස් චොපර් යන්ත්‍ර 2000ක් ලබාදීම**

වැඩසටහන මඟින් 4Ps ව්‍යාපෘතිවල කිරි ගොවින් සඳහා ග්‍රාස් චොපර් යන්ත්‍ර 2000 ක් ප්‍රසම්පාදනය පුද්ගලික ඉංජිනේරු තාක්ෂණ ආයතනයකට ප්‍රදානය සඳහා 2022 අගෝස්තු 02 වන දින ගිවිසුම් අත්සන් කර තිබුණි. එදින සිට සති 8 – 12 ක් ඇතුළත එම යන්ත්‍ර අදාළ ප්‍රතිලාභීන්ට ලබා දිය යුතු නමුත් අදාළ ආයතනය සති 68 කින් අවස්ථා 24 කදී යන්ත්‍ර ලබා දී ඇත. එම යන්ත්‍ර සැපයීම නිමකිරීමට සැපයුම්කරුට වසර 1 ½ කට වැඩි කාලයක් ගත වී තිබුණද, මෙම ප්‍රමාදය හා ඒ සඳහා වූ පාඩුව අයකර ගැනීමට වැඩසටහන මගින් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර මෙම ප්‍රමාදය හේතුවෙන් වැඩසටහන විසින් වැට්බදු (VAT) ලෙස රු.මිලියන 18.69 ක් අතිරේකව ගෙවීමට සිදුව තිබූ බව නිරීක්ෂණය විය.

**බිම්මල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 350 ක් ඉලක්ක කර ක්‍රියාත්මක කල බිම්මල් ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 63.01 ක් අදාළ ප්‍රවර්ධක ආයතනය වෙත සෘජුව බැර කිරීම හේතුවෙන් එම මුදල් වැය කිරීම වැඩසටහනේ අධීක්ෂණයෙන් බැහැර වී තිබුණි. මෙම ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ රු.මිලියන 55.65 ක් වැය කිරීමට අපේක්ෂා කළද ඉන් රු.මිලියන 34.58 ක් පමණක් වැයකර තිබුණි. උපකරණ ලබා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.6, 2.8.4 සහ 6.2.2 ට පටහැනිව කටයුතු කර තිබූ අතර එම ප්‍රතිලාභීන් විසින් ලබා දීමට යෝජිත දායකත්වය රු.මි.181.8 ක් වුවද එම දායකත්ව ප්‍රමාණයන් තහවුරු කර නොතිබුණු අතර එරත්න ප්‍රදේශයේ ප්‍රතිලාභීන් විසින් බිම්මල් වගාව අතහැර තිබුණි.

**කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය**

2022 ඔක්තෝබර් 10 වන දින පුද්ගලික සමාගමක් වෙත රු.මිලියන 1.47ක වටිනාකමකින් යුත් ශිතුම්කරණ පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා මිලදී ගැනීමේ නියෝගයක් (PO) නිකුත් කර එම මිලදී ගැනීමේ නියෝග, නියමයන් සහ කොන්දේසිවලට අනුව, සියලුම ස්ථාපන කටයුතු ගිවිසුම්ගත දින සිට දින 26 ක් ඇතුළත අවසන් කළ යුතු විය. 2023 පෙබරවාරි 16 වන දින වන විට, ශිතුම්කරණ පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා මුළු කොන්ත්‍රාත් මුදලින් සියයට 75 ක් වන රු. මිලියන 1.10 ක් ගෙවා එදිනට ස්ථාපන ක්‍රියාවලිය අවසන් වූ බවට වාර්තා වුවද, IFAD මගින් නිර්දේශිත ඉල්ලුම් කරනු ලබන ආකෘති සාධාරණීකරණ වාර්තා සහ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම වැනි අත්‍යවශ්‍ය සංරචක ලබා දුන් විසඳුමට ඇතුළත් කර නොමැති බව දක්වා තිබුණි.

අනුමත සේවක තනතුරු අනුව සැලකිය යුතු වැදගත් කාර්යභාරයක් වන කෘෂිකර්ම විශේෂඥ තනතුර සඳහා තනතුරු 6 ක් අනුමත කර ඇතත්, 2024 දෙසැම්බර් 31 වන විට කිසිදු පුරප්පාඩුවක් පුරවා නොතිබුණි.

## කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය අදියර 01

**කුරුඳු සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම**

ව්‍යාපෘතියේ ගැළපුම් ප්‍රදාන මත රත්නපුර දිස්ත්‍රික්කයේ අයගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුරුඳු සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සහ අස්වනු නෙළීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමේ අවසාන අරමුණ ඇතිව අපනයන වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් රු.මිලියන 10.56ක ප්‍රදාන ලබා ගැනීමට පෞද්ගලික සමාගමක් ගිවිසුම් ගත වී තිබුණි.2019 නොවැම්බර් වනවිට සමාගම පළමු හා දෙවන ගැළපුම් ප්‍රදාන ලෙස රු මිලියන.9.51 ක් ලබාගෙන 2024 දෙසැම්බර් වනවිට සමාගමේ ක්‍රියාකාරිත්වය නවතා තිබුණි. ඒ අනුව සමාගමේ අපේක්ෂිත අරමුණු වූ කුරුඳු අස්වනු නෙළීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම, අපනයන වෙළඳපොළට කුරුඳු නිෂ්පාදන ඉදිරිපත් කිරීම, දිනකට නැවුම් කුරුඳු කි.ග්‍රෑම් 5000 ක ශාක සඳහා පහසුකම් සැලසෙන ආදර්ශ ව්‍යාපෘතියක් ලෙස සංවර්ධනය කිරීම, අයගම අවට

කුරුඳු ගොවීන්ගේ ජීවනෝපාය සංවර්ධනය කිරීම සහ රැකියා අවස්ථා ලබා දීම යන අරමුණු ඉටුකර නොතිබුණි.

**කෘෂිකර්මාන්තය සඳහා වූ නිෂ්පාදන සිදුකිරීම**

පුත්තලම දිස්ත්‍රික්කයේ වෙන්නප්පුව ප්‍රදේශයේ පුද්ගලික සමාගමකට රු.මිලියන 30 ක ගැලපුම් ප්‍රදානයක් ලබා ගැනීම සඳහා 2021 වර්ෂයේ දී ව්‍යාපෘතිය සමඟ ගිවිසුම් ගත වී පළමු ගැලපුම් ප්‍රදානය ලෙස රු මිලියන.15 ක් 2023 ජුනි 14 දින ලබාගෙන තිබුණු අතර 2024 ඔක්තෝබර් වන විටත් දෙවන ගැලපුම් ප්‍රදානය ලබාගෙන නොතිබුණි. ඒ අනුව අදාළ සමාගමේ අරමුණු ලෙස දක්වන ලද කෘෂිකර්මාන්තය සඳහා යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය කිරීම, කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සහ කර්මාන්ත සඳහා අවශ්‍ය උපදේශන සේවා සැපයීම, විදේශ මුදල් රටින් පිටතට ගලායාම අවම කිරීම, නව තාක්ෂණය හඳුන්වා දීම, රැකියා අවස්ථා වැඩි කිරීම, අඛණ්ඩව පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාවලිය හරහා යන්ත්‍රෝපකරණ සංවර්ධනය කිරීම යන අරමුණු ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණි.

## කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය අදියර 02

**යාපනය අර්තාපල් බීජ මිලදී ගැනීමේ ව්‍යාපෘතිය**

ව්‍යාපෘතිය මඟින් යාපනය ප්‍රදේශයේ අර්තාපල් පොකුරු ව්‍යාපෘතිය සඳහා බීජ අර්තාපල් (red la Soda) මිලදී ගැනීම, ගබඩා කිරීම, බැහැර කිරීම සහ වෙනත් වියදම සඳහා රු.මිලියන 14.48 ක් වැය කර තිබුණි. ආනයනය කල අර්තාපල් බීජවල Geotrichum නැමති දිලීරයක් දක්නට ලැබෙන බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශාක නිරෝධායන ආරක්ෂණ සේවයේ මූලික රසායනාගාර විමර්ෂන වාර්තාවේ සඳහන් කර තිබුණි. එබැවින් අර්තාපල් බිජ ගබඩා කිරීමේදී වැඩි සැලකිල්ලක් දැක්විය යුතු බවද සඳහන් කර තිබුණි. නමුත් බිජ පැල ගබඩාකිරීමේදී වාතාශ්‍රය පහසුවෙන් නොලැබෙන වායුසමීකරණ නොකල ස්ථානයක ගෝනිවල අසුරා එකමත එක ලෙස ගබඩා කිරීම හේතුවෙන් Geotrichum දිලීරය ව්‍යාප්ත වී අර්තාපල් බිජ විනාශ වී තිබුණි. අර්තාපල් පොකුරු ව්‍යාපෘතිය සඳහා දරන ලද රු.මිලියන

14.48 ක වියදම නිෂ්කාර්ය වියදමක් බවත් අර්තාපල් බීජ අස්වැන්න ලබා ගැනීමේ අරමුණු ඉටු වී නොමැති බවත් නිරීක්ෂණය විය.

**මහනුවර දෙමුහුන් බීජ නිෂ්පාදන ගෘහ ඉදිකිරීම**

මහනුවර දිස්ත්‍රික්කයේ රු.මිලියන 399.20 ක් යටතේ දෙමුහුන් බීජ නිෂ්පාදන ගෘහ 75 ක් ඉදිකිරීම සඳහා 2023 ජුනි 25 දින පෞද්ගලික සමාගමක් සමඟ කොන්ත්‍රාත්තුවකට එළැඹ තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව රු.මිලියන 133.10 ක් වටිනා කාර්යසාධන ඇපකර 03 ක් ඉදිරිපත් කළයුතු වුවද 2024 අගෝස්තු 13 දින වන විටත් කාර්යසාධන ඇපකර ඉදිරිපත් කර නොතිබුණි. වගා ගෘහ 75 ඉදි කිරීම මාස 03 ක් ඇතුළත අවසන් කළයුතු වුවද 2024 අගෝස්තු වන විටද ගෘහ 35 ඉදිකිරීම අවසන් කර නොතිබුණි. ඉදිකරන ලද දෙමුහුන් බීජ නිෂ්පාදනාගාර පිළිබඳව භෞතික පරීක්ෂාවේදී වැඩ අවසන් කළ නිෂ්පාදන ගෘහ ප්‍රමිතියෙන් තොර වීම හේතුවෙන් අධික උෂ්ණත්ව පාලනය කිරීමට නොහැකි වීම, පොහොර යෙදීමේ ඒකකය මඟින් පොහොර යෙදීමේ ක්‍රියාවලිය කළ නොහැකි වීම, අපේක්ෂිත පැළ ප්‍රමාණය වගා කිරීමට නොහැකි වීම වැනි අඩුපාඩු විගණනයට නිරීක්ෂණය විය. තවද වගා ගෘහ ප්‍රදානය කළ බීජ ගොවීන් සමඟ ව්‍යාපෘතිය ගිවිසුම් ගත නොවීම හේතුවෙන් අදාළ දෙමුහුන් බීජ නිෂ්පාදන කාර්යය ඉටු නොකිරීමේ අවදානමක් පවතින බවද නිරීක්ෂණය විය.

**බදු වාර්තා සැපයීමේ අවශ්‍යතාවයන් ඉටුකිරීම**

සෑම කාර්තුවක් අවසානයේදීම සැපයුම්කරුවන් වෙත කරන ලද ගෙවීම් පිළිබඳ විස්තර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ව්‍යාපෘතිය විසින් සපයා නොතිබුණු අතර සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී සහ සැපයුම්කරුවන්ට ගෙවීම් කිරීමේදී වැට් බදු ගෙවීමට ලියාපදිංචි වී ඇතිද සහ සක්‍රීව වැට් බදු ගෙවන්නේද යන්න පරීක්ෂා කර නොතිබුණි.

## ප්‍රවාහන අංශයේ ව්‍යාපෘති

වගු අංකය 2.45 - ප්‍රවාහන අංශයේ ව්‍යාපෘති

| | ව්‍යාපෘතියේ නම | ණය ආධාර මුදල | | ව්‍යාපෘති කාලය | | 2024/12/31 දිනට උපයෝජනය | | 2024/12/31 දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | එ.ජ.ඩොලර් මිලියන | රු. මිලියන | ආරම්භක දිනය/ වර්ෂය | ව්‍යාපෘති කාලය | එ.ජ.ඩොලර් | රු. මිලියන | එ.ජ.ඩොලර් මිලියන | රු. මිලියන |
| 1 | කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය. | 11.3 | 1,654.54 | 2016.10.28 | වසර 6 | 9.34 | 1,700.08 | 83 | 100 |
| 2 | කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය. | 147.7 | 47,215.8 | 2019.08.20 සිට 2024.12.31 | වසර 5 | 61.99 | 18,093.47 | 38 | 69 |

මූලාශ්‍රය - ප්‍රවාහන හා මහාමාර්ග ව්‍යාපෘති අංශ මූල්‍ය හා ප්‍රගති වාර්තා

## කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය

**සකස්කරන ලද ශක්‍යතා අධ්‍යයන හා සවිස්තරාත්මක සැලසුම් භාවිතයට නොගැනීම**

මරදාන සිට රඹුක්කන, කළුතර දකුණ, කැලණිවැලි මාර්ගය හා රාගම සිට කොච්චිකඩේ දක්වා කොළඹ තදාසන්න ප්‍රදේශයේ දුම්රිය මාර්ග ජාලය, දුම්රිය ස්ථාන හා ඒ ආශ්‍රිත විදුලි පද්ධතිය හා දුම්රිය මඟී පහසුකම් සංවර්ධනය කිරීමට අදාළ සැලසුම් සකස් කිරීම වෙනුවෙන් ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 93 ක් වූ රු. මිලියන 1,446.95 ක් වැයකර තිබුණි. එම වාර්තා අමාත්‍යාංශය වෙත භාරදී වර්ෂ 04 කට වැඩි කාලයක් ගතවී තිබුණද, කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක් වෙනුවෙන් භාවිත කර නොතිබුණි.

**නැවත පදිංචිය ප්‍රමාදවීම**

කැලණිවැලි දුම්රිය මාර්ග අයිතියේ (RoW) පදිංචි පවුල් නැවත පදිංචි කිරීමට අවශ්‍ය නිවාස ඒකක 1,244 ක් දේශීය අරමුදල් භාවිතයෙන් රු.මිලියන 5,412 කට මිලදී ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සහ ප්‍රවාහන අමාත්‍යාංශය (MOT) අතර 2017 හා 2018 වර්ෂවලදී අවබෝධතා ගිවිසුම්වලට එළඹ තිබුණි. ගිවිසුම් ගතවූ දින සිට වසර දෙකක් ඇතුළත නාවල 01 අදියරේ නිවාස සංකීර්ණයෙන් නිවාස 406 ක් ද නාවල 02 අදියරේ නිවාස සංකීර්ණයෙන් නිවාස 144 ක් ද වශයෙන් මුළු නිවාස ඒකක 550 ක් ඉදිකර අවසන්කර ව්‍යාපෘතිය වෙත භාරදිය යුතු වුවද එම ව්‍යාපෘතිවල

ප්‍රගතිය පිළිවෙලින් සියයට 39ක් හා 89ක් වී තිබුණි. අවස්ථා ගණනාවක දී ගිවිසුම් කාලය දීර්ඝ කර නව අවබෝධතා ගිවිසුම් වලට එළඹ තිබුණද, 2024 වසර අවසන් වන විටත් කැලණිවැලි මාර්ග අයිතිය තුළ සිටින පවුල් නැවත පදිංචි නොකිරීම හේතුවෙන් කැලණිවැලි දුම්රිය මාර්ගය සංවර්ධනයට නොහැකි වී තිබුණි.

## කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

**ව්‍යාපෘතියේ මූල්‍ය කාර්යසාධනය**

ව්‍යාපාතියේ ඇස්තමේන්තුගත පිරිවැය එ.ජ.ඩොලර්ලර් මිලියන 147.7 ක් වූ අතර ව්‍යාපෘතිය අවසන් කිරිමට නියමිතව තිබූ 2024 දෙසැම්බර් 31 වන විට අරමුදල් උපයෝජනය එ.ජ.ඩොලර්ලර් මිලියන 61.99 ක් වීමෙන් මූල්‍ය ප්‍රගතිය සියයට 38 තරම් පහළ මට්ටමක පැවතුණු අතර ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 69 ක්ව පැවතුණි. තවද, එ.ජ.ඩොලර්ලර් මිලියන 0.35 ක් වූ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත ප්‍රයාපන ගාස්තු 2024 දෙසැම්බර් 31 වන විට එ.ජ.ඩොලර්ලර් මිලියන 0.92 ක් දක්වා වැඩිවී තිබුණි. සමස්ත ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය කාර්ය සාධනයේ මන්දගාමී ප්‍රගතිය මෙම අහිතකර තත්ත්වයට හේතු වී තිබුණි.

**කොන්ත්‍රාත්තුව අතරමඟ නවතා දැමීම**

ව්‍යාපෘතිය යටතේ ආසියානු සංවර්ධන බැංකු ණය යොදා ගනිමින් උප ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරන ලද මහනුවර නගරාශ්‍රිත දුම්රිය සේවාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනය හා විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් සකස් කිරීම සඳහා අදාළ උපදේශන සේවාව ලබා ගැනීමට කැබිනට් මණ්ඩල අනුමැතිය මත විදේශීය බද්ධ ව්‍යාපාරයක් සැපයුම්කරු ලෙස තෝරාගෙන තිබුණි. ඒ අනුව 2019 නොවැම්බර් 28 දින සිට මාස 18 ක කාලයකින් නිම කිරීම සඳහා කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු අතර, 2024 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 694.35 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. කොන්ත්‍රාත්තුව පිරිනමා වසර 05 කට වඩා වැඩි කාලයක් ගතකර තිබුණද, ගිවිසුම් ප්‍රකාරව උපදේශන වාර්තා ලබා දීමකින් තොරව 2023 වර්ෂයේ සිට කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම අත්හිටුවා තිබුණි. ඒ හේතුවෙන් ව්‍යාපෘතිය යටතේ දරන ලද වියදම් ඵල රහිත වී තිබුණු අතර ව්‍යාපෘති කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් රජයට සිදුවන

අලාභයන් ගිවිසුම් ප්‍රකාරව අයකර ගැනීමටත්, කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුව අත්හිටුවීම සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**දීප ව්‍යාප්ත දුම්රිය සන්නිවේදන පද්ධතිය ස්ථාපිත කිරීම**

ආසියානු සංවර්ධන බැංකු ණය යෝජනා ක්‍රමය යටතේ දීප ව්‍යාප්ත දුම්රිය සන්නිවේදන පද්ධතිය ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා එ.ජ.ඩොලර්ලර් මිලියන 7.49 ක වටිනාකමකට දේශීය පුද්ගලික සමාගමක් සමඟ ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්වරයා ගිවිසුම් ගතවී තිබුණි. ව්‍යාපෘතිය යටතේ නව සන්නිවේදන පද්ධතිය භාවිත කරමින් ජනතාවට වඩාත් කාර්යක්ෂම සහ ආරක්ෂිත දුම්රිය සේවාවක් ලබා දීමට අපේක්ෂා කර තිබුණි. රු. මිලියන 1,901.27 ක මුදලක් වැය කර 2022 සැප්තැම්බර් මාසය වන විට ව්‍යාපෘති කටයුතු අවසන් කර තිබුණු අතර නඩත්තු හා සේවා කටයුතු සඳහා රු. මිලියන 73.2 ක් හා අමතර උපාංග සඳහා රු. මිලියන 50 ක පිරිවැයක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට දරා තිබුණු නමුත් එම පද්ධතිය ප්‍රායෝගිකව භාවිත නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු ඉටුවී නොතිබුණි. එමෙන්ම ගිවිසුම් ප්‍රකාරව පද්ධතියේ නඩත්තු හා සේවා සඳහා මාසිකව රු. මිලියන 3.5 ක් බැගින් ගෙවීමේ වගකීමක්, භාවිතා නොවන මෙම පද්ධතිය වෙනුවෙන් 2031 ජූලි දක්වා උද්ගතවී තිබුණි.

**සුහුරු ප්‍රවේශපත්‍ර සහ ආසන වෙන්කිරීමේ පද්ධතිය**

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ කාර්යක්ෂමතාව තවදුරටත් ඉහළ නැංවීම අරමුණු කරගෙන ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා සුහුරු ප්‍රවේශ පත්‍ර හා ආසන වෙන් කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා අදියර 03 ක් යටතේ කාර්යයන් 16 ක් ලෙස ආසියානු සංවර්ධන බැංකු අරමුදල් යොදා ගනිමින් එ.ජ.ඩොලර් මිලියන 19.3 ක වටිනාකමකට විදේශීය බද්ධ ව්‍යාපාරයක් සමඟ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණු අතර අත්තිකාරම් ලෙස එ.ජ.ඩොලර්ලර් මිලියන 1.6 ක් ගෙවා තිබුණි. එමෙන්ම පද්ධතියේ උපදේශන සේවා වෙනුවෙන් රු. මිලියන 6.6 ක් වෙනත් පාර්ශවයක් වෙත ගෙවා තිබුණු අතර සුහුරු ප්‍රවේශපත් වල වලංගුභාවය පරීක්ෂා කිරීම සඳහා රු. මිලියන 151.7 ක් වැයකර උපකරණ කට්ටල 900 ක් දුම්රිය ස්ථාන 344 කට බෙදා දී තිබුණි.

එම කාර්යයන් 16 න් එක් කාර්යයක් වන සුහුරු ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේ වෙබ් අඩවිය ස්ථාපිත කිරීම පමණක් 2024 අගෝස්තු මාසයේදී සිදු කර තිබුණද, එම ප්‍රවේශපත්‍ර අලෙවිය මුළු ප්‍රවේශපත් අලෙවියෙන් සියයට 1 ක් තරම් පහළ මට්ටමක පැවතුණු අතර සුහුරු ප්‍රවේශපත්‍රවල වලංගුභාවය පරීක්ෂා කිරීමේ උපකරණ භාවිතා කරමින් ටිකට් පත් පරීක්ෂා කිරීම එසේ අලෙවි කරන ලද සුහුරු ප්‍රවේශපත්‍ර වලින් සියයට 0.6 ක් තරම් පහළ මට්ටමක පැවතුණි. එමෙන්ම ව්‍යාපෘතිය යටතේ අනෙකුත් කාර්යයන් 15 ගිවිසුම් ප්‍රකාරව 2024 මැයි වන විට අවසන් කළ යුතු වුවද, එම කාර්යයන්හි භෞතික ප්‍රගතිය සියයට 0 සිට සියයට 20 දක්වා මට්ටමක පැවතුණි.

## ආපදා කළමනාකරණ අංශයේ ව්‍යාපෘති

### ස්ථායි කරන ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය

| | |
|---|---|
| **කොන්ත්‍රාත් පරිපාලනය** | නිම කරන ලද ඉදිකිරීම් ස්ථානවල තිරසරභාවය සඳහා ඒවා අදාළ ආයතන වෙත භාරදිය යුතු බව ණය දෙන ඒජන්සි ආයතනය වන ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ ව්‍යාපෘති මෙහෙවර වාර්තාවේ සඳහන් කර තිබූ නමුත් රු. මිලියන 1,308.77ක් වටිනා ඉදිකිරීම් ස්ථාන 13ක නඩත්තු කටයුතු පැවරීමට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය කිසිදුපියවරක් ගෙන නොතිබුණි. |
| **වටවල වැඩබිම් ඉදිකිරීම** | ක්ෂේත්‍ර පරීක්ෂාවේදී, වටවල වැඩබිමේ අංක 135 ඉදිකිරීම් නිම කිරීම සඳහා අමුද්‍රව්‍ය දුම්රිය පැටවීම් 30 ක් ගෙනඒමට නියමිතව තිබූ බව නිරීක්ෂණය විය, නමුත් ඉල්ලා සිටි දිනවල දුම්රියන් ලබා ගත නොහැකි වීම සහ දුම්රිය පැටවීම් 24 ක් පමණක් ලැබීම හේතුවෙන්, නියමිත කාලය තුළදී ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට නොහැකි වී තිබුණි. තවද, වටවල වැඩබිමේ ඉදිකර ඇති ජලාපවහන කාණුවේ මතුපිට, ජලය වේගයෙන් ගලා යාම සහ බදාම හා ගල් සෝදා යාම වැළැක්වීම සඳහා සුමට මතුපිටක් ලෙස සකස් කර නොතිබූ බව නිරීක්ෂණය විය. |

33 වන උමග අසල සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී වනාන්තරයට ඇතුළුවීමට අවසර ලබා ගැනීම සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් රක්ෂිත වනාන්තරවලට මායිම්ව ඇති වැඩබිම්වල ගස් ඉවත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ඉදිකිරීම් නියමිත

වේලාවට ආරම්භ කළ නොහැකි වූ බවත් එය ප්‍රමාද වූ බවත් නිරීක්ෂණය විය.

## උසස් අධ්‍යාපන අංශයේ ව්‍යාපෘති

### විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන (STHRD) ව්‍යාපෘතිය

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ ගොඩනැගිලි ඉදිකිරීම්**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු, ඉදිකිරීම් ආරම්භ කළ දින වන 2021 ජනවාරි 21 දින සිට දින 913ක් ඇතුළත අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ඉදිකිරීම්වල මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් ව්‍යාපෘතිය 2025 මැයි 31 දක්වා හය වතාවක් දීර්ඝ කිරීම් ලබා දී තිබුණි. කොන්ත්‍රාත්තුවේ ප්‍රගති වාර්තාවලට අනුව, ආරම්භ කළ දින සිට වසර 4ක් ගතවී 2024 දෙසැම්බර් 31 වන විට භෞතික ප්‍රගතියෙන් සියයට 81ක් පමණක් ලබාගෙන තිබුණි. මේ අනුව ඉංජිනේරු පීඨය ඉදිකිරීමේ ප්‍රධාන අරමුණ වූ 2024 අධ්‍යයන වර්ෂය සඳහා ඉංජිනේරු පීඨයට ඇතුළත් කර ගන්නා සිසුන් සංඛ්‍යාව 120 සිට 400 දක්වා වැඩි කිරීමට නොහැකි වී තිබුණි. ව්‍යාපෘතිය නිම කිරීම ප්‍රමාද වීම හේතුවෙන් වර්තමානයේ සිසුන් 180 දෙනෙකු පමණක් ඇතුළත් කරගෙන තිබූ අතර 2023 ජූලි සිට 2025 මාර්තු දක්වා කාලය සඳහා කුලියට ගත් ගොඩනැගිල්ල සඳහා කුලී ගාස්තු ලෙස රු.මිලියන 49.71 ක් විශ්වවිද්‍යාලයට ගෙවීමට සිදු වී තිබුණි.

**සබරගමුව විශ්වවිද්‍යාලය සඳහා පුස්තකාල පොත් මිලදී ගැනීම**

ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂයේදී සබරගමුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය සඳහා පුස්තකාල පොත් මිලදී ගැනීමේදී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල නොවී, පූර්ව අත්දැකීම් නොමැති සැපයුම්කරුවෙකු තෝරා ගෙන, වර්ග 118 කට අයත් පොත් 421 ක් රු. මිලියන 20.20 ක් හෙවත් මුළු ප්‍රසම්පාදනයෙන් සියයට 76 ක වට්ටමකට මිලදී ගෙන තිබුණි. එයින් රු. මිලියන 7.59 ක් වට්ටමකින් යුතු වර්ග 33 කට අයත් වන පොත් 114 ක් භාවිතා කළ පොත් විය. ඒ හා සමානව, විෂය නිර්දේශයට අදාළ නොවන වර්ග 69 ක පොත් 179 ක් රු. මිලියන 6.92 ක වියදමින් මිලදී ගෙන තිබුණි. මෙම ප්‍රසම්පාදනයේදී, ජාත්‍යන්තර

වෙළඳපොලේ පැරණි සහ නව පොත් අලෙවි කරන අවම මිලට සාපේක්ෂව වැඩි මිලකට පොත් වර්ග 63 ක ඒකක 227 ක් මිලදී ගැනීම හේතුවෙන් රු. මිලියන 12.12 ක මූල්‍යමය අලාභයක් සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.

## වාරිමාර්ග අංශයේ ව්‍යාපෘති

## මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන

**වැඩසටහනෙහි අපේක්ෂිත ඉලක්ක සහ භෞතික ප්‍රගතිය**

මහවැලි ද්‍රෝණියේ අතිරික්ත ජලය උතුරු, උතුරු මැද හා වයඹ පළාත්වල ජලය හිඟ ප්‍රදේශයන්ට ගෙනයමින් එම පළාත්වලට අවැසි ජල අවශ්‍යතාවයන් සැපිරීම ඉලක්කය වේ .

2025 ජූනි මාසයේදි අවසන් වීමට නියමිතව තිබූ උතුරු මැද පළාත් ඇල මාර්ග ව්‍යාපෘතිය හා වයඹ පළාත් ඇල ව්‍යාපෘතියට අදාළ කොන්ත්‍රාත් පැකේජ නිම කිරීමේ කාලය දීර්ඝ වීම, අතිරේක වැඩ එකතු කිරීම, උපදේශන ගාස්තු සඳහා වඩා වැඩි මුදලක් ගෙවීමට සිදුවීම, වැනි හේතුන් මත ව්‍යාපෘතිය අපේක්ෂිත කාලය තුළ නිම කිරීමට නොහැකි විය. තවදුරටත් නිම කිරීමට නියමිත පැකේජයන් සඳහා රු. මිලියන 1,330 ක් වැය වන බවට ඇස්තමේන්තු සකස් කර තිබුණු අතර එකී ඇස්තමේන්තු මුදල මූල්‍යයනය කර ගැනීමට අපොහොසත් වුවහොත් 2024 දෙසැම්බර් 31 දක්වා දැරූ රු. මිලියන 62,219 ක මුළු පිරිවැය ගිලුණු පිරිවැයක් බවට විගණනයට නිරීක්ෂණය විය.

තවද 2024 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර තිබූ පහත පැකේජයන් ඌන උපයෝජිතව තිබුණු අතර ව්‍යාපෘතිවල අපේක්ෂිත ප්‍රතිලාභ ඉටුකර ගැනීමටද නොහැකි වී තිබුණි.

වගු අංක 2.46 - ඌන උපයෝජිත ව්‍යාපෘති

| පැකේජය | | වියදම රු. මිලියන |
|---|---|---|
| **NWPCP-ICB2** | නැබඩගහවත්ත සිට මහකිරුල පිවිසුම් උමඟ දක්වා ප්‍රධාන ඇල ඉදි කිරීම | 13,837 |
| **NWPCP-NCB 01** | නැබඩගහවත්ත දක්වා ඇල මාර්ගය ඉදි කිරීම (වැඩි දියුණු කිරීම හා වාන් දොරටුව සහිත පැකේජය ) | 1,133 |
| **UECP- ICB2B** | මොරගහකන්ද ජලාශයේ සිට කි.මී. 0+100 - කි.මී. 6.225 දක්වා ඇල මාර්ගය ඉදි කිරීම | 7,695 |
| | | **22,665** |

ව්‍යාපෘතියට අදාළ ණය ගිවිසුම ප්‍රකාරව ණය මුදල 2020 ජූනි 30 වන විට උපයෝජනය කොට අවසන් කළ යුතු වුවද 2024 වර්ෂය අවසානය දක්වා උපයෝජනය කර නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ රුපියල් මිලියන 4.45 ක කැපවීමේ ගාස්තු (commitment charges) පැන නැගී තිබුණු අතර 2024 දෙසැම්බර් 31 වන දින වන විට සමුච්චිත කැපවීමේ ගාස්තුව රු. මිලියන 351.49 ක් විය.

2024 දෙසැම්බර් 31 වන දින වන විට, වැඩසටහනේ අපේක්ෂිත සමස්ත ප්‍රගතිය (T1, T2, T3) සියයට 91ක් වූ නමුත් එදින නිරීක්ෂණය කරන ලද සත්‍ය ප්‍රගතිය සියයට 19.6 කි. එසේම ව්‍යාපෘතියේ මිණිපෙ ඇළ ප්‍රතිසංස්කරණය කිරීමේ MLBCRP - පැකේජය 6 හි අපේක්ෂිත භෞතික ප්‍රගතිය සියයට 40ක් වූ නමුත් සත්‍ය භෞතික ප්‍රගතිය සියයට 10 ක මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. UECP - ICB - 1 පැකේජය සඳහා සියයට 100 ක භෞතික ප්‍රගතියක් අපේක්ෂා කළ අතර, එම දිනයේ නිරීක්ෂණය කරන ලද සත්‍ය ප්‍රගතිය සියයට 64 කි. ඒ අනුව, සත්‍ය ප්‍රගතිය හා සසඳන විට සියයට 36 ක ප්‍රගතියක් ලබා ගැනීමට නොහැකි විය.

**කි.මී. 27.7 ක් දිග උමං ඇළ ඉදිකිරීම සඳහා දෙවන උමං විදුම් යන්ත්‍රය මිලදී ගැනීම.**

ගිවිසුම් ප්‍රකාරව මොරගහකන්ද ජලාශයේ සිට හුරුළු වැව දක්වා මුළු දුර කි. මී. 27.7 ක උමං මාර්ගයේ කි. මී. 27+509 සිට කි.මී. 34 දක්වා වූ කි.මී. 6.5 ක කොටස Drill & Blasting ක්‍රමවේදය මගින්ද, කි.මී. 34 සිට කි.මී. 54.5 දක්වා වූ කි.මී. 20.5 ක කොටස උමං විදුම් යන්ත්‍රයක් (TBM) උපයෝගී කරගෙනද කි.මී.54.5 සිට කි.මී. 55+600 දක්වා වූ කි.මී.1.1 ක් වූ කොටස Drill & Blasting ක්‍රමවේදය වශයෙන්ද ඉදිකිරීමට නියමිතව තිබුණි.

ත්‍රිකුණාමලය වරායේ නිෂ්කාශන අදියරේදී කොන්ත්‍රාත්කරුට ගෙවන ලද මුළු මුදල රු. මිලියන 6,691 ක් වුව ද රේගු වාර්තාව (CusDec Report) අනුව එහි පිරිවැය රුපියල් මිලියන 2,148 කි. ඒ අනුව රුපියල් මිලියන 4,543 ක ශේෂ වියදම් පැහැදිලි කිරීමට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

උක්ත උමං මාර්ගයේ දකුණු ද්වාරයේ කැණීම් කටයුතු දෙවන උමං විදුම් යන්ත්‍රය (TBM 2 ) යොදාගෙන කිරීමට සැලසුම් කළද 2023 මාර්තු සිට මාස 08 ක කාලයක් නිශ්කාර්යව තිබුණි.

ව්‍යාපෘතියේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ අරමුණින් දෙවන TBM යන්ත්‍රය මිල දී ගත්ත ද, ව්‍යාපෘතිය ඉලක්කගත කාල රාමුව තුළ නිම කිරීමට නොහැකි වී තිබුණි.

**කි.මී 27.7 ක් දිග උමං ඇල මාර්ගයේ කොන්ක්‍රීට් වළලුවල ඉරි තැලීම්**

උමං මාර්ගයේ දුර්වල පාෂාණ ඇති ස්ථාන වලට කොන්ක්‍රීට් වළලු (Ring) යෙදීම සිදුවන අතර 2024 ජනවාරි 31 දිනට උමං මාර්ගයේ සවි කරන ලද කොන්ක්‍රීට් වළලු 2,967 න් වළලු 1,298 ක් එනම් සියයට 44 ක් විවිධ ස්ථාන වලින් ඉරි තැලී තිබූ බවට මෙහෙයුම් ව්‍යාපෘති කාර්යාලය විසින් හඳුනාගෙන තිබුණි. 2025 ජනවාරි 05 දින මේ සම්බන්ධව මෙහෙයුම් ව්‍යාපෘති කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද වාර්තා වලට අනුව සවි කළ මුළු වළලු 8,275 න් වළලු 5,608 ක් එනම්, සියයට 68 ක් ඉරි තැලී තිබුණි. 2024 ජනවාරි 31 දින සිට 2025 ජනවාරි 05 දක්වා වාර්තා වී ඇති ඉරි තැලීම් අවස්ථා 4,310 ක් හඳුනාගෙන ඇති අතර ඉරිතැලීම් වර්ධනය වීමේ ප්‍රගතිය සියයට 52 ක් වේ.

තවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සකස් කරන ලද කොන්ක්‍රීට් වළලු 8,275 න් ගුණත්වය පරීක්ෂා කර තිබුණේ කොන්ක්‍රීට් වළලු 1,338 ක් පමණි. මෙය සමස්තයෙන් සියයට 16 ක් පමණක් නියෝජනය කරන අතර, ඉතිරි කොන්ක්‍රීට් වළලුවල තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව සෑහීමකට පත්විය නොහැක.

**NWPCP ICB – 01 කොන්ත්‍රාත් පැකේජය (මහ කිතුල හා මහ කිරුල ජලාශ දෙක ඉදිකිරීම)**

NWPCP ICB – 01 (මහ කිතුල හා මහ කිරුල ජලාශ දෙක ඉදිකිරීම) කොන්ත්‍රාත්තුවේ, ව්‍යාපෘති සැලැස්මේ මූලික අවශ්‍යතා සහ කොන්ත්‍රාත්කරුගේ අවශ්‍යතා (අයිතමය 1.3.4 හැර) සඳහා කොන්ත්‍රාත්කරුට රු. මිලියන 74.71 ක් ගෙවා තිබුණි. දුර්වල කාර්ය සාධනය හේතුවෙන් ගිවිසුම අවසන් කිරීමේ දී සියයට 3 ක පමණ භෞතික ප්‍රගතියක් ඇති මෙම කොන්ත්‍රාත්තුවේ මූලික අවශ්‍යතා

සඳහා ගෙවන ලද රු. මිලියන 74.71 න් රු. මිලියන 72.47 ක් ව්‍යාපෘතිය මගින් සිදු වූ පාඩුවක් ලෙස අයකර ගත යුතු බව ද, මෙම පැකේජයේ උපදේශන සමාගමට ගෙවන ලද රුපියල් මිලියන 139.11 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවද නිරීක්ෂණය විය.

මෙම කොන්ත්‍රාත්තුව අවසන් කරන ලද අතර අවසාන බිල්පත් පියවීමේදී, කොන්ත්‍රාත් ගිවිසුමේ 15.4 වගන්තියට අනුව කොන්ත්‍රාත් ඉංජිනේරුවරයා විසින් ගණනය කරන ලද මුළු පාඩුව රුපියල් මිලියන 53.63 ක් ලෙස සහතික කර ඇති බව සඳහන් විය. කෙසේ වෙතත්, අලාභය ගණනය කළ ආකාරය පෙන්වන කිසිදු ලියවිල්ලක් හෝ ගණනය කිරීම සිදු කරන ලද කිසිදු ලියවිල්ලක් විගණනය සඳහා ඉදිරිපත් කර නොමැති අතර, මේ දක්වා අලාභය අයකර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. තවද අතහැර දැමූ සහ ඌන උපයෝජිත කඳවුරු භූමියේ ආරක්ෂාව සහ නඩත්තුව සඳහා දරන ලද මුළු වියදම රුපියල් මිලියන 9.33 ක් වන අතර එය නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය.

**NWPCP –ICB 2 කොන්ත්‍රාත් පැකේජයේ වැඩ නිම කිරීම (නැබඩගහවත්ත සිට මහකිතුල පිවිසුම් උමඟ ඇල මාර්ගය ඉදිකිරීම )**

වයඹ ඇළ මාර්ගයේ නැබඩගහවත්ත සිට මහකිතුල පිවිසුම් උමඟ දක්වා කි.මී. 17+050 ක ඇළ ඉදිකිරීමට අදාළ කොන්ත්‍රාත්තුව 2018-2021 කාලය තුළ නිමකල යුතු වුවත් ඉදිකිරීම් සිදු කරන ප්‍රදේශවල ඉඩම් කොටස් පවරාගෙන භූමියේ අයිතිය නිරවුල් කර භාරදීමට වසර 2 ½ කාලයක් ප්‍රමාද වීම නිසා 2023 දෙසැම්බර් 05 දක්වා අවස්ථා 04 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. මෙහිදී අදාළ කොන්ත්‍රාත්තුව මුළුමනින් නිම කිරීම සිදු නොවුවද කොටස් වශයෙන් නිම කිරීම් සඳහා අවස්ථා 13 කදී කොටස් වශයෙන් භාර ගැනීමේ සහතික (Taking over Certificate ) නිකුත් කර තිබුණද සම්පූර්ණ කොන්ත්‍රාත්තුව නිම නොවීම හේතුවෙන් ඉදි කිරීමට යෝජිත වූ ඇළ පාවිච්චියට ගත නොහැකි වී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය ජාත්‍යන්තර ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.2 හා 10.2 වගන්ති වලට පටහැනිව කටයුතු කර ඇති බව විගණනයට නිරීක්ෂණය විය. තවද කොටස් වශයෙන් ඇළ බාර ගැනීම හේතුවෙන් කොන්ත්‍රාත් ගිවිසුමේ 8.7 වගන්තිය යටතේ අයකල හැකි

රු. මිලියන 722.46ක ප්‍රමාද ගාස්තු අයකර ගැනීමේ අවස්ථාවද අහිමි වී තිබුණි.

**වනජීවී දෙපාර්තුමේන්තුව සඳහා අඩවි වන කාර්යාලයක් ඉදි කිරීම**

උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතියට අදාළ වනජීවී කළමණාකරන සැලැස්මට අනුව වනජීවී දෙපාර්තුමේන්තුව සඳහා අඩවි වන කාර්යාලයක් (beat office) බකමූණ, අත්තනකඩවල සැපයුම් මාර්ගයේ ඉදිකිරීමට යෝජිතව තිබුණි. එම සැලැස්මට අනුව මේ සඳහා රු. මිලියන 6 ක් වෙන්කර තිබුණි. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන විසින් ඉහත ඉදිකිරීම සඳහා දේශීය තරඟකාරි මිල ගණන් යටතේ සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී වනජීවී කළමණාකරන සැලැස්මෙහි සඳහන් පරිදි අඩවි වන කාර්යාලය වෙනුවට වනජීවී කලාප කාර්යාලයක් හා නිල නිවසක් ඉදි කිරීම යනුවෙන් සඳහන් කර තිබුණි. මේ ආකාරයට මෙම ඉදි කිරීම සංශෝධනය කිරීම සඳහා මූලික වූ කාරණය අදාළ සංශෝධිත සැලැස්ම,නිසි අනුමැතීන් මෙන්ම රු.මිලියන 06 කින් අවසන් කිරීමට යෝජිත වූ ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 39ක් වෙන් කිරීමට අදාළ ප්‍රසම්පාදන අනුමැතීන් විගණනයට ඉදිරිපත් නොවුන අතර මුල් ඇස්තමේන්තුවට වඩා රු.මිලියන 22.5ක් ඉක්ම වූ මුදලකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

**කෘෂිකාර්මික යෙදවුම් සඳහා ගොවීන් යොමුකරවීමට සහාය දැක්වීම**

2021 වර්ෂයේ සිට රටේ පැවති ආර්ථික අර්බුදය හමුවේ ඉන්ධන අර්බුදය, අසාමාන්‍ය ලෙස භාණ්ඩ මිල ඉහල යාම, රුපියලේ අගය පහල යාම ආදි කරුණු හේතුවෙන් ඉදිකිරීම් කටයුතු පවත්වාගෙන යාම දැඩි අසීරුතාවයකට මුහුණ දී තිබීම හේතුවෙන් 2022 නොවැම්බර් 14 සිට 25 දින දක්වා පැවති ADB Mission සාකච්ඡාවලදී ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණුවලට අමතරව කෘෂිකාර්මික යෙදවුම් සඳහා ගොවීන් යොමුකරවීමට සහාය දැක්වීම සඳහා ව්‍යාපෘතියට ලබාදෙන මූල්‍ය ප්‍රතිපාදන වලින් එ.ජ.ඩොලර් මිලියන 50 ක් වහාම ලබාදීමට එකඟ වී තිබුණි. ඒ අනුව මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන මගින් 2022/23 මහකන්නයේ වී වගාව සඳහා එ.ජ.ඩොලර් මිලියන 39.78 ක මුදලක් (ආසන්න වශයෙන් රු.මිලියන 14,202) වැය කර සිංගප්පූරුවේ පුද්ගලික

සමාගමක් වෙතින් MOP පොහොර මෙට්‍රික් ටොන් 41876ක ප්‍රමාණයක් මිලදී ගෙන තිබුණි. මෙම පොහොර තොගය ආනයනය කිරීම, 2022/2023 මහ කන්නය සඳහා වී වගා කිරීමේදී ගොවීන්ට ලබාදීම අරමුණ වුවද 2025 ජනවාරි 31 දින වන විටත් මෙට්‍රික් ටොන් 16543.7 ක ප්‍රමාණයක් ජාතික පොහොර සමාගමේ ගබඩාවල ඉතිරි වී තිබුණි.

## ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය

**අම්පාර සේනානායක සමුද්‍රයේ රළපනාව සහ මාර්ගය ඉදිකිරීම** රළපනාව සකස් කිරීමේදී අඩු ගුණත්වයෙන් යුත් කළුගල් යොදා එයට මතුපිටින් ඉහළ ගුණත්වයේ කළුගල් යොදන බවට මාධ්‍ය මගින් ප්‍රචාරණය වී තිබුණි. මේ සම්බන්ධව ව්‍යාපෘතිය විසින් විමර්ශණයක් සිදුකර තිබූ අතර රළපනාව සකස් කිරීම සඳහා වැඩබිම වෙත ප්‍රවාහනය කර තිබූ කළුගල් වර්ග දෙකක කියුබ් 282 ක් ප්‍රමිතියෙන් තොර බවට එහිදී හඳුනාගෙන තිබූ අතර ඒවා කොන්ත්‍රාත්කරු ලවා වැඩබිමෙන් ඉවත් කිරීමටත් රළපනාවට යොදා ඇති ප්‍රමිතියෙන් තොර ගල් ඉවත් කර නැවත පිළිසකර කිරීමටත් පියවර ගෙන තිබුණි. වාරිමාර්ග නිලධාරීන්ද රළපනාවේ සමහර ස්ථාන වලට කොන්ත්‍රාත්කරු ප්‍රමිතියෙන් තොර කළුගල් යොදා ඇති බවට හඳුනාගෙන තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව 2025 ජනවාරි 10 දින වන විට සම්පූර්ණයෙන්ම වැඩ අවසන් කළ යුතු වුවද 2024 දෙසැම්බර් 31 දින වන විටත් එහි භෞතික ප්‍රගතිය සියයට 50 ක අවම මට්ටමක පැවතුණි.

ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන කොන්ත්‍රාත්තු 03 ක් සඳහා රු.මිලියන 393.46 ක ප්‍රතිපාදනයක් වෙන් කර තිබුණද එම කොන්ත්‍රාත්තු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි

වලව දකුණු ඉවුරු ඇළ දියුණු කිරීමට අදාළ කොන්ත්‍රාත් පැකේජයන් අපේක්ෂිත දින වන විටත් මෙහෙයුම් කටයුතු අවසන් කර නොතිබුණු අතර 2024 දෙසැම්බර් 31 දින වන විටත් භෞතික ප්‍රගතිය සියයට 5 - සියයට 35 අතර ඉතා අවම මට්ටමක පැවතුණි.

## දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශ ව්‍යාපෘතිය

**සංවර්ධන අරමුණු සපුරාලීමේ ප්‍රගතිය**

ව්‍යාපෘතියෙහි අදියර 01 ක්‍රියාත්මක කර අවසන් කිරීම සඳහා 2021 සිට 2026 දක්වා වසර 05 ක කාල සීමාවක් තුළ එ.ජ.ඩොලර් මිලියන 92 ක් වෙන් කිරීම සිදු කළද, 2024 දෙසැම්බර් 31 දින වන විටත්, ඉන් එ.ජ.ඩොලර් මිලියන 9.655 ක් (සියයට 10.49) ක් පමණක් උපයෝජනය කර ඇති බව නිරීක්ෂණය වුණි. එබැවින් ව්‍යාපෘතියේ සංවර්ධන අරමුණු සපුරාලීමේ ප්‍රගතිය දුර්වල බැවින්, එහි අදියර 01 හි විෂය පථයෙන් කොටසක් වන අබතලේ ලවණතා බාධකය ඉදි කිරීම ( Ambatale Salinity Barrier ) මෙම අදියරෙන් ඉවත් කර මීළඟ අදියරට (phase II) මාරු කිරීම හා ව්‍යාපෘතියේ 02 වන කොටසෙන් (Component 02) , 05 වන කොටසට ( Component 05 ) එ.ජ.ඩොලර් මිලියන 5 ක් දක්වා යළි වෙන් කිරීමටත්, අවධානය යොමු කිරීමට කටයුතු සම්පාදනය කරමින් පවතින බව World Bank – Mid – Term Review Mission ( April 02, 2025) නිරීක්ෂණය වුණි. එනම් මෙය ව්‍යාපෘතියේ අරමුදල් ඌණ උපයෝජනය හේතුවෙන් ප්‍රධාන ව්‍යාපෘති අභිප්‍රායන්/ අරමුණු පසෙකලා අතුරු අරමුණු වෙනුවෙන් වැඩියෙන් අරමුදල් යෙදවීමක් වශයෙන්ද නිරීක්ෂණය විය.

## ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය

වගු අංක **2.47 -** ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ණය /ආධාර මුදල | | ව්‍යාපෘති කාලය | | 2024.12.31 දිනට | | 2024.12.31 දිනට | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | එ.ජ.ඩොලර්.මිලියන | රු.මිලියන | ආරම්භක දිනය/වර්ෂය | ව්‍යාපෘති කාලය | එ.ජ.ඩොලර්.මිලියන | රු.මිලියන | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
| 1 | යාපනය කිළිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | | | | | | | | |
| | විදේශ ණය / ආධාර | එ.ජ.ඩොලර්.මි. 198 | 26,906.00 | 2013 මාර්තු | වසර 14 කාල දිගු ලබාදීමෙන් පසු වසර 18 | එ.ජ.ඩොලර්.මි 131.12 | 29,158 | 84 | 90 |
| | දේශීය අරමුදල් | එ.ජ.ඩොලර්.මි 56 | 7,586.00 | | | | | | |
| 2 | රුවන්වැල්ල මහපරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතිය | | | | | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | විදේශ ණය / ආධාර | එ.ජ.ඩොලර්.මි 18,452 | 3,250.00 | 2019 | වසර 3 කාල දිගු ලබාදීමෙන් පසු වසර 6 | එ.ජ.ඩොල ර්.මි 17.54 | 4,381.15 | 50 | 70 |
| | දේශීය අරමුදල් | එ.ජ.ඩොලර්.මි 17.21 | 3,041 | | | | | | |
| 3 | අනුරාධපුර උතුරු ජල සම්පාදන යෝජනා ක්‍රමය - අදියර 02 | | | | | | | | |
| | විදේශ ණය / ආධාර | ජපන් යෙන් මි. 19,409 | 22,464.00 | 2016.11.17 | වසර 7 කාල දිගු ලබාදීමෙන් පසු වසර 15 | _ | 319.00 | 1 | 13 |
| | දේශීය අරමුදල් | ජපන් යෙන් මි. 4,089 | 4,315.00 | | | | | | |
| 4 | කළු ගඟ ජල සැපයුම් පුළුල් කිරීමේ ව්‍යාපෘතිය | | | | | | | | |
| | විදේශ ණය / ආධාර | ජපන් යෙන් මි. 31,810 | 45,056.00 | 2017/7/7 | වසර 9 | ජපන් යෙන් මි. 479 | 954 | 1 | 5 |
| | දේශීය අරමුදල් | ජපන් යෙන් මි. 7,257 | 10,282.00 | | | | | | |
| 5 | මහනුවර නගර අපජලය කළමණාකරණ ව්‍යාපෘතිය | | | | | | | | |
| | විදේශ ණය / ආධාර | ජපන් යෙන් මි. 14,087 | 17,922.00 | 2010/03/26 | වසර 9 කාල දිගු ලබාදීමෙන් පසු වසර 17 | ජපන් යෙන් මි. 11,635 | 19,615 | 95 | 94 |
| | දේශීය අරමුදල් | ජපන් යෙන් මි..3.191 | 4,060 | | | | | | |
| 6 | නගර සඳහා සනීපාරක්ෂක හා සෞඛ්‍ය සමාරම්භ වැඩසටහන අදියර 01 | | | | | | | | |
| | විදේශ ණය / ආධාර | යුරෝ මි 76 | 14,215.81 | 2016 ජුනි | වසර 4 කාල දිගු ලබාදීමෙන් පසු වසර 7 | යුරෝ මි. 4.92 | 1,890.04 | 10 | 12 |
| | ප්‍රදාන | යුරෝ මි 5.7 | | | | | | | |
| | දේශීය අරමුදල් | යුරෝ මි 26 | 4,524 | | | | | | |
| 7 | රත්මලාන මොරටුව අපජල අපහරණ ව්‍යාපෘතීය අදියර 2 | | | | | | | | |
| | විදේශ ණය / ආධාර | යුරෝ මි 75 | 15,414.00 | 2021/12/31 | වසර 4 | යුරෝ මි. 8.5 | 2,067 | 47 | 29 |
| | දේශීය අරමුදල් | යුරෝ මි 30 | 6,268.36 | | | | | | |
| 8 | ආනමඩුව ජල සම්පාදන ව්‍යාපෘතිය | | | | | | | | |
| | විදේශ ණය / ආධාර | යුරෝ මි 29.5 | 4,635.00 | 2016 | වසර 3 කාල දිගු ලබාදීමෙන් පසු වසර 6 | _ | _ | _ | 79 |
| | දේශීය අරමුදල් (HNB) | යුරෝ ම 13.05 | 2,050.00 | | | | | | |
| 9 | විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය | | | | වර්ෂ 3 කාල දිගු ලබාදීමෙන් පසු වර්ෂ 05 (2022 | | | | |
| | විදේශ ණය / ආධාර | යුරෝ මි 123.73 | 20,129.00 | 2017 අප්‍රේල් | | _ | 36,682.0 0 | 100 | 100 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දේශීය අරමුදල් | යුරෝ මි 38.6 | 8,762.82 | | පෙබරවාරි අවසන් කර ඇත) | | | | |
| 10 | ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 165 | 24,750 | 2015.12.07 | මූලිකව වර්ෂ 05 කාල දිගුවලින් පසු වර්ෂ 08කින් පසු නිමකර ඇත. | 159.06 | 55,574.79 | 100 | 100 |
| 11 | ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය- අතිරේක මූල්‍ය කරණය | 40 | 12,000 | 2021.09.04 | මූලිකව වර්ෂ 02 යි කාල දිගුවලින් පසු වර්ෂ 03 ½ | 36.21 | 11,284.37 | 96 | 96.396 |
| 12 | මහ කොළඹ ජලය සහ අපජලය කළමණාකරණ වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩසටහන ව්‍යාපෘති 01 | | | | | | | | |
| | විදේශ ණය / ආධාර | එ.ජ.ඩොලර්.මි. 84.00 | 11,088.00 | 2013 | 4 | එ.ජ.ඩොලර්.82.92 | 13,461.11 | 100 | 100 |
| | දේශීය අරමුදල් | එ.ජ.ඩොලර්. 28.00 | 3,696.00 | | | එ.ජ.ඩොලර්.18.98 | 3,901.68 | | |
| 13 | මහ කොළඹ ජලය සහ අපජලය කළමණාකරණ වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩසටහන ව්‍යාපෘති 02 | | | | | | | | |
| | විදේශ ණය / ආධාර | එ.ජ.ඩොලර්.මි. 79.95 | 10,394.0 | 2014 | 5 | එ.ජ.ඩොලර්.මි.77.03 | 16,431.63 | 84 | 99 |
| | දේශීය අරමුදල් | එ.ජ.ඩොලර්.මි. 27.10 | 3,523.00 | | | එ.ජ.ඩොලර්.මි.9.33 | 4,087.07 | | |
| 14 | මහ කොළඹ ජලය සහ අපජලය කළමණාකරණ වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩසටහන ව්‍යාපෘති 03 | | | | | | | | |
| | විදේශ ණය / ආධාර | එ.ජ.ඩොලර්.මි. 38.00 | 4,940.00 | 2016 | 4 | එ.ජ.ඩොලර්.මි.38.70 | 10,601.33 | 89 | |
| | දේශීය අරමුදල් | එ.ජ.ඩොලර්.මි. 17.63 | 2,291.90 | | | එ.ජ.ඩොලර්.මි. 7.40 | 2,142.71 | | |
| 15 | අනුරාධපුර උතුර ජල සම්පාදන යෝජනා ක්‍රමය අදියර 1 | | | | | | | | |
| | විදේශ ණය / ආධාර | ජපන් යෙන් 5166.00 | 8,726.00 | 2013 | 5 | ජපන් යෙන් 4803.00 | 7,943.00 | 98 | 99 |
| | දේශීය අරමුදල් | ජපන් යෙන් 1,651.00 | 2,789.00 | | | ජපන් යෙන් 680.00 | 1.297.00 | | |
| 16 | අඹතලේ ජල සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම | | | | | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | සහ බලශක්ති සංරක්ෂණ ව්‍යාපෘතිය | | | | | | | | |
| | විදේශ ණය / ආධාර | එ.ජ.ඩොලර්.මි. 70.00 | 9,100.00 | 2014 | 5 | එ.ජ.ඩොල ර්.මි. 42.53 | 9,942.75 | 83 | 91 |
| | දේශීය අරමුදල් | එ.ජ.ඩොලර්.මි. 30.00 | 3,900.00 | | | එ.ජ.ඩොල ර්.මි. 14.53 | 3,997.16 | | |

මූලාශ්‍රය - ජාතික ජල සම්පාදන හා ජලාපවාහන ව්‍යාපෘති අංශ මූල්‍ය හා ප්‍රගති වාර්තා



**ආණමඩුව ජල සම්පාදන ව්‍යාපෘතිය**

විදේශීය කොන්ත්‍රාත් ආයතනයක් සමඟ 2017 වර්ෂයේ ආරම්භ කර තිබූ ව්‍යාපෘති කටයුතු 2020 පෙබරවාරි අවසන් කර කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක දෙකෙහි පුද්ගලයන් 81,740ක් සඳහා ජල සම්බන්ධතා 16,350 ක් ලබාදීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ විය.

2023 මැයි 26 දින සේවායෝජක විසින් දුර්වල කාර්යසාධනය පදනම් කරගෙන කොන්ත්‍රාත්කරුගේ වැඩ අවසන් කර තිබූ අතර කොන්ත්‍රාත්කරුගේ අත්තිකාරම් හා කාර්යසාධන සුරක්ෂණය මුදල් කර රු.මිලියන 2,527 ක් මණ්ඩලය විසින් ලබාගෙන තිබුණි. මුදල් කරගත් අත්තිකාරම් සුරක්ෂණයෙන් රු.මිලියන 930ක් ව්‍යාපෘතියේ ඉතිරි වැඩ සඳහා භාවිතා කර තිබූ අතර ඉතිරි මුදල් වූ රු.මිලියන 1,597 වසර 2 අධික කාලයක් මණ්ඩලීය ගිණුමක තැන්පත් කර පවත්වාගෙන යමින් පැවතුණි.

ව්‍යාපෘතිය සඳහා මිලදීගෙන තිබූ රු.මිලියන 700 අධික නල හා උපාංග තොගය කොන්ත්‍රාත්කරු වෙතින් විධිමත්ව සත්‍යාපනය භාරගැනීමට කටයුතු කර නොතිබූ අතර ඇතැම් තොග අයිතමයන් නැවත භාවිතා කල නොහැකි ලෙස ගුණත්වය හීනවෙමින් පවතින බව නිරීක්ෂණය විය.

වසර 2 කට අධික කාලයක් ගෙවීම් කර නොමැති රු.මිලියන 25.5 සහ යුරෝ මිලියන 0.5 ක් වූ අතරමැදි බිල්පත සඳහා ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදුවීමේ අවධානමක් පැවතුණි. කොන්ත්‍රාත්කරු විසින් සියයට 83 භෞතික ප්‍රගතියක් සහිතව ඉදිකර තිබූ නවගත්තේගම ජල කුළුණෙන් ජලය කාන්දු වන බව අනාවරණය වී තිබූ අතර ඒ වන විටත් කොන්ත්‍රාත්කරු වෙත ජල කුළුණ ඉදිකිරීම සඳහා රු.මිලියන 58.3 ක් ගෙවා තිබුණි. මෙම ජල කාන්දුව නිවැරදි කිරීම සඳහා රු.මිලයන 8 ඉක්මවන වියදමක් දැරීමට සිදුවීමේ අවදානමක්ද

පවතින බව නිරීක්ෂණය විය. 2024 දෙසැම්බර් වන විට ව්‍යාපෘති කටයුතු ආරම්භ කර වසර 8 අධික කාලයක් ගතවී, ඒ සඳහා රු.මිලියන 5,983 ක් වැය කර තිබූ නමුත් ජල සම්බන්ධතා කිසිවක් ලබාදී නොතිබුණි.

**යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය**

2024 දෙසැම්බර් 31 දින වන විට මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් රු.මිලියන 35,121 සහ සියයට 90 ක් පමණ වුවත් ව්‍යාපෘති කටයුතු සම්පූර්ණ වී නොමැති බැවින් නව ජල සබඳතා කිසිවක් ලබාදී නොතිබුණි.

දෛනිකව ඝණ මීටර් 24,000 යුත් මුහුදු ජලය ප්‍රති ආශ්‍රිත පිරියත ඒකකයේ ඉදිකිරීම් කටයුතු 2024 ඔක්තෝබර් වන විට අවසන් කර පැවති නමුත් මෙම පිරියත ඒකකයේ වසර 7 ක මෙහෙයුම් හා නඩත්තු සඳහා රු.මිලියන 3,694 ක් අවශ්‍ය වුවද ණය කාල සීමාව 2026 ජූනි 30 අවසන් වීමට නියමිතව පවතින බැවින් ඉතිරි වසර 5 ක මෙහෙයුම් පිරිවැය ආවරණය කර ගැනීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග සොයාගැනීම හෝ පවත්නා ණය ගිවිසුමේ කාල සීමාව දීර්ඝ කර ගැනීමට අවශ්‍යතාවයක් පවතින බව නිරීක්ෂණය විය. එමෙන්ම මෙම පිරියත ඒකකය ක්‍රියාත්මක කිරීමේදී දැරීමට සිදුවන අධික බලශක්ති පිරිවැය අවම කර ගැනීම සඳහා පුනර්ජනනිය බලශක්ති විකල්පයක් සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් උපදෙස් ලබාදී තිබූ නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**විදුලි බල සැපයුම් විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සහය දීමේ ව්‍යාපෘතිය**

2024 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය අවසන් අදියරේ පවතින නමුත් ව්‍යාපෘති අරමුණු ලෙස හඳුනාගත් අරමුණු 4 අතරින් එක් අරමුණක් පමණක් ඉටු කර තිබුණි.

පානීය ජල නිෂ්පාදනය සඳහා රු.මි. 185 ක් වැයකර දෛනිකව ඝණ මීටර් 150 ක ධාරිතාවයකින් යුත් මුහුදු ජලය ප්‍රති අශ්‍රිත පිරියත ඒකකයක් 2021 වර්ෂය වන විට ඉදිකර තිබුණි. 2024 දෙසැම්බර් 31 දින වන විටත් දෛනික ජල නිෂ්පාදනය ඝණ මීටර් 85 මට්ටමේ

පැවති අතර මෙය දූපත් 3 හි ජනතාවගේ අවම පානීය ජල අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා හෝ ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

**රත්මලාන මොරටුව අප ජල අපහරණ පියවර 1 අදියර 2 ව්‍යාපෘතිය**

ණය දෙන ආයතනය 2022 වර්ෂයේ සිට ණය ලබාදීමේ කටයුතු අත්හිටුවීම නිසා කොන්ත්‍රාත්කරුට ලබාදී තිබූ යූරෝ මිලියන 4 සහ රු.මිලියන 493 වන අත්තිකාරම් මුදල් භාවිතා කර හඳුනාගත් ප්‍රමුඛතා විෂය පථය ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබුණි.

මලාපවහන ජාලය පුළුල් කිරීමේ කොන්ත්‍රාත්තුව අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවක නිර්දේශ ප්‍රකාරව යූරෝ මිලියන 20.5 හා ශ්‍රී ලංකා රු.මිලියන 3,869 වටිනාකමට කොන්ත්‍රාත් ආයතනයක් වෙත 2021 දෙසැම්බර් මස ලබාදී තිබූ අතර එම කොන්ත්‍රාත්තුවේ විචලනයක් ලෙස එම කොන්ත්‍රාත්තුවට අදාළ නොවන රු.මි.474 ක් වටිනා වෙනත් කොන්ත්‍රාත්තුවක් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව පවත්නා කොන්ත්‍රාත්කරුට ලබාදී තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව සඳහා මණ්ඩලය විසින් රු.මිලියන 403 ක ඇස්තමේන්තුවක් සකස් කර තිබූ නමුත් එම ඇස්තමේන්තු වටිනාකමට වඩා රු.මිලියන 71 කට වැඩි වටිනාකමක් වූ රු.මිලියන 474 වටිනාකමකට පවත්නා කොන්ත්‍රාත්කරු වෙතට ලබාදී තිබුණි.

**මහනුවර නාගරික අපජල කළමණාකරණ ව්‍යාපෘතිය**

ව්‍යාපෘති කටයුතු 2010 වර්ෂයේ ආරම්භ කර 2017 වර්ෂයේ අවසන් කිරීමට සැලසුම කර තිබූ නමුත් 2024 දෙසැම්බර් වන විටත් ව්‍යාපෘති කටයුතු අවසන් කර නොතිබුණි.

පැකේජ 01 යටතේ දිනකට ඝණ මීටර 14,000 ධාරිතාවයකින් යුත් අප ජල පවිත්‍රාගාරය ඉදිකර, 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලැබුවත් දේපල සබඳතා ලබාදීමේ කොන්ත්‍රාත්තුව 2024 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබීම නිසා පවිත්‍රාගාරය දිනකට ඝණ මීටර 6,100 පමණ අඩු ධාරිතාවයකින් 2024 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

පැකේජ් 2 කොන්ත්‍රාත්කරු විසින් ආශ්‍රිත පිරිවැය සහ කාලය දිගු කිරීම සඳහා අවස්ථා දෙකකදී හිමිකම් පෑම් ඉල්ලීම කර තිබූ නමුත් ව්‍යාපෘති ඉංජිනේරු ඒ සඳහා එකඟ නොවීම නිසා ආරවුල් විනිශ්චය

මණ්ඩලයක් වෙත ඉදිරිපත් කර තිබුණි. ආරවුල් විනිශ්චය මණ්ඩලය විසින් ලබාදී තිබූ තීරණය සේවායෝජක පිලිගෙන නොතිබූ අතර ඒ සඳහා එකඟනොවීමේ නිවේදනය නිකුත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් මණ්ඩලය විසින් අවස්ථා කිහිපයකදී නීතිපති උපදෙස් පතා තිබූ අතර 2024 දෙසැම්බර් 31 දින වන විට මෙම වන්දි ඉල්ලීම ස්ථාවර ඉහල මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව විසින් සලකා බලමින් පැවතුණි.

**ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යනය**

ගම්පහ දිස්ත්‍රික්කයේ (අත්තනගල්ල) සෙප්ටේජ් පිරිපහදු යන්ත්‍රාගාරයේ ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදනය සඳහා ජාතික ප්‍රසම්පාදන ආයතනය විසින් සමාජ බලපෑම් තක්සේරුව, පාරිසරික බලපෑම් තක්සේරුව තහවුරු කිරීම වැනි ශක්‍යතා අධ්‍යයනයන් සිදු කර නොතිබුණි. එම හේතුවෙන් මධ්‍යම පරිසර අධිකාරියෙන් අනුමැතිය නොලැබීම සහ මහජන විරෝධතා ඇතිවීම හේතුවෙන් මෙම වැඩ බිමෙහි ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණු අතර කොන්ත්‍රාත්කරුට ගෙවන ලද රුපියල් මිලියන 4.7 ක මුදල අනාර්ථික වියදමක් විය.

මල්ලාවි ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා වසර අවසානයේ සැලසුම් කළ සියයට 74 ක ඉලක්කයට වඩා භෞතික ප්‍රගතිය අඩුවීම හේතුවෙන් 2025 ජුනි මාසය අවසානයේ එනම් ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසානයේ ඉලක්කගත සියයට 100 ක ප්‍රගතිය සියයට 80කට යළි සකස් කරන ලදී. එබැවින්, ව්‍යාපෘති කාල සීමාවෙන් පසු මූල්‍ය සීමාවන් මත කොන්ත්‍රාත්තුව සම්පූර්ණ නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත්තුවෙහි අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අවදානමක් පවතී.

2025 මැයි මස අවසානයේදී මහවැලිගම ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ අපේක්ෂිත සම්බන්ධතා 1,580 න් සියයට 30 ක් හෙවත් 430 ක් පමණක් ලබා දී තිබූ අතර මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් ඇස්තමේන්තුගත රුපියල් මිලියන 427 න් සියයට 33 ක් හෙවත් මිලියන 140 ක් පමණක් වියදම් කර තිබුණි. 2025 මැයි 20 වන විට කොන්ත්‍රාත් පමාව සඳහා කොන්ත්‍රාත්කරුගෙන් ඇවර කිරීමේ හානි ඉල්ලා නොතිබුණි.

**ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2015 නොවැම්බර් 06 දින එළඹි අංක 5685 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ II උපලේඛනයේ II ඡේදයේ (ඇ) (3) හා 2010 ජුලි 31 දින එළඹි ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය හා ප්‍රදාන සාමාන්‍ය කොන්දේසිවල 4.09 (ආ) අනුව විගණනය සඳහා 2024 අප්‍රේල් 30 දිනට මාස 4ක කාලයක් සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතු වුවත් 2025 ජුලි 30 වන දින දක්වා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

**මහ කොළඹ ජල හා අපජල කළමණාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන් ව්‍යාපෘතිය**

2016,2019 හා 2020 වන විට නිම කිරීමට මූලිකව සැලසුම්කර තිබූ අතර එම දිනයන්ට නිම කිරීමට අපොහොසත්වීම තුළ ව්‍යාපෘති 01 2021 ජූනි 30 සහ ව්‍යාපෘති 02 හා 03 2024 පෙබරවාරි 29 දින දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කර තිබුණි.

ආදායම් නොලබන ජල අනුපාතය සියයට 49 සිට සියයට 18 දක්වා අවම කිරීම සඳහා කොළඹ නගරය දිස්ත්‍රික් මිණුම් කලාප 78 ට බෙදා ආසන්න වශයෙන් රු.මි.258 ක් වැය කරමින් DMA මීටර් 78 ක් ස්ථාපිත කර තිබුණද 2024 දෙසැම්බර් 31 වන විට එම මීටර් වලින් 65 ක් දෝෂ සහිතව අක්‍රීයව පැවතුණි. මේ හේතුවෙන් ජල ප්‍රවාහ මිණුම් දත්ත ලබාගැනීමට නොහැකි වීම මත ආදායම් නොලබන ජලය (NRW) කළමණාකරණය කිරීමේ ව්‍යාපෘති අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

**අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩි දියුණු කිරීම සහ බලශක්ති ඉතිරිකිරීමේ ව්‍යාපෘතිය**

2024 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය සිව් වතාවක් කාලය දීර්ඝ කර තිබුණු අතර සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 91.46 ක් හා සියයට 83.02 ක් ව තිබුණි.

ව්‍යාපෘතියේ සැලසුම් සමාලෝචනය හා ඉදිකිරීම් අධීක්ෂණ උපදේශන සේවාව සඳහා වන කොන්ත්‍රාත්තුව රු.මි. 343 කට මාස 36 ක කාලයක් සඳහා 2015 දී ප්‍රදානය කර තිබූ අතර 2025 ජුලි 09

වන විටත් කොන්ත්‍රාත් කාලය දිගු කිරීම් 7 ක් සමඟ මාස 67 කින් සහ එහි පිරිවැය රු.මි.768 කින් ද ඉක්මවා ගොස් තිබුණි. විධිමත් අනුමැතියකින් තොරව උපදේශන කොන්ත්‍රාත් සේවාව පවත්වාගෙන යන අතර කාල දිගු කිරීම් ලබාදීම හා අමතර ගෙවීම් අනුමත කිරීම කළමණාකාරීත්වය මඟින් සිදුකර තිබූ බව නිරීක්ෂණය විය.

දුර්වල ව්‍යාපෘති කාර්යය සාධනය හේතුවෙන් 2024 දෙසැම්බර් 31 වන විට මුළු ණය පහසුකමින් සියයට 60 ක් පමණක් භාවිතා කර තිබුණු අතර ණයදෙන ආයතනය මුදල් ලබාදීම නවතා දමා තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතිය විසින් උපයෝජනය නොකල ණය මත බැඳීම් ගාස්තු වශයෙන් රු.මි. 390.4 ක සමස්ත මුදලක් ගෙවීමට රජයට සිදුවී තිබුණි.

**අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - I අදියර**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ අනාරක්ෂිත භූගත ජලය පානය හේතුවෙන් දන්ත හා අස්ථි ෆ්ලෝරෝසිස් මෙන්ම නිදන්ගත වකුගඩු රෝග ඇතිවීමට වැඩි නැඹුරුවක් ඇති මැදවච්චිය හා රඹෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල පාරිභෝගිකයන් 115,000 සඳහා පානීය ජල සබඳතා 25,000 ක් ලබාදීමේ අරමුණින් යුතුව 2013 වර්ෂයේ ආරම්භ කර 2018 පෙබරවාරි මස අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2025 අගෝස්තු 15 දින වන විට ජල සබඳතා 7,978 ක් ලබාදී තිබුණද රු.මි.255.75 ක වැයක් දරමින් ඉදිකල රඹෑව නැගෙනහිර මධ්‍යස්ථානයෙන් කිසිදු ජල සබඳතාවයක් පාරිභෝගිකයින්ට ලබාදීමට ව්‍යාපෘති කළමණාකරණය අපොහොසත් වී තිබුණි.

ව්‍යාපෘතිය යටතේ එළන ලද නලවල ජලයේ ප්‍රවාහය මැනීම සඳහා දළ වශයෙන් රු.මි.16.1 කට විද්‍යුත් චුම්භක ප්‍රවාහ මීටර 6 ක් 2020 වර්ෂයේදී මිලදීගෙන ස්ථාපිත කර තිබුණද ගලවා ඉවත් කරන ලද මීටර් අක්‍රීයව හා භාවිතයෙන් තොරව 2025 අගෝස්තු වන විටත් අනුරාධපුර සහය සේවා මධ්‍යස්ථානයේ ගබඩාකර පැවතිණි.

මෙම ජල පිරිපහදු මධ්‍යස්ථානයේ සහ ජල බෙදාහැරීම් කටයුතු වඩා ආරක්ෂිතව හා කාර්යක්ෂමව ඵලදායීතාවයෙන් යුතුව ක්‍රියාත්මක කිරීමට සහ අධීක්ෂණය කිරීමේ අරමුණින් යුතුව ස්වයංක්‍රීයව, අර්ධ ස්වයංක්‍රීයව හා මිනිස් ශ්‍රමයෙන් ක්‍රියා කල හැකි පරිදි එ.ජ.ඩොලර්

1,500 ක් හා රු.මි.15.29 ක් වැය කර SCADA පද්ධතියක් සවිකර තිබුණද එමඟින් ලබාදෙන දත්ත හා තොරතුරු වල පරස්පරතාවයන් පවතින අතර ස්වයංක්‍රීයව සිදුකිරීමට සැලසුම් කල බොහෝ ජල සම්ප්‍රේෂණ කාර්යයන් මිනිස් ශ්‍රමයෙන් තවදුරටත් සිදුකරනු ලබයි.

ව්‍යාපෘතියේ ජලය බෙදාහැරීමේ කටයුතු ආරම්භ කර ආසන්න වශයෙන් තෙවසරක් ගතවී භෞතික ප්‍රගතිය සියයට 99.28 ක් ව පැවතියද ආදායම් නොවන ජල අනුපාතයේ අපේක්ෂිත ඉලක්කය වූ සියයට 20 වඩා සැලකිය යුතු ලෙස ඉතා ඉහළ අගයක්ව (සියයට 50) පැවතුණි.

## මහා භාණ්ඩාගාරයේ ක්‍රියාත්මක ව්‍යාපෘති

### සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය

**සමාජ ආරක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය**

IWMS පද්ධතිය සංවර්ධනය සඳහා රුපියල් මිලියන 25ක ඇස්තමේන්තුගත වටිනාකමකට ගිවිසුම්ගතව තිබූ අතර ගිවිසුම් කාලය අවසන් වන විට සංවර්ධනයට අපේක්ෂිත මොඩියුල 12න් 08ක් පමණක් සංවර්ධනය කර තිබුණි. ඒ සඳහා රු. මිලියන 15ක් හෙවත් ගිවිසුම්ගත වටිනාකමින් සියයට 60ක් ගෙවා තිබුණි. රු. මිලියන 10ක ඇස්තමේන්තු වටිනාකමකට සංවර්ධනයට අපේක්ෂිත ඉතිරි මොඩියුල හතර 2024 දෙසැම්බර් 31 වන විටත් සංවර්ධනය කර නොතිබුණි.

**පද්ධතිගත ප්‍රතිලාභීන්**

සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය විසින් 2024 දෙසැම්බර් මසට අදාළ තොරතුරු අනුව, පද්ධතිගත කළ අඩු ආදායම්ලාභීන් හා වැඩිහිටි දීමනා හිමි ප්‍රතිලාභීන් 2,233,159ක් සඳහා රුපියල් මිලියන 12,630ක්ද, පද්ධතිගත නොකළ ප්‍රතිලාභීන් 520,707ක් සඳහා රුපියල් මිලියන 2,389ක්ද වශයෙන් ගෙවා තිබුණි. පද්ධතිගත නොකළ ගෙවීම් වටිනාකම මුළු ගෙවීම් වටිනාකමින් සියයට 16 ක් වූ අතර වැඩිහිටි දීමනා, ආබාධිත දීමනා හා නිදන්ගත වකුගඩු රෝග සඳහා වූ ප්‍රතිලාභීන් පද්ධතිගත නොවීම මේ සඳහා හේතු වී පැවතුණි.

**පද්ධති විගණනය සිදු නොකිරීම**

IWMS පද්ධතියේ දුර්වලතා සහ අනාගතයේදී අවශ්‍ය වැඩි දියුණු කිරීම් හඳුනාගැනීම සඳහා සිදු කර තිබූ පද්ධති විගණනය 2024 ,දී සැලසුම් කළ පරිදි සිදු කර නොතිබුණි.

**තොරතුරු සත්‍යාපනය සඳහා පහසුකම් නොමැතිවීම**

ප්‍රතිලාභීන්ගේ තොරතුරු සත්‍යාපනය කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, මූල්‍ය ආයතන, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වැනි අනෙකුත් අදාළ රාජ්‍ය ආයතනවල දත්ත පද්ධති සමඟ සම්බන්ධ වීමට පද්ධතිය තුළ නිසි යාන්ත්‍රණයක් ස්ථාපිත කර නොතිබුණි.

**ගැටලු විසඳීමේ යාන්ත්‍රණය**

සමාලෝචිත වර්ෂය අවසන් වන විට, දුක්ගැනවිලි විසඳන යාන්ත්‍රණය හරහා ලැබුණු දුක්ගැනවිලිවලින් සියයට 40ක් විසඳී නොතිබුණි. තවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 341න් 24ක් පමණක් දත්ත යාවත්කාලීන කිරීම සහ ප්‍රතිලාභී වාර්තා සංශෝධනය කිරීම සඳහා සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලයට තොරතුරු ඉදිරිපත් කර තිබීමෙන් සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද වී තිබුණි.

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වැඩිදියුණු කිරීමේ මූල්‍ය ව්‍යාපෘතිය

**අරමුදල් ඌන උපයෝජනය**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වැඩිදියුණු කිරීමේ මූල්‍ය ව්‍යාපෘතිය යටතේ, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා මූල්‍ය ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ ආර්ථික ස්ථාවරත්වය වර්ධනය කිරීමේ අරමුණින් ඇමරිකානු ඩොලර් මිලියන 50 ක් හෙවත් රු. මිලියන 14,839.96 ක් වෙන්කර තිබුණි. 2024 දෙසැම්බර් 31 වන දින වනවිට මෙම මුළු ණය මුදල අදියර 2ක් මඟින් සහභාගීත්ව මූල්‍ය ආයතන 13කට බෙදා දී තිබූ අතර පළමු අදියර යටතේ රු.මිලියන 6,826.38ක් ආයතන 13කට ලබා දී තිබුණි. අරමුදල් භාවිතය පිළිබඳ ප්‍රගතිය මත පදනම්ව, පළමු අදියරේදී ලබාදුන් මුදලින් සියයට 80කට වඩා උපයෝජනය කළ සහභාගීත්ව මූල්‍ය ආයතන 10කට 2024 නොවැම්බර් 11 දින, දෙවැනි අදියර යටතේ එකතුව රු.මිලියන 8,013,58ක් ලබා දී තිබුණි. එහෙත්, 2024 දෙසැම්බර් 31 වන දින වනවිට, ආයතන 3ක් පළමු අදියර යටතේ ලබා දුන් මුදලින් සියයට 59කට අඩු ප්‍රමාණයක් පමණක් උපයෝජනය කර තිබූ අතර ඉන් එක් ආයතනයක් මුළු ණය මුදලම උපයෝජනය කර නොතිබුණි.

**උපයෝජනය නොකළ මුදල් නැවත බෙදාහැරීම**

4441 – SRI(COL) ණය ගිවිසුම යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන සමඟ ගිවිසුම්ගතව ඇති උපණය ගිවිසුම් අනුව, ආයතන 8ක් වෙත ලබාදුන් ණය මුදලින් සියයට 86කට වඩා උපයෝජනය කර තිබූ අතර ආයතන දෙකක උපයෝජනය සියයට 60ට අඩුවී තිබුණි. ව්‍යාපෘති මෙහෙයුම් මාර්ගෝපදේශ අනුව, වෙන්කරනු ලැබූ මුදල් ලබාදුන් දිනයේ සිට එක් වසරක් ඇතුළත උපයෝජනය නොකළහොත් එම මුදල් ව්‍යාපෘති පාලන කමිටුව මගින් නියමිත පරිදි උපයෝජනය කර ඇති සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත නැවත බෙදාහැරිය යුතු නමුත්, ව්‍යාපෘති පාලන කමිටුව විසින් 2025 ජූනි 25 වන දින වන විටත් උපයෝජනය නොකර ඉතිරි වී ඇති මුදල් නැවත බෙදා හැරීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

**මුදල් උපයෝජනය පිළිබඳ අධීක්ෂණය ප්‍රමාණවත් නොවීම**

SMELoC2 ව්‍යාපෘතිය යටතේ, 2025 මැයි 21 දින වන විට සහභාගීත්ව මූල්‍ය ආයතන 13 මඟින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 1,273 ක් සඳහා ණය ලබාදී තිබුණි. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි මූල්‍ය ප්‍රවේශය ව්‍යාප්ත කිරීම සහ ඔවුන්ගේ ආර්ථික හැකියාව වැඩිදියුණු කිරීමේ අරමුණින් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියේ ණය මුදල් උපයෝජනයේ ප්‍රගතිය පරීක්ෂාව සඳහා ක්ෂේත්‍ර පරීක්ෂා සිදුකිරීම වැදගත් වන නමුත්, ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් 1,273 කට ණය ලබාදී තිබුණද විගණන දින වන 2025 ජූනි 24 දින වන විට ක්ෂේත්‍ර පරීක්ෂා 18ක් පමණක් සිදුකර තිබීමෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක වීම පිළිබඳ ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදුකර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

## ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය සංවර්ධන හදිසි ආධාර ව්‍යාපෘතිය

**අරමුදල් ඌන උපයෝජනය**

මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දී ඇති එ.ජ.ඩොලර් මිලියන 200 ක ණය මුදලින් 2024 වර්ෂය සඳහා අඩු ආදායම්ලාභී පවුල්වල ජීවනෝපාය වැඩිදියුණු කිරීම යටතේ දිවයින පුරා සිටින නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සිදු කිරීම සඳහා එ.ජ.ඩොලර් මිලියන 1.25 ක් හෙවත් රු.මිලියන 365.20 ක ප්‍රතිපාදන වෙන් කරන ලද නමුත් 2024 වර්ෂයේදී අදාළ ක්‍රියාකාරකම් සිදු කිරීම

සඳහා එ.ජ. ඩොලර් මිලියන 0.03 ට සමාන රුපියල් මිලියන 11.33 ක් පමණක් භාවිතා කර තිබුණි. එය 2024 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 3 පමණක් වී තිබුණි.

**අනෙකුත් පද්ධති සඳහා ලබා දී ඇති අරමුදල්**

ආසියානු සංවර්ධන බැංකු ණය මඟින් සමාජ ආරක්ෂණ පද්ධතිවල ඵලදායීතාවය සහ ප්‍රශස්තතාවය වැඩි දියුණු කිරීම (CRM පද්ධතිය සංවර්ධනය- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ Geogovia පද්ධතිය සංවර්ධනය- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව) එ.ජ. ඩොලර් මිලියන 2.65ක් හෙවත් රු.මිලියන 965.47ක් ව්‍යාපෘතිය ආරම්භයේදීම ඇස්තමේන්තු කර තිබුණද, 2024 දෙසැම්බර් 31 දින වන විටත් වර්ෂ 02කට ආසන්න කාලයක් එම ප්‍රදාන මුදල් උපයෝජනය කර නොතිබුණි.

තවද, ආසියානු සංවර්ධන බැංකු ප්‍රදාන මඟින් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය යටතේ අවධානමට ලක්වූවන් වෙනුවෙන් (කාන්තා, ළමා සහ ආබාධ සහිත පුද්ගලයින්) හදිසි ආධාර සඳහා වූ ප්‍රදාන යටතේ අදාළ කාර්යයන් ඉටු කිරීමට රු.මි.448.33ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණු අතර රු.මි.276.88ක් පමණක් උපයෝජනය කර තිබුණි.

**පුහුණු අවස්ථා ඌන උපයෝජනය**

ආසියානු සංවර්ධන බැංකු ප්‍රදාන මඟින් කෘෂිකාර්මික පුහුණුව සඳහා රු.මි.11.74ක් වෙන්කර තිබුණද රු.මි.4.39ක් පමණක් උපයෝජනය කර තිබුණි .

## රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය - e-GP ලේකම් කාර්යාලය

**ප්‍රතිපාදන ඌන උපයෝජනය**

රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා, 2023 ජූලි සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා ලබා දුන් රු. මිලියන 80ක විදේශ අරමුදල් ප්‍රතිපාදනයෙන් රු. මිලියන 11.64ක් වියදම් කර, රු.මිලියන 68.36ක් ඉතිරිවී තිබූ අතර එම ඉතිරිය අයවැය ප්‍රතිපාදනයෙන් සියයට 85 ක් විය.

**2024 ප්‍රතිපාදන ඉතිරිය**

මෙම ව්‍යාපෘතිය සඳහා, 2024 වර්ෂය සඳහා දේශීය අරමුදල් යටතේ රු. මිලියන 10ක් සහ විදේශීය අරමුදල් යටතේ රු.මිලියන 410ක්

වෙන් කර තිබූ අතර 2024 වර්ෂය තුළ, දේශීය අරමුදල්වලින් රු.මිලියන 0. 67ක් සහ විදේශීය අරමුදල්වලින් රු.මිලියන 74.61ක් පමණක් වියදම් කර තිබූ අතර ඒ අනුව ඉතිරිය අයවැය ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 93 ක් සහ සියයට 82 ක් වී තිබුණි.

**e – GP පද්ධතිය සැකසීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය**

විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය සැකසීමේ කොන්ත්‍රාත්තුව රු. මිලියන 71.50 කට පිරිනමා කොන්ත්‍රාත්තුව සඳහා පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුම් ගතවීම 2019 නොවැම්බර් 25 දින සිදු කර තිබුණද වසර 02 ක් ගතවී2021 දෙසැම්බර් 31 වන විටත් කොන්ත්‍රාත්කරු ප්‍රමාණවත් කාර්යසාධනයක් පෙන්වා නොතිබුණි. එසේ තිබියදීත්, මෙම පද්ධතියේ නව අනුවාදයන් නිර්මාණය සඳහා මුල් කොන්ත්‍රාත් වටිනාකමට රු. මිලියන 81.37 ක් ඇතුලත් කර රු. මිලියන 152.87 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමකට මාස 20 ක කාලයක් තුල පද්ධතිය සැකසීම සඳහා උක්ත කොන්ත්‍රාත් සමාගම සමඟ 2023 මාර්තු 22 දින මුල් කොන්ත්‍රාත්තුවට අතිරේකයක් අත්සන් කර තිබුණි.

**මුල් කොන්ත්‍රාත් ගිවිසුමේ හා සංවර්ධන පද්ධතියේ අඩුපාඩු**

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය සහ ලෝක බැංකුව දක්වන ලද නිරීක්ෂණ අනුව මුල් ගිවිසුමේ හා සංවර්ධිත පද්ධතියේ අඩුපාඩු ලෙස මුල් ගිවිසුමට අනුව අවශ්‍යතා ලේඛනගත නොකිරීම, මුල් ගිවිසුමේ පරීක්ෂණ ක්‍රියාවලිය හා මුදා හැරීමේ ක්‍රියාවලිය පැහැදිලිව නිර්වචනය කර නොතිබීම, පද්ධතියේ මුල් අනුවාදය version 3 වෙත සංක්‍රමණය කිරීමට සැලකිය යුතු කාලයක් ගතවීම, ICTA ආයතනයේ ප්‍රතිපෝෂණය අනුව පද්ධතිය මොනොලිතික් ව්‍යුහයෙන් මයික්‍රෝසර්විස් ව්‍යුහයකට මාරුකිරීම, කොන්ත්‍රාත් ආයතනය විසින් යොදාගනු ලබන නිලධාරීන් සඳහා මාසික ගාස්තු පදනම් කරගෙන මිල තීරණය කර තිබීම, ජාත්‍යන්තර උපදේශකයින්ගේ තක්සේරු කිරීමකදී අවශ්‍ය පරිදි පද්ධතිය වැඩි දියුණු කිරීම, මුල් කොන්ත්‍රාත්තුවේ ව්‍යාපෘති විෂය පථය පැහැදිලිව නිර්වචනය කර නොතිබීම, මුල් ගිවිසුමේ එකඟ වූ ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් විශේෂඥයින් යෙදවීමට සිදුවීම ආදී කරුණු හඳුනාගෙන තිබුණි.

**e – GP පද්ධතිය යොදා ගැනීම**

2025 මාර්තු 31 දින වන විටත් මිල සැදැහුම් ක්‍රමය යටතේ පමණක් ප්‍රසම්පාදන කටයුතු සඳහා ලංසු කැඳවීමට පද්ධතිය සංවර්ධනය කර

තිබුණි. 2025 ජුනි 17 විගණිත දින වන විට e-GP පද්ධතිය හරහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම අපේක්ෂිත ආයතන 3000 කින් ආයතන 753 ක් පමණක් මෙම පද්ධතියේ ලියාපදිංචි වී තිබුණු අතර වෙළඳපළ මිල සැදැහුම් ක්‍රමය යටතේ ප්‍රසම්පාදනයට e-GP පද්ධතිය භාවිතා කරන ලද ආයතන තම ආයතනවල සියලු ප්‍රසම්පාදනයන් සඳහා මෙම පද්ධතිය යොදාගෙන නොතිබුණි.

**ඉලක්ක ලඟාකර ගැනීම්**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ උපලේඛනයේ ඇතුළත් Sprint 3 හා Sprint 4 හි NCB/ICB Goods සඳහා පමණක් පද්ධති සංවර්ධක විසින් ඉදිරිපත් කළ System Release විගණිත දින වන 2025 මැයි 31 දින වන විටත් පරීක්ෂණ මට්ටමේ පැවතුණි. 2024 මාර්තු වන විට Sprint 5 සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණද 2025 මැයි 27 දින වන විටත් එම  කටයුතු අවසන් කර නොතිබුණි. Sprint 3, 4 හා 5හි Works Procurement හා Sprint 6, 7 හා 8 2024 දෙසැම්බර් මස වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණ ද 2025 මැයි 31 දින වන විටත් එම කටයුතු ආරම්භ කිරීමවත් සිදු කර නොතිබුණි.

## බැංකු අංශයේ ව්‍යාපෘති

### වගු අංකය 2.48 - රාජ්‍ය බැංකු අංශයේ ක්‍රියාත්මක ව්‍යාපෘති

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනය | ව්‍යාපෘතියේ නම | | ණය/ආධාර මුදල | | ව්‍යාපෘති කාලය | | 2024.12.31 දිනට උපයෝජනය | | 2024.12.31 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | එ.ජ.ඩො.මිලියන | රු. මිලියන | ආරම්භක දිනය/ වර්ෂය | ව්‍යාපෘති කාලය | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | මූල්‍ය ප්‍රගතිය % |
| මහජන බැංකුව | SMELoC I ව්‍යාපෘතිය | 3370 (ණය ගිවිසුම් අංකය) | 8.33 | 1,280.33 | 2016.02.23 | 2017-2018 | 8.33 | 1,280.33 | 100 |
| | | 3640 (ණය ගිවිසුම් අංකය) | 4.03 | 734.50 | 2018.02.16 | 2019-2020 | 4.03 | 734.50 | 100 |
| | | 4007 (ණය ගිවිසුම් අංකය) | 13.58 | 2,866.48 | 2020.11.27 | 2020-2023 | 13.58 | 2,866.48 | 100 |
| | | 4007 අයකර ගැනීම් නැවත ණය ලෙස ලබා දීම | | 1,613.91 | | 2023-2024 | - | 1,438.50 | 89 |
| | SMELoC II ව්‍යාපෘතිය | 4441 (ණය ගිවිසුම් අංකය) | 3.92 (ආසන්න වශයෙන්) | 1,155.27 | 2024.04.05 | 2024-2025 | - | 615.10 | 53 |
| ලංකා බැංකුව | SMELoC I ව්‍යාපෘතිය | 3370 (ණය ගිවිසුම් අංකය) | 8.334 | 1,280.333 | 2016.02.23 | 2017-2018 | 8.334 | 1,280.333 | 100 |
| | | 3640 (ණය ගිවිසුම් අංකය) | 8.716 | 1,504.878 | 2018.02.16 | 2019-2020 | 8.716 | 1,504.878 | 100 |
| | | 4007 (ණය ගිවිසුම් අංකය) | 16.163 | 3,753.18 | 2020.11.27 | 2020-2023 | 16.163 | 3,753.18 | 100 |
| | | 4007 අයකර ගැනීම් නැවත ණය ලෙස ලබා දීම | - | 1,795.041 | - | 2023-2024 | - | 1,671.32 | 93.1 |
| | SMELoC II ව්‍යාපෘතිය | 4441 (ණය ගිවිසුම් අංකය) | 4.107 | 1,219.00 | 2024.04.05 | 2024-2025 | | 966.548 | 79.3 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | SMELoC I ව්‍යාපෘතිය | 3370 (ණය ගිවිසුම් අංකය) | 8.334 | 1,280.333 | 2017.04.01 | 2017-2018 | 8.334 | 1,280.333 | 100 |
| | | 3640 (ණය ගිවිසුම් අංකය) | 8.716 | 1,504.878 | 2019.4.01 | 2019-2020 | 8.716 | 1,504.878 | 100 |
| | | 4007 (ණය ගිවිසුම් අංකය) | 11.688 | 2,554.979 | 2020.11.27 | 2020-2023 | 11.688 | 2,554.979 | 100 |
| | | 4007 අයකර ගැනීම් නැවත ණය ලෙස ලබා දීම | | 1,503.232 | | 2023 - 2024 | 3.735 | 1,503.232 | 100 |
| | SMELoC II ව්‍යාපෘතිය | 4441 (ණය ගිවිසුම් අංකය) | 2 | 1,920.6 | 2024.05.01 | 2024-2025 | 1.784 | 529.5 | 27.5 |
| | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය | | 50 | 11,121.33 | 2019.10.10 | 2019-2031 | 50 | 11,121.33 | 100 |
| ශ්‍රී ලංකා මහ බැංකුව | මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය | | 150 | 47,612 | 2024 | වර්ෂ 04 | 100.02 | 30,015.55 | 66.68 |

**මූලාශ්‍රය - බැංකු ව්‍යාපෘති අංශ මූල්‍ය හා ප්‍රගති වාර්තා**

## ශ්‍රී ලංකා මහ බැංකුව

**මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකා රජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය 2024 ජනවාරි 31 දින, මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් එ.ජ.ඩොලර් මිලියන 150 ක (විශේෂ ගැණුම් හිමිකම් මිලියන 112.8 කි) සහනදායී මුල්‍යකරණයක් සඳහා මූල්‍ය ගිවිසුමකට එළඹුණි. තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳව අවධානය යොමුකරමින් ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලයේ මූල්‍ය හා ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ පරමාර්ථය වේ. යෝජනාක්‍රමය ප්‍රාග්ධනීකරණය, ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයතනික ධාරිතාවය ගොඩනැංවීම, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම යනාදි වශයෙන් ව්‍යාපෘතිය කොටස් තුනකින් සමන්විත වන අතර ඒවා 2024 සිට ඉදිරියට ක්‍රියාත්මක කරනු ලැබිය යුතුව තිබුණි.

## මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය - සංරචක 1

**ව්‍යාපෘති ප්‍රමාදයන්**

කාර්යසාධනය පාදක කරගත් කොන්දේසි (PBCs) 5 - CBSL විසින් සාමාජික ආයතන SLDIS හි ඔවුන්ගේ සාමාජිකත්වය සහ තැන්පතු රක්ෂණ ආවරණය ලබා ගැනීමේ හැකියාව ප්‍රසිද්ධියේ හෙළි කිරීමට (උදා: ඔවුන්ගේ පරිශ්‍රයන්, වෙබ් අඩවි, ATM යන්ත්‍ර, ස්මාර්ට්ෆෝන් යෙදුම් සහ වෙළඳ දැන්වීම්) අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම 2025 අප්‍රේල් මාසයේදී සම්පූර්ණ කළ යුතු වුවද, 2025 ජුනි 30 වන දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.

මාස පහකට වැඩි ප්‍රමාදයක් වාර්තා වී ඇතත්, කාර්ය සාධනය පාදක කරගත් කොන්දේසි (PBCs) 8 - අර්බුදකාරී කාලවලදී විශාල හෝ එකවර ගෙවීම් මෙහෙයුම් සිදු කරන්නේ කෙසේද යන්න පිළිබඳව CBSL විසින් අනුගමනය කරන මහජන සන්නිවේදන උපාය මාර්ගයක් ඇතුළුව හදිසි සැලැස්ම, සකස් කිරීම 2025 ජුනි 30 වන දින පවා ආරම්භ කර නොතිබුණි.

## මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය - සංරචක 2 සහ සංරචක 3

**භාවිතයට නොගත් සම්පත්**

2024 වර්ෂය සඳහා සංරචක 2 සහ 3 සඳහා එ.ජ. ඩොලර් 400,000 ක මුදලක් ලද අතර, එයින් එ.ජ. ඩොලර් 99,403.11 ක් (රු.මිලියන 20.09 ට සමාන) ව්‍යාපෘතියේ රුපියල් මිලියන ගිණුමට මාරු කර ඇත. කෙසේ වෙතත්, සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, උපදේශන ගාස්තුව සහ ප්‍රකාශන වියදම් සඳහා වැය වූයේ රු. මිලියන 4.55 ක් පමණි. සංරචක 2 ට අදාළව සැලසුම් කළ කිසිදු ක්‍රියාකාරකමක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් අතිරික්තව පැවති එ.ජ. ඩොලර් 300,000 ක මුදල ලෝක බැංකුවට ආපසු යවා තිබුණි.

## මහා මාර්ග අංශයේ ව්‍යාපෘති

**වගු අංක 2.49 - මහා මාර්ග අංශයේ ව්‍යාපෘති**

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ණය ආධාර මුදල | | ව්‍යාපෘති කාලය | | 2024/12/31 දිනට උපයෝජනය | | 2024/12/31 දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | ආරම්භක දිනය/ වර්ෂය | ව්‍යාපෘති කාලය | එ.ජ.ඩො මිලියන. | රු. මිලියන | මූල්‍ය ප්‍රගතිය | එ.ජ.ඩො. මිලියන |
| 1 | කොහුවල ගැටඹේ ගුවන් පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය | යූරෝ මි.52 | 10,102 | 2021.08.16 | අවු.05 | යූරෝ මි.13.8 | 3,411.09 | කොහුවල ගුවන් පාලම 92.77 | කොහුවල ගුවන් පාලම 99 |
| | | | | | | | | ගැටඹේ ගුවන් පාලම 13 | ගැටඹේ ගුවන් පාලම 36 |
| 2 | පාලම් 25 නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය | කුවේට් ඩිනාර් මි.10 | 5,500 | 2014 අප්‍රේල් 28 | අවු.09 මාස 08 | කුවේට් ඩිනාර් 6.827 | 4,128.01 | 84.7 | 98 |
| 3. | මහනුවර බහු විධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය | 69.33 | 20,799 | 2021.05.06 | අවු.06 | 11.75 | 3,523.40 | 13.25 | 24.2 |
| 4. | වරාය පිවිසුම් ගුවන් මාර්ග ව්‍යාපෘතිය | 293.48 | 46,319.95 | 2016 පෙබරවාරි | අවු.09 | 211.00 | 60,780.38 | 58.43 | 72.7 |
| 5. | බස්නාහිර පළාත් මාර්ග ව්‍යාපෘතිය | 17.00 | 2,209.84 | 2017.10.05 | අවු.08 | 14.87 | 3,039.01 | 99.95 | 100 |
| 6. | කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීමේ හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | 50.00 | 6.499.57 | 2013.12.11 | අවු.12 | 43.16 | 7,849.3 | 86.52 | 93.09 |
| 7. | A-017 මාර්ග පුනරුත්ථාපනය කිරීමේ හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | 40.00 | 5,497.9 | 2022.10.17 | අවු.03 | 14.26 | 4,207.68 | 75.9 | 81.08 |
| 8. | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 01 කොටස | 989.44 | 134,628 | පැකේජ 1 | 2020. 09.15 | වසර 2 යි මාස 6 යි | 51.57 | 32.3 | 39.77 |
| | | | | පැකේජ 2 | 2020. 09.15 | වසර 4 යි | | 33.98 | 35.57 |

මූලාශ්‍රය - මහාමාර්ග ව්‍යාපෘති අංශ මූල්‍ය හා ප්‍රගති වාර්තා

**කොහුවල ගැටඹේ ගුවන් පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

2021 වර්ෂයේදී කොළඹ නගරයට පිවිසෙන ප්‍රධාන මාර්ගයක් ලෙස කොහුවල හංදියේ ගුවන් පාලමක් සහ මහනුවර නගරයට පිවිසෙන ප්‍රධාන ධමනි මාර්ගය (AB42) ඔස්සේ ගැටඹේ හංදියේ ගුවන් පාලමක් ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා රජය හංගේරියානු ජනරජයෙන් ණය ආධාර මත 2021 අගෝස්තු 16 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ මුල්‍ය වටිනාකම රු. මිලියන 11,156.60 ක් වූ අතර එයින් රු. මිලියන 10,192 ක් විදේශ ණය ප්‍රාග්ධන වේ. විදේශ ණය ආධාර සපයන ආයතනය (Hungarian EXIM bank) විසින් 2022 අප්‍රේල් 14 දින සිට ණය ලබාදීම අත්හිටුවා තිබුණි. ඒ අනුව මුල්‍ය පහසුකම් සපයාගැනීමට අපොහොසත්වීම මත සේවායෝජකයා විසින් කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු රු. මිලියන 2,309.86 ක මුදල ගෙවීමට නොහැකිවීම නිසා කොන්ත්‍රාත්කරු විසින් 2023 මැයි 01 දින සිට කොන්ත්‍රාත්තුව යටතේ කාර්යයන් සිදු කිරීම අත්හිටුවා තිබුණි. 2024 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත්කරු වෙත රු. මිලියන 2,814.96 ක් ගෙවිය යුතුව තිබුණි. මෙම ගෙවිය යුතු ශේෂය ගෙවීම ප්‍රමාදවීම මත රු. මිලියන 311.57 ක මූල්‍ය ගාස්තුවක් ගෙවීමට හා 2,192.24 ක වැඩපූර්ව අත්කාරම් මුදලක් අයකර ගැනීමට පැවතුණි. මේ අනුව සේවායෝජකයා ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සම්පූර්ණ කිරීම සඳහා විකල්ප අරමුදල් මූලශ්‍ර හඳුනාගත යුතු වුවත්, 2025 ජූලි මස අවසන් වන තෙක් විකල්ප අරමුදල් මූලාශ්‍ර හඳුනාගෙන නොතිබුණි.

**පාලම් 25 නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ විදේශ මුදල් ලැබීම**

ගිවිසුම් ගත වටිනාකම කුවේට් ඩිනාර් මිලියන 10ක් වූ අතර රට තුළ ඇති වූ ආර්ථික අර්බුදයත් සමඟ 2022 ජුනි 22 වන දින ණය නියෝජිතායතනය විසින් ණය ගිවිසුම අවලංගු කර ඇති අතර වැඩ නිම නොවූ පැකේජ අංක 03හි පාලම් 5 දේශීය අරමුදල් භාවිතයෙන් වැඩ අවසන් කිරීමට ජාතික මෙහෙයුම් මැදිරිය (NOR) විසින් අනුමැතිය ලබා දී තිබුණි.

**වරාය පිවිසුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය**

වරාය පිවිසුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ සිවිල් වැඩ සඳහා ගිවිසුම්ගත මුලික කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 28,002 සිට රු.මිලියන 68,337 දක්වා රු. මිලියන 40,335 කින් ඉහල ගොස් තිබුණු අතර ඒ සඳහා කොන්ත්‍රාත් ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදය මූලික වශයෙන් බලපා තිබුණි. අමාත්‍ය මණ්ඩලය විසින් පත්කල ප්‍රසම්පාදනය කමිටුවේ නිර්දේශ සහ ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාවයට යටත්ව මේ සඳහා 2024 ඔක්තෝම්බර් 28 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් අනුමැතිය ලබා දී තිබුණි.

**මධ්‍යම අධිවේගී මාර්ගය**

කඩවත සිට දඹුල්ල දක්වා කි.මී. 170 කින් යුත් මධ්‍යම අධිවේගී මාර්ගය 2016 – 2021 කාලසීමාව තුල අදියර හතරක් යටතේ ඉදිකිරීමට සැළසුම් කර තිබුණි. ව්‍යාපෘතියේ දෙවන අදියර වූ කි.මී. 40.91 කින් යුත් මීරිගම සිට කුරුණෑගල කොටස රු. මිලියන 151,510 ක පිරිවැයක් දරා ඉදිකිරීම් කර 2022 ජනවාරි 15 දින මහජනතාව වෙත විවෘත කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ කි.මී. 36.47 ක දිගකින් යුත් කඩවත සිට මීරිගම දක්වා වූ පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු 2024 සැප්තැම්බර් 14 දින නිම කිරීමට නියමිතව තිබුණි. ඒ යටතේ රු.මිලියන 80,257.79 ක් වැය කර සියයට 36.14 ක ඉදිකිරීම් නිම කර තිබුණි. කෙසේ නමුත් මෙම පළමු කොටසේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව තුල කඩවත පිටත වටරවුම් මාර්ගයට සම්බන්ධවන මීටර් 500 ක කොටස (Ch 0 + 000 to Ch 0 + 500) ඇතුලත්ව නොතිබුණි. එම කොටසේ විස්තරාත්මක සැලසුම් 2024 වර්ෂය අවසානය වන විටත් සකස්කර නොතිබුණි.

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රියාත්මක ව්‍යාපෘති

**වගු අංක අධ්‍යාපන අංශයේ ව්‍යාපෘති**

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ණය/ආධාර මුදල | | ව්‍යාපෘති කාලය | | 2024.12.31 දිනට උපයෝජනය | | 2024.12.31 දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | එ.ජ.ඩො මිලියන | රු. මිලියන | ආරම්භක දිනය/ වර්ෂය | ව්‍යාපෘති කාලය | එ.ජ.ඩො මිලියන | රු. මිලියන | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
| **01** | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන (GEMP) | *85 | 15,300 | 2018.07.25 | – 2018 2025 | **17.595 | **4,430 | %70.38 | |
| **02** | ද්විතියික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (SESIP) | 400 | 76,000 | 2020.12.01 | - 2020 2025 | 254.20 | 48,298 | %63.55 | *** 33 DLI’s |
| **03** | තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන )TEDP) | 50 | 7,650 | 2018.07.03 | - 2018 2025 | **** | **** | **** | **** |

මූලාශ්‍රය - අධ්‍යාපන ව්‍යාපෘති අංශයේ මූල්‍ය හා ප්‍රගති වාර්තා 2024

**බහු වාර්ගික හා ත්‍රෛයිභාෂා පාසලක් ඉදිකිරීම**

ඉන්දියානු ජනරජයේ ආධාර යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බහුවාර්ගික හා ත්‍රෛභාෂා අධ්‍යාපනය සහිත නව ජාතික පාසලක් ඉදිකිරීම සඳහා 2016 දෙසැම්බර් 07 වන දින අමාත්‍ය මණ්ඩල තීරණයක් ලැබී තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ ගොඩනැගිලි දෙකක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දින වන විට අදියර 01 ගොඩනැගිල්ල සඳහා රු.මිලියන 227.22(වැට් සහිත) ක මුදලක් වැයකර විෂයපථය සීමාකිරීම් සහිතව ගොඩනැගිල්ලේ වහලය සහ පළමු මහල පමණක් අවසන් කර අදාල කොන්ත්‍රාත්කරු විසින් අමාත්‍යාංශය වෙත භාරදී තිබුණි. අදියර 02 ගොඩනැගිල්ල සඳහා රු. මිලියන 111.43 (වැට් සහිත) මුදලක් වැයකර සියයට 42ක පමණ භෞතික ප්‍රගතියක්ද ලබාගෙන තිබුණි. එසේම ගොඩනැගිලි ඉදිකිරීමට අදාල භූමිය සකස් කිරීමේ වියදම් සඳහා රු.මිලියන 67.92ක්ද ඇතුළුව රු. මිලියන 491.11 ක වියදමක් දරා ත්‍රෛ භාෂා ජාතික පාසලක් ආරම්භ කිරීම සඳහා සැලසුම් කලද ගොඩනැගිලි අපේක්ෂිත මට්ටමින් නිම කිරීමට නොහැකි වීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දක්වා පාසල ආරම්භ කර ගත නොහැකි වී තිබුණි.

**විදේශ ශිෂ්‍යත්ව සම්පූර්ණ නොකිරීම**

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEMP) යටතේ විසර්ජන සබැඳි දර්ශක 08ට අදාලව අධ්‍යාපනඥයින්ට විදේශ ශිෂ්‍යත්ව ලබාදීම යටතේ කථිකාචාර්යවරයකුට 2020 ජූලි 13 සිට 2021 නොවැම්බර් 30 දක්වා නවසීලන්තයේ අධ්‍යාපනපති (Master of Education) උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා පාඨමාලා ගාස්තු වශයෙන් රු. මිලියන 6.07ක් ගෙවා තිබුණද මෙම නිලධාරියා පාඨමාලාව අතරමග නතරකර තිබුණු බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් පාඨමාලා ගාස්තු වශයෙන් ගෙවන ලද මෙම සම්පූර්ණ මුදලම නිශ්කාර්යය වියදමක් වී තිබුණි. පාඨමාලා කාලය අවසන් වී වසර 03කට අධික කාලයක් ගතවී තිබුණද වැයවූ මුදල් අදාල නිලධාරියාගෙන් අයකර ගැනීමට හෝ ආයතන සංග්‍රහයේ XV වැනි පරිශිෂ්ඨය ප්‍රකාරව පාඨමාලා හැරයාමෙන් රජයට වන අලාභය අදාල බැඳුම්කරය අත්සන් කරන නිලධාරියාගෙන් අයකර ගැනීමට හෝ අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

**පසුවිපරම් කිරීමේ අඩුපාඩු**

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ සංරචක I හි විසර්ජන සබැඳි දර්ශක (DLI) 07ට අදාලව පාසල් වැඩිදියුණු කිරීම සඳහා වූ වැඩසටහන (EPSI) යටතේ පාසල්වල ගුණාත්මක සංවර්ධනය උදෙසා 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු.මිලියන 593ක් තෝරාගත් පාසල් වෙත ලබා දී තිබුණි. මෙම ප්‍රදාන, පාසල් මඟින් උපයෝජනය කිරීම සම්බන්ධ මූල්‍ය හා භෞතික ප්‍රගතිය 2025 අප්‍රේල් 30 දින වන විටත් අමාත්‍යාංශය විසින් ලබාගෙන නොතිබුණි. ඒ අනුව අදාල විසර්ජන සබැඳි දර්ශක (DLI) ලඟාකර ගැනීමේ අරමුණින් අමාත්‍යාංශය විසින් ලබාදෙනු ලබන පාසල් ප්‍රදාන සම්බන්ධව පසුවිපරම් කටයුතු සිදුකිරීම ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

**කොන්ත්‍රාත්තු අතරමඟ නතරකිරීම හේතුවෙන් රජයට අලාභ සිදුවීම**

තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන (TEDP) යටතේ ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 2,243.61 ක්වූ තාක්ෂණ විද්‍යාගාර 36ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. මෙම විද්‍යාගාර අතරින් නියැදි විගණන පරීක්ෂාවට භාජනය කරන ලද 2021 වර්ෂයේදී ආරම්භ කර ඇති ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 39 ක්වූ හම්බන්තොට මහානාග ජාතික පාසලේ තාක්ෂණික විද්‍යාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම 2024 පෙබරවාරි 24 දින කොන්ත්‍රාත්කරු විසින් අතරමග නතර කර තිබුණු අතර ගිවිසුමේ 60.1 වගන්තිය අනුව නතරකල අවස්ථාවේ පැවති ඉතිරි වැඩ වල වටිනාකමින් සියයට 25ක් වූ රු. මිලියන 4.47ක් හා වැඩිපුර ගෙවන ලද රු. මිලියන 0.9 ක් අමාත්‍යාංශය විසින් අයකරගත යුතු වුවත් එලෙස අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා රු. මිලියන 5.41 ක අලාභයක් රජයට සිදුවී තිබුණි. එසේම කොන්ත්‍රාත්තුවට අදාල රු. මිලියන 1.95 ක් වටිනාකමැති කාර්යසාධන බැදුම්කරය 2022 අගෝස්තු 30 දින කල් ඉකුත් වී තිබුණු අතර කල්ඉකුත්වීමට ප්‍රථම මුදල්කර ගැනීමට හෝ දින දීර්ඝකර ගැනීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණි.

**විද්‍යාගාර ඉදිකිරීම් වලට අදාල ව්‍යුහාත්මක සැලසුමේ පැවති අඩුපාඩු නිවැරදි නොකිරීම**

තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන යටතේ මහානාග ජාතික පාසලේ හා මීරිගම පල්ලෙවෙල මහා විද්‍යාලයේ ඉදිකරන ලද තාක්ෂණික විද්‍යාගාරවල ඉදිකිරීම් සම්බන්ධයෙන් විගණනය විසින් සිදුකරන ලද

භෞතික පරීක්ෂාවේදී ගොඩනැගිල්ලේ Beam වල ඉරිතැලීම් නිරීක්ෂණය වූ අතර එම විද්‍යාගාරවල ව්‍යුහාත්මක සැලැස්මේ පැවති අඩුපාඩු හේතුවෙන් උක්ත දෝෂයන් ඇතිවී තිබුණ බව පිළිවෙලින් රුහුණු විශ්වවිද්‍යාලයේ හා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විශේෂඥ වාර්තා මඟින්ද පෙන්වාදී තිබුණි. අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද ව්‍යුහාත්මක සැලසුමක් අනුව තාක්ෂණ විද්‍යාගාර 29ක් ඉදිකර තිබුණු නමුත් විශේෂඥ වාර්තාවල සඳහන් දෝෂයන් අනුව මූලික සැලසුම නිවැරදි කල බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර දිවයිනපුරා ඉදිකරන ලද විද්‍යාගාර 29හි තාක්ෂණික දෝෂ නිවැරදි කල බවට හඳුනාගත නොහැකි විය.

# පළාත් සභා

1987 වර්ෂයේදී පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු කරන ලද 154 අ (1) ව්‍යවස්ථාව මගින් බස්නාහිර, මධ්‍යම, දකුණ, වයඹ, උතුරුමැද, ඌව, නැගෙනහිර, උතුර, සබරගමුව යන පළාත් සභා 09 ක් පිහිටුවා ඇත.

පළාත් සභාවක් ආණ්ඩුකාරවරයාගේ පාලනය යටතේ පවතින අතර ප්‍රධාන ලේකම්වරයෙකු පරිපාලන නිලධාරියා ලෙස කටයුතු කරනු ලබයි. ව්‍යවස්ථාදායකයේ ප්‍රධානියා ලෙස ප්‍රධාන අමාත්‍යවරයෙකු කටයුතු කරනු ලබන අතර ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළුව අමාත්‍යවරුන් 05 දෙනෙකුගෙන් පළාත් සභාවක් සමන්විත වේ.

පළාත් සභාවල අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, පළාත් සභා රාජ්‍ය සේවයට අදාළ කාරණා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට අනුෂාංගික කාරණා පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහා 1987 අංක 42 දරන පළාත් සභා පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කර තිබේ. දැනට පවතින පළාත් සභා 09 හි නිල කාලය අවසන්ව ඇති නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(ඉ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව එම සභා විසිර ගියා සේ සලකණු ලැබ ඇත. ඒ අනුව සභාවක් නොමැතිව සබරගමුව, නැගෙනහිර හා උතුරු මැද පළාත් සභාවන් 2017 වර්ෂයේ සිටද, වයඹ, මධ්‍යම හා උතුරු පළාත් සභාවන් 2018 වර්ෂයේ සිටද, බස්නාහිර ඌව හා දකුණ පළාත් සභාවන් 2019 වර්ෂයේ සිටද 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2(1) (අ) වගන්තියේ විධිවිධාන ප්‍රකාර එක් එක් පළාත් සභාවේ ආණ්ඩුකාරවරු විසින් පවත්වාගෙන යමින් පැවතුණි.

## පළාත් සභාවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**මූල්‍ය ප්‍රකාශන විගණනය**

සෑම පළාත් සභාවක් විසින්ම සභාවේ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ මෙහෙයුම් ප්‍රතිඵලය පිළිබිඹු වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව ප්‍රකාරව සහ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය ප්‍රකාරව එම මූල්‍ය ප්‍රකාශන විගණනය විගණකාධිපති විසින් කළ යුතුය.

**ඒකාකාරී ගිණුම් ක්‍රමයක් හඳුන්වා දී නොතිබීම**

ආරම්භයේ සිට මේ දක්වාම පළාත් සභාවල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ඒකාකාරී ගිණුම් ක්‍රමයක් හඳුන්වා දී නොතිබූ අතර 2024 හා 2025 වර්ෂවලදී පළාත් සභා 09 විසින් විවිධ ක්‍රමවේදයන් අනුගමනය කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

එම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එකිනෙකට වෙනස් ආකෘතීන්, නාමයන් හා ප්‍රභවයන් භාවිතා කරමින් වටිනාකම් සටහන් කර තිබුණි. පළාත් සභා අරමුදල් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා විධිමත් ඒකාකාරී මාර්ගෝපදේශයක් හෝ චක්‍රලේඛයක් රජය හෝ පළාත් සභා විසින් නිකුත් කර නොතිබූ අතර ඒවා විශ්ලේෂණය කර සංසන්දනාත්මකව භාවිතා කරමින් තීරණ ගැනීමට නොහැකි තත්ත්වයක් පැවතුණි.

නිශ්චිත මාර්ගෝපදේශයක් නොලැබීම හා පළාත් සභා අමාත්‍යාංශය මගින් ද නියාමනයක් සිදු නොවීම හේතුවෙන් පළාත් සභාවලට තොරතුරු වසං කිරීමේ, අත්හැරීමේ හෝ තීරණ ගන්නන් නොමඟ යන ආකාරයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමේ හැකියාව පවතින බව නිරීක්ෂණය විය.

**පළාත් සභාවල ආදායම් හා වියදම්**

පළාත් සභාවන් උපචිත පදනම, මුදල් පදනම, වැඩිදියුණු කරන ලද මුදල් පදනම යන පදනම් විකල්ප ලෙස භාවිතා කර තිබීම හා ඒකාකාරී ක්‍රමවේද අනුගමනය නොකිරීම යන තත්ත්වයන්ට යටත්ව පළාත් සභාවන්හි ආදායම හා වියදම සැසැඳීම සිදු කරන ලදී.

**වගු අංකය 2.50 - 2024 වර්ෂයේ පළාත් සභාවල ආදායම්,වියදම්, අතිරික්තය / ඌණතාවය පිළිබඳ විස්තර**

| පළාත් සභාව | රැස්කල හා වෙනත් ආදායම් (රු.මිලියන) | ප්‍රතිශතයක් ලෙස % | රජයේ ප්‍රදානවල එකතුව (රු.මිලියන) | මුළු ලැබීම (රු.මිලියන) | මුළු වියදම (රු.මිලියන) | අතිරික්තය (ඌනතාවය) (රු.මිලියන) |
|---|---|---|---|---|---|---|
| බස්නාහිර පළාත් සභාව | 46,442 | 38.5 | 74,292 | 120,734 | 111,792 | 8,943 |
| මධ්‍යම පළාත් සභාව | 7,015 | 11.3 | 55,296 | 62,311 | 61,700 | 611 |
| දකුණු පළාත් සභාව | 9,752 | 13.7 | 59,262 | 69,014 | 64,910 | 4,104 |
| වයඹ පළාත් සභාව | 10,186 | 19.3 | 42,658 | 52,844 | 50,183 | 2,661 |
| උතුරු මැද පළාත් සබාව | 4,143 | 10.8 | 34,295 | 38,439 | 37,607 | 831 |
| ඌව පළාත් සභාව | 3,303 | 19.6 | 38,996 | 42,299 | 44,140 | (1,841) |
| නැගෙනහිර පළාත් සභාව | 3,449 | 6.8 | 47,560 | 51,009 | 47,914 | 3,095 |
| උතුරු පළාත් සභාව | 2,353 | 6.3 | 40,814 | 43,167 | 42,977 | 190 |
| සබරගමුව පළාත් සභාව | 5,314 | 10.7 | 44,192 | 49,506 | 49,549 | (43) |
| එකතුව | **91,957** | | **437,365** | **529,323** | **510,772** | **18,551** |

**මූලාශ්‍රය - 2024 පළාත් සභාවල මූල්‍ය ප්‍රකාශන**

**පළාත් සභා ආදායම්**

පළාත් සභා 09 විසින් 2024 වර්ෂයේදී එකතුව රු.මිලියන 529,323 ක ආදායම් රැස් කර තිබුණි. එම ආදායම බදු , බදු නොවන හා වෙනත් ආදායම් වලින් සමන්විත වී තිබුණි. කෙසේවුවද, රජය විසින් පළාත් සභාවලට ලබා දී තිබූ රජයේ ප්‍රදාන එකතුව රු.මිලියන 437,365 ක් වී තිබුණි. ඒ අනුව පළාත් සභා 09 හි මුළු ආදායමින් සියයට 83 ක් රජයෙන් ලබා දුන් ප්‍රදාන වලින් සමන්විත වී තිබූ බැවින් සියළු පළාත් සභා භාණ්ඩාගාරයෙන් ලබා දෙන ප්‍රදාන මත යැපෙමින් පවතින බව නිරීක්ෂණය වේ.

වගු අංක 2.38 හි දක්වා ඇති ආකාරයට භාණ්ඩාගාර ප්‍රතිපාදන මත යැපෙමින් පළාත් සභා පවත්වාගෙන යන නමුදු පිළිගත් පොදු චක්‍රලේඛවලට පටහැනිව පළාත් සභාවල ආණ්ඩුකාරවරුන්ගේ අනුමැතිය මත නිලධාරීන්ගේ ඉන්ධන දීමනා වැඩිකර ගැනීම්, අනෙකුත් ආකාරයේ සාධාරණ නොවන දීමනා ලබා ගැනීම් හා

ආයතන සංග්‍රහයට පටහැනිව නිවාස කුලී දීමනා වලින් ලබා ගැනීම මගින් පළාත් සභාවල අරපිරිමැස්මකින් තොරව වියදම් සිදු කර තිබූ බව නිරීක්ෂණය විය.

**පළාත් සභා වියදම්**

සෑම පළාත් සභාවක් විසින්ම පෞද්ගලික පාරිශ්‍රමික, අනෙකුත් භාණ්ඩ හා සේවා නඩත්තු වියදම් ඇතුළත්ව පුනරාවර්ථන වියදම්ද, ප්‍රාග්ධන ස්වරූපයේ සංවර්ධන වියදම්ද වාර්ෂිකව දරනු ලබයි. 2024 වර්ෂයේදී පළාත් සභා 09 විසින් එකතුව රු. මිලියන 510,772 ක් වියදම් කර තිබුණි. එම වියදමින් සියයට 96 ක් පුනරාවර්තන වියදම් වූ අතර සියයට 4 ක් ප්‍රාග්ධන වියදම් ලෙස වැය කර තිබුණි. එසේම මුළු පුනරාවර්තන වියදම්වලින් සියයට 77 ක් පළාත් සභාවල පෞද්ගලික පඩි නඩි ගෙවීමට වැය කර තිබුණි.

**ඉතිරි කිරීම් හා ආයෝජන**

පළාත් සභා විසින් රජයෙන් ලැබෙන ප්‍රදාන ඌන උපයෝජනය කර හෝ පළාත් සභා ආදායම නිසි ලෙස ඇස්තමේන්තු කිරීමකින් තොරව මධ්‍යම රජයෙන් අධි ප්‍රතිපාදනයන් ලබා ගැනීම හේතුවෙන් වසර අවසානයේදී ඉතිරිවන ප්‍රතිපාදන, ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම වාර්ෂිකව ක්‍රමක්‍රමයෙන් වැඩි වී තිබුණි. ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇති මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

වගු අංක **2.51-** පළාත් සභාවල මුදල් හා බැංකු ශේෂය, ඉතිරිකිරීම් හා ආයෝජන පිළිබඳ

| 2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා බැංකු ශේෂය (රු.මි) | පළාත් සභාව | දෙසැම්බර් 31 දිනට ආයෝජන ශේෂය (රු.මි) 2024 | 2023 |
|---|---|---|---|
| **8,576** | බස්නාහිර පළාත් සභාව | 40,000 | 35,000 |
| **11,519** | දකුණු පළාත් සභාව | 53 | 2,505 |
| **2,506** | වයඹ පළාත් සභාව | 11,679 | 11,679 |
| **2,730** | සබරගමුව පළාත් සභාව | 4,769 | 3,967 |
| **2,227** | ඌව පළාත් සභාව | 428 | 372 |
| **1,224** | මධ්‍යම පළාත් සභාව | 26 | 274 |
| **1,712** | උතුරු මැද පළාත් සභාව | 4,487 | 1983 |
| **2,282** | නැගෙනහිර පළාත් සභාව | 470 | 434 |
| **3,857** | උතුරු පළාත් සභාව | - | - |
| **36,633** | **එකතුව** | **61,912** | **56,214** |

**මූලාශ්‍ර; 2024 පළාත් සභාවල මූල්‍ය ප්‍රකාශන**

ඉහත දක්වා ඇති පරිදි 2023 වර්ෂයේදී රු. මිලියන 56,214 ක් වූ ආයෝජන හා ඉතිරි කිරීමේ ගිණුම්වල එකතුව 2024 වර්ෂයේදී රු.මිලියන 61,912 ක් දක්වා වැඩි වීමෙන් සියයට 10 කට ආසන්න

ප්‍රමාණයකින් ආයෝජන හා ඉතිරි කිරීම් වැඩි වී තිබුණි. කෙසේ වුවද, ඒකාකාරී ගිණුම් ක්‍රමවේදයක් නොතිබූ බැවින් උතුරු පළාත් සභාවේ 2023 හා 2024 වර්ෂවල ආයෝජන පිළිබඳ තොරතුරු විගණන වෙත ලබා ගැනීමට නොහැකි විය.

**පළාත් සභාවල මුදල් හා බැංකු ශේෂ**

සෑම පළාත් සභාවකම වර්ෂ අවසානයේදී සැලකිය යුතු තරම් මුදල් ශේෂ පවතින බව අනාවරණය වී තිබුණි. එම මුදල් ශේෂ භාණ්ඩාගාරය වෙත ආපසු යැවීමක් සිදු නොවේ.

ඉහත වගු අංක 2.51හි දක්වා ඇති පරිදි 2024 දෙසැම්බර් 31 දින වන විට පළාත් සභා 09 හි රු.මිලියන 36,633 ක මුදල් හා බැංකු ශේෂයන් පැවති බව තහවුරු විය. මේ අනුව පළාත් සභාවලට ප්‍රතිපාදන ලබා දීමේ දී මහා භාණ්ඩාගාරය, මුදල් කොමිසම, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය වැනි ආයතන විසින් පළාත් සභා සතු ආයෝජන හා ඉතිරි කිරීම් ප්‍රමාණය පිළිබඳව කිසිදු අවධානයක් යොමු කිරීමෙන් තොරව ප්‍රතිපාදන ලබා දීම සිදු වන බව නිරීක්ෂණය විය.

**පළාත් සභාවල වත්කම්**

2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 517,046 ක් ලෙස හඳුනාගෙන තිබූ පළාත් සභාවල මුළු වත්කම් ප්‍රමාණය 2024 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 639,548 ක් ලෙස රු.මිලියන 122,502 ක් හෙවත් සියයට 24 කින් වර්ධනය වී තිබුණි. එසේම 2024 වර්ෂයේදී පළාත් සභාවල මුළු වත්කම්වලින් රු.මිලියන 639,548 කින් සියයට 95 ක් මූල්‍ය නොවන වත්කම් වී තිබුණි. තවද, බස්නාහිර පළාත් සභාව ඇතුළුව බොහෝ පළාත් සභා විසින් ඉඩම් හා ගොඩනැගිලි ඇතුළු වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමටත් කාලීනව ප්‍රත්‍යාගණනය කිරීමටත් පරිහරණය කරන ලද වත්කම් නිසි ලෙස පවරා ගෙන ගිණුම්ගත කිරීමටත් කාලීනව කටයුතු කර නොතිබුණු බවද නිරීක්ෂණය විය.

**වගු අංක 2.52 - 2023 හා 2024 වර්ෂවල පළාත් සභාවල වත්කම් පිළිබඳ විස්තර**

| පළාත් සභාව | 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂය (රු.මිලියන) | 2024 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම් ශේෂය (රු. මිලියන) | 2023 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම් ශේෂය (රු.මිලියන) |
|---|---|---|---|
| බස්නාහිර පළාත් සභාව | 64,795 | 121,551 | 98,356 |
| මධ්‍යම පළාත් සභාව | 17,389 | 20,283 | 13,756 |
| දකුණ පළාත් සභාව | 56,906 | 69,931 | 60,745 |
| වයඹ පළාත් සභාව | 114,158 | 117,749 | 106,380 |
| උතුරු මැද පළාත් සභාව | 30,203 | 38,269 | 35,864 |
| ඌව පළාත් සභාව | 80,312 | 84,025 | 85,386 |
| නැගෙනහිර පළාත් සභාව | 15,906 | 23,023 | 19,881 |
| උතුර පළාත් සභාව | 72,647 | 77,805 | 57,686 |
| සබරගමුව පළාත් සභාව | 75,912 | 86,912 | 38,992 |
| එකතුව | 608,025 | 639,548 | 517,046 |

මූලාශ්‍ර: 2024 පළාත් සභාවල මූල්‍ය ප්‍රකාශන

**පළාත් සභා වගකීම්**

2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 11,257 ක් වූ පළාත් සභාවල මුළු වගකීම් 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 16,083 ක් දක්වා වැඩි වී තිබුණි.. එක් එක් පළාත් සභාවේ වගකීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

වගු අංක 2.53 - පළාත් සභාවල වගකීම්

| පළාත් සභාව | 2024 දෙසැම්බර් 31 දිනට මුළු වගකීම් ශේෂය (රු.මිලියන) | 2023 දෙසැම්බර් 31 දිනට මුළු වගකීම් ශේෂය (රු. මිලියන) |
|---|---|---|
| බස්නාහිර පළාත් සභාව | 1,708 | 645 |
| මධ්‍යම පළාත් සභාව | 594 | 679 |
| දකුණ පළාත් සභාව | 2,893 | 2,212 |
| වයඹ පළාත් සභාව | 1,641 | 984 |
| උතුරු මැද පළාත් සභාව | 1,998 | 1,118 |
| ඌව පළාත් සභාව | 1,094 | 867 |
| නැගෙනහිර පළාත් සභාව | 603 | 552 |
| උතුර පළාත් සභාව | 3,649 | 3,179 |
| සබරගමුව පළාත් සභාව | 1,903 | 1,021 |
| **එකතුව** | **16,083** | **11,257** |

මූලාශ්‍ර - 2024 පළාත් සභාවල මූල්‍ය ප්‍රකාශන

## බස්නාහිර පළාත් සභාව

**හිමිකම් නොමැති නිල නිවාස**

**දීමනා ගෙවීම.**

රජයේ නිලධාරීන්ට මාසිකව නිවාස දීමනාවක් ගෙවීමට කිසිදු හැකියාවක් නොමැති වුවද නිල නිවාස ඉදිකරන තෙක් තාවකාලික ගෙවීමක් ලෙස හිටපු ප්‍රධාන ලේකම් වෙත රු. 50,000 බැගින් සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් හා අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත රු. 30,000 බැගින් වන පරිදි 2011 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා නිලධාරීන් 25 දෙනෙකු වෙත රු.මිලියන 26.37 ක් නිල නිවාස දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.

**ජ්ත්තු කාල ජල උද්‍යාන ව්‍යාපෘතියේ ඉදිකිරීම්**

ජ්ත්තු කාල ජල උද්‍යාන ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා රු.මිලියන 185.55 ක් වැයකර ඉදිකිරීම් කටයුතු අවසන් කර සංචාරක මණ්ඩලයට භාරදී විගණිත දින වන විට වසර 09 කට අධික කාලයක් ගත වී තිබුණද, සංචාරක ආකර්ශණය දිනා ගැනීම තුළින් ආදායම් ලබා ගැනීමට හැකි ආකාරයෙන් යොදා ගැනීමට පියවර ගෙන නොතිබුණි. 2022 මැයි 09 දින රට තුළ ඇති වූ කලබලකාරී තත්ත්වය

හේතුකොට ගෙන කිසියම් පිරිසක් විසින් මණ්ඩලයට අයත් ඒත්තුකාල ජල උද්‍යානයේ දේපළවලට සිදු වූ හානිය රු.මිලියන 3.48 බවට ඇස්තමේන්තු කර තිබූ අතර මෙම අලාභහානි සිදු කර විගණිත දින වන විට වසර 03 කට ආසන්න කාලයක් ගත වී තිබුණද, දේපළවලට සිදු වූ හානිය සම්බන්ධව අවශ්‍ය කිසිදු පියවරක් මණ්ඩලය විසින් ගෙන නොතිබුණි.

බස්නාහිර පළාත් තුළ සංචාරක ආකර්ශනයට ප්‍රමුඛතාවය යොමු කරමින් ඒ හරහා ආදායම් ගලා එන සුවිශේෂී ස්ථාන හඳුනාගෙන ඒ සඳහා ප්‍රතිපාදන අනුමත කිරීමට කටයුතු කිරීමකින් තොරව පිලිකුත්තුව තිරසර සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතිය සඳහා 2021 හා 2023 වර්ෂ වලදී රු.මිලියන 14.00 ප්‍රතිපාදන අනුමත කරගැනීමට සංචාරක මණ්ඩලය කටයුතු කර තිබුණි. ඒ අනුව පිලිකුත්තුව රජමහ විහාරය අසල කුඩා වෙළඳසැල් දෙකක් ඉදිකිරීමට රු.මිලියන 3.77 ක් ද විහාරය අසල 2023 වර්ෂය අවසන් වන විට රු. මිලියන 10.50 ක් වැය කර පොදු පහසුකම්ද සංවර්ධනය කර තිබුණි. මෙම ව්‍යාපෘති සඳහා පළාත් පාලන අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන ලබා දීම සිදුකර තිබුණද කිසිදු අධීක්ෂණයක් හෝ පසුවිපරමක් සිදු කර නොතිබූ අතර සංචාරක ප්‍රවර්ධනය සඳහා සෘජු දායකත්වයක් ලැබී නොතිබුණි.

**ටෙන්ඩර් කැඳවීම් නොකර මාර්ග බලපත් ලබාදීම**

2016 – 2024 කාල පරිච්ඡේදය තුළ බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මඟින් බස්නාහිර පළාතේ සාමාන්‍ය බස් මාර්ගවල ධාවනය කිරීම සඳහා කලින් කල ලබාදී තිබූ බස් රථ සඳහා මාර්ග බලපත්‍ර වෙනුවට ටෙන්ඩර් කැඳවීමක් සිදු නොකර අධිවේගී මාර්ගයේ ධාවනය කිරීම සඳහා මාර්ග බලපත්‍ර ලබාදී තිබුණි. විගණන නියැදි පරීක්ෂණයේදී බලපත්‍ර 10 ක් එලෙස ලබා දී තිබූ බව තහවුරු විය.

**හිඟ බලපත්‍ර ගාස්තු අය නොකිරීම**

2014 සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදයට අයත් බලපත්‍ර ගාස්තුව සම්පූර්ණයෙන් ගෙවා නොතිබූ බස්රථ හිමියන් 253 ක ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට මගී සේවා අවසරපත්‍රය ටෙන්ඩර් කිරීමෙන් ලැබිය යුතු ආදායම රු. මිලියන 43.79 ක් මී තිබුණි. ඉහත ලැබිය යුතු ශේෂයෙන් බස් රථ හිමියන් 105 දෙනෙකුගෙන් 2014 සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව රු. මිලියන 23.39 ක් අය නොවී පවතින අතර, මෙම මුදල් 2024 වර්ෂයේදී ද අයකර ගැනීමට

හෝ බලපත්‍ර ලාභීන්ගේ බලපත්‍ර අවලංගු කිරීමට කටයුතු කර නොතිබුණි.

**ධාවනයෙන් ඉවත් වූ බස් රථ නැවත ධාවනය**

මගී සේවා බස් රථ ධාවනය නවතා මාස 06 කට වඩා ධාවනයෙන් ඉවත් වූ බස් රථවල මාර්ග බලපත්‍රය අවලංගුවන අතර, එම බස් රථ නැවත ධාවනයට එක් කිරීමේදී මගී සේවා බලපත්‍රය යාවත්කාලීන කිරීමේදී බලපත්‍රකරු පැරණි බස් රථයම ධාවනයට යොදවන්නේ නම් රු.30,000 ක ගාස්තුවක් ද නව බස් රථයක් යොදවන්නේ නම් රු.60,000 ක ගාස්තුවක්ද අධිකාරියට අයවිය යුතු වුවත්, 2018-2024 කාලය තුළ එම ගාස්තු අයකර ගැනීමෙන් තොරව බස් රථ 182 ක් ධාවනයට එක් කිරීමට අධිකාරිය විසින් අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව 2024 දෙසැම්බර් 31 දක්වා දිනට බස් රථ හිමියන් 182 ක ගෙන් අයවිය යුතු හිඟ ආදායම රු. මිලියන 3.94 ක් වී තිබුණි.

**නියමිත බලපත්‍ර පැවරීමේ ගාස්තු අය නොකිරීම**

බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ධාවනය සඳහා නිකුත් කර ඇති මාර්ග බලපත්‍රවල අයිතිය බලපත්‍රලාභීන් විසින් වෙනත් පාර්ශවයකට පැවරීමේදී රු.100,000 ක ගාස්තුවක් අධිකාරිය විසින් අයකරනු ලැබේ. එලෙස 2018 සිට 2024 දෙසැම්බර් 31 කාලපරිච්ඡේදය තුළ බලපත්‍ර 102 ක අයිතිය වෙනත් පාර්ශවයකට පවරා ඇතත්, එලෙස අයවිය යුතු ගාස්තුව රු. මිලියන 5.37 ක් අයකර ගැනීමකින් තොරව බලපත්‍ර අයිතිය සංශෝධනය කිරීමට අධිකාරිය කටයුතු කර තිබුණි.

**අරමුණු ගත පරිදි මෘදුකාංග සංවර්ධනය නොකිරීම.**

2017 ඔක්තෝබර් 06 දිනැති 2017 අංක 01 දරන බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් අධිකාරී ප්‍රඥප්තිය අනුව පළාත් සභාවේ සේවා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට මෘදුකාංග පද්ධති ස්ථාපනය ප්‍රධාන අරමුණක් ලෙස හඳුනාගෙන තිබුණද මෘදුකාංග විසඳුම් ස්ථාපනය වෙනුවෙන් ක්‍රියාකාරකම් හඳුනාගැනීම හෝ ප්‍රමාණවත් ප්‍රතිපාදන ඇති කිරීම සිදු කර නොතිබුණි.

**අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය ආරම්භ නොකිරීම.**

අධිකාරිය විසින් දහනය කල හැකි අපද්‍රව්‍ය කළමණාකරණය කිරීම සඳහා කෙරවලපිටිය බලාගාරය වෙත කසළ ප්‍රවාහනය කරන අතර 2023 හා 2024 වර්ෂ තුල ඒ සඳහා වැය කරන ලද වියදම පිළිවෙලින්

රු. මිලියන 73.97 ක් හා රු. මිලියන 42.36 ක් වී තිබුණි. නමුත් එම අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම, ජීව වායු නිෂ්පාදනය, විදුලි උත්පාදනය ආදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටද මේ දක්වා අධිකාරිය අපොහොසත්ව තිබුණි.

**තොග ඌනතා සම්බන්ධ කටයුතු නොකිරීම.**

ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය යටතේ ක්‍රියාත්මක වන වෙස්ප්‍රෝ මුද්‍රණාලයේ 2023 අගෝස්තු 08 දිනට පැවති භෞතික තොගය, ආයතනය විසින් නඩත්තු කර තිබූ ගබඩා ලෙජරය, කාර්ය පත්‍රිකා සාරාංශය මිලදී ගැණුම් සාරාංශය පදනම් කරගෙන මුද්‍රණ ද්‍රව්‍ය 38 ක් සම්බන්ධයෙන් විගණනය විසින් සිදුකරන ලද පරික්ෂාවේදී රු. මිලියන 41.50 ක් වටිනා තොග ඌනතාවයක් නිරීක්ෂණය විය. වෙස්ප්‍රෝ මුද්‍රණාලයේ 2022 හා 2023 වර්ෂවල පමණක් සිදු වී තිබූ ඌණතාවයේ සමස්ථ වටිනාකම ලෙස රු. මිලියන 69.10 ක් බව ඒ වෙනුවෙන් පත්කල කමිටු විශේෂ වාර්තාවක් මඟින් තහවුරු වී තිබුණද 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල තොග ඌණතාවය රු. මිලියන 30.85 ලෙස දක්වා තිබුණි. නමුත් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල තොග ඌනතාවය රු. මිලියන 42.69 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව සත්‍ය වශයෙන්ම සිදු වූ ඌනතාවයේ වටිනාකම හා එම වංචාව සම්බන්ධ පුද්ගලයින් හඳුනාගෙන නීත්‍යානුකූලව කටයුතු කිරීමට විගණනය දිනය වූ 2025 මැයි 16 දක්වාම නොහැකි වී තිබුණි.

**මිහිලක් කෘෂි නිෂ්පාදන සැකසීමේ ව්‍යාපෘතිය හා ටින් මාළු සැකසීමේ ව්‍යාපෘතිය**

පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කල මිහිලක් කෘෂි නිෂ්පාදන සැකසීමේ ව්‍යාපෘතිය හා ටින් මාළු සැකසීමේ ව්‍යාපෘතිය වඩා ලාභදායී ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යාම සඳහා 2022 සැප්තැම්බර් මස කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත රු.මිලියන 49.75 ක් වූ යන්ත්‍ර සූත්‍ර හා රු. මිලියන 8.78 ක් වූ අමුද්‍රව්‍ය හා නිමි තොගද සමඟ පවරා තිබුණි. 2024 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතිය සඳහා දරා ඇති මුළු වියදම රු. මිලියන 417.11 ක් විය. එසේ වුවද ව්‍යාපෘතියේ නිෂ්පාදන පිරිවැය අධික වීම, වෙළඳපල පුරෝකථනයක් අලෙවි සැලැස්මක් නොමැතිව නිෂ්පාදන කිරීම, නිෂ්පාදන අලෙවි කර ගැනීමට නොහැකි විශාල වශයෙන් නිෂ්පාදන කල් ඉකුත්වීම, පිරිවැයට වඩා අඩුමිලට භාණ්ඩ තොග විකිණිම, නිෂ්පාදන විකුණුම් ණය අයනොවී පැවැතිම හේතුවෙන් 2024 වර්ෂය වන විට ව්‍යාපෘතිය

ඌව පළාත

රු. මිලියන 51.09 ක අලාභයක් වාර්තා කරමින් අලාභදායී තත්වයට පත්වී තිබුණි

**රෙජී රණතුංග ආදර්ශ ප්‍රාථමික විදුහලේ පිහිනුම් තටාකය ඉදිකිරීම**

බස්නාහිර පළාත් අධ්‍යාපන ක්‍රීඩා අමාත්‍යාංශ ප්‍රතිපාදන මත මිනුවන්ගොඩ රෙජී රණතුංග ආදර්ශ ප්‍රාථමික විදුහලේ පිහිනුම් තටාකය ඉදිකිරීමේ කාර්යය බස්නාහිර පළාත් පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට ගිවිසුමකින් තොරව පවරා 2012 අගෝස්තු 24 දින ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කර තිබුණි. නියමිත සැලැස්මකට හා නිසි ප්‍රමිතියකට අනුව ටයිල් ඇල්ලීම සිදු නොකිරීම,ආදී හේතු නිසා තටාකය ඉදිකර තිබුණද එය ක්‍රියාකාරී තත්වයට පත් කිරීමට බස්නාහිර පළාත් ක්‍රීඩා හා අධ්‍යාපන අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි.

**ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානය ඉදි කිරීම**

මීගොඩ ආයුර්වේද රෝහලේ ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානය ඉදි කිරීම - අදියර II ව්‍යාපෘතිය යටතේ පළාත් ආණ්ඩුකාරවරයා ලබාදුන් උපදෙස් අනුව බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ රු. මිලියන 111.20 ක ඇස්තමේන්තුව මත 2022 නොවැම්බර් 21 අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් ප්‍රකාරව වසරක් තුල ව්‍යාපෘතිය නිම කිරිමේ එකගතාවය මත ලබා දී තිබුණද 2024 වර්ෂය අවසානය වන විටත් ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි.

**ලෙනගල කනිෂ්ඨ විද්‍යාලයේ තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම**

ලෙනගල කනිෂ්ඨ විද්‍යාලයේ අඩි 70× 25 ප්‍රමාණයේ තෙමහල් ගොඩනැගිල්ල ඉදි කිරීම - I වන අදියර යටතේ තාක්ෂණික ශක්‍යතාවය අධ්‍යයනයකින් තොරව නුසුදුසු ස්ථානයක ගොඩනැගිල්ල ඉදිකිරීමට කටයුතු කිරීම හේතුවෙන් ව්‍යුහාත්මක සැලසුම් අනුව සිදු කළ යුතු අමතර වැඩ කොටස් වෙනුවෙන් රු මිලියන 2.24 ක අමතර පිරිවැයක් දැරීමට සිදුව තිබුණු අතර 2021 වර්ෂයේ නිම කරන ලද පළමු මහලේ ස්ලැබ් කොටස වර්ෂ 02 කට ආසන්න කාලයක් වැසි ජලයට නිරාවරණය වී පැවතුණි. මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ආරම්භ කර වර්ෂ 06 ක් ගත වී තිබුණද ගොඩනැගිල්ලේ ඉදිකිරීම එක් මහලකට පමණක් සීමා වී තිබුණි.

**ධර්මසේන ආටිගල බාලිකා විද්‍යාලයේ තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම**

බප/පිළි/ධර්මසේන ආටිගල බාලිකා විද්‍යාලයේ තනි මහල් ගොඩනැගිල්ල (110*20) තෙමහල් ගොඩනැගිල්ලක් ( 90*25) දක්වා වැඩිදියුණු කිරීමේ වැඩසටහන සඳහා පළාත් සවර්ධන ප්‍රදාන යටතේ රු. මිලියන 17.50 ක මුදලක් අනුමත වී තිබූ අතර, ඒ සඳහා සුදුසු ප්‍රජා පාදක සංවිධානයක් සමග ගිවිසුම් අත්සන් කිරීමට 2024 ජුලි 31 දක්වා මාස 04 කින් ප්‍රමාද වී තිබුණි. 2024 අගෝස්තු 05 දින රු. මිලියන 3.95 ක අත්තිකාරම් ගෙවීම් කර තිබුණද 2024 ඔක්තෝබර් 04 දින දක්වාත් ප්‍රමාණ බිල් පත්‍රයේ මූලික කාර්යයන් පමණක් සිදු කර තිබූ මෙම ගොඩනැගිල්ලේ සියළු ඉදිකිරීම් හා නිම කිරීම් කටයුතු වර්ෂ අවසානයට පෙර නිම කිරීම අවිනිශ්චිත තත්වයක පැවතුණි.

**ඉඩම් පවරා නොගැනීම**

හෝමාගම කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසල් 98 ක් විසින් භුක්ති විදිනු ලබන ඉඩම් හෙක්ටයාර් 136 ක් මැනුම් කටයුතු සිදුකර පවරාගෙන වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. තවද පාසල් 03 ක් හා කලාප අධ්‍යාපන කාර්යාලය විසින් භුක්ති විදිනු ලබන ඉඩම්වලින් විගණනය වෙත ඉදිරිපත් වූ වටිනාකම අනුව රු. මිලියන 219.67 ක් වටිනා රූඩ් 140 ක් පමණ බාහිර පාර්ශව විසින් වර්ෂ ගණනාවක සිට අනවසරයෙන් භුක්ති විඳ තිබුණි.

**පළාත් සභා ගොඩනැගිල්ලේ බිම් මහල උපයෝජනය**

පැරණි බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ බිම් මහලේ වර්ග අඩි 2500 කට ආසන්න ඉඩ ප්‍රමාණයක් වෙස්ප්‍රෝ ආරක්ෂක සේවාවේ නිලධාරීන්ගේ නවාතැන් සඳහා යොදාගෙන තිබූ අතර එම නිලධාරීන් විසින් පරිහරණය කරන ලද විදුලිය, ජලය සහ අනෙකුත් පහසුකම් සඳහා කිසිදු මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. ආරක්ෂක සේවා සපයා ගැනීම වෙනුවෙන් වාර්ෂිකව රු.මිලියන 49 කට අධික මුදලක් වැය කරන අතර, එම ආරක්ෂක සේවාවන්හි නියැලෙන නිලධාරීන්ගේ නවාතැන් පහසුකම් සැලසීමේ වගකීම ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයෙන් ලබා දිය යුතු වුවත්, ඉන් බැහැර වී පළාත් සභා ගොඩනැගිල්ලේම කොටසක් වසර කිහිපයක් තුළ මුදල් ගෙවීමකින් තොරව පරිහරණය කරමින් තිබුණි.

පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා වැටුපට අමතරව ගෙවනු ලබන දීමනා තීරණය කිරීමේදී ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සහ මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ ලබා ගැනීමට කටයුතු කලයුතු වුවද නිත්‍ය රාජකාරි කටයුතු ඉටුකිරීම සඳහා අයවැය අංශයේ නිලධාරීන්ගේ 6 දෙනෙකුට හා ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් (මූල්‍ය), අධ්‍යක්ෂ (අයවැය) ට මූලික වැටුපෙන් 1/3 ක විශේෂ දීමනාවක් ලෙස පසුගිය වසර 5 ක කාලයක් තුළ රු. මිලියන 4.52ක මුදලක් හා පිරිස් හා පුහුණු ඒකකයේ නිලධාරීන් 12 දෙනෙකුට සාමාන්‍ය රාජකාරී සඳහා 2024 වර්ෂයේදී රු. මිලියන 0.40ක මුදලක් අධීක්ෂණ දීමනා හා පරිපාලන දීමනා ලෙසද වාර්ෂික ස්ථානමාරු සමාලෝචන කටයුතු හා අභියාචනා සලකා බැලීමේ කමිටු සඳහා රු. මිලියන 0.44 ක දීමනාවක් ද වැටුපට අමතරව ගෙවා තිබුණි.

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලය යටතේ පවත්නා සෞඛ්‍ය ආයතන 40 ක 2024 වර්ෂයේ අවසාන දිනට රු. මිලියන 8.48 ක් වටිනා කල් ඉකුත් වූ හා රු. මිලියන 53.65 ක් වටිනා තත්වයෙන් අසමත් ඖෂධ තිබූ අතර මෙමගින් රජයට සිදුවි ඇති පාඩුව සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තියට පටහැනි ලෙස බුලත්සිංහල මහජන ක්‍රීඩාංගනයට යාබද අනුබෙදුම් කරන ඉඩම සම්බන්ධව දේපල සමාගමක් විසින් ගොනුකර තිබූ නඩුවේ තීන්දුව පරිදි 2022 දෙසැම්බර් 31 දිනට වන්දි වශයෙන් රු. මිලියන 7.84ක මුදලක් ප්‍රාදේශීය සභාව විසින් දේපල සමාගමට ගෙවා තිබුණි. මෙම ඉඩම අනුබෙදුම සම්බන්ධයෙන් විධිමත් පරිපාටි අනුගමනය නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් කාර්යාලය මගින් විමර්ශන වාර්තා ඉදිරිපත් කිරීම ප්‍රමාද කිරීම මත මෙම නඩුව අවසන් වී වර්ෂ 05 කට අධික කාලයක් ගත වී තිබුණ ද වන්දි ලෙස ගෙවා තිබූ රු. මිලියන 7.84ක මුදල අදාළ නිලධාරීන්ගෙන් අය කර ගැනීමට බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට 2025 මැයි 25 දිනය දක්වාත් නොහැකි වී තිබුණි.

මාසිකව ලීටර් 19 පානීය ජල බෝතල් 100 කට වඩා මිලදී ගන්නා විට රු. 220 ක මුදලකට (ප්‍රවාහනය සමඟ) සපයාගත හැකිව තිබියදී ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව පානීය ජල බෝතලයක්

රු. 384 බැගින්, ආර්ථික ප්‍රවර්ධන කාර්යංශයෙන් සපයා ගැනීමට කටයුතු කර තිබීම හේතුවෙන් එක් ජල බෝතලයක් සඳහා රු. 164 බැගින් 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වැඩිපුර රු.මිලියන 18.15 ක මුදලක් අතර මැදි ආයතනයකට ගෙවා තිබුණි.

**ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොකිරීම.**

2024 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ සේවයේ නියුතු 10,849 ක්වූ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 19,985.50 ක් ගෙවා තිබුණි. කෙසේවුවත් සෞඛ්‍ය සේවාවේ කිසිදු නිලධාරියෙකු ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයෙන් පැමිණීම පිටවීම සටහන් කිරීමක් සිදු නොවන නිසා නිවැරදි පරීක්ෂාවකින් හෝ පාලනයෙන් තොරව උක්ත දීමනා ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

**ගම්පහ සංවර්ධන පෞද්ගලික සමාගමේ ආයෝජන.**

ගම්පහ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් සණස සංගමය ඇතුළු සණස සමිති 24 ක් 1998 සිට 2016 දක්වා කාලය තුල සමූපකාර සංවර්ධන කොමසාරිස්වරයාගේ අනුමැතියක් නොමැතිව ප්‍රඥප්තියට පටහැනිව ප්‍රඥප්තියේ සඳහන් නොවන ගම්පහ සංවර්ධන පෞද්ගලික සමාගමෙහි (GDC) රු.මිලියන 841.06 ක මුදලක් සාමාන්‍ය කොටස් හා වරණීය කොටස්වල ආයෝජනය කර තිබුණි. මෙම ආයෝජිත මුදල් හා ලැබිය යුතු පොළී ආදායම් ලබා දීම ගම්පහ සංවර්ධන පෞද්ගලික සමාගම පැහැර හැර වසර 06 කට අධික කාලයක් ගතවී තිබුණද විධිමත් ක්‍රියාමාර්ග ගෙන ආයෝජිත මුදල් හා පොලි අයකරගෙන නොතිබුණි.

**ගම්පහ සංවර්ධන පෞද්ගලික සමාගමට ණය ලබා දීම.**

සමූපකාර ප්‍රඥප්තියේ 38 (1) වගන්තියට පටහැනිව සමිතියේ සාමාජිකයෙකු නොවන ගම්පහ සංවර්ධන පෞද්ගලික සමාගම වෙත 2011-2019 කාලය තුල සී/ස ගම්පහ දිස්ත්‍රික් සණස සංගමය රු.මිලියන 708.70 ක්ද සී/ස ගම්පහ සණස නගර බැංකුව රු.මිලියන 540.15 ක් ද ලෙස එකතුව රු. මිලියන 1,248.85 ක ණය ලබාදී තිබුණි. ණය ලබාදීමේදී නිත්‍යානුකූල ඇප සුරකුම්පත් ලබාගැනීමකින් තොරව ණය නිකුත් කර තිබූ අතර ණය මුදල් හා පොළි ආදායම් ලබාදීම සමාගම පැහැර හැරීම සම්බන්ධව නිතීමය

පියවරගෙන ණය මුදල් හා පොළි අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

**සණස ආයෝජනවලට ප්‍රතිලාභ නොලැබීම.**

සමූපකාර ප්‍රඥප්තියේ 33(2) (ආ) වගන්තිය ප්‍රකාරව දේපල මිලදී ගැනීමේදී සමූපකාර කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද එසේ පූර්ව අනුමැතියක් රහිතව 2010 -2019 කාලය තුල ගම්පහ දිස්ත්‍රික්කයේ සණස සමිති 06 ක් ගම්පහ සංවර්ධන පෞද්ගලික සමාගමේ (GDC) රු.මිලියන 485.52 ක දේපල ආයෝජන කර තිබුණි. මෙම දේපල ආයෝජන වෙනුවෙන් කිසිදු ආදායමක් සමිති සඳහා ලැබී නොතිබු හෙයින් සමිතිවලට මූල්‍ය හානි සිදුවී තිබු අතර එම දේපල ආයෝජනයන් සම්බන්ධව කිසිදු නිත්‍යානුකූල ලියවිල්ලක් සමිති සතුව නොතිබුණි. මේ සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ග නොගැනීම හා සමූපකාර නියාමනයක් සිදු නොවීම හේතුවෙන් සමූපකාර සමිති උග්‍ර මූල්‍ය අර්බුදයන්ට ලක් වී සණස සමිති අක්‍රිය තත්වයට පත්වී තිබුණි.

**සණස සමිති ව්‍යාපාරය කඩා වැටීම.**

ගම්පහ දිස්ත්‍රික්කය තුල සණස සමිති 36 ක් සමූපකාර ප්‍රඥප්තියට හා රීති මාලාවට පටහැනිව සමූපකාර කොමසාරිස්වරයාගේ අනුමැතියකින් තොරව මුදල් ආයෝජනය කිරීම, ආයෝජිත අරමුදල් හා පොළී සමිති වෙත නොලැබීම, ප්‍රඥප්තියට පටහැනිව ණය ලබා දීම, ණය හා ණය පොළී අය නොවී පැවතීම හා 2018 වර්ෂයේ සිට සමිතිවල ඇතිවූ මූල්‍ය අක්‍රමිකතා, මූල්‍ය වංචා, දූෂණ සම්බන්ධව නිසි ක්‍රියාමාර්ග නොගැනීම හා සමූපකාර සමිති නියාමනයක් සිදු නොවීම හේතුවෙන් මූල්‍ය අර්බුදයන්ට ලක්වී සාමාජික හා සාමාජික නොවන තැන්පත්කරුවන් 79,246 ක ගෙන් බාරගත් රු.මිලියන 14,759.41 ක තැන්පතු මුදල් ආපසු ගෙවීමට නොහැකියාව මත ගම්පහ දිස්ත්‍රික් සණස සමිති ව්‍යාපාරය කඩා වැටී මෙහෙයුම් කටයුතු නවතා දමා අක්‍රීය තත්ත්වයට පත්වී තිබුණි.

**eRL- 02 ක්‍රමය ක්‍රියාත්මක නොකිරීම.**

රථ වාහන ආදායම් බලපත්‍ර නිකුත් කිරීම සඳහා නවීන තාක්ෂණය යොදා ගනිමින් වඩාත් ඵලදායී හා කාර්යක්ෂම සේවාවක් ලබාදීම සඳහා eRL- 02 ව්‍යාපෘතිය ආරම්භකර තිබුණි. මේ සඳහා පළාත් මෝටර් රථ දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) ආයතනය සමඟ

2018 මාර්තු 05 දින රු.මිලියන 137.31 ක මුදලකට අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. ඉතිරි පළාත් 08 තුලම මෙම eRL- 02 ක්‍රමය ක්‍රියාත්මක කර තිබුණද 2024 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 26.02ක් ICTA ආයතනයට ගෙවා තිබුණද 2018 වර්ෂයේ සිට මේ දක්වා බස්නාහිර පළාත තුළ මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

**කේතුමතී කාන්තා රෝහල සඳහා මධ්‍යම වායු සමීකරණ පද්ධතියක් සවි කිරීම.**

කේතුමතී කාන්තා රෝහලේ ශල්‍යාගාරය හා දැඩි සත්කාර ඒකකයන් සඳහා මධ්‍යම වායු සමීකරණ පද්ධතියක් සපයා සවිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් 2018 පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ රු. මිලියන 38.50 ක ප්‍රතිපාදන අනුමත වී තිබුණි. මෙසේ නිසි පරික්ෂාවක් හා ඇගයීමක් සිදු කර නොතිබීම හේතුවෙන් පද්ධතිය නිරන්තර බිඳ වැටීම්වලට ලක්ව තිබූ අතර අළුත්වැඩියා කටයුතු සිදු කර තිබුණද ඒවා තාවකාලික විසඳුම් බවට පත්ව තිබූ අතර 2022 ඔක්තෝබර් 07 දින වරලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ නිර්දේශය අනුව Condencer Unit 04 හිම නිෂ්පාදන දෝෂ පවතින බැවින් ඒවා මාරු කර අලුතින් යෙදිය යුතු බව සඳහන් කර තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ඒ සඳහා කටයුතු නොකිරීම හේතුවෙන් දැනට වර්ෂයක පමණ කාලයක සිට සමස්ත පද්ධතියම අක්‍රිය වී තිබුණු බව 2025 මාර්තු 07 සිදු කරන ලද භෞතික පරීක්ෂණයෙදී නිරීක්ෂණය විය.

**ස්ථානමාරු ක්‍රමවේදය ක්‍රියාත්මක නොකිරීම.**

බස්නාහිර පළාත තුල 2025 අප්‍රේල් 28 දිනට සංවර්ධන නිලධාරි හා කළමණාකරණ සේවා නිලධාරීන් 2,110ක ප්‍රමාණයක් ස්ථාන මාරු නොවී එකම සේවා ස්ථානයේ රැඳී තිබුණි.

## දකුණු පළාත් සභාව

**නිෂ්කාර්ය වත්කම්**

දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් රු.මිලියන 25.46 ක මුදලක් වැයකර 2019 අප්‍රේල් 22 දින වැඩනිම කර තිබූ යශෝරාපුර තොරතුරු මධ්‍යස්ථානය ඉදිකිරීමේදී ප්‍රමිතිගත නොවන අමුද්‍රව්‍ය භාවිතා කර තිබූ නමුත් ප්‍රමිතිගත අමුද්‍රව්‍ය මිල රේටයන්ටම ගෙවීම් කර තිබීම නිසා රු.මිලියන 6.3 ක් වැඩිපුර කොන්ත්‍රාත්කරුට ගෙවා

තිබුණි. තවද එම ඉදිකිරීම නිෂ්කාර්යව පැවතීම නිසා ඒ සඳහා වැය කරන ලද මුලු මුදලම නිෂ්කාර්ය වී ඇති බව නිරීක්ෂණය විය.

**නාගොඩ ප්‍රාදේශීය රෝහලේ ආහාර සැපයීම**

නාගොඩ ප්‍රාදේශීය රෝහලේ කණිෂ්ඨ කාර්ය මණ්ඩලයට හා රෝගීන්ට ආහාර සැපයීමේදී සැපයුම්කරු විසින් සපයනු ලබන අමු ආහාර ද්‍රව්‍ය රෝහලේ මුළුතැන්ගෙයි කටයුතු කරනු ලබන අරක්කැමිගේ නිවසට සපයා තිබුණි. අරක්කැමියා විසින් දෛනිකව අවශ්‍ය කරනු ලබන අමු ආහාර ප්‍රමාණය පමණක් රැගෙනවිත් ආහාර පිළියෙල කරනු ලබන අතර සැපයුම්කරු විසින් සපයනු ලබන අමුද්‍රව්‍ය සහ දෛනික කෑම වට්ටෝරුවට අනුව එම ආහාර රෝගීන්ට හා රෝහල් සේවකයින්ට ලබා දෙනු ලබන බවට ප්‍රමාණවත් අධීක්ෂණයක් සහ එම ආහාරවල තත්ත්ව පරීක්ෂාවක් සිදු නොවන බවත් නිරීක්ෂණය විය.

**නීතානුකූල නොවන පරිපාලන කටයුතු**

මාතර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සේවය කරනු ලබන නිලධාරියෙකු 2023 ජනවාරි 22 දින සිට 2023 පෙබරවාරි 19 දින දක්වා අනුමැතියකින් තොරව විදේශගත වී තිබූ අතර ඒ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය පියවර ගැනීම වෙනුවට එකී නිලධාරියාගේ ඉල්ලීම මත විශ්‍රාම ගැන්වීමට කටයුතු කර තිබුණි. කෙසේ වුවද අදාළ නිලධාරියා 2023 පෙබරවාරි 27 දින නැවත සේවයට වාර්තා කර විශ්‍රාම යැමේ ඉල්ලීම ඉවත් කර ගන්නා බව 2023 අප්‍රේල් 19 දිනැති ලිපිය මඟින් දැනුම් දී තිබූ අතර 2023 පෙබරවාරි 27 දින සිට 2023 ජුනි 30 දක්වා කාලය සඳහා නිලධාරියා වෙත රු.මිලියන 0.1 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. තවද නිවාඩු අනුමත කිරීම සඳහා පත් කර තිබූ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුවද 2023 පෙබරවාරි 01 දින සිට 2023 පෙබරවාරි 27 දින දක්වා මෙම නිලධාරියාට විවේක දින 27 ක් අනුමත කර තිබූ නමුත් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව උක්ත නිලධාරියා 2023 ජනවාරි 22 දින සිට 2023 පෙබරවාරි 19 දින තෙක් විදේශ ගත වී තිබුණු බව නිරීක්ෂණය විය. විදේශ ගත වූ කාලය තුළ ශ්‍රී ලංකාව තුළ රෝහල් ගත වී සිටියා සේ දක්වමින් දෙයියන්දර ප්‍රාදේශීය රෝහලේ ආයතන භාර වෛද්‍ය නිලධාරී විසින් නිකුත් කර තිබූ දින 10 ක් සඳහා වූ වෛද්‍ය වාර්තාවද, නැරවල්පිට ප්‍රාදේශීය රෝහලේ ආයතන භාර වෛද්‍ය නිලධාරී විසින් නිකුත් කර

තිබූ දින 17 ක් සඳහා වූ වෛද්‍ය වාර්තාවද සාවද්‍ය වාර්තා බැවින් වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 31.1.12 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**නිවැරදි නොවන තක්සේරු කිරීම්**

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ගලගොඩ වැඩ අංගනයේ සවිකර තිබූ ඇස්පෝල්ට් යන්ත්‍රය වෙන්දේසි කිරීමේදී තක්සේරු කාර්යය සඳහා පත්කළ කමිටුව මඟින් වත්කම සඳහා ලබා දුන් තක්සේරුව රු.මිලියන 10.4 ක් වූ අතර යන්ත්‍රය වෙන්දේසියේදී රු.මිලියන 21.1 කට අලෙවි වී තිබුණි. මේ අනුව තක්සේරු වටිනාකම නිවැරදි නොවන බවද තක්සේරු කිරීමේදී යන්ත්‍රය තුළ වූ තාර ලීටර් 21,782 ක් හා ඩීසල් ලීටර් 4,028 ක් පිළිබඳව සැලකිල්ලට නොගෙන තක්සේරු කර තිබීමෙන් අධිකාරියට රු.මිලියන 3.27 ක පාඩුවක් සිදුවී තිබුණි.

**කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා වූ අරමුදල**

කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා නම්‍යශීලී අරමුදල මඟින් කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා සියයට 50 ආධාර යටතේ රුපියල් මිලියනයක් වැය කර කොම්පෝස්ට් හලන යන්ත්‍රයක් සහ කැබලි කරන යන්ත්‍රයක් මිලදීගෙන තිබුණි. ප්‍රතිලාභියා සමඟ විධිමත් ආකාරයේ කොන්දේසි ඇතුළත් ගිවිසුමකට එළඹ නොතිබූ අතර මේ වන විට කිසිදු නිෂ්පාදන කටයුත්තක් සිදුනොවන බවත් කොම්පෝස්ට් හලන යන්ත්‍රය හා බහුකාර්ය කැබලි කරන යන්ත්‍රය නිෂ්කාර්යව පැවතීම නිසා ඒ සඳහා ලබාදෙන ලද රුපියල් මිලියනයක මුදල මේ වන විට නිෂ්කාර්ය වියදමක් වී ඇති බවත් නිරීක්ෂණය විය.

**වාහන අවභාවිතාවය**

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2024 ජනවාරි 10 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024හි 4.2ට පටහැනිව 2024 වර්ෂයේදී දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ හිටපු ගණන් දීමේ නිලධාරියා විසින් සති අන්ත දිනවල පෞද්ගලික ගමන් සඳහා සංචිත වාහන රැගෙන ගොස් තිබූ බව නිරීක්ෂණය විය. තවද, ඔහු විසින් ධාවනය කර රියදුරන් ලවා දෛනික ධාවන සටහන්වලට කාර්යාලයේ වැඩබිම් සඳහා ධාවනය කළා සේ සටහන් කොට ඊට ඉංජිනේරු සහකාරවරයෙකුගේ අත්සන් යොදා තිබීමෙන් හා නිල

වාහන හිමිකම් හා ඉන්ධන දීමනාව ලබා ගනිමින් සති අන්ත දිනවල ආයතනයේ සංචිත වාහන භාවිතා කිරීමෙන් යථෝක්ත නිලධාරියා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II කොටසේ 31.1.12 හි සඳහන් විෂමාචාර සිදු කිරීම පිළිබඳව විනය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## මධ්‍යම පළාත් සභාව

**අනුමත ප්‍රඥාප්ති නොමැතිවීම**

මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ අනුමත ප්‍රඥප්තියක් හෝ රීති මාලාවක් නොමැතිව පවත්වාගෙන යන පළාත් සමූපකාර සංවර්ධන අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව ශේෂය රු.මිලියන 20.09 කට සහ එදිනට අරමුදල මගින් සමූපකාර සමිතිවලට ලබා දුන් රු.40.00 ක ණය මුදල්වලට අදාල ගණුදෙණු හා සිද්ධීන් පිළිබඳව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් කර නොතිබුණි.

1987 අංක 42 දරන පළාත් සභා පනත යටතේ පළාත් සභාව තුළ පිහිටුවනු ලබන දෙපාර්තමේන්තු සඳහා ප්‍රඥප්තියක අවශ්‍යතාවය පැවතියද, මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව හා පළාත් සංචාරක දෙපාර්තමේන්තුව සඳහා පනතේ විධිවිධාන ප්‍රකාරව ප්‍රඥප්තියක් අනුමත කර ගෙන නොතිබුණි.

**ගිණුම්ගත නොවූ වත්කම්**

මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාළව උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (SCDP) මගින් රු.මිලියන 24.99ක් වූ GPS යන්ත්‍ර 2366ක් පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය වෙත ලබා දී ඇතත් එම යන්ත්‍ර වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**වියදම සඳහා බිල්පත් නොවීම්**

මධ්‍යම පළාතේ විද්‍යාලයක පාසල් සංවර්ධන සමිතියක ගිණුමෙන් අවස්ථා 13කදී බිල්පත් හෝ ලියවිලි ඉදිරිපත් කර නොමැතිව රු. මිලියන 1.14 ක් ගෙවීම් කර තිබුණු අතර අවස්ථා 07 කදී මිලදී ගන්නා ලද රු. මිලියන 0.47ක් වූ භාණ්ඩ සඳහා ගෙවීම් සනාථ කිරීමට අදාළ සහතික ඉදිරිපත් කර නොතිබුණි.

පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ අරමුණුවලට පටහැනිව සුභසාධන වැඩසටහන් ලෙස රු. මිලියන 3.53ක් වෙන්කර එම මුළු ප්‍රතිපාදනම ප්‍රයෝජනයට ගෙන 2024 සිංහල - හින්දු අළුත් අවුරුද්ද වෙනුවෙන් අධිකාරියේ සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 11කට සහ අධිකාරියේ විධායක මට්ටමේ සියළු නිලධාරීන් ඇතුළු අනෙකුත් නිලධාරීන්/සේවකයින් 241 දෙනෙකුට වියළි ආහාර මල්ලක් ලබා දී තිබුණි. එසේම සභාපති ඇතුළු අධිකාරියේ සමස්ථ කාර්යය මණ්ඩලය 218 ක් වුවත් 241 ක් වෙනුවෙන් මෙම වියලි ආහාර මලු ලබා දී තිබූ බැවින් බඩු මලු 23 ක් ලබාදුන් පාර්ශවයන් කවරේද යන්න විගණනය සඳහා සනාථ කිරීම් ඉදිරිපත් නොකරන ලදි.

**ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා නොකිරීම**

ආණ්ඩුකාරවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 15 දෙනෙකු, 2023 මැයි 15 සිට 2024 මැයි 31 දක්වා දෛනික පැමිණීම හා පිටවීම සටහන් තැබීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කර නොතිබුණ අතර එම නිලධාරීන් 09 දෙනෙකුට රු. මිලියන 1.57 ක අතිකාල දීමනා ගෙවා තිබුණි.

**දායකත්ව මුදල් අය කර නොගැනීම**

2024 වර්ෂය අවසාන දිනට සමුපකාර සංවර්ධන අරමුදලට මහනුවර දිස්ත්‍රික්කයේ සමූපකාර සමිති 229 කින් රු. මිලියන 159.60 ක්ද, නුවරඑළිය දිස්ත්‍රික්කයේ සමුපකාර සමිති 92 කින් රු. මිලියන 48.44 ක්ද, මාතලේ දිස්ත්‍රික්කයේ සමූපකාර සමිති 159 කින් රු. මිලියන 54.44 ක්ද ලෙස එකතුව රු. මිලියන 262.49 ක වටිනාකමක දායකත්වයක් අය නොවී පැවතුණි.

**භාණ්ඩ ලැබීමට පූර්වයෙන් ගෙවීම් කිරීම**

පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ පරිගණක ජාල ගත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2015 හා 2018 වර්ෂයන්හි දී පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුම්ගත වී ඒ සඳහා රු.මිලියන 0.93ක් පළාත් මූල්‍ය රීතිවලට අනුකූල නොවන පරිදි පුද්ගලික සමාගමක් වෙත ගෙවීම් කර ඇතත් 2024 වර්ෂය අවසාන වන විටත් ගිවිසුම් ප්‍රකාරව අදාළ සැපයුම ලබා දී නොතිබුණි.

**කාර්යසාධනය**

මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග කි.මී. 2071ක් පවතින අතර ඉන් 2024 වර්ෂය අවසන් වන විට සියයට 72 ක් මාර්ග කාපට් කර තිබුණු අතර එම ප්‍රමාණය කි.මී.1501 ක් විය. ඒ අනුව තවදුරටත් කාපට් කල යුතු පාරවල් කි.මී.570 (සියයට 28)න් මාර්ග කි.මී.166 ක් ඉතාම අබලන් තත්ත්වයක පවතින අතර, කි.මී.404 නඩත්තු කර ගෙන පවත්වාගෙන යනු ලැබේ. පසුගිය වර්ෂ පහක් (5) තුළ පළාත් මාර්ග අධිකාරියට ලැබුණු ප්‍රතිපාදන සහ දරන ලද වියදම අනුව ප්‍රතිපාදනවලින් සියයට 46 ක ප්‍රතිපාදන එම වර්ෂයන් තුල ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

**වගු අංක 2.54 - 2020 -2024 ප්‍රාග්ධන ආයෝජන ප්‍රතිපාදන හා උපයෝජනය**

| වර්ෂය<br>------- | ලැබුණු මුදල<br>------------- | මූල්‍ය ප්‍රගතිය<br>------------ | ඉතිරි මුදල<br>----------- |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| **2020** | 150.00 | 108.30 | 41.70 |
| **2021** | 548.00 | 377.00 | 171.00 |
| **2022** | 378.00 | 262.40 | 115.60 |
| **2023** | 429.00 | 16.80 | 412.20 |
| **2024** | 619.00 | 388.87 | 230.13 |
| **එකතුව** | 2,124.00 | 1,153.37 | 970.63 |

මූලාශ්‍රය. මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ තොරතුරු

**ABC ඇතිරීම සඳහා වැඩියෙන් ගෙවීම**

තලාතුඔය කන්දකැපුතැන්න මාර්ගයේ හා හාගල ගිරිඇල්ල ගෝමරය මාර්ගයේ ABC ඇතිරීමේදී සමතල මිනුම් ගණනය කිරීමක් සිදු නොකර මිලිමීටර් 150 සාමාන්‍ය ඝනකමක් සහිතව ගෙවීම් කරතිබූ නමුත් ක්ෂේත්‍ර පරීක්ෂණවලදී හෙළිදරව් වූ පරිදි අතුරා තිබූ ඝනකම පිළිවෙලින් මිලිමීටර් 111.3 ක් හා 126.3ක් වීමෙන් රු.මිලියන 1.99ක් කොන්ත්‍රාත්කරුවන්ට වැඩියෙන් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

**ඇස්ෆෝල්ට් ඇතිරීම හා ඇස්ෆෝල්ට් බයින්ඩර් මිලදී ගැනීම වෙනුවෙන් වැඩියෙන් ගෙවීම**

තලාතුඔය කන්දකැපුතැන්න මාර්ගය හා කොලඹිස්ස පට්ටියගම මාර්ගයේ ඇසෆෝල්ට් ඇතිරීමේදී සමතල මිනුම් නොගෙන පිළිවෙලින් මිලිමීටර් 40 හා 50 ඝනකමක් සඳහා ගෙවීම් කරතිබූ නමුත් ක්ෂේත්‍ර පරීක්ෂාවකදී හෙළිදරව් කරගත් පරිදි එම මාර්ගවල අතුරා තිබූ ඇසෆෝල්ට්වල ඝනකම පිළිවෙලින් මිලිමීටර් 33.12ක් හා මිලිමීටර් 42.68ක් වූයෙන් ඇසෆෝල්ට් සඳහා සහ කොලඹිස්ස පට්ටියගම මාර්ගයේ ඇසෆෝල්ට් බයින්ඩර් වෙනුවෙන් රු. මිලියන 6.712ක් වැඩිපුර ගෙවා තිබුණි.

**මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

2024 වර්ෂයේ දී රු.මිලියන 6.15ක් වැය කර සුභසාධන වැඩසටහන් ලෙස මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින්ට 2024 වර්ෂයේ සිංහල - හින්දු අළුත් අවුරුද්ද වෙනුවෙන් එක් බඩු මල්ලක වටිනාකම රු.9,710 ක් වූ වියළි ආහාර බඩුමලු 634 ක් ලබා දීමට කටයුතු සංවිධානය කර තිබුණි. නමුත් අධිකාරියේ සේවකයින් නොවන පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ, ප්‍රධාන ලේකම් කාර්යාලයේ, ආණ්ඩුකාරවරයාගේ කාර්යාලයේ හා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිලධාරින් 17 දෙනෙකු සඳහාද රු.මිලියන 0.16ක් වටිනා බඩුමළු ලබාදීම මතභේදයට තුඩුදෙන කරුණක් වේ. එසේ ම මුළු සේවකයින් 368ක් වුවත් රු. මිලියන 5.99ක් වටිනා ඉතිරි බඩුමළු බෙදාදීම පිළිබද විස්තර විගණනයට ඉදිරිපත් නොකරන ලදි

**නොපියවූ අත්තිකාරම්**

හැටන් සීඩා සම්පත් මධ්‍යස්ථානයේ වසර 06 ක සිට ඉදිරියට එමින් පැවති පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ එකතුව රු. මිලියන 171.98ක් වූ නොපියවූ අත්තිකාරම් ශේෂ 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**අලාභ අය කිරීම සඳහා අධිභාර නිකුත් කිරීම**

මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2024 වර්ෂය අවසාන වන විට සමුපකාර සමිති සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද 46 (1) පරීක්ෂණවලට අදාලව මහනුවර, මාතලේ හා නුවරඑළිය යන දිස්ත්‍රික්කවල සමිති 18 ක් වෙනුවෙන් සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් රු. මිලියන 344.44 ක අධිභාර සහතික නිකුත් කර තිබුණද එම අලාභයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අදාලව හඳුනාගත් අලාභ හානි සම්බන්ධව සිදුකල මු.රෙ.104(4) පරීක්ෂණවල නිර්දේශ අනුව සහ මුදල් රෙගුලාසි 119 (පළාත් මූල්‍ය රීති 68) අනුව අධිභාර කරන ලද අලාභ හානි 07 ක් සම්බන්ධව රු. මිලියන 1.99 ක් 2024 වර්ෂය අවසන් වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**සමුපකාර සමිති ගැටළු**

මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබූ සමුපකාර සමිති අතරින් ප්‍රවර්ථන වර්ෂය අවසාන වන විට ගැටළුකාරී/අවදානම් සහිත ලෙස හඳුනාගෙන ඇති සමුපකාර සමිති 09 ක ගණුදෙනුකරුවන් 43,657 ක් සඳහා රු. මිලියන 1,468.59 ක තැන්පතු ආපසු ගෙවීමට නොහැකි වී තිබූ අතර මෙම තැන්පතු මුදල් ගෙවා නිරවුල් කිරීම සම්බන්ධයෙන් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

**හිඟ ඉඩම් බදු මුදල් අය නොකිරීම**

මධ්‍යම පළත් ඉඩම් දෙපාර්තමේන්තුව විසින් මධ්‍යම පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 38 කට අදාලව 2024 වර්ෂයේ රැස් කළ බදු ආදායම රු. මිලියන 283.66 ක් වන අතර එම වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 31 කට අදාලව රු. මිලියන 122.69 ක හිඟ බදු ආදායමක් අයකර ගත යුතුව පැවතුණි. ඉන් එකතුව රු. මිලියන 115.30 ක හිඟ බදු ආදායමක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 9 ක බදුකරුවන්ගෙන් අයකර ගත යුතුව පැවති අතර එය මුළු හිඟ බදු ආදායමෙන් සියයට 94 ක් විය. 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ ආදායම් කාල විශ්ලේෂණය අනුව මුළු හිඟ බදු ආදායමින් සියයට 45 ක් එනම් රු. මිලියන 54.97 ක් වර්ෂ 3ට වඩා කාලයක සිට හිඟව පැවතුණි.

**අධිභාර අය නොකිරීම**

මධ්‍යම පළාතේ, පලාත් පාලන ආයතනවල අධිභාර සම්බන්ධයෙන් විගණකාධිපතිතුමා විසින් 2013 සිට 2022 කාල පරාසයක් තුළ නිකුත් කර තිබූ අධිභාර සහතික 14 කට අදාලව රු. මිලියන 9.52 ක අධිභාර අයකර ගැනීම සම්බන්ධයෙන් 2024 වර්ෂයේ අවසන් දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**ගොවිපළ සංඛ්‍යාව සහ සත්ත්ව ගහණය අඩු වීම**

2023 දෙසැම්බර් 31 දිනට මහනුවර දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කළ මුළු ගවයින් හා මී ගවයින් සහිත ගොවිපල් සංඛ්‍යාව 24,126 ක් වුවත් ඉන්

සක්‍රීය ගොවිපල් ගණන 6,480 ක් වූයෙන් ගොවිපල් 17,646 ක් හෙවත් සියයට 73ක් අක්‍රීයව පැවතුණි. 2022 වර්ෂයේ එළගව, මීගව, එළු හා බැටළු ගොවිපල සංඛ්‍යාව 24,008 ක් වූ අතර 2023 වර්ෂයේ එය 11,112 ක් වීමෙන් 2023 වර්ෂයේදී එම ගොවිපල සංඛ්‍යාව 12,896 කින් අඩු වී තිබුණි. එමෙන්ම දේශීය කිරි නිෂ්පාදනයට ප්‍රධාන දායකත්වයක් සපයන එළ ගව හා මීගව ගොවිපල සංඛ්‍යාව 2022 වර්ෂයේ දි 11,338 ක් වූ අතර එය 2023 වර්ෂයේ දි 7,239 ක් වූයෙන් එම ගොවිපල සංඛ්‍යාව 4,099 කින් එනම් සියයට 36 කින් අඩු වී තිබුණි

**කල් ඉකුත් වූ ඖෂධ**

මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් දිස්ත්‍රික්ක 03 හි ප්‍රාදේශීය රෝහල් 06 ක හා ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් ඒකකයේ රු.මිලියන 14.55 ක් වටිනා ඖෂධ වර්ග 426 ක ඖෂධ ඒකක 1,265,294 ක් කල් ඉකුත් වී තිබුණි.

**අසමත් ඖෂධ තොග**

මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් දිස්ත්‍රික්ක 02 ක ප්‍රාදේශීය රෝහල් 02 හා ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් ඒකකයේ රු.මිලියන 5.02 ක් වටිනා ඖෂධ වර්ග 66 ක ඖෂධ ඒකක 144,034 ක තත්ත්වයෙන් අසමත් වූ ඖෂධ තොග පැවතුණි.

**දෘශ්‍ය අක්‍රමිකතා**

2019 මැයි 09 දින මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් අදාළ වගකිව යුතු නිලධාරීන් 14 දෙනෙකුගෙන් අයකර ගැනීමට නිර්දේශ කර තිබුණු, මහනුවර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මඟින් සෞඛ්‍ය උපකරණ වල තීන්ත ආලේප කිරිම වෙනුවෙන් සාවද්‍ය ලෙස ගෙවා තිබුණු රු. මිලියන 3.11 ක මුදලෙන් 2024 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 06 දෙනෙකුගෙන් රු.මිලියන 1.43 ක් අයකර ගෙන නොතිබුණි.

2016 සිට 2021 දක්වා කාලසීමාව තුළ මධ්‍යම පළාත් පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින මහනුවර ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධියක්ෂ කාර්යාලයේ වැටුප් සැකසීමේ දී වැටුප් රාජකාරි ඉටු කළ නිලධාරීන් දෙදෙනෙකු විසින් ඔවුන්ගේ හා සමීපතයන්ගේ පෞද්ගලික බැංකු ගිණුම් 14 කට රු. මිලියන 51.96 ක් සහ බැංකු ගිණුම් අංක මඟින් තහවුරු නොවන රු මිලියන.1.08 ක් වශයෙන් එකතුව රු. මිලියන 53.04 ක මුදලක් සාවද්‍ය ලෙස ප්‍රේෂණය

කිරීමෙන් සිදු ව ඇති වැටුප් වංචාව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් පවත්වා අදාළ වගකිවයුතු පාර්ශවයන්ගෙන් වංචා කළ මුදලෙන් රු. මිලියන 50.44ක මුදලක් අය කර ගැනීමට අදාළ බලධාරීන් කටයුතු කර නොතිබුණි. එසේම වැටුප් කට්ටලවලට අදාල ලිපිගොනු හා ලේඛන පරිගණක මෘදුකාංග උපස්ථිත ( Backup ) විධිමත්ව හා සම්පූර්ණව ඉදිරිපත් නොකිරීම හා මුරපද අමතක වීම, තාක්ෂණ දෝෂ පැවතීම හේතුවෙන් පරිගණක 02 ක උපස්ථිත ( Backup ) වලට ප්‍රවේශ වීමට නොහැකි වීම වැනි හේතු මත එම කාල සීමාවට අදාලව වංචා කර ඇති සම්පූර්ණ මුදල නිශ්චිතව හඳුනා ගැනීමට ද මෙතෙක් නොහැකි වී තිබුණි.

**හඳුනාගන්නා ලද පාඩු**

පළාත් සභා සංකීර්ණයේ සූර්යබල විදුලි ජනන පද්ධතියක් සවිකර අදාළ සමාගම විසින් ගිවිසුම් ප්‍රකාරව අයිතමයන් නඩත්තු නොකිරීම හා ගිවිසුම උල්ලංඝනය කිරීම නිසා අපේක්ෂිත විදුලි බිල අඩු කර ගැනීමට නොහැකි වීමෙන් 2023 පෙබරවාරි 28 දිනට  රු. මිලියන 6.29 ක පාඩුවක් සිදු වී තිබුණු අතර එදින සිට 2024 වර්ෂයේ අවසන් දින දක්වා සිදු වූ පාඩුව ගණනය කිරීමටද කටයුතු කර නොතිබුණි.

**අසාර්ථක ව්‍යාපෘති**

මහනුවර නගරයේ ගුඩ්ෂෙඩ් බස් නැවතුම්පොළ කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත බහුමාදිලි ප්‍රවාහන පර්යන්තයේ මෙහෙයුම් හා පාලන කටයුතු සැලසුම් කිරීමේ කාර්යය සඳහා ලෝක බැංකු ආධාර ව්‍යාපෘතිය යටතේ මහ නගර හා බස්නාහිර සංවර්ධන ව්‍යාපෘතිය සහ මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය අතර රු. මිලියන 128ක මුදලකට ඉතිරි වර්ෂ 03ක් සහ 2018 සැප්තැම්බර් 28 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. එහි දෙවන අදියර ලෙස රුපියල් මිලියන 303කට මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරි 2024 මාර්තු 22 දින ගිවිසුම් ගතව එහි කටයුතු 2024 අප්‍රේල් 01 දින ආරම්භ කර තිබුණි.

යථෝක්ත අදියර දෙක යටතේ GPS යන්ත්‍ර භාවිතා කර බස් රථ ගමනාගමනය අධීක්ෂණය කිරීම මඟින් මහජනතාවට ගුණාත්මක මගී ප්‍රවාහන සේවයක් ඇති කිරීම සඳහා තොරතුරු ලබා ගෙන බස් රථ යම් නියාමනයකට ලක්කිරීම අපේක්ෂා කර තිබුණි. අධිකාරියට හා ප්‍රවාහන කාර්යය සඳහා සෘජුව සම්බන්ධ වන අයට ජංගම දුරකථන ලබාදීම, බස් රථ තුළ GPS යන්ත්‍ර සවිකර මහජනතාවට

සජීවීව තම අදහස් පළකිරීමට අවස්ථාව සැලසීම සහ බස් රථ ගාල මහජනතාවට ඉතා ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාම අරමුණු කරගනිමින් ආරම්භ කර කරන ලද මෙම ව්‍යාපෘතිය 2024 වර්ෂය අවසන් වන විටත් ඉලක්ක ගත බස් රථවලට GPS යන්ත්‍ර සවිකර ගුණාත්මක යෙදවුම් බස් රථ වලට ලබා දී මහජනතාවට ගුණාත්මක සේවයක් ලබාදීමට, බස් රථ ගාල් නිසි ලෙස කළමනාකරණය කිරීමට මෙම ව්‍යාපෘතිය මගින් අසාර්ථක වී තිබීම තුලින් තාක්ෂණය භාවිතා කර මගී ජනතාවට ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් අත්කර දීමට මධ්‍යම පළාත් මගී සේවා අධිකාරියට නොහැකි වී තිබුණි.

**නිශ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්**

ස්ත්‍රී පුරුෂ සමාජ භාවය ඇතුලත් සමාජ ආර්ථික සංවර්ධන ව්‍යාපෘතිය (EGSD) යටතේ පශු වෛද්‍ය සේවා පුළුල් කිරීමේ අරමුණින් අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හැටන් පශු වෛද්‍ය කාර්යාලයට Oxfam පෞද්ගලික ආයතනය මඟින් 2020 වර්ෂයේ රු. මිලියන 4.15 ක් වැය කර ඉදිකර තිබුණු වර්ග අඩි 787.44 ක ගොඩනැගිල්ලේ වසර 4ක කාලයක් ගත වී තිබුණද රසායනාගාර සේවා පවත්වා ගෙන යාමට කටයුතු කර නොතිබුණි. තවද, 2021 වර්ෂයේ කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් නාලන්ද දිස්ත්‍රික් කෘෂිකර්ම පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය වෙත රු.මිලියන 17.88 ක විද්‍යාගාර උපකරණ හා ද්‍රව්‍ය ලබා දී තිබුණද එම උපකරණ හා ද්‍රව්‍ය භාවිතයට නොගෙන 2024 වර්ෂය වන විට වර්ෂ 03 කට ආසන්න කාලයක් ගත වී තිබුණි.

**ගුරු පුහුණුව නොලත් නිළධාරින් ඉගැන්වීම් කටයුතු වල නිරත වීම**

මධ්‍යම පළාතට අනුයුක්ත පාසල් වල සේවය කරනු ලබන සංවර්ධන නිළධාරින්ට කිසිදු ගුරු පුහුණුවක් නොමැතිව කලාප 11 ක නිළධාරින් 446 දෙනෙකු සිංහල මාධ්‍යයෙන් සහ කලාප 06 ක දෙමළ මාධ්‍යයෙන් 21 දෙනෙකු ප්‍රාථමික අංශයේ ඉගැන්වීම් කටයුතුවල නිරත වන අතර කලාප 10 ක නිලධාරීන් 71 දෙනෙකු සිංහල මාධ්‍යයෙන් ගණිතය විෂයයේද 23 දෙනෙකු විද්‍යාව විෂයයේ සහ 11 දෙනෙකු ඉංග්‍රීසි විෂයයේ ඉගැන්වීම් කටයුතුවල නිරත වන බවත්, දෙමළ මාධ්‍යය ගණිතය විෂයය සඳහා සංවර්ධන නිලධාරීන් 06 දෙනෙකු සහ ඉංග්‍රීසි විෂයය සඳහා එක් අයෙකු අනුයුක්ත කර තිබුණි.

එසේම කලාප 05ක විෂයයන් 04 පවතින පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩියෙන් සංවර්ධන නිලධාරීන් 108 දෙනෙකු අතිරික්තව ඉගැන්වීම් කටයුතුවල යොදවා තිබුණි.

**ගුරු පුරප්පාඩු සහ අතිරික්තතා**

මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති මධ්‍යම පළාත් කාර්ය මණ්ඩලය තුළ විදුහල්පති පුරප්පාඩු 504 ක්, නියෝජ්‍ය විදුහල්පති පුරප්පාඩු 137 ක් හා අතිරික්තතා 10 ක් සහ සහකාර විදුහල්පති පුරප්පාඩු 11 ක් හා අතිරික්තතා 444 ක් පැවතුණි. එසේම මධ්‍යම පළාත තුළ ගුරු සේවයේ නිළධාරින් 420 දෙනෙකු විදුහල්පති තනතුරේ වැඩබලන අතර විදුහල්පතිවරුන් 420 විදුහල්පති ශ්‍රේණිධාරීන් 454 දෙනෙකු පාසල්වල අතිරික්ත ලෙස සේවයේ යොදවා තිබුණි.

## වයඹ පළාත් සභාව

**නව තක්සේරු මත බදු මුදල් නොගෙවීම**

ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අක්කර 50 ක ඉඩම් කොටසක් සඳහා 2014 වර්ෂය සඳහා වන නොදියුණු තක්සේරු වටිනාකම රු.මිලියන 37 ක් බව දක්වා තිබියදී, බදු මුදල සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබීම මත අක්කර 50ක් වූ එකී ඉඩම් කොටස් රු.761 ක් වැනි වාර්ෂික බදු මුදලකට වර්තමාන හිමිකරු භුක්ති විඳිමින් පැවතුණි.

**නව තක්සේරු මත බදු නොගෙවීම හා උපබදු දීම**

ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පොතුවිල ග්‍රාම නිලධාරි වසමේ අක්කර 75 ක භූමියක් වසර 30 ක් සඳහා 1999 ජනවාරි 18 දින ගොවි සමාගමක් වෙත බදු දී ඉඩමේ වටිනාකම වූ රු.මිලියන 37.6 ක තක්සේරු මුදල සඳහා වාර්ෂික බදු මුදල ලෙස රු.මිලියන 1.5 ක් අයකළ යුතු වේ. එහෙත් රු.මිලියන 0.3 ක් අය කිරීමෙන් 1999 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වසර 25 ක් වෙනුවෙන් රු.මිලියන 30 ක බදු ආදායමක් රජයට අහිමි වී ගොස් තිබුණි. බදු ගිවිසුමේ 10 වන වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස්ගේ කැමැත්තකින් තොරව අතුරු බදු දීමක් හෝ උප බදු දීමක් සිදු කල නොහැකි වුවත්, 2022 මැයි 22 දින සිට 2026 අගෝස්තු 31 දින දක්වා වසර 5 ක කාලයකට පළමු හා හතර වන වර්ෂය මාසිකව රු.මිලියන 0.4 ක් බැගින්ද,

පස්වන වසරේදී රු.මිලියන 0.5 බැගින් අය කිරීමේ කොන්දේසිය මත පුද්ගලික සමාගමක් වෙත අතුරු බදු දී තිබුණි.

**හිඟ බදු අය නොකිරීම**

වයඹ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2024 වර්ෂයේ බදු ඇස්තමේන්තුවෙන් හා හිඟ බදු ඇස්තමේන්තුවෙන් 2025 මාර්තු 31 දිනට හිඟ බදු මුදල රු.මිලියන 119 ක් වූ අතර, එම මුදලින් අධිකරණ කටයුතු මත අයකළ නොහැකි හිඟ බදු මුදල රු.මිලියන 79 ක් වූයෙන් තවදුරටත් අයකළ හැකි හිඟ බදු මුදල රු.මිලියන 40 ක් විය.

**සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට ණයදීම හා අයකිරීම**

වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය විසින් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සඳහා ණය සහන ලබාදීමේ වැඩසටහන යටතේ වයඹ පළාතේ සමූපකාර සමිති 02 ක් සඳහා අදියර කිහිපයක් යටතේ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ අධීක්ෂණය හා නිර්දේශ මත චක්‍රීය ණය වැඩසටහනක් ලෙස පුත්තලම දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිති වෙත අදියර 04 යටතේ රු.මිලියන 82 ක්ද, කුරුණෑගල දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිති වෙත අදියර 06 ක් යටතේ රු.මිලියන 69 ක්ද ලබාදී තිබුණි. මෙලෙස සමිති වෙත ලබාදුන් ණය මුදලින් 2024 වර්ෂය අවසානය වන විට පුත්තලම හා කුරුණෑගල යන සමිති දෙකෙන් රු. මිලියන 143 ක මුදලක් පියවා නොතිබුණි. තවද, සමූපකාර සමිති සමඟ ඇති කරගන්නා ලද ගිවිසුම්වල තෙවන පාර්ශවයේ එකඟතා හා වගකීම් අනුව ණය මුදල ලබාදුන් දින සිට මාස 06 ක් ඉකුත් වීමට පෙර ගෙවීමට බැඳී සිටින අතර කල් පසු වූ ණය සඳහා මාසිකව සියයට 1.5 බැගින් ප්‍රමාද ගාස්තුවක් අයකළ යුතු නමුත් එලෙස කටයුතු නොකිරීම මත 2023 වර්ෂයේ දෙසැම්බර් සිට 2024 වර්ෂය දක්වා කුරුණෑගල දිස්ත්‍රික් සමිතිය වෙත නිදහස් කළ රු.මිලයන 25 ක ණය කල් පසුවීම මත අයකළ යුතු ප්‍රමාද ගාස්තුව වූ රු.මිලියන 4.9 ක මුදල හා පුත්තලම දිස්ත්‍රික් සමිතිය වෙත නිදහස් කර තිබූ රු.මිලියන 22 ක මුදල සඳහා රු.මිලයන 2.1 ක් වශයෙන් එකතුව රු.මිලියන 7 ක ප්‍රමාද ගාස්තුව අයකිරීමට කටයුතු කර නොතිබුණි.

**හිමිකම් නොමැති විදුහල්පති දීමනා**

විදුහල්පති තනතුරුවල වැඩබැලීමේ දීමනාව ලබා දිය යුතු වන්නේ, විදුහල්පති තනතුරක නිත්‍ය ලෙස රාජකාරී කරනු ලබන හෝ එම තනතුරක වැඩ බලන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ, හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1, 2 හා 3 පන්තියේ වරප්‍රසාද හිමි නිලධාරීන්ට පමණක් වුවද, ඊට අනුකූල නොවන පරිදි වයඹ පළාත් කලාප අධ්‍යාපන කාර්යාල 08 හි වැඩබලන ගුරු සේවයේ ගුරුවරුන් 199 දෙනෙකුට රු.මිලියන 35.56 ක දීමනා අදාළ පත්වීම් දින සිට ගෙවීම් කර තිබුණි.

**ආර්ථික නොවූ ගනුදෙනු**

කොම්පෝස්ට් පොහොර සඳහා පැවති ඉල්ලුම අඩුවීම නිසා ගොවීන් කාබනික පොහොර නිෂ්පාදනය සිදු නොකිරීම හේතුකොටගෙන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් Huller යන්ත්‍ර 97 ක් මිලදීගැනීමට වැයකළ රු.මිලයන 49 ක වියදම වර්තමානය වන විට නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

## සබරගමුව පළාත් සභාව

**පාඩු හා හානි සඳහා ක්‍රියාමාර්ග නොගැනීම**

ගණන් දීමේ නිලධාරීන් විසින් නියමිත කාල සීමාවන් තුළ අවශ්‍ය ක්‍රියාමාර්ග නොයෙදීමේ හේතුවෙන් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ සහ ප්‍රධාන අමාත්‍යාංශයේ පිළිවෙලින් 2020 හා 2017 වර්ෂයේ දී සිදු වු වාහන අනතුරු දෙකකට අදාළ අළුත්වැඩියා කටයුතු සඳහා වැයකළ රු. මිලියන 13.9 ක වටිනාකමක් රක්ෂණ වන්දි ලෙස අදාල රක්ෂණ සමාගමෙන් අයකර ගැනීමට නොහැකිව තිබුණි.

**මිල විචලන වාසි ලබා නොගැනීම**

2021 සහ 2022 වර්ෂයන්හි දී සීඝ්‍රයෙන් වැඩි වු යෙදවුම් මිල ගණන් 2023 වර්ෂයේ සිට නැවත අඩුවන ප්‍රවණතාවයක් පෙන්නුම් කළ ද ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනය අනුමත කරන ලද ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනයේ සම්මත ලංසු ආකෘති මඟින් හඳුන්වා දී ඇති සමීකරණ අනුව මිල විචලන නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය නියමිත කාලසීමාවන් වලදී ගණනය කර අනුමතකර බිල්පත් වලට ගැලපීමට කටයුතු නොකිරීම නිසා ප්‍රධාන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 12 ක එකතුව රු. මිලියන 4 ක් බිල්පත්වලින් අඩු කර ගැනීමට නොහැකි වී තිබුණි.

**නිෂ්කාර්ය වත්කම්**

සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් නිසි අවශ්‍යතා අධ්‍යයනයකින් තොරව 2015 වර්ෂයේ දී රු. මිලියන 58 ක් වැය කර කම්පැක්ටර් යන්ත්‍ර 14 ක් මිලට ගෙන සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන 14 ක් වෙත බෙදාහැර තිබූ නමුත් එම යන්ත්‍ර මාර්ගවලට යෝග්‍ය නොවන පරිදි අඩි 10 ක් පළල වීම නිසා එකී යන්ත්‍ර භාවිතයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. තවද, පරිවාස, ළමාරක්ෂක හා සමාජසේවා දෙපාර්තමේන්තුව යටතේ වූ මුරුත්තෙට්ටුව පිරිමි ළමා රැඳවුම් මධ්‍යස්ථානය සඳහා රු. මිලියන 17.1 ක් වැයකර ඉදිකර තිබූ උපදේශන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල 2019 සැප්තැම්බර් 26 දින විවෘත කර තිබුණද උපදේශන කටයුතු සඳහා රැඳවුම් මධ්‍යස්ථානයේ ම කොටසක් භාවිතා කිරීම හේතුවෙන් 2024 වර්ෂය අවසානය දක්වා භාවිතා කර නොතිබුණි.

**අවශ්‍යතාවයන් හඳුනානොගෙන මිලදී ගැනීම**

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පුනර්ජනනීය බලශක්ති වීථි ආලෝකකරණ ව්‍යාපෘතියේ (අදියර 01) සූර්ය බල වීථි ලාම්පු සවිකිරීමේ ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතනවලට ලබා දීම සඳහා ප්‍රධාන අමාත්‍යාංශය විසින් පැය එකයි විනාඩි 20 ක් පමණ දැල් වී තිබෙන වොට් 90 එල්ඊඩී සූර්ය බල වීථි ලාම්පු 1,500 ක් රු. මිලියන 29.2 ක වටිනාකමකට වසර 02 ක වගකීම් කාලයක් සහිතව ලබා ගෙන තිබුණද, එසේ මිලදී ගැනීමට පෙර ඒ සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනවලින් නිවැරදිව අවශ්‍යතාව හඳුනාගෙන නොතිබුණි. එසේ ම, භාණ්ඩ භාරගැනීමට පෙර පිරිවිතර පිළිබඳ විධිමත් පරීක්ෂාවක් සිදුකර නොතිබු අතර, වීථි ලාම්පුවල බැටරි ධාරිතාවය, සූර්ය බල වීථි ලාම්පු පැනලයේ ධාරිතාවය හා වොට් ගණන පිරිවිතරවලට නොගැලපෙන බව පසුව වාර්තා වීම මත වීථි ලාම්පු පළාත් පාලන ආයතන වෙත බෙදාහැරිය ද අවශ්‍යතාවයට නොගැලපීම හේතුවෙන් එම ආයතන ප්‍රතිකෂේප කිරීම මත නැවත අමාත්‍යාංශයට ලබා ගෙන ගබඩා කර තිබූ අතර 2025 මැයි වන විට වගකීම් කාලයෙන් මාස 10ක් ගතවී තිබුණි.

තවද, අදාළ සැපයුම්කරු වෙත උක්ත මුදල් ගෙවා නොතිබුණු අතර පිරිවිතර හා නොගැලපෙන උක්ත විථි ලාම්පු නැවත සැපයුම්කරුවෙත භාර දී නොතිබුණු අතර, සැපයුම්කරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මහනුවර ප්‍රාදේශීය

කාර්යාලය වෙත මුදල් නොගෙවීම පිළිබඳව 2024 සැප්තැම්බර් 26 දින පැමිණිලි කර තිබුණි.

**ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය නොකර සෘජු කොන්ත්‍රාත් පිරිනැමීම**

සබරගමුව පළාත් සභාව, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පරිදි ප්‍රසම්පාදන කටයුතු නොකර අධ්‍යාපන අමාත්‍යාංශය හා ප්‍රධාන අමාත්‍යාංශය ඊට පටහැනිව ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය පරිදි සංවර්ධන නිර්මාණ යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත 2024 වර්ෂය තුළ දි රු. මිලියන 472.8 ක් වටිනා ඉදිකිරීම් කොන්ත්‍රාත් 41ක් පිරිනමා තිබුණි.

**ළමා නිවාස සඳහා උපකරණ මිලදී නොගැනීම**

පරිවාස, ළමාරක්ෂක හා සමාජසේවා දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි ළමා නිවාස හා රැඳවුම් නිවාස සඳහා අත්‍යාවශ්‍ය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් 2024 වර්ෂය සඳහා රු.මිලියන 7 ක් වෙන් කර තිබුණද 2024 දෙසැම්බර් 31 දිනට ඉන් රු.මිලියන ද.0.97 ක් වැය කර තිබූ අතර රු. මිලියන 6 ක් එනම් සියයට 86 ක් ඉතිරි වී තිබුණි.

**දිගු කාලීන ඉඩම් බදු එකතු කිරීමේ අකාර්යක්ෂමතා**

බලංගොඩ, රත්නපුර, ඇහැළියගොඩ හා ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 හි වාර්ෂික අවසරපත්‍ර දීර්ඝ කර නොගෙන බදු මුදල් ගෙවීම පැහැර හැර වර්ෂ 01 ත් 17 ත් අතර කාලයක් ගත වූ බදු කරුවන් 394 ක් 2024 දෙසැම්බර් 31 දිනට පැහැරහැර තිබූ බදු මුදල රු.මිලියන 37.3 ක් හා ඒ මත ගණනය කර තිබුණු දඩමුදල රු.මිලියන 3.6 ක් විය.

**දිගු කාලීන බදු අයනොකිරීම**

රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුවගම පොත්ගුල් කන්දෙහි සමගිපුර 182 C ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මිරිස්හේන මූකලාන නැමති ඉඩමෙන් පර්චස් 20 ක ප්‍රමාණයක් පෞද්ගලික සමාගමක් වෙත සන්නිවේදන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රත්නපුර ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 1995 ජනවාරි 03 දින දීර්ඝ කාලීන බදු අනුමැතිය ලබා ගැනීමට යටත්ව නිදහස් කර තිබුණි. එසේ වුවද ඉඩම් කොටස නිදහස් කර වසර 30 ක කාලයක් ගතවී තිබුණද දීර්ඝකාලීන බදු අයකිරීමට කටයුතු කර නොතිබූ නමුදු එම ඉඩම් කොටස වාණිජ කටයුත්තකට යොදා ගනිමින් පෞද්ගලික සමාගමක් ආදායම් උපයන බව තහවුරු විය.

යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මූ.පි.කැ.2868 හි කට්ටි අංක 05 වශයෙන් දැක්වෙන රජයේ ඉඩමෙන් හෙක්ටයාර් 2.161 ක ඉඩම් කොටසක් 2002 මාර්තු 22 දින සිට සී/ස රූපවාහිනි ආයතනයට විකාශන මධ්‍යස්ථානයක් ඉදිකර ගැනීම සඳහා බදු ලබා දී තිබුණ ද රූපවාහිනි ආයතනය විසින් 2008 වර්ෂයේ සිට බදු ගෙවීම පැහැර හැර තිබීමෙන් 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 10.2 ක බදු මුදලක් හිඟව පැවතුණි.

**සමාජ සේවා අරමුදල මඟින් ප්‍රතිලාභ ගෙවීම**

අරමුදල් නිදහස් කිරීමේදී අසරණ හා ආබාධිත දරුවන්ට පෝෂණය, සෞඛ්‍ය හා අධ්‍යාපන කටයුතු සඳහා ආධාර ලබාදීමට මුදල් නිදහස් කළ හැකි බව දක්වා තිබුණද 2024 වර්ෂයේ කිසිදු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින් අධ්‍යාපන ආධාර ලබා දී නොතිබුණු අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකකින් පමණක් ප්‍රතිලාභීන් දෙදෙනෙකුට පෝෂණාධාර ලබා දී තිබුණි.

එසේම , අරමුදලේ 24 වන රෙගුලාසිය ප්‍රකාරව වෙනත් කිසිදු ආධාර යෝජනා ක්‍රමයකින් ආධාර හෝ සහනාධාර ලැබි නැති ඉතාමත් අන්ත දුගී තත්ත්වයේ සිටින පවුල්වල පුද්ගලයන්ට සහනයක් සැපයිය හැකි වුවද, පළාතේ සමාජ සේවා නිලධාරීන් මඟින් කිසිදු ආධාරයක් නොලබන පවුල් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර එවැනි පවුල් හඳුනාගැනීමට වසර ගණනාවක් තුළ කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද සමාජ සේවා අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 176.6 ක ප්‍රමාණාත්මක මුදල් ශේෂයක් පැවැතිණි.

**ව්‍යාපෘති සඳහා වැඩිපුර ගෙවීම්**

2016 හා 2017 වර්ෂයන්හිදී පළාත් මාර්ග අමාත්‍යාංශ ප්‍රතිපාදන මත කොළොන්න ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කර තිබූ ක්‍රීඩා පිටි සංවර්ධන ව්‍යාපෘති 21 ක ගෙවීම් කරන ලද වැය විෂයක් මඟින් ආවරණය වී තිබූ අට්ටි ගසන ලද පස් ඇතිරීම යන වැඩ විෂය අතිරේක වැඩ විෂයක් ලෙසද ඇතුලත් කර පස් ඝන මීටර් 38,872 ක් වෙනුවෙන් එකතුව රු.මිලියන 5.9 ක් අධි ඇස්තමේන්තුගත කර ගෙවා තිබුණි. එහෙත් 2024 වර්ෂය දක්වාම එම වැඩියෙන් ගෙවීම් අයකර ගැනීමට සහ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධ විනය කටයුතු අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම පළාත් මාර්ග අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේදී ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව මඟින් ඉටු කල ව්‍යාපෘති වෙනුවෙන් රු. මිලියන

17.87 ක් සාවද්‍ය ලෙස ගෙවා තිබීම හා ව්‍යාපෘති 03ක් සඳහා රු.මිලියන 4.16 ක් නිශ්කාර්ය ලෙස වැය කර තිබුණු අතර 2024 වර්ෂය දක්වාම සාවද්‍ය ගෙවීම් අයකර ගැනීමට හා විනය කටයුතු අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.

**අවිධිමත් ලෙස නිල වාහන පහසුකම් ලබා දීම**

1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපතිවරයා නිල වාහනයක් හිමි තනතුරක් යටතට ඇතුලත්ව නොතිබුණ ද, ඔවුන් වෙත ඉන්ධන සමඟ නිල වාහනයක් ලබා දී තිබුණි.

## නැගෙනහිර පළාත් සභාව

**මුද්දර බදු පළාත් පාලන ආයතනවලට ප්‍රේෂණය නොකිරීම**

2010 සිට 2024 දක්වා කාලය තුළ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් එකතු කරන ලද මුද්දර ගාස්තු වටිනාකම රු.මිලියන 6,475.26 ක් වුවද, රු. මිලියන 3,988.4 ක මුදලක් පමණක් පළාත් පාලන ආයතන වෙත ප්‍රේෂණය කර තිබුණි. ඒ අනුව, රු. මිලියන 1,435.80ක මුද්දර බදු ආදායමක් වසර 01 සිට 14 දක්වා කාලය තුළ පළාත් පාලන ආයතන වෙත ප්‍රේෂණය නොකර පළාත් සභා අරමුදල් ගිණුමට බැර කර තිබුණු අතර තවත් රු. මිලියන 1,051.04 ක මුදලක් ආදායම් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**වාර්තාගත නොවූ හිඟ ආදායම්**

2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 08 වන වගන්තියට අනුව, ආදායම් මූලාශ්‍ර 25 කින් ලැබිය යුතු හිඟ ආදායම් වසර 10 ක් පුරා තක්සේරු කර ,ගණනය කර හා මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර නොතිබූ අතර, එබැවින් මුදල් රෙගුලාසි අංක 128 (2) (ඇ (හි දැක්වෙන පරිදි, පැහැර හරින ලද මුළු බද්දෙන් සියයට 97 ක් හෙවත් රු. මිලියන 55.71 ක් දක්වා පැහැර හරින ලද මුද්දර ගාස්තු සහ දඩය වසර 01 සිට 10 දක්වා කාල සීමාව තුළ පැහැර හරින ලද 1,135 දෙනෙකුගෙන් අයකර නොගෙන හිඟ වීමට ඉඩ දී තිබුණි.

**අත්තිකාරම් ආපසු ගෙවීම් පැහැර හැරීම්**

2021 සිට 2024 දක්වා කාලය තුළ ආහාර කොමසාරිස්වරයාගෙන් ලැබුණු අරමුදලෙන් ත්‍රිකුණාමලය, මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කයේ සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති 32 කට සහල් මෝල් හිමියන් නඟා සිටුවීමේ අරමුණින් වී මිලදී ගැනීමේ අත්තිකාරම් රු.මිලියන 129.70 ක් ගෙවා තිබූ අතර එම මුදල් සහල් අලෙවියෙන් ලැබෙන ආදායමෙන් මාස 06 ක් ඇතුළත අයකර ගත යුතු විය 2021 .දෙසැම්බර් 15 දින නැගෙනහිර පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා විසින් ඇති කරගත් ගිවිසුමට අනුව අම්පාර දිස්ත්‍රික්කයේ මුදල් ආපසු ගෙවීම පැහැර හරින ලද සහල් නිෂ්පාදකයින් 10 දෙනෙකු  සඳහා 2024 මාර්තු 07 දින ගෙවන ලද රු. මිලියන 16.00ක මුදලක් ඇතුළුව රු. මිලියන 101.64ක මුදලක් අයකර ගැනීමට කටයුතු නොකර 2025 අප්‍රේල් 30 වන විට මාස 10 සිට වසර 03 ක කාලයක් තිස්සේ හිඟව පැවතුණි.

**විධිමත් අනුමත නොවූ දිරිදීමනා ගෙවීම**

2008 අංක 01 දරන නැගෙනහිර පළාත් මූල්‍ය ප්‍රඥප්තියේ 102A (01) වගන්තිය ප්‍රකාරව ආදායම් දිරි දීමනා අරමුදල ස්ථාපිත නොකර, 2018 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ නැගෙනහිර පළාත් සභා අරමුදල් ගිණුමෙන් අරමුදල් ලබා ගෙන විවිධ තනතුරු කාණ්ඩ 14 කට අදාළ විවිධ නිලධාරීන් 98 දෙනෙකුට රු. මිලියන 63.88 ක දිරි දීමනාවක් ප්‍රධාන ලේකම්වරයා විසින් අනුමත කර ගෙවා  තිබුණි. එසේම දිරි දීමනා ගෙවන විටෙක එකී නිලධාරීන්ට අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස එකම කාර්ය සඳහා වෙනත් දීමනා ගෙවීම් කළ නොහැකි වුවද එම තත්ත්වය සැලකිල්ලට නොගෙන වසර 06ක  කාලය තුළ ආදායම් ඒකකයේ විවිධ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් රු.මිලියන 4.28 අතිකාල/නිවාඩු වැඩ සඳහා ගෙවීම් කර තිබුණි.

**කාර්යය මණ්ඩල දීමනා ගෙවීම**

2019 ජනවාරි 1 සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ පළාත් සභාවේ ව්‍යවස්ථාපිත අධිකාරී  2 ක විවිධ කාර්ය මණ්ඩල කාණ්ඩ 08 ක් සඳහා වසර 05 ක් තිස්සේ එම කාර්ය මණ්ඩලය අනුමත කර

නොගෙන නැගෙනහිර පළාත් සභා අරමුදලින් රු.මිලියන 20.55 ක් වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ ලෙස ගෙවා තිබුණි

## ඌව පළාත් සභාව

**නිල නිවාස භාවිතා නොකිරීම**

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ඌව පළාතේ අධ්‍යාපන කලාප 09 කට අයත් මුළු නිල නිවාස 1025 කින් පදිංචිය සඳහා භාවිතා කර තිබුණේ නිල නිවාස 586 ක් පමණක් වූ අතර පදිංචිය සඳහා යොදා නොගත් නිල නිවාස 408 ක් නිෂ්කාර්යව පැවතුණි.

නිෂ්කාර්ය වත්කම්

බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් මිලදීගෙන තිබුණු රු. මිලියන 1.11 ක් වටිනා Card Printers සහ Barcode Readers අපේක්ෂිත පරමාර්ථය සඳහා යොදා නොගෙන රෝහල් ගබඩාවන්හි දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව සහ ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය. බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් මිලදී ගෙන තිබුණු රු. මිලියන 18.835 ක් වටිනා ශල්‍ය වෛද්‍ය තොග මිලදී ගැනීමේදී අපේක්ෂිත පරමාර්ථය සඳහා යොදා නොගෙන විගණිත දින වූ 2024 අගෝස්තු 22 දින වන විටත් ශල්‍ය වෛද්‍ය උපකරණ ගබඩාවේ නිෂ්කාර්යව තිබුණි.

**අපේක්ෂිත ප්‍රතිලාභ (Out Come)**

**ලබා නොගැනීම**

ඌව පළාත් මාර්ග සංවර්ධන, නිවාස, ජලසම්පාදන, වතු යටිතල පහසුකම් සහ සමුපකාර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය හා ඌව පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ඒකාබද්ධව මොනරාගල කඳුරට විවිධ සේවා සමුපකාර සමිතියට අයත් ඉඩමක රු. මිලියන 8.148 ක මුදලක් වැය කර 2011 වර්ෂයේ වෙල්ලස්ස සහල් සැකසුම් මධ්‍යස්ථානය ආරම්භ කර තිබුණ ද 2018 වර්ෂයේ සිට එය වසාදමා නිෂ්කාර්යව පැවතුණි. එසේම සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වර්ෂයේ දී රු. මිලියන 5.06 ක ණය මුදලක් සභාපති සී/ස මොනරාගල විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ලබා දී එය වසරක සහන කාලයකින් පසුව වාරික 60 කින් අය කර ගැනීමට (වසර 5 කින්) ගිවිසුම් ගතව තිබූ අතර මේ වන විට ගිවිසුම් කාලය අවසන් වී තිබුණ ද එම මුදලින් එක් වාරිකයක් හෝ අය කර නොතිබුණි.

**උපකරණ හා බීජ මිලදී නොගැනීම**

මොනරාගල සහ බදුල්ල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂක කාර්යාල මගින් 2022 සහ 2023 වර්ෂවල පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා සියයට 50 ගොවි දායකත්ව මුදලින් මිලදී ගැනීමට සැලසුම් කර තිබූ උපකරණ හා බීජ මිලදී නොගැනීම හේතුවෙන් එම ගොවීන් වෙත ප්‍රතිලාභ ලබාදීමට නොහැකි වී තිබුණු අතර ගොවීන්ගෙන් අයකර ගන්නා ලද සියයට 50 දායකත්ව මුදලින් රු. මිලියන 1.036 ක් ගොවීන් වෙත නිදහස් නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**අතිරික්ත කාර්යය මණ්ඩල යෙදීම**

සිසුන් දෙදෙනෙකු පමණක් ඉගෙනුම ලබන මො/වෙහෙරබැදිතැන්න ප්‍රාථමික විද්‍යාලයේ ඉගැන්වීම් කටයුතු සඳහා ගුරුවරයන් දෙදෙනෙකු සේවයේ යෙදවීමට අමතරව සංවර්ධන නිලධාරීන් 04 දෙනෙකු ද පත්කර 2024 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා වැටුප් වශයෙන් රු. මිලියන 3.234 ක් ගෙවා තිබුණි.

**ව්‍යාපෘති සඳහා ලද මුදල් භාවිතා නොකිරීම**

ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ද්විතීයික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (SESIP) යටතේ ක්ෂය ද්‍රව්‍ය හා පරිභෝජ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා 2022 ජනවාරි 05 දින රු මිලියන 0.3 බැගින් පාසල් වෙත ලබා දී තිබුණු පාසල් පාදක ප්‍රදාන වලින් එකතුව රු. මිලියන 1.090 ක් වූ ප්‍රදාන නියැදි පදනම මත පරීක්ෂා කළ පාසල් 08 ක් විසින් අදාළ මිල දී ගැනීම් සිදු නොකර පාසල් සංවර්ධන ගිණුමේ නිශ්කාර්යව රඳවා ගෙන තිබුණි. තවද, අධ්‍යාපන අමාත්‍යාංශ අතිරේක ලේකම්ගේ (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන - රා.ආ.) 2024 ජූලි 01 දිනැති අංක ED/01/103/02/06(IV) දරණ චක්‍රලේඛය අනුව ඉලක්කගත විෂයන් සංවර්ධනය සඳහා ලබා දෙන ලද එකතුව රු. මිලියන 6.290 ක් වූ පාසල් පාදක ප්‍රදානයන් 2024 ඔක්තෝබර් 31 දින වන විට උපයෝජනය කර අවසන් කළ යුතු වුවත් 2024 නොවැම්බර් 01 දින වන විටත් පාසල් 22 ක එකතුව රු. මිලියන 2.704 ක් වූ ප්‍රදාන උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

**ගුරු අතිරික්ත හා ඌනතා**

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ඌව පළාත තුළ විධිමත් ගුරු තුලනයක් සිදු

නොකිරීම හේතුවෙන් 2024 ජුනි මස අවසානයට අධ්‍යාපන කලාප 08 ක පාසල් 605 ක ගුරුවරු 2828 දෙනෙකුගේ ඌනතාවයක් පවතින පසුබිමක අධ්‍යාපන කලාප 02 ක පාසල් 145 ක ගුරුවරු 338 දෙනෙකුගේ අතිරික්තයක් පවත්වාගෙන යමින් එකී අතිරික්ත කාර්ය මණ්ඩලයට 2023 ජනවාරි මස සිට 2024 ජුනි මස දක්වා එකතුව රු. මිලියන 446.741 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. කලාප 02 ක ගුරු අතිරික්තයක් පැවතිය ද ගුරුතුලනයක් සිදු නොකිරීම හේතුවෙන් පාසල් 178 ක ගුරුවරු 622 දෙනෙකුගේ ඌනතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

**නේවාසිකාර ගොඩනැගිල්ල ඉදිකිරීමේ ප්‍රමාදය**

බණ්ඩාරවෙල කුඩා කුසුම් බාලිකා විද්‍යාලයේ තෙමහල් ශිෂ්‍ය නේවාසිකාගාරය ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේදී, පෞද්ගලික ඉදිකිරීම් ආයතනයක් සමඟ රු. මිලියන 47.09 වටිනාකමකට ගිවිසුම්ගතව තිබුණු අතර එකී ගිවිසුම් ප්‍රකාරව 2018 අගෝස්තු 04 වන දින වැඩ නිම කිරීමට නියමිතව පැවතිය ද 2024 දෙසැම්බර් 06 දින වන විටත් ඉදිකිරීම් වැඩ අවසන් කර නොතිබුණි.

**සූර්ය බලශක්ති ව්‍යාපෘතිය**

2024 නොවැම්බර් 24 දිනැති අංක 2/PVC/ACP/06/Solar දරන නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) ගේ ලිපිය අනුව ඌව පළාත් සභාව මගින්, සූර්ය බලශක්ති විදුලිය ජනනය කිරීම සඳහා ඌව පළාත් සභාව සතු ගොඩනැගිලි වහළවල් යොදාගැනීමේ ව්‍යාපෘතිය රාජ්‍ය-පෞද්ගලික හවුල් ව්‍යාපෘතියක් (Public Private Partnership (PPP)) ලෙස හා ලංසු ලේඛනවල 01 ඡේදය අනුව Turnkey ව්‍යාපෘතියක් ලෙස දක්වා තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 03.10 ඡේදය අනුව මෙවැනි ප්‍රසම්පාදන සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් අවශ්‍ය වුවද එසේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි. තවද, පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරු ඇමතූ 2019 මාර්තු 26 දිනැති අංක 02/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය අනුව මෙවැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුවක (Cabinet Appointed Procurement Committee) සහ තාක්ෂණික ඇගයීම් කමිටුවක (Technical Evaluation Committee) අනුමැතිය අවශ්‍ය වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. ප්‍රසම්පාදන ලේඛනවල Condition of Contract හි 03 වන වගන්තිය අනුව රු. මිලියන 2.5 ක කාර්යසාධන ලේඛනයක්

ලබාදෙන ලෙස දන්වා තිබුණ ද ව්‍යාපෘතියේ ගිවිසුම් වටිනාකම අනුව ලබාගත යුතුව තිබුණු කාර්යසාධන සුරක්ෂණයේ වටිනාකම රු. මිලියන 292.82 ක් විය. ගිවිසුම පරිදි ව්‍යාපෘතිය 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිම වියයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. එසේම ව්‍යාපෘතිය සඳහා කාලය දීර්ඝ කිරීමේ ලිපි විගණනයට ඉදිරිපත් නොවුණ ද කොන්ත්‍රාත්කාර සමාගම විසින් රු. මිලියන 2.5 ක කාර්යසාධන සුරක්ෂණයේ කාලය 2022 ජුනි 22 දින සිට 2022 දෙසැම්බර් 22 දින දක්වා දීර්ඝ කර ලබාදී තිබුණි. ගිවිසුම අනුව ව්‍යාපෘතිය නිමකර හෝ කාලය දීර්ඝ කර නොතිබුණ අතර කාර්යසාධන බැදුම්කරය ද මුදල් කර නොතිබුණි. එසේම කොන්ත්‍රාත්කරු සමඟ අත්සන් කළ ගිවිසුමේ කාර්යසාධන ඇපකරය පිළිබඳව කිසිදු වගන්තියක් ඇතුළත් නොවීය.

ව්‍යාපෘතියට අදාළ ගිවිසුමේ 6(xvi) ඡේදයේ සඳහන් වන පරිදි ගිවිසුම්ගත දිනයේ සිට මාස 12 ක කාලයක් තුළ මෙගාවොට් 46.35 ක ධාරිතාවයෙන් යුතු සූර්ය පැනල සවිකර අවසන් කළයුතු වුවත් 2024 නොවැම්බර් 30 දිනටත් ගිවිසුම්ගත වහලවල් 879 න් 450 ක පමණක් සූර්ය පැනල සවිකර තිබුණ අතර එයින් උත්පාදනය කෙරෙන විදුලි ධාරිතාවය මෙගාවොට් 20 ක ප්‍රමාණයක් විය. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ප්‍රමාද වීම හේතුවෙන් 2023 හා 2024 වර්ෂවල ඌව පළාත් සභාවට ලැබිය යුතු ආදායම රු. මිලියන 73.26 ක් පමණ අහිමි වී තිබුණි.

**දීමනා ගෙවීම්**

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත පමණක් 2021 නොවැම්බර් 03 සිට 2024 නොවැම්බර් 29 දක්වා නිලධාරීන් 14 දෙනෙකුට රු. මිලියන 7.36ක් වූ දීමනාවන් ගෙවා තිබුණි.

## උතුරු පළාත් සභාව

**හිඟ බදු කුලී**

උතුරු පළාත් රජයේ ඉඩම් දීර්ඝකාලීන බදු සඳහා සහ ව්‍යාපාර අරමුණු සඳහා ලබාදී ඔවුන් ආදායම් ඉපැයීමේ තත්ත්වයට පත්වූ පසුව 2019 සිට 2025 අප්‍රේල් 16 දින දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් එකතුව රු.මිලියන 20.20ක හිඟබදු කුලී

දෙපාර්තමේන්තුව විසින් අය නොකර ලැබිය යුතු ලෙස පැවැතී අතර ඒවා අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ගද ගෙන නොතිබුණි.

**නිෂ්කාර්යය වත්කම්**

2019 වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) අරමුදලින් රු. මිලියන 17.14 වැයකර ඉදිකළ මන්නාරම සුරක්ෂා/ආරක්ෂක නිවාසය පසුගිය වර්ෂ 03ක කාලයක සිට අභාවිතව පැවැති අතර එම ගොඩනැගිල්ලට අදාල ආරක්ෂක නිලධාරීන්ගේ වැටුප් ලෙස එකතුව රු. මිලියන 1.64ක් පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි.

**වාරි ජල පහසුකම් සැලසීම**

වන්නේරිකුලම මාර්ගයෙන් වාරිජල පහසුකම් සලසා අක්කර 240ක් යල කන්නයේ වී වගාව සිදුකර තිබියදී, අක්කර 800කට යල කන්නයේ වගාවන් සිදුකිරිම සඳහා රු. මිලියන 93.66ක් ප්‍රතිසංස්කරණ වැඩසටහනින් වැයකර තිබුණි. කාර්යයන් නිමකළ යුතු දිනය අවසන්ව තිබූ නමුත් අදාල කාර්යයන් නිම කර නොතිබූ අතර ව්‍යාපෘතියෙන් අපේක්ෂා කළ  නිමවුම් මට්ටම ලබාගැනීමට නොහැකි වී තිබුණි.

**වැව් ජලය රඳවා ගැනීම**

කල්මඩුකුලමේ වේල්ල සඳහා වූ Spill Structure ව්‍යාපෘතිය ඇස්තමේන්තුවට ඇතුළත් කර ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන්, රු. මිලියන 522.82ක් වැයකර තිබු නමුත් වැඩිපුර වැසි ජලය රඳවා ගැනීමට නොහැකි වි තිබුණි.

**ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකිරීම**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව 2024 වර්ෂයේ මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් උතුරු පළාතේ එකතුව රු. මිලියන 397.45ක මූලධන කාර්යයන් 2024 වර්ෂය සඳහා වූ වැඩ කොන්ත්‍රාත් සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවේ ලියාපදිංචි නොකළ, පූර්ව සේවා පළපුරුද්ද ආදි කරුණු සැලකිල්ලට නොගෙන කොන්ත්‍රාත්කරුවන් තෝරාගෙන ඉටුකර ගෙන තිබුණි.

තවද, 2024 වර්ෂයේ මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ එකතුව රු. මිලියන 24.91ක නව මූලධන කාර්යයන් 02ක් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව වෙළෙඳපොල සැඳැහුම් ක්‍රමය යටතේ ලංසු කැඳවා කොන්ත්‍රාත්කරු තෝරාගෙන තිබුණි.

## උතුරු මැද පළාත

**ඉඩම් බදු ආදායම් අහිමිවීම**

2021 පෙබරවාරි 01 දිනැති 2020/06 (i) චක්‍රලේඛය හා අමප/20/1622/322/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව ඉඩම් කොමසාරිස්වරයා විසින් බදු සහන ලබා දීම හේතුවෙන් පළාත් සභාවට රු. මිලියන 73.4 ක බදු මුදලක් අහිමි වී තිබුණි. තවද, 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 කට අදාළව අයවිය යුතු දිර්ඝ කාලීන ඉඩම් බලපත්‍ර ගාස්තුව රුපියල් මිලියන 673.7 ක් වූ අතර, ඒ තුළ වසර 1-3ත් අතර අයවිය යුතු ශේෂය රුපියල් මිලියන 469.7 ක් ද, වසර 03 කට වඩා පැරණි ශේෂය රුපියල් මිලියන 204 ක් ද විය.

**ඇඟිලි සළකුණු යන්ත්‍ර මගින් පැමිණීම හා පිටවීම සනාථ කර නොගෙන අතිකාල ගෙවීම.**

2024 වර්ෂයේදී ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල දෙකෙහි සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පිළිවෙලින් රුපියල් මිලියන 1677.3 ක් සහ රු. මිලියන 0.37ක මුදලක් ඇඟිලි සළකුණු යන්ත්‍ර මගින් පැමිණීම හා පිටවීම සනාථ කර නොගෙන අතිකාල දීමනා ගෙවා තිබුණි.

**සනීපාරක්ෂක පහසුකම් සපුරා නොතිබීම**

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කලාප අධ්‍යාපන කාර්යාල 03 ක වැසිකිලි හා කැසිකිලි අවශ්‍යතාවය සහිත පාසල් 495 ක් පවතින අතර, පාසල් 1008 ක් වැසිකිළි අලුත්වැඩියා කළයුතු තත්ත්වයේ පවතී. එමෙන්ම පාසැල් 92 ක පානීය ජල අවශ්‍යතා ද සපුරාලිය යුතුව ඇති නමුත්, 2024 වර්ෂය තුළදී ද එකී අවශ්‍යතා සපුරාලීමට කටයුතු කර නොතිබුණි.

**කොන්ත්‍රාත් පරිපාලන කටයුතුවල අඩුපාඩු**

ප්‍රාදේශීය සංවර්ධක සහයක ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන 07 ක ඉදිකිරීම් ව්‍යාපෘති 07 කට අදාළව ගෙවීම් කිරීමේදී ව්‍යාපෘති 03 ක ඉටු නොකළ වැඩ ඒකක 27 ක් සඳහා රුපියල් මිලියන 2.9 ක් ද, ව්‍යාපෘති 06 කට අදාළව රුපියල් මිලියන 31.2ක මුදලක් අතිරේක වැඩ හා ඇස්තමේන්තු ප්‍රමාණය ඉක්මවීම සඳහාද ව්‍යාපෘති 03ක් සඳහා රු. මිලියන 15.9 ක මුදලක් මිල විචලනයන් සඳහාද

ගෙවා තිබුණු අතර, එම මිල විචලනය සියයට 21 සිට සියයට 35 ත් අතර විය. එමෙන්ම රු. මිලියන 4.9ක් වටිනා අයිතම 41 ක් සඳහා වගකීම් සහතික ඉදිරිපත් කර නොතිබිය දී ඊට අදාළ ගෙවීම් කර තිබුණි.

**සූර්යය බල විදුලි පද්ධති ක්‍රියාත්මක නොවීම**

උතුරු මැද පළාත් පරිපාලන සංකීර්ණයේ වහලය මත හා පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාල ගොඩනැගිල්ලේ සූර්යය බල විදුලි පද්ධති සවිකර තිබුණු අතර මෙම පද්ධති මඟින් අපේක්ෂිත පරිදි විදුලිය ජනනය නොවීම හේතුවෙන් 2019 වර්ෂයේ සිට 2024 දක්වා පිළිවෙලින් රු. මිලියන 21 ක සහ රු. මිලියන 9 ක ආදායමක් අහිමි වී තිබුණි.

**නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

කහටගස්දිගිලිය මූලික රෝහලේ රුපියල් මිලියන 9.6 ක් වටිනා විකිරණ ඒකකය, මැදිරිගිරිය මූලික රෝහලේ රුපියල් මිලියන 0.3ක් වටිනා ECG යන්ත්‍රය, අරලගංවිල ප්‍රාදේශීය රෝහලේ රුපියල් මිලියන 0.58 ක් වටිනා මල්ටි පැරා මොනිටරය හා මූලික රෝහල් 01 ක, ප්‍රාදේශීය රෝහල් 10 ක හා ප්‍රාථමික වෛද්‍ය සත්කාරක ඒකක 05 ක වෛද්‍ය උපකරණ ස්ථාන ගත කිරීම සඳහා පහසුකම් නොමැති වීම, අමතර කොටස් නොමැති වීම හා අක්‍රියවීම නිසා වෛද්‍ය උපකරණ 46 ක් මාස 03 ත් අවුරුදු 10 ත් අතර කාලයක සිට නිෂ්ක්‍රියව පැවතුණි. තවද, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ L.D.S.P ව්‍යාපෘතිය යටතේ පදවිය ප්‍රාදේශීය සභාවේ ආදායම් උත්පාදනය සඳහා 2023 අප්‍රේල් 24 දින හා 2023 ජූලි 18 දින මිලදී ගත් වටිනාකම රු. මිලියන 4 ක් වූ ඔරු 26 ක් භාවිතයට ලබා නොදී නිශ්කාර්යව ප්‍රාදේශීය සභා භූමියේ ගොඩ ගසා තිබුණි.

**අක්‍රිය පරිගණක අළුත්වැඩියා කිරීමට නොහැකිවීම**

දිඹුලාගල හා පොළොන්නරුව කලාප අධ්‍යාපන කාර්යාලවල පරිගණක විද්‍යාගාර 14 ක පරිගණක 293 ක් අක්‍රියව පැවතුණි. පළාතේ පාසල්වල විද්‍යාගාරවල අක්‍රීය පරිගණක පිළිබඳ දත්ත පද්ධති නඩත්තු කර පාසල්වලට සේවාවක් සැපයීම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහ කලාප අධ්‍යාපන කාර්යාලවල වගකීම දරන නිලධාරීන්ගේ කාර්යය වුවත්, ඒ පරිදි කටයුතු කර නොතිබුණි.

**උතුරු මැද පළාත් දරුවන්ගේ විභාග ප්‍රතිඵල විශ්ලේෂණය**

ජාතික මට්ටමින් පාසල් ශිෂ්‍යයන් සඳහා පවත්වනු ලබන විභාගවලට පෙනී සිටි උතුරු මැද පළාතේ දරුවන්ගේ ප්‍රතිඵල විශ්ලේෂණය කිරීමේදී අ.පො.ස (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව 2017 වර්ෂය දක්වා 06 වන ස්ථානයේ පැවති උතුරු මැද පළාත අඛණ්ඩව පසුගිය වසර 03 කදී 09 වන (අවසාන) ස්ථානයට පත්වී තිබුණි. අපො.ස (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව 2017 වර්ෂයේදී 08 වන ස්ථානයේ පැවති උතුරු මැද පළාත අඛණ්ඩව පසුගිය වසර 03 කදී 09 වන (අවසාන) ස්ථානයට පත්වී තිබුණි.

# පළාත් පාලනය



ශ්‍රී ලංකාවේ පළාත් පාලන කටයුතු පළාත් පාලන ආයතන 341 ක් මඟින් ක්‍රියාත්මක කරන අතර එම පළාත් පාලන ආයතන මහා නගර සභා ආඥා පනතේ 252 අධිකාරිය මඟින් ක්‍රියාත්මක වන මහා නගර සභා 28 ක් හා නගර සභා ආඥා පනතේ 255වන අධිකාරිය මඟින් ක්‍රියාත්මක නගරසභා 37 ක් හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මඟින් ක්‍රියාත්මක ප්‍රාදේශීය සභා 276 කින්ද සමන්විත වේ.මෙම පළාත් පාලන ආයතනවල 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීම හා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති මතයන් පිළිබඳ සාරාංශයක් පහත වගුවෙහි දැක්වේ.

වගු අංක 2.55 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ විගණන මතයන්

| පළාත් පාලන ආයතන වර්ගය | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු සභා ගණන | 2025 පෙබරවාරි 28 දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ සභා ගණන | විගණන වාර්තා නිකුත් කළ සභා ගණන | 2025 අගෝස්තු 15 දිනට නිකුත් කර ඇති වාර්තා අනුව විගණන මතය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | තත්ත්වා ගණනය නොකළ | තත්ත්වා ගණනය කළ | මතය ව්‍යාවනය | අහිතකර මතය |
| මහා නගර සභා | 28 | 19 | 25 | - | 20 | 1 | 4 |
| නගර සභා | 37 | 31 | 37 | - | 35 | 0 | 2 |
| ප්‍රාදේශීය සභා | 276 | 247 | 275 | 4 | 257 | 3 | 11 |
| එකතුව | **341** | **297** | **337** | **04** | **312** | **4** | **17** |

මූලාශ්‍ර - විගණන ශාඛා මඟින් ලබාගන්නා ලද තොරතුරු

(කළුතර, පුත්තලම, වවුනියා මහා නගර සභාවල සහ කළුතර ප්‍රාදේශීය සභාව 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.)

## වරිපනම් බදු, කුලී, බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් අයකර ගැනීම

2024 වර්ෂයේ ඉහත පළාත් පාලන ආයතනවල වරිපනම් බදු, දේපල කුලී , බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් සඳහා බිල් කළ ආදායම රු.මිලියන 41,296 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

වගු අංක 2.56 - පළාත් පාලන ආයතනවල බිල් කළ ආදායම - 2024

| පළාත් පාලන ආයතන වර්ගය | වරිපනම් බදු රු. මිලියන | කුලී රු. මිලියන | බලපත්‍ර ගාස්තු රු. මිලියන | වෙනත් ආදායම් රු. මිලියන | මුලු ආදායම රු. මිලියන |
|---|---|---|---|---|---|
| මහා නගර සභා | 10,535 | 2,125 | 449 | 4,663 | 17,772 |
| නගර සභා | 1,660 | 991 | 157 | 1,829 | 4,637 |
| ප්‍රාදේශීය සභා | 3,953 | 3,532 | 763 | 10,638 | 18,886 |
| එකතුව | 16,148 | 6,648 | 1,369 | 17,130 | 41,296 |

**මූලාශ්‍ර - පළාත් පාලන ආයතනවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන-2024**

## විගණන නිරීක්ෂණ

**හිඟ ආදායම**

2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතනවලට ලැබිය යුතු හිඟ ආදායම රු.මිලියන 20,826 ක් වූ අතර වරිපනම් හා බදු අය කර ගැනීම සඳහා පනත්වල විධිවිධාන අනුව කටයුතු නොකිරීම, පළාත් පාලන ආයතනවල වසර 05 සිට 10 දක්වා කාල පරාසයක් තුල පවතින වරිපනම් බදු තක්සේරු කිරීමේ ප්‍රමාදයන්, දියුණු ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අය නොකිරීම් සහ සංවර්ධන බලපත්‍ර ලබා දීමෙන් පසු අනුකූලතා සහතික නිකුත් කර බදු සංශෝධනය නොකිරීම හේතුවෙන් පළාත් පාලන ආයතනවලට අය විය යුතු විශාල වරිපනම් බදු ප්‍රමාණයක් අය නොවී පැවතුණි. කුලී ආදායම් අය කර ගැනීම සඳහා කුලී ගිවිසුම්වල කොන්දේසි අනුව කටයුතු නොකිරීම, කාලීනව කුලී තක්සේරු නොකිරීම, තක්සේරු කළ බදු කුලී අය කිරීම් ප්‍රමාද කිරීම සහ බදු ගිවිසුම් යාවත්කාලීන නොකිරීම හේතුවෙන් බොහෝ පළාත් පාලන ආයතනවලට ලැබිය යුතු කුලී ආදායම් අතහැරී තිබුණි. හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු අය කිරීම සඳහා නඩු නොපැවරීම හා වෙනත් ආදායම් අය කිරීම සඳහා පනත්වල විධිවිධාන, අතුරු ව්‍යවස්ථා විධිවිධාන සහ ගිවිසුම් අනුව කටයුතු නොකිරීම ඒ සඳහා හේතු වී තිබුණි.

**අයවිය යුතු හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයනොවීම.**

2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව උසාවි දඩ රු. මිලියන 2,623 ක් සහ මුද්දර ගාස්තු රු.මිලියන 9,034 ක් පළාත් සභාවලින් අයවිය යුතුව තිබුණි. විස්තර පහත දැක්වේ.

**වගු අංක 2.57 - පළාත් පාලන ආයතනවල හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු - 2024**

| පළාත් පාලන ආයතන වර්ගය | උසාවි දඩ රු. මිලියන | මුද්දර ගාස්තු රු. මිලියන | එකතුව රු. මිලියන |
|---|---|---|---|
| මහා නගර සභා | 309 | 927 | 1,236 |
| නගර සභා | 159 | 567 | 726 |
| ප්‍රාදේශීය සභා | 2,155 | 7,540 | 9,695 |
| එකතුව | 2,623 | 9,034 | 11,657 |

මූලාශ්‍ර - පළාත් පාලන ආයතනවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන-2024

උසාවි දඩ හා මුද්දර ගාස්තු නියමිත පරිදි  පළාත් පාලන ආයතන වෙත ලබා දීම පළාත් සභා විසින් අතපසු කර තිබුණු අතර,එය පළාත් පාලන ආයතනවල අයවැය සහ සැලසුම් ක්‍රියාවලියට අහිතකර ලෙස බලපා තිබුණි.

**වත්කම් හා වගකීම්- ඉඩම් හා ගොඩනැගිලි**

රට තුළ ඇති වානිජ වටිනාකමින් වැඩි ඉඩම් සහ ගොඩනැගිලිවලින් විශාල ප්‍රමාණයක අයිතිය පළාත් පාලන ආයතනය සතු වේ. මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු. මිලියන 300,852 ක් වේ.විස්තර පහත දැක්වේ.

වගු අංක 2.58 -  පළාත් පාලන ආයතනවල  ඉඩම් හා ගොඩනැගිලි

| පළාත් පාලන ආයතන වර්ගය | වටිනාකම රු. මිලියන |
|---|---|
| මහා නගර සභා | 123,049 |
| නගර සභා | 42,032 |
| ප්‍රාදේශීය සභා | 135,771 |
| එකතුව | 300,852 |

මූලාශ්‍ර - පළාත් පාලන ආයතනවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන-2024

ඉහත ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම තුළ ඇතුළත් ඉඩම් හා ගොඩනැගිලිවලින් බස්නාහිර පළාත් සහ උතුරුමැද පළාත්වල පළාත් පාලන ආයතන පමණක් පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය අනුව වත්කම් වර්තමාන වෙළඳපොළ මිලට ප්‍රත්‍යාගණනය කර ගිණුම්වල දක්වා තිබුණි.

**මෝටර් රථවාහන**

2024 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතන සතු මෝටර් රථවාහන සංඛ්‍යාව 10,798 ක් වූ අතර ඒවායේ වටිනාකම රු. මිලියන 29,500 ක් විය.විස්තර පහත දැක්වේ.

වගු අංක 2.59 -  පළාත් පාලන ආයතන සතු මෝටර් රථවාහන

| පළාත් පාලන ආයතන වර්ගය | වාහන සංඛ්‍යාව | වටිනාකම රු.මිලියන |
|---|---|---|
| මහා නගර සභා | 3,544 | 12,579 |
| නගර සභා | 1,173 | 2,420 |
| ප්‍රාදේශීය සභා | 6,081 | 14,501 |
| එකතුව | 10,798 | 29,500 |

මූලාශ්‍ර - පළාත් පාලන ආයතනවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන-2024

**ආයෝජන**

පළාත් පාලන ආයතනවල ප්‍රධාන අරමුණ පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම බැවින් ඒ සඳහා සභාවේ ආදායමට ගැළපෙන පරිදි වියදම් සැලසුම් කර අය වැය ලේඛනය පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.නමුත් පළාත් පාලන ආයතන බොහොමයක අයවැය සහ පරිපූරක ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල නොකිරීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඒවා ආදායම් ඉපයීමේ අරමුණු ඇතිව ස්ථාවර තැන්පතු හා වෙනත් තැන්පතුවල ආයොජනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

වගු අංක 2.60 - පළාත් පාලන ආයතනවල ආයෝජන

| පළාත් පාලන ආයතන වර්ගය | ආයෝජන (රු. මිලියන) |
|---|---|
| මහා නගර සභා | 17,218 |
| නගර සභා | 3,417 |
| ප්‍රාදේශීය සභා | 15,291 |
| එකතුව | 35,926 |

මූලාශ්‍ර - පළාත් පාලන ආයතනවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන-2024

පළාත් පාලන ආයතනවලට පැවරී ඇති මහජන සෞඛ්‍ය, පොදු උපයෝගී සේවා , පොදු මංමාවත් පිළිබඳ කටයුතු සහ ජනතා සුභසාධන කටයුතු ඉටු කිරීම නිසි පරිදි ඉටු කර නොතිබියදී ඒවායේ අරමුදල් ස්ථාවර තැන්පතු ලෙස පවත්වාගෙන යෑම ගැටළුකාරී තත්ත්වයක් විය.

**මුදල් හා බැංකු ගිණුම්**

2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතනවල බැංකු ගිණුම්වල පැවති සහ අතැති මුදල් ශේෂය රු. මිලියන 15,677 ක් විය. විස්තර පහත දැක්වේ.

වගු අංක 2.61 - පළාත් පාලන ආයතනවල 2024 දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂ සහ අතැති මුදල් ශේෂය

| පළාත් පාලන ආයතන වර්ගය | මුදල රු. මිලියන |
|---|---|
| මහා නගර සභා | 1,864 |
| නගර සභා | 2,042 |
| ප්‍රාදේශීය සභා | 11,770 |
| එකතුව | 15,676 |

මූලාශ්‍ර - පළාත් පාලන ආයතනවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන-2024

**පළාත් පාලන ආයතනවල ණය** ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන ආයතන දේශීය ණය සංවර්ධන අරමුදල (LLDF) වෙතින් සහ වෙනත් ආයතනවලින් ලබාගෙන තිබුණු ණය ප්‍රමාණය රු.මිලියන 50,263 ක් විය. විස්තර පහත දැක්වේ.

වගු අංක 2.62 - පළාත් පාලන ආයතනවල 2024 දෙසැම්බර් 31 දිනට ණය ශේෂ

| පළාත් පාලන ආයතන වර්ගය | දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබා ගත් ණය. රු. මිලියන | වෙනත් ණය රු. මිලියන | එකතුව රු. මිලියන |
|---|---|---|---|
| මහා නගර සභා | 2,166 | 4058 | 6,224 |
| නගර සභා | 961 | 68 | 1,029 |
| ප්‍රාදේශීය සභා | 661 | 42,349 | 43,010 |
| එකතුව | 3,788 | 46,475 | 50,263 |

මූලාශ්‍ර - පාලන ආයතනවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන - 2024

## බස්නාහිර පළාත- කොළඹ දිස්ත්‍රික්කය

**කොළඹ මහා නගර සභාව** කොළඹ නගරයේ සාමාන්‍ය වැසි තත්ත්වයකදී ජලයෙන් යටවන ස්ථාන 20ක් පමණ මහා නගර සභාව විසින් හඳුනාගෙන තිබුණු අතර සංවර්ධනය කිරීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබූ ස්ථාන 13ක් අතරින් 2024 වර්ෂය තුල අවසන් කර තිබුණේ කොන්ත්‍රාත් 3ක් පමණි. ස්ථාන 7ක් සම්බන්ධව මේ වනතුරු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2023 ජුනි 01 දින සිට ක්‍රියාත්මකවන පරිදි බහුකාර්යය සංවර්ධන සහයකයන් 37 දෙනෙකු කොළඹ මහා නගර සභාවට කම්කරුවන් ලෙස අනුයුක්ත කර තිබුණි. එහෙත් ඔවුන් කොළඹ මහා නගර සභාවේ සේවයට නියුක්ත නොකර බස්නාහිර පළාත් සභාවට අයත් වෙනත් කාර්යාලවලට අනුයුක්ත කර කොළඹ මහා නගර සභාවෙන් වැටුප් ලෙස එකතුව රු. මිලියන 17.9ක් 2024 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබුණි.

**දෙහිවල ගල්කිස්ස මහනගර සභාව**

සභාව විසින් ගිවිසුමකින් තොරව කේබල් ටී වී ව්‍යාපෘතියකට එළඹ තිබුනෙන් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු එම ව්‍යාපෘතියෙන් ලැබිය යුතුව පැවති රු. මිලියන 4.5ක හිඟ බදු කුලී ආදායමක් අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

2024 වර්ෂයේ ආරම්භක හිඟ වරිපනම් ශේෂය රු. මිලියන 763.7ක් වූ අතර එයින් වර්ෂය තුළ දී රු. මිලියන 191.2ක් අය කරගෙන තිබූ අතර රු. මිලියන 572.5ක් හෙවත් සියයට 75ක් අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. තවද 2024 දෙසැම්බර් 31 දිනට වරිපනම් ඒකක 45,685ක රු. මිලියන 900.5ක වරිපනම් හිඟයක් පැවතුණි.

2025 පෙබරවාරි වන විටත් 2024 වර්ෂයේ වෙළඳ බලපත්‍ර නොලත් ආයතන 683ක් අතරින් ආයතන 47ක් සඳහා පමණක් නඩු පැවරීමට කටයුතු කර තිබූ අතර, ඉතිරි ආයතන 636ක් සම්බන්ධයෙන් නඩු පැවරීමට කටයුතු කර නොතිබුණි.

මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් 1995 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළදී පැනවූ අධිභාර වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 2.4ක් අයකර ගැනීමට පැවතුණි.

2024 වර්ෂය තුළ ඉදුල් කසළ විකිණීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වුවද වර්ෂය තුළ රු. මිලියන 19.3ක් වැයකර ඉදුල් කසළ ටොන් 19,284ක් කරදියාන කසළ අංගනයට බැහැර කර තිබුණි. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා මූළ ප්‍රාග්ධන පිරිවැය සඳහා රු.මිලියන 43.5ක් අයවැය මඟින් ප්‍රතිපාදනය කර තිබුණද එයින් රු.මිලියන 2.6ක් වැය කර කාර්යාල උපකරණ මිලදී ගැනීම හැර ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු ක්‍රමවත් හා කාර්යක්ෂමව ඉටු කිරීම පිණිස කටයුතු කර නොතිබුණි.

**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව**

2024 ජනවාරි 01 දින සිට නව තක්සේරු කිරීමට අදාලව කඩ කුලී සඳහා බිල් කිරීම් රු.මිලියන 84කින් ලැබිය යුතු රු.මිලියන 70ක් අයකර ගැනීමේ අවිනිශ්චිතතාවයක් පැවතුණි.

**මොරටුව මහා නගර සභාව**

වරිපනම් හා බදු අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා 2024 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.මිලියන 290.73ක් වූ අතර ඒ තුළ හිඟ වරිපනම් වටිනාකම රු.50,000 ඉක්ම වූ වරිපනම්

| | |
|---|---|
| | ඒකක 318කින් අයවිය යුතු වටිනාකම රු.මිලියන 87.91ක් වූ අතර රු. මිලියනයක් ඉක්මවූ හිඟ වරිපනම් සහිත රාජ්‍ය ආයතන 10කින් ලැබිය යුතු මුදල රු. මිලියන 40.48ක් වී තිබුණි. |
| | 2003 සිට 2015 වර්ෂය දක්වා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට වාර්තා සහ දායක මුදල් යැවීම ප්‍රමාදවීම මත සභාවට පැන නැගී තිබූ රු. මිලියන 1.55ක අධිභාරය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | අංක 1329 දරණ මුදල් සැලසුම් අනුමත කිරීම සම්බන්ධයෙන් සභාවට එරෙහිව පවරන ලද නඩුවේදී 2018 ජූලි 20 වන දින ලබා දුන් අධිකරණ නියෝගය අනුව පැමිණිලිකරු වෙත වන්දි මුදල් සහ නඩු ගාස්තු වශයෙන් සභාව විසින් ගෙවූ රු. මිලියන 11.60ක් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට 2024 වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. |
| මහරගම නගර සභාව | ඉකුත් වර්ෂය අවසානයට පැවති රු. මිලියන 243.2ක් වූ හිඟ වරිපනම් හා බදු ශේෂයෙන් 2024 දෙසැම්බර් 31 දිනට ආදායම් සම්බන්ධ ප්‍රගති වාර්තා අනුව රු. මිලියන 78.6ක් පමණක් අය කර ගෙන තිබූ අතර රු. මිලියන 164.6ක් හෙවත් සියයට 67ක් අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. |
| කොළොන්නාව නගර සභාව | 2024 වර්ෂය අවසාන දිනට හිඟහිටි වරිපනම් රු. මිලියන 80.1ක් වූ අතර සභාවට අයත් කඩ කාමර 164කින් එදිනට ලැබිය යුතු කඩකුලී ශේෂය රු. මිලියන 7.8ක් විය. |
| හෝමාගම ප්‍රාදේශීය සභාව | මීගොඩ ආර්ථික මධ්‍යස්ථානය වෙනුවෙන් සාවද්‍ය ලෙස බිල්කර තිබූ රු. මිලියන 6ක කුලී මුදල හා රු.මිලියන 183ක දඩ මුදල වශයෙන් මුළු මුදල රු. මිලියන 189ක් ගිවිසුම් නිවැරදි කිරීමකින් හා ආණ්ඩුකාරවරයාගේ අනුමැතියකින් තොරව පාලන කමිටු අනුමැතිය පමණක් ලබාගෙන 2024 වර්ෂයේ ආදායමෙන් කපාහැර තිබුණි. |
| | ජල්තර ආදාහනාගාරය ඉදිකිරීම සඳහා 2019 වර්ෂයේදී ආයතනයකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබූ අතර ඒ වන විටත් ආදාහනාගාරය ඉදිකිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය ලැබී නොතිබුණි. පළමු අදියර යටතේ රු.මිලියන 3.5ක් ගෙවා තිබුණු අතර. දෙවන අදියර යටතේ රු.මිලියන 3.36ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. එහෙත් ව්‍යාපෘතිය අතරමග නතරකොට කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතුවලින් ඉවත් වී තිබූ අතර |

කොන්ත්‍රාත්තු කාර්යසාධන සුරක්ෂණයද 2024 මැයි 10 දින කල්ඉකුත් වී තිබුණි.

## ගම්පහ දිස්ත්‍රික්කය

**ගම්පහ මහා නගර සභාව**

ගම්පහ මහා නගර සභා සීමාව තුළ එක් සිනමා ශාලාවකින් අයකර ගතයුතු වර්ෂ 5ත් 10ත් අතර හිඟ විනෝද බදු රු.මිලියන 3.85ක ශේෂය සම්බන්ධයෙන් පවරන ලද නඩුවෙහි තීන්දුව ලබා දී වර්ෂ 2ක් ගතවුවද 2025 මාර්තු 15 දින වන විටත් එම මුදල් අය කර ගෙන නොතිබුණි.

ගම්පහ මහා නගර සභාවේ කොළඹ නුවර පාර පුළුල් කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් යක්කල උපකාර්යාලයෙන් බිම් කොටසක් අත්පත් කර ගැනීම සම්බන්ධව පවරා ඇති නඩුවෙන් රු.මිලියන 4.62ක වන්දි මුදල සහ පොළී මුදල සභාවට ලබාදෙන ලෙස 2024 දෙසැම්බර් 12 දින දිසා අධිකරණයේදී නියෝගයක් ලබාදී තිබුණද, වන්දි මුදල සහ පොළිය 2025 මැයි 15 දින වන විටත් ලබාගෙන නොතිබුණි.

ගම්පහ නගර මධ්‍යයේ පිහිටා ඇති පර්චස් 15ක ඉඩමේ පිහිටි රු.මිලියන 6ක් වූ ප්‍රජා ශාලාව ප්‍රජා කටයුතු සඳහා භාවිතා නොකිරීම මත එහි අනවසරයෙන් පුද්ගලයින් පදිංචි වී සිටින බව නිරීක්ෂණය වූ අතර රු.මිලියන 3.96ක් වූ නගර සභා ක්‍රීඩා පිටියේ ප්‍රේක්ෂකාගාරයෙහි, කාමර 4කින් 3ක් බාහිර පාර්ශවයන් විසින් අනවසරයෙන් කායවර්ධන උපකරණ සහ වෙනත් උපකරණ දමා වසා දමා තිබුණු අතර මෙහි විදුලි හා ජල බිල්පත් නගර සභාව විසින් ගෙවීම් කර තිබුණද පාලනය නගර සභාවෙන් බැහැර වී තිබුණි.

**මීගමුව මහා නගර සභාව**

සභාව සතු තලාහේන මාතෘ සායනය පිහිටි භූමියේ තලාහේන උපකාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් 10 දින සිට 2025 මැයි 30 දින දක්වා ආණ්ඩුකාර අනුමැතියක් ලබාගැනීමකින් හෝ කිසිදු ඉදිකිරීමක් සිදුකිරීමකින් තොරව උපදේශන ගාස්තු සහ පස් පරීක්ෂණ ගාස්තු ලෙස එකතුව රු. මිලියන 3.81ක් ගෙවා තිබුණි.

වානිජ පහසුකම්වලින් යුත් දෙමහල් පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම් සිදුකරන ලද මුල් කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් ගිවිසුම් අවලංගු කර තිබුණි. එසේ වුවද රු.මිලියන7.85ක් වූ කාර්යසාධන බැඳුම්කරය මුදල් කර නොගැනීම හේතුවෙන් සභා අරමුදලට ලැබිය යුතු රු. මිලියන7.85ක මුදල හා 2019 නොවැම්බර් 20 දින සිට ඒ මත ප්‍රතිලාභ අහිමි වී තිබුණි. තවද, මෙම ඉදිකිරීම් රු. මිලියන 157කට 2017 ජුනි 23 දින අවසන් කළ යුතුව තිබුණද, ඉදිකිරීම් අතරමඟ නතර කිරීම නිසා 2024 සැප්තැම්බර් 09 දින ඉතිරි කොටස් සම්පූර්ණ කරන ලද කොන්ත්‍රාත්කරුට ඉහල උද්ධමනය මත මිල විචලනයන් ද සහිතව රු. මිලියන 206ක් ද ලෙස සම්පූර්ණ දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීමට රු.මිලියන 313ක් ගෙවීමට සිදුවී තිබුණි.

මහා නගර සභාව 2023 ජනවාරි 18 දින කාමච්චෝඩය ඩඩ්ලි සේනානායක මධ්‍යම වෙළඳපොල ගොඩනැගිල්ල මහල් 04කින් යුතුව ඉදිකිරීම සඳහා රු. මිලියන 479කට, 2023 ඔක්තෝබර් 12 දින ඉදිකිරීම් නිම කිරීමට ගිවිසුම්ගතවී තිබුණි. කොන්ත්‍රාත්තුවේ වැඩ සියයට 50ක ප්‍රමාණයකට සීමා කර තිබියදී ගිවිසුම්ගත මුළු අගය වූ රු. මිලියන 479ක් පදනම් කරගෙන රු. මිලියන 99ක අත්තිකාරම් ගෙවා තිබීමෙන්, රු. මිලියන 51ක අධි ගෙවීමක් සිදුකර තිබුණි.

**කටුනායක නගර සභාව**

2023 පෙබරවාරි 10 දින ලියාපදිංචි කරන ලද අංක 1443 දරන පර්චස් 88.82ක් වූ ඉඩමේ අවම වෙන්දේසි වටිනාකම රු. මිලියන 111ක් ව තිබියදී රු.100,000ක වටිනාකමකට එම ඉඩම ලියාපදිංචි කර තිබීම නිසා 2006 අංක 12 දරන මුද්දර බදු පනත (විශේෂ ප්‍රතිපාදන) අනුව සියයට 2ක අනුපාතිකය මත රු.මිලියන110ක් සඳහා සභා අරමුදලට ලැබිය යුතු වන මුද්දර බදු ආදායම් රු.මිලියන 2.2ක් අහිමි වී තිබුණි.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් අම්බලම්මුල්ල අක්කර 10ක පමණ වූ වගුරු ඉඩමකට සභා බල ප්‍රදේශයේ සියයට 75කින් දෛනිකව එකතු කරනු ලබන දිරන කසල ට්‍රැක්ටර් ලෝඩ් 25ක් සහ නොදිරන ආහාර ඇසුරුම් වැනි පොලිතින් ඇසුරුම්ද සහිතව වර්ෂ ගණනාවක සිට බැහැර කර තිබූ අතර, වාර්ෂිකව දළ එකතුව වන යකඩ කිලෝ ග්‍රෑම් 12000ක්, ප්ලාස්ටික් කිලෝ ග්‍රෑම් 18000ක්, වීදුරු කිලෝ ග්‍රෑම් 6000ක් සභාව විසින් බාහිර පාර්ශවවලට වෙන්කර අලෙවි කර ගැනීමට අවස්ථාව සලසා තිබුණි.

**ජා-ඇල නගර සභාව**

1986 මාර්තු 10 දිනැති අංක 392/9 දරන ගැසට්පත්‍රයෙන් ප්‍රකාශ කරන ලද නාගරික සංවර්ධන අධිකාරි සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි අංක 22 අනුව හෙක්ටයාර් 01කට වැඩි ඉඩම් අනු බෙදීම් කරනු ලබන විටදී ප්‍රජා හා ක්‍රීඩා, විනෝද කාර්යයන් සඳහා මාර්ග හැර ඉතිරි ඉඩම් ප්‍රමාණයෙන් සියයට 10කට නොඅඩු බිම් ප්‍රමාණයක සුදුසු ස්ථානයක් ලබා දිය යුතු බව නිශ්චිතව දක්වා තිබියදී ජා-ඇල නගර සභාව, මෙම වගන්තිය උල්ලංඝණය කරමින් ලේක් සිටි ඉඩම අනුබෙදීමෙන් කැබලි 05ක් ඉහත නිශ්චිතව දක්වා ඇති අරමුණට භාවිතා කළ නොහැකි සහ දේපල වෙන්දේසිකරුට අලෙවි කළ නොහැකි කොටස් වන අක්කර 01 රූඩ් 03 පර්චස් 0.26ක වැවක් හා කැබලි කිරීමෙන් අනතුරුව ශේෂ වන ත්‍රිකෝණාකාර වැනි කොටසක් ද චේතාන්විතව පොදු ඉඩම් කොටස ලෙස එකතුව අක්කර 03 රූඩ් 01 පර්චස් 20.98ක් ලබා දී තිබුණි.

ජෛව හායනයට ලක්වන හා නොවන ලෙස කසළ වෙන් කිරීම් කරනු ලැබුවද නැවත අලෙවි කළ හැකි පොලිතින්, වීදුරු, යකඩ, ප්ලාස්ටික්, ගොඩනැගිලි ද්‍රව්‍ය ලෙස වර්ගීකරණය කර වෙන් නොකිරීම හේතුවෙන් ජා-ඇල නගර සභාවට ලබාගත හැකි ආදායමක් වෙනත් පාර්ශ්ව විසින් ලබා ගන්නා අතර සුදුවැල්ල කසළ අංගනය පවතින අක්කර 11ක පමණ ඉඩම 2024 සැප්තැම්බර් 13 දින පරීක්ෂා කිරීමේදී මුළු ඉඩම පුරාම ජෛව හායනයට ලක් නොවන ආහාර ඇසුරුම් ද්‍රව්‍ය, පොලිතින් බෑග් ලෙස මිශ්‍ර කසල මුළු ඉඩම පුරාම අවිධිමත් පරිදි බැහැර කර තිබුණි.

**පෑලියගොඩ නගර සභාව**

2021 වර්ෂයේදි පෑලියගොඩ නගර සභාව විසින් මල්ශාලාවක් ලෙස භාවිතා කිරීම සඳහා මහල් 04කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට තීරණය කර තිබූ අතර, ඒ අනුව ඇස්තමේන්තු සකස් කර උපදේශන සේවා ආයතනයක් තෝරාගෙන මූලික කාර්යයන් ආරම්භ කර රු.මිලියන 28ක් වූ ගෙවීම් කර තිබුණි. එසේ වුවද 2022 වර්ෂයේදි එම ව්‍යාපෘතිය නවතා දමා තිබුණු අතර ඒ හේතුවෙන් සභාව වෙත කොන්ත්‍රාත් සමාගමෙන් රු. මිලියන 19.9ක් ආපසු අයකර ගැනීමට හැකිව තිබියදී රු. මිලියන 8ක මුදලක් සභාවට අහිමි වී තිබුණි.

**අත්තනගල්ල ප්‍රාදේශීය සභාව**

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ජල නල යොදා පළුදු වූ මාර්ග 2ක් කොන්ක්‍රීට් කිරීම සඳහා ජල සම්පත් හා ජලාප්‍රවාහන මණ්ඩලය මගින් 2019 වර්ෂයේ ලබාදී තිබුණු රු.මිලියන 30.86ක්ද, 2023 වර්ෂයේදී ලබා දී තිබුණු රු.මිලියන 1.88ක්ද, අරමුණුගත කාර්යයට නොයොදා 2021 වර්ෂයේදී රු.මිලියන 10ක් ස්ථාවර තැන්පතුවක තැන්පත් කර ඉතිරිය සභාවේ වියදම් ප්‍රතිපූර්ණය සඳහා යොදවාගෙන තිබුණි. 2023 සහ 2024 වර්ෂවලදී එම මාර්ග 2ක සංවර්ධනය සඳහා රු.මිලියන 28.81ක් ගෙවීම් කර තිබුණු අතර මුදල් ලද වර්ෂවලදීම සංවර්ධන කටයුතු නොකිරීම හේතුවෙන් මීටර් 1400ක පමණ ප්‍රමාණයක වැඩ නිමකළ නොහැකි වී තිබුණි.

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ රු.මිලියන 0.99ක් වූ නිමකරන ලද ගොඩනැගිලි 2ක් සහ රු. මිලියන 5.91ක් වූ අර්ධ වශයෙන් නිමකරන ලද ගොඩනැගිලි 6ක් නිෂ්කාර්යව පැවති අතර, රු.මිලියන 8.39ක්වූ ගොඩනැගිලි 8ක ස්ලැබ් වහලය පමණක් යොදා තිබුණි.

**බියගම ප්‍රාදේශීය සභාව**

බියගම ප්‍රාදේශීය සභාව සතුව තිබූ ආයුර්වේද ගොඩනැගිල්ල නවීකරණය සඳහා 2023 වර්ෂය දක්වා ප්‍රාදේශීය සභා අරමුදලින් රු.මිලියන 38.75ක් වැයකර තිබුණු අතර ගොඩනැගිල්ල ජලයෙන් යටවන තත්ත්වය හේතුවෙන් ඉදිකිරීම් කර වසර 04ක් ගතවී තිබුණත් 2025 ජනවාරි 29 දිනය වන විටත් අරමුණුගත කාර්ය සඳහා භාවිතයට ගෙන නොතිබුණි.

බියගම ප්‍රාදේශීය සභාවේ මාකොළ බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම 2002 වර්ෂයේ ආරම්භ කර වසර 23ක් ගත වී 2025 වර්ෂය වන විට ඉදිකිරීම අවසන් කර තිබුණද, රු.මිලියන 479.09ක්වූ ලී බඩු හා සවිකිරීම් සහිත ගොඩනැගිල්ල, 2025 ජූනි 18 දින වන විටත් නිෂ්කාර්යව තිබුණි.

**මීරිගම ප්‍රාදේශීය සභාව**

ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ පුර නැගුම ව්‍යාපෘතිය මගින් රු.මිලියන 26.76ක් වැයකර 2019 වර්ෂයේදී සභා භූමියේ ඉදි කරන ලද, පානීය ජල ව්‍යාපෘතිය වැඩ අවසන් කර වර්ෂ 5ක් ඉක්මවීමටත් පෙර ජල මූලාශ්‍රය සිඳීයාම නිසා අසාර්ථක වී තිබුණි. මේ හේතුවෙන් සභාවට අයත් ජල බවුසර් මගින් ව්‍යාපෘතියට ජලය සැපයීම සඳහා 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ඉන්ධන වියදම රු.මිලියන 1ක් දරා තිබීමත්, බිල් කළ ජල ගාස්තු රු.මිලියන 0.99ක්

සහ එයින් රැස්කළ ආදායම රු.මිලියන 0.63ක් වී තිබීමත්, ජල බවුසර් වෙනත් සේවා සඳහා යොදවා ගැනීමට නොහැකිවීමත් නිරීක්ෂණය විය.

**දිවුලපිටිය ප්‍රාදේශීය සභාව**

ඉඩම්, පොදු ළිං සහ පොදු සුසාන භූමි ආදී දේපළ 281ක එකතු වටිනාකම වූ රු. මිලියන 493කට අදාලව හිමිකම තහවුරු කර ගැනීම සඳහා 2024 වර්ෂය අවසාන වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**ජා-ඇල ප්‍රාදේශීය සභාව**

ජා-ඇල ප්‍රාදේශීය සභාවේ 2023 ජූලි 10 දින වත්කම් කළමණාකරන හා ප්‍රත්‍යාගණන කමිටු වාර්තාව අනුව මුළු දේපල 176කින් ඔප්පු සකස් කළ යුතු පිඹුරු ඇති දේපල 18ක් ද පිඹුරු සකස් කළ යුතු ඔප්පු ඇති දේපල 20ක් ද ඔප්පු හා පිඹුරු සකස් කළ යුතු දේපල 76ක් ද ගැටළු සහිත දේපල 19ක් ද හඳුනාගෙන තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**කැළණිය ප්‍රාදේශීය සභාව**

කැළණිය ප්‍රාදේශීය සභාවට අයත් පර්චස් 47.85ක භූමි ප්‍රමාණයක ඉදිකර ඇති මහල් දෙකකින් යුතු කඩ කාමර 36ක නව ගොඩනැගිල්ලේ පහත මහලයේ හා ඉහල මහලයේ කඩ කාමර 14ක් ගිවිසුම්වලට පටහැනිව වසා දමා තිබුණි.

**වත්තල ප්‍රාදේශීය සභාව**

විනය නියෝගයක් පරිදි වත්තල ප්‍රාදේශීය සභාවේ සේවය කරන ලද කළමනාකරණ සේවා නිලධාරිනියකගෙන් රු. මිලියන 68ක් අයකර ගැනීමට පැවතියද 2024 වර්ෂය අවසන් වන විටත් අය කරගෙන නොතිබුණි.

වත්තල ප්‍රාදේශීය සභාව භාවිතා කරන ඉඩම් 164කින් ඉඩම් 75ක් සඳහා ඔප්පු ද ඉඩම් 63කට අදාලව පිඹුරුපත් ද නොමැති වීමෙන් එම ඉඩම් වෙනත් පාර්ශවයන් විසින් අනවසරයෙන් භාවිතා කිරීමේ අවධානමක් පැවතිණි.

## කළුතර දිස්ත්‍රික්කය

**කළුතර මහා නගර සභාව**

2020 වර්ෂයේ රු.මිලියන 241ක් වැය කර ඉදි කරන ලද සුපිරි වෙළඳ සංකීර්ණ දෙමහල් ගොඩනැගිල්ල 2024 වර්ෂය දක්වාම නිෂ්කාර්යව පැවති අතර එහි ඉහළ මහලේ සිවිලිම තැනින් තැන කැඩී ගොස් තිබුණු අතර 2019 වර්ෂයේ රු.මිලියන 14.46ක් වැය කර කායවර්ධන

මධ්‍යස්ථානයක් සඳහා ඉදි කරන ලද දෙමහල් ගොඩනැගිල්ල 2024 වර්ෂයේ දී ද නිශ්කාර්යව පැවතුණි.

| | |
|---|---|
| **බේරුවල නගර සභාව** | බහු කාර්ය පදනම මත සභාවට බඳවා ගන්නා ලද සේවකයින් 10 දෙනා අතරින් සේවකයින් 07ක්ම බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ නියෝග පරිදි වෙනත් රජයේ ආයතනවලට අනුයුක්ත කර සභාව විසින් 2024 වර්ෂයේ වැටුප් ලෙස රු. මිලියන 0.65ක් ගෙවා තිබුණි.<br>බේරුවල නගර සභාව විසින් 2019 අගෝස්තු 26 දින 2020 ජනවාරි 13 දින හා 2020 ජුනි 03 යන දිනයහිදී පිළිවෙලින් රු. මිලියන 4.59ක්, රු. මිලියන 2.99ක් හා රු. මිලියන 4.35ක් ලෙස එකතුව රු.මිලියන 11.94ක් වූ පරිගණක මෘදුකාංග පද්ධති 28ක් පුද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණද ක්‍රීඩාපිටි පහසුකම් සහ නගර ශාලාවක් නොතිබීමෙන් රු. මිලියන 0.45ක් බැගින් එකතුව රු.මිලියන 0.9ක් වැය කළ අන්තර්ජාලය හරහා ක්‍රීඩාපිටි හා නගර ශාලා වෙන් කිරීමේ මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබුණි. |
| **හොරණ නගර සභාව** | පිරිවැය ප්‍රතිලාභ පිළිබඳ විශ්ලේෂණය කර ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමකින් තොරව 2019 දෙසැම්බර් 22 දින පුද්ගලික සමාගමක් වෙතින් රු.මිලියන 4.0ක් ගෙවා මිලදී ගෙන තිබුණු පරිගණක මෘදුකාංග පද්ධති 06 තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණි. |
| **පාලින්දනුවර ප්‍රාදේශීය සභාව** | සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා පත් කර තිබූ සෞඛ්‍ය කම්කරු සේවිකාව, 2023 ජූලි 07 දින සිට පාලින්දනුවර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ සේවයට යොදවා සභාව විසින් සමාලෝචිත වර්ෂයේ වැටුප් ලෙස රු. මිලියන 0.57ක් ගෙවා තිබුණි.<br>2023 වර්ෂයේ රු. මිලියන 2.99ක් වැය කර නල එලීම සිදු කරන ලද උඩුවන්කන්ද කපුගෙදර ප්‍රදේශයේ ජල ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂයේද නල එලීම හා ටැංකි ඉදි කිරීම සඳහා එකතුව රු. මිලියන 5.99ක් වැය කර තිබුණද 2024 වර්ෂය අවසාන වන විටත් ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. |

| | |
|---|---|
| **වලල්ලාවිට ප්‍රාදේශීය සභාව** | සභාව සතු කැබ් රථයක් , ජේ.සී.බී. යන්ත්‍රයක් වර්ෂ 04ක සිට ද, තවත් ට්‍රැක්ටර් රථ 02ක් අවුරුදු 07කට අධික කාලයක සිට ද අළුත්වැඩියා කිරීමකින් තොරව නිශ්කාර්යව පැවතුණු අතර 2015 මාර්තු 06 දින පළාත් පාලන අමාත්‍යාංශයෙන් පරිත්‍යාගයක් ලෙස සභාවට ලැබුණු රු. මිලියන 1.6ක් වටිනාකමින් යුතු කම්පැක්ටර් රථය එදින සිට සභාව විසින් භාවිතයට ගැනීමෙන් තොරව සභා පරිශ්‍රයේ පැවතුණි. |
| **දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව** | දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව සඳහා 1970 අප්‍රේල් 09 දින පැවරුම් නියෝගයක් මගින් සුසානභූමියක් ලෙස පවරා දෙන ලද අංක 808 තුඩුගල බටහිර ග්‍රාම නිලධාරි වසමේ අක්කර 03 පර්චස් 26ක් ප්‍රමාණගත කටුකුරුදුගල්පොත ඉඩමේ ජී.පී.ඒ.166 කැබලි අංක 02 තුල වර්ෂ 10කට පෙර සිට පාර්ශව 02ක් විසින් ස්ථිර නිවාස සාදා අක්කරයක පමණ ප්‍රදේශයක ගම්මිරිස් වගාවක් ද සිදු කරමින් පැවති අතර 2024 දෙසැම්බර් 31 වන දින වන විටත් එය නිරවුල් කරගෙන සභාව සතු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **හොරණ ප්‍රාදේශීය සභාව** | 2021 අප්‍රේල් 01 දින රු.මිලියන 85ක වියදමකින් වැඩ නිම කරන ලද කසළ දාහකයෙන් අධික දුමාරයක් පිටවීම සම්බන්ධයෙන් සභාව ක්‍රියාමාර්ග නොගැනීම නිසා 2023 වර්ෂයේ සිට නිශ්කාර්යව පැවතුණි. කසළ දහනාගාරය ඉදි කරන ලද පරිශ්‍රය තුල නොදිරන කසළ විශාල ප්‍රමාණයක් වර්ග කිරීමකින් තොරව එක් රැස් කර තිබුණද, කසළ බේල් කිරීම සඳහා වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| **බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව** | බණ්ඩාරගම ප්‍රාදේශීය සභා පරිපාලනය යටතේ ඇති සුසාන භූමි 25 අතරින් සුසාන භූමි 16ක හිමිකම සභාව වෙත පවරාගෙන නොතිබුණි. |
| **මදුරාවල ප්‍රාදේශීය සභාව** | 2016 දෙසැම්බර් 31 දින කැබ් රථයක එන්ජිමට සිදු වී තිබුණු හානිය ප්‍රතිපූර්ණය සඳහා රු.මිලියන 1.16ක් සභාව විසින් වැය කළද වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **බුලත්සිංහල ප්‍රාදේශීය සභාව** | 2023 වර්ෂයේ එකතුව රු.මිලියන 2.49ක් වැය කර සංවර්ධනය කරන ලද බුලත්සිංහල ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනය 2024 වර්ෂය අවසාන වන විටත් සභාව වෙත පවරාගෙන නොතිබුණි. |

ඇගල්ඔය බහුකාර්ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල තුල පැවති ප්‍රේක්ෂකයන් 450ත් 500ත් අතර ප්‍රමාණයක් එකවර අසුන් ගැනීමට හැකි ශ්‍රවනාගාරය 2019 වර්ෂයේ සිට නිශ්කාර්යව පැවතුණි.

**මිල්ලනිය ප්‍රාදේශීය සභාව**

සභාවේ කොම්පොස්ට් පොහොර නිපදවීම සඳහා 2021 වර්ෂයේදී රු.මිලියන 7.69ක් වැය කර සවි කරන ලද කොම්පොස්ට් පොහොර නිෂ්පාදිත යන්ත්‍රයට පැයකට ටොන් 01ක පොහොර නිෂ්පාදන හැකියාවක් පැවතියද එම උපරිම ධාරිතාවය උපයෝගී කරගෙන පොහොර නිෂ්පාදනය සිදුකර නොතිබුණි.

**මතුගම ප්‍රාදේශීය සභාව**

මතුගම පොදු වෙළඳපොල කඩ 41ක් ද මැද මිදුල කඩ 04ක් ද මාළු කඩ 06ක් ද වර්ෂ 06කට අධික කාලයක සිට ගිවිසුම් අළුත් කිරීමකින් තොරව පවත්වා ගෙන ගොස් තිබුණු අතර සභාව සතු කඩ කාමර 89ක් හා මාළු කඩ 11ක්ද , වැලිපැන්න උප කාර්යාලයේ කඩ 34ක් ද සභාව සමඟ ගිවිසුම්ගත වීමකින් හා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට ඉඩකඩ සලසා දී තිබුණි.

සභාව සතු අක්කර 07 රූඩ් 01 පර්චස් 11.4කින් යුත් පොත් වටිනාකම රු.මිලියන 20.5ක්වූ මතුගම වත්ත ඉඩමේ සභාවේ සේවකයින් නොවන පිරිසක් විසින් ඉදිකර තිබුණු අනවසර නිවාස 11ක් සම්බන්ධයෙන් සභාව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව නිවෙස් හිමියන්ගෙන් වරිපනම් අය කර තිබුණි.

සභාව සතු පරිශ්‍රයක 2022 වර්ෂයේ බාහිර පාර්ශව විසින් කඩ කාමර 19ක් ඉදිකර 2024 වර්ෂය අවසාන වනතුරුත් කුලී ගෙවීමකින් තොරව කඩ පවත්වාගෙන යාමට එරෙහිව සභාව නීත්‍යානුකූලව කටයුතු කර නොතිබූ අතර සභාවට ආදායමක් අහිමි කිරීමට කටයුතු කරන ලද වගකිව යුතු පාර්ශවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව 2024 වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

**බේරුවල ප්‍රාදේශීය සභාව**

පරිසර බලපත්‍ර ලබා නොගත් ආයතන සඳහා වෙළඳ බලපත්‍ර ලබා දීමට සපුරාලිය යුතු අවශ්‍යතා දක්වමින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා ආඥා පනතේ 122 වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා සකස් කර නොතිබුණු අතර ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය අනුව සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා යොදා ගන්නා හෝටල්

සම්බන්ධයෙන් බලපත්‍ර ගාස්තු අය කර ගැනීමට අදාල අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර ගැනීමට ද ක්‍රියා කර නොතිබුණි.

බේරුවල ප්‍රාදේශීය සභාවේ විශාල වශයෙන් රැස් වන කසළ බැහැර කිරීම සඳහා දිගුකාලීන ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබීම නිසා 2024 වර්ෂය තුල කසළ කළමනාකරණය වෙනුවෙන් රු.මිලියන10.86ක් වැය කර තිබුණි.

2023 ජුනි මස සිට සභාවට අනුයුක්ත කරන ලද කම්කරුවන් 30ක් 2024 වර්ෂය අවසානය දක්වා වෙනත් රජයේ කාර්යාලවල සේවය කර තිබූ අතර ඒ සඳහා වැටුප් ලෙස සභා අරමුදලින් රු.මිලියන 17.38ක් ගෙවා තිබුණි.

ප්‍රධාන කාර්යාලය හා උපකාර්යාල සඳහා අවශ්‍ය කරන මෘදුකාංග පද්ධති 17ක් මිලදී ගැනීම සඳහා 2018 මාර්තු මස බේරුවල ප්‍රාදේශිය සභාව විසින් පුද්ගලික ආයතනයක් සමඟ එළඹි ගිවිසුම අනුව රු.මිලියන 0.49ක්, වූ වැටුප් කළමනාකරණ පද්ධතිය සහ රු. මිලියන 0.27ක් වූ අන්තර්ජාලය හරහා ගාස්තු ගෙවා වෙන් කර ගැනීමේ වෙබ් අඩවි පද්ධතිය 2024 දෙසැම්බර් 31 දින වන විටත් පරිගණක පද්ධතිය තුල ස්ථාපිත කර නොතිබුණි. එමෙන්ම සියළු ගිණුම් කළමනාකරණ පද්ධතිය, මානව සම්පත් කළමනාකරණ පද්ධතිය හා තොග ගබඩා කළමනාකරණ පද්ධතිය වෙනුවෙන් පිළිවෙලින් රු. මිලියන 0.49ක් රු. මිලියන 0.29ක් හා රු. මිලියන 0.69ක් ගෙවා තිබුණද එම මෘදුකාංග සභාව විසින් 2024 වර්ෂය අවසාන වන තුරුත් භාවිතයට ගෙන නොතිබුණි.

සභා අරමුදලට සිදුකර තිබුණු රු. මිලියන 0.86ක් පාඩුවට අදාළව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) උප වගන්තිය ප්‍රකාරව විගණකාධිපති විසින් අධිභාර සහතිකයන් මගින් අධිභාර පනවා තිබුණ ද 2024 වර්ෂය අවසාන වන විටත් පළාත් පාලන කොමසාරිස් විසින් අධිභාර අයකර ගැනීමට ක්‍රියා කර නොතිබූ අතර ප්‍රාදේශීය සභාව ද ඒ පිළිබඳ සිහි කැඳවීම් කර සභා අරමුදලට අලාභ අයකර ගැනීමට ක්‍රියා කර නොතිබුණි.

## දකුණු පළාත

**ගාල්ල මහා නගර සභාව**

පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ රු. මිලියන 244.19ක ප්‍රතිපාදන යටතේ ගාල්ල මහා නගර සභාව විසින් 2023 වර්ෂයේ දී ආරම්භ කර තිබුණු කවෂිමා කොම්පෝස්ට් නිෂ්පාදනය ව්‍යාපෘතිය 2024 වර්ෂය අවසානය දක්වා ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණ අතර කසළ කළමනාකරණය ද විධිමත් පරිදි සිදු නොවන බව නිරීක්ෂණය විය.

**වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂයේ දී පුර නැගුම ව්‍යාපෘතිය මඟින් රු.මිලියන 34.77ක ප්‍රතිපාදන යටතේ වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ ඉදිකර තිබුණු දෙමහල් ගොඩනැගිල්ලට ආබාධිත පුද්ගලයන්ට ප්‍රවේශ වීමට සවිකර ඇති විදුලි සෝපානයෙහි, ආබාධිත පුද්ගලයන්ට ප්‍රවේශ විය හැකි ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති බවත් එය භාවිතා නොකර නිශ්කාර්යව පවතින බවත් නිරීක්ෂණය විය.

**හම්බන්තොට මහා නගර සභාව**

හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශයට අයත් හම්බන්තොට වරාය පිහිටි විශේෂ දේපල තක්සේරු කිරීම් කටයුතු 2017 වර්ෂයේ සිට 2024 වර්ෂය අවසානය දක්වා වසර 07ක කාලයක් ප්‍රමාද වෙමින් පැවතීම හේතුවෙන් වරිපනම් බදු ආදායම් ප්‍රමාද වෙමින් පැවතුණි. 2025 වර්ෂයේ රජයේ තක්සේරු වාර්තා අනුව 2017 වර්ෂයට අදාළව දේපලෙහි වාර්ෂික වටිනාකම රු.මිලියන 2,030.77ක් වූයෙන් වාර්ෂික වරිපනම් බදු ආදායම රු.මිලියන 142.15ක් බව නිරීක්ෂණය විය.

**ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව**

2019 වර්ෂයේ දී රු.මිලියන 18 ක් වැයකර ඉදිකර තිබුණු ලුණුගම්වෙහෙර බස් නැවතුම්පොළ ගොඩනැගිල්ලෙහි බොජුන්හලක් පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීය සභාව වෙත පරිහරණ අයිතිය පැවරීමට අදාළව 2022 වර්ෂයේ දී ප්‍රාදේශීය සභාව හා දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය අවබෝධතා ගිවිසුමකට එළඹී වර්ෂ 03ක් ගතවී ඇතත්, එසේ කටයුතු කර නොතිබුණ අතර ලුණුගම්වෙහෙර නව බස් නැවතුම්පොළ ගොඩනැගිල්ල වසර 06ක සිට නිශ්කාර්යව පැවතුණි.

**තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව**

නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂයේ දී තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට භාර දී තිබුණු බහුකාර්යය ගොඩනැගිල්ලෙහි පිහිටි කඩ කාමර 48 න් 41ක් සඳහා 2023 වර්ෂයේ දී බදුකරුවන් ගෙන් රු.මිලියන 96.15ක එක්වන් මුදල් අයකර ගෙන තිබුණ ද 2024 වර්ෂය අවසන් වන විටත් එම කඩ කාමර බදු කරුවන් වෙත භාර දීමට කටයුතු කර නොතිබුණි.

**තංගල්ල නගර සභාව**

නගර සභා ආඥා පනතේ 227(1) වගන්තියට අනුකූල නොවන ලෙස, 2008 සිට 2023 වර්ෂයේ මාර්තු 18 දක්වා තංගල්ල නගර සභාවේ සභිකයෙකු ලෙස කටයුතු කළ පුද්ගලයෙකු විසින් සභාවට අයත් බස් නැවතුම්පොළ අංක S-01 දරන කඩ කාමරයේ බදුකරු වශයෙන් කටයුතු කර තිබුණු අතර එම කාල සීමාව වෙනුවෙන් ඔහුට ගෙවන ලද එකතුව රු.මිලියන 1.86ක් වූ දීමනාවල වටිනාකම සහ එම කඩ කාමරය වෙනුවෙන් 2024 වර්ෂය අවසානය වන තෙක් සභාවට ලැබිය යුතු කඩකුලී හා දඩ මුදල් රු.මිලියන 1.01ක් අයකර ගෙන නොතිබුණි.

නගර සභාවේ පට්ටියපොළ කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ කසළ අට්ටි ගැසීමේ කටයුතු සඳහා 2020 වර්ෂයේ දී රු.මිලියන 1.55ක් වැයකර විවෘත අංගනයක් ඉදිකිරීම ආරම්භකර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම කාර්ය අතරමඟ නවතා දමා තිබූ බැවින් ඒ සඳහා වැයකරන ලද මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

**කටුවන ප්‍රාදේශීය සභාව**

කටුවන ප්‍රාදේශීය සභාව විසින් වටිනාකම රු.මිලියන 36.34ක් වූ කිරම කඩකාමර සහිත බස් නැවතුම්පළ ගොඩනැගිල්ලේ ඉහල මහල වර්ෂ 05ක කාලයක සිට බදු දීමට කටයුතු නොකිරීම නිසා එකී වත්කම් වලින් ආදායම් ඉපයීමකින් තොරව ඌන උපයෝජිතව පැවතුණි.

**දෙවිනුවර ප්‍රාදේශිය සභාව**

දෙවිනුවර ප්‍රාදේශිය සභාව විසින් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට පොත් ලබා දීමේ වැඩසටහන් සඳහා රු.මිලියන 4.70ක් වූ පොත් 20,200 ක් ලබා ගැනීමේ දී , 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා

පරිපාලන) රීති 177 හා 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූල නොවී ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව කටයුතු කර තිබුණි.එසේ මිලදී ගත් පොත් නියමිත GSM අගයට වඩා අඩු මට්ටමක පැවති අතර, 2024 වර්ෂය අවසන් වන විටත් ගබඩාවේ නිශ්කාර්යව පැවතුණි.

| | |
|---|---|
| **පිටබැද්දර ප්‍රාදේශීය සභාව** | 2017 වර්ෂයේ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් මොරවක පොළ භූමියේ ඉදිකර තිබුණු නළ ළිං දෙකෙහි ජලය පාරිභෝජනයට නුසුදුසු තත්ත්වයක පැවතිය දී එම ජලය පිරිපහදු කිරීම සඳහා වැඩ පිලිවෙළක් සකස් නොකර, පිටබැද්දර ප්‍රාදේශීය සභාව විසින් පළාත් නිශ්චිත ප්‍රතිපාදන මත රු.මිලියන 1.03ක් වැය කර ඉදිකර තිබුණු ජල ගබඩා ටැංකිය 2024 වර්ෂය අවසන වන විටත් නිශ්කාර්යව පැවතුණි. |

## මධ්‍යම පළාත - මහනුවර දිස්ත්‍රික්කය

| | |
|---|---|
| **උඩුදුම්බර ප්‍රාදේශීය සභාව** | 2024 වර්ෂය තුළ සිමෙන්ති කි.ග්‍රෑ. 50ක වෙළඳපල මිල රු.1,800ක්ද වී තිබියදී කඳුරට දශකය, පළාත් නිශ්චිත හා ප්‍රාදේශීය සභා අරමුදල මඟින් සිදුකළ ව්‍යාපෘති 33ක මාර්ග හා කාණු ඉදිකිරීමේදී සිමෙන්ති කි.ග්‍රෑ. 50 මිටි 01ක් සඳහා කොන්ත්‍රාත්කරුවන්ට රු.2,200ක විශේෂ මිලක් ලබාදී රු. මිලියන 1.1ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද, වැලි ප්‍රවාහනය සඳහා එකතුව රු. මිලියන 1.1ක්ද වැඩිපුර ගෙවා තිබුණි. |
| **කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව** | අළුත්වත්ත ඝන අපද්‍රව්‍ය ව්‍යාපෘතියේ පොලිතීන් හා ප්ලාස්ටික් මඟින් ඉන්ධනයක් නිපදවීමේ නියමු ව්‍යාපෘතියක් සඳහා 2021 වර්ෂයේ ජනවාරි 28 දින සභාව හා පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම් ගත වී තිබුණි. එහෙත් සමාගමේ ආරවුලක් හේතුවෙන් ව්‍යාපෘතිය අතරමඟ නවතා දමා තිබූ අතර යන්ත්‍රය සවි කිරීම සඳහා රු. මිලියන 29.8ක් වැය කර සභා භූමිය පස් කපා සකස් කර තිබුණි. |
| **පන්විල ප්‍රාදේශීය සභාව** | රු. මිලියන 13.1 ගිවිසුම්ගතව නකල්ස් සංචාරකයින් සඳහා පහසුකම් සපයන මධ්‍යස්ථානයේ ආගන්තුක සත්කාර නිවහනක් ඉදිකිරීමට |

කටයුතු කර තිබුණු අතර 2022 අප්‍රේල් 04 දින වන විට කොන්ත්‍රාත්කරු විසින් රු. මිලියන 5.9ක වැඩ කොටසක් ඉටුකර තිබුණද, පළාත් පාලන අමාත්‍යාංශය විසින් මුදල් ලබා නොදීම හේතුවෙන් ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස් ඉටුකිරීම නවතා දැමීමට සිදුවී තිබුණි.

තවද,2015 වර්ෂයේදී රු. මිලියන 4.4ක් වැයකර ඉදිකර තිබුණු නකල්ස් නිවාඩු නිකේතනය 2024 වර්ෂය අවසාන දින වන විටත් නිෂ්කාර්යව හා ඌන උපයෝජිතව පැවතුණි.

**පාතහේවාහැට ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂයේදී සභා බල ප්‍රාදේශයේ ග්‍රාම නිලධාරී වසම් 09ක් ආවරණය වන පරිදි රු. මිලියන 70.39ක ඇස්තමේන්තුවක් මත වැඩ ආරම්භ කළ අංකෙලිපිටිය මොරගොල්ල ජල ව්‍යාපෘතිය රු. මිලියන 51.16ක් වැය කර 2018 වර්ෂයේ සිට අතරමඟ නවතා දමා තිබුණි. සභා බල ප්‍රදේශයේ උග්‍රජල හිඟයක් පවතින අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීමෙන් මහජනතාව දැඩි සුෂ්කරතාවයන්ට පත්ව තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා මිලදී ගෙන තිබුණු රු. මිලියන 3.6ක් වටිනා ජල මෝටර් 4ක්ද නිෂ්කාර්යව පැවතුණි.

## මාතලේ දිස්ත්‍රික්කය

**දඹුල්ල මහා නගර සභාව**

මහා නගර සභාව විසින් දිගම්පතහා කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ රු. මිලියන 27.69ක පිරිවැයක් දරා ඉදිකල පරිපාලන ගොඩනැගිල්ල 2022 වර්ෂයේ දී විවෘත කර තිබුණ ද, 2024 දෙසැම්බර් 31 දින වන විට ද අපේක්ෂිත කාර්යයට යොදා ගැනීමකින් තොරව නිශ්කාර්යව විනාශවීමට ඉඩහැර තිබුණි. එහි නොදිරන අපද්‍රව්‍ය පිළිස්සීම සඳහා 2020 වර්ෂයේ දී රු. මිලියන 20.98ක වියදමින් ඉදිකළ තාප දාහකය ක්‍රියාවිරහිතව පැවතීම හේතුවෙන් නොදිරන අපද්‍රව්‍ය පිළිස්සීම විවෘත පරිසරයේ සිදු කිරීම හේතුවෙන් අදාළ යන්ත්‍රයෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගෙන නොතිබුණි.

## නැගෙනහිර පළාත - මඩකලපුව දිස්ත්‍රික්කය

**හිඟ බදු කුළී**

මඩකලපුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 10 මගින් 2024 වර්ෂයේ අවසානය වනවිට අයකර ගැනීමට නියමිත බදු කුළී හිඟ ආදායම එකතුව රු.මිලියන 45.8ක් විය.

**නිශ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්**

2024 වර්ෂය අවසානයේ මඩකලපුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 06 තුළ නිශ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්වල එකතු වටිනාකම රු. මිලියන 138ක් විය.

## අම්පාර දිස්ත්‍රික්කය

**හිඟ බදු කුළී**

අම්පාර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 19 මගින් 2024 වර්ෂයේ අවසානය වනවිට අයකර ගැනීමට නියමිත බදුකුළී හිඟ ආදායම් එකතු වටිනාකම රු. මිලියන 163.6ක් විය.

**නිශ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්**

2024 වර්ෂය අවසානයේ අම්පාර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 07 තුළ නිශ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්වල එකතු වටිනාකම රු. මිලියන 50.2ක් විය.

## ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය

**හිඟ බදු කුළී**

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 13 මගින් 2024 වර්ෂයේ අවසානය වනවිට අයකර ගැනීමට නියමිත බදුකුළී හිඟ ආදායම් එකතු වටිනාකම රු. මිලියන 174.9 ක් විය.

**නිශ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්**

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 13 තුළ භාවිතයට නොගත් හෝ ඌන උපයෝජිත වත්කම්වල මුළු ප්‍රමාණය රු.මිලියන 105.1 ක් වී තිබුණි.

## උතුරු පළාත

**හිඟ ආදායම්**

උතුරු පළාතට අයත් පළාත් පාලන ආයතන 34ක 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් හා කුළී ආදායම එකතුව රු. මිලියන 493.34ක් අයකර ගෙන නොතිබුණි.

**අතහැර දමන ලද ව්‍යාපෘති**

මනල්කඩු ප්‍රදේශයේ සංචාරකයින් සඳහා 2016 වර්ෂයේදී පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව විසින් රු. මිලියන 2.80ක වියදමින් නිම කරන ලද ව්‍යාපෘතිය සහ 2014 වර්ෂයේදී වඩමරාඩ්චි නිරිත ප්‍රාදේශීය සභාව විසින් රු. මිලියන 2.99ක් වැයකර වැඩ අවසන් කර තිබූ මුදලයිකුලි පානීය ජල යෝජනා ක්‍රමය සම්පූර්ණයෙන්ම අතහැර දමා තිබුණි.

**රක්ෂණ වන්දි අය කර නොගැනීම**

2020 වර්ෂයේදී යාපනය මහ නගර සභාවේ ගිනි නිවන රථයකට සිදුවූ අනතුර සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලැබිය

යුතු රු. මිලියන 4.19ක වන්දි මුදලක් අයකර ගැනීමට වර්ෂ 04කට අධික කාලයක් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**බලපත්‍ර කාලය දීර්ඝ කිරීමේ ගාස්තු**

2021 ජූලි 21 දිනැති අංක 2235/54 දරන නාගරික සංවර්ධන අධිකාරියේ ගැසට් පත්‍රයේ 11 ඡේදයට පටහැනිව උතුරු පළාත් පාලන ආයතන 17කට අදාළව ගොඩනැගිලි 5,309ක බලපත්‍ර කාලය දීර්ඝ කිරීමේ ගාස්තු එකතුව රු. 32.54ක් 2022 සිට 2024 දක්වා කාලපරිච්ඡේදය සඳහා ගොඩනැගිලි හිමිකරුවන්ගෙන් අයකරගෙන නොතිබුණි.

තවද, 1987 ප්‍රාදේශීය සභා පනතේ 19(XII) වගන්තියට අනුව, පළාත් පාලන අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව, වවුනියාව දකුණ සිංහල ප්‍රාදේශීය සභාව විසින් වාණිජ දේපළ 02ක් 99 අවුරුදු බදු පදනම මත ලබා දී තිබුණි.

**සභාවලට අයත් නොවන ඉඩම්වල ඉදිකිරීම්**

2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 1.1 ඡේදයට පටහැනිව වල්වෙට්ටිතුරෙයි නගර සභාව වඩමරච්චි නිරිත ප්‍රාදේශීය සභාව, චාවකච්චේරි ප්‍රාදේශීය සභාව සහ වාලිකාමම් උතුරු ප්‍රාදේශීය සභා විසින් එම සභාවලට අයත් නොවන ඉඩම්වල එකතුව රු. මිලියන 146.28ක් පිරිවැය වූ ගොඩනැගිලි 40ක් ඉදිකර තිබුණි.

උතුරු පලාත් පාලන ආයතන 22ක් විසින් ඉඩම් සහ ගොඩනැගිලි 761ක්, උද්‍යාන 17ක්, සුසාන භූමි 188ක්, ළිං 240ක්, ක්‍රීඩා පිටි 27ක්, පුස්තකාල 16ක් සහ කසළ දමන ස්ථාන 04ක් පරිහරණය කරනු ලබන නමුත් එහි අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි.

**ඝාතකාගාරය සහ වාහන නැවැත්වීමේ ස්ථානය**

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව විසින් රු. මිලියන 6.70ක් වැයකර ඉදිකළ ඝාතකාගාරය සහ වාහන නැවැත්වීමේ ස්ථානය මේ දක්වා භාවිතයට ගෙන නොතිබුණි.

**ළමා ක්‍රීඩා උපකරණ**

ඩෙල්ෆ් ප්‍රාදේශීය සභාව විසින් රු.මිලියන 4.47කට මිලදීගෙන තිබුණු ළමා ක්‍රීඩා උපකරණ පසුගිය වර්ෂ 02ක සිට අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා තර නොතිබුණි.

**නිශ්කාර්ය යන්ත්‍ර**

වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාවේ රු.මිලියන 11.25ක් වටිනා තෙල් ඇඹරුම් යන්ත්‍රය, ලැමිනේටින් යන්ත්‍රය, කැනොන් කැමරාව, මුද්‍රණ යන්ත්‍රය, ක්ෂේත්‍ර මුදල් රැස් කිරීමේ යන්ත්‍රය, ප්ලාස්ටික් කුඩු කිරීමේ යන්ත්‍රය, විදුලි උත්පාදක යන්ත්‍රය, ගලි බවුසරය සහ G.P.S. යන්ත්‍ර 17ක් වර්ෂ 03ක සිට නිශ්කාර්යව පැවතුණි.

**නිශ්කාර්ය යන්ත්‍ර**

උතුරු කඩිනම් පුනරුත්ථාපන ව්‍යාපෘති යටතේ 2011 වර්ෂයේදී රු. මිලියන 26.14ක් වැයකර ඉදිකරනු ලැබූ නැදුන්කේනි බස් නැවතුම්පොළ හා බස් නැවතුම්පොළ ආශ්‍රිත වෙළඳසැල් 2022 වර්ෂයේදී රු. මිලියන 4.5ක් වැයකර ඉදිකළ ජල පෙරණ සහ ජල පිරිපහදු මධ්‍යස්ථානය භාවිතා කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## සබරගමු පළාත

**රත්නපුර මහා නගර සභාව**

පැරණි බස් නැවතුම්පල වෙළඳ සංකීර්ණය බදු දීමට අදාළව 2002 මාර්තු 13 දින එළඹි ගිවිසුමේ කොන්දේසි අංක 03 ප්‍රකාරව, සෑම අවුරුදු 05කට වරක්ම කුලිය සංශෝධනය කළ යුතු වුවත්, 2022 වර්ෂය දක්වා එපරිදි කටයුතු කර නොතිබුණි. පසුව, 2022 වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මාසික වෙළඳපල කුලිය රු.460,000ක් බව තක්සේරු කර තිබුණද, 2024 දෙසැම්බර් වන විටත් නව තක්සේරු කුලිය අයකර ගෙන නොතිබීමෙන් සභා අරමුදලට රු. මිලියන 6.16ක පාඩුවක් සිදුව තිබුණි.

**රත්නපුර ප්‍රාදේශීය සභාව**

ප්‍රාදේශීය සභාවේ වාහන සඳහා ඉන්ධන සැපයීමේ සිට ගෙවීම් වවුචරය සකස් කිරීම දක්වා වන සියළු කාර්යයන් එක් නිලධාරිනියක වෙත පවරා තිබීමෙන් ඒ සම්බන්ධ අභ්‍යන්තර පාලනය ඉතා දුර්වල මට්ටමක පැවැතුණි. එම නිලධාරිනිය විසින් ඉන්ධන බිල්පත් පියවීමේදී කූට ලේඛන සකස් කර 2023 මැයි සිට 2024 ජනවාරි 19 දක්වා කාලපරිච්ඡේදය තුළ රු. මිලියන 2.23ක පමණ මූල්‍ය අක්‍රමිකතාවක් සිදුකර තිබුණි.

**කුරුවිට ප්‍රාදේශීය සභාව**

2022 වර්ෂයේදී රු. මිලියන 34.79ක් වැයකර ඉදිකර තිබුණු සම්මන්ත්‍රණ ශාලාව සඳහා අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම්, විදුලි පංකා සහ ලී බඩු උපකරණ ආදී මූලික අවශ්‍යතා සම්පූර්ණ කර

| | |
|---|---|
| | නොතිබීම හේතුවෙන් 2025 අප්‍රේල් වන විටත් නිෂ්කාර්යයව පැවැතිණි. |
| **අයගම ප්‍රාදේශීය සභාව** | දේශීය ණය සංවර්ධන අරමුදලෙන් රු. මිලියන 17.75ක ණය මුදලක් ලබා ගෙන 2023 අගෝස්තු මස වැඩ අවසන් කර තිබුණු නව වෙළඳ සංකීර්ණය 2025 අප්‍රේල් වන විටත් අරමුණුගත කාර්යය සඳහා යොදවා ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව** | පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 42ක් වැය කර ඉදිකර තිබුණු ගලගම බහුකාර්යය ගොඩනැගිල්ල 2016 වර්ෂයේ සිටම අරමුණුගත කාර්යයන් වෙනුවෙන් යොදවා නොතිබුණි. |
| **වැලිගෙපොල ප්‍රාදේශීය සභාව** | රු. මිලියන 4.41ක පිරිවැයක් දරා 2022 දෙසැම්බර් 31 දින වැඩ අවසන් කර තිබුණු කසළ අංගනයේ කොම්පෝස්ට් නිෂ්පාදන කටයුතු 2024 වර්ෂය අවසාන දින වන විටත් ආරම්භ කර නොතිබුණි. |
| **පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව** | සභාවේ ආදාහනාගාරය පිහිටි ඉඩම අසල මැණික් පතල් ආරම්භ කිරීමේ බලපත්‍රයක් ලබා ගෙන තිබුණු පුද්ගලයකු එම පතල හරහා දෝනාවක් සකස් කර ආදාහනාගාර ඉඩම තුළට ඇතුළු වී ඉල්ලම් පස් ලබා ගෙන තිබුණි. මෙවැනි අවධානමක් පවතින බව හඳුනා ගෙන තිබියදීත් දෝනාව හරහා ඉඩමට ඇතුල් වී ඉල්ලම් පස් ලබා ගන්නා තෙක් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| **ඇඹිලිපිටිය නගර සභාව** | කසළ රැස් කිරීම සඳහා 2002 ජූනි 11 දින පැවරුම් නියෝග මත මහවැලි අධිකාරියෙන් ලද පර්චස් 118.6ක ඉඩමෙන් පර්චස් 72.8ක පමණ ප්‍රමාණයක් අනවසර පුද්ගලයින් විසින් අත්පත් කර ගෙන තිබුණි. |
| **ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව** | සභා බල ප්‍රදේශය තුළ එකතු වන නොදිරන කසළ චන්ද්‍රිකා වැව අසල ඉඩමකට අවිධිමත්ව හා පරිසර හිතකාමී ක්‍රමවේදයකින් තොරව බැහැර කරමින් පැවතුණි. |
| **බලංගොඩ ප්‍රාදේශීය සභාව** | සභා බල ප්‍රදේශය තුළ එකතු වන දිරන කසළ එකතු කර කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා 2022 වර්ෂයේදී රු. මිලියන 5.64ක් වැය කර වැලිපතයාය කසළ අංගනය ඉදිකර තිබුණද, 2024 වර්ෂය අවසන් වන විටත් එය නිෂ්කාර්යව පැවතුණි. |

**මාවනැල්ල ප්‍රාදේශීය සභාව**

මාවනැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2008/2009 වර්ෂවලදී රු. මිලියන 9.37ක් වැයකර නව සතිපොළ හා කඩ කාමර සහිත දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. සතිපොළ ස්ථානගත කිරීමේ ගැටළු හේතුවෙන් ඉදිකර තිබුණු ස්ථිර අලෙවි කුටි 217න් අලෙවි කුටි 143ක්ම භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

**කෑගල්ල මහා නගර සභාව**

2014 හා 2015 වර්ෂවලදී අදියර 02 ක් යටතේ රු. මිලියන 13.7ක් වැයකර මහා නගර සභා කාර්යාලය පිටුපස මහල් තුනකින් යුත් ගොඩනැගිල්ලක කොටසක් ඉදිකර තිබුණි. මහා නගර සභාව සතුව රු. මිලියන 388ක් ඉක්ම වූ ස්ථාවර තැන්පතු ශේෂයක් පැවතියදී, 2024 වර්ෂය අවසන් වන විටත් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

**කෑගල්ල ප්‍රාදේශීය සභාව**

2021 වර්ෂයේදී රු. මිලියන 5.82ක් වැයකර මොරොන්තොට සති පොල භූමියට යාබදව ජීව වායු ඒකකයක් ඉදිකර තිබුණි. ව්‍යාපෘති යෝජනාවට අනුව දිරන කසළ හා ගලි අපද්‍රව්‍ය යොදා ගෙන ජීව වායු ඒකකය හරහා මොරොන්තොට බහුකාර්යය ගොඩනැගිල්ලට, සතිපොලට හා කඩකාමරවලට විදුලිය ලබා දීමට අරමුණු කර තිබුණද, ජීව වායු ඒකකය සඳහා ගලි අපද්‍රව්‍ය යොදා ගෙන නොතිබුණු අතර විදුලිය ලබා දීමක්ද සිදු කර නොතිබුණි.

කසළ කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේදී රු. මිලියන 4.00කට මිලදී ගෙන තිබුණු අක්කර 10ක වපසරියෙන් යුතු ඉඩම ඇතුළුව සභාව සතු ප්‍රමාණයෙන් අක්කර 12, රූඩ් 02, පර්චස් 30ක් වූ රු. මිලියන 8.03ක් වටිනාකමැති ඉඩම් කැබලි 09ක් නිෂ්කාර්යව පැවතුණි.

## උතුරු මැද පළාත- අනුරාධපුර දිස්ත්‍රික්කය

**අනුරාධපුර මහා නගර සභාව**

මාර්කට් පෙදෙසෙහි අංක 43 දරන කඩ කාමරයට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2.0ක් ලෙස වසර 10කට ආසන්න කාල සීමාවක් තුළදී කිසිදු වාරික මුදලක් නොගෙවීම මත ඇති වූ හිඟ මුදල සම්බන්ධයෙන් මහා නගර සභාව විසින් 2023 සැප්තැම්බර් 11 වන දින වාස බද්ද අවසන් කිරීමේ දැන්වීම යවා තිබුණද ඊට අදාළව ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

මහා නගර සභාවට අයිතිව තිබුණු එක්ස්කැවේටර් යන්ත්‍රය 2014 වර්ෂයේදී ගිනිගෙන විනාශ වී තිබුණු අතර ඒ සඳහා අයවිය යුතු රු.මිලියන 4.82ක් වූ ශේෂයක් අයකර ගැනීමට 2024 වර්ෂය අවසානයේදී ද කටයුතු කර නොතිබුණි.

2014 වර්ෂයේ ජනවාරි සිට 2018 වර්ෂයේ ජූලි දක්වා කාලපරිච්ඡේදයේදී මහා නගර සභාවේ සේවකයින් ඇතුලු පුද්ගලයින් 11 දෙනෙකුගේ බැංකු ගිණුම්වලට රු.මිලියන 40.85ක මුදලක් වංචනික ලෙස බැහැර කර තිබුණු බවට විගණන පරීක්ෂාවක් මගින් අනාවරණය කර ගෙන තිබුණු අතර එම අලාභය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට 2024 වර්ෂයේ අවසානය දක්වා ද කටයුතු කර නොතිබුණි.

**රඹෑව ප්‍රාදේශීය සභාව**

2019 වර්ෂයේ සිට පැවත එන වාහන හිඟ කුලී රු. මිලියන 2.1ක් අයකර ගැනීමට නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2023 දෙසැම්බර් හා ඔක්තෝබර් දෛනිකව ලද මුදල් සභා අරමුදලට බැර නොකර වංචා කිරීම සම්බන්ධයෙන් සරප් තනතුරේ රාජකාරී කළ නිලධාරියාගේ වැඩ තහනම් කර තිබූ නමුත් රු. මිලියන 0.37ක් සභාවට අයකර ගැනීමට පැවතියද එම මුදල් අයකර ගෙන නොතිබුණි.

**මැදවච්චිය ප්‍රාදේශීය සභාව**

2022 සැප්තැම්බර් 26 දිනැති ලිපිය අනුව රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය මගින් සභාවට දී ඇති අංක LP 3229 දරන වටිනාකම රු. මිලියන 14ක් වූ ජල බවුසරය 2024 දෙසැම්බර් මස වන විටත් කිසිදු කාර්යයක් සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

**තලාව ප්‍රාදේශීය සභාව**

සභා ගොඩනැගිල්ලේ ඉහළ වහලය සඳහා වූ ස්ලැබ් (Slab) කොටස වැසි දිනවලදී වතුරෙන් පිරීයාම නිසා හා එම ජලය පහළ මහලට වසර ගණනාවක සිට කාන්දු වෙමින් පවතින නමුත් ඒ සඳහා පිළියම් යෙදීමටද අවශ්‍ය කිසිඳු පියවරක් බලධාරීන් ගෙන නොතිබුණු අතර මෙම තත්ත්වයට කඩිනමින් පිළියම් නොකළොත් එම ගොඩනැගිල්ලේ සිටින නිලධාරීන්ගේ ආරක්ෂාවටද තර්ජනයක් වන අතර මෙම තත්ත්වය තව වසර කීපයක් පැවතුණ හොත් මෙම ගොඩනැගිල්ල කඩා වැටීමේ අවදානමක්ද පැවතුණි.

තඹුත්තේගම සතිපොළ සඳහා 2017 වසරේදී රු. මිලියන 09 ක් වියදම් කර ඉදිකරන ලද සතිපොළ ගොඩනැගිලි නිෂ්කාර්යව පවතින නමුත් එම සතිපොළ නව ස්ථානය වෙත ගෙනයාමට කටයුතු කර නොතිබුණි.

**පලාගල ප්‍රාදේශීය සභාව**

පිරිසිදු කල පානීය ජල බෝතල් ව්‍යාපෘතිය වෙනුවෙන් 2020 සිට 2023 වර්ෂය දක්වා කාල සීමාව තුල රු.මිලියන 10කට වැඩි මුදලක් වැය කර තිබුණද එම ව්‍යාපෘතිය වෙනුවෙන් යෙදවූ සම්පත් සභාව වෙත ආදායමක් ලැබෙන ආකාරයෙන් උපයෝජනය නොකර නිෂ්කාර්යව පැවතුණි.

සභාවේ ආදායම් ඉහළ නැංවීම වෙනුවෙන් 2022 වර්ෂයේදී රු.මිලියන 8.69ක වියදමකින් ආරම්භ කර තිබුණු ඉන්ටර්ලොක් ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණු ඉටු කරවා ගැනීම වෙනුවෙන් යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ ව්‍යාපෘතියක් වෙනුවෙන් 2021 වර්ෂයේදී රු.මිලියන 16.86ක මුදලක් ප්‍රාදේශීය සභාව විසින් වැය කර තිබුණු නමුත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පැමිණි මහජන විරෝධතා හේතුවෙන් අදාළ ව්‍යාපෘතිය නවතා දමා තිබීම නිසා එම වත්කම් නිෂ්කාර්යව පැවති අතර, ව්‍යාපෘතිය තුළ ඉටුකර තිබුණු ඇතැම් ඉදිකිරීම් විනාශ වෙමින් පැවතුණි.

පොල් ආශ්‍රිත නව නිෂ්පාදන හඳුන්වා දීම, ප්‍රදේශයේ පොල් ගොවීන් දිරිගැන්වීම, ප්‍රදේශයේ ජනතාවට රැකියා අවස්ථා උදාකරලීම, වෙළෙඳපලට දේශීය නිෂ්පාදන හඳුන්වා දීම හා සභාවට අමතර ආදායමක් උපයා ගැනීම වැනි අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කර තිබුණු පොල් ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් 2022 වර්ෂයේ සිට 2024 වර්ෂය අතර කාලය තුළදී රු.මිලියන 37.74ක් වියදම් කර තිබුණු නමුත් එම ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකරවා ගැනීම වෙනුවෙන් යොදවා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

**වැලිකන්ද ප්‍රාදේශීය සභාව**

රුහුණුකෙත ජල ව්‍යාපෘති පිහිටි භූමියට නිතර වන අලි පැමිණෙන බැවින්, ජල ව්‍යාපෘතිවල සිටින සේවකයන්ගේ ජීවිතවලට සහ

දේපලවල ආරක්ෂාව සඳහා ගත යුතු ආරක්ෂිත ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

ජල පෙරණ ටැංකි සඳහා සැකසූ වැලි වසර කිහිපයක සිට යොදා නොතිබුණු බැවින්, එම ටැංකිවලින් ලබා ගන්නා ජලයෙහි මඩ සහිත බව අධික බැවින් වැලි මත මඩ තැම්පත් වී ජලය පෙරීම නැවතී ඇති හෙයින් මඩ ඉවත් කිරීම පමණක් සිදු වී තිබුණද, වැලි ඉවත් කිරීමක් කාලයක සිට සිදු වී නොතිබුණි. මේ තුළින් පිරිපහදු නොවූ ජලය පාරිභෝගිකයින්ට පරිභෝජනය කිරීමට සිදුව තිබුණි.

**දිඹුලාගල ප්‍රාදේශීය සභාව**

ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 196.6ක් වූ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ඇති සභාව විසින් භාවිතා කරනු ලබන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් ඉඩම් කැබලි 196ක් ප්‍රාදේශීය සභාව ස්ථාපිත කර වර්ෂ 37කට අධික කාලයක් ගත වී තිබුණද, සභාව වෙත විධිමත් පරිදි පවරා ගැනීමට 2024 වර්ෂ තුළදී කටයුතු කර නොතිබුණි.

2011 වර්ෂයේදී දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ ආදායම් පරිපාලක විසින් සිදු කරන ලද මූල්‍යමය අලාභය රු.මිලියන 1.4ක් ලෙස හඳුනා ගෙන 2021 දෙසැම්බර් 27 දින විනය නියෝග පනවා තිබූ නමුත් 2024 වර්ෂය වන විටත් ඊට අදාළව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව**

පිබිදෙමු පොළොන්නරුව සංවර්ධන ව්‍යාපෘතිය සඳහා යන්ත්‍ර කුලී පදනම මත ලබා දී, අයවිය යුතු රු.මිලියන 3.1ක් අදාළ ව්‍යාපෘතිය අවසන් කර වර්ෂ 02ක් ගත වුවත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද හිඟුරක්ගොඩ පොදු වෙළඳපොළ කඩ කාමර 65න් 35ක් විගණිත දින වූ 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ගිවිසුම්ගත ප්‍රතිලාභීන් විසින් විවෘත කර නොතිබීම සම්බන්ධයෙන් සභාව විසින් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

බල ප්‍රදේශයේ ජනනය වන කසල කළමනාකරණය සඳහා ප්‍රාදේශීය සභාව වෙත අක්කර 25ක බිම් කොටසක් හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් රොටවැව ග්‍රාම නිලධාරි වසමෙන් 2019 වර්ෂයේදී වෙන්කර දී ඇති නමුත් අදාළ රාජ්‍ය ආයතන සමඟ කටයුතු කර එම

ඉඩම නිරවුල් කර ගැනීමට හා විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට 2024 වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

වටිනාකම රු. මිලියන 79.8ක් වූ සභාව සතු ගොඩනැගිලි 03ක් හා වාහන හා යන්ත්‍ර 07ක් වසර 05කට වැඩි කාලයක සිට නිෂ්ක්‍රියව පැවතුණි.

රු. මිලියන 27.15 ක් වැයකර පිබිදෙමු පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන යටතේ 2019 වර්ෂයේ ඉදිකර හිඟුරක්ගොඩ පොදු වෙළඳපොල කුලියට දීමේදී ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව සභාපතිවරයා හා සභාව විසින් ගනු ලැබූ තීරණ හේතුවෙන් කුලියට ලබා දීම ප්‍රමාද වීම මත වර්ෂ 05කට ආසන්න කාලයක් නිෂ්කාර්යව පැවතීමෙන් තක්සේරු කුළිය මත 2022 වර්ෂයේ සිට සභාවට අහිමි වී තිබූ ආදායම රු.මිලියන 37.3ක් විය.

පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන මගින් 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කළ ඊ-පුස්තකාල 03ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය මගින් පුස්තකාල 02ක් වෙනුවෙන් රු.මිලියන 3.1ක වියදමක් දරා ව්‍යාපෘති 05 අත්හැර දැමීම හේතුවෙන් යොමුගත කාර්යයට යොදවා ගැනීමට නොහැකි වී තිබුණි.

**පොළොන්නරුව මහා නගර සභාව**

කදුරුවෙල නව වෙළඳ සංකීර්ණය හා රථගාල ඉදිකිරීම කොන්ත්‍රාත්තුව ලබා දීමේදී තරඟකාරිත්වයකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් සහ විචලතා වැඩ හා අතිරේක වැඩ විෂයයන් සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ රේටයන්ට ගෙවීම් නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබූ 5 වන බිල්පත පරීක්ෂා කිරීමේදී විචලතාවයන් සඳහා BOQ රේටයන්ට වඩා වැඩි රේටයන් භාවිතා කිරීම හේතුවෙන් රු.මිලියන 11.4ක අතිරේක මුදලක් කොන්ත්‍රාත්කරුට ගලායාමට ඉඩ හැර තිබුණි.

**පොළොන්නරුව ප්‍රාදේශීය සභාව**

ප්‍රාදේශීය සභාව විසින් භුක්ති විඳින රු. මිලියන 27.3ක් වටිනා කාර්යාල , පුස්තකාල, සුසාන භූමි හා ක්‍රීඩා පිටි පිහිටි ඉඩම් 35ක අයිතිය ප්‍රාදේශීය සභාවට පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

**ලංකාපුර ප්‍රාදේශීය සභාව**

ප්‍රාදේශීය සභාව සතු රු.මිලියන 179.9ක වත්කම් අයිතම 08ක් හා වටිනාකම තක්සේරු නොකල වත්කම් අයිතම 05ක් ඇතුළුව වත්කම්

අයිතම 13ක් විවිධ හේතු මත වසර 02 සිට වසර 08 දක්වා කාලයක සිට ප්‍රයෝජනයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ රු.මිලියන 167.5ක ප්‍රතිපාදන මත ඉදිකල සුංගාවිල කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ කව්ෂිමා යන්ත්‍රය සඳහා ප්‍රමාණවත් කසල නොලැබීම මත ක්‍රියාත්මක නොකර මිනිස් ශ්‍රමය යොදා ගෙන කොම්පෝස්ට් නිෂ්පාදනය සිදු කරමින් පැවතුණි.

## ඌව පළාත- බදුල්ල දිස්ත්‍රික්කය

| | |
|---|---|
| **බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව** | 2016 වර්ෂයේදී ආසියානු සංවර්ධන අරමුදලේ මූල්‍ය අනුග්‍රහය යටතේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් පුරනැගුම ව්‍යාපෘතියට සමගාමීව රු.මිලියන 400ක් වැයකර වැඩ නිමකර තිබුණු බණ්ඩාරවෙල හීල්ඔය ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල, පුස්තකාලය, සතිපොළ හා වැසිකිළි පද්ධතිය 2024 වර්ෂය අවසන් වන විටත් ඌන උපයෝජිත තත්ත්වයේ පැවතුණි. |
| **ඇල්ල ප්‍රාදේශීය සභාව** | ඇල්ල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පවත්වා ගෙන යන සම්භාහන මධ්‍යස්ථාන 19ක් නියාමනය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි<br><br>ප්‍රාදේශීය සභා සීමාව තුළ පවත්වා ගෙන යන රාවණා ඇල්ල සහ දුම්රියපොළ අසල රථගාල් දෙකකින් 2024 දෙසැම්බර් 31 දිනට ආදායම් රු.මිලියන 3.55ක් අයකර ගෙන තිබුණද, අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.<br><br>මධ්‍යම පරිසර අධිකාරිය මගින් නියම කරන ලද නිර්නායක සම්පූර්ණ නොකිරීම හේතුවෙන් ප්‍රාදේශීය සභාව විසින් පවත්වා ගෙන යනු ලබන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට නොහැකි වී තිබුණි.<br><br>සංචාරක පහසුකම් සැකසීම වෙනුවෙන් 586කට අධික හෝටල් සහ ලැගුම්හල් පිහිටි ප්‍රාදේශීය සභා සීමාවේ මළ අපද්‍රව්‍ය බැහැර කිරීමේ විධිමත් ක්‍රමවේදයක් නොතිබුණි. |
| **බණ්ඩාරවෙල මහා නගර සභාව** | උප පත්‍රිකා පොත් ලේඛනයට අනුව 2019 වර්ෂයේ සිට 2024 ඔක්තෝබර් 09 දින දක්වා කාලපරිච්ඡේදය තුළ ක්ෂේත්‍රයේ ආදායම් එකතු කිරීම සඳහා නිලධාරීන් හතර දෙනෙකු වෙත නිකුත් කර |

තිබුණු වරිපනම් බදු, කඩ කුලී උප කුවිතාන්සි පොත් 04ක් ආපසු ගබඩාවට භාර දී නොතිබුණි.

**වැලිමඩ ප්‍රාදේශීය සභාව**

ප්‍රාදේශීය සභා පනතේ 172 (3) වගන්තිය අනුව 2019 වර්ෂයේදී විගණකාධිපති විසින් පනවා තිබුණු එකතුව රු.මිලියන 0.29ක් වූ අධිභාර 02ක් 2024 දෙසැම්බර් 31 දිනට ද අයකර ගෙන නොතිබුණි.

ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල හා කාර්යයන් ඉටුකිරීම සඳහා අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන සලසා නොගෙන 2024 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු තුළ රු. මිලියන 201.37ක ශේෂයක් රඳවා ගෙන තිබුණි.

වැලිමඩ නගරයේ පොදු බස්නැවතුම්පල ආසන්නයේ පිහිටි ප්‍රාදේශීය සභාවට අයත් මාළු වෙළඳසැල් වලින් සහ ව්‍යාපාරික ස්ථාන වලින් බැහැර කරන මළ අපද්‍රව්‍ය නගරය මැදින් ගලා යන උමාඔය ඇල මාර්ගයට යොමු කර තිබුණි.

**ඌව පරණගම ප්‍රාදේශීය සභාව**

2019 මැයි 08 දිනැති අංක 2122/29 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ රීති අංක 02ට අනුව පටහැනිව ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයෙකු විසින් බල ප්‍රදේශයේ රාජකාරී කටයුතුවල නිරත නොවූ දින 224ක් සඳහා සංයුක්ත දීමනා වශයෙන් රු. මිලියන 0.19ක් ලබා ගෙන තිබුණු අතර රියදුරාට සංයුක්ත දීමනා වශයෙන් රු. මිලියන 0.10ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

**පස්සර ප්‍රාදේශීය සභාව**

ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ මූලාා ප්‍රතිපාදන රු.මිලියන 26.08ක් වැයකර 2023 වර්ෂයේ වැඩ නිම කර සභාවට භාර දී තිබුණු නව වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල නායයාමේ අවදානමට පත් වී තිබුණි.

## වයඹ පළාත- කුරුණෑගල දිස්ත්‍රික්කය

**කුරුණෑගල මහා නගර සභාව**

සභාව විසින් ලංකා බැංකුවෙන් ලබාගන්නා ලද රු.මිලියන 700ක ණය මුදලෙහි පොලී ගෙවීම් සිදු කරනු ලබන අතර 2025 අගෝස්තු 08 දිනට පෙර අදාළ ණය මුදල් සම්පූර්ණයෙන් ගෙවා අවසන් කළ යුතු වුවත් 2025 මාර්තු 31 වන විටත් කිසිදු ණය වාරිකයක් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

සභාවේ රෝහල ඉදිරිපිට වැසිකිළිය පිහිටි ඉඩමේ බදු කුලිය ලෙස 2023 ජූලි 06 දින රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින්

රු.මිලියන 1.14ක වාර්ෂික බදු කුලියක් තක්සේරු කර තිබුණද නගරාධිපතිගේ හා නාගරික කොමසාරිස්ගේ ලිඛිත නියෝගයකට අනුව ආදායම් පරීක්ෂක විසින් කරන ලද රු.25,000ක මාසික තාවකාලික තක්සේරුවකට බිම් කුලි අයකර තිබුණි.

| | |
|---|---|
| **මාවතගම ප්‍රාදේශීය සභාව** | සභාව විසින් ගලි ප්‍රතිකර්ම මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේදී රු මිලියන.5.15ක මුදලක් වැයකර තිබුණද එය ප්‍රයෝජනයට නොගෙන ගලි අපද්‍රව්‍ය කපන ලද වලකට මුදා හැර තිබුණි. |
| **ගිරිබාව ප්‍රාදේශීය සභාව** | ශක්‍යතා අධ්‍යයනයකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් රු. මිලියන 15.06ක් වැය කර ඉදිකල නිරාවිය ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ කොම්පෝස්ට් පොහොර ඒකකය 2019 වර්ෂයේ සිටම කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිෂ්කාර්යව පැවතුණි. |
| **ගල්ගමුව ප්‍රාදේශිය සභාව සහ නාරම්මල ප්‍රාදේශීය සභාව** | බල ප්‍රදේශයේ රෝහල්වලින් බැහැර කෙරෙන අපද්‍රව්‍ය අවිධිමත් ලෙස භූමියක බැහැර කිරීම හා නාරම්මල ප්‍රාදේශිය සභාවේ ඝණ අපද්‍රව්‍ය එක්රැස් කරන මධ්‍යස්ථාන 200කින් රැස්කරන ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කිරීම හා පිළිස්සීම සිදු කරනු ලැබීම හේතුවෙන් බැර ලෝහ එම ප්‍රදේශවල ජල මූලාශ්‍රවලට හා භූගත ජලයට මිශ්‍රවීමේ අවධානමක් පවතින බව නිරීක්ෂණය විය. |




# 03

# මූල්‍ය නොවන විගණන

# කාර්යසාධන හා පරිසර විගණන අංශය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව හා 2018 අංක 19 දරන විගණන පනත ප්‍රකාරව කාර්යසාධන විගණනය සිදු කිරීම විගණකාධිපතිවරයා වෙත අධිකාරී බලය ලබා දී ඇත. 2011 වර්ෂයේදී කාර්යසාධන විගණන ඒකකයක් ආයතනය තුල ස්ථාපනය කරන ලද අතර එතැන් සිට 2024 වර්ෂය අවසානය දක්වා ජාතික වශයෙන් වැදගත් වන විවිධ වූ මාතෘකාවන් යටතේ කාර්යසාධන විගණන වාර්තා සියයකට ආසන්න ප්‍රමාණයක් පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. කාර්යසාධන විගණනය මඟින් යම් රාජ්‍ය ආයතනයක, වැඩසටහනක, ව්‍යාපෘතියක හෝ යම් වියදම් ඒකකයක තෝරා ගත් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් එහි ආර්ථිකභාවය, කාර්යක්ෂමතාවය හා ඵලදායී බව ඇගයීමට ලක් කරනු ලැබේ. උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර ආයතනය (INTOSAI) විසින් සාමාජික රටවල උත්තරීතර විගණන ආයතනවල කාර්යසාධන විගණනය කෙරෙහි වැඩි අවධානයක් යොමුකරමින් පවතින අතර අපරට තුළද මහජනතාව හා අනෙකුත් පාර්ශ්වයන් අතර කාර්යසාධන විගණන වාර්තා කෙරෙහි වැඩි අවධානයක් යොමු වී ඇත.

විගණන කටයුතු සිදුකිරීමේදී INTOSAI ආයතනය විසින් යාවත්කාලීනව ඉදිරිපත් කරනු ලබන ප්‍රමිතීන් පිළිබඳව අවදානය යොමු කරන අතරම මේ වන විට ජාතික විගණන කාර්යාලය විසින් නිකුත් කර ප්‍රසිද්ධ කරන ලද කාර්යසාධන විගණන ප්‍රමිති පදනම් කරගෙන කාර්ය සාධන විගණනයන් සිදු කරනු ලැබේ.

විගණන කටයුතු ජාතික විගණන කාර්යාලයේ ස්ථාපිත කාර්යසාධන විගණන අංශය මඟින් මෙන්ම ශාඛා මට්ටමෙන්ද සිදු කරනු ලැබේ. උත්තරීතර ජාතික විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර ආයතනය විසින් සිදු කරනු ලබන සහයෝගීතා විගණනයන් සඳහා සහභාගී වීමද ජාතික විගණන කාර්යාලයේ ස්ථාපිත කාර්යසාධන විගණන අංශය මඟින් සිදු කරනු ලැබේ.

යම් කිසි විශේෂිත පාරිසරික ගැටළුවක් හෝ ආර්ථික ප්‍රතිපත්තීන් හෝ වැඩසටහන් මෙන්ම පාරිසරික ගැටළු කළමනාකරණය කිරීමේදී ඒවායේ කාර්ය සාධනය සම්බන්ධයෙන් වගකිව යුතු ආයතන ක්‍රියාත්මක කර ඇති ප්‍රවේශය කෙරෙහි අවධානය යොමු කරමින් සිදු කර ඇති කාර්ය සාධන, අනුකූලතා හෝ මූල්‍ය විගණනය පරිසර විගණනය ලෙස හැඳින්වේ.

අපද්‍රව්‍ය, ජලය, වාතය, ජෛව විවිධත්වය ක්ෂේත්‍ර මෙන්ම පාංශු ඛාදනය, භූ ගත ජලය අඩු වීම, ජල දූෂණය, සමුද්‍ර හා වෙරළ දූෂණය, වනාන්තර විනාශය, වායු ගුණත්වය සහ අපද්‍රව්‍ය හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය වැනි ගැටළු මේ යටතේ සාකච්ඡා කරනු ලබන අතර පරිසර විගණනයන් සිදු කිරීමේදී කාර්ය සාධන විගණනයක් සඳහා ලැබී ඇති නෛතික ප්‍රතිපාදන මෙන්ම ජාත්‍යන්තර විගණන ප්‍රමිතීන් යටතේ වන ISSAI 5110, 5120, 5130 හා 5140 පදනම් ලෙස යොදා ගනු ලැබේ.

ජාතික විගණන කාර්යාලය විසින් 2024 වර්ෂයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද කාර්යසාධන විගණන හා පරිසර විගණන වාර්තාවල ප්‍රධාන කරුණු ඇතුලත් සාරාංශ වාර්තා පහත පරිදි වේ.

## ආසියානු සංවර්ධන බැංකුවේ ණය ආධාර මත සිදුකරනු ලැබූ ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

### නිකුත් කිරීමේ පසුබිම

2022 වර්ෂයේ දෙවන කාර්තුවේ පමණ සිට ශ්‍රී ලංකාව තුළ ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපායන් අඛණ්ඩව පිරිහෙමින් පැවති අතර, එහිදී දිළිඳු හා අවදානමට ලක් වූ පුද්ගලයන්ගේ ආහාර සහ ජීවනෝපායන් ආරක්ෂා කිරීම පිණිස රජය විසින් ආසියානු සංවර්ධන බැංකුවෙන් හදිසි ආධාර ඉල්ලා සිටින ලදී. ඒ අනුව, ලද ඩොලර් මිලියන 200ක ණය මුදලට අදාළ ගිවිසුම 2022 සැප්තැම්බර් 09 වන දින අත්සන් තබා තිබූ අතර මෙම විගණනයේ අරමුණ වූයේ එසේ ලද ණය මුදල උපයෝජනය කිරීමට අපේක්ෂිත වූ ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතියේ කාර්යසාධන ඇගයීම විය. 2022 වර්ෂයේ සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා ණය ආධාර යටතේ සමෘද්ධිලාභීන්, අඩු ආදායම්ලාභී වැඩිහිටි හා ආබාධිත පුද්ගලයින් සහ වකුගඩු රෝගීන්, 2023 මාර්තු සහ අප්‍රේල් මාසයන්හි දීමනා ලද ගර්භණී සහ කිරි දෙන මව්වරුන් සහ 2022 මහ කන්නයේ වී වගා කළ ගොවීන් සඳහා ද ගෙවන ලද දීමනා පිළිබඳව මෙහිදී අවධානය යොමු කරන ලදී. එසේම විගණනය සඳහා කුරුණෑගල, හම්බන්තොට, මොණරාගල, අනුරාධපුර හා මඩකලපුව යන දිස්ත්‍රික්ක නියැදිය වශයෙන් තෝරා ගන්නා ලදී.

### පහත සඳහන් ආයතන වෙත වාර්තාව නිකුත් කරන ලදී.

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය , කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය, කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

### ලබා දෙන ලද නිර්දේශකෙටියෙන්

- 2002 අංක 24 දරන සුබ සාධක ප්‍රතිලාභ පනත අනුව 2022 ඔක්තෝබර් මස නිකුත් කරන ලද ගැසට් නිවේදනය ප්‍රකාරව සියළු සුබසාධක වැඩසටහන් සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්ගේ බලතල අනුව ක්‍රියාත්මක කිරීම.
- සමෘද්ධි බැංකු පරිගණක පද්ධතිය (CRM system) නවීකරණය මගින් ප්‍රතිලාභීන්ට කාර්යක්ෂම සේවයක් ලබා දීම.
- ප්‍රතිලාභීන්ට කාර්යක්ෂම සේවයක් ලබා දීමටත්, නිලධාරීන්ට තෘප්තිමත්ව රාජකාරී ඉටු කිරීම සඳහාත් සමෘද්ධි බැංකු සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලබා දීම.

- පහසුවෙන් අවධානමට ලක් වන පුද්ගලයන් (අඩු ආදායම්ලාභීන්, වැඩිහිටි හා ආබාධිත පුද්ගලයන්, රෝගීන්, ළමයින්, කාන්තාවන්) සඳහා ප්‍රතිලාභ ලබා දීමේ දී විශේෂ අවධානයකින් වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

- ගොවීන් සම්බන්ධයෙන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පවත්වාගෙන යන Geo Goviya පරිගණක පද්ධතියට මිනුම් කළ භූමි ප්‍රමාණ ඇතුලත් කිරීම, වගා කන්නවල ගොවීන් විසින් සපයනු ලබන තොරුතුරු අනුව අවශ්‍ය සංශෝධන කඩිනමින් සිදුකළ හැකි පරිදි පරිගණක පද්ධතිය වැඩි දියුණු කිරීම.

- ගෙවීම් පිළිබඳ තොරතුරු දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන කොමසාරිස්, ප්‍රාදේශිය නිලධාරි ඇතුලු වගකිව යුතු නිලධාරින්ට අවශ්‍යකරන දිනයට කඩිනමින් ලබාගත හැකි පරිදි පරිගණක පද්ධතිය නවීකරණය කිරීම .

- ගොවීන් දිරිමත් කිරීම සඳහා රාජ්‍ය බැංකු පවත්වාගෙන යනු ලබන ගොවි දිරිය බැංකු ගිණුම් සක්‍රීයව පවත්වා ගැනීමට රාජ්‍ය බැංකු සමග එකඟතාවයක් ඇති කර ගැනීම සහ සහනාධාර ගෙවීම සඳහා ගොවිදිරිය බැංකු ගිණුම් භාවිතා කිරීම.

- හදිසි ප්‍රතිලාභ ගෙවීමේ දී ලිඛිත චක්‍රලේඛ උපදෙස් නවීන තාක්ෂණික ක්‍රම මගින් අදාළ නිලධාරීන් වෙත කාලීනව යොමු කිරීම හා අදාළ ක්‍රියාමාර්ග ගැනීම.

- 2030 වර්ෂය වන විට තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට දැනට පවතින අඩුපාඩු (Gaps) හඳුනාගෙන ඒ සඳහා අදාළ වගකිව යුතු ආයතන විසින් පියවර ගැනීම.

## සංචාරක සංවර්ධන ප්‍රදේශ සහ සංචාරක සංවර්ධන ව්‍යාපෘති සංචාරක කර්මාන්තයට දායකකර ගැනීම පිළිබඳ කාර්යසාධන විගණනය

### නිකුත් කිරීමේ පසුබිම

සංචාරක කර්මාන්තය මඟින් ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ විනිමය වර්තමානයේදී ඇති වී තිබෙන ආර්ථික අර්බුදයත් සමඟ වැඩි වැදගත්කමක් උසුලන අතර එම විදේශ විනිමය ඉපයීම ඉහළ නැංවීම උදෙසා සංචාරක කර්මාන්තය හා ඒ ආශ්‍රිත කර්මාන්තවලට අදාල ප්‍රතිපත්තිමය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීමේ පහසුකම් සැලසීම, කර්මාන්තය විධිමත් කිරීම, නියාමනය, සංචාරක සංවර්ධන කලාප හඳුනා ගැනීම හා ඒ තුල පහසුකම් හා සේවා ප්‍රවර්ධනය කිරීමේ කාර්යභාරය 2005 අංක 38 දරණ සංචාරක කටයුතු පනත ප්‍රකාරව සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් සිදු කරයි.

සංචාරක කර්මාන්තය නංවාලීම සඳහා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන්හි කාර්යසාධනය ඇගයීම මෙම විගණනයේ මූලික අරමුණ වූ අතර එහිදී

අධිකාරිය විසින් 1987 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ විවිධ කාලවකවානු වලදී ප්‍රකාශයට පත් කරන ලද සංචාරක සංවර්ධන ප්‍රදේශ 14ක සහ යාල, කල්පිටිය, කුච්චවේලි, දෙද්දූව සහ පාසිකුඩා යන ප්‍රදේශයන්හි සිදුකරන සංචාරක සංවර්ධන ව්‍යාපෘතීන්හි කාර්යසාධනය ඇගයීමට ලක් කරන ලදී.

**පහත සඳහන් ආයතන වෙත වාර්තාව නිකුත් කරන ලදී.**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**ලබා දෙන ලද නිර්දේශ කෙටියෙන්**

- 2005 අංක 38 දරන සංචාරක කටයුතු පිළිබඳ පනතේ 26 (1) වගන්තිය ප්‍රකාරව සංචාරක සංවර්ධන ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කිරීම සහ සංචාරකයින්ගේ සිත් ඇද ගන්නා ආකර්ශනීය ස්ථාන ද ඊට ඇතුලත් කර අධිකාරියේ නිර්දේශ මත කටයුතු කිරීම.
- නව සංචාරක සංවර්ධන ප්‍රදේශ හඳුනාගෙන ප්‍රකාශයට පත් කළ යුතු වීම.
- 2005 අංක 38 දරන සංචාරක කටයුතු පිළිබඳ පනතේ 26 (3) වගන්තිය ප්‍රකාරව සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත කරගෙන යා හැකි සංචාරක කටයුතු, වාණිජ හා වෙනත් කටයුතු නියම කරමින් නියෝග සෑදිය යුතු වීම.
- අධිකාරියේ ඍජු මුදල් ප්‍රතිපාදන මත සහ අදාළ ආයතන සමග ඒකාබද්ධව සිදුකළ සංවර්ධන ව්‍යාපෘති සමීපව අධීක්ෂණය කිරීම හා ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක කර සංචාරක සංවර්ධන කලාපයන්ට අදාළව නව පහසුකම් ස්ථාපිත කිරීම හෝ පවත්නා පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කිරීම.
- සංචාරක සංවර්ධන ව්‍යාපෘති යටතේ ඉඩම් බදු දීමේදී ආයෝජකයින් විධිමත් ක්‍රමවේදයකට අනුව තෝරා ගත යුතු වීම සහ ආයෝජකයන් මුහුණ දෙන ගැටළු සඳහා අධිකාරිය විසින් ප්‍රමාණවත් මැදිහත්වීමක් සිදු කළ යුතු වීම.
- ආයෝජන දේපල සම්බන්ධයෙන් ප්‍රමාණවත් පරිදි සැලසුම් සකස් කළ යුතු වීම හා ශක්‍යතා අධ්‍යයනයන් සිදු කළ යුතු වීම, ආයෝජන දේපල සංචාරක සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් කිරීමට හා ඉඩම් සඳහා අනවසර ප්‍රවේශයන් වැලැක්වීමට කටයුතු කළ යුතු වීම, ආයෝජකයින් විසින් බදු ගත් දේපලවල සිදු කරන සංවර්ධන කටයුතු හා ඒවා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ප්‍රමාණවත් පරිදි අධීක්ෂණය කළ යුතු වීම හා ඌන උපයෝජිත ආයෝජන දේපල ඉක්මනින් ආයෝජන කටයුතු සඳහා යෙදවීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කළ යුතු වීම.

- වෙනත් රාජ්‍ය ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම තුලින් සංචාරකයින් සඳහා පහසුකම් හා ආකර්ෂණය ඉහළ නැංවීම
- ගිවිසුම් ප්‍රකාරව කාර්යසාධන ඇපකර නියමිත පරිදි ලබා ගැනීම, හිඟ බදු මුදල් අය කර ගැනීමට නිසි හා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම සහ
- ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොමැති ආයෝජන දේපළ ගිවිසුම් අවලංගු කර නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වීම හා අලාභ අය කර ගත යුතු වීම
- ආයෝජකයින් විසින් අදාල පරිසර සහතික ලබාගෙන තිබේද යන්න හා ඉදිකිරීම් හරිතමය වන්නේද යන්න අධීක්ෂණය කළ යුතු වීම

## ශ්‍රී ලංකාවේ පෞද්ගලික සෞඛ්‍ය සේවාව නියාමනය කිරීමේ ක්‍රියාවලියේ කාර්යසාධනය ඇගයීම

### නිකුත් කිරීමේ පසුබිම

ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්වචනයට අනුව, සෞඛ්‍ය යනු සම්පූර්ණ ශාරීරික මානසික හා සමාජීය නිරෝගිතාවයක් වේ. රෝගයක් හෝ යම්කිසි දුබලතාවයක් නොමැති වීම පමණක් නීරෝගීකම නොවන අතර එදිනෙදා ජීවිතයට එය සම්පතක් වන අතර එය සමාජීය සහ පුද්ගල සම්පත් පිළිබඳ විග්‍රහ කෙරෙන ධනාත්මක සංකල්පයකි. මේ හේතුවෙන් ලොව සියළු රාජ්‍යයන් තම ජනතාවගේ සෞඛ්‍ය සම්පන්න භාවය සඳහා වැඩි ප්‍රමුඛතාවක් දක්වයි. අතීතයේ සිටම සියළුම ශ්‍රී ලාංකිකයන්ටද නිදහස් සෞඛ්‍ය සේවයක් හිමි වන අතර මේ දක්වා සියළු රජයන් ජනතාවගේ සෞඛ්‍ය නගාසිටුවීම සඳහා සැලකිය යුතු දායකත්වයක් දැක්වීම හේතුවෙන් 2022 වසරේදී දකුණු ආසියාවේ සියළු රටවල් අභිබවා මානව සංවර්ධන දර්ශකයේ (Human Capital Index) 0.782 ක ඉහලම අගයක් ශ්‍රී ලංකාව හිමිකර ගෙන තිබුණි.

ශ්‍රී ලංකාවේ නිදහස් සෞඛ්‍ය සේවයක් ස්ථාපිත වුවද, වර්තමානය වන විට මුළු දිවයින පුරාම පෞද්ගලික වෛද්‍ය ආයතන ස්ථාපිත වී සෞඛ්‍ය ක්ෂේත්‍රයට ඉහළ දායකත්වයක් සපයනු ලැබේ. මේ හේතුවෙන් පාර්ලිමේන්තුව විසින් පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පරීක්ෂා කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද, ඒ ආයතනවල වර්ධනය වැඩිදියුණු කිරීම පිණිසද, ඊට සම්බන්ධ හෝ ආනුෂාංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද වූ පනතක් ලෙස 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත සම්මත කර තිබුණි. එහි කාර්ය සඳහා 2007 වර්ෂයේ සිට පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව ස්ථාපිත කර තිබුණු අතර පෞද්ගලික සෞඛ්‍ය අංශ සංවර්ධනය වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පෞද්ගලික සෞඛ්‍ය සංවර්ධන අංශය නමින් වෙනමම අංශයක් ද ස්ථාපිත කර ඇත.

රජයේ රෝහල් පද්ධතියේ පවතින තදබදය, සැත්කම් හා පරීක්ෂණ සඳහා දිගු කාලයක් පොරොත්තු ලේඛනයේ රැඳී සිටීමට සිදු වීම, ආර්ථික අර්බුදය හේතුවෙන් රජයට සෞඛ්‍ය අංශය සඳහා ඉහළ දායකත්වයක් දැරීමට නොහැකිවීම, ගුණත්වයෙන් අඩු ඖෂධ රජයේ රෝහල්වල භාවිතා වන බවට ජනමාධ්‍ය මඟින් ප්‍රචාරණය වීමත් වැනි හේතු මත පෞද්ගලික අංශය වෙත යොමු වන රෝගීන් සංඛ්‍යාවේ වැඩිවීමක් දක්නට ඇත.එයට සමගාමීව පෞද්ගලික වෛද්‍ය ආයතනයන්ට එරෙහිව පැමිණිලි ලැබීමේ වර්ධනයක්ද සිදුව ඇති බැවින් පෞද්ගලික වෛද්‍ය ආයතන සම්බන්ධ නෛතික පසුබිම, ඒවායේහි ක්‍රියාකාරිත්වය හා නියාමනය සම්බන්ධව අදාළ රාජ්‍ය ආයතනයන්හි කාර්යසාධනය ඇගයීම පිණිස මෙම කාර්යසාධන විගණනය සිදුකරන ලදි.

### වාර්තාව නිකුත් කරන ලද ආයතන පරිදි වේ.

සෞඛ්‍ය අමාත්‍යංශය,පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව,පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය,මධ්‍යම පරිසර අධිකාරිය,ජාතික ඖෂධ නියාමන අධිකාරිය

### ලබා දෙන ලද විගණන නිර්දේශ කෙටියෙන්

- රට තුළ ක්‍රියාත්මක පෞද්ගලික සෞඛ්‍ය සේවාවන් සපයන සමස්ථ ආයතන පද්ධතියෙන් මහජනතාවට සාධාරණ, වගකීම් සහිත, දැරිය හැකි අයකිරීම් යටතේ, ආරක්ෂිත, කාර්යක්ෂම සෞඛ්‍ය සේවාවක් සපයන බවට සහතික විය හැකි ආකාරයේ නියාමනයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තීරණ ගත හැකි ආකාරයේ පාලක මණ්ඩල සංයුතියක් සහිතව නව පාර්ලිමේන්තු පනතක් සම්මත කර ක්‍රියාත්මක කිරීම හෝ 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත මඟින් පිහිටුවා ඇති පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ සංයුතිය පෞද්ගලික සෞඛ්‍ය ආයතන නියාමනය සඳහා තීරණ ගැනීමේ රාජ්‍ය අංශයේ හැකියාව වැඩි වන ආකාරයට සංශෝධනය කිරීම.

- 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතෙහි පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව විගණනය කිරීමට අදාළ විධිවිධාන නිශ්චිතව සඳහන් කර නොමැති බැවින් ඒ පිළිබඳ සුදුසු ඇගයීමකින් පසුව නිශ්චිත විධිවිධාන ඇති කිරීම.

- 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත මඟින් නියෝග සකස් කිරීම සඳහා ලබාදී ඇති බලතල ප්‍රකාරව මෙතෙක් සකස් කර ඇති නියෝග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නීතියක් බවට පත් කිරීම හා මේ දක්වා විෂයභාර අමාත්‍යවරයා විසින් සකස් කර නොමැති නියෝග කඩිනමින් සකස් කර රජයේ ගැසට් පත්‍රයේ පළකර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නීතියක් බවට පත් කිරීම.

- 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත මඟින් රීති සකස් කිරීම සඳහා ලබාදී ඇති කරුණු වලට අදාළ රීති සකස් කර විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කර රජයේ ගැසට් පත්‍රයේ පළ කර බලාත්මක කිරීම.

- රට තුළ පවතින සියළුම පෞද්ගලික වෛද්‍ය ආයතන ශ්‍රේණිගත කර මහජනතාවට දැරිය හැකි සාධාරණ ගාස්තු ක්‍රමයක් සම්බන්ධයෙන් නියෝග සකස් කර බලාත්මක කිරීම පිළිබඳව කඩිනම් අවධානය යොමු කිරීම.

- පවතින පනත සංශෝධනයේදී හෝ නව පනතක් සකස් කිරීමේදී පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානවල අනිවාර්ය රාජකාරි මොනවාද යන්න සඳහන් කිරීම, පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් විසින් නියෝගයක් හෝ රීතියක් කඩ කර ඇත්නම් නියාමන සභාවට ගතහැකි පියවර නිශ්චිතව සඳහන් කිරීම, තාක්ෂණය තක්සේරු කිරීම සහ නියාමනය කිරීම හා ඊට අදාළ සදාචාරාත්මක ගැටළු පිළිබඳ ආමන්ත්‍රණය කිරීම යන කරුණු කෙරේ කඩිනම් අවධානය යොමු කිරීම.

- පනතේ අරමුණු ඉටුවන ආකාරයට ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතන පවත්වා ගෙන යායුතු ප්‍රමිති සංවර්ධනයට, අධීක්ෂණයට හා ප්‍රමිති ඇගයීමට, සේවකයන් බඳවා ගැනීමේදී අවම සුදුසුකම් හා පුහුණු කිරීමේදී අවම ප්‍රමිතීන් අනුගමනය කරන බවට සහතික වීමට, රෝගීන් රැකබලා ගැනීමේ සේවාවල ගුණාත්මකභාවය තහවුරු කිරීමට විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කර එය නීතිගත කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම. එසේම වෘත්තිකයන් බඳවා ගැනීමේදී ජාතික බඳවා ගැනීම් නිර්නායක පිළිපැදීම සහතික කිරීම.

- 2007 වර්ෂයේදි තීරණය කරන ලද ලියාපදිංචි ගාස්තු වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කිරීම.

- සමාගම් පනත යටතේ හෝ වෙනත් විධිවිධානයක් යටතේ පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ලියාපදිංචි කිරීමේදි හෝ ලියාපදිංචිය අළුත් කිරීමේදි හෝ පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ ලියාපදිංචිය ලබා තිබීම අනිවාර්ය කොන්දෙසියක් බවට පත් කිරීමට ඇති හැකියාව පිළිබඳව අවධානය යොමු කිරීම.

- ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන ආයතන සඳහා ඉක්මනින් ලියාපදිංචිය ලබා දීමේ වැඩපිළිවෙලක් හඳුන්වා දීම, ලියාපදිංචිය සඳහා අවශ්‍ය අවම අවශ්‍යතා සපුරා නොමැති පෞද්ගලික වෛද්‍ය ආයතන සඳහා එකි අවම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා නිශ්චිත කාලයක් ලබාදීම හා එම නිශ්චිත කාලය තුළ අදාළ අවම අවශ්‍යතා සම්පූර්ණ කිරීමට කටයුතු නොකරණ ආයතනවලට එරෙහිව නීතිමය පියවර කඩිනමින් ගැනීම.

- පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ ලියාපදිංචි නොවී රට තුළ පවත්වාගෙන යනු ලබන සියළුම පෞද්ගලික වෛද්‍ය ආයතන සම්බන්ධයෙන් පනත මඟින් ලබාදී ඇති බලතල පාවිච්චි කර නීතිමය ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීම.

- පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව විසින් ප්‍රදානය කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකයක් යම් නිශ්චිත කාලයකට වලංගු වන ලෙස සකස් කිරීම හා වලංගු කාලය අවසන් වීමෙන් පසුව ලියාපදිංචි කිරීමේදී සුදුසු දඩ මුදල් අයකිරීමේ ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කිරීම.

- රසායනාගාර ලියාපදිංචියේදී, රසායනාගාර නියමිත ප්‍රමිතීන්ට අනුව පවතින බවට ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයෙන් වාර්ෂිකව පරීක්ෂා කිරීමෙන් පසු ලබාදෙන බලපත්‍රය ලබාගෙන තිබීම අනිවාර්ය කිරීම.

- සායනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා අනිවාර්යයෙන්ම ලබාගත යුතු පරිසර ආරක්ෂණ බලපත්‍රය (Environmental Protection License – EPL) සහ උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රය (Schedule Waste Management License – SWML) ලබා ගැනීමේ නීතිමය අවශ්‍යතාවය සපුරා තිබීම පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේදී අනිවාර්ය කිරීම.

- සෞඛ්‍ය මහා සැලැසුමේ (2016-2025) ( Health Master Plan) සඳහන් පරිදි හා 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 14 වන වගන්තියේ දැක්වෙන පරිදි "බලයලත් නිලධාරීන්" වඩාත් නිවැරදිව නිර්වචනය කිරීම හා පෞද්ගලික සෞඛ්‍ය සේවාවන් නියාමනය පිළිබඳව සෞඛ්‍ය මහා සැලැසුම මඟින් හඳුනාගෙන තිබුණු අඩුපාඩු මගහරවා ගැනීමට කඩිනම් ක්‍රියා මාර්ග ගැනීම.

- පෞද්ගලික වෛද්‍ය ආයතන ප්‍රාදේශීය මට්ටමින් නියාමනය කිරීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල සේවයේ නියුතු නිළධාරියෙකුගේ සම්බන්ධීකරණය යටතට පත් කළ යුතු වීම. ප්‍රාදේශීය සෞඛ්‍ය නිළධාරී කාර්යාල මට්ටමින් ක්ෂේත්‍ර නිළධාරීන් පත්කර ඔවුන් හරහා කාර්තුමය වශයෙන් පෞද්ගලික සෞඛ්‍ය වෛද්‍ය ආයතනවල මානව සම්පත් දත්ත, සේවක සුදුසුකම් හා ගාස්තු පිළිබඳ දත්ත එකතු කර ගැනීම.

- සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල තුළ පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ ලියාපදිංචියට අදාළව හා නියාමන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා බලතල සහිත වෙනමම කාර්ය මණ්ඩලයකින් සමන්විත වෙනම ඒකකයක් ස්ථාපිත කිරීම.

## ශ්‍රී ලංකාවේ සිදුවන ස්වභාවික ව්‍යවසනවලින් වන ආපදාවන් කළමනාකරණය සඳහා සම්බන්ධිත ආයතනවල කාර්යසාධනය

### නිකුත් කිරීමේ පසුබිම

ශ්‍රී ලංකාවට බලපාන ප්‍රධාන ස්වාභාවික ව්‍යසන ලෙස නායයාම්, සුළි සුළං, ගංවතුර, ලැව්ගිනි,භූ කම්පන,නියඟයන් හා සුනාමි දැක්විය හැක. මිනිස් ජීවිතවලට, දේපළවලට සහ පරිසරයට හානියක්, වෙනසක්, විනාශයක් තර්ජනයක් වන්නා වූ ස්වභාවික සිද්ධීන් ස්වාභාවික ව්‍යසන ලෙස සැලකේ.ස්වභාවික ව්‍යසන සඳහා සූදානම්වීම හා ඉන්පසු ඇතිවන ඵලවිපාක මඟින් ජනතාවට නැතහොත් ජනජීවිතයට රටේ දේපළවලට සහ ස්වාභාවික පරිසරයට වන බලපෑම අවම කිරීම ව්‍යසන කළමනාකරණය වේ. මෙම ජාතික කර්තව්‍ය සාක්ෂාත් කරගැනීම උදෙසා වර්තමානයේ රේඛීය අමාත්‍යාංශය වන ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශය මෙන්ම ඒ යටතේ ඇති කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය හා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ.

2021 වර්ෂයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුව නියඟය, ගංවතුර, නායයාම්, කණ්ඩි කඩාවැටීම්, දැඩි සුළං, ගිණි ගැනීම්, අකුණු අනතුරු යනාදී ආපදා හේතුවෙන් බලපෑමට ලක්වූ පුද්ගලයන්ගේ සංඛ්‍යාව ආසන්න වශයෙන් 1,253,476ක්ද, මරණයට පත්වූ සංඛ්‍යාව 184ක් ද, තුවාල සිදුවීම් 90ක් ද,ගංවතුර හේතුවෙන් අර්ධ නිවාස හානි 3,791ක් ද , පූර්ණ නිවාස හානි 96ක් දලෙස වාර්තා වී තිබුණි.ඒ අනුව, ස්වභාවික ව්‍යසන හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ ආපදාවන්ට ලක්වන පිරිස සහ සිදුවන දේපල හානි ඉහළ මට්ටමක පවතී.සංවර්ධන කටයුතුවලදී සහ මානව ක්‍රියාකාරකම්වලදී සිදුවන පාරිසරික බලපෑම් ඉහළයාම, මධ්‍යම කඳුකරය ආශ්‍රිත ප්‍රදේශවල නායයාම් අවදානම් වර්ධනය වීමට බලපාතිබුණි. ශ්‍රී ලංකාවේ සිදුවන ස්වභාවික ව්‍යසන හා ආපදාවන් කළමනාකරණයට අදාළ රේඛීය අමාත්‍යාංශය හා ඊට අදාළ ආයතනවල කාර්යසාධනය ඇගයීම මෙම කාර්යසාධන විගණනයේ අරමුණ වේ.මෙහිදී රේඛීය අමාත්‍යාංශය සහ ඊට සම්බන්ධිත ආයතන විසින් 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ගංවතුර, නියඟය,නායයාම් හා සුළිසුළං යන ආපදාවන් හඳුනාගැනීමේ පෙර සූදානම, ඒවාට ප්‍රතිචාර දැක්වීම හා ආපදාවෙන් පසු එය කළමනාකරණය කිරීමේ කාර්යසාධනය පරීක්ෂා කරන ලදී.

### වාර්තාව නිකුත් කරන ලද ආයතන පහත පරිදි වේ

ආපදා කළමනාකරණ අංශය (ආරක්ෂක අමාත්‍යාංශය) , ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය , ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, **ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) ,** කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුව

ලබා දෙන ලද නිර්දේශ කෙටියෙන්

1. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

- 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත මගින් ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ සමාජිකයන් පත් කිරීම,කාර්මික උපදේශන කමිටුවක් පත් කිරීම, ඒ සම්බන්ධ හෝ ඊට අනුෂාංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම, ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව බලාත්මක කිරීම සහ මෙම පනතේ විධිවිධාන ප්‍රකාර අරමුණු හා කාර්යයන් ඉටු කර ගැනීමට කටයුතු කිරීම.

- 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත ප්‍රකාරව සහ ආපදා කළමනාකරණ ජාත්‍යන්තර ගිවිසුම මත සෙන්දායි රාමුවට අනුකූලව ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සකස් කිරීම,ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම නිමකිරීම සහ පනතට අදාල සංශෝධන පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

- 2014 ආපදා කළමනාකරණ ජාතික ප්‍රතිපත්ති නව අවශ්‍යතාවයන් හඳුනාගනිමින් සකස් කිරීම,ප්‍රතිපත්තිය අනුව සකස් කළ යුතු අවදානම් දර්ශකය නියමිත පරිදි යාවත්කාලීන කරමින් එහි විචල්‍යයන් අධ්‍යයනය කර සුදුසු පියවර ගැනීම.

- මානව සම්පත් සැලැස්ම සකස් කිරීම මඟින් මානව සම්පත් නිසි ලෙස කළමනාකරණය කිරීම.

- ආපදා අවම කිරීම සම්බන්ධ ව්‍යාපෘති තෝරාගැනීමේදී ආපදා සිදුවිය හැකි ප්‍රදේශ පිළිබඳ අධ්‍යයනයක් මඟින් ආපදා අවදානම අවම කිරීම.

- 2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු 13 හි ඉලක්ක 3 යටතේ දේශගුණික විපර්යාස හා එමගින් ඇතිවන බලපෑම් වලට එරෙහි ක්‍රියාමාර්ග ගැනීමේ ප්‍රගතිය වැඩිකර අදාල අරමුණු කරා ලඟා වීම.

2. ජාතික ගොඩනැගිලි පර්යේෂණසංවිධානය

- ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සඳහා වඩාත් බලවත් නීතිමය තත්ත්වයක් ලබාදීම උදෙසා පනතක් පිළියෙළ කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව කඩිනම් අවධානය යොමු කිරීම.

- නායයාම් ප්‍රදේශ හඳුනාගැනීම සඳහා 1: 10 ,000 පරිමාණයේ සිතියම්කරණ කටයුතු කඩිනම් කිරීම හා සිතියම් කටයුතු අවසන් කර ඇති ප්‍රදේශවල පවතින ගොඩනැගිලි හඳුනාගැනීමට කටයුතු කිරීම.

- සිතියම්කරණයේ දී එම ස්ථානයේ නායයාම් අවදානම් මට්ටම අධි, මධ්‍යම හා අවම ලෙස හඳුනාගැනීමට කටයුතුකිරීම.

- ස්වයංක්‍රිය වර්ෂාමානවල නිරවද්‍යතාවය වැඩිකර ගැනීම සඳහා පරීක්ෂා කිරීම සහ වර්ෂාමාන නඩත්තු කිරීම් දිස්ත්‍රික් කාර්යාලවලට පැවරීම.

## 3. ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශය

- ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශය යටතේ පවතින කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යන ආයතනවල ආපදා කළමනාකරණය සම්බන්ධව තොරතුරු සන්නිවේදනය කිරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම.

- සුරක්ෂිත මධ්‍යස්ථාන ලෙස භාවිතා කළ හැකියැයි හඳුනාගෙන ඇති ස්ථානවල සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීම.

- පානීය ජල අවශ්‍යතා සපුරාලීම සඳහා දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශ වෙත ලබාදී තිබූ ට්‍රැක්ටර් බවුසර්,ලොරි බවුසර් හා ජල ටැංකිවල ප්‍රශස්ථ හා කාලීන උපයෝජනය පිළිබඳ පසු විපරමක් සිදුකිරීම.

- නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘති යටතේ ඉදිකිරීම් මට්ටමේ පවතින නිවාස සහ ඉදිකිරීමට ඇති නිවාස කඩිනමින් ඉදිකිරීම.

## 4. කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුව

- නව රේඩාර් පද්ධති ස්ථාපිත කිරීමට අපේක්ෂා කරනු ලබන පුත්තලම වැඩබිමෙහි පාරිසරික බලපෑම් පිළිබඳව අධ්‍යනයක් සිදුකර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

- කාලගුණ විද්‍යා උපකරණ නිසි පරිදි නඩත්තු කර ඒවා නිවැරදි අනාවැකිකරණය සඳහා කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගැනීම.

- 2021 සිට 2025 දක්වා වසර 05 වෙනුවෙන් සකස් කර තිබූ සංයුක්ත සැලැස්මට අනුව අදාළ කාර්යයන් සිදුකිරීම හා ක්‍රියාකාරී සැලැසුම් සංයුක්ත සැලැස්මට අනුරූපීව සකස්කිරීම.

## පාරිභෝගිකයා ආරක්ෂා කිරීමෙහිලා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ දායකත්වය

### නිකුත් කිරීමේ පසුබිම

පාරිභෝගිකයන්ගේ ජීවිත හා දේපලවලට උපද්‍රවයක් සිදුවන භාණ්ඩ අලෙවි කිරීමට සහ සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම , අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලට විරුද්ධව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම්වලට නිසි සැලකිල්ල දැක්වීමට සහතික වීම, හැකි සෑම විටම පාරිභෝගිකයන්ට තරගකාරී මිලට භාණ්ඩ හා සේවාවලට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබාදීමට සහතික වීම සහ අසාධාරණ වෙළෙඳ පිළිවෙත්, සීමිත වෙළෙඳ පිළිවෙත් හෝ වෙළෙන්දන් විසින් සිදුකරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම්වලට එරෙහිව සහනයන් ලබාදීම යන අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමේ අරමුණින් 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත මගින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවා තිබුණි.

පාරිභෝගිකයන්ගේ ජීවිත හා දේපලවලට උපද්‍රවායක් සිදුවන භාණ්ඩ හා සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම, අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලට විරුද්ධව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම හා පාරිභෝගික අයිතිවාසිකම්වලට නිසි සැලකිල්ල දැක්වීම, හැකි සෑම විටම පාරිභෝගිකයන්ට තරගකාරී මිලට භාණ්ඩ හා සේවාවලට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබා දීමට සහතික වීම හා වෙළෙන්දන් සිදුකරන පාරිභෝගික සූරාකෑම්වලට එරෙහිව සහනය ලබාදීම යන කරුණු සම්බන්ධව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට කල හැකි කාර්යභාරය ඉතා වැදගත් වේ. ඒ සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත මඟින් විධිවිධාන සපයා ඇත. ඒ අනුව පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා පනතේ සඳහන් අරමුණු ළඟාකර ගැනීම සම්බන්ධයෙන් අධිකාරිය කටයුතු කර ඇති ආකාරය ඇගයීම සඳහා මෙම කාර්යසාධන විගණනය සිදුකරන ලදී. ඒ අනුව මෙම විගණනයේ අරමුණ වනුයේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගින් පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා සිදු කරන කාර්යභාරයේ කාර්යසාධනය ඇගයීම වේ.

වාර්තාව නිකුත් කරන ලද ආයතන පහත පරිදි වේ

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

ලබා දෙන ලද නිර්දේශ කෙටියෙන්

- 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ 73 වගන්තිය ප්‍රකාරව, ඉවත් කරනු ලැබූ 1979 අංක 1 දරන පාරිභෝගික ආරක්ෂා කිරීමේ පනත යටතේ නිකුත් කරන ලද විධානවල කාලීන අවශ්‍යතාවය හඳුනාගෙන එම විධාන වර්තමානයට ගැලපීම සම්බන්ධයෙන් පත් කල කමිටුව ඉදිරිපත් කර තිබුණු යෝජනා සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම

- 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සංශෝධන කටයුතු කඩිනම් කිරීම

- ආනයනික භාණ්ඩ සම්බන්ධයෙන් උපරිම සිල්ලර මිල සහතික නිකුත් කිරීමට අවශ්‍ය වන භාණ්ඩ වර්ග තවදුරටත් හඳුනාගෙන වර්තමානයට ගැලපෙන ආකාරයට රටට ආනයනය කරනු ලබන භාණ්ඩ වර්ග ඇතුලත් කරමින් පුළුල් ආවරණයක් වන පරිදි නව විධානයක් නිකුත් කිරීම

- ආනයනික භාණ්ඩ සම්බන්ධයෙන් උපරිම සිල්ලර මිල සහතික නිකුත් කිරිමේදි ආනයනකරුවන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට ප්‍රකාශ කරනු ලබන උපරිම සිල්ලර මිලටම, එම භාණ්ඩ අලෙවි වනවා දැයි පරීක්ෂා කිරීමට වෙළඳපොළේ සියලු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි වැටලීම් කටයුතු පුළුල් කිරීම

- උපරිම සිල්ලර මිල සහතික ලබා ගැනීමට අධිකාරියට තොරතුරු ඉදිරිපත් නොකරන ආනයනකරුවන් සම්බන්ධව වෙළෙඳපොල වැටලීම් කිරීම හා ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම

- ආනයනකරුවන් විසින් උපරිම සිල්ලර මිල සහතික ලබා ගැනීමට ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සඳහා අනුමැතිය ලබා දීමට පෙර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් එම මිල ගණන් සම්බන්ධව භෞතිකව පරීක්ෂා කිරීම

- පැමිණිලි අංශයට ලැබෙන පැමිණිලි අතරින් අධිකාරියට විසඳිය නොහැකි පැමිණිලි අදාල ආයතන වලට යොමුකල පසුව එම පැමිණිලි මඟින් පාරිභෝගිකයාට ඇති ගැටලුව විසඳී ඇද්ද යන්න පසු විපරම් කිරීම

- පැමිණිලි අංශයෙන් විසඳීමට නොහැකි පැමිණිලි නීති අශයට යොමු කර එම පැමිණිලි කෙටි කාලයකින් විසඳා පරිභෝගිකයාට සහන සැලසීමට පියවර ගැනීම

- කෘෂි උපකරණ සම්බන්ධ ලැබෙන පැමිණිලි විසඳීමට පනතේ නීතිරීති ඇතුලත් කිරීම

- ප්‍රමිති ආයතනය සමඟ එකඟ වී ආනයනය කරන යන්ත්‍ර සූත්‍ර වල අදාල ප්‍රමිතියන් නියමයන් නියම කිරීම

- පනත ප්‍රකාරව වෙළෙන්දන් ලියාපදිංචි කිරීමේ කටයුතු ආරම්භ කල යුතු අතර. ඒ සඳහා ක්‍රමවත් දත්ත පද්ධතියක් ඇති කිරීම

- සාම්පල් පරීක්ෂා කිරිමේදි පාරිභෝජනයට නුසුදුසු බවට හෝ නියමිත ප්‍රමිතිය නොමැති බවට තහවුරු වන සාම්පල් සම්බන්ධව එම වෙළෙන්දුන්ට හා නිෂ්පාදකයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කිරීම

- වෙළඳපල මිල ගණන් පාරිභෝගිකයාට දැන ගැනීමට හැකිවන ආකාරයට 1977 සේවාව සකස් කිරීම හා ඒ මඟින් කරන පැමිණිලි සටහන් වූ බව පැමිණිලිකරුට නැවත දැන්වීමට ක්‍රමවේදයක් ඇති කිරීම

- දත්ත පද්ධතියේ තොරතුරු ඇතුලත් කිරිමේදී සෑම දිස්ත්‍රික්කයකම එකම ආකාරයෙන් තොරතුරු ඇතුලත් කිරීම

- විධාන අංක අනුව කරන වැටලීම් පිළිබඳව වෙන වෙනම දත්ත ලබාගත හැකි පරිදි තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීම

- වැටලීම් වලදී නඩු මඟින් දඩ අයකිරිමේදී එම අයකරන දඩ මුදල අදාල නඩුවට අයකර තිබේද යන්න හඳුනා ගත හැකි පරිදි දත්ත පද්ධතියට තොරතුරු ඇතුලත් කිරීමට ක්‍රමවේදයක් ඇති කිරීම

- වැටලීම් සිදු කර, නඩු පැවරීම් සිදු නොකල වැටලීම් සම්බන්ධයෙන් නඩු පැවරීම් නොකිරීමට හේතු වන කරුණු සම්බන්ධව අධීක්ෂණය සිදු කිරීම

- පනතේ විවිධ වගන්ති යටතේ මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ කරුණු සම්බන්ධයෙන් අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම

- 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත ප්‍රකාරව පැමිණිලි ලැබී මසක් ඇතුලත විසඳීමට කටයුතු කිරීම

## අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පිළිබඳ ඇගයීම

### නිකුත් කිරීමේ පසුබිම

රජයේ සහ රජයට අනුබද්ධ පාසල් හා පිරිවෙන්ද ඇතුළුව ඉගෙනුම ලබන සිසුන්ට අවශ්‍ය පාසල් පෙළපොත් නොමිලේ ලබාදීමේ සහ එයටම බද්ධ වූ අතිරේක කියවීම් පොත් හා ඉගෙනුම් ආධාරක සම්පාදනය කරදීමේ ජාතික කර්තව්‍ය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබයි.

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම කාර්යභාරය වන පෙළපොත් මුද්‍රණය හා බෙදාහැරීමේ ක්‍රියාවලියෙහි කාර්යසාධනය පිළිබඳ ඇගයීම මෙම විගණනයේ ප්‍රධාන අරමුණ වේ.

**පහත සඳහන් ආයතන වෙත වාර්තාව නිකුත් කරන ලදී.**

අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ලබා දෙන ලද ප්‍රධාන නිර්දේශ පහත පරිදි වේ.**

- මුද්‍රණය කල යුතු පොත් ප්‍රමාණය තීරණයේ දී බෙදාහැරීමේ මධ්‍යස්ථාන හා පාසල් සතුව පවතින නොබෙදා ඉතිරිව ඇති පොත් ප්‍රමාණය පිළිබඳ හැකිතාක් නිවැරදි දත්ත ලබා ගැනීමට කටයුතු කිරීම.
- විධිමත් තොග පවත්වාගෙන යාම සඳහා පරිගණක තොරතුරු පද්ධතියක් නඩත්තු කරමින් තොග ශේෂ නිවැරදිව පවත්වා ගැනීම.
- අමතර පොත් ඉල්ලීම් සඳහා හැකිතාක් භාවිතයට සුදුසු පැරණි පොත් ලබාදීමට කටයුතු කිරීම.
- 6,7,8 හා 9 ශ්‍රේණි සඳහා පොත් නැවත භාවිතයට දරුවන් උනන්දු කරවීම හා ඒ පිළිබඳව පළාත් අධ්‍යක්ෂකවරුන් හරහා විදුහල්පතිවරුන්ට උපදෙස් ලබා දීමට කටයුතු කිරීම.
- 10,11 ශ්‍රේණි දරුවන් උසස් පෙළ සඳහා වෙනත් පාසලකට යාමේදී හෝ එම පාසලේම රැඳෙන්නේ නම් එහිදී හෝ හැකි උපරිමයෙන් පොත් ආපසු ලබා ගැනීමට කටයුතු කිරීම.
- අධ්‍යාපන අමාත්‍යාංශය හා එක්ව එක් එක් විෂය හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව නිවැරදිව තීරණය කිරීමට කටයුතු කිරීම. ඒ සඳහා පාසල් මට්ටමෙන් තොරතුරුලබා ගැනීම හා විධිමත් පරිගණක පද්ධතියක් යාවත්කාලීනව පවත්වා ගෙන යාමට කටයුතු කිරීම.
- පෙළපොත් සඳහා ඇනවුම් ලබාදීමේ ප්‍රමාදය අවම කිරීමට කටයුතු කිරීම.

- වාර්ෂිකව සිදු කරන පෙළපොත් මුද්‍රණයට අදාළ ප්‍රසම්පාදන කටයුතු කඩිනමින් සිදුකිරීමට කටයුතු කිරීම හා පෙළපොත් බෙදාහැරීමේ කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කිරීම.
- පළමු වාරය ආරම්භයට පෙර පාසල් පෙළපොත් දරුවන්ට ලබා දීමට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව කටයුතු කිරීම හා පෙළපොත් දරුවන්ගෙන් ලබාගෙන විධිමත් වශයෙන් බෙදා දීමට අවශ්‍ය උපදෙස් විදුහල්පතිවරුන්ට ලබා දීම.
- ගබඩාවේ ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කරමින් ගබඩාව ක්‍රමානුකූලව පවත්වාගෙන යාම.
- බ්‍රේල් මුද්‍රණාලය සඳහා කඩිනමින් බ්‍රේල් මුද්‍රණ ක්‍රියාකරුවකු බඳවා ගැනීමට කටයුතු කිරීම. මුද්‍රණ යන්ත්‍ර කටයුතු කාර්යක්ෂම කරගැනීම හෝ නවීන ලෝකයට ගැලපෙන ආකාරයට විධිමත් ක්‍රමවේද සකස් කිරීම පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව සාකච්ඡා කර ඉක්මන් පියවර ගැනීමට කටයුතු කිරීම.
- සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ විධිමත් සැලසුම්වලින් තොරව ප්‍රතිපාදන වැය කරමින් කටයුතු කල ඒ සඳහා වගකිවයුතු නිලධාරීන්ගෙන් ඒ පිළිබඳ තොරතුරු කැඳවීමට කටයුතු කිරීම සහ ඒ සඳහා නිර්දේශ ලබා ගැනීමට කටයුතු කිරීම.
- නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කර පිටිපන පෙළපොත් ගබඩා සංකීර්ණය පිහිටා ඇති ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කිරීම.

## 2024 වර්ෂයේදී සභාගත කරන ලද පරිසර විගණන වාර්තාව

**ශ්‍රී ලංකාවේ ජාතික උද්‍යාන වල තෘණ භූමි සංරක්ෂණ ක්‍රියාවලිය ඇගයීම පිළිබඳ පාරිසරික විගණන වාර්තාව - ඊඑන්වී/2024/01 (2024.03.05)**

වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥා පනත (469 වන අධිකාරිය) යටතේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පාලනය කරන ජාතික උද්‍යාන ශ්‍රී ලංකාවේ ආරක්ෂා කළ යුතු වන සම්පත් වන අතර පරිසරයේ තුලනාත්මක බව රැක ගැනීමට හා වනජීවීන්ගේ පැවැත්ම උදෙසා මෙම කලාප මගින් මහත් පිටුවහලක් ලබා දේ. මෙම ජාතික උද්‍යාන වල පවතින තෘණ භූමි ඉහළ පාරිසරික වැදගත්කමකින් යුක්ත වන අතර තෘණ භක්ෂක සතුන් විශාල ප්‍රමාණයක් සඳහා වාසභූමියක් වීම, ජෛව විවිධත්වයෙන් යුක්ත වීම, පැළෑටි හා සතුන්ගේ තුලනාත්මකභාවය පවත්වාගෙන යෑම, පාංශු ගුණත්වය ආරක්ෂා කිරීම, ශාක වැස්මක් නැති විවෘත භූමි ප්‍රදේශ වල අලංකාරව විහිදී පැවතීම මගින් සොබාදහමට ආකර්ෂණීය සුන්දරත්වයක් එක් කිරීම, තෘණ භූමි ආශ්‍රිතව වාසය කරන වන අලින්, මුවන්, ගෝනුන් වැනි සතුන් නැරඹීමට විශාල සංචාරකයින් ප්‍රමාණයක් පැමිණීම, සංචාරක ආකර්ෂණය දිනා ගැනීම මගින් රටට විශාල ආදායමක් රැස් කර ගත හැකි වීම සහ එමගින් ආර්ථිකය

සංවර්ධනය වීම වැනි ප්‍රයෝජන රාශියක් ජාතික උද්‍යාන සතු මෙම තෘණ භූමි මගින් සිදු වේ. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දැනට ජාතික උද්‍යාන 26 ක් ප්‍රකාශයට පත්කර තිබේ. මෙම උද්‍යාන වල පැවැත්ම පිළිබඳ මෑත කාලයේදී පැන නැගී ඇති ගැටළු හේතුවෙන් මේවායේ පැවැත්ම අභියෝගයට ලක්ව ඇත. ඒ අනුව ඊට වගකිව යුතු රාජ්‍ය ආයතන වල කාර්යභාරය ඇගයීම හා මෙම පරිසර පද්ධති තුළින් පරිසරයට ඇති කරන බලපෑම ඇගයීම පිණිස ජාතික උද්‍යාන 09 ක් සහ අභයභූමි 02 ක් සඳහා අවධානය යොමු කරන ලදී. ජාතික උද්‍යාන සතු මෙම තෘණ භූමි වල වැදගත්කම මෙතෙක් අවධානයට ලක්නොවීම නිසා තෘණ භූමි වල පැවැත්මට ඇතිවන්නා වූ තර්ජනයන්හී වර්ධනය වීමක් දක්නට ලැබුණි. පාරිසරික වශයෙන් ඉතා වැදගත් වූ මෙම තෘණ භූමි ප්‍රදේශ විනාශයට පත්වීමේ අවධානමක් පවතින හෙයින් තෘණ භූමි සංරක්ෂණය කිරීම සඳහා අදාල බල අධිකාරිය ඇති ආයතන මගින් සිය කාර්යය ඉටුවී ඇත්ද යන්න ඇගයීමත් පවතින ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමත් මෙම විගණනයේ අරමුණ විය.

නිර්දේශ

- තෘණ භූමි කළමණාකරණය හා සංරක්ෂණය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීම හා ඒ සම්බන්ධයෙන් කළමනාකරණ සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.

- ආගන්තුක ආක්‍රමණශීලී ජීවී විශේෂ පාලනය සම්බන්ධයෙන් වූ ජාතික ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම, පසු විපරම් කිරීම හා මූලික අවධියේදීම ආක්‍රමණික ශාක හඳුනා ගැනීම හා ශාක පැතිරීම අඛණ්ඩව පාලනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා ඊට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා දීම.

- පවතින තෘණ භූමි සංරක්ෂණය කිරීමටත් තෘණ භූමි වැඩි දියුණු කිරීමටත් අවශ්‍ය කටයුතු කිරීම හා තෘණ භූමි සංරක්ෂණ ක්රියාවලිය සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නියමිත කාල වලදී ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- වැව් පිටිවල පවතින තෘණ භූමි වල ස්වභාවික පැවැත්මට ඇතිවී තිබෙන බාධා අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා නව ජල යෝජනා ව්‍යාපෘති සහ වාරිමාර්ග කටයුතු සඳහා ජලය මුදා හැරීමේදී වර්ෂය පුරා වැව් අඛණ්ඩව පිරී පැවතීමෙන් වැව් පිටිවල තෘණ වර්ධනයට බාධා වී තිබෙන බැවින් එවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී තුලනාත්මකව කටයුතු කිරීම හා ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම.

- ජාතික උද්‍යාන තුළ පවතින තෘණ භූමි මනා ලෙස කළමනාකරණය හා සංරක්ෂණය නොකිරීම හේතුවෙන් වන අලි ගම් වැදීමට ප්‍රධාන හේතුවක් වන බැවින් තෘණ භූමි නිසි පරිදි කළමනාකරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. [ඡේද අංක 3.5.5 (ඇ) (ii)]

- ජාතික උද්‍යාන සම්බන්ධයෙන් පාරිසරික තත්ත්වයන් පිළිබඳව දත්ත පද්ධතියක් (මාසික වාර්තා) පවත්වාගෙන යාමට ක්‍රියා මාර්ග ගැනීම.

.

# විශේෂ විමර්ශන අංශය

විගණකාධිපතිවරයා ලෙස රාජ්‍ය විගණනයට අදාළව මා සතු ව්‍යවස්ථාපිත බලතල ක්‍රියාත්මක කිරීම ක්‍රමානුකූල සහ පහසු කරවීම සඳහා විගණන කාර්ය මණ්ඩලය විවිධ විෂයානුබද්ධ විගණන අංශ යටතේ අනුයුක්ත කර ඒවා සඳහා සුවිශේෂ කාර්යයන් පවරා ඇත. එහිදී යම් විගණන අස්ථිත්වයකට අදාළව ඇතැම් ගණුදෙනුවක් හෝ සිද්ධියක් සම්බන්ධයෙන් විමර්ශනාත්මක විගණනයක් සිදු කිරීමේ අවශ්‍යතාවයක් පැන නඟින විට එවැනි විමර්ශන විගණන කාර්යයන් සිදු කිරීම සඳහා සහ වෙනත් අංශ වලින් සිදුකරන එවැනි විගණනයන්ට සහය දැක්වීම සඳහා ජාතික විගණන කාර්යාලයේ සේවයේ නිරත විශේෂ විමර්ශන හා ‍වෝහාරික විගණනය පිළිබඳ පුහුණුවීම් සහ අත්දැකීම් සහිත නිලධාරීන්ගේ සමන්විතව විශේෂ විමර්ශන හා ‍වෝහාරික විගණන අංශයක් ස්ථාපිත කර ඇත.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 04 වන වගන්තිය පරිදි මා වෙත ලැබෙන මහජන නියෝජනද, රාජ්‍ය ගිණුම් පිළිබඳ සහ ව්‍යවසාය පිළිබඳ කාරක සභාවන්හි දැනුම් දීම මෙන්ම රාජ්‍ය ආයතන ප්‍රධානීන්, ජනමාධ්‍ය වෙතින් ප්‍රකාශිත කරුණු, කාලීනව වැදගත්කමක් ඇති ආර්ථික හා සමාජීය කරුණු ද, මා විසින් සැලකිල්ලට ගනු ලබන වෙනත් වෘත්තීමය අවශ්‍යතාවයන් ද පදනම් කර ගනිමින් විශේෂ විගණන විමර්ශනයකට ලක්වීම උචිත යයි මා විසින් තීරණය කරනු ලබන ගණුදෙනු හා සිද්ධීන් මෙම විමර්ශන අංශයේ විගණනයට ලක් කරවනු ලැබේ. ඇතැම් අවස්ථාවන්හි දී මෙම අංශයේ නිලධාරීන් වෙනත් විගණන අංශ / ශාඛා වෙත තාවකාලිකව අනුයුක්ත කර විශේෂ විමර්ශනයක් සිදු කරවනු ලැබේ.

**2024 වර්ෂයේ දී එලෙස විශේෂ විමර්ශනයට ලක් කළ ගනුදෙනු හා සිද්ධීන් සමූහය අතරින් ප්‍රමාණාත්මකව වැදගත් නිරීක්ෂණයන් පහත දැක්වේ.**

01. 2020 ජනවාරි 01 සිට 2022 මැයි 31 දක්වා කාලය තුළ දී ජාතික පාසල්වල අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම පිළිබඳ විගණන පරීක්ෂාවේ දී 2022 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ පාසල් අතුරින්, පාසල් 396 ක් ජාතික පාසල් ලෙස හඳුනාගෙන තිබුණි.

    ජනප්‍රිය පාසල් ලෙස එම පාසලකට සිසුන් ඇතුළත් කිරීම සඳහා අතරමැදි ශ්‍රේණියකට සිසුන් ඇතුළත් කිරීමේ දී නියමිත ක්‍රමවේදයෙන් බැහැරව විවිධ පාර්ශවයන්ගේ ඉල්ලීම් නිර්දේශයන්/අභියාචනයන්/නියෝග ලෙස හැඟී යන තත්ත්වයන් මත අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සෘජුව විදුහල්පතිවරුන් වෙත ලිපි නිකුත් කර සිසුන් ඇතුළත් කිරීම් සිදු වූ අවස්ථා නිරීක්ෂණය වේ. 2020 වර්ෂයේ සිට 2022 මැයි 31 දක්වා අධ්‍යාපන ලේකම්වරයා විසින් නිකුත් කරන ලද ලිපි 4.775 ක් උපයෝගී කරගෙන පාසල්වලට සිසුන් ඇතුළත් කර ගෙන තිබූ බව අනාවරණය විය.

02. විදේශ ප්‍රේෂණ මත, එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් වෙත පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා දීමට අදාළව, 2022 මැයි 01 සිට 2023 සැප්තැම්බර් 15 දින දක්වා පමණක් විදේශ මුදල් ප්‍රේෂණය කර තිබූ විදේශ සේවා නියුක්තිකයින් වෙනුවෙන් (2023 මැයි 23 දිනැති අංක අමප/23/0843/625/018 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ) ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රමය පිළිබඳ විශේෂ විගණනයක් සිදු කරන ලදී. එහිදී,

(i) විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගෙන් ලංකාවට ලැබෙන ප්‍රේෂණ ඉහළ නැංවීමේ අරමුණින්, එවන ලද ප්‍රේෂණ මත පදනම්ව, එනම් එම ප්‍රේෂණ වලින් සියයට 50 ක උපරිමයක් දක්වා මි.ර.ගා. (CIF) වටිනාකමක් සහිත විද්‍යුත් වාහනයක් ආනයනය කිරීම සඳහා බලපත්‍රයක් ලබා දීමේ යෝජනා ක්‍රමයක් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් 2022 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. ඒ අනුව, වාහන ආනයනය තාවකාලිකව අත්හිටුවා තිබූ අවස්ථාවක විදේශගත ශ්‍රමිකයින් දිරිගැන්වීමේ අරමුණින් විද්‍යුත් වාහනයක් ආනයනයට අවස්ථාව ලබා දීමත්, ආනයනය කරන වාහනය මත අයකරන සුඛෝපභෝගී බදු නිදහස් සීමාව රු. මිලියන 6 සිට රු. මිලියන 12 දක්වා ඉහළ නැංවීමත් මෙම යෝජනා ක්‍රමය යටතේ සිදුකර තිබුණි. කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයෙන් ලද තොරතුරු අනුව, යෝජනා ක්‍රමය යටතේ 2022 සැප්තැම්බර් 22 සිට 2024 ජුනි 30 දක්වා කාලය තුළ බලපත්‍ර 1,077 ක් නිකුත් කර තිබූ අතර එයින් බලපත්‍ර 77 ක් අවලංගු කර තිබුණි. 2024 ජුනි 30 දින වන විට වලංගු බලපත්‍ර 1,000 අතුරින් බලපත්‍ර 510 කට අදාළව පමණක් වාහන ආනයනය කිරීමට අදාළ බලපත්‍රලාභීන් කටයුතු කර තිබුණු අතර, ඉන් 375 ක් පමණක් මෝටර් රථ කොමසාරිස් ජනරාල් කාර්යාලයේ ලියාපදිංචි කර තිබුණි. ඉතිරි වාහන 135 ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි. 2024 ජුනි 30 දින වන විට ඇ.ඩො. 121,505,640 ක් වූ විදෙස් ප්‍රේෂණ, යෝජනා ක්‍රමය යටතේ බලපත්‍රලාභීන්ගේ බැංකු වෙත ලැබී තිබූ අතර ආනයනිත වාහන 510 සඳහා ඇ.ඩො. 24,100,757 ක් විදේශ වෙත ප්‍රේෂණය කර තිබුණි.

(ii) මෙම බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් මූලික හා අත්‍යවශ්‍ය තොරතුරු විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේද යටතේ පිළිගත හැකි පරිදි ලේඛනගත කිරීමේ ක්‍රමවේදයක් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය අනුගමනය නොකිරීම හේතුවෙන් සහ බලපත්‍ර නිකුත් කිරීමට අදාළව අයදුම්පත් භාර ගැනීම, පරීක්ෂා කිරීම, බලපත්‍ර නිකුත් කිරීම, අවලංගු කිරීම ඇතුළු සියලු කරුණු කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ නිලධාරීන් කිහිප දෙනෙකු විසින් අක්‍රමවත් පරිදි සිදු කර තිබීම හේතුවෙන් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දී බරපතල ලෙස විනිවිදභාවය කඩකර තිබූ බවට කරුණු අනාවරණය විය.

(iii) තවද, සහනදායි තීරුබදු බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක රජයේ අධිකාරී ආයතනය වන මහා භාණ්ඩාගාරයේ වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හෝ මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී බලපත්‍ර නිකුත් කළ යුතු යැයි අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබූ ආනයන අපනයන පාලක වෙත එම කටයුතු පැවරීමකින් තොරව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් විසින් එම කටයුතු පවරා ගැනීම් තුලින් අධිකාරී බලය අවභාවිතා කිරීම හා පැවතිය යුතු යහපත් අභ්‍යන්තර පාලන ක්‍රමවේද නොසලකා හැරීමක් කර තිබූ බවට කරුණු අනාවරණය විය

(iv) මෙම යෝජනා ක්‍රමය යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට නම් 2022 මැයි 01 දින සිට 2023 සැප්තැම්බර් 15 දින දක්වා කාල පරිච්ඡේදය තුළ විදේශ රටක සේවා නියුක්ත වී සිටීමේ කොන්දේසිය සපුරාලිය යුතු වුවත් එලෙස තහවුරු කර ගැනීමේ ක්‍රම වේදයක් අමාත්‍යාංශය විසින් අනුගමනය කර නොතිබුණි. ස්වාධීන විගණන පරීක්ෂාවලදී විදේශගත වූ බවට තහවුරු නොවූ පුද්ගලයින් හතර දෙනෙකු (04) වෙනුවෙන් ද අදාළ නීතිරීති රෙගුලාසි නොසලකා විද්‍යුත් වාහන ආනයන බලපත්‍ර නිකුත් කිරීමට අමාත්‍යාශය කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය. මෙම පුද්ගලයින් 04 දෙනාගේ බැංකු ගිණුම්වලට සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී ඇ.ඩො. 445,942 ක විදේශ ප්‍රේෂණ, ලැබී තිබුණු අතර විදේශගත නොවූ පුද්ගලයින්ගේ බැංකු ගිණුම් සඳහා ලැබී තිබුණු මෙම විදේශ මුදල් ප්‍රේෂණ, මුදල් විශුද්ධිකරණය මගින් හෝ වෙනත් අනීතික අකාරයකින් ලද මුදල් නොවන බවට තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම විද්‍යුත් වාහන බලපත්‍රයක හිමිකම ලැබීමට විදේශගත වී සිටිය යුතු අවම නිශ්චිත කාලසීමාවන් පිළිබඳ අදාළ චක්‍රලේඛය මගින් නිශ්චය කර නොතිබුණු අතර දින 03 සිට මාස 03 දක්වා වූ කෙටි කාලපරිච්ඡේදය තුළ විදේශගතව සිට පැමිණි පුද්ගලයන්ට හා කඩින් කඩ විදේශගත වූ පුද්ගලයන් සඳහා ද මෙම යෝජනා ක්‍රමය යටතේ බලපත්‍ර ලබා දීමට කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් කටයුතු කර තිබුණි. ඒ අනුව, සලකා බලන ලද කාලසිමාව තුළ ගිණුම්වලට කවරාකාරයකින් හෝ ලැබී ඇති ප්‍රේෂණ මුදල පිළිබඳව පමණක් අවධානය යොමු කර ඇති බවට කරුණු අනාවරණය විය.

(v) කැබිනට් අනුමැතියක් හෝ මුදල් අමාත්‍යාංශයේ නිර්දේශයකින් තොරව යෝජනා ක්‍රමය යටතේ බලපත්‍රලාභීන් සඳහා වාහන ආනයනය කිරීමට පහසුකම් සපයන ආනයනකරුවන් ලෙස, ආයතන ලියාපදිංචි කිරීමට කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය කටයුතු කර තිබුණි. එසේ ලියාපදිංචි කරන ලද ආයතන දෙකක් විසින් බලපත්‍රලාභීන් 640 ක් සඳහා පහසුකම් සපයන ආනයනයකරු ලෙස කටයුතු කර තිබුණද, වාහන ආනයන කිරීමේ කටයුතු වෙනත් පාර්ශව මගින් සිදු කර තිබුණි.

එබැවින් මෙම ලියාපදිංචි කර ඇති ආයතන සඳහා අතරමැදි ව්‍යාපාරික අවස්ථාවක් මෙම යෝජනා ක්‍රමය යටතේ නිර්මාණය කර තිබුණු බවට කරුණු අනාවරණය විය.

(vi) යෝජනා ක්‍රමය යටතේ ආනයනය කර තිබූ වාහන 510 ක් සඳහා පමණක් සුබෝපභෝගී බදු නිදහස් සීමාව රු. මිලියන 6 සිට රු.මිලියන 12 දක්වා ඉහළ දැමීම හේතුවෙන් විගණනයේ ගණනය කිරීම් අනුව අයකරගත හැකිව තිබුණු රු.මිලියන 1,384 ක බදු ආදායමක් රජයට අහිමි වී තිබුණු බව නිරීක්ෂණය විය. තවද, මෙම බලපත්‍ර මත ආනයනය කරන වාහනයක් CIF වටිනාකමින් සියයට 10 ක බද්දක් ගෙවා වෙනත් පාර්ශවයකට පැවරීමට අවස්ථාව ලබා දී තිබුණද, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලද විස්තර අනුව වෙනත් පාර්ශවයන්ට පවරා තිබූ වාහන 06 ක් සඳහා රු. මිලියන 12.8 ක් වූ පැවරුම් බදු ගෙවූ බවට විගණනයට තහවුරු නොවුණි.

මෙම විශේෂ විමර්ශන හා වෝහිරික විගණන අංශය විසින් අනාවරණය කර ගත් ඇතැම් නිරීක්ෂණ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 13 වගන්තිය පරිදි නිකුත් කරනු ලබන විශේෂ වාර්තාවන්ටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව පරිදි පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවල ද ඇතැම් නිරීක්ෂණ කළමනාකරණය වෙත නිකුත් කරනු ලබන වාර්තාවලට ඇතුළත් කරනු ලැබේ.

කෙසේ වෙතත්, අංශයට අනුයුක්ත කාර්ය මණ්ඩලය අවස්ථානුකූලව වෙනත් අංශ / ශාඛා සඳහා ස්ථිරව හා තාවකාලිකව අනුයුක්ත කිරීම, විමර්ශන විගණනයන් සඳහා සාපේක්ෂව වැඩි කාලයක් ගත වීම සහ විගණන නිරීක්ෂණ සඳහා පිළිතුරු ලබා දීමට විශාල කාලයක් ලබාගැනීම මෙන්ම එම පිළිතුරු නැවත නැවත සමාලෝචනය කිරීමට සිදුවීම වැනි කරුණු හේතුවෙන් එකිනෙක වර්ෂ තුළදී සිදුකරනු ලබන විමර්ශන විගණනයන්හි නිරීක්ෂණ, ඉහත සඳහන් වාර්තාවලට ඇතුළත් කිරීම බොහෝ විට ඉදිරි වර්ෂවල දී සිදු කෙරේ.

# විශේෂ වාර්තා අංශය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 13 වගන්තිය ප්‍රකාරව විශේෂ විගණනයන් සිදුකිරීම සඳහා විගණකාධිපතිවරයා වෙත අධිකාරී බලය ලබා දී ඇත. තවද, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, රාජ්‍ය ගිණුම් කාරක සභාව හා රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාව විසින් කරනු ලබන ඉල්ලීම් හා ජාතික සහ කාලීන වැදගත්කමක් සහිත මාධ්‍ය හෙළිදරව් කිරීම් හෝ මහජන නියෝජනයන් මඟින් පැන නගින විශේෂිත කරුණුද විශේෂ වාර්තා නිකුත් කිරීමට අදාල කර ගනු ලැබේ. මෙම නිරීක්ෂණ සමඟ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගද ඇතුළත් කර විශේෂ වාර්තා නිකුත් කරනු ලැබේ. 2024 වර්ෂය තුල පහත පරිදි විශේෂ වාර්තා 06ක් නිකුත් කර ඇත.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අදාල මුලාශ්‍රයන්ට අදාලව කරගෙන නොමැති එකතු කල අගය මත බදු පිළිබඳ විශේෂ විගණන වාර්තාව , රාජ්‍ය බැංකුවල ඉහළම අක්‍රීය ණය ගනුදෙනුකරුවන් 25 පිළිබඳ විශේෂ විගණන වාර්තාව , එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් ගේ විදේශ ප්‍රේෂණ මත පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සහා බලපත්‍ර ලබාදීමේ යෝජනා ක්‍රමය විශේෂ විගණන වාර්තාව, ඖෂධ සම්බන්ධයෙන් අවශ්‍යතාවය, ප්‍රසම්පාදනය, සැපයුම, බෙදාහැරීම පිළිබඳ විශේෂ විගණන වාර්තාව, ශ්‍රී ලංකා රේගුවේ පවතින විවිධ අරමුදල් කළමනාකරණය පිළිබඳ විශේෂ විගණන වාර්තාව හා ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනයේ 2017 ජනවාරි සිට 2022 මාර්තු මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ පරිපාලන හා මෙහෙයුම් ක්‍රියාකාරකම් පිළිබඳ සිදුකල විශේෂ විගණන වාර්තාව එම විශේෂ වාර්තා වේ.

මේ අතරින් රාජ්‍ය බැංකුවල ඉහළම අක්‍රීය ණය ගනුදෙනුකරුවන් 25 පිළිබඳ වාර්තාව රහසිගත වාර්තාවක් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනයේ 2017 ජනවාරි සිට 2022 මාර්තු මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ පරිපාලන හා මෙහෙයුම් ක්‍රියාකාරකම් පිළිබඳ සිදුකල විශේෂ විගණන වාර්තාව ව්‍යවස්ථාපිත හා කරුණු හේතුවෙන් ප්‍රසිද්ධියට පත් නොකරන ලදී.

## 01. දේශීය ආදායම් දෙපාර්තමේන්තු මුලාශ්‍රයන්ට අනුව රජයට අය විය යුතු නමුත් මෙතෙක් අය කරගෙන නොමැති එකතු කළ අගය මත බදු පිළිබඳ විශේෂ විගණන වාර්තාව

### වාර්තාව නිකුත් කිරීමේ පසුබිම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් බදු පරිපාලන පද්ධති 2 කට අදාලව අයකර ගත යුතු රු. මිලියන 114,293.74 ක එකතු කළ අගය මත හිඟ බදු හා දඩ මුදල කඩිනමින් අයකර ගැනීම හා ඊට අදාල අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම හා අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් කාර්යක්ෂමතාවයකින් යුතුව සිදු නොවීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයන් සිදුකර ඊට අදාල හේතු හා සිදුවිය හැකි අක්‍රමිකතාවයන් හඳුනා ගැනීම මූලික අරමුණ විය.

දේශීය ආදයම් දෙපාර්තමේන්තුව එකතු කළ අගය මත බදු (VAT) නියමිත කාලය තුලදී අය කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් දැනටමත් මහජනතාව විසින් කැප කිරීමක් කර රජයට අදායමක් ලෙස ගෙවා තිබූ ආදායමෙන් විශාල ප්‍රමාණයක් අවභාවිතාවීමේ හෝ / සහ රජයට අහිමි වීමේ අවධානම, බදු අයකර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග නියමිත කාලපරිච්ඡේදය තුල නොගැනීම හේතුවෙන් හිඟ බදු අයකර ගැනීමට අදාළව එළඹ ඇති නීති කෘත්‍යාන්ද ඉදිරියට පවත්වා ගෙන යාමේ හා ඒවා දෙපාර්තමේන්තුවට වාසිදායක ලෙස විසඳීමේ අවිනිශ්චිතතාව, හිඟ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් පවතින ගැටළු පිළිබඳ විවිධ අවස්ථාවන් වල දී මාධ්‍ය හා මහජන නියෝජනයන් මඟින් දක්වා තිබූ කරුණු සහ දේශිය ආදායම් දෙපාර්තමේන්තුව විසින් බදු පරිපාලනය සඳහා පවත්වා ගෙන යනු ලබන පරිගණකගත බදු පරිපාලන පද්ධති දෙකට අදාළව පවත්නා හිඟ බදු මුදල් පිළිබඳව කාර්යක්ෂමතාවයකින් යුතුව කටයුතු නොවීම යනාදී කරුණු සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු ඇතුළත් කර මෙම වාර්තාව නිකුත් කරන ලදී.

## වාර්තාව නිකුත් තරන ලද ආයතනය

දේශීය ආදයම් දෙපාර්තමේන්තුව

## ලබාදෙන ලද නිර්දේශ කෙටියෙන්

- අය කර ගත හැකි (බාධාවකින් තොරව) ලෙස හඳුනා ගෙන ඇති හිඟ බදු මුදල්වලට අදාළ කේවළ ශේෂ අනුව දිගු කාලයක සිට අයවීම් සිදු නොවන හිඟ බදු, සෙමෙන් අයවන හිඟ බදු හා කාල කඩඉමට ලක්විය හැකි හිඟ බදුවලට අදාළව ඊට හේතු වෙන වෙනම හඳුනා ගැනීම හා අයවීම් කඩිනම් කර ගැනීම සහ අය නොවීමේ අවදානමට ලක්වන හිඟ බදු සඳහා අවශ්‍ය සුදුසු වැඩපිලිවෙලක් ක්‍රියාත්මක කිරීම.

- බදු පරිපාලන පද්ධති දෙකටම අදාළව අයකිරීම් තාවකාලිකව අත්හිටුවා ඇති හිඟ බදු මුදල්වලට අදාළ කේවල ශේෂයන් පරීක්ෂාවට ලක් කර එම ශේෂයන්හි ඇතුළත් මතබේදකාරී බදු හා දඩ ශේෂයන් නිවැරදිව, හඳුනාගෙන ඒවා සම්බන්ධයෙන් එකඟ විය හැකි සාධාරණීයකරණය කළ හැකි බදු බරක් වෙතොත් එය කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය සුදුසු ක්‍රියාමාර්ග/ පියවර ගැනීම හා පවත්නා දත්ත පද්ධතින් ප්‍රශස්ථ ලෙස උපයෝජනය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කිරීම.

- වංචනිකව,නොසැලකිලිමත්ව හෝ චේතනාන්විතව හෝ අයකර ගත හැකි හිඟ බදු හා දඩ මුදල් අයකරගැනීමට පියවර ගෙන නොමැති, අයවීමේ කාර්යක්ෂමතාවයට බාධාකාරී ලෙස කටයුතු කරන සහ විගණකාධිපතිගේ ව්‍යවස්ථාපිත අයිතීන්ට අගතිගාමී ලෙස කටයුතු කරන නිලධාරීන් සිටී ද යන්න සම්බන්ධයෙන් ආයතනික

මට්ටමින් හෝ ඉන් ඉහළ නියාමනයකින් පරීක්ෂණයක් සිදුකර, වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය හා වෙනත් අදාළ නීතීන් ප්‍රකාරව සුදුසු පියවර ගැනීම.

- පනතේ සඳහන් විධිවිධාන පරිදි දෙපාර්තමේන්තුව විසින් කාලීන ප්‍රමාණවත් පියවර ගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කිරීම සහ එයට අනුගත නොවන අවස්ථා ක්ෂණිකව හඳුනාගත හැකි පරිදි අදාළ පද්ධති නියාමනය කිරීම.

- තමන් රැස් කර ඇති VAT බදු මුදල් නිසි කලට නිවැරදි ප්‍රමාණයෙන් රජයට නොගෙවා පනත ප්‍රකාරව ඉඩ දී ඇති කාලයට අමතරව දීර්ඝ කාලයක් තමන් අත රඳවා ගැනීමට බදු මුදල් රැස් කරන ලියාපදිංචි තැනැත්තන්ගේ හැකියාව අවම කිරීම සඳහා මෙන්ම කූඨ චේතනාවෙන් එලෙස කටයුතු කිරීම අඩපණ කරවන ක්‍රමවේදයන් හඳුන්වාදීමේ අවශ්‍යතාවය පිළිබඳ දැඩි අවධානය යොමු කිරීම.

- අධිකරණමය ක්‍රියාමාර්ගයක් මගින් හිඟ බදු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරමින් පැවතුණද එලෙස පවත්නා ඇතැම් නඩුවලට අදාලව තවදුරටත් අයකරගත හැකි හිඟ ශේෂයන් දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය තුළ නොමැති වීම හේතුවෙන් මේ සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂාවන් සිදුකර අදාල පරිදි පද්ධතිය යාවත්කාලීන කිරීම හෝ පවත්නා අධිකරණමය ක්‍රියාදාමයන් සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීම.

## 02. ශ්‍රී ලංකා රේගුවේ පවතින විවිධ අරමුදල් කළමනාකරණය/ පරිපාලනය සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාව

### වාර්තාව නිකුත් කිරීමේ පසුබිම

රේගු ආඥා පනතට අනුකූලව ශ්‍රී ලංකා රේගුව විසින් බදු හා දණ්ඩන පනවා රජයට ආදායම් රැස් කරනු ලබන අතර එලෙස අයකරගන්නා මුදල්වලින් වැඩි ප්‍රතිශතයක් යම් ක්‍රමවේද යටතේ රේගු නිලධාරීන් අතර බෙදා හැරීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් පවත්වාගෙන යනු ලබන අරමුදල් තුනකට බැර කරනු ලබන අතර මෙම අරමුදල් පවත්වාගෙන යාම මගින් රජයේ ආදායම ශක්තිමත් කිරීමට ප්‍රමාණවත් දායකත්වයක් දක්වන්නේ ද යන්න, අරමුදල් සම්බන්ධයෙන් පවත්නා අභ්‍යන්තර පාලනයේ ශක්තිමත්භාවය පරීක්ෂා කිරීම සහ රාජ්‍ය ආදායම වර්ධනය කිරීම, රේගු වැරදි අවම කිරීම සහ නිලධාරීන්ට පෞද්ගලික ප්‍රතිලාභ හිමිකරදීම යන අංශයන් ත්‍රිත්වයේ ප්‍රමුඛත්වයන් ප්‍රශස්ත ලෙස කළමනාකරණය වන්නේ ද යන්න පිළිබඳව ඇගයීම යන අරමුණු මූලික කරගනිමින් මෙම විශේෂ විගණන වාර්ථාව නිකුත් කරන ලදි.

## වාර්තාව නිකුත් කරන ලද ආයතනය

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

## ලබාදෙන ලද නිර්දේශ කෙටියෙන්

- රේගු අඥා පනතෙහි මෙම අරමුදල් සම්බන්ධයෙන් පවත්නා ඇතැම් විධිවිධාන /දණ්ඩන වර්තමානයට ගැලපෙන පරිදි හා රජයට වඩාත් ආර්ථික වාසි ලැබෙන පරිදි සංශෝධනය කිරීමට කඩිනම් පියවර ගැනීම.
- 1988 වසරේ සිට දෙපාර්තමේන්තුව තම අභිමතය පරිදි සකස් කරන ලද අභ්‍යන්තර නියෝග මත පමණක් ත්‍යාග මුදල් ගෙවා තිබීම, පනතෙහි විධිවිධාන උල්ලංඝනය වීමක් බැවින් දෙපාර්තමේන්තු නියෝග නැවත සමාලෝචනය කර පනතෙහි විධිවිධානවලට අනුකූල වන පරිදි අමාත්‍යවරයාගේ එකඟතාවකින් යුතුව පමණක් දෙපාර්තමේන්තු නියෝග සංශෝධනය කිරීම.
- සේවක ප්‍රතිලාභ වර්ධනය කිරීමේ චේතනාවෙන් බැහැරව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව රේගු නිලධාරීන් විසින් සාමාන්‍යයෙන් ඉටුකල යුතු වැඩ කාර්යයන් හා වගකීම් මොනවාද යන්න සහ ත්‍යාග මුදල් ලබා දීමේදී ඒ සඳහා සුදුසුකම් ලැබිය යුතු රාජකාරීන් හා අවස්ථාවන් මොනවාද යන්න සේවක ප්‍රතිලාභ වර්ධනය කිරීමේ චේතනාවෙන් බැහැරව නිසි අධ්‍යනයකින් පසුව හඳුනා ගැනීම සහ අතිකාල ගෙවීමේ දී කාර්යය මණ්ඩලයෙහි පැමිණීම, පිටවීම සටහන් කිරීම විධිමත් කර අතිකාල ගෙවීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට පියවර ගැනීම.
- ඒකාබද්ධ අරමුදලට බැරවන ප්‍රතිශතය වැඩිකර රාජ්‍ය ආදායම වැඩි කිරීම සඳහා අරමුදල් පරිපාලනය හා මෙහෙයවීමට අදාල නිර්නායක /කොන්දේසි සංශෝධනය කිරීම.
- පනත මඟින් ලබා දී ඇති නිශ්චිත ප්‍රතිපාදන මත පමණක් දණ්ඩන ලිහිල් කිරීම මඟින් රජයට ලැබිය යුතු අවම බදු මුදල හෝ අය කර දීම තුළින් රාජ්‍ය ආදායම ඉහල උපයා නැංවීමට කටයුතු කිරීම.

## 03. විදේශ ප්‍රේෂණ මත, එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් වෙත පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා දීමට අදාළව 2022 මැයි 01 දින සිට 2023 සැප්තැම්බර් 15 දින දක්වා ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රමය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

### වාර්තාව නිකුත් කිරීමේ පසුබිම

පූර්ණ විද්‍යුත් වාහන සඳහා බලපත්‍ර නිකුත් කිරීමට පදනම් වූ කරුණු, එහි ක්‍රමවේදය සම්බන්ධයෙන් විවිධ පාර්ශවයන් අතර සාකච්ඡාවන් හා ක්‍රියාත්මක කිරීමේ අවිධිමත්භාවය, බලපත්‍ර නිකුත් කිරිමට අදාළ නෛතික කරුණු, ක්‍රියාවලිය සඳහා වරින් වර සිදු කරන ලද ප්‍රතිපත්තිමය සංශෝධනයන් සැලකිල්ලට ගනිමින් මෙම බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ආශ්‍රිත කරුණු ඇතුළත් කරමින් මෙම වාර්තාව නිකුත් කරන ලදී.

### වාර්තාව නිකුත් කරන ලද ආයතන

ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව

ආගමන විගමන දෙපාර්මේන්තුව

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

### ලබාදෙන ලද නිර්දේශ කෙටියෙන්

- විදේශ ශ්‍රමිකයින් සඳහා වාහන ආනයන බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රතිපත්ති හා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ඇතුළත් අමාත්‍ය මණ්ඩල අනුමැතියලත් කමිටු වාර්තාවෙහි දක්වා තිබූ මූලික ප්‍රතිපත්තිමය කරුණු උල්ලංඝනය කරමින් විද්‍යුත් වාහන ආනයනයට අදාළ 2022 අගෝස්තු 31 දිනැති අංක 2/2022 දරන චක්‍රලේඛය නිකුත් කිරීම් සම්බන්ධයෙන් අදාල බලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම.
- අදාළ කාලය තුළ නිශ්චිත වශයෙන්ම විදේශගත ශ්‍රමිකයෙකු බවට තහවුරු කර නොගත් සහ ඉතා කෙටි කාලපරිච්ඡේද සඳහා විදේශගතව තිබූ පුද්ගලයන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂාවන් සිදු කර යම් අක්‍රමිකතාවයක් සිදු වී / සිදුකර ඇත්නම් ඒ සඳහා වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීම හා රජයට සිදුව ඇති අලාභයන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම.
- තෝරාගත් පාර්ශවයන් සඳහා ප්‍රතිලාභ ලබා දීමට ක්‍රියාත්මක කරනු ලබන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ඍජු සම්බන්ධතාවක් ඇති මෙවැනි යෝජනා ක්‍රම සැලසුම් කිරීම, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම හා චක්‍රලේඛ නිකුත් කිරීම වැනි ප්‍රධාන ප්‍රතිපත්තිමය කාර්යයන් නිශ්චිත හා විනිවිදභාවයෙන් යුතු ක්‍රමවේද අනුව මහාභාණ්ඩාගාරයේ ඍජු අධීක්ෂණයට යටත්ව සිදු කිරීම.

- වාහන ආනයන ක්‍රියාවලියේදී සම්බන්ධිත ආයතන අතර මනා සම්බන්ධීකරණයක් නොමැති වීම හේතුවෙන් ද ගනුදෙනුවල විනිවිදභාවය පිළිබඳ ගැටලු ඇති වී තිබුණු බැවින් සම්බන්ධිත ආයතන අතර පද්ධතිමය සම්බන්ධතාවයක් ඇති කිරීම.

## 04. ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනයේ 2017 ජනවාරි සිට 2022 මාර්තු මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ පරිපාලන හා මෙහෙයුම් ක්‍රියාකාරකම් පිළිබඳ සිදුකල විශේෂ විගණන වාර්තාව

### වාර්තාව නිකුත් කිරීමේ පසුබිම

කරාතේ සංගමයේ නාමය 1988 වර්ෂයේදී "ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනය" නමින් වෙනස් කර එහි කටයුතු පවත්වා ගෙන යමින් පැවතුණු අතර එහි ක්‍රියාකාරිත්වයෙහි ස්වභාවය, 2017 ජනවාරි සිට 2022 මාර්තු දක්වා කාලපරිච්ඡේදයෙහි සිදු වූ ගණුදෙනු හා සිද්ධීන් සම්බන්ධයෙන් සහ 2017 සහ 2022 අතර කාලය තුළ සම්මේලනයේ නිලවරණය පැවැත්වීමට අදාළව පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ කරුණු ඇතුළත් කර මෙම විශේෂ වාර්තාව නිකුත් කරන ලදි.

### වාර්තාව නිකුත් කරන ලද ආයතනය

යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය

ක්‍රීඩා දෙපාර්තමේන්තුව

### ලබාදෙන ලද නිර්දේශ කෙටියෙන්

- පනත මගින් ලබා දී තිබු නෛතික විධිවිධානයන්ට යටත්ව නිලධාරින් තෝරා පත්කර ගැනීමට කටයුතු කිරීම, සම්මේලනය විසින් අනුමත කරගන්නා ලද ව්‍යවස්ථාවෙන් නෛතිකව ලබා දී ඇති ප්‍රතිපාදන හා නියෝග මත ව්‍යවස්ථාවට අදාළ සංශෝධන සිදු කිරීම සහ අදාළ ව්‍යවස්ථාව පරිදි සම්මේලනයේ කටයුතු පවත්වාගෙන යාම.

- සම්මේලනයේ පාලක මණ්ඩලය විසින් ගෙන තිබූ ඇතැම් තීරණ පවත්නා නීතිරීතිවලට පටහැනිව මෙන්ම ගෙන තිබූ වැදගත් තීරණද කූඨ ලෙස වෙනස් කිරීමටද කටයුතු කර තිබූ බැවින් එවැනි තත්ත්වයන් වැලැක්වීම සඳහා සම්මේලනයේ කටයුතු ක්‍රීඩා අමාත්‍යාංශය සහ/හෝ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් අධීක්ෂණය කිරීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් සකස් කිරීම හා කූඨ ලේඛන පිළියෙල කිරීමට කටයුතු කර තිබූ නිලධාරීන් සම්බන්ධයෙන් දැනට සිදුකරමින් පවතින විනය ක්‍රියාමාර්ගයන් කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

- සම්මේලනය විසින් කර තිබූ ඇතැම් ගෙවීම් එකී ගෙවීම් ලැබීමට හිමි පාර්ශවයන්ටම ලැබුනේදැයි ගැටලු සහගත තත්ත්වයක් ඇති වීමත්, ඇතැම් බිල්පත් කූට ස්වරූපයේ බිල්පත් බවට විගණනයට නිරීක්ෂණය වීමත් හා මූල්‍ය වංචා හා අක්‍රමිකතා පිළිබඳව සම්මේලනයට පවතින චෝදනා පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් පරීක්ෂණයක් සිදුකිරීමට අවශ්‍ය පියවර ගැනීම

- ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනය විසින් ඉදිරි ජාත්‍යන්තර තරඟාවලි සඳහා ක්‍රීඩකයින් තෝරා ගැනීම සඳහා වඩාත් සුදුසුම කණ්ඩායම් ක්‍රීඩකයින් තේරීම සඳහා යෙදවීමත්, අදාළ තරඟාවලින් සඳහා ශ්‍රී ලංකාවෙන් යෙදවිය හැකි ඉහළම දක්ෂතා ඇති ක්‍රීඩකයින් ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය සෑම පියවරක්ම ගැනීම.

## 05. 2022 හා 2023 වර්ෂවල ඖෂධ අවශ්‍යතාවය, ප්‍රසම්පාදනය, සැපයුම, බෙදාහැරීම හා නියාමනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

### වාර්තාව නිකුත් කිරීමේ පසුබිම

2020 වර්ෂයේ දී ඇති වූ කොවිඩ් වසංගතය හා 2021 අවසාන කාර්තුවේ ඇතිවූ ආර්ථික අර්බුදය හේතුවෙන් විදේශ සංචිත ප්‍රමාණය සීඝ්‍රයෙන් ක්ෂය වීම නිසා රට තුළ ඇතිවූ විදේශ විනිමය ඌනතාවය මත එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය සීඝ්‍රයෙන් අවප්‍රමාණය වීම සෞඛ්‍ය ක්ෂේත්‍රයට ද අහිතකර අයුරින් බලපා තිබුණි. එම තත්ත්වය මත රට තුළ ඖෂධ හිඟයක් ඇති වූ බවට හා ඒ අනුව හදිසි මිලදී ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යවරයා ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශයට ලද අනුමැතිය මත අභිලාෂ කැඳවීමේ ක්‍රමවේදය සහ ආනායාචිත යෝජනා යටතේ මුදල් අමාත්‍යාංශය විසින් ලිහිල් කොන්දේසි සහිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් හඳුන්වාදීම මත රෝගීන් සඳහා නිකුත් කරන ලද ඖෂධ නියමිත ප්‍රමිතියෙන් තොර වීම හා ඖෂධ මිල සීඝ්‍රයෙන් ඉහළ යාමත් ආදී කරුණු සම්බන්ධයෙන් මෙම වාර්තාව නිකුත් කරන ලදි.

### වාර්තාව නිකුත් තරන ලද ආයතනය

සෞඛ්‍ය අමාත්‍යාංශය

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

## ලබාදෙන ලද නිර්දේශ කෙටියෙන්

- ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතික නිකුත් කිරීමේ දී එවකට පැවති අවම ක්‍රමවේදයට බැහැරව යමින් විශේෂ ක්‍රමවේදයක් (Special Pathway) යටතේ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතික නිකුත් කිරීම හේතුවෙන් ඖෂධවල ගුණාත්වය පිළිබඳ පරීක්ෂාවකින් තොරව මෙරටට ඖෂධ ගෙන්වීමට ඉඩ සැලසීම තුළින් රෝගී ජනතාව අවදානමට ලක්කර තිබුණු බැවින් ඉහත විශේෂ ක්‍රමවේදය නිර්දේශ කර තිබුණු අධිකාරියේ එවකට සිටි ප්‍රධාන විධායක නිලධාරියා සහ එය අනුමත කර තිබුණු පාලක මණ්ඩලය සම්බන්ධයෙන් විමර්ශනය කර නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු බවට හා නිර්දේශ කෙරේ.

- ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ඖෂධ සඳහා ලියාපදිංචිය පිරිනැමීමේ කටයුතු කඩිනමින් හා විධිමත්ව සිදු කිරීමට අවශ්‍ය ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීමටත්, එම ක්‍රමවේදයන් නිසි පරිදි ක්‍රියාත්මක වේදැයි පසුවිපරම් කිරීම සඳහා වූ ක්‍රමවේදයක් සකස් කිරීමටත් නිර්දේශ කෙරේ.

- තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයුම් සිදු කළ සමාගම් / ආයතන අසාධු ලේඛනගත කිරීමේ දී එම ආයතනවල හිමිකාරිත්වය ඇති පුද්ගලයින්ගේ ජාතික හැඳුනුම්පත හෝ ගුවන් ගමන් බලපත්‍රය වැනි අනන්‍යතාවය තහවුරු කරන ලේඛනයන් මඟින්ම අසාධු ලේඛනගත කිරීම සඳහා කඩිනම් පියවර ගැනීමට මුදල් අමාත්‍යාංශ ලේකම්, සමාගම් රෙජිස්ටාර් හා ප්‍රසම්පාදන කොමිෂන් සභාව කටයුතු කළ යුතු බව නිර්දේශ කෙරේ.

- ඖෂධවල මිල නියම කිරීමේ හා නියාමනය මඟින් මහජනතාවට සාධාරණ මිලකට ඖෂධ ලබාදෙන බවට තහවුරු කිරීම සඳහා ක්‍රමවේද සකස් කර ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කෙරේ.

- හිඟ ඖෂධ සම්බන්ධයෙන් පද්ධති මඟින් පෙන්නුම් කෙරෙන ඉතිරි තොග, සැපයුම්කරුවන් වෙතින් ලැබීමට නියමිත ඇණවුම් ප්‍රමාණයන් හා ඒවා ලැබීමේ සම්භාවිතාවන්, ඖෂධයේ මාසික භාවිතය සහ අවස්ථාවෝචිතව අනෙකුත් සාධක සැලකිල්ලට ගෙන තීරණය කරනු ලබන හිඟ ඖෂධ සඳහා හදිසි මිලදී ගැනීම්වලට යොමුවීමට පෙර සැපයුම්කරුවන් වෙතින් ලැබීමට නියමිත ඇණවුම් ප්‍රමාණයන් ලබා ගැනීමට උපරිම ආකාරයෙන් කටයුතු යෙදීම, වැඩ අවසන් නොවූ සාමාන්‍ය වාර්ෂික ඇණවුම් කඩිනමින් සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ එසේ හදිසි මිල දී ගැනිම සඳහා යොමු වීම සඳහා නිලධාරින්ගේ නොසැලිකිල්ල හෝ අකාර්යක්ෂමතාවය

හේතුවී ඇත්නම් එම නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතු බවටත් හදිසි මිල දී ගැනීම නිසා රජයට දැරීමට සිදුවන අලාභය ඊට වගකිවයුතු නිලධාරින්ගෙන් අයකළ යුතු බවට නිර්දේශ කෙරේ.

- ඖෂධ ප්‍රසම්පාදන ක්‍රියාවලිය, අභිලාෂ කැඳවීමේ සහ අනායාචිත පදනම යටතේ සිදු කිරීමේදී අමාත්‍ය මණ්ඩල තීරණ අභිබවා කටයුතු කිරීම, තාක්ෂණික ඇගයීම් නිසි පරිදි සිදු නොකිරීම, සැපයුම්කරුවන්ට වාසිසහගත වන ලෙස නිර්දේශ ලබා දීම සහ ව්‍යාජ ඖෂධ වෙනුවෙන් ගෙවීම් කිරීමේ දී ප්‍රමුඛතාවයදී කටයුතු කිරීම යනාදිය සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කර ඊට වගකිව යුතු තැනැත්තන් සම්බන්ධයෙන් සහ ඖෂධ තොග සැපයීමේදී සැපයුම්කරු විසින් සිදුකළ වංචා සහගත ක්‍රියා හේතුවෙන් රෝගී ජීවිත බරපතල අවදානමට ලක් කිරීම පිළිබඳව විධිමත් විමර්ශනයෙන් අනතුරුව සැපයුම්කරුට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීමට නිර්දේශ කෙරේ.